අභිනවටීකාචාර්ය බුද්ධඝෝෂ සංඝරාජපාදයන් විසින් විරචිත

සමන්තපාසාදිකා විනයට්ඨකථා

(සිංහල පරිවර්තනය)

පළමුවන කොටස

සම්පාදක

අම්බලම්ගොඩ ශාස්ත්‍රෝදයපරිවෙණාධිපතිව වැඩ විසූ
ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය විනයකීර්ති ශ්‍රී මහොපාධ්‍යාය

රාජකීයපණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල

අමරපුර නිකායේ මහානායක සංඝරත්නවහන්සේ

1975 - 1984

බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අවසරය පිට
මුද්‍රණය කරන ලදී.

අටුඨකථාචාර්‍ය බුද්ධඝෝෂ සථවිරපාදයන් විසින් විරචිත

සමන්තපාසාදිකා විනයට්ඨකථා

පාරාජිකකාණ්ඩය

(සිංහල පරිවර්තනය)

පළමුවන කොටස

ප්‍රථම මුද්‍රණය : ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය - 1999

පෙරවදන (පළමු මුද්‍රණය)

සමන්තපාසාදිකා විනයට්ඨකථා සිංහල පරිවර්තනය නමින් ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ පාළි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන මෙම ග්‍රන්ථය අස්මදාචාර්යෝත්තම **රාජකීය පණ්ඩිත මහෝපාධ්‍යාය අතිගරු අම්බලංගොඩ ධම්මකුසල අමරපුර නිකායේ මහානායක මාහිමියන් වහන්සේ** විසින් සම්පාදනය කරනලද විනය විවෘතිනම්වූ සිංහල සමන්තපාසාදිකාවයි. එහි විශාලත්වය සලකා කාණ්ඩ වශයෙන් මුද්‍රණය කරවීම මහානායක මාහිමියන් වහන්සේගේ අදහස විය. එහෙත් උන්වහන්සේගේ ජීවිත කාලයතුළ මුද්‍රණය කරගැනීමට හැකිවූයේ පළමුවන කාණ්ඩය පමණි. ඒ මෙයට අවුරුදු විසිහතකට (27) පමණ පෙරය. දෙවෙනි කාණ්ඩයේ අත්පිටපත් අනාරක්ෂිතව තිබුණු බැවින් එහි සමහර තැන් කියවීමට පවා නොහැකි තත්වයක තිබුණේය. ඒ තැන් ශක්ති පමණින් සකස් කෙළෙමි.

සිංහල සමන්තපාසාදිකාවේ පළමු කාණ්ඩය අද කෙනෙකුට ලබා ගැනීමට නොහැකිවී ඇත. නැවත මුද්‍රණය කිරීමට හා දෙවෙනි කාණ්ඩයද මුද්‍රණය කිරීමටත් අවශ්‍යව තිබුනද විවිධ දුෂ්කරතා නිසා, එයද කළ නොහැකි විය.

එය අතහැර ඉදිරි කාණ්ඩ පමණක් මුද්‍රණය කිරීම අර්ථවත් නොවේ. ප්‍රයෝජනයක්ද නැත. එබැවින් සම්පූර්ණ ග්‍රන්ථයම මුද්‍රණය කිරීම සුදුසු වේයයි අපගේ අදහස වෙයි.

මේ තත්වය අපගේ බලවත් කණගාටුවට හේතුවී තිබිණ. මේ කාර්යය කෙසේ ඉටුකර ගනිම්දැයි කල්පනා කරමින් සිටින අවස්ථාවේ, රාජකීය ආසියාතික සමිතිය මගින් පාළි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති බව දැන ගන්ට ලැබිණ. මේ ගැන මහාචාර්ය ඇම්. බී. ආරියපාල මහතාගෙන් විමසුවිට ඔහු කියා සිටියේ පරිවර්තන කටයුතු පිළිබඳ කොමිටියෙන් විමසා පිළිතුරක්

ඉක්මනින් දෙන බවය. සති දෙකකට පමණ පසු සමන්තපාසාදිකාවේ කොටස් සියල්ලම මුද්‍රණය කිරීමට කොමිටිය සතුටින් පිළිගන්නා බව මහුවිසින් දන්වන ලදී.

මේ අවස්ථාවේදී ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය සිය පාළි අටඨකථා පරිවර්තන ව්‍යාපෘතිය මගින් සිංහල සමන්තපාසාදිකාවද මුද්‍රණය කිරීමට කැමැත්ත ප්‍රකාශ කිරීම අපගේ බලවත් ප්‍රසාදයට හා සහනයටද හේතුවීමයි. මෙම සත්කාර්‍යය සඳහා ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ පාළි අඨකථා පරිවර්තන කටයුතු පිළිබඳ කමිටුවේ ගරු සභාපති මහාචාර්ය ඇම්. බී. ආරියපාල මහතාණන් ගෙන් ලැබුණු කාරුණික, සුවිශේෂ අනුග්‍රහය කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. එසේම රාජකීය ආසියාතික සමිතියට හා එම සමිතියේ පාළි අඨකථා පරිවර්තන කටයුතු පිළිබඳ කමිටුවටද අපගේ කෘතඥතා පූර්වක ආශීර්වාදය පිරිනමමු.

තවද මාගේ ආචාර්‍යෝත්තම රාජකීය පණ්ඩිත මහෝපාධ්‍යාය අතිගරු අම්බලංගොඩ ධම්මකුසල මහානායක මාහිම්යන්වහන්සේ, තමන්වහන්සේ විසින් සම්පාදිත සද්ධම්සාගර නම්වූ ධම්පදවණ්ණනාවේ කාණ්ඩ 9, සිංහල අකුරු, චතුර්වේදය, විනයවිවෘති නම්වූ සිංහලසමන්තපාසාදිකාව ආදී සියලු ග්‍රන්ථවල පූර්ණ අයිතිය හා බලතල උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයා වසයෙන් මා වෙත පවරා ඇතිබව ප්‍රකාශ කරමි. ඒ පැවරීම අනුව සිංහල සමන්තපාසාදිකාවේ සියලු කාණ්ඩ මුද්‍රණය කිරීම බෙදහැරීම ආදී සියලු කාර්‍යයන් පිළිබඳ අයිතිය ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ පාළි අඨකථා පරිවර්තන කටයුතු පිළිබඳ කමිටුවට පැවරුබවද ප්‍රකාශ කරමි.

මෙහි මුද්‍රණකටයුතු ඉතා මැනවින් සිත් ගන්නාලෙස නිමකර දුන් දෙහිවල ශ්‍රීදේවී ප්‍රින්ටර්ස්හි අධිපති, මහේන්ද්‍ර සේනානායක මහතාටද අපගේ කෘතඥතාව හිමිවෙයි.

මේ වගට-ශාසනොදයකාමී

අම්බලම්ගොඩ සුමඩ්ගල
අමරපුරනිකායේ මහානායක ස්ථවිර

2546
2003

සවණ්ණමාලි විහාරය
තෙලවල පාර
ගල්කිස්ස

පූර්විකාව (පළමු මුද්‍රණය)

විනයශබ්දය:

මේ විනයශබ්දයෙහි නිපැත්මට අර්ථවත්වූ අකුරු තුණක් මුල්ව සිටියේය. ඒ නම් **වි, නි, අ,** යන අකුරු තුණය. එහි **වි**, යනු උපසර්ගයි. **නී,** යනු ධාතුයි. **අ,** යනු ප්‍රත්‍යයයි. එහි **වි, නී,** යන උපසර්ග - ධාතු දෙක විවිධාර්ථ ඇත්තේය. නිපාතද මේ ගණයට වැටේ. නිපාත - උපසර්ග - ධාතුයන තුන් කොටසම නානාර්ථවත් යි ශාස්ත්‍රයෙහි කියනලදී. **'නිපාතාශ්චොපසර්ගාශ්ච ධාතවශ්චෙති තෙ ත්‍රයඃ, අනෙකාර්ථාඃ සම්භෘතාඃ සන්ථ පාඨසෙෂාඃ නිදර්ශනම්'**යි. මෙසේ නානාර්ථවත්වූ වි උපසර්ගය විසින් නානාර්ථවත්වූ නී ධාතුව පිළිබඳ ප්‍රසිද්ධාර්ථයවූ (ප්‍රාපණ) පැමිණවීමයන අර්ථය යටපත්කොට එහි නිලීනව ගැබ්ව තුබූ ශික්ෂණාර්ථය මතුකොට දෙනලද්දේය. **'ධාතූනමනෙකාර්ථත්වා ඵව නීත්‍යාසම්ඃ ධාතුමහි සන්නමෙව සික්ෂාර්ථඃ විසදෙ, ජොතෙති'**යනු එහෙයින් කියනලදී.

මෙහි නී ධාතුවෙන් පරව සිටි අප්‍රත්‍යයය හා සෙසු කෘත්ප්‍රත්‍යයයෝ කර්ම් - කර්තෘ - කරණාදි ෂට්කාරකාර්ථ හා භාවාර්ථයද, අතීත වර්තමාන - අනාගත යන කාලාර්ථද යථාලාභ විසින් ලැබෙන ලැබෙන පරිදි පවසාලන්නෝය. එහෙයින් අප්‍රත්‍යය මෙහි යෙදී සිටියේ කර්තෘ - කරණ - ආධාරයන කාරකාර්ථ හා අතීත - වර්තමාන - අනාගතයන කාලාර්ථයන් පවසනු පදහාය. වෘද්ධි - ආදෙශද ලබා මෙසේ නිපන් විනයශබ්දයෙහි ඇති කාරකාර්ථ හා කාලාර්ථ පළටකරණු පිණිස ආචාර්‍යපාදයෝ **'විනෙසි, විනෙති, විනෙස්‍යති එතෙන ඵර්ථ වාති විනයොයි** ලියා තැබූහ.

විනයාර්ථ:

විවිධවූ පඤ්චවිධප්‍රාතිමොක්ෂාදෙශ, පාරාජිකාදිසප්තාපත්ති සඤ්ඣ, මාතෘකා, විභඞ්ගාදිප්‍රභෙද නයින් හා විශෙෂවූ ලොකවද්‍ය ශික්ෂාවන්හි දළ්හිකම්ප්‍රයොජනයද ප්‍රඥප්තිවිද්‍යාශික්ෂාවන්හි ශිථීලීකරණප්‍රයොජනයද ඇති අනුප්‍රඥප්ති නයින් කායික වාචසික

අධ්‍යාචාරයන් වළකාලීමෙන් මේ විනය කය වචන හික්මවාලූයේය. හික්මවාලයි. හික්මවාලන්නේය. එහෙයින් විවිධනය ඇතිබැවින් හා විශෙෂණය ඇතිබැවින් හා කය වචන හික්මවනබැවින් හා රාගාදී කෙලෙස් වනසනබැවින් හා විනයයි කියනලද්දේය. විනයශබ්දය පිළිබඳ වචනාර්ථ දක්වනුපිණිස **'විවිධවිසෙසනයත්තා - පෙ - විනයො විනයොති අක්ඛාතො'**යි මෙහිම කියනලදී.

මෙහිලා ප්‍රධාන විසින් භික්ෂු-භික්ෂුණීන්ගේ කායවාග්ද්වාර දෙකින් සිදුවන සියලු අකුසල් වළකා ඔවුන් මනාපිළිවෙතෙහි පිහිටුවා යථාර්ථවශයෙන් ශාසනාවචරයන් කිරීමෙහි පරමාද්‍යාශයෙන් යුක්තව භික්ෂු-භික්ෂුණීසඞ්ඝයාගේ පරිහරණයපිණිස පරමකාරුණිකවූ භාග්‍යවත් සම්මාසම්බුදුරජානන්වහන්සේ විසින් දෙශනාකොට වදළ ප්‍රඥප්ති ධර්මසමූහය විනය නමැයි නිශ්චිතය.

මේ ප්‍රඥප්තිධර්මසමූහයෙහි පළමු කියූ ලෙසින් පඤ්චවිධ ප්‍රාතිමොක්ෂාදෙශ සප්තාපත්තිස්කන්ධාදි විවිධක්‍රම හා වස්තු පුද්ගලාදි විශෙෂක්‍රමද ඇතිබව, වි, පූර් නය ශබ්දයෙන් සිද්ධවූ විනය ශබ්දය කියාලන්නේය. වි, යතු හා එක්වූ නය ශබ්දය ක්‍රමවාචීය. නය නම් ක්‍රමයයි. **ආගමනය, ශාස්ත්‍රනය, නෙත්තීනයයි** එය පළමුකොට තෙවැදරුම්ය. නැවත එහි ආගමනය **විනයනය, සුත්තන්තනය, අභිධම්මනය, පාළිනය, අට්ඨකථානය, ටීකානය, පකරණනය, කථත්තනය, පත්තිනය, දෙසනානය, අන්තද්වයවිවිජ්ජනානය, අවිත්තෙය්‍යනය, අධිපායනය, එකත්තනය, නානත්තනය, අව්‍යාපාරනය, එවංධම්මත්තානයයි** බහුවිධවේ. මේ විනයනයාදීන් අතුරෙහි මෙහි විනයශබ්දයෙහි වි, හා යෙදීසිටි නයශබ්දය විනයනය ගෙන සිටියේ විවිධවිශෙෂක්‍රම ඇතිබව පවසාලයි.

විනයනාම:

මෙසේ අර්ථවත්වූ විනය **ආණාදෙසනා, යථාපරාධ සාසන, සංවරාසංවරකථා** යන නාමයන්ගෙන්ද හඳුන්වනුලැබේ. එහි අණ පැණවීමෙහි අසහාය මහාපුරුෂවූ දෙවාතිදෙවවූ බ්‍රහ්මාතිබ්‍රහ්මවූ භාග්‍යවත් සම්මාසම්බුදුරජානන්වහන්සේවිසින් ආඥ බාහුල්‍යයෙන් ව්‍යවසථිතවූ විනය ආණාදෙසනා නම්. අපරාධ ඇති සත්ත්වයන් අපරාධ කළ සත්ත්වයන් අපරාධයනට නුසුදුසුපරිදි විනයයෙහිලා හික්මවූබැවින් යථාපරාධසාසන නම්වේ. අද්‍යාචාරයට ප්‍රතිවිරුද්ධවූ කායවාග්ද්වාර පිළිබඳ හික්මීමෙහි සීමාව ඉක්මවා සිටි අපරාධයනට පටහැනිව සිටි කුදු මහත් සංවරාසංවරය මෙහි කියනලදනුයි සංවරාසංවර කථානම්වේ. විශෙෂවිසින් මේ විනයෙහි

අධිශීලශික්ෂාවද ශීලය තමා කෙලෙසුන්ගේ ව්‍යතික්‍රමයට පටහැනිබැවින් ව්‍යතික්‍රමප්‍රහාණයද කෙලෙසුන්ගේ තදඞ්ගප්‍රහාණයද කියනලද්දේය.

විනයප්‍රභෙදඃ

විනය විවිධවිශෙෂක්‍රම ඇතිබැවින් හා කායවාග්ද්වාරයන් හික්මවනබැවින් හා එකක්වූයේද, **සංවරවිනය, පහාණවිනය**යි දෙපරිදිද **සංවරවිනය, පහාණවිනය, සමථවිනය, පඤ්ඤත්තිවිනය**යි සිවුවැදෑරුම්දවේ.

සංවරවිනයඃ

අකුසලයන්ගේ ඉපැත්මට ඉඩ නොතබා ඒ ඒ ඇවුරුම්වලින් සිත හික්මවාගැනීම සංවරවිනයයි කියනුලැබේ. ඒ මේ සංවරය සති, සීල, ඤාණ, ඛන්ති, විරියයි පස්වැදෑරුම්ය. එහි ඇස්, කන්, නාස්, දෑ සවැදෑරුම් ඉඳුරන්ගේ රැකීම සතිසංවරනම්. කටයුතු නොකටයුතු මේ මෙය යි බෙදවෙන්කොට ඇති විනයපිටකයට අයත් ප්‍රාතිමොක්ෂාදිවතුර්විධශීලයෙන් හික්මීම සීලසංවරනම්. තෘෂ්ණාදෘෂ්ටි ආදි කෙලශයන්ගේ මුල් සිඳලන මාගීඥනය ඤාණසංවරනම්. ශීතොෂ්ණාදි විෂමප්‍රත්‍යයයන් ඉවසීම ඛන්තිසංවරනම්. කාමවිතර්කාදිය දුරුකිරීම්වසයෙන් සිතෙහි පවත්නා වීර්‍ය්‍ය විරියසංවරනම්.

පහාණවිනයඃ

තදඞ්ග, විකම්භණ, සමුච්ඡේද, පටිප්පස්සද්ධි, නිස්සරණයන පස්වැදෑරුම් හෙද අතුරෙහි ඒ ඒ අඞ්ගයෙන් කෙලෙසුන් යටපත්කොට කෙලෙස්ගිනි නිවාලීම පහාණවිනයනම්. එහි අකුශලධර්මයන්ට විරුද්ධව සිටි කුශලධර්මයන්ගේ බලයෙන් ඒ ඒ අකුශලාඞ්ගයන්ගේ ප්‍රහාණය තදඞ්ගප්‍රහාණනම්. අර්පණොපචාරසමාධීන්ගෙන් කාමච්ඡන්දදිපඤ්ච නීවරණයන්ගේ ප්‍රහාණය විකම්භණප්‍රහාණනම්. ස්‍රොතාපත්ති ආදීවූ ඒ ඒ මාගීඞ්ගයෙන් නසාලියයුතුවූ කෙලෙසුන් මුලිනුපුටා සිඳහැරීම සමුච්ඡේදප්‍රහාණනම්. මාගීඥනයෙන් සිඳහල කෙලෙස්ඇති සිතෙහි ඉතිරි කෙලශවාසනා කෙලෙස් පුරුද්ද සෝදාහැරීමෙන් නසාලීමෙන් ලැබෙන සිතෙහි මිදීම ප්‍රතිප්‍රස්සද්ධිප්‍රහාණනම්. සියලු සංස්කාරයන්ගෙන් මිදුනු නිවණ නිස්සරණප්‍රහාණනම්. ඵලඥනයට ගොදුරුවන සංසිදීමය. විනයධර්මයෙහි ප්‍රකටව ගිය සමථවිනය - පඤ්ඤත්තිවිනයයන මේදෙක මොවුනට තුඩුදී සිටියේය.

සමථවිනයඃ

භික්ෂූන්වහන්සේ අතර හටගන්නාවූ **විවාදාධිකරණ - අනුවාදාධිකරණ - ආපත්තාධිකරණ - කිච්චාධිකරණ**යන සිවුවැදෑරුම්වූ අධිකරණයන්ගේ

සන්සිඳුවීමපිණිස පණවාවදළ **සම්මුඛාවිනය - සතිවිනය - අමූළ්හවිනය - පටිඤ්ඤාතකරණ - යෙභුය්‍යසිකා - තස්සපාපිය්‍යසිකා - තිණවත්ථාරකය**න සත්වැදරුම්වූ සමථයෝ සමථවිනය නාමයෙන් පළටවෙති.

එහි **සඞ්ඝසම්මුඛතා - ධම්මසම්මුඛතා - පුග්ගලසම්මුඛතා**යන ත්‍රිවිධ සම්මුඛතාවෙන් පැමිණි අධිකරණය සන්සිඳුවීම සම්මුඛාවිනයය. **'සුදෙඛා හොති අනාපත්තිකො අත්‍ථවදති ච නං යාචති ච තස්ස සඞ්ඝො සතිවිනය‍ං දෙති ධම්මෙන සමග්ගෙන**'යි කියූලෙසින් අධිගමලාභයෙන් සමෘතිවිපුලත්වයට පැමිණි රහතුන්වහන්සේට සඞ්ඝයාවිසින් ඳපති චතුර්‍ථ කාම්වාක්‍යයෙන් දෙනුලබන අධිකරණ සමථය සතිවිනයයි. රහතුන්වහන්සේ හැර අනෙකක්හට අධිගමය ලැබූපමණකින්ම මෙය දියහැකි නොවේ. මෙයට අනාගාමීහුද සුදුස්සෝ නොවෙති. උමතුබැවින් මුළාවූ මහණහුට ත්‍රිවිධ ධාර්මිකයන්ගේවසයෙන් දෙනුලබන අධිකරණසමථය අමූළ්හවිනයයි. 'මම අසුවල් ඇවැතට පැමිණියෙමි, එය ඇවැතක්වසයෙන් දක්නෙමියි පිළිණ දුන්නහු, ධම්මානුශාසනාවෙන් ආයතිසංවරයෙහි පිහිටුවීම පටිඤ්ඤාතකරණයයි. යම්කිසි අධිකරණයෙක්හි ධම්වාදීපිරිස බහුල වේනම්, ඔවුන්ගේ කැමැත්තපරිදි දශවිධධාර්මිකසලාක ගෘහාපනාදියෙන් කලහවිවාදදියට ඉඩ නොතබා අධිකරණය සන්සිඳුවීම යෙභුය්‍යසිකාය. යම් මහණෙක් භණ්ඩනකාරක, කලහකාරක, විවාදකාරක, භස්සකාරකවේද, අව්‍යක්තයෙක් ආපත්තිබහුලයෙක්වේද, අනනුලොමිකවූ ගිහිසසගින් හැනී ගියේ හෝවේද, ආචාර විප්‍රතිපන්නයෙක් හෝවේද, තුණුරුවන්හි අයුණු කියන්නෙක් හෝවේද, එබඳු මහණහු පිළිබඳ කළයුතු සමථය තස්සපාපිය්‍යසිකායයි. යම් අධිකරණයක් කැකුළුබවපිණිස සැඩබවපිණිස පවත්නේවේද, ඒ අධිකරණය නොවිමසා දුහදැති යමක් තණපත් ආදියෙන් වසාලන්නාක් මෙන් දෙපසවූවන්ගේ දන්වීමෙන් සන්සිඳුවීම තිණවත්ථාරකයයි.

පඤ්ඤත්තිවිනය:

සුත්ත - සුත්තානුලොම - ආචරියවාද - අත්තනොමති යි පඤ්ඤත්තිවිනය සිවුවැදරුම්ය. එහි සියලු විනයපිටකයෙහි ඇතුළත්වූ මාතිකා - විභඞ්ග - ඛන්ධක - පරිවාර යි භෙදගතවූ විනයපාළිය සුත්තනම්. විභඞ්ග - ඛන්ධකයන්හි නිර්දේශයන්ට උද්දෙශමාත්‍රවූ ප්‍රාතිමොක්ෂය මාතිකානම්. පාරාජිකපාළි - පාචිත්තියපාළි යන ග්‍රන්ථද්වයෙහි ඇතුළත්වූ භික්ෂු - භික්ෂුණීන්ගේවසයෙන් දෙපරිදිවූ ශික්ෂාපදසමූහය විභඞ්ගනම්, චුල්ලවග්ගපාළි මහාවග්ගපාළියන ග්‍රන්ථද්වයෙහි ඇතුළත්වූ දෙවිසිකඳුවත් ඛන්ධකනම්. සොළොස් පරිවාරය පරිවාරනම්.

මාතිකා:

'මාතිකාති උද්දෙසො, සො හි නිද්දෙසපදනං ජනනීඨානෙ ඨිතත්තා මාතාවියාති මාතිකා'යන වාක්‍යාර්ථය අනුව මාතිකායනු උද්දෙසයයි. ඒවනාහි ශික්ෂාපදයන්හි නිදන - පුග්ගල - වත්‍ථු - අඩ්ඝ - පදභාජනීය - තිකදුක පරිවෙජද - ආපත්ති - අනාපත්ති - අන්තරාපත්තියන නිර්දේශපදයන්ගේ උත්පත්තිස්ථානයෙහි සිටිබැවින් මාතාවක වැනිනුයි මාතිකානම්විය. මෙය භික්ෂු - භික්ෂුණීන්ගේවසයෙන් දෙපරිදිවූයේ අරුත්විසින් පාතිමොක්ඛයිද ශාසනිකයන් අතර ප්‍රසිද්ධියට ගියේය. අරුත්විසිනැයි කීයේ, මෙය කුශලධර්ම පක්ෂයෙහි අතිශ්‍රෙෂ්ඨද අත්‍යුත්තමද ඒ මේ අත්‍යුත්තම ශීලය යමෙක් රකීද, ඒ රකින්නහු අත්තානුවාදභය පරානුවාදභයාදියෙන් හා සියලු සසරදුකින් මුදු ක්ෂෙම ස්ථානයෙහි තබාද, එහෙයිනි.

ඒ මේ ප්‍රාතිමොක්ෂය, **අවවාදප්‍රාතිමොක්ෂ-ආඥප්‍රාතිමොක්ෂ** වශයෙන්ද, **ශීලප්‍රාතිමොක්ෂ - ග්‍රන්ථප්‍රාතිමොක්ෂ** වශයෙන්ද දෙපරිදි දෙපරිදිවේ.

එහි අවවාදප්‍රාතිමොක්ෂය උදෙසන්නාහු බුදුවරයෝම වෙති. බුද්ධශ්‍රාවකයෝ නොද උදෙසත්. මෙහි විස්තරකථාව මෙම ග්‍රන්ථයෙහි ඇතුළත්ව ඇතිබැවින් ඒ පිළිබඳ කිසිවක් මෙහි නොලියැවුනේය.

මහණ - මෙහෙණන්ගේ දෙස් සහිතවූ කායවාක්සමාචාරයෙහි දසවැදරුම් අනුසස් සලකා ඔවුනට දෙලොව හිතපිණිස මදඅායු ඇති බුදුවරුන්ගේ සසුන්හි පවත්නා 'මෙනම් වරදෙහි මෙනම් ඇවැතැ'යි පැණවූ ආපත්තිවිටි ඇති, මහණ-මෙහෙණන්විසින් අඩමසක් පාසා දෙසියයුතුවූ ඔවුන්ටම සාධාරණවූ ප්‍රාතිමොක්ෂය ආඥප්‍රාතිමොක්ෂ නම්වේ.

'ආදිමෙතං මුඛමෙතං පමුඛමෙතං කුසලානං ධම්මානං තෙන වුච්චති පාතිමොක්ඛං' යනාදිවිසින් දක්වනලද්දේ ශීලප්‍රාතිමොක්ෂයයි. ඒනම් ප්‍රාතිමොක්ෂසංවරශීලයයි.

'උභයානි බො පනස්ස පාතිමොක්ඛානි විත්‍ථාරෙන සාගතානි හොන්ති සුවිභත්තානි'යනුවිසින් ආයේ භික්ෂු - භික්ෂුණීන්ගේවසයෙන් දෙපරිදිවූ ග්‍රන්ථප්‍රාතිමොක්ෂයයි. එහි භික්ෂුග්‍රන්ථප්‍රාතිමොක්ෂය, නිදනුද්දෙස - පාරාජිකුද්දෙස - සඩ්ඝාදිසෙසුද්දෙස - අනියතුද්දෙස - විත්‍ථාරුද්දෙසයන උද්දෙසපසින් බැඳීසිටියේය.

භික්ඛුණීග්‍රන්ථප්‍රාතිමොක්ෂය, නිදානුද්දෙස - පාරාජිකුද්දෙස - සඞ්ඝාදිසෙසුද්දෙස - විත්ථාරුද්දෙසයන උද්දෙස සතරින් ප්‍රමාණවත් කරනලද්දේය එහි අනියතුද්දෙසය නොද යෙදෙන්නේය.

'සුණාතු මෙ භන්තෙ සඞ්ඝා' යනාදීන් දක්වනලද පුබ්බකරණ - පුබ්බකිච්ච - පත්තකාල පිළිබඳ විස්තරවිභාගය ඇතුළත් උද්දෙසය නිදානුද්දෙසයිද, සතරපාරාජිකා ඇතුළත් උද්දෙසය, පාරාජිකුද්දෙසයිද, තෙළෙස්සහවෙසෙස් ඇතුළත් උද්දෙසය, සඞ්ඝාදිසෙසුද්දෙසයි දෙවැදරුම් අනියතයන් ඇතුළත් උද්දෙසය, අනියතුද්දෙසයිද, **'අවසෙසං සුත්තෙන සාවෙතබ්බං'**යනුවිසින් දක්වූ තිස්නිසගි පචිති - දෙයාතුපචිති - පන්සැත්තෑ සෙඛියා - සතර පාටිදෙසනීය - සත් අධිකරණසමථයන මෙතෙක් ශික්ෂාවන්ගෙන් බැඳීසිටි උද්දෙසය විත්ථාරුද්දෙසයිද ව්‍යවස්ථිතය. මෙසේ අඩමසක් පාසා උදෙසියයුතු දෙසියවිස්සක් ශික්ෂා ඇතුළත් ග්‍රන්ථය **භික්ෂුග්‍රන්ථ ප්‍රාතිමොක්ෂය**යි දතයුතුය.

නිදානුද්දෙසය හා සාධාරණ අසාධාරණවිසයෙන් පාරාජිකා අටක් ඇතුළත් පාරාජිකුද්දෙසය, දසසතක් ශික්ෂා ඇතුළත් සඞ්ඝාදිසෙසුද්දෙසය, තිස් නිසගි, එක්සිය සූසැටක් පචිති, අටක් ඛුද්දක, පන් සැත්තෑවක් සෙඛියායන ශික්ෂාපද ඇතුළත් විත්ථාරුද්දෙසයයන සිවුවැදරුම් උද්දෙසයන්ගෙන් ප්‍රමාණකරණලද, සමථයන්ගෙන්ද යුත් තුන්සිය සතරක් ශික්ෂාවන්ගෙන් පිරී සිටියේ, **භික්ෂුණීග්‍රන්ථප්‍රාතිමොක්ෂය**යි සම්මත කරනලද්දේය. භික්ෂුග්‍රන්ථප්‍රාතිමොක්ෂ භික්ෂුණීග්‍රන්ථප්‍රාතිමොක්ෂයන මෙදෙක එකම ග්‍රන්ථප්‍රාතිමොක්ෂ නමින් හඳුන්වනුලැබේ.

විභඞ්ගඃ

පාරාජිකපාළි, පාචිත්තියපාළියන ග්‍රන්ථද්වය **උභයවිභඞ්ගය**යි සම්මතය. ප්‍රාතිමොක්ෂයෙහි ආ ශික්ෂාපද සමූහය බෙද දක්වනබැවින් ඒ ග්‍රන්ථද්වය උභයවිභඞ්ගය නමින් හඳුන්වනුලැබේ. විභඞ්ගනම් ශික්ෂාපද පිළිබඳ විස්තරය බෙද විදහාදක්වීමය. විභඞ්ගයෙහි ඒ ඒ ශික්ෂාපද වත්ථු - නිදන - පුග්ගල - පඤ්ඤත්ති - අනුපඤ්ඤත්ති - ආපත්ති - අනාපත්ති - පදභාජනීය - යන මොවුහු විස්තරකරනලදහ. එහි ප්‍රථමවූ **පාරාජිකපාළිය,** පාරාජික - තෙරසක - අනියත - තිංසකයන ග්‍රන්ථපරිච්ඡේදංශයන්ගෙන් ප්‍රමාණවත් කරණලද්දේය.

විභඞ්ගයෙහි දවිතීය ග්‍රන්ථයවූ **පාචිත්තියපාළිය** භික්ෂු - භික්ෂුණී විභඞ්ගද්වයෙන් හා ඛුද්දක - පාටිදෙසනීය - සෙඛියා - අධිකරණසමථ - පාරාජික - සත්තරසක-නිස්සග්ගිය -ඛුද්දක - පාටිදෙසනීය - සෙඛියා - අධිකරණසමථ යන ග්‍රන්ථාංශ එකොළොසකින් බැඳීසිටියේය.

ඛන්ධක:

මහාවග්ගපාළි, චුල්ලවග්ගපාළි ග්‍රන්ථද්වය ඛන්ධකයි ගැනේ. එහි මහාවග්ගපාළිය, මහාඛන්ධක - උපොසථඛන්ධක - වස්සූපනායිකඛන්ධක - පවාරණඛන්ධක - චම්මඛන්ධක - භෙසජ්ජඛන්ධක - කඨිනඛන්ධක - චීවරඛන්ධක - චම්පෙය්‍යඛන්ධක - කොසම්බකඛන්ධක යන ඛන්ධක දසයකින් බැඳුනේවිය.

ඛන්ධකයෙහි ද්විතීය ග්‍රන්ථයවූ චුල්ලවග්ගපාළිය, කම්මඛන්ධක - පරිවාසඛන්ධක - සමුච්චයඛන්ධක - සමථඛන්ධක - ඛුද්දකවත්ථුඛන්ධක - සෙනාසනඛන්ධක - සඞ්ඝභෙදඛන්ධක - වත්තඛන්ධක - පාතිමොක්ඛඛන්ධක - භික්ඛුණීඛන්ධක - පඤ්චසතිකඛන්ධක - සත්තසතිකඛන්ධකයන ඛන්ධක දෙළොසකින් පිරිගියේය.

පරිවාරපාළිය විනයපිටකයෙහි අවසාන ග්‍රන්ථයයි. එය පඤ්ඤත්තිවාර - කතාපත්තිවාර - විපත්තිවාර - සඞ්ගහවාර - සමුට්ඨානවාර - අධිකරණවාර - සමථවාර - සමුච්චයවාර යන මහාවාර අටකින්ද මේ අටම ප්‍රත්‍යයවශයෙන් ගෙණ ප්‍රත්‍යයවාර අටකින්දැයි ප්‍රධානවාර සොළොසකින් යුක්තවූයේ සමුට්ඨානසීසාදි ප්‍රකරණාංශයන්ගෙන් ප්‍රෂ්ටිමත්ව සිටුනේය. මෙසේ මේ ග්‍රන්ථය සොළොස් පරිවාරයකින් පිරිවරණුබැවින් පරිවාරයයි කියනුලැබේ. විභඞ්ග - ඛන්ධක - පරිවාරයන හෙදයෙන් තුණට බෙදීසිටි පාරාජිකපාළි - පාචිත්තියපාළි - මහාවග්ගපාළි - චුල්ලවග්ගපාළි - පරිවාරපාළියන ග්‍රන්ථ පස සුත්ත නාමයෙන් ගණුලැබේ.

"යං භික්ඛවේ මයා ඉදං න කප්පතීති අප්පටික්ඛිත්තං, තං වේ අකප්පියං අනුලොමේති, කප්පියං පටිබාහති, තං වෝ න කප්පති. යං භික්ඛවේ මයා ඉදං න කප්පතීති අප්පටික්ඛිත්තං, තං වේ කප්පියං අනුලොමේති, අකප්පියං පටිබාහති, තං වෝ න කප්පති, යං භික්ඛවේ මයා ඉදං කප්පතීති අනුඤ්ඤාතං තං වේ අකප්පියං කප්පියං අනුලොමේති, අකප්පියං පටිබාහති, තං වෝ කප්පති. යං භික්ඛවේ මයා ඉදං කප්පතීති අනුඤ්ඤාතං, තං වේ අකප්පියං අනුලොමේති, කප්පියං පටිබාහති, තං වෝ න කප්පති, යං භික්ඛවේ මයා ඉදං කප්පතීති අනුඤ්ඤාතං තං වේ කප්පියං අනුලොමේති, අකප්පියං පටිබාහති, තං වෝ කප්පති'යන මෙසතර මහා ප්‍රදෙශනය, සූත්‍රසඞ්ඛ්‍යාත පාලියට එක්කොට සසඳ අනුලොම්ව ගතයුතුබැවින් සූත්‍රතානුලොමනම්. මෙහි අරුත් විනයවිවෘතියෙහි දකිනුහැකිය.

ධම්සඞ්ග්‍රාහක මහරහතුන් පන්සියයක්දෙනා වහන්සේවිසින් තබනලද ඔක්කන්තික විනිවිඡයවූ අට්ඨකථාපාළිය **ආචරියවාදනම්**. මෙය පාළිමුත්තකවිනයයිද කියනුලැබේ.

සුත්ත - සුත්තානුලොම - ආචරියවාදයන්හි පිහිටාගත් විනයධරයාගේ සිතෙහි පහළවන නයග්‍රාහකඥාව අත්තනොමතිනම්. සූත්‍රාභිධම්විනයාට්ඨකථාවන්හි ඇතුළත්ව සිටුනා සියලු ථෙරවාදය හෝ අත්තනොමතියිද කියනලද්දේය. තවද බුදධභාෂිතය, සුත්තයිද, ශ්‍රාවකභාෂිතය, සුත්තානුලොමයිද, අට්ඨකථාපාළිය ආචරියවාදයිද, ටීකාපාළිය, අත්තනොමතියිද නයග්‍රාහවසයෙන් ගතහැකිවේ.

විනයානිසංසඃ

"සඞ්ඝසුට්ඨුතාය - සඞ්ඝඵාසුතාය - දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය - පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය - දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය - සම්පරායිකානං ආසවානං පටිඝාතාය - අප්පසන්නානං වා පසාදය - පසන්නානං භියොභාවාය - සද්ධම්මට්ඨිතියා - විනයානුග්ගහාය" භාග්‍යවත් සම්මාසම්බුදුරජානන්වහන්සේවිසින් පණවාවදළ මේආනිසංස දසවිධවෙයි. අරුත් ග්‍රන්ථාගතය. විනයපඥාපතියෙහි දක්ෂවූ බුදුගලතෙමේ සසුනෙහි පිළිලද සැදැහැති කුලපුත්‍රයන්ගේ මවුපිය තනතුරෙහි සිටියේවේ. තමන්ගේ ශීලය මොනවට රක්නාලද්දේවේ. සද්ධම්සථිතිය පිණිස පිළිපන්නේවේ. **'පඤ්චිමේ භික්ඛවේ ආනිසංසා විනයධරෙ පුග්ගලෙ'**යනු වදළ එහෙයිනි. තවද **'විනයෝ සංවරත්ථාය, සංවරෝ අවිප්පටිසාරත්ථාය, අවිප්පටිසාරෝ පාමුජ්ජත්ථාය, පාමුජ්ජං පීතත්ථාය, පීති පස්සද්ධත්ථාය, පස්සද්ධි සුඛත්ථාය, සුඛං සමාධත්ථාය, සමාධි යථාභූතඤාණදස්සනත්ථාය, යථාභූතඤාණදස්සනං නිබ්බිදත්ථාය, නිබ්බිදා විරාගත්ථාය, විරාගෝ විමුත්තත්ථාය, විමුත්ති විමුත්ති ඤාණදස්සනත්ථාය, විමුත්තිඤාණදස්සනං අනුපාදපරිනිබ්බානත්ථාය එතදත්ථා කථා, එතදත්ථා මන්තණා, එතදත්ථා උපනිසා, එතදත්ථං සොතාවධානං යදිදං අනුපාද චිත්තස්ස විමොක්ඛෝ'**යි වදළබැවින් විනයපඥාපතියෙහි නැවත නැවත යෙදියයුතුය. බවදුක් තරණය කරණුපිණිස උත්සාහවත් වියයුතුය. මෙතැන්හි අරුත් පොතෙහි ආයේය.

සඞ්ගීතිඃ

සුත්ත නාමයෙන් ගැණෙන පාරාජිකපාළි ආදි ග්‍රන්ථ **පස පඤ්චසතිකා - සත්තසතිකා - සාහස්සිකා**යන සඞ්ගීති තුණෙන් සඞ්ගීත වූයේ දුම්ත බැහැරව ගියේ ශාසනයෙහි චිරස්ථිතියපිණිස පැවැත ආයේ අද ද ඒ පිණිසම පවත්නේය.

එහි ප්‍රථමසඞ්ගීතිය පන්සියයක් මහරහතුන්වහන්සේවියින් කළබැවින් **පඤ්චසතිකා** නමිය. **ථෙරියා** යිද එය පළවිය. මේ සඞ්ගීතිය බුද්ධපරිනිර්වාණයෙන් තෙමසක් ගෙවීගොස් සිවුවනමය පැමිණිකල්හි ඒ සිවුවන මසෙහි රජගහා නුවරදී පවත්වනලදය. බුද්ධපරිනිර්වාණයෙන් සත්වනද සුභද්ද නම් මහලු පැවිද්දහුවියින් කියූ නිඳිත කථාව ද මේ සඞ්ගීතිය පැවැත්වීමෙහිලා එක් කරුණක් විය.

දුතියසඞ්ගීතිය සත්සියයක් මහරහතුන්වහන්සේවියින් කළබැවින් **සත්තසතිකා** නමිය. මේ සඞ්ගීතිය බුද්ධපරිනිර්වාණයෙන් සියවසක් ගෙවීගිය තැන **විඤාලා** මහනුවරදී පවත්වනලදී. අකැප දසවස්තුවක් කැපැයි ඉදිරිපත් කිරීමෙන් වැදෑරට වැසි මහණුන්වියින් උපදවනලද ශාසනාර්බුදය සන්සිඳුවනුපිණිස මේ සඞ්ගීතිය කරණලදී.

තතියසඞ්ගීතිය දහසක් දෙනාවහන්සේවියින් කළබැවින් සාහස්සිකා නමිවිය. මේ සඞ්ගීතියට කරුණුවූයේ ධර්මාශොක අධිරාජයන්ගේ කාලයෙහි ලාභසත්කාරයන්ගෙන් පිරිහුනු අන්‍ය තීර්ථකයෝ තුමූම සිවුරු පෙරවගෙණ 'අපි ශ්‍රමණයම්හ'යි කියා නියම භික්ෂූන්වහන්සේ හා එක්වීම, හැනීගැන්ම, හෙතුවෙන් භික්ෂූන්වහන්සේ පොහෝ පවුරුණු ආදි සඞ්ඝකර්ම නොකොට අත්හැරීමය. එහෙයින් මේ සඞ්ගීතිය බුද්ධපරිනිර්වාණයෙන් දෙසියපන්තිස්වන වසෙහි පැළලුප් නුවරදී සිදුකරණ ලදී.

චතුත්ථසඞ්ගීතිය හෙළදිව සිදුකළ ප්‍රථමසඞ්ගීතියවේ. මෙය චතුර්ත්‍රීවන්නේ දඹදිව සිදුකළ සඞ්ගීතිත්‍රය හා එක්කොට ගිණිමෙනි. **මහාමහින්ද** මහාක්ෂීණාස්‍රවයන්වහන්සේ බුද්ධපරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වසක් ඉක්මගිය පසු දෙසියසතිස් වැන්නෙහි පොසොන් මස පුරපසළොස්වකද මෙහි වැඩමකළසේක. උන්වහන්සේගේ මෙහි වැඩම වීමෙන් අවුරුදු දෙකකට පසු අනුරාධ පුරයෙහිදී මේ සඞ්ගීතිය සිදුකරණලදී.

පොත්ථකසඞ්ගීතිය හේළදිව කළ දෙවන සඞ්ගීතියවේ. බුද්ධපරිනිර්වාණයෙන් පස්වන සියවසතෙක් වාචනාමාර්ගයෙන් ගෙණඇා පුරාණඨ්ඨකථා සහිත සම්පූර්ණ ත්‍රිපිටකපාළිය බුද්ධවර්ෂ හාරසිය හතළිහටත් හාරසිය හතළිස් පහටත් අතර කාලයෙහි මාතුල ජනපදයෙහිදී සිංහල අකුරෙන් පුස්තකාරූඪකොට සඞ්ගායනා කරණලදී.

මෙසේ පස්වරක් මහරහතුන්වහන්සේවියින්ම කරණලද ත්‍රිපිටක සඞ්ගීති පිළිබඳ කථාව සවිස්තරව මෙම ග්‍රන්ථයෙහි ඇතුළත්බැවින් මෙහිලා ඒ පිළිබඳව දක්වූයේ මුඛමාත්‍රයෙකැයි දතයුතුය.

අට්ඨකථා:

ත්‍රිපිටකපාළියෙහි නොපැහැදිලි තැන් පැහැදිලිකරමින් ලියනලද ග්‍රන්ථ, අට්ඨකථායි ගැනේ. ඒ අට්ඨකථා පිළිබඳ දීඝකථාව මෙහි යොදඇති අට්ඨවත් ප්‍රස්තාවනාවෙන් මුළුමනින් දතහැකිබැවින් එහිලාද කිසිවක් මෙහි නොලියැවුණේය. ඒ දන්නට ප්‍රස්තාවනාව කියවා බැලියයුතුය.

සමන්තපාසාදිකාව:

දඹදිවෙන් මෙහි වැඩම කළ මහාප්‍රාඥ බුද්ධඝොෂ මහාස්ථවිරයන් වහන්සේ **මහාඅට්ඨකථා - මහාපච්චරී - කුරුන්දී - අන්ධක - සඞ්ඛ - පට්ඨකථා** යන අට්ඨකථාවන් මෙහි හෙළදිව් වැසි විනයධර මහතෙරුන් වහන්සේගෙන් උගෙණ තමන් උගත් ඒ අට්ඨකථා නැවත නැවත කියවා බලා ඒ අට්ඨකථා ඇසුරුකොට ඒ අට්ඨකථාවන්හි එන කරුණු එකෙකින් හා සසඳ මහාඅට්ඨකථාව පිහිටකොටගෙණ එහි පිහිටාසිට මහානාම (සිරිනිවාස) රජුගේ විසිවන රාජ්‍යවර්ෂයෙහි ලියන්නට පටන්ගෙණ අවුරුද්දක් තුළදී මෙය ලියා අවසන්කළහ. මෙයට සමන්තපාසාදිකායන අට්ඨවත්නමද තැබුහ. සමන්තපාසාදිකා කරණප්‍රකාරය හා තදට්ඨිනිරූපණයද කළහ. ඒ මෙසේය:

'තත්‍රිදං සමන්තපාසාදිකාය සමන්තපාසාදිකත්තසම්භ:

ආචරියපරම්පරතෝ - නිදානවත්ථුප්පභෙදදීපනතෝ,
පරසමයවිවජ්ජනතෝ - සකසමයවිසුද්ධිතෝ චෙව

ව්‍යඤ්ජනපරිසොධනතෝ - පදත්ථතෝ පාළියොජනක්කමතෝ,
සික්ඛාපදනිච්ඡයතෝ - විභඞ්ගනයභෙදදස්සනතෝ.

සම්පස්සතං න දිස්සති - කිඤ්චි අපාසාදිකං යතෝ එත්ථ,
විඤ්ඤූනමයං තස්මා - සමන්තපාසාදිකාතෙවච

සංවණ්ණනා පවත්තා - විනයස්ස වෙනෙය්‍යදමනකුසලෙන,
වුත්තස්ස ලොකනාථෙන - ලොකමනුකම්පමානෙනාති'

මේ ගාථාවන්හි අරුත් විනයවිභංගයෙහි ආ බැවින් නැවත මෙහි නොදක්වීමි.

ටීකාචාර්‍යයෝ **'සමන්තතෝ සබ්බසෝ පසාදං ජනෙතීති සමන්තපාසාදිකා'**යි මෙහි අට්ඨ සමර්ථනය කළහ, හැමතින් සියලු අයුරින් ප්‍රසාදය උපදවා යනු එහි අරුත්ය. මෙසේ මෙහි ටීකාචාර්‍යයන් අරුත් දක්වනලද්දේද,

'සංවණ්ණනා සිහළදීපකෙන
වාක්‍යෙන එසා පන සඞ්ඛත්‍තා,
න කිඤ්චි අත්‍ථං අභිසම්භුනාති
දීපත්තරෙ භික්ඛු ජනස්ස යස්මා'

යන මෙයින් බුද්ධඝොෂාචාර්‍යපාදයෝ **'සාමන්තෙ පසාදෙති'**යන අත්‍ථසමත්‍ථනයෙහි පිහිටා මෙ නම තැබූහයි ගැණීමට ඉඩඇත්තේ නොවේදැයි සිතාබැලියයුතුය. සාමන්ත නම් දීපන්තර වාසීහුය. අසල් රටවැසියෝය. ඔවුනට හෙළටුවාවන්ගෙන් වැඩක් නොවන බැවින් එකල සාර්‍ථජනීනවූ පාලිභාෂාවෙන් කරන්නෙමියි උන්වහන්සේ ම මෙයින් කියා පෑහ. **'සාමන්ත ඉති සඞ්විඡයානන්තරා භූමිඃ, සාමන්තවාසිනඞ්ච'**යනු කොෂාගතය. සාමන්තයන්නෙහි ආද්‍යක්ෂරයාගේ හ්‍රස්වත්වයෙන් 'සමන්තපාසාදිකා'යනු වියහැකි නොවේදැයිද සලකාබැලියයුතුසේ පෙණේ.

විසිහත් දහසකට මදක් වැඩි ග්‍රන්ථයන්ගෙන් සමන්තපාසාදිකා නම් විනයසංවර්ණනාව ලියා අවසන් කරණලද යි

'සමට්ඨ සත්තවීසති - සහස්සමත්තෙන තස්ස ගන්ථෙන
සංවණ්ණනා සමත්තා - සමන්තපාසාදිකා නාම'

යන මෙයින් කියනලද්දේය. ග්‍රන්ථයක් අකුරු දෙතිසකින් ප්‍රමාණවත් කරණලදය.

විනයවිවෘතිඃ

සමන්තපාසාදිකානම් පාල්‍යන්ථකථාව විනයවිවෘති නමින් සිංහලට නගනලද්දී පාලිභාෂාව ගැන වැඩි දැනීමක් නැති ගෘහසථ ප්‍රව්‍රජිත හිතෛෂීන්ගේ ප්‍රයොජනය සලකාගෙණය. උගතුන්පිණිසම නොවේ. එහෙත් ඔවුන් වෙතද මේ සිංහල පරිවර්තනය කොතරම් දුරට සාර්‍ථක වේදයි කියනු ධර්මවිනයධර උගතුන් අතේ පවතී.

විනයග්‍රන්ථයක් පෙළබසින් අන් බසකට පෙරළීම ලෙහෙසි පහසු කාර්‍යයක් නොවේයයනු උගතුන්ගේ පිළිගැණීමය. පෙළබසෙහි එන ඇතැම් නාමපදයන්හි නියම අරුත දීමට හෙළවදන්පද කිහිපයක් යොදන්නට සිදුවන්නේය. එසේ යෙදූකල්හි ඇතැම්විට පෙළවදනින් අදහස්කළ අරුත වැසීගොස් අන් අරුතක් මතුවීමට ඉඩනැත්තේ නොවේ. එයින් නියම අරුත වැසීගොස් අන් අරුතක් මතුව ආයේ නම් එය මහත් අපරාධයක් වන්නේය. එහෙයින් මම එබඳුතන්හි ඉතා පරීක්ෂාකාරීවීමි. බැහැරින් අමුතු වදන්පද එක්නොකොටම පෙළෙහි ආ පදයන්ට නිසිඅරුත් එක්ම පදයකින් දක්වා මෙම පෙරැළිය කෙළෙමි.

ඇතැම් තැන ටීකාවන්හි ආ ලෙසින් ඒ ඒ වචන, ඒ ඒ පද සිංහලට නගා ලියනලද්දේය. එය මෙය පරිශීලනය කරන්නහුගේ සිත් ගණිදැයි කියනුනොහැකිය.

ආශ්‍රිත ග්‍රන්ථ:

වජිරබුද්ධිටීකා, සාරත්ථදීපනීටීකා, විමතිවිනොදනීටීකා, පාළි මුත්තකවිනයවිනිච්ඡය, විනයවිනිච්ඡය, බුද්ධසික්ඛා, විසුද්ධිමග්ගටීකා, විශුද්ධිමාර්ගසන්නය, සිඛාවළඳවිනිස, කඞ්ඛාවිතරණීය, කඞ්ඛාවිතරණීපිටපොත, විනයත්ථසමුච්චය (පුස්කොළපොත) **වනවිනිස,විනයඟැටපදය, විනයකොෂයයන** ග්‍රන්ථ මෙහිලා මාවිසින් ආශ්‍රිතය.

සමන්තපාසාදිකාව හෙළබසට නැඟීමට මා අදහස්කොට සිටුනාබව දැන එය කළයුත්තක්මයයි වඩාලාත් මා එහි උත්සාහවත්කළ ශ්‍රෙෂ්ඨයන් අතුරෙහි ශ්‍රී ලඞ්කා විද්‍යාලඞ්කාර විශ්වවිද්‍යාලයයෙහි සම්මාන උපකුලපතිව වැඩවිසූ රාජකීයපණ්ඩිත **කිරිවත්තුඩුවේ සිරි පඤ්ඤාසාර** නායකමහාස්ථවිර, ශාස්ත්‍රාචාර්ය්‍ය **ගෝනාපීතුවල පුඤ්ඤසාර** නායකමහාසථවිර, රාජකීයපණ්ඩිත **අම්බලම්ගොඩ පඤ්ඤවංස** නායකමහාසථවිර, රාජකීයපණ්ඩිත **ඉඳුරුවේ උත්තරානන්ද** නායකමහාසථවිර, රාජකීයපණ්ඩිත **අකුරැටියේ අමරවංස** නායකමහාසථවිර, රාජකීයපණ්ඩිත **මොරටුවේ සාසනරතන** මහාසථවිර, රාජකීයපණ්ඩිත **ගණේගම සරණඞ්කර** නායකමහාසථවිර, රාජකීයපණ්ඩිත **වැලිගම සීලානන්ද** නායක මහාසථවිරයන ශ්‍රෙෂ්ඨයෝ ප්‍රධානවෙති.

ප්‍රස්තාවනාව

මෙහි එන ප්‍රස්තාවනාව ලියුවෝ අප අමරපුරනිකායයෙහි මහා නායකධුරන්ධර වහා කෝට්ටගොඩ ඤාණවිමලමහාවිහාරයෙහි හා තත්ත්‍ය සෞගතොදයවිද්‍යාලයෙහි අධිපතිව වැඩවිසූ අතිගරු **රාජකීයපණ්ඩිත ශාස්ත්‍රාචාර්ය්‍ය වන්ද්‍රකීර්තිශ්‍රී කහඳමෝදර පියරතනාභිධාන මහා සාමින්ද්‍රයන්වහන්සේය.**

උන්වහන්සේ මේ සඳහා මා කළ ආරාධනය ඉතසිතින් පිළිගෙණ ලියූ තත්ත්වපූර්ණවූ අර්ථවත් ඒ දීර්ඝප්‍රස්තාවනාවෙන් මේ සංඥපනය ලිවීමෙහිදී මාඅතට එන්නටතුබූ මහත් බරක් නැතුව ගියේය. මට මෙහිලා එය මහත් පහසුවක්විය. නැත, විනයාර්ථකථා පිළිබඳ දීර්ඝ විස්තරකථාවක් මාවිසින් ලියයුතු වන්නීය. විනයාර්ථකථා පිළිබඳ කියයුතු හැමකරුණු ඇතුළත්කොට ලියනලද ඒ දීර්ඝප්‍රස්තාවනාව විනයාර්ථඥීන්ගේ මනදෙළ පුරණුඑකාන්තය.

මේ ග්‍රන්ථපරිවර්තනයෙහිදී අපගේ ඥාතිපුත්‍ර ශිෂ්‍යවූ රත්මලානේ සඛ්ඛිමාලී විහාරාධිපතිව සිටුනා ශාස්ත්‍රාචාර්‍ය්‍ය **අම්බලම්ගොඩ සුමඩගල** සංවිරතැනද අපගේ ධර්මාන්තෙවාසිකවූ ශාස්ත්‍රාචාර්‍ය්‍ය **වරදිවෙල ධම්මාරාම** භික්ෂුනම හා මෙහි උපාචාර්‍ය්‍යවසිටි **පොල්වත්තේ වංසික** භික්ෂුනම මෙහි පිටපත් ලියාදීමෙහි යෙදුනෝය.

කිරම පුඤ්ඤරතන, දෙඩන්දූවේ සිරිකර, කුලීගොඩ රතනවංස, පල්ලේමලල පියධම්ම යන පැවිදි ශිෂ්‍යයෝ මෙහි ශොධ්‍යපත්‍ර කියවා බැලූහ. මේ ශිෂ්‍යනමලාද ඉදිරියෙහි ශාසනික ප්‍රතිපත්තියෙන් හා ධර්මවිනයඥනයෙන් දියුණුවනු දැක්මෙහි ආශා ඇත්තෙමි ඒපිණිස තෙරුවන්සරණ ලැබේවායනු ආශංසාය.

ප්‍රව්‍රජ්‍යාචාර්‍ය්‍යානුස්මෘතිඃ

අම්බලම්ගොඩ **සුනන්දාරාම මහාවිහාරය,** නින්දනේ **අභිනවාරාම විහාරය**යන උභයවිහාරයන්හි අධිපතිව ලොකශාසනාභිවෘද්ධියෙහි නිරතව වැඩවූසු අතිගරු ගණාචාර්‍ය්‍ය **ශ්‍රී ඉන්දජෝත්‍යාභිධාන මහා සඞ්ඝාමාත්‍යයන්වහන්සේ** මා පැවිදිකොට ශාසනාවවරයකු, ධර්මවිනයයෙහි ශික්ෂිතයකුකොට සසුන් සිරිතින් මා වැඩූහ. ඒ පිණිස උන්වහන්සේ වේවැල්කෝටු අතට නොගත්හ. එහෙයින් උන්වහන්සේ වැඩිද නොඉක්මවා නිවන්රස විඳින්වායි දිවාරෑ පින්දෙමි.

ධර්මාචාර්‍ය්‍යානුස්මෘතිඃ

පානදුරේ සෞගත විද්‍යාලයාධිපතිව වැඩවිසූ අතිගරු **පානදුරේ සිරි සුමඞ්ගලතිස්සාභිධාන** නායක මහා සඞ්ඝාමාත්‍යයන්වහන්සේ, එහි උපප්‍රධානවූ අතිගරු **කරගම්පිටියේ ජොතිරත්නනාභිධාන** නායක මහා සඞ්ඝාමාත්‍යයන්වහන්සේ, කොළඹ විද්‍යෝදය පරිවෙණාධිපතිව වැඩවිසූ අතිගරු **කහවේ සිරි රතනසාරාභිධාන** නායක මහා සඞ්ඝාමාත්‍යයන්වහන්සේයන විඳුත් ප්‍රශස්ත මහනීය ගුණයුත් විවක්ෂණ මහොත්තමයෝ මාගේ ධර්මාචාර්‍ය්‍යවරයෝය. මුත්වහන්සේ මා ධර්මවිනයයෙහි හා පාලි සිංහල සංස්කෘත ප්‍රාකෘත භාෂාවන්හි හා තදීය තර්ක ව්‍යාකරණ ඡන්දෝලඞ්කාරාදි ශාස්ත්‍රාන්තරයන්හිද මැනවින් හික්මවාලූබැවින්ම මට මෙසේ ග්‍රන්ථකරණයෙහිද සාමර්ථ්‍යය යන්තමකින් ලැබුනේය. කරුණු මෙසේබැවින් ග්‍රන්ථකරණයෙන් හා අන්ලෙසිනුත් මා කළ මා කරන පින් උන්වහන්සේට පමුණුවමින් උන්වහන්සේ වහාම බවදුක් නසා නිවන්සුව අත්පත්කෙරෙත්වා යනු මාගේ ආයාචී ප්‍රාර්ථනාය.

පුණ්‍යානුමෝදනාඃ

මවුපියදෙපොල ප්‍රධානකොට ඇති මාගේ සහෝදර සහෝදරියෝ, ශාස්ත්‍රාධාර සභාවේ මෙලොව දිවි ගෙවාගිය ආදිම සාමාජිකයෝ, ඉඩකඩම් ගැණීමෙන් ආවාසමන්දිර තැනවීමෙන් පිරිවෙන්ශාලා ගොඩනැංවීමෙන් පැන් පොකුණු තැනවීමෙන් පුස්තකාලය ඉදිකරවීමෙන් විදුලිඵලිය සැපයීමෙන් වැසිකිළි කැසිකිළි පිළියෙලකිරීමෙන් පිරිවෙණ නගාසිටුවීමට හැමතින් ක්‍රියාකළ දයකදයිකාවෝ, පිරිවෙණෙහි ගුරු-ශිෂ්‍ය දෙපක්ෂය රැකබලාගෙණ දනමානාදියෙන් සඩ්ග්‍රහකරන ශාස්ත්‍රාධාර සභාවේ වර්තමාන සාමාජික-සාමාජිකාවෝ, අම්බලම්ගොඩ නගරවැසි සෙසු දයක - දයිකාවෝ, ශාස්ත්‍රෝදය ගෘහසථ ආදිශිෂ්‍ය සඩ්ගමයේ සභාපති මහතා ඇතුළු සාමාජිකයෝ, පිරිවෙණට හිතවත්වූ මහාසථවිරයන් වහන්සේ, මාගේ සහෝදර සහෝදරියන්ගේ දූ පුත්හු යන හැමදෙන මා කළ පින් අනුමෝදන්ව සසර වසනතුරු සුඛිත මුදිතවූවෝ වහා නිවන්සුව විඳිත්වායි පින් පමුණුවමි.

අවසානයඃ

මෙහි යම් දෙසක් අඩුබවක් වේනම් එයට වගකියයුතු මාවිසින්මය. මාගේ නොදැනීමෙන් හා අනවධානතාවෙන් සිදුවූ දෙස් අඩුපාඩු මෙහි නොවියහැකි නොවේ. වියහැකිමය. එතන්හි විනයඥවූ සුධීන්ගේ අනුකමපාව මාපිට එනුඇතැයි සිතමි. ආයුතුමය. එතන්හි ලැබෙන යම් පරිහාෂණයෙක් වේ නම් එය මටත්, උත්සාහයෙහි ඵලවශයෙන් නැගෙන යම් සතුතිවචනයක්වේ නම් එය මාගේ ගුරුහුමීන්ටත් අයත්විය යුතුබව අවසාන වශයෙන් කියාසිටිමි.

'කසසවවයා න විජජනති කසස නතථි අපාගතං,
කො න සමෙමාහ මාපාදි කො වා ධීරො සද සතතො,

තසමා හි ඡනදගමනං නපපසංසනති පණඩිතා,
අදුටඨචිතතෙතා හාසෙයය ගිරං සාධු පසංසිතං'

මේ වගට-විනයාර්ථී,

අම්බලම්ගොඩ ධම්මකුසල
මහානායක මහාසථවිර

ප්‍රස්තාවනා (පළමු මුද්‍රණය)

විනයවිවෘති

ශ්‍රීඝණසුගතතථාගත සම්මාසම්බුදුරජාණන්වහන්සේ විසින් සදෙවකලොකයාගේ ඓහලෞකික පාරලෞකික හිතාහිතීයපිණිස දෙශනාකොට වදළ ත්‍රිපිටකසද්ධර්ම්ය තත්පරිනිර්ව්‍රාණයෙන් දැනට අවුරුදු දෙදහස් පන්සියයකටත් වැඩිකලක් ගතවූයේද එද බුදුරජාණන්වහන්සේ දෙසූ සැටියෙන්ම අදත් එක අකුරකුදු වෙනස් නොවී නිරුපද්‍රැතව පවත්නේය. ශාස්තෘවරයාගේ භාෂිතය ඒ සා දිගුකලක් කිසිදු වෙනසක් නැතිව ඒ භාෂාවෙන්ම පවත්නා අන්කිසි ආගමක්ගැන නිදර්ශනකළ නොහැක. මෙහි ආශ්චර්‍යීය තවත් වැඩිවනුයේ බුදුරජාණන්වහන්සේ ධර්ම්දෙශනා කළ භාෂාව ජනභාෂාව කොටඇති ජනතාවක් පසුකලෙක නැතිව ගොස් තිබියදී උන්වහන්සේගේ ජන්මභූමියෙන්ම ත්‍රිපිටකධර්ම්යත් එය දෙශනාකළ භාෂාවත් අතුරුදහන්වයද්දී, බුද්ධධර්ම්ය නිරුපද්‍රැතව මෙතෙක්කල් පැවැත්තේ කෙසේදයනු සලකා බැලීමෙන්ය. ඒ එසේමය.

බුදුරජාණන්වහන්සේ කථාකළ භාෂාවවූ මාගධීප්‍රාකෘතය බුදුවසින් තෙවැනි සියවසතෙක් හෙවත් තුන්වන සංගායනාවතෙක් යෙහෙන් පැවැතවිත් ඉන්පසු එය ක්‍රමයෙන් දඹදිව ඒ ඒ දේශවල දේශීය ප්‍රාකෘත භාෂාබවට වෙනස්වෙමින් පැතිරීගියේය. ප්‍රථම සංගායනාවෙහි ත්‍රිපිටකය සංගීතවූ ශුද්ධමාගධිය (දැන් අප පාළියයි කියනභාෂාව) ථෙරවාදීන්ගේ ආගමිකභාෂාවබවට පැමිණ ත්‍රිපිටකයෙහිම රැඳීගියේය. ථෙරවාදයෙන් බිඳීගිය මහායානිකයෝ බුද්ධධර්ම්ය සංස්කෘතයට පෙරලා ගත්හ. මෙසෙයින් ශුද්ධමාගධී සඞ්ඛ්‍යාත පාළිභාෂාව බුද්ධජන්මභූමියෙන් අතුරුදහන්වූවාය. පාළිභාෂාව එසේ අභාවයටයත්ම පාළිත්‍රිපිටකයද ඉන්දියාවෙන් ඉවත්විය.

පාළිභාෂාවත් පාළියෙන් දෙසූ තෙවළාදහමත් බුද්ධජන්මභූමියෙන් ඉවත්වගොස් තිබියදී ඒ දෙකම අවුරුදු දහස්ගණනක් ලොකයේ වෙන රටක හෝ යෙහෙන් පැවැත ඊමේ හාස්කම කෙසේ සිදුවීදැයි සෙවිය

යුතුය. මේ හාස්කම කරනලද්දේ **මහාකාශ්‍යප** මහරහතන්වහන්සේවිසින්ය. උන්වහන්සේ මතුනොවෙති. **අනුරුද්ධ, ආනන්ද, උපාලි** ආදි පන්සියයක් මහරහතන්වහන්සේලාද ඊට සහභාගීවූහ. සම්බුද්ධපරිනිර්වාණයෙන් යම්තම් තුන්මසක් ගෙවුණුපසු රජගහනුවර **සප්තපර්ණිගුහාවෙහි** කළ ඒ ප්‍රථමසංගීතිය එසේ සිදුනොවීනම් බුදුරදුන් දෙසූ ත්‍රිපිටකධර්ම එකඅකුරක්වත් අඩුපාඩුවක්නැතිව ඒවූ පරිද්දෙන්ම මේතාක්කලක් බෞද්ධලෝකයාට අයත් නොවන්නට ඉඩතිබුණි.

එහිදී මහාකාශ්‍යප මහරහතන්වහන්සේ ප්‍රමුඛ ඒ සඞ්ඝසභාව බුදුරජාණන්වහන්සේ දෙසූතාක් ධර්ම එක්තැන්කොට එකට ගණසජ්ඣායනාකොට කටපාඩමෙන් ධරා පිටකවශයෙන් බෙදා, ඒ මතුදනොව මතුමත්තෙහිත් එය නොනැසී පවත්වා ගෙනයෑමට ත්‍රිපිටකයේ ඒ ඒ කොටස් ඒ ඒ ඇත්තන්ට බාරදී මුළුබුද්ධවචනයම සිත්හි ලියා තබාගත්තාය. බුදුදහමෙහි චිරස්ථිතියපිණිස සථාපිතවූ මේ මූල්ගල කෙතරම් ශක්තිමත් වීදයත්, එද සඞ්ගීතවූ ත්‍රිපිටකධර්ම අකුරකුදු නොසෙල්වී අදවනතුරුත් එකසේ පවත්නේය. මෙබඳුසිද්ධියක් ලොව අන්කවර ආගමකවත් දකින්නට නැත.

බුදුදහමෙහි පවත්නා මේ අසහාය අසාමාන්‍ය අච්ඡරියබ්භුතසිද්ධියට තුඩුදුන් කරුණගැනද යමක් කිවයුතුය. එය **සුභද්දනම්** බුඩ්ඪපබ්බජිතභික්ෂුවගේ දුෂ්ටවචනය බව පොතපතෙහි ප්‍රකටව සඳහන්වෙයි. බුදුරදුන් පිරිනිවී සත්දිනක් ගියකල්හි මේ සුභද්ද භික්ෂුව සම්බුද්ධවියොගයෙන් හඩනවැලපෙන භික්ෂූන් අමතා "ඇවැත්නි! කම් නැත, නොහඬවු, ශොක නොකරවු, දැන් අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මිදුනෙමු, මෙය කැපය, මෙය අකැපයයි කියමින් පැනවූ නීතිරීතිවලින් අපි පෙළුනෝ වෙමු, දැන් අපට කැමැතිදෙයක් කළහැකිය"යි කී දුෂ්ටවචනය කනවැකුණු මහාකාශ්‍යප මහරහතන්වහන්සේ ශාස්තෘන්වහන්සේ පිරිනිවී දින කීපයක් ගතවන්ටත් මත්තෙන් බුද්ධශ්‍රාවක භික්ෂූහු මෙසේ කියත්නම් අනාගතයෙහි ධර්මවිනයට කුමක් වියහැකිදයි මහත්සේ ධර්මසංවේගයට පැමිණ බුද්ධ භාෂිතය එක්තැන්කොට තැබීමේ වැදගත්කම අවබොධකොටගෙන ප්‍රථමධර්මසංගායනාව කළබව සඳහන්වෙයි.

සංගායනාවේ මූලික හෙතුව මෙයම නම් "සියල්ලම සිදුවන්නේ යහපතටය"යි කීවාක් මෙන් සුභද්ද භික්ෂුවගේ ප්‍රකාශයෙනුදු යහපතක් සිදුවී තිබේයයි කිවයුතුය. එය නම් බුද්ධධර්ය අවුරුදු පන්දහසක් කල්පැවැතීමේ මූල්ගල මහුගේ ප්‍රකාශයනිසා පිහිටුවීමයි. එහෙත් එය

ඔහු නොසිතා හෝ නොදන කළදෙයක් වියයුතුය. ඔහුට එහි සම්පූර්ණ ගෞරවය නොදියහැක්කේ මීට අමතරව තවත් හේතුවක් එහි පැවතිබව සැලකීමෙනි.

බුදුරදුන් දෙසූ ධර්මය හා විනය එකවරම එක දවසකදී නොදෙසූ බවත් විකෙන්ටික වැඩෙමින්ගොස් ත්‍රිපිටකධර්මය ගොඩනැගුණුබවත් අපි දනිමු. **ධම්මචක්කප්පවත්තන සූත්‍රය** පටන් **මහාපරිනිර්වාණ සූත්‍රය** දක්වා දේශනාකළ සූත්‍රපිටකයට අයත් ධර්මස්කන්ධය එක් එක් අවස්ථාවල දෙශනාකළබැවින් කෙමෙන් වැඩෙමින් ආවේය. බුද්ධත්වයෙන් මුල් විසිවසතුළ පැනවූ එකම ශික්ෂාපදයක්වත් නැතිබැවින් ඒ කාලයතුළ විනයපිටකයක් විද්‍යාමාන නොවූබව සිතියයුතුය. විනයපිටකය ආරම්භවූයේත් එය සම්පූර්ණවූයේත් ඊළඟ පස්විසි වසතුළය. මාතෘදිව්‍යරාජයා ප්‍රමුඛ දෙවසමූහයාට තවිතිසා දෙවිලොවදී අභිධර්මය දේශනාකළේ බුද්ධත්වයෙන් සත්වෙනි වසෙහිය. ඊට පෙර අභිධර්මය ගැන කථාවක් නැත. බුදුවීමෙන් සිවුවෙනි සතියෙහි බුදුරජාණන්වහන්සේ අභිධර්මපිටකයට අයත් සමන්තපට්ඨානය මෙනෙහිකළබව කියවේ. එහෙත් එය යම් කිසිවෙකුට දෙසූ දහමක් නොවේ. මනසිකාරමාත්‍රයකි. මෙයින් පෙනෙනුයේ ත්‍රිපිටකධර්මය අනුක්‍රමයෙන් වැඩෙමින් ආබවය.

මෙසේ වැවුණු ත්‍රිපිටකධර්මයේ ඒ ඒ කොටස් බුදුරදුන් ජීවමානව වැඩසිටියදීම යම් යම් රහතන්වහන්සේලා විසින් කටපාඩමින් ධරාගෙන ආබව සිතියයුතුය. එසේම බුද්ධකාලයේ අක්ෂර ශාස්ත්‍රයත් ලිපි ශාස්ත්‍රයත් ඉතා දියුණු තත්ත්වයක පැවැත්තේයයි ඉතිහාසයෙනුත් ශාසනප්‍රවෘත්තීන්ගෙනුත් පෙනෙනබැවිනුත් එසේ දෙශනාකළ ධර්මය කිසිම පොතක හෝ පතක ලියා නොගතයුතුයයි තහනමක් නැතිබැවිනුත් ධර්මයේ යම්යම් කොටස් පොතපතෙහි ලියාගෙන තිබෙන්ට ඇතැයිද සැලකීම යොගය්‍යය.

මෙසේ කටින්කට හා අතින්අත කොටස්වසයෙන් පැවතඅා ධර්මවිනය බුද්ධපරිනිර්වාණයෙන් පසු එක්තැන්කර තැබීමේ ආවශ්‍යකත්වය එකල සිටි මහරහතන්වහන්සේලාට වැටහී තුබුබව සිතිය හැකිය. පරිනිර්වාණයෙන් පසු භික්ෂුසඞ්ඝයාගේ නායකත්වය පැවරුනේ **මහාකාශ්‍යප** මහරහතන්වහන්සේටය. **අනුරුද්ධ, ආනන්ද, උපාලි** හිමිවරුන් සමග උන්වහන්සේ මේ කටයුත්ත බුදුරදුන්ගේ ආදහණපූජොත්සවය නිමවා නිෂ්කලඞ්කව විවෙකව සිදුකිරීමට සිතාගෙන සිටිබවට සැකයක් නැත.

නමුත් සුභද්දගේ දුෂ්ටවචනය ඇසූ මහසුප් මහරහතන්වහන්සේගේ ගේ හිස්මොලය රත්විය. ශාස්තෘන්වහන්සේ පිරිනිවන්පා ආදහණයවත්

කරන්නට මත්තෙන් බුද්ධශ්‍රාවකභික්ෂූහු මෙසේ කියත්නම් දැන් ඉතින් මොහොතක්වත් බලා සිටීම සුදුසුනැතැයි උන්වහන්සේට කල්පනාවන්ට ඇත. එහෙයින් ආදහණ පූජාව නිමවා ලහිලහියේ ත්‍රිපිටකධර්මය එක්තැන් කරනැබීමට උන්වහන්සේ උත්සුකවූහ. මෙයින් පෙනෙනුයේ මහාකාශ්‍යපාදි රහතන්වහන්සේලා නිෂ්කලඞ්කව විවෙකව කරන්ට අදහස්කොට සිටි කටයුත්ත සුභද්‍රගේ වචනය නිසා ඉක්මන්වූබවය. ශාසනභාරය දරාසිටි උන්වහන්සේලා එබඳු දෙයක් ගැන නොසිතා ශාසනයේ චිරස්ථිතිය ගැන නොබලා වගකීමේ කල්පනාවක් නැතිව නිකම්ම සිටියාහුයයිද සුභද්‍රගේ වචනයෙන් පමණක් උනන්දු වූවාහුයයිද සිතීම වැරදිය. සුභද්‍රගේ ප්‍රකාශයෙන්වී තිබෙන්නේ උන්වහන්සේලා යුහුසුළුවීමය. එහෙයින් සුභද්‍රගේ දුෂ්ටවචනය පමණක් ප්‍රථමසඞ්ගීතියට නිදනවූ බව සිතිය නොහැකිය.

මෙසේ බුද්ධපරිනිර්වාණයෙන් තුන්මසකදී එක්තැන් කළ ත්‍රිපිටකය ධර්මය එතැන් සිට සියක් අවුරුද්දක් වනතුරු වෙනසක් නැතිව යෙහෙන් පැවතිබව මුත් මෙදතුර සිදුවූ ශාසනික සිදුවි මොනවාද? ආරාම, විහාර, පන්සල් කෙසේ පැවතුනේද? වාචනාමාර්ගය රැකගෙන ආවෝ කවරහුද? යනාදි විස්තරයක් කිරීමට ශාසනඉතිහාසය මැලිවෙයි. පළමුවෙනි දෙවෙනි සඞ්ගායනා අතර කාලයතුළ **අජාසත්** රජු පටන් තත්පුත්‍ර **උදයිභද්‍ර** ආදි රජවරුන්ගේ පරම්පරාවේත් උපාලි හිමියන්ගේ පටන් තත් සද්ධිවිහාරිකදසකාදි විනයාචාර්‍ය තෙරුවරුන්ගේ පරම්පරාවේත් නම් ලැයිස්තුව දක්වීම හැර අන්කිසි ශාසනික තොරතුරක් දක්වීම සම්බන්ධයෙන් ඉතිහාසය නිහඬය.

කෙසේ හෝ බුදුවසින් සියක්වෙනි වසෙහි වෙනසක්විය. එය නම් වෛශාලියෙහි වජ්ජීපුත්‍රකභික්ෂූහු විනයපිටකයෙහි අකැපයයි දක්වූ කරුණු දසයක් කැපයයි ප්‍රකාශකිරීමෙන්වූ අවුලයි. **'කප්පති සිඞ්ගිලොණකප්පෝ, කප්පති ඬඞ්ගුලකප්පෝ'** යනාදීන් ඔවුන් කැපයයි ඉදිරිපත්කළ දශවස්තුව විභාග කළ **සබ්බකාමී, යස, රේවත, සම්භූතාදී** මහාස්ථවිර ප්‍රමුඛ විනිශ්චය කාරකසඞ්ඝසභාව ඒ කරුණු දසයම විනයවිරෝධියයි තීරණය කළාය. නමුත් වජ්ජීපුත්‍රකභික්ෂූහු ඒ තීරණය නොපිළිගත්තාහුය. ඔවුන්ගේ පක්ෂයට දසදහසකටත් අධික වූ ප්‍රබල භික්ෂුපිරිසක් සිටියාය. රාජානුග්‍රහයද පළමුකොට ඔවුන්ට ලැබීතිබුණි. නමුත් පසුව වජ්ජීපුත්‍රකභික්ෂූන්ගේ මතය සාවද්‍යබව වටහාගත් **කාලාශොකරජුගේ** අනුග්‍රහයද ලැබ සබ්බකාමීස්ථවිර ප්‍රමුඛ සත්සියයක් රහතන්වහන්සේලා විශාලා මහනුවර **වාළුකාරාමයේදී** දෙවෙනි සඞ්ගායනාවකොට නිර්මල බුද්ධධර්මය ආරක්ෂාකොටගත්හ.

ඊට පටහැනිව සිටි වජ්ජිපුත්තකභික්ෂූහු අන් පලාතකට ගොස් **මහාසඞ්ගීති** නමිවූ සඞ්ගායනාවක් කොට ථෙරියවංසයෙන් හිනනව වෙනම නිකායක්වූහ. ඒ නිකායට බැඳුණු භික්ෂුපිරිසද සුළුපටු නැත. ගණනින් ඔවුහු දසදහසක්වූහ. මෙය වනාහි බුද්ධශාසනයෙහි ඇතිවූ පළමුවන නිකායභෙදයයි. ඊට හෙතුවූයේ විනය පිළිබඳ මතභෙදයකි.

කවදත් භික්ෂූන්ගේ නිකායභෙදයන්ට මුල්ව පවත්නේ විනය පිළිබඳව නැගෙන මතභෙදයි. ථෙරවාදී භික්ෂූන් අතර නිකායරාශියක් ඇතිවීමට හෙතුවී තිබෙන්නේ විනය පිළිබඳ කරුණු ගැන දක්වන අදහස්වල ගැටීමය. එකිනෙකට වෙනස්වීමය. නිර්‍ණය, කර්‍ම්ය, පුනරුත්පත්තිය, මද්ධ්‍යමප්‍රතිපදව, කුශලාකුශලවිභාගය යනාදීවූ ධර්‍ම්ය පිළිබඳ කරුණු උඩ හිනනවගිය නිකායක් නැත. මේ තත්ත්වය එදමෙන්ම අදත් එකසේය. **සථවිරවාදී බුද්ධධර්‍ම්ය පවත්නා ලංකාව, බුරුමය, සියම** ආදි රටවල මෙකල පවත්නා නිකායභෙදයන්ට මුල්වූයේත් ධර්‍ම්ය පිළිබඳ කරුණුනොව විනය පිළිබඳ කරුණුය. මේ සියළු රටවල සියළු නිකායිකයෝම එකම නිර්‍ණයක් අදහති. එකම මද්ධ්‍යමප්‍රතිපදවක් අනුගමනය කරති. අනාත්මවාදය එකසේ පිළිගනිති. කුශලාකුශලකර්‍ම්විපාක එකසේ විග්‍රහ කරති. ධර්‍ම්ය පිළිබඳ කරුණු අතින් නිකායභෙදය ගොඩනගාගත්තෝ මහායානිකයෝය.

මේ පළමුවන නිකායභෙදයෙහි තවත් විශේෂලක්ෂණයක් ඇත්තේය. **මහාසඞ්ඝික** නමිවූ වජ්ජිපුත්තකනිකාය පක්ෂයෙහි මාඝීඵල ප්‍රාප්තවූ එකම භික්ෂුවකුදු නොවීය. සියල්ලෝම පෘථග්ජනයෝය. සථවිරවංශපක්ෂයෙහි සෝවාන් ආදි මාඝීඵලයන්ට පැමිණියෝ බහුතරවූහ. වැඩිදෙනෙක් රහතන්වහන්සේලාය. දෙවන ධර්‍ම්සඞ්ගායනාවෙන් තවත්වරක් ආරක්ෂිතවූ ත්‍රිපිටකධර්‍ම්ය හා ඒ හා සබැඳි පාලි භාෂාවත් එකම අකුරකුදු වෙනසක් නැතිව එතැන් සිට අටළොසක් අධික තවත් සියක් අවුරුද්දක් නිරුපද්‍රැතව ආයේය. සථවිරවංශයෙන් බිඳීගිය මහාසඞ්ඝිකනිකාය පසු කලෙක තවතවත් කොටස්වලට කැඩීගොස් බුදුවසින් දෙසියවසක් පිරෙන්ට පළමු සතළොස් නිකායක් දඹදිව පහළවූහ.

පසු කලෙක මහායානය යන නමින් ප්‍රසිද්ධියට පත් මේ බෞද්ධ භික්ෂුනිකායන්ගේ ප්‍රභවයට හෙතුවී ඇත්තේ දෙවන සඞ්ගායනාවට මෙන් විනයමතභෙද නොව විවිධදෘෂ්ටිමතභෙදයි. ධර්‍ම්ශොකරජුගේ කාලයෙහි පැවැත්වූ තුන්වෙනි සඞ්ගායනාවට මූලික හෙතුව වීතිබෙන්නේ ලාභාපෙක්ෂාවෙන් තම තමන් සිවුරු පොරවා ගෙන සසුනට ඇතුළත්වී සිටි මිත්‍යාදෘෂ්ටිකයන් පළකළ දෘෂ්ටි මතභේදයි කිවයුතුය.

තුන්වෙනි සඞ්ගායනාවෙන් තුන්වෙනි වරටත් එක්තැන්බවට පත් ශුද්ධවූ ත්‍රිපිටකබුද්ධධර්මය පාලිභාෂාවත් සමග ලඞ්කාවට ගෙනෙන ලද්දේ මිහිඳු මහරහතන්වහන්සේ විසිනි. එය වනාහි අශොක ධර්මදූත ව්‍යාපාරයේ ප්‍රතිඵලයක්වශයෙනි. **ධර්මාශොක මහරජු** විසින් රටවල් නවයකට පිටත්කර යැවූ ධර්මදූත පිරිස් නවයම ඒ ඒ රටට ගෙන ගියේ එකම පාලි ත්‍රිපිටකධර්මයයි. නමුත් එය මේ තාක් නොවෙනස්ව පවත්නේ දඹදිවින් ඈත්ව පිහිටි දෙරටක් වන ලඞ්කාවේ හා බුරුමයේය. සියම්, කාම්බෝජ රටවලද පවත්නේ මේ පාලිත්‍රිපිටකය නමුදු එය අශොක කාලයෙහි පැතිරගිය එකක් නොවේ. දඹදිවටම අයත්වූ **කාශ්මීර, ගන්ධාර, මහිසමණ්ඩල, වනවාස, අපරන්ත, මහාරාෂ්ට්‍ර, හිමවත** යන රටවල් සයට හා ආසියාවේ බටහිර දෙස යවනදෙශයට (ග්‍රීසිය හා සුළු ආසියාවේ රටවලට) ගෙන ගිය පාලි ත්‍රිපිටකය කොතෙක් කල් පැවැතුනේදැයි නොකියහැකි තරමට වැඩිකලක් යන්තට පළමු කාලයේ අදුරුවලාවෙන් වැසී ගියේය. කාශ්මීර, ගන්ධාර ආදි ඉන්දියානු ප්‍රාන්තයන්හි පැතුරුණු බුද්ධධර්මය අශෝක කාලයෙන් බොහෝ කලක් ගතවනතුරුද ස්ථවිරවාදී පාලි ත්‍රිපිටකය මුල්කොට පැවැත්තේ ය. එහෙයත් එය ඉන්දියාවෙන් අතුරුදහන්ව ගියේ කිනම් කාලයෙකදැයි නිශ්චය වශයෙන් කිව නොහැක.

බුදුගොස් හිමියන් ලක්දිවට වැඩම කළ කාලය වනතුරුත් දඹදිව ස්ථවිරවාදී පාලිත්‍රිපිටකය නිමිලව පැවැතිබව පෙනේ. උන්වහන්සේ ලක්දිවට වැඩම කළෝ බු: ව: 953 දී රජපැමිණි **මහානාම** රජුගේ කාලයේය. මහාවංශයෙහි දක්වන පරිදි දඹදිව මහාබොධි විහාරයෙහි **රෙවත** හිමියන් වෙත පැවිදිවූ බුද්ධඝොෂ හිමියන් **'ඤාණොදය'** නම් ධර්මප්‍රකරණයක් හා ධම්මසඞ්ගණියට **'අත්ථසාලිනී'** නම් අටුවාද කළ බවත් පිරිත් අටුවාව කරන්නට පූදනම්වූ බවත් කිවයුතුව ඇත. දඹදිවදී ලියූ මේ පොත් අභාවයට ගොස් ඇතත් මේ පොත් ලියනලද්දේ පාලිභාෂාවෙන්ය යනු පිළිගත යුතුය. **'ධම්මසඞ්ගණී'** ආදි පොත් ගැන කියවෙනබැවින් බුදුවසින් දසවන ශතවර්ෂීය වනතුරුත් දඹදිව පාලිත්‍රිපිටකය යෙහෙන් පැවත්තේයයි නිගමනය කළයුතුය.

එහෙත් 11 වෙනි ශතවර්ෂයෙහි පටන් දඹදිව ස්ථවිරවාදී ශාසනවංශ කථාව අදුරට යන්නීය. පසුව හීනයානයයි ආරූඪ කරගත් නමකින් හඳුන්වන ස්ථවිරවාද බුද්ධධර්මය මෙසේ දඹදිව අභාවයට යන්ම මහායාන නම්වූ සංස්කෘත බුද්ධධර්මය විවිධදෘෂ්ටිමතයන්ට හා නොයෙක් අඳුවැඩි කිරීම්වලට බඳුන්වී දඹදිව මුළුල්ලෙහි පැතිරෙන්නටවිය. දඹදිවින් එය ආසියාකරයේ බොහෝ රටවලට පැතිර ගත්තේය. එසේවත්ම පාලිත්‍රිපිටකය

දඹදිවින් විකින්ටික මුළුමනින් අතුරුදහන් වන්නටවිය. මෙයට හේතු සෙවියයුතුය.

1. ස්ථවිරවාද බුද්ධධර්මය පිළිගත් බෞද්ධරජුන්ගේ බලය පිරිහීම.
2. සංස්කෘතය එකල රටේ බහුල ව්‍යවහාරයට පැමිණි ජනප්‍රිය භාෂාවක්වූ බැවින් එබසින් ලියා තිබෙන මහායානධර්මග්‍රන්ථ ප්‍රචාරයට පත්වීම.
3. ත්‍රිපිටකය ලියා තිබෙන පාලිභාෂාව එකල ජනවහරට නොපැමිණි භාෂාවක්වීම.
4. අළුත් අළුත් විවිධදර්ශනික මත මහායානිකයන් විසින් ඉදිරිපත්කිරීම.
5. මහායානික භික්ෂූන් විසින් නාලන්ද, තක්සලා, ජගද්දලා වැනි ලක්ෂ ගණනක් ශිෂ්‍යයන්ගෙන් පිරී සිටි විශ්වවිද්‍යායතන ඇතිකොට (මහායාන) බෞද්ධ අධ්‍යාපනය රට මුළුල්ලෙහි පතුරුවා හැරීම.
6. ස්ථවිරවාදීන් මෙන් නොව මහායානිකයන් ගීතවාදිතයෙන් හා ආමිෂ පූජාදියෙන්ද යන්ත්‍ර, මන්ත්‍ර, තන්ත්‍ර, ශාන්තිකර්ම, පෙතාත්‍ර විධීන්ගෙන්ද යුකතව ආගමප්‍රචාරයකොට මහාජනප්‍රසාදය දියුණුකිරීම.
7. භෞගොලීය දෙශගුණික බලපෑමට අනුරූපව මහායානිකයන් භික්ෂුවිනයනීති සකස්කරගැනීම.

යන මේ කරුණු මහායාන ධර්මයේ බාහුල්‍යව්‍යාප්තියට හෙතුවී තිබේ. මෙයින් පසුව දැක්වූ කරුණ පිළිබඳ මදවිස්තාරයක් මෙහි දැක්විය යුතුය.

භූගොලය දෙශගුණික කලාප පසකට බෙදී ඇත.

1. උත්තරශීතකලාපය
2. උත්තරසමශීතොෂ්ණකලාපය
3. ග්‍රීෂ්මකලාපය
4. දක්ෂිණසමශීතොෂ්ණකලාපය
5. දක්ෂිණශීතකලාපය යනුවෙනි.

මොවුනතුරෙහි උත්තර-දක්ෂිණ ශීතකලාප දෙකත් සමශීතොෂ්ණ කලාප දෙකත් සමානදෙශගුණය ඇති ප්‍රදේශයෝය. ග්‍රීෂ්මකලාපය

නිරක්ෂරෙඛායික ප්‍රදෙශයයි. මෙයින් බුදධාගම පහළ වූයේ ග්‍රීෂ්ම කලාපයට අයත් ජම්බුදවීපයෙහිය. භික්ෂූන්ගේ හැදීම්, පෙරවීම්, ආහාර පානවිහරණවිධි, ගමන් බිමන් පිළිබඳ ශික්ෂාපද පනවා ඇත්තේ ග්‍රීෂ්ම ඛණ්ඩයේ දෙශගුණයට හා පරිසරයට අනුරූප වන ලෙසටය. ආසියාවේ උත්තරකලාපයේ සයිබීරියාවේ තුන්ද්‍රාප්‍රදෙශ වැනි පලාත්වල වසන සථවිරවාදී භික්ෂුවකට ඒවා අනුගමනය කිරීම පහසු නැත. ඒ නිසා මහායානිකයෝ එබඳු කරුණු දෙශගුණික බලපෑමට යටත්ව සකස්කර ගත්හ. එහෙයින් සථවිරවාද බුදධධර්මය ග්‍රීෂ්මකලාපයෙන් පිට නොගොස් එහි ම රැඳී සිටියදී මහායානය ආසියාවේ උත්තරශීත කලාපය දක්වා විහිදී ගියේ ය. එය ග්‍රීෂ්මකලාපයේත් කාශ්මීරය ඇතුළු ඉන්දියාව, ඉන්දුචීනය, ඉන්දුනීසියාව, ජාවා, සුමාත්‍රා, මලයාදි රටවලට පමණක් නොව උත්තරශීත කලාපයේ ආසියාරුසියාව, සයිබීරියාව වැනි රටවලට ද උත්තරසමශීතොෂ්ණ කලාපයේ චීනය, ටිබෙට්රට, ජපානය, මොංගෝලියාව, මැංචූරියාව සහ කොරියාව යනාදී රටවලටද පැතිර ගියේය. ස්ථවිරවාද බුදධධර්මය ලඞකාව, බුරුමය, සියම, කාම්බෝජය යනාදී ග්‍රීෂ්මකලාපයට අයත් රටවල් කිහිපයෙහි පමණක් රැඳී සිටියේය. අන් ලෙසකින් කියතොත් මෙකියූ රටවල් කිහිපය අත්හළ විට මුළු මහත් ආසියාවේ සියලු රටවල පැතිර ගියේ මහායාන බුදධධර්මය බව කිවයුතුය. දෙශගුණික බලපෑම අනුව මහායානිකයන් ඔවුන්ගේ විනයශික්ෂා සකස් කර ගැනීම ඊට හේතුව වශයෙන් සිතිය හැකිය.

හෙළඅටුවා

දැන් අප මිහිඳු මාහිමියන් ලක්දිවට ගෙන ආ පාලිත්‍රිපිටකය පිළිබඳ කථාවට බැසිය යුතුය. මිහිඳු මාහිමියන් ගෙන ආ ත්‍රිපිටක බුදධධර්මය මහාඅරිටඨාදී වූ දහස් ගණන් සිංහල භික්ෂූන්ගේ හැදෑරීමෙන් ලක්දිව හැම තැන ව්‍යාප්තව ගියේය. එසේම ධර්මය දේශනාකොට තිබෙන පාලිභාෂාව පිළිබඳ උද්ග්‍රහණයද ලක්දිව පැතිරගියේය. පාලියෙන් තුබූ ත්‍රිපිටකධර්මයේ ගැඹුරු තැන් සිංහල ජනතාවට පැහැදිලි කර දීමෙහි අවශ්‍යතාවද මිහිඳු මාහිමියන්ට පෙනී ගියේය. එහෙයින් උන්වහන්සේ බුදධකාලයේ සිටම වාචනාමාර්ගීවශයෙන් ආචාර්ය පරම්පරාවෙන් පැවතඅා අර්ථවිවරණක්‍රමය සිංහල භික්ෂූන්ට කියා දුන්සේක. ලියා දුන්සේක. එය කරනලද්දේ සිංහල ජනතාවගේ භාෂාවවූ හෙළ බසිනි. එය හෙළඅටුවා නම්. ත්‍රිපිටක ධර්මයට ලියනලද හෙළඅටුවා තුනක් ඇතිබව පිළිගෙන ඇත්තේය. එනම්:

i **මහාඅට්ඨකථා**

ii **කුරුන්දියට්ඨකථා**

iii **මහාපච්චරියට්ඨකථා** යන මෙතුනය.

මිහිඳු මාහිමියන් වහන්සේ විසින් මේ අටුවා තුන ම ලියන ලදැයි සිතිය නොහැකිය. එකකතීඃක වූ අටුවා තුනක ආවශ්‍යකත්වයක් නොමැති බැවිනි. මහටුවාව තුන් පිටකයට ම ලියන ලද්දක් බව පෙනෙන බැවින් මිහිඳු මාහිමියන් විසින් ලියන ලද්දේ ඒ අටුවාවයයි පිළිගැනීම වරදක් නොවේයයි කිවයුතුය. අනික් අටුවා දෙක පසු කලෙක අන් කෙනෙකුන් විසින් ලියන ලදයි සිතිය හැකිය. **අන්ධකට්ඨ කථා, සඞ්ඛෙපට්ඨකථා** නම් කවත් අටුවා දෙකක් ගැනද හෙළටුවා පාලියට පෙරලූ බුදුගොස් හිමියන් විසින් සඳහන් කරන ලද්දේය. ඒ මේ අන්ධකට්ඨකථාව හෙළ අටුවාවක් නොව ඉන්දියාවේ ආන්ධ්‍රදෙශයෙහි බුද්ධාගම පැවැති කාලයෙහි ආන්ධ්‍ර (ද්‍රවිඩ) භාෂාවෙන් ලියන ලද්දක් වේ. සඞ්ඛෙපට්ඨකථාව, නමින් ම හැඟෙන පරිදි සංක්ෂෙප ක්‍රමයෙන් ලියූ කුඩා අටුවාවක් විය යුතුය. ඇතැම් විචාරකයෝ එයින් මහඅටුවාව මූළත්‍රිපිටකයට ද කුරුන්දිය විනයපිටකයට ද මහාපච්චරිය අභිධම්පිටකයට ද වෙන් වෙන් වශයෙන් කළ අටුවායයි කියත්. එහෙත් මේ මතය පිළිගැනීමට සාධක නැත්තේය.

සංවණ්ණනං තං ච සමාරභන්තො
තස්සා මහාඅට්ඨකථං සරීරං
කත්වා මහාපච්චරියං තථෙව
කුරුන්දිනාමාදිසු විසුතාසු[1]

යන්නෙන් දක්වූපරිදි විනය අටුවාව පාලියට නගන බුදුගොස් හිමියෝ එය **මහාඅට්ඨකථා, මහාපච්චරිය, කුරුන්දි** සහ ආදිශබ්දයෙන් දක්වන **සංඛෙපට්ඨකථාවද** ඇසුරුකොට කරනබව පවසත්. මේ හෙළඅටුවා සතරටම විනයපිටකයද ඇතුළත්බව මෙයින් පෙනේ.

"එසථ ච සත්තිවතුසථකම්මං එකමෙව ආගතං. ඉමස්මිං පන ඨානෙ ඨත්වා චත්තාරි සඞ්ඝකම්මානි නීහරිත්වා විත්ථාරතො කථෙතබ්බානීති සබ්බඅට්ඨකථාසු වුත්තං"[2]

යන්නෙන් සත්තිවතුසථකම්ය ගැන දක්වන මේ කාරණය සියළු අටුවාවන්හි (හෙළ) කියනලදැයි දක්වත්. මේ වනාහි විනය පිළිබඳ කාරණයක් වේ.

---

1. සමන්තපාසාදිකා, 2 පිටුව 2. සමන්තපාසාදිකා, 172 පිටුව

එය සියළු අටුවාවන්හි ම කියූ බව දක්වීමෙන් හෙළ අටුවා සතරට ම විනය අටුවාව ද ඇතුළත් බව පැවසේ. තවද සතරවෙනි පාරාජිකාවෙහි උත්තරිමනුෂ්‍යධර්මාරොචන විස්තරයේදී අත්ථප්‍රතිසම්භිදාවට පැමිණියෙමියි අවිශෙෂයෙන් කියූ කල්හි පාරාජික වේයයි **සංඛෙපට්ඨකථාව** කියාලන්නීය. **කුරුන්දිය** ද එය ම අනුමත කරයි. එසේ කියූ තරමින් පාරාජිකාවක් නැතැයි මහාට්ඨකථාව එයට පටහැනිව සිටියි. නිරොධසමාපත්තියට අනාගාමීන් හා රහතුන් පමණක් සමවදින බැවින් මා ඔවුන්ගෙන් අන්‍යතරයෙකු ලෙස පිළිගනිතැයි යන සිතින් මම නිරොධසමාපත්තියට සමවදිමියි කියන ලද්දේ නම් පාරාජික වේයයි **මහාපච්චරියෙහි** දක්වන ලදැයි[3] යන මේ විස්තරයෙන් එකී අටුවා සතරටම විනයපිටකයද ඇතුළත් වන බව ප්‍රකාශවේ. මේ නිදර්ශනයන්ගෙන් ඔප්පුවන්නේ හෙළඅටුවා සතර එක් එක් පිටකයට වෙන් වෙන් වශයෙන් කළ ග්‍රන්ථ නොව මුළු තුන්පිටකයට පොදුවේ කළ අටුවා බවයි.

ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

මිහිඳු මාහිමියන් ගෙන ආ ත්‍රිපිටකධර්මයද එකල ලියූ හෙළඅටුවාද භික්ෂූන් විසින් මුඛපාඨ වශයෙන් ගෙනවුත් බු: ව: 5 වෙනි ශතවර්ෂයේ සිටි **වළගම්බා** රජුගේ කාලයේදී **මාතලේ අලුවිහාරයේදී** පුස්තකාරූඪ කළබව ලඞ්කාඉතිහාසය කියයි* එයින් පෙනෙනුයේ 3 වෙනි ශත වර්ෂයෙහි ගෙන ආ ත්‍රිපිටකධර්මය එතැන් සිට ශතවර්ෂ දෙකක් පමණ කාලය තුළ කිසිම පොතක පතක අකුරක්වත් නොලියා කටපාඩමෙන්ම ගෙනාබවය. මහාවංශය දක්වනපරිදි පෙළ පමණක්නොව හෙළඅටුවාද එසේ ගෙන එන ලද්දීය. මහාප්‍රාඥ වූ **ෂඩභිඥලාභී** මහරහතන් වහන්සේලා වැඩ විසූකාලයබැවින් සාත්ථිකථා ත්‍රිපිටකය කටපාඩමෙන් ගෙන ඊම පුදුමයක් ලෙස නොසැලකිය හැකිය.

එහෙත් මෙහිදී පැනනගින ප්‍රශ්නයනම් ත්‍රිපිටකය කටපාඩමෙහි තිබියදී පොතකපතක නොලියා කටපාඩමෙන්ම අටුවා කළේ කෙසේද? යන්නය. අටුවායනු ත්‍රිපිටකයේ ගැඹුරුතැන් විස්තරකරන විවරණයයි. ත්‍රිපිටකය කාගේ හෝ මුඛගතව තිබියදී එහි ගැඹුරුතැන් අවුලන්නේ කෙසේදැයි සිතියයුතුය. එසේ ගැඹුරුයයි පෙනෙන තැන් අවුලාගන්නාලදද, එහි විස්තර, ලිවීමක් නොමැතිව කෙනකුන්හට කියාදීමෙන් පොතක් පිළියෙලවිය හැකිද යනුත් මෙහිලා සිහිකටයුතු ප්‍රශ්නයක්වේ. එසේ පොතක

3. සමන්තපාසාදිකා 352 පිටුව

* මහාවංශ පරි 33

නොලියා කටින් එකතුකරගත් පෙළ හා අටුවාව පොතක් නොමැතිව ගුරුවරයෙක් ශිෂ්‍යයකුට උගන්වන්නේ කෙසේද? යනුත් විමසියයුතුය. ලියන කලාවකුත් එකල රටේ දියුණුවී තුබුණේනම් පෙළඅටුවා පොත පතක ලිවීමෙහි තහනමකුත් නොතිබිණිනම් එසේ ලිවීම පවකුත් නොවේනම් ගිහියන් කෙසේවෙතත් අකුරු ලියන්නට කියවන්නට දත් භික්ෂූන්වහන්සේලාත් සිටියාහුනම් පෙළඅටුවා පොතපතක නොලියනලද්දේ කුමක්නිසාද යනුත් කල්පනාකළයුතු තවත්කරුණක්වේ.

දික්සඟිය, මැදුම්සඟිය වැනි විශාල ග්‍රන්ථයක් ගුරුවරයෙකු වෙත කටපාඩමේම තබාගෙන පොතක් නැතිව ශිෂ්‍යයෙකුට ඉගැන්විය හැකිද? කටපාඩම් කරවිය හැකිදැයි සිතනවිට මේ ප්‍රශ්නය නිරාකරණය කරගතහැකිය. තුන්පිටකයම කටපාඩමින් කියන්නට ශක්තිමත්වූ ත්‍රිපිටකධාරීභික්ෂූන් විශාලසඛ්‍යාවක් එකල සිටිබව සත්‍යයක්වේ. උන්වහන්සේලාද ත්‍රිපිටකය උගත්තාහු ගුරුවරුන්ගෙනි. ඒ ගුරුන්ට පොතක් නැතිව කටපාඩමින්ම තව කෙනකුන්ට කටපාඩම්කරවන්නට නොහැකිබව පැහැදිලි කරුණක්වේ. එහෙයින් මිහිඳු මාහිමියන්ගේ කාලයෙහි පටන් ත්‍රිපිටකයත් එයට කළ හෙළඅටුවාවත් මුඛපාඨවශයෙන් හා පොත්පත් වශයෙනුත් පැවතිබව පිළිගතයුතුය. එවිට පැනනගින තවත් ප්‍රශ්නයක් ඇත්තේය. මේ දැක්වූ පරිදි මුල්කාලයෙහි සිට තුන්පිටකය පොත පතේ ලියා තුබුණේනම් වළගම්බා රජුගේ කාලයෙහි මාතලේ අළුවිහාරයෙහිදී එය පුස්තකාරූඪකළේ කෙසේද? යනුයි. අළුවිහාරයෙහිදී කළ සඞ්ගායනාවට පුස්තකාරූඪ සඞ්ගායනාවයයි ව්‍යවහාරකරනබව සත්‍යයකි. එයින් අදහස් කරනුයේ මිහිඳු මාහිමියන්ගේ කාලයපටන් වළගම්බා කාලයදක්වා ශතවර්ෂ දෙකකටත් අධික කාලයතුළ ත්‍රිපිටකයෙහි අකුරක්වත් පොතක හෝ පතක නොලියා කටින්කටම ආබවක් නොවේ. එකල පැවති භාණකක්‍රමයවශයෙන් දීඝනිකාය, මජ්ඣිමනිකායාදී කොටස් ඒ ඒ ආචාර්‍යවරයන්ගේ භාරයෙහි පැවතිබැවින් ඒ ආචාර්‍යවරයන් ඒවා පොත්වල ලියා තම අතවැසියන්ට පාඩම් කරවමින් ආබව පෙනේ.

ඒ පොත් අතින් අත ලියාගැනීමෙන් යම් යම් ව්‍යාකුලතාද ඇති විය හැකිය. අළුවිහාර සඞ්ගායනාවෙහිදී කළේ ඒ ඒ භාණකපරම්පරාවන් සතුව වෙන් වෙන්ව තුබූ ත්‍රිපිටකයේ ඒ ඒ පොත් එක්තැන්කොට ලිපිග්‍රම දෙඛාදියවීනම් ඒ තැන් සංශොධනය කොට තුන් පිටකයම එකතැනකදී ලියා තැබීමය. පුස්තකාරූඪසඞ්ගායනාව සිදුවූවා මෙසේය යනු මාගේ අදහසය.

හෙළඅටුවා පරිවර්තනය

මිහිඳු මාහිමියන් දවසම ආරම්භවූ සිංහලාර්ථකථා එතැන් සිට අවුරුදු 700 ක් පමණ කාලය තුළ සිංහලජනතාවට ත්‍රිපිටකය හෙළිපෙහෙළි කරමින් පැවැත්විය. ලක්දිව ත්‍රිපිටකයට සිංහල භාෂාවෙන් ලියනලද අර්ථවිවරණග්‍රන්ථ ඇති බව දඹදිව වැසියන්ටද දැනගන්නට ලැබී ඇත. අනෙක් ථෙරවාදී බෞද්ධ රටවලටද ඒ ගැන දැනීම ලැබුනේයයි කිවහැකිය. එහෙත් ඔවුන්ට එබදු ත්‍රිපිටක අර්ථකථාග්‍රන්ථ නැති බැවිනුත් හෙළටුවා නොවැටහෙන බැවිනුත් ඔවුහු බොහෝසේ සිත්තැවුලියට පැමිණ සිටියහ. මෙසේ මෙයින් දුකට පත් විදෙශිකයන් අතර බු: ව: 10 වෙනි සියවසෙහිදී දඹදිව මහාබොධි විහාරයෙහි වැඩවිසූ රෙවත මහාසථවිරයන්වහන්සේද එක් නමකි. උන්වහන්සේ ලක්දිව ත්‍රිපිටකයට ලියනලද හෙළටුවා ඇති බව දැන ඒ අටුවා පාළියට පෙරළා ගතහොත් ලක්දිවෙන් පිටත ස්ථවිරවාදී බෞද්ධ රටවලටද එයින් වැඩක් ගත හැකියයි සිතන්නට වූහ. මෙසේ සිතා එයට සුදුස්සකු නොලැබ දුකට පත්ව සිටි උන්වහන්සේට පසු කලෙක බුද්ධඝොෂ හිමියන් උන්වහන්සේ වෙත පැවිදි වී ත්‍රිපිටකධර්ය ඉගෙන ඊට අර්ථකථා ලියන්නට සූදානම් වනවිට මුලින් සඳහන් කළ පරිදි රෙවත හිමියෝ එය නවතා "ලක්දිව මිහිඳු මාහිමියන් දවස සිට පැවැත එන හෙළටුවා ඇතැයි දැනගන්නට ලැබී ඇති බැවින් ඔබ එහි ගොස් ඒ හෙළටුවා පාලිභාෂාවට පෙරලිය යුතුයයි නියොග කළහ. ඒ නියොගය පරිදි බුදුගොස් හිමියෝ ලක්දිවට වැඩ ඒ හෙළටුවා පාළියට පෙරලූහ. එය සිදුවූයේ බු: ව: 953 ලක්දිව රජපැමිණි මහානාම රජු දවසය.

හෙළබසට වූ හානිය

මේ පෙරලීම නිසා අවුරුදු 700 ක් පමණ කාලයක් පැවැත ආ හෙළටුවා ටිකින් ටික අභාවයට ගොස් පසු කලෙක නැත්තට ම නැතිවී ගියේය. එහි භාෂාස්වරූපයවත් දැන ගැනීමට ඉඩක් නොතබා සම්පූර්ණයෙන්ම නැතිවියැම සිංහලභාෂාවට සිදුවූ බලවත් පාඩුවක් නිසා බුදුගොස් හිමියන්ට මේ සම්බන්ධයෙන් ඇතැම් විවාරකයෝ දෙෂාරොපණයද කරති. එම දෙෂාරොපණය ආනුෂඩ්ගිකවශයෙන් එක් අතකින් සකාරණවුවත් උන්වහන්සේ අපෙක්ෂාකළ මුඛ්‍යප්‍රයොජනය ත්‍රිපිටකධර්යේ උද්දීප්තියපිණිස වනබැවින් උන්වහන්සේ එයින් නිදහස් කළහැකිය. හෙළටුවා ආරක්ෂාකරගෙන එය දිගින්දිගට ගෙනයෑම බුදුගොස් හිමියන්ට අයත් කාර්‍යයක් නොවේ. එය හෙළදිවි වැස්සන්

අත පවත්නේය. පුස්කොල පොත්වල පැවැත්ම එකින්එක අතින්අතට පිටපත් ලියාගැනීම නිසා සිදුවනබැවින් පාළියට නැගුපසු සිංහල අටුවාපොත් තවදුරටත් අතින්අතට පිටපත් කරගැනීමෙහි උනන්දුව භික්ෂූන්අතර නැතිවන්නට ඇතැයි කියයුතුසේ පෙනේ. ඉන්පසු එවක තුබූ පොත්ටික දිරාපත්වීමෙන් ටිකින්ටික අභාවයට ගියේයයි කිවයුතුව ඇත.

හෙළටුවාවලින් ගන්නාලදයි සැකකළහැකි වචනකීපයක් ධම්ප්‍රදීපිකාවෙහි සඳහන්වී තිබේ. එහි 'ටුකිමඩගලගීතෙහි'* යන්නට පරිකථා ලියන **ගුරුළුගෝමීහු** 'දයි මාළේ' 'ද නැහේ' 'ඉන්සේ' 'ඉන්සේ' 'ද පුදයි මාළේ' යන වචන කිහිපය දක්වති. මේ වදන් ගුරුළුගෝමීන්ගේම වදන් නොවනබව ඔප්පුවන්නේ ඔහුම ඊට ගැටපදයක් ලියනබැවිනි 'මාළේ'යනු 'මා අළියෙකු යූසේයි' යනාදීන් හෙළටුවාවල භාෂාතත්ත්වය මැනගැනීමට මේ වචන සවලපයවූවද අපට ප්‍රමාණවත්ය. සාහිත්‍යයුගවශයෙන් සලකා බලනවිටද එය අනුරාධපුරයුගයේ ශිලාලිපිවල හා සීගිරිකුරුටුගීයෙහි භාෂාතත්ත්වයට සමානබව පෙනේ.

දැනට අප සතුව තිබෙන පාළිඅටුවාපොත් හෙළබසින් පෙළබසට පෙරලූබව ඒවා පෙරලූ බුදුගොස් හිමියෝම පවසති. එයම එයට අභ්‍යන්තර සාක්ෂියකි. ඒ ගැන මතභෙදයක් නැත්තේය. ඊට බාහිර සාක්ෂි අනවශ්‍යවූවත් වුවමනා කෙනෙකුන්ට පාළිඅටුවාවලින්ම එයද ඉදිරිපත්කළ හැකිය. පාළිඅටුවාපොත්වල ධම්ය හෝ විනය පිළිබඳ යම්යම් කරුණු සපුටකිරීමට නිදර්ශනකථාවස්තුරාශියක් දක්වා තිබේ. ඒ නිදර්ශනකථා හෙළදිව හෝ දඹදිව සිදුවූ සිද්ධීන් පිළිබඳ කථාය. මෙයින් දම්පියාඅටුවාව හා ජාතකඅටුවාව හැර අන්සියළු අටුවාවල වැඩියක් දක්නට ඇත්තී **ලඞ්කාදීපකථාය. ජම්බුදීපකථා** ඇත්තී ඉතා ටිකකි. දම්පියාඅටුවාවේ සූකරපොතිකාවගේ කථාව හැර අනික් සියළු කථාද, ජාතකඅටුවාවෙහි 'සුපපාරක' ජාතකකථාව හැර අනික් කථාද දඹදිව සිදුවූ සිදුවී පිළිබඳවය. මෙසේ ලක්දිවසිටි භික්ෂු භික්ෂුණීන්ගේද උපාසක උපාසිකාවන්ගේද රජ යුවරජුන්ගේද මැති ඇමැතියන්ගේද කථාවස්තු අටුවාපොත්වල බොහෝසෙයින් දක්නටලැබේ. එපමණක් නොව ලඞ්කාවේ පිරිවෙන්, වෙහෙර, විහාර, ගම්, නියම්ගම්, දනවු, නගර, ඇල, දෙල, ගඩොා, පර්වත, වැව් පොකුණු, උද්‍යාන, වනාන්තර, වෙළඳව්‍යාපාර, බෙත්හේත්විටි, කෘෂිකර්මාන්තය, ගොවිඋපකරණ, ඇදුම්, පැළඳුම්, ආහාරපානවිධි, ආගමික උත්සව හා පින්කම් යනමේ ආදි නොයෙක් දේ පිළිබඳ නම්ගම්

---

* මහාවංශ පරි 33

වතගොත ඇ විවිධවිස්තර අටුවාපොත්වලින් දතහැකිය. සිංහල උදෑල්ලක් ගැනද එහි කියවේ. සිංහල අටුවාවලට සිංහල රටෙන්ම සපයාගත් කථාවස්තු නිදර්ශන වශයෙන් ඇතුළත්වීම අනිවාර්‍ය සිද්ධියකි. එබැවින් දැන් අප අත ඇති පාළි අටුවා සිංහල අටුවාවලින් ම පෙරලා ගත් බවට මෙයද බාහිර සාක්ෂියකි.

පාළිඅටුවා ලොව පැතිරයෑම

මෙසේ හෙළටුවා පාළියට පෙරලීමෙන් බුදුගොස් හිමියන් පිළින කළ පරිදි ම විදෙශික රටවල ද ත්‍රිපිටක අර්ථකථා පැතිර යෑමෙහි දෙර විවෘත වූයේය. එයින් ඉන්දියා, බුරුම, සියම්, කාම්බෝජාදි සථවිරවාදී බෞද්ධරටවල ද ත්‍රිපිටක අර්ථකථාවෝ පැතිර ගියහ. එහෙත් ඒ අර්ථ කථා ග්‍රන්ථයන්හි අයිතිකාරයෝ ලාඬකිකවූ අපිම වෙමු. බුරුම සියම් ආදි රටවල බොහෝ උගත් භික්ෂූන් ටීකා අනුටීකාදිග්‍රන්ථ රාශියක් ලියනලදද ඒ සියල්ල ලියනලද්දේ අපේ අටුවා පොත්වලටය. ඒ අටුවා මූලාශ්‍රය කොට ගෙනය. එබැවින් ත්‍රිපිටකධර්මයේ උද්දීපනිය හා චිරස්ථිතිය උදෙසා ලඬකාවට හිමිවන ගෞරවය ලොකයෙහි වෙන කිසිම රටකට දිනාගත නොහැකි එකක් බව කිවයුතුය.

විනයවිවෘති

සිංහල භාෂාවෙන් පාළියට නැගූ අටුවාපොත් ශතවර්ෂ 16 ක් පමණ ගතවූ පසු නැවතත් සිංහල භාෂාවට පෙරළීමේ ආවශ්‍යකත්වය සිංහල බෞද්ධයන්ට වැටහී ටීකකලක් ගතවී ගොස් ඇත. එකල සිංහල ග්‍රන්ථ පාළියට පෙරලන්නට සිදුවූයේ සිංහල නොදත් පාළි දත් විදෙශිකයන්ගේ ප්‍රයොජනය සඳහාය. මෙකල ඒ පොත් නැවතත් සිංහලයට පෙරලිය යුතු වන්නේ පාළි නොදත් සිංහල බෞද්ධ ජනතාවගේ ප්‍රයොජනය සඳහාය.

මෙකල ත්‍රිපිටකග්‍රන්ථත් සිංහලයට පෙරලාගෙන යනබැවින් අර්ථකථා ග්‍රන්ථත් එසේ පෙරලා තැබීම සුදුසුයයි කිවහැකිය. එහෙත් ඒ කාර්‍යය එතරම් පහසුවූවක් නොවේ. පාලිභාෂාවේ හා ධර්මවිනයෙහි මනා පටුත්වයකුත් ලෙඛනකලාවෙහි කෘතහස්තභාවයකුත් එයට අවශ්‍ය බැවිනි. මේ **විනයවිවෘතිය** නම් ඒ කියූ අඩගතුනම එක්තැන්වීමෙන් වූ ප්‍රතිඵලයක් වෙයි. මේ වනාහි සමන්තපාසාදිකා නම් විනයටඨකථාවෙහි සිංහල පරිවර්තනයයි. අම්බලම්ගොඩ ශාස්ත්‍රෝදය පරිවෙණාධිපතිව වැඩවිසූ

රාජකීය පූජ්‍ය පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසලාභිධාන අමරපුර නිකායේ මහානායක මහාසථවිරපාදයන්වහන්සේ මෙහි අනුවාදකයාණෝය. ධම්ග්‍රන්ථයකට වඩා විනයග්‍රන්ථයක් සිංහලයට පරිවර්තනය කිරීම පහසු වැඩක් නොවේ. විනයෙහි එන බොහෝ පාළිවචන හෙළබසට එතරම් හුරු නැතිබැවිනි. අටුවා හෙළබසින් පෙළබසට පෙරළීමෙහිදී බුදුගොස් හිමියන්ට හමුවූ දුෂ්කරතා විනය අටුවාව හෙළබසට පෙරළීමෙහිදී පණ්ඩිත ධම්මකුසල සථවිරපාදයන්ටද හමුවන්නට ඇත. නමුත් උන්වහන්සේගේ භාෂා නිපුණත්වය හා පරිවර්තනකුශලත්වය ඒ දුෂ්කරතා මැඩපියන්නට සමත්වී ඇතිබව පෙනේ.

පාළිඅටුවා පොතක් සිංහලයට පෙරළීම සම්බන්ධයෙන් මේ විනය විවෘතිය උන්වහන්සේගේ පළමුවෙනි ප්‍රයත්නය නොවේ. මෙයට කලිනුදු උන්වහන්සේ ධම්මපදට්ඨකථාවට පරිවර්තනයක් කළහ. එය දැනඋගත් සියලුදෙනාගේ ප්‍රසාදයට ලක්වඇතිබව පෙනේ. සද්ධර්මයට සාගරයක් වැනි හෙයින් සද්ධර්මසාගර නම්වූ පිටු 2707කින් හෙබි ඒ මහා ග්‍රන්ථය නිකම් පදානුපදික පරිවර්තනයක් නොව විස්තරවිවරණ සහිත විශාල ධර්ම්ප්‍රකරණයකි. මෙකල ලියනලද අතිවිශාල සිංහල ධර්ම්ග්‍රන්ථය ඒය. උන්වහනසේගේ ධර්ම්ග්‍රන්ථ පරිවර්තන කෞශල්‍යය එයින් අවසන් නොවේ. මේ දෙකම අටුවාපොත්ය. පෙළපෞත් පෙරළීමෙහි ද කෘතහස්තභාවයක් උන්වහන්සේට ඇත්තේය. **ශ්‍රී ලඞ්කා බෞද්ධ මණ්ඩලයේ** බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලාවට අයත් **මහාවග්ගපාළිය** සිංහලට පරිවර්තනය කරන ලද්දේද පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල මහානායක මහාසථවිරයන්වහන්සේ විසිනි. පරිවර්තනය අළුතෙන් පොතක් ලිවීමට වඩා අමාරු කාය්‍යයක්වේ.

පොතක් අමුතුවෙන් ලිවීමෙහිදී කරනුයේ ලේඛකයා තම සිතෙහි පහළවන අදහස්වැල ලිපියට නැඟීමය. එහිදී ඔහුට තම අදහස් කවර අයුරකින් හෝ ලියා තැබීමට සම්පූර්ණ නිදහස ඇත්තේය. පරිවර්තිකයාහට එබඳු නිදහසක් නැත. තමා කැමතිපරිදි කැමතිඅතකට හරවා එය පෙරළීමට ඔහුට අවකාශ නැත්තේය. එක් බසකින් තවත් බසකට නැඟීමෙහිදී මුල් ලිපියේ රසභාවය නොනසා අදහස විකෘත නොකොට වචනයන්ගේ සංකලනයෙන් උදාතවන මුඛ්‍යාර්ථයට හානිනොවනසේ එය පෙරලියයුතුය. පදානුපදික පරිවර්තනයෙන් මුල්ලිපියේ ගැබ්ව තුබූ රසය වැනසී යනුහැකිය. මෙසෙයින් ග්‍රන්ථපරිවර්තන විෂයෙහිලා දක්නා ලැබෙන මේ ඈ දුෂ්කරතාමද්‍යයෙහි පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල මහානායක සථවිරයන්වහන්සේගේ සිංහලසමන්තපාසාදිකාව පරිවර්තන

රීති නොඉක්මවා නියම මඟින් ගෙනගොස් ඇතිබව පෙනේ. එය සිංහල භාෂාවට සමන්තපාසාදිකාවක්ම වන ලෙසට පරිවර්තනයකොට තිබේ. එබැවින් මෙහි භාෂාව සරලය. ව්‍යක්තය. කඩතොලු රහිතය. ඔපමට්ටම් සහිතය. කියවීමට රුචිකරය. තැනක උස්වද තැනක පහත්වද, තැනක වක්වද යන මාඟීයක්මෙන් නොව සමතාප්‍රාණයෙන් සමතලාය. උදරප්‍රාණයෙන් ආටෝපවත්ය.

සමන්තපාසාදිකාව විනයවිසතර පමණක්නොව ධර්මවිසතරද ඇතුළත් ග්‍රන්ථයක්බැවින් මේ සිංහලසමන්තපාසාදිකාව පාළි නොදත් සිංහල බෞද්ධයන්ට ධර්මවිනය දෙකම ඉගෙනීමට ඉතා ප්‍රයෝජනවත්ය. එසේම සිංහල සාහිත්‍යයටද මෙයින් සිදුවන සේවාව අතිවිශාලය.

මේවගට - ශාසනොදයකාමී,

පණ්ඩිත කහදමෝදර වඳුකිත්තිශ්‍රී පියරතන
අමරපුර නිකායේ මහානායක සථවිර

2518
1975

සෞගතොදය විද්‍යාලය
කෝට්ටේගොඩ

ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ
අටඨකථා පරිවර්තන කටයුතු පිළිබඳ කොමිටිය

මහාචාර්ය ඇම්. බී. ආරියපාල (සභාපති)

මහාචාර්ය එන්. ඒ. ජයවික්‍රම

ආචාර්ය කේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය

රාජකීය පණ්ඩිත ආචාර්ය පී. එස්. බී. සේනානායක

ආචාර්ය ඇස්. පී. සමරසිංහ (ලේකම්)

ආචාර්ය කේ. ඩී. පරණවිතාන (භාණ්ඩාගාරික)

මහාචාර්ය කපිල අභයවංස

ආචාර්ය ඒ. අධිකාරී

පටුන

බාහිර නිදන වණ්ණනා	1-86
වේරඤ්ජ කාණ්ඩ	86-188
ප්‍රථම පාරාජික වණ්ණනා	189-273
දුතීය පාරාජික වණ්ණනා	274-373
තෘතීය පාරාජික වණ්ණනා	374-451
චතුර්ථ පාරාජික වණ්ණනා	452-484

සමන්තපාසාදිකා
විනයට්ඨකථා

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

1. **යෝ කප්පකෝටීහිපි අප්පමෙය්‍යං**
කාලං කරොන්තෝ අතිදුක්කරානි,
බෙදං ගතෝ ලොකහිතාය නාථෝ
නමෝ මහාකාරුණිකස්ස තස්ස

සූචයි විනයත්ථං යෝ - සම්බුද්ධං තං සුදෙසිතං ධම්මං,
ධම්මෙ විරූළ්හමූලං - වන්දෙහං අරියසඞ්ඝඤ්ච.

උභයත්ථම්පති යා සා - සුස්සූසා මෙ කතා හිතා යෙසං,
සායං ලද්ධපතිට්ඨා - වන්දෙහං තෙ ගුරූ භත්තා.

විනයවිභාවිතවිතතා - සමන්තපාසාදිකාති විඛ්‍යාතං,
සත්ථං අට්ඨකථං තං - ආරොපෙස්සං සහාසාය.

ආරොපිතා යථාවිධි - විනයට්ඨකථා හිතාය විනයස්ස,
හදයං විනයවිදූනං - ථිනොතු විනයෙහිවිනයාය.

විනයවිවුත්තිඛ්‍යාතා - සමන්තපාසාදිකාපි සීහළිකා,
ධරණී විනයධරානං - ධරණී රමණී සද භවතු.

---

1. ලොකනායකවූ යම් සර්ඥවරයෙක් කප් කෙළ ගණනිදු පමණ නොකට හැකි කලක් මුළුල්ලෙහි අතිශය දුෂ්කර ක්‍රියාවන් කරණුයේ, සත්ත්වලොකයට හිතපිණිස, කායික පරිශ්‍රමයට පැමිණියේද, මහාකාරුණිකවූ ඒ ලොකනායකවූ සර්ඥයන්වහන්සේට මාගේ නමස්කාරය වේවා.

2. අසම්බුධං බුද්ධනිසෙවිතං යං
භවාභවං ගච්ඡති ජීවලොකො,
තමො අවිජ්ජාදිකිලෙසජාලං
විද්ධංසිතො ධම්මවරස්ස තස්ස.

3. ගුණෙහි යො සීලසමාධිපඤ්ඤා
විමුත්තිඤාණප්පභුතීහි යුත්තො,
ලොකුත්තරානං කුසලත්ථිකානං
තමරියසඞ්ඝං සිරසා නමාමි.

4. ඉච්චේවමච්චන්ත නමස්සනීයං
නමස්සමානො රතනත්තයං යං,
පුඤ්ඤාභිසන්දං විපුලං අලත්ථං
තස්සානුභාවෙන හතන්තරායො.

5. යස්මිං ඨිතෙ සාසනමට්ඨිතස්ස
පතිට්ඨිතං හොති සුසණ්ඨිතස්ස,
තං වණ්ණයිස්සං විනයං අමිස්සං
නිස්සාය පුබ්බාචරියානුභාවං.

---

2. බුදුරජුන් විසින් නිති සෙවුනාලද යම් සපයඃපාපනික නවලොකොත්තර ධර්මයක් අවබොධ නොකිරීම හෙතුකොට, සත්ත්වලොකය කුදු මහත්වූ භවයෙන් භවයට යේද, අවිද්‍යාදිකෙලශ සමූහය නසනසුලුවූ ඒ උතුම් ධර්මයට මාගේ නමස්කාරය වේවා.

3. ශීලසමාධිප්‍රඥාවිමුක්තිවිමුක්තිඥානාදි ගුණයන්ගෙන් යම් ආර්‍ය්‍ය සමූහයක් යුක්තවූයේද, පින් කැමති ජනයන්හට කෙතක් වැනිවූ ඒ ආර්‍ය්‍යසඞ්ඝයා මස්තකයෙන් වඳිමි.

4. මෙසේ අත්‍යන්තයෙන් නමස්කාර කටයුතුවූ රත්නත්‍රය නමස්කාර කරන්නාවූ මම, යම් මහත් පුණ්‍යරාශියක් ලැබුයෙමිද, ඒ පුණ්‍යරාශියෙහි ආනුභාවයෙන් නැසූ අනතුරු ඇතියෙමි

5. කාමසුඛල්ලිකඅත්තකිලමථානුයොග සඞ්ඛ්‍යාතවූ උභයාන්තයෙහි 'නොසිටියාවූ මැදුම් පිළිවෙතෙහි මැනවින් පිහිටාගත් බුදුරජාණන් වහන්සේගේ අධිශීල අධිචිත්ත අධිප්‍රඥ සඞ්ඛ්‍යාත ශික්ෂාත්‍රයෙහි ඇතුළත්වූ ශාසනය, යම් විනය පිටකයක් පෙළ අරුත් විසින් ලජ්ජීන් කෙරෙහි පැවතීම් අරුතින් පිහිටා සිටියේද, ඒ විනයපිටකය නිකායාන්තර ලබ්ධීන් හා මිශ්‍රනොකොට පොරණදුරන් විසින් වණ්නා කරණලද අර්ථකථාව ඇසුරුකොට වණ්නා කරන්නෙමි.

6. කාමඤ්ච පුබ්බාචරියාසභෙහි
කෙණම්බුනිද්ධොතමලාසවෙහි,
විසුද්ධවිජ්ජාපටිසම්භිදෙහි
සද්ධම්මසංවණ්ණනකොවිදෙහි.

7. සලෙඛියෙ නො සුලභූපමෙහි
මහාවිහාරස්ස ධජූපමෙහි,
සංවණ්ණිතොයං විනයො නයෙහි
විත්ථෙහි සම්බුද්ධවරත්වයෙහි.

8. සංවණ්ණනා සීහළදීපකෙන
වාක්‍යෙන එසා පන සඞ්ඛටත්තා,
න කිඤ්චි අත්ථං අභිසම්භුනාති
දීපන්තරෙ භික්ඛුජනස්ස යස්මා

9. තස්මා ඉමං පාළිනයානුරූපං
සංවණ්ණනාදනි සමාරභිස්සං,
අජ්ඣෙසනං බුද්ධසිරිව්හයස්ස
ථෙරස්ස සම්මා සමනුස්සරන්තො.

10. සංවණ්ණනං කං ච සමාරභන්තො
තස්සා මහාඅට්ඨකථා සරීරං,
කත්වා මහාපච්චරියං තථෙව
කුරුන්දිනාමාදිසු විස්සුතාසු.

6-7. එකාන්තයෙන් මේ විනය මාගීඥන ජලයෙන් දේනාලද රාගාදි මල හා කාමාදි ආස්‍රව ඇති, පිරිසිදුවූ ත්‍රිවිද්‍යා හා ප්‍රතිසම්භිද ඇති, සද්ධර්මසංවර්ණනාවෙහි දක්ෂවූ සැහැල්ලු පැවැත්මෙහි සුලභ උපමා නැත්තාවූ මහාවිහාරයට ධජ වැනිවූ උතුම්වූ සම්බුදුරජුන්හට අනුව ගියාවූ පොරණැදුරන් විසින් විසිතුරුවූ නයින් මනාකොට වර්ණනා කරණලද්දේය.

8. යම් හෙයකින්, මේ සංවර්ණනා හෙළදිව් වැසියන්ගේ බසින් කළබැවින්, අන් දිවයින්වැසි භික්ෂුසමූහයාට කිසි ප්‍රයොජනයක් සිදුනොකෙරේද,

9. එහෙයින්, මේ සංවර්ණනාව පාලිනයට අනුරූප කොට, බුද්ධසිරි නම්වූ මහාතෙරුන්ගේ ආරාධනය මනාකොට මෙනෙහි කරමින්, දැන් ආරම්භ කරන්නෙමි.

10. ඒ සංවර්ණනාවද මනාකොට ආරම්භකරන්නාවූ මම, මහ අටුවාව ඒ සංවර්ණනාවෙහි ශරීරයකොට, මහාපච්චරි නම් අටුවාවෙහිද, කුරුන්දි ආදි නම් ඇති ප්‍රසිද්ධවූ

11. විනිච්ඡයෝ අට්ඨකථාසු වුත්තෝ
යෝ යුත්තමත්ථං අපරිච්චජන්තෝ,
තතෝ පි අන්තෝගධථේරවාදං
සංවණ්ණනං සම්ම සමාරභිස්සං.

12. තමේම නිසාමෙන්තු පසන්නචිත්තා
ථේරා ච භික්ඛූ නව මජ්ඣිමා ච,
ධම්මප්පදීපස්ස තථාගතස්ස
සක්කච්ච ධම්මං පතිමානයන්තා.

13. බුද්ධේන ධම්මෝ විනයෝ ච වුත්තෝ
යෝ තස්ස පුත්තේහි තථේව කතෝ,
සෝ යේහි තේසං මතිමච්චජන්තා
යස්මා පුරේ අට්ඨකථා අකංසු.

14. තස්මා හි යං අට්ඨකථාසු වුත්තං
තං වජ්ජයිත්වාන පමාදලේඛං,
සබ්බම්පි සික්ඛාසු සගාරවානං
යස්මා පමාණං ඉධ පණ්ඩිතානං.

---

11. අටුවාවන්හි යම් විනිශ්චයක් කියනලද්දේද, එයිනුදු යුතු අරුත් නොහරිණුයේ, ඇතුළත් කළ සථවිරවාද ඇත්තක්කොට, සංවර්ණනාව මනාකොට පටන්ගන්නෙමි.

12. ධම්ප්‍රදීපවූ තථාගතයන්වහන්සේගේ ධර්මයට හෝ පාලිධර්මයට සකසා පුදන්නාවූ සථවිරවූද නවකවූද මධ්‍යමවූද භික්ෂූහු පහත් සිත් ඇත්තාහු මාගේ ඒ සංවර්ණනාව අසත්වා.

13. බුදුරජාණන්වහන්සේ විසින් යම් සූත්‍රාභිධර්මසඞ්ඛ්‍යාත ධර්මයක්ද විනයක්ද පෙළ විසින් හා අරුත් විසින් වදරණලද්දේද, ඒ ධර්මවිනය උන්වහන්සේගේ යම් පුත්‍ර කෙනකුන් විසින් ඒ වදළ ලෙසින්ම දන්නාලද්දේද, ඔවුන්ගේ අදහස නොහරිමින් පෙර අටුවාවන් කළාහුද.

14. (බුද්ධපුත්‍රයන්ගේ අදහස් වෙනස් නොකොට පෙර අර්ථකථා කළාහුද,) එහෙයින්ම, අර්ථකථාවන්හි යමක් කියනලද්දේද, (ප්‍රසාදකාරූඵ කාලයෙහි නොසැලකිල්ලෙන් ඒ ඒ තැන වැටුනු) ප්‍රමාදපාඨ හැරපියා, මේ ශාසනයෙහි ශික්ෂාවන්හි ගෞරව සහිතවූ පණ්ඩිතයන්ට ඒ සියල්ලත් යම් හෙයකින් ප්‍රමාණවේද.

15. තත්‍රා ච භාසන්තරමේව හිත්වා
විත්ථාරමග්ගඤ්ච සමාසයිත්වා,
විනිච්ඡයං සබ්බමසෙසයිත්වා
තන්තික්කමං කඤ්චි අවොක්කමිත්වා.

16. සුත්තන්තිකානං වචනානමත්ථං
සුත්තානුරූපං පරිදීපයන්තී,
යස්මා අයං හෙස්සති වණ්ණනාපි
සක්කච්ච තස්මා අනුසික්ඛිතබ්බාති.

---

15. ඒ අටුවාවෙන්ද, සිංහල භාෂාව පමණක්ම හැර, විස්තාර මාගීයද සංක්ෂිප්තකොට, සියලු විනිශ්චය ඉතිරි නොකොට, කිසිදු පාලික්‍රමයක් නොඉක්මවා.

16. සූත්‍ර පිළිබඳවූ වචනයන්ගේ අර්ථය, යම් හෙයකින්, සූත්‍රයන්ට අනුරූපකොට, හැමතින් දක්වන්නාවූ මේ සංවර්ණනා එහි ප්‍රමාණවන්නේද, එහෙයින් මනාකොට ඒ අනුව හික්මියයුතුය.

ඒ ගාථාවන්හි **"තං වණ්ණයිස්සං විනයං"** යි කියූ බැවින්, සංවරවිනයාදීන්ගේ වශයෙන් විනය බහුවිධ වූයේද, මෙහි විනය නම් සියලු විනය පිටකය අදහස් කරණ ලද්දේයයි මෙය කියනුලැබේ. මේ විනය පිටකය පිළිබඳ සංවර්ණනාව පිණිස මාතෘකාය:

'වුත්තං යෙන යදා යස්මා - ධාරිතං යෙන චාහතං,
යත්ථපපත්ථිතඤ්චත්ත - මෙතං වත්වා විධිං තතෝ.

තෙනාති ආදිපාඨස්ස - අත්ථං නානප්පකාරතෝ,
දස්සයන්තෝ කරිස්සාමි - විනයසඞ්ඛ්‍යවණ්ණනං'

යමකු විසින් කියනලද්දේද, යම් කලෙක්හි කියනලද්දේද, යම් හෙයකින් කියනලද්දේද, යමකු විසින් දරණ ලද්දේද, යමකු විසින් ගෙණෙනලද්දේද, යමෙකු කෙරෙහි පිහිටියේද, යන මේ මේ විටිය දක්වා එයට අනතුරුව - තෙන, යනාදි පාඨයේ අර්ථය නොයෙක් අයුරින් දක්වන්නෙමි විනය පිළිබඳ අර්ථවර්ණනාව කරන්නෙමි.

ඒ ගාථාවන්හි **'වුත්තං යෙන යදා යස්මා'** යන මේ වචනය වනාහි **'තෙන සමයෙන බුද්ධෝ භගවා වෙරඤ්ජායං විහරති'** යන මේආදි වචනය සඳහා කියනලද්දේය. මේ වනාහි භාග්‍යවත් බුදුරජාණන්වහන්සේගේ ආත්මප්‍රත්‍යක්ෂ වචනයක් නොවේ. එහෙයින් මේ වචනය කියයුතුය. මේ වචනය, කවරෙකු විසින් කියනලද්දේද; කවර

කලක කියනලද්දේද, කුමක් හෙයින් කියනලද්දේද'යි කියයුතුවේ. එද වනාහි ප්‍රථමසඞ්ගීති කාලයෙහි ආයුෂ්මත් උපාලි මහාස්ථවිරයන්වහන්සේ විසින් කියනලද්දේය. මේ ප්‍රථමසඞ්ගීතිය, පඤ්චසතික සඞ්ගීතිස්කන්ධකයෙහි කියනලද නමුත් මෙහිද නිදානයෙහි පටුත්වය පිණිස මේ කියනපරිදි දතයුතුය.

——\\——

ධම්චක්‍රප්‍රවර්තනය ආදිකොට සුභද්‍ර පරිව්‍රාජකයාගේ හික්මවීම තෙක් කළ බුදුකිස ඇති ලොකඤ්ඤාමීවූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ, **කුසිනාරා** නුවර සමීපයෙහිවූ **මල්ල** රජුන්ගේ **උපවර්තන** නම් ශාලවනොද්‍යානයෙහි යමකශාලයන් අතර පැණවූ පරිනිර්වාණ මඤ්චකයෙහි හොත්සේක්, වෙසක් පුන්පොහෝදා අලුයම අනුපාදිශේෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන්පා වදළසේක.

භාග්‍යවතුන්වහන්සේගේ පිරිනිවීම හෙතුකොට, එතන්හි රැස්වූ සත් ලක්ෂයක් භික්ෂූන්වහන්සේ අතුරෙහි සඞ්ඝස්ථවිරවූ ආයුෂ්මත් මහාකාශ්‍යප මහාස්ථවිරයන්වහන්සේ - භාග්‍යවතුන්වහන්සේගේ පිරිනිවීමෙන් සත් දවසක් ඉක්ම ගිය කල්හි, **සුභද්‍ර** නම් මහලු පැවිද්දහු විසින් 'ඇවැත්නි, කම් නැත, ශොක නොකරවු, විලාප නොකියවු, තොපට මේ කැපය, තොපට මේ නොකැපයයි අපි ඒ මහාසමණහුගෙන් උවදුරු ලද්දෝ වම්හ, අපි දැන් ඒ මහා සමණහුගෙන් මිදුනෝ වම්හ, අපි දැන් යමක් කැමති වන්නමෝ නම්, එය කරන්නෙමු, යමක් නොකැමතිවන්නමෝ නම්, එය නොකරන්නෙමු'යි කියූ වචනය මෙනෙහි කරනුවෝ-

'පාපී භික්ෂූහු, යම් කරුණක් හෙතුකොට, ඉක්මගිය ශාස්තෘන් ඇති ධම්විනයකැයි හහින්නෝ අලජ්ජිපක්ෂ ලැබ, නොබෝ කලකින්ම සද්ධර්මය අතුරුදහන් කරන්නාහ' යන මේ කාරණය වියහැකිය. යම්තාක් කල් මුළුල්ලෙහි ධම්විනය ලජ්ජී පුද්ගලයන් කෙරෙහි පවත්නේ නම්, ඒ තාක් ධම්විනය නොඉක්මගිය ශාස්තෘන් ඇත්තේමය,

ආනන්ද! තොපට මා විසින් යම් ධර්මයක් යම් විනයක් දෙශනා කරණලද්දේද, පණවන ලද්දේද, ඒ ධම්විනය, මාගේ ඇවෑමෙන් තොපගේ ශාස්තෘයි යන මෙය භාග්‍යවතුන්වහන්සේ විසින් වදරණ ලද්දේමය. යම් ලෙසකින් මේ ශාසනය බොහෝ කල් පැවැත්මට සුදුසුවූයේ, කල් පවතින්නක් වේද, එලෙසින් මම ධර්මයත් විනයත් සඞ්ගායනා කරන්නෙම් නම්, ඉතා මැනව, යම් හෙයකින් භාග්‍යවතුන්වහන්සේ විසින්, මම

කාශ්‍යප! ඔබ පරිභෝගයෙන් දිරාගිය හණ වැහැරියෙන් කළ පාංසුකූල චීවරය දරන්නහු'යි වදාරා, චීවරයෙහි සාධාරණ පරිභෝගයෙන්ද, මහණෙනි! මම යම්තාක් කැමති වෙමිද, ඒ තාක් කාමයන්ගෙන් වෙන්ව - ප්‍රථමධ්‍යානයට එළඹ වෙසෙමිද, මහණෙනි! කාශ්‍යපද යම්තාක් කැමතිවේද, ඒ තාක් කාමයන්ගෙන් වෙන්ව-ප්‍රථමධ්‍යානයට එළඹ වෙසේයයි මේ ආදි ක්‍රමයෙන් නවානුපූර්ව විහාර ෂඩභිඥාදි ප්‍රභෙද ඇති උත්තම මනුෂ්‍යධර්මයෙහි තමන්වහන්සේ හා සමතන්හි තැබීමෙන් මම අනුග්‍රහ කරනලද්දෙමි වෙමිද, එසේ අනුග්‍රහ කරනලද මට ධර්මවිනය සඞ්ගායනාව හැර, අන් කිනම් මගකින් නය නැති බවක් වන්නේද, තමන්ගේ කවජඉසුරු දීමෙන් ස්වකීය කුලවංශය පිහිටුවන පුතුට රජක්හු මෙන්, භාග්‍යවතුන්වහන්සේ, මෙතෙමේ මාගේ සද්ධර්මවංශය පිහිටුවන්නේයයි දැන, මේ අසාධාරණ අනුග්‍රහයෙන් මට අනුග්‍රහ කළසේක්වනැ'යි සිතන්නාහු, ධර්මවිනය සඞ්ගායනා කරණුපිණිස භික්ෂූන්ට උත්සාහ ඉපදවූහ.

ඉක්බිති ආයුෂ්මත් **මහාකාශ්‍යප** මහාස්ථවිරයන්වහන්සේ, 'ඇවැත්නි, මම එක්කලක පන්සියයක් පමණ මහාභික්ෂුසඞ්ඝයා සමග **පාවා** නුවරින් නික්ම **කුසිනාරා** නුවර දිග්මගට පිළිපන්නෙමි'යි භික්ෂූන් ඇමතූසේක. මෙසේ පඤ්චසතිකඛන්ධකයෙහි ඇ සියලු සුභද්‍රකාණ්ඩය විස්තරවිසින් දතයුතුය.

ඉක්බිති උන්වහන්සේ 'අවැත්නි! ඉදිරියෙහි අධර්ම බබලන්නේය, ධර්ම යටපත් කරණු ලබන්නේය, අවිනය බබලන්නේය, විනය යටපත් කරණු ලබන්නේය, ඉදිරියෙහි අධර්මවාදීහු බලවත් වන්නාහුය, ධර්මවාදීහු දුර්ල වන්නාහුය, අවිනයවාදීහු බලවත් වන්නාහුය, විනයවාදීහු දුර්ල වන්නාහුය, එබැවින් අපි ධර්මයත් විනයත් සඞ්ගායනා කරන්නෙමු'යි භික්ෂූන්ට දන්වාසිටියහ.

එකල්හි භික්ෂූහු 'ස්වාමීනි! එසේනම්, මහාස්ථවිරයන්වහන්සේම සඞ්ගායනාවට පුදුසු භික්ෂූන් තෝරාගන්නා සේක්වා'යි ඇයද සිටියහ.

භික්ෂූන්ගෙන් ලද ආරාධනා ඇති මහාකාශ්‍යපමහාස්ථවිරයන් වහන්සේ, සකල නවාඞ්ගශාසනෘ ශාසනපර්‍යාපතිධරවූ නොයෙක් සියගණුන් නොයෙක් දහස්ගණුන් පෘථග්ජනස්‍රොතාපන්න සකෘදගාමී අනාගාමී ශුෂ්කවිදර්ශික ක්ෂීණාස්‍රව භික්ෂූන් හැරපියා බොහෝසෙයින් භාග්‍යවතුන්වහන්සේ විසින් එතදග්‍රයට නගනලද ත්‍රිපිටක සකල පර්‍යාපති ප්‍රභෙදධරවූ සිවුපිළිසැඹියා පත් මහානුභාව සම්පන්නවූ ත්‍රිවිද්‍යාදිභෙද ඇති ක්ෂීණාස්‍රව භික්ෂූන්ම එකකුඅඩු පන්සියයක් භික්ෂූන් තෝරාගත්හ. **'අථඛො ආයස්මා මහාකස්සපො එකෙනූන පඤ්චඅරහන්තසතානි උවචිනි'යි**

යම් කෙනකුන් සඳහා මෙය සඩ්ගීතික්ඛන්ධකයෙහි කියනලද්දේද, එහෙයිනි. කුමක් හෙයින් මහාසථවිරයන්වහන්සේට සඩ්ගායනාවට පැමිණීමට ඉඩ තබනුපිණිසය.

ආනන්ද සථවිරයන්වහන්සේ හා එක්වද, ආනන්ද සථවිරයන් වහන්සේ හැරපියාද ධම්සඩ්ගායනාව කරන්නට නොහැකිය. උන්වහන්සේ ශෛක්ෂ්‍යයහ. මතු මාඝීත්‍රය පිළිබඳ කටයුතු අවසන් නොකළ බැවින් කෘත්‍ය සහිතයහ. එහෙයින් උන්වහන්සේ හා එක්ව නොකටහැකිය.

ආනන්ද සථවිරයන්වහන්සේ විසින්, බුදුරජාණන් වහන්සේ දෙශනා කළ බුදුරජාණන්වහන්සේගේ නොහමුවෙහි පිළිගත් සූත්‍රගෙය්‍යාදීවූ කිසිදු ධම්යක් නැත්තේය. එහෙයින් උන්වහන්සේ හැරපියාද නොකටහැකිය.

ආනන්ද සථවිරයන්වහන්සේ, ශෛක්ෂ්‍යවූවාහුද, ධම්සඩ්ගායනාවට බොහෝ උපකාරබැවින් මහාකාශ්‍යප මහාසථවිරයන්වහන්සේ විසින් ධම්සඩ්ගායනාව පිණිස තෝරා ගතයුතුම වෙත්නම් එසේ තෝරා ගතයුතුව තිබියදී කුමක් හෙයින් තෝරා නොගන්නාලද්දහුද;යත්:- අන්හු නගන චොදනා දුරුකරණු පිණිසය.

මහාකාශ්‍යප මහාසථවිරයන්වහන්සේ, ආයුෂ්මත් ආනන්ද සථවිරයන්වහන්සේ කෙරෙහි දඩි විස්වස් ඇතියහ. ඒ එසේමය. හිසෙහි කෙස් පැසී තිබියදීද, මහාකාශ්‍යප මහාසථවිරයන්වහන්සේ 'මේ කුමරු පමණ නොදන්නේය'යි ආනන්ද සථවිරයන්වහන්සේට කුමාරවාදයෙන් කතාකරති, මේ ආයුෂ්මත් තෙමේ ශාක්‍ය කුලයෙහි උපන්නේය, බුදුරජානන්වහන්සේගේ සුලුපියහුගේ පුත්ය, සොහොයුරුය, එහිදී භික්ෂූහු, මා ඡන්දයෙන් අගතියට ගොස් කටයුතු කරන්නෙකු මෙනැ'යි හඟිමින් අශෛක්ෂප්‍රතිසම්භිදප්‍රාපත බොහෝ භික්ෂූන් අත්හැර, බැහැරකොට, ශෛක්ෂප්‍රතිසම්භිදප්‍රාප්ත ආනන්ද සථවිරයන් තෝරා ගත්හයි චොදනා නගතියි ඒ චොදනා නැගීමට ඉඩ නොතබමින්, 'ආනන්ද සථවිරයන් හැර සඩ්ගායනාව කරනු නොහැකිය'යි භික්ෂූන්ගේම අනුමතියෙන් ගනිමි'යි ආනන්ද සථවිරයන්වහන්සේ තෝරානොගත්හ.

එකල්හි භික්ෂූහු, තුමූම ආනන්ද සථවිරයන්වහන්සේ සඳහා 'ඍාමිනි! මේ ආයුෂ්මත් ආනන්ද සථවිරයන්වහන්සේ ශෛක්ෂ්‍යවූවාහුද, ඡන්දයෙන් දෙවසයෙන් භයෙන් මොහයෙන් අගතියට යන්නට නොසුදුස්සහ, ඒ සථවිරයන්වහන්සේ විසින් බුදුරජානන්වහන්සේගේ ඉදිරියෙහිදීම බොහෝ

ධම්මියත් විනයත් හදරණුලද්දේය, එහෙයින් සවාමීනි! මහාසථවිරයන්වහන්සේ 'ආයුෂ්මත් ආනන්ද සථවිරයන්වහන්සේ තෝරාගන්නා සේක්වා'යි මහාකාශ්‍යප මහාසථවිරයන්වහන්සේගෙන් ඉල්ලාසිටියහ.

ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප මහාසථවිරයන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද සථවිරයන්වහන්සේද, තෝරාගත්හ. මෙසේ, භික්ෂූන්ගේ අනුමතියෙන් තෝරාගත් ආනන්ද සථවිරයන්වහන්සේ සමග සඞ්ගායනාව පිණිස පන්සියයක් සථවිරවරු වූහ. එයින් පසු සථවිරභික්ෂූන්ට 'අපි කොතැනක ධම්මියත් විනයයත් සඞ්ගායනා කරන්නමෝද්ද'යි මෙබඳු අදහසෙක් වූයේය. නැවැත සථවිරභික්ෂූන්ට "රජගහා නුවර, භික්ෂාවපිණිස හැසිරීමට ඉඩ පහසුකම් ඇති මහත් තැනක් වන්නේය, බොහෝ සෙනසුන්ද ඇත්තේය, එහෙයින් අපි රජගහා නුවර වස්වසන්නමෝ, ධම්මියත් විනයත් සඞ්ගායනා කරන්නෙමු, අන්‍ය භික්ෂූහු රජගහා නුවර වස් නොඑළැඹෙන්නාහු නම් ඉතා මැනවැ'යි මේ අදහසද උපන්නේය. කුමක් හෙයින් උන්වහන්සේලාට මේ අදහස උපන්නේද;යත්: 'අපගේ මේ විරසථායී ක්‍රියාව සුභද්‍ර වැනි විසහාග පුද්ගලයෙක් සහමැදට පැමිණ උගුළු වන්නේය' යන මේ අදහසින් මේ උපන්නේය. අනතුරුව ආයුෂ්මත් මහාකාශ්‍යප මහාසථවිරයන්වහන්සේ ඳපඤ්චිතීය කම්මයෙන් ඇස්වූහ. එය සඞ්ගීතිඛන්ධකයෙහි *කියනුලැබූ ලෙසින් දතයුතුය.

එකල්හි බුදුරජානන්වහන්සේගේ පිරිනිවීමෙන් සාධුක්‍රීඩා සත්දවසද, ධාතුපූජා සත්දවසද ඉක්ම යෑමෙන් අඩමසක් ගෙවීගියේය. දැන් ඉකිරිවි සිටියේ ග්‍රීෂ්මඍතුව පිළිබඳ එක්මස් පසළොස් දවසකි. එහෙයින් වස් එළඹෙන දවස ආසන්නයයි දැන, මහා කාශ්‍යප මහාස්ථවිරයන්වහන්සේ, 'අවැත්නි! රජගහානුවරට යමු'යි අඩක් භික්ෂුසඞ්ඝයා ගෙණ, එක් මගකින් වැඩියසේක. අනුරුද්ධ මහාසථවිරයන්වහන්සේද, අඩක් ගෙණ එක් මගකින් වැඩියාහ. ආනන්ද මහාසථවිරයන්වහන්සේ, බුදුරජානන්වහන්සේගේ පාසිවුරු ගෙණ, භික්ෂුසඞ්ඝයාගෙන් පිරිවරණුලදුව සැවැත් නුවරට ගොස්, රජගහානුවරට යනු කැමැත්තාහු සැවැත්නුවර සැරිසැරූහ.

ආනන්ද මහා සථවිරයන්වහන්සේ එහි ගියගිය තැන, 'ඝාමීනි! ආනන්ද මහාසථවිරයන්වහන්ස! ශාස්තෘන්වහන්සේ කොතැන තබා මෙහි ආවහු ද'යි මහත් විලාපයක් නැඟී ගියේය. ආනන්ද මහා සථවිරයන්වහන්සේ

---

* චුල්ලවග්ග

පිළිවෙළින් සැවැත් නුවරට පැමිණිකල්හි එහි නැගී ගිය මහත් විලාපය, බුදුරජානන්වහන්සේ පිරිනිවි දවසෙහි නැගුනු මහත් විලාපය සේ වූයේය. එහිදී ආයුෂ්මත් ආනන්ද මහාසථවිරයන්වහන්සේ, අනිත්‍යතාදිප්‍රතිසංයුක්ත ධම්කථාවෙන් ඒ විලාප නගන මහාජනයාට කරුණු දක්වා සතසා ජෙතවනයට පිවිස බුදුරජුන් වැඩවිසූ ගඳකිළියෙහි දෙර හැර, ඇද පුටු බැහැරට ගෙණ ගසාදමා ගඳකිළිය හැමද, මැලවී ගිය මල්කසළ බැහැර දමා, ඇඳපුටු ඇතුළට ගෙණ, නැවැත, තුබූ තැනම තබා, බුදුරජානන්වහන්සේ වැඩසිටි කාලයෙහි කටයුතුවූ සියලු වත් කළහ.

ඉක්බිති ආනන්ද මහා සථවිරයන්වහන්සේ, බුදුරජානන්වහන්සේගේ පිරිනිවීමෙහි පටන් සිටීම් හිඳීම් බහුලවීමෙන් උතසන්නවූවා පිත් සෙම් ඇති සිරුර සන්සිඳවනුපිණිස දෙවන දවසෙහි ක්ෂීරවිරෙචනය වළඳ, විහාරයෙහි වැඩහුන්හ. එකල්හි සුභ නම් මාණවකයා විසින් තමන් වෙත එවූ තරුණයාහට 'මාණවක! මා විසින් අද සුලු බෙහෙතක් වළඳනලදය, එහෙයින් එහි යෑමට මේ කාලය නොවේ, හෙටවත් එන්නට ලැබුනොත් එන්නෙමු'යි මෙය ඒ සඳහා කියනලදී.

දෙවන දවසෙහි උන්වහන්සේ වෙතක තෙරුන් පැසුළු මහණහුකොට එහි වැඩ සුභ මාණවකයා විසින් විවාරණලද්දහු, දීඝනිකායෙහි දසවන සූත්‍රයවූ සුභ සූත්‍රය වදළසේක. අනතුරුව ආනන්ද මහාසථවිරයන්වහන්සේ ජෙතවන විහාරයෙහි කැවුම් බිඳුම් පිළිසකර කරවා වස් එළඹෙන දවස ලංව සිටිකල්හි රජගහා නුවරට වැඩියසේක. එසේ මහාකාශ්‍යප මහාසථවරයන්වහන්සේද, අනුරුද්ධ මහාසථවිරයන් වහන්සේද, සියලු භික්ෂුසඞ්ඝයාද ගෙන රජගහා නුවරට වැඩමකළාහුය.

එ සමයෙහි වනාහි රජගහා නුවර අටළොස් මහා විහාරවිය. ඒ හැම විහාරම හැරදමන ලද්දහු, ඒ ඒ තැන ඇද වැටුනාහු, ගැවසීගත් කසළ ඇත්තාහුද වූහ. භාග්‍යවතුන්වහන්සේගේ පිරිනිවීමෙහිදී සියලු භික්ෂූහු තමතමන්ගේ පාසිවුරු ගෙණ විහාරද පිරිවෙන්ද හැරදමා ගියහ. ඒ විහාරයන්හි විසූ ස්ථවිරයන්වහන්සේලා, බුදුරජානන්වහන්සේගේ වචනයට පුදනු පිණිසත් තීර්ථකයන්ගේ වාද මුදනු පිණිසත් වෂ්ාසෘතුවෙහි ප්‍රථම මාසයෙහි කැවුම් බිඳුම් පිළිසකර කරම්හයි සිතූහ. තීර්ථකයෝ වනාහි 'ශ්‍රමණ ගෞතමගේ ශ්‍රාවකයෝ ශාස්තෘන් දිවමන්ව සිටියදීම වෙහෙර පිළිදගුම් කළහ, පිරිනිවි කල්හි හැරදමා ගියහයි මෙසේ කියන්නාහ'යි ඒ තීර්ථකයන්ගේ ගැරහුම් බසින් මිදෙනු පිණිසද, උන්වහන්සේලා මෙසේ සිතූහයි කියනලද්දේවේ.

නැවත 'ඇවැත්නි! කැඩුම් බිඳුම් පිළිසකරකිරීම භාග්‍යවතුන්වහන්සේ විසින් පසස්නාලද්දේය, එබැවින් ඇවැත්නි! අපි ප්‍රථම මාසයෙහි කැඩුම් බිඳුම් පිළිසකර කරමු, මධ්‍යම මාසයෙහි රැස්ව ධර්මයත් විනයත් සඬගායනා කරන්නෙමු'යි සථවිර භික්ෂූන්වහන්සේට මේ අදහසවූයේය. ඒ සථවිරභික්ෂූන්වහන්සේ දෙවන දවසෙහි ගොස් රජගෙදෙර සමීපයෙහි සිටගත්හ. එකල්හි අජාසත් රජතෙමේ ඉදිරියට පැමිණ වැඳ 'ස්වාමීනි! මෙහි වැඩියහු කිමැ'යි තමන්විසින් කළයුතු කිස පිළිවිසියේය. ස්ථවිරයන්වහන්සේ අටළොස් මහවෙහෙර පිළිසකරකිරීම පිණිස අත්කම් වුවමනාබව දන්වා සිටියහ. රජතෙමේ 'මැනව, ස්වාමීනි!'යි අත්කම් කරණ මිනිසුන් නියමකොට දුන්නේය.

ඉක්බිති ස්ථවිරයන්වහන්සේ ප්‍රථම මාසයෙහි සියලු වෙහෙර පිළිසකරකරවා රජහට 'මහරජ! වෙහෙර පිළිසකරකිරීම නිමාවට ගියේය, දැන් ධර්මචිනය සඬගායනා කරමහ'යි දන්වූහ. 'ස්වාමීනි! මැනවැ, නියැක සින් ඇතිව කරණු මැනැවැ, මෙහිලා මාගේ අණසක වේවා, ඔබවහන්සේගේ දම්සකවේවා, ස්වාමීනි! මා විසින් කටයුතු යමෙක් වේනම් ඒපිණිස මට අණකළ මැනවැ'යි රජු දන්වා සිටිකල්හි 'මහරජ! ධර්මසඬගායනා කරණ භික්ෂූන්ට රැස්ව හිඳිනට තැනක් පිළියෙල කළයුතුය'යි කීහ. 'ස්වාමීනි! එය කොතැනක කරම්ද'යි ඇසීය. 'මහරජ! වෙහාරපර්වත-පාශ්වයෙහි සපතපණී ගුහාද්වාරයෙහි කිරීම සුදුසුය' යි උන්වහන්සේ දන්වාසිටියහ.

අජාසත් රජ තෙමේ, 'ස්වාමීනි! මැනැවැ'යි විස්කම් දෙවිපුත්තුවිසින් මවනලද්දක් වැනිවූ, මොනවට බෙදූ බිතු ටැම් හිණි මං ඇති, නන්වැදරුම් මල්කමින් හා ලියකමින් විසිතුරුවූ, රජවිමන්සිරි මඩින්නක් වැනිවූ, දෙවිවිමන් සිරියට අපහාස කරන්නක් වැනිවූ, ලක්ෂ්මියගේ වාසස්ථානය වැනිවූ දෙවිමිනිසුන්ගේ නෙත් නැමැති විහඟුන්ට බැසීමට එක් පැන් තොටක් වැනිවූ, ලොව ඇතිතාක් සිත්කලුබව පිඬුකළ තැන් වැනිවූ, දක්කයුතු ඉතා විසිතුරු සැරසුම්වලින් යුත් මණ්ඩපයක් කරවා, ඒ මණ්ඩපය ඵල්බෙන නන්වැදරුම් මල්දම් වමාරන්නක් වැනිවූ සිත්කලු වියන් ඇත්තක්කොට, නන්රුවනින් විසිතුරුවූ මැණික් ඔබ්බා කළ තලය ඇත්තක්කොට, නානාවිධ පුඤ්ඤොපහාරයෙන් විසිතුරුවූ මැනැවින් නිමවූ භූමිකම්නත ඇත්තක් කොට බඹවිමනක් සේ සරසා, ඒ මහා මණ්ඩපයෙහි පන්සියයක් භික්ෂූන්ට අනගි කැප පසතුරුණු පන්සියයක් පණවා, දකුණුදිග ඇසුරුකොට උතුරුදිගට මුණලා සථවිරාසනයද, මණ්ඩප මධ්‍යයෙහි පෙරදිගට මුණලා භාග්‍යවත් බුදුරජානන්වහන්සේට වැඩහිඳීමට සුදුසුවූ ධර්මාසනයද පනවා, මෙහි දළමුවා විජනිපත

තබා 'සාමීනි! මාගේ කටයුතු නිමවන ලදැ'යි භික්ෂු සඞ්ඝයාට සැලකරවිය.

ඉක්බිති භික්ෂූන් වහන්සේලා "ඇවැත්නි! හෙට රැස්වීම වන්නේය. ඔබ ද ශෛක්ෂ්‍යවහු, කටයුතු ඇත්තහුවහු, එහෙයින් ඔබට රැස්වීමට යෑම සුදුසු නොවේ, අප්‍රමත්තවහු'යි ආයුෂ්මත් ආනන්ද මහාස්ථවිරයන්වහන්සේට දන්වා සිටියහ. එකල්හි ආයුෂ්මත් ආනන්ද මහාස්ථවිරයන්වහන්සේ, 'හෙට රැස්වීම වන්නේය, ශෛක්ෂ්‍යවූ ඒ මම රැස්වීමට යන්නෙමි නම්, මාගේ ඒ යෑම සුදුසු නොවේ මැ'යි රෑ බොහෝ වේලාවක් කායගතාසතියෙන් කල්ගෙවා, රෑ අලුයම සක්මනින් බැස වෙහෙරට පිවිස! හොවින්නෙමි'යි කය ආවර්ජනාකළහ. දෙපාදයෝ බිමින් මිදුනාහ. හිස කොට්ටයට නොපැමිණියේද වේ. මේ අතර සිත තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් කිසිවක් අල්ලා නොගෙන, ආස්‍රවයන්ගෙන් මිදීගියේය. මේ ආයුෂ්මත්තෙමේ සක්මනින් පිටත කල්ගෙවා විශෙෂාධිගමයක් උපදවන්නට අසමත්වූයේ, බුදුරජානන්වහන්සේ මට 'ආනන්ද තෝ කළපින් ඇත්තෙහිය, ප්‍රධන වීර්‍යයෙහි යෙදෙව, වහා ආස්‍රවරහිත වෙව'යි මෙසේ වදළෝ නොවෙත්ද'යි සිතුයේය. 'බුදුරජානන්වහන්සේගේ කථාවෙහි දෙෂයෙක් නම් නැත්තේය, මාවිසින් වීර්‍යය පමණ ඉක්මවා දැඩිව පටන් ගන්නාලද්දේය, එයින් මාගේ සිත උඩඟුබවට වැටුනේය, එබැවින් මම වීර්‍යය සමබවෙහි යොදම්'යි සක්මනින් බැස පාදෙත්නාතැන සිට, පා දෙවා වෙහෙරට පිවිස ඇදෙහි හිඳ මදක් විඩා සන්සිඳුවන්නෙම්'යි කය ඇඳට එළවිය. දෙපාද බිමින් මිදුනි. හිස කොට්ටයෙහි නොතැබුනේය. මේ අතර සිත තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් කිසිවක් අල්ලා නොගෙණ ආස්‍රවයන්ගෙන් මිදුනේය. මෙසේ ආනන්ද මහාස්ථවිරයන්වහන්සේගේ අර්හත්වය සතර ඉරියව්වෙන් වෙන්වම සිදුවූයේය එහෙයින් මේ ශාසනයෙහි කවරනම් භික්ෂුනමක් නොහොත්තේ නොහුන්නේ නොසිටියේ සක්මන් නොකරණුයේ අර්හත්වයට පැමිණියේද'යි විචාළකල්හි ආනන්ද මහාස්ථවිරයන්වහන්සේයයි කීම වටියි.

ඉක්බිති දෙවන දවසෙහි ස්ථවිරභික්ෂූන්වහන්සේ කළ බත්කිස ඇත්තාහු පාසිවුරු තැන්පත්කොට ධර්මසභාවෙහි රැස්වූහ. ආනන්ද මහා ස්ථවිරයන්වහන්සේ තමන් රහත්බවට පැමිණීම දන්වනු කැමැත්තාහු භික්ෂූන් සමග ධර්මසභාවට නොවැඩියාහ. භික්ෂූහු වැඩිමහලු පිළිවෙළින් තම තමන්ට පැමිණි අසුන්හි හිඳින්නාහු ආනන්ද මහාස්ථවිරයන්වහන්සේට අසුන තබා වැඩහුන්හ. එහි කිසිවකුන් 'මේ අසුන කවරක්හටද'යි

විවාළකල්හි 'ආනන්ද මහාසථවිරයන් වහන්සේටය'යි කිහ. ආනන්ද මහාසථවිරයන්වහන්සේ කොහි ගියාහුදැයි විවාළාහුය. එකල්හි උන්වහන්සේ 'දැන් මට යෑමට කාලය'යි සිතා තමන්ගේ ආනුභාවය දක්වන්නාහු, පොළොව ගැලී තමන්ගේ අසුන්හිම තමන් දක්වූහ. සමහර මදධ්‍යමභාණිකයෝ අහසින් අවුත් හුන්හයි කියත්.

උන්වහන්සේ මෙසේ අවුත් හුන්කල්හි මහාකාශ්‍යප මහා සථවිරයන්වහන්සේ 'ඇවැත්නි! කිම, පළමුකොට ධර්‍ම සඞ්ගායනා කරමුද, නැත, විනය සඞ්ගායනා කරමුද'යි භික්‍ෂූන්ගෙන් අසා වදළසේක. එහිදී 'සවාමීනි! මහාකාශ්‍යප මහා සථවිරයන්වහන්ස! විනය බුදුශාසනයාගේ ආයුෂයවේ, විනය සිටිකල්හි ශාසනය සිටියේවේ, එහෙයින් පළමුකොට විනය සඞ්ගායනා කරමු'යි දන්වා සිටිකල්හි මහාකාශ්‍යප මහාසථවිරයන්වහන්සේ 'කවරකු දෙවුකොට, විනය සඞ්ගායනාව කරමුද'යි ඇසූහ. 'ආයුෂ්මත' උපාලි මහාසථවිරයන්වහන්සේ දෙවුකොට කරමු'යි. 'ඇයි; එයට ආනන්ද සථවිර තෙමේ නො පොහොනේද'යි ඇසූහ. 'නො පොහොනේ නොවේ, එහෙත් සම්මාසම්බුදුරජානන්වහන්සේ ධරමාණසේක්ම, ආයුෂ්මත් උපාලි මහාසථවිරයන් 'මේ උපාලි තෙමේ මාගේ විනයධර ශ්‍රාවකයන් අතුරෙහි අග්‍රය'යි විනය පඤ්ඤාපතියෙහි ලා එතදග්‍රසථානයෙහි තැබූසේක. එහෙයින් උපාලි මහාසථවිරයන් විචාරා විනය සඞ්ගායනා කරමු'යි කිහ.

අනතුරුව මහාකාශ්‍යප මහාසථවිරයන්වහන්සේ, විනය විචාරණු පිණිස තුමූම තමන් සම්මතකළහ. **'අථ ඛො ආයසමා මහා කසසපො සඞ්ඝං ඤපෙසිඃ- සුණාතු මෙ ආවුසො සඞ්ඝා, යදි සඞ්ඝසස පත්තකලලං අහං උපාලිං විනයං පුචඡෙයයං.''** යනු එහි මේ පාළියවේ. ඉක්බිති ආයුෂ්මත් උපාලි මහා සථවිරයන්වහන්සේ සඞ්ඝයාහට මෙසේ දන්වූහ:- **'සුණාතු මෙ භනෙත සඞ්ඝා යදි සඞ්ඝසස පත්තකලලං අහං ආයසමතා මහාකසසපෙන විනයං පුටඨා විසසජජෙයයං.'** යනු එහි මේ පාළියවේ.

මෙසේ ආයුෂ්මත් උපාලි මහා සථවිරයන්වහන්සේ තුමූම තමන් සම්මත හුනස්නෙන් නැගිට සිවුර එකස්කොට, සථවිර භික්‍ෂූන් වැඳ දත්මුවා විජනිපත ගෙන, ධර්‍මාසනයෙහි වැඩහුන්හ. අනතුරුව ආයුෂ්මත් මහාකාශ්‍යප මහාසථවිරයන්වහන්සේ සථවිරාසනයෙහි වැඩහිඳ ආයුෂ්මත් උපාලි මහාසථවිරයන් වහන්සේගෙන් විනය විවාළසේක:

මහාකාශ්‍යප මහාස්ථවිර - උපාලි ආයුෂ්මත්නි! භාග්‍යවතුන්වහන්සේ විසින් ප්‍රථමපාරාජිකාව කොතැනදී පණවනලදද?

උපාලි මහාස්ථවිර - සවාමීනි! විශාලා මහානගරයේදීය.

මහාකාශ්‍යප මහාස්ථවිර - කවරක්හු අරඹයා පනවන ලදද?

උපාලි මහාස්ථවිර - කලන්දකපුත්‍ර සුදින්න අරබයා

මහාකාශ්‍යප මහාස්ථවිර - කවර වස්තුවක් නිමිතිකොට පනවන ලදද?

උපාලි මහාස්ථවිර - මෙවුන්දම් නිමිතිකොටය.

ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප මහාස්ථවිරයන්වහන්සේ ආයුෂ්මත් උපාලි මහාස්ථවිරයන්වහන්සේ අතින් ප්‍රථම පාරාජිකාව පිළිබඳ වස්තුවද විවාළාහුය. නිදනයද විවාළාහුය. පුද්ගලයාද විවාළාහුය. ප්‍රඥප්තියද විවාළාහුය. අනුප්‍රඥප්තියද විවාළාහුය. ආපත්තියද විවාළාහුය. අනාපත්තියද විවාළාහුය. යම් සේ ප්‍රථම පාරාජිකාව පිළිබඳ වස්තු-නිදන-පුද්ගල-ප්‍රඥප්ති-අනුප්‍රඥප්ති-ආපත්ති-අනාපත්ති විවාළසේක්ද, එසේ ද්විතීය-තෘතීය-චතුර්ථ පාරාජිකා පිළිබඳ වස්තුවද විවාළසේක -පෙ- අනාපත්තියද විවාළසේක. මෙසේ මහාකාශ්‍යප මහාස්ථවිරයන්වහන්සේ විසින් විවාරණලද විනය ප්‍රශ්න උපාලි මහාස්ථවිරයන් වහන්සේ විසඳූහ.

ඉක්බිති මේ සතර පාරාජිකාවන්, **පාරාජිකකණ්ඩ** නම් මේ ය යි සඞ්ග්‍රහයට නගා තැබූහ. තෙළෙස් සඞ්ඝාදිසෙස **තෙරසකයි** තැබූහ. දෙකක් ශික්ෂාපද, අනියතයි තැබූහ. තිසක් ශික්ෂාපද, **නිස්සග්ගියපාචිත්තියයි** තැබූහ. දෙයාතුවක් ශික්ෂාපද, පාචිත්තියයි තැබූහ. සතරක් ශික්ෂාපද, **පාටිදෙසනීයයි** තැබූහ. පන්සැත්තෑවක් ශික්ෂාපද, සෙඛියායි තැබූහ. සතක් ධම්, **අධිකරණසමථයයි** තැබූහ.

මෙසේ මහාවිභඞ්ගය සඞ්ග්‍රහයට නගා භික්ෂුණී විභඞ්ගයෙහි අටක් ශික්ෂාපද, **පාරාජිකකණ්ඩ** නම් මේයයි තැබූහ. සතළොසක් ශික්ෂාපද, **සත්තරසකයයි** තැබූහ. තිසක් ශික්ෂාපද, **නිස්සග්ගිය-පාචිත්තියයි** තැබූහ.

එක්සිය සසැටක් ශික්ෂාපද, **පාචිත්තිය**යි කැබුහ. අටක් ශික්ෂාපද, **පාටිදෙසනීය**යි කැබුහ. පන්සැත්තැවක් ශික්ෂාපද, **සෙඛිය**යායි කැබුහ. සතක් ධම්, **අධිකරණසමථය**යි කැබුහ. මෙසේ භික්ෂූණී විභඩගය සඩ්ග්‍රහයට නගා, මේ උපායෙන්ම බඳු-පරිවාරයන්ද නගා කැබුහ.

මෙසේ මේ උභතො විභඩග බන්ධක පරිවාර සහිතවූ සඩ්ග්‍රහයට නැගූ සියලු විනයපිටකය, මහාකාශ්‍යප මහාසථවිරයන්වහන්සේ මෙසේ විචාළසේක. උපාලි මහා සථවිරයන්වහන්සේ විසඳූසේක. මේ පිළිවිසීම් විසඳීම් අවසානයෙහි පන්සියයක් මහරහතුන්වහන්සේ, සඩ්ග්‍රහයට නැගූ පරිදිම ගණසජ්ඣායනා කළහ. විනය සඩ්ග්‍රහාවසානයෙහි උපාලි මහාසථවිරයන්වහන්සේ දත්මුවා විජනිපත තබා ධම්මාසනයෙන් බැස වැඩිමහලු තෙරුන් වැඳ තමන්ට පැමිණි අසුනෙහි වැඩහුන්හ.

විනය සඩ්ගායනාකොට, ධම්ය සඩ්ගායනා කරණු කැමති ආයුෂ්මත් මහාකාශ්‍යප මහාසථවිරයන්වහන්සේ, 'ධම්ය සඩ්ගායනා කරන්නාවූ අප විසින් කවර පුද්ගලයකු දෙවුකොට ධම්ය සඩ්ගායනා කටයුතුද'යි භික්ෂූන් විචාළසේක. භික්ෂූහු 'ආනන්ද මහාසථවිරයන් වහන්සේ දෙවුකොට'යි කීහ. එකල්හි ආයුෂ්මත් මහාකාශ්‍යප මහාසථවිරයන්වහන්සේ, **'සුණාතු මෙ ආවුසො සඩ්ඝො යදි සඩ්ඝස්ස පත්තකල්ලං අහං ආනන්දං ධම්මං පුච්ඡෙය්‍යං'**යි සඩ්ඝයාහට දන්වාවූසේක. නැවැත ආයුෂ්මත් ආනන්ද මහා සථවිරයන්වහන්සේ, **'සුණාතු මෙ භන්තෙ සඩ්ඝො යදි සඩ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මන්තං මහාකස්සපෙන ධම්මං පුට්ඨො විස්සජ්ජෙය්‍යං'**[A]යි සඩ්ඝයාහට දන්වාවූසේක.

ඉක්බිති ආයුෂ්මත් ආනන්දමහා සථවිරයන්වහන්සේ හුනස්නෙන් නැගිට සිවුර එකස්කොට සථවිරභික්ෂූන් වැඳ දත්මුවා විජනිපත ගෙන ධම්මාසනයෙහි වැඩ හුන්හ. මහාකාශ්‍යප මහා සථවිරයන්වහන්සේ සථවිරාසනයෙහි වැඩහිඳ ආයුෂ්මත් ආනන්ද මහා සථවිරයන්වහන්සේගෙන් ධම්ය විචාළසේක.

මහා කාශ්‍යප මහාසථවිර - ආනන්ද ආයුෂ්මත'නි, භාග්‍යවතුන්වහන්සේ විසින් **ජාලසූත්‍රය** කොතැන්හිදී වදරණලදද?

ආනන්ද මහාසථවිර - සවාමීනි, රජගහා තුවරටත් නාලන්දවටත් අතර අම්බලට්ඨිකා නම් රජළයන්හි කළ රාජගෘහයෙහිදීය.

---

* වුල්ලවග්ග - පඤ්චසතිකඛන්ධක

මහාකාශ්‍යප මහාස්ථවිර - කවරක්හු අරබයා වදරණලදද?

ආනන්ද මහාස්ථවිර - **සුපපිය** පරිව්‍රාජක හා **බ්‍රහ්මදත්ත** මාණවක අරබයාය.

ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප මහාස්ථවිරයන්වහන්සේ ආයුෂ්මත් ආනන්ද මහාස්ථවිරයන්වහන්සේගෙන් බ්‍රහ්මජාල සූත්‍රය පිළිබඳ නිදානයද විචාළාහුය. පුද්ගලයාද විචාළාහුය.

මහාකාශ්‍යප මහාස්ථවිර - ආනන්ද ආයුෂ්මත්නි! සාමඤ්ඤඵල සූත්‍රය කොතැනකදී වදරණලදද?

ආනන්ද මහාස්ථවිර - සේඛාමිනි, රජගහානුවර ජීවකයාගේ අඹුඋයන්හිදීය.

මහාකාශ්‍යප මහාස්ථවිර - කවරක්හු සමගද?

ආනන්ද මහාස්ථවිර - **අජාතශත්‍රු වෙදෙහියගේ** පුතු සමගය.

ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප මහාස්ථවිරයන්වහන්සේ ආයුෂ්මත් ආනන්ද මහා ස්ථවිරයන්වහන්සේගෙන් සාමඤ්ඤඵල සූත්‍රය පිළිබඳ නිදානයද විචාළාහුය. පුද්ගලයාද විචාළාහුය. උන්වහන්සේ මේ උපායෙන් පස්නිකාය විචාළසේක. **දීඝනිකාය - මජ්ඣිමනිකාය - සංයුත්තනිකාය - අඞ්ගුත්තරනිකාය - ඛුද්දකනිකාය** යන පස්නිකාය ග්‍රන්ථවෙයි. එහි **ඛුද්දකනිකාය** නම්, දීඝනිකායාදීවූ නිකාය සතර හැර, අවශෙෂ බුද්ධවචනයි. බුද්දකනිකායෙහිලා ගැනෙන විනය ආයුෂ්මත් උපාලි මහා ස්ථවිරයන් වහන්සේ විසින් විසඳන ලද්දේය. සෙසු බුද්දකනිකාය හා දීඝනිකායාදී නිකාය සතර ආයුෂ්මත් ආනන්ද මහා ස්ථවිරයන්වහන්සේ විසින් විසඳනලද්දේය.

ඒ මේ සියළුම බුද්ධවචනය, රස වශයෙන් එක්වැදෑරුම්ය. ධර්මවිනය වශයෙන් දෙවැදරුම්ය. ප්‍රථම මධ්‍යම පශ්චිම වශයෙන් තෙවැදෑරුම්ය. පිටක වශයෙන් එසේ තෙවැදරුම්ය. නිකාය වශයෙන් පස්වැදරුම්ය. අඞ්ග වශයෙන් නවවැදරුම්ය. ධර්මස්කන්ධ වශයෙන් සුවාසූදහස් ප්‍රකාරයයි දතයුතුය. රස වශයෙන් එක්වැදරුම්වූයේ කෙසේද. යම් කලක භාග්‍යවතුන් වහන්සේ නිරුත්තරවූ සම්‍යක්සම්බොධිය මැනවින් අවබෝධකොට, යම් කලක අනුපාදිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවිසේක්ද, මේ අතර පන්සාළිස් අවුරුද්දක් මුළුල්ලෙහි දෙවිමිනිස් නා යක් ඇතට අනුශාසනා කරන්නාවූ හෝ උදනාදි වශයෙන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ භාග්‍යවතුන්වහන්සේ

විසින් වදළාවූ ඒ සියලු ධර්මය එකම රසයවූ විමුක්තිරසයමවේ. මෙසේ රස වශයෙන් එක්වැදරුම්වේ.

ධර්මවිනය වශයෙන් දෙවැදරුම්වූයේ කෙසේද: මේ සියල්ලම ධර්මය, විනයයි ගිණීමට යන්නේය. එහි විනයපිටකය විනය නම්වේ. අවශෙෂ බුද්ධවචනය ධර්ම නම්වේ. එහෙයින්ම **'යන්නූන මයං ආවුසො ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායෙය්‍යාම'** යනුද, **'අහං උපාලිං විනයං පුච්ඡෙය්‍යං, ආනන්දං ධම්මං පුච්ඡෙය්‍යං'** යනුද වදළසේක. මෙසේ ධර්මවිනය වශයෙන් දෙවැදරුම්වේ.

ප්‍රථම මධ්‍යම පශ්චිම වශයෙන් තෙවැදරුම්වූයේ කෙසේද: මේ සියලු ධර්මයම, ප්‍රථමබුද්ධවචනය, මදධ්‍යමබුද්ධවචනය, පශ්චිම බුද්ධවචනයයි තෙවැදරුම්වේ. එහි,

'අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං.

ගහකාරක, දිට්ඨොසි පුන ගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛිතං,
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා'[A]

යන මෙය ප්‍රථමබුද්ධවචනයවේ. එහෙත් සමහර කෙනෙක් **'යදා හවේ පාතුභවන්ති ධම්මා'**[B] යන ඛන්ධකයෙහිවූ උදනගාථා ප්‍රථමබුද්ධවචනයයි කියත්. මේ වනාහි සවීඥභාවයට පැමිණියාවූ සොමනසින් යුත් නුවණින් ප්‍රත්‍යයාකාරය ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ භාග්‍යවතුන්වහන්සේහට පැළවියද උපන් උදනගාථායි දතයුතුය. පරිනිර්වාණකාලයෙහි **'හන්දදානි භික්ඛවෙ! ආමන්තයාමි වො, වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථ'**[C]යි යමක් වදළසේක්ද, මෙය පශ්චිමබුද්ධවචනයවේ. ප්‍රථම-පශ්චිමබුද්ධවචන දෙක අතුරෙහි යම් ධර්මයක් වදරණලද ද, මෙය මදධ්‍යමබුද්ධවචනයවේ. මෙසේ ප්‍රථම-මධ්‍යම-පශ්චිම වශයෙන් තෙවැදරුම්වේ. පිටක වශයෙන් තෙවැදරුම්වූයේ කෙසේද: මේ සියලුම බුද්ධවචනය, **විනයපිටක-සුත්තන්තපිටක-අභිධම්මපිටක**යි තෙවැදරුම් හෙද ඇත්තේමවේ.

එහි ප්‍රථමසඞ්ගීතියෙහි සඞ්ගායනා කරන ලද්දවූද සඞ්ගායනා නොකළාවූද සියල්ලම එක්කොට, භික්ෂු භික්ෂුණී උභය ප්‍රාතිමොක්ෂය, භික්ෂු භික්ෂුණී උභය විභඞ්ගය, මහාවග්ග, චුල්ලවග්ග දෙක්හි ආවාවූ

A ධම්මපද B මහාවග්ගමහාඛන්ධක C දීඝනිකාය මහාපරිනිබ්බාණ

දඩවිංශතිසංඛන්ධකය, ඡොඩශපරිවාරය යන මේ ධර්මසමූහය විනයපිටක නම්වේ.

බ්‍රහ්මජාලසූත්‍රය ආදිකොට සිටි සූත්‍රස්වරූපයන්ගේ සඞ්ග්‍රහය දීඝනිකායවේ. මූලපරියාය සූත්‍රය ආදිකොට එක්සිය දෙපණසක් සූත්‍රයන්ගේ සඞ්ග්‍රහය මජ්ඣිමනිකායවේ. ඔඝතරණ සූත්‍රය ආදිකොට සත්දහස් සත්සිය දෙසැටක් සූත්‍රයන්ගේ සඞ්ග්‍රහය සංයුත්ත නිකාය. චිත්තපරියාදන සූත්‍රය ආදිකොට නවදහස් පන්සිය සත්පණසක් සූත්‍රයන්ගේ සඞ්ග්‍රහය අඞ්ගුත්තර නිකායවේ. ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්ථු, පෙතවත්ථු, ථෙරගාථා, ථෙරීගාථා, ජාතක, නිද්දෙස, පටිසම්භිදා, අපදාන, බුද්ධවංස, චරියාපිටක යන මේ ග්‍රන්ථයන් වසයෙන් පසළොස් හෙද ඇතියේ ඛුද්දකනිකායයි. මේ වනාහි සුත්තන්තපිටක නම්වේ.

ධම්මසඞ්ගණී, විභඞ්ග, ධාතුකථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන මෙය අභිධම්මපිටක නම්වේ.

එහි:

'විවිධවිසෙසනයත්තා - විනයනතො වෙව කායවාචානං,
විනයත්ථවිදූහි අයං - විනයෝ විනයොති අක්ඛාතෝ'

විනයාර්ථ දන්නවුන් විසින්, මේ විනය නන්වැදරුම්වූ විශෙෂ නය ඇතිබැවින්, කය, වචන හික්මවනබැවින් විනයයි කියනලද්දේය.

මෙහි විවිධවූ පඤ්චවිධ ප්‍රාතිමොක්ෂාදෙශ, පාරාජිකාදිඅපත්තා - පත්තිඤ්ඣාන්ධ, මාතෘකා විභඞ්ගාදි ප්‍රභෙද නයින්ද, විශෙෂවූ ලොකවජ්ජ ශික්ෂාවන්හි දළහීකම් ප්‍රයොජනය හා ප්‍රඥප්තිවජ්ජ ශික්ෂාවන්හි ශිථිලීකරණ ප්‍රයොජනය ඇති අනුප්‍රඥප්ති නයින්ද, කායික, වාචසිකාදධ්‍යාචාරයන් වළකාලීමෙන්ද, මේ විනය කය වචන හික්මවාද, එහෙයින් විවිධ නය ඇති බැවින්, විශෙෂ නය ඇති බැවින්, කය වචන හික්මවන බැවින් විනයයි කියනලද්දේය. ඒ හේතුවෙන් මේ ගාථාවචනය මේ විනය පිළිබඳ වචනාර්ථඥනය පිණිස කියනලදී.

අන්‍ය සූත්‍රය වනාහි:

'අත්ථානං සූචනතො - සුවුත්තතො සවනතො ච සුදනතො,
සුත්තාණසුත්තසභාගතො ච - සුත්තං සුත්තන්ති අක්ඛාතං'

අත්ථ ප්‍රකාශ කරන බැවින්, මැනවින් කියූබැවින්, අත්ථ ප්‍රසවය කරනබැවින්, අරුත් වගුරණබැවින්, මැනවින් රක්නාබැවින්, හූ සමානබැවින් සූත්‍රයයි කියනලද්දේය.

ඒ සූත්‍රය වනාහි ආතමාත්ථපරාත්ථාදිභෙද ඇති අත්ථ ප්‍රකාශකරන්නේය. මෙහි අත්ථ විනෙයජනයාගේ අදහසට අනුකූල භාවයෙන් වදළ බැවින් මොනවට වදරණලද්දේවේ. මේ සූත්‍රය සස්‍යය ඵලප්‍රසවය කරන්නාසේ යථොක්තාත්ථියන් ප්‍රසවය කෙරේයයි කියනලද්දේවේ. දෙනක් යම්සේ කිරි වගුරාද, එසේ මේ සූත්‍රය අරුත් වගුරන්නේයයි කියනලද්දේවේ. ඒ අරුත් මොනවට පාලනය කරයි, රකියියි, කියනලද්දේවේ. මේ සූත්‍රය හූය හා සමානදවේ. වඩුවන්ගේ දලිනූල, ඒ අනුසාරයෙන් දඬුකඩ සැසීමට පැළීමට යම්සේ පමණවේද, එසේ මේ සූත්‍රයද නුවණැතියනට අත්ථඥනය පිණිස පමණවන්නේය. යම් සේ හුයෙන් ඇවුණු මල්, නොවිසිරෙණු ලැබේද, නොනැසෙනු ලැබේද, එසේ මේ සූත්‍රයෙන් සඩග්‍රහ කරනලද අත්ථ නොවිසිරී නොනැසී පවතී. මේ ගාථාවචනය සූත්‍රය පිළිබඳ වචනාත්ථ ඥනය පිණිස කියනලද්දේය.

අන්‍ය අභිධම්ය වනාහි:

'යං එත්ථ වුද්ධිමන්තෝ - සලක්ඛණ පූජිතා පරිච්ඡින්නා,
වුත්තාධිකා ච ධම්මා - අභිධම්මෝ තෙන අක්ඛාතෝ'

යම් හෙයකින් මෙහි වෘද්ධිමත් ධම්යෝ, සුවලක්ෂණ ධම්යෝ, පූජිත ධම්යෝ, පරිච්ඡින්න ධම්යෝ, උක්තාධික ධම්යෝ වෙත්ද, එහෙයින් අභිධම්යයි කියනලද්දේය.

මේ අභි ශබ්දය වනාහි, වෘද්ධි, සුවලක්ෂණ, පූජිත, පරිච්ඡින්න, අධිකාත්ථියන්හි දක්නාලැබේ. ඒ එසේමය. මේ අභිශබ්දය **'බාළ්හා මේ දුක්ඛා වෙදනා අභික්කමන්ති'**[A] යනාදි තන්හි වෘද්ධියෙහි ආයේය. **'යා තා රත්තියෝ අභිඤ්ඤාතා අභිලක්ඛිතා'**[B] යනාදි තන්හි සුවලක්ෂණයෙහි, **'රාජාභිරාජා මනුජින්දෙ'**[C] යනාදි තන්හි පූජිතයෙහි, **"පටිබලෝ විනෙතුං අභිධම්මෙ අභිවිනයෙ"**[D] යනාදි තන්දී පරිච්ඡින්නයෙහි ආයේය. අන්‍යොන්‍ය සඩකර විරහිත ධම්යෙහි හා විනයෙහි කියනලද්දේය. **"අභික්කන්තෙන වණ්ණෙන"**[E] යනාදි තන්හි අධිකයෙහි ආයේය. මේ අභිධම්යෙහිද **'රූපූපත්තියා මග්ගං භාවෙති මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං**

A බොජ්ඣඩ්ගසූත්ත
B මජ්ඣිමනිකාය - භයභෙරවසූත්ත
C සූත්තනිපාත - සෙලසූත්ත
D මහාවග්ග - මහාඛන්ධක
E විමානවත්ථු

එරිත්වා විහරති'[A] යනාදි නයින් වෘද්ධිමත් ධර්ම, **'රූපාරම්මණං වා සද්දාරම්මණං වා'**[B] යනාදි නයින් අරමුණු කරනකොට, හැදහියයුතුබැවින් සවිලක්ෂණ ධර්ම, **'සෙක්ඛා ධම්මා, අසෙක්ඛා ධම්මා ලොකුත්තරා ධම්මා'**[C] යනාදි නයින් පූජිත ධර්ම, පූජාර්හධර්ම යනු අදහසය. **'එසෙසා හොති වෙදනා හොති'**[D] යනාදි නයින් සවිභාවයෙන් පිරිසිඳුනු බැවින් පරිච්ඡින්න ධර්ම, **'මහග්ගතා ධම්මා අප්පමාණා ධම්මා අනුත්තරා ධම්මා'**[E] යනාදි නයින් අධික ධර්ම කියනලදි. එහෙයින් මේ ගාථාවචනය මොහුගේ වචනාර්ථඥනය පිණිස කියනලද්දේය.

මෙහි අසාධාරණවූ විනයාදීවූ කොටස් තුණ අතුරෙහි යමක් සාධාරණවූයේද ඒ පිටකශබ්දය වන්නේය.

'පිටකං පිටකත්ථවිදූ - පරියත්තිභාජනත්ථතො ආහු,
තෙන සමොධානෙත්වා - තයොපි විනයාදයො ඤෙය්‍යා'

පිටක ශබ්දයේ අර්ථය දන්නාහු, පර්‍යාපතියට බඳුන්ය යන අර්ථවිසින් පිටකැයි කීහු. එහෙයින් ඒ පිටකශබ්දය හා එක්කොට විනයාදීවූ පිටකවන්නේයයි දතයුතුය.

පර්‍යාපතිය වනාහි **'මා පිටක සම්පදනෙන'**[F] යනාදි තන්හි පිටකැයි කියනුලැබේ. **'අථ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දල පිටකං ආදය'**[G] යනාදි තන්හි යම්කිසි බඳුනක් කියනුලැබේ.

මෙසේ දෙවැදරුම් අරුත් ඇති ඒ පිටකශබ්දය හා සමාසකොට, විනයවූයේද, හේමය, පර්‍යාපතිභාවයෙන් හෝ ඒ ඒ අර්ථයන්ට භාජනභාවයෙන් පිටකවූයේද, හේම, නුයි විනයපිටක නම්වේ. ඒ කියූ නයින්ම, සූත්‍රවූයේද, හේමය, පිටක වූයේද හේම, නුයි සූත්‍රපිටක නම්වේ. අභිධම්ම වූයේද, හේමය, පිටක වූයේද, හේම, නුයි අභිධම්මපිටක නම්වේයයි මෙසේ මේ විනයාදීවූ තුණ දතයුත්තේය. මෙසේ දැනම නැවත ඒ පිටකයන්හි නානාවිධ කෞශල්‍යය පිණිස:

'දෙසනා සාසනකථා - භෙදං තෙසු යථාරහං,
සික්ඛාපපභාණගම්භීර - භාවඤ්ච පරිදීපයෙ.'

A විභඞ්ග - අපමඤ්ඤාවිභඞ්ග
B ධම්මසඞ්ගණී - රූපාවචරකුසලකථා
C ධම්මසඞ්ගණී - තිකමාතිකා
D ධම්මසඞ්ගණී - චිත්තුපාදකණ්ඩ
E ධම්මසඞ්ගණී - තිකමාතිකා
F තිකඩ්ගුත්තර - කාලාමසූත්ත
G මජ්ඣිමනිකාය - කකචූපමසූත්ත

'පරියත්තිභෙදං සම්පත්තිං - විපත්තිං වාපි යං යහිං,
පාපුණාති යථා භික්ඛු - තම්පි සඛ්ඛං විභාවයෙ'

ඒ පිටකයන්හි දෙශනාභෙදය, ශාසනභෙදය, කථාභෙදය හා ශික්ෂා - ප්‍රහාණ - ගම්භීර භාවයන්ද සුදුසු පරිදි දක්වන්නෙමි. යම් විනයාදියෙක්හි පර්‍යාප්තිභෙදයකට, සම්පත්තියකට, විපත්තියකට යන යමකට, මහණෙක් යම්සේ පැමිණේද, ඒ සියල්ලද දක්වන්නෙමි.

මේ එහි පරිදීපනවිභාවනාය:- මේ ත්‍රිපිටකය පිළිවෙළින් **ආණාදෙසනා, වොහාරදෙසනා, පරමත්ථදෙසනායිද, යථාපරාධ සාසන, යථානුලොමසාසන, යථාධම්මසාසනයිද, සංවරාසංවර කථා, දිට්ඨිවිනිවෙඨනකථා, නාමරූපපරිවෙඡදකථා**යිද, කියනුලැබේ.

මෙහි අණ පැණවීමට සුදුසුවූ භාග්‍යවතුන්වහන්සේ විසින් ආඥාබාහුල්‍යයෙන් දෙසූබැවින් විනයපිටකය, ආණාදෙසනා නම්. ව්‍යවහාරයෙහි දක්ෂවූ භාග්‍යවතුන්වහන්සේ විසින් ව්‍යවහාර බාහුල්‍යයෙන් දෙසූබැවින් සූත්‍රපිටකය වොහාරදෙසනා නම්. පරමාර්ථයෙහි දක්ෂවූ භාග්‍යවතුන්වහන්සේ විසින් පරමාර්ථ බාහුල්‍යයෙන් දෙසූබැවින් අභිධම්මපිටකය පරමත්ථදෙසනා නම් වන්නේයයි කියනුලැබේ.

එසේ අපරාධ බහුලවූ යම් ඒ සත්ත්වයෝ වෙත්ද, ඔවුහු අපරාධයට සුදුසු සේ මෙහි අනුශාසනා කරනලදහයි ප්‍රථමවූ විනයපිටකය, යථාපරාධසාසනයිද, නන් වැදරුම්වූ ආශය, අනුශය, චරිතය, අධිමුත්ති ඇති සත්ත්වයෝ අනුලොම්වූ පරිදි මෙහි අනුශාසනා කරනලදහයි දෙවැනිවූ සූත්‍රපිටකය, යථානුලොමසාසනයිද, ධම්සමූහ මාත්‍රයෙහි මමය, මාගේය, යන හැඟීම් ඇති සත්ත්වයෝ ධම්සභාවයට අනුරූප පරිදි මෙහි අනුශාසනා කරනලදහයි තෙවැනිවූ අභිධම් පිටකය, යථාධම්මසාසනයිද කියනුලැබේ.

එසේ අධ්‍යාචාරයට පටහැනිවූ කුදුමහත් සංවරාසංවර මෙහි කියනලදැයි ප්‍රථමවූ විනයයපිටකය සංවරාසංවරකථායිද, දෙසැට මිසදිටුවට පටහැනිවූ දෘෂ්ටිවිමුක්තිය, මෙහි කියනලද'යි දෙවැනිවූ සූත්‍රපිටකය, දිට්ඨිවිනිවෙඨනකථායිද, රාගාදි කෙලශයන්ට පටහැනිවූ නාමරූපපරිවෙඡදය මෙහි කියනලදැයි තෙවැනිවූ අභිධම්පිටකය නාමරූපපරිවෙඡදකථායිද කියනුලැබේ.

මේ ත්‍රිපිටකයෙහිම ත්‍රිවිධශික්ෂා, ත්‍රිවිධප්‍රහාණ, චතුර්විධ ගම්භීරභාවයද දතයුතුය. ඒ එසේමය. විනයපිටකයෙහි විශෙෂයිසින්

අධිශීලශික්ෂාවද, සූත්‍රපිටකයෙහි අධිචිත්තශික්ෂාවද, අභිධම්පිටකයෙහි අධිප්‍රඥශික්ෂාවද කියනලදහ.

ශීලය කෙලෙසුන්ගේ ව්‍යතික්‍රමයට පටහැනිබැවින් විනයපිටකයෙහි ව්‍යතික්‍රමප්‍රහාණයද, සමාධිය නීවරණයන්ගේ නැඟිසිටීමට පටහැනිබැවින් සූත්‍රපිටකයෙහි පර්‍යුත්ථානප්‍රහාණයද, ප්‍රඥව කාමරාගාදි අනුශයන්ට පටහැනිබැවින් අභිධම්පිටකයෙහි අනුශයප්‍රහාණයද, ප්‍රථමවූ විනයපිටකයෙහි කෙලෙසුන්ගේ තදඞ්ගප්‍රහාණයද, අන්‍යවූ සූත්‍ර, අභිධම් පිටක දෙක්හි විෂ්කම්භණ, සමුච්ඡේද ප්‍රහාණද, ප්‍රථමවූ විනයපිටකයෙහි දුශ්චරිත සඞ්කලශයන්ගේ ප්‍රහාණයද, අන්‍යවූ සූත්‍ර, අභිධම් පිටකදෙක්හි තෘෂ්ණාදෘෂ්ටි සඞ්කලශයන්හි ප්‍රහාණයද කියනලදහ.

මෙහි එක් එක් පිටකයෙහි චතුර්විධවූ ධම්මාර්ථදෙශනා ප්‍රතිවෙධ භාෂාවයි. ගම්භීරභාවය දතයුතුය. එහි ධම් නම්, පාළිභාෂාවයි. අර්ථ නම්, එ' පාළිභාෂාව පිළිබඳ අර්ථයය. දෙශනා නම්, භාග්‍යවතුන්වහන්සේ විසින් සිතින් ව්‍යවස්ථා කරනලද ඒ පාළිභාෂාව පිළිබඳ දෙශනාය. ප්‍රතිවෙධ නම්, පාළිභාෂාව පිළිබඳ වූත් පාල්‍යර්ථය පිළිබඳවූත් තත්ත්වාබොධයයි. මේ ත්‍රිපිටකයෙහි එන මේ ධම්මාර්ථදෙශනා ප්‍රතිවෙධ, යම් හෙයකින් සසාදීන් විසින් මහාසමුද්‍රයසේ, මන්දබුද්ධීන් විසින් දුකින් බැසගත යුත්තාහුද, නොලැබිය හැකි පිහිට ඇත්තාහුද, එහෙයින් ගම්භීරයහ. මෙසේ මෙහි එක් එක් පිටකයෙහි චතුර්විධවූ ගම්භීරභාවයද දතයුතුය.

මෙහිලා අන්‍ය ක්‍රමයක් වේ: ධම් නම්, හෙතුවයි. **'හෙතුම්හි ඤණං ධම්මපටිසම්භිද'**[A]යි මෙය වදරණලද්දේය. අර්ථ නම්, හෙතුඵලයයි. **'හෙතුඵලෙ ඤණං අත්ථපටිසම්භිද'**[B] යි මෙය වදරණලද්දේය. දෙශනා නම්, ප්‍රඥප්තියයි. ධම්යවූ පරිදි, ධම්ය නොඉක්මවා අර්ථ ව්‍යඤ්ජන වශයෙන් විපරිත නොකොට, කීමය යන අභිප්‍රායය ප්‍රතිවෙධ නම්, මනා අවබොධයයි. එයද ලෞකිකද, ලොකොත්තරදවේ. එහි ලෞකිකය ධම්මාර්ථාදිය අරමුණු කොටම පවත්නා බැවින් තද්විෂයක මොහවිද්ධවංසනයෙන් අසමෙමාහ විසින්ද කාරණයන්හි කායඃඍතුරූප විසින්ද, කායඃඍතුරූපයන්හි කාරණාතුරූප විසින්ද ෂඩ්විධ නාම ප්‍රඥප්තීන් අතුරෙහි ප්‍රඥප්තිපථාතුරූප විසින්ද අවබොධයයි දතයුතුය.

A විභඞ්ගපකරණ - පටිසම්භිදාවිභඞ්ග B විභඞ්ගපකරණ - පටිසම්භිදාවිභඞ්ග

දන් යම්හෙයකින් මේ පිටකයන්හි කාරණප්‍රභෙදවූ හෝ කාරණමවූ, කාර්‍යප්‍රභෙදවූ කාර්‍යමවූ යමක්වේද, යම්සේ හැහවිය යුතුවූ යම් අර්ථයක් අසන්නවුන්ගේ නුවණට අභිමුඛවේද, ඒ ඒ ලෙසින් එයරුත් පවසන දෙශනාවක්වේද, මේ ත්‍රිපිටකයෙහි යම් අවිපරීතාවබොධ නම්වූ ප්‍රතිවෙධයක්වේද, මේ සියල්ලම රැස්නොකළ කුසල්සමූහ ඇති නුවණැතියන් විසින් සසාදීන් විසින් මහාසමුද්‍රය මෙන් බැසිය නොහැක්කේද, නොලැබිය හැකි පිහිටද ඇත්තේද එහෙයින් මෙසේද මෙහි එක්එක් පිටකයෙහි චතුර්විධගම්භීරභාවය දතයුතුය.

මෙසේ මේ ත්‍රිපිටකයෙහි ත්‍රිවිධපර්‍යාප්තිභෙදය දතයුතුය. අලගද්දූපමපරියත්ති, නිස්සරණර්‍ථපරියත්ති, භණ්ඩාගාරිකපරියත්තියි පර්‍යාප්ති තුනක්වේ. එහි නොමනාව උගත් අන්හට ගැරහීම් ආදිය හෙතුකොට පුහුණුකළ පර්‍යාප්තිය අලගද්දූපමපරියත්ති නම්වේ. එය මෙසේ වදළසේක: **'සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො අලගද්දත්‍ථිකො අලගද්දගවෙසී අලගද්දපරියෙසනං චරමානො, සො පස්සෙය්‍ය මහන්තං අලගද්දං, තමේනං හොගෙ වා නඞ්ගුට්ඨෙ වා ගණ්හෙය්‍ය, තස්ස සො අලගද්දෙ පටිපරිවත්තිත්‍වා හත්‍ථෙ වා බාහාය වා අඤ්ඤතරස්මිං වා අඞ්ගපච්චඞ්ගෙ වා ඛසෙය්‍ය, සො තතොනිදානං මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං, තං කිස්ස හෙතු, දුග්ගහිතත්තා භික්ඛවෙ අලගද්දස්ස, එවමේව ඛො භික්ඛවෙ ඉධෙකච්චෙ මොඝපුරිසා ධම්මං පරියාපුණන්ති සුත්තං -පෙ- වෙදල්ලං, තෙ තං ධම්මං පරියාපුණිත්‍වා තෙසං ධම්මානං පඤ්ඤාය අත්‍ථං න උපපරික්ඛන්ති, තෙසං තෙ ධම්මා පඤ්ඤාය අත්‍ථං අනුපපරික්ඛතං න නිජ්ඣානං ඛමන්ති, තෙ උපාරම්භානිසංසා චෙව ධම්මං පරියාපුණන්ති ඉතිවාදප්පමොක්ඛානිසංසා ච, යස්සච්ඡත්‍ථාය ධම්මං පරියාපුණන්ති, තං චස්ස අත්‍ථං නානුභොන්ති, තෙසං තෙ ධම්මා දුග්ගහීතා දීඝරත්තං අහිතාය දුක්ඛාය සංවත්තන්ති, තං කිස්ස හෙතු; දුග්ගහිතත්තා භික්ඛවෙ ධම්මානං.'**[A] යි.

යම් පර්‍යාප්තියක් මනාව උගන්නා ලද්දී ශීලස්කන්ධාදීන්ගේ පිරීමම කැමතිවන්නහු විසින් පුහුණු කරනලද්දේ අන්හට ගැරහීම් ආදිය හෙතුකොට නොපුහුණු කරනලද්දේ, එය නිස්සරණර්‍ථපරියත්ති නම්වේ. එය මෙසේ වදළසේක: **'තෙසං තෙ ධම්මා සුග්ගහීතා දීඝරත්තං හිතාය සුඛාය සංවත්තන්ති තං කිස්ස හෙතු; සුග්ගහිතත්තා භික්ඛවෙ ධම්මානං.'**[B]

A මජ්ඣිමනිකාය - අලගද්දසුත්ත

B මජ්ඣිමනිකාය - අලගද්දසුත්ත

යම් පය්‍යාප්තියක් දන්නාලද සකඬ ඇත්තාවූ, ප්‍රහීණකළ කෙලෙස් ඇත්තාවූ, වැඩූ මාගී ඇත්තාවූ, පිළිවිදි රහත්පල ඇත්තාවූ, සාක්ෂාත්කළ නිරොධය ඇත්තාවූ ක්ෂීණාස්‍රවයන්වහන්සේ, හුදෙක් ප්‍රවේණි පාලනයපිණිස වංශානුරක්ෂණය පිණිස පුහුණුකෙරෙත්ද, භාණ්ඩාගාරිකපරියත්ති නම්වේ.

විනයයෙහි සුපිළිපන් මහණ ශීලසම්පත්තිය නිසා ත්‍රිවිද්‍යාවනට පැමිණේ. මෙසේ කියන්නේ විනය පිටකයෙහි ඒ ත්‍රිවිද්‍යාවන් පිළිබඳවූම ප්‍රභේද කථා ඇතිබැවිනි. සූත්‍රයෙහි සුපිළිපන් මහණ සමාධිසම්පත්තිය නිසා ෂඩභිඥවනට පැමිණේ. එහි සූත්‍රපිටකයෙහි ඒ ෂඩභිඥ පිළිබඳවූම ප්‍රභේද කථා ඇතිබැවින් මෙසේ කියන්නාහුය. අභිධර්මයෙහි සුපිළිපන් මහණතෙමේ, ප්‍රඥාසම්පත්තිය නිසා සිවුපිළිසිඹියාවනට පැමිණේ. අභිධර්මයෙහි ඒ සිවුපිළිසිඹියා පිළිබඳවූම ප්‍රභේද කථා ඇතිබැවිනි. මෙසේ මේ ත්‍රිපිටකයෙහි සුපිළිපන් මහණතෙමේ, පිළිවෙළින් මේ ත්‍රිවිද්‍යා ෂඩභිඥ චතුර්විධ ප්‍රතිසංවිද්භෙද සම්පත්තියට පැමිණේ.

විනයයෙහි දුපිළිපන් මහණ භාග්‍යවතුන්වහන්සේ විසින් අනුදන්නාලද සුවපහස් ඇති සුවපහසින්යුත් ඇතිරිලි පොරෝණ ආදීන්ගේ පහස හා සමකොට, භාග්‍යවතුන්වහන්සේ විසින් ප්‍රතික්ෂේපකරනලද ස්ත්‍රීසුඝාදිඋපාදින්නවස්තූන්ගේ පහස් ආදියෙහිද නිරවද්‍ය සංඥ ඇත්තේවේ. මෙය **‘තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායාය’**[A]යි වදළසේක්මය. මෙසේ හැඟීම් ඇති මහණ, ඒ හැඟීම් හෙතුවෙන් දුශ්ශීලභාවයට පැමිණේ.

සූත්‍රයෙහි දුපිළිපන් මහණ, **‘චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා’**[B] යනාදී තන්හි භාග්‍යවතුන්වහන්සේගේ අදහස නොදන්නේ, එය විපරීත කොටගන්නේය. **‘අත්තනා දුග්ගහිතෙන අමෙව වෙව අඛාවික්ඛති, අත්තානං ච ඛණති, බහුඤ්ච අපුඤ්ඤං පසවති’**[C] යනු මේ සඳහා වදළසේක. එයින් මිසදිටුබවට පැමිණෙන්නේය.

අභිධර්මයෙහි දුපිළිපන් මහණ ධර්මස්වභාවය දැනීම ඉක්මවා සිටියේ, නොසිතිය හැකි ධර්මයන් ගැනද සිතන්නේය. ඒ හෙතුවෙන් හෙතෙමේ, චිත්තවික්ෂෙපයට පැමිණෙන්නේය. එහිලා මෙය වදරණුලද්දේය. **‘චත්තාරිමානි භික්ඛවෙ අචින්තෙය්‍යානි න චින්තෙතබ්බානි, යානි චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස භාගී අස්ස’**[D]යි. මෙසේ මෙතැන්හි

A චතුක්කඩ්ගුත්තර - පුග්ගලවග්ග
B චතුක්කඩ්ගුත්තර - අපණ්ණකවග්ග
C චතුක්කඩ්ගුත්තර - අපණ්ණකවග්ග
D චතුක්කඩ්ගුත්තර - අපණ්ණකවග්ග

දුපිළිපන්වූයේ, පිළිවෙළින් මේ දුසිල්බව, මිසදිටුබව, උමතුබවයි ප්‍රභෙදවත්වූ විපත්තියට පැමිණෙන්නේය. මෙසේද, නන් අයුරින් පිටකයන් දැන ඔවුන්ගේ වසයෙන් බුද්ධවචනය තෙවැදරුම්යයි දතයුතුය.

නිකාය වසයෙන් පස්වැදරුම්වූයේ කෙසේද: මේ සියලු බුද්ධවචනය, **දීඝනිකාය, මජ්ඣිමනිකාය, සංයුත්තනිකාය, අඞ්ගුත්තරනිකාය, ඛුද්දකනිකාය**යි නිකාය වසයෙන් පස්වැදරුම්වේ.

එම **දීඝනිකාය** කවරේද යත්:- වගීත්‍රයකින් සඞ්ග්‍රහකරණලද බ්‍රහ්මජාලසූත්‍රය ආදිකොටසිටි සූතිස්සූත්‍රයෝය. එහිලා මෙද දතයුතුය.

‘චතුත්තිංසෙව සුත්තන්තා - තිවග්ගෝ යස්ස සඞ්ගහෝ,
එස දීඝනිකායොති - පඨමෝ අනුලොමිකෝ’ යනු

යම් නිකායයෙක්හි සූතිසක්ම සූත්‍රවෙයිද, ත්‍රිවර්‍ගසඞ්ග්‍රහයක්වේද, අර්ථයනට අවිරුද්ධවූ මේ ප්‍රථම නිකාය දීඝනිකායයි. කුමක් හෙයින් මෙය දීඝනිකායයි කියනුලැබේද යත්: ප්‍රමාණයෙන් දීඝීවූ සමූහවශයෙන් හා නිවාසවශයෙන් දීඝනිකායයි කියනුලැබේ. සමූහ නිවාසනිකාය නම්වේ. **‘නාහං භික්ඛවේ අඤ්ඤං එකනිකායම්පි සමනුපස්සාමි, එවං චිත්තං යථයිදං භික්ඛවේ තිරච්ඡානගතා පාණා’**[A] යනු හා **‘පොණ්ණික නිකායෝ චිකිලලික නිකායෝ’** යනාදීහුද මෙහි ශාසනව්‍යවහාරවශයෙන් හා ලොකව්‍යවහාර වශයෙන් සාධකයහ. අන්‍ය නිකායයන්යිද නිකාය භාවයෙහි වචනාර්ථය මෙසේ දතයුතුය.

මජ්ඣිමනිකාය කවරේද යත්: ප්‍රමාණයෙන් මධ්‍යමවූ පසළොස් වගකින් සඞ්ග්‍රහකරනලද මූලපරියාය සූත්‍රය ආදිකොට ඇති එක්සිය දෙපණසක් සූත්‍රය. එහිලා මේද දතයුතුය.

‘දියඩ්ඪසතසුත්තන්තා - දෙව ච සුත්තානි යත්ථ සෝ,
නිකායෝ මජ්ඣිමෝ පඤ්ච - දසවග්ගපරිග්ගහෝ’ යනු

යම් නිකායක එක්සියදෙපණසක් සූත්‍රයෝ වෙත්ද, පසළොස් වගකින් සඞ්ග්‍රහකරණලද ඒ නිකාය මජ්ඣිමනිකායයි.

සංයුත්තනිකාය කවරේද යත්: දෙවතා සංයුත්තාදීන්ගේ වසයෙන් ඔඝතරණසූත්‍රය ආදිකොට සිටි සත්දහස්සත්සිය දෙසැටක්සූත්‍රයෝය. එහිලා මේද දතයුතුය:

A ඛන්ධකසංයුත්ත - පූජාවග්ග

'සත්තසුත්තසහස්සානි - සත්තසුත්තසතානි ච,
අථාසටීී වෙව සුත්තන්තා - එසො සංයුත්තසඞ්ගහො' යනු

සත්දහස් සත්සිය දෙසැටක් සූත්‍ර සංයුත්තසඞ්ග්‍රහයයි.

අඞ්ගුත්තරනිකාය යනු කවරේද යත්: එක්එක් අඞ්ගයක් වැඩිගොස්සිටි චිත්තපරියාදන සූත්‍රය ආදිකොට ඇති නවදහස්පන්සිය සත්පණස්සූත්‍රය. එහිලා මේද දතයුතුය:

'නවසුත්තසහස්සානි - පඤ්චසුත්තසතානි ච,
සත්තපඤ්ඤාය සුත්තානි - සඞ්ගා අඞ්ගුත්තරෙ අයං' යනු

අඞ්ගුත්තරනිකායයෙහි නවදහස් පන්සිය සත්පණසක් සූත්‍රවෙයි. මේ එහි ගණනය.

ඛුද්දකනිකාය නම් කවරේද යත්: සිවුනිකාය හැර සියලු විනයපිටකය හා අභිධම්පිටකයද, පෙර සූත්‍රපිටක නිර්දේශයෙහි දක්වනලද පසළොස් ප්‍රභෙදවූ ඛුද්දකපාඨාදීන් හා සෙසු බුද්ධවචනය. එහිලා මේද දතයුතුය:

'ඨපෙත්වා චතුරොපෙතෙ - නිකායෙ දීඝ ආදිකෙ,
තදඤ්ඤං බුද්ධවචනං - නිකායො ඛුද්දකො මතො' යනු

දීඝනිකායාදීවූ මේ නිකාය සතර හැර, අන්‍යවූ බුද්ධවචනය ඛුද්දකනිකායයි දන්නාලදී. නිකායවසයෙන් පස්වැදරුම්වූයේ මෙසේය.

අඞ්ගවසයෙන් නවවැදරුම්වූයේ කෙසේදයත් මේ සියලුම බුද්ධවචනය, **සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ලයි** නවවැදරුම්වේ. එහි උභතොවිභඞ්ග, චුල්ලනිද්දේස, මහානිද්දේස, ඛන්ධක, පරිවාර යන මොවුහුද, සූත්‍රනිපාතයෙහි මඞ්ගලසුත්ත, රතනසුත්ත, නාලකසුත්ත, තුවටකසුත්ත යන සූත්‍රයෝද, සූත්‍ර නාමයෙන් ගැණෙන අන්‍යවූ තථාගත වචනද, සුත්තයි දතයුතුය. සියලුම සගාථක සූත්‍ර ගෙය්‍ය නම්වේ. විශෙෂ විසින් සංයුත්තනිකායයෙහි සියලු සගාථක වර්‍ගය මෙහි ඇතුළත්ව සිටියේය. සියලු අභිධම්පිටකය ගාථාවිරහිත සූත්‍ර අටකින් සඞ්ග්‍රහ නොකළ යම් අන්‍යවූ බුද්ධවචනයෙක්වේද, මේ සියල්ල වෙය්‍යාකරණයි දතයුතුය. ධම්මපද, ථෙරගාථා, ථෙරීගාථා, සූත්‍රනිපාතයෙහි සූත්‍රනාම විරහිතවූ සුද්ධික ගාථා **ගාථා**යි දතයුතුය. සොමනස් සහගිය ඥානයෙන් උපන් ගාථාවන්ගෙන් ප්‍රතිසංයුක්තවූ දෙයාසූවක් සූත්‍ර **උදාන**යි දතයුතුය. **'වුත්තං හෙතං භගවතා'** යනාදී නයින් පැවති එක්සිය දොළොසක්

සූත්‍ර **ඉතිවුත්තකැ**යි දතයුතුය අපණ්ණක ජාතකය ආදිකොට ඇති පන්සිය පණසක් ජාතක, **ජාතකය**යි දතයුතුය. **'චත්තාරෝ මේ භික්ඛවේ අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දේ'** යනාදි නයින් පැවති සියලුම, ආශ්චර්‍යාද්භූත ධර්මයන්ගෙන් ප්‍රතිසංයුක්තවූ සූත්‍ර, **අබ්භුතධම්ම**යි දතයුතුය. චුල්ලවේදල්ල, මහාවේදල්ල, සම්මාදිට්ඨි, සක්කපඤ්හ, සඞ්ඛාරභාජනිය, මහාපුණ්ණම සූත්‍රාදීවූ තුවණත් සතුටත් ලබමින් විචාරණලදුව, වදළ සියලුමසූත්‍ර, **වේදල්ල**යි දතයුතුය. මෙසේ අඞ්ග වසයෙන් නවවැදරුම්වේ. ධර්මස්කන්ධ වසයෙන් අසූසාර දහසක්වූයේ කෙසේදයත්: මේ සියලුම බුද්ධවචනය:

'ඛාසීති බුද්ධතෝ ගණිං - දෙසහස්සානි භික්ඛුතෝ,
චතුරාසීති සහස්සානි - යෙ මේ ධම්මාපවත්තිනෝ'යි

මෙසේ දෙයාසු දහසක් ධර්මස්කන්ධ, බුදුරජානන්වහන්සේ වෙතින් උගතිමි. දෙදහසක් ධර්මස්කන්ධ, දම්සෙනෙවි ඇ මහරහත් තෙරුන්වහන්සේ වෙතින් උගතිමි. යම් ධර්මයක් මාගේ ලෙහි පවතීද ඒ ධර්ම, සුවාසු දහසක් වේයයි දක්වනලද ධර්මස්කන්ධයන්ගේ වසයෙන් සුවාසූ දහසක් ප්‍රභෙද ඇත්තේය.

එහි එක් අනුසන්ධියක් ඇති සූත්‍රය එක් ධර්මස්කන්ධයක්වේ. නොයෙක් අනුසන්ධි ඇති යම් සූත්‍රයක් වේද, එහි අනුසන්ධි වසයෙන් ධර්මස්කන්ධයන්ගේ ගණන වේ. ගාථා බන්ධයන්හි **'කති ඡින්දෙ කති ජහෙ'** යනාදි ලෙසින් පැවති ප්‍රශ්න විචාරීම, එක් ධර්මස්කන්ධයක් වේ **'පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ'** යනාදි ලෙසින් පැවති ප්‍රශ්න විසර්‍ජනය එක් ධර්මස්කන්ධයක් වේ. අභිධර්මයෙහි එක් එක් ධර්මස්කන්ධයක්වේ. විනයයෙහි වස්තු ඇත්තේය. මාතෘකා ඇත්තේය. පදභාජනිය ඇත්තේය. අන්තරාපත්ති ඇත්තේය අනාපත්ති ඇත්තේය. පරිවේඡද ඇත්තේය. එහි එක් එක් කොටසක් එක් එක් ධර්මස්කන්ධයකැයි දතයුතුය. මෙසේ ධර්මස්කන්ධවශයෙන් සුවාසූදහස් වැදැරුම්වූයේය.

මෙසේ අභෙදයෙන් රසවසයෙන් එක් වැදරුම්වූ භෙදයෙන් ධර්මවිනයාදිවශයෙන් දෙවැදරුම් ඇ භෙද ඇති මේ බුද්ධවචනය සඞ්ගායනාකරන්නාවූ මහාකාශ්‍යප මහාස්ථවිර ප්‍රමුඛ වශීගණයා විසින් මේ ධර්මය, මේ විනයය, මේ ප්‍රථමබුද්ධවචනය, මේ මද්ධ්‍යම බුද්ධවචනය, මේ පශ්චිමබුද්ධවචනය, මේ විනයපිටකය, මේ සූත්‍ර පිටකය, මේ අභිධර්මපිටකය, මේ දීඝනිකායයි -පෙ- මේ බුද්දකනිකායය, මේ සූත්‍රාදීහු නවාඞ්ගය, යන මේ ප්‍රභෙදය ව්‍යවස්ථා කොටම, සඞ්ගායනා කරනලද්දේය.

හුදෙක්මේ පමණක්ම සඞ්ගායනා කරනලද්දේ නොවේ. අන්‍යවූද උදානසඞ්ග්‍රහ, වර්‍ගසඞ්ග්‍රහ, පෙය්‍යාලසඞ්ග්‍රහ, ඒකකනිපාත දුකනිපාතාදීවූ නිපාතසඞ්ග්‍රහ, සංයුක්තසඞ්ග්‍රහ, පණ්ණාසකසඞ්ග්‍රහ යනාදීවූ ත්‍රිපිටකයෙහි පෙණෙන නන් වැදරුම්වූ සඞ්ග්‍රහ ප්‍රභේදයද ව්‍යවස්ථාකොට, මෙසේ සත්මසකින් සඞ්ගායනා කරනලද්දේය.

මේ බුද්ධවචනයෙහි සඞ්ගීතිය අවසානයෙහිද, මහාකාශ්‍යප මහා ස්ථවිරයන්වහන්සේ විසින් බුදුරජානන්වහන්සේගේ මේ ශාසනය අවුරුදු පන්දහසක් පමණ කල්පැවැත්මට සමර්ථවූවක් කරනලදයි හටගත් ප්‍රමොදය ඇති මේ මහාපෘථිවී තොමෝ සාධුකාර දෙන්නියක සේ දිය කෙළවරකොට නොයෙක් අයුරින් නැගිනැගී සැලුනීය. උඩ යට යෙමින් සැලුනීය. සිවු දිසාවෙහි යෙමින් සැලුනීය. අනෙකප්‍රකාරවූ ආශ්චර්‍යයී පහළවිය. මෝ ප්‍රථම සඞ්ගීති නම් වන්නීය.

ලෙවිහි යම් සඞ්ගීතියක් මහාකාශ්‍යප මහාස්ථවිරාදීවූ පන්සියයක් රහතුන් වහන්සේ විසින් කරණ ලද ද, ඒ කරණ කොට, පඤ්චසතායිද, තෙරුන්විසින්ම කළබැවින් ථේරිකායිද කියනු ලබාද ඕ තොමෝ ප්‍රථමසඞ්ගීති නමු.

ප්‍රථමසඞ්ගීතිය නිමි.

—\\—

මේ ප්‍රථමසඞ්ගීතිය පවත්නා කාලයෙහි විනය විචාරන්නාවූ ආයුෂ්මත් මහාකාශ්‍යප මහාස්ථවිරයන්වහන්සේවිසින් **‘පඨමං ආවුසො උපාලි පාරාජිකං කත්ථ පඤ්ඤත්තං’** යි වදළ මේ ආදී වචන අවසානයෙහි **‘වත්ථුම්පි පුච්ඡි, නිදානම්පි පුච්ඡි, පුග්ගලම්පි පුච්ඡි’**යි මෙහි නිදනය විචාළකල්හි ඒ නිදනය මුල පටන් විස්තරකොට ‘යමක්හු විසින් පණවනලදද; යම් හෙයකින් පණවනලදද’ යි මේ සියල්ල කියනු කැමැතිවූ ආයුෂ්මත්වූ උපාලි මහාස්ථවිරයන්වහන්සේවිසින් කියනලද **‘තේන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති’** යන මේ සියල්ල කියයුත්තේය. මෙසේ මෙය ආයුෂ්මත් උපාලි මහාස්ථවිරයන්වහන්සේවිසින් කියනලද්දේය. එද ප්‍රථමසඞ්ගීති කාලයෙහි කියනලදයි දතයුතුය. මෙපමණකිනුදු **‘ඉදං වචනං කෙන වුත්තං කද ච වුත්තං’** යන මේ පදවල අර්ථය ප්‍රකාශකරණලද්දේවේ.

දැන් **'කසමා වුත්තං'** යනු මෙහිලා කියනුලැබේ. යම්හෙයකින් මේ ආයුෂ්මත් උපාලි මහාසථවිර තෙමේ ආයුෂ්මත් මහාකාශ්‍යප මහාසථවිරයන්වහන්සේවිසින් නිදනය විචාරණලද්දේද, එහෙයින් උන්වහන්සේවිසින් ඒ නිදනය මූලපටන් විස්තරකරනු පිණිස කියනලද්දේයයි මෙසේ මේ විස්තරය ප්‍රථමසඞ්ගීති කාලයෙහි කියන්නාවූද ආයුෂ්මත් උපාලි මහාසථවිරයන්වහන්සේවිසින් මේ කාරණයෙන් කියනලදයි දතයුතුය. මෙපමණකිනුදු **'වුත්තං යෙන යද යසමා'** යන මේ මාතෘකාපදයන්ගේ අර්ථය ප්‍රකාශ කරනලද්දේවේ.

දැන් **'ධාරිතං යෙන වාහතං යත්‍රපපතිට්ඨිතං චෙතමෙතං වත්‍රා විධිං තතෝ'** යන මේ පදවල අර්ථප්‍රකාශයපිණිස මේ කියනුලැබේ. **'තෙන සමයෙන බුද්ධෝ භගවා වෙරඤ්ජායං විහරති'**යි. මේආදි වචනයන්ගෙන් ප්‍රතිමණ්ඩිතවූ නිදනය ඇති ඒ මේ විනයපිටකය වනාහි **'කවරකුවිසින් දරණලදද; කවරකුවිසින් ගෙණඑනලදද; කවරෙකු කෙරෙහි පිහිටියේද'**යි කියනුලැබේ:

ආදියෙහි වනාහි මේ විනයපිටකය භාග්‍යවතුන්වහන්සේ හමුවෙහි ආයුෂ්මත් උපාලි මහාස්ථවිරයන්වහන්සේ විසින් දරණලද්දේය. තථාගතයන්වහන්සේ ධරමාණ කාලයෙහිම ෂඩභිඥාදි ප්‍රභෙදවත් ගුණ ඇති නොයෙක් දහස්ගණන් භික්ෂූන්විසින් උපාලි මහාසථවිරයන්වහන්සේගේ හමුවෙහි උගන්නාලද්දේය. තථාගතයන්වහන්සේ පිරිනිවිකල්හි මහාකාශ්‍යප මහා සථවිර ප්‍රමුඛ ධර්මසඞ්ග්‍රාහක මහාසථවිරයන්වහන්සේලාවිසින් දරණලද්දේය. **'කෙනාභතං'** මේ විනයපිටකය දඹදිව උපාලි මහාසථවිරයන්වහන්සේ ආදිකොට සිටි ඇදුරුපරපුර විසින් තෘතීය සඞ්ගීතිය දක්වා ගෙනඑන ලද්දේය.

මේ ඒ ඇදුරුපරපුර: දිනූ කෙලෙස් ඇති **උපාලි** මහාසථවිර, **දසක** ස්ථවිර **සොණක** සථවිර, **සිග්ගව** සථවිර, **මොග්ගලිපුත්තතිස්ස** සථවිර යන මහාසථවිරයන්වහන්සේලා පස්නම, විනයපිටකය දඹදිව නොසිඳුනක්කොට, පරම්පරාවෙන් තෘතීය සඞ්ගීතිය දක්වා ගෙනආහ.

ආයුෂ්මත් උපාලි මහාස්ථවිරයන්වහන්සේ මේ විනයවංසය, විනයතන්තිය, විනයප්‍රවේණිය, භාග්‍යවතුන්වහන්සේ හමුවෙහි උගෙන, බොහෝ භික්ෂූන්ගේ ලෙහි පිහිටුවාලූහ. ඒ ආයුෂ්මත් උපාලි මහාස්ථවිරයන්වහන්සේගේ සමීපයෙහි විනය උගෙන, ව්‍යක්තභාවයට පැමිණි පුද්ගලයන් අතුරෙහි පෘථග්ජන, ස්‍රොතාපන්න, සකෘදගාමී, අනාගාමීහු සඞ්ඛ්‍යාපථය ඉක්මවා ගියහ. රහතුන්වහන්සේම එක්දහසක්වූහ.

දසකසථවිරයන් වහන්සේද? ඒ උපාලි මහාසථවිරයන්වහන්සේගේම සදධිවිහාරිකයෙක් වූයේය. දසකසථවිර උපාලි මහාස්ථවිරයන්වහන්සේගේ හමුවෙහි විනය උගෙන එපරිද්දෙන් විනය කියවූයේය. ඒ ආයුෂ්මත්හුගේද සමීපයෙහි විනය උගෙන, විනයයෙහි ව්‍යක්තභාවයට ගියාවූ පෘථග්ජනාදීහු සඞඛ්‍යාපථය ඉක්මවූහ. රහතුන්වහන්සේ දහසක්මවූහ. සොණක සථවිර වනාහි දසක සථවිරයන්වහන්සේගේ සදධිවිහාරිකවූයේය. උන්වහන්සේද තමන්ගේ උපාදධ්‍යායවූ දසක සථවිරයන්වහන්සේගේ හමුවෙහි විනය උගෙන, එසේම විනය කියවූහ. ඒ ආයුෂ්මත්හුගේද සමීපයෙහි විනය උගෙන, විනයයෙහි ව්‍යකත භාවයට පැමිණි පෘථගජනාදීහු සඞඛ්‍යාපථය ඉක්මවා සිටියහ. රහතුන්වහන්සේම දහසක්වූහ. සිගගව සථවිර, සොණක සථවිරයන්වහන්සේගේ සදධිවිහාරිකවූයේය. උන්වහන්සේ සොණක සථවිරයන්වහන්සේගේ හමුවෙහි විනය උගෙන, දහසක් රහතුන්වහන්සේගේ ප්‍රධානස්ථානය ගත්හ. ඒ ආයුෂ්මතුන්වහන්සේගේ සමීපයෙහි විනය උගෙන, විනයයෙහි ව්‍යක්තභාවයට පැමිණි පෘථග්ජන, ස්‍රොතාපන්න, සකෘදගාමී, අනාගාමීහුද, රහත්හුද සියගණනින් මෙතෙකැයි හෝ දහස් ගණනින් මෙතෙකැයි නොපිරිසිඳින ලද්දහුවූහ. එකල්හි දඹදිව ඉතා මහත්වූ භික්ෂු සමූහයක්වූයේය. මොග්ගලීපුත්තතිස්ස මහාසථවිරයන්වහන්සේගේ ආනුභාවය තෘතීය සඞගීතියෙහි ප්‍රකටවන්නේය.

මෙසේ මේ විනයපිටකය පළමුකොට දඹදිව මේ ඇදුරුපරපුර විසින් තෘතීය සඞගීතිය දක්වා ගෙනඑනලදැයි දතයුතුය. දවිතීය සඞගීතිය පිළිබඳ කරුණු දැනීමපිණිස මේ පිළිවෙළ දතයුතුය: යම් කලක වනාහි සදධර්‍මය සඞගායනාකොට සියලුතන්හි ඒ සදධර්‍මය බබුලුවා මුළුමනින් ගෙවාදැමූ කාමාදි ආස්‍රව ඇති ප්‍රඥ ලොකයෙන් ආලොකවත්වූ ආලය රහිතවූ මහාකාශ්‍යපාදීවූ පන්සියයක් මහාසථවිරයන්වහන්සේලා දිවි කෙළවරතෙක් සිට සිදීගිය තෙල් ඇති පහන් මෙන් අනුපාදිශේෂ නිර්‍වාණධාතුවෙන් පිරිනිවියාහුය.

මෙසේ ක්‍රමයෙන් රැදවල ඉක්මයනකල්හි භාග්‍යවතුන්වහන්සේගේ පිරිනිවීමෙන් අවුරුදු සියයක් ඉක්මයන්ම විසල්පුර වැසි වජ්ජිපුත්‍රක භික්ෂූහු, විසල් පුරයෙහි **‘කපපති සිඞගිලොණ කපපා, කපපති දවඞගුලකපපා, කපපති ගාමන්තරකපපා, කපපති ආවාසකපපා, කපපති අනුමතිකපපා, කපපති ආචිණණකපපා, කපපති අමථිතකපපා, කපපති ජලොගිපාතුං, කපපති අදසකං නිසීදනං, කපපති ජාතරූපරජතං’** යන මේ දශවස්තූන් කැපයයි දක්වාලූහ.

වැදරට වැසි ඒ භික්ෂූන්ට **සුසුනාග** පුත්‍රවූ **කාලාශොක** රජතෙමේ පක්ෂවූයේය.

එකල්හිවනාහි කාකණ්ඩක පුත්‍රවූ ආයුෂ්මත් යස මහාස්ථවිරයන් වහන්සේ වැදරට චාරිකාවෙහි හැසිරෙණසේක් 'විසල්පුර වැසි වජ්ජිපුත්‍රක භික්ෂූන් විසල්පුරයෙහි දශවස්තූන් ප්‍රකාශ කරති'යි ඇසූහ. ඒ අසා 'යම්බඳුවූ මම බුදුරජාණන්වහන්සේගේ ශාසනයට වන විපත අසා පසුබට වන්නෙම්නම් එය මට සුදුසු නොවේ, එබැවින් මම අධර්මවාදීන්ට නිග්‍රහකොට ධර්ම්ය දක්වාලම්'යි සිතා විශාලා මහානගරයට වැඩමකළහ. කාකණ්ඩක පුත්‍රවූ ආයුෂ්මත් යස මහාස්ථවිරයන් වහන්සේ එහි විශාලා මහානගරයෙහි මහා වනයෙහි කූටාගාරශාලාවෙහි වැඩවසනසේක.

එකල්හි විසල්පුර වැසි වජ්ජිපුත්‍රකභික්ෂූහු ඒ දවස පොහොයෙහි රන්තලියක් දියෙන් පුරවා භික්ෂූ සඞ්ඝයා මැද තබා එහි පැමිණි විසල්පුර වැසි උපාසකයන්ට, 'උපාසකයෙනි! සඞ්ඝයාහට කහවණු, අඩකහවණු, කහවණුපාද, මසුද දෙවු, සඞ්ඝයාහට පිරිකරින් කටයුතු ඇත්තේ වන්නේය'යි කියන්නටවූහ. සත්තසතිකක්ඛන්ධකයෙහි ආ සියල්ල මෙහි කියයුතුය. මේ විනයසඞ්ගීතියෙහි අඩුවැඩි නොවූ සත්සියයක් භික්ෂූහු වූවාහුද, එහෙයින් දවිතීය සඞ්ගීතිය සත්තසතිකායි කියනුලැබේ.

මේ සඞ්ඝ සන්නිපාතයෙහි ආයුෂ්මත් යස මහාස්ථවිරයන්වහන්සේ- විසින් උත්සාහවත් කරනලද දෙළොස් ලක්ෂයක් භික්ෂූහු රැස්වූහ. ඒ භික්ෂූන් මැද ආයුෂ්මත් රෙවත මහාස්ථවිරයන්වහන්සේවිසින් විචාරණ ලද විනය විසඳන්නාවූ සබ්බකාමී මහාස්ථවිරයන්වහන්සේවිසින් ඒ දශවස්තූහු විනිශ්චය කරනලද්දහු අධිකරණය සන්සිඳුවන ලද්දේය.

ඉක්බිති ඒ මහාස්ථවිරයන්වහන්සේලා නැවත ධර්ම්යත් විනයයත් සඞ්ගායනා කරන්නෙමුයි තෙවළාදරවූ පැමිණි පිළිසැඹියා ඇති සත්සියයක් භික්ෂූන් තෝරාගෙන විශාලා මහානගරයෙහි වාලුකාරාමයෙහි රැස්වහිඳ මහාකාශ්‍යප මහාස්ථවිරයන්වහන්සේ විසින් සඞ්ගායනාකළ පරිද්දෙන්ම සියලු සසුන්මල සෝද හැර, නැවැත පිටක වසයෙන් නිකායවසයෙන් සියලුධර්ම්යද විනයයද සඞ්ගායනාකළහ. මේ සඞ්ගායනාව අටමසකින්කොට නිමවනලදී. යම් සඞ්ගීතියක් ලොකයෙහි:

'සත් සියයක් මහරහතුන්වහන්සේ විසින් කරනලදද, එහෙයින් **සත්තසතිකා**යිද, පෙරකළ සඞ්ගීතිය ගෙන, **දුතියා**'යිද කියනුලැබේද ඒ

මේ ප්‍රසිද්ධවූ දවිතීයසඞ්ගීතිය යම් මහා තෙරකෙනකුන් විසින් සඞ්ගායනා කරනලදද, ඒ සඞ්ගීතිකාරක මහා සථවිරයන්වහන්සේ අතුරෙහි ආනන්ද මහා සථවිරයන්වහන්සේගේ සද්ධිවිහාරිකවූ තථාගතයන්වහන්සේ දුටුවිරූ සබ්බකාමී මහා සථවිර, **සාළහ** මහා සථවිර, **රෙවත** මහාසථවිර, **ඛුජ්ජසොභිත** මහා සථවිර, **යස** මහා සථවිර, **සාණ** සමඟත මහා සථවිර යන මේ මහා සථවිරයන්වහන්සේ ප්‍රසිද්ධයහ.

සුමන මහාසථවිර, **වාසභගාමි** මහාසථවිර යන මහාසථවිරයන්වහන්සේලා දෙනම අනුරුද්ධ මහාසථවිරයන්වහන්සේගේ සද්ධිවිහාරික වෙති. තථාගතයන්වහන්සේ පෙර දක්නාලද්දෝයයි දතයුත්තාහ.

යම් මහා තෙරකෙනෙකුන්විසින් දවිතීය සඞ්ග්‍රහය සඞ්ගායනා කරනලද්දේද, ඒ සියලුදෙනාවහන්සේම බහා තැබූ සකන්ධභාරය ඇත්තාහුය. සිවුමගින් කළයුතුවූ සොඩශවිධ කෘත්‍යය ඇත්තාහුය. ආස්‍රවරහිතයහ.

මේ දවිතීයසඞ්ගීතියයි.

—\\—

මෙසේ මේ දවිතීයසඞ්ගීතිය සඞ්ගායනාකොට, ඒ මහා සථවිරයන්වහන්සේලා 'අනාගතයෙහිද ශාසනයට මෙබඳු උවදුරු වන්නේද'යි බලා වදරන්නාහු, 'මෙයින් අවුරුදු සියයකට පසුව අටළොස්වන අවුරුද්දෙහි **පැළලුප්** නුවර **ධම්මාශොක** නම් රජෙක් ඉපිද, සියලු දඹදිව රාජ්‍යය කරවන්නේය, හෙතෙම බුදුසසුනෙහි පැහැද මහත් ලාභසත්කාර පවත්වන්නේය, ඒ හේතුවෙන් තීර්ථකයෝ ලාභසත්කාර පතන්නෝ, සසුනෙහි පැවිදිව තමතමන්ගේ දෘෂ්ටීන් දක්වන්නාහුය, මෙසේ සසුනෙහි මහත් අර්බුද උපදින්නේය' යන මෙය දැනවදළාහුය. එකල්හි උන්වහන්සේලාට 'කිම, අපි මේ අර්බුදය උපන්කල්හි හමු වන්නමෝද, හමු නො වන්නමෝද'යි මේ අදහස උපන්නේය. ඉක්බිති සියල්ලෝම එකල්හි තමන් නොහමුවනබව දැන කවරෙක් ඒ අධිකරණය සන්සිඳුවාලන්නට සමර්ථවන්නේදයි සියලු මනුෂ්‍ය ලොකයත් ෂඩ්විධ කාමාවචර දෙවලොකයත් බලන්නාහු, ඒ දෙලොවම එයට සමර්ථවූ කිසිවෙකු නොදක, බ්‍රහ්මලොකයෙහි මදආයු ඇතිව මතු බඹලොවක ඉපදීමට වැඩූ ධ්‍යාන ඇතිව සිටි තිස්සනම් මහබඹහු දුටහ.

දක'ඉදින් අපි මිනිස්ලොව ඉපදීමට, මොහුට උත්සාහය උපදවන්නෙමුනම්, ඒකාන්තයෙන් මෙතෙමේ මොගලි බ්‍රාහ්මණයාගේ ගෙයි පිළිසිඳ ගන්නේය, එයින් පසු මන්ත්‍රයන්ගෙන් පොළොඹවනලදුයේ, ගෙන් නික්ම පැවිදි වන්නේය, හෙතෙමේ මෙසේ පැවිදිව සියලු බුදුවදන් උගෙන, ලැබූ පිළිසැඹියා ඇත්තේ, තීර්ථකයන් මැඩ ඒ අධිකරණය විනිශ්චයකොට සසුන නගාසිටුවන්නේය'යි මේ අදහසවූයේය. අනතුරුව උන්වහන්සේලා බඹ ලොවට වැඩ තිස්සනම් මහාබ්‍රහ්මයාහට 'මෙයින් අවුරුදු සියයකට මත්තෙහි අටළොස්වන අවුරුද්දෙහි ශාසනයෙහි මහත් අර්බුදයක් උපදින්නේය, අපිද සියලු මනුෂ්‍යලොකයත් ෂඩ්විධ කාමාවචර දෙවලොකයත් පරීක්ෂාකර බලන්නමෝ, ශාසනය නගාසිටුවන්නට සමර්ථවූ කිසිවෙකු නොදක බඹලොව පරීක්ෂාකර බලන්නමෝ, පින්වත්හු දුටුවෙමු, සත්පුරුෂය! මැනව, එහෙයින් මිනිස්ලොව ඉපද දශබලධාරී භාග්‍යවතුන්වහන්සේගේ සසුන නගාසිටුවනු මැනවි, එයට අපට පොරොන්දුවක් දෙව'යි කියාසිටියාහ. මෙසේ කියාසිටිකල්හි මහාබ්‍රහ්මතෙමේ 'මම අනාගතයෙහි සසුනෙහි උපදින අර්බුදය නසාලීමෙන් සසුන නගාසිටුවන්නට සමර්ථවන්නෙමි'යි තුටුපහටුවූයේ, අතිශයින් ඔද වැඩීගියේ, 'යහපතැ'යි ගිවිස පොරොන්දුවක් දුන්නේය. මහාසථවිරයන්වහන්සේලා බඹලොව ඒ කටයුතුකොට නිමවා පෙරළා මිනිස්ලොවට පැමිණියහ.

ඒ කාලයෙහි **සිඟව, වණ්ඩවජ්ජි** යන සථවිරදෙනම නවකයෝවෙති. තරුණ භික්ෂූහුය. තෙවළාදරයහ. ලැබූ පිළිසැඹියා ඇතියහ. රහත්හුය. එහෙයින් ඒ සථවිර දෙනම වැදරට භික්ෂූන් ඉපදවූ ඒ අධිකරණයට නොපැමිණියහ. එහෙයින් ඒ සථවිරයන්වන්සේලා 'අවැත්නි! තෙපි මේ අධිකරණයෙහි අපට සහාය නොවූවාහුය. එහෙයින් තොපට මෙය දඬුවම වේවා, එනම් තිස්සනම් බ්‍රහ්ම තෙමේ මොගලී බ්‍රාහ්මණයාගේ ගෙයි පිළිසිඳ ගන්නේය, තොප අතුරෙන් එකෙක් ඔහු ගෙන අවුත් පැවිදිකෙරේවා, එකෙක් බුදුවදන් උගන්වා ලන්නැ'යි කියා නියමකොට සියල්ලෝම ආයු පමණින් සිට:

සබ්බකාමී මහාසථවිරයන්වහන්සේ ආදිකොට සිටි මහත් ඍද්ධි ඇති ඒ මහා සථවිරයන්වහන්සේලාද දෙවන සඞ්ගායනාව කිරීමෙන් සසුන පිරිසිදුකොට අනාගතයෙහිද සද්ධම්ශුද්ධියපිණිස කරුණු සලසා තබා ලෙවිහි ගිනිකඳන් සේ දල්වෙමින් සිට පිරිනිවියාහුය. ක්ෂයකළ ආස්‍රව ඇති වශීභාවයට පැමිණි ප්‍රභෙදගත ප්‍රතිසම්භිද ඇති ඒ මහා රහතුනන්වහන්සේ පවා අනිත්‍යතායෙහි වශයට පැමිණියාහුය. ලාමකවූ

මැඩලීමට නොහැකිවූ අනිත්‍යතාව මෙසේ දැන නුවණැත්තේ යමක් නිත්‍යවේද, ඒ අමෘතපදයට පැමිණෙනුපිණිස ව්‍යායාම කරන්නේය.

මෙපමණකින් දවිතීයසඞ්ගීතිය
සවිප්‍රකාරයෙන් කියා නිමවනලදී.

——\\——

කිසස මහා බ්‍රහ්මතෙමේ, බඹලොවින් ච්‍යුතව මොගගලි බ්‍රාහ්මණයාගේ ගෙයි පිළිසිඳගත්තේය. සිඟව සථවිරයන්වහන්සේද, ඔහු පිළිසිඳගත් තැන් පටන් සත් අවුරුද්දක් මුළුල්ලෙහි එ බමුණුගේ ගෙට පිඬුපිණිස ගියහ. එහෙත් එක් දවසකුදු කෙණෙස්සක් පමණ කැඳක් හෝ සැන්දක් පමණ පතක් නොලැබූහ. මෙසේ සත්අවුරුද්දක් ගෙවීයෑමෙන් පසු එක් දවසක් 'සාමීනි! මෙතැන ඉක්මවා වඩිනු මැනව'යි යන මේ වචනමාත්‍රය ලැබූහ. එ දවසම බ්‍රාහ්මණ තෙමේද, පිටත ගොස් කිසි කායර්‍යයක් කොට එනුයේ පෙරමගදී තෙරුන් දක 'පින්වත් පැවිද්ද; අපගේ ගෙට ගියහුදැ'යි ඇසීය. 'එසේය, බ්‍රාහ්මණ! ගියෙමු' යි උන්වහන්සේ පිළිතුරු දුන්හ. නැවත 'කිසිවක්ලදද' යි ඇසීය. 'එසේය බ්‍රාහ්මණ! ලැබීමු'යි කීහ. බ්‍රාහ්මණතෙමේ ගෙට ගොස්, 'අර පැවිද්දහුට කිසිවක් දුන්නහුදැ'යි අසා කිසිවක් නොදුන්නෙමු'යි කීකල්හි, බ්‍රාහ්මණතෙමේ දෙවනද 'අද පැවිද්දහුට මුසාවාදයෙන් නිග්‍රහ කරන්නෙම්'යි ගෙදෙරම හුන්නේය.

සිඟව සථවිරයන්වහන්සේ දෙවනද බ්‍රාහ්මණයාගේ ගෙදෙරට වැඩියහ. බ්‍රාහ්මණ තෙමේ උන්වහන්සේ දැක 'ඔබවහන්සේ ඊයේ අපගේ ගෙයින් කිසිවක් නොලැබම ලැබුවෙම්' යි කීවාහුය. ඔබවහන්සේට මුසාවාදය වටීද'යි ඇසීය. ස්ථවිරයන්වහන්සේ 'බ්‍රාහ්මණ! අපි තොපගේ ගෙයිදී සත්අවුරුද්දක් මුළුල්ලෙහි "මෙතැන ඉක්මවා වඩින්න" යන වචනමාත්‍රයකුදු නොලැබ ඊයේ "මෙතැන ඉක්මවා වඩින්න" යන වචනමාත්‍රය ලැබීමු, මේ ලත් ප්‍රතිසථාරය නිසා මෙසේ කීම්හ'යි කීහ. එකල්හි බමුණු තෙමේ 'මොවුහු පිළිසඳර පමණකුත් ලැබ ලැබීමු'යි පවසන්නාහ, අන්කිසි කෑයුතු බිදියයුතු දයක් ලත්කල්හි කුමක් හෙයින් නොපසසත්ද'යි උන්වහන්සේ කෙරෙහි පැහැද තමන් පිණිස පිළියෙල කළ බතින් සැන්දක් පමණ බත්ද, එයට සෑහෙන පමණ ව්‍යඤ්ජනද දෙවා මේ භික්ෂාව හැමද ඔබවහන්සේ ලබන්නහු'යි කීයේය.

බ්‍රාහ්මණතෙමේ දෙවන දිනපටන් ගෙට එළැඹෙන්නාවූ ස්ථවිරයන්වහන්සේගේ උපසමය දැක බොහෝ සෙයින් පැහැද හැමද

තමන්ගේ ගෙයි බත්කිස කරන්නට තෙරුන්ගෙන් ඉල්ලාසිටියේය. ස්ථවිරතෙමේ ඒ ඉල්ලීම ඉවසා දිනපතා එහි බත්කිසකොට වඩිනයේක් මදමදවිසින් ඔවුනට බුදුවදන් කියා යන්නේය. ඒ තරුණ තෙමේ ද, සොළොස් වස් ඇතියේම ත්‍රිවේදයෙහි පරතෙරට ගියේය. බ්‍රහ්මලොකයෙන් මිනිස්ලොවට උත්පත්තිවශයෙන් පැමිණි ශුද්ධසත්ත්වයක්හුගේ අසුනෙක යහනෙක හිඳින්නාවූ හෝ නිදන්නාවූ හෝ අන් කිසිවෙක් නැත්තේය. හෙතෙමේ යම් දවසක සිය ගුරුගෙට යන්නේද එදවස තමාගේ ඇඳපුටු සුදුවතකින් වසා එල්වාතබන්නේය.

ඒ අතර කාලයෙහි සිඟව ස්ථවිරයන්වහන්සේ 'මාණවකයා පැවිදි කරන්නට මේ කාලයයි, එහෙත් බොහෝ දවසක සිට මෙහි එන මාගේ මොහු හා කිසිත් කතාවක් නැත, එහෙයින් දැන් මේ උපායෙන් පලහනිසා කතාවක් උපදින්නේය' යි සිතා ගෙට ගොස් ඒ ගෙයි තුබූ මාණවකයාගේ අසුන හැර අන්කිසින් අසුනක් නොපෙණෙනසේ ඉටූහ. එ වේලෙහි බමුණු ගෙදර සිටි ජනයා ගෙට පැමිණි තෙරුන් දැක උන්වහන්සේට වැඩහිඳින්නට දීමට අන්කිසි අසුනක් නො දැක මාණවකයාගේ පලඟ බා ඇතිරියක් අතුරා දුන්නේය. ස්ථවිරයන් වහන්සේ එහි වැඩහුන්හ. මාණවක තෙමේද එකෙණෙහි ගුරු ගෙයින් පෙරළා ආයේ තමන්ගේ පලඟෙහි හුන් තෙරුන් දැක කිපියේ නොසතුටුවූයේ 'කවරෙක් මාගේ පලඟ මහණහුට පණවාදුන්නේද'යි ඇසීය. ස්ථවිරයන්වහන්සේ බත්කිසකොට මාණවකයාගේ සැඩබව සන්සිඳීගිය කල්හි 'මාණවක! නුඹ කිසියම් වෙදමන්ත්‍රයක් කිම දනිහිද'යි ඇසූහ. මාණවක තෙමේ 'පින්වත් පැවිද්ද, මා වෙදමන්ත්‍ර නොදනිතොත් මෙහි අන් කවරහු වෙදමන්ත්‍ර දන්නාහුද'යි කියා 'ඔබවහන්සේ වෙදමන්ත්‍ර දන්නහුද'යි තෙරුන්ගෙන් ඇසීය. උන්වහන්සේ 'අසව මාණවක! අසා දන්නට හැකිය'යි කීහ.

එකල්හි මාණවකතෙමේ නිඝණ්ඩු කෙටුභ සහිතවූ අක්ෂරප්‍රභෙද සහිතවූ ඉතිහාසය පස්වැනි කොට ඇති ත්‍රිවේදයෙහි යම් යම් ග්‍රන්ථිස්ථාන වේද, ඒ ග්‍රන්ථිස්ථානයන්හි නයක්‍රමය තෙමේත් නොදත්තේද, ආචාර්‍ය්‍ය තෙමේත් නොමදුටුයේද, ඒ ඒ තන්හි ආ ග්‍රන්ථිස්ථාන තෙරුන්ගෙන් විවාළේය. ස්ථවිරයන්වහන්සේ පියවින්ම ත්‍රිවේදයන්හි පරතෙරට ගියහ. දැන් වනාහි පිළිසැඹියාවන්ට පැමිණ සිටිත්. එහෙයින් මුන්වහන්සේට ඒ ප්‍රශ්න විසඳීමෙහි බරක් නැත්තේය. එකෙණෙහිම ඒ ප්‍රශ්න විසඳ 'මාණවක! තොප විසින් මාගෙන් ප්‍රශ්න බොහෝ ගණනක් අසනලද්දේය, මමත් දැන් තාගෙන් එක් ප්‍රශ්නයක් විචාරමි, මට එය ප්‍රකාශකරව'යි මාණවකයාහට කිහ. 'පින්වත් පැවිද්ද! එසේය, ප්‍රකාශකරන්නෙමි'යි

කීකල්හි ස්ථවිරයන්වහන්සේ චිත්තයමකයෙහි එන **'යස්ස චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති, තස්ස චිත්තං නිරුජ්ඣිස්සති නූපපජ්ජිස්සති, යස්ස වා පන චිත්තං නිරුජ්ඣිස්සති නූපපජ්ජිස්සති, තස්ස චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣිස්සති'** යන මේ ප්‍රශ්නය විචාළාහුය.

මාණවක තෙමේ පූර්වපදය හා පරපදය යොද ප්‍රශ්නයෙහි අර්ථය පිරිසිඳින්නට අසමර්ථවන්නේ 'පින්වත් පැවිද්ද, මේ කිනම්ද'යි ඇසීය. 'මාණවක! මේ වනාහි බුද්ධමන්ත්‍රය'යි වදළකල්හි 'පින්වත! මෙය මටත් දෙන්නට හැකිද' යි විචාළේය. 'මාණවක! අප විසින් ගත් පැවිද්ද ගන්නහුට දෙන්නට හැකිය'යි කීකල්හි මාණවක තෙමේ මවුපියන්කරා ගොස් 'මේ පැවිදි තෙමේ බුද්ධමන්ත්‍ර නම්වූ මන්ත්‍රයක් දන්නේය, තමන්වෙත පැවිදි නොවූවක්හට එය නොදෙන්නේය, එහෙයින් මම මොහුවෙත පැවිදිව මන්ත්‍රය උගන්නෙමි' යි කියාසිටියේය.

මවුපියෝ 'අපගේ පුත්‍ර තෙමේ පැවිදිව හෝ මන්ත්‍රය උගණිවා, උගෙණ පෙරළා එන්නේය'යි හඟින්නාහු 'ගණු පුත!' යි අනුදත්හ. ස්ථවිරයන්වහන්සේ දරු පැවිදිකොට පළමුව ද්වත්තිංසාකාරය කම්මට්ඨානය කීහ. හෙතෙමේ එහි පිරියම්කරණුයේ නොබෝ කලකින් ම සෝවාන් පලයෙහි පිහිටියේය. අනතුරුව ස්ථවිරයන්වහන්සේ 'හෙරණ සෝවාන් පලයෙහි පිහිටියේය, දැන් සසුනෙන් බැහැරවන්නට නොසුදුසුය, ඉදින් මම මොහුට කම්ස්ථානය වඩා කියන්නෙමිනම් රහත්බවට පැමිණෙන්නේය, එකල්හි බුදුවදන් උගන්නට උත්සාහවත් නොවන්නේය, දැන් මොහු චණ්ඩවජ්ජී තෙරුන්ගේ සමීපයට යවන්නට කාලය'යි සිතුහ.

ඉක්බිති ස්ථවිරයන්වහන්සේ ඔහුට 'හෙරණ! තෝ චණ්ඩවජ්ජී තෙරුන් වෙතට ගොස් බුදුවදන් උගණුව, මාගේ වචනයෙන් ආරොග්‍යය විචාරව, ස්වාමීනි! මාගේ උපාදධ්‍යාය තෙමේ මා ඔබවහන්සේ වෙතට එවීයයි මෙසේද කියව. තාගේ උපාදධ්‍යාය තෙමේ කිනම් ඇත්තේද'යි විචාළකල්හි 'ස්වාමීනි! සිඟව සථවිර නමැ'යි කියව, මම කිනම් ඇත්තෙම්ද'යි විචාළකල්හි 'ස්වාමීනි! මාගේ උපාදධ්‍යාය තෙමේ ඔබ වහන්සේගේ නම දනීය'යි මෙසේ කියවයි කීහ.

තිසස හෙරණ 'සාමීනි! එසේය'යි කියා තෙරුන් වැඳ පැදකුණුකොට පිළිවෙළින් චණ්ඩවජ්ජී ස්ථවිරයන්වහන්සේගේ සමීපයට ගොස් වැඳ එකත්පසෙක සිටියේය. එකල්හි ස්ථවිරයන්වහන්සේ 'හෙරණ! කොහි සිට ආයේවෙහිද'යි ඇසූහ. 'මාගේ උපාධ්‍යාය තෙමේ මා ඔබවහන්සේගේ සමීපයට පිටත්කර එවීය'යි හෙරණුන් කියූකල්හි 'තාගේ

උපාධ්‍යාය තෙමේ කිනම් ඇත්තේ ද'යි ඇසූහ. 'සාමීනි! මාගේ උපාධ්‍යාය තෙමේ සිඟගව ස්ථවිර නමැ'යිකීය. 'මම කිනම් ඇත්තෙම්ද'යි ඇසූ කල්හි 'ස්වාමීනි! මාගේ උපාධ්‍යාය තෙමේ ඔබ වහන්සේගේ නම දනීය'යි කීය. එකල්හි වණඩවජී සථවිරයන්වහන්සේ 'දැන් පාසිවුරු තැන්පත්කොට තබව'යි කීහ. හෙරණ තෙමේ 'සාමීනි! මැනව'යි පාසිවුරු තැන්පත්කොට තබා දෙවනද පිරිවෙණ හැමද දිය දැහැටි එළවා තැබීය. සථවිරයන්වහන්සේ හෙරණුන් හැමදි තැන නැවැත හැමැන්දහ. ඒ තැබූ දිය බැහැරට දමා අන් දියක් ගත්හ. ඒ දැහැටි දඬුද බැහැරට දමා අන් දැහැට්ටක් ගත්හ. සත්දවසක්ම මෙසේකොට සත්වන දවසෙහි නැවතත් විචාළාහුය. හෙරණ තෙමේ නැවතත් පෙර කියූ සේම කියාසිටියේය. ස්ථවිරයන්වහන්සේ ඒකාන්තයෙන් ඒ මේ තෙමේ බ්‍රාහ්මණැ'යි හිඳින 'කුමක් පිණිස ආයෙහිද'යි ඇසූහ. 'සාමීනි! බුදුවදන් උගැන්ම පිණිසැ'යි හෙරණ කීයේය. සථවිරයන්වහන්සේ 'හෙරණ! උගණුව' යි කියා දෙවන දවසපටන් බුදුවදන් උගන්වන්නට පටන්ගත්හ.

තිසසතෙමේ හෙරණෙක්වූයේම විනයපිටකය තබා අන්සියලු බුදුවදන් අට්ඨකථා සහිතව උගත්තේය. උපසපන්වීමෙන් වසකුදු නොඉක්මවූයේ නොපිරිපුන් එක් වස් ඇතියේම තෙවළාදරවූයේය. මෙසේ ආචාර්‍ය්‍ය උපාධ්‍යායයෝ මොග්ගලිපුත්තතිසස තෙරුන් අත සියලු බුදුවදන් පිහිටුවා ආයු ඇතිතාක් සිට පිරිනිවී ගියහ. මොග්ගලිපුත්තතිසස සථවිරයන්වහන්සේද අන් කලෙක කමටහන් වඩා රහත්බවට පැමිණියාහු බොහෝදෙනාට ධම්විනය ඉගැන්නූහ. එකල්හි බින්දුසාර රජුට එක්සියයක් පුත්‍රයෝවූහ. ඔවුන් අතුරෙහි අශොක කුමාර තෙමේ තමන් හා එකමාතෘකවූ තිසස කුමරු තබා ඒ සියලුදෙනා නසාලූයේය. නසාලන්නේද සිවුවසක් අභිෂෙක නොකරණ ලදුව රාජ්‍යයකරවා සිවුවසක් ඉක්ම යෑමෙන් පසු තථාගතයන්වහන්සේගේ පිරිනිවීමෙන් දෙසිය වසකට පසුව අටළොස්වන අවුරුද්දෙහි මුළුඹදිව එකරාජ්‍යාභිෂෙකයට පැමිණියේය. අභිෂෙකයාගේ ආනුභාවයෙන් මේ රාජර්ද්ධිහු පහළවූහ.

මහපොළොව යට යොදුනක් පමණ තැනද අහස මතුවෙහි යොදුනක් පමණ තැනද ආඥාචක්‍රය පවත්නේය. අනවතප්ත විලෙන් අටකදකින් පැන් කළ සොළොසක් දෙවියෝ දිනපතා ගෙන එත්. සසුනෙහි උපන් සැදැහැ ඇතියේ ඒ සොළොස් පැන්කළයෙන් පැන්කළ අටක් භික්ෂුසඞ්ඝයාහට පිදුයේය. දෙකළයක් තෙවළාදර සැටක් පමණ භික්ෂූන්වහන්සේට ද, දෙකළයක් අසන්ධිමිත්‍රා අගමෙහෙසියටද මොළොක් රසවත් නාළිය දහැටි දිනපතා ගෙණවුත් තබත්. රජහුගේ, මෙහෙසියගේ, සොළොස් දහසක් නාටක ස්ත්‍රීන්ගේ, සැටදහසක් භික්ෂූන්වහන්සේගේද

දිනපතා දෑහැටිකිස මෙයින්ම සිදුවේ. දෙවියෝ දිනපතාම ඔහුට බෙහෙත් නෙල්ලි හා බෙහෙත්අරළුද සුවඳින් හා රසයෙන් පිරිහිය රන්වන් අඹපලද ගෙන එත්, එසේම ඡද්දන්ත විල සමීපයෙහි පිහිටි දෙව්විමන්වලින් හෝ කප්රුකෙන් පස් පැහැති හඳනා පොරෝණා රෙදිපිළිද, රන්වන් අත්පිස්නා පිළිද, දිව්‍යමය පැන්ද ගෙන එත්, මේ රජහට දවස් පතාම නාරජහු සිරුරෙහි ගල්වන සුවඳ, පෙරවීම පිණිස හුයින් නොගෙතූ සමන්මල් පිළි හා මාහැඟි අඳුන් නාග භවනයෙන් ගෙන එත්. ඡද්දන්ත විලෙහිම හටගත් ඇල්වී ගැල් නව දහසක් ගිරවු දිනපතාම ගෙන එත්. මීයෝ ඒ සහල් පොතු ගලවා හැර පිරිසිදු කරත්, එහි එක්ම කඩසහලෙක් නොවේ. රජුට සියලු තන්හි මේ සහල්ම පරිභෝගය පිණිස යෙදෙන්නේය. මීමැස්සෝ මී බඳිත්. කම්මාරශාලාවන්හි වලස්සු කුළු ගසත්. කුරවි කොවුලෝ මිහිරි හඬින් නාදකරමින් රජුට බිලියම් කරත්.

මෙසේ මේ සෘද්ධීන්ගෙන් යුක්තවූ රජතෙමේ එක් දවසක් රන් හැකිල්ලක් යවා කකුසන්ධාදීවූ සිවු බුදුවරුන්ගේ රූප දක්නාලද කලපායුෂකවූ කාල නම් නාරජහු ගෙන්වා සේසත යට මාහැඟි පලහෙහි හිඳුවා දිය ගොඩ හටගන්නා නොයෙක් සිය ගණුන් පැහැ ඇති මලින් හා රන්මලින් පුද සියලු අබරණින් සැරසුනු සොළොස් දහසක් නළඟනන්ගෙන් හාත්පසින් වටකරවා 'මාගේඅනන්තඥන ඇති සද්ධම්වර චක්‍රවර්තිවූ සම්මාසම්බුදු රජානන්වහන්සේගේ රූපය මොවුන්ගේ ඇස්වලට හමුකරව'යි කියාසිටියේය.

ඉක්බිති රජතෙමේ ඒ නාරජු විසින් මැවූ සියලු සිරුරෙහි විසුරුනු පින්තෙදින් නැගුනු අශීත්‍යානුබ්‍යඤ්ජනයෙන් යුක්ත ද්වාත්‍රිංශද්වර මහාපුරුෂ ලක්ෂණයන්ගේ සශ්‍රීකතායෙන් විකශිතවූ රත්පියුම් නිලුපුල්, හෙළපියුම්වලින් ගැවසීගත් ජලතලාවක් වැනිවූ තාරකා සමූහයාගේ රශ්මිසමූහයෙන් පැතිරිගත් ශොභාවෙන් බබලන අහස්තලය වැනිවූ නීල පීත ලොහිතාදි ප්‍රභෙදවත් විචිත්‍රවූ වණ්ණ රශ්මියෙන් වළඳනාලද ව්‍යාමප්‍රභාවෙන් වටකළ විලාසය ඇතිබැවින් සන්ධ්‍යාප්‍රභාරාගයෙන් යුත් ඉඳුසැවුවෙන් හා විදුලියෙන් වටකළ රන්කඳු මුදුනක් වැනිවූ නත් පැහැයෙන් නිම්ලවූ කෙතුමාලාවෙන් මොනවට බබලන මනොඥවූ මසාක ශොභා ඇති දෙවි, බඹ, මිනිස්, නා, යක් සමූහයාගේ නෙත්‍රයන්ට රසායනයක් වැනිවූ බුදුරුව බලමින් සත් දවසක් මුළුල්ලෙහි අක්ෂිපූජාව කෙළේය. රජතෙමේ අභිෂෙකයට පැමිණ තුන් අවුරුද්දක්ම බාහිර පාෂාණඩයන්ට සඩග්‍රහ කළේය. සිවුවන අවුරුද්දෙහි බුදුසසුනෙහි පහන්වූයේය.

ඒ රජුගේ පියවූ බින්දුසාර රජු බ්‍රාහ්මණයන් කෙරෙහි හක්තිමත් වූයේය. හෙතෙමේ බ්‍රාහ්මණයන්ට බ්‍රාහ්මණ ජාතික පාෂාණ්ඩයන්ට පණ්ඩරඞ්ග පරිව්‍රාජකාදීන්ට යන සැටදහසක් දෙනාට නිති බත් පිහිටුවාලූයේය. අශොක රජ තෙමේ පියරජහුවිසින් පවත්වනලද ඒ දනය තමාගේ ඇතුළු පුරයෙහි එසේම පවත්වනුයේ එක් දවසෙක සීමැදුරු කවුළුව වෙත සිටියේ, උපසමරහිතවූ ආචාරයෙන් යුක්තව බත් අනුභවකරණ නොසන්සුන් ඉඳුරන් ඇති නොහික්මුනු ඉරියවු ඇති ඔවුන් දැක 'මෙබඳු දන් පරික්ෂාකොට දීමට සුදුසු තැනම දීම වටිය'යි සිතීය. සිතා ඇමතියන් කැඳවා 'සගයෙනි! යවු, තම තමන් විසින් මනාය'යි පිළිගත් මහණ බමුණන් ඇතුළුපුරයට කැඳවාලවු, දන් දෙන්නෙමු'යි කීයේය. ඇමතියෝ 'මැනවි, දේවයන්වහන්ස'යි රජුට පිළිවදන් දී පණ්ඩරඞ්ග පරිබ්බාජක ආජීවක නිගණ්ඨාදීවූ ඒ ඒ අන් තොටුවන් පමුණුවා 'මහරජ! මේ අපගේ රහත්හු'යි රජුට දන්වාලූහ. එකල්හි රජ තෙමේ ඇතුළු පුරයෙහි කුදු මහත් අසුන් පණවාලා එත්වා'යි කියා ආ ආවුනට තම තමන්ට සුදුසු අසුන්හි හිඳිනු මැනව'යි කීයේය. උන් අතුරෙහි ඒ ඇතැම් කෙනෙක් භද්‍රපීඨයන්හිද ඇතැම් කෙනෙක් එලකපීඨයන්හිද හිඳගත්හ. රජතෙමේ ඔවුන්ගේ ඒ හිඳීම දැක ඔවුන්ගේ ඇතුළත ශීලාදීවූ ගුණභරයක් නැතැ'යි දැන ඔවුන්ට සුදුසුවූ කෑයුතු බිදියයුතු දෙයදී පිටත්කොට යැවූයේය.

මෙසේ කල්යත් එක් දවසක් රජතෙමේ සීමැදුරු කවුළුවවෙත සිටියේ, රජගෙදෙර මිදුලෙන් යන දමුනු රැකුනු සන්සුන් ඉඳුරන් ඇති මනා ඉරියව්වෙන් යුක්තවූ නිග්‍රොධ නම් හෙරණහු දුටුයේය. මේ නිග්‍රොධ නම් කවරෙක්ද යත්: බින්දුසාර රජුගේ දෙටුපුත්වූ සුමන රාජකුමාරයාගේ පුත්‍රතෙමේය. මේ එහි පිළිවෙළ කතාය: බින්දුසාර රජුගේ දුවිල අවස්ථාවෙහිම අශොක කුමාර තෙමේ තමන්ලද උදේනි රාජ්‍යය හැරපියා අවුත් මුළු නුවර තමන් අත්පත්කොට ගෙන සුමන නම් රජකුමරු අල්ලා ගත්තේය. එදවසම සුමන රජකුමරුගේ සුමනා නම් රාජදේවී පිරිපුන් ගැබ් ඇත්තීවූවාය. ඕ තොමෝ අප්‍රසිද්ධ වෙශයෙන් නික්ම නොදුරෙහිවූ එක්තරා සැඩොල් ගමක් බලා යන්නී, එහි දෙටු සැඩොලුගේ ගෙට නොදුරෙහි එක්තරා නුග රුකක අරක්ගෙන සිටි දෙවතාවක විසින් 'සුමනා! මෙහි එව'යි කියන්නියගේ ශබ්දය අසා ඇය වෙතට ගියාය. දෙවතාතොමෝ තමන්ගේ ආනුභාවයෙන් එක් හලක් මවා 'මෙහි වසව'යි කියා එය ඇයට පාවාදුන්නීය. ඕ තොමෝ ඒ හලට පිවිසියාය. එහි ඇතුල්වූදම පුතකු වැදූය. ඕ තොමෝ ඔහුට න්‍යග්‍රොධ දෙවතා විසින් රැකුම් ගත්බැවින් න්‍යග්‍රොධයි නම් කළාය.

එහි දෙටු සැඩොල් තෙමේ සුමනා රාජකුමරිය දුටු ද පටන් ඇය තමන්ගේ ස්වාමිදුව මෙන් සලකනුයේ ඇය පිණිස නිති වැටුප් තැබූයේය. රජදු තොමෝ එහි සත්අවුරුද්දක් විසූය. න්‍යග්‍රොධ කුමාර තෙමේද සත් වැසි වූයේය. එකල්හි මහාවරුණ නම් එක් රහතුන්වහන්සේ තමක් මේ දරුගේ රහත්බවට උපනිශ්‍රයවූ කුසල සම්පත්තිය දැක වසනුවෝ 'මේ දරු දැන් සත් වැසිය, ඔහු පැවිදි කිරීමට මේ කාලය'යි සිතා රජදුවට දන්වා න්‍යග්‍රොධ කුමරු පැවිදිකළහ. කුමාර තෙමේ කරකම් කෙළවරම රහත්බවට පැමිණියේය.

ඒ හෙරණ භික්ෂුව එක් දවසක් උදැසනම සිරුර පිළිදගුම් කොට ඇදුරු උවදුවත්කොට පාසිවුරු ගෙන මවු උවැසියගේ ගෙට යම්'යි නික්මුනේය. මෑ වසන තැනට දකුණුදෙරින් නුවරට පිවිස, නුවර මැදින් ගොස් පැදුම්දෙරින් නික්ම යායුතුවේ. ඒ වේලෙහි අශොක ධර්මරාජ තෙමේ පැදුම්දෙසට අභිමුඛව සීමැදුරු කවුළුව සමීපයෙහි සක්මන් කරමින් සිටියේය. එකෙණෙහිම න්‍යග්‍රොධ සාමණෙර තෙමේ සන්සුන් ඉඳුරන් ඇතියේ, සන්සුන් සිත් ඇතියේ, වියදඬු පමණ තැන් බලමින් රජ ගෙදෙර මිදුලට පැමිණියේය. **'එකදිවසං සීහපඤ්ජරෙ ඨිතො අද්දස නිග්‍රොධං සාමණෙරං රාජඩහණෙ ගච්ඡන්තං දන්තං සන්තින්ද්‍රියං ඉරියාපථසම්පන්නං'** යනු එහෙයින් කියනලදී.

රජගෙදෙර මිදුලෙහි යන දමුනු රැකුනු සන්හුන් ඉඳුරන් ඇති ඊර්‍යාපථසම්පන්නවූ ඒ හෙරණහු දැක රජහට 'මේ සියලු ජනතෙමේ විසිරුනු සිත් ඇත්තේ සැලෙන මුවන් වැනිවේ, මේ දරු තෙමේ නොවිසිරුනු සිත් ඇත්තේය, මොහුගේ ඉඳිරිය බැලීම අනුදිග් බැලීම අත්පා හැකිළීම දිගහැරීම ඉතා හොබනේය, ඒකාන්තයෙන් මොහුගේ ඇතුළත ලොකොත්තර ධර්ම පිහිටියේ වන්නේය'යි මෙසේ සිත්විය. තවද හෙරණහු දැකීම සමගම හෙරණහු කෙරෙහි රජුගේ සිත පහන්විය. ප්‍රෙමය උපන. පෙර මොවුන් පින්කම් කරන කාලයෙහි මේ හෙරණ භික්ෂුව රජුගේ දෙටුබෑ මී වෙළඳවූයේය.

එහෙයින් මෙය කියනලදී:

'පුබ්බෙව සන්නිවාසෙන - පච්චුපන්නහිතෙන වා
එවං තං ජායතෙ පෙමං - උප්පලංව යථොදකෙ'

පෙර සහවාසයෙන් හෝ මෙකල හිත වැටුමෙන් හෝ මෙසේ ප්‍රෙමය දියෙහි උපුල්පියුම් හටගන්නා සේ හටගන්නේයයි.

ඉක්බිති රජතෙමේ උපන් පෙම් ඇතියේ, බුහුමන් සහිතවූයේ 'අර යන හෙරණහු කැඳවා ගෙනඑවු'යි ඇමැතියන් යැවූයේය. රජතෙමේ 'ඒ ඇමැතියෝ බොහෝ කල්යවති'යි නැවතත් 'වහා එව'යි ඇමැතියන් දෙතුන් දෙනකුන් යැවීය. හෙරණතෙමේ තමන්ගේ පියවී ගමනින්ම ගියේය. රජතෙමේ 'සුදුසු අසුනක් දන වැඩහිඳිනු මැනවැ'යි උන්වහන්සේට කීය. හෙරණතෙමේ ඇත මැත බලා 'දන් මෙහි අන් මහණහු නැතැ'යි නැගූ සේසත් ඇති රජපලඟ වෙතට ගොස් පාත්‍රය ගැණීම පිණිස රජුට ඉඟියක් දක්වීය. රජතෙමේ පලඟ සමීපයට යන උන්වහන්සේ දැක 'අදම දන් මේ හෙරණ තෙමේ මේ ගෙට ස්වාමියෙක් වන්නේය'යි සිතීය. හෙරණතෙමේ රජුගේ අතට පාත්‍රය දී පලඟට නැගී වැඩහුන්නේය. ඉක්බිති රජතෙමේ තමන්ට පිළියෙලකොට තුබූ කැද කැවිලියෙන් යුත් ආහරවඟී එළවා තැබූයේය. හෙරණතෙමේ තමන්ට යැපිය හැකි පමණක්ම පිළිගත්තේය. බත්කිස අවසන්හි රජතෙමේ 'ශාස්තෘන්වහන්සේ විසින් ඔබවහන්සේලාට දෙනලද අවවාදය දන්නහුද'යි ඇසීය. හෙරණතෙමේ 'මහරජ! තරමක් දනිමි'යි කීයේය. 'එසේ නම් දරුව! එය මටත් වදරනු මැනවැ'යි කීය. 'මැනව මහරජ!'යි රජුට සුදුසුවූ ධම්පදයෙහි අප්‍රමාදවඟීය අනුමොදනාපිණිස වදළේය.

රජතෙමේ **'අප්පමාදෙ අමතපදං පමාදෙ මච්චුනෝ පදං'** යනු අසාම 'දරුව! දන්නා ලදය, බණ හමාරකරන මැනවැ'යි කීයේය. අනුමොදනා අවසානයෙහි 'දරුව! ඔබ වහන්සේට නිති බත්අටක් දෙමි'යි කියූකල්හි, හෙරණතෙමේ 'මහරජ! මේ නිතිබත් අට මම මාගේ උපාද්ධ්‍යායන්වහන්සේට දෙමි'යි දන්වා සිටියේය. 'දරුව! මේ කවරෙක් උපාද්ධ්‍යාය නම්වේද'යි ඇසූකල්හි 'මහරජ! කුදු මහත් වරද නිවරද දැක වොදනා කරනුයේ සිහිකරවනුයේ උපාද්ධ්‍යාය'යි කීයේය. 'එසේ නම් දරුව! අනිකුදු අටක් දෙමි'යි කියූකල්හි 'මේ අට මාගේ ආචාර්‍යයන්වහන්සේට දෙමි'යි හෙරණතෙමේ කීය. එකල්හි රජතෙමේ මේ කවරෙක් ආචාර්‍ය නම්වේද'යි ඇසීය. 'මහරජ! මේ ශාසනයෙහි භික්ෂුයුතු දහමිහි පිහිටුවාලන්නේය'යි කීය. 'හොඳයි දරුව! අනිකුදු අටක් දෙමි'යි රජු කියූ කල්හි 'මහරජ! මේ අට සඞ්ඝයාවහන්සේට දෙමි'යිකීය. එකල්හි රජතෙමේ 'දරුව! මේ කවරෙක් සඞ්ඝ නම්වේද'යි ඇසීය. 'මහරජ! අපගේ ආචාර්‍යෝපාද්ධ්‍යායන්වහන්සේගේත් මාගේත් පැවිද්ද හා උපසම්පදව යමෙකුනිසා වේනම් ඒ භික්ෂු සඞ්ඝ' නමැයි හෙරණතෙමේ කීයේය.

රජතෙමේ අතිශයින් සතුටුවූයේ 'දරුව! අනිකුදු අටක් ඔබවහන්සේට දෙමි'යිකීය. හෙරණතෙමේ 'මැනවැ'යි පිළිගෙන පසුද දෙතිස්නමක් භික්ෂූන්ගෙන රජුගේ ඇතුළුපුරයට පිවිස බත්කිස කෙළේය. රජතෙමේ 'අනිකුදු දෙතිස්නමක් භික්ෂූහු ඔබවහන්සේ සමගම භික්ෂාව ගන්නාසේක්වා'යි මේ ලෙසින් දවසින්දවස දවිගුණදවිගුණකොට භික්ෂූන් වඩන්නේ සැටදහසක් බ්‍රාහ්මණ පරිබ්‍රාජකාදීන්ට දෙනලද බත් නවතා, න්‍යග්‍රොධ ස්ථවිරයන්වහන්සේ කෙරෙහි උපන් පැහැදීමෙන් ඇතුළුගෙයි සැටදහසක් භික්ෂූන්ට නිතිබත් පිහිටුවාලූයේය. න්‍යග්‍රොධ ස්ථවිරයන්වහන්සේද පිරිස් සහිතවූ රජු තිසරණයෙහි හා පඤ්චශීලයෙහි පිහිටුවා බුදුසසුනෙහි සුහුදුන් පැහැදීමෙන් නොසැලෙන පැහැදුම් ඇත්තකු කොටපිහිටවූහ. නැවත රජතෙමේ අශොකාරාම නම් මහාවිහාරය කරවා සැටදහසක් භික්ෂූන්ට නිතිබත් එළවූයේය. සියලු දඹදිව සූවාසූදහසක් නගරයන්හි සූවාසූදහසක් චෛත්‍යයෙන් ප්‍රතිමණ්ඩිතවූ සූවාසූදහසක් විහාර ධර්මයෙන්ම කරවූයේය. අධර්මයෙන් නොද කරවූයේය.

එක් දවසක් රජතෙමේ අශොකාරාමයෙහි සළු, සත්, වහන් ආදියෙන් යුත් මහදනක්දී සැටදහසක් භික්ෂුසඞ්ඝයා මැද හිඳ සඞ්ඝයා සිවුපසයෙන් පවරා 'සචාමිනි! භාග්‍යවතුන්වහන්සේ විසින් දේහනා කළ ධර්ම කොපමණ වේද'යි යන මේ ප්‍රශ්නය විවාළේය. 'මහරජ! අඞ්ගවශයෙන් නවාඞ්ගයෙක, ස්කන්ධවශයෙන් සූවාසූදහසෙකැ'යි වදළකල්හි රජතෙමේ ධර්මයෙහි පැහැද එක් එක් ධර්මස්කන්ධය එක් එක් විහාරයෙන් පූදන්නෙමියි එක්ම දවසෙහි සයාතූකෙළක් ධනය විසදා ඇමතියන් කැඳවා 'සගයෙනි! එවු, එක්එක් නුවර එක්එක් විහාරකරවන්නහු, සූවාසූදහසක් නුවර සූවාසූදහසක් වෙහෙරකරවාලවු'යි අණකෙළේය. තෙමේද අශොකාරාමයෙහි අශොක මහාවිහාරය පිණිස කර්මාන්ත පටන්ගත්තේය. සඞ්ඝයාවහන්සේ මහත් සෘද්ධිඇති මහත් ආනුභාව ඇති ක්ෂයකළ ආස්‍රව ඇති ඉන්ද්‍රගුත්ත මහතෙරහු කර්මාන්ත විධාන කරන්නහුකොට දුන්නේය. ඒ මහාස්ථවිරයන්වහන්සේ යම් යම් කර්මාන්තයක් නොනිමියේද ඒ ඒ කර්මාන්ත තමන්ගේ ආනුභාවයෙන් නිමකරවූහ. මෙසේ තුන් අවුරුද්දකින් විහාර කර්මාන්ත නිමකරවූහ. එක්ම දවසෙහි සියලු නගරයන්ගෙන් ඒවග දන්වා ලියුම් ආයේය. ඇමතියෝ 'දෙවයන් වහන්ස! සූවාසූ දහසක් විහාර ගොඩනගා අවසන්කරණුලද'යි රජුට සැලකළහ.

ඉක්බිති රජතෙමේ 'මෙයින් සත්දවසක් ඇවැමෙන් විහාරපූජොත්සවය වන්නේය, එහෙයින් සියල්ලෝ අටසිල් සමාදන්ව

ඇතුළුනුවරෙහිද, පිට නුවරෙහිද විහාර පූජොත්සවය පිළියෙල කෙරෙත්වා'යි නුවර බෙර හැසිරවූයේය. එයින් යත් දවසක් ඇවැමෙන් සියලු අබරණින් සැරසුණු නොයෙක් සියදහස් ගණන් සිවුරහසෙනහින් පිරිවරනලද රජතෙමේ, දෙව්ලොව අමරවතී රාජධානියෙහි ශොභාවට අධිකතරවූ ශොභා ඇත්තක්කොට නුවර සරසනු කැමතිවූ හටගත් උත්සාහය ඇති මහාජනයා විසින් සරසා පිළියෙලකළ නුවර හැසිරෙනුයේ, විහාරයට ගොස් භික්ෂුසඞ්ඝයා මැද සිටගත්තේය. එකෙණෙහි අසූකෙළක් භික්ෂූහු එහි රැස්වූහ. භික්ෂුණීහු සයාතූකෙළක්වූහ. එහි ක්ෂීණාස්‍රව භික්ෂූහුම ලක්ෂගණනක්වූහ. උන්වහන්සේලාට 'ඉදින් රජතෙමේ තමන්ගේ අධිකාරය ඉතිරි නොකොට දක්නේ නම් වැඩියක් සසුනෙහි පහදින්නේය'යි සිත්වූයේය. එහෙයින් උන්වහන්සේලා ලොකවිවරණ නම් පෙළහර කළහ. රජතෙමේ අශොකාරාමයෙහි සිටියේම සිවුදිගුන් බලනුයේ හාත්පසින් මුහුද කෙළවරකොට සිටි දඹදිවද, උදරවූ විහාර පූජෝත්සවයෙන් බබලන අසූසාරදහසක් විහාරද දක්නේය. රජතෙමේ ඒ ශ්‍රී විභූතිය දක්නේ උදරවූ ප්‍රීතිප්‍රමොද්‍යයෙන් යුක්තවූයේ 'අන් කිසිවක්හටත් පෙර උපන්විරූ මෙබඳු ප්‍රීතිප්‍රමොද්‍යයක් ඇත්තේද'යි සිතනුයේ 'ස්වාමීනි! අපගේ දසබලධාරී ලොකස්වාමිවූ බුදුරජානන්වහන්සේගේ ශාසනයෙහි කවරක්නම් මහා පරිත්‍යාගයක් කළේද, කවරක්හුගේ පරිත්‍යාගය මහත්යි කියත්ද'යි භික්ෂුසඞ්ඝයාගෙන් විචාළේය. මහා භික්ෂුසඞ්ඝයා එයට පිළිතුරුදීම මොග්ගලිපුත්තතිස්ස මහාස්ථවිරයන්වහන්සේට භාරකළහ.

ඉක්බිති මොග්ගලිපුත්තතිස්ස මහා ස්ථවිරයන්වහන්සේ 'මහරජ! දසබලධාරී බුදුරජානන්වහන්සේගේ ශාසනයෙහි ඔබ සමානවූ අන්කිසි ප්‍රත්‍යය දයකයෙක් තථාගතයන්වහන්සේ ධරමාන කාලයෙහිද නොවූයේය, ඔබගේම පරිත්‍යාගය මහත්'යි කීහ. රජතෙමේ තෙරුන්ගේ මේ වචනය අසා උදරවූ ප්‍රීතිප්‍රමොද්‍යයෙන් නිරතුරුව පහස්නාලද සිරුරු ඇතියේ 'මා හා සමාන ප්‍රත්‍යය දයකයෙක් නැත්තේය, මාගේම පරිත්‍යාගය මහත්ය, මම දියයුතු දෑයින් සසුනට සඞ්ග්‍රහකරම්, කිම? මම මෙසේ ඇතිකල්හි සසුනෙහි නෑයෙක් වෙම්ද, නොවෙම්ද'යි සිතීය. එසේ සිතා රජතෙමේ, 'ස්වාමීනි! මම සසුනෙහි නෑයෙක් වෙම්ද' යි භික්ෂු සඞ්ඝයාගෙන් විචාළේය.

ඉක්බිති මොග්ගලිපුත්තතිස්ස මහා ස්ථවිරයන්වහන්සේ රජුගේ මේ වචනය අසා මහින්ද රජකුමරුගේ උපනිඃශ්‍රය සම්පත්තිය දක්නාහු 'මේ කුමරු පැවිදිවන්නේනම් එය සසුනෙහි මහත් අභිවෘද්ධියෙකැ'යි සිතා 'මහරජ! මෙපමණකින් සසුනෙහි නෑයෙක් නොවේමය, එහෙත්

ප්‍රත්‍යය දයකැයි හෝ උපස්ථායකැයි ගිනීමට යන්නේය, මහරජ! යමෙක් පොළොව පටන් බඹලොව පමණතෙක් ප්‍රත්‍යය රාශියක් දෙන්නේ නමුත් හෙතෙමේද සසුනෙහි නැයෙකැ'යි ගිනීමට නොයන්නේය'යි රජුට වදළසේක. 'ස්වාමීනි! එසේනම් කෙසේ වනාහි සසුනෙහි නැයෙක්වේද'යි ඇසීය. 'මහරජ! පොහොසත්වූ හෝ දිළිඳුවූ යම්කිසිවෙක් තමන්ගේ ඖරසපුත්‍රයකු සසුනෙහි පැවිදිකරවාද, මහරජ! මෙතෙමේම සසුනෙහි නැයෙක්වේය'යි වදළසේක.

මෙසේ වදළකල්හි අශෝක රජතෙමේ 'මම මෙබඳු මහත් පරිත්‍යාගකොටද සසුනෙහි නැයෙකු බවට නොදපැමිණියෙමි'යි සසුනෙහි නැබව පතමින් වටපිට බැලීය. එවිට නොදුරෙහි සිටි මිහිඳුකුමරු දැකීමෙන් රජහට 'මම තිස්සකුමරු පැවිදිවූදසිට මේ කුමරු යුවරජ බැවිහි පිහිටුවනු කැමැත්තෙම්වීමි, එහෙත් යුවරජබවට වඩා පැවිද්දම උතුමැ'යි සිත්විය. ඉක්බිති 'පුත! පැවිදිවන්නට හැක්කෙහිද'යි මිහිඳුකුමරුන්ගෙන් ඇසීය. මිහිඳු කුමරතෙමේද පියොවින්ම තිස්සකුමරු පැවිදිවූදසිට පැවිදිවනු කැමැත්තේම රජුගේ වචනය අසා හටගත් වැඩියක් හටගත් ප්‍රමොදය ඇත්තේ 'දේවයන්වහන්ස! පැවිදිවෙමි, මා පැවිදිකරවා ඔබ සසුනෙහි දයාදවහු'යි කීයේය.

ඒ වේලෙහි **සඞ්ඝමිත්‍රා** රජදු කුමරියද එතැනම සිටියාය. ඇයගේ ස්වාමිපුත්‍රවූ අග්ගිබ්‍රහ්මනම් කුමරුද යුවරජවූ තිස්සකුමරුන් හා පැවිදිවූයේවේ. රජතෙමේ ඇය දැක 'දියනියෙනි! තිටත් පැවිදිවනු හැකිද'යි ඇසීය. 'පියාණෙනි! මැනවි, පැවිදිවන්නට හැක්කෙමි'යි කුමරිය පිළිතුරු දුන්නීය. රජතෙමේ දූපුතුන්ගේ අදහස ලබාගෙන, පහටුසිත් ඇත්තේ භික්ෂුසඞ්ඝයාහට 'ස්වාමීනි! මේ දරුවන් පැවිදිකරවා මා සසුනෙහි නැයකු කරමැනව'යි කියාසිටියේය. සඞ්ඝයාවහන්සේ රජුගේ වචනය පිළිගෙණ **මොග්ගලිපුත්තතිස්ස** මහා ස්ථවිරයන්වහන්සේ උපාධ්‍යායකොට මහාදෙව මහා සථවිරයන්වහන්සේ ආචාර්‍යකොට මිහිඳුකුමරු පැවිදිකරවූයේය. මජ්ඣන්තික මහා ස්ථවිරයන්වහන්සේ ආචාර්‍යකොට උපසපන් කරවූයේය. එකල්හි මිහිඳුකුමරු පිරිපුන් විසිවයස් ඇත්තේදවේ. ඒ මහිඳුහිකුණු උපසම්පද මණ්ඩලයෙහිදීම පිළිසැඹියාවත් සමග රහත්බවට පැමිණියේය.

සඞ්ඝමිත්‍රා රාජ දුහිතෘ ආචාර්‍යවූවා **ආයුපාලි** ස්ථවිරිතොමෝය. උපාධ්‍යායවූවා **ධම්මපාලි** ස්ථවිරිතොමෝය. එදවස සඞ්ඝමිත්‍රා ස්ථවිරාතොමෝ. අටළොස්වස් ඇත්තීය. පැවිද්ද පමණක් ඇති ඇය ඒ සීමාමණ්ඩලයෙහිදීම ශික්ෂාසමුතියදී **'පාණාතිපාතා වෙරමණි'**

යන ශික්ෂාපදය මුල්කොටඇති **'විකාලභොජනා වෙරමණි'** යන ශික්ෂාපදය කෙළවරකොටඇති ෂට්ශික්ෂාවෙහි සමාදන්කරවීම්වසයෙන් ශික්ෂාවෙහි පිහිටෙව්වාහුය. ඒ දෙදෙන පැවිද්දලැබූ කාලයෙහි රජතෙමේ අභිෂෙකයෙන් සවස් ඇත්තේවේ.

මහින්ද ස්ථවිරයන්වහන්සේ උපසපන්වූ කාලයෙහිපටන් තමන්ගේ උපාදධ්‍යායයන්වහන්සේ වෙතම ධර්මයද විනයද පුහුණුකරන්නාහු ප්‍රථම-දවිතීය සඞ්ගායනාවන්ට නැගූ අර්ථකථා සහිතව සඞ්ගායනාකරණලද සියලු ථෙරවාද ත්‍රිපිටකධර්මය තෙවසක් ඇතුළතදී උගෙන තමන්ගේ උපාදධ්‍යායයන්වහන්සේගේ අතවැසි දහසක් පමණ භික්ෂූන් අතුරෙහි ප්‍රමුඛවූහ. එකල්හි අශොක ධර්මරාජතෙමේ අභිෂෙකයෙන් නවවස් ඇත්තේවේ. රජුගේ අභිෂෙකයෙන් අටවස් කාලයෙහිම කුන්නපුත්තතිස්ස ස්ථවිරයන්වහන්සේ ව්‍යාධි පිළියම්පිණිස භික්ෂාචාරවතින් ඇවිදින්නාහු අතළොස්සක් පමණවූ ගිතෙලක් නොලැබ ව්‍යාධි බලයෙන් පිරිහී ගිය ආයුසංස්කාර ඇත්තාහු භික්ෂුසඞ්ඝයාහට අප්‍රමාදයෙන් අවවාදදී අහසෙහි පර්‍යඞ්කයෙන් හිඳ තෙජොධාතු සමාපත්තියට සමවැද පිරිනිවියහ.

රජතෙමේ කුන්නපුත්‍රතිස්ස ස්ථවිරයන්වහන්සේ පිළිබඳ එපුවත අසා තෙරුන්ගේ. ධාතුසත්කාරයකොට 'මා රාජ්‍යය කරවනකල්හි භික්ෂූන්වහන්සේට මෙසේ ප්‍රත්‍යය දුලීභය'යි දන නුවර සිවුදෙරටුවෙහි එක් දෙරටුවෙහි සතරසතර බැගින් පොකුණුකරවා බෙහෙතින් පුරවා සඞ්ඝයාහට දෙවූයේය.

ඒ කාලයෙහි රජහට පැළලුප් නුවර සිවුදෙරින් සාරලක්ෂයක්ද, නුවරමැද විනිශ්චයශාලාවෙන් ලක්ෂයක්ද'යි දවසක් දවසක් පාසා රටින් උපදින අය හැර පන්ලක්ෂයක් උපදියි. රජ තෙමේ ඒ පන්ලක්ෂයෙන් එක් ලක්ෂයක් න්‍යග්‍රොධ තෙරුන් පිණිස දවස් පතා වියදම්කරයි. බුදුරජානන්වහන්සේගේ සෑය ගඳ මල් ආදියෙන් පුදනුපිණිස එක් ලක්ෂයක්ද, ධර්මයට එක් ලක්ෂයක්ද වියදම්කරයි, ධර්මයට පිදූ එක් ලක්ෂය බහුශ්‍රැතවූ ධර්ධරයන්ගේ සිවුපසයපිණිස එළවනුලැබේ. සඞ්ඝයාහට එක් ලක්ෂයක් පිදුනේය. සිවුදෙරටුවෙහි බෙහෙත්පිණිස ලක්ෂයක් යෙදුනේය. මෙසේ සසුනට මහත්ලාභ සත්කාර උපන්නේය.

මේ හේතුවෙන් පිරිහුණු ලාභසත්කාර ඇති තීර්ථකයෝ යටත්පිරිසෙයින් කැමිඇදීම් පමණකුත් නොලබන්නාහු ලාභසත්කාර පතන්නාහු සසුනෙහි පැවිදිව 'මේ ධර්මය, මේ විනයය'යි තමතමන් අයත් මිත්‍යාදෘෂ්ටීන් ප්‍රකාශකරත්. පැවිද්ද නොලබන්නාහුද තුමූම හිස මුඩුකොට

කසටවත් හැඳ විහාරයන්හි හැසිරෙමින් පොහොයකිරීමටද, පවාරණයටද, සඞ්ඝකර්මයටද, ගණකර්මයටද,වැදගණිත්. භික්ෂූහු ඔවුන් සමග පෙහොය නොකරත්. එකල්හි මොග්ගලිපුත්තතිස්ස මහා ස්ථවිරයන්වහන්සේ 'දැන් මේ අධිකරණයෙක් උපන්නේය, වැඩිකල් නොගොස්ම එය කැකුළුවන්නේය, මේ අධිකරණය මොවුන් මැද වසන්නහු විසින් සන්සිඳුවන්නට නොහැකිය'යි මිහිඳුතෙරුන්ට ගණයා පාවාදී තමන්වහන්සේ පහසුවිහරණයෙන් වසනුකැමැතිව අහොගඞ්ග පර්වතයට වැඩියසේක.

ඒ තීර්ථකයෝද භික්ෂුසඞ්ඝයා විසින් ධර්මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් නිග්‍රහකරණ්ඩුලබන්නාහුද, ධර්මවිනයයට අනුලොම්වූ පිළිවෙතෙහි නොසිටින්නාහු සසුනට නන්වැදරුම්වූ අර්බුදද, මලද, කවුද ඉපදවූහ. සමහරු ගිනි පුදත්. සමහරු සතරපැත්තෙහි ගිනි දල්වා එහි මැදසිට සූර්‍යතාපයෙන් තැවෙත්, සමහරු හිරුට මූණදී පෙරළෙත්, සමහරු ධර්මයත් විනයත් ඉතිරි නොකොට බිඳහරින්නෙමු'යි තැත්කළහ. එකල්හි භික්ෂුසඞ්ඝයා ඔවුන් සමග පොහොයද පවාරණයද නොකෙළේය. අශෝකාරාමයෙහි සත්අවුරුද්දක් පොහොයකිරීම මුළුමනින් සිඳීගියේය. රජුටද මේ කාරණය දන්වා සිටියහ. එකල්හි රජතෙමේ එක් ඇමතියෙකුට 'විහාරයටගොස් අධිකරණය සන්සිඳුවා පොහොය කරවාලව'යි අණකෙළේය. අණලත් අමාත්‍යතෙමේ රජුගෙන් නැවත විචාරන්නට අසමර්ථවූයේ අන් ඇමතියන්කරා එළඹ, 'රජතෙමේ විහාරයට ගොස් අධිකරණය සන්සිඳුවා සඞ්ඝයාලවා පොහොය කරවාලන්නැ'යි මා පිටත්කොට හැරියේය, අධිකරණය කෙසේ සන්සිඳේද'යි ඇසීය. ඒ ඇමතියෝ 'පසල් දනවු සන්සිඳුවන්නෝ හොරුන් අල්ලා යම්සේ නසාලත්ද, එපරිද්දෙන් යම්කෙනෙක් පොහොය නොකරත්ද රජතෙමේ ඔවුන් මරවනු කැමැත්තේ වන්නේයයි මෙසේ අපි සලකමු'යි කීහ.

ඉක්බිති ඒ ඇමතිතෙමේ විහාරයට ගොස් භික්ෂුසඞ්ඝයා රැස්කරවා, 'ඔබවහන්සේ ලවා පොහොය කරවාලවයි රජුවිසින් මම මෙහි එවන ලද්දෙමි වෙමි, එහෙයින් ස්වාමිනි! දැන් පොහොය කරනුමැනවැ'යි දන්වා සිටියේය. භික්ෂූහු 'අපි තීර්ථකයන් සමග පොහොය නොකරමු'යි කීහ. එකල්හි අමාත්‍යතෙමේ ථෙරාසනයෙහි පටන් කඩුවෙන් භික්ෂූන්ගේ හිස් කපා හෙලන්නට පටන්ගත්තේය. එහි සිටි තිස්ස ස්ථවිරයන්වහන්සේ එසේ විපිළිපන් ඒ අමාත්‍යයා දුටහ. තිස්ස ස්ථවිරයන්වහන්සේ යම් ඒ කෙනෙක් නොවෙති. උන්වහන්සේ රජුගේ එක් මවුකුස උපන් සොහොයුරුවූ තිස්ස

කුමාරයෝය. රජතෙමේ පැමිණි රාජ්‍යාභිෂේකය ඇත්තේ ඒ තිස්සකුමරු යුවරජ බැවිහි තැබුයේය. හෙතෙමේ එක් දවසක්හි වනයෙහි හැසිරීමට ගියේ කැමැතියේ කෙළින මහත් මුවරැළක් දුටුයේය. ඒ දකීමෙන් ඔහුට 'මේ මුවෝ තණ බුදින්නාහු මෙසේ ක්‍රීඩා කරන්නෝය, මේ ශ්‍රමණයෝවනාහි රජගෙයින් ලැබෙන පිණිබොජුන් වළඳ මොළොක් යහන්හි හොවින්නාහු කොතරම් සිත්ගත් ක්‍රීඩාවක් නමුත් නොකරන්නාහුය'යි අදහස්වූයේය. ඔහු වනයෙන් අවුත් තමන්ගේ මේ චිතකීය රජුට සැලකොට සිටියේය. එ කල්හි රජතෙමේ 'කුමරුන් නොතැන කුකුස්කරණුලද්දේය. එබැවින් එය මොහුට මෙසේ හඟවන්නෙමි'යි එක් දවසක් කිසි කරුණකින් කිපියෙකු මෙන්ව 'එව මෙහි, සත්දවසකට මේ රජය පිළිගණුව, සත්දවස ගෙවීගියතැන තා නසා ලන්නෙමි'යි මරණබියෙන් තැතිගන්වා ඒ කාරණය අවබෝධ කරවීය. ඒ කුමාරතෙමේ සත්වන දවසෙහි මා මරවනු ඇතැ'යි සිත් සේ නොනෑයේය. නොකෑයේය. නිදි නොගත්තේය. එහෙයින් තදින් වැහැරීගිය රළුසිරුරු ඇත්තේවිය.

ඉක්බිති රජතෙමේ 'තෝ කවර හෙයකින් මෙසේ වැහැරී ගියෙහිදැ'යි ඔහුගෙන් ඇසීය. 'දෙවයන්වහන්ස! මරණ බියෙනැ'යි කීය. 'කොල! තෝ සත්දවසින් පිරිසිදිනලද මරණය දක්නෙහි, නිසැක සිත් ඇතියෙහි ක්‍රීඩා නොකරන්නෙහිය, භික්ෂූහු හුස්ම ගැනීම හා පිටකිරීම සම්බන්ධකොට ඇති මරණය ගැණ බලාපොරොත්තු වන්නාහු කෙසේ ක්‍රීඩා කරන්නාහුදැ'යි කීයේය. එතැන් පටන් කුමාරතෙමේ සසුනෙහි පැහැදුනේය.

හෙතෙමේ නැවැත එක් දවසක් මුවදඩයමට ගොස් වනයෙහි ඒ ඒ තැන හැසිරෙනුයේ, එක්තරා ඇත්රජෙකු විසින් සල් අත්තක් ගෙන පවන්සලනුලබන වැඩහුන් **යොනක මහාධම්මරක්ඛිත** මහා ස්ථවිරයන්වහන්සේ දුටුයේය. දැක හටගත් ප්‍රමුදිතභාව ඇත්තේ, 'කවදනම් මමත් මේ මහතෙරුන්මෙන් පැවිදිවන්නෙමිද කවදනම් එබඳු දවසක් මටත් වන්නේද'යි සිතීය. යොනක මහා ධම්මරක්ඛිත ස්ථවිරයන්වහන්සේ ඔහුගේ මේ අදහස දැන ඔහු බලාඉන්දදීම අහසට නැඟී ගොස් අශොකාරාමයෙහිවූ පොකුණෙහි දියමතුපිට සිට සිවුරත් උතුරුසහ සිවුරත් අහසෙහි එල්ලා නාන්නට පටන්ගත්හ. කුමාරතෙමේ තෙරුන්ගේ ආනුභාවය දැක වැඩියක් පහන්වූයේ, 'අදම පැවිදිවන්නෙමි'යි පෙරළා අවුත් 'දෙවයන්වහන්ස! මම පැවිදි වන්නෙමි'යි රජුට දන්වා සිටියේය. රජතෙමේ නොයෙක් අයුරින් යැදද, ඔහු නවතාලන්නට නොහැකිවනුයේ අශොකාරාමයට යායුතු මඟ සරසවා

කුමරුට උත්සවවෙශය ගන්වා සැරසුනු සේනාවෙන් පිරිවරවා විහාරයට පැමිණවූයේය.

'යුවරජතෙමේ පැවිදි වන්නේය'යි අසා බොහෝ භික්ෂූහු පාසිවුරු පිළියෙලකළහ. කුමාරතෙමේ පධානඝරයට ගොස් **මහාධම්මරක්ඛිත** මහා ස්ථවිරයන්වහන්සේගේ සමීපයෙහිම සියදහසක් පුරුෂයන් සමග පැවිදිවූයේය. කුමරු අනුව ගොස් පැවිදිවූවන්ගේ ගණන් පිරිසිඳීමක් නැත්තේය. කුමරු රජුගේ අභිෂෙකයෙන් සිවුඅවුරුදු කාලයෙහි පැවිදිවූයේය. නැවත රජුගේ බුහුනන් පුත්වූ සඞඝමිත්‍රාවගේ ස්වාමිපුත්‍රවූ **අග්ගිබ්‍රහ්ම**නම් කුමාරයෙක් ඇත්තේය. සඞඝමිත්‍රා ඔහුට දව එක්ම පුතෙකු වැදූය. ඔහුද 'යුවරජතෙමේ පැවිදිවූයේය'යි අසා රජු වෙත ගොස් 'දෙවයන්වහන්ස! මමත් පැවිදි වන්නෙමි'යි පැවිද්දට අවසර ඉල්ලීය. 'දරුව! පැවිදිවෙව'යි රජුවිසින් අනුදන්නාලද්දේ එදවසම පැවිදිවූයේය. මෙසේ උදර සම්පත් ඇති ක්‍ෂත්‍රිය ජනයා අනුව ගොස් පැවිදිවූ රජුගේ කනිටුබෑ තිස්ස ස්ථවිර'යි දතයුතුය.

ඒ තිසස ස්ථවිරයන්වහන්සේ එසේ විපිළිපන් ඒ ඇමතියා දක 'රජතෙමේ තෙරුන් මරන්නට මොහු නොඑවන්නේය, ඒකාන්තයෙන් මෙය මේ ඇමතියාගේම නපුරු ගැන්මෙක් වන්නේය'යි සිතුයේය. එසේ සිතා ගොස් තෙමේ ඔහුට ලංව තුබූ අසුනෙහි හිඳගත්තේය. ඒ ඇමති තෙරුන් හැඳින කඩුව හෙළන්නට අපොහොසත්වූයේ ගොස්, දෙවයන්වහන්ස! මම පොහොය කරන්නට නොකැමැතිවූ මෙපමණ භික්ෂූන්ගේ හිස් කපා හෙළීමි, අනතුරුව ආයුර්තික්ෂ්‍ය ස්ථවිරයන්වහන්සේට පිළිවෙළ පැමිණියා කුමක් කරම්ද'යි රජුට දන්වා සිටියේය. රජතෙමේ එපුවත අසාම 'බොල! කිම මාවිසින් තෝ යවනලද්දෙහි භික්ෂූන් නසන්නටද'යි එකෙණෙහිම සිරුරෙහි හටගත් දහය ඇත්තේ විහාරයට ගොස් 'ස්වාමීනි! මේ ඇමතිතෙමේ මාවිසින් නොඅණවනලද්දේම මෙසේ කෙළේය, කවරක්හට මේ පාපය වියයුතුද'යි ස්ථවිරභික්ෂූන් අතින් විවාළේය. එහි ඇතැම් ස්ථවිරයන්වහන්සේ 'මෙතෙමේ ඔබගේ වචනයෙන් මෙය කෙළේය, එහෙයින් මේ පාපය ඔබටැ'යි කීහ. ඇතැම්හු 'මේ පාපය ඔබ දෙපොලටමැ'යි කීහ. ඇතැම්හු 'මහරජ! කිම මෙ තෙමේ ගොස් භික්ෂූන් නසාවායි ඔබට සිතක්වූයේද'යි ඇසූහ. 'ස්වාමීනි! එබදු සිතක් මට නොවීය. මම කුසල්අදහස් ඇතියෙමි, සමග්‍රවූ භික්ෂුසඞඝතෙමේ පොහොය කෙරේවායි දන්වා යැවීමි'යි රජතෙමේ කීයේය. 'මහරජ! ඉදින් ඔබ කුසල්අදහස් ඇතියහුනම් ඔබට පාපයක් නැත්තේය, මේ පාපය ඇමතිහටමැ'යි කීහ.

රජතෙමේ ස්ථවිරභික්ෂූන් කියූ මෙබස් අසා හටගත් සැක ඇත්තේ 'ස්වාමීනි! මාගේ සැකය සිඳහැර සසුන නගාසිටුවන්නට සමර්ථවූ කිසි භික්ෂුනමක් ඇත්තේද'යි ඇසීය. 'ඇත, මහරජ! මොග්ගලිපුත්තතිස්ස මහාස්ථවිරයන්වහන්සේ, උන්වහන්සේ ඔබගේ මේ සැකය සිඳහැර සසුන නගාසිටුවන්නට සමර්ථ වනසේකැ'යි කීහ. රජතෙමේ, එදවසම එකක් එකක්හට සමර්ථ වනසේකැ'යි කීහ. රජතෙමේ, එදවසම එක් භික්ෂුවට භික්ෂූන් එක් එක් දහස පිරිවරකොටදී ධර්මකථික භික්ෂූන් සිවුනමක්ද, එක ඇමතියකුට පුරුෂයන් දහසදහස පිරිවරකොටදී ඇමතියන් සිවුදෙනකුන්ද 'තෙරුන් වැඩමවාගෙන එවු'යි යැවූයේය. ඔවුහු ගොස් 'රජතෙමේ කැඳවා'යි කීහ. මහාස්ථවිරයන්වහන්සේ නොවැඩියාහ. රජ තෙමේ, දෙවන වරද, දහසදහස පිරිවර ඇතිවම ධර්මකථික භික්ෂූන් අටනමක්ද, ඇමතියන් අටදෙනෙකුන්ද 'ස්වාමීනි! රජතෙමේ කැඳවා'යි කියා තෙරුන් ගෙනම එවු' යි යැවීය. ඔවුහු තෙරුන් වෙත ගොස් එසේම සැලකොට සිටියහ. දෙවන වරද මහා ස්ථවිරයන්වහන්සේ නොද වැඩියාහ. එකල්හි රජතෙමේ, ස්ථවිරභික්ෂූන් අතේ 'ස්වාමීනි! මම දෙවරක්ම ආරාධනා යැවීමි, කුමක් හෙයින් මහා ස්ථවිරයන්වහන්සේ නොවඩින සේක්ද'යි විචාළේය. 'මහරජ! රජතෙමේ කැඳවායි කියූබැවින් නොවැඩියහ, ස්වාමීනි! සසුන පසුබස්නේය, අපගේ සසුන නගාසිටුවන්නට සහාය වනුමැනවයි මෙසේ දන්වා යැවූකල්හි වඩිනු ඇතැ'යි කීහ.

ඉක්බිති රජතෙමේ, එසේ කියා දහසදහස පිරිවරකොට ඇති සොළොසක් ධර්මකථික භික්ෂූන්ද, සොළොසක් ඇමතියන්ද යැවූයේය. යවා, 'ස්වාමීනි! මහාස්ථවිරයන්වහන්සේ මහලුසේක්ද, නැත, තරුණසේක්ද'යි භික්ෂූන් අතින් විචාළේය. 'මහරජ! මහලුසේකැ'යි කියූකල්හි 'ස්වාමීනි පුවරුවෙන් වසාකළ ගැලකට, සිවිගෙයකට හෝ නගිනසේක්ද'යි ඇසීය. 'නැත, මහරජ! නොනගිනසේකැ'යි කීහ. එකල්හි 'ස්වාමීනි! මහාස්ථවිරයන්වහන්සේ කොතැන වසත්ද'යි විචාළේය. 'මහරජ! ගහ මතුවෙහි'යි කීහ. රජතෙමේ, 'සඟයෙනි! එසේනම් තෙපි එකට ගටා නැවක් බැඳ, එහි තෙරුන් වඩාහිඳුවා දෙගංඉවුරෙහි රැකවල්තබා තෙරුන් වඩාගෙන එවු'යි අණකෙළේය. භික්ෂූහුද ඇමතියෝද තෙරුන්වෙත ගොස් රජුගේ ආරාධනාව සැලකොට සිටියහ. මහා ස්ථවිරතෙමේද එය අසා 'මම යම්හෙයකින් මුල පටන් සසුන නගාලන්නට පැවිදිවූයෙම් වෙමිද, මට දැන් එයට ඒ මේ කාලය පැමිණියේය'යි සම්කඩ හකුළා ගෙනම නැගිසිටියහ. එකල්හි රජතෙමේ හෙටම මහා ස්ථවිරයන්වහන්සේ පැළලුප් තුවරට

පැමිණෙන්නාහයි රාත්‍රියෙහි සිහිනයක් දුටුයේය. රජු දුටු සිහිනය මෙබඳු වූයේය: 'මුළු සිරුර සුදුවන් ඇත්රජෙක් රජුවෙතට අවුත් රජු හිසපටන් පරාමර්ශනයකොට රජුගේ දකුණත අල්ලා ගත්තේය' මේ ඒ දුටු සිහිනය.

පසුද තෙමේ 'මා විසින් මෙබඳු සිහිනයක් දක්නාලද්දේය, එයින් මට කුමක් වන්නේද'යි සිහින හදරන්නන් අතින් විචාළේය. 'මහරජ! එක් ශ්‍රමණයෙක් ඔබගේ දකුණත ගන්නේය'යි ඔවුහු කීහ. රජතෙමේ එකෙණෙහිම මහාස්ථවිරයන්වහන්සේ වැඩියාහයි අසා ගංඉවුරට ගොස් ගඟට බැස ඉදිරියට යනුයේ දණපමණ දියෙහිදී මහ තෙරුන්වෙත පැමිණ නැවෙන් බසින්නාවූ මහා ස්ථවිරයන්වහන්සේලාට අත දුන්නේය. මහා ස්ථවිරයන්වහන්සේ රජුගේ දකුණත අල්ලාගත්හ. ඒ දුටු කඩු ගත්තාහු මහතෙරුන්ගේ හිස ගසා හෙලන්නෙමු'යි කඩුව කඩු කොපුවෙන් එලියට ඇදගත්හ. ඒ කුමක් හෙයින්දයත්: 'යමෙක් රජුගේ අත අල්ලාගනීද ඔහුගේ හිස කඩුවෙන් සිඳහළ යුතුය' යනු රජකුලයෙහි මේ චාරිත්‍රය බැවිනි. රජතෙමේ එහි ඡායා මාත්‍රයක්ම දැක 'පෙරත් මම භික්ෂූන්කෙරෙහි වැරදි ලෙසින් කළ කරුණක් නිසා අස්වැසුමක් නොවිඳිමි, තෙරුන්කෙරෙහි විරුද්ධයක් නොකරවු'යි කීයේය. කුමක් හෙයින් මහා ස්ථවිරයන්වහන්සේ රජුගේ අත අල්ලාගත් සේක්දයත්: 'යම් හෙයකින් රජුවිසින් ප්‍රශ්නයක් විචාරනුපිණිස මහා ස්ථවිරයන්වහන්සේ කැඳවාගන්නාලද්දහුද, එහෙයින් මෙතෙමේ මාගේ අතැවැසියෙකැ'යි සලකා රජුගේ අතගත්හ.

රජතෙමේ මහතෙරුන් උයනට පමුණුවා උයනට පිටින් තුන්වළල්ලක් සිටින සේ පිරිවරවා රුකවල තබා තෙමේම මහතෙරුන්ගේ පා සෝදා තෙල් ගල්වා මහතෙරුන් වෙත හිඳ 'මහා ස්ථවිරයන්වහන්සේ මාගේ සැකය සිඳහැර හටගෙන ඇති මේ අධිකරණය සන්සිඳුවා සසුන නගාසිටුවන්නට සමර්ථයේක් ද'යි විමසනුපිනිස 'ස්වාමීනී! මම එක් පෙළහරක් දකිනු කැමැතියෙමි'යි කියාසිටියේය. 'මහරජ! කිනම් පෙළහරක් දකිනු කැමත්තෙහිද'යි ඇසුකල්හි 'ස්වාමීනි! පොළෝ සැලීමය'යි කීයේය. 'මහරජ! දකිනු කැමැතියෙහි මුළු පොළොවෙහි සැලීමක්ද, නැත, පොළොවෙහි එක් පෙදෙසෙක සැලීමක්ද'යි විචාළසේක. එකල්හි 'ස්වාමීනි! මෙහි කවරනම් පෙළහරක් දුෂ්කර වන්නේද'යි ඇසීය. මහා ස්ථවිරයන්වහන්සේ 'කිම මහරජ! දියපිරු කස්ලෝ තලියෙහි සියලුදිය සැලීම දුෂ්කරද? නැත, ඉන් අඩක් සැලීම දුෂ්කරද'යි අසාවදළකල්හි 'ස්වාමීනි! අඩක් සෙලවීම දුෂ්කරය'යි කීයේය. 'මහරජ! එපරිද්දෙන්ම

ප්‍රදේශපෘථිවි කම්පනය දුෂ්කරය'යි වදළවිට 'ස්වාමීනි! එසේනම් පොළොවෙහි එක් පෙදෙසක සැලීම දකිනු රිසියෙමි'යි කීයේය. 'මහරජ! එසේ නම් භාත්පස යොදුනක්හි යොදුනක්හි පෙරදිග සීමාව එක් රියසකකින් ආක්‍රමණයකොට රථයක් තිබේවා, දකුණුදිග දෙපසකින් සීමාව පාගාගෙන අශ්වයෙක් සිටීවා, පැසුළුදිග එක් පයකින් සීමාව පාගා ගෙන පුරුෂයෙක් සිටීවා, උතුරුදිග අඩකොටසක් සීමාව යටකොට එක් දියතලියක් තිබේවා'යි වදළසේක. රජතෙමේ එසේකරවූයේය.

ඉක්බිති මහා ස්ථවිරයන්වහන්සේ අභිඥාපාදක චතුත්‍රීධ්‍යානයට සමවැද එයින් නැගිට 'රජතෙමේ දකීවා'යි පොළොවෙහි යොදුනක් පමණ තැන සැලීම ඉවූසේක. පෙරදිග තිබූ රියෙහි සීමාව ඇතුළත සිටි රියසක සැලීගියේය. අනික් රියසක නොසැලුනේය. මෙසේ දකුණු-පැසුළු දික්හි සිටි අශ්වයන්ගේ හා පුරුෂයන්ගේ සීමාව ඇතුළතවූ පාද සැලීගියේය. සිරුරුද අඩඅඩ සැලුනේය. උතුරුදිග තුබූ දියතලියෙහිද සීමාව තුළසිටි අඩකොටසක්මවූ දිය සැලුනේය. ඉතිරි කොටස නිසලව සිටියේය.

රජතෙමේ මේ පෙළහර දැක 'මහා ස්ථවිරයන්වහන්සේ සසුන නගාලන්නට සමර්ථයහ'යි තීරණයට බැස 'ස්වාමීනි! මම විහාරයට ගොස් අධිකරණය සන්සිඳුවා පොහොය කරවාලවයි එක් ඇමතියෙකු විහාරයට යැවීම්, ඒ ඇමතිවරයා විහාරයට ගොස් මෙතෙක් භික්ෂූන් ජීවිතයෙන් තොරකෙළේය, ස්වාමීනි! මේ පාපය කවරක්හටවේද'යි තමන්ගේ කුකුස දන්වා විචාළේය. 'කිම මහරජ! මෙතෙමේ විහාරයට ගොස් භික්ෂූන් නසාවායි ඔබට සිතක් උපන්නේද'යි ඇසූහ. 'නැත ස්වාමීනි!'යි කියූකල්හි 'මහරජ! ඉදින් ඔබට එබදු සිතක් නොඋපන්නේ නම් පාපයක් ඔබට නැත්තේය'යි වදරා, නැවත මහා ස්ථවිරයන්වහන්සේ රජුට **'චෙතනාහං භික්ඛවේ කම්මං වදමි, චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා'** යන සූත්‍රයෙන් මෙහි අර්ථය හැඟවූසේක. ඒ කරුණම දක්වන්නට මහා ස්ථවිරයන්වහන්සේ තිත්තිර ජාතකය ගෙනහැර දක්වූසේක. 'මහරජ! යටගිය දවස දීපක තිත්තිර තෙමේ : 'අපගේ නෑයෙක් හුන්නේය'යි බොහෝ වටුවෝ මා වෙතට එත්, ආවෝ මා නිසා මරණයට පැමිණෙත්, එහෙයින් ඒ ගැන මාගේ සිත්හි සැකයක් වේය'යි තවුසාගෙන් විචාළේය.

එකල්හි තාපස තෙමේ 'මාගේ හඬින් මාගේ රූ දක්මෙන් අවුත් මේ වටුවෝ බැඳෙත්වා, නැසෙත්වායි තට උපන් සිතක් ඇත්තේද'යි ඇසූයේය. 'නැත, ස්වාමීනි!'යි තිත්තිරතෙමේ කීයේය. අනතුරුව

තාපසතෙමේ 'ඉදින් තට එබඳු සිතක් නැත්තේනම් පාපයක්ද නැත්තේය, කම්‍ය සිතන්නහුම පහසන්නේය, නොසිතන්නහු නොදපහසන්නේය'යි මහුට හැහවීය.

'සිත දූෂිත නොවේනම් කම්‍ය නිසා දුක් නොවිඳියි, පාපක්‍රියාවෙහි නිරාලයවූ පිරිසිදු සත්ත්වයාගේ සිත පාපයෙහි නොඇලේය'යි මෙසේ මහා ස්ථවිරයන්වහන්සේ රජුට කරුණු අවබෝධ කරවා එහි රාජොද්‍යානයෙහිම සත්දවසක් වසනසේක්, රජුට බුදුරජාණන්වහන්සේගේ ලබ්ධිය ඉගැන්නුහ. රජතෙමේ සත්වන දවසෙහි අශෝකාරාමයට භික්‍ෂුසඞ්ඝයා රැස්කරවා තිරපවුරකින් හාත්පස වටකරවා තිරපවුර තුළ හුන්නේ සමාන ලබ්ධික සමාන ලබ්ධික භික්‍ෂූන් එක්එක් තන්හි කරවා එක්එක් භික්‍ෂුසමූහයා කැඳවා 'සම්මාසම්බුදුරජාණන්වහන්සේ කිනම්වාද ඇතිසේක්ද'යි විවාළේය.

එකල්හි ශාස්වතවාදීහු ශාස්වතවාදීහයිද, එකත්‍යශාස්වතිකයෝ එකත්‍යශාස්වතවාදීහයිද, අන්තානන්තිකයෝ අන්තානන්තිකවාදීහයිද, අමරාවික්‍ෂෙපිකයෝ අමරාවික්‍ෂෙපිකහයිද, අධිත්‍යසමූතපනතිකයෝ අධිත්‍යසමුත්පන්තිකවාදීහයිද, සංඥිවාදීහු සංඥිවාදීහයිද, අසංඥිවාදීහු අසංඥිවාදීහයිද, නෙවසංඥී නාසංඥිවාදීහු නෙවසංඥී නාසංඥිවාදීහයිද, උවෙඡදවාදීහු උවෙඡදවාදීහයිද, දෘෂ්ටධර්මනිර්වාණවාදීහු දෘෂ්ටධර්මනිර්වාණවාදීහයිද කීහ.

රජතෙමේ පළමුකොට බුදුරජාණන්වහන්සේගේ ලබ්ධිය උගත්බැවින් 'මොවුහු භික්‍ෂූහු නොවෙති, මොවුහු අන්‍යතීර්ථකයෝය'යි දැන ඔවුනට සුදුවත්දී සිවුරු හැරවූයේය. ඒ සියල්ලෝ සැටදහසක්වූහ. නැවත එහි ඉතිරිවූ භික්‍ෂූන් ගෙන්වා 'ස්වාමීනි! සම්මාසම්බුදුරජානන්වහන්සේ කිනම් වාද ඇතිසේක්ද'යි විවාළේය. 'මහරජ! සම්මාසම්බුදුරජානන්වහන්සේ විභජ්ජවාදීහ'යි මෙසේ කියූකල්හි රජතෙමේ 'ස්වාමීනි! සම්මාසම්බුදුරජානන්වහන්සේ විභජ්ජවාදීහුද'යි මහතෙරුන්ගෙන් විවාළේය. 'එසේය මහරජ!'යි උන්වහන්සේ වදළසේක. ඉක්බිති රජතෙමේ 'ස්වාමීනි! දැන් සසුන පිරිසිදුය, භික්‍ෂුසඞ්ඝයා පොහොය කෙරේවා'යි ආරක්‍ෂාවදී නුවරට පිවිසියේය.

සමග්‍රසඞ්ඝයා රැස්ව පොහොය කෙළේය. ඒ රැස්වීමෙහි සැටලක්‍ෂයක් භික්‍ෂූහුවූහ. ඒ සමාගමයෙහි මොග්ගලීපුත්තතිස්ස මහා ස්ථවිරයන්වහන්සේ පරප්‍රවාදය මඩිමින් **කථාවස්තුප්‍රකරණය** වදළසේක. ඉන්පසු සැටලක්‍ෂ ගණනක්වූ භික්‍ෂූන් අතුරෙහි ත්‍රිපිටක පර්‍යාප්තිධරවූ, පැමිණි පිළිසැඹියා ඇති, ත්‍රිවිද්‍යා ප්‍රභෙද ඇති භික්‍ෂූන් එක්දහසක් තෝරාගෙන මහා කාශ්‍යප

මහා ස්ථවිරයන්වහන්සේද, කාකණ්ඩපුත්‍ර යස මහා ස්ථවිරයන්වහන්සේද ධර්මයත් විනයයත් යමිසේ සඞ්ගායනා කළාහුද, එපරිද්දෙන්ම ධර්මයත් විනයයත් සඞ්ගායනා කරණසේක් සියලු සසුන්මල සෝදහැර තෘතීයසඞ්ගීතිය කළසේක. සඞ්ගීතිය අවසානයෙහි නන්අයුරින් පොළොව සැලුනීය. මේ සඞ්ගීති නවමසකින් නිමවනලදී. ලොකයෙහි යම් සඞ්ගීතියක්:

භික්ෂූන් දහසක් විසින් කරනලදද, එහෙයින් සාහස්සිකායිද, ප්‍රථම, ද්වීතීය සඞ්ගීතිදෙක කරුණුකොට තෘතීයයිද කියනුලැබේ.

මේ තෘතීයසඞ්ගීතිය නිමවනලදී.

——\\——

මේ පමණකින්ද **'කෙනාහතං'** කවරෙකු විසින් ගෙනඑනලදද; යන මේ ප්‍රශ්නය විසඳනුපිණිස අපි පළමුකොට දඹදිව උපාලි මහා ස්ථවිරයන්වහන්සේ ආදිකොට ඇති ඇදුරුපරපුරෙන් තෘතීයසඞ්ගීතිය යම්තාක්ද ඒතාක් ගෙනඑනලද්දේයයි යමක් කීමුද මේ එහි ඇදුරුපරපුරය:

දිනූ කෙලෙස් ඇති **උපාලි** මහා ස්ථවිර, **දසක** මහා ස්ථවිර, **සොණක** මහා ස්ථවිර, **සිග්ගව** මහා ස්ථවිර, **මොග්ගලීපුත්තතිස්ස** මහා ස්ථවිර යන මේ මහා ස්ථවිරයන්වහන්සේලා පස්නම විනය පිටකය දඹදිව නොසිඳුනක්කොට පරම්පරාවෙන් තෘතීය සඞ්ගීතිය යම්තාක්ද ඒතාක් ගෙන ආහ. ඒ ප්‍රශ්නයේ අර්ථය මෙපමණකින් ප්‍රකාශකරනලද්දේමවේ.

මෙසේකොට අවසන්කළ තෘතීයසඞ්ගීතියෙන් මතු මේ හෙළදිවයිනට මහාමහීන්ද්‍රාදීවූ මහරහතුන්වහන්සේ විසින් ගෙනඑනලද්දේය. මහා **මහින්ද** මහරහතුන්වහන්සේ වෙතින් උගෙණ, මදකලක් අරිෂ්ට ස්ථවිරාදීවූ මහා ස්ථවිරයන්වහන්සේලා විසින් ගෙනඑන ලද්දේය. එතැන්සිට අද දක්වා උන්වහන්සේගේම අන්තෙවාසික පරම්පරාගතවූ ආචාර්‍ය්‍ය පරම්පරාවෙන් ගෙනඑනලදැයි දතයුතුය. හෙළදිව හෙළඅටුවා කළ පොරණූදුරෝ එය මෙසේ දක්වූහ:

ඉන්පසු පවි නසාසිටි මහා නුවණැති **මහින්ද** ස්ථවිර, **ඉට්ඨිය** ස්ථවිර, **උත්තිය** ස්ථවිර, **සම්බල** ස්ථවිර, පණ්ඩිත **භද්දසාල** ස්ථවිර යන මේ මහා ස්ථවිරයන්වහන්සේලා දඹදිවින් මෙහි වැඩියාහු හෙළදිව විනය පිටකය කියවූහ. නිකාය පසද සප්තප්‍රකරණද කියවූහ.

ඉන්පසු නුවණැති **අරිට්ඨ** ස්ථවිරද, පණ්ඩිත **තිස්සදත්ත** ස්ථවිරද, විශාරදවූ **කාලසුමන** ස්ථවිරද, **දීඝ** නම් ස්ථවිරද, පණ්ඩිත **දීඝසුමන** ස්ථවිරද, ඉන්පසු **කාලසුමන** ස්ථවිරද, **නාග** ස්ථවිරද, **බුද්ධරක්ඛිත** ස්ථවිරද, නුවණැති **තිස්ස** ස්ථවිරද, පණ්ඩිත **දෙව** ස්ථවිරද,

නැවත විනයෙහි විශාරදවූ නුවණැති **සුමන** ස්ථවිරද, නොමැඩිය හැකි ඇතෙකු වැනිවූ බහුශ්‍රැතවූ **චූලනාග** ස්ථවිරද,

රුහුණෙහි උපන් සත්පුරුෂයන් විසින් පුදනලද **ධම්මපාලිත**නම් ස්ථවිරද, උන්වහන්සේගේ ශිෂ්‍යවූ මහා නුවණැති ත්‍රිපිටකධර **බෙම**නම් ස්ථවිරද, යන මහා ස්ථවිරයන්වහන්සේලා හෙළදිව සඳුමෙන් නුවණින් අතිශයින් බැබලුනාහ.

නුවණැති **උපතිස්ස** ස්ථවිරද, **මහාකවි උස්සදෙව** ස්ථවිරද,

නැවත නුවණැති **සුමන** ස්ථවිරද, බහුශ්‍රැත **පුප්ඵ** නම් ස්ථවිරද, ත්‍රිපිටකයෙහි සියලු තන්හි දක්ෂවූ මහා කවි **මහාසීව** ස්ථවිරද,

නැවත විනයයෙහි විශාරදවූ නුවණැති **උපාලි** ස්ථවිරද, සද්ධම්වංශයෙහි දක්ෂවූ මහා නුවණැති **මහානාග** ස්ථවිරද,

නැවත ත්‍රිපිටකයෙහි සියලුතන්හි දක්ෂවූ නුවණැති **අභය** ස්ථවිරද, විනයයෙහි දක්ෂවූ නුවණැති **තිස්ස** ස්ථවිරද, උන්වහන්සේගේ ශිෂ්‍යවූ මහා නුවණැති බහුශ්‍රැතවූ **පුප්ඵ**නම් ස්ථවිරද, යන මහා ස්ථවිරයන්වහන්සේලා සසුන රකිමින් දඹදිව දිවි ගැලවූහ.

විනයයෙහිද විශාරදවූ නුවණැති **චූලාභය** ස්ථවිරද, සද්ධම්වංශයෙහි දක්ෂවූ නුවණැති **තිස්ස** ස්ථවිරද,

විනයයෙහි දක්ෂවූ නුවණැති **චූලදෙව** ස්ථවිරද, විනයයෙහි සියලුතන්හි දක්ෂවූ නුවණැති **සීව** ස්ථවිරයන්වහන්සේලා

ශ්‍රේෂ්ඨවූ මහාප්‍රාඥවූ විනයඥවූ ස්වඟී - මොක්ෂ මාඟීයෙහි දක්ෂවූ මේ මහා ස්ථවිරයන්වහන්සේලා හෙළදිව විනය පිටකය කියවූහ. මේ එහි පිළිවෙළකතාය.

මොග්ගලිපුත්තතිස්ස මහා ස්ථවිරයන්වහන්සේවනාහි මේ තෘතීය ධර්මසඞ්ගීතියකොට 'අනාගතයෙහි බුදුසසුන කොතැනක මැනවින් පිහිටන්නේද'යි බලාවදළසේක. මෙසේ බලාවදරන්නාවූ උන්වහන්සේට 'ප්‍රත්‍යන්ත ජනපදයන්හි මැනවින් සසුනෙහි පිහිටීම වන්නේය'යි

පෙනීගියේය. ඉක්බිති උන්වහන්සේ ඒ ඒ භික්ෂූන්ට සසුන භාරකොට ඒ ඒ භික්ෂූන් ඒ ඒ ප්‍රදේශයන්ට යැවූහ.

'තමුන්නාන්සේ මේ රටට ගොස් මෙහි සසුන පිහිටුවාලවු'යි **මජ්ඣන්තික** මහා ස්ථවිරයන්වහන්සේ **කාශ්මීර ගන්ධාර** රටට යැවූහ. එසේ ම කියා **මහාදේව** මහා ස්ථවිරයන්වහන්සේ **මහිසමණ්ඩලයටද, රක්ඛිත** මහා ස්ථවිරයන්වහන්සේ **වනවාසී රටටද, යොනකධම්මරක්ඛිත** මහා ස්ථවිරයන්වහන්සේ **අපරන්තක** රටටද, **මහාධම්මරක්ඛිත** මහා ස්ථවිරයන්වහන්සේ **මහරටටද, මහාරක්ඛිත** මහාස්ථවිරයන්වහන්සේ **යොනක ලෝකයටද, මජ්ඣිම** මහා ස්ථවිරයන්වහන්සේ **හිමවත් පෙදෙසටද, සොණක** මහා ස්ථවිරයන්වහන්සේ හා **උත්තර** මහා ස්ථවිරයන්වහන්සේ **සුවණ්ණභූමියටද**, යවා තමන්ගේ සද්ධිවිහාරිකවූ **මහින්ද** මහා ස්ථවිරයන්වහන්සේ **ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල** මහා ස්ථවිරයන්වහන්සේලා සමඟ 'ඔබ **හෙළදිවට** ගොස් හෙළදිව සසුන පිහිටුවාලවු'යි හෙළදිවට යැවූහ. එසේ නියමිතවූ ඒ සියලුදෙනාවහන්සේ ඒ ඒ දිශාවන්ට යවන්නාහු 'ප්‍රත්‍යන්ත ජනපදයන්හි පඤ්චවර්ගීය ගණය උපසම්පදාකර්මයට පමණය'යි සිතන්නාහු තමා පස්වැනිකොට ඇතියාහු නියමකළ ඒ ඒ දිශාවන්ට ගියහ.

මජ්ඣන්තික මහා ස්ථවිරයන්වහන්සේ කාශ්මීර ගන්ධාර රටට වැඩමකළ කාලය එහි පැසුන ගොයම් කපා පාගාගන්නා කාලයවූයේය. ඒ කාලයෙහි අරවාළතම් නාරජ හිමපාතකතම් වැස්සක් වස්වා, ගොයම් දියපාරට හසුකොට ගෙනගොස් මහමුහුදට දමන්නේය. මජ්ඣන්තික මහා ස්ථවිරයන්වහන්සේවනාහි පැළලුප් නුවරින් අහසට නැගී හිමවතෙහි අරවාළ විල මත්තෙහි බැස අරවාළ විල දියපිට සක්මන් කරනසේක. නැවතීද සිටිනසේක. හිඳීමද කරනසේක. නිදීමද කරනසේක. තරුණ නාගයෝ උන්වහන්සේ දැක අරවාළ නාරජුට 'මහරජ! කැපූ කෙටූ රදන් ගැන්වූ පිළී දරන හිස මුඩුකළ කසටවත් හැඳි එකෙක් අපගේ දිය සිලිටි කෙරේය'යි දන්වා සිටියහ. නාරජ තෙමේ එකෙණෙහිම ක්‍රොධයෙන් මැඩුනේ නික්මගොස් මහතෙරුන් දැක ගුණමකුබව සන්සිඳුවා ගැනීමෙහි අපොහොසත්වූයේ අහසට නැගී එහි නොයෙක් බිහිසුණු අරමුණු මවාපෑයේය. ඒ ඒ දිගින් බලගතු වාතය හමයි. ගස්කොළන් බිඳවැටෙයි. කඳු මුදුන් ඇදහැලේයි. වලාකුට ගුගුරයි. විදුලිය කොටයි. හෙන පුපුරයි. අහස බිඳුනක්මෙන් දිය වැගිරේ. බිහිසුණු රූ ඇති නාකුමරුවෝ රැ ස්වෙති. තෙමේද දුමයි. දිලෙයි. අවි වැසි වස්වයි. 'හිස මුඩුකළ සුන්බුන් පිළී දරන මූ කවරෙක්ද?' යනාදීවූ කැකුළු බසින් මහතෙරුන්ට තර්ජනය කෙළේය. 'එව මේ මහණහු අල්ලා ගනීවු, බිඳිවු, මෙතැනින් ඇදදමවු'යි

නාගසේනාවට අණ කෙළේය. මහා ස්ථවිරයන්වහන්සේ ඒ සියලු විහිංසනක ක්‍රියාවන් තමන් වහන්සේගේ ඍද්ධිබලයෙන් ප්‍රතිබාහනයකොට නාරජුට:

'දෙවියන් සහිතවූ මුලුලොවම අවුත් මා තැතිගන්වන්නේ නමුදු මට බිය උපදවන අරමුණක් උපදවන්නට ඒ කිසිවෙක් සමර්ථ නොවන්නේය, මහා නාගය! තෝ මුහුද සහිතවූ පර්වත සහිතවූ මේ සියලු මහපොළොව ඔසොවා මා මතුවෙහි හෙළන්නෙහි නමුත් මට බිය උපදවන අරමුණක් උපදවන්නට නොදහැක්කෙහිය, නාගාධිපතිය! එය තටම එකතින් වෙහෙසක් වන්නේය'යි වදළසේක.

මෙසේ වදළකල්හි නාරජතෙමේ පහවූ ආනුභාව ඇත්තේ ඵල රහිත ව්‍යායාම ඇත්තේ දුක් ඇත්තේ දෙමිනස් ඇත්තේවිය. මහා ස්ථවිරයන්වහන්සේ ඒ අවස්ථාවට සුදුසුවූ ධර්මකථාවෙන් ඒ නාරජුට මෙලොව පරලොව වැඩ දක්වා කුසල්දහම්හි සමාදන්කරවා එහි සිත තියුණුකරවා සිත සතුටුකරවා සුවාසූදහසක් නාගයන් සමග තිසරණයෙහි හා පන්සිල්හි පිහිටුවාලූහ. අන්‍යවූද හිමවත් වැසි බොහෝ යක්ෂයෝද ගාන්ධර්ව කුම්භාණ්ඩයෝද, මහතෙරුන්ගේ ධර්මකථාව අසා ශරණයන්හිද, ශීලයන්හිද පිහිටියහ. පඤ්චකනම් යක්ෂ තෙමේද බිරිඳ යකින්න හා පන්සියයක් පුතුන්ද සමග ප්‍රථම ඵලයෙහි පිහිටාගත්තේය. ඉක්බිති ආයුෂ්මත් මජ්ඣන්තික මහාස්ථවිරයන්වහන්සේ සියලුම නා, යක්, රකුසන් අමතා:

'මෙයින් පසු ඉදිරියෙහි පෙරසේ අදසිට කිසිවකු කෙරෙහි ක්‍රොධ නොඋපදවාලවූ, සියලු සත්ත්වයෝ සැප කැමැතියහ. සස්‍ය නසාලීමද නොකරවු, මනුෂ්‍යයෝ සැපසේ වෙසෙත්වායි සත්ත්වයන් කෙරෙහි මෙත් කරවු'යි ධර්මදේශනා කළසේක.

ඒ සියල්ලෝම 'ස්වාමීනි! යහපතැ'යි මහා ස්ථවිරයන්වහන්සේට පිළිවදන් දී ඒ අනුශාසනා පරිදි පිළිපැද්දහුය. එදවසම නාරජු පිළිබඳ පූජා සමයවේ. එහෙයින් නාරජතෙමේ තමන්ගේ රුවන්මුවා පළඟ ගෙන්වා මහතෙරුන්ට වැඩහිඳිනට පණවාදුන්නේය. උන්වහන්සේ පලඟෙහි වැඩහුන්සේක. නාරජතෙමේද මහතෙරුන්ට පවන්සලමින් උන්වහන්සේගේ සමීපයෙහි සිටියේය. ඒ වේලෙහිම **කාශ්මීර ගන්ධාර** රටවැස්සෝ එහි ආවාහු මහතෙරුන් දැක 'අපගේ නාරජුටද වඩා මහා ස්ථවිරයන්වහන්සේ අතිශයින් මහත් ඍද්ධි ඇත්තාහ'යි මහතෙරුන්ට වැඳහුන්හ. මහා ස්ථවිරයන්වහන්සේ ඔවුනට **ආශීවිෂොපම සූත්‍රය** දෙසූසේක. සූත්‍රදේශනාවසානයෙහි අසූදහසක්

ප්‍රාණීන්ට ධර්මාවබෝධය වූයේය. සියදහසක් පුරුෂයෝ පැවිදිවූහ. එතැන්පටන් කාශ්මීර ගන්ධාර රටවැසියෝ අදදක්වා කසාවතින් බබලන්නාහ. භික්ෂූන්ගේ හඳනා පොරෝණා කසාවත් පවනින්ද අත්පාහැකිළීම් දිගුකිරීම් ආදීන් පිළිබඳ පවනින්ද හාත්පසින් පවන් සලනුලබන්නෝම වූහ.

මජ්ඣන්තික මහා ස්ථවිරයන්වහන්සේ කාශ්මීර ගන්ධාරයට වැඩමකොට එකල්හි කිපියාවූ නාගයා පහදවා බොහෝදෙන භවබන්ධනයෙන් මුදහළසේක.

මහාදෙව මහා ස්ථවිරයන්වහන්සේ මහිසමණ්ඩලයට වැඩමකොට දෙවදූතසූත්‍රය දෙසූසේක. සූත්‍ර දේශනාවසානයෙහි සතළිස්දහසක් ප්‍රාණීහු ධර්මචක්ෂුසලැබූහ. සතළිස්දහසක් ප්‍රාණීහු පැවිදිවූහ.

මහත් සෘද්ධිඇති **මහාදේව** මහා ස්ථවිරයන්වහන්සේ **මහිංසක රටට** වැඩමකොට දේවදූතයන්ලවා චොදනාකරවා බොහෝ දෙන භවබන්ධනයෙන් මුදහළසේක.

රක්ඛිත මහා ස්ථවිරයන්වහන්සේ **වනවාසී රටට** වැඩමකොට අහසෙහි සිට **අනමතග්ගපරියාය** කථාවෙන් **වනවාසී** රටවැසියන් පැහැදවූහ. මුන්වහන්සේගේ ධර්මකථාවසානයෙහි සැටදහසකට ධර්මාවබෝධයවූයේය. සත්තිස්දහසක්පමණ දෙනා පැවිදිවූහ. පන්සියයක් විහාර එහි පිහිටියේය. මෙසේ උන්වහන්සේ එහි සසුන පිහිටුවාලූසේක.

මහත් සෘද්ධි ඇති **රක්ඛිත** මහා ස්ථවිරයන්වහන්සේ **වනවාසී රටට** වැඩමකොට එහි අහසෙහි සිට **අනමතග්ගියසංයුත්තය** දෙසූසේක.

යොනක ධම්මරක්ඛිත මහා ස්ථවිරයන්වහන්සේද අපරන්තක ජනපදයට වැඩමකොට **අග්ගික්ඛන්ධූපම** සූත්‍රාන්තකථාවෙන් අපරන්තක දනවුවැස්සන් පහදවා සත්තිස් දහසක් ප්‍රාණීන්ට දහම්අමා පෙවූසේක. කැත්කුලයෙන්ම සයදහසකට අධිකවූ ස්ත්‍රීහුද, දහසක් පුරුෂයෝද පැවිදිවූහ. මෙසේ උන්වහන්සේ එහි සසුන පිහිටුවාලූසේක.

යොනක ධම්මරක්ඛිත මහා ස්ථවිරයන්වහන්සේ අපරන්තක ජනපදයට වැඩමකොට මෙහිදී අග්ගික්ඛන්ධූපසූත්‍රයෙන් බොහෝ දෙනාපැහැදවූසේක.

මහාධම්මරක්ඛිත මහා ස්ථවිරයන්වහන්සේවනාහි මහරටට වැඩ **මහානාරදකස්සප** ජාතකකථාවෙන් මහරට වැසියන් පහදවා සූවාසුදහසක් ප්‍රාණීන් මාඟීඵලයන්හි පිහිටවූසේක. තෙළෙස්දහසක් දෙනා පැවිදිවූහ. මෙසේ උන්වහන්සේ එහි සසුන පිහිටවූසේක.

ඒ සෘෂිවූ **මහා ධම්මරක්ඛිත** මහා ස්ථවිරයන්වහන්සේ මහරටට වැඩ **මහානාරදකස්සප ජාතකය** වදරා මහාජනයා පැහැදවූසේක.

මහාරක්ඛිත මහාස්ථවිරයන් වහන්සේ ද යොන් රටට වැඩ **කාලකාරාමසූත්‍රාන්ත** කථාවෙන් යොන් රටවැසියන් පහදවා සත්තිස් දහසක් අධිකකොටඇති සියදහසක් ප්‍රාණීන්ට මාඟීඵලාලඬකාරය දුන්සේක. මුන්වහන්සේගේ සමීපයෙහිද දසදහසක් දෙනා පැවිදිවූහ. උන්වහන්සේද මෙසේ එහි සසුන පිහිටවූසේක.

මහාරක්ඛිත මහර්ෂීන් වහන්සේ යොන් රටට වැඩ එකල්හි **කාලකාරාම සූත්‍රයෙන්** ඒ යොනකයන් පැහැදවූසේක.

මජ්ඣිම මහා ස්ථවිරයන්වහන්සේවනාහි **මහා කස්සපගොත්ත** මහාඝථවිර, **අලකදෙව** මහාස්ථවිර, **දුන්දුභිස්සර** මහා ස්ථවිර, **මහාදෙව** මහාස්ථවිර යන මහතෙරුන් සමඟ හිමවත් පෙදෙසට වැඩ **ධම්මචක්කප්පවත්තන සූත්‍රාන්ත** කථාවෙන් එදෙස් වැස්සන් පහදවා අසූකෙළක් ප්‍රාණීන්ට මඟපලරුවන් ලබාදුන්සේක. ඒ පස්මහතෙරහු පස්රටක් පැහැදවූහ. එක්එක් ස්ථවිර නමක්වෙත සියදහසක් පමණ දෙනා පැවිදිවූහ. උන්වහන්සේලා මෙසේ එහි සසුන පිහිටවූහ.

මජ්ඣිම මහා ස්ථවිරයන්වහන්සේ හිමවත් පෙදෙසට වැඩ දමිසක් පැවතුම් සුතුර වදරන්නාහු යක්ෂසේනාව පැහැදවූසේක.

සොණ මහා ස්ථවිරයන්වහන්සේ, **උත්තර** මහා ස්ථවිරයන්වහන්සේ සමඟ ස්වර්ණභූමියට වැඩියසේක. ඒ කාලයෙහි එහි එක් යකින්නක් මුහුදෙන් නික්ම අවුත් රජගෙයි උපතුපත් දරුවන් කන්නීය. එදවසම එහි රජගෙයි එක් දරුවෙක් උපන්නේය. එහි මිනිස්සු තෙරුන් දැක 'මෙතෙමේ රකුසන්ගේ යහළුවෙකැ'යි සිතන්නාහු ආයුධ ගෙන තෙරුන්ට පහරදෙනු කැමැත්තාහු ඉදිරියට එත්. එකල්හි මහා ස්ථවිරයන්වහන්සේ 'තෙපි ආයුධ ගත් අත් ඇතිව කුමට එවුද්' යි ඇසූහ. ඔවුහු 'රජගෙයි උපතුපත් දරුවන් රාක්ෂයෝ අවුත් කන්නාහ. තෙපි ඔවුන්ගේ යහළුවෝ'යි ඔවුහු කීහ. මහා ස්ථවිරයන්වහන්සේ 'අපි රකුසන්ගේ යහළුවෝ නොවම්හ, අපි ශ්‍රමණයෝනම් වන්නෙමු, ප්‍රාණඝාතයෙන් වැළකුනෝවෙමු, - පෙ- මද්‍ය පානයෙන් වැළකුනෝ

වෙමු, එක් වේලේ වළඳන්නමෝය, සිල්වත්හුවෙමු, කලණ සැහැවි ඇත්තමෝය අපි'යි වදළසේක.

එකෙණෙහිම රජගෙයි උපන් එදරු කන්නෙමියි ඒ රාක්ෂසී තොමෝ පිරිවර සහිතව මුහුදෙන් නික්ම ආය. මිනිස්සු රකුසිය දැක 'ස්වාමීනි! මෝ රකුසිය එන්නීය'යි බියපත්ව මොරදෙන්නටවූහ. මහා ස්ථවිරයන්වහන්සේ රකුසන්ට වඩා ද්විගුණවූ ආත්මභාව මවා ඒ ආත්මභාවයන්ගෙන් පිරිස් සහිතවූ ඒ රකුසිය මැදිකොට දෙපසින් වටකළහ. එකල්හි පිරිස් සහිතවූ ඒ රකුසියට 'එකතින් මොවුන් විසින් මේ තැන අත්පත්කොට ගන්නාලද්දේ වන්නේය. අපිවනාහි මොවුන්ට බත් වන්නෙමු'යි සිත්විය. බිය පත්වූ සියලු රකුසෝ වේගයෙන් පැනදිවූහ. මහා ස්ථවිරයන්වහන්සේද ඔවුන් නොපෙනෙන තෙක් පන්නා හැර දිවයින වටා රැකවල් තැබූහ. ඒ වේලෙහිද එහි රැස්වූ මහාජන සමූහයා බ්‍රහ්මජාල සූත්‍රාන්ත කථාවෙන් පහදවා ශරණයන්හි හා ශීලයන්හිද පිහිටවූහ. මෙහිදී සැටදහසකට ධර්මාවබෝධය වූයේය. කුලදරුවන්ගෙන් තුන්දහස් පන්සියයක්ද, කුලදුහිතෘන්ගෙන් එක්දහස් පන්සියයක්ද පැවිදිවූහ. උන්වහන්සේ මෙසේ එහි සසුන පිහිටවූසේක. එතැන් පටන් රජගෙයි උපන් දරුවන්ට සොණුත්තර නමම තබත්.

මහත් සෘද්ධි ඇති **සොණ - උත්තර** මහාස්ථවිරයන්වහන්සේලා සඞ්ඝභූමියට වැඩ පිශාචයන් පලවාහැර බ්‍රහ්මජාල සූත්‍රය දෙසූහ.

මහාමහීන්ද මහාස්ථවිරයන්වහන්සේ වනාහි 'තාම්‍රපර්ණී ද්වීපයට ගොස් සසුන පිහිටුවා ලවු'යි උපාදධ්‍යාය මහාස්ථවිරයන්වහන්සේ හා භික්ෂුසඞඝයා විසින් අණවනලද්දහු 'මට තාම්‍රපර්ණී ද්වීපයට යන්නට මේ කාලයවේද නොවේද'යි සිතා බැලූහ. එසේ විමසන්නාවූ උන්වහන්සේට 'තවම කාලය නොවේය'යි සිත් වූයේය. කුමක් දැක මුන්වහන්සේට මේ අදහසවූයේදයත්: එවක තාම්‍රපර්ණියෙහි රජය කළ මුටසීව රජුගේ මහලුබවදැක මෙසේ සිත් උපන. අනතුරුව 'මේ රජතෙමේ මහලුය, මොහු වහල්කොටගෙන සසුන නගාලන්නට නොහැකිය, මොහුගේ ඇවෑමෙන් මොහුගේ පුත්‍රවූ **දේවානම්පියතිස්ස** රජය කරවන්නේය, ඔහු වහල්කොට ගෙන සසුන නගාලන්නට හැකිවන්නේය, එබැවින් ඒ කාලය එනතුරු නැයින් බලන්නෙමු, නැවත අපි මේ ජනපදයට එන්නමෝද නොහොත් නොඑන්නමෝද'යි සිතූහ. උන්වහන්සේ මෙසේ සිතා උපාදධ්‍යායයන් වහන්සේද භික්ෂු සඞඝයාද වැඳ අශොකාරාමයෙන් නික්ම ඒ ඉට්ඨියාදී වූ මහා තෙරුන් සතර නමද, සඞඝමිත්‍රාවගේ පුත්‍රවූ සුමන සාමණේර හා භණ්ඩුක උපාසකද සමග රජගහා නුවර

හැර ඉන් පිටත දක්ෂිණගිරි ජනපදයෙහි සැරිසරන්නාහු නෑයන් බලමින් සමසක් කල්ගෙවූහ. ඉන්පසු පිළිවෙළින් මෑනියන් වසන තැනවූ වෙදිසනම් නුවරට වැඩියහ.

අශෝක මහරජතුමා කුමාර කාලයෙහි උදෙනි ජනපදය ලබා එහි යනුයේ වෙදිස නුවරට පැමිණ වෙදිස සිටුහුගේ දුව සරණපාවා ගත්තේය. ඕතොමෝ එදවසම ගැබ්ගෙන උදෙනි නුවරදීම මිහිඳු කුමරු වැදූය. කුමරුගේ තුදුස් වස්කල්හි **අශොක** රජතුමා රාජ්‍යාභිෂෙකයට පැමිණියේය. මිහිඳු කුමරුගේ ඒ මවුබිසව ඒ කාලයෙහි නැගෙයිම වාසයකළාය. **'අථානුපුබ්බෙන මාතුනිවෙසඨානං වෙදිසනගරං නාම සම්පත්තො'** ය්නු එහෙයින් කියනලදී. වෙදිස නුවරට පැමිණි තෙරුන් දක ස්ථවිරමාතෘවූ ඒ දේවිය උන්වහන්සේගේ පාමුල වැටී හිසින් වැඳ දන්දී තමන් විසින් කළ වෙදිසගිරි මහාවිහාරයද තෙරුන්ට පාවාදුන්නීය. මහා ස්ථවිරයන්වහන්සේ එහි වැඩහුන්සේක් 'මෙහි අප විසින් කළයුතු කිස නිමාවට ගියේය, ලක්දිවට යෑමට දන් කාලයවේද'යි සිතාබැලූහ. ඉක්බිති 'මාගේ පියතුමන් විසින් යවනලද අභිෂේකය දේවානම්පියතිස්‍ස රජු අනුභව කෙරේවා, තෙරුවන් ගුණද අසාවා, උත්සව පිණිස නුවරින් නික්ම මිශ්‍රක පර්වතයට නගීවා, එකල්හි එහිදී ඔහු දකින්නමෝය'යි සිතූහ. නැවතද එක් මසක් එහිම විසූහ. මස ඉක්ම යෑමෙන් පසු පොසොන් මස පසළොස්වක් පොහෝ දිනයෙහි සියල්ලෝම රැස්ව 'අපට තාම්‍රපර්ණී ද්වීපයට යෑමට මේ කාලයවේද නොහොත් කාලය නොවේද'යි සාකච්ඡාකළහ. එහෙයින් පුරාතනයෝ:

'නමින් මහින්ද නමවූ මහා ස්ථවිරයන්වහන්සේ එකල්හි සඩ්ඝස්ථවිරවූහ. **ඉට්ඨිය** ස්ථවිර, **උත්තිය** ස්ථවිර, **භද්දසාල** ස්ථවිර, **සම්බල** ස්ථවිරද, ෂඩභිඥවූ මහත් සෘද්ධි ඇති **සුමන** සාමණෙරද, ඔවුන් අතුරෙහි සත්වැනිවූ ප්‍රතිවෙධකළ චතුසත්‍යය ඇති **භණ්ඩුක උපාසකද** යන මේ මහා ශ්‍රේෂ්ඨයෝ රහසිගතව මන්ත්‍රණයකළහ'යි කියත්.

එකල්හි සක්දෙවි රජතෙමේ **මහාමහින්ද** මහා ස්ථවිරයන්වහන්සේ වෙත එළඹ 'ස්වාමීනි! **මුටසීව** රජතෙමේ කලුරියකෙළේය, දන් **දේවානම්පියතිස්ස** මහරජ රජය කරවයි, අනාගතයෙහි මහිඳුනම් ස්ථවිරතෙමේ තාම්‍රපර්ණී ද්වීපය පහදවන්නේ'යි සම්මාසම්බුදුරජානන්වහන්සේ විසින්ද ඔබවහන්සේ දක්වනලද්දහුය, එහෙයින් ස්වාමීනි! මෙහි ඔබවහන්සේලාට ඒ උතුම් දිවයිනට යෑමට

මේ කාලයවේ, මමද ඔබවහන්සේලාට සහායවන්නෙමි'යි මෙසේ කීයේය.

කුමක් හෙයින් සක්දෙවි රාජෝත්තමයා මෙසේ කියේදයත්: 'භාග්‍යවතුන් වහන්සේ වනාහි බෝමුලදීම බුදුඇසින් ලොව බලා අනාගතයෙහි මේ දිවයිනෙහි සම්පත්තිය දක මේ කාරණය මොහුට වදළසේක. එකල්හි ඔබද එයට සහායවවු'යි ඇණවූසේක. එහෙයින් සක්දෙවි රජ මෙසේ දන්වා සිටියේය. මහා **මහින්ද** මහා ස්ථවිරයන්වහන්සේ ඔහුගේ වචනය පිළිගෙන තුමූ සත්වැනිවූවෝ **වෙදිස** පර්වතයෙන් අහසට නැඟී අනුරාධපුරයට පූර්වදිශාවෙහිවූ මිශ්‍රකපර්වතයෙහි පිහිටාගත්හ. දැන් මේ පර්වතය චෛත්‍යපර්වතයයිද දනිත්. එහෙයින් පුරාතනයෝ:

'රජගහ නුවර වෙදිස ගිරියෙහි තිස්රැයක් වාසයකොට ගමනට මේ කාලයමය, එහෙයින් උතුම් දිවයිනට යම්හයි දඹදිවින් අහසට නැංගාහුය. මෙසේ' හස්රජුන්' මෙන් අහසට නැංගාවූ මහාස්ථවිරයන්වහන්සේ පර්වතයනට උතුම්වූ සැගිරි පව්වෙහි පිහිටාගත්හ.

පුරශ්‍රේෂ්ඨවූ අනුරාධපුරයෙහි පූර්වදිශාභාගයෙහි නිල් මහමේකුළක් සමානවූ පිලකුටනම් පර්වතමස්තකයෙහි හංසයන්මෙන් පෙනී සිටියහ'යි කියත්.

මෙසේ ආයුෂ්මත් **මහාමහින්ද** මහා ස්ථවිරයන්වහන්සේ **ඉට්ඨියාදි** මහා ස්ථවිරයන්වහන්සේ සමග මෙහි වැඩමකොට, සම්මාසම්බුදුරජාණන්වහන්සේගේ පිරිනිවීමෙන් දෙසියවසක් ඇවැමෙන් මතුවෙහි සතිස්වන අවුරුද්දෙහි මේ දිවයිනෙහි පිහිටාගත්හයි දතයුතුය. අජාසත්රජුගේ අටවන අවුරුද්දෙහි සම්මාසම්බුදුරජාන්වහන්සේ පිරිනිවිසේක. ඒ අවුරුද්දෙහිම **සීහ** කුමාරයාගේ පුත්‍රවූ හෙළදිව ආදිරාජවූ **විජය කුමරා** මේ දිවයිනට පැමිණ දිවයින මනුෂ්‍යවාස ඇත්තක්කෙළේය. දඹදිව **උදයභද්ද** රජුගේ තුදුස්වන අවුරුද්දෙහි මෙහි විජයරජ කලුරියකෙළේය. **උදයභද්ද** රජුගේ පසළොස්වන අවුරුද්දෙහි **පණ්ඩුවාසදෙව** රජ මේ දිවයිනෙහි රාජ්‍යයට පැමිණියේය. ඒ දඹදිව **නාගදසක** රජුගේ විසිවන අවුරුද්දෙහි මේ ලක්දිව **පණ්ඩුවාසදේවරජු** කලුරියකෙළේය. ඒ අවුරුද්දෙහිම **අභය**නම් රජකුමරා මේ දිවයිනෙහි රාජ්‍යයට පැමිණියේය. එහි දඹදිව **සුසුනාග** රජුගේ සතළොස්වන අවුරුද්දෙහි මෙහි අභයරජහට විසිවසක් සම්පූර්ණවූයේය. අනතුරුව අභයරජුගේ විසිවන අවුරුද්දෙහි **පකුණ්ඩකාභය**නම්වූ දමරිකයෙක් රාජ්‍යය අල්ලාගත්තේය.

දඹදිව **කාලාශෝක** රජුගේ සොළොස්වන අවුරුද්දෙහි මේ දිවයිනෙහි **පකුණ්ඩකාභය** රජුට සතළොස්වසක් පිරිසිටියේය. යට එක් වසක් සමග ඒ වස් ගණන අටළොසක්වේ. එහි දඹදිව **චන්ද්‍රගුප්ත** රජුගේ තුදුස්වන අවුරුද්දෙහි මෙහි **පකුණ්ඩකාභය** රජු කලුරියකෙළේය. **මුටසීව** රජු රාජ්‍යයට පැමිණියේය. එහි දඹදිව **අශොකධම්** රජුගේ සතළොස්වන අවුරුද්දෙහි මෙහි **මුටසීව** රජු කලුරියකෙළේය. **දේවානම්පියතිස්සරජ** රාජ්‍යයට පැමිණියේය. බුදුරජාණන්වහන්සේගේ පිරිනිවීමෙන් පසුද අජාසත් සුවිසි වසක් රාජ්‍යය කරවීය.

උදයභද්ද සොළොස් වසක්ද, **අනුරුද්ධ - මුණ්ඩ** දෙදෙන අටවසක්ද, **නාගදසක** සුවිසිවසක්ද, **සුසුනාග** අටළොස්වසක්ද, ඔහුගේම පුත්‍රවූ **කාලාශොක** අටවිසිවසක්ද, අශොකගේ පුත්‍රවූ **දසභාතුක** රජහු දෙවිසිවසක්ද, රාජ්‍යයකරවූහ. ඔවුනට පසු **උගසෙනනන්ද, පණ්ඩුකනන්ද, භූතපාලනන්ද, රට්ඨපාලනන්ද, ගොවිසාණනන්ද, සවින්ධකනන්ද, කෙවට්ටකනන්ද, ධනනන්දයන** **නවනන්ද** රජහු දෙවිසිවසක්ම රාජ්‍යයකළහ. **චන්ද්‍රගුප්ත** සුවිසිවසක්ද, **බින්දුසාර** අටවිසිවසක්ද රාජ්‍යයකළහ. ඔහුගේ අවසානයෙහි **අශොකරජු** රාජ්‍යයට පැමිණියේය. ඔහුගේ අභිෂෙකයෙන් පෙර සිවුවසක්ද, අභිෂේකයෙන් අටළොස්වන අවුරුද්දෙහි මේ දිවයිනෙහි මහාමහීන්ද මහා ස්ථවිරයන්වහන්සේ පිහිටාගත්හ. මේ පැමිණීම මෙසේ රාජවංශානුසාරයෙන් දතයුතුය. සම්මාසම්බුදුරජානන්වහන්සේගේ පරිනිර්වාණයෙන් දෙසිය සතිස්වන අවුරුද්දෙහි මෙහිද සසුනපිහිටියේය.

එදවසද මෙහි හෙළදිව පොසොන්මස පහළොස්වක් පොහෝදිනයෙහි මූලනක්ෂත්‍රනම් නැකැත්කෙළියක්වේ. රජතෙමේ නැකැත්කෙළිය හඬගා කියවා 'උත්සව කරවු'යි ඇමතියන්ද අණවා සතළිස්දහසක් පුරුෂයන් පිරිවරකොට ඇතියේ නුවරින් නික්ම මුවන් පෙළීමෙන් ක්‍රීඩා කරනු කැමතිව මිශ්‍රක පර්වතයට ගියේය. ඉක්බිති ඒ පර්වතයෙහි අරක්ගත් එක් දේවතාවෙක් රජුට මහතෙරුන් දක්වන්නෙමි'යි රොහිත මෘගවෙශයක් ගෙන නොදුර තැනක තනපත් කන්නියකමෙන් හැසිරෙන්නීය. රජු ඌ දක 'පමාවූවහු විදීම අයුතුය'යි දුනුදිය පෙළීය. මෘගතෙමේ අඹතලා මගටවැටී පැන යන්නට පටන්ගත්තේය. රජු ඌ පසුපස ලුහුබැඳ දුවනුයේ අඹතලයට නැගගත්තේය. මෘගතෙමේද මහතෙරුන්ට නොදුරෙහිදී නොපෙනීගියේය. **මහා මහීන්ද** මහා ස්ථවිරයන්වහන්සේ නොදුරෙහි එන රජු දක 'රජතුමා ම දකීවා, අන්හු නොදකීවා'යි ඉටා 'තිසස! තිසස! මෙහි එව'යි වදළසේක. රජතුමා ඒ

අඩගෑම අසා 'මේ දිවයිනෙහි උපන්නෙක් 'තිස්ස'යි නම්කියා මට අමතන්නට සමර්ථවූයේනම් නොවේ, මේ සුන්බුන්පිළී දරන හිස මුඩුකළ කසාවත් හැඳ පෙරවූ මෙතෙමේ නම් කියා මා අමතන්නේය, මෙතෙමේ මනුෂ්‍යයෙක්ද, අමනුෂ්‍යයෙක්ද කවරෙක් හෝ වන්නේද'යි සිතීය. එකල්හි මහා ස්ථවිරයන්වහන්සේ:-

'මහරජ! ධර්මාජන්වූ බුදුරජානන්වහන්සේගේ ශ්‍රාවකවූ අපි ශ්‍රමණයෝ වම්හ, ඔබටම අනුකම්පාපිණිස දඹදිවින් මෙහි ආම්හ'යි වදළසේක.

ඒ කාලයෙහි දේවානම්පියතිස්ස රජතුමා, ධර්මාශෝක මහරජතුමාදයන දෙදෙන නොදුටු මිතුරෝ වෙත්. දේවානම්පියතිස්ස මහරජුගේද පුණ්‍යානුභාවයෙන් ඡාතක පර්ව පාදයෙහි එක් උණලැහැබක රියකෙවිටි පමණවූ උණයටි තුනක් හටගත්තේය. එකක් ලතායෂ්ටිනම. එකක් පුෂ්පයෂ්ටිනම. එකක් ශකුණයෂ්ටිනම. ඒ යට අතුරෙහි ලතායෂ්ටි රිදීපැහැ ඇත්තේවේ. ඒ රිදී පැහැය අලඩකාරකොට උපන් ලතා සියල්ල රන්වන්වූවාසේ වැටහේ. පුෂ්පයෂ්ටියෙහි නීල පීත ලොහිත අවදාත කාලවර්ණ පුෂ්පයෝ මොනවට බෙදූ නටුපත් කෙසුරු ඇතිව පෙනේ. ශකුණ යෂ්ටියෙහි හංස කුක්කුට ජීවඤ්ජීවකාදි පක්ෂීහුද නන්වැදරුම් සිවුපාවෝද දිවිඇත්තන්මෙන් පෙනෙත්. දීපවංසයෙහි මෙය:

'ඡාත පර්වතපාදයෙහි හුණයටි තුනක් විය. රිදියටක් මෙන් සුදුවූ ලතා තොමෝ කසුන් සමානවූය. නිල්ඇ පැහැයෙන්යුත් පුෂ්ප යම්බඳු වේද, පුෂ්පයෂ්ටියෙහි එබඳුව වැටහේ. ශකුණ යෂ්ටියෙහි ස්වරූපයෙන්ම පක්ෂීහු පිහිටියාහුය'යි කියනලදී.

මේ රජුට මුහුදෙන්ද මුතු මැණික් වෙරළුමිණිආදීවූ නන්වැදරුම් රුවන් උපන්නේය. හෙළදිව හයමුතු, ගජමුතු, රියමුතු, ඇඹුල්පල මුතු, වලය මුතු, ඇහිලිවෙළුම් මුතු, කුඹුක්පල මුතු, පියවි මුතු යන අටවැදරුම් මුතු උපන. දේවානම්පියතිස්ස රජතෙමේ ඒ යටිද, ඒ මුතුද, අන්‍යවූ බොහෝ රුවන්ද ධර්මාශෝක මහරජුට පඬුරුපිණිස යැවූයේය.

අශෝක රජතෙමේ පැහැද දේවානම්පියතිස්ස රජුට ඡත්‍රය, චාමරය, ඛඩ්ගය, මෞලිය, රුවන් මිරිවැඩිසහලයයන පඤ්චවිධ කකුධභාණ්ඩයන්ද, අභිෂෙකයපිණිස, එයින් අන්‍යවූ නන්වැදරුම් පඬුරුද එවූයේය. එනම්: දක්ෂිණාවර්ත්ත සඬඛය, අනවතප්ත ජලය, අලඩකාර සුණ්ණය, කන්පලඳනාය, ස්වර්ණමය කෙණ්ඩිය, කවුඩුපා සටහන් ඇති රන්බඳුනය, සිවිගෙය, කැත්කුමරිය, රන්මුවා සැන්දය, කිලිටිවූ කල ගින්නෙහිලූ ඇසිල්ලෙහි

පිරිසිදුවන එනම් වස්ත්‍ර යුග්මය, රන්වන් අත්පිස්නා පටපිළිය, රන්වන් සඳුන්ය, අරුණවන් මැටිය, නයින් විසින් ගෙනෙනලද අඳුන්ය, දිව්‍යමය අරළය, දිව්‍යමය නෙල්ලිය, මාහැඟිවූ අමෘතෞෂධයයන මොවුහුය. දීපවංසයෙහි මෙය කියනලද්දේ මෙසේය:

'වල්විදුන්නාය, නලල්පටය, ඡත්‍රය, ඛඩ්ගය, මිරිවැඩිසහලය, හිස්වෙළුම්ය, උතුම් හවඩිය, රන් කෙණ්ඩිය, නන්දිවට්ටනම් රන් බඳුනය, සිවිගෙය, දක්ෂිණාවෘත්ත ශඛය, කන් පලඳනාය, (අධොවිමනම්) වස්ත්‍ර යුග්මය, රන්තලිය, රන්මුවාහැන්දය, මාහැඟි අත්පිස්නය, අනවතප්තවිල දිය, කැත්කුමරිය, උතුම් ගොසීතසඳුන්ය, අරුණුවන්මැටිය, නයින් විසින් ගෙනෙනලද අඳුන්, දිව්‍යමය අරළය, දිව්‍යමය නෙල්ලිය, මාහැඟි අමතොසධනම් සුටිකාය, පුණ්‍යකම් බලයෙන් උපන් ගිරවුන් විසින් ගෙනෙනලද සුවඳහැල් එක්සියසැට ගැලක්ද අශොකනම් රජු එවූයේය'යි.

හුදෙක් මේ ආමිස පඬුරුම නොද එවූයේය. 'මම බුදුන්ද, දහම්ද, සඟුන්ද, සරණකොට ගියෙමි, ශාක්‍යපුත්‍රවූ බුදුරජානන්වහන්සේගේ ශාසනයෙහි උපාසකභාවය ප්‍රකාශකෙළෙමි, නරොත්තමය! එහෙයින් ඔබද මේ උතුම්වූ වස්තුත්‍රයයෙහි සිත පහදවවු, ශ්‍රද්ධාවෙන් සරණ යවුයි මේ දහම් පඬුරුද එවූයේය.

ඒ මේ දේවානම්පියතිස්ස රජතෙමේද එදවස අශොක මහරජුවිසින් එවනලද අභිෂෙකයෙන් අභිෂෙකකරනලද එක්වස් ඇත්තේ වේ. වෙසක් පුණුපොහොයද මොහුගේ අභිෂෙකය කළහ. හෙතෙමේ නොබෝද ඇසූ ඒ ශාසනප්‍රවෘත්තිය සිහිකරනුයේ **'සමණා මය• මහාරාජ ධම්මරාජස්ස සාවිකා'** යන මහතෙරුන්වහන්සේගේ ඒ වචනය අසා 'ආයුෂ්මයෝ ආවාහු මැ'යි එකෙණෙහිම අත තුබූ ආවුධ බිම හෙළා සතුටුවියයුතු කතා කරමින් එකත් පසෙක හුන්නේය. එය මෙසේකීහ:

'ආවුධ බිම හෙළා එකත්පසෙක හුන්නේය. රජතෙමේ එසේ එකත්පසෙක හිඳ අරථියෙන් යුක්තවූ බොහෝ කතාකරමින් සතුටුවූයේය'යි.

රජු සතුටුවියයුතු කතා කරනකල්හිම ඒ සතළිස්දහසක් පුරුෂයෝ එහි අවුත් රජු පිරිවරාගත්හ. එකල්හි මහා ස්ථවිරයන්වහන්සේ රජුට අනික් සදෙනාද දක්වූහ. රජතෙමේ ඔවුන්දැක 'මොවුහු කවද ආවාහුද'යි ඇසීය. 'මහරජ! මා සමගමැ'යි වදළවිට 'ස්වාමීනි! දැන් දඹදිව මෙබඳු ශ්‍රමණයෝ තවත් වෙත්ද'යි ඇසීය. 'මහරජ! ඇත්තාහ, දැන් මේකාලයෙහි දඹදිව කසාවතින් බබලන්නේය, භික්ෂූන් වෙතින් හමන වාතප්‍රතිවාත ඇත්තේය, එහි ත්‍රිවිද්‍යා ඇත්තාවූ ඍද්ධිවිධඥානයට පැමිණි පරා පිළිබඳ

සිත්හසර දැනීමෙහි දක්ෂවූ ක්ෂය කළ ආස්‍රවඇති රහත්වූ බුද්ධශ්‍රාවකයෝ බොහෝය'යි වදළසේක.

'ස්වාමීනි! ඔබවහන්සේලා කුමකින් වැඩියහුද'යි විචාළකල්හි 'මහරජ! දියෙන් නොම ආයෙමු, ගොඩින් නොම ආයෙමු'යි වදළසේක. එකල්හි රජතෙමේ 'උන්වහන්සේලා අහසින් වැඩියාහ' යි දැනගත්තේය. ඉක්බිති මහා ස්ථවිරයන්වහන්සේ ප්‍රඥව පිළිබඳ ව්‍යක්තභාවයක් රජුට ඇත්තේද'යි විමසනුපිණිස අසල තුබූ අඹරුකක් ඇරැඹ 'මහරජ! මේ රුක කිනම්ද'යි ඇසූහ. 'ස්වාමීනි! මේ අඹරුක නමැ'යි කීය. 'මහරජ! මේ රුක හැර අන් අඹරුකක් ඇත්තේද; නැත්තේද'යි ඇසූහ. 'ස්වාමීනි! අන්‍යවූද බොහෝ අඹරුක් ඇතැ'යි එයට පිළිතුරු දුන්කල්හි 'මහරජ! මේ අඹරුකද ඒ අඹරුක්ද හැර අන් රුක් ඇත්තේද'යි විචාළසේක. 'ස්වාමීනි! ඇත්තේය, ඒ අඹරුක් නොවේය'යි කියුකල්හි 'මහරජ! ඒ අන් අඹරුක්ද ඒ නොඅඹරුක්ද හැර අන්රුකක් ඇත්තේද'යි ඇසූහ. 'ස්වාමීනි! මේ අඹරුකැ'යි රජතෙමේ පිළිතුරු දුන්නේය. එකල්හි 'මැනවි, මහරජ! ඔබ පණ්ඩිතවහු'යි වදළසේක.

නැවත 'මහරජ! ඔබට නෑයෝ ඇත්තාහුද'යි ඇසූහ. බොහෝදෙනෙක් ඇතැ'යි කියුකල්හි 'මහරජ! ඒ නෑයන් හැර නොනෑවූ අන්කිසි කෙනෙක් ඇත්තාහුද'යි ඇසූහ. 'ස්වාමීනි! නෑයන්ට වඩා නොනෑයෝම ඉතා බොහෝ වෙති'යි කීය. එකල්හි මහරජ! ඔබගේ ඒ නෑයන්ද නොනෑයන්ද හැර අන්කිසිවෙක් ඇත්තේද'යි ඇසූහ. 'ස්වාමීනි! ඒ මම්මැ'යි කීයේය. 'මැනවි, මහරජ! තෙමේ තමාගේ නෑයෙක් නොවේමය, නොනෑයෙක්ද නොවේමය'යි වදරා මහා ස්ථවිරයන්වහන්සේ 'රජතෙමේ පණ්ඩිතය, ධර්‍මය දැනගන්නට හැකිවන්නේය'යි රජහට **චූලහත්ථිපදෙපම** සූත්‍රය වදළසේක. ධර්‍මකථාවසානයෙහි රජතෙමේ සතළිස්දහස් පිරිවරජනයා සමග තුන්සරණයෙහි පිහිටියේය. ඒ වේලෙහිම රජුට බත් එළවනු ලැබිය. රජතෙමේ සූත්‍රාන්තය අසන්නේ 'මුන්වහන්සේට මෙකල්හි වැළඳීම නොසුදුසුය'යි දැනගත්තේද, නොවිචාරා වැළඳීම අයුතුය'යි සිතා 'ස්වාමීනි! වළඳන්නහුදැ'යි විචාළේය. 'මහරජ! මේ කාලයෙහි බොජුන් ගැණීම අපට කැප නොවේය'යි වදළකල්හි 'ස්වාමීනි! කවර වේලාවක ඒ සුදුසුද'යි ඇසීය. 'මහරජ! අරුණ නැගි තැන්පටන් මදධ්‍යාහන කාලයදක්වා කැපය'යි වදළසේක. නැවත රජතෙමේ 'ස්වාමීනි! නුවරට යමු'යි කීයේය. 'මහරජ! කම් නැත, අපි මෙහිම වසන්නෙමු'යි කීහ. 'ඉදින් ස්වාමීනි! ඔබවහන්සේ මෙහි වසන්නහුනම් මේ දරු ඒවා, 'මහරජ! මේ දරු පැමිණි අනාගාමීඵල ඇත්තේය, දන්නාලද

ශාස්තෘශාසනය ඇත්තේය, පැවිද්ද බලාපොරොත්තුවේ, දන් පැවිදිවන්නේය'යි වදළසේක. 'සචාමීනි! එසේනම් හෙට රිය එවන්නෙමි, එයට නැග වඩිනුමැනව'යි කියා වැඳ නික්මගියේය.

රජු පෙරළා ගිය නොබෝ වේලාවකදී මහා ස්ථවිරයන්වහන්සේ 'සුමන! මෙහි එව, ධම්ශ්‍රවණයපිණිස කල් දන්වාලව'යි සමන සාමණේරයන් ඇමතූහ. 'ස්වාමීනි! කොතෙක් දුරට අස්වන නම්, සෝෂාකරම්ද'යි ඇසූකල්හි 'සියලු තාම්‍රපණ්ණියටැ'යි කීහ.'ස්වාමීනි! යහපතැ'යි සාමණේර තෙමේ අභිඥාපාදක චතුර්ථධ්‍යානයට සමවැද එයින් නැගිට ඉටා එකහවූ සිතින් සියලු තාම්‍රපණ්ණියට අස්වමින් තෙවරක් ධම්ශ්‍රවණයට කාලඝොෂා කෙළේය. රජතෙමේ එහඬ අසා 'ස්වාමීනි! කිසි උවදුරක්වේද'යි සොයා බැලීමට මහතෙරුන් වෙතට රාජපුරුෂයන් යැවූයේය. උන්වහන්සේ 'අපට කිසි උවදුරක් නැත්තේය, ධම්ශ්‍රවණයට කාලඝොෂා කරවුම්හ. බුදුදහම් කියාදෙනු කැමැත්තම්හ'යි ඔවුනට වදළසේක.

සුමන සාමණේරයන්ගේ ඒ කාලඝොෂය අසා බුමාටුදෙවියෝ ශබ්ද ඇස්වූහ. මේ ක්‍රමයෙන් බඹලොවතෙක් ශබ්දය උස්ව පැනනැගී ගියේය. ඒ ශබ්දයෙන් මහත්වූ දේවතා සන්නිපාතයවූයේය. මහා ස්ථවිරයන්වහන්සේ මහත්වූ ඒ දේවතා සන්නිපාතය දක එහිදී **සම්මිත්ත** සූත්‍රාන්තය දෙසූසේක. දේශනාවසානයෙහි සඬ්ඛ්‍යා නොකට හැකිවූ දෙවියන්ට ධම්ාවබෝධයවූයේය. බොහෝ නාගයෝද, ගරුඩයෝද තිසරණයෙහි පිහිටියහ. ශාරීපුත්‍ර මහාස්ථවිරයන්වහන්සේ මේ සූත්‍රය දේශනාකරණකල්හි යම්බඳුවූම දෙවතාසන්නිපාතයක්වූයේද, මහා **මහිඳු** මහා ස්ථවිරයන්වහන්සේටද එබඳුමවූ දෙවතාසන්නිපාතයක්වූයේය.

ඉක්බිති රජතෙමේ ඒ රැය ගෙවීයෑමෙන් පසු මහතෙරුන් වෙතට රිය යැවීය. රියැදුරුතෙමේ රිය ගෙනගොස් පසෙක තබා මහතෙරුන්ට 'ස්වාමීනි! රිය ගෙන එනලද්දේය, යන්නෙමු, රියට නගිනු මැනව'යි දන්වා සිටියේය. ස්ථවිරයන්වහන්සේ 'අපි රියට නොනගිමු, ඔබ යවු, අපි පසුව එන්නෙමු'යි කියා අභයට නැගී අනුරාධපුරයෙහි පූර්වදිශාවෙහි ප්‍රථමකචෛත්‍යස්ථානයෙහි බැසගත්හ. ඒ චෛත්‍යය මහතෙරුන් පළමු බටහැන කළබැවින්ම **'ප්‍රථමකචෛත්‍ය'**යි කියනුලැබේ.

රජතෙමේද රියැදුරු යවා 'ඇතුළු නිවෙස්නෙහි මණ්ඩපයක් පිළියෙල කරවු'යි ඇමැතියන්ට අණකෙළේය. එකෙණෙහිම සියල්ලෝ තුටුපහටුව අතිශය ප්‍රසාදවහවූ මණ්ඩපයක් පිළියෙල කළහ. නැවත රජතෙමේ

‘ඊයේ මහා සථවිරයන්වහන්සේ ශීලස්කන්ධය වදරනසේක් උසසුන් මහසුන් අකැපය’යි වදළසේක. ආයුෂ්මත්වහන්සේලා අසුන්හි හිඳින්නාහුද නොහිඳින්නාහුද’යි සිතූයේය. රජු මෙසේ සිතත්ම ඒ රියැදුරු නුවර දෙරට පැමිණියේය. තමාට ඉතා පෙරාතුව අවුත් කාබාන බැඳ සිවුරුපොරවන මහතෙරුන් දුටුයේය. දක තදින් පහන්වූ සිත්ඇති රියැදුරු අවුත් ‘දෙවයන්වහන්ස! මහා ස්ථවිරයන්වහන්සේ වැඩම කළහ’යි රජුට සැලකර සිටියේය. එහිදී රජතෙමේ ‘උන්වහන්සේ රියට නැංගාහුද’යි විචාළේය. ‘දෙවයන්වහන්ස! නොනැංගාහ, එහෙත් මට පසුව එතැනින් පිටත්ව මා මෙහි ඊමට ඉතා පෙරාතුව අවුත් පැදුම්දෙර සිටියාහ’යි කීය. රජතෙමේ ‘මහතෙරහු රියට නොනැංගාහ’යි අසා ‘ආයුෂ්මත්වහන්සේ දැන් උසසුන් මහසුන් නොඉවසන්නාහ’යි සිතා ‘සහයෙනි! එසේ නම් මහතෙරුන්ට බුමුතුරුණු අයුරින් අසුන් පණවාලව’යි නියමකොට පෙරමහට ගියේය. ඇමතියෝ බිම තල්පතින්කළ තටුපණවා ඒ මතුවෙහි කොදුපලස්ආදීවූ විසිතුරු ඇතිරිලි ඇතුරුහ. භූමිකම්පනාදිය කියාපාන විද්‍යාඥයෝ ඒ දක ‘දැන් මොවුන් විසින් පොළොව ගන්නාලදය, මොවුහු තාම්‍රපර්ණියෙහි ඊශ්වර වන්නාහ’යි කියාපෑහ. රජතෙමේද ඉදිරියටගොස් මහතෙරුන් වැඳ මහා **මහීන්ද්‍ර** මහා ස්ථවිරයන්වහන්සේගේ අතින් පාත්‍රයගෙන මහත්වූ පූජාවෙන්ද මහත්වූ සත්කාරයෙන්ද යුක්තව මහතෙරුන් නුවරට වැඩමකරවා අනතුරුව ඇතුල්නිවෙස්නට වැඩමකරවීය.

මහා **මහීන්ද්‍ර** මහාස්ථවිරයන්වහන්සේ අසුන් පැනවීම දක ‘අපගේ ශාසනය මුළුලක්දිව පොළොවමෙන් පැතිර නිසලවම පිහිටා ගත්තේය’යි සිතමින් වැඩහුන්සේක. රජතෙමේ මහතෙරුන් ප්‍රණීතවූ කෑයුතුදයින් හා බිදියයුතුදයින් සියතින් සතප්වා මොනවට පවරා ‘අනුලාදේවිය ප්‍රමුඛවූ පන්සියයක් ස්ත්‍රීහු මහතෙරුන්ට වැඳුම්පිදුම් සත්කාර කෙරෙත්වා’යි උන් කැඳවා එකත්පසෙක හුන්නේය. මහා **මහීන්ද්‍ර** මහා ස්ථවිරයන්වහන්සේ බත්කිස අවසන්හි පිරිවරදෙනා සහිතවූ රජුට දම්රුවන් වැයිවස්වනසේක් **ප්‍රේතවස්තුව** හා **විමානවස්තුවද, සත්‍යසංයුක්තයද** වදළසේක. මහා සථවිරයන්වහන්සේගේ ඒ ධර්මදේශනාව අසා ඒ පන්සියයක් ස්ත්‍රීහු සොතාපත්තිඵලය ප්‍රත්‍යක්ෂකළහ.

යම් ඒ මිනිස්කෙනෙක් පළමුදිනයෙහි මිශ්‍රක පර්ෂදයෙහිදී මහතෙරුන් දුටුවාහුද, ඔවුහු ඒ ඒ තන්හි මහතෙරුන්ගේ ගුණකියත්. ඔවුන් කියන ගුණකථාව අසා මහාජනසමූහයා රජගෙදෙර මිදුලෙහි රැස්ව මහා හඬ නැගූයේය. රජතෙමේ ඒ අසා ‘මේ හඬ කිමැ’යි විචාළේය. ‘දෙවයන්වහන්ස! නුවරවැස්සෝ මහතෙරුන් දක්නට නොලබමු’යි හඬ නගති’යි කීහ. ‘ඉදින් ඔවුහු මෙහි පිවිසෙන්නාහුනම් ඉඩපහසුනැතිව යන්නේය’යි සිතා

රජතෙමේ 'සගයෙනි! ඇත්හල පිළිදඟ වැලිඅතුරා පස්පැහැති මල් විසුරුවා සෙල්වියන් බැඳ මගුල්ඇතු සිටිතැන මහතෙරුන්ට අසුන් පනවාලව'යි ඇමතියන්ට අණකෙළේය. ඇමතියෝ එසේකළහ. මහා **මහීන්ද** මහා ස්ථවිරයන්වහන්සේ එහි වැඩමවා වැඩහිඳ **දෙවදූත** සූත්‍රාන්තය දෙසූසේක. ධර්මකථාවසානයෙහි ප්‍රාණීන් දහසක් සොතාපත්තිඵලයෙහි පිහිටියේය.

ඉක්බිති ඇත්හල අතිසම්බාධයයි දකුණුදෙර නඳන වනොද්‍යානයෙහි අසුන් පැනවූහ. මහාස්ථවිරයන්වහන්සේ එහි වැඩහිඳ ආශූවිඝොපමසූත්‍රය දෙසූසේක. එයද අසා ප්‍රාණීන් දහසක් සොතාපත්තිඵලය පිළිලැබිය. මෙසේ මෙහි වැඩමකළ දවසින් දෙවනදවසෙහි දෙදහස් පන්සියයක් දෙනාහට ධර්මාවබෝධය වූයේය. එහි ආ කුලස්ත්‍රීන් කුලයෙහෙළින් කුලකුමාරීන් සමග සතුටුවියයුතු දැහැමිකතාවෙහි යෙදීසිටි මහා ස්ථවිරයන්වහන්සේට නඳන වනයෙහිදීම සවස්වූයේය. උන්වහන්සේ කාලය ගැන සලකා 'දැන් මිශ්‍රක පර්වතයට යමු'යි නැගීසිටියහ. එකල්හි ඇමතියෝ 'ස්වාමීනි! කොතැන වඩින්නහුද'යි ඇසූහ. 'අපගේ වාසස්ථානයටැ'යි උන්වහන්සේ කීහ. ඇමතියෝ රජුට දන්වා රජුගේ අනුමතියෙන් 'ස්වාමීනි! එහි වඩින්නට දැන් කාලය නොවේ, මේ නදුන්වනඋයනම ආර්‍යයන්වහන්සේලාට වාසස්ථානය වේවා'යි දන්වා සිටියහ. එකල්හි 'කම් නැත යමු'යි කීහ. නැවත රජුගේ වචනයෙන් 'ස්වාමීනි! රජු මෙසේ කීයේය: මේ මෙඝවනනම් උයන මාගේ පියයතුය, නුවරට ඉතා දුර නොවේ, ඉතා සමීපද නොවේ, යෑමටඊමට පහසුය, මහා ස්ථවිරයන්වහන්සේලා මෙහි වාසයකරත්වා'යි කීහ. එකල්හි මහාස්ථවිරයන්වහන්සේලා මෙඝවනඋයනෙහි විසූහ.

රජතුමාද ඒ රැය ගෙවීගිය පසු මහතෙරුන්වෙත ගොස් 'කිම, ස්වාමීනි! මෙහි සුවසේ හොත්තහුද, ඔබවහන්සේලාට මේ නිවස සැපද යන සුඛසහිතභාවය විචාරා 'ස්වාමීනි! භික්ෂුසඞ්ඝයාහට ආරාමය කැපවේද'යි විචාළේය. මහා ස්ථවිරයන්වහන්සේ 'කැපය, මහරජ'යි වදරා '**අනුජානාමි භික්ඛවෙ ආරාමං**'යන මේ සූත්‍රය වදළසේක. රජතෙමේ තුටුවූයේ රන්කෙණ්ඩිය ගෙන මහතෙරුන්ගේ අතෙහි පැන් වත්කොට මහා මෙඝවනඋයන පිදූයේය. පැන්වැටීම සමග පොළොව සැලුනීය. මේ වනාහි මහා විහාරයෙහිවූ ප්‍රථම පෘථිවිකම්පනයයි. මේ පෘථිවිකම්පනයෙන් බියටපත් රජ 'ස්වාමීනි! කුමක් හෙයින් පොළොව සැලුනීද'යි ඇසීය.

'මහරජ! බිය නොවව, මේ දිවයිනෙහි බුදුරජානන්වහන්සේගේ සසුන පිහිටන්නේය, මෙතැන ප්‍රථම විහාරස්ථානය වන්නේය, මේ එයට පෙරනිමිති'යි වදළසේක. රජතෙමේ බෙහෙවින් පහන්වූයේය. මහා

ස්ථවිරයන්වහන්සේ පසුදද රජගෙයිම වළඳ නඳන වනයෙහිදී **අනමතග්ගියසංයුක්තය** වදළසේක. එයට පසුද **අග්ගික්ඛන්ධොපම** සූත්‍රය දෙසුසේක. ඒ ක්‍රමයෙන්ම සත්දවසක් දහම්දෙසුහ. ධර්මදේශනාවසානයෙහි අටදහස් පන්සියයක් ප්‍රාණීන්ට ධර්මාවබෝධයවූයේය. එතැන්පටන් නඳනවනය සසුනට ආලොකය පහළවන තැනැයි ස්ථිරකොට ජොතිය වනය යන නම ලැබීය. සත්වන දිනයෙහි මහා ස්ථවිරයන්වහන්සේලා ඇතුළු නුවරදී රජුට **අප්පමාද** සූත්‍රය වදරා සැගිරියටම වැඩියසේක.

ඉක්බිති රජතෙමේ 'මහා ස්ථවිරයන්වහන්සේ අපට දැඩි අවවාදයෙන් අවවාද කරනසේක, කිම පෙරළාවඩින්නාහුද'යි ඇමතියන්ගෙන් විචාළේය. ඇමතියෝ 'දෙවයන්වහන්ස! මහා ස්ථවිරයන්වහන්සේලා දෙවියන් විසින් අනාරාධිතව තුමූම මෙහි වැඩියසේක. එහෙයින් ඔබවහන්සේ නොවිචාරා ගමනද වන්නේය'යි කීහ. ඉක්බිති රජතුමා රියටනැගී දෙවින්දෙදෙනද රියට නංවාගෙණ මහත් රාජානුභාවයෙන් සැගිරියට ගියේය. ගොස් දෙවින්දෙදෙන එකත්පසකට බැහැරකරවා තෙමේම තෙරුන්වෙත එළඹෙනුයේ දැඩිසේ වෙහෙසුනු බව ඇතිව එළඹියේය. ඉක්බිති මහා ස්ථවිරයන්වහන්සේ 'මහරජ! කුමක්හෙයින් ඔබ මෙසේ වෙහෙස වීද මෙහි ආවහුද'යි රජුගෙන් විචාළේය. 'ස්වාමීනි! මට දැඩිසේ අවවාදදී පෙරළා වඩිනුකැමැත්තහුදයි දැනගණුපිණිසය'යි කීය. 'මහරජ! අපි යනු කැමැත්තෝ නොවම්හ, එහෙත් මහරජ! මේ වස් එළඹෙන කාලයවේ, මහණහු විසින් එහි වස් එළඹෙන තැනක් දැනගතයුතුය්යි කීහ. එදවසම **අරිට්ඨ**නම් ඇමති පස්පණසක් දෙටුකනිටුබෑයන් සමඟ රජුවෙත සිටියේ 'දෙවයන්වහන්ස! අපි මහතෙරුන් සමීපයෙහි පැවිදිවනු කැමැත්තම්හ'යි කීය. එකෙණෙහි රජතුමා 'සගයෙනි! පැවිදිවෙවු'යි අනුදන මහතෙරුන්ට ඔවුන් භාරකෙළේය. මහතෙරුන්වහන්සේ ඔවුන් එදවසම පැවිදි කළහ. සියල්ලෝ කරකම් අවසන්හි රහත්බවට පැමිණියහ. රජතෙමේද එදවසම **කණ්ටක චෛත්‍යාඩඝණය** වටකොට අටසැටක් ලෙන්හි කම්‍මාන්ත පටන්ගන්වා නුවරටම පිවිසියේය. ඒ මහා ස්ථවිරයන්වහන්සේලාද දසබෑයන් ගෙන්යුත් රජකුලය පහදවා මහාජනයාට අවවාදකරමින් සැගිරියෙහිම වස් එළඹියහ. එද සැගිරියෙහි පළමු වස එළඹියාහු දෙසැටක් රහතුන්වහන්සේලාවූහ.

ඉක්බිති ආයුෂ්මත් මහා **මහින්ද** මහා ස්ථවිරයන්වහන්සේ වුසූ වස්ඇතිසේක් වස්පවරා ඉල්මස මැදිපොහොය දිනයෙහි රජු අමතා 'මහරජ! අපවිසින් සම්මාසම්බුදුරජානන්වහන්සේ දක්නාලද බොහෝකල් ඇත්තාහ. අපි අනාථවාසයෙන් විසූම්හ, එහෙයින් දඹදිව යන්නට

කැමැත්තමිහ'යි කීහ. එකල්හි රජතෙමේ 'ස්වාමීනි! ඔබවහන්සේලාට සිවුපසයෙන් උපස්ථානකරම්, මේ මහාජනයාද ඔබ වහන්සේලා නිසා තිසරණයෙහි පිහිටියේය, කුමක් හෙයින් ඔබවහන්සේලා උකටලීවූවහුද'යි විවාළේය. 'මහරජ! අපවිසින් සම්මාසම්බුදුරජානන්වහන්සේ බොහෝ ඈතකල්හි දක්නාලදහ. අපට උන්වහන්සේට වැඳීමට දැක නැගීසිටීමට ඇඳිලිබැඳීමට සැලකිලි දැක්වීමට තැනක් නැත්තේය, එහෙයින් අපි උකටලී වූමිහ'යි වදළසේක. 'සවමීනි! ඔබවහන්සේලා සම්මාසම්බුදුරජානන්වහන්සේ පිරිනිවියාහු'යි වදළාහු නොවහුද'යි රජතෙමේ ඇසීය. 'මහරජ! අපවිසින් කියනලද්ද සත්‍යය, එහෙත් උන්වහන්සේගේ ශාරීරික ධාතූහු ඇත්තාහ'යි වදළසේක. 'ස්වමීනි! දන්නාලද්දේය, ඔබවහන්සේලා සෑයක් ගොඩනැගීමට කැමතිවහුනම් 'ස්වාමීනි! සෑයක්කරම්, සෑය පිහිටුවීමට බිම් පෙදෙසක් දැන් සොයා බලහු'යි කීයේය. එහෙත් 'ස්වාමීනි! ධාතූන් කොයින් ලබමු ද?' 'මහරජ! සුමන හා ඒ ගැණ සාකච්ඡා කරව'යි වදළ කල්හි රජතුමා 'ස්වාමීනි! යහපතැ'යි සුමන සාමණේරයන් වෙත එළැඹ 'ස්වාමීනි! දැන් ධාතූන් කොතැනින් ලබමු ද'යි ඇසීය. සුමන සාමණේර භික්ෂු 'මහරජ! ඔබ එයට උත්සාහවත් නොවව, මාවත් පිරිසිදුකරවා, ධවජපතාකා, පූණ්ඝටාදියෙන් සරසවා, පිරිවර ජනයා සහිතව පෙහෙවස් සමාදන්ව, සියලු තූර්‍යභාණ්ඩ වයන්නන් එළවා, මගුලැතු සව්ලඬකාරයෙන් ප්‍රතිමණ්ඩිතකරවා, ඇතු මතුවෙහි සේසත් නංවා, සවස්වේලෙහි මහමෙවුනා උයනට මූණදී යතුමැනවි, එහිදී එකතින් ධාතූන්ලබන්නහුය'යි කීයේය රජතෙමේ 'යහපතැ'යි පිළිගත්තේය.

මහා ස්ථවිරයන්වහන්සේලා සෑගිරියටම වැඩියාහුය. එහිදී ආයුෂ්මත් මහා **මහින්ද** මහා ස්ථවිරයන්වහන්සේ සුමන සාමණේරයන්හට 'සාමණේරය! යව, දඹදිව ඔබගේ මුත්තනුවූ අශෝක දම්රජුන්වෙත එළඹ 'මහරජ! ඔබගේ යහළුවූ දේවානම්පියතිස්ස මහරජතෙමේ බුදුසසුන්හි පහන්වූයේය, ඒ රජතෙමේ සෑයක් පිහිටවනු කැමැත්තේය, ඔබඅත ධාතූහු ඇත්තාහ, එය මට දෙනුමැනවැ'යි මාගේ වචනයෙන් මෙසේ කියන්න, මෙසේ කියා ඒ ධාතුගෙන සක්දෙව් රජුවෙත ගොස් 'මහරජ! ඔබඅත **දකුණු දළද, දකුණු අකුද** දෙක ඇත්තේය. එයින් ඔබ දකුණු දළදව පුදවු, දකුණු අකුදව මට දෙවු, 'මහරජ! කුමක්හෙයින් ඔබ අප හෙළදිවට යවා පමාවහුද'යි ඔහුට මෙසේත් කියව'යි වදළසේක. 'ස්වාමීනි! යහපතැ'යි සුමන සාමණේරතෙමේ මහතෙරුන්ගේ වචනය පිළිගෙණ එකෙණෙහිම පාසිවුරු ගෙන අහසටනැගී පැළලුප්නුවර දෙරබැස රජුවෙත ගොස් මේ කාරණය දන්වා සිටියේය. රජතුමා තුටුවූයේ හෙරණහු අතින්

පාත්‍රය ගෙන සුවඳින් උළා උතුම්මුතු සමානවූ ධාතූන්ගෙන් එය පුරවා දුන්නේය.

සාමණේරතෙමේ ඒ ධාතු ගෙන සක්දෙව් රජුවෙත ගියේය. සක්දෙව් රජු හෙරණහු දැක'ස්වාමීනි! සුමන! කුමක්නිසා ඇවිදින්නහුද'යි ඇසීය. 'මහරජ! ඔබ අප හෙළදිවට යවා පමාවහු කුමක් හෙයිනැ'යි හෙරණුන් විවාළකල්හි 'ස්වාමීනි! පමා නොවෙමි, කුමක් කරම්ද'යි කියතුමැනවැ'යි කීයේය. 'ඔබගේඅතෙහි දකුණුදළදව හා දකුණුඅකුදවයන දෙධාතු ඇත්තේය, එයින් ඔබ දකුණුදළදව පුදවු, දකුණුඅකුදවවනාහි මට දෙවු'යි කීයේය. 'ස්වාමීනි! යහපතැ' යි සක්දෙව් රජතෙමේ යොදුනක් පමණවූ මැණික්සෑය විවෘතකොට දකුණු අකුදව පිටතටගෙන සුමන සාමණේරයන්හට දුන්නේය. සාමණේරතෙමේ එය ගෙණ සැගිරියෙහිම තැබූයේය. ඉක්බිති මහා **මහින්ද** මහා ස්ථවිර ප්‍රමුඛවූ ඒ සියලු මහාශ්‍රේෂ්ඨයෝ අශොක දම්රජහු විසින් දෙනලද ධාතූන් සැගිරියෙහිම පිහිටුවා දකුණු අකුදව ගෙන **පසුබත** මහානාගවනයට වැඩියහ. රජතෙමේද සාමණේරයන් කියූපරිදි **පූජාසත්කාරකොට** මගුලැතුපිට නැගුනේ තෙමේම මගුලැතු මත සේසත් නගමින් මහා නාගවනයට පැමිණියේය.

ඉක්බිති රජහට 'මේ ධාතු සම්මාසම්බුදුරජානන්වහන්සේගේ වේනම් මේ සේසත එයට නැමී සිටීවා, මගුලැත්තෙමේ දණින් බිම සිට ගනීවා: දකරඩුව මා හිස පිහිටාවා'යි සිත්වූයේය. රජුගේ ඒ සිතීම සමගම සේසත නැමීගියේය. මගුලැත්තෙමේ දණින් බිම සිටගත්තේය. දකරඩුව රජුගේ හිසමත පිහිටියේය. රජතෙමේ අමෘතයෙන් අභිෂෙක කරනලද සිරුරු ඇතියෙකුමෙන් බලවත් ප්‍රීතිප්‍රමොද්‍යයෙන් යුක්තවූයේ 'ස්වාමීනි! ධාතුවට කුමක් කරමුද'යි විවාළේය. 'මහරජ! ඇත්කුඹෙහිම තබවු'යි කීහ. රජතෙමේ දකරඩුවගෙන ඇත්කුඹෙහි තැබූයේය. පිණාගිය ඇත්තෙමේ කුඤ්චනාද කෙළේය. මහමේ නැගුනේය. පොකුරුවැසි වට. දිය කෙළවරකොට මහත්වූ භූමිකම්පනයක් වූයේය. ප්‍රත්‍යන්තයෙහිද සම්මාසම්බුදුරජාණන්වහන්සේගේ ධාතු පිහිටාය'යි දෙවිමිනිස්සු ප්‍රමුදිතවූහ. මෙසේ දෙවිමිනිසුන්ට සෘද්ධ්‍යනුභාවශ්‍රියෙන් ප්‍රීතිය උපදවමින්:

'මහාවීරතෙමේ සිවුමසක්හුගේ කෙළවර පුණුපොහෝ දිනයෙහි දෙවිලොවින් මෙහි අවුත් ඇත්කුඹෙහි පිහිටියේය.'

ඉක්බිති ඒ ඇත්රජ තන්වැදරුම්වූ පසඟතුරු වයන්නන් විසින් පිරිවරනලද්දේ ඉතා මහත්වූ පූජාවෙන් සත්කාර කරනුලබන්නේ පැසුළුදිගට

මූණදී පසුබස්නේ නුවර පෙරදිග දොරතෙක් ගොස් පෙරදිගදොරින් නුවරට පිවිස සියලු නුවර වැස්සන්විසින් මහත්පුද පවත්වනකල්හි දකුණු දොරින් නික්ම ථූපාරාමයට පශ්චිමදිශාභාගයෙහි ඇති මහෙජවාස්තුවට ගොස් නැවත ථූපාරාමයට අභිමුඛව නැවතී සිටගත්තේය.

ඒ කාලයෙහි ථූපාරාමයෙහි කකුසන්ධාදීවූ තුන්බුදුවරයන්ගේ පරිභොගචෛත්‍යස්ථානය පිහිටියේවේ.

අතීතයෙහි මේ දිවයින **ඔජදීප** නම්වූයේය. රජතෙමේ අභය නම්ය. නුවර **අභයපුර** නම්ය. සෑගිරිපවුව දෙවිකුළුපවුවය. ථූපාරාමය **පටියාරාම** නම්වූයේය.

ඒ කාලයෙහි **කකුසන්ධ** භාග්‍යවතුන්වහන්සේ ලෝකයෙහි උපන්සේක. උන්වහන්සේගේ ශ්‍රාවක **මහාදේව** නම් මහා ස්ථවිරයන්වහන්සේ මහා **මහින්ද** මහා ස්ථවිරයන්වහන්සේ සෑගිරිපවුවෙහි පිහිටාගත්තාක්මෙන් භික්ෂූන් දහසක් සමග දෙවිකුළුපවුවෙහි පිහිටා ගත්සේක. ඒ කාලයෙහි ඔජදීපයෙහි සත්ත්වයෝ උණුරෝගයෙන් විපතට පැමිණෙත්. කකුසන්ධ භාග්‍යවතුන්වහන්සේ බුදුඇසින් ලොව බලා වදරණසේක් විපතටපත් ඒ සත්ත්වයන් දැක, වදළසේක. දැක, සතළිස්දහසක් භික්ෂූන්ගෙන් පිරිවරනලද්දහු මෙහි වැඩමකළහ. උන්වහන්සේගේ ආනුභාවයෙන් එකෙණෙහිම ඒ උණුරෝගය සන්සිඳී ගියේය. රෝගය සන්සිඳී ගියපසු භාග්‍යවතුන්වහන්සේ ධර්මදේශනා කළසේක. එහිදී සුවාසූදහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධයවූයේය. භාග්‍යවතුන්වහන්සේ මෙහි වැසියනට පුදන්නට ඩබරාව දී පෙරළා වැඩමකළහ. එය ඇතුළතබහා පටියාරාමයෙහි සෑයක් කළහ. මහාදෙව මහා ස්ථවිරයන්වහන්සේ දිවයින් වැසියන්ට අනුශාසනා කරමින් මෙහිම වැඩවිසූහ.

කොණාගමන භාග්‍යවතුන්වහන්සේගේ කාලයෙහි මේ දිවයින **වරදීප** නම් වූයේය. රජතෙමේ **සමිද්ධි** නම්ය. නුවර **වඩ්ඪමාන** නම්ය. පවුව **සුවණ්ණකූට** නම්ය.

ඒ කාලයෙහි වරදීපයෙහි නපුරු වැසි වැටුනේය. එයින්ම දුර්භික්ෂයක් දුශ්ශස්‍යයක් වූයේය. මෙහි සත්ත්වයෝ ඡාතක රොගයෙන් විපතට වැටෙත්. කොණාගමන භාග්‍යවතුන්වහන්සේ බුදුඇසින් ලොව බලාවදරනසේක් විපතට පත් ඒ සත්ත්වයන් දැක තිස්දහසක් භික්ෂූන්ගෙන් පිරිවරනලද්දහු මෙහි වැඩමකළහ. බුද්ධානුභාවයෙන් මෙඝය මැනවින් දියදහර මුදහැරියේය. දිවයින සුභික්ෂවිය. භාග්‍යවතුන්වහන්සේ ධර්මදේශනා කළසේක. එහිදී සුවාසූදහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධයවූයේය. භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්

දහසක් පිරිවරකොටැති මහාසුමන ස්ථවිරයන්වහන්සේ මෙහි නවතා කාබාන දී පෙරළා වැඩමකළහ. එය, ඇතුළත බහා සෑයක්කළහ.

කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේගේ කාලයෙහි මේ දිවයින **මණ්ඩදීප** නම්වූයේය. රජතෙමේ **ජයන්ත**නමය. නුවර **විශාල** නමය. පවුව **සුභකූට** නමය.

ඒ කාලයෙහි මණ්ඩදීපයෙහි මහා විවාදයක්වේ. බොහෝ සත්ත්වයෝ හටගත් කලහ විග්‍රහ ඇත්තාහු විපතට පැමිණෙත්. කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේ බුදුඇසින් ලොව බලා වදරනසේක් විපතට වැටෙන ඒ සත්ත්වයන් දුටුසේක. දැක, විසිදහසක් භික්ෂූන්ගෙන් පිරිවරනලද්දහු මෙහි වැඩමකොට විවාදය සන්සිඳුවා ධර්මදේශනා කළසේක. එහිදී සුවාසුදහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධයවූයේය. භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්දහසක් පිරිවරකොටඇති **සඛබන්ධ** මහා ස්ථවිරයන්වහන්සේ මෙහි නවතා දියසළුව දී පෙරළා වැඩමකළහ. එය, ඇතුළත බහා සෑයක් කළහ.

මෙසේ ථූපාරාමයෙහි පළමු තුන් බුදුවරුන්ගේ චෛත්‍ය පිහිටියේය. ඒ චෛත්‍ය ශාසනාත්තධිානයෙන් නැසුනේය. චෛත්‍යය පිහිටි තැන පමණක් ඉතිරිවේ. **'තෙන ච සමයෙන ථූපාරාමේ පුරිමිකානං කිණ්ණං සම්මා සම්බුද්ධානං පරිභොගචෙතියට්ඨානං හොති'** යනු එහෙයින් කියනලදී. චෛත්‍යයන් නැසීගියකල්හි ඒ මේ තැන 'කිසිවෙක් ඉදුල්, අසුචි, වල් කසළින් දූෂිත නොකෙරේවායි දෙවියන්ගේ ආනුභාවයෙන් කටුවෙන් ගැවසීගත් අතුඇති ගස්වලින් පිරිවරනලදුව සිටින්නේය.

ඉක්බිති මේ ඇතුට පෙරටු පෙරටුව ගොස් රාජපුරුෂයෝ සියලු ගස් සිදහැර බිම පිරිසිදුකොට එතැන අත්තලක්මෙන් කළහ. ඇත්රජ ගොස් එතැන ඉදිරියෙහි එයට පැසුළු දිග බෝරුක පිහිටන තැන සිටගත්තේය. අනතුරුව ඇතුගේ මස්තකයෙන් ධාතූන්වහන්සේ බස්වන්නට ඉදිරිපත්වූහ. එහෙත් ඇත්තෙමේ ධාතූන්වහන්සේ බස්වන්නට ඉඩනොදෙයි. රජු 'ස්වාමීනි! කුමක්හෙයින් ඇතු ධාතූන්වහන්සේ බස්වන්නට ඉඩනොදේද'යි මහා ස්ථවිරයන්වහන්සේගෙන් විචාළේය. 'මහරජ! නගාතබනලද්ද බස්වන්නට නොවටීය'යි වදළසේක.

ඒ කාලයෙහි අභය වැවෙහි දිය සිඳීගියේවේ. හාත්පස බිම පැලී සිටියාය. මැටිපිඬු පහසුවෙන් උදුරා ගතහැකිවිය. මහාජන තෙමේ එයින් වහවහා මැටිපිඬු ගෙනවුත් ඇත්කුඹ පමණ උසට වාස්තුවක් කෙළේය. එකෙණෙහිම සෑය ගොඩනැගීමට ගඩොල්කරන්නට පටන්ගත්හ. යම්තාක්

ගඩොල් ඉදිකොට නොනිමවෙත්ද ඒතාක් ඇත්රජ තෙමේ කිහිප දවසක් දහවල බෝධිවෘක්ෂ ස්ථානයෙහි ඇත්හලෙහි සිටියි. රාත්‍රියෙහි සෑය පිහිටන බිම වටපිට හැසිරෙයි. නැවත චෛත්‍යවාස්තුව ඉදිකරවා රජතෙමේ 'ස්වාමීනි! කෙබඳු සෑයක් කටයුතුද'යි මහතෙරුන් විචාළේය. 'මහරජ! වීගොඩක් වැනි සෑයක් කටයුතුය'යි මහතෙරුන් වදළකල්හි 'ස්වාමීනි! යහපතැ'යි රජතෙමේ මල්අසුනක් පමණවූ සෑයක් ගොඩනංවා ඇත්කුඹින් ධාතූන් බාගන්නට මහත්සත්කාර කරවූයේය. සියලු තුවරවැස්සෝද දනවුවැස්සෝද ධාතුපූජාව දකිනුපිණිස එහි රැස්වූහ. මහාජනයා එහි රැස්වූකල්හි සම්මාසම්බුදුරජානන්වහන්සේගේ ධාතූන්වහන්සේ ඇත්කුඹින් සත්තලක් පමණ අහසට පැනනැග යමාමහපෙළහර දක්වූහ. ඒ ඒ ධාතු ප්‍රදේශයන්ගෙන් සවණක්රැස් මුදුවූ දියදහරද ගිනිකඳුද පවතිත්. භාග්‍යවතුන්වහන්සේ විසින් සැවැත්නුවර ගණ්ඩම්බ වෘක්ෂමූලයෙහි දක්වනලද පෙළහරවැනිවූම පෙළහරක්වූයේය. ඒ පෙළහර වනාහි මහා **මහින්ද** මහා ස්ථවිරයන්වහන්සේගේ ආනුභාවයෙන් නොමවූයේය. බුද්ධානුභාවයෙන්ම වූයේය. භාග්‍යවතුන්වහන්සේ ධරමානසේක්ම 'මා පිරිනිවිකල්හි හෙළදිව අනුරාධපුරයෙහි දක්ෂිණ දිශාභාගයෙහි පළමු තුන්බුදුවරුන්ගේ පරිභොග චෛත්‍යස්ථානයෙහි මාගේ දකුණු අකුඳ පිහිටන දිනයෙහි යමාපෙළහරවේවා'යි ඉටුසේක.

'මෙසේ බුදුවරයෝ නොසිතිය හැක්කාහ. බුදුගුණ නොසිතිය හැක්කාහ. නොසිතිය හැකියන් කෙරෙහි පහත්වූවන්ගේ විපාකය නොසිතිය හැක්කේවේ.'

සම්මාසම්බුදුරජානන්වහන්සේ ධරමාන කාලයෙහිද මේ දිවයිනට තෙවරක් වැඩියසේක. පළමුකොට යක්ෂයන් දමනුපිණිස එකලාවම මෙහි වැඩමවා යකුන් දමනයකොට 'මා පිරිනිවිකල්හි මාගේ ශාසනය මේ දිවයිනෙහි පිහිටන්නේය'යි හෙළදිව ආරක්ෂා තබමින් තෙවරක් දිවයින හාත්පස හැසුරුණුසේක. දෙවන වර මයිල් බැනහුවූ නාරජුන් දමනය කිරීමපිණිස එකලාවම මෙහි වැඩමවා ඔවුන් දමනයකොට වැඩියසේක. තෙවනවර පන්සියයක් භික්ෂූන් පිරිවරකොට ඇතිසේක් මෙහි වැඩමකොට **මහාචෛත්‍යස්ථානයෙහිද ථූපාරාම චෛත්‍යස්ථානයෙහිද මහාබොධිප්‍රතිෂ්ඨිතස්ථානයෙහිද මුතියඩඟණ චෛත්‍යස්ථානයෙහිද දීඝවාපිචෛත්‍යස්ථානයෙහිද කල්‍යාණි චෛත්‍යස්ථානයෙහිද** නිරොධසමාපත්තියට සමවැද වැඩහුන්සේක. මේ උන්වහන්සේගේ සිවුවනවර ධාතුශරීරයෙන් වැඩීමය. මුන්වහන්සේගේ ධාතුශරීරයෙන්ද නිකුත් දියපොදින් මුළු හෙළදිවිතෙලෙහි නොපහළ කිසිත් අවකාශයක්නම් නොවූයේය.

මෙසේ භාග්‍යවතුන්වහන්සේගේ ඒ ධාතුශරීරය දිය පොදින් හෙළදිවිතෙලෙහි පරිදහය සන්සිඳුවා මහාජනයාහට පෙළහර දක්වා ඇත්කුඹින් බැස රජුගේ හිස මතුයෙහි පිහිටා ගත්තේය. රජු 'මිනිසත්බව ලැබීම ඵලසහිතය'යි සිතමින් මහත්සත්කාරකොට ධාතූන්වහන්සේ පිහිටුවාලූයේය. ධාතු පිහිටුවීම සමගම මහත් භූමි කම්පාවක්විය. ඒ ධාතු ප්‍රාතිහාර්‍යයෙහිද සිත් පහදගෙණ රජුගේ සොහොයුරුවූ **මත්තාභය** රජකුමරු දහසක් පුරුෂයන් සමග පැවිදිවූයේය. **වෙතාළි** ගමින් පන්සියයක් තරුණයෝ පැවිදිවුහ. එසේම **ඣාරමණ්ඩලාදී**වූ ගම්වලින් නික්ම අවුත් පන්සියයක් පන්සියයක් තරුණයෝ පැවිදිවූහ. ඇතුළුනුවරින් හා පිටතුවරින් පැවිදිවූ සියල්ලෝම තිස්දහසක් භික්ෂූහු වූහ. සෑය නිමිකල්හි රජතෙමේද රජුගේ සොහොයුරෝද දේවීහුද දෙවි, නා, යකුන්ට විස්මය කරවූ වෙන්වෙන්වූ පූජාවන් කළාහුය. ධාතුපූජා නිමිකල්හි උතුම් ධාතුව සෑයෙහි පිහිටි කල්හි මහාමහීන්ද්‍ර මහාස්ථවිරයන් වහන්සේ මහාමේඝ වනොද්‍යානයටම වැඩමකොට එහි වාසය කළසේක.

ඒකාලයෙහි **අනුලා** දෙවී තොමෝ පැවිදිවනු කැමැතිව එබව රජුට සැලකළාය. රජතෙමේ ඇයගේ වචනය අසා මහා **ස්ථවිරයන්වහන්සේට** 'ස්වාමීනි! අනුලා දෙවී තොමෝ පැවිදිවනු **කැමැත්තීය**. ඇය පැවිදිකරණු මැනව'යි දන්වා සිටියේය. 'මහරජ! මාගමුන් පැවිදිකිරීම අපට කැප නොවේ, පැළලුප් නුවර සඞ්ඝමිත්‍රා ස්ථවිරා නම්වූ මාගේ බුහුනක් ඇත, ඇය කැඳවා ගනිවු, මහරජ! මේ දිවයිනෙහිද පළමු තුන්සම්බුදුරජුන්ගේ බෝධීහු පිහිටා තුබුහ, අපගේද භාග්‍යවතුන්වහන්සේගේ ඔදවත් රැස්කළ විහිදුවන බෝධිය මෙහි පිහිටියයුතුය. එහෙයින් යම්සේ සඞ්ඝමිත්‍රා තොමෝ බෝධිය ගෙන මෙහි එන්නීද, එසේ හසුනක් යවහු'යි. රජ තෙමේ 'ස්වාමීනි! යහපතැ'යි මහතෙරුන්ගේ වචනය පිළිගෙන ඇමතියන් සමග සාකච්ඡාකොට තමාගේ බෑනනුවූ අරිට්ඨනම් ඇමතියාහට 'දරුව! පැළලුප් නුවරට ගොස් මහාබෝධිය සමග ආර්‍ය්‍ය සඞ්ඝමිත්‍රා ස්ථවිරින් මෙහි කැඳවාගෙන එන්නට හැකියෙහිද'යි විවාළේය. 'දෙවයන්වහන්සෙ! මට පැවිදිවන්නට අනුදත්තහුනම් හැකියෙමි'යි. 'දරුව! යව, ස්ථවිරාවන් මෙහි වැඩමවාගෙන අවුත් පැවිදිවෙව'යි.

අරිට්ඨතෙමේ රජුගේද මහාස්ථවිරයන්වහන්සේගේද හසුන් ගෙන මහතෙරුන්ගේ අධිෂ්ඨාන බලයෙන් එක් දවසින් දඹකොළපටුනට ගොස් නැව් නැගී මුහුද තරණයකොට පැළලුප් නුවරටම ගියේය. අනුලා දේවී තොමෝද පන්සියයක් කන්‍යාවන්ද පන්සියයක් ඇතුළුනුවර වැසි ස්ත්‍රීන්ද සමග දසසිල් සමාදන්ව කසාවත් හැඳ නුවර එක් පෙදෙසෙක

මෙහෙණවරක් කරවා වාසයකළාය. අරිට්ඨතෙමේද එදවසම ගොස් රජුගේ හසුන ඔප්පු කෙළේය. ඔප්පුකොට 'දෙවයන්වහන්ස! ඔබගේ පුත්‍රවූ මහා **මහීන්ද්‍ර** මහා ස්ථවිරයන්වහන්සේ ඔබවහන්සේගේ යහළුවූ දේවානම්පියතිස්ස රජුගේ සොහොයුරුගේ බිරිඳවූ අනුලාදේවී තොමෝ පැවිදිවනු කැමැත්තීය, ඇය පැවිදි කරන්නට ආර්‍ය්‍යා සඞ්ඝමිත්‍රා ස්ථවිරීන් එවනු මැනවි, ඒ ආර්‍ය්‍යාව සමගම මහාබෝධියත් එවනු'යි දන්වන්නට මට නියමකළසේකැයි මෙසේද කීයේය.

මහා ස්ථවිරයන්වහන්සේගේ හසුන මෙසේ සැලකොට සඞ්ඝමිත්‍රා ස්ථවිරීන් වෙතටගොස් 'ආර්‍ය්‍යාවෙනි! ඔබගේ බෑවූ මහාමහීන්ද්‍ර මහා ස්ථවිරයන්වහන්සේ මා ඔබවෙතට එවූහ, දේවානම්පියතිස්ස රජුගේ සොහොයුරුගේ බිරිඳවූ අනුලා දෙවිතොමෝ පන්සියයක් කන්‍යාවන් හා පන්සියයක් ඇතුළුපුර වැසි ස්ත්‍රීන්ද සමග පැවිදිවනු කැමැත්තීය, එහෙයින් එහි වැඩමකොට ඇය පැවිදිකරහු'යි කීයේය. සඞ්ඝමිත්‍රා ස්ථවිරිය 'එකෙණෙහිම ඉතා වහා පියරජු වෙතට ගොස් මෙසේ කීවාය: **'මහරජ! මාගේ බෑවූ මහාමහීන්ද්‍ර මහාස්ථවිරයන්වහන්සේ මෙසේ දන්වා තිබේ: 'දෙවානම්පියතිස්ස රජුගේ සොහොයුරුගේ බිරිඳවූ අනුලා දේවියතොමෝ පන්සියයක් කන්‍යාවන් හා පන්සියයක් ඇතුළුපුරවැසි ස්ත්‍රීන් සමග පැවිදිවනු කැමැත්තීය, මාගේ ඊම බලාපොරොත්තු වෙති, මහරජ! එහෙයින් මම හෙළදිවට යමි'යි දන්වා සිටියාය.**

රජතෙමේ 'දියනියනි! මාගේ පුත් මිහිඳුතෙරද, මුණුබුරුවූ සුමනහෙරණද, මා සිදහළ අත්ඇතියෙකුමෙන් කරමින් හෙළදිවට ගියහ, ඔවුන් නොදක්නාවූ ඒ මට උපන් ශෝකය ඔබගේ මූණ බලත් සන්සිඳී යන්නේය, එහෙයින් දුව! කමිනැත, නොයනු මැනවැ'යි කීයේය. 'මහරජ! මාගේ සොහොයුරුගේ වචනය මට බරය, අනුලා ක්ෂත්‍රියාතොමෝද දහසක් ස්ත්‍රීන්ගෙන් පිරිවරණලද්දී පැවිද්දපිණිස උපන් ආශාව පෙරටුකොට ඇත්තී මා එනු බලාපොරොත්තුවේ, මහරජ! එහෙයින් මම එහි යමි'යි සඞ්ඝමිත්‍රා තොමෝ කියාසිටියාය. 'එසේ නම් දුව! මහා බෝධියත් ගෙනයව'යි කීයේය. රජුට මහාබෝධිය කොතනින්ද යත්:- ධාතූන් ගෙනයෑමපිණිස සුමන හෙරණුන් නොපැමිණිකල්හි එයට පෙරම ලක්දිවට බෝධිය යවනුකැමතිවූ රජතෙමේ ආයුධයකින් සිදීමට නොසුදුසුවූ මහා බොධිය කෙසේ යවන්නෙමිද'යි උපායක් නොදක්නේ මහාදෙවනම් ඇමතියාගෙන් එය විචාළේය. 'දෙවයන්වහන්ස! පණ්ඩිත භික්ෂූහු බොහෝ ඇත්තාහ'යි හෙතෙමේ කීයේය. රජ තෙමේ ඇමතිහුගේ ඒ වචනය අසා භික්ෂුසඞ්ඝයාහට බත් පිළියෙලකොට වළඳවා බත්කිස අවසන්හි 'ස්වාමීනි! භාග්‍යවතුන්වහන්සේගේ බෝධිය ලක්දිවට යායුතුද, නොයායුතුද'යි සඞ්ඝයා

විවාළේය. සඬ්ඝයාවහන්සේ එයට පිළිතුරුදීම මොග්ගලීපුත්තතිස්ස මහා ස්ථවිරයන්වහන්සේට භාරකෙළේය. උන්වහන්සේ 'මහරජ! මහා බෝධිය ලක්දිවට යායුතුය'යි වදරා භාග්‍යවතුන්වහන්සේගේ මහා අධිෂ්ඨානපස රජුට කීහ. කවර අධිෂ්ඨාන පසක්ද යත්:

භාග්‍යවතුන්වහන්සේ වනාහි මහාපරිනිර්වාණ මඤ්චකයෙහි වැදහොත්සේක් 'ලක්දිව මහාබෝධිය පිහිටවනුපිණිස අශෝක මහාරජතෙමේ මහාබොධිය ගනුපිණිස යන්නේය, එකල්හි මහාබෝධියෙහි දක්ෂිණශාඛාව තොමෝම සිදී රත්කටාහයෙහි පිහිටාවා'යි ඉටුසේක. මේ එක් අධිෂ්ඨානයකි.

'මහාබොධි දක්ෂිණශාඛාව එහි පිහිටනකල්හිද මහාබෝධිය හිමිවලාගැබට පිවිස සිටිවා'යි ඉටුසේක. මේ දෙවන අධිෂ්ඨානයයි.

'සත්වන දවසෙහි හිමවලාගැබින් බැස රත්කටාහයෙහි පිහිටනුයේ පත්වලින්ද පලවලින්ද සවණක් රැස් මුදවා'යි ඉටුසේක. මේ තෙවන අධිෂ්ඨානයයි.

'ථූපාරාමයෙහි දකුණුඅකුර්ව සැයෙහි පිහිටන දවසෙහි යමා පෙළහර කෙරේවා'යි ඉටුසේක. මේ සිවුවන අධිෂ්ඨානයයි.

'ලක්දිවම මගධනැළියෙන් සොළොස් නැළියක් පමණවූ මාගේ ධාතූහු මහාසැයෙහි පිහිටන කල්හි බුදුවෙස් ගෙන අහසට පැනනැඟී යමාපෙළහර කෙරෙත්වා'යි ඉටුසේක. මේ පස්වන අධිෂ්ඨානයයි.

රජතෙමේ මේ පඤ්ච මහාඅධිෂ්ඨානයන් අසා පහන් සිත්ඇත්තේ පැළලුප් නුවර සිට මහාබෝමැඩ තෙක්ම පිළිදැගුම් කරව. රන්කටාහය කරනුපිණිස බොහෝ රන් බැහැරකරවූයේය. එකෙණෙහිම රජුගේ අදහස් දන විස්කම් දෙවිපුත්තෙමේ කඹුරුවෙසක් ගෙන රජුගේ ඉදිරියෙහි පෙනීසිටියේය. රජතෙමේ ඔහු දක 'දරුව! මේ රන් ගෙන කටාහයක් කරව'යි කීයේය. 'දෙවයන්වහන්ස! පමණ දනිහු'යි කීකල්හි 'ඔබම දරුව! එය දන කරව'යි රජතෙමේ කීයේය. 'දෙවයන්වහන්ස! යහපති, කරන්නෙමි'යි රන් ගෙන තමන්ගේ ආනුභාවයෙන් ඒ රන් අතින් පිරිමැද නවරියන් වටඇති පස්රියන්උස ඇති තුන්රියන් පුළුලැති අටගුලක් ඝනවූ ඇත්සොඩක් පමණ මුවවිට ඇති රන්කටාහයක් මැවූයේය.

ඉක්බිති රජතෙමේ සත්යොදුනක් දික්වූ තුන්යොදුනක් පළල්වූ මහත්වූ සෙනාව සමග පැළලුප් නුවරින් නික්ම ආයෂ්මඩියා කැඳවා ගෙණ මහාබෝධිය සමීපයට ගියේය. සේනාව එසවූ ධ්වජපතාකා ඇති

නන්රුවනින් විසිතුරුවූ නානාලඬකාරයෙන් සැරසූ නන්වැදරුම් මලින් ගැවසීගත් නොයෙක් පසඟතුරුරුවින් ගුම්ගත් මහා බෝධිය වටකොට සිටියහ. රජතෙමේ දහසක් පමණ ගණපාමොක් මහතෙරුන් ගෙන සියලු දඹදිව අභිෂෙක ලත් රජුන් දහසක්ලවා තමන්ද මහා බෝධියද පිරිවරවා මහබෝමුලසිට මහා බෝධිය දෙස හිස ඔසොවා බැලූයේය. ඒ වේලෙහි මහා බෝධියෙහි කඳද, දක්ෂිණ මහා ශාඛාවෙහි සිවුරියන් පමණ පෙදෙසද තබා ඉතිරිකොට, සෙසුකොටස් නොපෙනී ගියේය. රජතෙමේ ඒ පෙළහර දැක හටගත් ප්‍රීතිප්‍රමොදය ඇත්තේ 'ස්වාමීනි! මම මේ පෙළහර දැක තුටුවූයෙම් මහාබෝධිය සියලු දඹදිව් රජයෙන් පුදම්'යි භික්ෂුසඬසයාහට දන්වා අභිෂෙකය දුන්නේය.

ඉක්බිති සුවඳමල් ආදියෙන් පුද තෙවරක් පැදකුණුකොට අට තැනක වැඳවැටී නැගීසිට ඇදිලිබැඳගෙනු සත්‍යවචන ක්‍රියාවෙන් බෝධිය ගනු කැමැත්තේ බිම සිට බෝධියෙහි දක්ෂිණ ශාඛාවතෙක් උස්කොට තැබූ සියලු රුවනින් කළ පුටුව මතුවෙහි රන්කටාහය තබවා රුවන් පුටුවට නැගී රන්තෙල්ල ගෙන රන්සිරියලින් රේඛාවක්කොට 'ඉදින් මහා බෝධියය ලක්දිව පිහිටියයුතුනම් ඉදින් මමද බුදුසසුනෙහි විමති නැත්තෙක් වන්නෙම් නම් මහා බෝධිය තෙමේම මේ රන්කටාහයෙහි පිහිටාවා'යි සත්‍යක්‍රියා කෙළේය. සත්‍යක්‍රියාව සමග බෝධිශාඛා තොමෝ රන්සිරියලින් පිරිසිදි තැනින් සිදී සුවඳ මඩින් පිරූ රන්කටාහ මතුවෙහි සිටියාය. ඒ ශාඛාවෙහි කඳ උසින් දසරියන් ඇත්තේවේ. සිවුරියන් සිවුරියන් දිගැති පස්මහා ශාඛාවෝ පස්ඵලයකින්ම යුක්තවූහ. කුඩා අතු දහසෙකි. නැවත රජතෙමේ මුල් රෙඛාවෙන් මතුවෙහි තුන්අඟුල් පෙදෙසෙහි අන්‍යවූ රේඛාවක් පිරිසින්දේය. ඉක්බිති එකෙණෙහි එතැනින් බුබුලුව මහමුල් දසයක් නික්මුනේය. නැවත මතුමතුවෙහි තුන්තුන් අඟුලක් පාසා අන්‍යවූ රේඛා නවයක් පිරිසින්දේය. ඒ රේඛාවන්ගෙන්ද බුබුලුව දසයක් දසයක් බැගින් මුල් අනුවක් නික්මුනේය. පළමු දස මහා මූලයෝ සතුරඟුල් පමණට නික්මුනාහුය. අන් මුල් දැල්කවුළු වැනිව එකට බැඳී නික්මුනේය.

රජතෙමේ රුවන්පුටුව මතුවෙහි සිටියේම මෙතෙක් පෙළහර දැක ඇදිලිබැඳගෙණ මහානාද කෙළේය. නොයෙක් දහස්ගණන් භික්ෂූහු සාධුකාර දුන්හ. සියලු රාජසෙනා තොමෝ උස්වූ ශබ්ද ඇත්තීවූය. පිළිහිස සිසැරුම් සියදහස් ගණන් පැවැත්තේය. බුමාටු දෙවියන් ආදිකොට ඇති යම්තාක් බ්‍රහ්මකායික දෙවියෝ වෙත්ද ඒ හැමදෙන සාධුකාර පැවැත්වූහ. ප්‍රීතියෙන් නිරතුරුව පැතිරගිය සිරුරු ඇතිව ඇදිලිබැඳ

සිටිරජු මේ පෙළහර බලාසිටියදීම මහාබෝධිය මුල්සියයකින් යුක්තව රන්කටාහයෙහි පිහිටියේය. දසමහා මූලයෝ රන්කටාහයෙහි යටතලය හැපී සිටියහ. සෙසු අනුවක්මුල් පිළිවෙළින් වැඩෙන්නෝව සුවඳ මඩෙහි බැස සිටියෝය. මෙසේ මහාබෝධිය රන්කටාහයෙහි පිහිටි ඇසිල්ලෙහි මහපොළොව සැලුනීය. අහසෙහි මෙඝයෝ ගිගුරුහ. පෘථිවි කම්පනයෙන් ඔබමොබ බමන්නාවූ පර්වතයන්ගේ නෘත්‍යයෙන්ද, දෙවියන්ගේ සාධුනාදයෙන්ද, යක්ෂයන්ගේ හිඬකාරයෙන්ද, අසුරයන්ගේ ස්තුති වචනයෙන්ද, බ්‍රහ්මයන්ගේ අත්පොළසින්ද, මේඝයන්ගේ ගර්ජනාවෙන්ද, සිවුපාවුන්ගේ රාවයෙන්ද, පක්ෂීන්ගේ නාදයෙන්ද, සියළු පසහතුරු වයන්නන්ගේ තමතමන් පිළිබඳ දස්කම් දක්වීමෙන් ද පොළොතලපටන් බ්‍රහ්මලෝකය තෙක් එක් ම කෝලාහලයක් එක්ම නින්නාදයෙක් වූයේය. ශාඛා පසෙහි ඵලයෙන් ඵලයෙන් සවණක්රැස් නික්ම මුළු සක්වල රුවන් ගොනැස්සෙන් ගැවසුනක්මෙන් කරමින් බඹලොවතෙක් උස්ව නැංගේය. එකෙණෙහි පටන් සත්දවසක් මහාබෝධිය හිමවලාගැබට පිවිස සිටියේය.

එසේ සිටි බෝධිය කිසිවෙක් නොදකියි. රජතෙමේ රුවන්පුටුවෙන් බැස සත්දවසක් බෝධිපූජාව කරවූයේය. සත්වනදවසෙහි සියලුදිශාවන්ගෙන් හිමද රැස්ද කරකැවී පැදකුණුකොට මහාබෝධියටම ඇතුල්වූහ. පහවූ හිමවලා ඇති සක්වළ ගැබ වෙසෙසින් පහන්වූකල්හි මහා බෝධිය පරිපූර්ණ ස්කන්ධශාඛා ප්‍රශාඛා ඇත්තේද පස්ඵලයෙන් යුක්තවූයේ රන්කටාහයෙහි පිහිටියේම පෙනීගියේය. රජතෙමේ මහා බෝධිය දැක ඒ පෙළහරින් හටගත් ප්‍රීතිප්‍රමෝදය ඇත්තේ සියලු දඹදිවිරජයෙන් තරුණ මහා බෝධිය පුදන්නෙමි'යි අභිෂේකය දී. සත්දවසක් මුළුල්ලෙහි මහා බෝධිය පිහිටිතැනම සිටියේය.

මහා බෝධිය වප්මස පෙරපස පුණුපොහෝ දිනයෙහි සවස් කාලයෙහි පළමුකොට රන්කටාහයෙහි පිහිටියේය. අනතුරුව හිමගැබ රැඳීසිටි සත්දවසද අභිෂේක සප්තාහයද ඉක්මවා කෘෂ්ණපක්ෂය පිළිබඳවූ පොහොය දිනයෙහි රජතෙමේ එක් දවසින්ම පැළලුප් තුවරට පිවිස වප්මස පෙරපස පෑළවිය දවසෙහි මහාබෝධිය පැදුම් දක්හිවූ මහසල්මුල තැබූයේය. රන්කටාහයෙහි පිහිටි දිනයෙන් සත්වෙනිදින දිනයෙහි මහා බෝධියෙහි අභිනව අඬකුර පහළවූවාහුය. ඒ අඬකුර දැකද පහන්වූ රජතෙමේ නැවත මහා බෝධිය රාජ්‍යයෙන් පුදනුයේ සියලු දඹදිව අභිෂේකය දුන්නේය. එකල්හි සුමන සාමණේරතෙමේ කාර්තික පෞර්ණමී දිනයෙහි ධාතු ගැනීමපිණිස ගියේ මහා බෝධිය පිළිබඳ කාර්තිකොත්සව

පූජාව දුටුයේය. මෙසේ මහබෝමැඩින් ගෙනවුත් පැළලුප්තුවර තබනලද මහා බෝධිය සඳහා 'එසේනම් මැනියෙනි! මහා බෝධිය ගෙන යව'යි කීයේය. ඕතොමෝ 'යහපතැ'යි පිළිගත්තීය.

රජතෙමේ මහා බෝධිය රැකීමපිණිස දෙවතාකුල අටළොසක්ද, අමාත්‍යකුල අටක්ද, බ්‍රාහ්මණකුල අටක්ද, කුටුම්බිකකුල අටක්ද, ගොපකකුල අටක්ද, තරවඡකුල අටක්ද, කාලිඞ්ගකුල අටක්ද මහාබෝධියට දිය ඉසිනුපිණිස රන්කළ අටක්ද, රිදීකළ අටක්ද දී මේ පිරිවරින් යුක්තව මහාබෝධිය නැවට නංවා තෙමේද නුවරින් නික්ම **විහාරනය** ඉක්මවා පිළිවෙළින් සත්දිනකින් තාමලිප්තියට පැමිණියේය. අතරමගදී දෙව, නාග, මනුෂ්‍යයෝ මහත්වූ බෝධිපූජාවන් කළහ. රජතෙමේද මුහුදුතෙර සත්දවසක් බෝධිය තබා මුළු දඹදිව මහා රාජ්‍යය දුන්නේය. මේවනාහි මොහුගේ තෙවන ජම්බුද්වීපරාජ්‍යය දීමවේ.

මෙසේ මහා රාජ්‍යයෙන් පුදු ඉල්මස පෙරපස පළමු පැළවිය දවසෙහි අශොක ධර්මාජරජු මහා බෝධිය ඔසොවාගෙන ගෙලපමණ දියටබැස නැවෙහි පිහිටුවා පිරිවර සහිතවූ සඞ්ඝමිත්‍රා ස්ථවිරින්ද නැවට නංවා අරිටඨ ඇමතිහට 'පුත! මම මහා බෝධිය තෙවරක් මුළු දඹදිව රාජ්‍යයෙන් පුදු ගෙල පමණ දියට බැස මාගේ යහළුහට යැවීමි, හෙතෙමේද මෙපරිද්දෙන්ම මහා බොධිය පුදවා'යි දන්වා සිටියේය. මෙසේ යහළුහට හසුන්දී 'අහෝ! ඒකාන්තයෙන් දශබලධාරීහුගේ මහා බෝධිවෘක්ෂය ඔදවත් රැස්දල් විහිදුවමින් වඩිය'යි වැඳගෙන ඇදිලිබැඳ කඳුලු හෙලමින් මුහුදුතෙර සිටියේය. මහා බෝධිය වඩා නැගූ ඒ නැව රජු බලබලා ඉන්දදීම මහමුහුදු තලයට පැමිණුනීය. මහමුහුදෙහිද භාත්පස යොදුනක්පමණ පෙදෙසෙහි රළ සන්සිඳී ගියේය. පස්පැහැති පියුම් පිපිගියේය. අහසෙහි දිව්‍යතූර්‍යනාද වාදනයවූහ. අහසෙහි දිය, ගොඩ, ගස්කොළන් ඇ ඇසුරුකොටසිටි දෙවියන් විසින් පවත්වනලද අතිමහත් පූජාවූයේය. සඞ්ඝමිත්‍රා ස්ථවිරිතොමෝද ගුරුළු වෙස්ගෙන මහා මුහුදෙහි නාකුලයන් තැතිගැන්නුය. තදින් තැතිගත් සැහැවි ඇති ඒ නාගයෝ අවුත් ඒ ආශ්චර්‍යය දැක ස්ථවිරීන් අයැද මහා බෝධිය නාගභවනයට ගෙනගොස් සත්දවසක් නාරජයෙන් පුදු නැවත නැවෙහි පිහිටුවාලූහ. එ දවසම නැව දඹකොළ පටුනට ලහාවූය. අශොක මහරජතෙමේද මහා බෝධි වියොගදුඃඛයෙන් හටගත් දුක්ඇත්තේ හඬාවැලප ඇසට නොපෙනෙනතුරු බලාසිට පෙරළා යන්නට හැරුනේය.

දේවානම්පියතිස්ස මහරජතෙමේද සුමන සාමණේරයන්ගේ වචනයෙන් ඉල්මස පළමු පැළවිය දිනපටන් අනුරාධපුරයෙහි උතුරුදෙරසිට

දඹකොළ පටුනතෙක් මග පිරිසිදුකරවා සරසවා තුවරින් නික්මෙන දවසෙහි උතුරුදෙර සමීපයෙහි සමුද්‍රශාලාවාස්තුවෙහි නැවතීසිටියේම ඒ මහත් විහිතියෙන් මහමුහුදෙහි එන්නාවූම මහාබෝධිය තෙරුන්ගේ ආනුභාවයෙන් දැක තුටුපිත් ඇත්තේ නික්මගොස් සියලුමග පස්පැහැති මලින් අතුරුවමින් මගපෙදෙස අතරින්අතර මල්ඇගැ තබමින් එක්දවසින්ම දඹකොළ පටුනට පැමිණ සියලු තූර්‍යභාණ්ඩ වයන්නන්ගෙන් පිරිවැරුනේ සුවඳමල් සුවඳදුම් ආදියෙන් පුදමින් ගෙලපමණ දියට බැස 'අනේ! එකතින් බුදුරජාණන්වහන්සේගේ ඔදවත් රැස්දල් විහිදුවන මහාබෝධිවෘක්ෂය පැමිණියේය'යි පහන්සිත් ඇත්තේ මහා බෝදිය ඔසොවා උත්තමාඩගයවූ හිසෙහි පිහිටුවාගෙන මහා බෝධිය පිරිවරා පැමිණි ජාතිමත් සොළොස් කුලයන් සමග මුහුදෙන් ගොඩනැගී මුහුදු වෙරළෙහි මහා බෝධිය තබා තුන්දවසක් මුළු ලක්දිව රාජ්‍යයෙන් පිදූයේය. ජාතිමත් සොළොස් කුලවලට රාජ්‍යය පිළිබඳ කටයුතු විචාරීම භාරකෙළේය.

නැවත සිවුවන දිනයෙහි මහා බෝධිය රැගෙන මහත් පූජාවන් කරමින් පිළිවෙළින් අනුරාධපුරයට පැමිණියේය. අනුරාධපුරයෙහිදීද මහත් සත්කාරකොට තුදුස්වක්හිම පස්වරුයෙහි මහා බෝධිය උතුරුදෙරින් ඇතුල්කරවා තුවරමැදින්ගෙන යනුයේ දකුණුදෙරින් නික්ම දකුණුදෙරින් දුනු පන්සියයක් ගියතැන අපගේ සම්මාසම්බුදු රජානන්වහන්සේ යම්තැනක නිරෝධසමාපත්තියට සමවැද වැඩහුන්සේක්ද පෙරවූ සම්මාසම්බුදුරජානන්වහන්සේලා තුන්නම සමාපත්තියට සමවැද වැඩහුන්සේක්ද, කකුසඳ භාග්‍යවතුන්වහන්සේගේ **මහරි බෝධිය,** කෝණාගමන භාග්‍යවතුන්වහන්සේගේ **උදුම්බර බෝධිය,** කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේගේ **නිග්‍රොධ බෝධිය** යම් තැනක පිහිටියාහුද, එහි මහාමෙඝ වනොද්‍යානයට තිලකයක්වූ සුමන සාමණේරයන්ගේ වචනයෙන් පළමුකොටම කළ බිම පිරියම්ඇති රජළුයනෙහි දෙරකොටු පිහිටි තැන මහාබෝධිය පිහිටුවාලූයේය. කෙසේදයත්:

බෝධිය පිරිවරා මෙහි පැමිණි ඒ ජාතිමත් සොළොස් කුලපිරිස රජ වෙස් ගත්හ. රජතෙමේ දෙරටුපල් වෙස් ගත්තේය. සොළොස් කුලයෝ මහාබෝධිය ගෙන බැස්සූහ. මහා බෝධිය ඔවුන්අතින් මිදීමට අනතුරුවම අසුරියනක් පමණ අහසට නැගී සවණක්රැස් විදූයේය. රශ්මීහු සියලු දිවයින පැතිර මත්තෙහි බඹලොව හැපී සිටගත්හ. මහබෝ පෙළහර දැක හටගත් පැහැදීම් ඇති දසදහසක් පුරුෂයෝ අනුපුබ්බිදේශීනාව පටන්ගෙන එළවා රහත්බවට පැමිණ පැවිදිවූහ.

හිරු බැසයනතුරු මහා බෝධිය අහසෙහි රැඳී සිටියේද හිරු බැසගියකල්හි රෙහෙණ නැකතින් පොළොවෙහි පිහිටියේය. බෝධිය පොළොවෙහි පිහිටීම සමගම දිය කෙළවරකොට මහපොළොව කම්පිතවිය. පොළොවෙහි පිහිටාද මහාබෝධිය සත්දවසක් හිමගැබ තුළ සිටියේය. ලෝවැසියනට නොපෙනීගියේය. සත්වන දවසෙහි අහස පහවූ වලා ඇත්තේවිය. ෂඩ්වර්ණ රශ්මීහු දිලිසෙමින් හැමතැන පැතිරෙමින් විසිරිගියහ. මහාබෝධියෙහි කඳද අතුද ඒ පස්ඵලද පෙනීගියේය. **මහාමහින්ද** මහාස්ථවිරයන්වහන්සේද සඞ්ඝමිත්‍රාස්ථවිරීන්ද රජතුමාද පිරිවර සහිතවූවාහු මහාබෝධිය පිහිටිතැනට ගියහ. සියලු දිවයින්වැස්සෝද බොහෝ සෙයින් රැස්වූහ. ඔවුන් බලාසිටියදීම උතුරුදිගශාඛාවෙන් එක් ඵලයක් පැසී ශාඛාවෙන් ගිලිහීගියේය. මහාස්ථවිරයන්වහන්සේ එයට අත එළවූහ. ඵලය මහතෙරුන්ගේ අතෙහි පිහිටියේය. මහාස්ථවිරයන්වහන්සේ ඒ ඵලය 'මහරජ! මෙය රෝපණයකරව'යි රජුට දුන්හ. රජතෙමේ එය පිළිගෙන රන්කටාහයෙහි මිහිරිපස් වගුරුවා සුවඳමඩ පුරවා රෝපණයකොට මහා බෝධියට පෙරපස මහගල් අසුන තුබූතැන තැබූයේය. සියල්ලන් බලාසිටියදීම සිවුරියන් පමණවූ තරුණ බෝරුක් අටක් එයින් නැඟුනේය. රජතෙමේ ඒ ආශ්චර්‍යය දැක තරුණ බෝරුක් අට සේසතින් පුද අභිෂෙකය දුන්නේය. එයින් එක් බෝරුකක් මහාබෝධිය මෙහි ගෙනඇා කාලයෙහි පළමු පිහිටි අවකාශයවූ දඹකොළ පටුනෙහි රෝපණයකළහ. එකක් **තිවක්ක** බ්‍රාහ්මණයාගේ ගම්දෙරද එකක් **ථූපාරාමයෙහිද** එකක් **ඉසුරුමුනි** විහාරයෙහිද එකක් පළමු සෑ පිහිටි තැනද එකක් සෑපවිවෙහිද එකක් රුහුණු දනවිවෙහි කතරගමද එකක් රුහුණු දනවිවෙහිමවූ සදුන්ගමෙහිද රෝපණය කළහ.

අනික් සිවුඵලයන්ගේ බිජුවටින් උපන් දෙතිස් තරුණ බෝපැල යොදුනෙක්හි යොදුනෙක්හි කරණලද ආරාමයන්හි පිහිටවූහ. මෙසේ අනුරාධපුරයට හාත්පස ලක්දිවි වැස්සන්ගේ දරුමුණුබුරු පරපුරට හිතපිණිස සැපපිණිස මහා බෝධිය පිහිටිකල්හි අනුලාදේවිය පන්සියයක් කන්‍යාවන්ද, පන්සියයක් ඇතුළුපුර වැසි ස්ත්‍රීන්ද'යි දහසක් මාගමුන් සමග සඞ්ඝමිත්‍රාස්ථවිරාවන්ගේ සමීපයෙහි පැවිදිව නොබෝ කලකින්ම පිරිවර සහිතව රහත්බැවිහි පිහිටා ගත්තීය. රජුගේ බෑනනුවූ අරිට්ඨ තෙමේද පන්සියයක් පුරුෂයන් සමග මහතෙරුන්ගේ සමීපයෙහි පැවිදිව නොබෝ කලකින්ම රහත්බැවිහි පිහිටාගත්තේය.

නැවත රජතෙමේ එක් දවසක් මහා බෝධිය වැඳ මහා ස්ථවිරයන්වහන්සේ සමග ථූපාරාමයට යන්නේය.

ලෝවාමහාප්‍රාසාදස්ථානයට පැමිණි ඔහුට මිනිස්සු මල් එළවූහ. රජතෙමේ ඒ මල් මහාස්ථවිරයන්වහන්සේට පිළිගැන්වීය. උන්වහන්සේ මල්වලින් ලෝහප්‍රාසාදස්ථානය පිදූහ. ඒ මල් බිමට වැටුනු ඇසිල්ලෙහි මහා භූමිකම්පාවක්වූය. එකල්හි රජතෙමේ 'ස්වාමීනි! කුමක් හෙයින් පොළොව සැලුනීද'යි විචාළේය. 'මහරජ! අනාගතයෙහි මේ අවකාශයෙහි සඞ්ඝයාගේ උපොසථාගාරය වන්නේය, මේ එයට පෙරනිමිත්තැ'යි වදළසේක. නැවත රජතෙමේ මහතෙරුන් සමග යනුයේ අඹඩඟණසථානයට පැමිණියේය. එහිදී රජුට පැහැයෙන් හා සුවඳින්යුත් ඉතා මිහිරි රසඇති එක් අඹපලයක් එළවන ලද්දේය. රජතෙමේ එය වැළඳීමපිණිස මහතෙරුන්ට පිදූයේය. උන්වහන්සේ එය එහිදීම වළඳ 'මෙය මෙහිම රෝපණය කරව'යි වදළාහුය. රජතෙමේ ඒ අඹඇටය ගෙන එහිම රෝපණය කරවා දියවත් කෙළේය. අඹ බිජුවටය රෝපණයකිරීම සමගම පොළොව කම්පිතවූය රජ තෙමේ 'ස්වාමීනි! කුමක් හෙයින් පොළොව කම්පිතවූද'යි විචාළේය. 'මහරජ! අනාගතයෙහි මේ අවකාශයෙහි සඞ්ඝයාගේ අඹඩඟණනම් සන්නිපාතස්ථානය වන්නේය, මෙය එයට පෙරනිමිත්තැ'යි වදළසේක. රජතෙමේ එහි මල්දම්මිටක් විසුරුවා වැද නැවත මහතෙරුන් සමග යනුයේ මහසෑය පිහිටන තැනට පැමිණියේය. එහිදී රජුට සපුමල් ගෙනවුත් එළවූහ. රජතෙමේ ඒ මල් මහතෙරුන්ට පිදුයේය. උන්වහන්සේ මහසෑය පිහිටන තැන මල්වලින් පුදා වැන්දහ. එකෙණෙහිම මහා පොළොව කම්පිතවූය. රජතෙමේ ස්වාමීනි, කුමක් හෙයින් පොළොව කම්පිතවූද'යි විචාළේය. උන්වහන්සේ 'මහරජ! අනාගතයෙහි මේ අවකාශයෙහි භාග්‍යවත් බුදුරජානන්වහන්සේගේ අසදෘශ මහා ස්තූපය වන්නේය, මෙය එයට පෙරනිමිත්තැ'යි වදළසේක.

ඉක්බිති රජතෙමේ 'ස්වාමීනි! ඒ මහා ස්තූපය මමම කරමි'යි කීයේය. රජු එසේ කීකල්හි 'මහරජ! කම් නැත, ඔබට අන්‍යවූ බොහෝ වැඩ ඇත, අනාගතයෙහි ඔබගේ මුණුබුරුවූ දුටුගැමුණු අභය රජතෙම් එය කරවන්නේය'යි වදළසේක. එකල්හි රජතෙමේ 'ස්වාමීනි! ඉදින් මාගේ මුණුබුරෙක් එය කරන්නේනම් මාවිසින් කරන ලද්දේමය.'යි දෙළොස් රියන් පමණවූ ගල්ටැඹක් ගෙන්වා 'දෙවන පැතිස් රජුගේ මුණුබුරුවූ දුටුගැමුණු අභයතෙමේ මේ පෙදෙසෙහි මහා ස්තූපය කෙරේවා'යි අකුරුලියවා එහි පිහිටුවා මහතෙරුන් වැද 'ස්වාමීනි! හෙළදිව බුදුසසුන පිහිටියේද'යි ඇසුයේය. 'මහරජ! බුදුසසුන පිහිටියේය, එහෙත් මෙතෙක් එහි මුල්වනාහි මෙහි නොබැසගති'යි වදළකල්හි 'ස්වාමීනි! කවද එහි මුල් මෙහි බැසගත්තේනම් වේද'යිඇසීය. 'මහරජ! යම්දවසක හෙළදිව උපන් මවුපියන්ගේ හෙළදිව

උපන් දරුවෙක් හෙළදිවඳීම පැවිදිව හෙළදිවඳීම විනය උගෙන හෙළදිවෙහිඳ අන්හට කියවන්නේද එකල්හි සඳුනෙහි මුල්බැසගත්තේවේ'යි වදළසේක. 'ස්වාමීනි! එබඳු භික්ෂු නමක් ඇත්තේද, 'ඇත මහරජ! මහාඅරිට්ඨ භික්ෂුතෙමේ මේ ක්‍රියාවෙහි ප්‍රතිබලය'යි වදළසේක. එකල්හි රජතෙමේ 'ස්වාමීනි! මෙහිදී මාවිසින් කුමක් කටයුතුද'යි විචාළේය. 'මහරජ! මණ්ඩපයක් කිරීමවටිය'යි කීහ. 'ස්වාමීනි! යහපතැ'යි රජතෙමේ මෙඝවණ්ණාභය රජුගේ ඇමතියාගේ පරිවෙණස්ථානයෙහි මහාසඞ්ගීතිකාලයෙහි අජාසත් මහරජු විසින් කළ මණ්ඩපයෙහි ආකාර ඇති මණ්ඩපයක් රාජානුභාවයෙන් කරවා සියලු පසහතුරුවයන්නන් තමතමන් පුහුණු කළ ශිල්පයෙහි යොදවා සඳුනෙහි බැසගන්නාවූ මුල් බලන්නෙම්'යි නොයෙක් දහස්ගණන් පුරුෂයන්ගෙන් පිරිවරනලද්දේ ථූපාරාමයට පැමිණියේය.

ඒ කාලයෙහි අටසැට දහසක් භික්ෂූහු ථූපාරාමයෙහි රැස්වූහ. එහි මහා **මහින්ද** මහාස්ථවිරයන්වහන්සේගේ ආසනය දකුණුදිගට අභිමුඛකොට පණවනලද්දේවේ. මහාඅරිට්ඨස්ථවිරයන්වහන්සේගේ ධර්මාසනය උතුරුදිගට අභිමුඛකොට පණවනලද්දේවේ. ඉක්බිති මහාඅරිට්ඨ ස්ථවිරයන්වහන්සේ මහා **මහින්ද** මහා ස්ථවිරයන්වහන්සේ විසින් අණවනලද්දහු තමන්ට අනුරූපවූ පැමිණි පිළිවෙළින් ධර්මාසනයෙහි වැඩහුන්හ. මහා **මහින්ද** මහා ස්ථවිර ප්‍රමුඛවූ අටසැටක් මහතෙරහු ධර්මාසනය පිරිවරා වැඩහුන්හ. රජුගේද කනිටුසොහොයුරුවූ මත්තාභයනම් ස්ථවිරතෙමේ ධුරග්‍රාහීව විනය උගන්නෙමියි පන්සියයක් භික්ෂූන් සමග මහා **අරිට්ඨ** ස්ථවිරයන්වහන්සේගේ ධර්මාසනය පිරිවරා වැඩහුන්නේය. සෙසු භික්ෂූහුද රජු සහිත පිරිසද තමතමන්ට පැමිණි අසුන්හි හුන්හ.

ඉක්බිති ආයුෂ්මත් මහා **අරිට්ඨ** ස්ථවිරයන්වහන්සේ **'තෙන සමයෙන බුද්ධෝ භගවා වේරඤ්ජායං විහරති නළෙරුපුච්මන්දමූලේ'**යන විනයනිදනය ප්‍රකාශකළහ. ආයුෂ්මත් මහා **අරිට්ඨ**ස්ථවිරයන්වහන්සේ විසින් විනය නිදනය වදළකල්හි අහස මහහඬ නැගුයේය. අකාල විද්‍යුල්ලතාවෝ පැතිරිගියහ. දෙවියෝ සාධුකාරදුන්හ. මහාපෘථිවිය දිය කෙළවරකොට තදින් සැලුනි. මෙසේ නොයෙක් පෙළහර පවත්නාකල්හි ආයුෂ්මත් මහා **අරිට්ඨ** ස්ථවිරයන්වහන්සේ මහා **මහින්ද**මහාස්ථවිර ප්‍රමුඛවූ වෙන්වෙන්ව ගණාචාර්‍යවූ අටසැටක් ක්ෂීණාස්‍රව මහා ස්ථවිරයන්වහන්සේලා විසින්ද උන්වහන්සේලාගෙන් අන්‍යවූද අටසැට දහසක් භික්ෂූන් විසින් පිරිවරණලද්දහු වප්මය පසළොස්වක් පොහෝදිනයෙහි ථූපාරාමවිහාරමධ්‍යයෙහි ශාස්තෘන්වහන්සේගේ කරුණාගුණය ප්‍රකාශකරන්නාවූ භාග්‍යවතුන්වහන්සේගේ අනුශාසනාව කරන්නවුන්ගේ

කාය වාග්ද්වාරයන්හිවූ ක්ලේශයන්ගේ සැලීම හික්මවන්නාවූ විනයපිටකය ප්‍රකාශකළහ. ප්‍රකාශකොටද දිවිඇතිතාක් වැඩසිටින්නාහු බොහෝදෙනාට කියවා බොහෝදෙනාගේ ලෙහි පිහිටුවා අනුපාදිශේෂ නිර්වාණධාතුවෙන් පිරිනිවියාහුය. ඒ සමාගමෙහි මහා **මහින්ද** මහා ස්ථවිර ප්‍රමුඛවූ ඒ මහා ස්ථවිරයන්වහන්සේලාද,

'එහි රැස්වූ ධුරග්‍රාහීවූ වෙන්වෙන්ව ගණයා ඇති ධර්මරාජන්වූ බුදුරජාණන්වහන්සේගේ ශ්‍රාවකවූ ක්ෂයකළ ආස්‍රව ඇති වශීප්‍රාප්තවූ ත්‍රිවිද්‍යා ඇත්තාවූ සෘද්ධියෙහි දක්ෂවූ අටසැටනමක්වූ ඒ සියලු මහා ස්ථවිරයන්වහන්සේලා උත්තමාතථීය වෙසෙසින් දැන රජුට අනුශාසනාකළහ.

ඒ මහර්ෂීහු ඥානාලෝකය දක්වා මේ මහපොළොව බබුලුවා ගිනිකඳුමෙන් දිලිහීසිට පිරිනිවීගියහ.'

උන්වහන්සේලාගේ පිරිනිවීමෙන් මැතභාගයෙහි ඒ මහතෙරුන්ගේ අන්‍යවූ අතවැසියෝද, මහා අරිට්ඨස්ථවිරයන්වහන්සේගේ **තිස්සදත්ත, කාලසුමන, දීඝසුමන** ආදීවූ අතවැසියෝද අතවැසියන්ගේ අතවැසියෝදයි මෙසේ පෙරකියූඅයුරු ඇති ආචාර්‍ය පරම්පරා විසින් මේවිනයපිටකය අදදක්වා ගෙනෙනලදී. එහෙයින් '**තතියසඞ්ගහතෝ පන උද්ධං ඉමං දීපං මහින්දාදීහි ආභතං, මහින්දතෝ උග්ගහෙත්වා කඤ්චි කාලං අරිට්ඨත්ථෙරාදීහි ආභතං, තතෝ යාවජ්ජතනා තෙසංයෙව අන්තෙවාසිකපරම්පරාභතාය ආචරියපරම්පරාය ආභතං**'යනු කියනලදී.

කොතැන්හි පිහිටියේදයන ප්‍රශ්නයෙහිලා යම්කෙනකුන් අත පෙළ විසින්ද අරුත් විසින්ද නොඅඩුව පවතීද මිණිමුවා කළයෙහි වත්කළ සිංහ තෙලක් මෙන් මදකුත් නොවැගිරේද මෙබඳුවූ අධිකමාත්‍ර ස්මෘතිගති ධෘතිමත්වූ ලජ්ජිතවූ කුක්කුච්චකවූ ශික්ෂාකාමීවූ පුද්ගලයන්කෙරෙහි පිහිටියේයයි දතයුතුය.

එහෙයින් විනය පිහිටුවීම පිණිස විනයපර්‍යාප්තියෙහි අනුසස් සලකා ශික්ෂාකාමී භික්ෂූහු විසින් විනය පුහුණුකටයුතුය. එහි විනයපර්‍යාප්තියෙහි මේ ආනිසංසයවේ: විනයපර්‍යාප්තියෙහි දක්ෂවූ පුද්ගල තෙමේම සසුනෙහි පිළිලද සැදැහැති කුලපුත්‍රයන්ගේ මවුපිය තනතුරට සුදුසුවූයේවේ. ඔවුන්ගේ පබ්බජ්ජා, උපසම්පදා වත්තානුවත්තපටිපත්ති ආචාර ගොචර කුසලතායන මොවුන් ඔහු අයත්බැවිනි.

තවද මොහුගේ විනයපර්‍යාප්තිය නිසා තමාගේ ශීලස්කන්ධය මොනවට ගොපනය කරණලද්දේ මොනවට රක්නාලද්දේවේ. කුකුසින් මැඩුනවුන්ට පිළිසරණවේ. සහ මැද විශාරදව කියන්නේය. කරුණු සහිත වචනයෙන් සතුරන්ට ඉතා දැඩිව නිග්‍රහ කරන්නේය. සද්ධර්මයාගේ පැවැත්ම පිණිස පිළිපන්නේවේ. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ **'පඤ්චිමේ භික්ඛවෙ ආනිසංසා විනයධරෙ පුග්ගලෙ, අත්තනො සීලක්ඛන්ධො සුගුත්තො හොති සුරක්ඛිතො-පෙ සද්ධම්මට්ඨිතියා පටිපන්නො හොති'**[A] යි වදළසේක.

භාග්‍යවතුන්වහන්සේ විසින් සංවරය මුල්කොටඇති යම් කුශලධර්ම වදරනලද්දේද, විනයධර පුද්ගලතෙමේ ඒ ධර්මයන්ට දයාදවේ. ඒ ධර්මයන් විනය මුල්කොට ඇතිබැවිනි. මෙද භාග්‍යවතුන්වහන්සේවිසින් **'විනයො සංවරත්ථාය, සංවරො අවිප්පටිසාරත්ථාය, අවිප්පටිසාරො පාමුජ්ජත්ථාය, පාමුජ්ජං පීතත්ථාය, පීති පස්සද්ධත්ථාය, පස්සද්ධි සුඛත්ථාය, සුඛං සමාධත්ථාය, සමාධි යථාභූතඤාණ දස්සනත්ථාය, යථාභූතඤාණදස්සනං නිබ්බිදත්ථාය, නිබ්බිදා විරාගත්ථාය, විරාගො විමුත්තත්ථාය, විමුත්ති විමුත්තිඤාණදස්සනත්ථාය, විමුත්තිඤාණදස්සනං අනුපාදා පරිනිබ්බානත්ථාය, එතදත්ථා කථා, එතදත්ථා මන්තණා, එතදත්ථා උපනිසා, එතදත්ථං සොතාවධානං, යදිදං අනුපාද චිත්තස්ස විමොක්ඛො'**[B]යි වදරනලද්දේය. එහෙයින් විනයපර්‍යාප්තියෙහි නැවතනැවත දැඩිව යෙදියයුතුය.

මෙපමණකින්ද විනයසංවර්ණනාවපිණිස යම් ඒ මාතෘකාවක් තබනලද්දීද ඒ මාතෘකා පදයෙහිලා

'වුත්තං යෙන යදූ යසමා - ධාරිතං යෙන වාහතං,
යත්ථප්පතිට්ඨිතං චෙතමෙතං වත්වා විධිං තතො'

යන මේ ගාථාවෙහි අර්ථය පළමුකොට ප්‍රකාශකරණලද්දේය. විනයපිටකය පිළිබඳ බාහිර නිදනවර්ණනා අදහස් පරිදි වර්ණනාකරන ලද්දීවේ.

බාහිර නිදනවර්ණනා නිමි

——\\——

A පඤ්චකඞ්ගුත්තර B මජ්ඣිමපණ්ණාසක

දැන්:-

'තෙනාති ආදිපාඨස්ස - අත්ථං නානප්පකාරතො,
දස්සයන්තෝ කරිස්සාමි - විනයස්සත්ථවණ්ණනන්ති'

තෙන යනාදි පාඨයන්හි අර්ථය නොයෙක් අයුරින් දක්වමින් විනය පිළිබඳ අර්ථවර්ණනාව කරන්නෙමියි කියූබැවින් **'තෙන සමයෙන බුද්ධෝ භගවා'** යනාදීන්ගේ අර්ථවර්ණනාව කරන්නෙමි.

ඒ කෙසේදයත්: **තෙන** යනු අනියම නිර්දේශවචනයි. **තෙන** යන ඒ පදයට සරූපවසයෙන් පෙළෙහි නොකියනලද, එහෙත් පසුභාගයෙහි අර්ථවශයෙන් සිදුවූ **යෙන** යන මේ වචනයෙන් ප්‍රතිනිර්දේශය දතයුත්තේය. යම්හෙයකින් පසුභාගයෙහි **'එකස්ස භගවා කාලෝ, එකස්ස සුගත කාලෝ, යං භගවා සාවකානං සික්ඛාපදං පඤ්ඤපෙය්‍ය උද්දිසෙය්‍ය පාතිමොක්ඛං, යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං'**යි මෙසේ විනය ප්‍රඥප්තියාචනයට කරුණුවූ ආයුෂ්මත්වූ ශාරිපුත්‍ර මහා ස්ථවිරයන්වහන්සේට **'කතමෙසානං ඛෝ බුද්ධානං භගවන්තානං බ්‍රහ්මචරියං න චිරට්ඨිතිකං අහොසි, කතමෙසානං බුද්ධානං භගවන්තානං බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං අහොසි'** යි මෙසේ පහළවූ යම් පරිචිතකීර්යක්වූයේද එහෙයින් යම්කලක ඒ පරිචිතකීය පහළවූයේද ඒ කාලයෙහි භාග්‍යවත් බුදුරජානන්වහන්සේ වෙරඤ්ජාවෙහි වැඩ වසනසේකැයි මෙසේ මේ පදවල සම්බන්ධය දතයුත්තේය.

යම් මේ, තැනක **තෙන** යනු කියනුලැබේද ඒ ඒතැන පෙර හෝ පසුව අර්ථවශයෙන් සිද්ධවූ **යෙන** යන මේ වචනයෙන් ප්‍රතිනිර්දේශය කටයුතුයයන මේ වනාහි සියලුවිනයපිටකයෙහි යුක්තියවෙයි. එහි මේ මුඛමාත්‍රයක් දක්වීමය. 'මහණෙනි! එසේනම් භික්ෂූන්ට ශික්ෂාපද **පණවන්නෙම්**, යම්හෙයකින් **සුදින්න**තෙමේ මෙවුන්දම් පිළිසෙවිද එහෙයින් **පණවන්නෙම්**'යි වදරණලද්දේවේ. මෙසේ පූර්වයෙහි මෛථුනධර්මප්‍රතිසෙවනසඞ්ඛ්‍යාත අර්ථවශයෙන් සිද්ධවූ **යෙන** යන මේ වචනයෙන් විස්තරය දක්වීම සුදුසුවේ. **යෙන** යන පදයගෙන ඒ හා අර්ථ විස්තරය දතයුතුයයි කීසේය. ඒ කාලයෙහි භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ **රජගහානුවර** වැඩවසනසේක, යම්කාලයක **ධනියකුම්භකාරපුත්‍ර** තෙමේ රජුවිසින් නොදුන් දැවදඬු ගත්තේයයි මෙසේ පසු අර්ථවශයෙන් සිද්ධවූ **යෙන** යන මේ වචනය හා ගෙන විස්තරය යෙදේනුයි **තෙන** යන වචනයෙහි අර්ථය කියනලදී.

සමයෙන යන මෙහි සමය ශබ්දය ප්‍රත්‍යයසාමග්‍රියෙහි ක්ෂණයෙහි කාලයෙහි සමූහයෙහි හේතුවෙහි දෘෂ්ටියෙහි ප්‍රතිලාභයෙහි ප්‍රහාණයෙහි

ප්‍රතිවෙධයෙහිද දක්නාලැබේ. ඒ එසේමය. මේ සමය ශබ්දයාගේ **'අපෙපවනාම සෙව උපසඞ්කමෙය්‍යාම යාව කාලඤ්ච සමයඤ්ච උපාදය'**[A]යන මේ ආදි තන්හි ප්‍රත්‍යයසාමග්‍රි අර්ථයවේ. **'එකොව ඛො භික්ඛවෙ ඛණො ච සමයො ච බ්‍රහ්මචරියවාසාය'**[B]යන මේ ආදි තන්හි ක්ෂණාර්ථයවේ. **'උණ්හසමයො පරිළාහසමයො'**[C]යන මේ ආදි තන්හි කාලාර්ථයවේ. **'මහාසමයො පවනසමිං'**[D]යන මේ ආදි තන්හි සමූහාර්ථය ගැනේ. **'සමයොපි ඛො තෙ භද්දලි අපපටිවිද්ධො අහොසි භගවාපි ඛො සාවත්ථියං විහරති, භගවාපි මං ජානිස්සති භද්දලි නාම භික්ඛු සත්ථුසාසනෙ සික්ඛාය අපරිපූරකාරිති, අයමපි ඛො තෙ භද්දලි සමයො අපපටිවිද්ධො අහොසි'**[E]යන මේආදි තන්හි හෙත්වර්ථයෙහිවේ. **'තෙන ඛො පන සමයෙන උග්ගහමානො පරිබ්බාජකො සමණමණ්ඩිකා පුත්තො සමයප්පවාදකෙ තින්දුකාචීරෙ එකසාලකෙ මල්ලිකාය ආරාමෙ පටිවසති'**[F]යන මේ ආදි තන්හි දෘෂ්ටිය කියනුලැබේ.

'දිට්ඨෙව ධම්මෙ යො අත්ථො යො චත්ථො සම්පරායිකො,
අත්ථාභිසමයා ධීරො පණ්ඩිතොති පවුච්චති'[G]

යන මේ ආදි තන්හි ප්‍රතිලාභය කියවේ. **'සම්මා මානාභිසමයා අත්තමකාසි දුක්ඛස්ස'**[H]යන මේ ආදි තන්හි ප්‍රහාණයෙහිවේ. **'දුක්ඛස්ස පීළනට්ඨො සඞ්ඛතට්ඨො සන්තාපට්ඨො විපරිණාමට්ඨො අභිසමයට්ඨො'**[I] යන මේ ආදි තන්හි ප්‍රතිවෙධාර්ථයි. මෙහි වනාහි සමය ශබ්දයෙහි කාලාර්ථය ගනුලැබේ. එහෙයින් යම් කලක ආයුෂ්මත් **ශාරිපුත්‍ර** මහා ස්ථවිරයන්වහන්සේහට විනයප්‍රඥප්තියාවනයට හේතුභූතවූ පරිවිතර්ක පහළවූයේද ඒ කාලයෙහියි මෙසේ මෙහි අර්ථ දතයුතුය.

මෙහිලා විතණ්ඩවාදී තෙමේ කියේය: එසේනම් කුමක් හෙයින් සූත්‍රාන්තයෙහි **'එකං සමයං'**යි ද්විතීයා විභක්ති වචනයෙන් නිර්දේශය කරනලද්දේද? අභිධර්මයෙහිද **'යස්මිං සමයෙ කාමාවචරං'**යි සප්තමීවිභක්ති වචනයෙන් කරනලද්දේද? එසේ නොකොට මෙහි **'තෙන සමයෙන'**යි කරණ වචනයෙන් නිර්දේශය කරනලද්දේදැයි එහි එසේද මෙහි අන්පරිද්දෙකින්ද අර්ථය ලැබෙනබැවිනි. සූත්‍රාන්තයෙහි වනාහි කෙසේ අත්‍යන්තසංයොගාර්ථය ලැබේද? යම් කලෙක භාග්‍යවතුන්වහන්සේ

A දීඝනිකාය - සුභසූත්‍ර
B චතුක්කඩ්ඨකර
C පාචිත්තියපාළි
D සංයුත්ත-මහාසමයසූත්‍ර
E මජ්ඣිමනිකාය - භද්දලිසූත්‍ර
F මජ්ඣිමනිකාය-සමණමණ්ඩිකසූත්‍ර
G කොසලසංයුත්ත
H තිකඩ්ඨකර
I පටිසම්භිදාමග්ග

බ්‍රහ්මජාලාදීවූ සූත්‍රාන්තයන් දෙසූසේක්ද, නිරතුරුවම ඒ කාලයෙහි පරහිතප්‍රතිපත්තිසඞ්ඛ්‍යාත කරුණා විහරණයෙන් වියූසේක. එහෙයින් ඒ අත්‍යන්තසංයොගාත්ථීය දක්වනු පිණිස එහි සූත්‍රාන්තයෙහි **'එකං සමයං'**යි අත්‍යන්තසංයොගාත්ථීයෙහි ද්විතීයාවිභක්තිනිර්දේශය කරනලද්දේය.

අභිධර්මයෙහි අධිකරණ සඞ්ඛ්‍යාත ආධාරාත්ථීය හා ක්‍රියාසඞ්ඛ්‍යාත භාවයෙන් භාවලක්ඛණාත්ථීයද ලැබන්නේය. ආධාරාත්ථීයෙහි එන සමය ශබ්දය කාලාත්ථී සමූහාත්ථී ඇත්තේවේ. එහෙයින් මෙහි කාලාත්ථී සමූහාත්ථී දෙක සමයයි කියනුලැබේ. **'යස්මිං කාලෙ ධම්මපුඤ්ඤා වා කාමාවචරං කුසලං චිත්තං උපපන්නං හොති තස්මිං යෙව කාලෙ ධම්ම පුඤ්ඤා ච එස්සාදයෝ හොන්ති'** යනු අභිධර්මයෙහි සමය ශබ්දය සමූහාත්ථී කාලාත්ථී දෙක්හි හෙනබවට නිදසුන්වේ. අෂ්ටදුෂ්ටක්ඛණයෙන් මිදුනාවූ බුද්ධොත්පාදක්ඛණයද **'චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං'** යි මේ ලෙසින් කියූ චක්ඛුරූපාදීන්ගේ ප්‍රත්‍යයසාමග්‍රියද **ජනක**හෙතුවද යන **ක්ෂණ**, සමවාය, හෙතු සඞ්ඛ්‍යාතවූ සමය ශබ්දයාගේ භාවයෙන් ඒ **සප්තඛීදධර්මයන්**ගේ භාවය යම්හෙයකින් හඟිනුලැබේද එහෙයින් ඒ ආධාරාත්ථීයාගේ භාවයෙන් භාවලක්ඛණාත්ථීය දක්වනුපිණිස **'ගාවිසු දුය්හමානාසු ගතො, දුද්ධාසු ආගතො'** යනාදිතන්හිමෙන් එහි සප්තමීවිභක්ති වචනයෙන් නිර්දේශ කරනලද්දේය.

මේ විනයපිටකයෙහිවනාහි **'අත්තෙන වසති. විජ්ජාය වසති'** යනාදිතන්හිමෙන් හෙතු අත්ථීයද **'එරසුනා ජීනති, කුද්දලෙන ඛණති'** යනාදිතන්හිමෙන් කරණාත්ථීයද ලැබෙන්නේය. ශික්ෂාපද පැණවීමට පුදුසුවූ යම් ඒ කාලයක්වේද ඒ කාලය ශාරීපුත්‍රාදි මහා ස්ථවිරයන්වහන්සේ විසිනුදු නොදත හැක්කේය. හේතුවූද කරණවූද ඒ කාලයෙහි භාග්‍යවතුන්වහන්සේ ශික්ෂාපද පණවමින් ශික්ෂාපද පැණවීමට හේතුද බලාපොරොත්තු වෙමින් ඒ ඒ තැන වැඩවිසූසේක්ද එහෙයින් ඒ අත්ථීය ප්‍රකාශකරනුපිණිස මේ විනයපිටකයෙහි කරණවචනයෙන් නිර්දේශ කරනලදැයි දතයුතුය. යතොක්ත්ථීය සඞ්ග්‍රහකිරීමවශයෙන්

'උපයොගෙන භුම්මෙන - තං තං අත්ථමපෙක්ඛිය
අසූදත්‍ර සමයො වුත්තො - කරණෙනෙව සො ඉධ'

සූත්‍ර අභිධර්ම දෙක්හි උපයොග සඞ්ඛ්‍යාත ද්විතීයාවෙන්ද භුම්ම සඞ්ඛ්‍යාත සප්තමියෙන්ද ඒ ඒ අත්ථී අපෙක්ෂාකොට මේ විනයපිටකයෙහි ඒ සමයශබ්දය කරණයෙන්ම කියනලද්දේය.

පුරාණාචාර්‍යයෝවනාහි **'එකං සමයං'** යි හෝ **'යස්මිං සමයෙ'**යි හෝ **'තෙන සමයෙන'**යි හෝ යන මෙය වචනමාත්‍ර භේදයෙක. මෙය සියලු තන්හි සප්තම්‍යර්ථය මැ'යි කියත්. එහෙයින් ඔවුන්ගේ පිළිගැනීම්වසයෙන් **'තෙන සමයෙන'**යි කියූකල්හිද ඒ කාලයෙහි යන අර්ථය දතයුතුය.

'බුද්ධො භගවා'යන මේ පදයන්ගේ අර්ථ ඉදිරියෙහි විස්තර කරන්නෙමු. **'වෙරඤ්ජායං විහරති'**යන මෙහි වෙරඤ්ජා යනු එක්තරා නගරයක නාමයකි. ඒ වෙරඤ්ජාවෙහිය. සම්පාර්‍ථයෙහි සප්තමී වචනයි. **'විහරති'** යන මෙය වෙනසක් නොමැතිව ඊර්‍යාපථවිහරණ, දිව්‍යවිහරණ, බ්‍රහ්මවිහරණ, ආයතීවිහරණයන විහරණ අතුරෙහි එක්තරා විහරණයකින් යුක්තබව දක්වාලන්නේය. මෙහිවනාහි සිටීම, යෑම, හිඳීම, නිදීමයන ප්‍රභෙද ඇති ඊර්‍යාපථ අතුරෙහි එක්තරා ඊර්‍යාපථයකින් මැනවින් යෙදීම දක්වන්නේය. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ සිටිසේක්ද ගමන්කරනසේක්ද හිඳිනසේක්ද නිදනසේක්ද ඒ සිටීම්, යෑම්, හිඳීම්, නිදීම්, යන හැමඉරියවුම 'විහරති' වැඩවසනසේකැයි යන එක්ම ක්‍රියාපදයෙන් ගැනෙන්නේය. යම් හෙයකින් භාග්‍යවතුන්වහන්සේ එක් ඉරියවුවකින් නැඟී සීඝාවක් අන් ඉරියවුවකින් සිදහැර ආත්මභාවය නොවැටෙන්නක්කොට හිතසුව එළවනසේක්ද පවත්වනසේක්ද එහෙයින් 'විහරති'යි කියනුලැබේ.

'නළෙරුපුච්මන්දමූලෙ' මෙහි නළෙරුනම් යක්ෂයෙකි. **පුච්මන්ද**යනු කොසඹ රුකය. මූලයනු සමීපය. මේ මූල ශබ්දයවනාහි **'මූලානි උද්ධරෙය්‍ය අත්තමසො උසීරනාළමත්තානිපි'**[A] යනාදිතන්හි මූලමූලයෙහිද **'ලොභො අකුසල මූල.'**[B] යනාදිතන්හි අසාධාරණ හේතුවෙහිද **'යාව මජ්ඣන්හිකෙ කාලෙ ඡායා එරති නිවාතෙ පණ්ණානි පතන්ති එත්තාවතා රුක්ඛමූල.'** යනාදිතන්හි සමීපයෙහිද දක්නාලැබේ. මෙහිවනාහි සමීපය අභිමතවේ. එහෙයින් නළෙරු යකු විසින් අරක්ගත් කොසඹ රුක සමීපයෙහියි මෙසේ මෙහි අරුත් දතයුතුය. ඒ කොසඹ රුක සිත්කලුය. දුටුවන් පහදවන්නේය. නන්වැදරුම් වෘක්ෂයනට අධිපතිභාවය කරන්නකුමෙන් එනුවරට නොදුරෙහි යෑමර්මට පහසුකම් ඇති තැනක වූයේය. එකල්හි භාග්‍යවතුන්වහන්සේ වෙරඤ්ජාවට වැඩමකොට සුදුසුතැනක වසනසේක් ඒ රුක සමීපයෙහි යටපෙදෙසෙහි වැසූසේක. **'වෙරඤ්ජායං විහරති නළෙරුපුච්මන්ද මූලෙ'**යි එහෙයින් කියනලද්දේය.

A අභිසමය සංයුත්ත- දුකඛවග්ග B තිකඩ්ඨුත්තර

'තෙන සමයෙන බුද්ධා භගවා වෙරඤ්ජායං විහරති නළෙරුපුච්මන්දමූලෙ'යි යමක් කියනලදද එහි කිසිවක්හට පරිවිතර්කයක් වන්නේය. ඉදින්වනාහි භාග්‍යවතුන්වහන්සේ වෙරඤ්ජාවෙහි වැඩවසනසේකැයි ගනිත්නම් නළෙරුපුච්මන්දමූලයෙහියි නොකියයුතුය. නළෙරුපුච්මන්දමූලයෙහි වැඩවසනසේකැයි ගනිත්නම් වෙරඤ්ජාවෙහියි නොකියයුතුය. දෙතැනක ඒ කාලයෙහිම පෙරපසු නොවී වසන්නට නොමහැකියයුතුයි. මෙයවනාහි මෙසේ නොදතයුතුය. සමීපාර්‍ථයෙහි සප්තමී වචනයි කීවෝ නොවෙමුද? එහෙයින් ගඞ්ගා-යමුනාදීන්ගේ සමීපයෙහි හැසිරෙත්, ගෝමඬුලු ගඞ්ගාවෙහි හැසිරෙති, යමුනාවෙහි හැසිරෙතියි යම්සේ කියතුලැබෙත්ද මෙසේ මෙහිද වෙරඤ්ජානුවරසමීපයෙහි යම් මේ නළෙරුපුච්මන්දමූලයවේද එහි වැඩවසනසේක් 'වෙරඤ්ජාවෙහි නළෙරුපුච්මන්දමූලයෙහි වැඩවසත්'යි කියතුලැබේ. මෙහි වෙරඤ්ජාවචනය මුන්වහන්සේගේ ගොදුරුගම දක්වීමපිණිසය. නළෙරුපුච්මන්දමූලවචනය පැවිද්දන්ට සුදුසුවූ නිවාසස්ථානය දක්වීමපිණිසය.

එහි වෙරඤ්ජාව දක්වීමෙන් ආයුෂ්මත් උපාලි මහා ස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේගේ ගැහැවියනට අනුග්‍රහකිරීමද දක්වාලන්නෝය. එසේ පළමු වචනයෙන් සිවුපසය ගැනීමෙන් අත්තකිලමථානුයෝගයාගේ දුරුකිරීමද, පැසුළු වචනයෙන් කෙලශකාමයට වස්තුවූ රූපාදීවූ වස්තුකාමයන්ගේ ප්‍රහාණයෙන් කාමසුඛල්ලිකානුයෝගය දුරුකිරීමෙහි උපාය දක්වීමද, පළමුවචනයෙන් ධර්මදේශනාභියෝගයද, පැසුළුවචනයෙන් විවේකාධිමුක්තියද, පළමුවචනයෙන් කරුණාවට එළඹසිටීමද, පැසුළුවචනයෙන් ප්‍රඥව හේතුකොට ලාභාපෙක්ෂාවෙන් දුරුවීමද, පළමු වචනයෙන් සත්ත්වයන්ට හිතසුව නිපදවීමෙහි නැමුනු බවද, පැසුළුවචනයෙන් පරහට සුඛකරණයෙහි ඇලීමද, පළමුවචනයෙන් ධාර්මික සුඛපරිත්‍යාගයට කරුණුවූ ඵාසුවිහරණයද, පැසුළුවචනයෙන් උත්තරීමනුෂ්‍යධර්මයෙහි එක්වන් යෙදීමට කරුණුවූ ඵාසුවිහරණයද, පළමුවචනයෙන් මිනිසුන්ට උපකාර බහුලබවද, පැසුළුවචනයෙන් දෙවියන්ට උපකාර බහුලබවද, පළමුවචනයෙන් ලෙවිහි උපන්නහුගේ ලෙවිහි ආමිසපරිභොගයෙන් වැඩීමද, පැසුළු වචනයෙන් ලෙවිහි නොඇලුනුබවද, පළමුවචනයෙන් **'එකපුග්ගලෝ භික්ඛවේ ලොකෙ උපපජ්ජමානෝ උපපජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං, කතමෝ එකපුග්ගලෝ, තථාගතෝ අරහං සම්මා සම්බුද්ධෝ'**[A] යි වදළවචනයෙන් යම් අර්‍ථයක්පිණිස භාග්‍යවතුන්වහන්සේ උපන්සේක්ද, ඒ

A අඞ්ගුත්තරනිකාය - එකකනිපාත

ලොකාභිනිෂ්පාදනයද, පැසුළුවචනයෙන් යම්තැනක උපන්සේක්ද, එයට අනුරූපවූ විහරණයද, භාග්‍යවතුන්වහන්සේ පළමුකොට ලුම්බිනි වනයෙහිද, දෙවනුව බොධිමණ්ඩයෙහිදයි ලෞකික ලොකෝත්තර උත්පත්තියෙන් වනයෙහිම උපන්සේක්ද එහෙයින් වනයෙහිම මුන්වහන්සේගේ විහරණයද දක්වන්නේයයි මේආදි නයින් මෙහි අර්ථ යෝජනාව දතයුතුය.

'මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං'යනමෙහි මහතා, ගුණ මහත්වයෙන්ද, සඞ්ඛ්‍යා මහත්වයෙන්ද මහත්වූ ඒ භික්ෂුසඞ්ඝතෙමේ වනාහි ගුණයන්ගෙනුදු මහත්වූයේය. යම්හෙයකින් එහි යම් පැසුළු මහණෙක්වූයේද හෙතෙමේ සෝවන්වූයේය. ගණන් විසිනුදු පන්සිය ගණන්බැවින් මහත්වූයේය. භික්ෂූන්ගේසමූහය භික්ඛුසඞ්ඝ' නම්වේ. ඒ භික්ෂුසඞ්ඝයා සමග ආයාචිවූ දෘෂ්ටියෙහි හා ශීලයෙහි සමානභාවයෙන් එක්වූ හැනී සිටියාවූ ශ්‍රමණගණයා හා යන අර්ථයි **'සද්ධිං'** එක්ව.

'පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි' පසක්ප්‍රමාණ මොවුනටනුයි පඤ්චමත්තනම්. මත්තායන මෙයින් ප්‍රමාණය කියනුලැබේ. එහෙයින් යම්සේ 'භොජනෙ මත්තඤ්ඤූ'යි කියූකල්හි බොජුනෙහි මාත්‍රය දනී, පමණ දනී, යන අර්ථයවේද එසේ මෙහිද ඒ භික්ෂූන් සියය පිළිබඳ පංචමාත්‍රය පංචප්‍රමාණයයි මෙසේ අර්ථය දතයුත්තේය. භික්ෂූන් පිළිබඳ සියය **'භික්ඛුසත'**නම්වේ. ඒ පන්සියයක් පමණවූ භික්ෂූන් සමග 'මහතා භික්ඛු සඞ්ඝෙන සද්ධිං'යන මෙයින් යමක් කියනලදද එයින් මෙහි ඒ භාග්‍යවතුන්වහන්සේගේ මහත්වූ භික්ෂුසඞ්ඝයාගේ සඞ්ඛ්‍යාමහත්වය දක්වනලද්දේවේ. ඉදිරියෙහි වනාහි මේ පන්සියයක් පමණ භික්ෂුසඞ්ඝයා පිළිබඳ 'ශාරීපුත්‍ර! භික්ෂුසඞ්ඝතෙමේ වියවුල් රහිතය, එහෙයින් දෙස් නැත්තේය, පහවූ පව් ඇත්තේය, පිරිසිදුය, සාරයෙහි පිහිටියේය, ශාරීපුත්‍ර! මේ පන්සියයක් භික්ෂූන් අතුරෙහි යම් පැසුළුමහණෙක්වේද, හෙතෙමේ සොතාපන්නය' යන වචනයෙන් ගුණමහත්වය ප්‍රකටවන්නේය.

'අසෙසාසි ඛො වෙරඤ්ජා බ්‍රාහ්මණො' යන මෙහි **'අසෙසාසි'**, ඇසූයේය. ලැබුයේය. කණට වැටුණු වාගෙඝාෂානුසාරයෙන් දැනගත්තේය. 'ඛො'යනු පදපූරණ මාත්‍රයෙහි හෝ අවධාරණාර්ථයෙහි නිපාතයි. එහි අවධාරණාර්ථයෙන් ඇසුයේමය, මොහුට කිසි ශ්‍රවණාන්තරායක් නොවූයේය, යන මේ අර්ථය දතයුතුය. පදපූරණ මාත්‍රයෙන්වනාහි ව්‍යඤ්ජනයන්ගේ සිලිටිබව පමණක්මවේ. වෙරඤ්ජාවෙහි උපන්නේය, වෙරඤ්ජාවෙහිවූයේය, වෙරඤ්ජාව මොහුට වාසස්ථාන හෝ වූයේයයි වෙරඤ්ජ නම්වේ. මවුපියන්විසින් කරනලද නාමවශයෙන් මෙතෙමේ 'උදය'යි කියනුලැබේ. වේදය හදරානුයි 'බ්‍රහ්මණ'නම්. ඍගේවෙදදි මන්ත්‍ර

හදරන්නේයයන අර්ථයි. මේ වනාහි බැහැරකළ බහාතැබූ පවි ඇතිබැවින් බ්‍රාහ්මණයෝයි කියතුලැබෙත්.

දැන් වෙරඤ්ජබ්‍රාහ්මණතෙමේ යම් අර්ථයක් ඇසුයේද එය පවසනුයේ **'සමණෝ බලු හො ගොතමෝ'**යනාදිය කීයේය. එහි සන්සිඳවූ පවි ඇතිබැවින් 'ශ්‍රමණය'යි දතයුතුය. **'බාහිතපාපොති බ්‍රාහ්මණෝ**[A] **සමිතපාපත්තා සමණොති වුච්චති'යි** මෙය කියනලද්දේය. භාග්‍යවතුන්වහන්සේද නිරුත්තරවූ ආයම්මාගීයෙන් සන්සිඳවූ පවි ඇතිසේක. එහෙයින් යම් මේ ශ්‍රමණයන නාමයක්වේද මෙය භාග්‍යවතුන්වහන්සේවිසින් යථාර්ථවත්වූ ගුණයන්ගෙන් ලබනලද්දේය. **'බලු'**යනු අනුශ්‍රවණාර්ථයෙහි නිපාතයකි. **'හො'**යනු බ්‍රාහ්මණ ජාති ඇතියනට ජාතිවශයෙන් සිද්ධවූ ආලපන මාත්‍රයකි. **'හොවාදී නාම සො හොති සචේ හොති සකිඤ්චනො'**[B]යි මෙය කියනලද්දේය. **'ගොතමෝ'**යන මෙය ගොත්‍රවශයෙන් භාග්‍යවතුන්වහන්සේ දක්වාලන්නේය. එහෙයින් **'සමණෝ බලු හො ගොතමෝ'**යන මෙහි භවත්ති! ශ්‍රමණතෙමේවනාහි ගෞතම ගොත්‍රඇත්තේයයි මෙසේ අර්ථ දතයුතුය. **'සක්‍යපුත්තො'**යන මෙය භාග්‍යවතුන්වහන්සේගේ උසස්කුලය දක්වන්නේය. **'සක්‍යකුලා පබ්බජිතො'**යනු ශ්‍රද්ධාවෙන් පැවිදිවූ බව දක්වීමය. කිසිදු පිරිහීමකින් නොමඩනාලද්දහු කිසිවකින් ක්ෂයනොවූම ඒ කුලය හැරපියා ශ්‍රද්ධාවෙන් පැවිදිවූහ'යි කියනලද්දේවේ. එයින් අන්‍යවූයේ කියූඅර්ථ ඇත්තේමය.

'තං ඛො පන'යනු ඉතිපිමහුතාඛ්‍යානයෙහි ද්විතියාවචනයි. ඒ භවත් ගෞතමයන්වහන්සේගේයන අර්ථයි. 'කල්‍යාණෝ' කල්‍යාණ ගුණ යුක්තයහ. ශ්‍රේෂ්ඨයහයි කියනලද්දේවේ. **'කිත්තිසද්දෝ'**යනු කීර්තියමය. හෝ ස්තුතිඝොෂයයෙයි. **'ඉතිපි සො භගවා'** යනාදිතන්හි වනාහි **'සො භගවා ඉතිපි අරහං ඉතිපි සම්මා සම්බුද්ධො** -පෙ- **ඉතිපි භගවා'** යන මේවනාහි යෙදීමය. මේ මේ කාරණයෙනැයි කියනලද්දේවේ.

දැන් විනයධරයන්ගේ සූත්‍රාන්තනය කෞශල්‍යයපිණිස විනය සංවර්ණනාවගේ ආරම්භයෙහි බුද්ධගුණ ප්‍රතිසංයුක්තවූ ධර්මකථාවෙන් චිත්ත සන්තොෂයපිණිස චිත්තප්‍රසාදය උපදවනුපිණිස මේ පදයන්ගේ සංවර්ණනාව විස්තරනයින් කරන්නෙමි. එහෙයින් **'සො භගවා ඉතිපි අරහං'**යනාදිවිසින් යමක් කියනලදද එහිලා මෙසේ දතයුතුය.

A ධම්මපද - බ්‍රාහ්මණවග්ග B ධම්මපද - බ්‍රාහ්මණවග්ග

අරහං

එහි කෙලෙසුන්ගෙන් දුරුවූබැවින් කෙලෙස් සතුරන් හා සංසාර චක්‍රයාගේ දෑවී නැසූබැවින් වීවරාදිප්‍රත්‍යයන්ට සුදුසුබැවින් පවිකිරීමෙහි රහසක් නැතිබැවින් රහසිහුදු පවිනොකරණබැවින් යනමේ කරුණුවලින් පළමුකොට ඒ භාග්‍යවතුන්වහන්සේ **'රහත්හ'**යි දතයුතුය.

ඒ භාග්‍යවතුන්වහන්සේ සියලු කෙලෙසුන්ගෙන් ඈත්වෙති. ඉතාදුර ඉතාඇත්හි සිටියහ. ආයතිමාගීයෙන් සවාසනා කෙලශයන් විධ්වංසනය කළබැවිනැයි ඈත්හිවූබැවින් රහත්හ. මේ භාග්‍යවතුන්වහන්සේවිසින් ඒ කෙලෙස්සතුරෝ මාගීඥනයෙන් නසනලදහයි කෙලෙස් සතුරන් නැසූබැවින්ද රහත්හ. අවිද්‍යා භවතෘෂ්ණාමය නාභි ඇති පුණ්‍යාභිසංස්කාරාදීවූ අභිසංස්කාර නැමති අර ඇති ජරාමරණ නැමති නිම්වළලු ඇති ආප්‍රව සමුදයමය අලවංගුවෙන් විද භවත්‍රයනැමති රියෙහි මොනවට යොදනලද මුල් නොදතහැකි කලක්පැවැති යම් මේ සංසාරචක්‍රයක්වේද මුන්වහන්සේවිසින් ඒ සංසාරචක්‍රයාගේ හවරූපවූ සියලුඅරයෝ බෝමැඩදී වීර්‍යනැමැති පාදයෙන් ශීලනැමැති පෘථිවියෙහි පිහිටාගෙන ශ්‍රද්ධානැමති හස්තයෙන් කම්ක්ෂයකරඥනනමැති පොරොවගෙන නසනලදහයි මෙසේ සංසාරචක්‍රයෙහි අර නැසූබැවිනුදු රහත්හ.

තවද, 'සංසාරවක්‍ර' යන මෙයින් නොදත් පුථ් කෙළෙවරඇති සංසාර වෘත්ත කියනුලැබේ. එයටද අවිද්‍යාව මූලයබැවින් නාභියවේ. කෙළවරබැවින් ජරාමරණ නිම්වළල්ලවේ. අවිද්‍යාව මූලයබැවින් හා ජරාමරණ අවසානයබැවින් පෙසු දශධම්යෝ අරවෙත්.

එහි දුඃඛාදියෙහි නොදැනීම අවිද්‍යාය. කාමභවයෙහි අවිද්‍යාව කාමභවයෙහි සංස්කාරයන්ට ප්‍රත්‍යයවේ. රූපභවයෙහි අවිද්‍යාව රූපභවයෙහි සංස්කාරයන්ට ප්‍රත්‍යයවේ. අරූපභවයෙහි අවිද්‍යාව අරූපභවයෙහි සංස්කාරයන්ට ප්‍රත්‍යයවේ. කාමභවයෙහි සංස්කාරයෝ කාමභවයෙහි ප්‍රතිසන්ධිවිඥනයට ප්‍රත්‍යයෝවෙත්. රූපභව, අරූපභවයන්හිද මේ ක්‍රමයවේ. කාමභවයෙහි ප්‍රතිසන්ධිවිඥනය කාමභවයෙහි නාමරූපයට ප්‍රත්‍යයවේ. රූපභවයෙහිද එසේය. අරූපභවයෙහි නාමයටම ප්‍රත්‍යයවේ. කාමභවයෙහි නාමරූපය කාමභවයෙහි ෂඩායතනයට ප්‍රත්‍යයවේ. රූපභවයෙහි නාමරූපය රූපභවයෙහි චක්ඛු, සොත, මන යන ත්‍රිවිධ ආයතනයන්ට ප්‍රත්‍යයවේ. අරූපභවයෙහි නාමය අරූපභවයෙහි එක් ම මනායතනයට ප්‍රත්‍යයවේ. කාමභවයෙහි ෂඩායතනය කාමභවයෙහි සවැදෑරුම්වූ ස්පර්ශයට ප්‍රත්‍යයවේ. රූපභවයෙහි චක්ඛු, සොත, මනයන

ත්‍රිවිධආයතන රූපභවයෙහි තෙවැදරුම් ස්පර්ශයන්ට ප්‍රත්‍යයවේ. අරූපභවයෙහි එක්ම මනායතනය අරූපභවයෙහි එක්ම ස්පර්ශයට ප්‍රත්‍යයවේ. කාමභවයෙහි සවැදරුම්වූ ස්පර්ශවේ කාමභවයෙහි සවැදරුම්වූ වෙදනාවන්ට ප්‍රත්‍යයවේ. රූපභවයෙහි තෙවැදරුම්වූ ස්පර්ශ රූපභවයෙහිම තෙවැදරුම්වූ වෙදනාවන්ට ප්‍රත්‍යයවේ. අරූපභවයෙහි එකම ස්පර්ශය එහිම එක්ම වෙදනාවට ප්‍රත්‍යයවේ. කාමභවයෙහි සවැදරුම්වූ වෙදනා කාමභවයෙහි සවැදරුම්වූ තෘෂ්ණාකායයන්ට ප්‍රත්‍යයවේ. රූපභවයෙහි තෙවැදරුම්වූ වෙදනා එහිම තෙවැදරුම්වූ තෘෂ්ණාකායයන්ට ප්‍රත්‍යයවේ. අරූපභවයෙහි එක්ම වෙදනා අරූපභවයෙහි එක්ම තෘෂ්ණාකායට ප්‍රත්‍යයවේ. ඒ ඒ තන්හි ඒ ඒ තෘෂ්ණා තොමෝ ඒ ඒ උපාදනයට ප්‍රත්‍යයවේ. උපාදනාදිය කාමභවාදීන්ට ප්‍රත්‍යයවේ කිසේයයත්:

මේ ලොකයෙහි ඇතැම් එකෙක් කාමයන් වළඳන්නෙම්'යි කාමොපාදාන ප්‍රත්‍යයයෙන් කයින් දුශ්චරිත කරයි. වචනයෙන් දුශ්චරිත කරයි. මනසින් දුශ්චරිත කරයි. දුශ්චරිත පරිපූර්ණත්වයෙන් අපායයෙහි උපදියි. එහි මොහුගේ උපතට හේතුවූ කර්ම කර්මභව නම්වේ. කර්මයෙන් උපන් ස්කන්ධ උත්පත්තිභව නම්වේ. ස්කන්ධයන්ගේ හටගැනීම ජාතියය. පැසීම ජරාය. බිඳීම මරණයයි. අනෙකෙක් ඨවර්ගසම්පත්තිය වළඳන්නෙම්'යි එසේම දුචරිතයෙහි හැසිරෙයි. දුචරිතයන්ගේ පරිපූර්ණත්වයෙන් ඨවර්ගයෙහි උපදියි. එහි මොහුගේ උපතට හේතුවූ කර්ම කර්මභව නම්වියයන මෙහිද ඒ ක්‍රමයමවේ. අනෙකෙක් බ්‍රහ්මලෝකසම්පත්තිය වළඳින්නෙම්යි කාමොපාදන ප්‍රත්‍යයයෙන්ම මෛත්‍රිය වඩයි. කරුණා, මුදිතා, උපෙක්ෂාවන් වඩයි. භාවනාවන්ගේ පරිපූර්ණත්වයෙන් බ්‍රහ්මලෝකයෙහි උපදියි. එහි මොහුගේ උපතට කරුණුවූ කර්ම කර්මභව නම්වේ, යන මෙහිද ඒ ක්‍රමයමවේ. අනෙකෙක් අරූපභවයෙහි සම්පත්තිය වළඳන්නෙම්'යි එසේම ආකාසානඤ්චායතනාදි සමාපත්තීන් වඩයි. භාවනාවන්ගේ පරිපූර්ණත්වයෙන් ඒ ඒ තන්හි උපදියි. එහි මොහුගේ උපතට කරුණුවූ කර්ම කර්මභව නම්වේ. කර්මයෙන් උපන් ස්කන්ධ උත්පත්තිභව නම්වේ. ස්කන්ධයන්ගේ හටගැනීම ජාතියය. පැසීම ජරාය. බිඳීම මරණයයි. පෙපු උපාදන මුල්කොටගත් යොජනාවන්හිද මේ ක්‍රමයවේ.

මෙසේ මේ අවිද්‍යාව හෙතුයි. සංස්කාර හේතුසමුත්පන්නයහ. මේ අවිද්‍යා, සංස්කාර දෙකම හේතුසමුත්පන්නයයි. ප්‍රත්‍යය පිරිසිඳ දැනීමෙහි නුවණ ධර්මස්ථිතිඥානයයි. ඒ නම් ප්‍රතීත්‍යසමුත්පාදවබෝධයයි. අද්ධානසඞ්ඛ්‍යාතදීඝවූ අතීත කාලයටත් අනාගත කාලයටත් අවිද්‍යාව හෙතුය. සංස්කාරයෝ හෙතු සමුත්පන්නයහ. මේ දෙක හේතුසමුත්පන්නයයි.

ප්‍රත්‍යය පිරිසිඳ දැනීමෙහි තුවණ ධම්ස්ථිතිඤ්ඤනයයි. මේ ක්‍රමයෙන් සියලුපද විස්තර කටයුතුය.

එහි අවිද්‍යා, සංස්කාර එක් සඬ්ඛ්‍යෂපයෙකි. විඤ්ඤන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වෙදනා එක් සඬ්ඛ්‍යෂපයෙකි. තෘෂ්ණා උපාදන, භවයෝ එක් සඬ්ඛ්‍යෂපයෙකි. ජාති ජරා, මරණ මෙහි ප්‍රථම සංඬ්ඛ්‍යෂපය එක් සංකල්පයකි. අතීත කාලයයි. මධ්‍යයෙහිවූ සඬ්ඛ්‍යෂප දෙක වර්තමාන කාලයි. ජාති, ජරා, මරණ සඬ්ඛ්‍යෂපය අනාගත කාලයි. මෙහි අවිද්‍යා සංස්කාරයන්ගේ ගැනීමෙන් තෘෂ්ණා උපාදනභව ගන්නාලදී. අවිද්‍යා, සංස්කාර, තෘෂ්ණා, උපාදන - භවයන මේ ධර්ම පස අතීත කර්මවෘත්තයි. විඤ්ඤන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වෙදනායන ධර්ම පස දැන් මේ ආත්මභාවයෙහි විපාකවෘත්තයි. තෘෂ්ණා උපාදනභවයන්ගේ ගැනීමෙන් අවිද්‍යා, සංස්කාර ගන්නාලද්දේම වෙයි. තෘෂ්ණා, උපාදන, භව, අවිද්‍යා, සංස්කාරයන මේ ධර්මපස දැන් මේ ආත්මභාවයෙහි කර්මවෘත්තයි. ජාති, ජරා, මරණ දැක්වීමෙන් විඤ්ඤාදීන් දැක්වූබැවින් විඤ්ඤන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වෙදනායන මේ ධර්මපස අනාගතයෙහි විපාකවෘත්තයි. ඒ අවිද්‍යාදී ආකාරවශයෙන් විසිවැදෑරුම් වන්නේය. මෙහි සංස්කාර විඤ්ඤනයන්ගේ අතර එක්සන්ධියකි. වෙදනා, තෘෂ්ණා අතර එක්සන්ධියකි. භව, ජාති අතර එක්සන්ධියකි.

මෙසේ භාග්‍යවතුන්වහන්සේ සඬ්ඛ්‍යෂපසතරක් ඇති අද්ධතුනක් ඇති ආකාරවිස්සක් ඇති සන්ධිතුනක් ඇති මේ ප්‍රතීත්‍යසමුත්පාදය සියලු අයුරින් දන්නාසේක. දක්නාසේක. පිළිපදිනසේක. ඒ දැනීම යථාස්වභාවවශයෙන් ජානනාර්ථයෙන් ඥනනම. අනිත්‍යාදි ආකාරයෙන්, පිළිවිදින අර්ථයෙන් ප්‍රඥනම. **'පච්චයපරිගගහෙ පඤඤ ධම්මට්ඨිතිඤඤං'**[A]යි එහෙයින් කියනුලැබේ. භාග්‍යවතුන්වහන්සේ මේ ධම්ස්ථිතිඤ්ඤනයෙන් ඒ අවිද්‍යාදි ධර්මයන් තතුපරිදි දැන ඒ අවිද්‍යාදි ධර්මකෙරෙහි බලවත් විදර්ශනාවෙන් කළකිරෙණසේක් ආර්‍යමාර්ගයෙන් නොඇලෙනසේක් මිදෙනසේක් කියුආකාරඇති මේ සංසාරවක්‍රයෙහි අර නැසූසේක. වෙසෙසින් නැසූසේක. විද්ධවංසනය කළසේක. මෙසේද අර නැසූබැවින් රහත්හ.

භාග්‍යවතුන්වහන්සේ අග්‍රදක්ෂිණාහී බැවින්ම චීවරාදි ප්‍රත්‍යයයන්ටද සෙසු පූජාවිශේෂයන්ටද සුදුසුසේක. එහෙයින්ම තථාගතයන්වහන්සේ උපන්කල්හි යම්කිසි මහෙශාක්‍යවූ දෙවිමිනිස් කෙනෙක්වෙත්ද ඔවුහු අන්තැනක පූජා නොකෙරෙත්. ඒ එසේමය. **සහම්පති බ්‍රහ්ම**නෙමේ මහමෙර

A පටිසම්භිදාමග්ග

තරම්වූ රුවන්දමකින් තථාගතයන්වහන්සේ පිදූයේය. අන්‍යවූ දෙවියෝද මනුෂ්‍යයෝද බිම්බිසාර, කෝශල රාජාදීහුද ශක්තිපමණින් උන්වහන්සේ පිදූහ. අශොක මහරජතෙමේ පිරිනිවියාවූද භාග්‍යවතුන්වහන්සේඋදෙසා සයාතුකෙළක් ධනය වියදම්කොට සියලු දඹදිව අසූසාරදහසක් විහාර පිහිටුවාලූයේය. අන්‍යයන්ගේ පුද වෙසෙස්ගැන කවරකතාද. මෙසේ ප්‍රත්‍යයයන්ට සුදුසුබැවින්ද රහත්හ.

ලෝකයෙහි යම්කිසි පණ්ඩිතමානීවූ අඥයෝ අපකීර්තියට බියෙන් රහසිගතව යම්සේ පව්කෙරෙත්ද, එපරිද්දෙන් භාග්‍යවතුන්වහන්සේ කිසිකලෙකත් පව් නොකෙරෙතියි පව් කිරීමෙහි රහසක් නැතිබැවින් රහත්හ. මේ අරුත් ගාථාබන්ධනයෙන් සැකෙවින් මෙසේදක්වත්:

‘ආරකත්තා හතත්තා ච - කිලෙසාරීන සො මුනි
හතසංසාරචක්කාරො - පච්චයාදීන චාරහො,
න රහො කරොති පාපානි - අරහං තෙන වුච්චති’ යි

සම්මාසම්බුද්ධෝ

අවිපරීතකොට තමන්වහන්සේම සියලු ධර්මයන් අවබෝධ කළබැවින්වනාහි භාග්‍යවතුන්වහන්සේ සම්‍යක්සම්බුද්ධ වනසේක. ඒ එසේමය. මුන්වහන්සේ සියලු ධර්මයන් විපරීත නොකොට තුමූම අවබෝධ කළසේක. විශිෂ්ටඥනයෙන් දතයුතු ධර්මයන් විශිෂ්ටඥනයෙන් දතයුතුබැවින් අවබෝධ කළසේක. පිරිසිඳ දතයුතු ධර්මයන් පිරිසිඳ දතයුතුබැවින් හැරියයුතු ධර්මයන් හැරියයුතුබැවින්, සාක්ෂාත් කටයුතු ධර්මයෙන් සාක්ෂාත් කටයුතුබැවින් වැඩියයුතු ධර්මයන් වැඩියයුතුබැවින්ද විශිෂ්ටඥනයෙන් අවබෝධ කළහ. එහෙයින් සෙල බ්‍රාහ්මණයාහට තමන්වහන්සේගේ බුදුබව දක්වනසේක්,

‘අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤතං - භාවෙතබ්බඤ්ච භාවිතං,
පහාතබ්බං පහීණං මෙ - තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ’

‘බ්‍රාහ්මණ! මා විසින් මැනවින් දතයුතුවූ දුඃඛසත්‍යය මැනවින් දන්නාලදී. වැඩියයුතුවූ මාර්ගසත්‍යය වඩනලදී. ප්‍රහීණකටයුතුවූ සමුදයසත්‍යය ප්‍රහීණකරණලදී. එහෙයින් බුදුවූයෙමි වේමි’යි මෙසේ වදළසේක.

තවද, චක්ඛායතනය දුඃඛසත්‍යය ය. ඒ දුඃඛසත්‍යයට මූලකාරණ භාවයෙන් තදුතපාදකවූ පූර්භවයෙහි සිද්ධවූ තෘෂ්ණාව සමුදය සත්‍යයයි. ඒ දුඃඛසත්‍ය, සමුදයසත්‍ය දෙදෙනාගේ නොපැවැත්ම නිරොධසත්‍යයයි.

නිරොධය ප්‍රතිවෙධ කරන ප්‍රතිපදාව මාඝීසත්‍යයයි. මෙසේ එක්එක් පදය නගාලීමෙන්ද සියලු ධර්මයන් මැනවින් තුමූම අවබෝධකළහ. සොතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, මනායතනයන මොවුන් කෙරෙහිද මේ ක්‍රමයවේ. මේ ක්‍රමයෙන්ම රූපාදීවූ සවැදරුම් ආයතන, චක්ඛුවිඤ්ඤාණාදීවූ සවැදරුම් විඤ්ඤාණකාය, චක්ඛුසම්ඵස්සාදීවූ සවැදරුම් ඵස්ස, චක්ඛු සම්ඵස්සජාදීවූ සවැදරුම් වේදනා, රූපසඤ්ඤාදීවූ සවැදරුම් සඤ්ඤා, රූපසඤ්චේතනාදීවූ සවැදරුම් චේතනා, රූපතණ්හාදීවූ සවැදරුම් තණ්හාකාය, රූපවිතක්කාදීවූ සවැදරුම් විතක්ක, රූපවිචාරාදීවූ සවැදරුම් විචාර, රූපස්කන්ධාදීවූ පඤ්චස්කන්ධ, දසකසිණ, දසඅනුස්සති, උදධුමාතක සඤ්ඤාදීන්ගේ වශයෙන් දසඅඤ්ඤ, කෙසාදිවූ ද්වත්තිංසාකාරය, දවාදසායතන, අට්ඨාරසධාතු, කාමභවාදීවූ නවභව, ප්‍රථමධ්‍යානාදීවූ චතුර්විධ ධ්‍යාන, මෙත්තාභාවනාදීවූ සිවුවැදරුම්වූ අප්පමඤ්ඤ, සිවුවැදරුම්වූ අරූපසමාපත්ති, ප්‍රතිලෝම වශයෙන් ජරාමරණාදිය හා අනුලෝම වශයෙන් අවිද්‍යාදීවූ ප්‍රතීත්‍යසමුත්පාදඞ්ගද යෙදියයුතුය. එහි මේ එක් පදයක්හුගේ යෙදීමය. ජරාමරණ දුඃඛසත්‍යයය. ජාතිය සමුදයසත්‍යයය. දුඃඛසත්‍ය, සමුදයසත්‍ය දෙදෙනාගේ නිස්සරණය නිරොධසත්‍යයයි. නිරොධය ප්‍රතිවෙධ කරන ප්‍රතිපදව මාඝීසත්‍යයයි. මෙසේ එක් එක් පදය නගාලීමෙන් සියලු ධර්මයන් මනාකොට තුමූම අවබෝධකළහ. අනුරූපවශයෙන් අවබෝධකළහ. ප්‍රතිවෙධකළහ. **'සම්මා සාමඤ්ඤ සබ්බධම්මානං බුද්ධත්තා පන සම්මාසම්බුද්ධො'**යනු එහෙයින් කියනලදී.

විජ්ජාචරණසම්පන්නො

විද්‍යාවන්ගෙන්ද චරණයන්ගෙන්ද සමන්වාගතබැවින් **විජ්ජාචරණ සම්පන්නයහ.** එහි විජ්ජායි ත්‍රිවිද්‍යාවද අෂ්ටවිද්‍යාද ගැනෙත්. ත්‍රිවිද්‍යාවෝ භයභෙරව සූත්‍රයෙහිද, අෂ්ටවිද්‍යාවෝ **අම්බට්ඨ** සූත්‍රයෙහිද කියූනයින් දතයුත්තාහ. එහිවනාහි ෂට්අභිඥවන් විදර්‍ශනාඥානය හා මනොමය සෘද්ධිය හාසමග එක්කොට ගැනීමෙන් අෂ්ටවිද්‍යාව කියනලදී.

චරණ යන මෙහිලා සීලසංවර-ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා-භොජනෙ මත්තඤ්ඤුතා-ජාගරියානුයොග, සද්ධා, හිරි, ඔත්තප්ප, බාහුසච්ච, විරිය සති, පඤ්ඤ, පඨම, දුතිය, තතිය, චතුත්ථජ්ඣාන යන පසළොස්ධර්ම දතයුතුය. යම්හෙයකින් ආයර්‍ශ්‍රාවක තෙමේ මේ ධර්ම කරනකොට හැසිරේද නිවනට යේද එහෙයින් මේ පසළොස් ධර්මයෝම චරණයි කියනලදහ. ඒ මෙසේ වදළසේක. **'ඉධ මහානාම අරියසාවකො සීලවා හොති'**[A] යි එහි විස්තරයවේ. භාග්‍යවතුන්වහන්සේ මේ විද්‍යාවන්ගෙන්ද

A මජ්ඣිමනිකාය සෙඛසුත්ත

මේ වරණයෙන්ද සමන්නාගතයේක්ද, එහෙයින් **විජ්ජාචරණසම්පන්නභයි** කියනුලැබෙත්. එහි විද්‍යාසම්පද තොමෝ භාග්‍යවතුන්වහන්සේගේ සච්ඡිකාඤාණය පුරවාසිටියාය. චරණසම්පද තොමෝ මහාකාරුණිකභාවය පුරවා සිටියාය. ඒ භාග්‍යවතුන්වහන්සේ සච්ඡිකාඤාණයෙන් සියලු සත්ත්වයන් පිළිබඳ අත්ථානත්ථ දැන යම්සේ තමන්වහන්සේ විජ්ජාචරණසම්පන්න සේක්ද එසේ මහා කරුණා භාවයෙන් අනර්ථ දුරුකොට ඔවුන් අත්ථයෙහි යොදනසේක. එබැවින් මුන්වහන්සේගේ ශ්‍රාවකයෝ සුප්‍රතිපන්නවෙති. දුෂ්ප්‍රතිපන්න නොවෙති. විද්‍යාචරණවිපන්නයන්ගේ ශ්‍රාවකයෝවනාහි අත්තන්තපාදීමෙන්වෙති.

සුගතෝ

ශොභනවූ ගමන් ඇතිබැවින් සොඳුරු තැනට ගියබැවින් මනාකොට ගියබැවින් මනාතෙපුල් පවසනබැවින් **සුගත්ත.** ගමනද වනාහි ගතයි කියනුලැබේ. භාග්‍යවතුන්වහන්සේගේ ඒ ගමනද හොබනේය. පිරිසිදුය. නිවරදය. ඒ ගමන කිනම්දයත්: ආර්‍යමාර්ගයයි. මුන්වහන්සේ ඒ ආර්‍යමාර්ග ගමනින් කිසිතැනක නොලැගෙමින් නිවනට වැඩියසේකැයි ශොභනවූ ගමන්ඇතිබැවින් **සුගත්ත.** මුන්වහන්සේ අමානිවනැයි ගැණෙන සොඳුරුතැනට ගියාහු සොඳුරුතැනට ගියබැවින් **සුගත්ත.** ඒ ඒ මාර්ගයෙන් ප්‍රහීණවූ කෙලෙසුන්කරා නැවත පෙරළා නොපැමිණෙනුවෝ මැනවින් ගියහ. මෙය මෙසේ කියනලදී: **'සොතාපත්ති මග්ගෙන යෙ කිලෙසා පහීණා තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති න පච්චාගච්ඡතීති සුගතෝ -පෙ- අරහත්තමග්ගෙන යෙ කිලෙසා පහීණා, තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති න පච්චාගච්ඡතීති සුගතෝ'**[A]යි දීපඞ්කර පාදමූලයෙහිපටන් බෝමැඩදක්වා සමතිස්පැරැම් පිරීමවූ මනාපිළිවෙතින් මුළුලොවට හිතසුවම කරමින් ශාස්වත, උච්ඡද, කාමසුඛ, අත්තකිලමථයන මේ අන්තයන්ට නොපැමිණෙනුවෝ මනාකොට ගියහ. මුන්වහන්සේ මනාකොට බණන්නාහ. සුදුසුතැන සුදුසුම වචන වදරණසේකැයි මනාකොට වදරන බැවිනුදු **සුගත්ත.** එහි මේ සාධක සූත්‍රයි: **'යං තථාගතෝ වාචං ජානාති අභූතං අතච්ඡං අනත්ථසංහිතං, සා ච පරෙසං අපියා අමනාපා, තම්පි තථාගතෝ වාචං න භාසති. යඤ්ච ඛො තථාගතෝ වාචං ජානාති භූතං තච්ඡං අනත්ථසංහිතං, සා ච පරෙසං අපියා අමනාපා, තම්පි තථාගතෝ වාචං න භාසති. යඤ්ච ඛො තථාගතෝ වාචං ජානාති භූතං තච්ඡං අත්ථසංහිතං, සා ච පරෙසං අපියා අමනාපා, තත්‍ර කාලඤ්ඤූ තථාගතෝ හොති, තස්සා වාචාය වෙය්‍යාකරණාය, යං තථාගතෝ**

A පටිසම්භිදාමග්ග

වාචං ජානාති අභූතං අතච්ඡං අනත්ථසංහිතං, සා ච පරෙසං පියා මනාපා, න තං තථාගතො වාචං භාසති. යම්පි තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අනත්ථසංහිතං සා ච පරෙසං පියා මනාපා, තම්පි තථාගතො වාචං න භාසති. යඤ්ච ඛො තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අත්ථසංහිතං, සා ච පරෙසං පියා මනාපා, තත්‍ර කාලඤ්ඤූ තථාගතො හොති තස්සා වාචාය වෙය්‍යාකරණාය'[A]යනු. මෙසේ මනාකොට වදරනබැවින් **සුගත්හයි** දතයුතුය.

ලොකවිදූ

සවිප්‍රකාරයෙන් දන්නාලද ලොක ඇතිබැවින්වනාහි **ලොකවිදූහ**. ඒ භාග්‍යවතුන්වහන්සේ ස්වභාවවශයෙන් සමුදයවශයෙන් නිරොධවශයෙන් නිරොධොපායවශයෙන්යන සියලු අයුරින් ලොකය දත්සේක. විශිෂ්ටඥනයෙන් දත්සේක. ප්‍රතිවෙධ කළසේක. තදත්ථසාධනයෙහිලා මෙසේ වදළසේක.

'යත්‍ථ ඛො ආවුසො න ජායති න ජීයති න මීයති න චවති න උප්පජ්ජති නාහන්තං ගමනෙන ලොකස්සන්තං කතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදමි. න චාහං ආවුසො අප්පත්වා ලොකස්සන්තං දුක්ඛස්ස අන්තකිරියං වදමි. අපිචාහං ආවුසො ඉමස්මිංයෙව ව්‍යාමමත්තෙ කලෙබරෙ සසඤ්ඤිම්හි සමනකෙ ලොකඤ්ච පඤ්ඤපෙමි ලොකසමුදයඤ්ච ලොකනිරොධඤ්ච ලොකනිරොධගාමිනිඤ්ච පටිපදං.

ගමනෙන න පත්තබ්බො - ලොකස්සන්තං කුදාචනං,
න ච අප්පත්වා ලොකන්තං - දුක්ඛා අත්ථි පමොචනං

'තස්මා හවෙ ලොකවිදූ සුමෙධො - ලොකන්තගූ වුසිතබ්‍රහ්මචරියො,
ලොකස්ස අන්තං සමිතාවි ඤත්වා - නාසිංසතී ලොකමිමං පරඤ්ච'[B]යි

තවද සංඝකාරලොක, සත්ත්වලොක, අවකාශලොකැයි ලොකතුනෙකි. එහි **'එකො ලොකො සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා'**[C]යි ආ තන්හි සංස්කාරලොකයද, **'සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා'**[D]යි ආ තන්හි සත්වලොකයද,

'යාවතා චන්දිමසූරියා - පරිහරන්ති දිසා භන්ති විරොචනා,
තාව සහස්සධා ලොකො - එත්ථ තෙ වත්තති වසො'[E]යි

A මජ්ඣිමනිකාය-අභයරාජකුමාරසුත්ත
B දෙවපුත්ත සංයුත්ත
C පටිසම්භිදාමග්ග
D චූළමාලුඛ්‍යපුත්ත සූත්ත
E මජ්ඣිමනිකාය-බ්‍රහ්මනිමන්තනසුත්ත

ආතන්හි අවකාශලොකයද දතයුතුය. භාග්‍යවතුන්වහන්සේ සියලුඅයුරින් ඒ ත්‍රිවිධලොකය දත්සේක. ඒ එසේමය.

'එකො ලොකො සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා, ද්වෙ ලොකා නාමඤ්ච රූපඤ්ච, තයො ලොකා තිස්සො වෙදනා, චත්තාරො ලොකා චත්තාරො ආහාරා, පඤ්ච ලොකා පඤ්චුපාදානක්ඛන්ධා, ඡලොකා ඡ අජ්ඣත්තිකානි ආයතනානි, සත්ත ලොකා සත්ත විඤ්ඤාණට්ඨිතියො, අට්ඨ ලොකා අට්ඨ ලොකධම්මා, නව ලොකා නව සත්තාවාසා, දස ලොකා දසායතනානි, ද්වාදස ලොකා ද්වාදසායතනානි, අට්ඨාරස ලොකා අට්ඨාරස ධාතුයො'[A]යිආ මේ සංස්කාරලොකයද මුන්වහන්සේ විසින් සියලුඅයුරින් දන්නාලද්දේය.

යම් හෙයකින් වනාහි මුන්වහන්සේ සියලුම සත්ත්වයන්ගේ ආශය දනිත්ද අනුශය දනිත්ද චරිතය දනිත්ද අදහස දනිත්ද නුවණැසෙහි මදකෙලෙස් රජස් ඇත්තාවූද නුවණැසෙහි මහත් කෙලෙස්රජස් ඇත්තාවූද තියුණුවූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇත්තාවූද මොලොක්වූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇත්තාවූද යහපත් අදහස් ඇත්තාවූද අයහපත් අදහස් ඇත්තාවූද ධර්ම්ය සුවසේ හැඟවිය හැක්කාවූද ධර්ම්ය සුවසේ හැඟවිය නොහැක්කාවූද කර්ම්වරණාදිය නැත්තාවූද කර්ම්වරණාදිය ඇත්තාවූද සත්ත්වයන් දනිත්ද, එහෙයින් මුන්වහන්සේ විසින් සත්ත්වලොකයද සියලුඅයුරින් දන්නාලද්දේය. සත්ත්වලොකය යම්සේ දන්නාලද්දේද අවකාශ ලොකයද එසේ සියලුඅයුරින් දන්නාලද්දේය.

මේ ලොකධාතුව එක් සක්වළකි. එක් සක්වළක්වනාහි දිගින් හා පුළුලින්ද දෙළොස්ලක්ෂ තුන්දහස් සාරසියපණස් යොදුනකි. වටින්වනාහි සියලු පරිමණ්ඩලය සතිස්ලක්ෂ දසදහස් තුන්සියපණස් යොදුනකි.

ඒ සක්වළෙහි ගනකමින් මහපොළොව දෙලක්ෂ සතළිස්දහස් යොදුන් ඇත්තියයි කියනලදී.

ඒ පොළොව දරා සිටින්නාවූ ජලය ගනකමින් යොදුන් සාරලක්ෂඅසූදහසෙක වාතයෙහි පිහිටියේය.

ඒ ජලපොළොව දරාසිටින්නාවූ අහසෙහි නැගුනු වාතය නවලක්ෂ සැටදහසක් යොදුන් පමණ වන්නේය. මේ වනාහි ලොක ධාතුවේ යටින් හා උඩින් සංක්‍ෂිප්තාකාරයෙන් පිහිටීමය.

A පටිසම්භිදාමග්ග

මෙසේ සිටියාවූද මේ සක්වළෙහි පර්වතයන්ට උතුම්වූ මහාමෙරු පර්වතය සුවාසූදහසක් යොදුන් මහසයුරෙහි ගැලීසිටියේය. එපමණම මුහුදු දියෙන් මතුව නැගීසිටියේය. දිග පළලද සුවාසූදහස් සුවාසූදහස් යොදුන් පමණවේ.

ඒ මහාමේරුවෙහි යටින් හා මතුවෙන් කීපමණින් අඩඅඩ පමණින් පිළිවෙළින් ගැලී නැගී සිටියාවූ දෙවියන් පිළිබඳවූ නන්රුවනින් විසිතුරුවූ **යුගන්ධර, ඊසධර, කරවීක, සුදස්සන, නෙමින්ධර, විනතක, අස්සකණ්ණ**යන සප්තකුට පර්වත හාත්පස පිහිටියේය. මේ සප්ත මහාශෛල සිවුවරම් මහරජදරුවන්ට වාසස්ථානවිය. දෙවි යකුන් විසින් සෙවුනාලද්දේය.

හිමවත් පර්වතය යොදුන් පන්සියයක් උසය. අයම්විතරින් තුන් දහසක් යොදුන් ඇත්තේය. සුවාසූදහසක් කුළින් හෙබියේය. යම් දඹගසක්නිසා ජම්බුද්වීපයයි ප්‍රකාශකරනලද්දේද, නග නම්වූ ඒ දඹගස වටින් පසළොස්යොදුන් කඳ ඇත්තේය. උසින් පණස්යොදුන් කඳ ඇත්තේය. හාත්පසින් පණස් පණස් යොදුන් දිගඅතු ඇත්තේය. පුළුලින් සියක්යොදුන් පමණය. එහෙයින් සියක්යොදුන් පමණ පළල ඇත්තේය. දෙයාසූදහසක්යොදුන් සාගරයෙහි බැසසිටියේය. එපමණම උස්ව සිටියේය. ඒ සියලු ලොකධාතුව වටකොට මේ සක්වළගල පිහිටියේය.

එහි සඳමඩල එකුන්පණස් යොදුන් පමණවේ. හිරුමඩල පණස්යොදුන් පමණවේ. තාවතිංස භවනය දසදහස් යොදුන් පමණවේ. අසුරභවනයද අවීචි මහා නිරයද ජම්බුද්වීපයද එසේ දසදහස්දස යොදුන. අපරගොයානයද පූර්වවිදෙහයද සත්දහස් සත්දහස් යොදුන. උතුරුකුරු දිවයින අටදහස් යොදුන. මෙහි එක්එක් මහා ද්වීපයක් පන්සියයක් පන්සියයක් කොදෙව් පිරිවරකොට ඇත්තේය. ඒ සියල්ලම එක් සක්වළකි. එක් ලොකධාතුවකි. ඒ චක්‍රවාටයන් අතුරෙහි ලොකන්තරික නරකාදිලෝක වෙයි. මෙසේ භාග්‍යවතුන්වහන්සේ අනන්ත චක්‍රවාට අනන්ත ලොකධාතු අනන්ත බුද්ධඥානයෙන් දත්සේක. හැමඅතින් දත්සේක. ප්‍රතිවෙධ කළසේක. මෙසේ මුන්වහන්සේ විසින් අවකාශ ලෝකයද සියලුඅයුරින් දන්නාලද්දේය. මෙසේද සියලුඅයුරින් දන්නාලද ලෝකය ඇතිබැවින් උන්වහන්සේ **ලෝකවිදූහ.**

තමන්ගේ ගුණයන්ට වඩා අතිශය විශිෂ්ටවූ ගුණඇති කිසිවෙකු නැතිබැවින් මුන්වහන්සේට වැඩිතරම් එකෙක් නැත්තේනු'යි අනුත්තරහ. ඒ එසේමය. මුන්වහන්සේ ශීලගුණයෙනුදු සියලුලෝකය මැඩලනසේක. සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්ති ඥානදර්ශන ගුණයන්ගෙන්ද සියලු ලෝකය මැඩලනසේක. ශීල ගුණයෙනුදු තමාට සමකෙනෙකු නැතිබැවින් අසමයහ.

අසමවූ දීපඞ්කරාදීවූ පෙර බුදුවරයන්ට සමවනබැවින් අසමසමයහ. ශීලාදිගුණයෙන් තමාට උපමාකටහැකිකෙනෙකු නැතිබැවින් තමා වැනි රූ ඇතියෙකුද නැතිබැවින් තමාගේ රූබදු පිළිරූ නොකොට හැකිබැවින් අප්‍රතිමයහ. තමන් දෙසූධර්මයට පටහැනිව නැගීසිටියහැකි තැනැත්තෙකු නැතිබැවින් අප්‍රතිභාගයහ. තමන් ඉදිරියෙහි 'මම බුදුම්'යි සිටියහැකි ප්‍රතිපුද්ගලයෙකු නැතිබැවින් අප්‍රතිපුද්ගලයහ.-විමුක්තිඥානදර්ශනගුණයෙනුදු අසමයහ. අසමසමයහ. අප්‍රතිමයහ. අප්‍රතිභාගයහ. අප්‍රතිපුද්ගලයහ. **'න ඛො පනාහං භික්ඛවේ සමනුපස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ -පෙ- සදෙවමනුස්සාය අත්තනා සීලසම්පත්තතරං'**[A]යි මෙසේ වදළසේක. මේ ආදි විස්තරයයි. අග්‍රප්‍රසාදසූත්‍රාදිය. මෙසේය. **'න මෙ ආචරියො අත්ථි'**[B] යනාදීවූ ගාථාද විස්තරකටයුතුය.

දමියයුතු පුරුෂයන් මෙහෙයත්නුයි **පුරිසදම්මසාරථිහ**. දමනයකරත්, කායසමාධීන් හා යොදත්, හික්මවත්යි කියනලද්දේවේ. එහි **පුරිසදම්ම**නම් නොදමුනු දමනයට සුදුසුවූ තිරශ්චීනපුරුෂයෝද මනුෂ්‍යපුරුෂයෝද අමනුෂ්‍යපුරුෂයෝද වෙත්. ඒ එසේමය. භාග්‍යවතුන්වහන්සේ විසින් **අජ්ලාල නාගරාජ, මහොදර, චූලොදර, අග්ගිසිඛ, ධූමසිඛ, ධනපාලහත්ථි**යන මේ ආදීවූ තිරශ්චීන පුරුෂයෝද දමනය කරණුලදහ. පහවූ විෂ ඇතියාහු කරනලදහ. සරණයෙහිද සීලයෙහිද පිහිටුවනලදහ. **සච්චක, නිගණ්ඨපුත්ත, අම්බට්ඨමාණව, පොක්ඛරසාති, සොණදණ්ඩ, කූටදන්ත**යනාදීවූ මනුෂ්‍යපුරුෂයෝද, **ආලවක, සුචිලොම, ඛරලොම යක්ඛ, සක්කදෙවරාජ**යනාදීවූ අමනුෂ්‍යපුරුෂයෝද විසිතුරුවූ විනය උපායයන්ගෙන් දමනය කරනලදහ. හික්මවනලදහ. **'අහං ඛො කෙසි පුරිසදම්මෙ සණ්හෙනපි විනෙමි, එරුසෙනපි විනෙමි, සණ්හඵරුසෙනපි විනෙමි'**[C]යනාදීවූ සූත්‍රය මෙහි විස්තරකටයුතුය. නොහොත් **'අනුත්තරො පුරිසදම්මසාරථි'**යන මෙය එක්ම අර්ථපදයක්වේ. යම්සේ එක්ම පලහකින් හුන්නාහු නොගැටෙමින් අට දිශාවන්ට දුවත්ද එසේ භාග්‍යවතුන්වහන්සේ දමියයුතු පුරුෂයන් මෙහෙයවනසේක. එහෙයින් අනුත්තර පුරිසදම්මසාරථී කියනුලැබේත්. **'භත්ථිදම්මකෙන භික්ඛවේ භත්ථිදම්මො සාරිතො එකං යෙව දිසං ධාවති'**[D]යන මේ සූත්‍රයද මෙහි විස්තර කටයුතුය.

දිට්ඨධම්මික, සම්පරායික, පරමත්ථයන අර්ථයන්ගෙන් සුදුසුපරිදි අනුශාසනා කෙරෙත්නුයි **ශාස්තෘ** නම්වෙති. තවද, සත්වායෙකුවැනිනුයි

A බ්‍රහ්මසංයුත්ත
B මජ්ඣිමනිකාය අරියපරියෙසන සූත්‍ර
C චතුක්කඞ්ගුත්තර - කෙසීවග්ග
D මජ්ඣිමපණ්ණාසක

සාත්‍ථිනම් භාග්‍යවතුන්වහන්සේ සාත්‍ථිවාහයහ. යම්සේ සාත්‍ථිවාහ තෙමේ වෙණුද සමූහයා කාන්තාරයෙන් එතෙරකරවාද **චොරකන්තාරය, වාළකන්තාරය, දුබ්භික්ඛකන්තාරය, නිරුදක කන්තාරය** තරණය කරවාද නිභීය ස්ථානයට පමුණුවාද බියසහිත ස්ථානයෙන් බැහැරකරමින් තරණය කරවාද අතින් ගෙන මෙන් තරණය කරවාද නිභීයස්ථානයට පමුණුවාද එපරිද්දෙන්ම 'භාග්‍යවතුන්වහන්සේ ශාස්තෘවූසේක් සාත්‍ථිවාහවූසේක් සත්වයන් එතෙර කරවනසේක. ජාතිකන්තාරයෙන් එතෙර කරවනසේකැ'යියන මේ ආදි නිදේශ නයින්ද අත්‍ථි දතයුතුය.

'දෙවමනුස්සානං' දෙවියන්ට හා මිනිසුන්ටද මෙය උත්තරිමනුස්ස ධර්මාරාධනයෙන් හා හව්‍යපුද්ගල පරිවේඡදවශයෙන් හා භව්‍යපුද්ගල පරිවේඡදවශයෙන් කියනලද්දේය. භාග්‍යවතුන්වහන්සේවනාහි තිරිසන් ගියවුන්ටද අනුශාසනා දීමෙන් ශාස්තෘසේක්මය. ඔවුහුද භාග්‍යවතුන්වහන්සේගේ දහම් ඇසීමෙන් උපනිශ්‍රය සම්පත්තියට පැමිණ ඒ උපනිශ්‍රය සම්පත්තියෙන්ම දෙවන හෝ තෙවන අත්බැවිහි මගඵල ලබන්නෝ වෙත්. මණ්ඩුක දිව්‍යපුත්‍රාදීහු මෙහි නිදසුන්වෙයි.

භාග්‍යවතුන්වහන්සේ **ගඟගරා**නම් පොකුණුඉවුරෙහි **චම්පා** නුවරවැසියන්ට ධර්මදේශනා කරනකල්හි එක් මැඩියෙක් උන්වහන්සේගේ ස්වරයෙහි නිමිති ගත්තේය. එහි එක් වසුපල්ලෙක් දඩුයෙහි එල්බසිටිනුයේ ඒ මැඩියාගේ හිස දඩුවෙන් ඔබාගෙන සිටියේය. ඒ මැඩියා ඒ වේලෙහිම කලුරියකොට තාවතිංසභවනයෙහි දෙළොස්යොදුන් පමණවූ රන්විමනක නිදපිබිදියෙකුමෙන් උපන්නේය. එහි දෙවහනන් සමූහයෙන් පිරිවරුනු තමන් දක 'එම්බල! මමද මෙහි උපන්මි, කිනම් කර්මයක් කෙළෙම්දෝ' හෝයි ආවර්ජනාකරණුයේ භාග්‍යවතුන්වහන්සේගේ ස්වරයෙහි නිමිති ගැනීම හැර තමන්කළ අන්කිසිදු කර්මයක් නොදුටුයේය. එකෙණෙහිම ඒ දිව්‍යපුත්‍ර තෙමේ විමානය සමග අවුත් භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීපාදයෙහි හිස තබා වැඳසිටියේය. එකල්හි භාග්‍යවතුන්වහන්සේ දන්නා සේක්ම 'සෘද්ධියෙන් හා පිරිවරින් දිලිසෙමින් ඉතා කාන්තිමත්වූ සිව්පැහැයෙන් සියලුදිග් බබුළුවමින් කවරෙක් මාගේ පාවඳීද'යි විචාළසේක. භාග්‍යවතුන්වහන්සේ විසින් විචාළ ඒ දිව්‍යපුත්‍ර තෙමේ 'මම පෙර මැඩියෙක්වීමි, දියෙහි දියම ගොදුරුකොට ඇතියෙමි වීමි, ඔබවහන්සේගේ ධර්ම අසාසිටියදී වසුපල්ලෙක් මා මැරිය'[A] යි කියා සිටියේය. භාග්‍යවතුන්වහන්සේ ඔහුට ධර්මදේශනා කළසේක. ධර්මදේශනාව අවසානයෙහි අසූසාරදහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය

A මණ්ඩුකදෙවපුත්තවිමාන

වූයේය. දිව්‍යපුත්‍ර තෙමේද සොතාපත්තිඵලයෙහි පිහිටාගෙන සිනහ පහළකොට එතැනින් නික්මගියේය.

දතයුතු යම්කිසිවක් ඇත්තේනම් ඒ සියල්ල අවබෝධ කළබැවින් විමොක්ෂාන්තිකඥනවශයෙන් බුද්ධනම් වනසේක. යම්හෙයකින් හෝ චතුසත්‍යය තුමූත් අවබෝධ කළසේක්ද අන්සතුන්හටත් අවබෝධ කරවූසේක්ද එහෙයින් මේ ආදි කරුණෙනුදු බුද්ධ වනසේක. මේ අර්ථයම දක්වනුපිණිස **'බුජ්ඣිතා සච්චානීති බුද්ධා බොධෙතා පජායාති බුද්ධා'**[A]යි පැවති සියලුම නිර්දේශය හෝ ප්‍රතිසමහිදනය හෝ විස්තර කටයුතුය.

'භගවා'යන මේ පදය ශීලාදි ගුණයන්ගෙන් විශිෂ්ටවූ සියලු සත්වයන් අතුරෙහි උතුම්වූ සියලු සත්වයන්ට ගුරුවූ භාග්‍යවතුන්වහන්සේට ගෞරවවශයෙන් කියනුලබන්නේය. එහෙයින් පුරාතනයෝ:-

'භගවාති වචනං සෙට්ඨං භගවාති වචනමුත්තමං,
ගරුගාරවයුත්තෝ සෝ භගවා තෙන වුච්චති'යි

භගවායන වචනය ශ්‍රෙෂ්ඨවාචකය. භගවායන වචනය උත්තමාර්ථවාචකය. ගරු ගුණයෙන් යුක්තබැවින් අතිශය ගෞරවයට සුදුසුය. එහෙයින් **භගවා**යි කියනුලැබේ.

නාමයවනාහි ආවත්ථික, ලිඩ්ගික, නෙමිත්තික, අධිවචසමුප්පන්නයි සිවුවැදෑරුම්වේ. අධිවචසමුප්පන්න නාමයනම් ලොකව්‍යවහාරවශයෙන් යදිච්ඡකයි කියනලද්දේය. එහි වච්ඡ, දම්ම, බලීවද්දයන මේආදිය ඒ ඒ අවස්ථා ගෙන පැනවූබැවින් ආවත්ථිකනම්. දණ්ඩි, ඡත්තී, සිඛී, කරීයන මේ ආදිය ඒ ඒ ලක්ඛණ ගෙන පැණවූබැවින් ලිඩ්ගිකනම්. තෙවිජ්ජ, ඡළභිඤ්ඤයන මේ ආදිය ඒ ඒ නිමිත්තිගෙන පැනවුබැවින් නෙමිත්තිකනම්. සිරිවඩ්ඪක, ධනවඩ්ඪකයන මේ ආදිය වචනාර්ථ නොසලකා පැනවූබැවින් අධිවචසමුප්පන්නනම්. භගවායන මේ නාමපදය තෙමිත්තකනම්. මෙය මහාමායා දේවියවිසින් සුද්ධොදන මහරජුවිසින් අසූදහසක් නැකුලයන් විසින් ශක්‍රයනතුෂිතාදිවූ දෙවතාවිශේෂයන්විසින් තබනලද්දේ නොවේ. ධම්සෙනාපතිහු විසින් මෙය කියනලද්දේය. **'භගවාති නෙතං නාමං මාතරා කතං -පෙ- විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤණස්ස පටිලාභා සහජිකා පඤ්ඤත්ති, යදිදං භගවා'**[B]යි යම්හෙයකින් මේ නාමය ගුණ නෙමිත්තික නාමයක්වේද, ඒ ගුණ පවසනුපිණිස මේ ගාථාව කියත්.

A සාරීපුත්තනිද්දෙස B තිස්සමෙත්තෙය්‍ය සුත්තනිද්දෙස

'භගී හජී භාගි විභත්තවා ඉති
අකාසි භගඝන්ති ගරුති භාග්‍යවා,
බහූහි කාරණෙහි සුභාවිතත්තනෝ
භවන්තගෝ සෝ භගවාති වුච්චති'

ඒ භාග්‍යවත්තෙමේ ඓශ්වර්‍යාදිභෙදඇති වාසනා ධර්‍මඇත්තේ, ප්‍රාන්තසයනාසනාදිය සෙවුනේ, අර්‍ථ, ධර්‍ම විමුක්තිරසභාගඇත්තේ, ලෞකික ලොකොත්තර ධර්‍මවිභාග කෙළේ, රාගාදීන් බිඳහැරියේ, කායභාවනාදි අනෙකවිධ භාවනා ක්‍රමයෙන් මනාකොට වැඩූ සිත් ඇත්තේ, භවයෙහි කෙළවරට ගියේ භගවත්හි කියනුලැබේ. නිර්දේශයෙහි කියූ ක්‍රමයෙන්ම ඒ ඒ පදයන්ගේ අර්‍ථ දතයුතුය. මේ අනික් ක්‍රමයක් වේ:-

'භාග්‍යවා භඤ්ඤා යුත්තෝ - භගෙහි ච විභත්තවා,
භත්තවා වන්තගමනෝ - භවෙසු භගවා තතෝ' යනු

යම්හෙයකින් භාග්‍ය ඇත්තේද රාගාදි කෙලශයන් බිඳහළේද භග ධර්‍මයන්ගෙන් යුක්තවූයේද මාර්‍ගඵලාදී ආර්‍යධර්‍මරත්නය විභාගකෙළේද අර්‍ථ ධර්‍ම, විමුක්තිරස, සෙවනය කෙළේද භවයෙහි වැමෑරූ තෘෂ්ණා ගමන් ඇත්තේද එහෙයින් භගවත්නම්වේ.

එහි **'වණ්ණාගමෝ වණ්ණවිපරියයෝ'** යනු විසින් මේ නිරුක්තිලක්ෂණ ගෙන ශබ්දනයින් හෝ පාෂොදරාදි ශබ්දයන් කෙරෙහි ප්‍රක්ෂෙප ලක්ෂණ ගෙන යම්හෙයකින් ලොවිලොවුතුරා සැප නිපදවන්නාවූ දානශීලාදීන්ගේ පාරමීභාවයට පැමිණි භාග්‍යය මුන්වහන්සේට ඇත්තේද එහෙයින් භාග්‍යවා කියයුතුතන්හි භගවායි කියනුලැබේයයි දතයුතුය. යම්හෙයකින් ලොභ, දෙස, මොහ, විපරීත, මනසිකාර, අහිරිකානොත්තප්ප, කොධ, උපනාහ, මක්ඛ, පලාස, ඉස්සා, මච්ඡරිය මායා, සාඨෙය්‍ය ථම්භ, සාරම්භ මාන, අතිමාන, මද, ප්‍රමාද, තණ්හා, අවිජ්ජා, තිවිධ අකුසලමූල දුච්චරිත සඞ්කිලෙසමල විසමසඤ්ඤ විතක්ක පපඤ්ච වතුබ්බිධ විපරියෙස ආසව ගන්ථ ඔඝ යොග අගති තණ්හුප්පාද උපාදන පඤ්චවෙතොඛීල විනිබන්ධ නීවරණ අභිනන්දන ඡව්විවාදමූල තණ්හාකාය සත්තානුසය අට්ඨම්බිච්ඡත්ත නවතණ්හාමූලක දසඅකුසලකම්මපථ දාවාසට්ඨිදිට්ඨිගත අට්ඨසතතණ්හාවිචරිත හෙදඇති සියලු සත්වයන්ට දරථපරිදාහකරවූ නොයෙක් ක්ලේශ ශතසහස්‍රයන් බිඳහළසේක්ද සඞ්ඛෂපවිසින් හෝ කිලෙස බන්ධ අභිසඞ්ඛාර මච්චු දෙවපුත්ත මාරයන පස්මරුන් බිඳහළ සේක්ද, එහෙයින් මේ කෙලෙස් උවදුරු බිඳහළබැවින් භගවායි කියයුතු තන්හි භගවායි කියනුලැබේ. මෙහිලා මෙසේද කීහ.

‘භග්ගරාගෝ භග්ගදෙසෝ - භග්ගමොහෝ අනාසවෝ,
භග්ගාසස්ස පාපකා ධම්මා - භගවා තෙන වුච්චති’යි

යම්හෙයකින් බිඳහළ රාග ඇත්තේද බිඳහළ ද්වේෂ ඇත්තේද බිඳහළ මොහ ඇත්තේද ආස්‍රව රහිතද මුන්වහන්සේ විසින් සියලුපාපධම් බිඳහරින ලද්දේද එහෙයින් භගවායි කියනුලැබේ.

භාග්‍යවත්බැවින් ශතපුණ්‍යලක්ෂණධරවූ මුන්වහන්සේගේ රූපකාය සම්පත්තිය දක්වනලද්දීය. බිඳහළ ද්වේෂ ඇතිබැවින් ධම්කාය සම්පත්තියද එසේ ලෞකික පරීක්ෂකයන්විසින් බුහුමන් කරණුලබනබවද, ගිහි පැවිද්දන් විසින් එළඹිය යුතුබවද, වෙත එළඹියාවූ ඔවුන්ගේ කය සිත පිළිබඳ දුක් දුරුකිරීමෙහි පොහොසත් බවද ආමිෂදන ධම්දනයෙන් ගිහි පැවිද්දන්ට උපකාරබවද ලෞකික ලෝකෝත්තර සුඛයන් හා යෙදීමෙහි පොහොසත් බවද දක්වනලදහ.

යම්හෙයකින් ලොකයෙහි භග ශබ්දය ඓශ්වර්‍ය්‍ය, ධම්, යශස්, කාම, සිරි, ප්‍රයත්නයන සයවැදෑරුම් අර්ථයෙහි පවත්නේද මුන්වහන්සේගේ සියසිත්හි උත්කෘෂ්ටවූ ඓශ්වර්‍යය ඇත්තේද ලෞකිකයන්විසින් සම්මතවූ අණිමා, ලඝිමායනාදීවූ ඓශ්වර්‍ය්‍යය හෝ හැමතින් පිරිපුන්ව ඇත්තේද එසේ ලෝකෝත්තර ධම්යද ඇත්තේය. තුන්ලොව පතළාවූ යථාභූතගුණයෙන් ලැබූ ඉතා පිරිසිදුවූ යශස රූපකාය දර්‍ශනයෙහි ව්‍යාවෘත මහාජනයාගේ ඇසට හා සිතට ප්‍රසාද එළවීමෙහි සමර්ථවූ සියලුඅතින් පිරිපුන්වූ සියලු අහපසහ පිළිබඳ ශොභාව මුන්වහන්සේ විසින් තමහට හිතවූ හෝ අන්හට හිතවූ යම් යම් අර්ථයක් කැමතිවනලද්දේද පතන ලද්දේද ඒ ඒ ආත්මහිතය පරහිතය එපරිද්දෙන්ම නිපන්බැවින් කැමතිදය නිපදවීමැයි හඳුන්වනලද කාමය සියලුලෝකයාගේ ගුරුබවට කරුණුවූ සම්‍යග්ව්‍යායාම නම්වූ ප්‍රයත්නය ඇත්තේද එහෙයින් මේ ඓශ්වර්‍ය්‍යාදීවූ භගධම්යන්ගෙන් යුක්තබැවින්ද මුන්වහන්සේට භගධම් වේනුයි යනඅර්ථයෙන් භගවායි කියනුලැබෙත්.

යම්හෙයකින් දුකතිකපද සඞ්ගෘහිතවූ කුශලාදි ප්‍රභෙදවශයෙන් සියලුධම්යන් බඳ, ආයතන ධාතු, සච්ච, ඉන්‍ද්‍රිය, පටිච්චසමුප්පාද යනාදීවූ භෙදයෙන් හෝ කුශල ධම්යන් දුඃඛාර්‍ය්‍ය සත්‍යය පීඩන, සඞ්ඛත, සන්තාප, විපරිනාමයන් අර්ථවශයෙන් හෝ සමුදයාර්‍ය්‍යසත්‍යය ආයූහන, නිදන, සංයොග, පළිබොධයන අර්ථවශයෙන් හෝ නිරොධාර්‍ය්‍යසත්‍යය නිස්සරණ, විවෙක, අසංඛත, අමතයන අර්ථවශයෙන් හෝ මාර්ගාර්‍ය්‍යසත්‍යයය නීයාණික, හෙතු, දස්සන, ආධිපතෙය්‍යයන අර්ථවශයෙන් හෝ බෙදූසේක්ද

බෙද විවරණයකොට දේශනා කළසේක්ද එහෙයින් විභත්තවායි කියයුතු තන්හි භගවායි කියනුලැබෙත්.

යම්හෙයකින් මුන්වහන්සේ දිව්‍ය, බ්‍රහ්ම, ආර්‍ය්‍ය, විහරණයන්, කාය, චිත්ත, උපධි විවේකයන් සුඤ්ඤත, අප්පණිහිත, අනිමිත්ත, විමොක්ෂයන්, අන්‍යවූද ලෞකිකලෝකෝත්තරාභිඥාවූ උත්තරි මනුෂ්‍යධර්මයන් හජනය කළසේක්ද සෙවනය කළසේක්ද බහුල කළසේක්ද එහෙයින් හත්තවා යි කියයුතු තන්හි භගවායි කියනුලැබෙත්.

යම්හෙයකින් මුන්වහන්සේ විසින් භවත්‍රයෙහි තෘෂ්ණාසඞ්ඛ්‍යාත ගමන ආර්‍ය්‍යමාර්ග මුඛයෙන් වමනය කරනලද්දේද එහෙයින් භවෙඵු වන්තගමනොයි කියයුතුතන්හි භව ශබ්දයෙන් 'භ' කාරය ගමන ශබ්දයෙන් 'ග' කාරය වන්ත ශබ්දයෙන් 'ව' කාරයද දිඞ්කොට ගෙන යම්සේ ලෝකයෙහි **'මෙහනස්ස ඛස්ස මාලා'යි** කියයුතු තන්හි 'මෙඛලා'යි කියනුලැබේද එසේ භගවායි කියනුලැබෙත්.

'සො ඉමං ලොකං' ඒ භාග්‍යවතුන්වහන්සේ මේ ලොකය, දන් කියයුත්ත මෙසේ දක්වාලන්නේය. **'සදෙවකං'** දෙවියන් සමග පවත්නේ **සදෙවක**ය. මෙසේ මාරයා සමග පවත්නේ **සමාරක**ය. බඹහු සමග පවත්නේ **සබ්‍රහ්මක**ය. මහණබමුණන් සමග පවත්නේ **සස්සමණ බ්‍රාහ්මණ**ය. කම්කෙලෙස් උපන්බැවින් පජානම්. ඒ **ප්‍රජා**ය. දෙවිමිනිසුන් සමග පවත්නේ **සදෙව මනුස්ස**ය. එහි සදෙවක වචනයෙන් වශවර්ති දෙවියන් හැර පඤ්චකාමාවචර දෙවියන්ගේ ගැනීම, සමාරක වචනයෙන් සවන කාමාවචර දෙවියන්ගේ ගැනීම, සබ්‍රහ්මක වචනයෙන් ප්‍රථමධ්‍යානභූමික බ්‍රහ්මයන්ආදිකොට ආරූප්පය කෙළවරකොටසිටි බ්‍රහ්මයන්ගේ ගැනීම, සස්සමණ බ්‍රාහ්මණි වචනයෙන් සසුනට පසමිතුරුවූ ශ්‍රමණබ්‍රාහ්මණයන්ගේ හා සන්සිඳවූ පවිඇති මහණබමුණන්ගේ ගැනීමද පජා වචනයෙන් සත්වලොකය ගැනීම, සදෙවමනුස්ස වචනයෙන් සම්මුති දෙවියන්ගේ හා අවශෙෂ මනුෂ්‍යයන්ගේ ගැනීම දතයුතුය. මෙහි මෙසේ **'සදෙවකං, සමාරකං, සබ්‍රහ්මකං'** යන තෙපදයෙන් අවකාශ ලොකයද **'සස්සමණබ්‍රාහ්මණං, සදෙවමනුස්සං'** යන දෙපදයෙන් ප්‍රජා වශයෙන් සත්වලොකයද ගන්නාලදයි දතයුත්තේය.

මෙහි අන් ක්‍රමයක් වේ: සදෙවක ග්‍රහණයෙන් අරූපාවචරලොක, සමාරක ග්‍රහණයෙන් ෂඩ්විධ කාමාවචරදෙවලොක, සබ්‍රහ්මක ග්‍රහණයෙන් රූපී බ්‍රහ්මලොක, සස්සමණ බ්‍රාහ්මණාදි ග්‍රහණයෙන් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණයන සිවුපිරිස්වශයෙන් සම්මුතිදෙවියන් සමග මනුෂ්‍යලොකය හෝ අවශේෂ සියලුසත්වලොකය ගන්නාලදහ.

තවද මෙහි සදෙවක වචනයෙන් උසස් පිරිසිදීමෙන් සියලුසත්ත්ව ලොකයම ප්‍රත්‍යක්ෂ කළබව අස්වමින් ඒ භාග්‍යවතුන්වහන්සේගේ කීර්ති ශබ්දය උස්ව පැනනැංගේය. ඒ හේතුවෙන් මරු මහත් ආනුභාව ඇත්තේය, ෂඩ්විධ කාමාවචරයට ඊශ්වරවූයේ අන්හු තමවශයෙහි පවත්වන්නේය, ඒ මාරතෙමේත් කිම? මේ භාග්‍යවතුන්වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂ කරනලද්දේදැයි යම්කෙනෙකුන්හට අදහසක් වන්නේනම් ඔවුන්ගේ විමතිය විද්ධවංසනය කරමින් මාරයා සහිත අවශේෂ ලෝකය යටපත්කරමින් ඒ කීර්තිශබ්දය උස්ව පැනනැංගේය.

තවද, 'බ්‍රහ්මතෙමේ මහත් ආනුභාව ඇත්තේය, එකැහිල්ලෙන් එක් සක්වළ දහසෙක්හි ආලොකය පතුරුවා හරින්නේය. දෙයැගිල්ලෙන් -පෙ- දසැගිල්ලෙන් දසදහසක් සක්වළ ආලොකය පතුරුවා හරින්නේය, නිරුත්තරවූ ධ්‍යානසමාපත්ති සුඛයද විඳින්නේය, කිම? ඒ බ්‍රහ්මතෙමේත් මේ භාග්‍යවතුන්වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂකරන ලද්දේද'යි යම්කෙනෙකුන්හට විමතියක් වන්නීනම් ඔවුන්ගේ විමතිය විද්ධවංසනයකරමින් බ්‍රහ්මයා සහිත අවශේෂ ලෝකය යටපත්කරමින් ඒ කීර්තිශබ්දය උස්ව පැනනැංගේය.

අනතුරුව 'සසුනට සතුරුවූ බොහෝ මහණබමුණෝ වෙත්ද කිම? ඒ මහණබමුණෝත් ප්‍රත්‍යක්ෂකරන ලද්දහුද'යි යම්කෙනෙකුන්හට විමතියක් වන්නී නම් ඔවුන්ගේ විමතිය විද්ධවංසනය කරමින් සසුනට සතුරුවූ මහණ බමුණන් හා සන්සිඳවූ පවි ඇති මහණ බමුණන් සහිත අවශේෂ ලෝකය යටපත් කරමින් ඒ කීර්තිශබ්දය උස්ව පැනනැංගේය.

මෙසේ උත්කෘෂ්ටොත්කෘෂ්ටයන් ප්‍රත්‍යක්ෂ කළබව ප්‍රකාශකොට නැවත සම්මුතිදෙවියන් හා අවශේෂමනුෂ්‍යයන්ද ගෙන උත්කෘෂ්ටපරිවේෂදවශයෙන් සෙසු සත්වලොකය ප්‍රත්‍යක්ෂ කළබව පවසනුයේ දෙවිමිනිසුන් සහිතවූ ලෝකය යටපත් කරමින් ඒ කීර්තිශබ්දය උස්ව පැනනැංගේය. මේ මෙහි අනුසන්ධික්‍රමයවේ. අතීපදයන්ගේ ගැළපීමය.

'සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදෙති' මෙහි **'සයං'** තෙමේ අන්හුවිසින් දැනගත යුත්තෙක්ව **'අභිඤ්ඤා'** මැනවින් දැන අධික ඥානයෙන් දැන යනඅර්ථයි. **'සච්ඡිකත්වා'** ප්‍රත්‍යක්ෂකොට. මේ පදයෙන් අනුමානාදියෙන් දැනීම ප්‍රතික්ෂෙපකරනලද්දේවේ. **'පවේදෙති'** අවබොධකරයි. දන්වයි; ප්‍රකාශකරයි. **'සො ධම්මං දෙසෙති ආදි -පෙ- පරියොසාන කල්‍යාණං'** ඒ භාග්‍යවතුන්වහන්සේ සත්වයන් කෙරෙහිවූ කරුණාභාවයනිසා නිරුත්තරවූ ඵලසමාපත්තිසුඛය හැරපියා දහම් දෙසනසේක. එදවනාහි

උදඝටිතඤ්ඤයන්ගේවශයෙන් ස්වල්පකොට හෝ විපචිතඤ්ඤයන්ගේවශයෙන් බොහෝකොට දෙසනසේක් ආදි කල්‍යාණ ප්‍රකාරයෙන්ම දෙසනසේක.

කෙසේදයත්: පයඃාප්තිධර්මය තමා හැමඅතින් යහපත්බැවින් එක් ගාථාවකුදු ප්‍රථම පාදයෙන් ආදිකල්‍යාණය. ද්විතීය, තෘතීය පාදයන්ගෙන් මධ්‍යෙකල්‍යාණය. පශ්චිම පාදයෙන් පයඃවසාන කල්‍යාණය. එක් අනුසන්ධියක් ඇති සූත්‍රය නිදනයෙන් ආදිකල්‍යාණය. නිගමනයෙන් පයඃවසානකල්‍යාණය. සෙස්සෙන් මදෙධ්‍යකල්‍යාණය. නොයෙක් අනුසන්ධිඇති සූත්‍රය ප්‍රථම අනුසන්ධියෙන් ආදිකල්‍යාණය. පශ්චිම අනුසන්ධියෙන් පයඃවසානකල්‍යාණය. සෙසු අනුසන්ධීන්ගෙන් මධ්‍යෙකල්‍යාණය. 'සබ්බපාපස්‍ස අකරණං, එතං බුද්ධාන සාසනං'යි මෙසේ වදළ ශාස්තෘශාසනය පවසන සියලුම පයඃාප්තිධර්ම තෙමේ තමාගේ ආත්මභූතවූ ශීලයෙන් ආදිකල්‍යාණය. ශමථවිදර්‍ශනා මාර්‍ගඵලයන්ගෙන් මධ්‍යෙකල්‍යාණය. නිර්‍වාණයෙන් පයඃවසානකල්‍යාණය. ශීලසමාධීන්ගෙන් හෝ ආදිකල්‍යාණය. ශමථ, විදර්‍ශනා, මාර්‍ගයන්ගෙන් මධ්‍යෙකල්‍යාණය. සොපාදිශේෂඵල නිර්‍වාණයෙන් පයඃවසානකල්‍යාණය. බුදුරජුන්ගේ සම්බුද්ධත්වයෙන් හෝ ආදිකල්‍යාණය. ධර්‍මයාගේ සුධර්‍මත්වයෙන් මධ්‍යෙකල්‍යාණය. ඒ ශාසනධර්‍මය අසා බුදුරජානනන්වහන්සේවිසින් යථාස්වභාවවූ ධර්‍මයක් දේශනාකරනලද්දේද ඒ තථාස්වභාවයපිණිස පිළිපන්නහු විසින් අවබෝධ කටයුතුවූ සම්‍යක් සම්බෝධයෙන් හෝ ආදිකල්‍යාණය. ප්‍රත්‍යෙකබෝධියෙන් මධ්‍යෙකල්‍යාණය. ශ්‍රාවකබෝධියෙන් පයඃවසානකල්‍යාණය. අසනුලබන මේ ශාසනධර්‍මය තෙමේ විමුක්තායතන ශීර්‍ෂයෙහි සිට අසන්නහුගේ නීවරණයන් යටපත්වනබැවින් ඇසීමෙනුදු යහපතක්ම එළවානුයි ආදිකල්‍යාණය. පිළිපදිනුලබන ශාසනධර්‍මය ශමථ, විදර්‍ශනා සුඛ එළවනබැවින් ප්‍රතිපත්තියෙනුදු යහපතක්ම එළවානුයි මධ්‍යෙකල්‍යාණය. ශමථ, විදර්‍ශනා සුඛය යම්සේ එළවානම් එසේ පිළිපන් ශාසන ධර්‍මය ප්‍රතිපත්තිඵලය නිමිකල්හි ෂඩඩෙඟාපෙක්‍ෂාවශයෙන් ඉෂ්ටානිෂ්ටාදියෙහි නොසැලෙනබව එළවනබැවින් ප්‍රතිපත්තිඵලයෙන්ද යහපතක්ම එළවානුයි පයඃවසානකල්‍යාණය. ශාසනධර්‍මය නාථප්‍රභවබැවින්ද ප්‍රභව ශුද්ධියෙන් ආදිකල්‍යාණය. නිරුපක්ලෙශතාව නෛර්‍යාණිකභාව යන අර්‍ථශුද්ධියෙන් මධ්‍යෙකල්‍යාණය. කෘත්‍යශුද්ධියෙන් පයඃවසානකල්‍යාණය. එහෙයින් මේ භාග්‍යවතුන්වහන්සේ ස්වල්පකොට හෝ බොහෝකොට ධර්‍මදේශනාකරනසේක් ආදිකල්‍යාණාදිප්‍රකාරයෙන්ම ධර්‍මදේශනාකරනසේකැයි දතයුතුය.

'සාත්‍ථං සබ්‍යඤ්ජනං' යන මේආදි තන්හිවනාහි යම්හෙයකින් මේ ත්‍රිවිධ කල්‍යාණධර්‍මය දේශනාකරනසේක් ශාසනබ්‍රහ්මචර්‍යය හා

මාගීබ්‍රහ්මචය්‍යස්ස ප්‍රකාශකරණසේක්ද නොයෙක් නයින් දක්වනසේක්ද ඒ දෙවැදෑරුම්වූ බ්‍රහ්මචය්‍යස්ස සුදුසුපරිදි අත්ථසම්පත්තියෙන් සාත්ථවේ. බ්‍යඤ්ජන සම්පත්තියෙන් සබ්‍යඤ්ජන වේ. සඩ්කාසන, පකාසන, විවරණ, විභජන, උත්තානීකරණ, පඤ්ඤත්තියන අත්ථ පදයන්ගේ සමායොගයෙන් සාත්ථද, අක්ඛර, පද, බ්‍යඤ්ජන, ආකාර, නිරුත්ති නිද්දෙස සම්පත්තියෙන් සබ්‍යඤ්ජනද, අත්ථගම්භීරතා ප්‍රතිවෙධ ගම්භීරතාවෙන් සාත්ථද, ධම්මගම්භීරතා දේශනාගම්භීරතාවෙන් සබ්‍යඤ්ජනද, අත්ථගම්භීරතා ප්‍රතිවෙධ ගම්භීරතාවෙන් සාත්ථද, ධම්මගම්භීරතා දේශනාගම්භීරතාවෙන් සබ්‍යඤ්ජනද, අත්ථ, ප්‍රතිභාණ ප්‍රතිසම්භිදාවන් විෂයකොට සිටිබැවින් සබ්‍යඤ්ජනද, නුවණැත්තන් විසින් දතයුතුබැවින් පරිඤ්ඤකයන්ට ප්‍රසාදය එළවානුයි සාත්ථද, ඇදහියයුතුබැවින් ලෞකිකජනයන්ට ප්‍රසාදය එළවානුයි සබ්‍යඤ්ජනද, ගැඹුරු අදහස් ඇතිබැවින් සාත්ථද, නොගැඹුරුපද ඇතිබැවින් සබ්‍යඤ්ජනදවේ.

එළවියයුතු බහාලියයුතු අත්ථ නැතිබැවින් සියල්ලෙන් පිරිපුන්බැවින් **කෙවලපරිපුණ්ණය**. බැහැර කළයුතු සංකෙලශධම්මයන්ගේ අභාවයෙන්වූ නිදෙස් බැවින් **පරිසුද්ධය**. ශික්ඛාත්‍රයෙන් පරිගෘහීතවූබැවින් ශ්‍රෙෂ්ඨාත්ථයෙන් බ්‍රහ්මවූ බුද්ධාදිශ්‍රෙෂ්ඨයන් විසින් හැසිරියයුතු බැවින් ඒ බුද්ධාදි ශ්‍රෙෂ්ඨයන්ගේ වය්‍යාබැවින් **බ්‍රහ්මචරිය**ය. එහෙයින් **'සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරිය'ං පකාසෙති'**යි කියනුලැබේ.

තවද, යම්හෙයකින් යටකියූ ලක්ඛණයෙන් නිදන සහිතව අත්ථොත්පත්ති සහිතව දේශනාකරණසේක් ආදිකල්‍යාණයෙන් යුක්තව දේශනාකරණසේක්ද, විනෙයජනයාගේ වය්‍යාදීන්ට අනුරූපවශයෙන් දේශනාකරණලද ශීලාදි අත්ථයන්ගේ අවිපරීත භාවයෙන් හා හෙතුදහරණයෙන් යුක්තබැවින්ද මදෙධ්‍යකල්‍යාණයෙන් යුක්තව දේශනාකරනසේක්ද තථාගතයන්වහන්සේ කෙරෙහි අසන්නවුන්ගේ ශ්‍රද්ධාප්‍රතිලාභයෙන් හා පෙරකියූ නිගමනයෙන්ද පය්‍යවසාන කල්‍යාණයෙන් යුක්තව දේශනාකරනසේක්ද මෙසේ දේශනා කරන්නාහුද පිරිසිදුවූ බ්‍රහ්මචය්‍යස්ස දේශනාකරනසේක. හෙද ශීලවිශුද්ධි ආදී සම්‍යක්ප්‍රතිපත්තියෙන් සත්‍යසම්ප්‍රතිවෙධවශයෙන් අධිගමයාගේ ප්‍රකටභාවයෙන් සාත්ථවේ. පය්‍යාප්ති ධම්මයෙහි පරිවයෙන් සිද්ධවූ බහුශ්‍රැතභාවය පිළිබඳ ව්‍යක්තභාවයෙන් සබ්‍යඤ්ජනවේ. ශීලාදීවූ පස්වැදෑරුම් ධම්ස්කන්ධයෙන් යුක්තබැවින්, නොතොරබැවින් කේවලපරිපුණ්ණවේ. දෘෂ්ටි මානාදි උපක්‍රෙලශ රහිතබැවින්ද දුක් එතෙරකිරීමපිණිස පවත්නාබැවින්ද ලොකාමිෂයෙහි බලාපොරොත්තු රහිතබැවින්ද පරිසුද්ධවේ. ශ්‍රේෂ්ඨාත්ථයෙන්

බ්‍රහ්ම භූත බුදුට ප්‍රත්‍යෙක බුද්ධ බුද්ධශ්‍රාවකයන්ගේ චර්‍යාව (ස්වභාවය) බ්‍රහ්මචර්‍යායි කියනුලැබේද එහෙයිනුදු **'සො ධම්මං දෙසෙති ආදි කල්‍යාණං -පෙ- බ්‍රහ්මචරියං පකාසෙති'**යි කියනුලැබේ.

'සාධු කො පන' මනහරමය. මෙලොව පරලොවහිත හා නිවන්හිත එළවන්නේය. මෙ කියූ ත්‍රිවිධ සුඛය එළවන්නේයයි කියනලද්දේවේ. **'කථාරූපානං අරහතං'** ඒ භවත් ගෞතමයන්වහන්සේ යම්බඳු වේද්‍ය, එබඳුවූ යථාභූත ගුණාවබොධයෙන් ලොකයෙහි රහත්හයි ලැබූ ශබ්දඇති රහතුන්ගේ **'දස්සනං හොති'** ප්‍රසාදයෙන් සෞම්‍යවූ ඇස් දල්වා දකිම්පමණද යහපත් වේයයි මෙසේ අදහස්කොට **'අථ කො වෙරඤ්ජා බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි'**යනුකීහ.

'යෙන' යනු සප්තමීවිභක්ත්‍යර්ථයෙහි කරණවචනයි. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ යම්තැනක විසූසේක්ද එහි එළඹියේයයි මෙසේ මෙහි අරුත් දතයුතුය. යම් කරුණක් හේතුකොට හෝ භාග්‍යවතුන්වහන්සේ දෙවිමිනිසුන් විසින් එළඹිය යුත්තාහුද ඒ කාරණය හේතුකොට එළඹියේයයි මෙසේද මෙහි අරුත්දතයුතුය. කවර කරුණක් හේතුකොට භාග්‍යවතුන්වහන්සේ එළඹිය යුත්තාහුද යත්: මිහිරිපල අනුභවකිරීමෙහි අදහසින් පක්ෂි සමූහයා එළඹෙන නිති පැවති පලඇති රුකක්මෙන් නානාප්‍රකාර ගුණ විශේෂයන් ලැබීමෙහි අදහසින් එළඹිය යුත්තාහ. **'උපසඞ්කමි'**යන මෙයින් ගියේයයි කියනලදදේවේ. **'උපසඞ්කමිත්වා'**යනු එළඹීමෙහි අවසානය දක්වීමය. තවද මෙසේ යම්තැනකට ගියේද ඒ ගියතැනට වඩා ඉතාආසන්නවූ භාග්‍යවතුන්වහන්සේගේ සමීපස්ථානයට ගොසිනැයි කියනලද්දේවේ.

'භගවතා සද්ධිං සම්මොදි' **'කච්චි තෙ බ්‍රාහ්මණ ඛමනීයං'** යනාදීවූ ඛමනීයාදිය විචාරන්නාවූ භාග්‍යවතුන්වහන්සේ යම්සේ ඒ බමුණාසමග සතුටුවූවාහුද මෙසේ ඒ බමුණුතෙමේත් භාග්‍යවතුන්වහන්සේ සමග සමව පැවති සන්තොෂය ඇත්තේවීය. සිහිල්දිය උණුදිය සමගමෙන් සැසඳීමට සමානබවට එකස්වරූපබවට ගියේය. **'කච්චි භො ගොතම ඛමනීයං කච්චි යාපනීයං කච්චි භොතො ච ගොතමස්ස ගොතමසාවකානඤ්ච අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරො'** යනාදීවූ යම් කථාවකින් සතුටුවූයේද එය ප්‍රීතිප්‍රාමොද්‍ය සඞ්ඛ්‍යාත සන්තොෂය උපදවනබැවින් සතුටුවන්නට යුතුබැවින්ද සම්මොදනීයවේ. ආරෝග්‍යඤ්ඤනයන්ගේ මධුරභාවයෙන් ඉතා බොහෝකලක් සිහිකරන්නට නිතර පවත්වන්නට සුදුසුබැවින් හා සිහිකටයුතුබැවින්ද සාරාණීයවේ අසනුලැබීමෙහි සුඛයෙන්ද **සම්මොදනීය**වේ. සිහිකරණුලැබීමෙහි සුඛයෙන්ද

සාරාණීයවේ. එසේ බාහුඤ්ඤතයන්ගේ පරිශුද්ධභාවයෙන් සමෙමාදනීයවේ. අත්ථියන්ගේ පරිශුද්ධභාවයෙන් සාරාණීයවේයයි මෙසේ නොයෙක් ක්‍රමයන්ගෙන් සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාව **'විහිසාරෙත්වා'** අවසන්කොට නිමවා, යම්අත්ථියක් හේතුකොට ආයේද එය විචාරණුකැමැත්තේ එකත්පසෙක හුන්නේය.

'එකමන්තං' යනු භාවනපුංසක නිදේශයි. **'විසමං චන්දිමසූරියා පරිවත්තන්ති'**[A] යනාදිතන්හිමෙනි. එහෙයින් යම් සේ හුන්නේවනාහි එකත්පසෙක හුන්නේවේද එසේ හුන්නේයයි මෙසේ මෙහි අරුත්දතයුතුය. මෙය සප්තමීවිභක්ත්‍යත්ථියෙහි හෝ ද්විතීයා විභක්ති වචනයි. **'නිසීදි'** හුන්නේය. නුවණැති පුරුෂයෝවනාහි ගරුකටයුත්තෙකු කරාපැමිණ අසුන් දැනීමෙහි දක්ෂභාවයෙන් එකත්පසෙක හිඳින්ද, මෙතෙමේද ඔවුනතුරෙහි එක්තරා එකෙක්වේද, එහෙයින් එකත්පසෙක හුන්නේය. කෙසේ හුන්නේවනාහි එකත්පසෙක හුන්නේවේද, කෙසේදයත්: ඉතාදුර, ඉතාලඟ, උඩුසුළඟ, උස්පෙදෙස, ඉතාහමුව, ඉතාපසුපස යන සවැදෑරුම් හිඳීම පිළිබඳ දෙස් හැරපියා එකත් පසෙක හුන්නේවේ. ඉතාදුර හුන්නේවනාහි යමක් කියනුකැමැත්තේනම් ඉතාඋස්හඩින් කියයුතුවේ. ඉතාලඟහුන්නේ ගැටීම කරන්නේය. උඩුසුළඟෙහි හුන්නේ ශරීරගන්ධයෙන් පෙළන්නේය. උස් පෙදෙසෙහි හුන්නේ අගෞරවය ප්‍රකාශකරන්නේය. ඉතාහමුවෙහි හුන්නේ ඉදින් දකිනුකැමැත්තේනම් ඇසින්ඇස පැහැර දකියයුතුවේ. ඉතාපසුපසහුන්නේ දකිනුකැමැත්තේනම් ගෙල දිගුකොට පෙරළා දැකියයුතුවේ. එහෙයින් මෙතෙමේද ඒ සවැදරුම් හිඳීමෙහි දෙස් දුරුකොට හුන්නේය. **'එකමන්තං නිසීදි'**යි එහෙයින් කියනලදී. **'එකමන්තං නිසින්නො ඛො වෙරඤ්ජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච'** යනමෙහි **'එතං'**යනු දන් කියයුතු අත්ථිය දක්වන්නේය. දකාරය පදසන්ධි කරන්නේය **'අවොච'** කීයේය.

'සුතමෙතං'යන මෙහි 'සුතං මෙ එතං'යනු පද වෙන්කිරීම. 'මෙය මාවිසින් අසනලද'යි දන් කියයුතු අත්ථිය දක්වන්නේය. **'භො ගොතම'යි** භාග්‍යවතුන්වහන්සේ ගොත්‍රයෙන් අමතන්නේය. ඔහු විසින් යමක් අසනලදද දන් එය දක්වනුයේ **'න සමණො ගොතමො'** යනමේ ආදිය කීයේය. එහි මේ අත්ථිවශයෙන් ප්‍රකටනොවූ පදයන්ගේ විණිනාය:

'බ්‍රාහ්මණෙ' උත්පත්තියෙන් බ්‍රාහ්මණයන් **'ජිණ්ණෙ'** දැදුරුවූ ජරාවෙන් වැටුනු දත් පැසුනු කෙස් ආදිය ඇති බවට පැමිණි 'වුඩ්ඪෙ' අභපසභ වැඩීමෙහි කෙළවරට පැමිණි **'මහල්ලකෙ'** උපතින් මහලුබැවින් යුක්තවූ, 'උපතින් බොහෝ කල්ගියාවූ'යනු කියනලද්දේවේ.

A චතුක්කඩ්ඪුත්තර-පත්තකම්මවග්ග

'අද්ධගතෙ' දිගුකලක් ඉක්මවූ, දෙතුන් රජකෙනෙකුන්ගේ රාජ්‍යානුශාසනා ඉක්මවා සිටියාවූ යන අදහසවේ. **'වයො අනුප්පත්තෙ'** පැසුළුවයසට පැමිණියාවූ, පැසුළුවයසනම් අවුරුදු සියයක පශ්චිමවූ තෙවන කොටසය. තවද **'පිණ්ණෙ'** පුරාතනවූ බොහෝකල් පැවති කුලවංශ ඇත්තාවූයි කියනලද්දේවේ. **'වුද්ධෙ'** සීලාචාරාදි ගුණයන්ගේ වැඩීමෙන් යුක්තවූ **'මහල්ලකෙ' විභව මහත්තයෙන්** යුක්තවූ, මහත්ධන ඇත්තාවූ, මහාභොග ඇත්තාවූ, **'අද්ධගතෙ'** බමුණන්ගේ පිළිවෙතට පැමිණියාවූ බ්‍රාහ්මණයන් පිළිබඳ ව්‍රතවය්‍යාදි සීමාවන් නොඉක්මවා හැසිරෙන්නාවූ, **'වයො අනුප්පත්තෙ'** උපතින් මහලුබවට අන්තිම වයසට පැමිණියාවූයි මෙසේද මෙහි අත්ථියොජනාව දතයුතුය.

දැන් **'අභිවාදෙති'**යන මේ ආදීහු **'න සමණො ගොතමො'**[A]**යි** මෙහි කියූ 'න' කාරය සමග යොද **'න වන්දති වා නාසනා වුට්ඨහති වා නාපි ඉධ භොත්තා නිසීදත්තු වා එවං ආසෙන න වා උපනිමන්තෙති'** මෙසේ අත්ථවශයෙන් දතයුතුය. මෙහිවූ 'වා' ශබ්දය **රූපං නිච්චං වා අනිච්චං වා'**[B] යනාදිතන්හිමෙන් ප්‍රකෘතිවිභාවනා සඞ්ඛ්‍යාත අත්ථයෙහි වැටේ. මෙසේ කියා නැවත තමාට අභිවාදනාදිය නො කරන්නාවූ භාග්‍යවතුන්වහන්සේ දක **'තයිදං භො ගොතම තථෙව'යි** කීයේය. මාවිසින් යම් වචනයක් අසනලදද ඒ ඇසීම එසේමය. මාගේ ඒ ඇසීම හා දැකීමද සැසඳෙන්නේය. සමවන්නේය. අත්ථවශයෙන් එකීභාවයට යන්නේය. **'න හි භවං ගොතමො -පෙ- ආසනෙන වා නිමන්තෙති'යි** මෙසේ තමන් විසින් අසනලද්ද දක්නලද්දෙන් නිගමනයකොට නිසුකරණුයේ **'තයිදං භො ගොතම න සම්පන්නමෙව'**යනු කීයේය. ඒ අභිවාදනාදිය නොකිරීම නොසුදුසුමය.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ තමන් හුවාදක්වීමෙහි හා පරා හෙළාදක්වීමෙහි දෝෂයට නොපැමිණ කරුණාවෙන් සිහිල්වූ හෘදයෙන් මොහුගේ ඒ නොදනීම විධමනයකොට එහි යුක්තිය දක්වනුකැමැතිව **'නාහං තං බ්‍රාහ්මණ -පෙ- මුද්ධාපි තස්ස විපතෙය්‍ය'**යනු වදළසේක. එහි මේ සංක්ෂෙපාත්ථය වේ:- 'බ්‍රාහ්මණ! මම නොපැකිළ පවත්නා සර්ව්ඥතාඥන චක්ෂුසින් බලනුයෙමිද, සදෙවකාදි හෙද ඇති ලොකයෙහි මම යමෙකුහට වදින්නෙමි හෝ දක හුනස්නෙන් නැගිසිටින්නෙමි. අසුනෙන් පවරන්නෙමි හෝ වෙමිද එබඳු පුද්ගලයෙකු නොදක්නෙමි. යම්බඳුවූ මම අද සර්ව්ඥභාවයට පැමිණියෙමි මෙබඳුවූ වැදීමට සුදුසුවූ පුද්ගලයෙකු නොදක්නෙමි. මෙය ආශ්චය්‍යීයක් නොවේ. තවද මම යම්කලක උපන්

A මජ්ඣිමනිකාය - මහාපුණ්ණමාසු සුත්ත B මජ්ඣිමනිකාය - සම්වක සුත්ත

මොහොතැතියෙම් උතුරුදිගට මුහුණ දුන්නෙම් සප්තපදවීතිහාරයෙන් ගොස් සියලු දශසහශ්‍රීලොකධාතුව බැලූයෙම්ද එකල්හිදු මේ සදෙවකාදි හෙද ඇති ලොකයෙහි මම යමෙකුහට වඳින්නෙම්, දක හුනස්නෙන් නැගී සිටින්නෙම්, අසුනෙන් පවරන්නෙම් හෝ වෙම්ද එබඳු පුද්ගලයෙකු නොදක්නෙම්. තවද කප් සොළොස්දහසක් ආයුඇති ක්‍ෂයකළ ආස්‍රවඇති මහාබ්‍රහ්ම තෙමේද ඇදිලිබැඳ 'ඔබවහන්සේ ලෝකයෙහි ජාති ගොත්‍ර කුල ප්‍රදෙශාදිවශයෙන් මහාපුරුෂවහුය, ඔබවහන්සේ දෙවියන් සහිත ලොකයෙහි ගුණ කරණකොට අග්‍රද වහුය, ගුණ කරනකොට ජ්‍යෙෂ්ඨදවහුය, ගුණකරනකොට ශ්‍රේෂ්ඨදවහුය, සදෙවකාදි හෙද ඇති ලෝකයෙහි ඔබවහන්සේට වඩා අග්‍ර වූවෙක් ජ්‍යෙෂ්ඨ වූවෙක් ශ්‍රේෂ්ඨවූවෙක් උත්තරීතරයෙක් නැත්තේය'යි උපන් සොම්නස් ඇත්තේ මා පිදූයේය. එකල්හිදු මම තමාටවඩා උත්තරීතරයකු නොදක්නෙම් 'මම ලොකයෙහි අග්‍රවෙම්, මම ලොකයෙහි ජ්‍යෙෂ්ඨවෙම්, මම ලොකයෙහි ශ්‍රේෂ්ඨවෙම්යි උත්තම වචනයක් පැතිරවීම්'යි. මෙසේ දැන් උපන් මොහොතැති මාගේ වැදුම් පිදුම් ආදියට සුදුසුවූ කිසිම පුද්ගලයෙක් නැත්තේය. ඒ මම දැන් **සර්ව්ඥභාවයට** පැමිණියෙම් කවරක්හට අභිවාදනය කරන්නෙම්ද -පෙ- අසුනෙන් හෝ පවරන්නෙම්ද, එහෙයින් බ්‍රාහ්මණ! ඔබ තථාගතයන්වෙත මෙබඳුවූ අභිවාදනාදීවූ ප්‍රණිපාතයක් නොපතව, බ්‍රාහ්මණ! තථාගතතෙමේ යමෙක්හට වඳින්නේ හෝ -පෙ- අසුනෙන් පවරන්නේද ඒ පුද්ගලයාගේ හිස අලුයම් කාලයෙහි පැසීමෙන් බුරුල්වූ බැදුම්ඇති නටුවෙන් ගිලිහුනු තල්ගෙඩියක් මෙන් බෙල්ලෙන් ගැලවී සිදී බිම හෙන්නේය'යි මෙසේ වදළසේක.

මෙසේ වදළකල්හිදු බ්‍රාහ්මණතෙමේ නුවණ නැතිබැවින් තථාගතයන්වහන්සේගේ ලොකජ්‍යෙෂ්ඨභාවය නොසලකනුයේ හුදෙක් **'නාහන්තං බ්‍රාහ්මණ!'** යනාදි වශයෙන් වදළ ඒ වචනය නොඉවසනුයේ **'අරසරූපෝ භවං ගොතමෝ'** යනු කීයේය. ලොකයෙහි යම් වැදීම් දක නැගීසිටීම් ඇදිලිබැඳීම් සැලකිලිදක්වීම් සාමග්‍රීරසයයි කියනුලැබේද එය භවත් ගෞතමයන්හට නැත්තේය, එහෙයින් භවත් ගෞතම තෙමේ සාමග්‍රී රසවිරොධීය, සාමග්‍රී රසයෙන් තොරවූ පියවි ඇත්තේය. සාමග්‍රී රසයෙන් තොරවූ සැහැවි ඇත්තේය යනු මේ මොහුගේ අදහසවේ.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මොහුගේ සිතෙහි මොළොක්බව උපදවනුපිණිස සෘජුව විරුද්ධවීම දුරුකරමින් ඔහුගේ වචනයෙහි ඇති අපථ්‍ය අන්අයුරකින් තමන්වහන්සේ කෙරෙහි ඇතිබව දක්වමින් **'අපිත්වෙවස බ්‍රාහ්මණ පරියායෝ'** යනාදිය වදළසේක.

එහි **'පරියායෝ'** යනු කාරණයයි. මේ පරියාය ශබ්දය, දේශනාවාරකාරණයන්හි පවත්නේය. **'මධුපිණ්ඩිකපරියායොත්වේව නං ධාරෙහි'**[A] යනාදිතන්හි මෙය දේශනාවෙහි පවත්නේය. **'කස්ස නුඛෝ ආනන්ද අජ්ජ පරියායෝ භික්ඛුනියෝ ඔවදිතූ'**[B] යනාදිතන්හි වාරයෙහිපවත්නේය. **'සාධු භන්තෙ භගවා අඤ්ඤං පරියායං ආචික්ඛතු යථායං භික්ඛු සඞ්ඝා අඤ්ඤය සණ්ඨහෙය්‍ය'** යනාදිතන්හි කාරණයෙහි පවත්නේය මෙහිද ඒ මේ පරියාය ශබ්දය කාරණයෙහි පවතීද එහෙයින් මෙහි මෙසේ අර්ථ දතයුතුය. 'බ්‍රාහ්මණ! මේ කරුණ ඇත්තේමය, යම්කාරණයකින් භවත් ගෞතම තෙමේ සාමග්‍රීරසයෙන් තොරවූ පියවි ඇත්තේයයි මට කියන්නාවූ පුද්ගල තෙමේ මොනවට කියන්නේය. සත්‍යවාදීයයි ගිණීමට යන්නේය. හේ කවරේදයත්: **'යෙ තෙ බ්‍රාහ්මණ රූපරසා -පෙ- ඵොට්ඨබ්බරසා තෙ තථාගතස්ස පහීණා'යි** කියන්නේය.

මෙයින් කුමක් කියනලද්දේදයත්: ජාතිවශයෙන් හෝ උත්පත්තිවශයෙන් හෝ ශ්‍රේෂ්ඨයයි සම්මතවූද රූපාලම්බනාදිය රසවශයෙන් විඳගන්නාවූද සප්‍රීතික තෘෂ්ණාවශයෙන් එහි සතුටුවන්නාවූද බලවත් රාගයෙන් එහි ඇලෙන්නාවූද පෘථග්ජනයන්ට කාමසුඛාස්වාදසඞ්ඛ්‍යාතවූ යම් ඒ රූපරස, ශබ්දරස, ගන්ධරස, රසරස, සප්‍රෂ්ටව්‍යරස යන රස උපදීද යම් රසයක් මේ ලෝකය ගෙලෙන් බැඳමෙන් අදීද වස්තු ආලම්බනාදීන්ගේ එකතුවීමෙහි උපන්බැවින් ඒ රස සාමග්‍රීරසයි කියනුලැබේද ඒ සියලු රස තථාගතයන් විසින් ප්‍රහීණකරනලද්දේය. 'මාවිසින් ප්‍රහීණ කරනලදය'යි කියයුත්තෙහිද මම‍ංකාරයෙන් තමන් හුවානොදක්වමින් භාග්‍යවතුන්වහන්සේ මෙසේ ධර්මදේශනා කරනසේක. මේ වනාහි භාග්‍යවතුන්වහන්සේගේ දේශනාවිලාසයහෝවේ.

එහි **'පහීණා'** චිත්තසන්තානයෙන් පහවූවාහුය. හරනලද්දහුහෝය. මේ අර්ථයෙහි වනාහි **'තථාගතස්ස'**යනු කරණාර්ථයෙහි සාම්වචනයි දතයුතුය. ආයර්‍යමාගී ශාස්ත්‍රයෙන් සිදහළ තෘෂ්ණා අවිද්‍යාමයවූ භවමූලය මොවුනට ඇතැයි **'උච්ඡින්නමූලා'යි.** ඒ රූපරසාදීන්ගේ වාස්තුව තාලවාස්තුවක් මෙන් කරනලදනුයි. **'තාලාවත්ථුකතා'ය.** යම්සේ තල්රුකක් මුල්සහිතව උදුරාහැර ඒ තල්රුක පිහිටිපෙදෙස සමතලාකොට වාස්තුමාත්‍ර කළකල්හි නැවත ඒ තල්රුකෙහි හටගැණීමක් නොපෙනේද, මෙසේ ආයර්‍යමාගීශාස්ත්‍රයෙන් රූපාදිරසයන් මුල්සහිතව උදුරාහැර ඔවුන් පෙර උපන්විරූබැවින් චිත්තසන්තානය වාස්තුමාත්‍රයක් කළකල්හි ඒ

A මජ්ඣිමනිකාය - මධුපිණ්ඩික සූත්‍ර B තෘතීය පාරාජික නිදන

සියලුරූපරසාදීහු තල්වත්තක්මෙන් කරනලදහයි කියනුලැබෙත්. නොහටගන්නා සැහැවිඇතිබැවින් හෝ මුදුන සිඳහළ තල්රුකක්මෙන් කරනලදහයි 'තාලාවත්ථුකතා'නම්. යම්හෙයකින්වනාහි මෙසේ තල්වත්තක්මෙන් කරනලද්දහු නැවත නොහටගැනීම කරනලද්දහුවෙත්ද, යම්සේ ඔවුන්ගේ පසුව හටගැනීමක් නොවේද එසේ කරනලද්දහුවෙත් **'අනභාවකතා'**යි එහෙයින් වදළසේක.

'අනු අභාවං කතා - අනභාවකතා'යනු මෙහි මේ පද සිදීමය. **'අනුභාවගතා'**යිද පාඨයි. පසුකාලයෙහි නොඉපදීම්වශයෙන් අභාවයට ගියහ යනු ඒ පදයාගේ අර්ථයි. එහි **'අනු අභාවංගතා - අනභාවගතා'**යනු පද සිදීමය. **'අනුඅජරියා - අනඵරියා'**යනුමෙනි. **'ආයතිං අනුපපාද ධම්මා'** අනාගතයෙහි නොඉපදෙන සැහැවි ඇත්තාහුය. යම්කෙලෙශ අභාවයට ගියාහුද ඔවුහු නැවත කෙසේනම් උපදින්නාහුද මෙහිලා **'අනභාවගතා ආයතිං අනුපපාදධම්මා'**යි එහෙයින් කීහ. **'අයං බො පන බ්‍රාහ්මණ පරියායො'** 'බ්‍රාහ්මණ! යම් කරුණක් හේතුකොට මනාකොට කියන්නෙක් මට ශ්‍රමණගෞතම තෙමේ අරසරූපො සමණො ගොතමො'යි කියන්නේනම් එහි මේ කාරණයවේ. **'නො ච බො යං තවං සන්ධාය වදෙසි'** ඔබ යම් වන්දනාදි සාමග්‍රීරසභාවසඞ්ඛ්‍යාත කාරණයක් සඳහා එසේ කීවහුද ඒ කාරණය නොවේම ය. කුමක්හෙයින් භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදළසේක්ද? මෙසේ වදළකල්හි බ්‍රාහ්මණයාවිසින් යම් සාමග්‍රීරසයක් කියනලද්දේද, ඒ සාමග්‍රීරසය තමන්කෙරෙහි ඇතිබව අනුදන්නා ලද්දේනොවේදයත්: කියනුලැබේනොවේ. යමෙක්වනාහි ඒ සාමග්‍රීරසය කරන්නට සුදුසුවූයේ නොකෙරේද, හෙතෙමේ ඒ සාමග්‍රීරසයාගේ අභාවයෙන් 'අරසරූපැ'යි කියයුතුවන්නේය. භාග්‍යවතුන්වහන්සේවනාහි ඒ අභිවාදනාදි සාමග්‍රීරස කරනයට නොසුදුස්සාහුමය. එහෙයින් භාග්‍යවතුන්වහන්සේගේ ඒ සාමග්‍රීරසකරනයෙහි නොසුදුසුබව ප්‍රකාශකරනසේක් **'නොච බො යං තවං සන්ධාය වදෙසි'**යනු වදළසේක. යම් කාරණයක් නිසා ඔබ මා අරසරූපැයි කීවහුද ඒ අරසරූපය අපකෙරෙහි නොකිය යුතුමය.

මෙසේ බ්‍රාහ්මණතෙමේ තමන් අදහස්කළ අරසරූප භාවය භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි නගන්නට නොහැකිවනුයේ නැවත, **'නිබ්බොගො භවං ගොතමො'** යනාදිය කීයේය. මෙහි සියලු වාරයන්හි කියූලෙසින්ම යෝජනාක්‍රමය දන යමක් සඳහා බ්‍රාහ්මණතෙමේ **'නිබ්බොගො භවං ගොතමො'**යනාදිය කීයේද භාග්‍යවතුන්වහන්සේද යමක්සඳහා **'නි බ්බොගො'**යනාදිය තමන්වහන්සේකෙරෙහි ආරොපණයකෙරෙත්ද ඒ සඳහා කියනලද අර්ථය මෙසේ දතයුතුය.

බ්‍රාහ්මණතෙමේ වයසින් වැඩිගියවුන්ට කරණුලද ඒ අභිවාදනාදි ක්‍රියාම ලෝකයෙහි සාමඤ්ඤපරිභොගයයි සලකනුයේ ඒ සාමඤ්ඤපරිභොගය නොවීමෙන් භාග්‍යවතුන්වහන්සේට **'නිබ්බෙඨාගී'යි** කීයේය. භාග්‍යවතුන්වහන්සේ රූපාදීන් කෙරෙහිවූ සත්ත්වයන් පිළිබඳ යම් මේ ඡන්දරාගපරිභොගයක්වේද, ඒ ඡන්දරාගපරිභොගයාගේ අභාවය තමන්වහන්සේකෙරෙහි දක්නාසේක් අනික්කාරණයක් අනුදන්නාසේක.

නැවත, බ්‍රාහ්මණතෙමේ ලෝවැස්සෝ ලෝකයෙහි වයසින් වැඩිගියවුන්ට යම් අභිවාදනාදි කුලසමුදාචාර ක්‍රියාකෙරෙත්ද, ඒ කුලාචාරකම් නොකිරීම දක්නේ භාග්‍යවතුන්වහන්සේට **'අකිරියවාදෝ'** අක්‍රියාවාදියයි කීයේය. භාග්‍යවතුන්වහන්සේවනාහි යම්හෙයකින් කායදුශ්චරිතාදීන්ගේ නොකිරීම වදරනසේක්ද, එහෙයින් ඒ අක්‍රියාවාදය තමන්වහන්සේකෙරෙහි දක්නාසේක් අනික්කාරණයක් අනුදන්නාසේක. එහිද **'කායදුච්චරිතං'**යනමෙහි ප්‍රාණඝාත, අදත්තාදන, කාමේසුමිච්ඡාචාරචෙතනා දතයුතුය. **'වචීදුච්චරිතං'**යනමෙහි මුසාවාද, පිසුණවචන, ඵරුසවචන, සම්ඵප්පලාප චෙතනා දතයුතුය. **'මනොදුච්චරිතං'**යනමෙහි අභිජ්ඣා, ව්‍යාපාද, මිච්ඡාදිට්ඨිහු දතයුතුය. ඒ කායදුශ්චරිතාදි අකුශලධර්මයන්හැර සෙසුඅකුශලධර්මයෝ **'අනෙකවිහිතා පාපකා අකුසලා ධම්මා'**යන මෙයින් ගතයුත්තාහ.

නැවත, බ්‍රාහ්මණතෙමේ ඒ අභිවාදනාදි ක්‍රියාම භාග්‍යවතුන්වහන්සේකෙරෙහි නොදක්නේ 'මොහුනිසා වයසින්වැඩිගියවුන්ට කටයුතුවූ අභිවාදනාදි ක්‍රියා ලක්ඛණ ලොකතන්තිය ලොකප්‍රවේණිය සිදීයායි සලකනුයේ භාග්‍යවතුන්වහන්සේට **'උච්ඡෙදවාදෝ'** උච්ඡෙදවාදීය'යි කීයේය. භාග්‍යවතුන්වහන්සේවනාහි යම්හෙයකින් අටවැදෑරුම්වූ ලොභසහගත චිත්තයන්හි උපදින්නාවූ පඤ්චකාම ගුණික රාගයාගේද දෙවැදෑරුම්වූ දෝමනස්සසහගත චිත්තයන්හි උපදින්නාවූ ද්වේෂයාගේද අනාගාමී මාර්ගයෙන් සිඳීයෑම වදරනසේක්ද, අර්හත්මාර්ගයෙන් සියලුඅකුශලයන්ගේ ඉපැත්මට කරුණුවූ මොහයාගේ නිරවශේෂයෙන් සිඳීයෑම වදරනසේක්ද, රාග, දෙවිෂ, මොහයන තිදෙනහැර සෙසු සක්කායදිට්ඨිආදීවූ ලාමක අකුශලධර්මයන්ගේ සුදුසුපරිදි සිවුමගින් සිඳීයෑම වදරනසේක්ද, එහෙයින් ඒ උච්ඡෙදවාදය තමන්වහන්සේකෙරෙහි දක්නාසේක් අනික්කාරණයක් අනුදන්නාසේක.

නැවත බ්‍රාහ්මණතෙමේ 'ශ්‍රමණගෞතමතෙමේ වයසින් වැඩිගියවුනුට කටයුතුවූ අභිවාදනාදි කුශලසමුදාචාරකම් පිළිකුල් කරන්නාක් මෙනි.

එහෙයින් ඒ නොකෙරේයයි හහිමින් භාග්‍යවතුන්වහන්සේට **'ජෙගුච්ඡී'** අභිවාදනාදි කුශලසමුදාචාරකම් පිළිකුල්කරනසුලුයි කීයේය. භාග්‍යවතුන්වහන්සේවනාහි යම්හෙයකින් කායදුශ්චරිතාදිය හේතුකොටගෙන පිළිකුල්කෙරේද කුමක් කියනලද්දේ වේදයත්: තෙවැදරුම්වූ යම් කායදුචරිතයක්වේද, සිවුවැදරුම්වූ යම් වචීදුචරිතයක්වේද, තෙවැදරුම්වූ යම් මනොදුචරිතයක්වේද, ඒ ත්‍රිවිධ දුශ්චරිතයන් හැර සෙසු නින්දිතාර්‍ථයෙන් **'පාපකානං'** ලාමකවූ නුනුවණින් හටගන්නා අර්‍ථයෙන් **'අකුසලානං ධම්මානං'** අකුශලධර්‍මයන්ට යම් පැමිණීමක් යම් සමාපජ්ජනයක් ඔවුන් හා එකීභාවයක්වේද, ඒ සියල්ල සැරසීම සැහැවිකොටගත් පුරුෂයෙක් ගුථයක් මෙන් පිළිකුල් කෙරේද, හටගත් ලජ්ජා ඇත්තේවේද, එහෙයින් ඒ පිළිකුල්කිරීම තමන්වහන්සේකෙරෙහි දක්නාසේක් අනික් කරුණක් අනුදන්නා සේක. එහි **'කායදුච්චරිතෙන'** යනු දවිතීයාවිභක්‍ත්‍යර්‍ථයෙහි කරනවචනයයි දතයුතුය.

නැවත බ්‍රාහ්මණතෙමේ ඒ අභිවාදනාදිකම් භාග්‍යවතුන්වහන්සේ-කෙරෙහි නොදක්නේ 'මෙතෙමේ මේ ලොකයෙහි දෙවු තැන්හට කළයුතු කටයුතු නසන්නේය, විනාශකරන්නේය, නොහොත් යම් හෙයකින් වැඩිහිටියන්ට කටයුතුවූ මේ අභිවාදනාදි සත්කාරය නොකෙරේද, එහෙයින් මෙතෙමේ හික්මවියයුතුය නිග්‍රහකටයුතුය'යි හහිමින් භාග්‍යවතුන්වහන්සේට **'වෙනයිකො'** නිග්‍රහයට සුදුසුයයි කීයේය. එහි මේ පදර්‍ථයවේ: විනයනය කෙරේනුයි විනය නම්. විනාශ කෙරේනුයි කියනලද්දේවේ. විනයම වෙනයික නම්වේ. නොහොත් විනයට සුදුසුනුයි වෙනයිකය. නිග්‍රහයට සුදුසුයි කියනලද්දේවේ. භාග්‍යවතුන්වහන්සේ වනාහි යම්හෙයකින් රාගාදීන්ගේ විනයපිණිස සන්සිඳීමපිණිස ධර්‍මදේශනා කරනසේක්ද එහෙයින් වෙනයික නම්වෙත්. මේම මෙහි පදර්‍ථයවේ. විනයපිණිස ධර්‍මදේශනා කෙරෙත්නුයි වෙනයිකභාවය තමන්වහන්සේකෙරෙහි දක්නාසේක් අනික් කාරණයක් අනුදන්නාසේක.

නැවත, බ්‍රාහ්මණතෙමේ යම්හෙයකින් අභිවාදනාදිසාමීචිකම් කරන්නෝ වයසින් වැඩිසිටියවුන් සතුටුකරන්නාහු සිනහ ගන්වන්නාහු වෙත්ද, ඒ නොකරන්නාහු වනාහි ඔවුන් තවත්ද, වෙහෙසත්ද, ඔවුන්ට දෙමිනස් උපදවත්ද, භාග්‍යවත්තෙමේ එය නොකෙරේද, එහෙයින් මෙතෙමේ වයසින් වැඩී සිටියවුන් තවායයි හහිනුයේ සත්පුරුෂාචාරයන්ගෙන් තොරබැවින් හෝ දීන පුරුෂයෙකැයි හහිනුයේ භාග්‍යවතුන්වහන්සේට **'තපසසී'** අන්හු තවන්නේයයි කීයේය. එහි මේ පදර්‍ථයවේ: තවානුයි තපනම්. දුෂිත කරයි, වෙහෙසායි කියනලද්දේවේ. සාමීචිකම් නොකරන්නහුට මේ නමකි. තපස් මොහුට ඇත්තේනුයි තපස්සීය. දෙවන

අනථ විකල්පයෙහි ව්‍යඤ්ජනයන් පරීක්ෂානොකොට ලොකයෙහි දරිද්‍රපුරුෂතෙමේ තපස්සීයි කියනුලැබේ. භාග්‍යවතුන්වහන්සේ වනාහි යම් අකුශලධර්මකෙනෙක් ලොකය තවනබැවින් තපනීයයි කියනුලැබෙත්ද, ඒ අකුශලධර්මයන් ප්‍රහීණකළබැවින් යම්හෙයකින් තපස්සීයි ගිණීමටයෙත්ද, එහෙයින් ඒ තපස්සීභාවය තමන්වහන්සේකෙරෙහි දක්නාසේක් අනික් කරුණක්ද අනුදන්නාසේක. එහි මේ පදත්‍ථියවේ: තවත්නුයි තපනම්. අකුශලධර්මයන්ට මේ නමකි. **'ඉධ තපති පෙච්ච තපති'**[A] යි මේ කියනලද්දේය. එසේ මුන්වහන්සේ ඒ අකුශලධර්මයන් හළු කළහ. ඉතිරිනොකොට හළු කළහ, හැරපූහ. වැනසූහයි තපස්සී නම්වෙත්.

නැවත, බ්‍රාහ්මණතෙමේ ඒ අභිවාදනාදිකම් දෙව්ලොව ගතීසම්පත්තියපිණිස, දෙව්ලොව ප්‍රතිසන්ධිය ලැබීමපිණිස පවතීයි හඟිනුයේ භාග්‍යවතුන්වහන්සේකෙරෙහි මේ අභිවාදනාදිකම් අභාවයදක භාග්‍යවතුන්වහන්සේට **'අපගබ්භා'** පහවූ ගැබ්ඇත්තෙක, ලාමකවූ ගැබ්ඇත්තෙකැයි කීයේය. ක්‍රොධවශයෙන් හෝ භාග්‍යවතුන්වහන්සේගේ මවුකුස පිළිසිඳගැනීමෙහි දෙස් දක්වනුයේද මෙසේ කීයේය. එහි මේ පදත්‍ථියවේ. ගැබින් පහවූයේනුයි අපගබ්භනම්. දෙව්ලොව උපතට පැමිණෙන්නට නොසුදුසුයයන අදහසය. ලාමකවූ ගැබෙක් මොහුට ඇත්තේනුයි හෝ අපගබ්භය. දෙව්ලොව ගැබ්ගැනීමෙන් බැහැරිබැවින් මත්තෙහි හීනවූ ගැබ්ලැබීම් ඇත්තෙක. මොහුගේ මාතෘකුක්ෂියෙහි ගර්භවාසය ලාමකවූයේ' හෝ' යනඅදහසය. යම්හෙයකින් භාග්‍යවතුන්වහන්සේගේ මත්තෙහි ගැබෙහි හොවීම පහවූයේද, එහෙයින් උන්වහන්සේ තමන්වහන්සේකෙරෙහි ඒ පහවූ ගැබ්ගැනුම දක්නාසේක් අනික්කරුණක් අනුදන්නාසේක. එහිද **'යස්ස බෝ බ්‍රාහ්මණ ආයතිං ගබ්භසෙය්‍යා පුනබ්භවාභිනිබ්බත්ති පහීණා'**යන මේ පදයන්ගේ අනථ මෙසේ දතයුතුය: 'බ්‍රාහ්මණ! යම් පුද්ගලයෙකුගේ මත්තෙහි ගර්භශය්‍යාව හා පුනර්භවාභිනිබ්බත්තිය අග්‍රමාර්ගයෙන් නැසූ කාරණයෙන් ප්‍රහීණවූය. මෙහි ගබ්භසෙය්‍යා ග්‍රහණයෙන් ජලාබුජයොනිය ගන්නාලදී. පුනබ්භවාභිනිබ්බත්ති ග්‍රහණයෙන් අණ්ඩජ, සංසෙදජ, ඔපපාතිකයන අන්‍යවූ ත්‍රිවිධයොනිහු ගන්නාලදහ. තවද ගැබෙහි හොවීම ගබ්භසෙය්‍යාය. පුනර්භවයම අභිනිබ්බත්තියි. පුනබ්භවාභිනිබ්බත්තිනම්. මෙසේ මෙහි අනථ දතයුතුය. යම්සේ විඤ්ඤාණට්ඨිතියි කියූකල්හිද විඥානයෙන් අන්‍යවූ ඨිතියක් නැත්තීද, මෙහිද මෙසේ ගැබින් අන්‍යවූ සෙය්‍යාවක් ඇතැයි නොදතයුතුය. අභිනිබ්බත්තිය නම්ද යම්හෙයකින්

A ධම්මපද - යමකවග්ග

පුනබ්භවවූවාද අපුනබ්භවවූවාද ඇත්තීද මෙහිද පුනබ්භවහුත අභිනිබ්බත්තිය අදහස් කරණුලදී. **'පුනබ්භවා එව අභිනිබ්බත්ති - පුනබ්භවාභිනිබ්බත්ති'**යි එහෙයින් කියනලදී.

මෙසේ තමන්වෙත පැමිණි තැන් පටන් අරසරූපාදීවූ අටවැදරුම්වූ ආක්‍රොශවස්තූන්ගෙන් ආක්‍රොශ කරන්නාවූ බ්‍රාහ්මණයා දෙස ධම්මේශ්වරවූ ධම්මරාජන්වූ ධම්මස්වාමීවූ තථාගතවූද භාග්‍යවතුන් වහන්සේ අනුකම්පාවෙන් සිහිල්වූම ඇසින් බලනසේක් යම් ධම්ධාතුවක් ප්‍රතිවේධකොට දේශනාවිලාශයට පැමිණියාහුවෙත්ද, ඒ ධම්ධාතුව ප්‍රතිවේධකළබැවින් පහළවූ වලාඇති අහසෙහි නැගීසිටි පුන්සඳමෙන්ද ශරත්කාලයෙහි නැගි හිරුමෙන්ද බ්‍රාහ්මණයාගේ හෘදයාන්ධකාරය නසමින් ඒ ආක්‍රොශවස්තූන්ම ඒ ඒ කාරණයෙන් අන්අයුරකින්දක්වා නැවතද, තමන්වහන්සේගේ කරුණාවිස්ථාරයද අෂ්ටලොකධම්යන්ගෙන් නොසැලීමෙන් පිළිලැබූ තාදිගුණ ලක්ෂණවූ පොළොව සමවූ සිත්ඇති බවද, නොකිපෙන සැහැවි ඇතිබවද ප්‍රකාශකරසේක් 'මේ බ්‍රාහ්මණතෙමේ හුදෙක් පැසුනුහිස වැටුනුදත් රැලිනැගීසම් ආදියෙන් තමන්ගේ මහලුබව දන්නේය. උත්පත්තිය හා අනුවගිය ජරාවෙන් වෙළනලද, ව්‍යාධියෙන් මඩිනලද, මරණයෙන් නසනලද, සසරට කණුවක්වූ අද මැරීගොස් නැවත හෙටම උඩුකුරුවහෝනා දරුබවට යායුතුවූ තමන් ගැන නොමදන්නේය, මෙතෙමේ මහත්උත්සාහයෙන් මාවෙතට ආයේය, එහෙයින් මොහුගේ ඒ ඊම සාර්ථකවේවා'යි සිතා මේ ලෝකයෙහි තමන්වහන්සේගේ අප්‍රතිසම අනන්‍යසාධාරණ පුරෙජාතභාවය දක්වනසේක් **'සෙය්‍යථාපි බ්‍රාහ්මණ'**යනාදි නයින් බ්‍රාහ්මණයාහට ධම්දේශනා කළසේක.

එහි **'සෙය්‍යථා'**යනු උපමාර්ථයෙහි නිපාතයි. **'අපි'**යනු සම්භාවනාර්ථයෙහි නිපාතයි. ඒ දෙකින්ම බ්‍රාහ්මණ! යම්සේයි දක්වාලන්නාහ. **'කුක්කුටියා අණ්ඩානි අට්ඨ වා දස වා ද්වාදස වා'**යන මෙහි වනාහි කිසිසේත් කිකිළියකට කියූ අයුරින් මෙයට අඩුවැඩිවූද අණ්ඩයෝ වෙත්ද එහෙත් වදන් සිලිටුබවපිණිස මෙසේ වදරණුලද්දේයයි දතයුතුය. මෙසේ එක්ම ගණනක් නොකියා අනික් ගණනක් සම්ගකීම ලොකයෙහි සිලිටු වචනයවේ. **'තානස්සු'** යන මෙහි **'තානි + අස්සු'**යනු පද වෙන්කිරීමය. වන්නාහුයයි කියනලද්දේවේ. **'කුක්කුටියා සම්මා අධිසයිතානි'** ඒ දිනිතියවූ කිකිළියවිසින් පියාපත් දිගහැර ඒ බිජුවට මත්තෙහි සයනය කරන්නීය විසින් මැනවින් ඒ අණ්ඩයෝ සයනය කරනලද්දාහුවෙති. **'සම්මා පරිසෙදිතානි'** කලින්කල සෘතු ගන්වන්නිය විසින් මැනවින් හාත්පසින් ඩහගන්වනලදහ. උණුසුම් කරනලදහයි

කියනලද්දේවේ. **'සම්මා පරිභාවිතානි'** කලින්කල මැනවින් භාත්පසින් වඩනලදහ. කුකුළුගඳ ගන්වනලදහයි කියනලද්දේවේ.

දැන් යම්හෙයකින් ඒ කිකිළිය විසින් මෙසේ තුන්අයුරකින් පාලනයකළ ඒ අණ්ඩයෝ කුණුනොවී පවතිත්ද, ඔවුන්ගේ යම් තෙත්ගතියක්වේද, එය පිරිසිදීමටයේද, කටුව තුනීවේද, පානියසිළු හා මුවතුඩ රළුවේද, කුකුළුපැටියෝ මේරීමට යෙත්ද, කටුව තුනීවගියබැවින් පිටත ආලොකය ඇතුළට පෙනේද, එවිට ඒ කුකුළුපැටියෝ අපි බොහෝකලක් හැකුළූ අත්පාඇතිව ඉඩකඩනැති තැනක හොවීමු, පිටතද මේ ආලෝකයක් පෙනේ, මෙහි දැන් අපට ආලෝකය පෙනෙන තැන සුවසේ විසීම වන්නේය'යි පිටතට එනුකැමැතිව කටුවට පයින් පහරදෙත්ද, ගෙල දිගුකරත්ද, එයින් ඒ කටුව දෙකටබිඳීයේද, කුකුළුපැටියෝ පියාපත් සලමින් ඒ මොහොතට සුදුසුලෙසින් හඬලමින් නික්මෙත්ද, මෙසේ නික්මෙන්නාවූ ඔවුන් අතරෙහි යමෙක් ඉතා පළමුකොට නික්මේද, **හේ වැඩිමලායයි කියනුලැබේ. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ ඒ උපමාවෙන් තමන්වහන්සේගේ දෙටුබව සිදුකරනු කැමතිසේක් බ්‍රාහ්මණයාගෙන් මෙසේ විචාරණසේක: 'යො නු ඛො තෙසං කුක්කුටච්ඡාපකානං -පෙ- කිත්ති සාවාස වචනීයෝ'**යි.

එහි **'කුක්කුටච්ඡාපකානං'** කුකුළුපැටවුන් අතරෙහි **'කිත්ති සාවාස වචනීයෝ'** කීම? හේ දෙටු හෝ කනිටුවේදැයි කියයුතුවන්නේද? සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය.

ඉක්බිති බ්‍රාහ්මණතෙමේ **'ජෙට්ඨොතිස්ස ඛො ගොතම වචනීයෝ'** භවත් ගෞතමයන්වහන්ස! හේ දෙටුය'යි කියයුතුවන්නේය. කුමක් හෙයින්දයත්: **'සො හි තෙසං ජෙට්ඨෝ'** යම්හෙයකින් හෙතෙමේ ඔවුන්අතරෙහි ඉතා වැඩිමහලුවේද එහෙයිනැයි කීයේය. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ උපමාව සසඳනසේක් පිළියෙල කරනසේක් **'එවමෙව ඛො අහං බ්‍රාහ්මණ'** යනාදිය වදළසේක. යම් සේ ඒ කුකුළුපැටවා දෙටුයයි ගිනීමටයේද, මමද එසේවෙමි. **'අවිජ්ජාගතාය පජාය'** එහි **'අවිජ්ජාගතාය'** සිවුසස්දහම් නොදැනීම අවිද්‍යායි කියනුලැබේ. ඒ අවිද්‍යාවෙහි ගැලුනු ප්‍රජාවෙහි, **පජා**යන මෙය සත්ත්වයන්ට නමකි. එහෙයින් මෙහි අවිද්‍යා නැමැති අණ්ඩකොෂයාගේ ඇතුළටපිවිසි සත්ත්වයන් අතුරෙහියි මෙසේ අර්ථය දතයුතුය. **'අණ්ඩභූතාය'** අණ්ඩයෙහි උපන්නාවූ හටගත්තාවූ යම්සේ අණ්ඩයෙහි උපන් ඇතැම් සත්ත්වයෝ අණ්ඩභූතහයි කියනුලැබෙත්ද එසේ මේ සියලු ප්‍රජා කොමෝ අවිද්‍යා නැමැති අණ්ඩකොෂයෙහි උපන් බැවින් අණ්ඩභූත'යි කියනුලැබේ. **'පරියොනද්ධාය'**

ඒ අවිද්‍යා නමැති අණ්ඩකොෂයෙන් හැමතින් වැසුනාවූ බැඳුනාවූ වෙළුනාවූ **'අවිජ්ජණ්ඩකොසං පදලෙත්වා'** ඒ අවිද්‍යාමයවූ අණ්ඩකොෂය සිඳහැර **'එකොව ලොකෙ'** සියලුලොක සත්තිවාසයෙහි මම ම අසහායවූයෙම් වෙමි. අදවිතියවූයෙම් වෙමි. **'අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධො'**යන මෙහි **'අනුත්තරං'** උත්තරවිරහිතවූ සර්ශ්‍රෙෂ්ඨවූ **'සම්මා සම්බොධිං'** අවිපරීතකොට තමන්ම අවබොධකළ නොහොත් ප්‍රශස්තවූද සුන්දරවූද වතුසත්‍යාවබෝධය, බෝධියි. වෘක්ෂයද මාර්ගයද සර්ඥතාඥානයද නිර්ණයද කියතුලැබේ. **'බොධිරුක්ඛමූලෙ පඨමාභිසම්බුද්ධො'**[A]යිද **'අත්තරා ච බොධිං අත්තරා ච ගයං'**[B]යිද ආතන්හි වෘක්ෂයබොධියිද **'බොධි වුච්චති චතුසු මග්ගෙසු ඤණං'**යි ආතන්හි මාර්ගයද **'පපොති බොධිං වරහුරි මෙධසො'**යි ආතන්හි සර්ඥතාඥානයද **'පත්වාන බොධිං අමතං අසඞ්ඛතං'**යි ආතන්හි නිර්ණයද කියතුලැබේ. මෙහිවනාහි භාග්‍යවතුන්වහන්සේගේ අතීනමාර්ගඥානය අදහස් කරනලද්දේය. සර්ඥතාඥානයද අදහස් කරනලදැයි කියත්. අන්‍යයන්ගේ අතීත්මාර්ගීය අනුත්තර බෝධියවේද නොවේදයත්ද නොවේ. කුමක් හෙයින්දයත්ද සියලුගුණ නොදෙනබැවිනි. ඔවුන් අතරෙහි කිසිවක්හට අතීනමාර්ගීය අතීත්ඵලයම දෙන්නේය. හේතුසම්පත් ඇති කිසිවක්හට අතීත්ඵලයසමග ත්‍රිවිද්‍යාවද කිසිවක්හට ෂඩභිඥද කිසිවක්හට චතුර්විධ ප්‍රතිසම්භිදද කිසිවක්හට ශ්‍රාවකපාරමී ඥානයද දෙන්නේය. පසේබුදුවරුන්ටද ප්‍රත්‍යෙකබොධි ඥානයම දෙන්නේය. බුදුවරුන්ටවනාහි සියලුගුණසම්පත්තිය දෙන්නේය. රජහට සර්ලොකෙකශ්වර්‍යයද්‍යෙන අභිෂෙකය මෙනි. එහෙයින් අන්කවරක්හටත් අනුත්තර බෝධිය නොවේ. 'අභිසම්බුද්ධො' මනාකොට දත්තෙමි. ප්‍රතිවෙධ කෙළෙමි. පැමිණියේ වෙමි. සියසතන්හි එළවිම්වසයෙන් පිළිලැබීමියි කියනලද්දේවේ.

භාග්‍යවතුන්වහන්සේ විසින් දැන් **'එවමෙව ඛො අහං බ්‍රාහ්මණ'**යනාදි ක්‍රමයෙන් යම් මේ උපමාසම්ප්‍රතිපාදනයක් වදරණලද්දේද එය මෙසේ උපමෙයාර්ථය සමග සසඳ දතයුතුය. තමන්ගේ අණ්ඩමත්තෙහි ඒ කිකිළියගේ හොවීම් ආදීවූ ත්‍රිවිධක්‍රියා කරනය යම්සේද බෝපලහෙහි වැඩහුන් බෝධිසත්ත්වවූ භාග්‍යවතුන්වහන්සේගේ තමන්ගේ සන්තානයෙහිලා අනිත්‍ය, දුඃඛ, අනාත්මයන ත්‍රිවිධඅනුදර්ශනාකරනය එසේය. කිකිළියගේ අණ්ඩමත්තෙහි හොවීම්ආදීවූ ත්‍රිවිධක්‍රියා සම්පාදනයෙන් අණ්ඩයන්ගේ කුණුනොවීම යම්සේද බොධිසත්ත්වවූ භාග්‍යවතුන්වහන්සේගේ ත්‍රිවිධානුදර්ශනා සම්පාදනයෙන් විදර්ශනාඥානයාගේ නොපිරිහීම එසේය. බෝධිසත්ත්වවූ භාග්‍යවතුන්වහන්සේගේ ත්‍රිවිධානුදර්ශනාසම්පාදනයෙන්

A මහාකණ්ඩක බොධිකථා B මජ්ඣිමනිකාය - පාසරාසිසුත්ත

භවත්‍රයානුගත තෘෂ්ණාසෙනහයෙහි ක්ෂයවීම කිකිළියගේ ත්‍රිවිධක්‍රියාකරනයන් අණ්ඩයන්ගේ තෙත්ගතිය ක්ෂයවීයෑමසේය. බොධිසත්ත්වවූ භාග්‍යවතුන්වහන්සේගේ ත්‍රිවිධානුදර්ශනා සම්පාදනයෙන් අවිද්‍යා නැමති අණ්ඩකොෂයාගේ තුනීබව කිකිළියගේ ත්‍රිවිධ ක්‍රියා කරණයෙන් බීජකපාලයන්ගේ තුනීබවසේය. බෝධිසත්ත්වවූ භාග්‍යවතුන්වහන්සේගේ ත්‍රිවිධානුදර්ශනාසම්පාදනයෙන් විදර්ශනා ඥනයාගේ තියුණුබව රළුබව පහත්බව සූරබව කිකිළියගේ ත්‍රිවිධක්‍රියා කරනයෙන් කුකුළුපැටවාගේ පානියතුඩුපිළිබඳ තදරළුබවසේය. බෝධිසත්ත්වවූ භාග්‍යවතුන්වහන්සේගේ ත්‍රිවිධානුදර්ශනාසම්පාදනයෙන් විදර්ශනා ඥනයාගේ මෝරණකාලය වැඩුනුකාලය ගැබ්ගන්නාකාලය කිකිළියගේ ත්‍රිවිධක්‍රියාකරනයෙන් කුකුළුපැටවාගේ මෝරණකාලය මෙන් දතයුතුය. බෝධිසත්ත්වවූ භාගයවතුන්වහන්සේගේ ත්‍රිවිධානුදර්ශනාසම්පාදනයෙන් විදර්ශනාඥනය ගැබ්ගන්වා පිළිවෙළින්ලැබූ අනීතමාර්ගයෙන් අවිද්‍යා නමැති අණ්ඩකොෂය පළාහැර අභිඥ නමැති තටුපොළා සුවසේ සියලු බුදුගුණ අවබෝධකළ කාලය කිකිළියගේ ත්‍රිවිධක්‍රියා කරනයෙන් කුකුළුපැටවාගේ පානිය සිළින් හෝ මුවතුඩින් බීජකපාලය පළාහැර තටුපොළා සුවසේ නික්මෙන කාලයමෙන් දතයුතුය. **‘සච්චං බ්‍රාහ්මණ පජෙට්ඨා සෙට්ඨා ලොකස්ස’** ‘බ්‍රාහ්මණ! ඒ මම ඒ කුකුළුපැටවුන් අතරෙහි ඉතා පළමුකොට අණ්ඩකොෂය පළා උපන් කුකුළුපැටවා යම්සේ දැටුවේද එසේ අවිද්‍යාවෙහි ගැලීගියාවූ අවිද්‍යාවෙහි වැදසිටියාවූ සත්ත්වයන් අතුරෙහි ඒ අවිද්‍යා නමැති අණ්ඩකෝෂය පළාහැර ඉතා පළමුකොට ආර්‍යජාතියෙහි උපන්බැවින් දැටුවෙමි. ඉතා වැඩිමහලුවෙමි. සියලුගුණයන්ගෙන් මට සමානයෙකු නැතිබැවින් ශ්‍රේෂ්ඨය’යි ගිනීමට පැමිණියෙමියි වදළසේක.

මෙසේ භාග්‍යවතුන්වහන්සේ තමන්වහන්සේගේ නිරුත්තරවූ ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨභාවය බ්‍රාහ්මණයාහට ප්‍රකාශකොට දැන් යම් ප්‍රතිපදවකින් එයට පැමිණියේක්ද පූර්වභාගීය ව්‍යායාමයෙහි පටන් ඒ ප්‍රතිපදව දක්වනුපිණිස **‘ආරද්ධං ඛො පන මෙ බ්‍රාහ්මණ විරියං’** යනාදිය වදළසේක. භාග්‍යවතුන්වහන්සේගේ නිරුත්තරවූ මේ ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨභාවය අසා බ්‍රාහ්මණයාහට ‘කිනම් ප්‍රතිපදවකින් මේ ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨභාවයට පැමිණියේද’යි මෙසේ සිත් උපන්නේය. ඔහුට උපන් ඒ සිත දන ‘මම මේ ප්‍රතිපදවෙන් නිරුත්තරවූ මේ ජ්‍යෙෂ්ඨභාවයට පැමිණියෙමි’යි දක්වනසේක් මෙසේ වදළසේක. එහි **‘ආරද්ධං ඛො පන මෙ බ්‍රාහ්මණ විරියං අහොසි’** බ්‍රාහ්මණ! කුසීතවූ මුළාවූ සිහිඇති කෙලෙස්දැවිල්ලෙන් දැවුනු නන්අරමුණෙහි විසිරීගිය සිත් ඇති මාවිසින් නිරුත්තරවූ මේ ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨභාවය ලද්දේ නොවේ. තවද එයට පැමිණෙනුපිණිස

ලබනුපිණිස මා විසින් වීර්‍යය පටන්ගත්නාලද්දේවුයේය. බෝමැඩ හුන්නාවූ මා විසින් සිවුරහින් යුක්තවූ වීර්‍යය පටන්ගන්නාලද්දේවූයේය. දැඩිව ගන්නාලද්දේ සිථිල නොකොට පවත්වනලද්දේයයි කියනලද්දේවේ. දැඩිව පටන්ගත් බැවින්ම මාගේ ඒ වීර්‍යය **'අසල්ලීනං'** නොහැකුළුනේය. හුදෙක් වීර්‍යය පමණක්ම නොවේ. **'සතිපි'** මාගේ සිහියද අරමුණට අභිමුඛවීමෙන් **'උපට්ඨිතා'** අරමුණට එළඹසිටියාය. එළඹසිටි බැවින්ම **'අසම්මුට්ඨා'** මුළා නොවූය. **'පස්සද්ධො කායො'** කාය, චිත්ත, පස්සද්ධිවසයෙන් මාගේ කයද නිවීගියේය. එහි යම්හෙයකින් නාමකාය නිවීගියකල්හි රූපකායද සන්සිඳී ගියේමවේද එහෙයින් නාමකාය, රූපකායයි වෙනසක් නොකොට කය සන්සිඳී ගියේයයි වදරණලද්දේය. **'අසාරද්ධො'** එම කය සන්සිඳුනු බැවින්ම පහවූ කෙලෙස්පීඩා ඇත්තේය. පහවූ කෙලෙස්දුවිලි ඇත්තේයයි කියනලද්දේවේ. **'සමාහිතං චිත්තං එකග්ගං'** මාගේ සිතද නන්අරමුණෙහි විසිරයෑම සිඳහැර එක් අරමුණක කරනලද්දේය. මොනවට තබනලද්දේය, ඔප්පු කරනලද්දක් මෙන්වූයේය. මොනවට පිහිටිබැවින්ම එකඟය. නිසලය. පහවූ සැලීම් ඇත්තේය. මෙපමණකින් ධ්‍යානය පිළිබඳ පූර්වභාගප්‍රතිපදා තොමෝ කියනලද්දීය.

දැන් මේ ප්‍රතිපදවෙන් ලැබූ ප්‍රථමධ්‍යානය මුල්කොට විද්‍යාත්‍රය කෙළවරකොටඇති විශේෂය දක්වනසේක් **'සො ඛො අහං'** යනාදිය වදළසේක. එහි **විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි'** යනාදීන්ගේ අර්ථ මෙසේ දතයුතුය. තවද එහි 'කාම කවරේදයත්: ඡන්දය, කාමය, රාගය කාමය, ඡන්ද රාගය කාමය, සඞ්කප්පය කාමය, රාගය කාමය, සඞ්කප්ප රාගය කාමය'යි යන මේ කෙලස් කාම නම්වේ. එහි 'අකුශලධම්ම කවරේදයත් කාමච්ඡන්දය -පෙ- විචිකිච්ඡායයන මොවුහු අකුශලධම්මයෝ'යි කියනු ලැබෙත්. මෙසේ මේ කාමයන්ගෙන්ද මේ අකුශලධම්මයන්ගෙන්ද වෙන්වූයේ අතිශයින් වෙන්වූයේවේද එහෙයින් **'විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි'**යනු කියනුලැබේ. මේ ආදි ක්‍රමයෙන් විභඞ්ගයෙහිම අර්ථය වදරණලද්දේය. එසේවුවද අර්ථකථානය හැර මෙහි අර්ථය මැනවින් ප්‍රකටනොවේ. එහෙයින් අර්ථකථානයින් ම එය ප්‍රකාශකරන්නෙමු. කෙසේදයත්:

"විවිච්චෙව කාමෙහි' කාමයන්ගෙන් වෙන්ව කාමයන් හැර පහකිරීම්වශයෙන් බැහැරකොට මෙහි යම් ඒ එවකාරයෙක් යෙදී සිටියේද ඒ එවකාරය නියමාර්ථ ඇත්තේයයි දතයුතුය. යම්හෙයකින් ඒ එවකාරය නියමාර්ථ ඇත්තේද එහෙයින් ප්‍රථමධ්‍යානයට පැමිණ වසන ඒ කාලයෙහි අවිද්‍යාමානවූද කාමච්ඡන්දී නීවරණධම්මයන්ගේ ඒ ප්‍රථමධ්‍යානයට පටහැනිබවද කාමයන්ගේ ප්‍රහාණයෙන්ම මේ ප්‍රථමධ්‍යානයේ අධිගමයද

දක්වාලන්නේය. කෙසේදයත්: **'විවිචෙව කාමෙහි'**යි මෙසේ නියමකරනු ලබනකල්හි 'එකාන්තයෙන් මේ ධ්‍යානයට කාමයෝ ප්‍රතිපක්ෂයහ. යම් යම් කාමයන් පවත්නාකල්හි අන්ධකාරය ඇතිකල්හි ප්‍රදීපයමෙන් මේ ධ්‍යානය නොපවතීද ගහක මෙතෙර හැරීමෙන් එතෙරට පැමිණෙන්නාසේ ඔවුන්ගේ දුරුකිරීමෙන්ම මේ ධ්‍යානයාගේ අධිගමයවේද එහෙයින් නියමකෙරේයයි දතයුතුය. එහි මෙසේ වන්නේය: කුමක්හෙයින් මේ එවකාරය උත්තර පදයෙහි නොයොදා පූර්වපදයෙහිම කියනලද්දේද? අකුශල ධර්මයන්ගෙන් නොවෙන්ව ධ්‍යානයට පැමිණ ධ්‍යානය උපදවා කිම වාසයකරන්නේද? අවධාරණාර්ථයෙහිවූ මේ එවකාරය පූර්වපදයෙහිම යෙදෙන්නේයයි මෙසේ නොදතයුතුය. මේ ධ්‍යානය කාමයන්ගේ නිශ්ශරණබැවින්ම පූර්වපදයෙහිමලා මෙය වදරණලද්දේය. කාමභවය ඉක්මවනබැවින්ද කාමරාගයට ප්‍රතිපක්ෂබැවින්ද මේ ධ්‍යානය කාමරාගයන්ගේම නිශ්ශරණයයි, **'කාමානමෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්මං.'**[A]යි එය මෙසේ වදළසේක. යම් සේවනාහි **'ඉධෙව හික්ඛවෙ සමණෝ, ඉධ දුතියෝ සමණෝ'**[B]යන මෙහි එවකාරය උත්තරපදයෙහිවූ එළවා කියනුලැබේද, මෙහිද එවකාරය එළවා කියනුලැබේයි මෙසේ කියයුතුය.

මෙයින් කාමච්ඡන්දයෙන් අන්‍යවූ නීවරණසඞ්ඛ්‍යාත අකුශලධර්මයන්ගෙන්ද නොවෙන්ව ධ්‍යානයට පැමිණ වසන්නට නොහැක්කේද, එහෙයින් **'විවිචෙව කාමෙහි විවිචෙව අකුසලෙහි ධම්මෙහි'**යි මෙසේ දෙපදයෙහිම මේ එවකාරය දතයුතුය. දෙපදයෙහිද **'විවිචව'**යන මේ සාධාරණ වචනයෙන් තදඞ්ග, වික්ඛම්භණ, සමුච්ඡේද, නිස්සරණ, පටිප්පස්සද්ධි විවේකයෝද කාය, චිත්ත, උපධි විවේකයෝද්දයන සියලුම විවේකයෝ සඞ්ග්‍රහයට යන්නාහ. එසේ වුවද කාය විවේකයද චිත්ත විවේකයද වික්ඛම්භණ විවේකයද යනමේ විවේක තුනම මේ ධ්‍යානකථාවෙහි දතයුතුය. **'කාමෙහි'**යන මේ පදයෙන්වනාහි මහානිද්දේශයෙහි **'කතමෙ වත්ථුකාමා, මනාපියාරූපා'**යි මේ ආදික්‍රමයෙන් යම් වස්තුකාමකෙනෙක් කියනලද්දහුද එහිම ධ්‍යානවිභඞ්ගයෙහිද **'ඡත්තෙ කාමො'**යි මේ ආදික්‍රමයෙන් යම් කෙලශකාමකෙනෙක් කියනලද්දහුද ඒ සියලු කාමයෝම සඞ්ග්‍රහය කරනලද්දහුමැයි දතයුතුය. මෙසේ ඒවිධකාමයන්ගේ සඞ්ග්‍රහය ඇතිකල්හි **'විවිචෙව කාමෙහි'**යන මෙයින් වස්තුකාමයන්ගෙන්ද වෙන්වම යනඅර්ථය යෙදෙන්නේය. ඒ වස්තුකාම විවේකයෙන් කායවිවේකය කියනලද්දේය.

A සංයුත්තනිකාය - මහාවග්ග B මජ්ඣිමනිකාය - චූලසීහනාදසූත්ත

"විවිච්ච අකුසලෙහි ධම්මෙහි' කෙලශකාමයන් කෙරෙන් හෝ සියලු අකුශල ධර්මයන්කෙරෙන් වෙන්වයන අර්ථය යෙදෙන්නේය. එයින් චිත්තවිවේකය කියනලද්දේවේ. **'විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි'**යන දෙකොටසෙහි **'විවිච්චෙව කාමෙහි'**යන මෙහි මුල්කොටසින් ගැනෙන කායවිවේකයෙන් වස්තුකාම විවේකය කියූබැවින්ම කාමසුඛ පරිත්‍යාගයද **'විවිච්ච අකුසලෙහි ධම්මෙහි'** යන දෙවනකොටසින් ගැණෙන චිත්තවිවේකයෙන් කෙලශකාමයන්ගෙන් විවේකය කියූබැවින් නෛෂ්ක්‍රම්‍ය සුඛ පරිග්‍රහයද ප්‍රකාශකරනලද්දේවේ. මෙසේ වස්තුකාම කෙලශකාම විවේක වචනයෙන්ම මේ දෙකොටස අතුරෙහි මුල්කොටසින් තෘෂ්ණාදි සඬ්කලශ වස්තූන්ගේ ප්‍රහාණයද දෙවන කොටසින් සඬ්කලශයන්ගේ ප්‍රහාණයද මුල්කොටසින් ලොලභාවය ඉපදීමට හේතුවූ වස්තුකාමයන්ගේ පරිත්‍යාගයද දෙවනකොටසින් අවිද්‍යාසඬ්ඛ්‍යාත බාලභාවයේ පරිත්‍යාගයද මුල්කොටසින් ප්‍රාණවධාදියෙන් වෙන්වීමෙන් ප්‍රයොගශුද්ධියද දෙවනකොටසින් තෘෂ්ණාදි සඬ්කලශයන්ගේ පාරිශුද්ධියෙන් අද්‍යාශය පෝෂණයද ප්‍රකාශකරන ලද්දේවේයයි දතයුතුය. **'කාමෙහි'**යනුවිසින් මෙහි කියනලද කාමයන් අතුරෙහි වස්තුකාමපක්ෂයෙහි මේ ක්‍රමයවේ.

කෙලශකාමපක්ෂයෙහිවනාහි **'ඡන්ද'**යිද **'රාග'**යිදයියන මේආදියෙන් නොයෙක් භෙදඇති කාමවඡන්දයම කාමයි අදහස්කරනලද්දේය. ඒ කාමවඡන්දයද අකුශලයන්හි ඇතුළත්වූයේද **'තත්‍ථ කතමෝ කාමවඡන්දෝ'**යන ප්‍රශ්නයෙහිලා **'කාමෝ'**යි මේආදි ක්‍රමයෙන් විභඬගයෙහි ධ්‍යානයට ප්‍රතිපක්ෂභාවයෙන්වෙන්ව කියනලද්දේවේ. කෙලශකාමබැවින් හෝ පූර්වපදයෙහිද අකුශලයන් කෙරෙහි ඇතුළත් බැවින් දෙවනපදයෙහිද කියනලද්දේය. ඒ කාමය, තමා නොයෙක් භේද හෙයින් **'කාමෙතෝ'**යි නොවදරා **'කාමෙහි'**යි වදරනලද්දේය. **දිට්ඨිමානාදීවූ** අන්‍යධර්මයන්ගේ හා තත්සම්ප්‍රයුක්තයාගේ අකුශලභාවය ඇතිකල්හිදු **'තත්‍ථ කතමේ අකුසලා ධම්මා'**යි ප්‍රශ්න නගා කාමවඡන්දයනාදි ක්‍රමයෙන් විභඬගයෙහි මතු ධ්‍යානාඬගයන්ට විරුද්ධවූ නීවරණයන්ගේ ප්‍රත්‍යනීක ප්‍රතිපක්ෂභාවය **දක්වීමෙන්** නීවරණයක්ම වදරනලද්දේය. නීවරණවනාහි ධ්‍යානාඬගයන්ට විරුද්ධවෙති. ධ්‍යානාඬගයෝම ඒ නීවරණයන්ට විරුද්ධවෙති. නීවරණයක්ම විද්ධවංසනය කරනුලබන්නේය. ඝාතනය කරනුලැබේයයි කියනලද්දේවේ. 'සමාධිය කාමවඡන්දයට ප්‍රතිපක්ෂය. ප්‍රීතිය ව්‍යාපාදයට, චිතකීය ථීනමිද්ධයට, සුඛය උද්ධච්චකුක්කුච්චයට, විචාරය විචිකිච්ඡාවට ප්‍රතිපක්ෂය'යි පෙටකයෙහි යම්සේ කියනලද්දේද එපරිද්දෙන් මෙහි **'විවිච්චෙව කාමෙහි'**යන මෙයින් කාමවඡන්දයේ විෂ්කම්භණ විවේකය වදරණලද්දේය. **'විවිච්ච අකුසලෙහි ධම්මෙහි''** යන මෙයින්

පඤ්චනීවරණයන්ගේම විෂ්කම්භණ විවේකයත් වදරණලද්දේවේ. අගහිත ග්‍රහණයෙන්වනාහි මුල්පදයෙන් කාමච්ඡන්දනීවරණයාගේද දෙවනපදයෙන් සෙසුනීවරණයන්ගේද එසේ මුල්පදයෙන් තුන්අකුසල් මුලඅතුරෙහි පඤ්චකාම ගුණභෙදයට විෂයවූ ලෝභයාගේද දෙවනපදයෙන් ආඝාතවස්තුභෙදිය ගොදුරුකොටසිටි දෝෂමොහයන්ගේද කාමොඝාදිධර්මයන් අතුරෙහි මුල්පදයෙන් කාමොඝ, කාමයොග, කාමාසව, කාමූපාදන, අභිජ්ඣාකායගන්ථ, කාමරාගසංයොජනයන්ගේද දෙවනපදයෙන් සෙසු ඔඝ, යොග, ආසව, උපාදන, ගන්ථ, සංයොජනයන්ගේද මුල්පදයෙන් තෘෂ්ණාවෙනි හා තත්සම්ප්‍රයුක්තකයන්ගේද දෙවනපදයෙන් අවිද්‍යාවගේ හා තත්සම්ප්‍රයුක්තකයන්ගේද තවද, මුල්පදයෙන් ලොභසම්ප්‍රයුක්තඅෂ්ට-චිත්තෝතපාදයන්ගේ දෙවනපදයෙන් සෙසුචතුර්විධ අකුශලචිත්තෝත්පාදයන්ගේද විෂ්කම්භණවිවේකය වදරණලද්දේවේය'යි දතයුතුය. මේවනාහි **'විවිච්චේව කාමේහි විවිච්ච අකුසලේහි ධම්මේහි'**යන මෙහි අර්ථප්‍රකාශනයවේ.

මෙපමණකින් ප්‍රථමධ්‍යානයාගේ ප්‍රභාණාඩ්ගයන් දක්වා දන් සම්ප්‍රයොගාඩ්ග දක්වනසේක් **'සවිතක්කං සවිචාරං'** යනාදිය වදළසේක. එහි විතැකීම විතකීනම්. අරමුණ පිළිබඳ කල්පනායි කියනලද්දේවේ. ඒ මේ විතකීය සිත අරමුණටනැඟීම ලකුණුකොට සිටියේය. අරමුණෙහි ගැටීම හාත්පසින් ගැටීම කෘත්‍යයකොට සිටියේය. ඒ එසේමය. එයින් යෝගාවචරතෙමේ අරමුණ විතකීයෙන් ගැටුනක් විතකීයෙන් හාත්පසින් ගැටුනක් කෙරේයයි කියනුලැබේ. අරමුණෙහි සිත එළවීම ඵලයකොට සිටියේය. අරමුණෙහි සිත හැසිරවීම විචාරනම්. පුනපුනා හැසිරීමයි කියනලද්දේවේ. ඒ මේ විචාරයතෙමේ අරමුණුපිරිමැදීම ලකුණුකොට සිටියේය. සිත සමඟ උප්පන් ධර්මයන් ඒ අරමුණෙහි සිතට අනුව යෙදීම කෘත්‍යයකොට සිටියේය. අරමුණෙහි චිත්තචෛතසික ධර්මයන් නොසිඳුනුසේ පැවැත්ම ඵලයකොට සිටියේය. ඒ විතකීවිචාර දෙදෙන ප්‍රථමධ්‍යාන සඞ්ඛ්‍යාතවූ ඇතැම් සිතෙක නොවෙන්ව පවත්නාකල්හි විචාරයටවඩා ප්‍රකට අර්ථයෙනුදු විචාරයට පෙරටුව යනඅර්ථයෙනුදු ඝණ්ටාවෙහි පළමුපහළවූ ශබ්දයමෙන් සිත පළමුකොට අරමුණෙහි වැටීම විතකීයනම්වේ. විතකීයට වඩා සියුම්වූ අර්ථයෙන් ඝණ්ටාවෙහි අනුරාවයමෙන් පිළිවෙළින් බැඳීපැවැත්ම විචාරයනම්වේ. මේ විතකීවිචාර දෙදෙනා අතුරෙහි විතකීයතෙමේ අහසටනගිනු කැමති පක්ෂියකුගේ පියාපත් පැහැරීමසේද, සුවඳෙහි බැඳුනු සිතැති බමරකුගේ පියුමට මුණදී වැටීමසේද, ප්‍රථමොත්පත්තිකාලයෙහි සිත පොපියන්නාසේ පැහිරීම් ඇතියේය. අහසට

නැගීගත් පක්ෂිහුගේ පියාපත් දිගහැර නොසොල්වා යෑමසේද, පියුමට මූණදී වැටුනු බමරාගේ පියුම මතුපිට කැරකීමසේද, සිත පිළිබඳ සන්හුන්පැවැත්ම නොතදසැලීම විචාරනම්වේ. විතකී - විචාරයන්ගේ ඒ විශේෂය ප්‍රථම, දවීතීයධ්‍යානයන්හි පැහැදිලිවේ. ප්‍රකටවේ. මල්පල හා එක්වසිටියාවූ රුකක්මෙන් මේ විතකීයහාද, මේ විචාරයහාද එක්වපවත්නා මේ ප්‍රථමධ්‍යානය සවිතක්ක සවිචාරයි කියනුලැබේ. විභඞ්ගයෙහිවනාහි **'ඉමිනා ව විතක්කෙන ඉමිනා ව විචාරෙන උපෙතො හොති සමුපෙතො'**යනාදී ක්‍රමයෙන් ධ්‍යානභාවනාව පුද්ගලයෙකු විසින් කටයුතුයයන අර්ථවශයෙන් දේශනා කටයුතුබැවින් ඒ ධ්‍යානයට ආධාරවූ පුද්ගලයා ගෙන දේශනාකරනලද්දේය. එහිද පරමාර්ථවශයෙන් පුද්ගලයෙකු නැතිබැවින් මෙපරිද්දෙන්ම ධම්මාධිෂ්ඨානවශයෙන්ම අර්ථ දතයුතුය.

'විවෙකජං' යන මෙහි වෙන්වීම විවෙකනම්වේ. නීවරණයන්ගේ පහවීමයනු අර්ථයි. පහවූයේනුයි හෝ විවෙකනම්. නීවරණ පහවූ ධ්‍යානය හා යෙදීගත් ධම්රාශියයනු අර්ථයි. නීවරණයන්ගේ පහවීමයි කියූ විවෙකය හේතුකොට හෝ නීවරණයන්ගෙන් පහවූ ධම්රාශියයි කියූ ඒ විවෙකයෙහි උපන්නේනුයි විවෙකජනම්වේ.

'පීතිසුඛං' යන මෙහි කය හා සිත පිණවානුයි පීතිනමු. ඒ ප්‍රීතිය මැනැවින් පිණවීම ලකුණුකොට සිටියේය. කය හා සිත පිණවීම කෘත්‍යයකොට සිටියාය. පැතිරීම හෝ මෙහි කෘත්‍යයවේ. ඔදවැඩිබව ඵලයකොට සිටියාය. සුඛකරනය සුඛනම්. කය හා සිත පිළිබඳ පෙළීම කානුයි හෝ කණිනුයිද සුඛනම්වේ. එය රසවිඳීම ලකුණු කොටසිටියේය. සම්ප්‍රයුක්ත ධම්යන් වැඩීම කෘත්‍යයකොටසිටියේය. සම්ප්‍රයුක්තධම්යන්ට අනුග්‍රහකිරීම ඵලයකොට සිටියේය. කිසිතැනක ඒ ප්‍රීතිසුඛයෙන් නොවෙන්වූ යෙදීමක් ඇතිකල්හි ඉෂ්ටාලම්බනයන්ගේ පිළිලැබීමෙන් උපදින තුෂ්ටිය ප්‍රීතිනමු. පිළිලැබූ අරමුණු රසවිඳීම සුඛනම්. යම් සිතෙක ප්‍රීතියවේද ඒ සිතෙහි සුඛයදවේ. යම් සිතෙක සුඛයවේද ඒ සිතෙහි නියමයෙන් ප්‍රීතියනොවේ. ප්‍රීතිය සංස්කාරස්කන්ධයෙහි සඞ්ග්‍රහ කරනලදුය. සුඛය වෙදනාස්කන්ධයෙහි සඞ්ග්‍රහකරනලදය. කානතාරමාගීයක යන පිපාසාවෙන් මැඩුනක්හටවන දියඳකීම් ඇසීම්හිමෙන් ප්‍රීතියද වනසෙවනට පිවිසීම් දියබීම්හිමෙන් සුඛයදවේ. ඒ ඒ කාලයෙහි ප්‍රීතිය හා සුඛය ප්‍රකටවනබැවින් මෙය කියනලද්දයි දතයුතුය. මේ ප්‍රීතියද මේ සුඛයද මේ ධ්‍යානයට හෝ මේ ධ්‍යානයෙහි ඇත්තේයයි මේ ධ්‍යානය ප්‍රීතිසුඛයි කියනුලැබේ. නොහොත් ප්‍රීතියද සුඛයද පීතිසුඛනම්. ධම්විනයාදියමෙනි. විවෙකයෙන් හටගත් ප්‍රීතිසුඛය මේ ධ්‍යානයට හෝ මේ ධ්‍යානයෙහි ඇත්තේයයිද මෙසේත් විවෙකජ පීතිසුඛනම්වේ. යම්සේ ධ්‍යානය

විවෙකජවේද එසේ මෙහි ප්‍රීතිසුඛයද විවෙකජමවේ. ඒ ප්‍රීතිසුඛය මේ ධ්‍යානයට ඇත්තේද එහෙයින් එක් පදයකින්ම **'විවෙකජං පීතිසුඛං'**යිකීම සුදුසුවේ. විභඞ්ගයෙහිවනාහි **'ඉදං සුඛං ඉමාය පීතියා සහගතං'** යනාදි ක්‍රමයෙන් මෙය වදරණලද්දේය. එහිදු අර්ථයවනාහි මෙපරිද්දෙන්ම දතයුතුය.

'පඨමං' ගණන්පිළිවෙළින් ප්‍රථමවේ. මේ ධ්‍යානයට පළමුකොට සමවදීනුයිද ප්‍රථමය. නීවරණාදි විරුද්ධධර්මයන් දවානුයි **ධ්‍යාන** නම්වේ. මෙයින් යෝගීහු සිතත්නුයිද ධ්‍යානනම්. ප්‍රතිවිරුද්ධධර්මයන් දවත්යි හෝ කසිණාදීවූ අරමුණු සිතත්නුයි යනඅර්ථයි. තෙමේ හෝ කසිණාදීවූ අරමුණු සිතයි. ලංකොට සිතානුයි ධ්‍යානනම්. එහෙයින්ම ඒ ධ්‍යානය උපනිධ්‍යාන ලක්ෂණයි කියනුලැබේ. ඒ මේ ධ්‍යානය ආලම්බනොපනිධ්‍යාන ලක්ෂණොපනිධ්‍යානයි දෙපරිදිවේ. එහි ආලම්බනොපනිධ්‍යාන යනමෙයින් උපචාරධ්‍යානය සමග අෂ්ටසමාපත්තීහු කියනුලැබෙත්. කුමක්හෙයින්ද යත්:- කසිණාදීවූ අරමුණු ලංකොට සිතනබැවිනි. ලක්ෂණොපනිධ්‍යානයන මෙයින් විදර්ශනා, මාර්ග, ඵලයයි කියනුලැබේ. කුමක්හෙයින්ද යත්:- ඇති සැටියෙන් අනිත්‍යාදි ලක්ෂණ හා නිවණපිළිබඳ තථ ලක්ෂණ ලංකොට සිතනබැවිනි. මෙහි විදර්ශනාවවනාහි අනිත්‍ය ලක්ෂණාදිය සිතා බලන්නීය. විදර්ශනාවෙන් සිදුවන උපනිධ්‍යානකෘත්‍යය මාර්ගයෙන්ම සිදුවේනුයි මාර්ග ලක්ෂණොපනිධ්‍යානයයි කියනුලැබේ. ඵලයවනාහි නිරොධයපිළිබඳ තථලක්ෂණය සිතාබලානුයි ලක්ෂණොපනිධ්‍යානයයි කියනුලැබේ. මේ අර්ථයෙහිවනාහි ආලම්බනොපනිධ්‍යානයම ධ්‍යානැයි අදහස්කරනලද්දේය. යම් ධ්‍යානයක් **'සවිතක්කං සවිචාරං** -පෙ- **පීතිසුඛං'**යනුවිසින් දක්වීමට සුදුසුවේද ඒ ධ්‍යානයවනාහි කවරේදයන ප්‍රශ්නයෙහිලා මෙසේ කියනුලැබේ:- **'සධනෝ සපරිජනෝ'** යනාදිතන්හි ධනය හා පිරිවර ජනයාද හැර දක්වීමට සුදුසුවූ අනිකක් යම්සේ නොවේද, එසේ විතර්කාදිධර්මයන්හැර දක්වීමට සුදුසුවූ අනිකක් නැත්තේය. රථ සහිත පාබල සහිත සෙනායිකියුකල්හි 'සෙනා' යන සම්මුතිය රථාදි සෙනාඞ්ගයන්හිම සෙනාසම්මුතිය යම්සේවේද, එපරිද්දෙන් මෙහි ධ්‍යානසම්මුතිය පඤ්චවිධ ධ්‍යානාඞ්ගයන්හිම වන්නේයයි දතයුතුය. කවර පසෙක්හිද යත්: විතර්ක විචාර, ප්‍රීති, සුඛ, එකාග්‍රතායන මොවුන්කෙරෙහිය. **'සවිතක්කං සවිචාරං'** යනාදික්‍රමයෙන් මෙපසම මේධ්‍යානයට අඞ්ගභාවයෙන් කියනලදී. එකාග්‍රතාව ධ්‍යාන පාඨයෙහි නොකියූබැවින් අඞ්ගනොවේදයත්: එයද නොවේ. කුමක්හෙයින්දයත්: කියූබැවින්මය. ඒ ඒකාග්‍රතා විභඞ්ගයෙහි **'ඣානන්ති විතක්කෝ විචාරෝ පීති සුඛං චිත්තස්සෙකග්ගතා'යි** මෙසේ කියනලද්දීමය. **'සවිතක්කං සවිචාරං'**යි යම්සේ කියනලද්දේද එසේ **'සවිත්තෙකග්ගතං'**යි මෙහි නොකියූකල්හිද මේ

විභඞ්ගවචනයෙන් විතෙතකාග්‍රතාවද අඞ්ගමැයි දතයුතුය. භාග්‍යවතුන්වහන්සේ විසින් යම් අදහසකින් **'සවිතක්කං සවිචාරං'යි** උදේශය කරනලද්දේද ඒ උදේශයම උන්වහන්සේ විසින් විභඞ්ගයෙහිද වදරණලද්දේය.

'උපසම්පජ්ජ' තමන්ගේ සිත්සතන්හි ඉපදවීම්වශයෙන් ළඟිය, පැමිණැයි කියනලද්දේවේ. තමන්වෙත සපයා හෝ නිපදවායි කියනලද්දේවේ. විභඞ්ගයෙහිවනාහි **'උපසම්පජ්ජාති පඨමජ්ඣානස්ස ලාභෝ පටිලාභෝ පත්ති සම්පත්ති ඵුසනා සමඵුසනා සච්ඡිකිරියා උපසම්පදා'යි** කියනලදී. එහිද අර්ථය මෙසේම දතයුතුය.

'විහාසිං' බෝමැඩ හිඳීමැයිකියූ ර්‍යාපථවිහාරයෙන් මෙසේ කියූ ආකාරඇති ධ්‍යානයෙන් යුක්තව ආත්මභාවය පිළිබඳ ක්‍රියාප්‍රවෘත්ති ර්‍යාපථ පීඩාවෙන් රැකීම ර්‍යාපථවිසින් යැපීම, යැපවීම, හැසිරීම, විසීම, මොනවට නිපදවීම් යන අර්ථයි. එහෙයින් විභඞ්ගයෙහි **'විහරතීති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති චරති විහරති, තෙන වුච්චති විහරතීති'** යනමෙය වදරණ ලද්දේය. කුමක්කොට භාග්‍යවතුන්වහන්සේ මේ ධ්‍යානයට පැමිණ විසූසේක්දයත්: කම්ස්ථාන වඩාය. කවර **කම්ස්ථානයක්දයත්:-** ආනාපානස්මෘතිකම්ස්ථානය වඩාය. එය ප්‍රයොජනකොටඇති අන්හු විසින් කුමක් කටයුතුදයත්: අන්හු විසින්ද මේ කම්ස්ථානය හෝ පඨවිකෂිණාදීන් අතුරෙහි එක්තරා එකක් හෝ වැඩියයුතුය. ඔවුන්ගේ භාවනා ක්‍රමය **විශුද්ධිමාර්ගයෙහි** කියූනයින්ම දතයුතුය. මෙහි එය කියනුලබනකල්හි විනයනිදනය ඉතා බර වන්නේය. එහෙයින් පෙළෙහි අරුත් පැවසීම පමණක්ම කරමු.

ප්‍රථමධ්‍යානකථා නිමි

'විතක්කවිචාරානං වූපසමා' විතර්කයෙහිද විචාරයෙහිදයන මේ දෙකෙහි සන්සිඳීම් හේතුවෙන් ප්‍රහාණවශයෙන් ඉක්මීමෙන් දවිතීයධ්‍යානක්ෂණයෙහි අනුත්පාදනයෙනැයි වදරණලද්දේවේ. එහි දවිතීයධ්‍යානයෙහි කිසිලෙසකින් සියලුම ප්‍රථමධ්‍යානධර්ම නොද ඇත්තේය. ප්‍රථමධ්‍යානයෙහි අන්‍යවූම සප්ඛාදියවේ. මේ දවිතීය ධ්‍යානයෙහි වන්නේ අන්‍යමවේ. ඔෘදරික අඞ්ගයන්ගේ ඉක්මීමෙන් ප්‍රථමධ්‍යානයෙන් අන්‍යවූ දවිතීයධ්‍යානාදියෙහි අධිගමය වේයයි දක්වීමපිණිස 'විතක්කවිචාරානං වූපසමා'යනු වදළසේකැයි දතයුතුය.

'අජ්ඣත්තං' මෙහි නියකජ්ඣත්තසඞ්ඛ්‍යාතවූ තමන්ගේ සන්තානයෙහිවූ ධම්මාත්‍රය අදහස්කරනලද්දේය. විභඞ්ගයෙහිවනාහි **'අජ්ඣත්තං පච්චත්තං'යි** මෙපමණක්ම වදරණලදය. යම්හෙයකින් මෙහි නියකජ්ඣත්තය අදහස්කරනලද්දේද එහෙයින් තමන්කෙරෙහි උපන් තමන්ගේ සන්තානයෙහි උපන් යන මේ අර්ථය මෙහි වන්නේය.

'සම්පසාදනං' ශ්‍රද්ධාව සම්පසාදනැයි කියනුලැබේ. ඒ ශ්‍රද්ධාව හා යෙදීමෙන් ධ්‍යානයද සම්පසාදනනම්වේ. නිල් පැහැය හා යෙදීමෙන් නීලවස්ත්‍රයයි කියන්නාසේය. යම්හෙයකින් හෝ ඒ ධ්‍යානය සම්පසාදන නම්වූ ශ්‍රද්ධාව හා යුක්තබැවින් විතර්ක විචාරයන්ගේ කැළඹීම සන්සිඳීමෙන් සිත පහදවාද, එහෙයිනුදු සම්පසාදනැයි කියනලදී. මේ අර්ථ විකල්පයෙහිද **'සම්පසාදනං චෙතසෝ'යි** මෙසේ පදසම්බන්ධය දතයුතුය. ප්‍රථම අර්ථවිකල්පයෙහි **'චෙතසෝ'**යන මෙය එකොදිභාවශබ්දය සමග යෙදියයුතුය. මේ මෙහි අර්ථයෝජනාය: අසහායව ශ්‍රේෂ්ඨව නැගේනුයි එකොදිනම්, විතර්ක විචාරයන් විසින් අභිණ්හාවට නොනැගුබැවින් අග්‍රව ශ්‍රේෂ්ඨව නැගේ, පහළවේ යන අර්ථයි. ලොකයෙහි ශ්‍රේෂ්ඨ 'එක'යි කියනුලැබේ. විතර්ක විචාරයන්ගේ විරහයෙන් හෝ එකලාව අසහායවයි මෙසේද කියනු වටියි. නොහොත් තමන් හා එක්ව යෙදුනු ස්පර්ශාදිචෛතසිකධර්ම පහළකරණුයේ **'උදි'**නම්වේ. නගා සිටුවා යන අර්ථයි. ශ්‍රේෂ්ඨාර්ථයෙන් එකලාවූයේද හේමය. සෙසුධර්මයන් අභිණ්හාවට නගාලනබැවින් උදිනම් වූයේත් හේමනුයි **'එකොදි'** නම්වේ. සමාධියට මේ නමකි. මෙසේ මේ එකොදිනම්වූ සමාධිය වඩානුයි මේ දුතියඣානය එකොදිභාවැයි ගතයුතුය. යම්හෙයකින් ඒ මේ එකොදිභාවය සිතපිළිබඳවේද සත්වයකු පිළිබඳ නොවේද ජීවය පිළිබඳ නොවේද එහෙයින් මේ ධ්‍යානය **'චෙතසෝ එකොදිභාවං'යි** වදළසේක.

මේ ශ්‍රද්ධාවද එකොදිනම්වූ මේ සමාධියද ප්‍රථමඣානයෙහිද ඇත්තේ නොවේද? එසේ ඇතිකල්හි මේ දුතියඣානයම කුමක් හෙයින් සිතපිළිබඳ සම්පසාදනය, එකොදිභාවයයි වදරණලද්දේදයත්: මෙහිලා කියනුලැබේ: මේ ප්‍රථමඣානයවනාහි කුදුමහත් රැළ පතරින් අවුල්වූ දියක් සේ විතර්ක විචාරයන්ගේ කැළඹීමෙන් මැනවින් පැහැදුනේ නොවේද, එහෙයින් ශ්‍රද්ධාව ඇතිකල්හිදු සම්පසාදනැයි නොවදරණලද්දේය. මනාකොට නොපහන්බැවින්ම මෙහි ප්‍රථමඣානයෙහි සමාධියද මනාකොට ප්‍රකටනොවේ. එහෙයින් එකොදිභාවයයිද නොවදරණලදය. මේ දුතියඣානයෙහිවනාහි විතර්ක විචාර පළිබොධයන්ගේ අභාවයෙන් ලැබූ අවකාශ ඇති ශ්‍රද්ධාව බලවත්ය. බලවත්වූ ශ්‍රද්ධාවෙහි සහාය ලැබීමෙන්ම සමාධියද ප්‍රකටවේ. එහෙයින් මේ දුතියඣානයම

'සම්පසාදනං චෙතසෝ එකොදිභාවං'යි මෙසේ වදරණලද්දේයයි දතයුතුය. විභඞ්ගයෙහිවනාහි **'සම්පසාදනන්ති යා සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදෝ, චෙතසෝ එකොදිභාවන්ති, යා චිත්තස්ස ඨිති -පෙ- සම්මා සමාධි'යි** මෙපමණක්ම වදරණලදය. මෙසේ වදළ මේ විභඞ්ගපාළිය සමග මෙහි දක්වූ අර්ථවිඤ්ඤාව යම්සේ විරුද්ධ නොවේද එකතින් සමවේද එපරිද්දෙන් දතයුතුය.

'අවිතක්කං අවිචාරං' භාවනාබලයෙන් ප්‍රහීණවූබැවින් මේ ධ්‍යානයෙහි හෝ මේ ධ්‍යානයට විතර්කියක් නැත්තේනුයි අවිතක්ක නම්වේ. මේ ක්‍රමයෙන්ම අවිචාර නම්දවේ. විභඞ්ගයෙහිද **'ඉති අයඤ්ච විතක්කෝ අයඤ්ච විචාරෝ සන්තා හොන්ති සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අඛණ්ඩඞ්ගතා අපිතා ව්‍යපිතා සොසිතා විසොසිතා ව්‍යන්තීකතා තෙන වුච්චති අවිතක්කං අවිචාරං'යි** වදරණලද්දේය. මෙහිලා කියඃ **'විතක්ක විචාරානං වූපසමා'**යන මේ වචනයෙනුදු මේ අර්ථය සිදුනොවේද, එකල්හි නැවත කුමක්හෙයින් **'අවිතක්කං අවිචාරං'යි** වදරණලද්දේද? මෙහිලා කියනුලැබේඃ මෙය මෙසේය. විතර්කවිචාරයන්ගේ අභාවාර්ථය සිද්ධමය. **'විතක්ක විචාරානං වූපසමා'**යන මේ වචනය ඒ අර්ථය දක්වන්නේ නොවේ 'ඖදරික ඖදරික අඞ්ගයන්ගේ ඉක්මීමෙන් ප්‍රථමධ්‍යානයෙන් අන්‍යවූ දවිතීයධ්‍යානාදීන්ගේ අධිගමයවේයයි දක්වනුපිණිස විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙනැයි මෙසේ වදරණලද'යි කීවාහු නොවෙමුද? තවද විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් මේ ද්විතීයධ්‍යානය සමපසාදන නම්වේ. නීවරණ සඞ්ඛ්‍යාතවූ කෙලෙස්කිලිටි සන්සිඳීමෙන් නොවේ. විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන්ද එකොදිභාවයවේ. උපචාරධ්‍යානයමෙන් නීවරණයන්ගේ ප්‍රහාණයෙන් නොවේ. ප්‍රථමධ්‍යානයමෙන් අඞ්ගයන්ගේ පහළවීමෙන්ද නොවේ. මෙසේ මේ **'විතක්ක විචාරානං වූපසමා'**යන මේ වචනය සම්පසාදන එකොදිභාවයන්ට හේතු දක්වන්නේය. එසේ විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් මේ ධ්‍යානය අවිතක්ක අවිචාරනම්වේ. තෘතීය චතුර්ථධ්‍යානයන් මෙන්ද චක්ෂුර්විඥානාදිය මෙන්ද විතර්ක විචාරයන්ගේ අභාවයෙන්ම නොවේ. මෙසේ අවිතර්ක අවිචාර භාවයට හේතු දක්වනුමුත් විතර්ක විචාරයන්ගේ අභාවමාත්‍රය දක්වන්නේ නොවේ. අවිතර්ක අවිචාරයන මේ වචනය හුදෙක් විතර්ක විචාරයන්ගේ අවිද්‍යාමානභාවය ප්‍රකාශකරන්නේමය. එහෙයින් විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙනැයි යනපූර්වාක්‍යය කියා අවිතර්ක අවිචාර යන මේ දෙවන වාක්‍යයද කියයුත්තේමය.

"සමාධිජං" ප්‍රථමදධ්‍යානසමාධියෙන් හෝ සම්ප්‍රයුක්තසමාධියෙන් උපන්නේය යනඅර්ථයි. එහි ප්‍රථමදධ්‍යානයද තමන් හා සම්ප්‍රයුක්තසමාධියෙන් උපන්නේ නම්, එකල්හි විතකී විචාරයන්ගේ කැළඹීමෙන් වෙන්ව අතිශය නිශ්චලබැවින්ද ඉතා පහත්බැවින්ද මේ දවිතීයධ්‍යාන සම්ප්‍රයුක්ත සමාධියම සමාධියයි කියයුතුබවට සුදුසුවේ. එහෙයින් මේ දවිතීයධ්‍යානයෙහි ගුණවිශේෂතා කරතුපිණිස මේම 'සමාධිජ'යි වදරණලද්දේය. **"පීතිසුඛං"** යනමෙය කියූ නය ඇත්තේමය.

'දුතියං' ගණන් පිළිවෙළින් දෙවෙනිවේ. දෙවෙනිව සමවදිනුයිද මෙය දෙවැනි වේ. **"ඣානං"** යන මෙහි ප්‍රථමධ්‍යානය යම් සේ විතකීාදියෙන් යුක්ත බැවින් අඩඟපසක් ඇත්තේවේද, මෙසේ මේ ධ්‍යානය සම්පසාදනාදියෙන් යුක්තබැවින් සිවුඅඟක් ඇත්තේයයි දතයුතුය. ඒ මෙසේ වදළසේක:- **"ඣානන්ති සම්පසාදෙ පීතිසුඛං චිත්තස්ස එකග්ගතා'**යි මේ ක්‍රමයමවේ. සම්පසාදනය හැර නිෂ්පර්‍යාය විසින් උපනිධ්‍යාන ලක්ෂණයට පැමිණ අඩඟයන්ගේවශයෙන් මේ ධ්‍යානය අංගතුනක් ඇත්තේමවේ. ඒ මෙසේ වදළසේක:- **'කතමං තස්මිං සමයෙ තිවඩඟිකං ඣානං හොති, පීති සුඛං චිත්තස්ස එකග්ගතා'යි** සෙස්ස ප්‍රථමදධ්‍යානයෙහි කියූ නය ඇත්තේමය.

දවිතීයධ්‍යාන කථා නිමි

—\\—

'පීතියා ච විරාගා' මෙහි ප්‍රීතිය කියූ අර්ථ ඇත්තේමය. 'විරාග'යනු ඒ ප්‍රීතියෙහි පිළිකුල්කිරීම හෝ ඉක්මවීමය. 'පීතියා විරාගා'යන දෙපදයන්ගේ අතරවූ 'ච' ශබ්දය පිඩුකිරීම අර්ථකොට සිටියේය. ඒ 'ච' ශබ්දය ප්‍රීතියෙහි සන්සිඳීම හෝ විතකී විචාරයන්ගේ සන්සිඳීම පිඬු කරන්නේය. එහි යම්කලෙක සන්සිඳීමම පිඩුකෙරේද එකල්හි ප්‍රීතිය සන්සිඳුවීමෙන්ද, නැවත කිමෙක්ද? සන්සිඳුවීමෙන්දැයි මෙසේ යෙදීම දතයුතුය. මේ යෙදීමෙහිද විරාග ශබ්දය පිළිකුල්කිරීම අර්ථකොට ඇත්තේවේ. එහෙයින් ප්‍රීතියෙහි පිළිකුලින්ද සන්සිඳීමෙන්දැයි මේ අර්ථය දතයුතුය. යම් කලෙක්හි විතකී විචාර ව්‍යපසමය පිඬු කෙරේද එකල්හි ප්‍රීතියෙහි නොඇලීමෙන්දැයි අරුත් දතයුතුය. නැවත කිමෙක්ද? විතකී විචාරයන්ගේ ව්‍යපසමයෙනැයි මෙසේ යෙදීම දතයුතුය. මේ යෙදීමෙහිද විරාගය සමතික්‍රමණාර්ථ ඇත්තේවේ. ප්‍රීතියෙහි සමතික්‍රමණයෙන්ද විතකී විචාරයන්ගේ සන්සිඳීමෙන්දැයි යනමේ අර්ථය දතයුතුය. ඒකාන්තයෙන්

මේ විතකී විචාරයෝ දවිතීයඣ්‍යානක්ෂණයෙහිදීම සන්සිඳීගියහ. මේ ධ්‍යානයට මාඟීය දක්වනුපිණිසද ගුණ බණනුපිණිසද මේ විතකී විචාර ව්‍යපශම වචනය කියනලද්දේය. විතකී විචාරයන්ගේ සන්සිඳීමෙනැයි කියූකල්හි ඒකාන්තයෙන් විතකී විචාරයන්ගේ සන්සිඳීම මේ තෘතීයඣ්‍යානයට මාඟීයයන මේ අර්ථය පෙනෙන්නේය. යම්සේ අනාගාමීමාඟී ක්ෂණයෙහි ප්‍රහීණනොවූද සත්කායදෘෂ්ටිආදීවූ පඤ්චොරම්භාගීයසංයොජනයන්ගේ ප්‍රහාණයෙනැයි මෙසේ ප්‍රහාණය කියනුලබන්නේ අනාගාමීමාඟීධිගමයපිණිස උත්සාහවත්වූවන්ට උත්සාහය උපදවනුපිණිස ගුණකීමක් වන්නේද, එපරිද්දෙන්ම මේ තෘතීයඣ්‍යානයෙහි නොසන්සිඳුනු විතකී විචාරයන්ගේ සන්සිඳීම කියනුලබන්නේ ගුණකීමක් වන්නේය. එහෙයින් ප්‍රීතිය ඉක්මීමෙන්ද විතකී විචාරයන්ගේ සන්සිඳීමෙන්දැයි යනමේ අර්ථය වදරණලදය.

'උපෙක්ඛකො ච විහාසිං' මෙහි සමව ඉසිලීමට සුදුසුපරිදි බලානුයි උපෙක්ෂා නමු. සමව බලයි. අපක්ෂපාතීව බලයි යනඅර්ථයි. කෙලෙස් පහවීමෙන් විශදවූ, මහද්ගතභාවයට පැමිණීමෙන් මහත්වූ, ප්‍රීතිය දුරුවීමෙන් ස්ථිරභාවයට ගියාවූ, ඒ උපෙක්ෂාවෙන් යුක්තබැවින් තෘතීයඣ්‍යාන සමඞ්ගී පුද්ගලතෙමේ උපෙක්ෂකයි කියනුලැබේ. උපෙක්ෂාව ෂඩඞ්ගොපෙක්ෂා, බ්‍රහ්මවිහාරොපෙක්ෂා, බොධ්‍යඞ්ගොපෙක්ෂා, වීර්‍යෝපෙක්ෂා, සංස්කාරොපෙක්ෂා, වෙදනොපෙක්ෂා, විදර්ශනොපෙක්ෂා, තත්‍රමධ්‍යත්වොපෙක්ෂා, ධ්‍යානොපෙක්ෂා, පාරිශුද්ධ්‍යුපෙක්ෂායි දසවැදෑරුම්වේ. මෙසේ මේ උපෙක්ෂාවද සවැදරුම්වූවාද ඒ ඒ තන්හි ආනයින් භූමි, පුද්ගල, චිත්තාලම්බනවශයෙන්ද ස්කන්ධසඞ්ග්‍රහ, එකක්ෂණ, කුශලත්‍රික, සඞ්ක්ෂපවශයෙන්දැයි **අර්ථශාලිනී** ධම් සඞ්ග්‍රහාර්ථකථාවෙහි කියූක්‍රමයෙන් දතයුතුය.

මෙහි කියනුලබන විනයනිදනය ඉතා බැරෑරුම් කරන්නේයයි නොකියනලදී. ලක්ෂණාදීන්ගේවශයෙන් මෙහි අභිමත ධ්‍යානොපෙක්ෂාව මැදහත්බව ලකුණුකොට ඇත්තේය. ප්‍රණීතවූද එහි අවනතියට ප්‍රතිපක්ෂ කෘත්‍යය ඇත්තේය. ඒ යුගයෙහි උත්සාහ රහිතබව වැටහීමකොට ඇත්තේය. ප්‍රීතිවිරාගය ආසන්න කාරණයකොට ඇත්තේය. මෙහිලා කීහ: අර්ථවශයෙන් මෙය තත්‍ර මධ්‍යත්වොපෙක්ෂාවම නොවේද? එය ප්‍රථම දවිතීයඣ්‍යානයන්හිද ඇත. එහෙයින් එහි ද උපෙක්ෂකව විසූයෙමියි මෙසේ මෙය කියයුතුය. කුමක්හෙයින් එය නොකියනලද්දේදයත්, අප්‍රකට කෘත්‍යය ඇතිබැවිනි. ප්‍රථම දවිතීයඣ්‍යානයන්හි තත්‍ර මධ්‍යත්වොපෙක්ෂාවෙහි කෘත්‍යය අප්‍රකටමය. විතකීාදීන්විසින් මැඩගත්බැවිනි. මෙහි මෙය විතකී

විචාර ප්‍රීති යන මොවුන් විසින් නොමැඩුනුබැවින් එසවූ හිස්ඇත්තෙකු මෙන්වී ප්‍රකටකෘත්‍යය ඇත්තේ වේ. එහෙයින් මෙහි වදරණුලදී.

'උපෙක්ඛකො විහාසිං' යනමෙහි අත්ථවණ්ණනාව සවිප්‍රකාරයෙන් නිමියේය.

—\\—

දැන් **'සතො ච සම්පජානො'** යනමෙහි 'සිහි කෙරේනු' යි **'සත'** නම්වේ. 'මොනවට දනී නු'යි **'සම්පජාන'**නම්. මෙහි පුද්ගලාධිෂ්ඨානවශයෙන් සිහියත් මොනවට දනීමත් වදරණුලද්දේය. එදෙක අතුරෙහි සතිය සිහිකිරීම ලකුණුකොට ඇත. නොමුළාබව කෘත්‍යයකොට ඇත. කෙලෙසුන්ගෙන් රැකීම වැටහීමකොට ඇත්තේය. සම්පජඤ්ඤය නොමුළාබව ලකුණුකොට ඇත. කෘත්‍යයන්හි තීරණය කෘත්‍යයකොට ඇත. විමසීම වැටහීමකොට ඇත.

එහි කිසියේත් මේ **ස්මෘතිසම්ප්‍රජන්‍යයෝ** යටකියූ ධ්‍යානයන්හිද ඇත්තාහ. මුළාවූ සිහිඇති නුවණ නැත්තනුටවනාහි උපචාර මාත්‍රයකුදු නොසැපයේ. අපි‍ණා ගැන කියනුකිම? ඒ ධ්‍යානයන් ඔෘදරිකබැවින්වනාහි පුරුෂයාගේ පොළොවෙහි ගමනමෙන් ඒ ධ්‍යානයන්හි චිත්තගතිය සැපවන්නීවේ. එහි සමෘතිසම්ප්‍රජන්‍යකෘත්‍යය අව්‍යක්තවේ. මේ ධ්‍යානය තමා ඔෘදරිකාඩ්ගයන්ගේ ප්‍රහාණයෙන්වනාහි සියුම්වනබැවින් පුරුෂයෙකුගේ කරමුවහතෙහි ගමන මෙන් සමෘතිසම්ප්‍රජන්‍යකෘත්‍යයෙන් පරිගෘහිතවූම චිත්තයාගේ ගතිය කැමතිවියයුතුයයි මෙහිම කියනලදී. නැවත කිමෙක්දයත්: යම්සේ දෙනවිසින් කිරි පෙවූ වස්සෙක් දෙනගෙන් ඉවත්කරනලද්දේ අත්තැනකට ගෙනගොස් නොරකිනුලබන්නේ නැවත දෙනකරාම එළඹේද, මෙසේ මේ තෘතීයද්ධ්‍යානසුඛය ප්‍රීතියෙන් ඉවත්කරනලද්දේ සිහුණුවණින් නොරකිනුලබන්නේනම් නැවත ප්‍රීතිසම්ප්‍රයුක්තධ්‍යානයටම පැමිණෙන්නේය. ප්‍රීතිසම්ප්‍රයුක්තමවන්නේය. සත්ත්වයෝ සුඛයෙහිද ඇලෙත්. මේ සුඛයද අතිමධුර සුඛයයි. එයට වඩා සුඛයක් නැතිබැවිනි. සිහිනුවණ දෙකෙහි ආනුභාවයෙන්වනාහි මේ තෘතීයද්ධ්‍යානසුඛයෙහි නොඇලීමවේ. අන් පරිද්දෙකින් නොවේයයි මේ අත්ථවිශේෂයද දක්වනුපිණිස **'සතො සම්පජානො'** යනමෙය මෙහිම කියනලදැයි දතයුතුය.

දැන් **'සුඛඤ්ච කායෙන පටිසංවෙදෙසිං'** යන මෙහි තෘතීයද්ධ්‍යානවෙන් යුක්තවූවහුට සුව විඳීමෙහි මනස්කාරයක් කිසියේත් නැත්තේය. මෙසේ ඇතිකල්හිදු යම්හෙයකින් ඒ ධ්‍යානසමඩ්ගීවූවහුගේ නාමකාය හා යෙදීසිටියාවූ යම් ඒ සුඛයක් ඇත්තේද හෙතෙමේ එය විඳින්නේය. නොහොත්

යම් ඒ නාමකායසම්ප්‍රයුක්තවූ සුඛයක් ඇත්තේද එයින් උපන්නාවූ ඒ ධ්‍යානලාභීහුගේ යම්හෙයකින් අතිප්‍රණීත රූපයෙන් රූපකාය සපරිග්‍රහකරණලදද, යම්යම් රූපයකින් සපරිග්‍රහ ලදබැවින් ධ්‍යානයෙන් නැගීසිටියේද කායිකසුඛය විඳින්නේද එහෙයින් මේ අතීත දක්වනයේක් **'සුඛං ච කායෙන පටිසංවෙදෙසි'**යනු වදළසේක.

දැන් **'යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරී'** යනමෙහි යම්ධ්‍යානයක් හෙතුකොට යම්ධ්‍යානකාරණයකින් ඒ තෘතීයධ්‍යානයෙන් යුක්ත පුද්ගලයා **උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරී'යි** බුද්ධාදිආර්‍යයෝ 'උපෙක්ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සුඛවිහරණ ඇත්තේය'යි වදරත්, දෙසත්, පණවත්, පිහිටුවත්, විවෘතකෙරෙත්, බෙදත්, ප්‍රකටකෙරෙත්, ප්‍රකාශකෙරෙත්, පසසත්යන අදහසවේ. **'තං තතියජ්ඣානං උපසම්පජ්ජ විහාසිං'** මම ඒ තෘතීයධ්‍යානයට පැමිණ විසීමියි මෙසේ මෙහි යෙදීම දතයුතුය.

කුමක්හෙයින් ඒ ආර්‍යයෝ තෘතීයධ්‍යානය ලැබුවහු මෙසේ පසසත්ද යත්:- පැසසීමට සුදුසුබැවිනි. යම්හෙයකින් මේ තෘතීයධ්‍යානලාභී පුද්ගලතෙමේ ඉතා මිහිරි සුවඇති සුවයෙහි පරතෙරට පැමිණි තෘතීයධ්‍යානයෙහිද උපෙක්ෂාඇත්තේ ඒ ධ්‍යානසුඛයෙහි ඇලීමෙන් නොඅදිනුලැබේද, යම්සේත් ප්‍රීතිය නොඋපදීද, මෙසේ එළඹසිටි සිහිඇතිබැවින් සිහි ඇත්තේද, යම්හෙයකින් ආර්‍යයන් සිත් අලවන්නාවූ ආර්‍යජනයා විසින් සෙවුනාලද්දවූම නොකිලිටි සුවය නාමකායයෙන් විඳීද, එහෙයින් පැසසීමට සුදුසුවේ. මෙසේ පැසසීමට සුදුසු බැවින් බුද්ධාදි ආර්‍යයෝ ඒ පැසසීමට සුදුසුවූ ගුණ ප්‍රකාශකරන්නාහු 'උපෙක්ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සුඛ විහරණ ඇත්තේය'යි ඔහුට මෙසේ පසසත්යි දතයුතුය.

'තතියං' යන මෙහි ගණන් පිළිවෙළින් තෙවැනිවේ. මේ ධ්‍යානයට තෙවනුව සමවදීනුයිද තෙවැනිවේ. **'ඣානං'** යනමෙහිද ද්විතීයධ්‍යානය යම් සේ සම්ප්‍රසාදදියෙන් අඞ්ගසතරක් ඇත්තේද, එසේ මේ තෘතීයධ්‍යානය උපෙක්ෂාදියෙන් අඞ්ගපහක් ඇත්තේමවේ. **'ඣානන්ති උපෙක්ඛා සති සම්පජඤ්ඤං සුඛං චිත්තස්ස එකග්ගතා'යි** මෙසේ වදළසේක. මේ එහි ක්‍රමයවේ. උපෙක්ෂා සමෘති සම්ප්‍රජන්‍යයන්හැරවනාහි නිෂ්පර්‍යායවශයෙන් මේ ධ්‍යානය අඞ්ගදෙකක් ඇත්තේමවේ. **'කතමං තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති සුඛං චිත්තස්සෙකග්ගතා'**[A] යි එය වදළසේක. සෙස්ස කියූනය ඇත්තේමය.

තෘතීයධ්‍යාන කථා නිමි

A ඣානවිභඞ්ග

'සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා' කායයිකසුඛයාගේද කායිකදුක්ඛයාගේද ප්‍රහාණයෙන්. **'පුබ්බෙව'** ඒ ප්‍රහාණයද පෙරමවූයේය. චතුර්ථධ්‍යානක්ෂණයෙහි නොවේ. **'සොමනස්සදෙමනස්සානං අත්ථඞගමා'** චෛතසිකසුඛයාගේද චෛතසිකදුක්ඛයාගේද යනමේ දෙදෙනාගේ පූර්වයෙහිමවූ අස්තඞගමයෙන් ප්‍රහාණයෙන්මයි කියනලද්දේවේ. කවදවනාහි ඔවුන්ගේ ප්‍රහාණයවේදයත්: ධ්‍යානචතුෂ්කයාගේ උපචාරක්ෂණයෙහි ඔවුන්ගේ ප්‍රහාණයවේ. සොම්නසවනාහි චතුර්ථධ්‍යානයේ උපචාරක්ෂණයෙහිම ප්‍රහීණවේ. දුක්ඛදෙමනස්ස ප්‍රථම, දවීතීය, තෘතීයධ්‍යානයන්ගේ උපචාර ක්ෂණයන්හි ප්‍රහීණවෙයි. මෙසේ ප්‍රහාණක්‍රමයෙන් නොකියනලද ඉන්ද්‍රියවිභඞගයෙහිවනාහි ඉන්ද්‍රියයන්ගේ උද්දේශ ක්‍රමයෙන්ම මෙහිද කියනලද සුඛදුක්ඛ දෙමනස්සයන්ගේ ප්‍රහාණය මෙසේ දතයුතුය. ප්‍රහාණක්‍රමයෙන් වදළෝනම්, **'දුක්ඛං දෙමනස්සං සුඛං සොමනස්සං'යි** වියයුතුය.

ඉදින් වනාහි මොවුහු ඒ ඒ ධ්‍යානයාගේ උපචාරක්ෂණයෙහිම ප්‍රහීණවෙත්නම්, නැවත කුමක්හෙයින් **'කත්ථ වුප්පන්නං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, එත්ථුප්පන්නං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති. කත්ථ වුප්පන්නං දෙමනස්සින්ද්‍රියං - සුඛින්ද්‍රියං, සොමනස්සින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති, ඉධ භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පහාණා -පෙ- චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති, එත්ථුප්පන්නං සොමනස්සින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති'ති**[A]යි මෙසේ ධ්‍යානයන්හිම නිරොධයවේයයි වදරණලද්දේදයත්: ධ්‍යාන ක්ෂණයෙහිම මේ ඉන්ද්‍රියයන් අතිශයින් නිරුදධවනබැවිනි. විරුදධ ධර්මයන්ගේ සන්සිඳීම්වශයෙන් ඒ දෙමනසසින්ද්‍රීයන්ගේ අතිශය නිරොධය ප්‍රථමදධ්‍යානාදියෙහිවේ. නිරොධමාත්‍රයමනොවේ. නිරොධයවනාහි උපචාරක්ෂණයෙහි අතිශය නිරොධයනොවේ. එසේමය. යම් ආවර්ජනයකින් අජිණාවවේද, එයින් හිනනවූ ආවර්ජනා ඇති ප්‍රථමදධ්‍යානොපචාරයෙහිදී නිරුදධවූද දුක්ඛින්ද්‍රියයාගේ ඩැහැ ලේබොන මැසිමදුරු ආදීන්ගේ පහසින් හෝ විෂමව හිඳීමෙන් උපදින පීඩාවෙන් නැවත ඉපදීම වියහැක්කේය. අජිණාවතුළදී නැවත ඉපදීම නොවේමය. උපචාරයෙහිදී හෝ නිරුදධවූ මේ දුක්ඛින්ද්‍රිය මනාකොට නිරුදධවූයේ නොවේ. කුමක් හෙයින්දයත්: ප්‍රතිපක්ෂධර්මයන් විසින් නොනැසුබැවිනි. අජිණාව තුළවනාහි ප්‍රීතියෙන් හටගත් රූප පැතිරීමෙන් සියලුකය සුඛවේදනාවට වැදුනේවේ.

A දීඝනිකාය - මහාසතිපට්ඨානසූත්‍ර

සුඛවේදනාවට වැදුනු සිරුරුඇත්තහුටද ප්‍රතිපක්ෂධර්මයන්විසින් නැසුනුබැවින් දුක්ඛින්ද්‍රිය මනාකොට නිරුද්ධවූයේ‍වේ. නානාවජ්ජිනවූම ද්වීතියද්ධ්‍යානොපචාරයෙහි ප්‍රහීණවූ දෙමනස්සින්ද්‍රියේ ඉපදීම වන්නේය. යම්හෙයකින් මේ දෙමනස්සින්ද්‍රිය විතර්ක විචාරයෙන් ප්‍රත්‍යයකොටඇති කායපීඩාවක් හෝ චිත්තපීඩාවක් ඇතිකල්හි උපදීනම්, විතර්ක විචාරයන්ගේ අභාවයෙහිද ඒ දෙමනස්සින්ද්‍රිය නොමැලපදී. දෙමනස්සින්ද්‍රිය යම්තැනක උපදීනම්, එහි විතර්ක විචාර ඇතිකල්හි ද්වීතියද්ධ්‍යානොපචාරයෙහි ප්‍රහීණනොවූ ප්‍රත්‍යය ඇතිබැවින් මේ දොමනස්සින්ද්‍රියයාගේ උත්පත්තිය වන්නීය. ප්‍රහීණවූ ප්‍රත්‍යය ඇතිබැවින් ද්වීතියද්ධ්‍යානයෙහි දෙමනස්සින්ද්‍රිය නොම උපදින්නේය. එසේම ප්‍රීතියෙන් උපන් ප්‍රණීතරූපයෙන් පැතිරීගිය කයඇත්තහුට තෘතීයද්ධ්‍යානොපචාරයෙහි ප්‍රහීණවූද සුඛින්ද්‍රියෙහි උත්පත්තිය වන්නීය.

තෘතීයද්ධ්‍යානයෙහි නොමැලපදියි. තෘතීයද්ධ්‍යානයෙහිවනාහි සුඛයට ප්‍රත්‍යයවූ ප්‍රීතිය මුළුමනින් නිරුද්ධවූවාය. එසේ චතුර්ථද්ධ්‍යානොපචාරයෙහි ප්‍රහීණවූද සොමනස්සින්ද්‍රියයාගේ ආසන්න භාවයෙන් අප්‍රීණාවට පැමිණි උපෙක්ෂාවගේ අභාවයෙන් මැනවින් නොඉක්මුත්තුබැවින්ද නානාවජ්ජින චතුර්ථද්ධ්‍යානොපචාරයෙහි ප්‍රහීණවූද සොමනස්සින්ද්‍රියයාගේ නැවතඉපදීම වියහැකිය. චතුර්ථද්ධ්‍යානයෙහි ඔහුගේ ඉපදීම නොවන්නේය. එහෙයින්ම **‘එත්‍ථුපපන්නං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති’**යි ඒ ඒතන්හි අපරිශේෂග්‍රහණය කරනලද්දේය.

මෙහිලා කීහ: එකල්හි මෙසේ ඒ ඒ ධ්‍යානයාගේ උපචාරයෙහි ප්‍රහීණවූද මේ වේදනාව මෙහි කුමක්හෙයින් ගෙනහැර දක්වනලදදයන්ද: සුඛග්‍රහණය පිණිසය. මෙහි **‘අදුක්ඛමසුඛං’යි** යම් අදුක්ඛමසුඛ වේදනාවක් කියනලදද ඒ වේදනාව සියුම්වූවා අතිශය දුර්විඥෙයවූවා සුවසේ දැනගන්නට නොහැකිය. එහෙයින් යම්සේ ලංව අල්ලා ගන්නට බැරිතරම්වූ නොදමුනු ගොනෙකු අල්ලාගන්නට ගොපලුතෙමේ එක් ගාලක සියලුගෙරින් එක්රැස්කෙරේද, නැවත එක් එක් ගොනු බැහැරකරමින් පිළිවෙළින් ආ ‘මේ ඌය, ඌ අල්ලා ගණිවු’යි ගන්වාද, එපරිද්දෙන්ම භාග්‍යවතුන්වහන්සේ සුවසේ ගැන්මපිණිස මේ සියලු වේදනා ගෙනහැර දක්වූසේක. මෙසේ එක්කොට ගන්නාලද මේ වේදනාවන් දක්වා යම් වේදනාවක් සුඛ නොවේද, දුක්ඛ නොවේද, සොමනස්ස නොවේද, දෙමනස්ස නොවේද, මේ වේදනාව ‘අදුක්ඛමසුඛවේදනා’යි ගන්වන්නට හැකිය.

තවද, අදුක්ඛමසුඛ හෙවත් උපෙක්ෂාවෙතොවිමුක්තියට ප්‍රත්‍යය දක්වනුපිණිසද මේ සියලු වේදනා වදරණලදහයි දතයුතුය. සුඛදුඃඛප්‍රහාණාදීහු ඒ උපෙක්ෂා වේදනාවට ප්‍රත්‍යය වෙත්. වදළෝ මැයි:

'චත්තාරෝ ඛෝ ආවුසෝ පච්චයා අදුක්ඛමසුඛාය වෙතෝ විමුත්තියා සමාපත්තියා, ඉධ ආවුසෝ භික්ඛු සුඛස්ස ච පහාණා -පෙ- චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති, ඉමේ ඛෝ ආවුසෝ චත්තාරෝ පච්චයා අදුක්ඛමසුඛාය වෙතෝවිමුත්තියා සමාපත්තියා'[A] යි යමිසේ ස්‍රොතාපත්ති මාර්ගයෙහිදී ප්‍රහීණවූ සත්කායදෘෂ්ටිආදීහු තෘතීයමාර්ගයවූ අනාගාමී මාර්ගයෙහිදී ප්‍රහීණකරණුලදහයි යම්සේ වදරණුලදද, එසේ මේ චතුර්ථධ්‍යානයේ ගුණ කියනුපිණිස මෙහි මෙසේ මේ උපෙක්ෂාවෙදනාව වදරණුලදයි දතයුතුය. තවද, ප්‍රත්‍යයනාශයෙන් හෝ මෙහි රාගද්වේෂයන්ගේ ඉතා දුරබව දක්වන්නටද මෙය වදරණුලදයිද දතයයුතුය. මේ අතුරෙහි සුඛවෙදනාව සොමනස්සවෙදනාවට, සොමනස්ස රාගයට, දුඃඛය දෙමනස්සයට, දෙමනස්සය දෝෂයට ප්‍රත්‍යයවේ. සුඛදුඃඛ නාශයෙන්ද ප්‍රත්‍යය සහිතවූ ඒ රාගද්වේෂ නසනලද්දේයි මේ අකුසල් ඉතා දුරවූවා වෙයි.

'අදුක්ඛමසුඛං' දුඃඛාභාවයෙන් අදුක්ඛවූ සුඛාභාවයෙන් අසුඛවූ මෙහි මෙයින් සුඛදුඃඛයන්ට ප්‍රතිපක්ෂවූ තෘතීයවෙදනාව දක්වාලයි. දුඃඛසුඛයන්ගේ අභාවමාත්‍රය නොදක්වයි. තෘතීයවෙදනානම් අදුක්ඛමසුඛවෙදනාය. උපෙක්ෂායිද කියනුලැබේ. ඉෂ්ටානිෂ්ට දෙකට විපරීතවූ මධ්‍යස්ථාලම්බනය විඳගැනීම ලක්ෂණකොටසිටියේය. මධ්‍යස්ථභාවය කෘත්‍යයකොටඇත්තේය. සුඛදුඃඛදෙකෙහි අප්‍රකට පැවැත්ම වැටහීම්කොටඇත්තේය. සුඛනිරොධවූ චතුර්ථධ්‍යානොපචාරය ආසන්න කාරණයකොට ඇත්තේයයි දතයුතුය.

'උපෙක්ඛාසතිපාරිසුද්ධිං' උපෙක්ෂාවෙන් උපන් සමෘතිපාරිශුද්ධිය ඇති මේ ධ්‍යානයෙහිවනාහි සිහිය ඉතාපිරිසිදුය. ඒ සිහිය පිළිබඳ යම් පාරිශුද්ධියක්වේද, ඕ උපෙක්ෂාවෙන් කරනලද්දීය. අනෙකෙකින් නොකරනලද්දීය. එහෙයින් මේ ධ්‍යානය උපෙක්ෂාසමෘති පාරිශුද්ධියි කියනුලැබේ. **'අයං සති ඉමාය උපෙක්ඛාය විසද හොති පරිසුද්ධා පරියොදතා තෙන වුච්චති උපෙක්ඛා සති පාරිසුද්ධි'**යි විභඞ්ගයෙහිදු වදරණුලදී. යම් උපෙක්ෂාවකින් මේ ධ්‍යානයෙහි සිහිය පිළිබඳ පාරිශුද්ධියක්වේද ඕ තොමෝ අත්‍රීවශයෙන් තත්‍රමජ්ඣත්තතායි දතයයුතුය. හුදෙක් මේ ධ්‍යානයෙහි ඒ තත්‍රමජ්ඣත්තතාවෙන් සිහිය පමණක්ම පිරිසිදුවන්නී නොවේ. තවද, සියලු සම්ප්‍රයුක්තධර්මයෝම පිරිසිදුවෙත්. එහෙත් සමෘතිශීර්ෂයෙන් දේශනාව දක්වනලද්දේය.

තවද, එහි මේ උපෙක්ෂා තොමෝ යට කියූ ධ්‍යානත්‍රයයෙහිද පවත්නීය. දහවල හිරුරැසින් මැඩුනු බැවින්ද සෞම්‍යභාවයෙන්ද තමන්ට

A මජ්ඣිමනිකාය - මහාවේදල්ල සූත්‍ර

උපකාරභාවයෙන් හෝ සහාගවූ රාත්‍රිය නොලැබීමෙන්ද දහවල විද්‍යමානවූද චන්ද්‍රරෙඛාව යම්සේ අපිරිසිදුවන්නීද නිම්ල නොවන්නීද, එසේ මේ තත්‍රමධ්‍යත්තෝපෙක්ෂා චන්ද්‍රරෙඛාව විතර්කාදී විරුද්ධ ධර්මතේජසින් මැඩුනුබැවින්ද සහාගවූ උපෙක්ෂාවෙදනා රාත්‍රිය නොලැබීමෙන්ද ප්‍රථමාදිධ්‍යාන භෙදයෙහි විද්‍යමානවූවාද අපිරිසිදු වන්නීය. එය අපිරිසිදුකල්හි දහවල අපිරිසිදුවූ චන්ද්‍රරෙඛාවගේ ප්‍රභාවමෙන් සහජාතවූද ස්මෘතිආදීහු අපිරිසිදුම වෙති. එහෙයින් ඒ ප්‍රථමධ්‍යානාදීන් අතරෙහි එක් ධ්‍යානයකුත් 'උපෙඛා සතිපාරිසුද්ධි'යි නොවදරණලද්දේය. මේ චතුර්ථධ්‍යානයෙහිවනාහි විතර්කාදි විරුද්ධ ධර්මයන්ගේ තෙජසින් නොමැඩුනුබැවින්ද සහාගවූද උපෙක්ෂාවෙදනා නැමති රාත්‍රිය ලැබීමෙන් මේ තත්‍රමධ්‍යත්තෝපෙක්ෂානමැති චන්ද්‍රරෙඛා තොමෝ වැඩියක් පිරිසිදු වන්නීය. ඒ තත්‍රමධ්‍යත්තෝපෙක්ෂාව පිරිසිදුබැවින් පිරිසිදුවූ චන්ද්‍රරෙඛාවෙහි ප්‍රභාවයමෙන් සහජාතවූද සමෘතිආදීහු පිරිසිදුවෙත්. නිම්ලවෙත්. එහෙයින් මේ චතුර්ථධ්‍යානයම **'උපෙඛාසතිපාරිසුද්ධි'යි** වදරණලදැයි දතයුතුය.

'චතුත්ථං' ගණන් පිළිවෙළින් සිවුවැනිවේ. මේ ධ්‍යානයට සිවුවනුව සමවදීනුයිද සිවුවැනිවේ. **'ඣානං'** යන මෙහි යම් සේ තෘතීයධ්‍යානය උපෙක්ෂාදියෙන් පස් අහක් ඇත්තේවේද, එසේ මේ චතුර්ථධ්‍යානය උපෙක්ෂාදියෙන් අංගතුනක් ඇත්තේවේ. **'ඣානන්ති උපෙඛා සති චිත්තස්ස එකග්ගතා'යි** එය මෙසේ වදළසේක. මේ එහි ක්‍රමයවේ. සිහිය හැර උපෙක්ෂාවෙදනාවම ගෙන නිෂ්පර්‍යායයෙන් මේ ධ්‍යානය අංගදෙකක් ඇත්තේමවේ. **'කතමං තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති, උපෙඛා චිත්තස්ස ඒකග්ගතා'**[A]යි එය මෙසේ වදළසේක. පෙස්ස කියූනය ඇත්තේමය.

චතුර්ථධ්‍යානකථා නිමි.

——\\——

මෙසේ මේ ධ්‍යාන සතර කිසිකෙනෙකුන්හට චිත්තසමාධියපිණිසවේ. කිසිකෙනෙකුන්හට විදර්‍ශනාපාදකවේ. කිසිකෙනෙකුන්හට අභිඥාපාදකවේ. කිසිකෙනෙකුන්හට නිරොධපාදකවේ. කිසිකෙනෙකුන්හට භවයෙහි උත්පත්තියපිණිසවේ.

එහි රහතුන්වහන්සේට චිත්තසමාධිය (දිට්ඨධම්මසුඛවිහරණය) ප්‍රයොජනකොට සිටියේවෙයි. උන්වහන්සේ ධ්‍යානයට සමවැද එකහවූ

A ඣානවිභඞ්ග

සිත්ඇතිව දවස මුළුල්ලෙහි සුවසේ වසන්නෙමුයි මෙසේ කිසිඳු පිරියම් කොට අෂ්ටසමාපත්තී උපදවයි.

සමවතින් නැගිට සමාධිගතවූ සිතින් විදර්ශනා කරන්නෙමුයි ධ්‍යාන උපදවන්නාවූ ශෛක්ෂ්‍යපෘථග්ජනයන්ට විදර්ශනා පාදකවෙත්. යම්කෙනෙක්වනාහි අෂ්ටසමාපත්තීන් උපදවා අභිඥාපාදකධ්‍යානයට සමවැද සමාපත්තියෙන් නැගිට **'එකොපි හුත්වා බහුධා හොති'** කියූනයින් අභිඥා ප්‍රාර්ථනාකරමින් ධ්‍යාන උපදවත්ද, ඔවුන්ට අභිඥා පාදකවෙත්.

යම්කෙනෙක් වනාහි අෂ්ටසමාපත්තීන් උපදවා නිරෝධසමාපත්තියට සමවැද සත්දවසක් මුළුල්ලෙහි අචිත්තකව ඉහාත්මයෙහිම නිරොධනම්වූ නිවණට පැමිණ සුවසේ වසන්නෙමුයි ධ්‍යාන උපදවත්ද, ඔවුන්ට නිරොධපාදක වෙත්.

යම්කෙනෙක් වනාහි අෂ්ටසමාපත්තීන් උපදවා නොපිරිහුනු ධ්‍යාන ඇතිව බ්‍රහ්මලොකයෙහි උපදින්නෙමුයි ධ්‍යාන උපදවත්ද ඔවුහු භවයෙහි උත්පත්තිය ප්‍රයෝජනකොට ඇත්තෝ වෙත්.

භාග්‍යවතුන්වහන්සේ විසින් මේ චතුර්ථධ්‍යානය බෝධිවෘක්ෂමූලයෙහිදී උපදවනලද්දේය. එය උන්වහන්සේට විදර්ශනාපාදකද අභිඥාපාදකද නිරොධපාදකද සර්වකෘත්‍යසාධකදැයි සියලුලෞකික ලෝකෝත්තර ගුණදයකවූයේයයි දතයුතුය.

යම් ගුණකෙනකුන් දෙන්නේවූයේද ඒ ගුණයන්ගේ එකදේශයක් දක්වනසේක් **'සො එවං සමාහිතෙ චිත්තෙ'** යනාදිය වදළසේක. එහි **'සො'** ඒ මම. **'එවං'** යනමෙය චතුර්ථධ්‍යානක්‍රමය දැක්වීමය. මේ ක්‍රමයෙන් චතුර්ථධ්‍යානය පිළිලැබැයි වදාරණලද්දේවේ. **'සමාහිතෙ'** මේ චතුර්ථධ්‍යාන සමාධියෙන් සමාහිතකල්හි. **'පරිසුද්ධෙ'** යනාදිතන්හිවනාහි උපෙක්ෂාසමෘති පාරිශුද්ධියෙන් පිරිසිදුවූකල්හි. පිරිසිදුවූබැවින්ම **'පරියොදතෙ'** නිමිලවූකල්හි ප්‍රභාස්වර කල්හියයි වදරණලද්දේය. **'අනඞ්ගණෙ'** සුබාදීවූ ප්‍රත්‍යයයන්ගේ නැසීමෙන් නැසීගිය රාගාදි කෙලෙස්මල ඇතිබැවින් පහවූ කෙලෙස්මල ඇතිකල්හි. කෙලෙස්මල පහවගියබැවින්ම **'විගතූපක්කිලෙසෙ'** පහවූ උපකෙලශ ඇතිකල්හි. අඩඟණයන් කරනකොට සිත කෙලෙසෙන්නේය. මොනවට වැඩුබැවින් **'මුදුභූතෙ'** මොළොක්වූකල්හි වශීභාවයට පැමිණිකල්හියයි වදරණලද්දේවේ. වශයෙහි පවත්නා සිත මුදුයි කියනුලැබේ. මොළොක්බැවින්ම **'කම්මනියෙ'** කර්මක්ෂමකල්හි, කර්මයට යොග්‍යකල්හියයි වදරණලද්දේය. මොළොක්වූ සිත පිරිසිදුකළ ස්වර්ණයක්සේ කර්මයට යොග්‍යවේ. මනාකොට වැඩුබැවින්ම

මොළොක්බව හා කම්යට යොග්‍යබව යනදෙකම වන්නේය. **'නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං භාවිතං බහුලීකතං මුදුඤ්ච හොති කම්මනියඤ්ච, යථයිදං භික්ඛවෙ චිත්තං'**යි එය මෙසේ වදළසේක. මේ පරිසුද්ධභාවාදියෙහි සිටිබැවින් **'ඨිතෙ'** සිටිකල්හි. සිටිබැවින්ම **'අනෙඤ්ජප්පත්තෙ'** නිසලබවට පැමිණිකල්හි අකම්පිතකල්හියයි වදාරණලද්දේවේ. මෘදුකම්ණ්‍යභාවයෙන් හෝ තමාගේ වශයෙහි සිටිබැවින්, සිටිකල්හි ශ්‍රද්ධාදීන්විසින් රක්නාලදබැවින් නොසැලෙන බවට පැමිණිකල්හි.

ශ්‍රද්ධාවෙන් රක්නාලද සිත අශ්‍රද්ධාවෙන් කම්පිතනොවේ. වීර්‍යයෙන් රක්නාලද සිත කුසීතභාවයෙන් කම්පිතනොවේ. සමෘතියෙන් රක්නාලද සිත ප්‍රමාදයෙන් කම්පිතනොවේ. සමාධියෙන් රක්නාලද සිත ඖද්ධත්‍යයෙන් කම්පිතනොවේ. ඥානාලෝකයෙන් යුක්තවූ සිත කෙලශාන්ධකාරයෙන් කම්පිතනොවේ. මේ ධර්මයෙන් රක්නාලද සිත නිසලබවට පැමිණියේවේ. මෙසේ අෂ්ටාඞ්ගසමන්වාගත සිත විශිෂ්ටඥනයෙන් ප්‍රත්‍යක්ෂ කටයුතුවූ ධර්මයන් විශිෂ්ටඥනයෙන් ප්‍රත්‍යක්ෂකිරීමපිණිස එළවීමට සුදුසුවූයේවේ.

මෙහි අනික් ක්‍රමයක් වේ: එහි චතුර්ථධ්‍යානසමාධියෙන් සමාහිතකල්හි නීවරණ දුරුවීමෙන් පිරිසිදුකල්හි චිතක්‍රීදීන්ගේ ඉක්මීමෙන් නිම්ලකල්හි ධ්‍යාන්ප්‍රතිලාභයනිසා උපදින ලාමකවූ ඉච්ඡාචාරයන්ගේ අභාවයෙන් රාගාදිකෙලෙස්මල පහවූ කල්හි අභිඥාදිචිත්තොපක්ලෙශයන් පහවීමෙන් පහවූ උපක්ලෙශ ඇතිකල්හි අනඞ්ගණාතථී - චිත්තොපක්ලෙශාතථීයන මේදෙක **අනඞ්ගණ -චතුසූත්‍රයන්ගේ** අනුසාරයෙන් දතයුතුය. වශීභාවයට පැමිණීමෙන් මොළොක්වූකල්හි සෘද්ධිපාදකභාවයට පැමිණීමෙන් කම්යට යොග්‍යවූකල්හි භාවනා පරිපූර්ණත්වයෙන් ප්‍රණීතභාවයට පැමිණීමෙන් සිටිකල්හි නිසලබවට පැමිණිකල්හි යම්සේ නිසලබවේද නිසලබවට පැමිණීමවේද එසේ සිටිකල්හිය යන අර්ථයි. මෙසේද අෂ්ටාඞ්ගසමන්වාගත සිත විශිෂ්ටඥනයෙන් ප්‍රත්‍යක්ෂකටයුතුවූ ධර්මයන් විශිෂ්ටඥනයෙන් ප්‍රත්‍යක්ෂකරනුපිණිස එළවීමට සුදුසුවේ. පාදකවේ. ආසන්න කාරණයක්වේය යනඅර්ථයි.

'පුබ්බෙනිවාසානුස්සතිඤාණය' මෙසේ මේ සිත අභිඥාපාදකවූ කල්හි පූර්වේනිවාසානුස්මෘතියෙහි යම්ඥානයක්වේද එ'පිණිස එහි **'පුබ්බෙනිවාසො'**යනු පෙර ඉකුත්වූ ජාතීන්හි විසූ ස්කන්ධය. **'නිවුත්ථා'** සිය සතන්හි හටගත්තෝය. නැවත නැවතවූවෝය. තමන්ගේ සන්තානයෙහි ඉපද නිරුද්ධවූවෝය. වසනලද ධර්මයෝය. **නිවුත්ථා** යනු අරමුණු

කිරීම්වශයෙන් වළඳනලද්දහුය. තමන්ගේ විඥානයෙන් දන්නාලද්දහුය. පිරිසිදිනලද්දහුය. සිදහළ සසර මගඇති බුදුපසේබුදු මහරහතුන්සිහිකිරීම් ආදියෙහි අන්හු පිළිබඳ විඥානයෙන් දැනගන්නාලද අන්හුවිසින් පිරිසිදිනලද ධර්මයෝ හෝ නිවුතථ නම්වෙති. **'පුබ්බෙනිවාසානුස්සති'** යම් සිහියකින් පෙරවුසු කඳපිළිවෙළ සිහිකෙරේද ඕතොමෝ පූර්වේනිවාසානුස්මෘතිය. **'ඤාණං'** ඒ සිහිය සමගයෙදීසිටි නුවණය. මෙසේ මේ පෙරවුසු කඳපිළිවෙළ සිහිකරන නුවණැලැබීමපිණිසය. පෙරවුසු කඳපිළිවෙළ සිහිකරන නුවණ පිණිසය. මේ නුවණෙහි අධිගමයපිණිසය. එයට පැමිණීමපිණිසයයි වදරණලද්දේවේ. **'අභිනිත්තාමෙසිං'** එළවීමි.

'සෝ' ඒ මම. **'අනෙකවිහිතං'** නානාභව යොනි ගති විඥානස්ථිති සත්වාවාසාදීන්ගේ වශයෙන් අනෙකප්‍රභෙදඇති නාමගොත්‍රාදිවශයෙන් නොයෙක් අයුරින් හෝ දේශනාවශයෙන් පවත්වනලද, වර්ණනාකරනලද යනඅර්ථයි. **'පුබ්බෙනිවාසං'** අනතුරුව ඉක්මගිය භවය ආදිකොට ඒ ඒ භවයෙහි වුසු ඒ ඒ භවයෙහි වැළඳූ චිත්තසන්තානය ස්කන්ධපරම්පරාව. **'අනුස්සරාමි'** එක් ජාතියකුත් දෙජාතියකුත්යි මෙසේ ජාතිපිළිවෙළින් ඥානගතියෙන් අනුවගොස් සිහිකරමි. අනුවම හෝ සිහිකරමි. සිත ධ්‍යානාලම්බනයෙන් පහකොට පූර්වේනිවාසයට අභිමුඛකොට නැමූ ඇසිල්ලෙහිම සිහිකරමියි දක්වාලනසේක. පිරූ පැරුම් ඇති මහා පුරුෂයන්ටවනාහි පරිකම් කිරීමක් නැත්තේය. එහෙයින් ඔවුහු සිත පූර්වේනිවාසයට අභිමුඛකොට යවාම සිහිකරත්. ආදිකර්මික කුලපුත්‍රයෝවනාහි පරිකම්කොටම සිහිකරත්. එහෙයින් ඒ ආදිකර්මික කුලපුත්‍රයන්ගේවශයෙන් පරිකම් කියයුතුවන්නේය. ඒ පරිකම්ය කියනුලබන්නේනම් විනයනිදානය ඉතා බැරෑරුම් කරන්නේය. එහෙයින් ඒ පරිකම්ය නොකියන්නෙමු. ප්‍රයොජන ඇත්තවුන් විසින් **විශුද්ධිමාර්ගයෙහි** කියූනයින් දතයුතුය. මෙහි පාළිභාෂාවම වර්ණනාකරන්නෙමු.

'සෙය්‍යථීදං'යනු සිහිකිරීමට පටන්ගත් පූර්වේනිවාසයාගේ ආකාර දක්වීම් අර්ථයෙහි නිපාතයකි. එයින්ම යම් මේ පූර්වේනිවාසයක් පටන්ගන්නා ලද්දේද එහි ආකාරභේදය දක්වනසේක් **'එකම්පි ජාතිං'** යනාදිය වදළසේක. එහි **'එකම්පි ජාතිං'**යනු එක්ම ප්‍රතිසන්ධියක් මුල්කොටසිටි ච්‍යුතිය අවසන්කොටඇති එක් භවයෙක ඇතුළත්වූ ස්කන්ධපරම්පරාවය. **'දෙපි ජාතියෝ'** යනාදි තන්හි මේ ක්‍රමයවේ.

'අනෙකෙපි සංවට්ටකප්පෙ' යනාදියෙහිවනාහි නැසි යන්නාවූ අසඞ්ඛ්‍යකල්පය සංවර්ත කල්පයයිද වැඩෙන්නාවූ කල්පය විවර්තකල්පයයිද දතයුතුය. එහිද 'සංවට්ට' යන පදයෙන් සංවර්තස්ථායී කල්පය

ගන්නාලද්දේය. එය මුල්කොට සිටිබැවිනි. **'විවට්ට'** යනපදයෙන් විවර්තිස්ථායී කල්පය ගන්නාලද්දේය. මෙසේ ඇතිකල්හි **'චත්තාරිමානි භික්ඛවෙ කප්පස්ස අසඞ්ඛ්‍යෙය්‍යානි කතමානි චත්තාරි, සංවට්ටෙ සංවට්ටට්ඨායී විවට්ටෙ විවට්ටට්ඨායී'**[A] යනුවෙන් යම් ඒ කල්ප වදරණලද්දේද ඒ සියලුකල්ප ගන්නාලද්දේය.

එහි ගින්නෙන් නස්නා කල්පය, ජලයෙන් නස්නා කල්පය, වාතයෙන් නස්නා කල්පයයි සංවර්තකල්ප තුණක් වේ. ආභස්වර, ශුභකෘත්ස්න, වෘහත්ඵලයි සංවර්තීසීමා තුනක්වේ.

යම් කලෙක කල්පය ගින්නෙන් නැසීයේද, එකල්හි ආභස්වර බ්‍රහ්මලෝකයෙන් යට ගින්නෙන් දැවෙනුලැබේ. යම් කලෙක ජලයෙන් නැසීයේද, එකල්හි ශුභකෘත්ස්න බ්‍රහ්මලොකයෙන් යට ජලයෙන් නැසෙන්නේය. යම් කලෙක්හි වාතයෙන් නැසීයේද, එකල්හි වෘහත්ඵල බ්‍රහ්මලෝකයෙන් යට වාතයෙන් නැසෙනුලැබේ. විස්තරවිසින්වනාහි සියලුකල්හිම එක් බුද්ධක්ෂෙත්‍රයක් නැසෙන්නේය.

බුද්ධක්ෂෙත්‍රයවනාහි ජාතික්ෂෙත්‍රය, ආඥාක්ෂෙත්‍රය, විෂයක්ෂෙත්‍රයයි තෙවැදරුම්වේ. යම් පමණ තැනක් තථාගතයන්වහන්සේගේ පිළිසිඳගැනීම් ආදියෙහි කම්පිතවේද, එහි දසදහසක් සක්වළ කෙළවරකොට සිටි තැන ජාතික්ෂෙත්‍ර නම්වේ. යම් තැනෙක රතනපරිත්ත, බන්ධපරිත්ත, ධජඟපරිත්ත, ආටානාටියපරිත්ත, මොරපරිත්ත යන මේ පරිත්‍රාණ ධර්මයන්ගේ ආනුභාවය පවත්නේද, කෙළලක්ෂයයක් සක්වළ කෙළවරකොට සිටි එතැන ආඥාක්ෂෙත්‍ර නම්වේ. විෂයක්ෂෙත්‍රයවනාහි කෙළවරක් නැත්තේය. ප්‍රමාණ රහිතය. යම් විෂයක්ෂෙත්‍රයක් සඳහා **'යාවතා වා පන ආකඞ්ඛෙය්‍ය'**යි වදරණලද්දේද, යම් අනන්තාපරිමාණ විෂයක්ෂෙත්‍රයෙක්හි යම් යම් තැනක් කැමති වනසේක්ද ඒ ඒ තැන සිහිකරනසේක.

මෙසේ මේ ත්‍රිවිධබුද්ධක්ෂෙත්‍රයන් අතුරෙහි එක් ආඥාක්ෂෙත්‍රයක් නැසීයේද, ඒ ආඥාක්ෂෙත්‍රය නස්නාකල්හි ජාතික්ෂෙත්‍රය නටුයේමවේ. නස්නේද එකතුවම නස්නේය. පිහිටන්නේද එකතුවම පිහිටන්නේය. එහි නැසීමත් පිහිටීමත් විශුද්ධිමාර්ගයෙහි කියනලද්දේය. ප්‍රයෝජන ඇත්තවුන්විසින් එයින් දතයුතුය. යම් ඒ සංවර්ත්‍යවිවර්ත්‍ය කල්පකෙනෙක් කියනලද්දහුද භාග්‍යවතුන්වහන්සේ සම්‍යක්සම්බෝධිය මැනවින් අවබෝධකරනුපිණිස බෝමැඩ වැඩහුන්සේක්, මොවුන් අතුරෙහි නොයෙක් සංවර්තකල්පයන්ද නොයෙක් විවර්තකල්පයන්ද නොයෙක් සංවර්ත්‍යවිවර්ත්‍යකල්පයන්ද සිහිකළසේක.

A චතුක්කඞ්ගුත්තර

කෙසේ සිහිකළයේක්දයත්: **'අමුත්‍රාසිං'** යනාදි ක්‍රමයෙනි. එහි **'අමුත්‍රාසිං'** අසුවල් නස්නාකල්පයෙහි මම අසුවල් භවයෙහි හෝ යෝනියෙහි හෝ ගතියෙහි හෝ විඤ්ඤාණස්ථිතියෙහි හෝ සත්ත්වාවාසයෙහි හෝ සත්ත්වනිකායයෙහි හෝ වීමි. **'එවන්නාමෝ'** විශ්වන්තරවූයෙමි හෝ ජෝතිපාලවූයෙමි හෝ **'එවඩ්ඨාත්තෝ'** භාගීවගොත්‍ර ඇත්තේවූයෙමි හෝ ගෞතමගොත්‍ර ඇත්තේවූයෙමි හෝ **'එවංවණ්ණෝ'** සුදුපැහැ ඇත්තේවූයෙමි හෝ කළුපැහැ ඇත්තේවූයෙමි හෝ **'එවමාහාරෝ'** හැල්බත් මසින්යුත් ආහාර ඇත්තේවූයෙමි හෝ සඨයංපතිතඵල ආහාරකොට ඇත්තේවූයෙමි හෝ **'එවං සුඛදුක්ඛ පටිසංවෙදී'** නොයෙක් අයුරින් කයසිත පිළිබඳවූ හෝ සාමිස නිරාමිසාදී ප්‍රභෙදවත්වූ හෝ සුවදුක් විඳිනසුලුවීමි. **'එවමායුපරියන්තෝ** මෙසේ සියක්අවුරුදු පරමායු කෙළවරකොට ඇත්තේවූයෙමි හෝ සුවාසූදහසක් අවුරුදු පරමායු කෙළවරකොට ඇත්තේවූයෙමි හෝ.

'සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං ඒ මම ඒ භවයෙන් හෝ ඒ යොනියෙන් හෝ ඒ ගතියෙන් හෝ ඒ විඤ්ඤාණස්ථියෙන් හෝ ඒ සත්ත්වාවාසයෙන් හෝ ඒ සත්ත්වනිකායයෙන් හෝ චුතව නැවත අසුවල් භවයෙහි හෝ අසුවල් යොනියෙහි හෝ අසුවල් ගතියෙහි හෝ අසුවල් විඤ්ඤාස්ථිතියෙහි හෝ අසුවල් සත්ත්වාවාසයෙහි හෝ අසුවල් සත්ත්වනිකායයෙහි හෝ උපන්මි. **'තත්‍රාපාසිං'** නැවත ඒ භවයෙහි හෝ යොනියෙහි හෝ ගතියෙහි හෝ විඤ්ඤාණස්ථියෙහි හෝ සත්ත්වාවාසයෙහි හෝ සත්ත්වනිකායයෙහි හෝ නැවතවීමි. **'එවන්නාමෝ'** යනාදිය කියූනය ඇත්තේය.

නොහොත් යම්හෙයකින් **'අමුත්‍රාසිං'**යන මෙය පිළිවෙළින් පූර්වේනිවාසයට නුවණින් නගින්නහුගේ කැමැත්ත සේ සිහිකිරීමවේද **'සෝ තතෝ චුතෝ'** පූර්වේනිවාසය සිහිකිරීම්වශයෙන් කැමති සේ ගොස් පෙරළා එන්නහුගේ සිහිකළ නොකළ තතු ගැන ප්‍රත්‍යවෙක්ෂා කිරීමක් වේ ද, එහෙයින් **'ඉද්ධූපපත්තෝ'** මෙහි මේ උත්පත්තියට අනතුරුව **'අමුත්‍ර උපපාදිං'** යනු තුසිත භවනයසඳහා වදරණුලදැයි දතයුතුය. **'තත්‍රාපාසිං එවන්නාමෝ'** එහිදි තුසිත භවනයෙහි ශ්වේතකෙතුනම් දෙවපුත්‍රවීමි. **'එවඩ්ඨාත්තෝ'** ඒ දෙවතාවන්සමග සමාන ගොත්‍ර ඇත්තේවීමි. **'එවං වණ්ණෝ'** රන්වන් වීමි. **'එවමාහාරෝ'** දෙවියන් පිළිබඳ සුධාභෝජනය ආහාරකොට ඇත්තේවීමි. **'එවං සුඛ දුක්ඛ පටිසංවෙදී'** මෙසේ දෙවියන් පිළිබඳ සුවවිඳිනසුලුවීමි. දුකවනාහි සංස්කාරදුඃඛ මාත්‍රයක්මවේ. **'එවමායුපරියන්තෝ'** මෙසේ අවුරුදු සත්පණස්කෙළ සැටලක්ෂයක් ආයු කෙළවරකොට ඇත්තේවීමි. **'සෝ**

තතො චුතො' ඒ මම ඒ තුසිත භවනෙන් ච්‍යුතවීමි. **'ඉධූප පන්නො'** මෙහි මහාමායා දෙවියගේ කුසෙහි උපන්මි. **'ඉති'** මෙසේ. **'සාකාරං සඋද්දෙසං'** නාමගොත්‍රවශයෙන් උද්දෙස සහිතය. වණ්ණාදිවශයෙන් ආකාර සහිතය. යම්හෙයකින් නාමගොත්‍ර වශයෙන්වනාහි සත්ව තෙමේ දත්ත, තිස්ස, ගොතමයි උදෙසනුලැබේද, වණ්ණාදිවශයෙන් සුදු හෝ කළුයි නානාභාවයෙන් දක්නාලැබේද, එහෙයින් නාමගොත්‍ර උදෙදසනම්. අන්ආකාරයිදවේ. කිම? බුදුවරයෝම පූර්වේනිවාසය සිහිකෙරෙත්දයත්: එහිලා කියනුලැබේ: බුදුවරයෝම පූර්වේනිවාසය සිහි නොකෙරෙත්. ප්‍රත්‍යෙකබුද්ධයෝ බුද්ධශ්‍රාවකයෝ තීර්ථකයෝ ද පූර්වේනිවාසය සිහිකෙරත්. එ ද විශෙෂයක් නොතබා නොවේ. තීර්ථකයෝවනාහි සතළිස් කපක්ම සිහිකරත්. එයින් මතු සිහිනොකරත්. කුමක් හෙයින්දයත්: නුවණ දුර්ලබැවිනි. නාමරූප පිරිසිදීමෙන් තොරබැවින් ඔවුන්ගේ නුවණ දුර්ලවේ. ශ්‍රාවකයන් අතුරෙහිවනාහි අසූ මහා ශ්‍රාවකයෝ කප්සියදහසක් සිහි කරත්. දෙයගසවිවෝ කල්ප ලක්‍ෂයක් අධිකකොට ඇති එක් අසඞ්ඛ්‍යයක්ද පසේබුදුවරයෝ දෙයාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයක්ද සිහිකරත්. ඔවුන්ගේ අභිනීහාරයද එපමණමවේ. බුදුරජුන්ගේවනාහි ඒ සිහිකිරීමෙහි පිරිසිදීමක් නැත්තේය. යම්තාක් කැමතිවෙත්ද, ඒතාක් සිහිකරත්. තීර්ථකයෝද සකන්ධපටිපාටියම සිහිකරත්. පටිපාටිය හැර ව්‍යුතිප්‍රතිසන්ධිවශයෙන් සිහිකරන්නට අසමර්ථ වෙත්. ඔවුන්ට අන්ධයන්ට මෙන් කැමති පෙදෙසෙකට ඇතුල්වීමක් නැත්තේය. ප්‍රකෘතිශ්‍රාවකයෝද මහාශ්‍රාවකයෝද අග්‍රශ්‍රාවකයෝද ස්කන්ධපටිපාටියෙන් හා ව්‍යුතිප්‍රතිසන්ධිවශයෙන් යන දෙඅරිය සිහිකරත්. පසේබුදුවරයෝද ඒ දෙඅයුරින්ම සිහිකරත්. බුදුවරයෝවනාහි ස්කන්ධපටිපාටියෙන් හා ව්‍යුති ප්‍රතිසන්ධි වශයෙන් යන දෙඅයුරින්ම සිහිකරත්. පසේබුදුවරයෝද ඒ දෙඅයුරින්ම සිහිකරත්. බුදුවරයෝවනාහි ස්කන්ධපටිපාටියෙන්ද ව්‍යුතිප්‍රතිසන්ධිවශයෙන්ද සිංහගතිවශයෙන්ද නොයෙක් කප්කෙළ ගණන්හි යට හෝ මතුවෙහි යම් කපක්හි යම් භවයක යම් යම් තැනක් සිහිකරන්නට කැමතිවෙත්ද, ඒ ඒ සියලුතැන් සිහිකරත්මය.

'අයං ඛො බ්‍රාහ්මණ'යනාදි තන්හි **'මෙ'**යනු මාවිසින්. **'විජ්ජා'** විදිත කරණාර්ථයෙන් විද්‍යාය. කුමක් විදිත කෙරේදයත්: පූර්වේනිවාසය විදිතකරත අර්ථයෙනි. **'අවිජ්ජා'** ඒ පූර්වේනිවාසය අවිදිතකරන අර්ථයෙන් එය වසාලන මොහොය අවිද්‍යායි කියනුලැබේ. **'තමො'** ඒ මොහයම පූර්වේනිවාසය වසාලන අර්ථයෙන් තමයි කියනු ලැබේ. **'ආලොකො'** ඒ විද්‍යාවම අවභාසකරන අර්ථයෙන් ආලෝකයි කියනුලැබේ. මෙහිද **'විජ්ජා අධිගතා'** යනු විද්‍යාව ලද්දීයයන අර්ථයවේ. සෙස්ස ප්‍රශංසා වචනයි.

මෙහිවනාහි යෙදීම මෙසේය: 'බ්‍රාහ්මණ! මා විසින් මේ විද්‍යාව ලද්දීය. ලැබුවිද්‍යාව ඇති ඒ මාගේ අවිද්‍යාව නැසුනීය. වෙසෙසින් නැසුනීයයන අතීයි. කුමක් හෙයින්දයත්: යම්හෙයකින් විද්‍යාව උපන්නීද එහෙයිනි අනික් දෙපදයෙහිද මේ ක්‍රමයවේ. **'යථා තං'** යන මෙහි **යථා** යනු උපමාවෙහිය. **තං** යනුනිපාතයි. ස්මෘති අවිප්‍රවාසයෙන් **'අපපමත්තස්ස'** ප්‍රමත්ත නොවූ වීර්‍යතාපයෙන් **'ආතාපිනෝ'** කෙලෙස් තවන වැර ඇත්තාවූ කයෙහිද ජීවිතයෙහිද අපෙක්ෂා රහිතබැවින් **'පහිතත්තස්ස'** හළ ආත්මාලය ඇති යථාභිප්‍රෙතාර්ථසිද්ධියෙන් හළ සිත්ඇත්තාවූ යන අතීයි. යම් සේ සමෘති අවිප්‍රවාසයෙන් යුක්තවූ කෙලෙස්තවන වැරඇත්තාවූ අභිප්‍රෙතාර්ථ සිද්ධියෙහි යොමුකළ සිත්ඇතිව වසන්නහුගේ අවිද්‍යාව නැසෙන්නීද, විද්‍යාව උපදින්නීද, අන්ධකාරය නැසෙන්නේද, ආලෝකය උපදින්නේද, එපරිද්දෙන්ම මාගේ අවිද්‍යාව නැසුනේය. විද්‍යාව උපන්නීය. අන්ධකාරය නැසුනේය. ආලෝකය උපන්නේය. මේ ප්‍රදහනවීර්‍යයෙහි යෙදුනාවූ මා විසින් එයට සුදුසුමවූ ඵලය ලදැයි මෙය වදරණලද්දේවේ. **අයං ඛෝ මේ බ්‍රාහ්මණ පඨමා අභිනිබ්භිදා අහොසි, කුක්කුටජාපකසෙව අණ්ඩකොසම්හා'** බ්‍රාහ්මණ! මුවතුඩින් හෝ පානියසිළුවෙන් බිජුවට පළාගෙණ ඒ බිජුවටින් කුකුළු පැටවාගේ ඉපදීම නික්මීම කුක්කුට නිකායයෙහි ඉපදීම මෙන්, පූර්‍වේනිවාසානුස්මෘතිඥාන නමැති මුවතුඩින් පෙරවුසු කඳපිළිවෙළ වසාලන අවිද්‍යා නැමති බිජුවට පළාහැරීමෙන්වූ මේ මාගේ පළමුවන ඉපදීම, පළමුවන නික්මීම, පළමුවන ආර්‍යජාතියවිය.

පූර්‍වේනිවාසානුස්මෘති කථාව නිමි

—\\—

'සෝ එවං -පෙ- චුතූපපාතඤාණය' ච්‍යුතියෙහිද ප්‍රතිසන්ධියෙහිද ඥානයපිණිස යම් ඥානයකින් සත්ත්වයන්ගේ ච්‍යුතියත් ප්‍රතිසන්ධියත් දක්නාලැබේද, ඒ පිණිසයයි වදරණලදය. **'චිත්තං අභිනින්නාමෙසිං'** පරිකර්ම චිත්තය ධ්‍යානාලම්බනයෙන් පහකොට දිවැසට අභිමුඛකොට එළවීමි. **'සෝ දිබ්බෙන -පෙ- පස්සාමි'** මෙහි වනාහි පිරුපැරුම්ඇති මහා සත්වයන්ට පරිකර්ම කිරීමක් නැත්තේය. ඔවුහු සිත දිවැසට අභිමුඛකොට එළවූ ඇසිල්ලෙහිම දිවැසින් සත්වයන් දකිත්. ආදිකර්මික කුලපුත්‍රයෝවනාහි පරිකර්මකොට සත්වයන් දකිත්. එහෙයින් ඔවුන්ගේවශයෙන් දිවැසට පරිකර්ම කියයුතු වන්නේය. එහෙත් එය කියනුලබන්නේ විනය නිදනය ඉතා බැරෑරුම් කරන්නේය. එහෙයින් එය මෙහි නොකියමු. ප්‍රයොජන ඇත්තවුන් විසින් විශුද්ධිමාර්ගයෙහි කියූනයින් දතයුතුය. පාළිභාෂාවම විස්තරවිසින් කියන්නෙමු.

"සො" ඒ මම. **'දිබ්බන'** යනාදිතන්හි දෙවියන්ගේ දිවැස වැනිබැවින් දිබ්බ නම්වේ. දෙවියන්ට සුචරිත කර්මයෙන් උපන් පින්, සෙම්, ලේ ආදියෙන් උපද්‍රූතනොවූ උපකෙලෙශයන්ගෙන් මිදුනුබැවින් දුරවූද අරමුණු පිළිගැනීමෙහි සමර්ථවූ දිව්‍යප්‍රසාද චක්ෂුසවේ. මේ වීර්‍ය භාවනාබලයෙන් උපන්නාවූ ඥානචක්ෂුසද එබඳුමයයි දිව්‍යසදෘශබැවින් දිබ්බ නම්වේ. දිව්‍යවිහරණසඞ්ඛ්‍යාත චතුර්විධ ධ්‍යානයන්ගේවශයෙන් පිළි ලැබුබැවින්ද,. තමාත් දිව්‍යවිහරණය ඇසුරුකොට පවත්නා බැවින්ද දිබ්බ නම්වේ. ඥානාලෝකයාගේ පැතිරීමෙන් මහත් බැබලීම් ඇතිබැවින්ද දිබ්බ නම්වේ. බිත්ති ආදියෙන් පිටත්හිවූ රූපදර්‍ශනයෙහි මහත් ගති ඇති බැවින්ද දිබ්බ නම්වේ. ඒ සියල්ල ශබ්දශාස්ත්‍රානුසාරයෙන් දතයුතුය. රූපදකීම් අරුතින් චක්ඛුනම්. චක්ෂුස්කෘත්‍යය කිරීමෙන් චක්ෂුස වැනිනුයි චක්ඛුනම්. ව්‍යුතිප්‍රතිසන්ධි දැකීමෙන් දෘෂ්ටිවිශුද්ධියට හේතුබැවින් විසුද්ධ නම්වේ.

යමෙක්වනාහි ච්‍යුතිය පමණක්ම දකීද, ප්‍රතිසන්ධිය නොදකීද, හෙතෙමේ උච්ඡෙදදෘෂ්ටියට බැසගනියි. යමෙක් ප්‍රතිසන්ධිය පමණක්ම දකීද ච්‍යුතිය නොදකීද, හෙතෙමේ අභිනව සත්වයන්ගේ ප්‍රාදුර්භාව දෘෂ්ටියට බැසගනියි. යමෙක්වනාහි ව්‍යුතිප්‍රතිසන්ධි දෙක දකීද, හෙතෙමේ යම්හෙයකින් ශාස්වතොච්ඡෙද සඞ්ඛ්‍යාතවූ දෙවැදරුම්වූද මිථ්‍යාදෘෂ්ටිය ඉක්මවාද, එහෙයින් මොහුගේ ඒ දකීම දිට්ඨිවිසුද්ධියට හේතුවේ. භාග්‍යවතුන්වහන්සේ එදෙකම දුටුසේක.

එහෙයින් මෙය ව්‍යුතිප්‍රතිසන්ධි දෙක දකීමෙන් දිට්ඨිවිසුද්ධියට හේතුබැවින් විසුද්ධයි වදළසේක. එකාදශවිධවූ උපකෙලෙශයන්ගෙන් තොරවූ බැවින් හෝ විසුද්ධය. භාග්‍යවතුන්වහන්සේගේ දිවැස එකාදශවිධ උපකෙලෙශයන්ගෙන් තොරවූයේය. එය මෙසේ වදළසේක. **'සො ඛො අහං අනුරුද්ධ විචිකිච්ඡා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා විචිකිච්ඡං චිත්තස්ස උපක්කිලෙසං පජහිං. අමනසිකාරො චිත්තස්ස, ථිනමිද්ධං චිත්තස්ස, ඡම්භිතත්තං චිත්තස්ස, උබ්බිල්ලාවිතං චිත්තස්ස, දුට්ඨුල්ලං චිත්තස්ස, අච්චාරද්ධවීරියං චිත්තස්ස, අතිලීනවීරියං චිත්තස්ස, අභිජප්පා චිත්තස්ස, නානත්ත සඤ්ඤා චිත්තස්ස, අතිනිජ්ඣායිතත්තං රූපානං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අභිජ්ඣායිතත්තං රූපානං චිත්තස්ස උපක්කිලෙසං පජහිං සො ඛො අහං අනුරුද්ධ අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො ඔභාසං හි ඛො සඤ්ජානාමි, න ච රූපානි පස්සාමි, රූපානි ඛො පස්සාමි, න ච ඔභාසං සඤ්ජානාමීති'**[A] යන මේ

A මජ්ඣිමනිකාය - උපක්කිලෙස සූත්‍ර

ආදියයි. එය මෙසේ එකාදශ උපකෙලශයන්ගෙන් තොරබැවින් හෝ විසුද්ධය. මනුෂ්‍යොපචාරය ඉක්මවා රූපදැකීම හේතුකොට අතික්කන්තමානුසකය. මිනිසුන් පිළිබඳ මසැස ඉක්මුනුබැවින් හෝ අතික්කන්තමානුසකයි දතයුතුය.

ඉක්මවා සිටි පිරිසිදුවූ දිවැසින් **'සත්තෙ පස්සාමි'** මසැසින් බලන මිනිසකු මෙන් සත්ත්වයන් බලමි. දකිමි. හාත්පසින් බලමි. **'චවමානෙ උපපජ්ජමානෙ'** මෙහි ව්‍යුතික්ෂණයෙහි හෝ උත්පත්ති ක්ෂණයෙහි දිවැසින් දකින්නට නොහැකිය. යම් සත්ත්වකෙනෙක් ආසන්නවූ ව්‍යුතිය ඇත්තාහුද, දැන් ව්‍යුතවන්නාහුද, ඔවුහු චවමාන නම්වෙතියිද, යම් සත්ත්වකෙනෙක් ගන්නාලදප්‍රතිසන්ධි ඇත්තාහුද, දැන් උපන්නාහු හෝ වෙත්ද, ඔවුහු උපපජ්ජමාන නම්වෙතියිද අභිමතයහ. මෙබඳුවූ ව්‍යුතවන්නාවූද උපදින්නාවූද සත්ත්වයන් දකිමියි දක්වනසේක. **'හීනෙ'** මෝහයාගේ උපනිශ්‍රය භාවයෙන් හා මෝහයාගේ ප්‍රවෘත්ති බාහුල්‍යයෙන් ලාමකවූ, ජාති, කුල, භොගාදීන්ගේවිශයෙන් ගැරහූ, වෙසෙසින් ගැරහූ, ලාමකභාවයෙන් දන්නාලද ලාමකභාවයෙන් වෙසෙසින් ගැරහූ, ලාමකභාවයෙන් දන්නාලද, ලාමකභාවයෙන් වෙසෙසින් දන්නාලද. **'පණීතෙ'** අමොහයාගේ ප්‍රවෘත්ති බාහුල්‍යයෙන් යුක්තබැවින් එයට විපරීතවූ, **'සුවණ්ණෙ'** අදෙස බාහුල්‍යයෙන් යුක්තබැවින් ඉෂ්ටවූ කාන්තවූ, මනවඩන්නාවූ, පැහැයෙන් යුක්තවූ **'දුබ්බණ්ණෙ'** දෙස බාහුල්‍යයෙන් යුක්තබැවින් අනිෂ්ටවූ, අකාන්තවූ, මන නොවඩන්නාවූ, පැහැයෙන් යුක්තවූ, අභිරූපවූද විරූපවූද යන අර්ථයි. **'සුගතෙ'** සුගතියට ගියාවූ, අලොභයාගේ බාහුල්‍යයෙන් යුක්තබැවින් හෝ ආඪ්‍යවූ මහත්ධන ඇත්තාවූ. **'දුග්ගතෙ'** දුගතියට ගියාවූ, ලොභයාගේ බාහුල්‍යයෙන් යුක්තබැවින් හෝ දිලිඳුවූ, කැම්බීම් නැත්තාවූ, **'යථාකම්මූපගෙ'** ඵල ළඟවනබැවින් යම් යම් කර්මයක් රැස්කරණලදද ඒ ඒ කර්මයෙන් යුක්තවූවන්.

එහි පළමු දක්වූ **'චවමානෙ'** යනාදී පදයන්ගෙන් දිව්‍යචක්ෂුස්කෘත්‍යය කියනලදී. **'යථාකම්මූපගෙ සත්තෙ පජානාමි'** යනමේ වාක්‍යයෙන් යථාකර්මොපගඥානකෘත්‍යය කියනලදී. ඒ ඥානයාගේ උත්පත්තික්‍රමය මෙසේය: දිවැස්නුවණ ලදහෙතෙමේ යට නිරයට අභිමුඛකොට ආලෝකය වඩා මහත් දුක් අනුභවකරන්නාවූ නෙරයිකසත්ත්වයන් දකියි. ඒ දැකීම දිව්‍යචක්ෂුස්කෘත්‍යයමවේ. දිවැස්නුවණ ලද හෙතෙමේ 'කිනම් කර්මයක්කොට මේ සත්වයෝ මේ දුක් විඳින්ද'යි මෙසේ මෙනෙහිකරයි. ඉක්බිති මොහුට 'මෙනම් කර්මයක් කොටැ'යි ඒ කර්මය අරමුණුකොට ඥානය උපදියි. එසේ මතුවෙහි දෙවිලොවට අභිමුඛකොට ආලෝකය වඩා නන්දනවන මිස්සකවන ඵාරුසක වනාදියෙහි

මහත්සම්පත් අනුභවකරන්නාවූ සත්වයන් දකියි. ඒ දකීමද දිව්‍යචක්ෂුස්කෘත්‍යයමවේ. දිවැස්තුවණලද හෙතෙමේ 'කිනම් කර්මයක්කොට මේ සත්වයෝ මේ සම්පත් විඳින්ද'යි මෙසේ සිහිකරයි. ඉක්බිති මොහුට 'මෙනම් කර්මයක්කොටැ'යි ඒ කර්මය අරමුණුකොට ඥානය උපදියි. මේ වනාහි යථාකර්මෝපගඥාන නම්වේ. මේ ඥානයට වෙන්වූ පරිකර්මයක් නැත්තේය. යම්සේ මේ ඥානයට වෙන්වූ පරිකර්මයක් නැත්තේද එසේ අනාගතාංශඥානයටද වෙන්වූ පරිකර්මයක් නැත්තේය. මේ යථාකර්මෝපග අනාගතාංශඥානයෝ දිව්‍යචක්ෂුස පාදකකොට සිටියහ. දිව්‍යචක්ෂුස සමගම සමෘද්ධ වන්නාහ.

'කායදුච්චරිතෙන' යනාදි තන්හි නපුරු හැසිරීම, කෙලෙසුන්ගෙන් කුණුවූ බැවින් නින්දිතවූ හැසිරීම දුච්චරිත නම්. කයින් නපුරුහැසිරීම හෝ කයින් උපන් දුශ්චරිතය කායදුශ්චරිතයයි. වාඩ්මන දුශ්චරිතයෝද මෙසේ දතයුත්තාහ. **'සමන්නාගතා'** යුක්තවූ. **'අරියානං උපවාදකා'** බුද්ධ, ප්‍රත්‍යේකබුද්ධ බුද්ධශ්‍රාවකවූ ආර්‍යයන්ට. යටත්පිරිසෙයින් ගිහි ස්‍රොතාපන්නයන්හටද අනර්ථී කැමතිව අන්තිම වස්තුවෙන් හෝ විද්‍යමාන ගුණ නැසීමෙන් දෙස් නගන්නෝය. ආක්‍රොශ කරන්නෝය. ගරහන්නෝයයි වදරණලද්දේවේ.

එහි 'මොවුන්හට මහණදමක් නැත, මොවුහු අශ්‍රමණයෝ'යි කියනුයේ අන්තිම වස්තුවෙන් දෙස් නැගීමම කරයි. 'මොවුන්හට ධ්‍යානයක්, විමොක්ෂයක්, මාර්ගයක්, ඵලයක් හෝ නැතැ'යි කියනුයේ ගුණ නැසීමෙන් දෙස් නැගීම කෙරේයයි දතයුතුය. ඒ දෙස් නැගීම කරනුයේද දන්නේ හෝ නොදන්නේ දෙස් නැගීම කරන්නේය. දෙපරිද්දෙන්ම දෙස් නැගීම ආර්‍යාපවාදයමවේ. මේ කර්මය ඉතා බැරෑරුම්ය. සැඟීවරණද මාර්ගාවරණදවේ. එය ප්‍රකට කරණුපිණිස මේ කථාවස්තුව ගෙනහැර දක්වත්:

එක්තරා ගමක එක් ස්ථවිරනමක්ද තරුණ භික්ෂුනමක්ද පිඬුසිහා හැසිරෙති. ඔවුහු පළමුගෙයිදීම කෙණෙස්සක් පමණ උණුකැඳක් ලැබූහ. තෙරුන්ගේ උදරයෙහි වාතයක් ඇත්තේය. එහෙයින් ස්ථවිරතෙමේ 'මේ කැඳ මට හිතවේ. සිහිල්වන්නට පෙරාතුව එය වළඳිමි'යි සිතුයේය. සිතා මිනිසුන් විසින් එලිපතක් සඳහා ගෙනැවිත්තුබූ දැවකඩක හිඳ එය වැළඳුයේය. තරුණ භික්ෂුතෙමේ 'මේ මහල්ලා තද බඩගිනිඇත්තේ ඒකාන්තයෙන් අපට ලජ්ජාවියයුත්තක් කෙළේය'යි එය පිළිකුල් කෙළේය. ස්ථවිරතෙමේ ගමෙහි පිඬුසිහා හැසිර වෙහෙරට ගොස් 'ඇවැත! ඔබට මේ ශාසනයෙහි පිහිටක් ඇත්තේද'යි ඒ තරුණ භික්ෂුනමගෙන් ඇසීය. 'සවාමීනි! එසේය, ඇත්තේය, මම සෝවාන්මි'යිකීය. 'ඇවැත! එසේනම්

මතු මාඝීපිණ්ඩය උත්සාහ නොකරව, යුෂ්මත්හු විසින් දෙස් නගනලද්දේ ක්ෂීණාස්‍රවයෙකැ'යි කීවිට ඒ භික්ෂුනම මහතෙරහු කමාකරවීය. එහෙයින් ඔහුගේ එය පියවිබවට ගියේය.

එහෙයින් අනෙකෙක්ද ආර්‍යයන්හට දෙස් නගානම්, ඔහු විසින් ඔහුවෙත ගොස් ඔහු තමාටවඩා වෘද්ධතර වේනම්, 'මම ආයුෂ්මත්හට මේ මේ වචන කීමි, මට එයට කමාවනු මැනවැ'යි කමාකරවියයුතුය. ඉදින් නවකතරයෙක් වේනම්, වැඳ උක්කුටිකයෙන්හිඳ ඇඳිලිබැඳ 'වහන්ස! මම ඔබවහන්සේට මේ මේ වචන කීමි, එයට මට කමාවනු මැනවැ'යි කමා කරවියයුතුය. ඉදින් ඔහු කමානොකෙරේනම්, දිග් බලා ගියේ හෝ වේනම්, එකල ඒ විහාරයෙහි යම් භික්ෂූහු වසත්නම්, ඔවුන් වෙතට ගොස් ඉදින් තමාටවඩා වෘද්ධතරවේනම්, සිටියනු විසින්ම කමාකරවියයුතුය. ඉදින් නවකතරවේනම්, උක්කුටිකයෙන්හිඳ ඇඳිලිබැඳ 'වහන්ස! මම අසුවල් ආයුෂ්මත්හට මේ මේ වචන කීමි, ඒ ආයුෂ්මත්තෙමේ මට කමාවා'යි මෙසේ කියන්නහු විසින් කමා කරවියයුතුය. ඉදින්හෙතෙමේ පිරිනිවියේවේනම්, පිරිනිවි ඇඳ කුබුකැනට ගොස්, සොහොනට හෝ ගොස් කමා කරවියයුතුය. මෙසේ කළකල්හි සඟීවරණද මාඝීවරණද නොවේ. පියවිසැහැවි ඇත්තේමවේ.

'මිච්ඡාදිට්ඨිකා' විපරීතදෘකුම්ඇත්තාහු. **'මිච්ඡාදිට්ඨිකම්ම සමාදනා'** මිත්‍යාදෘෂ්ටිවශයෙන් සමාදන්වූ නානාවිධ කම්ඇත්තාහු. යම්කෙනෙක් මිත්‍යාදෘෂ්ටිය මුල්කොටඇති කායකම්ාදීන්හි අන්හුද සමාදන්කරවත්ද, එහි වාග්දුශ්චරිත ග්‍රහණයෙන්ම ආයේ‍යාපවාදයද මනොදුශ්චරිත ග්‍රහණයෙන් මිත්‍යාදෘෂ්ටියද සඞ්ගෘහිත කල්හිද මේ ආයේ‍යාපවාද මිත්‍යාදෘෂ්ටි දෙක්හි නැවතකීම මහාසාවද්‍යභාවය දැක්වීම පිණිසයි දතයුතුය. ආයේ‍යාපවාදය මහාසාවද්‍යමය. අනතුරු අත්බවෙහි විපාක දෙන කම් සමානවේ. ඒ මෙසේ වදළසේක: **'සෙය්‍යථාපි සාරිපුත්ත භික්ඛු සීලසම්පන්නො සමාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො දිට්ඨේව ධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය, එවං සම්පදමිදං සාරිපුත්ත වදමි, තං වාචං අපහාය තං චිත්තං අපහාය තං දිට්ඨිං අපපටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ'**[A]යි. මිත්‍යාදෘෂ්ටියට වඩා අතිශය මහා සාවද්‍යවූ කම්යක් නැත්තේය. ඒ මෙසේ වදළසේක: **'නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං මහාසාවජ්ජතරං, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨිපරමානි වජ්ජානි'**[B] යි. **'කායස්ස භෙදා'** උපාදින්නස්කන්ධයන්ගේ පරිත්‍යාගයෙන්, **'පරම්මරණා'** එයට අනතුරුව උපන් ස්කන්ධයන්ගේ

A මජ්ඣිමනිකාය - මහාසීහනාද සූත්‍ර B එකකඞ්ගුත්තර

ගැනීමෙහි නොහොත් **'කායස්ස භෙදා'** ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීමෙන්. **'පරම්මරණා'** ව්‍යුතිචිත්තයෙන් මතුවෙහි. **'අපායං'** මේ ආදීසියල්ල නිරයට පර්‍යාය වචනයි. නිරය වනාහි සැඟී මොක්ෂයන්ට කරුණුවූ පුණ්‍යසම්මතවූ අය සඞ්ඛ්‍යාත සුඛයෙන් පහවූබැවින්, නොහොත් සුඛයන්ගේ හටගැනීමට කරුණුවූ අයසඞ්ඛ්‍යාත සුචරිතයාගේ අභාවයෙන් අපාය නම්වේ. දුකට පිහිටය, පිළිසරණුයි **දුග්ගති**. දෙවිෂබාහුල්‍යයෙන් හෝ දූෂිතකර්මයෙන් නිපත් ගතියනුයි **දුග්ගති**. දුෂ්කෘතකාරීහු තමාගේ වශයෙහි නොපවත්නාහු, එහි වැටෙත්නුයි **විනිපාත** නොහොත් බිඳුනු අහපසඟ ඇතිව වැනසෙන්නාහු මෙහි වැටෙත්නුයි විනිපාත. මෙහි ආස්වාදයි නම්ලද තමන් කැමතිසේ විඳිනුලබන සැපයක් නැත්තේනුයි **නිරය** නම්වේ.

තවද අපාය ග්‍රහණයෙන් තිරිසන් යොනිය දක්වයි. තිරිසන් යොනියවනාහි මනාගතියෙන් පහවූබැවින් අපායනම්. මහෙශාක්‍ය නාගරාජාදීන් උපදිනබැවින් දුර්ගතිනොවේ. දුර්ගතිග්‍රහණයෙන් ප්‍රෙතවිෂය දක්වයි. ඒ වනාහි සුගතිගතියෙන් පහවූ බැවින්ද, දුකට පිහිටවූ බැවින්ද, අපාය දුර්ගතිදවේ. ලොකාන්තරික නරකයෙහි ප්‍රේතාසුරයන්මෙන් නැසුනු සිරුරු ඇතිව නොවැටෙනබැවින් විනිපාතනොවේ. මහත්සෘද්ධිඇති ප්‍රේතයන්ටද විමන් පහළවේ. විනිපාත ග්‍රහණයෙන් අසුරකාය දක්වයි. ඒ අසුරකායවනාහි යටකියූ අරුතින් අපායද, දුර්ගතිදවේ. සියලු සම්පත් සමූහයෙන් විවශව පතිතවනබැවින් විනිපාතයිද කියනුලැබේ. නිරය ග්‍රහණයෙන් අවීචිආදීවූ අනෙකප්‍රකාර නිරයම දක්වයි. **'උපපන්නා'** එළැඹියෝය. එහි උපන්නාහුය යන අදහසය. මෙහි කියූ 'කායදුච්චරිතෙන' යනාදි පදයන්ට කියූ අර්‍ථයන්ට විපරීතවශයෙන් ශුකලපක්ෂය දතයුතුය. මේවනාහි විශේෂයවේ: මෙහි සුගතිග්‍රහණයෙන් මනුෂ්‍යගතියද සඞ්ග්‍රහකරනුලැබේ. සඟග්‍රහණයෙන් දෙවගතියම සඞ්ග්‍රහකරනුලැබේ. එහි සුන්දරවූ ගතියනුයි සුගති. රූපාදීවූ පඤ්චකාම විෂයයෙන් මොනවට අග්‍රනුයි ස්වර්ගනම්වේ. ඒ සියල්ලම නැසෙන වැනසෙන අරුතින් ලොකනම්වේයයනු වචනාර්‍ථයවේ. **'විජ්ජා'** දිව්‍යචක්ෂුර්ඥනවිද්‍යාය. **'අවිජ්ජා'** සත්වයන්ගේ ව්‍යුතිප්‍රතිසන්ධීන් වසාලන අවිද්‍යාය. සෙස්ස කියූ අර්‍ථක්‍රම ඇත්තේය. මේම මෙහි විශේෂයවේ: 'යම්සේ' පූර්වේනිවාසකථාවෙහි පූර්වේනිවාසානුස්මෘතිඥන නමැති මුවතුඩින් පෙරවුපූ කඳපිළිවෙළ වසාලන අවිද්‍යානමැති අණ්ඩකොෂය පලාහැරියි කියනලද්දේද, මෙසේ මෙහි ව්‍යුත්‍යුත්පත්තිඥන නමැති මුවතුඩින් ව්‍යුතිඋත්පත්තීන් වසාලන අවිද්‍යා නමැති අණ්ඩකොෂය පලාහැරයි කියයුතුය.

දිව්‍යචක්ෂුර්ඥන කථාව නිමි

'සො එවං සමාහිතෙ චිත්තෙ' යනමෙහි විදර්ශනාපාදක චතුර්ථ ධ්‍යාන චිත්තය දතයුතුය. **'ආසවානං ඛයඤාණාය'** අර්හත්ත්වමාර්ග ඥානයපි ණිසය. අර්හත්ත්වමාර්ගයවනාහි ආස්‍රවයන් නසනබැවින් ආස්‍රවයන්ගේ ක්ෂයයි කියනුලැබේ. එහිද මේ ඥානය එයට ඇතුළත්බැවිනි. **'චිත්තං අභිනින්නාමෙසිං'** විදර්ශනාචිත්තය එළවීමි. **'සො ඉදං දුක්ඛං'**යන මේආදිතන්හි 'දුක් මෙපමණය, මෙයට වැඩියක් නැත්තේය'යි සියලු දුඃඛසත්‍යය කෘත්‍යසහිත ලක්ෂණ ප්‍රතිවේධයෙන් තතුපරිදි අවබෝධ කෙළෙමි. දනගතිමි. ප්‍රතිවේධ කෙළෙමි. ඒ දුක උපදවන තෘෂ්ණාව 'මේ දුඃඛසමුදය'යිද, ඒ දුඃඛය හා දුඃඛසමුදය යනදෙක යම්තැනකට පැමිණ නිරුද්ධවේද, ඔවුන්ගේ ඒ නොපැවැත්මවූ නිවණ 'මේ දුඃඛනිරෝධය'යිද, එයට පමුණුවන ආර්‍යමාර්ගය 'මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදය'යිද කෘත්‍යසහිත ලක්ෂණ ප්‍රතිවේධයෙන් තතුපරිදි අවබෝධ කෙළෙමි. දනගතිමි. ප්‍රතිවේධ කෙළෙමියි මෙසේ අර්ථ දතයුතුය.

මෙසේ ස්වරූපවශයෙන් සත්‍යයන් දක්වා දැන් කෙලශවශයෙන් පර්‍යාය හෙයින් සත්‍යයන් දක්වනසේක් **'ඉමෙ ආසවා'** යනාදිය වදළසේක. **'තස්ස මෙ එවං ජානතො එවං පස්සතො'** මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඒ මාගේ. විදර්ශනාව සමග කෙළපැමිණි මාර්ගය වදරණසේක. 'කාමාසවා' කාමාස්‍රවයෙන්. **'විමුච්චිත්ථ'** මෙයින් ඵලක්ෂණය දක්වාලන්නාහ. මාර්ගක්ෂණයෙහිදීවනාහි සිත මිදෙන්නේය. ඵලක්ෂණයෙහිදී මිදුනේවේ. **'විමුත්තස්මිං විමුත්තමිති ඤාණං'** මෙයින් ප්‍රත්‍යවෙක්ෂාඥානය දක්වා ලන්නාහ. **'ඛීණා ජාති'** යනාදියෙන් ඒ ප්‍රත්‍යවෙක්ෂාඥානයාගේ භූමිය දක්වාලන්නාහ. භාග්‍යවතුන්වහන්සේ ඒ ඥානයෙන් ප්‍රත්‍යවෙක්ෂාකරනසේක් 'ජාතිය ක්ෂයවූවා' යනාදිය අවබෝධ කළසේක. භාග්‍යවතුන්වහන්සේගේ කවර ජාතියක්වනාහි ක්ෂයවූවාද? එය කෙසේ අවබෝධ කළසේක්දයත්: එහිලා කියනු ලැබේ: උන්වහන්සේගේ අතීත ජාතියවනාහි මාර්ග භාවනාවෙන් ක්ෂය නොවූය. එසේවූවා පෙරම ක්ෂයවූබැවිනි. අනාගතයෙහි ව්‍යායාමය නැතිබැවින් අනාගත ජාතිය ක්ෂයනොවූය. විද්‍යමානබැවින් ප්‍රත්‍යුත්පන්න ජාතිය ක්ෂය නොවූය. මාර්ගය නොවැඩුබැවින් ඒක චතුපඤ්චවොකාර භවයන්හි ඒක චතුපඤ්චස්කන්ධයන්ගේ වශයෙන් ප්‍රභෙදඇති යම් ජාතියක්වනාහි උපදින්නීද, ඒ ජාතිය මාර්ගය වැඩුබැවින් නැවත නොඉපැදෙනබවට පැමිණීමෙන් ක්ෂයවූවාය. ඒ භාග්‍යවතුන්වහන්සේ ඒ ජාතිය මාර්ගභාවනාව කරණකොට ප්‍රහීණකෙලශයන් ප්‍රත්‍යවෙක්ෂාකොට කෙලශයන්ගේ අභාවයෙහි විද්‍යමානවූද කර්මය මතුවෙහි පිළිසිඳගැනීම නොකෙරේයයි දන්නාසේක් මනාකොට අවබෝධකළසේක. **'වුසිතං'** වැස නිමවනලද කරනලද හැසිරෙණලද නිමවනලද යන අර්ථයි.

'බ්‍රහ්මචරියං' මාගීබ්‍රහ්මචර්‍යීය. පෘථග්ජන කල්‍යාණයාසමග සත් ශෛක්ෂ්‍යයෝ බ්‍රහ්මචර්‍යීවාසය වසන්නාහු නම්වෙති. ක්ෂීණාස්‍රවයන්වහන්සේ වැස නිමකළ බ්‍රහ්මචර්‍යීවාසය ඇත්තාහුය. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ තමන්වහන්සේගේ බ්‍රහ්මචර්‍යීවාසය ප්‍රත්‍යවේක්ෂාකරනසේක්, බ්‍රහ්මචර්‍යීය වැස නිමකරනලදැයි මොනවට අවබොධකළසේක. **'කතං කරණීයං'** චතුස්සත්‍යයන්හි චතුර්විධ මාගීයෙන් පරිඥ, ප්‍රහාණ, සාක්ෂාත්කරණ, භාවනාවශයෙන් සොළොස්වැදරුම්වූද කෘත්‍යය නිමවනලදය, යනඅර්ථයි. පෘථග්ජන කල්‍යාණාදීහු මේ කෘත්‍යය නිමවනලදය, යනඅර්ථයි. පෘථග්ජනකල්‍යාණාදීහු මේ කෘත්‍යය කරත්. ක්ෂීණාස්‍රවයන්වහන්සේ කළකෘත්‍යය ඇතිසේක. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ තමන්වහන්සේගේ කෘත්‍යය ප්‍රත්‍යවේක්ෂා කරනසේක් කළයුත්ත කරනලදැයි මොනවට අවබෝධකළසේක. **'නාපරං ඉත්ථත්තාය'** දැන් නැවත මේ වර්තමාන ස්කන්ධසන්තානය හේතුකොට අන්‍යවූ අනාගත ස්කන්ධසන්තානයක් මට නැත්තේයයි මෙසේ සොළොස් වැදරුම්වූ කෘත්‍යභාවයපිණිස හෝ ක්ලෙශයන්ගේ ක්ෂය කිරීමපිණිස මාගීභාවනා කෘත්‍යයක් මට නැත්තේයයි මොනවට අවබෝධකළසේක.

දැන් මෙසේ ප්‍රත්‍යවේක්ෂා ඥනයෙන් පරිගෘහිතවූ ආස්‍රවයන්ගේ ක්ෂයකිරීමෙන් සිද්ධවූ ඒ ඥනාධිගමය බ්‍රාහ්මණ්‍යාභට දක්වනසේක් **'අයං ඛො බ්‍රාහ්මණ'** යනාදිය වදළසේක. එහි **'විජ්ජා'** යනු අතීතභවමාගීඥන විද්‍යාය. **'අවිජ්ජා'** යනු චතුස්සත්‍යය වසන අවිද්‍යාය. සෙස්ස කියූනය ඇත්තේමය. මේ වනාහි විශේෂයවේ:- **'අයං ඛො මේ බ්‍රාහ්මණ පඨියා අභිනිබ්භිදා අහොසි'** යනමෙහි 'බ්‍රාහ්මණ යම්සේ මුවතුඩින් හෝ පානියසිඑවෙන් හෝ අණ්ඩකොෂය පලාහැර ඒ අණ්ඩකොෂයෙන් කුකුළුපැටවාගේ අභිනිෂ්ක්‍රමණය නික්මීම කුකුට නිකායෙහි ඉපැත්මවීද, එසේ මාගේ ආස්‍රවක්ෂය ඥන නමැති මුවතුඩුන් චතුස්සත්‍ය වසාලන අවිද්‍යා නමැති අණ්ඩකෝෂය පලාහැර මේ තෘතීය අභිනිෂ්ක්‍රමණයවූයේය, තෘතීය ආර්‍ය ජාතියවූය. මෙපමණකින් කුමක් දක්වන සේක්දයත්: 'බ්‍රාහ්මණ! ඒ කුකුළුපැටවා අණ්ඩකෝෂය පලාහැර එයින් නික්මෙනුයේ වරක්ම උපදනේය, මමවනාහි පෙරවුදු කඳපිළිවෙළ වසාලන අවිද්‍යා නමැති අණ්ඩකොෂය බිඳහැර පළමුකොට පූර්වේනිවාසානුස්මෘතිඥන විද්‍යාවෙන් උපන්නේවීමි, නැවත එයින් පසු සත්වයන්ගේ ච්‍යුතිප්‍රතිසන්ධීන් වසාලන අවිද්‍යා නැමති අණ්ඩකොෂය පලාහැර දෙවනුව දිව්‍යචක්ෂුර්ඥනවිද්‍යාවෙන් උපන්නේ වීමි, නැවත චතුස්සත්‍යය වසාලන අවිද්‍යා නැමති අණ්ඩකොෂය පලාහැර තෙවනුව ආස්‍රවයන්ගේ ක්ෂයඥන විද්‍යාවෙන් උපන්නේ වීමි, මෙසේ ත්‍රිවිද්‍යාවෙන් තෙවෙරක් උපන්නේ

වෙමි. මාගේ ඒ ජාතිය ආර්‍යය. ඉතාපිරිසිදුයයි මෙය දක්වා ලූසේක. මෙසේ දක්වාලනුසේක්ද, පෙරවූදු කඳපිළිවෙළ දක්නා තුවණින් අතීතයෙහි පැවති ස්කන්ධ, ධාතු, ආයතන යන තෙකොටසෙහිවූ අප්‍රතිහතඥනය, දිව්‍යචක්ෂුර්ඥනයෙන් වර්තමාන, අනාගත දෙක්හිවූ ස්කන්ධ, ධාතු, ආයතනයන තෙකොටසෙහි පැවති අප්‍රතිහතඥනය, ආස්‍රවක්ෂයකරඥනයෙන් සියලු ලොවිලොවුතුරු ගුණදයි මෙසේ ත්‍රිවිද්‍යාවෙන් සියලුසර්ඥගුණයන් ප්‍රකාශකොට තමන්වහන්සේගේ ආර්‍යජාතියෙහි ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨභාවය බ්‍රාහ්මණයාහට දක්වා වදළසේක.

ආස්‍රවක්ෂයකරඥන කථාව නිමි

——\\——

'එවං වුත්තෙ වෙරඤ්ජා බ්‍රාහ්මණො' මෙසේ ලොකානුකම්පකවූ භාග්‍යවතුන්වහන්සේ විසින් බ්‍රාහ්මණයාහට අනුකම්පාකරන්නහු විශේෂයෙන් සැහවියයුතුවූද තමන්වහන්සේගේ ආර්‍යජාතියෙහි ජ්‍යෙෂ්ඨ ශ්‍රේෂ්ඨභාවය විද්‍යාත්‍රය ප්‍රකාශකරන්නාවූ ධර්මදේශනාවෙන් දක්වාවදළකල්හි ප්‍රීතිය පැතිරීමෙන් පිරිසුන් කයසිත්ඇති වෙරඤ්ජ බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ ආර්‍ය ජාතියෙහි ඒ ජ්‍යෙෂ්ඨ ශ්‍රේෂ්ඨභාවය දැන මමවනාහි සියලුලෝකයට ජ්‍යෙෂ්ඨ ශ්‍රේෂ්ඨවූ සියලුගුණයන්ගෙන් සමන්විතවූ මෙබඳු සර්ඥයන්හට අන්හට අභිවාදනාදික්‍රියා නොකෙරේයයි කිම්, කොල්ලෙනි! මාගේ අඥතාවයට ඒකාන්තයෙන් නින්දවේවායි තමාට ගහීකොට 'මෙතෙමේ දැන් ලෝකයෙහි ආර්‍ය ජාතියෙහි පළමුවඋපන් අතීතයෙන් ජ්‍යෙෂ්ඨය, සියලුගුණයන්ගෙන් තමාට සමයෙක් නැත්තේය යනඅතීතයෙන් ශ්‍රේෂ්ඨය'යි නිෂ්ඨාවට ගොස් **'ජෙට්ඨො භවං ගොතමො සෙට්ඨො භවං ගොතමො'**යි භාග්‍යවතුන්වහන්සේට මෙය කීයේය. මෙසේද කියා නැවත භාග්‍යවතුන්වහන්සේගේ ඒ ධර්මදේශනාව මොනවට අනුමෝදන් වනුයේ, **'අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම'** භවත් ගෞතමයන්වහන්ස! ඉතාමනාය, භවත් ගෞතමයන්වහන්ස! ඉතාමනාය, යනමේආදිය කීයේය. එහි මේ **'අභික්කන්ත'** ශබ්දය, බය, සුන්දර, අභිරූප, අබහුනුමොදනයන්හි දක්නාලැබේ. **'අභික්කන්තා භන්තෙ රත්ති නික්ඛන්තො පඨමො යාමො චිරනිසින්නෙනා භික්ඛුසඞ්ඝො'**[A] යනමේආදිතන්හි ක්ෂයයෙහි දක්නාලැබේ. **'අයං ඉමෙසං චතුන්නං පුග්ගලානං අභික්කන්තතරො ච පණීතතරො ච'**[B] යනාදිතන්හි සුන්දරයෙහි දක්නාලැබේ.

A චූලවග්ග පාතිමොක්ඛ ඨපනක්ඛන්ධක B චතුක්කඞ්ගුත්තර කොසලසංයුත්ත

'කො මෙ වන්දති පාදනි ඉද්ධියා යසසා ජලං,
අභික්කන්තෙන වණ්ණෙන සබ්බා ඔභාසයං දිසා'[C]

යනාදි තන්හි අභිරූපයෙහි දක්නාලැබේ. **'අභික්කන්තං භන්තෙ'** යනාදි තන්හි අබභනුමොදනයෙහි දක්නාලැබේ. මෙහිද අබභනුමොදනයෙහිමය. යම්හෙයකින් අබභනුමොදනයෙහිවේද, එහෙයින් 'භවත්ගෞතමයන්වහන්ස! මැනව, මැනව'යි කියනලදයි දතයුතුය.

'භයෙහි, ක්‍රොධයෙහි, ප්‍රශංසාවෙහි, වෙගයෙහි, කොතුහලයෙහි, අච්ඡරයෙහි, හාසයෙහි, ශොකයෙහි, ප්‍රසාදයෙහි යනමෙතන්හි නුවණැත්තේ ආමෙණ්ඩිතය කරන්නේය'යි කියූ මේ ලක්ෂණයෙන්ද, මෙහි ප්‍රසාදප්‍රශංසාවශයෙන් මේ අභික්කන්ත ශබ්දය දෙවරක් කියනලදයි දතයුතුය. නොහොත් 'අභික්කන්තං' යන මෙය අතිශය කාන්තය, අතිශය ඉෂ්ටය, අතිශයින් මන වඩන්නේය. අතිශයින් සුන්දරය'යි කියනලද්දේවේ.

එහි එක් අභික්කන්ත ශබ්දයකින් දේශනාවට ස්තුතිකරයි. එක් අභික්කන්ත ශබ්දයකින් තමන්ගේ ප්‍රසාදය දක්වයි. 'භවත් ගෞතමයන්වහන්ස! භවත් ගෞතමයන්වහන්සේගේ යම් මේ ධම්දේශනාවක්වේද, ඒ ධම්දේශනාව ඉතා මැනව, භවත් ගෞතමයන්වහන්සේගේ ධම්දේශනාව නිසා උපන් මාගේ යම් මේ ප්‍රසාදයක්වේද, ඒ ප්‍රසාදය ඉතා මැනව'යනු මෙහි මේ අදහසවේ. භාග්‍යවතුන්වහන්සේගේම වචනයට හෝ අර්ථ දෙකක් දෙකක් සඳහා ස්තුතිකරයි. 'භවත් ගෞතමයන්වහන්සේගේ වචන රාගාදීවූ දෙස් නසනබැවින් අතිඉෂ්ටය. ශීලාදි ගුණයන්ගේ අධිගමයෙන් අතිඉෂ්ටය. එසේ ශ්‍රද්ධාව උපදවනබැවින්, ප්‍රඥව උපදවනබැවින්, ශීලාදි අර්ථ සම්පත්තියෙන් සාර්ථබැවින්, ස්වභාව නිරුක්ති සම්පත්තියෙන් සබ්‍යඤ්ජනබැවින්, සුවිඥෙය ශබ්ද ප්‍රයොගයෙන් උත්තානපද ඇතිබැවින්, ගම්භීරවූ අර්ථඇතිබැවින්, කණට සුවඑළවනබැවින්, හෘදයඞ්ගමබැවින්, තමා හුවානොදක්වන බැවින්, පරහට අවමන් නොකරණබැවින්, කරුණාවෙන් සිහිල්බැවින්, කෙලෙස් අඳුරු නැසීමෙන් ප්‍රඥවදනබැවින්, අභිමුඛවූවනට සිත්කලුබැවින්, පූර්වාපර විරෝධ රාහිත්‍යයෙන් විමදිඤ්ඡමබැවින්, ඇසීමෙන් සුවඑළවනබැවින්, විමසන්නවුනට හිතබැවින්, යනමේආදිය සමග යොද දතයුතුය. එයින් මතුද චතුර්විධ උපමාවන්ගෙන් දෙශනාවටම ස්තුතිකරයි.

එහි **'නික්කුජ්ජිතං'** යටිමුවකොට තබනලද්දක් සැහැවියෙන්වූ යටිහුරුමුව ඇත්තක් හෝ **'උක්කුජ්ජෙය්‍ය'** උඩුහුරුමුව ඇත්තක් කරන්නේද,

A විමානවත්ථු

‘පටිවිජ්ඣනං’ තණුපත් ආදියෙන් වසනලද්දක්. **‘විවරෙය්‍ය’** විවෘත කරන්නේද, **‘මූළ්හස්ස’** දිග් මුළාවූවක්හට **‘මග්ගං ආචික්ඛෙය්‍ය’** අතගෙණ මේමගැයි කියන්නේද **‘අන්ධකාරෙ’** කාලපක්ෂයෙහි තුදුස්වක, අඩරෑ, ගතවනලැහැබ, විලාපටල යනමෙයින්යුත් සිවුරභඅඳුරෙහි, මේවනාහි අප්‍රකට පදයන්ගේ අර්ථයි. මේ මෙහි අධිප්‍රායයොජනයා: යම්සේ කිසිවෙක් යටිමුවකොට තබනලද්දක් උඩුහුරුකොට තබන්නේද, මෙසේ සද්ධර්මයට විමුඛවූ අසද්ධර්මයෙහි පිහිටියාවූ මා, අසද්ධර්මයෙන් නගාසිටුවන්නාවූ ජිළිසන්වූවක් යම්සේ විවෘතකරන්නේද, එසේ කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේගේ ශාසනාන්තර්ධානයෙහි පටන් මිත්‍යාදෘෂ්ටි ග්‍රහණයෙන් වැසුනු ශාසනය විවෘතකොට තබන්නාවූ දිග් මුළාවූවක්හට යම්සේ මග කියන්නේද, එසේ කුත්සිතමාර්ග සඞ්ඛ්‍යාත මිත්‍යාදෘෂ්ටිමාර්ගයට පිළිපන්නාවූ මට, සග්ගමොක්මග කියාලන්නාවූ යම්සේ අන්ධකාරයෙහි තෙල්පහනක් දරන්නේද, එසේ මොහඳුරෙහි ගැලීගියාවූ බුද්ධාදි රත්නත්‍රය සඞ්ඛ්‍යාත රූපයන් නොදක්නාවූ මාගේ ඒ වසා සිටියාවූ මොහඳුර නසන්නාවූ දේශනා නමැති ප්‍රදීපය දරන්නාවූ භවත් ගෞතමයන්වහන්සේ විසින් මේ ක්‍රමයන්ගෙන් ධර්ම්ය දේශනාකළබැවින් නොයෙක්ක්‍රමයෙන් ධර්ම්ය දේශනාකරනලද්දේවේ.

මෙසේ දේශනාවට ස්තුතිකොට මේ දේශනාවෙන් රත්නත්‍රයයෙහි පහන්සිත් ඇත්තේ ප්‍රසන්නයන් විසින් කළයුතු සත්කාරය කරනුයේ **‘එසාහං’** යනාදිය කීයේ ය. එහි **‘එසාහං’** ඒ මම. **‘භවන්තං ගොතමං සරණං ගච්ඡාමි’** ‘භවත් ගෞතමයන්වහන්සේ පිළිසරණැයි දනිමි. භවත් ගෞතමයන්වහන්සේ මට පිළිසරණැයහ, අනර්ථයන් වැළකීමෙන් හා අර්ථයන් මොනවට පිළියෙල කිරීමෙන් පිහිටියහ, පාපයෙන් රකින්නාහ, හිතද කරන්නාහ’යි යනමේ අදහසින් භවත් ගෞතමයන්වහන්සේ දනිමි, භජනය කරමි, සෙවනය කරමි, ලංව ඇසුරු කරමි, මෙසේ දනිමි, මෙසේ අවබෝධ කරමියි යම් ධාතුකෙනෙකුනගේ ගමනාර්ථයක්වේද, ඒ ධාතූන්ගේ අවබෝධයද අර්ථයවේ. එහෙයින් ‘ගච්ඡාමි’ යනමේ ක්‍රියාපදයට දනිමි, අවබෝධකරමියි මේ අර්ථයද කියනලද්දේවේ.

‘ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච’ මෙහි අවබෝධකළ මාර්ගයඇති, සාක්ෂාත්කළ නිරොධයඇති, අනුශාසනාපරිදි පිළිපදින්නවුන් සිවුඅපායයන්හි නොවැටුනවුන්කොට දරානුයි ධර්ම් නම්වේ. ඒ ධර්ම්ය අර්ථවශයෙන් ආර්ය්‍යමාර්ගයද නිර්ව්‍රණයදවේ. මෙය වදරණලද්දේමය: **‘යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො තෙසං අග්ගමක්ඛායති’**[A] යි

A චතුක්කඞ්ගුත්තර කොසලසංයුත්ත

විස්තරයවේ. හුදෙක් ආයෂ්මාඟීයද නිර්ඝාණයද අග්‍රනොවේ. තවද, ආයෂ්ඵලයන්සමඟ පර්‍යාපන්නධර්මයද අග්‍රවේ. ඡත්තමාණවක විමානයෙහි:

'රාග විරාග මනෙජ මසොකං ධම්මමසඞ්ඛතමප්පටිකූලං
මධුරම්මං පගුණං සුවිහත්තං ධම්මම්මං සරණත්ථමුපෙමි'[A]යි මෙය කියනලද්දේය.

මෙහිවනාහි **'රාගවිරාගෝ'** යනමෙයින් මාඟීය වදරණලද්දේය. **'අනෙජමසොකං'** යනමෙයින් ඵලය වදරණලද්දේය. **'ධම්මමසඞ්ඛතං'** යනමෙයින් නිර්ඝාණය වදරණලද්දේය. **'අප්පටිකූලං මධුරම්මං පගුණං සුවිහත්තං'** යනමෙයින් පිටකත්‍රයවශයෙන් බෙදනලද සියලුධර්ස්කන්ධයෝ ගැනෙත්. දිට්ඨිසීලයන්ගේ සංහතභාවයෙන් කෙලෙස් නසනලද්දේනුයි සඞ්ඝ නම්වේ. ඒ සඞ්ඝතෙමේ අර්හත්වශයෙන් අෂ්ටාර්‍යපුද්ගලසමූහ තෙමේය. ඒ විමානයෙහිම:

'යත්ථ ච දින්නමහප්ඵලමාහු චතූසු සුවීසු පුරිසයුගෙසු,
අට්ඨ ච පුග්ගල ධම්මදසා තෙ සඞ්ඝම්මං සරණත්ථමුපෙමි'[B]යි

මෙය වදරණලද්දේය. භික්ෂූන්ගේ සමූහය තෙමේ භික්ෂුසඞ්ඝනම්. මෙපමණකින්ද බ්‍රාහ්මණතෙමේ ත්‍රිවිධශරනගමනය දන්වා සිටියේය.

දැන් ඒ තුන්සරණයෙහිම දක්ෂභාවයපිණිස සරණ, සරණගමන, යමෙක් සරණයටයේනම් ඔහු, සරණගමනප්‍රභෙද, සරණගමන ඵල, සඞ්කිලෙසභෙද මේවිටි දතයුතුය. ඒ විටිය මෙහි කියනුලබන්නේනම්, විනයනිදනය බැරෑරුම්කරන්නේයයි මෙහි නොකියනලද්දේය. ප්‍රයෝජන ඇත්තවුන් විසින් **ප්‍රපඤ්චසුදනී**නම් මධ්‍යමනිකායාර්ථ කථාවෙහි හයහෙරව සූත්‍රවර්ණනාවෙන් හෝ **සුමඞ්ගලවිලාසිනී**නම් දීඝනිකායාර්ථ කථාවෙහි ශරණ වර්ණනාවෙන් උගතයුතුය.

'උපාසකං මං භවං ගොතමො ධාරෙතු' භවත්, ගෞතමයන්වහන්සේ 'මෙතෙමේ උපාසකයෙකැ'යි මා දරණසේක්වා යනුඅර්ථයි. උපාසක විටියෙහි දක්ෂභාවයපිණිස මෙහිදී 'උපාසක කවරේද? කුමක්හෙයින් උපාසකයැයි කියනුලැබේද? මොහුගේ ශීලය කුමක්ද? ආජීවය කවරේද? විපත්තිය කවරේද? සම්පත්තිය කවරේද'යි මේ ප්‍රකීර්ණකය දතයුතුවේ. එය ඉතා බැරෑරුම්ය. එහෙයින් මෙහි නොබෙදනලදී. ප්‍රයෝජනඇත්තවුන් විසින් **ප්‍රපඤ්චසුදනී**නම් මධ්‍යමනිකායාර්ථ කථාවෙහි කියූ ක්‍රමයෙන්ම දතයුතුය.

A විමානවත්ථු B විමානවත්ථු

'අජ්ජතග්ගෙ' මෙහි **'අග්ග'** ශබ්දය තෙමේ ආදිකොට්, කොට්ඨාස, සෙට්ඨ යනමෙතන්හි දක්නාලැබේ. **'අජ්ජතග්ගෙ සම්ම දොවාරික ආවරාම් ඛාරං නිගණ්ඨානං නිගණ්ඨිනං'**[A] යනාදිතන්හි ආදියෙහි දක්නාලැබේ. **'තෙනෙව අඩ්ඪුලග්ගෙන තං අඩ්ඪුලග්ගං පරාමසෙය්‍ය, උච්ඡග්ගං වෙළග්ගං'** යනාදීතන්හි කෙළවරෙහිද, **'අම්බිලං මධුරග්ගං ච තිත්තකග්ගං අනුජානාම් භික්ඛවෙ විහාරග්ගෙන වා පරිවෙණග්ගෙන වා ගාහෙතුං'**[B] යනාදි තන්හි කොට්ඨාසයෙහිද, **'යාවතා භික්ඛවෙ සත්තා අපද වා ද්විපද වා -පෙ- තථාගතො තෙසං අග්ගමක්ඛායති"**[C] යනාදි තන්හි ශ්‍රේෂ්ඨාර්ථයෙහිද දක්නාලැබේ. මෙයවනාහි මෙය ආද්‍යර්ථයෙහි දතයුතුය. එහෙයින් **'අජ්ජතග්ගෙ'** යනු 'අද ආදී කොටැ'යි මෙසේ මෙහි අර්ථ දතයුතුය. **'අජ්ජතං'**යි අදබවැ'යි කියනලද්දේවේ. **'අජ්ජදග්ගෙ'**යි හෝ පාඨයි. දකාරය පදසන්ධිය කරන්නේය. 'අද පටන් කොටැ'යි කියන ලද්දේ වේ. **'පාණුපෙතං'** දිවිතෙක් පැමිණි. 'භවත් ගෞතමයන්වහන්සේ මාගේ ජීවිතය යම්තාක් පවතීද ඒතාක් අන්‍ය ශාස්තෘවරයෙකු නොඅදහන්නාවූ තුන්සරණින් යුක්තවූ මා තුන්සරණින් සරණගියෙකුකොට දරණසේක්වා, දන්නාසේක්වා, මමවනාහි මාගේ හිස තියුණු කඩුවකින් සිඳින්නාහු නමුත් බුදුරජ බුද්ධ නොවේයයිද හෝ ධර්ම්ය ධර්ම්ය නොවේයයි හෝ සඞ්ඝයා සඞ්ඝ නොවේයයි හෝ නොකියන්නෙම්'යි කීයේය. මෙහිද බ්‍රාහ්මණතෙමේ දිවිහිමිකොට සරණ ගියහුයි නැවත සරණගමනය කියනුයේ ආත්මසන්නිය්‍යාතනය පවසායි දතයුතුය.

මෙසේ තමන් පාවාදී පිරිස්සහිතවූ භාග්‍යවතුන්වහන්සේට උපස්ථාන කරනුකැමැත්තේ **'අධිවාසෙතු ච මෙ භවං ගොතමො වෙරඤ්ජායං වස්සාවාසං සද්ධිං භික්ඛු සඞ්ඝෙන'** යනු කීයේය. මෙයින් කුමක් කියනලද්දේදයත්: 'භවත් ගෞතමයන්වහන්සේ මා උපාසකයෙකුකොට දරණසේක්වා, මාගේ වෙරඤ්ජාවෙහි වස්විසීම ඉවසනසේක්වා, තෙමසක් වෙරඤ්ජාව ඇසුරුකොට මට අනුග්‍රහපිණිස වස්විසීම ඉවසනසේක්වා'යි මෙයින් කියනලද්දේවේ. **'අධිවාසෙසි භගවා තුණ්හිභාවෙන'** එකල්හි භාග්‍යවතුන් වහන්සේ මොහුගේ වචනය අසා කායාඩ්ගයක් හෝ 'හොතු, සාධු' යනාදීවූ වාචාඩ්ගයක් නොමෙහෙයවා ඇතුළතම ක්ෂාන්තිය දරා තූෂ්ණීම්භාවයෙන් ඉවසා වදළසේක. බ්‍රාහ්මණයාහට අනුග්‍රහපිණිස සිතින්ම පිළිගත්සේකැයි කියනලද්දේවේ.

A මජ්ඣිමනිකාය - උපාලිසුත්ත
B චූලවග්ග - සෙනාසනක්ඛන්ධක
C චතුක්කඩ්ගුත්තර - චක්කවග්ග

'අථ ඛො වෙරඤ්ජා බ්‍රාහ්මණො භගවතො අධිවාසනං විදිත්වා' ඉක්බිති වෙරඤ්ජ බ්‍රාහ්මණතෙමේ 'මාගේ ආරාධනාව ඉදින් ශ්‍රමණ ගෞතමතෙමේ නොඉවසන්නේනම්, කයින් හෝ වචනයෙන් ප්‍රතික්ෂේප කරන්නේය, යම්හෙයකින් වනාහි ප්‍රතික්ෂෙප නොකොට ඇතුළත ඉවසීම දරුයේද, එහෙයින් මාගේ ආරාධනාව සිතින්ම ඉවසූයේය'යි මෙසේ ආකාර සැලකීමෙහි දක්ෂභාවයෙන් භාග්‍යවතුන්වහන්සේගේ ඉවසීම දැන තමන් හුන් අසුනෙන් නැගිට සිවුදිසාවට හැරිහැරී භාග්‍යවතුන්වහන්සේට සකසා වැඳ තෙවරක් පැදකුණුකොට සරණගියතැන්පටන් උපතින් මහලුවූ බමුණන්හට වැඳුම්පිදුම් ආදිය නොකෙරේයයි ගහීකොටද දැන් දන්නාලද බුදුගුණඇත්තේ කයින්ද වචනයෙන්ද මනසින්ද නොයෙක්වර වඳින්නේද සෑහීමට නොපැමිණියෙක්වම දස නිය එකතු කිරීමෙන් බබලන දෙඅත් එක් කොට හිසෙහි පිහිටුවා දශීනවිෂය යම්තාක්ද, ඒ තාක් පිටුනොපා මුණ දුන්නේම ඉදිරියටගොස් දශීනවිෂය ඉක්මගියතැනසිට පසඟපිහිටුවා වැඳගියේය.

'තෙන ඛො පන සමයෙන වෙරඤ්ජා දුබ්භික්ඛා හොති' යම්කලක වෙරඤ්ජ බ්‍රාහ්මණයා විසින් වෙරඤ්ජාව ඇසුරුකොට වස්විසීමට භාග්‍යවතුන්වහන්සේ ආරාධනාකරණලද්දහුද, ඒ කාලයෙහි වෙරඤ්ජාව දුකසේ ලැබියයුතු භික්ෂා ඇත්තේවේ. **'දුබ්භික්ඛා'** දුලීභ භික්ෂා ඇත්තේය. යම්තැනක මිනිස්සු සැදැහැනැත්තාහු නොපහත්වූවාහු වෙත්ද, එහි මැනවින් වැඩුනු ගොයම් ඇතිකල්හිද, හැල්, උඳු, මුං ආදියෙහි අගය නැතිව ගියකල්හිද ඒ දුකසේ ලැබියයුතුබව වන්නේය. වෙරඤ්ජාවෙහිවනාහි යම්හෙයකින් එසේ නොවූයේද, එහෙත්, දුසස්‍යබැවින් හටගත් ජාතකදෙසයෙන් එසේවූයේය. එහෙයින් ඒ අරුත් දක්වනසේක් **'දුබ්භික්ඛා'**යනාදිය කීහ.

එහි **'දුබ්භික්ඛා'** දෙපරිද්දෙකින් පැවති ක්‍රියාඇත්තිය. ඊහිතනම් ක්‍රියාය. දෙපරිද්දෙකින් පැවති චිත්තක්‍රියාව චිත්තඊහානම්. 'මෙහි පිඬු සිහායන්නමෝ කිසිවක් ලබන්නෙමුදෝ නොලබන්නෙමුදෝ ජීවත්වන්නට හැක්කෙමුදෝ නොහැක්කෙමුදෝ යනු මෙහි අදහසය, නොහොත් **'දුබ්භික්ඛා'** යනු දුකසේ කළයුතු ජීවිකාය. ඊහිතං, ඊහා, ඉරියනං, වත්තනං, ජීවිතං යනාදි පදයෝ එකාත්ථවත්වෙති. එහෙයින් දුකින් ජීවත්වීම මෙහි පවතීනුයි 'දුබ්භික්ඛා'යි මේ මෙහි පදත්ථියවේ. සුදු මිනී ඇට මෙහි වේනුයි **'සෙතට්ඨිකා'** නම්. දවසක් මුළුල්ලෙහිදු ඉල්වා කිසිවක් නොලැබ මළාවූ දිළිඳු මිනිසුන්ගේ නයිහතු පැහැති ඇටවලින් ඒ ඒ තැන ගැවසී ගත්තේය'යි කියනලද්දේවේ. **'සෙතට්ඨිකායි'**ද පාඨයක්වේ. එහි අත්ථය මෙසේය:- ශ්වේත රොගය මෙහි වේනුයි සෙතට්ඨිකානම්. අට්ටියනු

ආතුරභාවයයි. ව්‍යාධියයි. රොගයයි. එහිද, ගොයම් ගැබ්ගත්නා කාලයෙහි ශ්වේතරොගයෙන් නැසුනාවූම සිදීගිය කිරිඇති සහල්ඇට නොහටගත් ඉතා සුදුවූ හැල්කරල් හෝ යවතිරිඟු කරල් නික්මෙන්නේද, එහෙයින් සෙතඨීකායි කියනුලැබේ. වපුරණකාලයෙහි මැනවින් සකස්කොටද වපුළ ගොයම් එහි වෙරඤ්ජාවෙහි ඉරටුම සැපයේනුයි **'සළාකාවුත්තා'** නම්. සලාකාවෙන් හෝ එහි ජීවිතය පවත්වත්නුයි **'සලාකාවුත්තා'**ය. කුමක් කියනලද්දේදයත්:- එහි වනාහි, ධාන්‍ය විකුණන්නවුන්ගේ සමීපයට ධාන්‍ය මිලදී ගන්නවුන් ගියකල්හි දුර්ලමනුෂ්‍යයන් මැඩ බලවත් මනුෂ්‍යයෝම ධාන්‍ය මිලදීගෙනියත්. දුර්ල මනුෂ්‍යයෝ ධාන්‍ය නොලබන්නාහු මහහඬ නගත්. ධාන්‍ය විකුණන්නෝ සියල්ලන්ට සඞ්ග්‍රහකරන්නෙමු'යි ධාන්‍ය මනින තැන ධාන්‍ය මනින්නෙකු හිඳුවා එක්පසෙක කහවණු සොයාබලා ගන්නෙකුද හිඳුවාලූහ. ධාන්‍යගන්නට එන්නාහු ධාන්‍යයෙන් ප්‍රයෝජන ඇත්තාහු පළමුකොට කහවණු අයකරන්නහුගේ සමීපයට යන්නාහ. ඔහු මිනිසුන් ආ පිළිවෙළින් මුදල් ගෙන 'මෙනම් ඇත්තහුට මෙතෙක් දියයුතුය'යි සාලාක ලියා දෙන්නේය. ඔවුහු එය ගෙන ධාන්‍ය මනින්නහුගේ සමීපයට ගොස් දුන් පිළිවෙළින් ධාන්‍ය ගන්නාහ. මෙසේ සලාකාවෙන් එහි දිවි පවත්වත්නුයිද සලාකාවුත්තායි කියන ලද්දේය. **'න සුකරා උඤ්ඡන පග්ගහෙන යාපෙතුං'** පාත්‍රය ගෙන යම් පිඬුසිහායෑමෙක්වේද, ඒ සිහාගත්පාත්‍රයෙන් යැපීම පහසුනොවේ. පාත්‍රය ගෙන ආර්‍යයෝ යම් පිඬුසිහායෑමක් කරත්ද, භික්ෂාචර්‍යාවෙහි හැසිරෙත්ද, ඒ සිහීමෙන් යැපෙන්නට සුවසේ නොහැකියයි කියනලද්දේවේ. එකල්හි වනාහි එහි ගම් සතඅටක පිඬුපිණිස හැසිරද, එක්දවසකට යැපෙන පමණකුත් සිහාගැනීමට නොහැකිවෙත්. එක් දවසකට යැපෙනපමණකුත් නොලබත්.

'තෙන ඛො පන සමයෙන උත්තරාපථකා අස්සවාණිජා -පෙ- අසෙසාසි ඛො භගවා උදුක්ඛලසද්දං'' තෙන, යම්කලෙක භාග්‍යවතුන්වහන්සේ වෙරඤ්ජාව ඇසුරුකොට වස්විසීමට එළැඹිසේක්ද, ඒ කාලයෙහි උත්තරාපථවාසීහු උත්තරාපථයෙන් ආබැවින් හෝ මෙසේලත් ව්‍යවහාරඇති අස්වෙළෙන්දෝ උත්තරාපථයෙහි අසුන් උපදින පෙදෙසෙහි අසුන්පන්සියයක් ගෙන ද්විගුණ, ත්‍රිගුණවශයෙන් ලාබ බලාපොරොත්තුවෙමින් අන්පෙදෙස් කරායන්නාහු, තමන්ගේ විකිණියයුතු භාණ්ඩවූ ඒ පන්සියයක් පමණවූ අසුන්ද ගෙන වැසිකාලයෙහි විසීමට වෙරඤ්ජාවට පැමිණියාහුවෙත්. කුමක්හෙයින්ද යත්: ඒ ප්‍රදේශයෙහි වැසිසාරමස මගට බසින්නට නොහැක්කාහුද එහෙයිනි. පැමිණෙන්නෝද තුවරින්පිටත දියෙන්යට නොවනතැනක තමන්ට විසීමට ගෙවල් හා

අසුන්ට අස්හල්ද කරවා වැටෙන් වටකළහ. ඔවුන්ගේ ඒ වාසස්ථාන අස්සමණ්ඩලිකායි ප්‍රසිද්ධවිය. එහෙයින් **'තෙහි අසසමණ්ඩලිකාසු භික්ඛූනං පත්‍රපත්‍රපුලකං පඤ්ඤත්තං හොති'** යනුකීහ.

'පත්‍රපත්‍රපුලකං එක් එක් මහණක්හට නැළියක් නැළියක් පමණ යවසහල්. පත්‍රනම්, නැළියක්පමණවේ. එය එක් පුරුෂයකුහට යැපීමට පමණවේ. 'දෙදෙනෙකුන්හට මේ සහල්නැළියේ බත පමණ නොවේයි මේ කියනලද්දේමය. **'පත්‍රෝදනෝ නාලමය දුවිත්තං'**[A]යි. පුලකනම්, කුඩු දහයියා රහිතකොට සෝදගත් යවසහල්යි කියනුලැබේ. ඉදින් කුඩුදහයියා සහිතවේනම් පණුවෝ විදින්නාහ. කල්පැවැත්මට නොසුදුසුය. එහෙයින් ඒ වෙළෙන්දෝ යවසහල් කල්පැවැත්මට සුදුසුකොටගෙණ මගට බසිත්. යම් තැනකදී අසුන්ට බත්වන්නේය. කුමක්හෙයින් ඒ යව ඔවුන්විසින් භික්ෂූන් සඳහා නියමකරනලදදයත්: එහිලා කියනුලැබේ: ඒ උත්තරාපථ වැස්සෝ දක්ෂිණාපථ වැස්සන්මෙන් සැඳහැනැත්තාහු නොවෙත් නොපහන්වූවාහු නොවෙත්. ඔවුහුවනාහි සැඳහැඇත්තාහ. පහන්වූවාහුය. බුදුරජුන් කෙරෙහි, ධර්මය කෙරෙහි, සඞ්ඝයා කෙරෙහි, මමත්වය ඇත්තාහ. යම්යම් කටයුතුසඳහා පෙරවරුයෙහි නුවරට පැමිණෙන ඔවුහු දෙතුන් දවසක් මොනවට හැඳපොරොවාගත් මනා ඉරියවුවලින් යුක්තව නුවර හැමතැන පිඩුසිහා හැසිරද කිසිවක් නොලබන හත්අට නමක් භික්ෂූන් දුටුවාහුය. දකීමෙන් 'මේ ආර්‍යයන්වහන්සේලා මෙනුවර ඇසුරුකොට වස් එළැඹියෝය, සාබියද පවත්නේය. මුන්වහන්සේලා කිසිවක් නොලබත්, තදින් විඩාපත්වෙති. අපිදු ආගන්තුකයෝ වම්හ. එහෙයින් මුන්වහන්සේලාට දිනපතා කැඳබත් පිළියෙල කරන්නට නොහැක්කෙමු. අපගේ අශ්වයෝ දවසට දෙවරක් උදය සවස බත් බුදින්නාහ. එහෙයින් අපි එක්එක් අසුගේ පෙරවරු බතින් එක් එක් භික්ෂු නමක්හට සෝද පිරිසිදුකළ යවසහල් නැළියනැළිය දෙන්නෙමුනම් මැනව, එසේකළකල්හි ආයර්‍යයන්වහන්සේලාද විඩාපත් නොවන්නාහ, අශ්වයෝද යැපෙන්නාහයි ඔවුනට මේ අදහසවූයේය. අනතුරුව ඔවුහු භික්ෂූන්වෙත ගොස් මේ තොරතුරු දන්වා 'ස්වාමීනි! ඔබවහන්සේලා සෝද පිරිසිදුකළ යවසහල් නැළිය නැළිය පිළිගෙණ පිළියෙල කරගත හැකි යම් ඒ එකක් පිළියෙලකොට ගෙණ වළඳිනු මැනවැ'යි ඉල්වා දවස්පතා සෝද පිරිසිදුකළ යවසහල් නැළියනැළිය දෙන්නට නියමකරගත්හ. **'තෙහි අසසමණ්ඩලිකාසු භික්ඛූනං පත්‍ර පත්‍ර පුලකං පඤ්ඤත්තං හොති'** යනු එහෙයින් කියනලදී. **'පඤ්ඤත්තං'** නිතිබත් ලෙසින් තබනලද්දේය.

A ජාතකපාලි

දැන් **'භික්ඛු පුබ්බණ්හසමයං නිවාසෙත්වා'** යනාදිතන්හි **'පුබ්බණ්හසමයං'** දවසෙහි පෙරවරු කාලය, දවස පිළිබඳ පෙරවරු කාලයෙහියන අර්ථයි නොහොත් පූර්වාහ්ණයෙහිකාලය පුබ්බණ්හ සමයය. පූර්වාහ්ණයෙහි එක් ක්ෂණයෙකුයි කියනලද්දේවේ. මෙසේ මෙහි අත්‍යන්ත සංයොගයෙහි දවිතීයාවචනයලැබේ. **'නිවාසෙත්වා'** හැඳපොරොවා වෙහෙරෙහිදී හැඳිසිවුර පෙරළීම්වසයෙන් මෙය දතයුතුය. ඒ භික්ෂූහු එයට පෙර නොහැඳියාහු නොවූහ. **'පත්තචීවරං ආදාය'** පාත්‍රය අත්වලින්, සිවුර කයින් ගෙන පිළිගෙන දරා යනඅරුත්ය. **'සමාදයෙව පක්කමති'**[A]යනු යම්සේද, එසේයම් ඒඅයුරකින් හෝ ගන්නාහු ගෙනමැයි කියනුලැබෙත්. **'පිණ්ඩං අලභමානා'** පිඬුලැබීම තිබේවා, සියලුම 'වෙරඤ්ජාවෙහි හැසිරද, යටත්පිරිසයින් 'ඉක්මවා වඩිනු මැනව' යනවචනයකුදු නොලබන්නාහු, **'පත්තපත්තුලකං ආරාමං හරිත්වා'** ගියගිය තැනදී ලද එක්එක් සෝදු පිරිසිදුකළ යවසහල් නැළිය ගෙන ආරාමයට පමුණුවා **'උදුක්ඛලෙ කොට්ටෙත්වා කොට්ටෙත්වා පරිභුඤ්ජන්ති'** යමෙක් ඒ තෙරුන්ගේ යවසහල් ගෙන කැඳ හෝ බත් පිසන්නේද, එබඳු කිසි කැපකරුවෙක් තෙරුන්ට නැත්තේය. තමන් පිසීමද ශ්‍රමණසාරුප්‍ය නොවේ. නොද වටියි. ඒ භික්ෂූහු 'අපගේ සැහැල්ලු පැවැත්මත් තමන් පිසීමෙන් වනදේෂයෙන් මිදීමත් මෙසේ වන්නේය'යි අටඅට දෙනා හෝ දසදස දෙනා එකතුව වඤ්ඤිලා කොටකොටා තමතමන් අයත්කොටස දියෙන් තෙමා වළඳත්. මෙසේ වළඳ අන්කටයුතුවල උත්සාහනැතිව මහණදම් කරත්.

ඒ අස් වෙළෙන්දෝ භාග්‍යවතුන්වහන්සේට සෝදු පිරිසිදුකළ යවසහල් නැළියක්ද සැහෙන පමණ ගිතෙල්, මී, සකුරුද දෙන්නාහ. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ එය ගෙනඅවුත් ගලෙකලා අඹරත්. පින්වත් නුවණැති පුරුෂයෙකු විසින් කරනලද්ද, මනවඩන්නේමවේ. ඒ යවසහල් අඹරා ගිතෙල්, මී ආදිය හා මැනවින් යොදු භාග්‍යවතුන්වහන්සේට එළවත්. නැවත දෙවියෝ එහි දිව්‍යඔජස් බහාලත්. භාග්‍යවතුන්වහන්සේ ඒ බොජුන් වළඳනසේක. වළඳ පලසමවතින් කල්යවනසේක. එතැන්පටන් පිඬුපිණිස නොහැසිරෙත්.

කිම, ආනන්ද ස්ථවිරයන්වහන්සේ එ්කාලයෙහි භාග්‍යවතුන්වහන්සේගේ උපස්ථායකවූවාහුදයත්: උපස්ථායක නොවෙත්. උපස්ථායක ස්ථානාන්තරය නොලැබූහ. භාග්‍යවතුන්වහන්සේට ප්‍රථමබෝධියෙහි විසිවසතුළ නිබඳව උපස්ථාන කරන්නෙක් නොවූයේය. සමහර කලක **නාගසමාල** ස්ථවිරයන්වහන්සේ, සමහර කලක **නාගිත**

A මජ්ඣිමනිකාය - චූලහත්ථිපදෙපමසුත්ත

ස්ථවිරයන්වහන්සේ, සමහර කලක **මේඝිය** ස්ථවිරයන්වහන්සේ, සමහර කලක **උපවාණ** ස්ථවිරයන්වහන්සේ, සමහර කලක **සාගත** ස්ථවිරයන්වහන්සේ, සමහර කලක **ලිච්ඡවී** පුත්‍ර සුනක්ඛත්තයෝ භාග්‍යවතුන්වහන්සේට උපස්ථාන කළහ. උන්වහන්සේ තමන් කැමති තාක්ම උපස්ථානකොට බැහැරයත්. **ආනන්ද** ස්ථවිරයන්වහන්සේ ඔවුන් උපස්ථාන කරනකල්හි භාග්‍යවතුන්වහන්සේට උපස්ථාන කිරීමෙහි උත්සාහ රහිතවූහ. ඔවුන් බැහැර ගියකල්හි තමන්වහන්සේම වත්පිළිවෙත් කෙරෙත්. භාග්‍යවතුන්වහන්සේද 'මාගේ ඥාතිශ්‍රේෂ්ඨතෙමේ මෙතෙක් උපස්ථායකස්ථානානන්තරය නොලබාසිටියි, මෙබඳුතන්හි මෙතෙමේම දුදුසුයයි ඉවසා වදළළසේක. එහෙයින් **'ආයස්මා ආනන්දෙ පත්ථපුලකං සිලායං පිංසිත්වා භගවතො උපනාමෙති තං භගවා පරිභුඤ්ජති'යි** කියනලද්දේය.

මනුෂ්‍යයෝ දුර්භික්ෂකාලයෙහි වැඩියක් උත්සාහවත්වද, පින්කරන්නාහු නොවෙත්ද? තුමූ නොකා නොබී භික්ෂූන්ට දියයුතුයයි සිතන්නාහු නොවෙත්ද? ඔවුහු කුමක්හෙයින් ඒ කාලයෙහි සැන්දක් පමණවූත් භික්ෂාවක් නොදුන්නාහුද? මේ වෙරඤ්ජ බ්‍රාහ්මණතෙමේද මහත් උත්සාහයෙන් භාග්‍යවතුන්වහන්සේට වස්විසීමට ආරාධනා කෙළේය. එසේ ඇතිකල්හි කුමක්හෙයින් ඔහු භාග්‍යවතුන්වහන්සේ ඇතිබවත් නොදනීදයත්: මේ මෙසේවූයේ මරහුකළ සිත්පෙරළියෙනැයි කියනුලැබේ. වෙරඤ්ජබ්‍රාහ්මණයා භාග්‍යවතුන්වහන්සේ වෙතින් බැහැරට ගිය ඇසිල්ලෙහිම මුළුතුවරද හාත්පස යොදුනක් පමණද යම්තැනක පෙරබත පිඬුපිණිස හැසිර පෙරළාඑන්නට හැකිද, ඒ සියලුතැන් මාරතෙමේ පෙරළා මුළාකොට සියල්ලන්ට නොසලකන හැටියක්කොට ගියේය. එහෙයින් කිසිවෙක් යටත්පිරිසෙයින් සැලකිලිපමණකුත් කටයුතුයයි නොසැලකුයේය.

කිම, භාග්‍යවතුන්වහන්සේද මේ මාරාවර්ජනය නොදන එහි වස්එළැඹිසේක්දයත්: මාරාවර්ජනය නොදන වස්එළැඹිසේක් නොවෙති, එසේනම් කුමක්හෙයින් චම්පා, සාවත්ථී, රාජගහා ආදීවූ එක්තරා නුවරක වස්නොඑළැඹිසේක්ද? චම්පා, සාවත්ථී, රාජගහාදිහු තිබෙත්වා, ඉදින් භාග්‍යවතුන්වහන්සේ ඒ අවුරුද්දෙහි උතුරුකුරු දිවයිනට හෝ තිදස පුරයට ගොස් වස්එළැඹෙන්නාහුද, මාරතෙමේ එතැන්ද ආවර්ජනයකරන්නේය. මාරතෙමේ ඒ අවුරුද්දෙහි තද ක්‍රෝධයෙන් මැඩුනුසිතැත්තේ වූයේය. තවද භාග්‍යවතුන්වහන්සේ මෙහිදී 'අස්වෙළෙන්දෝ භික්ෂූන්ට සඬ්ග්‍රහකරන්නාහ'යියන මේ අතිරෙක කාරණයද දුටුසේක. එහෙයින් වෙරඤ්ජාවෙහිම වස්එළැඹිසේක. කිම, මාරතෙමේ අස්වෙළෙඳුන් ආවර්ජනයකරන්නට නොහැක්කේද? නොහැක්කේ නොවේ. ඒ අස්වෙළෙන්දෝ වනාහි මාරාවර්ජනයෙහි කෙළවර එහි පැමිණියාහුය.

පෙරළාඅවුත් කුමක්හෙයින් ආවතීනය නොකෙළේද? එසේකරන්නට සමර්ථභාවයක් නැතිබැවිනි. මාරතෙමේවිනාහි තථාගතයන්වහන්සේට එළවූ භික්ෂාවටත් නිබද්ධදනයටත් වෙහෙරට ගෙනවුත් පිදූ වසතුවටත් අනතුරු කරන්නට පොහොසත් නොවේ.

සතරකට අන්තරාය කරන්නට නොහැක්කේය. කවර සතරකටද යත්: තථාගතයන්වහන්සේට එළවූ භික්ෂාසඞ්ඛ්‍යෙපයෙන් නිබද්ධදනයට හෝ නියමිත වාරිත්‍රවිධියෙන් පිරිණැමූ සිවුපසයට කිසිවෙකු විසිනුත් අන්තරායක්කරන්නට නොහැක්කේය. බුදුවරුන්ගේ ජීවිතයට කිසිවෙකු විසිනුත් අන්තරායක් කරන්නට නොහැක්කේය. අශීත්‍යනුබ්‍යඤ්ජනයට හා ව්‍යාමප්‍රභාවට කිසිවෙකු විසිනුත් අන්තරායක් කරන්නට නොහැක්කේය. චන්ද්‍ර, සූර්‍ය්‍ය, දිව්‍ය, බ්‍රහ්මයන්ගේද ප්‍රභාවෝ තථාගතයන්වහන්සේගේ අනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභා ප්‍රදේශයට පැමිණ පහවූ ආනුභාව ඇත්තාහුවෙත්. බුදුවරුන්ගේ සච්ඡිකාඤ්ඤයට කිසිවෙකු විසිනුත් අන්තරායක්කරන්නට නොහැක්කේය. මේ කියූසතරට කිසිවෙකු විසිනුත් අන්තරායක් කරන්නට නොහැක්කේය. එහෙයින් මාරයා විසින් නොකළ අන්තරායඇති භික්ෂාව භාග්‍යවතුන්වහන්සේ ශ්‍රාවකසඞ්ඝයා සහිතව එදා වැළඳූසේකැයි දතයුතුය.

මෙසේ වළඳනසේක්ද එක් දවසක් **'අසෙසාසි බො භගවා උදුක්ඛලසඳං'** භාග්‍යවතුන්වහන්සේ සෝදා පිරිසිදුකළ යවසහල් නැළිය නැළිය වණෙහිලා කොටන හික්ෂූන්ගේ මොහොල් ගැටීමෙන් හටගත් වණහඬ ඇසූසේක. එයින් මතු **'ජානන්තාපි තථාගතා'** යනමේආදිය ඉදිරියෙහි **'කින්නුඛො ආනන්ද උදුක්ඛලසද්දෙ'**යි යමක් විචාළසේක්ද එයට පරිහාර දක්වනුපිණිස කියනලද්දේය.

එහි මේ සඞ්ඛ්‍යෙප විඤ්ඤාය: ඉදින් තථාගතයන්වහන්සේ දන්නාහු නමුත් එබඳුවූ පිළිවිසීමට හේතුවක් වේනම්, විචාරණසේක. ඉදින්වනාහි එබඳුවූ විචාරීමට කරුණක් නැත්තේනම් දන්නාහුනමුත් නොවිචාරණසේක. යම්හෙයකින් බුදුවරුන්ට නොදක්මෙක් නැත්තේද එහෙයින් 'අජානන්තා'යනු නොකියනලද්දේය. **'කාලං විදිත්වා පුච්ඡන්ති'** ඉදින් ඒ විචාරීමට ඒ කාලයවේනම්, මෙසේ ඒ කාලය දන විචාරණසේක. ඉදින් කාලය නොවේනම්, මෙසේ කාලය දැනම නොවිචාරණසේක. මෙසේ විචාරණසේක්ද **'අත්‍ථසංහිතං තථාගතා පුච්ඡන්ති'** යමක් අර්ථනිඃශ්‍රිතද කාරණනිඃශ්‍රිතද එයම විචාරණසේක. **'නො අනත්‍ථසංහිතං'** අනර්ථනිඃශ්‍රිතයක් නොවිචාරණසේක. කුමක් හෙයින්ද යත්: යම්හෙයකින් **'අනත්‍ථසංහිතෙ සෙතුඝාතො තථාගතානං'** අනර්ථ නිශ්‍රිතවවන විෂයයෙහි තථාගතයන්ගේ මාගීයෙන් නැසීමවේද එහෙයිනි. අතීත්මාගීය සෙතුයි

කියනුලැබේ. අහිනමාගීයෙන්ම එබඳු වචනයන්ගේ නැසීමවේ. මුළුමනින්ම නැසීමයි කියනලද්දේවේ දැන් **'අත්ථසංහිතං'** යනමෙහි අත්ථනිශ්‍රිතවූ යම් වචනයක් තථාගතයන්වහන්සේගෙන් විචාරණසේක්ද, එය දක්වනුයේ **'ද්වීහි ආකාරෙහි'** යනාදියකීහ.

එහි **'ආකාරෙහි'** කාරණයන්ගෙන් **'ධම්මං වා දෙසිස්සාම'** අත්‍යොත්පත්තියෙන් යුක්තවූ සූත්‍රයක් හෝ පුර්වචරිතකාරණයෙන් යුක්තවූ ජාතකයක් වදරන්නෙමු. **'සාවකානං වා සික්ඛාපදං පඤ්ඤපෙස්සාම'** ශ්‍රාවකයන්ට හෝ ඒ ඒ විචාරීමෙන් ඒ ඒ භික්ෂූන් විසින් කරනලද ව්‍යතික්‍රමය ප්‍රකටකොට ගරුකවූ හෝ ලහුකවූ ශික්ෂාපදයක් පණවන්නෙමු. අණ තබන්නෙමුයි. **'අථ ඛො භගවා -පෙ- එතමත්ථං ආරොචෙසි'** යන මෙහි කියයුතු කිසිවක් නැත්තේය. පිරිසිදු කළ යවසහල් නැළිය නැළිය ලැබීමද, සැහැල්ලු පැවැතුම්ඇති බවද, තමන්ට පිසීමෙන් මිදීමද දක්වනසේක් **'මේ අත්ථය සැල කෙළේය'**යි කියනලද්දේමැයි කියනුලැබේ. **'සාධු සාධු ආනන්ද'** මේවනාහි භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත් **ආනන්ද** ස්ථවිරයන්වහන්සේ සතුටුකරමින් පහදවමින් වදළසේක. සාධුකාර දී දෙඅයුරෙන් එක්අයුරක් ගෙන ධම්දේශනා කරනසේක් **'තුම්හෙහි ආනන්ද සප්පුරිසෙහි විජිතං, පච්ඡිමා ජනතා සාලිමං සොදනං අභිමක්ඛිස්සති'**යි වදළසේක. එහි මේ අදහසවේ: 'ආනන්ද! සත්පුරුෂවූ තොප විසින් දුකසේ භික්ෂාව ලැබියයුතුකල්හි දුකසේ පිඬු ලැබියයුතුකල්හි මේ සැහැල්ලු පැවැත්මෙන් මේ කෙලෙස් සිඳලන පැවැත්මෙන් දිනනලද්දේය. කුමක් දිනනලදයත්: දුර්භික්ෂය දිනනලද්දේය. ලොභය දිනනලද්දේය. ඉර්ෂ්‍යාචාරය දිනනලද්දේය. කෙසේදයත්: මේ වෙරක්ෂාව දුකසේ ලැබියයුතු භික්ෂා ඇත්තීය, භාත්පසවනාහි අතරනැතිව පිහිටි ගම්නියම්ගම්හු පලබරින් නැමුනු සස්‍ය ඇත්තාහුය, සුවසේ ලැබියහැකි භික්ෂා ඇත්තාහුය. සුවසේ ලැබියහැකි පිඬු ඇත්තාහුය. මෙසේ ඇතිකල්හිද භාග්‍යවතුන්වහන්සේ අප රඳවාගෙන මෙහිම වසනසේකැයි එක් භික්ෂුනමක්හටද සිතුවිල්ලක් හෝ සිත්පෙළීමක් නැත්තේය. මෙසේ වනාහි දුර්භික්ෂය දිනනලද්දේය. මඩිනලද්දේය. තම යටතට ගන්නාලද්දේය. ලොභය කෙසේ කෙසේ දිනනලද්දේදයත්: මේ වෙරක්ෂාව දුකසේ ලැබියයුතු භික්ෂා ඇත්තීය. භාත්පස පිහිටි අතර නැති ගම්නියම්ගම්හු පලබරින් නැමුනු සස්‍ය ඇත්තාහුය. සුවසේ ලැබියහැකි පිඬු ඇත්තාහුය. එබැවින් අපි එහි ගොස් වළඳන්නෙමුයි ලොභවසයෙන් එක් භික්ෂුනමක් විසිතුදු රාත්‍රිවෙඡදයක් හෝ අවපැළවියෙහි එහි වස්ඵළැඹෙමිහයි වස්‍සාවෙඡදයක් නොකරන ලද්දේය. මෙසේ ලොභය දිනනලද්දේය. ඉර්ෂ්‍යාචාරය කෙසේ දිනනලද්දේදයත්: මේ වෙරක්ෂාව දුකසේ ලැබියයුතු භික්ෂාඇත්තීය. මේ මිනිස්සුද දෙතුන්මසක්

මෙහිවසන අප කිසි ගුණයෙක ලා නොසලකන්නෝය. එහෙයින් අසවල් මහණ ප්‍රථමධ්‍යානලාභීය -පෙ- අසුවල් මහණ ෂඩභිඥයි මෙසේ මිනිසුන්ට ගුණ වෙළඳම්කොට උනුන්ගැන ප්‍රකාශකොට කුස පිළිදගුම්කොට පසුව අපි සිල් ඉටාගන්නෙමුනම් යෙහෙකැයි එක් භික්ෂුනමක් විසිනුදු මෙබඳු ආශාවක් නොඋපදවන ලදුයයි මෙසේ ඉවජාචාරය දිනනලද්දේය. මඩිනලද්දේය. තම යටතට ගන්නාලද්දේය.

අනාගතයෙහිවනාහි පශ්චිමජනතාව විහාරයෙහි හුන්නේ නිදුකින්ම බත් ලැබද 'නොපැසුනු සහල් ඇති ඉතා තෙත්වූ, ලුනු නැති ලුනු වැඩිවූ ඇඹුල් නැති මේ කිම? මෙයින් කවර ප්‍රයෝජනයක්ද'යි මේ ආදී ක්‍රමයෙන් ඇල්සහලින් කළ රසමසින්යුත් බත පහත්කොට ලාමකකොට සිතාය. ඉතා පහත්කොට නිඳ කරමින්ය. තවද ජනපදය හැමද දුර්භික්ෂ නොවේ. සමහර කලක දුර්භික්ෂවේ. සමහර කලක සුභික්ෂවේ. ඒ මේ ජනපදය යම් කලක සුභික්ෂවන්නේද, එකල්හි සත්පුරුෂවූ තොපගේ මේ පිළිවෙතින් පහන්වූ මිනිස්සු භික්ෂූන්ට කැඳ, කැවිලි ආදීන්ගේ ප්‍රභෙදයෙන් නන්වැදෑරුම්වූ ඇල්සහලින්කළ කැමවඤ හා මසින්යුත් බත්ද දියයුතුයයි සිතන්නාහුය. තොප නිසා උපන් ඒ සත්කාරය තොපගේ සබ්‍රහ්මචාරීවූ පශ්චිමජනතාව තොප අතරම හිඳ අනුභවකරන්නේය. පහත්කොට, ලාමකකොට සිතන්නේය. ඒ හේතුකොට මානයද අවමානයද කරන්නේය. කෙසේදයත්: කුමක්හෙයින් මෙපමණ පිසනලදද? කිම? තමන් සතුදය බහා තබන්නට තොපට බදුන් නැත්තේදැයි අසන්නේය.

'අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානා' යනාදි තන්හි **'ආයස්මා'** යන මෙය ප්‍රියවචනයි. මෙය ගරුගුණ ඇත්තවුන් කෙරෙහි ජ්‍යෙෂ්ඨභාව කියාලන නාමයකි. **'මහාමොග්ගල්ලානො'** ගුණමහත්වයෙන් මහත්වූයේද හේමය. ගොත්‍රවශයෙන් මොග්ගල්ලාන' නම්. **'එතදවොච'** මෙය සැලකෙළේය. දැන් කියයුතු **'එතරහි භන්තෙ'** යනාදි වචන දක්වාලන්නේය. කුමක්හෙයින් සැලකළේදයත්: මහා මෞද්ගල්‍යායන මහාසථවිරයන්වහන්සේවනාහි පැවිදිවීමෙන් සත්වනද ශ්‍රාවක පාරමීඥනයෙහි මුදුනට පැමිණියහ. ශාස්තෘන්වහන්සේ විසිනුදු මහත් සෘද්ධි ඇතිබැවින් එතදග්‍රයෙහි තබනලදහ. උන්වහන්සේ තමන්ගේ ඒ මහත් සෘද්ධිය ඇසුරුකොට 'මේ වෙරඤ්ජාව දුකසේ ලැබියයුතු භික්ෂා ඇත්තේය, භික්ෂූහුද ක්ලාන්තවෙති, මම පොළොව පෙරළා භික්ෂූන්ට පෘථිවිමණ්ඩය (බිම්මල්, හතු) වළඳවන්නෙමිනම් ඉතා යෙහෙකැ'යි සිතූහ. නැවතත් උන්වහන්සේට 'ඉදින් මම භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි වසන්නෙමි භාග්‍යවතුන්වහන්සේට යාචඤ නොකොට අවසර නොලබා මෙසේ කරන්නෙමිනම්, මෙය මට සුදුසු නොවන්නේය, භාග්‍යවතුන්වහන්සේ

සමග කරනලද එකටඑක කිරීමක්මෙන් වන්නේය'යි මේ අදහස උපන්නේය. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ යදිනු කැමතිව අවුත් භාග්‍යවතුන්වහන්සේට මෙය සැලකළහ. **'හෙට්ඨිමං තලං සම්පත්තං'** පොළොවෙහි යටතෙලෙහි පෘථිවීමණ්ඩ පෘථිවීඕජා පෘථිවිපපට ඇත්තේද, ඒ සඳහා කියයි. එහි **'සම්පත්තං'** යනු මිහිරිය. මධුරරස සම්පන්නය යනඅර්ථයි **'තත්‍රස්ස රුක්ඛා සම්පන්නඵලා ච උපපන්නඵලා ච'**[A] යනමෙහි යම්සේ මධුරඵල ඇත්තේය යනඅර්ථයවේද, එසේ මෙහිද **'සම්පත්තං'** යනු මිහිරිය. මිහිරිරස ඇත්තේය යනඅර්ථය දතයුතුය. **'සෙය්‍යථාපි බුද්දමධුං අනීලකං'** මේවනාහි පොළොව යටතෙලෙහිවූ පෘථිවිමණ්ඩයාගේ මිහිරිබවට උපමා දැක්වීමපිණිස කියනලද්දේය. **'බුද්දමධුං'** කුඩා මැස්සන්විසින්කළ මීවදය. **'අනීලකං'** මැස්සන් රහිතය. පිළවුන් රහිතය. මැසිබිජු රහිතය. පිරිසිදුය. මේ මී සියලු මීවලටවඩා අග්‍රය. ශ්‍රේෂ්ඨය. මනා රසඇත්තේය. ඔජොවත්දවේ. **'සෙය්‍යථාපි බුද්දමධුං අනීලකං එවමසාදං'**යනු එහෙයින් කීහ. **'සාධාහං භන්තෙ'** මැනව, ස්වාමීනි! මම, සාධුයන මෙහි මෙය ආයාචන වචනයි. පොළොව පෙරළීම ආයාචනා කරන්නාවූ **ස්ථවිරයන්වහන්සේ** භාග්‍යවතුන්වහන්සේට **'පරිවත්තෙතය්‍යං'** උඩුහුරුකරන්නෙම්, යටතලය මතුකරන්නෙම්, **කුමක්හෙයින්දයත්:** මෙසේ කළකල්හි භික්ෂූහු සුවසේ පපටකොජය පෘථිවීරසය වළඳන්නාහුය'යි මෙසේ සැලකළහ.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ අනුදනු නොකැමැති සේක්ද, තෙරුන්ලවා සිංහනාද කරවන්නට **'යෙ පන තෙ මොග්ගල්ලාන පඨවිනිස්සිතා පාණා තෙ කථං කරිස්සසි'** 'පොළොව ඇසුරුකළ ගම්නියම්ගම්හිවූ යම් ප්‍රාණීහු වෙත්ද, පොළොව පෙරළනකල්හි අහසෙහි පිහිටා සිටින්නට නොහැකිවූ ඔවුන්ට කෙසේ කරන්නෙහිද? කොතැන තබන්නෙහිද'යි අසා වදළසේක. ඉක්බිති ස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේවිසින් එතදග්‍රයෙහි තැබුබවට අනුරූපකොට තමන්ගේ සෘද්ධ්‍යනුභාවය ප්‍රකාශකරන්නාහු, **'එකාහං භන්තෙ'** යනාදිය කීහ. 'ස්වාමීනි! මම එක් අතක් මේ මහපොළොව සේ මවාපාන්නෙම්, පොළොව ඇසුරුකළ යම් ප්‍රාණීහු වෙත්ද, ඒ ප්‍රාණීන් එක් අල්ලෙකසිටි ප්‍රාණීන් දෙවන අල්ලට මාරුකරන්නකුමෙන් මාරුකරන්නෙම්'යනු එහි අර්ථයවේ.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මෞද්ගල්‍යායන ස්ථවිරයන්වහන්සේගේ ආයාචනය ප්‍රතික්ෂෙපකරනසේක් **'අලං මොග්ගල්ලාන'** යනාදිය වදළසේක. එහි **'අලං'** යනු ප්‍රතික්ෂෙපවචනයි. **'විපල්ලාසම්පි සත්තා පටිලභෙය්‍යුං'** සත්වයෝ විපරිතග්‍රාහයට පැමිණෙන්නාහුය. කෙසේදයත්: 'මේ පෘථිවියද

A මජ්ඣිමනිකාය - පොතලියසුත්ත

නොහොත් මේ පෘථිවිය නොවේද? තවද, මේ අපගේ ගමද නොහොත් අන්‍යයන්ගේ ගමදැයි ගම්නියම්ගම්දනවු කෙත්, අරම්, ආදියෙහිද මෙසේය. සෘද්ධිමත්හුගේ සෘද්ධිවිෂය නොසිතිය හැකිය, එහෙයින් මේ විපය්‍යාසය නොවේ. 'මේ දුර්භික්‍ෂයවනාහි දැන් පමණක් වන්නේ නොවේ, අනාගතයෙහිද වන්නේය. එකල්හි භික්‍ෂූහු තා වැනිවූ සෘද්ධිමත් සබ්‍රහ්මචාරියෙකු කොතැනින් ලබන්නාහුද ඒ භික්‍ෂූහු, ස්‍රොතාපන්න, සකෘදගාමී, අනාගාමී, ශුෂ්කවිදර්‍ශීක, ධ්‍යානලාභී, ප්‍රතිසම්භිදාප්‍රාප්ත ක්‍ෂීණාස්‍රවයෝ වූවාහුද සෘද්ධිබල නැතිබැවින් පිඬුපිණිස පරකුලයන්කරා එළැඹෙන්නාහයි මෙසේ විපය්‍යාසය පිළිලබන්නාහුය. 'බුදුකාලයෙහි භික්‍ෂූහු ශික්‍ෂාපරිපූරිකාරීහුවූහ, ඔවුහු ගුණ උපදවා දුර්භික්‍ෂ කාලයෙහි පොළොව පෙරළා පෘථිවිරසය වැළඳූහ, දැන් වනාහි, ශික්‍ෂා පරිපූරකාරීහු නැත්තාහ, ඇත්තාහුනම්, එසේම කරන්නාහුය, අපට පැසුනාවූ හෝ අමුවූ කිසිවක් කන්නට නොදෙන්නාහුයි එහිදී මිනිස්සුන්ට මෙසේ අදහස්වන්නේය. මෙසේ ඒ මිනිස්සු ආය්‍යපුද්ගලයන් ඇතිකල්හි ආය්‍යපුද්ගලයෝ නැත්තාහයි මේ විපය්‍යාසය ලබන්නාහුය. විපය්‍යාස වශයෙනුදු ආය්‍යයන්ට අභිමුඛයෙහි ගරහන්නාහු අනභිමුඛයෙහි ආක්‍රොශ කරන්නාහු අපායට පැමිණෙන්නෝ වන්නාහ, එහෙයින් **'මා තෙ රුච්චි පථවිං පරිවත්තෙතුං'** 'පොළොව පෙරළීම තට අභිමත නොවේවා'යි වදළසේක.

ඉක්බිති මෞද්ගල්‍යායන ස්ථවිරයන්වහන්සේ මේ ඉල්ලීම නොලබන්නාහු අනිකක් යදින්නාහු **'සාධු භන්තෙ'** යනාදිය කීහ. භාග්‍යවතුන්වහන්සේ මුත්වහන්සේගේ ඒ ඉල්ලීමද ප්‍රතික්‍ෂෙපකරනයෙක් **'අලං මොග්ගල්ලාන'** යනාදිය වදළසේක. එහි 'සත්වයෝ විපය්‍යාසය ලබන්නාහ'යි කිසිසේත් නොවදරණුලද්දේද, එකල්හි, මෙහිද පෙරකියූ නයින්ම ගතයුතුය. මෙහි අතීයද කියූඅතීී සමානමයයි දතයුතුය. ඉදින් වනාහි, භාග්‍යවතුන්වහන්සේ අනුදන්නාහුනම් ස්ථවිරයන්වහන්සේ කුමක් කරන්නාහුද යත්: මහාසමුද්‍රය එක් පයක් තැබීමෙන් ඉක්මවා ගියහැකි මිටිරියනක් පමණවූ දියඇලක තරම්කොට ඉටා නළෙරු පුවම්හද මූලයෙහි සිට උතුරුකුරු දිවයිනට අභිමුඛකොට මඟ ගෙනහැර දක්වා, උතුරුකුරු දිවයින යෑමර්ම කළහැකි තැන්හිකොට යම්සේ භික්‍ෂූහු ගොදුරුගමට පිඬුපිණිස යන්නවුන්මෙන් සුවසේ පිඬුපිණිස නික්මෙන්නාහුද එසේ දක්වන්නාහුය.

මෞද්ගල්‍යායනස්ථවිර සිංහනාද කථා නිමි

——\\——

දන් ආයුෂ්මත් **උපාලි** මහාස්ථවිරයන්වහන්සේ විනයප්‍රඥප්තියෙහි මූලපටන් නිදානය දක්වනුපිණිස **ශාරිපුත්‍ර** මහාස්ථවිරයන්වහන්සේගේ ශික්ෂාපද ප්‍රතිසංයුක්තවූ චිත්තෝත්පාදය දක්වන්නාහු **'අථ ඛෝ ආයස්මතෝ සාරිපුත්තස්ස'** යනාදිය කීහ. එහි **'රහොගතස්ස'** රහසිගතවූ ජනවිවික්තස්ථානයට පැමිණියාවූ **'පතිසල්ලීනස්ස'** සැහවුනු චිත්තවිවේකයෙන් යුක්තවූ එකලාබවට පැමිණියාවූ ශාරිපුත්‍ර මහා ස්ථවිරයන්වහන්සේට **'කතමෙසානං'** අතීතයෙහිවූ විදර්ශීආදීවූ බුදුරජුන් අතුරෙහි කවර බුදුරජුන්ගේ ශාසනයෙහි පැවැත්ම බොහෝ කල්වූයේද, බොහෝකල්යුත් පැවැත්මවීදයි **චිරට්ඨිතික** නම්. මෙහි සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය.

කිම? මහා ස්ථවිරයන්වහන්සේ තමන්වහන්සේගේ මේ පරිවිතර්කය තුමූ විනිශ්චයකරන්නට අපොහොසත්වෙත්ද‍යත්: මෙහිලා කියනුලැබේ: සමර්ථද අසමර්ථදවෙත්. මේ මහා ස්ථවිරයන්වහන්සේ මෙනම් බුදුරජුන්ගේ ශාසනය කල් නොපවත්නේවූයේය, මෙනම් බුදුරජුන්ගේ ශාසනය කල් පවත්නේවූයේය, යන මෙපමණක්ම විනිශ්චය කරන්නට සමර්ථවෙත්. මේ කාරණය හේතුකොට කල් නොපවත්නේවූයේය. මේ කාරණය හේතුකොට කල් පවත්නේවූයේය, යන මෙය විනිශ්චයකරන්නට සමර්ථ නොවෙත් **මහාපදුම** මහා ස්ථවිරයන්වහන්සේවනාහි 'ඡොඩශවිධ ප්‍රඥාවෙහි මුදුනටපැමිණි අග්‍රශ්‍රාවකයාහට මෙයද බැරුරුම්නොවේ. සම්මාසම්බුදුරජානන්වහන්සේ සමඟ එක්තැන වසන්නහුට තමන් විනිශ්චයකිරීම, තරාදිය හැරදමා අතින් කිරීමක් වැනිවේයයි සිතා භාග්‍යවතුන්වහන්සේ කරාම එළඹ විචාළාහුය'යි කීහ. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මුන්වහන්සේගේ විචාරීම විසඳනසේක් **'භගවතොව සාරිපුත්ත විපස්සිස්ස'** යනාදිය වදළසේක. එය ප්‍රකට අර්ථ ඇත්තේමය.

නැවත මහා ස්ථවිරයන්වහන්සේ කරුණු විචාරන්නාහු **'කො නුඛො භන්තෙ හෙතු'** යනාදිය කීහ. එහි **'කො නුඛො භන්තෙ'**යනු කරුණු විචාරීමය. 'ස්වාමීනි! එයට හේතු කවරේද'යනු එහි අර්ථයි. හෙතු - පච්චය යන මෙදෙක කාරණයන්නට නමකි. යම්හෙයකින් ඒ කරනකොට ඔහුගේ ඵලය පිහිටුවාද පවත්වාද, එහෙයින් කාරණය හෙතුයි කියනුලැබේ. යම්හෙයකින් එයනිසා එය ඇසුරු කොට ඒද, පවතීද එහෙයින් ප්‍රත්‍යයයි කියනුලැබේ. මෙසේ අර්ථවශයෙන් එකක්වූයේද, ව්‍යවහාරවශයෙන් වචනයන්ගේ සිලිටිබව පිණිසද ඒ ඒ තන්හි මේ දෙපදයම කියනුලැබේ. මෙහි සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය.

දැන් ඒ හේතුව හා ප්‍රත්‍යය දක්වනුපිණිස භාග්‍යවතුන්වහන්සේ **'භගවා ච සාරිපුත්ත විපස්සි'** යනාදිය වදළසේක. එහි **'කිලාසුනෝ අහෙසුං'** අලසබැවින් උත්සාහ රහිතවූවාහු නොවූහ. බුදුවරුන්ට අලසබවක් හෝ පසුබස්නා වැරඇතිබවක් නැත්තේය. බුදුවරයෝවනාහි එකෙක්හට හෝ දෙදෙනකුට හෝ සියලුසක්වළ වැසියනට හෝ ධම්දේශනා කරනසේක් සමවූම උත්සාහයෙන් ධම්දේශනා කෙරෙත්. පිරිසෙහි මදබව දක පසුබස්නා වැර ඇත්තාහු නොවෙත්. පිරිසෙහි මහත්බව දක වැඩිවැර ඇත්තාහු නොවෙත්. මෘගරාජන්වූ සිංහතෙමේ සත්දවසක්හුගේ ඇවෑමෙන් ගොදුරුපිණිස යනුයේ කුඩාවූ හෝ මහත්වූ ප්‍රාණීන් දක එක්සමානවූම වේගයෙන් කඩාපනියි. එයට හේතුකිමයත්: 'මාගේ වේගය නොපිරිහේවා'යනුයි. එසේ බුදුවරයෝ ස්වල්පවූ හෝ මහත්වූ පිරිසට සමවූම උත්සාහයෙන් ධම්දේශනා කෙරෙත්. එයට හේතු කිමයත්: 'අපගේ ධම්ගෞරවය නොපිරිහේවා'යනුයි. බුදුවරයෝ ධම්ය ගරුකොට ගත්තාහුය. ධම්යෙහි ගෞරව ඇත්තාහුය. යම්සේවනාහි අපගේ භාග්‍යවතුන්වහන්සේ මහමුහුද පුරවන්නාසේ විස්තරවිසින් ධම්ය දේශනාකළසේක්ද, ඒ බුදුවරයෝ මෙසේ ධම්දේශනා නොකළාහුය. කුමක්හෙයින්ද යත්: සත්වයන්ගේ නුවණෙහි අල්පරජස්කභාවය හේතුකොටය. ඒ බුදුවරුන්ගේ කාලයෙහි දීඝායුස්කවූ සත්වයෝ අල්පරජස්කවූහ. ඒ අල්පරජස්ක සත්වයෝ චතුසත්‍ය ප්‍රතිසංයුක්තවූ එක්ගාථාවකුදු අසා ධම්ය අවබොධ කරගණිත්. එහෙයින් විස්තරවිසින් ධම්දේශනා නොකළාහුය. ඒ කාරණයෙන්ම ඒ බුදුවරුන්ගේ සූත්‍ර-වෙදලල ධම් ස්වල්පවූයේය. එහි සූත්‍රාදීන්ගේ නානාභාවය ප්‍රථමසඞ්ගීතිවිණිනාවෙහි කියනලද්දේමය.**'අපඤ්ඤත්තං සාවකානං සික්ඛාපදං'** ශ්‍රාවකයන් පිළිබඳ වස්තුව්‍යතික්‍රමයන්ගේ අභාවයෙන්වූ නිර්දෙෂභාවය හේතුකොට දෙෂයන්ට අනුරූපවශයෙන් පැනවියයුතුවූ සප්තාපත්ති ස්කන්ධයන්ගේ වශයෙන් පැවති ආඥාශික්ෂාපද නොපනවනලද්දේය. **'අනුද්දිට්ඨං පාතිමොක්ඛං'** අඩමසක් පාසා ආඥාප්‍රාතිමොක්ෂය නොඋදෙසන ලද්දේවූයේය. ඒ බුදුවරයෝ අවවාද ප්‍රාතිමොක්ෂයම උදෙසූහ. එද අඩමසක්පාසා නොවේ. ඒ එසේමය. විදර්ශී භාග්‍යවතුන්වහන්සේ සාවුරුද්ද සාවුරුද්ද ඇවෑමෙන් එක් එක්වර, සාවුරුද්දට එක්වරක් අවවාද ප්‍රාතිමොක්ෂය තමන්වහන්සේම උදෙසූසේක. මුන්වහන්සේගේ ශ්‍රාවකයෝවනාහි තමතමන් වසනතන්හිදු නොඋදෙසූහ. සියලු දඹදිව එක්මතැන බන්ධුමතී රාජධානියෙහි ක්ෂෙමනම් මෘගදයයෙහි **විදර්ශී** භාග්‍යවතුන්වහන්සේගේ වාසස්ථානයෙහිදී සියලු භික්ෂුසඞ්ඝතෙමේ පොහොය කෙළේය. ඒ ද සඞ්ඝුපොසථයමය. ගණුපොසථය නොකෙළේය. පුග්ගලුපොසථය නොකෙළේය. පාරිසුද්ධිඋපොසථය නොකෙළේය. අධිට්ඨානුපොසථය නොකෙළේය.

ඒ කාලයෙහි දඹදිව අසූසාරදහසක් විහාර විය. එක් එක් විහාරයෙහි විසහාග පුද්ගලයන් හා මිශ්‍රනොවූ එක්නොවූ දසදහස් විසිදහස් ගණන් භික්ෂූහු වාසයකරත්. එයට වැඩිතරම්වූද භික්ෂූහු වෙසෙත්. උපොසථය සැලකරණ දෙවියෝ ඒ ඒ තැන ගොස් 'නිදුකානෙනි! එක්වසක් ඉක්මගියේය, දෙවසක්, තෙවසක්, සිවුවසක්, පස්වසක් ඉක්මගියේය, මේ සවන වසය, එන පුන්පසළොස්වක බුදුරජුන් දැකීමපිණිසද, පොහොය කරනුපිණිසද, යායුතුය. ඔබවහන්සේලාගේ සන්නිපාතකාලය පැමිණසිටියේය'යි සැලකෙරෙත්. එයින් පසු සෘද්ධ්‍යනුභාව සහිතවූ භික්ෂූන්වහන්සේ පැදුම්දෙස මුහුදුකෙළවර පිහිටි පෙදෙස්හිද, පැසුළු, උතුරු, දකුණුදෙස මුහුදුකෙළවර පිහිටි පෙදෙස්හිද, සිටියාහු, ගම්කවත් පුරා පාසිවුරු ගෙන යමු'යි සිත් උපදවත්. සිත් ඉපදවීම සමගම පොහොයකරන තැනට ගියාහුම වෙත්. ඔවුහු එහි විදර්ශී සම්‍යක් සම්බුද්ධයන්වහන්සේ මනාකොට වැඳ හිඳගනිත්. භාග්‍යවතුන්වහන්සේද රැස්වහුන් පිරිසෙහි මේ අවවාදප්‍රාතිමොක්ෂය උදෙසනසේක:

'ඛන්තීපරමං තපෝ තිතික්ඛා
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා,
න හි පබ්බජිතෝ පරූපඝාතී
සමණෝ හොති පරං විහෙඨයන්තෝ

සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියෝදපනං එතං බුද්ධානසාසනං

අනූපවාදෝ අනූපඝාතෝ පාතිමොක්ඛේ ච සංවරෝ,
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්තඤ්ච සයනාසනං,
අධිචිත්තෙ ච ආයොගෝ එතං බුද්ධානසාසන'ං යි

මේ උපායෙන්ම අන් බුදුවරයන්ගේද ප්‍රාතිමොක්ෂොද්දෙශය දතයුතුය. මේ ගාථාත්‍රයම සියලු බුදුවරයන්ගේ අවවාදප්‍රාතිමොක්ෂ ගාථාය. ඒ ගාථා දීඝායුෂ්කවූ බුදුවරයන්ගේ සසුන්කෙළවරතෙක් උදෙසීමට එන්නේය. අල්පායුෂ්කවූ බුදුවරයන්ගේ ප්‍රථම බෝධියෙහිම උදෙසනුලබත්. ශික්ෂාපදප්‍රඥප්ති කාලයෙහිපටන් ආඥප්‍රාතිමොක්ෂයම උදෙසනුලැබේ. ඒද භික්ෂූහුම උදෙසත්. බුදුවරයෝ නොඋදෙසත්. එහෙයින් අපගේ භාග්‍යවතුන්වහන්සේද, ප්‍රථමබෝධියෙහි විසිවසක් පමණම මේ අවවාදප්‍රාතිමොක්ෂය උදෙසූසේක. නැවත, එක් දවසක් පූර්වාරාමයෙහි මෘගාරිමාතෘ ප්‍රාසාදයෙහි වැඩහුන්සේක් 'මහණෙනි! දැන් මම මෙයින් මතු පොහොය නොකරන්නෙම්, ප්‍රාතිමොක්ෂය නොඋදෙසන්නෙම්,

මහණෙනි! තෙපිම දැන් මෙයින් මතු පොහොයකරවු, පාමොක් උදෙසවු, මියාණෙනි! තථාගතතෙමේ යම්කරුණක් හෙතුකොට අපිරිසිදු පිරිසෙහි පොහොයකරන්නේද, පාමොක් උදෙසන්නේද, යන යමක්වේද, මෙය හේතු රහිතය, ප්‍රත්‍යය රහිතය'යි හික්ෂූන් ඇමතුයේක. එතැන්පටන් හික්ෂූහු, ආඥප්‍රාතිමොක්ෂය උදෙසත්. මේ ආඥප්‍රාතිමොක්ෂය නොඋදෙසන ලද්දේවූයේය. එහෙයින් **'අනුද්දිට්ඨං පාතිමොක්ඛං'**යනු වදරණලද්දේය.

'තෙසං බුද්ධානං' ඒ විදර්ශීආදී තුන්බුදුවරයන්ගේ **'අන්තරධානෙන'** සකන්ධයන්ගේ අතුරුදහන්වීමෙන් පිරිනිවීමෙනැයි වදරණලද්දේවේ. **'බුද්ධානුබුද්ධානං'** ඒ බුදුවරයන්ගේ යම් අනුබුද්ධවූ සම්මුඛශ්‍රාවකයෝවෙත්ද, ඒ සම්මුඛශ්‍රාවකයන්ගේද ස්කන්ධයන්ගේ අතුරුදහන්වීමෙන් **'යෙ තෙ පච්ඡිමා සාවකා'** ඒ සම්මුඛශ්‍රාවකයන්ගේ සමීපයෙහි පැවිදිවූ යම් පශ්චිමශ්‍රාවකයෝවෙත්ද, **නානා නාමා** බුද්ධරක්ඛිත, ධම්මරක්ඛිත යනාදි නාම වසයෙන් නන්වැදරුම් නම් ඇති, **නානා ගොත්තා** ගෞතම, මොග්ගල්ලාන යනාදි ගොත්‍ර වසයෙන් නන්වැදරුම් ගොත් ඇති, **'නානා ජච්චා'** ඛත්තිය-බ්‍රාහ්මණ යනාදි ජාති වශයෙන් නන්වැදරුම් ජාති ඇති **'නානා කුලා පබ්බජිතා'** ක්ෂත්‍රියකුලාදි වශයෙන් හෝ උස්පහත් අතිමහත් හොගාදිකුලවශයෙන් හෝ නන්වැදරුම්වූ කුලයන්ගෙන් නික්ම පැවිදිවූ, **'තෙ තං බ්‍රහ්මචරියං'** ඒ පශ්චිම ශ්‍රාවකයෝ යම් හෙයකින් එක් නම් ඇත්තාහු, එක් ගොත් ඇත්තාහු, එක් ජාති ඇත්තාහු, එක් කුලයෙන් නික්ම පැවිදිවූවාහු 'අපගේ ශාසනය, අපගේ ශාසනතන්තිය, අපගේ ශාසනප්‍රවේණියයි තමන් භාරයටගෙන බ්‍රහ්මචර්‍යීය රකින්නාහුද බොහෝකාලයක් පර්‍යාප්තිධර්මය පරිහරණය කරත්ද, මොවුහුද එබඳුවූවාහු නොවෙත්. එහෙයින් ඔවුනොවුන් වෙහෙසනුවෝ විලොම්ව ගන්නාහු 'අසුවල් ස්ථවිරතෙමේ දන්නේය, අසුවල් ස්ථවිරතෙමේ දන්නේයයි සිථිලකරන්නාහු ඒ බ්‍රහ්මචර්‍යීය වහාම අතුරුදහන්කරවූහ. සඞ්ග්‍රහයට නගා නොරැක්කාහුය. **'සෙය්‍යථාපි'** යනු ඒ අර්ථය පිළිබඳ උපමා දැක්වීමය. **'විකිරති'** විසුරුවයි. **'විධමති'** අන්තැනට පමණුවයි. 'විධංසෙති' තුබ්බතැනින් පහකරයි **'යථා තං සුත්තෙන අසඞ්ගහිතත්තා'** යම්සේ හුයෙන් නොගොතනලදබැවින් නොබඳිනලදබැවින් මෙසේ විසිරේද, හුයෙන් සඞ්ග්‍රහ නොකරනලද්දහු යම්සේ විසිරෙණුලැබෙත්ද, මෙසේ විසිරේයයි වදරණලද්දේය. **'එවමෙව ඛො'**යනු උපමා පිළියෙලකිරීමය. **'අන්තරධාපෙසුං'** වර්‍ණසඞ්ග්‍රහ පණඤාස සඞ්ග්‍රහාදීන් විසින් සඞ්ග්‍රහනොකරන්නාහු තමාට යමක් යමක් රුස්නේද, ඒ ඒම ගෙන සෙස්ස වැනසූහ. නොදැක්මට පැමිණවූහ.

'අකිලාසුනො ව තෙ භගවන්තො අහෙසුං සාවකෙ චෙතසා චෙතො පරිච්ච ඔවදිතුං' තවද, ශාරිපුත්‍ර! ඒ බුදුවරයෝ තමන්ගේ සිතින්

ශ්‍රාවකයන්ගේ සිත දැන, පිරිසිඳ අවවාදකරන්නට උත්සාහ සහිතවූහ. උත්සාහ නැත්තාහු නොවූහ. පරසිත් දැන කරන අනුශාසනාව බැරෑරුම් නොවනබැවින් විස්තරවිසින් නොදුටහ. **'භුතපුබ්බං සාරිපුත්ත'** යනාදිය උත්වහන්සේලාගේ උත්සාහයෙන් නොතොරබව පවසනුපිණිස වදරණලදී. **'භිංසනකෙ'** භයානකවූ බියඋපදවන්නාවූ **'එවං විතක්කෙථ'** නෙෂ්ක්‍රම්‍යවිතර්කාදීවූ ත්‍රිවිධවිතර්කයන් විතර්කණය කරවූ. **'මා එවං විතක්කයිත්ථ'** කාමවිතර්කාදීවූ ත්‍රිවිධඅකුශල විතර්කයන් විතර්කණය නොකරවූ. **'එවං මනසි කරොථ'** අනිත්‍යය, දුඃඛය, අනාත්මය, අශුභයයි මෙනෙහිකරවූ **'මා එවං මනසාකත්ථ'** නිත්‍යය, සුඛය, ආත්මය, ශුභයයි මෙනෙහි නොකරවූ. **'ඉදං පජහථ'** මේ අකුශලය දුරුකරවූ. **'ඉදං උපසම්පජ්ජ විහරථ'** කුශලයට පැමිණ කුශලය පිළිලැබ කුශලය නිපදවා වසවූ. **'අනුපාදය ආසවෙහි චිත්තානි විමුච්චිංසු'** අරමුණුවසයෙන් නොගෙන මිදුනාහ. ඔවුන්ගේ සිත් යම් ආස්‍රව කෙනෙකුන්ගෙන් මිදුනේද, ඔවුහු ඒ ආස්‍රවයන් අරමුණුවසයෙන් නොගෙන මිදුනාහ. අනුතපාද නිරොධයෙන්වනාහි නිරුද්ධවන්නාහ. ආස්‍රවයන් අරමුණුවසයෙන් නොගෙනම මිදුනාහ. **'අනුපාදය ආසෙවෙහි චිත්තානි විමුච්චිංසු'** යනු එහෙයින් වදරණලදී. ඒ සියල්ලෝම රහත්බවට පැමිණියාහු, හිරුරැසින් මොනවට පහසනලද පියුම්වනයක්මෙන් පිබිදි සිත් ඇත්තෝවූහ. **'තත්‍ර සුදං සාරිපුත්ත භිංසනතස්ස භිංසනකතසම්මං හොති'** යන මෙහි **'තත්‍ර'** යනු පූර්වවචනාපෙක්ෂායි. **'සුදං'** යනු පදපූරණමාත්‍රයෙහි නිපාතයි. **'සාරිපුත්ත'** යනු ආමන්ත්‍රණයි. මේ වනාහි මෙහි අර්ථ යොජනාය: 'එක්තරා බිහිසුනු වනලැහැබකැ'යි යමක් වදරණලදද, එහි යම් ඒ වනලැහබක් බිහිසුනුයි වදරන ලද්දේද, ඒ බිහිසුනු වනලැහබෙහි බිහිසුනුබවේ. භිංසනක්‍රියාවෙන්වේය, යන අර්ථයි. කුමක් වේදයත්:

'නොපහවූ රාගඇති යම්කිසිවෙක්වේද -පෙ- ලොමු දැහගනියි, යන මෙය වන්නේය නොහොත් **'තත්‍ර'** යනු සම්බන්ධාර්ථයෙහි සප්තමී වචනයි.' **'සු'** යනු නිපාතයි. **'කිංසු නාම තෙ හොන්තො සමණ බ්‍රාහ්මණා'**[A] යනාදි තන්හි මෙනි. **'ඉදං'** යනු අභිමතාර්ථය ප්‍රත්‍යක්ෂවූවක් මෙන්කොට දක්වීමෙහිලා යෙදෙන වචනයි. **'සු+ඉදං'** යනු **'සුදං'**යි වේ. සන්ධිවශයෙන් ඉකාරලොපය දතයුතුය. **'චක්ඛුන්ද්‍රියං ඉත්ථින්ද්‍රියං අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රියං, කිංසූධ විත්තං'**[B] යනාදි තන්හි මෙනි. මේ මෙහි අර්ථයොජනාය: 'ශාරිපුත්‍ර, ඒ බිහිසුනු වනලැහබෙහි බිහිසුනුබවෙහිදී මේ වන්නේය. **'භිංසනකතසම්මං'** බිහිසුනුබවෙහි යන අරුත්ය. එක්

A මජ්ඣිමනිකාය B යක්ඛපංයුත්ත

තකාරයක ලොපය දතයුතුය. **'හිංසනකත්තසමිං'** කියාම හෝ පාඨයවේ. **'හිංසනකතාය'යි** හෝ කියයුත්තෙහි ලිඞ්ගවිපයර්‍යාසය කරනලද්දේය. මෙහි නිමිත්තාර්‍ථයෙහිද සප්තමීවචනයි. එහෙයින් **'හිංසනකභාවේ ඉදංසු හොති'**යි සම්බන්ධය දතයුතුය. බිහිසුනුබව නිමිතිකොට, බිහිසුනුබව හේතුකොට, හිංසනකභාව ප්‍රත්‍යයයෙන් මේ වන්නේය. **'යො කොචි අච්තරාගො තං වනසණ්ඩං පවිසති යෙභුය්‍යෙන ලොමානි හංසන්ති'** ඉතා බොහෝවූ රෝම දහගනී. උඩුහුරුමුවඇතිවද, හිදි වැනිවද, කටු වැනිවද සිටගනී. ස්වල්පයක් රෝම දහනොගනී. ඉතාබොහෝ සත්වයන්ගේ හෝ රෝම දහනොගනී. ඉතාබොහෝ සත්වයන්ගේ හෝ රෝම දහගනී. ඝට්ල්පගණනක් අතිසූරපුරුෂයන්ගේ රෝම දහනොගනී.

දැන් **'අයං ඛො සාරිපුත්ත හෙතු'** යනාදිය නිගමනයවේ. මෙහි අතරතුර යමක් නොකියනලද්ද, එය ප්‍රකට අර්‍ථී ඇත්තේමය. එහෙයින් එය පෙළෙහි ආ ලෙසින්ම දතයුතුය. **'න විරට්ඨිකං අහොසි'**යි යමක් වදරනලද්ද එය පුරුෂයුග වශයෙන් වදරනලදයි දතයුතුය.

දවස් ගණනින්වනාහි විදර්ශී භාග්‍යවතුන්වහන්සේගේ ආයුෂය අවුරුදු අසූදහසකි. උන්වහන්සේගේ සම්මුඛශ්‍රාවකයන්ගේද ආයුෂය එපමණමවේ. මෙසේ මුන්වහන්සේගේ යම් සර්‍වපශ්චිමක ශ්‍රාවකයෙක්වූයේද, උන්වහන්සේ හා එක්කොට අවුරුදු එක්ලක්ෂ සැටදහසක් පමණ කල් බ්‍රහ්මචර්‍යය පැවැත්තේය. පුරුෂයුගවශයෙන්වනාහි යුග පරම්පරාවෙන් අවුත්, පුරුෂයුග දෙකක්ම බ්‍රහ්මචර්‍යය පැවැත්තේය. එහෙයින් විරට්ඨිතික නොවූයේයයි වදරණලදී.

සිඛී භාග්‍යවතුන්වහන්සේගේවනාහි ආයුෂය අවුරුදු සැත්තෑදහසෙහි මුන්වහන්සේගේ සම්මුඛශ්‍රාවකයන්ගේද ආයුෂය එපමණමවේ.

විශ්වභූ භාග්‍යවතුන්වහන්සේගේ ආයුෂය අවුරුදු සැටදහසෙකි. මුන්වහන්සේගේ සම්මුඛ ශ්‍රාවකයන්ගේද ආයුෂය එපමණමවේ.

මෙසේ උන්වහන්සේලාගේද යම් සර්‍වපශ්චිමක ශ්‍රාවකයෝ වෙත්ද ඔවුන් හා එක්කොට ලක්ෂයකින් වැඩි අවුරුදු සතළිස්දහසක් පමණද අවුරුදු විසිදහසක් පමණද බ්‍රහ්මචර්‍යය පැවැත්තේය. පුරුෂයුගවශයෙන් වනාහි යුග පරම්පරාවෙන් අවුත්, පුරුෂයුග දෙකක් දෙකක්ම බ්‍රහ්මචර්‍යය පැවැත්තේය. එහෙයින් **'විරට්ඨිතික** නොවූයේය'යි වදරණලදී.

මෙසේ ආයුෂ්මත් ශාරිපුත්‍ර මහා ස්ථවිරයන්වහන්සේ තුන්බුදුවරයන්ගේ බ්‍රහ්මචර්‍යය බොහෝකල් නොපැවැත්මෙහි කරුණු අසා අනික් තුන් බුදුවරයන්ගේ බ්‍රහ්මචර්‍යය කල්පැවැත්මෙහි හෙතු

අසනු කැමැත්තාහු, නැවත **'කො පන භන්තෙ'**යි මේ ආදි ක්‍රමයෙන් භාග්‍යවතුන්වහන්සේගෙන් විචාළාහුය. භාග්‍යවතුන්වහන්සේද මුන්වහන්සේට එය ප්‍රකාශකළසේක. ඒ සියල්ල කියනලද්දට ප්‍රතිපක්ෂවශයෙන් දතයුතුය. මෙහි විරස්ථිතිකභාවයෙහිද ඒ බුදුවරයන්ගේ ආයුපමණින්ද පුරුෂයුගවසයෙන්ද යන දෙයයුරෙන් විරස්ථිතිකභාවය දතයුතුය.

කකුසන්ධ භාග්‍යවතුන්වහන්සේගේ ආයුෂය අවුරුදු හතළිස් දහසකි. **කෝණාගමන** භාග්‍යවතුන්වහන්සේගේ ආයුෂ අවුරුදු තිස්දහසකි. **කාශ්‍යප** භාග්‍යවතුන්වහන්සේගේ ආයුෂ අවුරුදු විසිදහසකි. උන්වහන්සේලාගේ සම්මුඛශ්‍රාවකයන්ගේ ආයුෂද එපමණමවේ. උන්වහන්සේලාගේ බොහෝ ශ්‍රාවකයුගයෝද පරම්පරාවෙන් බ්‍රහ්මචර්‍යය පැවැත්වූහ. මෙසේ උන්වහන්සේලාගේ ආයුපමණින්ද ශ්‍රාවකයුගවශයෙන්දයි දෙපරිද්දෙන් බ්‍රහ්මචර්‍යය විරස්ථිතිකවූයේය.

කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේගේ ආයුෂයෙන් අඩක් ආයුපමණවූ දසදහස් අවුරුදු ආයුඇති කාලයෙහි අප භාග්‍යවතුන්වහන්සේ ඉපදියයුතුවන්නේය. ඒ ආයු කාලයට නොපැමිණෙන භාග්‍යවතුන්වහන්සේ විසින් පන්දහසක් අවුරුදු ආයුඇති කාලයෙහි හෝ දහසක් අවුරුදු ආයුඇති කාලයෙහි හෝ පන්සියයක් අවුරුදු ආයුඇති කාලයෙහි හෝ ඉපදියයුතුවන්නේය. යම්හෙයකින්වනාහි බුද්ධකාරකධර්මයන් සොයන්නාවූ භාත්පසින් සොයන්නාවූ නුවණ මෝරවන්නාවූ සර්ව්ඥතාඥානය ගැබිගන්වන්නාවූ උන්වහන්සේගේ නුවණ සියක්අවුරුදු ආයුඇති කාලයෙහි මේරීමට ගියේද, එහෙයින් ඉතා මද ආයුඇති කාලයෙහි උපන්සේක. එහෙයින් මුන්වහන්සේගේ ශ්‍රාවක පරම්පරාවශයෙන් බ්‍රහ්මචර්‍යය කල්පවත්නේවූයේද, ආයුපමණින් අවුරුදු ගණනින් කල් නොපවතින්නක්මවූයේයයි කියන්නට වටියි.

'අථ ඛො ආයස්මා සාරිපුත්තො' යන මෙහි පූර්වාපරකථා පිළිබඳ අනුසන්ධිය කවරේද යත්: මෙසේ තුන් බුදුවරයන්ගේ බ්‍රහ්මචර්‍යය පිළිබඳ කල්පැවැත්මෙහි හේතුව අසා ශික්ෂාපද ප්‍රඥප්තියම කල්පැවැත්මෙහි හේතුයයි නිමාවට ගොස් භාග්‍යවතුන්වහන්සේගේද බ්‍රහ්මචර්‍යයෙහි කල්පැවැත්ම කැමතිවන්නාවූ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේගෙන් ශික්ෂාපද පැණවීම ඇයද සිටියහ. ශික්ෂාපද පැණවීම පිළිබඳ ඒ යාචඤ්ඤාවිධිය දක්වනුපිණිස **'අථ ඛො ආයස්මා සාරිපුත්තො උට්ඨායාසනා -පෙ- චිරට්ඨිතිකං'** යන මෙය වදරණ ලද්දේය. එහි **'අද්ධනියං'** දිගුකල් පැවැත්මට සමර්ථය. දීඝකාලිකයයි කියනලද්දේවේ. සෙස්ස ප්‍රකටඅර්ථ ඇත්තේමය.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මෙතෙක් ශික්ෂාපද පැණවීමට කාලය නොවේයයි ශාරීපුත්‍ර මහාස්ථවිරයන්වහන්සේට ප්‍රකාශකරනසේක් **'ආගමෙහි තවං සාරිපුත්ත'** යනාදිය වදළසේක. එහි **'ආගමෙහි තවං'** ඔබ මදක් බලාපොරොත්තුවෙව, ඔබ මදක් ඉවසවයි වදරණලද්දේවේ. ආදරවසයෙන් මෙය දෙවරක් වදරණලදි. භාග්‍යවතුන්වහන්සේ මෙයින් ශික්ෂාපද පැණවීමෙහි ශ්‍රාවකයන්ගේ විෂයභාවය ප්‍රතික්ෂේපකොට ශික්ෂාපද පැණවීම බුදුවරයන්ට විෂයවූවෙකැයි ප්‍රකාශකරණසේක් **'තථාගතො වා'** යනාදිය වදළසේක. මෙහිද **'තත්‍රථ'** යනු ශික්ෂාපද පනවණ සේක්වා'යි තාවිසින් යමක් කියනලදද, එහි තථාගතතෙමේම ඒ ශික්ෂාපද පැණවීමෙහි කල් දන්නේය'යි මෙසේ වදරා 'එයට තවම කාලය නොවේය'යි දක්වන්නට **'න තාව සාරිපුත්ත'** යනාදිය වදළසේක.

එහි මොවුන් කෙරෙහි ආස්‍රව සිටින්නුයි ආසවට්ඨානීය නම්වෙත්. මෙලොව පරොපවාද විප්‍රතිසාර වධබන්ධනාදීවූ ආස්‍රවයෝද, පරලොව අපායදුඃඛයට විශේෂවූ ආස්‍රවයෝද, යම් කෙනෙකුන් කෙරෙහි සිටින්නෝම වෙත්ද යම්හෙයකින් ඔවුනට ඔවුහු කරුණුවෙත්ද, යන අර්ථයි. ආස්‍රවයන්ගේ පැවැත්මට කරුණු වූ ඒ ව්‍යතික්‍රම ධර්මයෝ යම්තාක් සඞ්ඝයාකෙරෙහි පහළනොවෙත්ද, ඒතාක් ශාස්තෘතෙමේ ශ්‍රාවකයන්ට ශික්ෂාපද නොපණවයි යනු මෙහි අර්ථ යොජනාය. ඉදින් පණවානම්, පරොපවාදයෙන් පරොපාරම්භයෙන් ගර්හාදෝෂයෙන් නොමිදෙන්නේය. කෙසේදයත්: පණවන්නහු විසින් **'යො පන භික්ඛු මෙථුනං ධම්මං පතිසෙවෙය්‍ය'** යනාදි සියල්ල පැණවියයුතු වන්නේය. ව්‍යතික්‍රම දෝෂයක් නොදකම මේ ප්‍රඥප්තිය දැනගෙන අන්‍යයෝ කෙසේද යත්: පණවන්නහු විසින් **'යො පන භික්ඛු මෙථුනං ධම්මං පතිසෙවෙය්‍ය'** යනාදි සියල්ල පැණවියයුතු වන්නේය. ව්‍යතික්‍රම දෝෂයක් නොදකම මේ ප්‍රඥප්තිය දැනගෙන අන්‍යයෝ 'කෙසේනම් ශ්‍රමණගෞතම තෙමේ, භික්ෂුසඞ්ඝතෙමේ මටඅනුව පවත්නේය. මාගේ වචනය කරන්නේය'යි මෙපමණකිනුදු ශික්ෂාපදයන්ගෙන් භික්ෂුසඞ්ඝයා වෙළාතබන්නේද? පාරාජිකා පණවන්නේද? මේ කුලපුත්‍රයෝ මහත් භොගසමූහයද, මහත් නෑසමූහයද අතට පත් රාජ්‍යයන්ද, හැරදමා පැවිදිවූවාහුය. කෑම් ඇඳීම් පෙවීමෙහි සැහැල්ලුබව පරමකොට ගැනීමෙන් සතුටුව, ශික්ෂාවෙහි දැඩි ගෞරව ඇතිව, කයෙහි හා ජීවිතයෙහි බලාපොරොත්තු රහිතව වසන්නාහුය, ඔවුන් අතුරෙහි කවරෙක්නම් ලෝකයාගේ ආමිෂයවූ මෛථුනය හෝ සේවනය කරන්නේද? අන්‍යයන් අයත් බඩු පැහැර ගන්නේද? අන්‍යයාගේ රිසිවූ සිත්කලුවූ ඉම්හිරිවූ ජීවිතය හෝ සිඳින්නේද? තමන්කෙරෙහිනොවූ ගුණපැවසීමෙන් ජීවිකාව හෝ කරන්නේද? පාරාජිකයන් නොපැණවූ කල්හිද, ප්‍රව්‍රජ්‍යා මුඛයෙන්

මේ මෙවුන්දම්ආදිය නොකිරීම ප්‍රකට කරනලද්දේ නොවේදයි උපවාද, උපාරම්භ, ගර්හා පවත්වන්නාහුය. සත්වයෝ තථාගතයන්වහන්සේගේ ශක්තියද බලයද නොදන්නාහ. පැණවූ ශික්ෂාපදයද කිපෙන්නේය, සුදුසු තැන නොසිටින්නේය. යම්සේ අදක්ෂවූ වෙදෙක් නොහටගත් ගඩක් ඇති පුරුෂයෙකු කැඳවා 'එම්බා! පුරුෂය! මෙහි එව, තාගේ මේ සිරුරු පෙදෙසෙහි මහා ගඩක් හටගෙන තා විනාශයට පමුණුවන්නේය. එහෙයින් ගඩ හටගැණීමට පෙරම එයට පිළියම් කරවා ගණුව'යි කියා 'ඇදුර! මැනව, ඔබම එයට පිළියම් කරව'යි කියනලද්දේ ඒ පුරුෂයාගේ නීරෝගවූ සිරුරු පෙදෙසක් පළා ලේ බැහැරකොට ආලේපන බන්ධන ධොවනාදියෙන් ඒ පෙදෙස සිවිසහිතකොට, නැවත ඒ පුරුෂයාහට 'මා විසින් තාගේ මහා රොගය පිළියම් කරනලද්දේය. එහෙයින් ඒ සඳහා මට දියයුතු දෑය දෙව'යි කියන්නේය. ඔහුද ඒ වෙදට 'මේ අඥවූ වෙද කුමක් කියාද? මොහුවිසින් මාගේ කිනම් රොගයක් පිළියම් කරණුලද්දේද? මෙතෙමේ නිකරුණේ මට දුක් ඉපදවූයේ නොවේද? රුධිරක්ෂයට මා පැමිණවූයේ නොවේද'යි මෙසේ ආක්‍රොශද කරන්නේය, දෙස්ද කියන්නේය, ගැරහීමද කරන්නේය. ඔහුගේ ගුණයක්ද නොදන්නේය. එපරිද්දෙන්ම ශාස්තෘන්වහන්සේ නොඋපන් ව්‍යතික්‍රම දෙෂයක් නිමිතිකොට, ශ්‍රාවකයන්ට ශික්ෂාපද පණවන්නාහුනම්, පරොපවාදදියෙන් නොමිදෙන්නාහුය. සත්වයෝ උන්වහන්සේගේ ශක්තිය හෝ බලය නොදන්නාහුය. පැණවූ ශික්ෂාපදයද කොප්‍යවන්නේය. සුදුසු තැන නොසිටින්නේය. එහෙයින් **'න කාව සාරිපුත්ත සත්ථා සාවකානං -පෙ- පාතුභවන්ති'** යනු වදරණුලද්දේය.

මෙසේ ශික්ෂාපද පැණවීමෙහි අකාලය දක්වා නැවත ශික්ෂාපද පැණවීමෙහි කාලය දක්වන්නට **'යතො ච ඛො සාරිපුත්ත'** යනාදිය වදළසේක. එහි **'යතො ච ඛො සාරිපුත්ත'** යනාදිය එහි **'යතෝ'** යම් කලෙක. යම් කලෙකැයි වදරණුලද්දේවේ. සෙස්ස කියූ අනුසාරයෙන්ම දතයුතුය. මේ මෙහි සඞ්ඛෙපපාඨීය වෙයි. යම් කලෙකවනාහි ආස්‍රවස්ථානීය ධර්මයි ගිනීමට ගියාවූ ව්‍යතික්‍රම දෙෂ සඞ්ඝයා කෙරෙහි පහළවේද, එකල්හි ශාස්තෘන්වහන්සේ ශ්‍රාවකයන්හට ශික්ෂාපද පණවන්නෝය. ප්‍රාතිමොක්ෂය උදෙසන්නෝය. කුමක්හෙයින්ද යත්: ආස්‍රවස්ථානීය ධර්මයි ගිණීමට ගියාවූ ඒ ව්‍යතික්‍රම දෙෂයන්ගේ නැසීමපිණිසය. එසේ පණවන්නේ යම්සේ දක්ෂවූ වෙදෙක් හටගත් ගඩය පැළීම, ආලෙප කිරීම, බැඳීම, සේදීම යන මේ ආදියෙන් එයට පිළියම්කරනුයේ මස්නගා සන්සිඳුවා එතැන සිවිසහිතකිරීමෙන් උපවාදදිය ලැබීමට සුදුසුනොවූයේමවේද, සිය ඇදුරුකම්හි ප්‍රකටවූ ආනුභාවඇත්තේ සත්කාරයට පැමිණේද, එපරිද්දෙන්

උපවාදදිය ලැබීමට සුදුසු නොවෙත්. ස්වකීයසච්ඡන්දභාවවිෂයයෙහි ප්‍රකට ආනුභාව ඇත්තෝ සත්කාරයට පැමිණෙත්. භාග්‍යවතුන්වහන්සේගේ ඒ ශික්ෂාපදයද කොප්‍ය නොවේ. සුදුසුතැන පිහිටා සිටින්නේය. මෙසේ ආස්‍රවස්ථානීය ධර්මයන්ගේ නොඉපැත්ම, ශික්ෂාපද පැණවීමට අකාලයයිද, ඉපැත්ම, කාලයයිද වදරා ඒ ධර්මයන්ගේ අනුත්පත්ති කාලයද උත්පත්තිකාලයද දක්වන්නට **'න තාව සාරිපුත්ත ඉධෙකච්චේ'** යනාදිය වදළසේක. එහි ප්‍රකට අර්ථඇති පදපෙළවිසින්ම දතයුතුය.

මේ වනාහි අප්‍රකටපද විණිනාය: රාත්‍රිකාලයන් දනිත්නුයි රත්තඤ්ඤූ. තමන් පැවිදිවූ දිනපටන් බොහෝ රාත්‍රිකාල දනිත්. පැවිද්දෙන් බොහෝ කල්ගියහයි කියනලද්දේවේ. රාත්‍රි දන්නවුන් හේතුකොට මහත්වයට ගියේ **රත්තඤ්ඤුමහත්ත** නම්. පැවිද්දෙන් බොහෝකල් ගියවුන් අතුරෙහි මහත්බවට පැමිණියේය යනඅර්ථයි. එහි රාත්‍රිකාල දනීමෙන් මහත්බවට පැමිණි සඞ්ඝයා විෂයෙහි **උපසෙන වඞ්ගන්තපුත්‍ර** අරබයා ශික්ෂාපදය පණවනලදැයි දතයුතුය. ඒ ආයුෂ්මත්තෙමේවනාහි උනූ දසවස් ඇතිව උපසම්පදකරන භික්ෂූන් දැක එක්වස් ඇතිව සද්ධිවිහාරිකයෙකු උපසම්ද කෙළේය. එකල්හි භාග්‍යවතුන්වහන්සේ **'න භික්ඛවේ ඌන දසවස්සෙන උපසම්පාදෙතබ්බා, යෝ උපසම්පාදෙය්‍ය ආපත්ති දුක්කටස්ස'**[A] යන ශික්ෂාපදය පැණවූසේක. මෙසේපැණවූ ශික්ෂාපදය ඇතිකල්හි නැවත භික්ෂූහු 'දසවස් ඇත්තම්හ'යි අඳුවූවෝ අව්‍යක්තවූවෝ උපසම්පද කෙරෙත්. එකල්හි භාග්‍යවතුන්වහන්සේ, **'න භික්ඛවේ බාලෙන අබ්‍යත්තෙන දසවස්සෙන උපසම්පාදෙතබ්බා, යෝ උපසම්පාදෙය්‍ය ආපත්ති දුක්කටස්ස, අනුජානාමි භික්ඛවේ ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන දසවස්සෙන වා අතිරෙක දසවස්සෙන වා උපසම්පාදෙතුං'**[B]යි අනිකුදු ශික්ෂාපදයක් පණවාවදළසේක. පැවිද්දෙන් බොහෝකල් ගියවුන් මහත්බවට පැමිණිකල්හි ශික්ෂාපද දෙකක් පණවනලද්දේය.

'වෙපුල්ලමහත්තං' ස්ථවිර, මද්‍යම, නවකයන්ගේ විපුලත්වයෙහි මහත්බව. යම්තාක් සඞ්ඝයාවනාහි ස්ථවිර, නවක, මද්‍යමයන්ගේවශයෙන් පැවිද්දන්ගේ බහුලභාවයෙන් මහත්බවට පැමිණියේ නොවේද, ඒතාක් සෙනසුන් පොහෝනේවේ. එහෙයින් ශාසනයෙහි ආවාස මාත්සර්‍යාදිය හේතුකොට ඇතැම් ආස්‍රවස්ථානීය ධර්ම නොඋපදියි. පැවිද්දන්ගේ බහුලභාවයෙන් මහත්බවට පැමිණිකල්හි ඒ ආස්‍රවස්ථානීය ධර්ම උපදියි. එකල්හි ශාස්තෘන්වහන්සේ ශ්‍රාවකයන්ට ශික්ෂාපද පණවත්. එහි පැවිද්දන්ගේ බහුල භාවයෙන් මහත්බවට පැමිණි සඞ්ඝයාවිෂයයෙහි

A මහාවග්ග - මහාඛන්ධක B මහාවග්ග - මහාඛන්ධක

පණවන්න ලද ශික්ෂාපදයෝ **'යො පන භික්ඛු අනුපසම්පන්නෙන උත්තරිං දිරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තිය'**[A] **'යා පන භික්ඛුනී අනුවස්සං වුට්ඨාපෙය්‍ය පාචිත්තිය'**[B] **'යා පන භික්ඛුනී එකං වස්සං දෙ වුට්ඨාපෙය්‍ය පාචිත්තිය'**[C] යි මේ නයින් දතයුත්තාහ.

'ලාභග්ගමහත්තං' චීවරාදිප්‍රත්‍යය ලාභයෙහි අග්‍රමහත්වය. ලාභය පිළිබඳ යම් අග්‍රබවක් උත්තමබවක්, මහත්බවක්වේද, එයට පැමිණියේවේද යනඅර්ථයි. නොහොත් ලාභයෙන් අග්‍රමහත්වයටද, ලාභයෙන් ශ්‍රේෂ්ඨත්වයටද, මහත්වයටද, පැමිණියේය යන අර්ථයි. සඞ්ඝතෙමේවනාහි යම්තාක්කල් ලාභාග්‍රමත්වයට පැමිණියේ නොවේද, ඒතාක් ලාභය නිසා ආස්‍රවස්ථානීය ධර්මයෝ නොඋපදිත්. ලාභාග්‍රමහත්වයට පැමිණිකල්හි උපදිත්. එකල්හි ශාස්තෘන්වහන්සේ ශික්ෂාපද පනවණසේක. **'යො පන භික්ඛු අවෙලකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දදෙය්‍ය, පාචිත්තිය'**[D] යන මේ ශික්ෂාපදය සඞ්ඝයා ලාභාග්‍රමහත්වයට පැමිණිකල්හි පණවනලද්දේය.

'බාහුසච්ච මහත්තං' බහුශ්‍රැතභාවයෙහි මහත්බව. සඞ්ඝතෙමේ යම්තාක් බහුශ්‍රැත මහත්වයට පැමිණියේ නොවේද, ඒතාක් ආස්‍රවස්ථානීය ධර්ම නොඋපදියි. බහුශ්‍රැත මහත්වයට පැමිණිකල්හිවනාහි යම්හෙයකින් එක් නිකායකුදු දෙනිකායකුදු -පෙ- නිකාය පසම උගෙණ විපරීතවශයෙන් නුනුවණින් ඉල්පෙන්නාවූ පුද්ගලයෝ ස්වභාවයෙන් ස්වභාවය හෙවත් **අනුපාදින්න එස්ස රසයෙන් උපාදින්න එස්ස රසය** යසඳ ශාස්‍තෘශාසනය ධර්මයෙන් පහවූවක්කොට, විනයෙන් පහවූවක්කොට දක්වත්. එකල්හි ශාස්‍තෘන්වහන්සේ **යො පන භික්ඛු එවං වදෙය්‍යඃ- තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි -පෙ- සමණුද්දෙසොපි වෙ එවං වදෙය්‍ය'**[E] යනාදික්‍රමයෙන් ශික්ෂාපද පණවනසේක.

මෙසේ භාග්‍යවතුන්වහන්සේ, ආස්‍රවස්ථානීය ධර්මයන්ගේ අනුත්පත්තිකාලයත් උත්පත්තිකාලයත් දක්වා, ඒ කාලයෙහි මුළුමනින් ඔවුන්ගේ අභාවය දක්වනසේක් **'නිරබ්බුදෙ හි සාරිපුත්ත'** යනාදිය වදළසේක. එහි **'නිරබ්බුදෙ'** අර්බුදරහිතය. සොරහු අර්බුදයි කියනුලැබෙත්. සොරු නැත්තේය යනඅර්ථයි. මේ අර්ථයෙහි දුශ්ශීලයෝ සොරහයි අදහස් කරණුලදහ. දුශ්ශීලයෝවනාහි ශ්‍රමණයෝ නොවූවාහුම ශ්‍රමණැයි ප්‍රතිඥාකිරීමෙන් අනුන් අයත් සිවුපසය සොරකම්කරත්. එහෙයින් නිරබ්බුද

A පාචිත්තියපාලි මුසාවාද වග්ග
B විනය-භික්ඛුනී විභඞ්ග කුමාරිභූත වග්ග
C විනය-භික්ඛුනී විභඞ්ග කුමාරිභූත වග්ග
D පාචිත්තියපාලි අවෙලකවග්ග
E පාචිත්තියපාලි සප්පාණකවග්ග

යනමෙයින් සොරු රහිතය, දුසිල්හු රහිතයයි කියනලද්දේවේ. **'නිරාදීනවෝ'** උවදුරු රහිතය. තැතිගැනීම් රහිතය. දුශ්ශීලාදීනවයන්ගෙන් විරහිතමයයි වදාරණලදී. **'අපගතකාළකෝ'** දුශ්ශීලයෝම කාළකැයි කියනුලැබේ. ඒ දුශ්ශීලයෝ රන්වන් වූවාහුද, දුශ්ශීලසඞ්ඛ්‍යාත පාපධර්මයෙන් යුක්තබැවින් කාළකයෝමැයි දතයුත්තාහ. ඔවුන්ගේ අභාවයෙන් අපගත කාළකය. **'අපහත කාළක'**යිද පාඨයක්වේ. **'සුද්ධෝ'** අපගත කාළකබැවින්ම පිරිසිදුය. භාත්පසින් පිරිසිදුය. ප්‍රභාස්වරය. **'සාරෙ පතිට්ඨිතෝ'** ශීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්තිඥානදර්ශන ගුණයෝ සාරයි කියනුලැබෙත්. ඒ සාරයෙහි පිහිටිබැවින් සාරයෙහි පිහිටියේය. මෙසේ සාරයෙහි පිහිටිබව වදරා නැවත මේ සඞ්ඝයාගේ ඒ සාරයෙහි පිහිටිබව මෙසේ දතයුතුයයි දක්වනසේක් **'ඉමෙසං සාරිපුත්ත'** යනාදිය වදළසේක.

එහි මේ සඞ්ක්ෂප වර්ණනාය: වෙරඤ්ජාවෙහි යම් මේ පන්සියයක් භික්ෂූහු වස්විසීමට එළැඹියාහුද, මොවුන් අතුරෙහි ගුණවසයෙන් පැසුළුවූ සියල්ලන් අතුරෙහි මදගුණ ඇත්තාවූ මහණෙක් වේද, ඒ ආනන්ද තෙමේ සොතාපන්නවේ. **'සොතාපන්නො'** මාගධ්‍යෝතයට පැමිණියේය. **'සොත'** යනමෙයද මාගධ්‍යට නමකි. **'සොතාපන්න'** යනු ඒ මාගධ්‍යෝතයෙන් සමන්විතවූ පුද්ගලයාහට නමකි. ඒ මෙසේ වදළසේක: **'සොතො සොතොති හිදං සාරිපුත්ත වුච්චති, කතමෝ නුඛෝ සාරිපුත්ත සොතොති, අයමේවහි භන්තෙ අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මා සමාධිති. සොතාපන්නො සොතාපන්නොති යෝ හි භන්තෙ ඉමිනා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සමන්නාගතෝ, අයං වුච්චති සොතාපන්නො සොයමායස්මා එවං නාමෝ එවං ගොත්තෝ'**[A]යි. මෙහි වනාහි මාගධ්‍යෙන් ඵලයට නම් දෙනලද්දේය. එහෙයින් ඵලස්ථ පුද්ගලතෙමේ සොතාපන්නයි දතයුතුය.

'අවිනිපාතධම්මෝ' විරූපව දුක්සහිතව උපායාස සහිතව වැටේනුයි විනිපාත නම්. මොහුට විනිපාත ධර්මයක් නැත්තේනුයි **අවිනිපාතධම්ම. අපායගමනීය** ධර්මයන් ක්ෂයවූ බැවින් තමන්ට අපායන්හි වැටෙන ස්වභාවයක් නැත්තේනුයි වදරණලද්දේය. කුමක්හෙයින්දයත්: යම්ධර්මකෙනෙක් අපායගමනීය වෙත්ද, ඒ අපායගමනීය ධර්මයන් ක්ෂයවූබැවිනි. විවසව වැටීම හෝ විනිපාත. ඒ විනිපාත ස්වභාවය මොහුට නැත්තේනුයි අවිනිපාත ධම්ම. අපායයන්හි විවසව වැටෙන ස්වභාවයක් මොහුට නැත්තේනුයි වදරණලද්දේවේ. මොනවට වැඩුනු සම්පත් දෘෂ්ටි ආදි මාගධ්‍යෙන් පිළිලැබූ මාගධ්‍යෙන් නියතබැවින් නියතවේ.

A සංයුත්තනිකාය

යටකෙළවරින් සත්වන භවයෙන් මතු නොඉපැදෙන ස්වභාවයන් නියතවේ. ආයතීමාඝීසඩ්ඛ්‍යාත නිර්වාණයට උතුම්වූ මාඝීය, උතුම්වූ ගතිය මොහුටනුයි **සම්බොධිපරායණ**. ඒකාන්තයෙන් උපරිමාඝීත්‍රයට පමුණුවන්නේය යනඅර්ථයි. කුමක්හෙයින්ද යත්: පිළිලැබූ පළමුමග ඇතිබැවිනි.

මෙසේ භාග්‍යවතුන්වහන්සේ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්ට කරුණු අවබෝධ කරවා, වෙරඤ්ජාවෙහි ඒ වස්විසීම ගෙවා, වැස නිමකළ වස් ඇතිසේක් මහාපවාරණයෙන් පවරා **'අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි'**යි ඇමතුසේක. වදළසේක. අවබෝධ කරවූසේක. කුමක් අවබෝධ කරවූසේක්දයත්: **'ආචිණ්ණං ඛො පනෙතං'** යන මේ ආදිය අවබෝධ කරවූසේක: **'ආචිණ්ණං'** පුරුදුකරණලදය. සිරිතය. වතය. ලොකොත්තර ධර්මානුගත ධර්මයය. ඒ මේ පුරුදුකරණලද්ද, බුදුවරුන් විසින් පුරුදුකරණලද්දය, ශ්‍රාවකයන් විසින් පුරුදුකරණලද්දයයි දෙවැදෑරුම්වේ.

බුදුවරයන් විසින් පුරුදු කරනලද්ද කවරේදයත්: එහි බුදුවරයෝ යම් කෙනෙකුන් විසින් නිමන්ත්‍රණය කරනලද්දහු, වස් වසත්ද, ඔවුන් නොබලා නොවිචාරා දනවූ සැරිසැරීමට නොවඩින්නාහ. මේ වනාහි එක්සිරිතකි. ශ්‍රාවකයෝවනාහි විචාරා හෝ නොවිචාරා පහසුඇති පරිද්දෙන් දනවූ සැරිසැරීමට යන්නාහ.

බුදුවරයන්ගේ අනික් සිරිතක්දවේ: බුදුවරයෝ වැස නිමකළ වස් ඇත්තාහු, පවාරණයකොට ජනසඩ්ග්‍රහයපිණිස දනවූ සැරිසැරීමට වඩින්නාහුමය. දනවූ සැරිසරන්නාහුද, මහා මණ්ඩල, මධ්‍යමන්ඩල, ක්ෂුද්‍රමණ්ඩල යනමේ තෙවැදරුම්වූ මණ්ඩලයන් අතුරෙහි එක්තරා මණ්ඩලයක සැරිසරන්නාහුය. එහි **මහා මණ්ඩලය**, යොදුන් නවසියයක් ඇත්තේය. **මධ්‍යමණ්ඩලය,** යොදුන් සසියයක් ඇත්තේය. **ක්ෂුද්‍රමණ්ඩලය,** යොදුන් තුන්සියයක් ඇත්තේය.

යම්කලක මහාමණ්ඩලයෙහි හැසිරෙණු කැමැත්තාහු වෙත්ද, එකල්හි මහා පවාරණයෙන් පවාරණයකොට පැළවිය දවසෙහි මහා භික්ෂුසඩ්ඝයා පිරිවරකොට ඇතිව නික්ම ගම්නියම්ගම් ආදියෙහි ආමිෂසඩ්ග්‍රහ පිළිගැණීමෙන් මහාජනයාහට අනුග්‍රහකරන්නාහු ධර්මදනයෙන්ද මේ මහාජනයාගේ නිවණට හේතුවූ නිවණ ඇසුරුකළ කුසල් වඩමින් නව මසකින් ජනපද චාරිකාව අවසන්කරත්.

ඉදින්වනාහි ඇතැළුවස භික්ෂූන්ගේ ශමථවිදර්ශනාවෝ තරුණවූවාහු වෙත්ද, මහා පවාරණයෙන් පවාරණය නොකොට

අනුමතිදානවසයෙන් පවාරණ සඞ්ගහයද, ඉල්මස මැදිපෝයද පවාරණයකොට උදුවප්මස පළමුදිනයෙහි මහාභික්ෂුසඞ්ඝයා පිරිවරකොට ඇතිව නික්ම කියූලෙසින්ම මද්‍යාමණ්ඩලයෙහි චාරිකාව අටමසකින් අවසන්කරත්.

ඉදින්වනාහි, වැස නිමකළ වස්ඇති බුදුවරයන් විසින් හික්මවියයුතුවූ නොමේරු ඉඳුරන්ඇති සත්වයෝ වෙත්ද, ඔවුන්ගේ ඉඳුරන් මෝරායෑම බලාපොරොත්තුවන්නාහු, උදුවප් මසද එහිම වැඩවාසයකොට, දුරුතුමස පළමුදිනයෙහි මහාභික්ෂුසඞ්ඝයා පිරිවරකොටඇතිව නික්ම කියූලෙසින්ම ක්ෂුද්‍රමණ්ඩලයෙහි චාරිකාව සත්මසකින් අවසන්කරත්. ඒ මණ්ඩලයන්හිද යම්කිසිතැනක හැසිරෙන්නාහුද, ඒ ඒ සත්ත්වයන් කෙලෙසුන්ගෙන් වෙන්කරමින් ස්‍රොතාපත්තිඵලාදිය හා යොදමින් හික්මවියයුතු සත්ත්වයන්ගේ වසයෙන්ම නන්පැහැති මල් නෙලන්නවුන්මෙන් හැසිරෙත්.

බුදුවරයන්ගේ අනිකුදු සිරිතක් බුදුවරයන්විසින් පුරුදුකරන ලද්දක්වේ: දිනපතා අලුයම් කාලයෙහි ශාන්තවූ සුබවූ නිවණ අරමුණුකොට, ඵලසමාපත්තියට සමවැදීම, ඵලසමාපත්තියෙන් නැගිට මහා කරුණාසමාපත්තියට සමවැදීම හා ඉනික්බිති දසදහස් සක්වළෙහි දහම් අවබෝධ කරවියහැකි සත්වයන් බැලීමය.

බුදුවරයන්ගේ අනිකුදු සිරිතක්වේ: ආගන්තුකයන් හා ඉතාපළමුකොට පිළිසඳරකිරීම, අනෙවාත්පත්තිවශයෙන් දහම් දෙසීම හා අවතීර්ණ දේෂයෙහි ශික්ෂාපද පැණවීමය යනමෙය බුදුවරයන්ගේ සිරිතය.

ශ්‍රාවකයන්ගේ සිරිත කවරේදයත්: බුදුරජානන්වහන්සේගේ කාලයෙහි වස් එළැඹීමට පෙරවුව කමටහන් ගැනීම පිණිසද, වස් වැස නිමකළවුන්ගේ තමන් ලැබූ ගුණ සැලකිරීමපිණිසද, මතුවෙහි කමටහන් ගැනීමපිණිසද අවුරුද්දට දෙවරක් සන්නිපාතයවේ. මේ ශ්‍රාවකයන්ගේ සිරිතය.

මෙහිවනාහි බුදුවරුන්ගේ සිරිත දක්වනසේක් **'ආචිණ්ණං ඛො පනෙතං ආනන්ද තථාගතානං'** යනු වදළසේක. **'ආයාම'** එව යමු. **'අපලොකෙස්සාම'** චාරිකාවෙහි හැසිරෙණුපිණිස විචාරන්නෙමු. **'එවං'** යනු පිළිගැණුම් අරුත්හි නිපාතයි. **'භන්තෙ'** යනමෙය ගාරවාධිවචනයි. ශාස්තෘන්වහන්සේට පිළිවදන් දීමයි කීමද වටියි. **'භගවතො පච්චස්සොසි'** භාග්‍යවතුන්වහන්සේගේ වචනයට පිළිවදන් දුන්නේය. මූණ දී ඇසූයේය. පිළිගත්තේය. **'එවං'** යන මේ වචනයෙන් පිළිගත්තේයයි කියනලද්දේවේ. **'අථ ඛො භගවා නිවාසෙත්වා'** මෙහි පෙරවරු කාලයෙහියි හෝ පස්වරුකාලයෙහියි නොකියනලද්දේය. මෙසේ ඇතිකල්හිදු

භාග්‍යවතුන්වහන්සේ කළ බත්කිස ඇතිසේක්, මධ්‍යාහ්න කාලය ඉක්මවා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ පැසුළු මහණහුකොට, තුවරදෙර පටන් නගර වීථීන් රන්දිය දහරකවැනි රන්වන් බුදුරැසින් මොනවට බබුලුවමින් වෙරඤ්ජ බ්‍රාහ්මණයාගේ ගෙට වැඩියසේක. භාග්‍යවතුන් වහන්සේ මොහුගේ ගෙදෙර සමීපයෙහි සිටි ඇසිල්ලෙහිම පිරිවර ජනතෙමේ උන්වහන්සේ දැක ඔහුට සැලකෙළේය. බ්‍රාහ්මණතෙමේ සිහිලැබ හටගත් සංවේගඇත්තේ වහා නැගිට මාහැඟි අසුනක් පණවා භාග්‍යවතුන්වහන්සේගේ ඉදිරියටගොස් භාග්‍යවතුන්වහන්සේ මෙහි වඩිනසේක්වායි දන්වාසිටියේය. භාග්‍යවතුන්වහන්සේ එහි වැඩමකොට, පැණවූ අසුනෙහි වැඩහුන්සේක. ඉක්බිති වෙරඤ්ජ බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි හිඳිනුකැමැත්තේ තමන් සිටිපෙදෙසින් භාග්‍යවතුන්වහන්සේ වැඩහුන් තැනට පැමිණියේය. මෙයින් මතු ප්‍රකට අර්ථ ඇත්තේමය.

බ්‍රාහ්මණ තෙමේ **'අපි ච යො දෙය්‍යධම්මො සො න දින්නො'**යි යමක් කීයේද, එහි අදහස මෙසේය: මා විසින් පවරණලද වස්විසූ ඔබවහන්සේලාට තෙමසක් මුළුල්ලෙහි දවසක් පාසා උදසන දියයුතු කැඳ කැවිලි මැදහන දියයුතු කෑයුතු බිඳියයුතුදය, සවස නන්වැදරුම් පැන් වගී හා ගඳමලින් කළයුතු පූජාසත්කාරදැයි යන මේ ආදීවූ යම් දියයුතු දයක් වන්නේද එය නොදෙනලද්දේය. **'තඤ්ච ඛො නො අසන්නං'** මෙහි ලිඞ්ග විපය්‍යාසය දතයුතුය. ඒ දියයුතුදය අපට නැත්තේනොවේ යනු අර්ථයි. තවද අපි ඔබවහන්සේලාට යමක් යමක් දෙන්නෙමුද, එය අපට නැත්තේ නොවේයි මෙසේද මෙහි අර්ථ දතයුතුය. **'නොපි අදානුකම්‍යතා'** බොහෝසෙයින් සතුට උපදවන උපකරණ ඇත්තාවූ මසුරන්ට මෙන් නොදෙනු කැමතිබවක්ද අපට නැත්තේය. **'තං කුතෙත්‍ථ ලබ්භා බහුකිච්චා ඝරාවාසා'** යන එහි මේ යොජනාය:- යම්හෙයකින් ගෘහවාසයෝ බොහෝ කටයුතු ඇත්තාහු ද, එහෙයින් මෙහි දියයුතු දය ඇති කල්හිද, දෙනු කැමැති බවක් ඇති කල්හි, එය කොතැනින් ලැබිය හැකි ද, අපි යම් දියයුතු දයක් ඔබවහන්සේලාට දෙන්නෙමුද, එය කොතැනින් ලබන්නට හැක්කේදැයි ගෘහවාසයට ගරහමින් කීයේය. ඒ බ්‍රාහ්මණ තෙමේවනාහි මාරයා විසින් ආවර්තිතභාවය නොදනියි. ගෘහවාස පළිබොධය කරනකොට, මට සිහිමුළාබවවූයේයයි සැලකීය. එහෙයින් **'අපි ච තං කුතෙත්‍ථ ලබ්භා'**යි මෙසේ කීයේය. 'මේ තෙමසතුළ මම යමක් ඔබවහන්සේලාට දෙන්නෙම්ද, එය කොතැනින් ලබම්ද, ගෘහවාසයෝ බොහෝ කටයුතු ඇත්තාහ'යි මෙසේද මෙහි අර්ථයෝජනාව දතයුතුය.

ඉක්බිති බ්‍රාහ්මණතෙමේ 'මා විසින් යම්දෙයක් තුන්මසකින් දියයුතුවන්නේද, මම ඒ සියල්ල එක්දවසින්ම දෙන්නෙමිනම්, යෙහෙකැයි සිතා **'අධිවාසෙතු මේ භවං ගොතමෝ'** යනාදිය කීයේය. එහි **'සඞ්ඝතනාය'** 'ඔබ වහන්සේලා විෂයයෙහි සත්කාර කළ කල්හි මට හෙට යම් කුශලයක් ප්‍රීතිප්‍රාමොද්‍යයක් වන්නේද, ඒ පිණිසය.' ඉක්බිති තථාගතයන්වහන්සේ 'ඉදින් මම නොඉවසන්නෙමිනම්, මෙතෙමේ තෙමස මුළුල්ලෙහි කිසිවක් නොලැබීමෙන් කිපියේවන, එහෙයින් මාවිසින් යදිනුලබන්නේද, එක් බතකුදු නොපිළිගනියි. මොහු කෙරෙහි අධිවාසනාක්ෂාන්තිය නැත්තීය. මෙතෙමේ සඒඳ නොවේය' යි මෙසේ බ්‍රාහ්මණ තෙමේද, වෙරඤ්ජා නුවර වැස්සෝද, මට ගරහා, බොහෝ අකුසල් රැස්කරන්නාහ. ඔවුනට ඒ නොවේවා'යි ඔවුනට අනුකම්පාපිණිස භාග්‍යවතුන්වහන්සේ තූෂ්ණීම්භාවයෙන් එය ඉවසාවදළසේක. භාග්‍යවතුන්වහන්සේ මෙසේ ඉවසාද, ගෘහවාසපළිබොධය ගැන සිතීමෙන් කම්නැතැයි වෙරඤ්ජ බ්‍රාහ්මණයාහට හඟවා, ඒ මොහොතට සුදුසුවූ දැහැමි කතාවෙන් මෙලොව පරලොව වැඩදක්වා කුසල්දහම්හි සමාදන් කරවා කුසල්දහම් ගන්වා එහිද එ බමුණු මොනවට තෙදගන්වා උත්සාහ ඇත්තෙකුකොට ඒ උත්සාහසහිත භාවයෙන් අන්‍යවූද විද්‍යමාන ගුණයන්ගෙන් මොනවට සතුටුකරවා දම්රුවන් වැසිවස්වා හුනස්නෙන් නැගිට වැඩසේක.

භාග්‍යවතුන්වහන්සේ නැගිට වැඩියකල්හි වෙරඤ්ජ බ්‍රාහ්මණතෙමේ 'පින්වත්නි! අපි තෙමසකට භාග්‍යවතුන්වහන්සේ පවරා එක් දවසක් එක් බතකුදු නොදුනිම්හ, එබැවින් දන් තෙමසට සැහෙන පමණින් දියයුතුදය හෙට එක් දවසින්ම දෙන්නට හැකිවේද, එසේ දනය පිළියෙලකරවු'යි අඹුදරුවන්ට නියමකෙළේය. ඉක්බිති ප්‍රණීතකොට දනය පිළියෙලකරවා, යම්දවසෙක භාග්‍යවතුන්වහන්සේ පවරණ ලද්දහු ද, එ දවස රැය ඉක්ම ගිය පසු අසුන් පණවන තැන සරසවා මාහැඟි අසුන් පණවා සුවඳදුම් කවූ මල්වලින් විසිතුරුවූ මහා පූජාවක් සූදානම්කොට භාග්‍යවතුන්වහන්සේට කල් දන්වාලූයේය. **'අථ ඛෝ වෙරඤ්ජෝ බ්‍රාහ්මණෝ තස්සා රත්තියා අච්චයෙන -පෙ- නිට්ඨිතං භත්තං'** යි එහෙයින් වදරණලද්දේය. භාග්‍යවතුන්වහන්සේ භික්ෂුසඞ්ඝයාගෙන් පිරිවැරුණුසේක්, එහි වැඩමකළසේක. **'අථ ඛෝ භගවා -පෙ- නිසීදි භික්ඛු සඞ්ඝස්ස'** යනු එහෙයින් වදරණලදය.

'අථ ඛෝ වෙරඤ්ජෝ බ්‍රාහ්මණෝ බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං' යනමෙහි **'බුද්ධපමුඛං'** බුද්ධපරිනායකවූ 'බුදුරජානන්වහන්සේ සඞ්ඝස්ථවිරකොට හුන්නාවූ'යි කියනලද්දේවේ. **'පණීතෙන'** උතුම්වූ. **'සහත්ථා'** සියතින් **'සන්තප්පෙත්වා'** මොනවටතර්පණයකොට. ප්‍රයොජන ඇතිපමණට

පිරිපුන්කොට. පිණ්ඩායෑමට පත්කොට සෑහෙන පමණකොට. **සම්පවාරෙත්වා'** මොනවට පවරා. කම් නැත, කම්නැතැයි හස්තසංඥවෙන්ද, මුඛසංඥවෙන්ද, වාගෙහදයෙන්ද පිළිකෙවිකරවා. **'භුත්තාවිං'** වැළඳූ. වැළඳීමඇති **'ඔනීතපත්තපාණිං'** පාත්‍රයෙන් බැහැරකළ අත්ඇති. බැහැරටගත් අත් ඇත්තාවූයි කියනලද්දේවේ. **'තිචීවරෙන අවඡාදෙසි'.** භාග්‍යවතුන්වහන්සේට තුන්සිවුරු පිදුයේය. **'තිචීවරෙන අවඡාදෙසි'** යන මෙය ව්‍යවහාර වචනමාත්‍රයක්වේ. ඒ තුන්සිවුරෙහිද, එක් එක් සළුව දහසක් අගනේය. මෙසේ බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන්වහන්සේට තුන්දහසක් අගනා උතුම්වූ කසීවත් සමානවූ තුන්සිවුරු පිදුයේය. **'එකමෙකඤ්ච භික්ඛුං එකමෙකෙන දුසසයුගෙන'** එක් එක් භික්ෂූ නමක් එක් එක් වස්ත්‍ර යුග්මයකින්. එහි එක් සළුවක් පන්සියයක් අගනේය. මෙසේ පන්සියයක් භික්ෂූන්ට පන්ලක්ෂයක් අගනාවූ වස්ත්‍ර පිදුයේය. බ්‍රාහ්මණතෙමේ මෙපමණකුදු පුදු සතුටුනොවූයේ, සෑහීමට නොපත්ව, නැවත, සත්අට දහසක් අගනා නොයෙක් රතු කම්බිලිද, පත්තුණ්ණ දෙශයෙහි උපන් පටවස්ත්‍ර හා චීන දේශයෙහි උපන් පටවස්ත්‍රද පලා පලා යොගීපට, අස්වැටි, කාබාන්, පෙරහන් යනාදියපිණිස දුන්නේය. සියක්වර පිසූ, දහස්වර පිසූ බෙහෙත් තෙල්වලින් සම්න්කළ සැළි පුරවා එක් එක් භික්ෂූනමක්හට ඇහ ගෑමපිණිස දහසක්අගනා තෙල්පිදුයේය. බොහෝකොට කීමෙන් කිම? සිවුපසය අතුරෙහි ශ්‍රමණපරිභොගවූ කිසිදු පිරිකරක් නොදෙනලද්දේනම් නොවූයේය. පෙළෙහි දක්වූනේ සිවුරු පමණකි.

භාග්‍යවතුන්වහන්සේ, මෙසේ මහදන්දී අඹුදරුවන් හා එක්ව වැදහුන්නාවූ තෙමසක් මාරාවතීනයෙන් ධම්ශ්‍රවණාමෘත රසපරිභොගයෙන් පිරිහුනු වෙරඤ්ජ බ්‍රාහ්මණයා එක් දවසින්ම දහම් අමාවැසි වස්වා, පිරිපුන් යහපත් අදහස් ඇත්තෙකු කරසේක්, දැහැමි කතාවෙන් එලොව මෙලොව වැඩදක්වා -පෙ- භුනස්තෙන් නැගිට වැඩියසේක. බ්‍රාහ්මණතෙමේද, අඹුදරුවන් සහිතවම භාග්‍යවතුන්වහන්සේද, භික්ෂූ සඞ්ඝයාද වැඳ 'සුමීනි! නැවතද අපට අනුග්‍රහ කරණ්ණුමැනවැ'යි මේආදිය කියමින් අනුවගොස් කඳුලුහෙලමින් නැවතුනේය.

'අථ ඛො භගවා වෙරඤ්ජායං යථාභිරන්තං විහරිත්වා' භාග්‍යවතුන්වහන්සේ අදහස්පරිදි රිසිතාක් ඒ වසවැස වෙරඤ්ජාවෙන් නික්ම මහාමණ්ඩල වාරිකාවෙන් හැසිරෙණ කාලයෙහි. යායුතු බුදධචීථිය හැර දුර්භික්ෂ දොෂයෙන් වෙහෙසට පැමිණි භික්ෂූසඞ්ඝයා සෘද්ධිමාර්ගයෙන් ගෙනයනු කැමතිසේක් සොරෙය්‍යාදියට නොවැඩ, පයාගනදිය පිහිටිතැනට වැඩ එහි ගඞ්ගා නදිය තරණයකොට

බරණැසට වැඩියසේක. එහිද අදහස්පරිදි රිසිපරිදි වැඩවාසයකොට විශාලා මහා නගරයට වැඩියසේක. **'අනුපගම්ම සොරෙය්‍යං -පෙ- වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං'** යනු එහෙයින් වදරණලද්දේය.

විනයවිවෘති

නම් වූ

සිංහල සමන්තපාසාදිකාවෙහි

වෙරඤ්ජකාණ්ඩ වර්ණනා නිමි.

——\\——

එහි හාත්පසින් හැමතින් ප්‍රසාදය උපදවනබැවින් එනමිලද අත්‍ථකථාව පිළිබඳ මේ සමන්තපාසාදිකභාවයයි.

උපාලි දසකොා යනාදීන් කියනලද ආචාය්‍ර්‍ය පරම්පරාවෙන්ද නිදනවසතු ප්‍රභෙද දැක්වීමෙන්ද පරලබධි දුරුකිරීමෙන්ද සාසමය පිහිටුවීමෙන්ද,

ව්‍යඤ්ජන පරිශොධනයෙන්ද පදත්‍ථ දැක්වීමෙන්ද පාලියොජනාක්‍රමයෙන්ද ශික්ෂාපද විනිශ්චයයෙන්ද විභඩ්ගනයභෙද දැක්වීමෙන්ද,

නුවණැසින් මොනවට බලන්නාවූ නුවණැත්තවුන්ට මේ සමන්තපාසාදිකාවෙහි නොපැහැදෙන කිසිවක් යම්හෙයකින් නොදක්නාලැබේද, එහෙයින් හික්මවිය හැකි සත්වයන් දමීමෙහි දක්ෂවූ ලොවට අනුකම්පාකරන්නාවූ ලොකනාථයන්වහන්සේවිසින් වදළ විනයප්‍රවෘත්ති ඇත්තාවූ මේ සංවර්ණනාව සමන්තපාසාදිකාමයයි දතයුතුය.

——\\——

ප්‍රථමපාරාජිකය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

—\\—

මෙයින් මතු **'තෙන ඛො පන සමයෙන වෙසාලියා අවිදූරේ'** යනාදිය බොහෝසෙයින් ප්‍රකට අර්ථ ඇත්තේය. එහෙයින් පදයක් පාසා වණ්ණනාකිරීම හැර යම් යම් තැනක කියයුත්තක් වේනම්, ඒ ඒ කියයුත්තම වණ්ණනා කරන්නෙමු. **'කලන්දගාමො'** ලෙහෙනෝ කලන්දකයි කියනුලැබෙත්. ලෙහෙනුන්ගේ නම්වසයෙන් ලැබූ නම් ඇති ගමය. **'කලන්දපුත්තො'** ගමවසයෙන් ලැබූ නම්ඇති රාජසම්මතවූ සතළිස් කෙළක් ධනය ඇති කලන්දක සිටුහුගේ පුත්‍රතෙමේය. යම්හෙයකින් වනාහි එගමෙහි කලන්දයන නම්ඇති අන්‍ය මනුෂ්‍යයෝත් වෙත්ද, එහෙයින් කලන්දපුත්‍රයි කියා නැවත සිටුපුත්යි වදළයේක. **'සම්බහුලෙහි'** බොහෝවූ **'සහායකෙහි'** සුඛදුඃඛයන්ට එක්ව යෙත්, එක්ව එළඹෙත්නුයි සහාය නම්වෙත්. සහායයෝම සහායකයහ. ඒ සහායයන් හා **'සද්ධිං'** එක්ව **'කෙනචිදෙව කරණීයෙන'** විකිණිය යුතු බඩු විකිණීම, දෙන්නට ලකුණුකළ දිනයෙහි ගොස් ගැනීම, අසුවල් දවසෙහි දියයුතුය'යි සිහිගැන්වීම යනාදීවූ කිසියම් කටයුත්තක් හේතුකොට ඉල්මස නැකැත්කෙළිකිස හෙතුකොටයයිද කියත්. භාග්‍යවතුන්වහන්සේ වනාහි ඉල්මස ශුක්ලපක්ෂයෙහි විශාලාමහානගරයට වැඩියසේක. මෙහි ඉල්මස නැකැත්කෙළිය ඉතා මහත්වේ. ඒ පිණිස ගියේයයි දතයුතුය.

'අද්දසා ඛො' කෙසේ දුටුයේදයත්: ඒ කලන්දක සිටුපුත්තෙමේ, බුදුරජුන් දැකීමපිණිසත්, දහම් ඇසීමපිණිසත්, වැළඳූ උදයබොජුන් ඇති පිරිසිදු උතුරුසළු පෙරොවගෙණ මල් ගඳවිලවුන් ගත් අත් ඇතිව නුවරින් නික්මයන මහාජනයා දැක 'කොතැන යහු'දයි විචාළේය. 'අපි බුදුරජුන් දැකීමපිණිසත් දහම් ඇසීමපිණිසත් යමු'යි ඔවුන් කියූකල්හි 'එසේ නම් මමත් යමි'යි ඔවුන් සමග ගොස් සිවුපිරිසෙන් පිරිවරණ ලදුව බ්‍රහ්මචාරයෙන් දහම් දෙසන්නාවූ භාග්‍යවතුන්වහන්සේ දුටුයේය. **'අද්දසා ඛො -පෙ- දෙසෙන්තං'**යනු එහෙයින් කියනලද්දේය. **'දිස්වා තස්ස'** දැක මොහුට. **'එතදහොසි'** පෙරකළ පින් ඇතිබැවින් මෙහෙයනුලබන භව්‍ය කුලපුත්‍රයාහට මේ අදහස වූයේය. කිනම් අදහසක්වූයේද යත්:

'යන්නූනාහම්පි ධම්මං සුණෙය්‍යං'යන මේ අදහසවූයේය. එහි **'යන්නූන'**යන මෙය පරිවිතර්කීය දක්වීමය. 'මේ පිරිස එකඟවූ සිත් ඇතිව යම් ධර්මයක් අසාද මමත් ඒ ධර්මය අසන්නෙම්නම් ඉතා යහපතැ'යි ඔහුට මේ පරිවිතර්කීය උපන්නේය.

'අථ ඛො සුදින්නො කලන්දපුත්තො යෙන සා පරිසා'යන මෙහි **'යෙන භගවා'**යි නොවදරා **'යෙන සා පරිසා'**යි කුමක් හෙයින් කියනලද්දේදයත්: භාග්‍යවතුන්වහන්සේ පිරිවරා ක්ෂත්‍රිය මහාසාරාදි අත්‍යුදර ජනයාඇති මහත්පිරිසක් හුන්නීය. එහි පසුව පැමිණි මොහුට භාග්‍යවතුන්වහන්සේ වෙත එළඹ හිඳින්නට නොහැකිය. පිරිසෙහි එක් පෙදෙසක හිඳින්නට හැකියයි හෙතෙමේ ඒ පිරිස වෙතම එළඹියේය. **'අථ ඛො සුදින්නො කලන්දපුත්තො යෙන සා පරිසා'**යි එහෙයින් කියනලද්දේය.

'එකමන්තං නිසින්නස්ස ඛො සුදින්නස්ස කලන්දපුත්තස්ස එතදහොසි' එහි අවුත් හුන් ඇසිල්ලෙහිම ඔහුට මේ අදහස නොවූයේය. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේගේ ශික්ෂාත්‍රය සංගෘහීතවූ සඩලපධම්කථාව අසා මේ අදහස උපන්නේය. යම්හෙයකින් එකත්පසෙක හුන් මොහුට ඒ අදහසවූයේද, එහෙයින් **'එකමන්තං නිසින්නස්ස ඛො සුදින්නස්ස කලන්දපුත්තස්ස එතදහොසි'**යනු කියනලදී. කවර අදහසක්වූයේද යත්: **'යථා යථා ඛො'** යනාදිය එහිලා කීහ. එහි මේ සඩක්ෂපකථාය. භාග්‍යවතුන්වහන්සේ විසින් යම්යම් අයුරකින් දෙසූ ධර්ම්ය මම දනිම්ද, ඒ ඒ අයුරින් විමසන මට මෙබඳු අදහසක්වේ: යම් මේ ශික්ෂාත්‍රය සඩගෘහිත බ්‍රහ්මචර්‍ය්‍ය එක් දවසකුදු නොකඩකොට ව්‍යුතිචිත්තයට පැමිණවිය යුතුබැවින් **'එකන්ත පරිපුණ්ණං'** එකතින් පිරිපුන්කොට හැසිරියයුතුය. එක් දවසකුදු නොකඩකොට ව්‍යුතිචිත්තයට පැමිණවිය යුතුවූබැවින් **'එකන්ත පරිසුද්ධං'** එකතින් පිරිසුදුවූ, **'සඩඛලිඛිතං'** ලියූ සකක් සමානකොට සේදූ සකක් සමානකොට හැසිරියයුතුවූ මේ ශික්ෂාත්‍රය සංගෘහීතවූ බ්‍රහ්මචර්‍ය්‍ය. **'අගාරං අජ්ඣාවසතා'** ගෙහි වසන්නහු විසින් එකතින් පිරිපුන්කොට පෙ- හැසිරීම පහසුනොවේ. මම **'කෙසෙ ච මස්සුඤ්ච ඔහාරෙත්වා'** කෙස්ද උඩුයටි රැවුළුද සිඳහැර, කසට දියෙන් රඳන්ගැන්වූබැවින්. **'කාසායානි'** කසටගැන්වූ බඹසර හැසිරෙන්නවුන්ට සුදුසුවූ, **'වත්ථානි අච්ඡාදෙත්වා'** වස්ත්‍ර හැඳ, පෙරව, **'අගාරමහා'**ගෙන් නික්ම. **'අනාගාරියං පඩ්ඩජ්ජෙය්‍යං'** සසුන් වදින්නෙම්නම් ඉතා යෙහෙක. මෙහි යම්හෙයකින් ගෘහවාසයට හිතවූ සීසෑම් වෙළඳම් ආදිකම්ාන්ත අගාරියයි කියනුලැබේද, එද පැවිද්දෙහි නැත්තේද, එහෙයින් පැවිද්ද අනගාරියයි දතයුතුය. ඒ අනගාරිය සඩඛ්‍යාත ප්‍රව්‍රජ්‍යාවට පැමිණෙන්නෙම්.

'අච්රවුටඨිතාය පරිසාය යෙන භගවා තෙනුපසඞකමි' සුදිනන තෙමේ පිරිස නොනැගිට හුන් කල්හි භාග්‍යවතුන්වහන්සේගෙන් පැවිද්ද නොඉල්ලීය. කුමක් හෙයින්දයත්: එහි සුදිනනගේ නෑ සහලේ නෑයෝ මිත්‍රාමාත්‍යයෝ බොහෝ වෙත්. ඒ වේලෙහි සුදිනන පැවිද්ද ඉල්ලාසිටියේනම් ඒ නෑයෝ සහලේ නෑයෝ මිත්‍රාමාත්‍යයෝ 'තෝ මවුපියන්ගේ එක්ම පුත්‍රයෙහි, තට පැවිදිවන්නට නොලැබෙන්නේය'යි බාහුවෙන් අල්ලා අදින්නාහ. එයින් පැවිද්දට අන්තරාය වන්නේය'යි ඒ පිරිස සමගම නැගිට මදක් දුර ගොස් නැවත මලමූ පහකිරීම් ආදීවූ කිසියම් සිරුරුකිස කරණාකාරයෙන් නැවතී සිට පෙරළා භාග්‍යවතුන්වහන්සේවෙත එළඹ පැවිද්ද ඉල්ලාසිටියේය. **'අථ ඛො සුදින්නො කලන්දපුත්තො අච්රවුටඨිතාය පරිසාය -පෙ- පබ්බාජෙතු මං භගවා'**යි එහෙයින් කියනලදී. භාග්‍යවතුන්වහන්සේවනාහි යම්හෙයකින් රාහුල කුමරුන්ගේ පැවිද්දෙහිපටන් මවුපියන්විසින් නොඅනුදත් පුතු පැවිදි නොකරණ සේක්ද, එහෙයින් **'අනුඤඤතොසි පන ත්වං සුදින්න මාතාපිතූහි -පෙ- පබ්බජ්ජාය'** සුදිනන! පැවිද්දපිණිස මවුපියන්විසින් තෝ අනුදන්නා ලද්දෙහිද'යි ඔහුගෙන් විචාළසේක.

මෙයින් මතු පාඨානුසාරයෙන්ම ගොස් **'තං කරණීයං තීරෙත්වා'** යනමෙහි මෙසේ අර්ථ දතයුතුය: ධුරනිඃක්ෂෙපයෙන්ම ඒ කිස කොට නිමවා පැවිද්දෙහි දැඩි ආශාව ඇත්තහුගේ සිත බඳු විකිණීම, ණය දීම, යෙදූ මිල වැඩිකොට ගැණීමෙහි උත්සාහය, අසුවල් දවසෙහි දෙනලදැයි ආදී ලෙසින් මුළාවූවහුට සිහි ඉපදවීම යනාදියෙහි හෝ නැකැත් කෙළියෙහි හෝ නොනැමෙන්නේය. **'අම්ම! තාත!'** යන මෙහි **'අම්ම!'**යි මව අමතයි. **'තාත!'**යි පියා අමතයි. **'ත්වං ඛොසි'** තෝම වෙහි. **'එකපුත්තකො'** එක්ම පුතට අන්‍යවූ දෙටුබෑයෙක් හෝ කනිටුබෑයෙක් නැත. මෙහිද **'එකපුත්තෙනා'**යි කියයුත්තෙහි අනුකම්පාවසයෙන් **'එකපුත්තක'**යි කියනලද්දේය. **'පියොා'** ප්‍රීතිජනකවෙහි. **'මනාපොා'** මනවඩන්නෙහිය. **'සුඛෙධිතොා'** සුවසේ වැඩුනෙහිය. සුඛයෙන් වඩනලද්දෙහිය යනඅර්ථයි. **'සුඛපරිහටොා'** සුඛයෙන් පොෂණය කරනලද්දෙහිය. උපන්ද සිට කිරිමවුන්විසින් ඇකයෙන් ඇකයට වඩා දරණු ලබන්නෙහිය. අස්රිය ඇ ලදරු කෙළිබඩුවෙන් කෙළින්නන් හා කෙළිමින් මිහිරි රසබොජුන් බුදිනු ලබන්නෙහිය. සුඛයෙන් පෝෂණය කරණුලද්දෙහිය. **'න ත්වං සුදින්න කිඤ්චි දුක්ඛස්ස ජානාසි'** 'පුත! සුදිනන' තෝ කිසි ස්වල්පමාත්‍රවූත් කලහාගයක් තරම්වූත් දුකක් නොදනිහි, නොහොත් දුකින් යුක්තව කිසි පස්කම්රසයක් නොවැළඳුයෙහිය යන අර්ථයි. කරණාර්ථයෙහි සාම්වචනයි. අනුභවනාර්ථයෙහිද දැනීමය. නොහොත් කිසිදු දුකක් සිහි නොකරහියන

අත්ථියි. උපයොගාත්ථියෙහි සාම්වචනයි. සරණාත්ථියෙහිද දැනීමයි. දැනීමනම් සිහිකිරීමය. දුතියා - තෘතීයා විකල්ප දෙක්හි **'කිඤ්චි'**යන පුරිම පදයෙහි **'දුක්ඛස්ස'**යන උත්තරපදය හා සමානවූ ෂෂ්ඨීවචනයේ ලොපය දතයුතුය. ඒ සියල්ල ශබ්දශාස්ත්‍රානුසාරයෙන් දතයුතුය.

'මරණෙන පි මයං තෙ අකාමකා විනා භවිස්සාම' අප ජීවත්ව සිටියදී තාගේ මරණය වන්නේනම් තාගේ ඒ මරණයෙන්ද අපි නොකැමති වන්නමෝ රුචි නොකරන්නමෝ තමන්ගේ කැමැත්තෙන් වෙන් නොවන්නෙමු. තාගෙන් වියොගයට හෝ නොපැමිණෙන්නෙමුයන අත්ථියි. **'කිං පන මයං තං'** මෙසේවූ කල්හි අපි යම්කරුණකින් ජීවත්වන තට එයට අනුදනිමුද, ඒ කරුණ කිම? කිනම්ද? නොහොත් **'කිං පන මයං තං'** අපි ජීවත්වන තට කවර කරුණකින් අනුදන්නෙමුදැයි මෙසේ අත්ථිය දතයුතුය.

'තඤ්ඤෙව' යම් තැනක සිටි ඔහුට මවුපියෝ නොඅනුදන්නාහුද එතැනදීම. **'අනන්තරහිතාය'** කිසි ඇතිරියකින් නොඅතුරණලද. **'පරිවාරෙහි'** ගඳඹ නළු ආදීන් තමන්වෙත පමුණුවාගෙණ එහි යහළුවන් සම සැපසේ ඉඳුරන් හසුරුවාලව. මැනැවින් ඉඳුරන් පිණවාලව. ඔබනොබ හසුරුවාලවයි කියනලද්දේවේ. නොහොත් **'පරිවාරෙහි'** ගඳඹ නළු ආදීන්වෙතට පමුණුවාගෙන යහළුවන් සමග ක්‍රීඩාකරව ලංව ක්‍රීඩාකරව. සිත් අලවව. ක්‍රීඩා කරවයි කියනලද්දේවේ. **'කාමෙ පරිභුඤ්ජන්තා'** තමන්ගේ අඹුදරුවන් සමග පඤ්චකාමගුණ අනුභවකරමින් **'පුඤ්ඤානි කරොන්තා'** බුදුන් දහම් සඟුන් උදෙසා දන්දීම්වසයෙන් පවත්නා සුගතිමග පිරිසිදුකරන කුශලකම් කරමින්. **'තුණ්හි අහොසි'** කථා පරම්පාරාව සිඳලනුපිණිස වදන් පිළිවදන් රහිතවූයේය.

ඉක්බිති මොහුගේ මවුපියෝ තෙවරක් කියා පිළිවදනකුදු නොලබනුවෝ යහළුවන් කැඳවා 'තොපගේ මේ යහළු පැවිදිවනු කැමැත්තේය. ඔහු වළාකාලවූ'යි කීහ. ඔවුහුද සුදින්න කරා එළඹ තෙවරක් කීහ. ඔවුන්ගේ බසටද කිසිවක් නොබැණ නිහඬ වූයේය. **'අථ ඛො සුදින්නස්ස කලන්දපුත්තස්ස සහායකා -පෙ- තුණ්හි අහොසි'** යනු එහෙයින් කියනලදී. ඉක්බිති 'ඉදින් මෙතෙමේ පැවිද්ද නොලබන්නේ නම් මැරෙන්නේය, එයින් කිසි යහපතක් නොවන්නේය, මවුපියෝද පැවිදිවූ ඔහු කලින්කල දකින්නාහුය. අපිද ඔහු දකින්නෙමු, මේ පැවිද්දනම් බැරුරුමය. දවසක්පාසා මැටිපයක් ගෙණ පිඬුපිණිස හැසිරියයුතුය. එක් යහන, එක් බත, බඹසර රැකුම් අති දුෂ්කරය, මෙතෙමේද සියුමැලිය, නුවරුන්ගේ ගතිගුණ ඇත්තේය. එහෙයින් මෙතෙමේ එහි හැසිරෙන්නට

නොහැකිවනුයේ පෙරළා මෙහිම එන්නේය, එහෙයින් මොහුගේ මවුපියන්ලවා පැවිද්දට අනුදන්වාලන්නෙමු'යි ඔහුගේ යහළුවන්ට මේ අදහසවූයේය. ඔවුහු එසේ කළහ. මවුපියෝද ඔහුට අනුදත්හ. **'අථ ඛො සුදින්නසස කලන්දපුත්තසස සහායකා යෙන සුදින්නසස කලන්දපුත්තසස මාතා පිතරො -පෙ- අනුසසදකොසි මාතා පිතුහි අගාරසමා අනගාරියං පබ්බජ්ජාය**'යන එහෙයින් කියනලදී.

'හට්ඨො' තුටුවූයේය. **'උදග්ගො'** ප්‍රීතිවෙගයෙන් ඉතාඋස්ව නැගීගිය කායචිත්ත ඇත්තේය. **'කතිපාහං'** කිහිප දවසක් **'බලං ගාහෙත්වා'** හිත බොජුන් බුදිමින් ඇඟඉලීම් නැම්ආදියෙන් කාය පරිහරණය කරමින් කායශක්තිය උපදවා. මවුපියන් වැඳ කඳුලු වැකුණු මුහුණු ඇති නැපරපුර හැරපියා භාග්‍යවතුන්වහන්සේ වෙත එළඹියේය. එළඹ - **'සචාමීනි! භාග්‍යවතුන්වහන්සේ මා පැවිදිකරන සේක්වා'**යි ඇයද සිටියේය. භාග්‍යවතුන්වහන්සේ සමීපයෙහි සිටි එක්තරා පිණ්ඩචාරික භික්ෂුනමක්හට 'මහණ! එසේනම් සුදින්න පැවිදිකරව, උපසපන් ද කරව'යි නියමකළසේක. ඒ භික්ෂුතෙමේ 'ස්වාමීනි! යහපතැ'යි භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දී කලන්දපුත්‍ර සුදින්න ජිනදත්තිය සද්ධිවිහාරිකයෙකු ලැබ පැවිදිකෙළේය. උපසපන් ද කෙළේය. එහෙයින් **'අලත්ථ ඛො සුදින්නො කලන්දපුත්තො භගවතො සන්තිකෙ පබ්බජ්ජං අලත්ථ උපසම්පදං'**යනු කියනලදී.

මෙතැන් සිට සියලු අර්ථකථාවන්හි ප්‍රව්‍රජ්‍යාව හා උපසම්පදව කියනලදය. අපිවනාහි තුබුපරිදි සිටිසේ පාලිවශයෙන්ම ඛන්ධකයෙහි කියන්නෙමු. හුදෙක් මෙයම නොකියන්නෙමු. අන්‍යවූ ද යමක් ඛන්ධකයෙහි හෝ පරිවාරයෙහි කියයුත්තේද අර්ථකථාචාර්‍යයන් විසින් විභඞ්ගයෙහි කියනලද්දේද ඒ සියල්ල ඒ ඒ තන්හිම කියන්නෙමු. මෙසේ කියනුලබනකල්හි පාලික්‍රමයෙන්ම වර්ණනා කරනලද්දේවේ. එහෙයින් ඒ ඒ විනිශ්චයෙන් ප්‍රයෝජන ඇතියනට පාලික්‍රමයෙන්ම මේ විනයසංවර්ණනාව බලා ඒ ඒ විනිශ්චය මොනවට දතහැකි වන්නේය.

'අච්රූපසම්පන්නො' උපසපන්වී නොබෝ කල්ඇත්තේ උපසම්පත්තියෙන් නොබෝකලකින්මැයි කියනලද්දේවේ. **'එවරූපෙ'** මෙබඳුවූ, මෙබඳු සැහැවි ඇති. **'ධුතගුණෙ'** කෙලෙස් සලන ගුණයන්. **'සමාදය වත්තති'** සමාදන්ව ගෙණ පවතී. හැසිරෙයි. වෙසෙයි. **'ආරඤ්ඤිකො හොති'** ග්‍රාමාන්තසෙනාසනය ප්‍රතික්ෂෙපකොට ආරණ්‍යක ධුතාඞ්ගවශයෙන් අරන්වැසියෙක්වේ. **'පිණ්ඩපාතිකො'** අතිරෙකලාභප්‍රතික්ෂෙප කිරීම්වශයෙන් සඞ්ඝභත්ත-උද්දෙසභත්ත-නිමන්ත්‍රණාදීවූ තුදුස්බත් ප්‍රතික්ෂෙපකොට පිණ්ඩපාතික ධුතාඞ්ගවශයෙන්

පිණ්ඩපාතිකයෙක්වේ. **‘පංසුකූලිකො’** ගෘහපතිචීවරය ප්‍රතික්ෂේපකොට පංසුකූලිකධුතාඞ්ගවශයෙන් පංසුකූලිකයෙක්වේ. **‘සපදනචාරිකො’** තෘෂ්ණාවශයෙන් හැසිරීම ප්‍රතික්ෂේපකොට සපදනචාරිකධුතාඞ්ගවශයෙන් සපදනචාරිකයෙක්වේ. ගෙපිළිවෙළින් භික්ෂාවපිණිස පිවිසෙන්නේය. **‘වජ්ජිගාමං’** වැද්දරජුන්ගේ ගම හෝ වැද්දරට වැස්සන් කෙරෙහි පවත්නා ගම.

‘අඩ්ඪා මහද්ධනා’ යනාදි තන්හි උපභොග පරිභොග උපකරණයන්ගේ මහත්බැවින් ආඪ්‍යවූ. ඔවුන්ගේ යම් උපභොගයෝ වෙත්ද, යම් උපභොගොපකරණයෝ වෙත්ද, ඔවුහු මහත්හ. බහුලයහ. සාරභූතහයි කියනලදී. නිදන්කොට තැබූ ධනය මහත්බැවින් මහත් ධන ඇත්තාහ. **‘මහාභොගා’** දවස වියදමැයිකියූ භොගයන්ගේ මහත්බැවින් මහත්භොග ඇත්තාහ. අන්‍ය උපභොගයන්ට වඩා රන්රිදීම මහත්බැවින් **පභූතජාතරූපරජතයහ.** ආහරණ භූතවූ ප්‍රීතිප්‍රමොදයට කරුණුවූ සතුට උපදවන උපකරණයන් බොහෝබැවින් **පභූතවිත්තූපකරණයහ.** වෙළඳම් ගණුදෙනුවසයෙන් භූවමාරු කරන ධනධාන්‍ය බොහෝබැවින් **පභූතධනධඤ්ඤහ** යි දතයුතුය.

‘සෙනාසනං සංසාමෙත්වා’ සෙනසුන් තැන්පත්කොට. යම්සේ නොනැසේද, එසේ සෙනසුන් මනාකොට තබා යනඅර්ථයි. **‘සට්ඨිමත්තෙ ථාලිපාකෙ’** ගණන් පිරිසිදීමෙන් සැටක් බත්සැළි මෙහි එක් එක් බත්සැළිය දසනමකට සෑහෙන බත් ගණියි. ඒ සියල්ලම සසියක් භික්ෂූන්ට බත්වේ. **‘හත්ථාහිහාරං අභිහරිංසු’** මෙහි මැනවින් එළවනුලැබේනුයි අභිහාර නම්වේ. කුමක් එළවනු ලැබේදයත්: බත්ය. බත්ම එළවනුලැබේනුයි හත්ථාහිහාර නම්. ඒ හත්ථාහිහාරය **‘අභිහරිංසු’** අභිමුඛයට එළවූහ. ඔහුගේ සමීපයට ගෙණඅහ යනුඅර්ථයි. එහි පමණ කෙතෙක්දයත්: බත්සැළි සැටෙක්වේ. **‘සට්ඨිමත්තෙ ථාලිපාකෙ හත්ථාහිහාරං අභිහරිංසු’**යි එහෙයින් කියනලද්දේය. **‘භික්ඛූනං විස්සජ්ජෙත්වා’** තෙමේ උත්කෘෂ්ට පිණ්ඩපාතිකබැවින් සපදන චාරිකාවෙහි හැසිරෙණු කැමැත්තේ භික්ෂූන්ට පරිභොගයපිණිස පරිත්‍යාගකොට. පුද දී. මේ ආයුෂ්මත්තෙමේ වනාහි ‘භික්ෂූහුද ලාභ ලබන්නෝය, මම ද පිඬුයෙන් වෙහෙසට පත්නොවන්නෙමි’යි සිතා මේ පිණිසම ආයේය. එහෙයින් තමන්ගේ ඊමට අනුරූපලෙසින් කරනුයේ භික්ෂූන්ට ඒ බත්සැළි පුද තෙමේ පිඬුපිණිස ගියේය.

‘සුතිදසි’ නැයන්ගේ දසීතොමෝ. **‘ආභිදෙසිකං’** පිළිනුවූ, එක් රැයක් ඉක්මගියාවූ කුණුවූ. එහි මේ පදර්ථයවේ. කුණුවීමේ දෙසයෙන් මැඩුනේනුයි අභිදෙසනම්. අභිදොසයම ආභිදෙසිකනම්වේ. යම් මේ

ආහිදෙසික යන නමක්වේද, මෙය එක් රැයක් ඉක්මගියහුට නාමසංඥය. ඒ ආහිදෙසිකවූ **'කුම්මාසං'** අඩක්තැම්බූ යවකොමු. **ඡඩ්ඩෙතුකාමා හොති'** එය යටත්පිරිසෙයින් දස්කම්කරුවන්ගේද ගෙරින්ගේද පරිභොගයට සුදුසු නොවූයේද එහෙයින් කසළමෙන් බැහැරලනු කැමැත්තීවූවාය. **'සචෙ තං'** ඉදින් මේ යවකොමු. **'භගිනි'** ආයාර්‍යව්‍යවහාරයෙන් නෑදස්ස අමතයි. **'ඡඩ්ඩනීයධම්මං'** බැහැරලියයුතු සැහැවි ඇති. 'බුහුන' මේ පිළිනුවූ යවකොමු බැහැරලියයුතු සැහැවි ඇත්තේනම් හළ ගැණීම් ඇත්තේනම් මෙහි මාගේ පාත්‍රයෙහි බහාලවයි මේ කියනලද්දේවේ. කිම? මෙසේ කියන්නට ලබාද විඥප්තිය හෝ ප්‍රයුක්තවචනයක් නොවේදයත්: නොවේ. කුමක්හෙයින්දයත්: හළ ආලය ඇත්තක්බැවිනි. යමක් බැහැරලියයුතු සැහැවි ඇත්තේද, හළ ආලය ඇත්තේද, අයිතිකරුවෝ යමක්කෙරෙහි ආලය රහිතවෙත්ද, ඒ සියල්ල 'දෙවු, ගෙණෙවු, මෙහි බහාලවු'යි කීමෙහි වරදක් නැත්තේය. එසේම අග්‍රාර්‍යවංශිකවූ ආයුෂ්මත් **රට්ඨපාල** ස්ථවිර තමේද 'බැහැරලියයුතු සැහැවිඇති යවකොමු මෙහි මාගේ පාත්‍රයෙහි බහාලව'යි කීයේය. එහෙයින් මෙබඳු බැහැරලියයුතු සැහැවි ඇති අන් යමක් හෝ අන්‍හුවිසින් තමන් අයත්කොට නොගත් වනමුල් පල බෙහෙත් ආදියක් හෝ වේද ඒ සියල්ල කැමතිසේ ගෙන්වාගෙණ වැළඳියයුතුය. කුකුස් නොකටයුතුය.

'හත්ථානං' ජිඩුගැනීම්පිණිස පාත්‍රය එළවන්නහුගේ මැණික්තටුවපටන් දෙයතෙහිද, **'පාදනං'** අඳන කෙළවරපටන් දෙපයෙහිද, **'සරසස'** ඉදින් බුහුන යන ඒ වචනය නිකුත් කරන්නහුගේ ශබ්දයෙහිද **'නිමිත්තං අග්ගහෙසි'** ගිහිකාලයෙහි සැලකුවිරූ ආකාරය ගත්තීය. හැඳින ගත්තීය. සලකා ගත්තීය. සුදිනන තෙමේ වනාහි භාග්‍යවතුන්වහන්සේගේ දෙළොස්වන අවුරුද්දෙහි පැවිදිවූයේය. විසිවන අවුරුද්දෙහි තමා පැවිද්දෙන් අටවස් ඇත්තේ, නෑකුලයට පිඬුසිහා ගියේය. එහෙයින් ඒ නෑදස්ස ඔහු දැකද හඳුනාගත නොහැකිවූය. එහෙත් නිමිති ගත්තීය. **'සුදින්නස්ස මාතරං එතදවොච'** ඉතා ගරුවූ ප්‍රව්‍රජ්‍යොපගතව සිටි ස්වාමිපුත්‍රයා සමග 'සවාමීනි! ඔබවහන්සේ ආයුෂ්මත් සුදිනන්ද'යි යනාදි වචනයක් කියන්නට නොහැකිවන්නී, වෙගයෙන් ගෙට දුවගොස් සුදිනනගේ මවට මෙය කිවූය. **'යගෙස'** ආරොචනාර්‍ථයෙහි නිපාතයි. **'සචෙ ජෙ! සච්චං'** මෙහි **'ජෙ'**යනු ආලේපනයෙහි නිපාතයි. ඒ දේශයෙහි දසීජනයාහට මෙසේ ආමන්ත්‍රණය කරත්. එහෙයින් 'එම්බා දැස්ස! තෝ සැබවක් කියහිද'යි මෙසේ අර්‍ථී දතයුතුය.

'අඤ්ඤතරං කුඩ්ඩමූලං' ඒ දේශයෙහි දනපතීන්ගේ ගෙවල එක්පෙදෙසෙක දනශාලා වෙයි. ඒ ශාලාවන්හි ආසනද පණවනලද්දේවේ.

දිය හා කැඳද එළවා තබන ලද්දේය. පැවිද්දෝ පිඩුසිහා හැසිර අවුත් එහි හිඳ වළඳත්. ඉදින් කැමති වෙත්නම් දනපතියන් අයත් දැයද පිළිගණිත්. එහෙයින් ඒ බිත්තිමුල්ලද එක්තරා කුලයෙක මෙබඳු ශාලාවක එක්තරා බිත්තිමුල්ලකැයි දතයුතුය. පැවිද්දෝ බැගෑපත් දිළිඳු මිනිසුන් මෙන් නොසරුප් තැන හිඳ නොවළඳන්නෝය.

'අත්ථි නාම තාත!' මෙහි **'අත්ථි'**යනු විද්‍යමානාත්ථියෙහිද **'නාම'**යනු පෘච්ඡනාත්ථියෙහි හා ජානනාත්ථියෙහිද නිපාතයි. 'පුත! සුදින්න! අපට ධනය ඇත්තේමය. අපි නිර්ධනැයි නොකියයුත්තම්හ. එබඳුවූ අපගේ පුත්‍රවූ තෝ මෙබඳු තැන හිඳ පිළුනු යවකොමු වළඳන්නෙහිය. එසේම පුත! සුදින්න! අපගේ ජීවිතයද තිබේ. එසේ ජීවත්වන අපගේ පුත්‍රවූ තෝ මෙබඳු තැන හිඳ පිළුනු යවකොමු වළඳන්නෙහිය, එයින් අපි මළම්හයි නොකියයුත්තම්හ, පුත! සුදින්න! යම්හෙයකින් තෝ මනා හොජනරසයෙන් වැඩුනෙහි පිළිකුල්කටයුතු පිළුනුවූ මේ යවකොමු අමාවක්මෙන් විකාර රහිතව වළඳන්නෙහිද? එහෙයින් තාගේ ඇතුළත ශාසනය නිසා පිළිලැබූ ශ්‍රමණගුණයක් ඇතැයි සිතම්'යි මේ කියනලද්දේවේ. ඒ ගැහැවිතෙමේවනාහි සිත්හිවූ දුකින් තදින් පෙළුනුබැවින් මේ අදහස සම්පූර්ණකොට කියන්නට අපොහොසත්වනුයේ **'අත්ථිනාම සුදින්න! ආහිදෙසිකං කුම්මාසං පරිභුඤ්ජිස්සසි'** යන මෙපමණක්ම කීයේය. අක්ෂරචින්තකයෝවනාහි මෙහි නොඇදහීම, නොඉවසීම යනඅත්ථිවශයෙන් මේ 'අත්ථි නාම' ශබ්දය උපපදව සිටිකල්හි 'පරිභුඤ්ජිස්සසි'යන අනාගත වචනය කරනලදයි මේ ලක්ෂණය කියත්. එහි **'අත්ථි නාම -පෙ- පරිභුඤ්ජිස්සසි'** යන මේ ප්‍රත්‍යක්ෂයද මම නොඅදහම්, නොඉවසම්යනු එහි මේ අත්ථියයි. **'තත්‍රායං ආහිදෙසිකෝ'** තාගේ ඒ ගෙයින් පිළුනුවූ මේ යවකොමු ලද්දේය' යනඅත්ථියි. **'තත්‍රෝයං'**යි පාඨයක්දවේ. **'තදයං'**යිද කියත්. එය නොමැනවි.

'යෙන සකපිතුනිවෙසනං' සිය පියහුගේ. තමන්ගේ පියා අයත් ගෙය, යම් තැනෙක්හිද යනඅත්ථියි. ස්ථවිරතෙමේ පියාකෙරෙහි ප්‍රේමයෙන්ම සුවවව එහි ගියේය. **'අධිවාසෙසි'** සථවිරතෙමේ උත්කෘෂ්ට පිණ්ඩපාතිකවූයේද 'එක් බතකුදු නොගන්නෙමිනම් එයින් ඔවුන්ට ඉතාදැඩි දෙමිනසක් වන්නේය'යි නැයන්ට අනුකම්පාවෙන් ඉවසුයේය. **'ඔපුඤ්ජාපෙත්වා'** ආලේපකරවා. **'එකං හිරඤ්ඤස්ස'** මෙහි හිරණ්‍යනම් කහවණුයි දතයුතුය. **'පූරිසෝ'** ඉතාඋස් නොවූ ඉතාමිටි නොවූ මැදියම් පමණ පුරුෂතෙමේයි දතයුතුය. **'තිරොකරණියං'** කරණාත්ථියෙහි සප්තමී වචනයි. තිරපවුරකින් වටකොට යනඅත්ථියි. නොහොත් 'මෙයින්

වටකෙරෙත්'නුයි තිරොකරණියනම්. එය **'පරික්ඛිපිත්වා'** හාත්පසින් වටකොට යනඅර්ථයි **'තෙන හි'** යම්හෙයකින් සුදින්නතෙමේ අද එන්නේද, ඒ කාරණයෙනි. **'හි'**යනු පදපූරණ මාත්‍රයෙහි නිපාතයි. **'තෙන'**යන මේ හෝ උය්‍යොජනාර්ථයෙහි නිපාතයක්මවේ. **'පුබ්බණ්හසමයං'** මෙහි කිසියේත් පාළියෙහි කල්දැන්වීමක් නොකියනලද්දේද, එහෙත් කල්දැන්වූ කල්හිම ගියේයයි දතයුතුය.

'ඉදං තෙ තාත'යනු දෙගොඩ දක්වමින් කීයේය. **'මාතු'** මවගේ **'මත්තිකං'** මවගෙන් පැමිණියේය. මේ ධනය තාගේ මිත්තනියවිසින් මේ ගෙට එන තාගේ මවට දෙනලද ධනය යනඅර්ථයි. **'ඉත්ථිකාය ඉත්ථිධනං'**යනු ගරහමින් කීයේය. ස්ත්‍රීන්ගේ පරිභොගය පිණිසමවූ නහනසුණු ආදියපිණිස ලත් ධනය ඉත්ථිකාය නම්වේ. එය කොපමණ වත්නේද, එහිදුවනාහි ප්‍රමාණය බලව. තවද 'පුත! සුදින්න! මේ තාගේ මවට අයත් ධනයයි. එද මව සතුය. මා විසින් දෙනලද්දේ නොවේ. තාගේ මව සතුමයයි කියනලද්දේවේ. ඒ මේ ධනය ගොවිකමින් රැස්කරණලද්දේනොවේ. වෙළඳමෙන් රැස්කරණලද්දේනොවේ. තවද, **ස්ත්‍රිය** සතුවූම ස්ත්‍රියගේ ධනයයි. නෑකුලයෙන් ස්වාමිකුලයට යන්නාවූ ස්ත්‍රියවිසින් නහනසුණු ආදිය සඳහා ලැබියයුතුවූ යම් ස්ත්‍රීධනයක්වේද, ඒ ධනයවනාහි මෙපමණැයි මෙසේද මෙහි අරුත් දතයුතුය. **'අඤ්ඤං පෙත්තිකං අඤ්ඤං පිතාමහං'** යම් ධනයක් තාගේ පියා හා මුත්තනුවන් සතුවේද, ඒ ධනය අනිකක්මය. නිදන් කරණ ලද්දවූද, වැඩීමට යොදනලද්දවූද ඒ ධනය ඉතාබොහෝය. මෙහිද **'පිතාමහං'**යි තද්ධිතප්‍රත්‍යය ලොප්කොට දතයුතුය. **'පෙතාමහං'යි** හෝ පාඨයක්වේ.

'ලබ්භා තාත! සුදින්න! හීනායාවත්තිත්වා' පුත! සුදින්න! උතුම්වූ ආයතිධර්මය, ශ්‍රමණවෙශය හැරපියා හීනවූ ගිහිබවට පෙරැළී භොග අනුභව කරන්නට ලබන්නේය. සම්පත් වළඳන්නට නොලබන්නේ නොවේ හෝ රජුන්ට බියව පැවිදිවූයේ නොවෙහි, ණයකාරයන්විසින් පෙළෙන ලද්දෙක්ව පැවිදිවූයේ නොවෙහි **'තාත! න උස්සහාමි'** මෙහි 'තාත'යන වචනය ගෘහාශ්‍රිතප්‍රේමයෙන් කීයේය. ශ්‍රමණතෙජසින් නොකීයේය. **'න උස්සහාමි'** නොහැකියෙමි. **'න විසහාමි'** නොපොහොනෙමි. සමර්ථවූයෙම් නොවෙමි. **'වදෙය්‍යාම ඛො තං ගහපති!'** මේ වචනයවනාහි ශ්‍රමණතෙජසින් කීයේය. **නාතිකඩ්ඪය්‍යාසි'** තාගේ සිත්හි මාකෙරෙහි යම් ප්‍රේමයක් ජිහිටියේද, එය ක්‍රොධවශයෙන් නොඇදගණුව, ඉදින් නොකිපෙන්නෙහිනම්යි කියනලද්දේවේ.

ඉක්බිති සිටුතෙමේ 'පුත්‍රතෙමේ මට සඬ්ග්‍රහ කරනු කැමැත්තේ වනැ'යි ඔදවැඩි සිත් ඇත්තේ **'වදෙහි තාත! සුදින්න!** යනුකියේය. 'තෙනහි' යනු උය්‍යොජනාර්ථයෙහි විභක්තිප්‍රතිරූපක නිපාතයෙකි. **'තතො නිදනං'** ඒ නිදනකොට. ඒ හේතුකොට. ප්‍රථමා වචනයට **තො** ආදේශය දතයුතුය. සමාස විෂයයෙහි ද මොහුගේ තොලොපාභාවයවේ. **'භයං වා'** ''කිම, මාගේ භොගයෙන් රජහුනොම පැහැර ගන්නාහුද'[A]යි යනාදි ක්‍රමයෙන් කියූ රාජාදීන්ගෙන් වනබිය. සිතෙහි තැතිගැණීම යනඅර්ථයි. **'ජම්භිතත්තං'** රජුන්විසින් හෝ සොරුන්විසින් ධනය දෙවයි කම්කටොලු කරවනුලබන්නහුගේ කය සැලීම. කය වෙවුලීම. හදය මස් සැලීමය. **'ලොමහංසො'** උපන් බිය නිමිත්තකොට ලොමයන්ගේ දහගැණීමය. ලොමයන්ගේ උඩුහුරු අග් ඇතිබවය. **'ආරක්ඛා'** ඇතුළතද පිටතද රැඳ දවලද රැකීමය.

'තෙනහි වධූ' සිටුගැහැවිතෙමේ ධනය දක්වා තමා සිය පුතු ගිහිබවට පොළඹවන්නට නොහැකිවනුයේ 'පුරුෂයන්ට දැන් මාගම සමානවූ බන්ධනයක් නැතැ'යි සලකා ඔහුගේ පැරණි අඹුවට **'තෙනහි වධූ'යි** ඇමතුයේය. **'පුරාණදුතියිකං'** පැරණි බිරිඳ පෙර ගිහිකාලයෙහි දෙවැන්නිය. ගෘහාශ්‍රිතදුබොපභොගයෙහි සහායිකාය. පෙර බිරිඳ යන අර්ථයි. **'තෙනහි'** යම් කරුණකින් මාගම සමානවූ බන්ධනයක් නැත්තේද එහෙයිනි. **'පාදෙසු ගහෙත්වා'** පා අල්වා ගෙන කම්‍යර්ථයෙහි සප්තමී වචන යි. පාවලින් හෝ ඔහු අල්ලා ගෙන **'කීදිසා නාම තා අය්‍යපුත්ත! අවජරායො'යි** කුමක් හෙයින් මෙසේ කීයේද? ඒ කාලයෙහි වනාහි මහත් සම්පත් හැරපියා පැවිදිවන බොහෝ කැත්කුමරුන්ද, බමුණු කුමරුන්ද, සිටුපුතුන්ද දැක පැවිදිගුණ නොදන්නාහු 'කුමක් හෙයින් මොවුහු පැවිදිවෙත්ද'යි කතාබහ කරත්. එහි අන් කෙනෙක් දිව්‍යාප්සරාවන් දිව්‍ය නාටිකාවන් කරුණු කොටැයි කියත්. ඒ කතාව පැතිරගියාය. ඒ කතාව අසා මෝතොමෝ මෙසේ කිවුය.

ස්ථවිරතෙමේ එය ප්‍රතික්ෂෙප කරණුයේ **'න ඛො අහං භගිනි!'** යනු කීයේය. **'සමුදචරති'** ව්‍යවහාර කරයි. කියයි. **'තඤ්ඤෙව මුචඡිතා පජතා'** භගිනි වාදයෙන් කතා කරන ඔහු දැක 'දැන් මාගෙන් ප්‍රයොජන නැත, යම් බඳුවූ මෙතෙමේ බිරිඳවූ මා, තමන් හා එක් මවුකුස හොත් දැරියක සේ සලකාය'යි හටගත් බලවත්ව උපන් ශෝක ඇතියා ඒ පෙදෙස්හිම මුසපත්ව පතනය වූවාය. වැටුනීය යනඅර්ථයි. **'මා නො**

A මජ්ඣිමනිකාය - මහාදුක්ඛක්ඛන්ධසුත්ත

විහෙඨයිත්ථ' ධනය දක්වා මාගමද යොදු අප වෙහෙස නොකරවු. මෙය පැවිද්දන්ට වෙහෙසක්මය.

'තෙනහි තාත! සුදින්න! බීජකම්පි දෙහි' මෙහි **'තෙනහි'** යන මෙයින් ඉදින් තෝ ඇලීම් ඇතිව බ්‍රහ්මචර්‍යයෙහි හැසිරෙහිනම් හැසිරෙව, හැසිර අහසෙහි හිඳ පිරිනිවියේවෙව, අපට කුලවංශයට බිඳුවටක්වූ එක් පුතෙකු දෙවයි අභිරතියෙහි යොදයි. **'මානෝ අපුත්තකං සාපතෙය්‍යං ලිච්ඡවියෝ අතිහරාපෙසුං'** අපිවනාහි ගණ රාජවූ ලිච්ඡවීන්ගේ රාජ්‍යයෙහි වසම්හ. ඔවුහු තාගේ පියාගේ ඇවැමෙන් කුල ධන රකින පුතුගෙන් තොරවු මෙසේ මහත්වූ අපගේ විභවවූ මේ ධනය තමන්ගේ රාජතෙපුරයට ගෙන්වන්නාහුය, ඔවුහු ඒ ධනය නොගෙන්වන්නාහු, නොගෙන්වත්වා. **'එතං ඛෝ මේ අම්ම සක්කා කාතුං** කුමක් හෙයින් මෙසේ කීයේද යත්: 'මොවුන්ගේ ධනයට මම ම හිමියෙමි, අනෙකෙක් නැත්තේය, ඔවුහු ධනය රැකගැණීමට නිතර මා ලුහුබඳින්නාහුය. එහෙයින් මම උත්සාහ රහිතව මහණදම්කරන්නට නොලබම්. පුතෙකු ලැබීමෙන් පුතෙකු ලබා ඔවුහු මෙයින් වළකින්නාහුය, ඉන්පසු මම සැපසේ මහණදම් කරන්නෙම්'යි හෙතෙමේ සිතුයේය. මේ ක්‍රමය දක්නේ මෙසේ කීයේය.

'පුපඵං' පුපඵයනු ඔසප් කාලයෙහි හටගත් ලෙයට නමකි. ඔසප්කාලයෙහි මාගමගේ ගැබ පිහිටන තැන ලේවන් පිළිකාවෝ හටගෙණ සත් දවසක්තුළ වැඩිගොස් බිඳියත්. ඉන්පසු ලේ වැගිරෙයි. **පුපඵ** යන මෙය එයට නමකි. එය යම් තරම් බලවත් වේද, ඒ තරම් ලෙසින් බොහෝ ලේ වැගිරෙන්නේය. ඒ කාලයෙහි දුන් ප්‍රතිසන්ධියද නොපිහිටයි. ලේ සමගම ප්‍රතිසන්ධියද වැගිරීයයි. ලේ වැගිරී ගියකල්හි පිරිසිදුවූ ගර්භාශයෙහි දෙනලද ප්‍රතිසන්ධිය වහා පිහිටාගණියි. **'පුපඵංසා උපපජ්ජී'** මැයට ලේ උපන. ආකාර ලොපය සමග සංයොගයාගේද ලොපයවේ. **'පුරාණ දුතියිකාය බාහායං ගහෙත්වා'** පැරණි බිරියගේ යම් බාහුවක්වීද, එයින් ඇය අල්ලාගෙණ යන අතථියි.

අපසාදත්ත සික්ඛාපදේ' ප්‍රථම පාරාජිකා ශික්ෂාපදය නොපැණවූ කල්හි ප්‍රථමබෝධියෙහි විසිවසක්ම භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේගේ සිත සතුටුකළහ. මෙබඳු අධ්‍යාචාරයක් නොකළහ. **'ආරාධයිංසු වත මේ භික්ඛවෙ භික්ඛු එකං සමයං චිත්තං'**[A] යන මේ සූත්‍රය ඒ සඳහාම වදළසේක. එකල්හි භාග්‍යවතුන්වහන්සේ අධ්‍යාචාරයක් නොදක්නාසේක් පාරාජිකයක් හෝ සඞ්ඝාදිසෙසයක් නොපැණවූහ. ඒ ඒ වස්තුවෙහි සෙසු පස්වැදෑරුම්වූ

A මජ්ඣිමනිකාය - කාකචූපමසුත්ත

ක්ෂුද්‍රපත්තිස්කන්ධයන්ම පැණුවූහ. **'අපඤ්ඤත්තෙ සික්ඛාපදෙ'**යනු එහෙයින් වදරණුලද්දේය. **'අනාදීනවදස්සෙ'** භාග්‍යවතුන්වහන්සේ දුන් ප්‍රථමශික්ෂාපදය පණවනසේක් යම් ආදීනවයක් දක්වන්නාහුද, එය නොදකිමින් නිරවද්‍යසංඥ ඇතිව 'ඉදින් මෙතෙමේ මෙය නොකට යුතුය'යි හෝ මුල් සිදීමපිණිස පවතියි දන්නේ නම් සැදහයෙන් පැවිදිවූ කුලපුත්‍රතෙමේ ඒ හේතුකොට ජීවිතක්ෂයට පැමිණෙනුයේද නොකරන්නේය. මෙතෙමේ මෙහි වනාහි ආදීනව නොදක්නේ නිර්දෝෂසංඥ ඇත්තේවූයේය. **'අනාදීනවදස්සෙ'**යනු එහෙයින් වදරණුලදී. **'පුරාණදුතියිකාය'**යනු සප්තමී වචනයි. **'අභිවිඤ්ඤාපෙසි'** පැවැත්වූයේය. පැවැත්මද කායවිඥප්තිවලනයෙන් **'විඤ්ඤත්ති'යි** කියනුලැබේ. මෙතෙමේ ගැබ් පිහිටීමෙහි තීරණයපිණිස තෙවරක් මෙවුන්දම් සෙවීම කෙළේයයි දතයුතුය. **'සා තෙන ගබ්භං ගණ්හි'** ඕතොමෝද ඒ ආචාරව්‍යතික්‍රමයෙන්ම ගැබ්ගත්තීය. අන් පරිද්දෙකින් ඒ නොවූයේය.

කිම, අන් පරිද්දෙකිනුදු ගැබ්ගැණීම වේදයත්: වන්නේය. කෙසේදයත්: කායසංසර්ගයෙන්, හැදිරෙදි ගැණීමෙන්, ශුකළ පානයෙන්, නැබ පිරිමැදීමෙන්, රූප දැකීමෙන්, ශබ්දශ්‍රවණයෙන්, ගන්ධාඝ්‍රාණයෙන් ගැබ් හටගැණීම වන්නේය.

ඇතැම් ස්ත්‍රීහු ඔසප් කාලයෙහි ඡන්දරාගයෙන් ඇලීගියාහු පුරුෂයන්ගේ අත් ගැණීම් කෙස් ගැණීම් අභපසභ පැහසීම් ඉවසන්නාහු ඒ හේතුවෙන් ගැබ් ගණිත්. මෙසේ කායසංසර්ගයෙන් ගැබ් හටගැණීමවේ.

උදයි තෙරුන්ගේ පැරණි බිරිඳවූ මෙහෙණතොමෝ උදයි තෙරුන්ගේ මිදුනු ශුකලකොටසක් මුවෙහි ලාගත්තීය. අඳනයෙහි රැඳී තුබූ කොටස අඳනයත් සමග තමාගේ අඩගජාතයෙහි බැහුය. ඕ තොමෝ එයින් ගැබ් ගත්තීය. රෙදිකඩ ගැණීමෙන් ගැබ් හටගැණීම මෙසේවේ.

මිගසිඬ්ග තාපසයාගේ මවවූ මුවදෙන ඔසප්කාලයෙහි තාපසයා මුත්‍රකරන තැනට අවුත් ශුකලසහිත මුත්‍ර බීවාය. ඕ තොමෝ එයින් ගැබ් ගෙණ මිගසිඬ්ග තවුසා වැදූය. ශුකල පානයෙන් ගැබ් හටගැණීම මෙසේ වේ.

සාම බෝසත්හුගේ මවුපියන්ගේ ඇස් නටබව දුන සක්දෙවි රජතෙමේ පුතෙකු දෙනුකැමැත්තේ **දුකූල** පණ්ඩිතයාහට 'ඔබට මෙවුන්දම් සෙවුම වටීය'යි කීයේය. 'අපි මෙවුන්දම් සෙවුමෙන් ප්‍රයොජන නැත්තමෝ වෙමු, අපි ඉසි පැවිද්දෙන් පැවිදිවූවෝ වෙමු'යි හෙතෙමේ කීයේය. 'එසේ නම් ඔසප්කාලයෙහි මැයගේ නාභිය ඇඟිල්ලෙන් පරාමර්ශනය කරවු'යි

සක්දෙවි රජු කීකල්හි හෙතෙමේ එසේ කෙළේය. ඕතොමෝ එයින් ගැබ්ගෙණ සාම තවුස් දරු වැදූය. නාභිය පැහැසීමෙන් ගැබ් හටගැණීම මෙසේ වේ. මේ නයින්ම **මණ්ඩව්‍යයාගේද චණ්ඩප්‍රද්‍යොතයා**ගේද වස්තුව දතයුතුය.

රූපදර්‍ශනයෙන් ගැබ් හටගැණීම කෙසේ වේදයත්: මෙහි ඇතැම් ස්ත්‍රියක්තොමෝ ඔසප්කාලයෙහි පුරුෂසංසර්‍ගයක් නොලබන්නී ගෙයතුළ හුන්නීම ඡන්දරාග වසයෙන් ලක්දිව රාජොරොධාව මෙන් ජනෙල් කවුළුවෙන් දැක හෝ පෙර දක්නා ලද්දවූ පුරුෂයෙකු ගැන සිතන්නීය. ඕතොමෝ එයින් ගැබ් ගන්නීය. රූප දැකීමෙන් ගැබ් හටගැණීම මෙසේවේ.

කෙකින්නන් අතර පිරිමිසතෙක් නැත. ඒ කෙකින්නෝ ඔසප්කාලයෙහි මේඝශබ්දය අසා ගැබ් ගණිත්. බොහෝ කිකිළියෝද කිසිකලෙක එක් කුකුළෙකුගේ හඬ අසා ගැබ් ගණිත්. එසේ බොහෝ ගවදෙන්නුද එක් වෘෂභයකුගේ හඬ අසා ගැබ් ගණිත්. ශබ්දශ්‍රවණයෙන් ගැබ් හටගැණීම මෙසේ වේ.

ගවදෙන්නුම සමහර කලෙක වෘෂභගන්ධයෙන් ගැබ් ගණිත්. ගන්ධාඝ්‍රාණයෙන් ගැබ් හටගැණීම මෙසේ වේ.

මේ වස්තුවෙහිවිනාහි සුදින්නගේ මේ පැරණි බිරිඳ තොමෝ මෛථුනධර්මසෙවනසඞ්ඛ්‍යාත ආචාරව්‍යතික්‍රමයෙන් ගැබ් ගත්තීය.**'මාතා පිතරෝ ච සන්නිපතිතා හොන්ති, මාතා ච උතුනී හොති, ගන්ධබ්බෝ ච පච්චුපට්ඨිතෝ හොති, එවං තින්නං සන්නිපාතා ගබ්භස්සාවක්කන්ති හොති'**[A]යනු මේ සඳහා වදරණුලදය.

'භුම්මා දෙවා සද්දමනුස්සාවෙසුං' 'නත්ථි ලොකෙ රහෝ නාම පාපකම්මං පකුබ්බතෝ' යම්හෙයකින් මොහුගේ ඒ පාපය සියල්ලන්ට පළමු තෙමේ දනීද ඉන්පසු ආරක්‍ෂක දෙවතාවෝ ඉක්බිති අන්‍යවූද පරසිත් දන්නා දෙවතාවෝ දැනගණිත්ද, එහෙයින් සියලු වනලැහැබ් ඇසුරුකොට සිටි පරසිත්දන්නා භූම්‍යස්ථදෙවතාවෝ මොහුගේ අද්ධ්‍යාචාරය දැක ශබ්ද ඇස්වූහ. යම් සේ අන්‍යවූ දේවතාවෝත් අසත්ද, එසේ **'නිරබ්බුදෙ වත හො -පෙ- ආදීනවො උප්පාදිතෝ'යි** හඬ පැතිරවූහ. මෙහි අතීත වෙරඤජකාණ්ඩයෙහි කියූ අයුරින් දතයුතුය. **'භුම්මානං දෙවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා'** මෙහි වනාහි භූම්‍යස්ථදෙවියන්ගේ ශබ්දය ආකාශස්ථ දෙවියෝ ඇසූහ. ආකාශස්ථදෙවියන්ගේ ශබ්දය චාතුම්මහාරාජික දෙවතාවෝ ඇසූහයි මේ ක්‍රමය දතයුතුය.

A මජ්ඣිමනිකාය - මහාතණ්හාසඞ්ඛයසුත්ත

'බ්‍රහ්මකායිකා' අසංඥසත්ත්වයන් හා අරූපාවචරයන්ද හැර සියලුම බ්‍රහ්මයෝ ඇතුහ. අසාද ශබ්ද ඇස්තුහයිද දතයුතුය. **'ඉතිහ තෙන ඛණෙන'** මෙසේ සුදිනනගේ ඒ අධ්‍යාචාර ක්ෂණයෙහි ම. **'තෙන මුහුත්තෙන'** ඒ අධ්‍යාචාර මුහුර්තයෙන් ම. **'යාව බ්‍රහ්මලොකා'** අකනිටා බඹලොවතෙක්. **'අබභුග්ගඤ්ඡි'** වෙසෙසින් උස්ව පැනනැංගේය. තදින් නැගීසිටියේය. එක්ම කොලාහලයක්වූයේය.

'පුත්තං විජායි' රන් පිළිරුවක් සමානවූ පශ්චිමභවික සත්ත්වයෙකු ඉපදවූය. **'බීජකොති නාමං අකංසු'** අන් නමක් කරන්නට නොදුන්හ. 'බීජකම්පි දෙහි'යි මිත්තනිය විසින් කියූබව ප්‍රකටබැවින් මොහුට බීජකැයි කියාම නම් වේවායි බීජකයි නම්කළහ. පුත්‍රයාගේ වනාහි නාමවසයෙන්ම මොහුගේ මවුපියන්ටද නම්කළහ. **'තෙ අපරෙන සමයෙන'**යනු බීජක හා බීජකගේ මවසඳහා වදරණලද්දේය. බීජකගේ සත්අට වයස්කාලයෙහි ඔහුගේ මවුතොමෝ මෙහෙණන් වෙතද, බීජකතෙමේ මහණුන් වෙතද පැවිදිව කළණමිතුරන් ඇසුරුකිරීමෙන් රහත්බවෙහි පිහිටාගත්හ. **'උභො අගාරසමා අනගාරියං පබ්බජිත්වා අරහත්තං සච්ඡාකංසු'**යනු එහෙයින් වදරණලදී. මෙසේ මවුපුතුන්ගේ පැවිද්ද ඵලසහිතවිය. පියතෙමේ විපිළිසරින් මඩනාලදුයේ වාසයකෙළේය. **'අථඛො ආයස්මතො සුදින්නස්ස අහුදෙව කුක්කුච්චං'** යනාදිය එහෙයින් වදරණලද්දේය.

එහි **'අහුදෙව'** අහු + එව යනු පද සිදීමමය. දකාරය පදසන්ධි කරන්නේය. වූසේමය යනඅර්ථයි. **'කුක්කුච්චං'** අධ්‍යාචාර හෙතුකවූ පසුතැවිල්ලය. **'විපටිසාරො'** යනු එයටම නමිය. ඒ වනාහි නුවණැතියන්විසින් නොකටයුතුබැවින් නින්දිතක්‍රියාවක්බැවින් කුකුච්චය නම. කළ අධ්‍යාචාරය නවතාලන්නට අසමර්ථබැවින් ඒ නිසා විරූපකොට සිහිකරනබැවින් විප්‍රතිසාරයි කියනුලැබේ. **'අලාභා වත මෙ'** ඒකාන්තයෙන් මට අලාභයෝය, ධ්‍යානාදි ගුණයන්ගේ යම් අලාභයෝ වෙත්නම්, ඒ අලාභයෝ මටම වෙත්. අන්හට නොවෙතියනු අදහසය. **'න වත මෙ ලාභා'** මාවිසින් පිළිලද යම් ප්‍රව්‍රජ්‍යාශරණගමන ශික්ෂාසමාදන ගුණයෝවෙත්ද, ඒ ගුණලාභයෝද අධ්‍යාචාරයෙන් කිලිටිවූබැවින් එකාන්තයෙන් මට නැත්තාහුමය. **'දුල්ලද්ධං වත මෙ'** මේ ශාසනය ලදුයේද, එය මට නින්දිතලැබීමක් වූයේය. **'න මෙ වත සුලද්ධං'** අන්‍ය කුලපුත්‍රයන්විසින් යම්සේ ලදද, එසේ මාවිසින් එකාන්තයෙන් මොනවට ලද්දේනොවේ. කුමක් හෙයින්දයත්: **'යොහං එවං ස්වාක්ඛාතෙ ධම්ම විනයෙ -පෙ- බ්‍රහ්මචරියං චරිතුං'**යි කියූබැවිනි. **'බ්‍රහ්මචරියං'** ශික්ෂාත්‍රය සඞ්ගෘහිත මාඟී බ්‍රහ්මචර්‍යය. **'කිසො අහොසි'** කන්නට හෝ බුදින්නට නොහැකිවනුයේ කෘශවූයේය. මස්ලේ රහිතවූයේය.

‘උපඋඬ්ඩපඋඬ්ඩකජාතො’ හටගත් තද පඬුවන්බව ඇත්තේ. පඬුපත් සමානවූයේය. **‘ධමනිසන්ථතගත්තො’** වියලීගිය මස්ලේ ඇතිබැවින් නහරවැල් සමූහයෙන්ම වෙළුනු සිරුරු ඇත්තේය. **‘අත්තා මනෝ’** නැවත නැවත ශොකකිරීම්වසයෙන් ඇතුළතම රැඳුනු සිත්ඇත්තේය. හෘදයවාසතුවනිසා පැවතීම්වසයෙන්වනාහි සියල්ලෝම ඇතුළත පැවති මනස් ඇත්තාහුමවෙති. **‘ලීනමනෝ’** උදෙසීමෙහිද පිළිවිසීමෙහිද කමටහන්හිද අධිශීලයෙහිද අධිචිත්තයෙහිද අධිප්‍රඥවෙහිද වත්පිළිවෙත් පිරීමෙහිද බහාතැබූ ධුරඇත්තේය. උදෙසීම් ආදියෙහි පැතිරීම් රහිතවූයේය. එකාන්තයෙන් කුසීතකම්න්ම සැහවුනු හැකුළුනු මනස් මොහුටනුයි ලීනමනනම්. **‘දුක්ඛී’** සිත පිළිබඳ දුකින් දුක් ඇත්තේය. **‘දුම්මනෝ’** දෙවෂයෙන් දුෂ්ටවූ සිත් ඇත්තේය. දෙමිනසින් වැඩුනුබැවින් විරූපමනස් ඇත්තේය. **‘පජ්ඣායී’** විපිළිසරවසයෙන් බරඉසිලීමෙන් නැදුනුසිරුරුඇති කොටුලුවෙකු මෙන් ‘ඉදින් මම පවිකම් නොකෙළෙම්නම්, මේ මහණුන්මෙන් පිරිපුන්සිල් ඇතියෙම්මි’යි යනාදීන් ඒ ඒ කරුණු සිතුයේය.

‘සහායකා භික්ඛූ’ මෙසේ වූ ගණයාකෙරෙහි ඇලීමෙන් වූ ප්‍රමාදයෙන් කල් යවන ඔහු දැක, මොහුගේ විශ්වාසිකවූ විශ්වාසිකබැවින් කථාකිරීමට පහසුවූ යම් භික්ෂූහු වෙත්ද, ඒ භික්ෂූහු ඔහුට මෙය කීහ. **පිණිතින්ද්‍රියෝ’** ප්‍රසාදය පිහිටනතැන් සම්පුණිබැවින් පිරිපුන් ඇස් කන් නාස් ආදීවූ ඉන්ද්‍රිය ඇත්තේය. **‘සොදනි තවං’**යන මෙහි **‘දනි’** යනු නිපාතයි. හෙතෙමේවනාහි ‘තෝ’යි කියනලද්දේවේ. **‘කච්චි නො තවං’** කිමෙක්ද තෝ? **‘අනභිරතො’** කළකිරුණෙහිද? ගිහිබව පතමින් යනඅර්ථයි. එහෙයින් ඒ අනභිරතියම ප්‍රතික්ෂෙපකරමින් **‘න ඛො අහං ආවුසො අනභිරතෝ’**යනු කීයේය. මම ශමථ විදර්ශනාදි අධිකුශල ධර්මයන් වැඩීමෙහි ආලය ඇත්තෙම් වෙමි. **‘අත්ථි මෙ පාපං කම්මං කතං’** මාවිසින් කළ එක් පාපකර්මයක් ඇත්තේය. ලැබේ. විද්‍යාමානවේ. එය නිතර මා ඉදිරියෙහි මෙන් සිටුනේය. නැවත එය පවසනුයේ **‘පුරාණදුතියිකාය’** යනාදිය කීයේය. **‘අලං හි තෙ ආවුසො සුදින්න කුක්කුච්චාය’** ‘ඇවැත! සුදින්න! තාගේ මේ පාපකර්මය කුකුසපිණිස පමණය. සමර්ත්ය. කුකුස් ඉපදවීමට ප්‍රතිබලවේය’යි කියනලද්දේවේ. **‘යං තවං’**යනාදි තන්හි ‘යම් පාපකර්මයකින් තෝ බඹසර හැසිරෙන්නට අපහොසත් වන්නෙහිද, තාගේ ඒ පාපකර්ම කුකුසපිණිස සමර්ථවේය’යි මෙසේ සම්බන්ධය දතයුතුය.

ඉක්බිති ඔහුට අනුශාසනා කරන්නාහු **‘නනු ආවුසො භගවතා’**යන මේ ආදිය කීහ. එහි නනුයනු අනුමතිග්‍රහණාර්ථයෙහි නිපාතයි. **‘අනෙකපරියායෙන’** නොයෙක් කරුණෙන් **‘විරාගාය’** භවභොගයන්හි

නොඇලීමපිණිස **'නො සරාගාය'** භවභොගයන්හිම රාගයෙන් ඇලීමපිණිස නොවේ. භාග්‍යවතුන්වහන්සේ විසින් 'මාගේ ධර්මය අසා සත්ත්වයෝ භවභොගයන්හි නොඇලෙන්නාහුය, නොරැඳෙන්නාහුය යන මේ අර්ථයපිණිස ධර්මදේශනා කරණලද්දේය යනඅදහසය. සියලු පදයන්හි මේ ක්‍රමයවේ. මේ වනාහි මෙහි පර්‍යායවචන මාත්‍රයකි. **'විසංයොගාය'** කෙලෙසුන් හා නොයෙදනුපිණිසය. **'නො සංයොගාය'** කෙලෙසුන් හා යෙදෙනුපිණිස නොවේ. **'අනුපාදය'** කෙලශයන්ගේ වසයෙන් දැඩිව නොගැනීම පිණිසය. **'නො සඋපාදනාය'** තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් දැඩිකොට ගැණීමපිණිස නොවේ.

'තත්‍රථ නාම තවං' එහි වනාහි තෝ **'සරාගාය වෙතෙස්සසි'** රාගය හා එක්ව පවත්නා මෛථුනධර්මයපිණිස සිතන්නෙහිය. කල්පනා කරන්නෙහිය. ඉතා තදින් කල්පනා කරන්නෙහිය. මේ පිණිස ව්‍යායාම කරන්නෙහිය යනුඅර්ථයි. සියලුතන්හි මේ ක්‍රමයවේ. නැවත රාගවිරාගාදීවූ නවපදයෝ උපදවනලද ලොකොත්තර නිර්‍වාණයම සඳහා වදරණලදහ. එහෙයින් **'රාගවිරාගාය'**යි හෝ **'මදනිම්මදනාය'යි** කීකල්හි නිර්‍වාණයපිණිසැයි මෙපරිද්දෙන්ම අර්ථදත්‍යුතුය. යම්හෙයකින් ඒ නිවණට පැමිණ නිවණ ඇරැබූ නිවණනිසා රාගය පහවයේද, රාගය නොවේද, එහෙයින් නිවණ **රාගවිරාග**යි කියනුලැබේ. යම්හෙයකින් ඒ නිවණට පැමිණ මානමද පුරිසමදදිමදයෝ නිමිද, අමදවෙත්ද, නැසී යන්නාහුද, එහෙයින් නිවණ **මදනිම්මදන**යි කියනුලැබේ. යම්හෙයකින් හෝ ඒ නිවණට පැමිණ සියලු කාමපිපාසා සන්සිඳීමට විනාශයට යේද එහෙයින් නිවණ **පිපාසවිනය**යි කියනුලැබේ. යම්හෙයකින් ඒ නිවණට පැමිණ පස්කම් ගුණයන්හි පවත්නා ආල විනාශයටයේද, එහෙයින් නිවණ **ආලයසමුග්ඝාත**යි කියනුලැබේ. යම් හෙයකින් ඒ නිවණට පැමිණ ත්‍රෛධාතුකකර්ම කෙලශවිපාක වෘත්තය සිදියේද, එහෙයින් නිවණ **වට්ටූපවෙඡ්ජ**යි කියනුලැබේ. යම් හෙයකින් ඒ නිවණට පැමිණ හැමතින් තෘෂ්ණාව විනාශයටයේද, නොරැඳේද, නිරුද්ධවේද, එහෙයින් නිවණ **තණ්හක්ඛය - විරාගනිරොධ**යි කියනුලැබේ. යම්හෙයකින් මේ නිවණ චතුර්විධයොනි - පඤ්චගති - සප්ත විඤ්ඤාණස්ථිති - නවසත්ත්වාවාසයන් අනික් අනික් යොනිආදියෙන් අනික් අනික් යොනිආදියපිණිස අවුණනබැවින් ගැටලනබැවින් නිවනබැවින් වාණයි ලදව්‍යවහාර ඇති තෘෂ්ණාවෙන් නික්මුනේද, බැහැරවූයේද, පහවූ යෙදුම් ඇත්තේද, එහෙයින් නිබ්බාණයි කියනුලැබේ.

'කාමානං පහාණං අක්ඛාතං' වස්තුකාමයන්ගේ හා කෙලශකාමයන්ගේද ප්‍රහාණය වදරණලදි. **'කාමසඤ්ඤානං පරිඤ්ඤං'** සියලු

කාමසංඥාවන්ගේ කැත - තීරණ - පහාණවයයෙන් ත්‍රිවිධපරිඥා වදරණලදී. **'කාමපිපාසානං'** කාමවස්තූන්හි පාතබ්‍යතා සඞ්ඛ්‍යාතශූභාදිආකාරයන්ගේ හා කාමයන් පානය කිරීමෙහිවූ ඊප්සාවන්ගේ. **'කාමවිතක්කානං'** කාමයෙන්යුකත විතකීයන්ගේ. **'කාමපරිළාහානං'** පඤ්චකාමකොට්ඨාසයන්හි ඇලීම්වයයෙන් උපන් දහයන්ගේ ඇතුළත දවන්නවුන්ගේ මේ පස්තැන කෙලෙසුන් ක්ෂයකරන ලොකොත්තරමාර්ගීයම වදරණලද්දේය. සියල්ලන්ට ප්‍රථමවූ තුන් තැන ලෞකික - ලොකොත්තර දෙකින් මිශ්‍රවූ මාර්ගීය වදරණලදැයි දතයුතුය.

'නෙතං ආවුසෝ' ඇවැත! තාගේ මේ පාපකම්ය. **'අප්පසන්නානං පසාදය'** මෙබඳුවූවන්ගේ පැහැදීමපිණිස නොවේ. 'අථඛෙවතං' තවද මෙය. **'අථ ඛො තං'**යි පාඨයක්දවේ. **'අඤ්ඤථත්තාය'** ප්‍රසාදයාගේ අන්‍යථාභාවයපිණිස විපිළිසරපිණිසවේ. යම්කෙනෙක් මාර්ගීයෙන් නොපැමිණි සැදැහැ ඇත්තාහුද ඔවුන්ට 'යම්තැනක මෙසේ භික්ෂූහු දුෂ්ප්‍රතිපන්නයෝ වෙත්ද, අපි මෙබඳු ධර්මවිනයයෙහි පහන්වූවෝ වම්හ'යි විපිළිසර උපදවයි. යම් කෙනෙක්වනාහි මාර්ගීයෙන් පැමිණි සැදැහැ ඇත්තාහුද, ඔවුන්ගේ පැහැදීම මෙබඳු කරුණු හෙතුකොට හෝ මෙයට වඩා ඉතා දරුණුවූ කරුණු හෙතුකොට වාතයෙන් මහමෙර සේ නොසැලෙන්නේය. **'එකච්චානං අඤ්ඤථත්තාය'**යනු එහෙයින් වදළසේක.

'භගවතෝ එතමත්ථං ආරොචේසුං' භාග්‍යවතුන්වහන්සේට මේ කරුණ සැලකළහ, දන්වාලූහ. සැලකරන්නාහුද, තමන් කෙරෙහි භාග්‍යවතුන්වහන්සේගේ ප්‍රියභාවය කැමැත්තෙන් නොවෙති. ඒ මහණහු හා භාග්‍යවතුන්වහන්සේ බිඳුවන අදහස පෙරටු කිරීමෙන් නොවෙති. ඒ ආයුෂ්මත්හුගේ අයුණු පහළකරණුපිණිසද නොවෙති. ක්‍රොධවශයෙන් ගැරහුම් දෙස්නගතුපිණිසද නොවෙති. භාග්‍යවතුන්වහන්සේ මෙය අසා මොහුට ශාසනයෙහි පිහිටක් නොදෙන්නාහ, ඔහු නෙරපා හරින්නාහයි සිතන්නාහු නොසැලකළහ. තවද භාග්‍යවතුන්වහන්සේ ශාසනයෙහි උපන් අර්බුද දැන ශික්ෂාපද පණවන්නාහ. වෙලාමයදාද ආඥා තබන්නාහයි සිතා සැලකළහ.

'එතසමිං නිදනෙ එතසමිං පකරණෙ' මෙහි සුදිනනගේ අධ්‍යාචාරව්‍යතික්‍රමය ශික්ෂාපද පැණවීමට කරුණුබැවින් නිදනයයිද ප්‍රකරණයයිද වදරණලදැයි දතයුතුය. කාරණයවනාහි යම්හෙයකින් තමාගේ ඵලය පිහිටුවාද, ඒ ඵලය ගණිවුයි දක්වන්නාහුමෙන් පමුණුවාද, එය මුළුමනින් කෙරේද, එය කරන්නට අරඹාද, කරන්නේම හෝ වේද, එහෙයින් නිදනයිද ප්‍රකරණයිද කියනුලැබේ. **'විගරහි බුද්ධො භගවා'**

භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ ගැරහූසේක. නිතු කළසේක. ඒ මෙසේය. ගුණ අගුණ පැවසීමට සුදුස්සන්ගේ ගුණද අගුණද කියා පාන්නවුන් අතුරෙහි භාග්‍යවත් බුදුරජානන්වහන්සේ අග්‍රපුද්ගල වනසේක. භාග්‍යවතුන්වහන්සේටවනාහි ශීලව්‍යතික්‍රමය කරණ පුද්ගලයෙකු දැක 'මෙතෙමේ ජාතිය හෙතුකොට හෝ ගොත්‍රය හෙතුකොට කුලපුත්‍රභාවය හෙතුකොට හෝ ශ්‍රුතය හෙතුකොට හෝ ධුතාඞ්ග හෙතුකොට හෝ ප්‍රසිද්ධවූයේය. මහත් පිරිවර ඇත්තේය. එහෙයින් මෙබඳු පුද්ගලයා රැකීම වටීය'යි සිතක්නම් නොම උපදින්නේය. එසේම ප්‍රියශීලීවූ ගුණවතෙකු දැක ඔහුගේ ගුණ වසාලන්නටද සිතක් නොද උපදින්නේය. එහෙත් ගැරහිය යුත්තහුට ගරහන සේක්මය. පැසසිය යුත්තහුට පසසනසේක්මය. මෙතෙමේද ගැරහිය යුත්තෙක් වූයේය. එහෙයින් තාදී ලක්ෂණයෙහි සිටියාවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ නොසැලෙන සිතින් යුක්තව **'අනනුවජ්ජියං'** යනාදි වචනයෙන් ඔහුට ගැරහූසේක.

එහි මේ අත්ථවණ්ණනාය: 'මොඝ පුරුෂය! තුච්ඡ මනුෂ්‍යය! තා විසින් යම් මේ කර්මයක් කරනලදද, ඒ කර්මය මහණකම සිදුකරණ ධර්මයන්ට හෝ මාගීඵලනිර්වාණශාසනයන්ට සුදුසුනොවේ. ඒ ධර්මයන්ගේ ප්‍රභාස්වරකරනයට ඒ ධර්මයන් බබුලුවන ආලොකයට සොඳුරුබවට නොපැමිණෙයි, අනුව නොයයි. තවද ඒ ධර්මයන්ගෙන් දුරුවම සිටියේය. නොසුදුසු බැවින්ම **අනනුලොමිකය**. ඒ ධර්මයන්ට අනුලොම් නොවේ. තවද විලොම්ව පසම්තුරුබවෙහි සිටියේය. අනනුලොමිකබැවින්ම **අපකිරූපය**. සුදුසුවූයේ සමානවූයේ ප්‍රතිභාගවූයේ නොවේ. තවද අසදෘශවූයේ අප්‍රතිභාගමවේ. අප්‍රතිරූප බැවින්ම **අසාමණකය**. ශ්‍රමණයන්ගේ කර්මයක් නොවේ. ශ්‍රමණයන්ගේ කර්මයක් නොවනබැවින්ම **අකප්පියය**. යම් කර්මයක් ශ්‍රමණයන්ගේ කර්මයක් නොවේද, එය ශ්‍රමණයෝ යමක් කැප නොවෙනම් එය නොකරත්. ඒ මේ අකැපයද තාවිසින් කරනලද්දේය. එහෙයින් **'අනනුවජ්ජියං තෙ මොඝපුරිස කතං -පෙ- අකරණීයං'**යනු වදළ සේක. **'කථං හි නාම'** කිනම් කරුණක් හෙතුකොට කිනම් කරුණක් දක්නේයි වදරණ ලද්දේය. අනතුරුව කාරණයාගේ අභාවය දක්වනසේක් පසුභාගයෙහි **'නනු මයා මොඝපුරිස'**යනාදිය වදළසේක. ඒ සියල්ල කියූ අර්ථ ඇත්තේමය.

දැන් යම් හෙයකින් ඔහුවිසින් යම් පාපකර්මයක් කරන ලද්දේද, ඒ පාපකර්මය පැසෙනුයේ දැඩි දුක්විපාක ඇත්තේද, එහෙයින් ඔහුට ඒ දුක්විපාකය දක්වාලනුපිණිස, කළ අපරාධ ඇති පුතුට අනුකම්පා කරන මවුපියන් මෙන් කරුණා බහුලවූ සිතින් සුදිනනාහට ගරහනසේක් **'වරං තෙ මොඝපුරිස'** යනාදිය වදළසේක. එහි මොහුගේ විෂය වහා වෙගයෙන්

දෂ්ටකරනලද්දහු කරා නැඟ ඒනුයි ආසීවිස නම. මොහුගේ විෂය සොරය, වණඩයයි සොරවිස නම. ඒ ආසීවිස ඇත්තහුගේය. සොරවිස ඇත්තහුගේය. **'පක්කිත්ත**ං'යන මේ පාදයාගේ **'වර**ං'යන මේ පදය හා සම්බන්ධයවේ. මෙබඳු සොරවිස ඇති ආසීවිසයක්හුගේ මුඛයෙහි අඩගජාතය බහාලනලද්දේ උතුම්වේ. ඉදින් බැහුයේ වන්නේනම් එය උතුම්වන්නේය. සොඳුරු වන්නේය. යහපත් වන්නේය. මනා වන්නේය යන අතථියි. **'නත්ථේ'** උතුම් නොවේමය. සොඳුරු නොවේමය. යහපත් නොවේමය. මනා නොවේමය. සියලු තන්හි මේ ක්‍රමයවේ. **'කණ්හසපපස්ස'** කළුනයකුගේ. **'අඩගාරකාසුයා'** අඟුරින් පිරුණු වළෙක. අඟුරු රැසෙක හෝ **'ආදිත්තාය'** තදින් ඇවිළගත්. ගන්නාලද ගිනි පැහැති **'සම්පජ්ජලිතාය'** හාත්පසින් තදින් දැල්වෙන. ගිනිදැල් මුදන. **'සජොතිභූතාය'** ප්‍රභාසහිතවූ හාත්පසින් නැගුනු ගිනිදලින් එක්ම ගිනිදැල් සමූහයක්වූයි කියනලද්දේවේ. **'තං කිස්ස හෙතු'** මාවිසින් උතුම්යි යමක් කියනලදද, එය කුමක් හෙතුකොට කවර කරුණකින්දයත්: **'මරණං වා නිගච්ඡෙය්‍ය'** යමෙක් එහි අඩගජාතය බහන්නේද, හෙතෙමේ මරණයට හෝ පැමිණෙන්නේය. **'ඉතෝ නිදානඤ්ච ඛෝ -පෙ- උපපජ්ජෙය්‍ය'** මාගමකගේ අඩගජාතයෙහි යම් මේ අඩගජාතය බැහීමක්වේද, මේ හෙතුකොට ඒ පාපකර්ම කළ පුද්ගලතෙමේ නිරයෙහි උපදින්නේය. මෙසේ මේ කර්මයාගේ මහාසාවද්‍යභාවය දක්නාසේක් ඔහුට ගැරහුසේක. ඔහුට දුක් ඉපදවීම කැමතිවෙමින් මේ ගැරහීම නොකළසේක.

'කත්‍ථ නාම ත්වං' මෙසේ මහාසාවද්‍යවූ ඒ මෙබඳු කර්මයෙහිද තෝ. **'යං ත්වං'**යන මෙහි **'යං'**යනු නිඳැත්තීයෙහි නිපාතයි. **ත්වං**යනු **තං** ශබ්දයාගේ වෙවචනයි. යං කියා හෝ තං කියා යන දෙකින්ම හෝ ගැරහීමවේ. ලාමකකොට දන්නාලද්දේය'යි වදරණ ලද්දේය. **'අසද්ධම්මං'** නොසන්සුන්වූ නීචජනයන්ගේ ධර්මයෙකි. ඒ නීචජනයන්විසින් සෙවියයුතුය යනඅතථියි. **'ගාමධම්මෝ'** ගම්වැස්සන්ගේ ධර්මයෙකි. ගම්වැසි මිනිසුන්ගේ ධර්මයයි වදරණලද්දේවේ. **'වසලධම්මං'** පාපධර්ම වස්වති, වගුරුවතියි වසලයහ. ඒ වසල ලාමක පුරුෂයන්ගේ ධර්මයකි. වසලවූ හෝ කෙලෙස් වගුරණ ධර්මයකි. **'දුට්ඨුල්ලං'** දුෂ්ටදවේ. කෙලෙසුන් ගෙන් තදින් දූෂිතදවේ. තරදවේ. නොසියුම්දවේ. අනිපුණුදයි වදරණුලදය. **'ඔදකන්තිකං'** දියකිස මෙයට කෙළවරය. අන්තිකය. අවසානයි ඔදකන්තික නම්. ඒ ඔදකන්තිකය. **'රහස්සං'** රහස්හි වන. පිළිසන් අවකාශයෙහි උපදින. මේ ධර්මයවනාහි පිළිකුල්කටයුතුබැවින් ප්‍රකටව අන්හුගේ ඇස් හමුවෙහි කරන්නට නොහැක්කේය. **'රහස්සං'**යි එහෙයින් වදරණුලදී. **'ද්වයං ද්වයසමාපත්තිං'** දෙදෙනෙකු දෙදෙනෙකුවිසින් පැමිණියයුතුය. **'ද්වයං ද්වයං සමාපත්තිං'**යිද

පාඨයක්වේ. **'දයං දයසමාපත්තිං'**යිද හදරත්. එය නොමැනවි. **'සමාපජ්ජිස්සති'**යන මෙය **'තඤ්ච නාම ත්වං'**යි මෙහි කියූ නාම ශබ්දය සමග **'සමාපජ්ජිස්සති නාම'**යි යෙදියයුතුය.

'බහුන්නං ඛෝ - පෙ- ආදිකත්තා පුබ්බඞ්ගමෝ'යනු ශාසනය සඳහා වදරණසේක. 'තෝ මේ ශාසනයෙහි බොහෝ පුද්ගලයන්ගේ අකුශල ධර්මයන්ට ආදිකර්‍ෂී වෙහිය. සියල්ලන්ට පළමුකොට කිරීමෙන් පූර්‍වඞ්ගම වෙහිය. සියල්ලන්ට පළමුකොට මේ මගට පිළිපන්බැවින් දෙර ඇරදුන්නේ වෙහිය. උපාය දක්වූයේ වෙහියයි වදරණලද්දේය. මේ මදඉඩක් ලැබ තට අනුව හික්මෙන බොහෝ පුද්ගලයෝ නන්වැදරුම්වූ වැඳිරියක හා මෙවුන්දම් යෙවුම් ආදීවූ අකුශලධර්මයන් කරන්නාහයනු මෙහි අදහසවේ. **'අනෙකපරියායෙන' 'අනනුච්ඡවියං'** යනාදි ක්‍රමයෙන් කියූ බොහෝ කරුණුවලිනි.

'දුභරතාය -පෙ- කොසජ්ජස්ස අවණ්ණං භාසිත්වා' දුර්භරභාවාදියට වසඟවූ අසංවරයාගේ නොපැසසීම -නිඳුව - ගැරහීම වදරා යන අර්‍ථයි. යම්හෙයකින් අසංවරයෙහි සිටි පුද්ගලයාගේ සිත දුක සේ ඉසිලියයුතුබවට හා දුකසේ පෝෂණය කළයුතුබවට පැමිණේද, එහෙයින් අසංවරය **දුභරතා - දුප්පොසත්තායි** කියනුලැබේ. යම්හෙයකින්වනාහි අසංවරයෙහි සිටියහුගේ සිත සිවුපසයෙහි මහත් ආශා ඇතිබවට මහමෙර තරම් සිවුපසය ලබාද නොසතුටුබවට පැමිණේද, එහෙයින් අසංවරය **මහිච්ඡතා අසන්තුට්ඨිතායි** කියනුලැබේ. යම්හෙයකින් අසංවරයෙහි සිටියහුගේ සිත ගණයා හා එක්වීමෙහිද කෙලෙසුන් හා එක්වීමෙහිද රැඳීසිටීද කුසීත භාවයට අනුව ගියේවේද, කුසීතභාවයට කරුණුවූ අෂ්ටකුසීත වසනූන් පිරීමෙහි පවත්නේද එහෙයින් අසංවරය **සඞ්ගණිකාකොසජ්ජයි** කියනුලැබේ.

'සුභරතාය -පෙ- විරියාරම්භස්ස වණ්ණං භාසිත්වා' සුභරභාවාදියට වසඟවූ සංවරයාගේ ගුණ වදරා යනඅර්‍ථයි. යම්හෙයකින් අසංවරය හැරපියා සංවරයෙහි සිටි පුද්ගලයාගේ සිත සුවසේ ඉසිලියහැකිවේද, සුවසේ පෝෂණය කළහැකිවේද, සිවුපසයෙහි අලෙවිය භාවයට තෘෂ්ණාරහිතභාවයට පැමිණේද, එක් එක් ප්‍රත්‍යයයෙහි යථාලාභ - යථාබල - යථාසාරුප්පවසයෙන් තෙවැදරුම්වූ භෙදඇති සන්තුෂ්ටියෙහි පවත්නේද, එහෙයින් සංවරය සුභරතාය, සුපෝසතාය, අපිච්ඡය - සන්තුට්ඨියි කියනුලැබේ. යම්හෙයකින්වනාහි අසංවරය හැරපියා සංවරයෙහි සිටියහුගේ සිත කෙලෙස් කපාලීමෙහි හා කෙලෙස් කම්පනයෙහි පවත්නේද, එහෙයින් සංවරය **සල්ලේඛ** යිද **ධූත** යිදයි කියනුලැබේ. යම්හෙයකින්

අසංවරය හැරපියා සංවරයෙහි සිටියහුගේ සිත කය වචන පිළිබඳ නොපැහැදුම් එළවන නොපැහැදුමට කරුණුවූ අශාන්තවූ අසාරුප්‍යවූ කාය වාග් දුශ්චරිතයටද, සිතෙහි නොපැහැදුම් එළවන නොපැහැදුමට කරුණුවූ අශාන්තවූ අසාරුප්‍ය වූ කාම - ව්‍යාපාද - විහිංසා යන අකුශල විතර්කතුණට ද නොපැමිණ. තත් විපරීතවූ පැහැදුම් එළවන පැහැදුමට කරුණුවූ ශාන්තවූ සාරුප්‍යවූ කායවාක් සුචරිතයාගේද, නෛෂ්ක්‍රම්‍ය - අව්‍යාපාද - අවිහිංසා යන කුශල විතර්ක තුණෙහි පාරිපූරිය පිණිසපවතීද, එහෙයින් සංවරය **පාසාදිකයි** කියනුලැබේ. යම් හෙයකින්වනාහි අසංවරය හැරපියා සංවරයෙහි සිටියහුගේ සිත රාගාදි සියලු කෙලෙසුන්ගේ නොවැඩීමට හේතුවූ නිර්ණාධාතුවපිණිසද, අටවැදරුම්වූ වීර්‍යාරම්භවස්තූන්ගේ පරිපූර්ණත්වයපිණිසද පවත්නේද, එහෙයින් **අපචය යි ද විරියාරම්භ යි ද** කියනුලැබේ.

'භික්ඛූනං තදනුච්ඡවිකං තදනුලොමිකං' එහි රැස්වූ භික්ෂූන්ට දන් යම් ශික්ෂාපදයක් පණවනසේක්නම්, එයට සුදුසුවූද අනුලොම්වූද සුභරතාදිය හෙතුකොට යම් සංවරයක් කියනලදද, එයට සුදුසුවූද අනුලොම්වූද පංචවිධ සංවරයෙන් හා පංචවිධ ප්‍රහාණයෙන් යුක්තවූ සූත්‍රාන්තයෙහි නොබැඳුනු විනයපාළියට නොනැගූ නුවණින් පිවිස අතරදී කියනුලබන ධර්මදේශනාව කොට යනඅර්ථයි. භාග්‍යවතුන්වහන්සේ මෙබඳු තන්හි 'මෙයින් කම් කිමැ'යි ප්‍රතික්ෂේපයෙහි අදහස් ඇති අසංවරයෙහි ඇලීගත් යම්කෙනෙක්වෙත්ද, ඔවුන් පරලොවෙහි වන සසර බියෙන් තැතිගන්වමින් තන්වැදරුම්වූ ආදීනව දක්වමින් ශික්ෂාකාමීවූ සංවරයෙහි පිහිටි යම්කෙනෙක් වෙත්ද ඔවුන් සමහර කෙනෙකුන් අර්හත්වයෙහි, සමහර කෙනකුන් අනාගාම්ඵලයෙහි, සමහර කෙනෙකුන් සකෘදගාම්ඵලයෙහි, සමහර කෙනෙකුන් සොතාපත්තිඵලයෙහි පිහිටුවමින් හෙතුසම්පත්තියෙන් තොරවූවන් සද්ධර්මාගීයෙහි පිහිටුවමින් පස්පැහැති මල්මාලාවක්කරන්නකු සේ රුවන්දමක් සරසන්නෙකුසේ **දීඝනිකාය** පමණවූද **මජ්ඣිමනිකාය** පමණවූද ධර්මදේශනා කරනසේක. **'භික්ඛූනං තදනුච්ඡවිකං තදනුලොමිකං ධම්මං කථා කත්වා'**යනු ඒ සඳහා මෙය වදරනලද්දේය.

'ඤාතහි' සුදින්නගේ ඒ කාරණහුතවූ අද්ධ්‍යාචාරයෙන්. **'සික්ඛාපදං'** මෙහි හික්මියයුතුනුයි සික්ඛානම්. මේ කරණකොට පැමිණේනුයි පදනම්. ශික්ෂාවෙහි පදය ශික්ෂාපදයයි. ශික්ෂාධිගමයෙහි උපාය යනඅර්ථයි. තවද මූලය, නිශ්‍රය, ප්‍රතිෂ්ඨායි කියනලද්දේවේ. මෛථුනවිරතියට මෛථුනසංවරයට මේ නමකි. මෛථුන සංවරයවනාහි එයින් අන්‍යවූ ශික්ෂාපද සඞ්ඛ්‍යාතවූ ශීල විදර්ශනාධ්‍යාන මාර්ගඵලයන්ට කියූ අර්ථවශයෙන් පදබැවින් මෙහි ශික්ෂාපදයි අදහස්කරනලද්දේය. මේ අර්ථය පැහැදිලිකරන

වචනයද ශික්ෂාපදයි දතයුතුය. 'ශික්ෂාපද'යනු එහි යම් නාම සමූහයක්වේද පද සමූහයක්වේද නිරුක්ති සමූහයක්වේද ව්‍යඤ්ජන සමූහයක්වේද හේයයි මෙ ද කියනලද්දේය. නොහොත් යම් සේ අනභිධ්‍යා තොමෝ එක් ධම්පදයකැයි කියූකල්හි අනභිධ්‍යා තොමෝ එක් ධම් කොට්ඨාසයෙකැයි යන අර්ථයවේද එසේ මෙහිද ශික්ෂාපදයනු ශික්ෂාකොට්ඨාසයක ශික්ෂාවෙහි එක් ප්‍රදෙශයකැයිද අර්ථය දතයුතුය.

'දස අත්ථවසෙ පටිච්ච' ශික්ෂාපද පැණවීමට කරුණුවූ අවබොධකටයුතු හිතවිශෙෂවූ දස කරුණක් නිසා එයට පැමිණ එය ඇරැබූ දසවැදරුම්වූ හිත විශෙෂයන්ගේ නිෂ්පත්තිය දකිමින් වදරණලද්දේවේ. දැන් ඒ දස කරුණ දක්වනසේක් **'සඞ්ඝසුට්ඨුතාය'** යනාදිය වදළසේක.

එහි සඞ්ඝසුට්ඨුතානම් සඞ්ඝයාගේ යහපත්බවයි. 'සුට්ඨු දෙව'යි ආතන්හි මෙන් 'මැනව සාමීනි'යි වදන් පිළිගන්නාබවය. යමෙක් තථාගතයන්වහන්සේගේ වචනය පිළිගණීද ඔහුට ඒ පිළිගැණීම බොහෝකලක් මුළුල්ලෙහි හිතපිණිස සැපපිණිස වන්නේය. එහෙයින් සඞ්ඝයාහට 'මැනව සාමීනි'යි මාගේ වචන පිළිගැණීම්පිණිස නොපිළිගැණීමෙහි ආදීනවය හා පිළිගැණීමෙහි ආනිසංස දක්වා පණවන්නෙමි. බලාත්කාරයෙන් මැඩලා නොපණවන්නෙමියි යන මේ අර්ථය ප්‍රකට කරනසේක් **'සඞ්ඝසුට්ඨුතාය'**යනු වදළසේක. **'සඞ්ඝ ඵාසුතාය'** සඞ්ඝයාගේ පහසුවපිණිස, ජීවිතය පිළිබඳ සුඛවිහරණයපිණිසවේයනු අර්ථයි.

'දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය' දුම්මඞ්කූනුනම් දුශ්ශීල පුද්ගලයෝය. යම් කෙනෙක් මකුබවට පැමිණෙන්නෝද, දුකින් පැමිණෙත්ද, ව්‍යතික්‍රම කරන්නෝ හෝ ව්‍යතික්‍රම කොට හෝ ලජ්ජිත නොවෙත්ද, ඔවුන්ට නිග්‍රහයපිණිස. ඔවිහු ශික්ෂාපද නැතිකල්හි 'තොපවිසින් කුමක් දක්නාලදද, කුමක් අසනලදද: අපවිසින් කුමක් කරණුලදද: කවර වස්තුවක් නිමිත්තිකොට කවරනම් ඇවැතක් නගා අපට නිග්‍රහකරවුද'යි සඞ්ඝයා වෙහෙස කරන්නාහ. ශික්ෂාපද පණවා ඇතිකල්හි සඞ්ඝයා ශික්ෂාපද දක්වා ධම්යෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් ඔවුනට නිග්‍රහකරන්නේය. **'දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය'**යනු එහෙයින් වදරණලද්දේය.

'පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය' යහපත් සොඳුරුවූ ප්‍රියශීලි භික්ෂූන්ගේ පහසුවිහරණයපිණිස. ප්‍රියශීලි භික්ෂූහු කටයුත්ත නොකටයුත්ත සාවද්‍යය අනවද්‍යය කාලය සීමාව නොදන්නාහු ශික්ෂාත්‍රය පරිපූරණයෙහි ගැටෙන්නාහු කලාතතවෙත්. සැකයට පැමිණෙන්නාහු දැඩිසේ පෙළුනෝ වෙත්. කටයුත්ත නොකටයුත්ත සාවද්‍යය අනවද්‍යය කාලය සීමාව දැන

ශික්ෂාත්‍රය පරිපූරණයෙහි ගැටෙන්නාහු වෙහෙසට පත්නොවෙත්. සැකයට පැමිණියාහු නොපෙළෙන්නාහු වෙත්. එයින් සිකපද පැණවීම ඔවුනට පහසුවිහරණයපිණිස පවත්නේය. දුශ්ශීල පුදගලයන්ට යම් නිග්‍රහයක් වේද, එයම මොවුන්ට පහසු විහරණය වේ. දුශ්ශීල පුද්ගලයන් නිසා උපොසථය නොසිටියි. පවාරණය නොසිටියි. සඞ්ඝකර්මයෝ නොපවතිත් සාමග්‍රීභාවය නොවේ. එකහනොවූ සිත්ඇති භික්ෂූහු උදෙසීම් පිළිවිසීම් කමටහන් වැඩීම් ආදියෙහි යෙදෙන්නට අසමර්ථවෙත්. දුශ්ශීලයන්ට නිග්‍රහ කළකල්හි මේ සියලු උවදුරු මගහැරී යන්නේය. එකල්හි ප්‍රියශීලි භික්ෂූහු සැපසේ වාසයකරත්. මෙසේ **'පෙසලානං භික්ඛුනං ඵාසුවිහාරාය'**යන මෙහි දෙපරිද්දෙකින් අර්ථ දතයුතුය.

'දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය' දෘෂ්ටධාර්මික ආස්‍රවයෝ නම්: අසංවරයෙහි සිටියහුවිසින් ඒ අත්බවෙහිම පැමිණියයුතුවූ හස්තප්‍රහාර දණ්ඩප්‍රහාර හස්තවෙඡ්ද පාදවෙඡ්ද අකීර්ති නින්ද විප්‍රතිසාරාදීවූ දුඃඛවිශෙෂයෝය. මෙසේ මේ ඉහාතමභාවයෙහිවූ ආස්‍රවයන්ගේ සංවරයපිණිස වැසීමපිණිස පැමිණෙන මග වැසීමපිණිසය යනඅර්ථයි.

'සම්පරායිකානං ආසවානං පටිඝාතාය' සාම්පරායික ආස්‍රවයෝ නම්: අසංවරයෙහි පිහිටියහු විසින් කරණලද පවිකම් මුල්කොටඇති පරලෝවිහි නිරයාදියෙහි පැමිණියයුතු දුඃඛවිශෙෂයෝය. ඔවුන් නැසීමපිණිස සන්සිඳවීමපිණිස ව්‍යුපශමනයපිණිසයයි කියනලද්දේවේ.

'අප්පසන්නානං පසාදය' ශික්ෂාපද පැනවීම ඇතිකල්හි ශික්ෂාපද පැනවීම දැන හෝ පැනවූ පරිදි පිළිපදින්නාවූ භික්ෂූන් දැක හෝ නොපහන් යම් තුවණැති මනුෂ්‍යයෝ වෙත්ද, ඔවුහු ලොකයෙහි මහාජනයා ඇලෙන ගැටෙන මුළාවන යම් කරුණුවේද, ඒ කරුණුවලින් මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ එකාන්තයෙන් දුරුවූවාහු, වෙන්වූවාහු වාසය කරති. කළනොහැක්කක් කරන්නාහුය. බැරෑරුම් වැඩක් කරත්'යි විනය පිටකයෙහි පොතක් දැක මිථ්‍යාදෘෂ්ටික ත්‍රිවේදී බ්‍රාහ්මණයාමෙන් ප්‍රසාදයට පැමිණෙත්. **'අප්පසන්නානං වා පසාදය'**යනු එහෙයින් වදරණලදී.

'පසන්නානං භීයෝභාවාය' ශාසනයෙහි පහන්වූ යම් කුලපුත්‍රයෝවෙත්ද ඔවුහුද ශික්ෂාපද පැනවීම දැන හෝ පැනවූ පරිදි පිළිපදින්නාවූ භික්ෂූන් දැක හෝ 'යම් කෙනෙක් දිවිහිමිකොට එක් බතක් වැළඳීම, බඹසර හැසිරීම, විනයයෙහි හික්මීම, එක්වන් රකිත්ද, ඒ පුදුමය, ඒ මේ ආයුෂ්මයෝ නොකොටහැකි ක්‍රියා කරන සුල්ලහ'යි වඩ වඩාත් පහදින්. **'පසන්නානං භීයෝභාවාය'**යනු එහෙයින් වදරණලදී.

'සද්ධම්මට්ඨිතියා' පයිාපතිසද්ධම් - ප්‍රතිපත්තිසද්ධම් - අධිගමසද්ධම්යි සද්ධම්ය තෙවැදෑරුම්වේ. එහි ත්‍රිපිටකයෙහි සඞ්ග්‍රහකළ සියලුම බුද්ධවචනය පයිාපතිසද්ධම්නම්. තෙළෙස් දුහඟගුණ - තුදුස් කඳුවත් - දෙයසූ මහවත් හා ශීල සමාධි විදර්ශනා යන මෙය ප්‍රතිපත්ති සද්ධම්නම්. චතුර්විධ ආයිාමාර්ග - චතුර්විධ ශ්‍රාමණ්‍යඵල - නිර්වාණයන මෙය අධිගමසද්ධම්නම්. යම්හෙයකින් ශික්ෂාපද පැණවීම ඇතිකල්හි භික්ෂූහු ශික්ෂාපදද ඒ ශික්ෂාපදයන්ගේ විභඞ්ගයද එහි අරුත් පවසනුපිණිස අන්‍යවූ බුද්ධවචනද පුහුණු කෙරෙත්ද, පැණවූපරිදි පිළිපදින්නාහු පිළිවෙත් පුරා පිළිවෙතින් පැමිණියයුතුවූ ලොකොත්තර ධර්මයට පැමිණෙත්ද එහෙයින් ඒ සියලුම සද්ධර්ම ශික්ෂාපද පැණවීම්හෙතුවෙන් බොහෝකල් පවත්නේවේ. 'සද්ධම්මට්ඨිතියා'යනු එහෙයින් වදරණලදී.

'විනයානුග්ගහාය' ශික්ෂාපද පැනවීම ඇතිකල්හි සංවරවිනයද, පහාණවිනයද, සමථවිනයද, පඤ්ඤත්තිවිනයද යන සිවුවැදෑරුම්වූ විනය අනුග්‍රහ කරනලද්දේවේ. රුකුල් දෙනලද්දේවේ. බලවත්සේ රුකුල් දෙනලද්දේවේ. **'විනයානුග්ගහාය'** යනු එහෙයින් වදරණලදී.

මේ සියලුම පද **'සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි'**යන මේවචනය සමග යොදගතයුතුය. එහි **'සඞ්ඝසුට්ඨුතාය සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි, විනයානුග්ගහාය සික්ඛාපදං පඤ්ඤපෙසසාමි** යනමෙය ප්‍රථම පශ්චිමපදයොජනාය. තවද, මෙහි අනෙකුදු ඇත්තේය. **'යං සඞ්ඝසුට්ඨු, තං සඞ්ඝඵාසු, යං සඞ්ඝඵාසු, තං දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය'**යි මෙසේ සඞ්ඛලිකනයවේ. මෙය **'යං සඞ්ඝසුට්ඨු, තං සඞ්ඝඵාසු, යං සඞ්ඝඵාසු, තං දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය'**යි මෙසේද එක් එක් පදය මුල්කොට දසවරක් යොද පරිවාරයෙහි:

'අට්ඨසතං ධම්මසතං - දෙ ව නිරුත්තිසතානි,
චත්තාරි ච ඤාණසතානි - අට්ඨවසෙ පකරණෙ'

අට්ඨවිශෙෂප්‍රකරණයෙහි 'අට්ඨ සියයක, ධම් සියයක, නිරුක්ති දෙසියක, ඤාණසාර සියයෙකැයි යමක් කියනලද්දේද ඒ සියල්ල දතයුතුය. ඒ මේ විස්තරය යම්හෙයකින් පරිවාරයෙහි පහළවන්නේද එහෙයින් මෙහි වණිනා නොකරනලද්දේය.

මෙසේ ශික්ෂාපද පැනවීමෙහි අනුසස් වදරා, ඒ ශික්ෂාපදයෙහි භික්ෂූන්විසින් කළයුතු කිස දක්වනසේක් **'එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ'**යි වදළසේක. කුමක් වදරණලද්දේවේද යත්: 'මහණෙනි! මාවිසින් මෙසේ දක්වනලද අනුසස් ඇති මේ ශික්ෂාපදය,

මෙසේ ප්‍රාතිමොක්ෂාදෙශයෙහිදී උදෙසවූ, පුහුණුද කරවූ, දැරීමද කරවූ, අන්හටද කියවූ'යි වදරණලද්දේවේ. මෙහි 'වූ' ශබ්දය අතිරෙකාත්ථියක් ගෙන ඊම අත්ථිකොට සිටියේය. එහෙයින් මේ අත්ථිය පමුණුවන ලද්දේවේ.

දැන් **'ඉමං සික්ඛාපදං'**යි යමක් වදරණලද්දේද, එය දක්වනසේක් **'යො පන භික්ඛු මෙථුනං ධම්මං පතිසෙවෙය්‍ය පාරාජිකො හොති අසංවාසො'**යනු වදළසේක.

මෙසේ මූලවෙජ්ජ්‍යවශයෙන් දැඩිකොට ප්‍රථමපාරාජිකාව පැනවූනකල්හි අන්‍යවූද අනුප්‍රඥප්තියපිණිස මක්කටීවත්‍ථුව පහළවූයේය. ඒ මක්කටීවත්‍ථුවෙහි උත්පත්තිය දක්වනුපිණිස **'එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති'**යි මෙය වදරණලද්දේය. එහි අත්ථිය මෙසේය: භාග්‍යවතුන්වහන්සේවිසින් භික්ෂූන්ට මේ ශික්ෂාපදය පනවනලද්දේය. මෙසේ පනවනලද්දේදැයි මේ අන්‍යවත්‍ථුවක්ද පහළවූයේයයි

ප්‍රථම ප්‍රඥප්ති කථාව නිමි

——\\——

දැන් යම් ඒ උපන් අන්‍යවස්තුව දක්වනුපිණිස **'තෙන ඛො පන සමයෙන'** යනාදිය වදාළසේක. එහි මේ ප්‍රකට නොවූ පදයන්ගේ වණ්ණනාය: **'මක්කටිං ආමිසෙන'** මහාවනයෙහි විසූ භික්ෂූන්ගේ ක්ෂාන්ති, මෛත්‍රී ආදී ගුණයන්ගේ ආනුභාවයෙන් නිසැක සිත්ඇති බොහෝ මුව, මොනර, කුකුළු, වඳුරුආදී තිරිසන්නු භාවනාකරන ගෘහසථානයන්හි හැසිරෙන්නාහ. එහි එක් වැදිරියක කැඳ, බත්, කැවිලිආදීවූ ආමිෂයෙන් **'උපලාපෙත්වා'** සඩ්ග්‍රහ කොටයි වදරණලද්දේවේ. **'තස්සා'**යනු සප්තමී වචනයි. **'පතිසෙවති'** බහුලවූ සෙවනයකිරීම් ඇත්තේවේ. දවස්පතා නිතර නිතර සෙවනය කරයි. ප්‍රවුරාත්තියෙහි වර්තමාන වචනයි. **'සො භික්ඛු'** මෙවුන්දම් සෙවුමෙහි යෙදුනු ඒ මහණතෙමේ **'සෙනාසනචාරිකං ආගිණ්ඩන්තා'** ඒ ආගන්තුක භික්ෂූහු බුදුරජුන් දකිනුපිණිස පැමිණියාහු, උදෑසනම ආගන්තුකබත් ලැබ කළ බත්කිස ඇත්තාහු, 'භික්ෂූන් වසන තැන් බලන්නෙමු'යි ඒ ඒ තැන හැසුරුනාහ. **'සෙනාසනචාරිකං ආගිණ්ඩන්තා'**යනු එහෙයින් වදරණලද්දේය. **'යෙන තෙ භික්ඛු තෙනුපසඞ්කමි'** එක් මහණෙකු සමග විශ්වාසයට පැමිණියාහු අන්හු කෙරෙහිද එබදුම සිත් උපදවත්. එහෙයින් ඒ වැදිරිය ඒ ආගන්තුක භික්ෂූන්වෙත එළැඹියාය. එළඹද තමන්ගේ විශ්වාසයට පැමිණුසිටි මහණහුටමෙන් ඒ ආගන්තුක භික්ෂූනටද ඒ විකාරය දක්වූය. **'ඡෙපං'** නගුට **'ඔඩ්ඩි'** ඉදිරිපත්කොට තැබූය. **'නිමිත්තම්පි අකාසි'** ඒ භික්ෂූහු යම්ලෙසකින් යම් ක්‍රියාවකින් මෙවුන්දම් සෙවීමෙහි අදහස දනගනිත්ද, ඒ ලෙසින් නිමිති කළාය යනඅර්ථයි. **'සො භික්ඛු'** මේ විභාරය යමක්හුගේද ඒ මහණතෙමේ. **'එකමන්තං නිලීයිංසු'** එක් අඩකාශයෙක්හි සැඟවිහුන්හ. **'සච්චං ආවුසො'** බඩුසහිතව අල්ලාගත් සොරහුමෙන් ප්‍රත්‍යක්ෂයෙන් දක වොදනා කළබැවින් 'මාවිසින් කුමක් කරනලදද'යි යනාදිය කියන්නට නොහැකිව 'ඇවැත්නි! සැබැව්'යි කීයේ ය. **'න නු ආවුසො තථෙව තං හොති'** ඇවත! ඒ ශික්ෂාපදය මනුෂ්‍යස්ත්‍රියක විෂයයෙහි යම්සේනම් තිරශ්චීනස්ත්‍රිය විෂයයෙහිද එසේම නොවේද? මනුෂ්‍යස්ත්‍රියකගේ අනුරාග සහිත දකීමද අනුරාගයෙන් අතින් ඇල්ලීමද තම සිරුරෙන් ඇයගේ සිරුර පිරිමැදීමද එයට වඩා දැඩිකොට පැහැසීමද සිරුරෙන් සිරුර ගැවීමද දුටුවුලලමවේ. තිරශ්චීනස්ත්‍රියක පිළිබඳවූද ඒ සියල්ල දුටුවුලලමය. මෙහි විශෙෂය කවරේද? තෝ අලෙශසථානයෙහි ලෙශයක් අභිමුඛකොට තැබූයෙහිය.

'අත්තකමසො තිරච්ඡානගතාය පි පාරාජිකො හොති අසංවාසො'යි මෙසේ තිරිසන්ගියක හාද මෙවුන්දම් සෙවුමෙන් පාරාජිකම වේයයි ශික්ෂාපදය ඉතා දැඩි කළසේක.

ලොකවජ්ජ - ප්‍රඥප්තිවජ්ජයි ශික්ෂාපදය දෙවැදරුම්වේ. එහි සචිත්තකපක්ෂයෙහි යමක්හුගේ සිත අකුසල්මවේද, එය ලොකවජ්ජනම්වේ. සෙස්ස ප්‍රඥප්තිවජ්ජයය. එහි ලොකවජ්ජයෙහි අනුප්‍රඥප්ති උපදනී ව්‍යතික්‍රමය වළකාලන්නී ව්‍යතික්‍රමලෙශයාගේ දෙර වසාලන්නී, ව්‍යතික්‍රම ප්‍රොතස සිදලන්නී **'අසඤ්ඤත්‍ර අධිමානා අසඤ්ඤත්‍ර සුපිනන්තා'** යනුවිසින් ඉතා දැඩිකරමින් උපදියි. **'අසඤ්ඤත්‍ර අධිමානා අසඤ්ඤත්‍ර සුපිනන්තා'** යනමෙය ව්‍යතික්‍රමයක් නැතිබැවින් හා ව්‍යවහාරයට නොනැගෙනබැවින් වදරණුලද්දීය. ප්‍රඥප්තිවජ්ජයෙහි ව්‍යතික්‍රමය නොකළකල්හි උපදින්නී, පළමුකොට සාමාන්‍යයෙන් පැනවූ ශික්ෂාපදය මුදහැර තමාගේ විෂයයෙහි අනාපත්තිකිරීම්වසයෙන් ලිහිල්කරන්නී මුදහරින්නී අනාපත්තියට දෙර දෙන්නී ගණ භොජන - පරම්පරභොජනාදියෙහි අනුප්‍රඥප්තීන් මෙන් අපරාපයඃවිශයෙන් අනාපත්තිකරමින් උපදියි. **'අන්තමසො තඩ්ඩණිකායපි'**යි මෙබඳුවූවා වනාහි ව්‍යතික්‍රමය කළකල්හි උපන්බැවින් මුළු ප්‍රඥප්තියෙහිම ඇතුළත්වූවාවේ. ප්‍රඥප්තිගතිකමවේ.

යම්හෙයකින් මේ ප්‍රථම ශික්ෂාපදය ලොකවජ්ජවේද, ප්‍රඥප්තිවජ්ජනොවේද, එහෙයින් මේ අනුප්‍රඥප්ති ව්‍යතික්‍රමය වළකාලන්නී ව්‍යතික්‍රමදෙෂයාගේ දෙර වසාලන්නී මතුමතුවෙහි ව්‍යතික්‍රම ප්‍රොතස සිදලන්නී ඉතා දැඩිකරමින් උපන්නීය. මෙසේ වසතු දෙකක්ම සම්පිණ්ඩනයකොට මුල්සිදීම්වසයෙන් ඉතා දැඩිකොට ප්‍රථමපාරාජිකය පැනවූ කල්හිද, අනුප්‍රඥප්තියක්පිණිස අන්‍යවූද වජ්ජීපුත්‍රක වසතුව උපන්නේය. ඒ වසතුවෙහි උත්පත්තිය දක්වනුපිණිස **'එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති'**යන මෙය වදරණුලද්දේය. භාග්‍යවතුන්වහන්සේවිසින් භික්ෂූන්ට මේ ශික්ෂාපදය මෙසේ පනවනලද්දේවේද මේ අන්‍ය වසතුවකුදු උපන්නේය යනු එහි අර්ථයවේ.

මක්කටීවසතු කථාව නිමි

—\\—

යම් ඒ අන්‍යවසතුවකුත් උපන්නේද, දැන් එය දක්වන්නට **'තෙන ඛො පන සමයෙන'**යනාදිය වදළසේක. එහිදු මේ අප්‍රකට පදයන්ගේ වණ්ණනාය: **'වෙසාලිකා'** විසල්පුර වැසි. **'වජ්ජිපුත්තකා'** වැදරට වෙසාලියෙහි කුලපුත්‍රයෝ. මේ ශාසනයෙහි යම් යම් උපද්‍රවයක් ආදීනවයක් අර්බුදයක් උපන්නේද, ඒ සියල්ල වජ්ජිපුත්‍රයන් නිසා උපන්නේය. ඒ එසේමය. **දෙවදත්ත** තෙමේද වජ්ජිපුත්‍රකපක්ෂය ලැබ සඞ්ඝයා බින්දේය. වජ්ජිපුත්‍රකයෝම භාග්‍යවතුන්වහන්සේගේ පිරිනිවීමෙන් අවුරුදු සියයක් ගෙවීගියකල්හි

ශාස්තෘශාසනය ධර්මයෙන් විනයෙන් පහවූවක්කොට දක්වූහ. මොවුහුද ඔවුන්ගේම ඇතැම්හුවෙති.

මෙසේ ශික්ෂාපදය පැනවූ කල්හිද **'යාවදත්ථං නහායිංසු -පෙ- මෙථුනං ධම්මං පතිසෙවිංසු'** කැමතිතාක් සානාය කළහ. -පෙ- මෙවුන්දම් සෙවනය කළහ. **'ඤත්තිඛ්‍යසනෙනපි'** මෙහි අසන - ව්‍යසන - විකෙප - විඛංසන - විනාශයන මේ සියල්ල එකාර්ථවත්වේ. ඤතීන්ගේ ව්‍යසනය ඤතිව්‍යසන නම්වේ. ඒ ඤතිව්‍යසනයෙන්. රාජදණ්ඩ - ව්‍යාධි - මරණ විප්‍රවාස යන මොවුන්ගේ හෙතුවෙන්වූ ඤතිව්‍යසනයෙන් යන අර්ථයි. දෙවන පදයෙහිද මේ ක්‍රමයවේ. තෙවන පදයෙහි ආරොග්‍යය නසන රොගයම රොගව්‍යසනනම්. ඒ රොගය ආරොග්‍යය වනසන්නේය. විසුරුවන්නේය. විනාශකරන්නේනුයි ව්‍යසනනම්. රොගයම බ්‍යසනනුයි රොගව්‍යසන නම්වේ. ඒ රොගව්‍යසනයෙන්. **'දුට්ඨා'** පීඩාවට පැමිණියහ. මඩින ලද්දහ. යුක්තයහ යනඅර්ථයි.

'න මයං භන්තෙ ආනන්ද බුද්ධගරහිනෝ' ස්වාමීනි! ආනන්ද සථවිරයන්වහන්ස! අපි බුදුරජානන්වහන්සේට නොගරහමු. බුදුරජානන්වහන්සේට දෙස් නොකියමු. **'න ධම්මගරහිනෝ න සඞ්ඝ ගරහිනෝ අත්තගරහිනෝ මයං'** අපි ධර්මයට නොගරහන්නමෝය. සඞ්ඝයාට නොගරහන්නමෝය. තමන්ටම ගරහන්නමෝය. තමන්ගේම දෙස් කියන්නෙමු. **'අලක්ඛිකා'** නිශ්‍රීකයෝවම්හ **'අපපඤ්ඤා'** මද පිණැත්තෝවම්හ. **'විපස්සකා කුසලානං ධම්මානං'** අටතිස් අරමුණෙහිලා බෙදූ ප්‍රථමද්‍යානාදීවූ යම් කුශල ධර්මයෝවෙත්ද, ඒ ධර්මයන් විදර්ශනා කරන්නමෝය. ඒ ඒ අරමුණෙන් නැගිට ඒ ධර්මයන්ම විශෙෂයෙන් දක්නමෝය, යනඅර්ථයි.

'පුබ්බරත්තාපරරත්තං' රාත්‍රිය පිළිබඳ පූර්වකාලය පුබ්බරත්තනම. රාත්‍රිය පිළිබඳ අපරකාලය අපරරත්තනම. මෙයින් රාත්‍රිය පිළිබඳ පූර්වයාමයත් රාත්‍රිය පිළිබඳ පශ්චිමයාමයත් කියනලද්දේවේ. **'බොධි පක්ඛිකානං'** අර්හත්මාර්ගඥානයාගේ පක්ෂයෙහිවූ අර්හත්මාර්ගඥානයට උපකාරවූ, යනඅර්ථයි. **භාවනානුයොගං'** එක්වන් භාවනා වැඩීමෙහි. **'අනුයුත්තා විහරෙය්‍යාම'** ගිහිපළිබොධ හා ආවාසපළිබොධ හැරපියා විවික්තසෙනාසනයන්හි යුක්තප්‍රයුක්තවූවමෝ අන්කටයුතු නැත්තමෝ වාසය කරන්නෙමු. **'එවමාවුසො'** ආනන්ද සථවිරයන්වහන්සේ මොවුන්ගේ අදහස නොදන්නාහු ඔවුන්ගේ මේ මහත් ගර්හනාව අසා 'මොවුහු මෙබන්දෝ වන්නාහුනම් මැනවැ'යි සිතින්නාහු 'ඇවැත්නි! එසේය'යි පිළිගත්හ.

'අඨානං අනවකාසො' මේ දෙපදයම කාරණ ප්‍රතික්ෂෙප වචනයි. එහි කාරණයවනාහි යම්හෙයකින් එහි එයට අයත් පැවතුම් ඇතිබැවින් ඵලය සිටීද, යම්හෙයකින් එයට අයත් පැවැතුම් ඇතිබැවින් ඒ කාරණය මෙයට අවකාශවේද, එහෙයින් ඨානයිද අවකාශයිද කියනුලැබේ. එය ප්‍රතික්ෂෙප කරනසේක් **'අඨානමෙතං ආනන්ද අනවකාසො'**යනු වදළසේක. මේ කාරණය හෝ අවකාශය නැත්තේය. **'යං තථාගතො'** යම් කරුණකින් තථාගතයන්වහන්සේ වජ්ජීන්ට හෝ -පෙ- සමූහනය කරන්නාහුද, ඒ කාරණය නැත්තේය යන අර්ථයි. ඉදින් භාග්‍යවතුන්වහන්සේ 'ලභෙය්‍යාම උපසම්පදං'යි යාචඤ්ඤ කරන්නාවූ මොවුනට උපසම්පදව දෙන්නාහුනම්, එසේ ඇතිකල්හි **'පාරාජිකො හොති අසංවාසො'**යි පණවනලද ශික්ෂාපදය සමූහනය කරන්නාහ. යම්හෙයකින් වනාහි ඒ ශික්ෂාපදය සමූහනය නො කෙරෙත්ද, එහෙයින් **'අඨානමෙතං'** යනාදිය වදළසේක.

'සො ආගතො න උපසම්පාදෙතබ්බො' ඉදින් මෙසේ ආයේවනාහි උපසම්පදව ලබන්නේනම්, එය ශාසනයට අගෞරවයක් වන්නේය. සාමණේර භූමියෙහිවනාහි සිටියේ ගෞරව සහිතවන්නේය. ආත්මාර්ථයද කරන්නේයයි දන අනුකම්පාකරන්නාවූම භාග්‍යවතුන්වහන්සේ 'හෙතෙමේ ආයේ උපසම්පද නොකටයුතුය'යි වදළසේක.

'සො ආගතො උපසම්පාදෙතබ්බො' මෙසේ ආයේ භික්ෂුභාවයෙහි සිට විපතට නොපත් සිල්ඇතිබැවින් ශාසනයෙහි ගෞරව සහිතවන්නේය. හෙතෙමේ හෙතු සම්පත් ඇතිකල්හි නොබෝ කලකින්ම නිවණට පැමිණෙන්නේයයි දන උපසම්පද කටයුතුයයි වදළසේක.

මෙසේ මෙවුන්දම් සෙවනයකොට ආවුන් අතුරෙහි උපසපන් නොකටයුත්තහුද උපසපන් කටයුත්තහුද දක්වා, ත්‍රිවිධවස්තූන් එක්කොට ගළපා, පිරිපුන්කොට ශික්ෂාපදය පනවනු කැමතිසේක් **'එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ'**යි වදරා **යො පන භික්ඛු -පෙ- අසංවාසො'**යි ශික්ෂාපදය සමපුණීකොට පැණවූසේක.

දැන් මේ ශික්ෂාපදයාගේ අර්ථය විභජනය කරනසේක් **'යො පනාති යො යාදිසො'** යනාදිය වදළසේක. ඒ ශික්ෂාපදයෙහිද, ශික්ෂාපදවිභඞ්ගයෙහිද, සියලු විනයවිනිශ්චයෙහිද දක්ෂභාවය පතන්නහුවිසින් චතුර්විධවිනය දතයුත්තේය.

'චතුබ්බිධං හි විනයං - මහාථෙරා මහිද්ධිකා,
නීහරිත්වා පකාසෙසුං - ධම්මසඞ්ගාහකා පුරා'

පෙර මහත් සෘද්ධිඇති ධම්මසඞ්ගාහක මහා ස්ථවිරයන්වහන්සේලා සිවුවැදෑරුම්වූ විනය සඵුනෙන් ඇද ප්‍රකාශකළහ.

චතුර්විධ විනය කවරේදයත්: **'සුත්ත - සුත්තානුලොම - ආචරියවාද - අත්තනොමති'**යි යනමේය. **'ආහච්චපදෙන ඛො මහාරාජ! රසෙන ආචරියවංසතා අධිප්පායො'** යනු යමක් සඳහා කියනලද්දේද, මෙහි **'ආහච්චපදං'** යනමෙයින් සූත්‍රයද, **'රසෙන'** යනමෙයින් සූත්‍රානුලොමයද, **'ආචරියවංසතා'** යනමෙයින් ආචාර්‍ය්‍ය වාදයද, **'අධිප්පායො'**යන මෙයින් අත්තනොමතියද දක්වනලදය.

එහි **'සූත්‍ර'**නම්, සියලු විනයපිටකයෙහි පාළියය. **'සූත්‍රානුලොම'**නම් සතර මහාප්‍රදෙශයෝය. 'මහණෙනි! මා විසින් මෙය කැපනොවේය'යි බැහැර නොකරණලද්ද, ඉදින් එය කැපයට අනුලොම්වේනම්, නොකැපය. ප්‍රතිබාහනය කෙරේනම් එය තොපට කැප නොවේ. මහණෙනි! මාවිසින් යමක් මෙය කැප නොවේය'යි බැහැරනොකරනලද්ද, ඉදින් එය කැපයට අනුලොම්වේනම්, නොකැපය ප්‍රතිබාහනය කෙරේනම් එය තොපට කැපවේ. මහණෙනි! මාවිසින් යමක් මෙය කැපවේය'යි නොඅනුදන්නාලද්ද, ඉදින් එය නොකැපයට අනුලොම්වේනම්, කැපය ප්‍රතිබාහනයකෙරේනම්, එය තොපට කැපනොවේ. මහණෙනි! මාවිසින් යමක් මෙය කැපවේයයි නොඅනුදන්නාලද්ද, ඉදින් එය කැපයට අනුලොම්වේනම්, නොකැපය ප්‍රතිබාහනය කෙරේනම් එය තොපට කැපවේයයනුයි. ආචාර්‍ය්‍යවාදනම්, ධම්මසඞ්ගාහකවූ පන්සියයක් රහතුන්වහන්සේලාවිසින් තබනලද පාළියෙන් විනිර්මුක්තවූ ධම්යට එක්වන් පිවිසසිටි අතරතුරකියනලද ධම්විනිශ්චය වශයෙන් පැවති අර්ථකථා පාලියයි. **අත්තනොමති**නම්. සූත්‍ර - සූත්‍රානුලොම - ආචාර්‍ය්‍යවාද හැරපියා නිශ්චයානුගතවූ සූත්‍රාදියටම අනුව ගිය තමාගේ බුද්ධියෙන් සූත්‍රාදියෙන් ලැබියයුතුවූ නයග්‍රාහයෙන් එළඹසිටි ආකාරය කියාපෑමය.

තවද සූත්‍රාභිධම් විනයාර්ථකථාවන්හි ආවාවූ සියලුම ස්ථවිරවාදය අත්තනොමතිනම්. ඒ අත්තනොමතිය ගෙණ කියන්නහුවිසින් එය දඩිකොටගෙණ ව්‍යවහාර නොකටයුතුය. කාරණය සලකා තමන් සැලකූ අර්ථය හා පෙළද, පෙළ හා අර්ථයද සසඳ කියයුතුය. අත්තනොමතිය ආචාර්‍ය්‍යවාදයෙහි නුවණින් බහාලියයුතුය. ඉදින් එහි බැස ගනීනම්, සමවේනම් ගතයුතුය. ඉදින් නොමබසීනම්, සමනොවේනම් නොගතයුතුය. මේ අත්තනොමතියවනාහි සියල්ලට වඩා දුර්ලවේ. අත්තනොමතියට වඩා ආචාර්‍ය්‍යවාදය ඉතා බලවත්වේ.

ආචායීවාදය සූත්‍රානුලොමයෙහි බහාලිය යුතුය. එහි බැසගන්නේම ගතයුතුය. බැසනොගන්නේ නොගතයුතුය. ආචායීවාදයටවඩා සූත්‍රානුලොමය ඉතා බලවත්වේ.

සූත්‍රානුලොමයද සූත්‍රයෙහි බහාලියයුතුය. එහි බසින්නේම ඒ හා සමවන්නේම ගතයුතුය. සමනොවන්නේ නොගතයුතුය. සූත්‍රානුලොමයටවඩා සූත්‍රයම ඉතාබලවත්වේ. සූත්‍රය ප්‍රතිබාහනය නොකටයුතුය. ප්‍රමාණවිසින් සඞ්ගීතිකාරකසඞ්ඝයා හා සමානය. බුදුරජාණන්වහන්සේ වැඩසිටි කාලය හා සමානවේ. එහෙයින් යම් කලෙක දෙනමක් හික්ෂූහු සාකච්ඡා කෙරෙත්ද, එකල්හි එහිදී යථාභූතාර්ථය ගෙන කියන සකවාදීතෙමේ, තමාගේ සූත්‍රය ගෙන කියාලන්නේය. විපරීතවිසින් අර්ථය ගෙන කියන පරවාදී තෙමේ, සූත්‍රානුලොමය ගෙන කියාලන්නේය. ඔවුන් විසින් 'මෙයින් කිමැ'යි හෝ 'මේ අඳතෙමේ කුමක් කියාද'යි හෝ බැහැරහෙළීමක් හෝ උනුනට ගැරහීමක් නොකොට පරවාදීහුවිසින් කියූ සූත්‍රානුලොමය සකවාදීහුවිසින් තමාගේ සූත්‍රයෙහි බහාලියයුතුය. ඉදින් බසින්නේනම්, සමවන්නේනම්, ගතයුතුය. ඉදින් නොබසින්නේනම් නොසමවන්නේනම් නොගතයුතුය. තමාගේ සූත්‍රයෙහිම සිටියයුතුය.

නැවත මේ සකවාදීතෙමේ තමාගේ සූත්‍රය ගෙන කියාලන්නේය. පරවාදීතෙමේ ආචායීවාදය ගෙන කියාලන්නේය. ඔවුන්විසිනුදු උනුන් බැහැරකිරීමක් හෝ උනුනට ගැරහීමක් නොකොට ආචායීවාදය සූත්‍රයෙහි බහාලියයුතුය. ඉදින් බසින්නේනම්, සමවන්නේනම් ගතයුතුය. නොබසින්නේනම්, නොසමවන්නේනම් ගැරහියයුතුවූ ඒ ආචායීවාදය නොගතයුතුය. සූත්‍රයෙහිම සිටියයුතුය.

නැවත මේ සකවාදීතෙමේ තමාගේ සූත්‍රය ගෙන කියාලන්නේය. පරවාදීතෙමේ අත්තනොමතිය ගෙන කියාලන්නේය. ඔවුන්විසිනුදු උනුන් බැහැර කිරීමක් හෝ උනුනට ගැරහීමක් නොකොට අත්තනොමතිය තමාගේ සූත්‍රයෙහි බහාලියයුතුය. ඉදින් බසින්නේනම්, සමවන්නේනම් ගතයුතුය. නොබසින්නේනම් නොසමවන්නේනම් නොගතයුතුය. සූත්‍රයෙහිම සිටියයුතුය.

නැවත මේ සකවාදීතෙමේ තමාගේ සූත්‍රානුලොමය ගෙන කියාලන්නේ ය. පරවාදී තෙමේ තමාගේ සූත්‍රය ගෙන කියාලන්නේය. සූත්‍රය, තමාගේ සූත්‍රානුලොමයෙහි බහාලියයුතුය. ඉදින් බසින්නේනම්, සමවන්නේනම් ත්‍රිවිධසඞ්ගීතියට නැගූ පාළියෙහි ආයේයයි පෙණේ නම් ගතයුතුය. ඉදින් එසේ නොපෙණේ නම් නොබසින්නේනම්, නොසමවන්නේනම්, ත්‍රිවිධසඞ්ගීතියට නොනැගූ බාහිරක සූත්‍රයක් හෝ

වන්නේනම්, පද්‍යායයක් හෝ වන්නේ නම්, මහාසඞ්ඝික නිකායිකයන්ගේ **ගුණාවෙසනතර - ගුණාවිනය - වේදලාදීන්** අතුරෙහි අන්‍යතර වශයෙන් ආවාඩු ගැරහිය යුතු සූත්‍රයක් හෝ වන්නේනම් නොගතයුතුය. සූත්‍රානුලොමයෙහිම සිටියයුතුය.

නැවත මේ සකවාදීතෙමේ තමාගේ සූත්‍රානුලොමය ගෙණ කියාලන්නේය. පරවාදී තෙමේ තමාගේ ආචාර්‍යවාදය ගෙණ කියාලන්නේය. එකල්හි ඒ ආචාර්‍යවාදය සූත්‍රානුලොමයෙහි බහාලිය යුතුය. ඉදින් බසින්නේනම්, සමවන්නේනම් ගතයුතුය. ඉදින් නොබසින්නේනම්, නොසමවන්නේ නම් නොගතයුතුය. සූත්‍රානුලොමයෙහිම සිටියයුතුය.

නැවත මේ සකවාදී තෙමේ තමාගේ සූත්‍රානුලොමය ගෙණ කියාලන්නේය. පරවාදී තෙමේ අත්තනොමතියි ගෙණ කියාලන්නේය. අත්තනොමතිය සූත්‍රානුලොමයෙහි බහාලිය යුතුය. ඉදින් බසින්නේනම්, සමවන්නේනම් ගතයුතුය. ඉදින් නොබසින්නේනම්, නොසමවන්නේනම් නොගතයුතුය. සූත්‍රානුලොමයෙහිම සිටියයුතුය.

නැවත මේ සකවාදීතෙමේ තාමාගේ ආචාර්‍යවාදය ගෙන කියාලන්නේය. පරවාදීතෙමේ සූත්‍රයගෙන කියාලන්නේය. සූත්‍රය තමාගේ ආචාර්‍යවාදයෙහි බහාලියයුතුය. ඉදින් බසින්නේනම්, සමවන්නේනම් ගතයුතුය. අන්‍යවූ ගැරහියයුතු සූත්‍රය නොගතයුතුය. තමාගේ ආචාර්‍යවාදයෙහිම සිටියයුතුය.

නැවත මේ සකවාදීතෙමේ තමාගේ ආචාර්‍යවාදය ගෙන කියාලන්නේය. පරවාදීතෙමේ අත්තනොමතිය ගෙන කියාලන්නේය. අත්තනොමතිය ආචාර්‍යවාදයෙහි බහාලියයුතුය. ඉදින් බසින්නේනම්, සමවන්නේනම් ගතයුතුය. ඉදින් නොබසින්නේ නම් නොසම වන්නේ නම් නොගතයුතුය. ආචාර්‍යවාදයෙහිම සිටියයුතුය.

නැවත මේ සකවාදීතෙමේ අත්තනොමතිය ගෙන කියාලන්නේය. පරවාදීතෙමේ සූත්‍රානුලොමය ගෙන කියාලන්නේය. සූත්‍රානුලොමය අත්තනොමතියෙහි බහාලියයුතුය. බසින්නේම සමවන්නේම ගතයුතුය. අන්‍යය නොගතයුතුය. අත්තනොමතියෙහිම සිටියයුතුය.

නැවත මේ සකවාදීතෙමේ අත්තනොමතිය ගෙන කියාලන්නේය. පරවාදීතෙමේ තමාගේසූත්‍රය ගෙන කියාලන්නේය. සූත්‍රය අත්තනොමතියෙහි බහාලියයුතුය. ඉදින් බසින්නේනම්, සමවන්නේනම් ගතයුතුය. ගැරහියයුතුවූ අන්‍යසූත්‍රය නොගතයුතුය. අත්තනොමතියෙහිම සිටියයුතුය.

නැවත මේ සකවාදීතෙමේ කැපයිගෙන කියාලන්නේය. පරවාදීතෙමේ අකැපයි ගෙන කියාලන්නේය. එය සකවාදීහුවිසින් තමාගේ සූත්‍රයෙහිද සූත්‍රානුලොමයෙහිද බහාලියයුතුය. ඉදින් කැපවේනම් කැපයෙහි සිටියයුතුය. ඉදින් අකැපවේනම් අකැපයෙහි සිටියයුතුය.

නැවත සකවාදීතෙමේ එහි කැපබව සිදුකරන්නාවූ බොහෝ කරුණුද විනිශ්චයද තමාගේ සූත්‍රයෙන් දක්වන්නේය. පරවාදීතෙමේ කරුණු නොලබන්නේය. කැපයෙහිම සිටියයුතුය.

නැවත පරවාදීතෙමේ එහි නොකැපබව සිදුකරන්නාවූ බොහෝ කරුණුද විනිශ්චයද තමාගේ සූත්‍රයෙන් දක්වන්නේය. මොහුවිසින් තමාගේ ගැනීමයයි දැඩිවගෙන නොසිටියයුතුය. මැනවැයි පිළිගෙන අකැපයෙහිම සිටියයුතුය.

එකල්හි සකවාදී - පරවාදී දෙදෙනාගේම කැපඅකැපබව සිදුකරන්නාවූ කරුණු පිළිබඳ සෙවණැලි දක්නාලැබේනම්, පිළිකෙවු කිරීමම යහපත්වේ. අකැපයෙහි සිටියයුතුය. විනයට පැමිණ කැපඅකැප විචාරණයට පැමිණ කැපයයන හැඟීමෙන් ව්‍යතික්‍රමකරණය වළකාලියයුතුය. ඒ වැළකීමේ සිත දැඩිකළයුතුය. එහි ව්‍යතික්‍රම ප්‍රවෘත්තිය සිදලියයුතුය. ගරුකභාවසඞ්ඛ්‍යාත අකප්පියභාවයෙහිම සිටියයුතුය.

නැවත මේ සකවාදීතෙමේ අකැපයි ගෙන කියාලන්නේය. පරවාදීතෙමේ කැපයි ගෙන කියාලන්නේය. එය තමාගේ සූත්‍රයෙහි හා සූත්‍රානුලොමයෙහිද බහාලියයුතුය. ඉදින් කැපවන්නේනම් කැපයෙහි සිටියයුතුය. ඉදින් කැපනොවන්නේනම් අකැපයෙහි සිටියයුතුය.

නැවත සකවාදීතෙමේ බොහෝ සූත්‍රයන්ගෙන් හා එයින් එළවනලද විනිශ්චයකාරණයන්ගෙන්ද නොකැපබව දක්වන්නේය. පරවාදීතෙමේ එහිලා කරුණු නොලබන්නේය. අකැපයෙහි සිටියයුතුය.

නැවත පරවාදීතෙමේ බොහෝ සූත්‍රයන්ගෙන් හා එයින් එළවනලද විනිශ්චයකාරණයන්ගෙන් කැපබව දක්වන්නේය. මේ සකවාදීතෙමේ කරුණු නොලබන්නේය. කැපයෙහි සිටියයුතුය.

එකල්හි සකවාදී - පරවාදී දෙදෙනාගේම කැපඅකැපබව සිදුකරන්නාවූ කරුණු පිළිබඳ සෙවණැලි දක්නාලැබේනම්, සකවාදීහුවිසින් අකැපයි තමාගේ ගැනීම නොහැරියයුතුය. කැප - අකැපයෙහි හා අකැප - කැපයෙහි යම් සේ මේ විනිශ්චය කියනලද්දේද එසේ අනාපත්ති - ආපත්තිවාදයෙහිද, ආපත්ති - අනාපත්තිවාදයෙහිද ලහුක - ගරුක

ආපත්තිවාදයෙහිද, ගරුක - ලහුක ආපත්තිවාදයෙහිද විනිශ්චය දතයුතුය. නාම මාත්‍රයම මෙහි වෙනසය. යොජනාක්‍රමයෙහි වෙනසක් නැත්තේය. එහෙයින් විස්තර නොකරනලදී.

මෙසේ කැප - අකැප ආදිය පිළිබඳ විනිශ්චයක් උපන්කල්හි සකවාදී - පරවාදීන් අතුරෙහි යමෙක් සූත්‍ර - සූත්‍රානුලොම - ආචාර්‍යවාද - අත්තනොමතියන මොවුන් අතුරෙහි වැඩිකරුණක් ලබන්නේද ඔහුගේ වාදයෙහි සිටියයුතුය. හැමතකින් කරුණුපිළිබඳ විනිශ්චයක් නොලබන්නහුවිසින් සූත්‍රය නොහළයුතුය. සූත්‍රයෙහිම සිටියයුතුය.

මෙසේ ඒ ශික්ෂාපදයෙහිද, ශික්ෂාපද විභඞ්ගයෙහිද, සියලු විනයවිනිශ්චයෙහිද දක්ෂභාවය පතන්නහුවිසින් මේ සිවුවැදෑරුම්විනය දතයුත්තේය.

මේ සිවුවැදෑරුම්විනය දැනද, විනයධර පුද්ගලයා ත්‍රිලක්ෂණ සම්පන්නයෙකු වියයුතුය. විනයධරයා පිළිබඳ ලක්ෂණ තුනක් කැමතිවියයුතුයි. කවර ලක්ෂණ තුනක්දයත්: **'සුත්තඤ්චස්ස ස්වාගතං හොති සුප්පවත්ති සුවිනිච්ඡිතං, සුත්තසෝ අනුව්‍යඤ්ජනසෝ'**යන මේ එක් ලක්ෂණයක්වේ. **විනයෙ ඛෝ පන ඨිතෝ හොති අසංහීරෝ'**යන මේ දෙවන ලක්ෂණයවේ. **'ආචරියපරම්පරා ඛෝ පනස්ස සුග්ගහිතා සුමනසිකතා සූපධාරිතා'**යන මෙය තෙවන ලක්ෂණයවේ.

එහි 'සුත්ත'නම්, සියලු විනයපිටකයයි. ඒ විනයපිටකය මොහුවිසින් මනාකොට හදරණලද්දේය. මනාකොට දන්නාලද්දේය. පුහුණුකරණලද්දේය. වචනයෙන් උගන්නාලද්දේය. **සුප්පවත්ති** මනාකොට පැවැත්තේය. පුහුණු කරනලද්දේය. වචනයෙන් උගන්නා ලද්දේය. **'සුවිනිච්ඡිතං සුත්තසෝ අනුව්‍යඤ්ජන සෝ'** පෙළවිසින්ද පිළිවිසීම්විසින්ද අටුවාවිසින්ද මනාකොට විනිශ්චයකරනලද්දේය. සැක සිඳ උගන්නාලද්දේය **'විනයෙ ඛෝ පන ඨිතෝ හොති'** විනයයෙහි ලජ්ජීභාවයෙන් පිහිටියේවේ. අලජ්ජීතෙමේ වනාහි බොහෝ ඇසුපිරුතැන් ඇත්තේද, ලාභය ගරුකොට ගත්බැවින් පෙළ වෙනස්කොට ශාස්තෘශාසනය ධර්‍මයෙන් විනයෙන් පහවූවක්කොට දක්වා ශාසනයෙහි මහත් උවදුරු කරන්නේය. සඞ්ඝභෙදයද සඞ්ඝරාජියද උපදවන්නේය. ලජ්ජීතෙමේවනාහි කුකුස්ඇත්තේ ශික්ෂාකැමැත්තේ ජීවිත හෙතුවෙනුදු පෙළ වෙනස් නොකොට ධර්‍මයම විනයම දක්වන්නේය. ශාස්තෘශාසනය ගරුකොට තබන්නේය. ඒ එසේමය. පෙර මහාස්ථවිරයන්වහන්සේ 'අනාගතයෙහි ලජ්ජීතෙමේ රකින්නේය, ලජ්ජීතෙමේ රකින්නේය, ලජ්ජීතෙමේ රකින්නේය'යි තෙවරක් කියාපැහ. මෙසේ යමෙක් ලජ්ජා ඇත්තේවේද, හෙතෙමේ විනය නොහරිණුයේ විනය නොඉක්මවනුයේ

ලජ්ජිභාවයෙන් විනයයෙහි සිටියේවේ. මනාකොට පිහිටියේවේ. **'අසංහීරෝ'** සංහීරනම් පෙළෙහි යටින් හෝ මතුවෙන්, පද පිළිවෙළින්, අටුවාවිසින් විචාරණු ලබනුයේ අර්ථය නොදක සැලෙන්නේය. කම්පිත වන්නේය. එක් අරුතෙක පිහිටා සිටින්නට නොහැක්කේය. අනිකෙකුවිසින් යමක් යමක් කියනුලබන්නේද, ඒ ඒ කියනලද්ද අනුදන්නේය. සකවාදය හැරපියා 'උක්කසටය යාවජීවිකය, රසය සත්තාහකාලිකය, එදෙකින් මිදුනු උක්තම් නැත්තේය, එහෙයින් උක් ද විකාලයෙහි වටීය'යන පරවාදය ගන්නේය. යමෙක්වනාහි පෙළෙහි හෝ අටුවාවෙහි, යටින්, මතුවෙන්, පද පිළිවෙළින්, විචාරණුලබනුයේ අර්ථය දැක නොසැලෙන්නේද, කම්පිත නොවන්නේද, පැසීගිය එක් එක් ලොමය අඩුවකින් උදුරා ගත්තකුසේ 'අපි මෙසේ කියමිහ, අපගේ ආචාර්‍යවරයෝ මෙසේ කියති'යි විසඳ ද, යම් පුද්ගලයෙකු කෙරෙහි පාලියත් පාලිවිනිශ්චයත් රන්බඳුනෙක වත්කළ සිංහතෙලක් මෙන් ගෙවීමට නැසීමට නොයනුයේ පවත්නේද, හෙතෙමේ අසංහීරයි කියනුලැබේ.

'ආචරියපරම්පරා ඛො පනස්ස සුග්ගහීතා හොති' මොහුවිසින් ස්ථවිරපරම්පරාව වංශපරම්පරාව මනාකොට උගන්නාලද්දීය. **'සුමනසිකතා'** මනාකොට මෙනෙහි කරනලද්දීය. මෙනෙහි කළ ඇසිල්ලෙහි දැල්වූ පහනක්මෙන්වේ. **'සූපධාරිතා'** මනාකොට දරණලද්දීය. පූර්‍වාපරානුසන්ධිවශයෙන්ද අර්ථවශයෙන්ද කාරණවශයෙන්ද මනාකොට විමසනලද්දීය. අත්තනොමතිය හැර ආචාර්‍යශුද්ධියෙන් 'මාගේ ඇදුරුතෙමේ අසුවල් ඇදුරහුවෙත උගත්තේය. ඒ ඇදුරුතෙමේ අසුවල් ඇදුරහුවෙත උගත්තේය'යි කියන්නේවේ. හෙතෙමේ අසුවලා වෙතයයි මෙසේ සියලු ආචාර්‍ය පරම්පරාව ස්ථවිරපටිපාටිය ගෙනහැර දක්වා 'උපාලි ස්ථවිරතෙමේ සම්මාසම්බුදුරජුන්වෙත උගත්තේය'යි **උපාලි** තෙරුන් දක්වා තබන්නේය. එතැනින්‍දු ගෙන **උපාලි** ස්ථවිරතෙමේ සම්මාසම්බුදුරජානන්වහන්සේවෙත උගත්තේය. **දසක** ස්ථවිරතෙමේ තමාගේ උපාධ්‍යායවූ **උපාලි** තෙරුන්වෙත **සොණක** ස්ථවිරතෙමේ තමාගේ උපාධ්‍යායවූ **දසක** තෙරුන්වෙත **සිග්ගව** ස්ථවිරතෙමේ තමාගේ උපාධ්‍යායවූ **සොණක** තෙරුන්වෙත **මොග්ගලිපුත්තතිස්ස** ස්ථවිරතෙමේ තමාගේ උපාධ්‍යායවූ **සිග්ගව** තෙරුන්වෙත හා **චණ්ඩවජ්ජි** තෙරුන්වෙත උගත්තේය'යි මෙසේ සියලු ආචාර්‍ය පරම්පරාව, ස්ථවිරපටිපාටිය ගෙනහැර තමන්ගේ ඇදුරහුට පමුණුවා තබන්නේය. මෙසේ ඇදුරු පරපුර උගන්නාලද්දී මනාකොට උගන්නාලද්දීවේ. මෙසේ උගන්නට අසමර්‍ථවන්නහුවිසින්වනාහි අවශ්‍යයෙන් දෙතුන් පරම්පරාවක් උගතයුතුය. සර්‍වඥම නයින්වනාහි යම්සේ ආචාර්‍යතෙමේද, ඒ ආචාර්‍යයන්ගේ ආචාර්‍යතෙමේද පාළියත් පිළිවිසීමත් කියන්ද එසේ දැනගැනීම වටියි.

මේ ත්‍රිවිධ ලක්ෂණයෙන් සමන්වාගතවූ විනයධරයාවිසින් වස්තුවිනිශ්චයපිණිස සඞ්ඝයා රැස්වූකල්හි චොදනාසඞ්ඛ්‍යාතවූ හෝ ව්‍යතික්‍රමසඞ්ඛ්‍යාතවූ වස්තුවක් සහමැදට බැසසිටිකල්හි සහ මැදටබැසසිටි ඒ වස්තුව ඇසුරුකොට චොදකයාවිසින්ද චුදිතකයාවිසින්ද කියයුත්ත කියූකල්හි වහා විනිශ්චය නොකොටම කරුණු සයක් බැලියයුතුය. කවර සයක්දයත්: වස්තුව බැලියයුතුය. මාතෘකාව බැලියයුතුය. පදභාජනීය බැලියයුතුය. ත්‍රිකපරිවෙජදය බැලියයුතුය. අන්තරාපත්තිය බැලියයුතුය. අනාපත්තිය බැලියයුතුය යන මේ සයය.

වස්තුව බලනුයේද **'තිණෙන වා පණ්ණෙන වා පටිච්ඡාදෙත්වා ආගන්තබ්බං, නත්වේව නග්ගෙන ආගන්තබ්බං, යෝ ආගච්ඡෙය්‍ය ආපත්තිදුක්කටස්ස'**[A] තෘණයෙන් හෝ පණ්ණයෙන් වසාගෙන ආයුතුය. නග්නවූවහුවිසින් නොමඅායුතු ය. යම් මහණෙක් මෙසේ එන්නේනම්, දුක්කටාපත්තිය වන්නීයයි මෙසේ ඇතැම් ඇවැතක් දකීද, හෙතෙමේ ඒ සූත්‍රය ගෙනහැර දක්වා ඒ අධිකරණය සන්සිඳුවන්නේය.

මාතෘකාව බලනුයේද **'සම්පජාන මුසාවාදෙ පාචිත්තිය'**[B] දන බොරුකීම නිමිතිකොට පාචිත්තිය වේයයි මේ ආදිනයින් පස්වැදරුම්වූ ආපත්තීන් අතුරෙහි එක්තරා ඇවැතක් දක්නේද, හෙතෙමේ ඒ සූත්‍රය පමුණුවා ගෙනහැර දක්වා ඒ අධිකරණය සන්සිඳුවන්නේය.

පදභාජනීය බලනුයේද **'අකඩියතෙ සරීරෙ මෙථුනං ධම්මං පතිසෙවති ආපත්ති පාරාජිකස්ස, යෙභුය්‍යෙන ඛයිතෙ සරීරෙ මෙථුනං ධම්මං පතිසෙවති ආපත්ති ථුල්ලච්චයස්ස'** ගෙවී නොගිය සිරුරෙහි මෙවුන්දම් සෙවීම කෙරේද, පාරාජිකාපත්තියවේ. බොහෝසෙයින් ගෙවීගිය සිරුරෙහි මෙවුන්දම් සෙවීම කෙරේද, ථුල්ලච්චයාපත්තියවේය යනාදි ක්‍රමයෙන් සත්වැදරුම්වූ ආපත්තීන් අතුරෙහි එක්තරා ඇවතක් දක්නේද, හෙතෙමේ පදභාජනීයයෙන් සූත්‍රයක් ගෙනහැර දක්වා ඒ අධිකරණය සන්සිඳුවන්නේය.

ත්‍රිකපරිවෙජදය බලනුයේද, තික සඞ්ඝාදිසෙසය හෝ තිකපාචිත්තිය හෝ තිකදුක්කටය හෝ යන එක්තරා ඇවැතක් තිකපරිවෙජදයෙහිලා දක්නේද, හෙතෙමේ ත්‍රිකපරිවෙජදයෙන් සූත්‍රයක් ගෙනහැර දක්වා ඒ අධිකරණය සන්සිඳුවන්නේය.

අන්තරාපත්තිය බලනුයේද **'පටිලාතං උක්ඛිපති ආපත්ති දුක්කටස්ස'**[C] මදක් දවුනු දරකැබැල්ල ගිනි කබලින් ඉවත්කොට නොදවුනු තන්හි

A පාරාජිකපාළි - අඤ්ඤතකවිඤ්ඤත්ති B පාචිත්තියපාළි - මුසාවාදවග්ග
C පාචිත්තියපාළි - සුරාපානවග්ග

දමාද, දුක්කටාපත්තිය වේයයි මෙසේ ශික්ෂාපද අතුරෙහි යම් අන්තරාපත්තියක්වේද, එය දක්නේද, හෙතෙමේ ඒ සූත්‍රය ගෙනහැර දක්වා ඒ අධිකරණය සන්සිඳුවන්නේය.

අනාපත්තිය බලනුයේද **'අනාපත්ති භික්ඛු අසාදියන්තස්ස, අථෙය්‍යචිත්තස්ස, න මරණාධිප්පායස්ස, අනුල්ලපනාධිප්පායස්ස, න මොචනාධිප්පායස්ස, අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස'** 'මහණ! නොඉවසන්නහුට, හොරසිත්නැත්තහුට, නොමරණඅදහස්ඇත්තහුට, නොබණින අදහස්ඇත්තහුට, නොමුදන අදහස්ඇත්තහුට, නොසිතා කරන්නහුට, නොසිහියෙන් කරන්නහුට, නොදන්නහුට අනාපත්තිය'යි මෙසේ ඒ ඒ ශික්ෂාපදයෙහි දක්වනලද අනාපත්තිය දක්නේද, හෙතෙමේ ඒ සූත්‍රය ගෙනහැර දක්වා ඒ අධිකරණය සන්සිඳුවන්නේය.

චතුර්විධවිනයයෙහි දක්ෂවූ ත්‍රිලක්ෂණ සම්පන්නවූ යම් මහණෙක්තෙමේ මේ කරුණු සය බලා අධිකරණය සන්සිඳුවන්නේද, ඔහුගේ විනිශ්චය නොපෙරළියයුතු වන්නේය. බුදුරජුන්විසින් තමන්වහන්සේ හිඳ විනිශ්චය කරනලද්දක් වැනිවේ.

ඉදින් කරනලද ශික්ෂාපද ව්‍යතික්‍රමය ඇති කිසි මහණෙක්තෙමේ මෙසේ විනිශ්චයයෙහි දක්ෂවූ ඒ මහණහු කරා එළඹ තමාගේ කුකුස විචාරන්නේනම්, ඔහුවිසින් මනාකොට සලකා ඉදින් ආපත්ති නොවේනම්, අනාපත්තියි කියයුතුය. ඉදින් ආපත්ති වේනම්, ආපත්තියි කියයුතුය. ඒ ඇවැත දෙසනාගාමිනීනම්, දෙසනාගාමිනීයි කියයුතුය. වුට්ඨානගාමිනීනම්, වුට්ඨානගාමිනීයි කියයුතුය.

එකල්හි මේ ව්‍යතික්‍රමයාගේ ව්‍යතික්‍රමසඞ්ඛ්‍යාත වස්තුව පාරාජිකාපත්තිය සමානව දක්නාලැබේද, එහෙත් පාරාජිකාපත්තියි නොකියයුත්තීය. කුමක් හෙයින්දයත්: මෛථුනධම්ව්‍යතික්‍රමයද, උත්තරිමනුෂ්‍යධම්ව්‍යතික්‍රමයද ඔෞදරිකවේ. අදින්නාදන - මනුෂ්‍යවිග්‍රහව්‍යතික්‍රමයෝ සියුම්හ. සිත හා යුහුව කෙරෙන පෙරළීම් ඇත්තාහ. සියුම් හෙයින්ම ඒ ව්‍යතික්‍රමයන්ට පැමිණේ. සියුම් හෙයින්ම රකියි. එහෙයින් වෙසෙසින් අදින්නාදන - මනුෂ්‍යවිග්‍රහ වස්තුකොටඇති ඒ කුකුස විචාරණු ලබන්නේ ආපත්තියි නොකියා ඉදින් මොහුගේ ආචාර්‍යත්වයෙමේ ජීවත්වේනම්, ඉන්පසු ඔහුවිසින් ඒ මහණතෙමේ 'අපගේ ඇදුරහු විචාරව'යි යැවියයුතුය. ඉදින් ඒ මහණතෙමේ නැවත අවුත් 'තොපගේ ඇදුරුතෙමේ සූත්‍රවශයෙන් නයවශයෙන් බලා පිළියම් සහිතයයි මට කීයේය'යි කියානම්, ඉක්බිති ඔහුවිසින් 'යහපති, මැනව, ඇදුරුතෙමේ යමක් කියානම් එය කරව'යි කියයුතුය.

තවද මොහුගේ ඇදුරුතෙමේ නැත්තේනම්, තමන් හා එක්ව උගත් සඨවිරනමක් ඇත්තේනම් 'අප හා එක්ව උගත් සඨවිරතෙමේ ගණ ප්‍රධාන වන්නේය. එහෙයින් උන්වහන්සේ කරා එළඹ විචාරව'යි ඔහු වෙත යැවියයුතුය. ඔහු විසිනුදු පිළියම් සහිතයයි විනිශ්චය කළකල්හි 'යහපති, මැනව, ඔහුගේම වචනය කරව'යි කියයුතුය.

තවද තමන් හා එක්ව උගත් සඨවිරනමක් නැත්තේනම්, පණ්ඩිත වූ අතවැස්සෙක් ඇත්තේනම් 'අසුවල් තරුණ මහණහු කරාගොස් විචාරව'යි ඔහුවෙත යැවියයුතුය. ඔහුවිසිනුදු පිළියම් සහිතයයි විනිශ්චය කළකල්හි 'යහපති, මැනව, ඔහුගේම වචනය කරව'යි කියයුතුය. එකල්හි ඒ තරුණ මහණහුටද පාරාජික වස්තුවක් සමානව වැටහෙන්නේ නමුදු ඔහු විසිනුදු 'පාරාජික වෙහි'යි නොකියයුතුය. 'බුද්ධොත්පාදය වනාහි දුකසේ ලැබියයුතුය, පැවිද්ද හා උපසම්පදව එයටද වඩා දුර්ලභතරය. එහෙයින් විචිත්‍රසථානයක් හැමද දිවාවිහරණයෙන් හිඳ, යම් වස්තුවක් ගැන කුකුසක් උපන්නේනම්, ඒ වස්තුව මෙනෙහි නොකොට සිල් පිරිසිදු කිරීමෙන් දුත්තිංසාකාර කම්සථානය මෙනෙහි කරව'යි මෙසේ කියයුතුය. ඉදින් ඔහුගේ නීරොගිශීලය කම්සථානය අතරතුර කඩවීමක් නොදක්වා සිත සමග ආලම්බනභාවයෙන් බොහෝ කලක් ගටා සිටීද, සංසකාරයෝ ප්‍රකටව වැටහෙන්නාහුද, සිත උපචාර අර්ණසමාධීන්ට පැමිණියක්මෙන් එකඟ වන්නේද, දවස ඉක්මගියද නොදනීද, දවස ඉක්මයෑමෙහිදී උපසථානයට ආවාවූ හෙතෙමේ 'තාගේ සිත්හි පැවැත්ම කෙබඳුද'යි මෙසේ කියයුතුය. සිත්හි පැවැත්ම සැලකළකල්හි 'පැවිද්දවනාහි චිත්තවිශුද්ධියපිණිස පවතී, එහෙයින් අප්‍රමත්තව මහණදම් කළයුතුයයි කියයුතුය. යමක්හුගේ ශීලය බිඳීගියේනම්, ඔහුගේ කම්සථානය නොගැටී සිටියි. කැවිටෙන් විදුනක්මෙන් සිත කම්පිතවේ. විපිළිසර නමැති ගින්නෙන් දැවෙන්නේය. රත්වූ ගලෙක හුන්නෙකුමෙන් එකෙණෙහිම නැගී සිටුනේය. ඔහු ආයේ, 'තාගේ සිත්හි පැවැත්ම කෙබඳුද'යි විචාළයුතුය. සිත්හි පැවැත්ම සැලකළකල්හි 'ලොකයෙහි පවිකම් කරන්නහුට රහසක්නම් නැත්තේය, පවිකම් කරණුයේම සියල්ලන්ට පළමු තෙමේ දැනගනියි, අනතුරුව මොහුගේ ආරක්‍ෂක දෙවතාවෝද, පරසිත්දන්නා මහණබමුණෝද, අන්‍යවූ දෙවියෝද දැනගනිත්, එහෙයින් තෝම දැන් තට ශුභයක් සොයාගනුව'යි කියයුතුය.

චතුර්විධවිනයකථා හා විනයධරලක්‍ෂණාදිකථා නිමි.

——\\——

දන් ශික්ෂාපදවිභඞ්ගය පිළිබඳ අත්ථවණ්ණනාව කරන්නෙමු. **'යො පනාති යො යාදිසො'**යනාදිවසයෙන් යමක් වදරණලද්දේද, එහි **'යො පන'**යනු බෙදියයුතු පදයයි. **'යො යාදිසො'** යනාදීනු එය බෙදන පදයි. මෙහිද යම්හෙයකින් **'පන'**යනු නිපාත මාත්‍රයක්වේද, **'යො'**යනු අත්ථපදයවේද, එද අනියමින් පුද්ගලයෙකු දක්වාද, එහෙයින් එහි අත්ථය දක්වනසේක් අනියමයෙන් පුද්ගලයා දක්වන **'යො'** ශබ්දයම දක්වා වදළසේක. එහෙයින් මෙහි මෙසේ අත්ථය දතයුතුය: **'යො පන'**යි යම් කිසිවෙකැයි කියනලද්දේවේ. යම්හෙයකින්වනාහි යම් ඒ එකෙක් යම් කිසිවෙක්නම්වේද, මෙතෙමේ එකාන්තයෙන් ලිඞ්ග - යුත්ත - ජාති - නාම - ගොත්ත - සීල - විහාර - ගොචර - වයස්යන මෙතැන්හි එක්අයුරකින් දක්නාලැබේද, එහෙයින් එය එසේ දක්වන්නට ඒ ප්‍රභෙදය ප්‍රකාශකරනසේක් **'යාදිසො'**යනාදිය වදළසේක.

එහි **'යාදිසො'**යනු ලිඞ්ගවශයෙන් යම්බඳුවූවෙක් හෝ එබඳුවූවෙක් වේවා: දිග්වූවෙක් හෝ මිටිවූවෙක් හෝ කලුවූවෙක් හෝ සුදුවූවෙක් හෝ මඟුරු පැහැතියෙක් හෝ කෘශවූවෙක් හෝ තරවූවෙක් හෝ යනඅත්ථයි. **'යථා යුත්තො'** යොගවශයෙන් යම් ඒ යොගයකින් යෙදුනෙක් හෝ වේවා: නවකම්හි යෙදුනෙක් හෝ උදෙසීමෙහි යෙදුනෙක් හෝ විදර්‍ශනාධුරයෙහි යෙදුනෙක් හෝ වේවායන අත්ථයි. **'යථා ජච්චො'** ජාතිවශයෙන් යම් ජාතිඇත්තෙක් හෝ ඒ ජාති ඇත්තෙක් හෝ වේවා: ක්ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශූද්‍රයෙක් හෝ වේවා! යන අත්ථයි. **'යථා නාමො'** නාමවශයෙන් යම්සේ නාමඇත්තෙක් හෝ එසේ නාමඇත්තෙක් හෝ වේව: බුද්ධරක්ඛිත හෝ ධම්මරක්ඛිත හෝ සඞ්ඝරක්ඛිත හෝ වේවා! යනඅත්ථයි. **'යථා ගොත්තො'** ගොත්‍රවශයෙන් යම්සේ ගොත්‍රඇත්තෙක් හෝ එසේ ගොත්‍රඇත්තෙක් හෝ වේවා: යම් ඒ ගොත්‍රයකින් කච්චායන හෝ වාසෙට්ඨ හෝ කොසිය හෝ වේවා! යනඅත්ථයි. **'යථා සීලො'** ස්වභාවයන් අතුරෙහි යම් ස්වභාව ඇත්තෙක් හෝ එබඳු ස්වභාව ඇත්තෙක් හෝ වේවා! නවකම්ස්වභාව ඇත්තෙක් හෝ උදෙදසස්වභාව ඇත්තෙක් හෝ විදර්‍ශනාධුර ස්වභාව ඇත්තෙක් හෝ වේවා! යනඅත්ථයි. **'යථා විහාරී'** විහරණයන් අතුරෙහි යම්සේ විහරණ ඇත්තෙක් හෝ එසේ විහරණ ඇත්තෙක් හෝ වේවා:- නවකම්විහරණ ඇත්තෙක් හෝ උද්දෙසවිහරණ ඇත්තෙක් හෝ විදර්‍ශනාධුර විහරණ ඇත්තෙක් හෝ වේවා! යනඅත්ථයි. **'යථා ගොචරො'** ගොචරයන් අතුරෙහි යම්සේ ගොචරඇත්තෙක් හෝ එසේ ගොචරඇත්තෙක් හෝ වේවා: නවකම්ගොචරයෙක් හෝ උද්දෙසගොචරයෙක් හෝ විදර්‍ශනාධුරගොචරයෙක් හෝ වේවා! යනඅත්ථයි. **'ථෙරො වා'** යනාදි තන්හි වයසින් වැඩී

සිටියවුන් අතුරෙහි යමෙක් හෝ වේවා, ඒ එකෙක් හෝ වේවා, පිරිපුන් දසවස් ඇතිබැවින් ස්ථවිර හෝ උනුපස්වස් ඇතිබැවින් නවක හෝ අයිරින් පස්වස් ඇතිබැවින් මද්ධ්‍යම හෝ වේවා! යනඅරථියි. එහෙත් මේ සියලුදෙනම **'එසො වුච්චති යො පන'**යන මේ අරථියෙහිලා ගැණේ.

භික්ෂුනීදේශයෙහි - සිහානුයි **'භික්ඛක'**නම්වේ. භික්ෂාව ලබනුයේ හෝ නොලබනුයේ හෝ ආයය්‍යාචනයෙන් සිහායන්නේය යනඅරථියි. බුදුධාදීන්විසින් පැමිණි පිඩුසිහා යෑමෙහි යෙදුනුබැවින් භික්ෂාවය්‍යීයට එළැඹියේ නම්වේ. යම් කිසිවෙක්වනාහි සවලපවූ හෝ මහත්වූ හෝ භොගරාශිය හැරදමා ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවූයේවේද, හෙතෙමේ සීසෑම් ගෙරිරැකීම් ආදියෙන් ජීවිකාවකිරීම හැරපියා, ශ්‍රමණලිඬගය පිළිගැණීම හෙතුකොටගෙනම පිඬුපිණිස හැසිරීමට පැමිණියේනුයි **භික්ඛු**නම. පරා පිළිබඳ ජීවිකාව ඇතිබැවින් හෝ වෙහෙර මැද හිඳ කඳින් ගෙනෙනලද බත අනුභවකරනුයේද, පිඬුපිණිස හැසිරීමට පැමිණියේනුයි **භික්ඛු**නම. පිණ්ඩියාලොප භොජනයනිසා පැවිද්දෙහි උත්සාහ හටගත්බැවින් හෝ පිඬුපිණිස හැසිරීමට පැමිණියේනුයි **භික්ඛු**නම. අගය, පහස, පැහැයයන මේදයේ පළමුපැවති ස්වභාවය දුරුවීමෙන් හිතුවූ පට දරානුයි **භින්නපටධර** නම. එහි සැතින් සිදීමෙන් අගය බිඳීයෑම දතයුතුය. දහසක් අගනාවූද වස්ත්‍රය කුදුමහත් කඩකඩකොට සැතින් සිදිනලද්දේ බිඳීගිය වටිනාකම් ඇත්තේය. මුල් අගයෙන් අඩකුදු නොවටින්නේය. හුයෙන් මැසීම හෙතුකොට පහස බිඳීයෑම දතයුතුය. සුවපහස්ඇති වස්ත්‍රය හූවලින් මසනලද්දේ බිඳීගිය පහස ඇත්තේවේ. රළුපහස් ඇතිබවට පැමිණෙන්නේය. හිදිමලආදිය හෙතුකොට පැහැය බිඳීයෑම දතයුතුය. ඉතා පිරිසිදුවූද වස්ත්‍රය හිදිකම්හිපටන් හිදිමලින්ද අත්හිවූ ඩහදිය, මල, දූලි, ආදියෙන්ද අවසන්හි රඳන් ගැන්වීමෙන් හා කප්බිදු තැබීමෙන්ද බිඳුනුපැහැය ඇත්තේවේ. පියවිපැහැය හැර සිටුනේය. මෙසේ තුන්අයුරකින් බිඳීගිය වස්ත්‍ර දරණබැවින් හින්නපටධරණුයේ **භික්ඛු**නම්. ගිහින්ගේ වස්ත්‍රයන්ට විසභාගවූ හෝ කසටවත් දූරීම් පමණකින්ම හින්නපටධරණුයේනුයි **භික්ඛු**නම.

'සමඤ්ඤය' ප්‍රඥප්තියෙන්, ව්‍යවහාරයෙන් යනඅරථියි. ඇතැම් එකෙක් ව්‍යවහාරයෙන්ම 'භික්ඛු'යි පෙණෙන්නේය. ඒ එසේමය. නිමන්ත්‍රණාදියෙහි භික්ෂූන් ගණිනු ලබනකල්හි හෙරණුන්ද ගෙන, මහණහු සියයක, මහණහු දහසකැයි කියත්.

'පටිඤ්ඤය' තමන්ගේ ප්‍රතිඥවෙන් හෝ ඇතැම් එකෙක් ප්‍රතිඥවෙනුදු 'භික්ඛු'යි පෙණෙන්නේය. 'මෙහි කවරෙක්වේද'යි විවාළකල්හි 'ඇවැත! මම භික්ෂු වෙමි'යි මේ ආදි තන්හි ඒ ප්‍රතිඥවෙහි සමභවය දතයුතුය.

ආනන්ද ස්ථවිරයන්වහන්සේවිසින් වදළබැවින් මෝ ධාර්මික ප්‍රතිඥවක්වේ. රාත්‍රි කාලයෙහි පෙරමග එන දුශ්ශීලයෝද 'මෙහි කවරෙක්ද'යි ඇසූකල්හි අධිශීලශික්ෂාදි භික්ෂුගුණ රහිතවූ අධාර්මික ප්‍රතිඥවෙන් 'අපි භික්ෂුවම්හ'යි කියත්.

'එහි භික්ඛූති භික්ඛු'නම්. භාග්‍යවතුන්වහන්සේවිසින් 'එව මහණ!' යි වදළ වචන මාත්‍රයෙන්ම භික්ෂුභාවයට, එහිභික්ෂූපසම්පදවට පැමිණි මහණතෙමේය. භාග්‍යවතුන්වහන්සේවනාහි එහිභික්ෂුභාවයට හෙතුසම්පත්ඇති පුද්ගලයෙකු දක, තමන්වහන්සේ පෙරවූ රත්පවුල්සිවුරු අතරින් සඬ්ඝාවඬ්ඝාවූ දකුණ ශ්‍රීහස්තය බැහැරටගෙන බ්‍රහ්මඝොෂය විහිදුවමින් 'මහණ! මෙහි එව, දුක් කෙළවරකිරීමපිණිස මනාකොට බඹසර හැසිරෙව'යි වදරණසේක. භාග්‍යවතුන්වහන්සේගේ ඒ වචනය සමගම ඔහුගේ ගිහිලකුණු අතුරුදහන් වන්නේය. ඒ හා ඔහුට පැවිද්ද හා උපසම්පදව උපදී. හිස මුඩුව හැඳි කසාවත් ඇත්තේවේ. එකක් හැඳ එකක් පෙරවගෙන එකක් උරහිස තබා වම්උරහිස ලැඟුනු නිලුපුල් පැහැති මැටිපයක් ඇත්තේවේ. 'තුන්සිවුරද, පාත්‍රයද, දෑහැටිඳුඬු කපන වෑයද, හිද්දද, කාබානද, පෙරහනද යනමේ අටභාවනාවෙහි එක්වන යෙදීම් ඇති මහණහු අයත්'යි මෙසේ කියූ සිරුරෙහි බහාලූ අටපිරිකරින්ම යුකතව සියවස්ඇති සථවිරතමක්සේ ඊර්ෂ්‍යාපථසම්පන්නවූයේ බුදුරජානන්වහන්සේම ප්‍රව්‍රජ්‍යාචාර්‍යයිකොට ඇත්තේ බුදුරජානන්වහන්සේම උපාදධ්‍යායකොට ඇත්තේ, සම්මාසම්බුදුරජානන්වහන්සේ වදිමින්ම සිටුනේය.

භාග්‍යවතුන්වහන්සේවනාහි ප්‍රථමබොධියෙහි එක්කලෙක එහි භික්ෂූපසම්පදවෙන්ම උපසම්පද කළසේක. මෙසේ උපසපන්වූ භික්ෂූහු එක්දහස් තුන්සිය එක්සාළිසක්වූහ. පඤ්ඝතෙරහුය. යස කුලපුත්‍රය, ඔහුගේ පිරිවරවූ සිවුපණසක් යහළුවෝය, නිංසහද්‍රවර්ගීයයෝය. දහසක් පුරාණ ජටිලයෝය. දෙඅගසවිවින් හා දෙසියපණසක් පිරිවැජියෝය, අහුල්මල් තෙරය යනමොවුහු ඔවුහුය.

'තීණිසතං සහස්සඤ්ච - චත්තාළීසං පුනාපරෙ,
එකො ච ථෙරො සපඤ්ඤො - සබ්බෙ තෙ එහි භික්ඛුකා'යි මෙය අටුවාවෙහි කියනලදී.

හුදෙක් මොවුහුම එහිභික්ෂූහු නොවෙති. අන්‍යවූද බොහෝ 'එහිභික්ෂූහු'වෙත්. ඔවුහු කවරහුදයත්: තෙසියයක්දෙනා පිරිවරකොටඇති **සෙල** බ්‍රාහ්මණය, දහසක්දෙනා පිරිවරකොටඇති **මහා කපිණය, කිඹුල්වත්**පුර වැසි දසදහසක් කුලපුත්‍රයෝය. සොළොස්දහසක් **පාරායණික**

බ්‍රාහ්මණයෝය, යනමේ ආදීහුය. ඔවුහුවනාහි විනයපිටකපාළියෙහි නොදක්වූබැවින් අටුවාවෙහි නොකියනලදහ. මොවුහු එහි විනයපිටකපාළියෙහි දක්වනලදබැවින් කියනලදහ.

'සත්තවීස සහස්සානි - තීණියෙව සතානි ච,
එතෙ හි සබ්බෙ සඩ්ඛාතා - සබ්බෙ තෙ එහි භික්ඛුකා'

සත්විසි දහස් තුන්සියයක්දයන මේ සියලුදෙන සමග ගණිනලද සියල්ලෝ එහිභික්ෂූහුය.

තීහි සරණගමනෙහි උපසම්පන්නෝ' 'බුද්ධං සරණං ගච්ඡාමි'යනාදි නයින් තෙවරක් වාගෙහදකොට කියනලද ත්‍රිවිධශරණගමනයෙන් උපසපන්වූයේය.

මෝ උපසම්පද වනාහි අටවැදරුම්වූවාය: **එහි භික්ඛු උපසම්පද, සරණගමනඋපසම්පද, ඔවාදපටිග්ගහණඋපසම්පද, පඤ්හව්‍යාකරණ-උපසම්පද, ගරුධම්මපටිග්ගහණඋපසම්පද, දූතෙන උපසම්පද, අට්ඨවාචිකා උපසම්පද, ඤත්තිචතුත්ථකම්ම උපසම්පද**යි.

ඒ උපසම්පදඅතුරෙහි එහිභික්ඛුඋපසම්පදව හා සරණගමන උපසම්පදවද කියනලද්දීමය. ඔවාද පටිග්ගහණඋපසම්පදනම්, **'තස්මාතිහ තෙ කස්සප!' එවං සික්ඛිතබ්බං: තිබ්බං මෙ හිරොත්තප්පං පච්චුපට්ඨිතං භවිස්සති ථෙරෙසු නවෙසු මජ්ඣිමෙසු වාති, එවං හි තෙ කස්සප! සික්ඛිතබ්බං. තස්මාතිහ තෙ කස්සප! සික්ඛිතබ්බං: යං කිඤ්චි ධම්මං සොස්සාම කුසලූපසංහිතං, සබ්බං තං අට්ඨිං කත්වා මනසි කත්වා සබ්බං චෙතසා සමන්නාහරිත්වා ඔහිතසොතෝ ධම්මං සොස්සාමීති එවං හි තෙ කස්සප! සික්ඛිතබ්බං තස්මාතිහ තෙ කස්සප! එවං සික්ඛිතබ්බං: සාතසහගතාව මෙ කායගතාසති න විජහිස්සතීති. එවං හි තෙ කස්සප! සික්ඛිතබ්බං**[A]යන මේ අවවාද ප්‍රතිග්‍රහණයෙන් **මහාකාශ්‍යප** මහාසථවිරයන් වහන්සේට අනුදනවදළ උපසම්පදය.

පඤ්හව්‍යාකරණ උපසම්පදනම්, **සොපාක** හෙරණහුට අනුදනවදළ උපසම්පදය. භාග්‍යවතුන්වහන්සේවනාහි **පූර්‍වාරාමයෙහි** එක්වන් සක්මන්කරන සොපාක හෙරණහුගෙන් **'උඳුම්මාතකසඤ්ඤාති වා සොපාක! රූපසඤ්ඤාති වා ඉමෙ ධම්මා නානට්ඨා නානාබ්‍යඤ්ජනා, උදාහු එකට්ඨා ව්‍යඤ්ජන මෙව නානං'**[B]යි දශඅශුභනිශ්‍රිත ප්‍රශ්න විචාළසේක. ඒ හෙරණතෙමේ ඒ ප්‍රශ්න ප්‍රකාශකෙළේය. භාග්‍යවතුන්වහන්සේ ඔහුට සාධුකාරදී 'සොපාක! කෙතෙක් වස් ඇතියෙහිද'යි අසා වදළසේක. 'භාග්‍යවතුන්වහන්ස! මම සත්වස්

A කස්සපසංයුත්ත B කස්සප කස්සපසංයුත්ත

ඇතියෙමි'යි සොපාක කියේය. 'සොපාක! මාගේ සවීඥතාඥනය සමග සසඳ ප්‍රඥා විසඳුයෙහි'යි තුටුවින් ඇති භාග්‍යවතුන්වහන්සේ ඔහුට උපසම්පදාව අනුදත්වේක. පඤ්හාබ්‍යාකරණ උපසම්පදය.

ගරුධම්මපටිග්ගහණ උපසම්පදනම්, **මහාප්‍රජාපතියගේ** අෂ්ටගරුධර්මප්‍රතිග්‍රහණය හෙතුකොට ප්‍රජාපතියට අනුදැනවදළ උපසම්පදය.

දූතෙන උපසම්පදනම්, **අඩ්ඨකාසී** වෙසහනට අනුදැනවදළ උපසම්පදය.

අට්ඨවාචිකා උපසම්පදනම්, භික්ෂුණියට භික්ෂුණීසඞ්ඝයාවෙතින් ඥප්තිචතුර්ථකර්මයෙන් හා භික්ෂුසඞ්ඝයාවෙතින් ඥප්තිචතුර්ථකර්මයෙන්ද යන මේ දෙවැදරුම්වූ කර්මයෙන් අනුදැනවදළ උපසම්පදය.

ඤත්තිචතුත්ථකම්ම උපසම්පදනම්, භික්ෂූන් පිළිබඳ මෙකල්හි පවත්නා උපසම්පදය.

මේ අටවැදරුම්වූ උපසම්පදඅතුරෙහි යම් මේ උපසම්පදවක් **'අනුජානාමි භික්ඛවෙ ඉමෙහි තීහි සරණගමනෙහි පබ්බජ්ජං උපසම්පදං'**[A]යි අනුදත් මේ උපසම්පදවෙන් උපසපන්වූයේයයි කියනලද්දේවේ.

'භද්‍රෝ' පවිනැත්තේය. කල්‍යාණ පෘථග්ජනාදීහුපටන් රහතුන්වහන්සේතෙක් භික්ෂූහු හඳුවූ ලාමක නොවූ ශීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් විමුක්තියෙන් විමුක්තිඥානදර්ශනයෙන් සමන්වාගතබැවින් පවිනැති භික්ෂූහුයි ගිනීමට යෙත්. **'සාරෝ'** ඒ ශීලසාරාදියෙන්ම සමන්වාගතබැවින් නිල්පැහැය හා එක්වීමෙන් නිල්වූ වස්ත්‍රයමෙන් සාරවූ භික්ෂුතෙමේයි දතයුතුය. පහවූ කෙලෙස්මල ඇතිබැවින් ක්ෂීණාස්‍රව තෙමේම සාරයි දතයුතුය. **'සෙඛෝ'** පෘථග්ජනකල්‍යාණයා සමග සප්තආර්‍යයෝ, ත්‍රිවිධශික්ෂාවන් හික්මෙත්නුයි ශෛක්ෂයහ. ඔවුනතුරෙහිවූ යම්කිසි ශෛක්ෂයෙක් භික්ෂුයි දතයුතුය. නොහික්මේනුයි අශෛක්ෂ නම්වේ. හික්මියයුතු ශෛක්ෂ ධර්මයන්හි හික්මී අවසන්කොට ඒ ශෛක්ෂධර්ම ඉක්මවා ගොස් අග්‍රඵලයෙහි සිටියේ, ඉන් මතුවෙහි හික්මිය යුත්තක් නැතිබැවින් ක්ෂීණාස්‍රවතෙමේ **අසෙඛයි** කියනුලැබේ. **'සම්මග්ගෙන සඩ්ඪන** සියලු අන්තිම ක්‍රමයෙන් පස්වගින් කටයුතුවූ කර්මයෙහි යම්පමණ භික්ෂූහු කර්මයට සුදුසු වූවාහු ද, ඔවුන් පැමිණි බැවින් ඡන්දය ගැණීමට සුදුසු වූවන්ගේ ඡන්දය ගෙනආබැවින් හමුවූවන් බැහැර නොකිරීමෙන්ද එක්ම කර්මයෙහි සමග්‍රභාවයට පැමිණියාවූ සඩ්ඝයාවිසින් **'ඤත්තිචතුත්ථකම්මෙන'** අනුශ්‍රාවණ තුණකින් හා එක් ඤත්තියකිනුදු කටයුතුවූ. **'කම්මෙන'** ධාර්මික

A මහාවග්ග - මහාඛන්ධක

විනයකර්මයෙන්. **'අකුපෙපන'** වත්තු - ඤත්ති - අනුසාවණ - සීමා - පරිසසම්පත්තියෙන් යුක්තබැවින් වෙනස් නොකළහැකිබවට බැහැර නොකටහැකිබවට පැමිණියාවූ **'ඨානාරහෙන'** උපසම්පද කර්මකරණයට සුදුසු වූ ශාස්තෘශාසනයට සුදුසු වූ. **'උපසම්පන්නො'** උපසම්පන්නනතම් උපරිම භාවයට මොනවට පැමිණියේය. පත්වූයේය යනඅර්ථයි. භික්ෂුභාවයම උපරිභාවයවේ. මෙතෙමේ කියූ විනයකර්මයෙන් එයට මොනවට පැමිණිබැවින් උපසම්පන්නයි කියනුලැබේ.

මෙහිද එහිභික්ඛු උපසම්පද - සරණගමන උපසම්පද - ඔවාද - පටිගහණ උපසම්පද - පඤ්හබ්‍යාකරණ උපසම්පදයන මෙයින් උපසපන්වූවෝ ලොකවජ්ජ ශික්ෂාපද ව්‍යතික්‍රමයෙහි අභව්‍යබැවින්ද ගරුධම්මපටිගහණ උපසම්පද - දූතෙන උපසම්පද - අට්ඨවාචික උපසම්පදයන මෙතුන භික්ෂූණීන්ට අනුදත්බැවින්ද, එක්ම ඤත්තිචතුත්ථකම්ම ආයේය. මෙතැන් සිට චතුර්විධසඞ්ඝකම් ගෙණහැරදක්වා විස්තරවිසින් **කියයුතුයයි සියලු අර්ථ කථාවන්හි කියනලද්දේය. ඒ සඞ්ඝකම්ද අපලොකනකම් - ඤත්තිකම් - ඤත්තිදුතියකම් - ඤත්තිචතුත්ථකම්යි** පිළිවෙළින් තබා විස්තරවශයෙන් ඛන්ධකයෙන්ද පරිවාරාවසානයෙහි කම්විභඞ්ගයෙන්ද පාළිය ගෙනහැර දක්වා කියනලදී. අපි ඒ කම්, පරිවාරාවසානයෙහි කම්විභඞ්ගයෙහිම විස්තර කරන්නෙමු. මෙසේ ඇතිකල්හි ප්‍රථමපාරාජික වර්ණනාවද බැරෑරුම් නොවන්නීය. තුඹුපරිදි පාළිය පිළිබඳ වර්ණනාවද මැනැවින් දතහැකි වන්නීය. ඒ සථාන ශූන්‍යද නොවන්නාහ. එහෙයින් පද අනුවම වර්ණනාව කරන්නෙමු.

'තත්‍ර' 'තෙසු භික්ඛූසු' යනාදි ක්‍රමයෙන් කියනලද භික්ෂූන් අතුරෙහි **'යොයං භික්ඛු'** යම් මේ මහණෙක් තෙමේ. **'සම්මග්ගෙන සඞ්ඝෙන - පෙ- උපසම්පන්නො'** යන මෙහි අටවැදෑරුම් උපසම්පදවන්අතුරෙහි ඤත්තිචතුත්ථකම්යෙන්ම උපසපන්වූයේය. **'අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛු'** 'මෙතෙමේ මෙවුන්දම් සෙවනයකොට පාරාජිකවූයේ වේය'යන මේ අර්ථයෙහි ගැනෙන භික්ෂුතෙමේයයි අදහස්කරණලද්දේය. 'භික්ඛකො'යනාදිවිසින් ගැනෙන අන්‍යයෝවනාහි අතේවාදාරවශයෙන් කියනලදහ. ඔවුනතුරෙහිද **'භික්ඛකො'** යනාදීහු නිරුක්තිවශයෙන් කියනලදහ. **'සමඤ්ඤය භික්ඛු, පටිඤ්ඤය භික්ඛු'**යන මේ දෙක ව්‍යවහාරවශයෙන් කියනලදී. **'එහිභික්ඛු'** යනු බුද්ධොපාධ්‍යායයන්වහන්සේ කරනකොට පිළිලද උපසම්පදවසයෙන් කියනලදී. ශරණාගමන භික්ෂුතෙමේ ඤත්තිචතුත්ථ කම්වාක්‍යය නොඋපන්කල්හි පිළිලද උපසම්පදවසයෙන් කියනලදී. **'භද්‍රො'** යනාදීහු ගුණවසයෙන් කියනලදහයි දතයුතුය.

දන් **'භික්ඛූනං'** යන මේ පදය විශෙෂාර්ථයක් නොමැතිබැවින් විභාග නොකොටම යම් ශික්ෂාවකටද යම් සාජීවයකටද පැමිණිබැවින් භික්ෂූන්ගේ ශික්ෂාසාජීවයට පැමිණියේවේද, එය දක්වනසේක් **'සික්ඛා'** යනාදිය වදළසේක. එහි භික්මිය යුත්තීනුයි ශික්ෂානම්. **'තිසොසා'**යනු ගණන් පිරිසිදීමය. **'අධිසීලසික්ඛා'** අධිකවූ උත්තමවූ සීලයනුයි අධිසීලනම්. අධිසීලවූයේද ඒ මය. භික්මියයුතුබැවින් සික්ඛාවූයේද ඒමනුයි අධිසීලසික්ඛානම්. අධිචිත්ත - අධිප්‍රඥශික්ෂාවත්හිද මේ ක්‍රමයවේ.

මෙහි වනාහි ශීලය කවරේද? අධිශීලය කවරේද? චිත්තය කවරේද? අධිචිත්තය කවරේද? ප්‍රඥව කවරීද? අධිප්‍රඥව කවරීද? යන මේ ප්‍රශ්නයන්හිලා කියනුලැබේ. පඤ්චාඞ්ගශීල - දශාඞ්ගශීල වනාහි ශීලමවේ. ඒ ශීල බුදුරජුන් උපන්කල්හිද නොඋපන්කල්හිද ලෙවිහි පවත්නේය. බුදුරජුන් උපන්කල්හි බුදුවරයෝද ශ්‍රාවකයෝද මහාජනයා ඒ ශීලයෙහි සමාදන්කරවත්. බුදුරජුන් නොඋපන්කල්හි පසේබුදුවරයෝද, කම්වාදී ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණයෝද, සක්විති මහරජහුද, මහාබොධිසත්ත්වයෝද මහාජනයා ඒ ශීලයෙහි සමාදන් කරවත්. පණ්ඩිත ශ්‍රමණ බ්‍රාහ්මණයෝ, තුමූද සමාදන්වෙත්. ඔවුහු ඒ කුශලධර්ම සම්පූර්ණකොට දෙවියන් අතුරෙහිද මිනිසුන් අතුරෙහිද සම්පත් අනුභවකරත්.

ප්‍රාතිමොක්ෂසංවරශීලයවනාහි අධිශීලයයි කියනුලැබේ. ඒ ශීලය ආලොකයන්අතුරෙහි සූර්‍යයාමෙන්ද පර්වතඅතුරෙහි මහාමේරුවමෙන්ද සියලු ලෞකික ශීලඅතුරෙහි අධිකවූයේද උත්තමවූයේද බුද්ධොත්පාදයෙහිම පවත්නේය. බුද්ධොත්පාදකාලය හැර අන්‍යකාලයෙක්හි නොද පවත්නේය. 'මේ වස්තුවෙහි මේ ව්‍යතික්‍රමයෙහි මෙනම්වේය'යි ඒ ප්‍රඥප්තිය උදුරා තබන්නට අන්‍යසත්ත්වයෙක් සමර්ථනොවේ. බුදුවරයෝමවනාහි හැමතින් කායවාග්ද්වාරයන්හිවූ අද්ධ්‍යාචාරස්‍රොතස සිඳහැර ඒ ඒ ව්‍යතික්‍රමයට සුදුසුවූ ඒ ශීලසංවරය පණවත්. ප්‍රාතිමොක්ෂසංවරයටද වඩා මාර්ගඵල සම්ප්‍රයුක්ත ශීලයම අධිශීලයවේ. ඒ ශීලයවනාහි මෙහි අදහස් නොකරණුලදී. එයටපැමිණි මහණතෙමේ මෙවුන්දම් සෙවීම නොකරන්නේමය.

අටවැදෑරුම් කාමාවචර කුසල්සිත් හා අටවැදෑරුම් ලෞකිකසමාපත්ති සිත්ද එක්කොට චිත්තයමැයි දතයුතුය. බුද්ධොත්පාදයෙහි හා අබුද්ධොත්පාදයෙහි මේ චිත්තයෙහි පැවැත්මද සමාදන්කරවීමද සමාදන්වීමද ශීලයෙහි කියූ නයින්ම දතයුතුය.

විදර්ශනාපාදක අෂ්ටසමාපත්තිචිත්තය අධිචිත්තයයි කියනුලැබේ. ඒ අධිචිත්තය ශීලඅතුරෙහි අධිශීලය මෙන් සියලු ලෞකික චිත්තයන්අතුරෙහි අධිකවූයේත් උත්තමවූයේත් බුද්ධොත්පාදයෙහිමවේ. බුද්ධොත්පාදය හැර

නොවේ. එයටද වඩා මාගීඵලසම්ප්‍රයුක්ත චිත්තයම අධිචිත්තය වන්නේය. ඒ අධිචිත්තය මෙහි අදහස් නොකරනලද්දේය. මාගීඵලසම්ප්‍රයුක්ත චිත්තයට පැමිණි මහණතෙමේ මෙවුන්දම් සෙවීම නොකරන්නේමය.

'අත්ථි දින්නං අත්ථි යිට්ඨං' යනාදිනයින් පැවති කම්ඵලඤාණඤාණය ප්‍රඥානම්. ඒ ප්‍රඥා බුදුරජුන් උපන්කල්හිද නොඋපන්කල්හිද ලෙවිහි පවත්නීය. බුදුරජුන් උපන්කල්හි බුදුවරයෝද, ශ්‍රාවකයෝද, මහාජනයා ඒ ප්‍රඥාවෙහි සමාදන්කරවත්. බුදුරජුන් නොඋපන්කල්හි පසේබුදුවරයෝද, කම්වාදී ධාර්මික ශ්‍රමණබ්‍රහ්මණයෝද, සක්විතිමහරජහුද මහා බොධිසත්ත්වයෝද මහා ජනයා ඒ ප්‍රඥාවෙහි සමාදන්කරවත්. පණ්ඩිත සත්ත්වයෝතුමූම සමාදන්වෙත්. ඒ එසේමය. අඞ්කුර තෙමේ අවුරුදු දසදහසක් මහදන් දුන්නේය. වෙලාම බ්‍රාහ්මණතෙමේද විශ්වන්තර රජතෙමේද අන්‍යවූ බොහෝ පණ්ඩිතමනුෂ්‍යයෝද මහදන් දුන්හ. ඔවුහු ඒ කුශලකම්ය සම්පූර්ණකොට දෙවියන්අතුරෙහිද, මනුෂ්‍යයන්අතුරෙහිද සම්පත් අනුභවකළහ.

අනිත්‍යාදි ත්‍රිලක්ෂණයාගේ ආකාරය පිරිසිඳ දන්නාවූ විදර්ශනාඤාණය වනාහි අධිප්‍රඥායයි කියනුලැබේ. ඒ ප්‍රඥා තොමෝවනාහි ශීල-චිත්තඅතුරෙහි අධිශීල - අධිචිත්තමෙන් සියලු ලෞකිකප්‍රඥාවන්අතුරෙහි අධිකවූවාද උත්තමවූවාදවේ. බුද්ධොත්පාදය හැර අන්කාලයක ලෙවිහි නොපවත්නීය. එයටද වඩා මාගීඵල ප්‍රඥාවම අධිප්‍රඥානම්වේ. ඕතොමෝවනාහි මෙහි අදහස් නොකරනලදී. ඒ අධිප්‍රඥාවට පැමිණි මහණතෙමේ මෙවුන්දම් සෙවීම නොකරන්නේය.

'තත්‍ර' ඒ ත්‍රිවිධශික්ෂාවන්අතුරෙහි **'යායං අධිසීලසික්ඛා'** යම් මේ ප්‍රාතිමොක්ෂශීලසඞ්ඛ්‍යාත අධිශීල ශික්ෂාවක් වන්නීද **'එතං සාජීවං නාම'** භාග්‍යවතුන්වහන්සේවිසින් විනයයෙහි තබනලද මේ සියලුම ශික්ෂාපදවේද, මෙහි යම්හෙයකින් නානාවිධ දෙශ, ජාති, ගොත්‍රාදිභෙදයෙන් භින්නවූ භික්ෂූහු එක්ව ජීවත්වෙත්ද, එක්ම දිවිපැවැතුම් ඇත්තාහු සම පැවැතුම් ඇත්තාහුවෙත්ද, එහෙයින් **'සාජීව'**යි කියනුලැබේ. **'තස්මිං සික්ඛති'** කිසියේත් ඒ ශික්ෂාපදය සිතට ආධාරස්ථානකොට ශික්ෂාපදයලෙසින් හික්මෙමිද, නොහික්මෙමිදැයි සිතින් බලමින් හික්මේද හුදෙක් මෙතෙමේ ඒ සාජීවසඞ්ඛ්‍යාත ශික්ෂාපදයෙහිම හික්මෙන්නේ නොවේ. ත්‍රිවිධශික්ෂාවෙහිද හික්මෙන්නේය. **'එතං සාජීවං නාම** යන මේ අනතුරුපදයාගේ වසයෙන් එහි හික්මේයයි විදාරණලද්දේය. ඒ මෙසේ විදරණ ලද්දේ නමුත් අධිශීලසඞ්ඛ්‍යාත ශික්ෂාවෙහි ශීලසංවරය පූරමින් හික්මෙයි. භාග්‍යවතුන්වහන්සේගේ වචනසඞ්ඛ්‍යාත ශික්ෂාපද නොඉක්මවමින් ඒ ශික්ෂාපදයෙහි හික්මේයයි මෙහි මෙසේ අත්ථදත්‍යුතය. **'තෙන වුච්චති සාජීවසමාපන්නෝ'** මෙද අනන්තරවූ සාජීව පදයේමවසයෙන් විදරණලදී.

යම්හෙයකින් හෙතෙමේ ශික්ෂාවටත් පැමිණියේවේද, එහෙයින් ශික්ෂාසමාපන්නයයිද අර්ථවශයෙන් දතයුතුය. මෙසේ ගත්කල්හි **'සික්ඛාසාජීවසමාපන්නො'**යන මේ පදයෙහි පදභාජනයද සම්පූර්ණවන්නේය.

'සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා' ශික්ෂාවද පිළිකෙව් නොකොට දුබලබවද නොපවසා යම්හෙයකින් දුබලබව පැවසූකල්හිද ශික්ෂාව පිළිකෙවු නොකරනලද්දීමවේද, ශික්ෂාවවනාහි පිළිකෙවුකළකල්හි දුබලබව ප්‍රකාශකරනලද්දේමවේද, එහෙයින් **'දුබ්බල්‍යං අනාවිකත්වා'**යන මේ පදයෙන් කිසි විශෙෂාර්ථයක් නොලැබෙන්නේය. යම්සේවනාහි **'දිරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය'**යි කියූකල්හි 'දවිරත්ත' වචනයෙන් කිසි විශෙෂාර්ථයක් නොලැබෙන්නේද, හුදෙක් ලොකව්‍යවහාරවශයෙන් ව්‍යඤ්ජනයන් පිළිබඳ ශ්ලිෂ්ටතාවෙන් මුඛාරූඪභාවයෙන් මෙය වදරණලද්දේය. මෙසේ මෙද ව්‍යවහාරසුඛයපිණිස ව්‍යඤ්ජන ශ්ලිෂ්ටතාව පිණිස මුඛාරූඪභාවයපිණිස වදරණලදැයි දතයුතුය. නොහොත් යම්හෙයකින් භාග්‍යවතුන්වහන්සේ අර්ථසහිතව ව්‍යඤ්ජන සහිතව ධර්ම දෙශනාකරණසේක්ද, එහෙයින් **'සික්ඛං අපච්චක්ඛාය'**යන මෙයින් අර්ථය සම්පාදනයකොට **'දුබ්බල්‍යං අනාවිකත්වා'**යන මෙයින් ව්‍යඤ්ජනය සම්පාදනය කරනසේක.

පරිවාරකපද විරහිතව කියනුලබන එක්ම අර්ථපදය පරිවාරජනවිරහිතවූ රජුමෙන්ද, වස්ත්‍රාලඞ්කාර විරහිතවූ පුරුෂයාමෙන්ද නොහොබනේය. ඒ පදය පරිවාරකවූ අර්ථානුලොමවූ සහායපදයක්සමග සිටියේ හොබනේය. නොහොත් යම්හෙයකින් **'බුද්ධං පච්චක්ඛාමි'** යනාදි ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන වචනයෙහි අර්ථය ඇතැම් දුබ්බල්‍යාවිකම්යෙක්වේද, එහෙයින් ඒ අර්ථභූත දුබ්බල්‍යාවිකම්යයදහා **'සික්ඛං අපච්චක්ඛාය'**යන පදයෙහි අර්ථය විවෘතකරනයේක් **'දුබ්බල්‍යං අනාවිකත්වා'**යනු වදළසේක. එහි මෙසේ වන්නේය: යම්හෙයකින් සියලු දුබ්බල්‍යාවිකම්ය සඳහා ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය නොවේද, එහෙයින් **'දුබ්බල්‍යං අනාවිකත්වා'**යනු පළමුකොට වදරා එහි අර්ථනියමය පිණිස **'සික්ඛං අපච්චක්ඛාය'**යනු කියයුතු නොවන්නේද? හෙද යුතුනොවේ. කුමක්හෙයින්ද්‍යත්: අර්ථයෙහි අනුපිළිවෙළ නැතිබැවිනි. **'සික්ඛාසාජීව සමාපන්නො'**යි වදළබැවින් යම් ශික්ෂාවකට පැමිණියේවේද, ඒ ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යානය නොකොටැයි කියනුලබන්නේ අර්ථය පිළිවෙළින් කියනලද්දේවේද අන්අයුරකින් කියනුලබන්නේ එසේනොවේද, එහෙයින් **'සික්ඛං අපච්චක්ඛාය'** යන මෙයම පළමුකොට වදරණලද්දේය. තවද **'සික්ඛාසාජීවසමාපන්නො'** යන මෙහි යම් ශික්ෂාවකට පැමිණියේද, ඒ ශික්ෂාව බැහැරනොකොට යම් ජීවයකට පැමිණියේද එහි දුබලබව පහළනොකොටැයි අනුපිළිවෙළින් මෙහි අර්ථ දතයුතුය.

දැන් ශික්ෂාප්‍රත්‍යාක්‍යාන දුර්ව්‍යාවිකම්යන්ගේ විශෙෂ අවශෙෂයත් ශික්ෂාප්‍රත්‍යාක්‍යාන ලක්ෂණත් දක්වනයේක් **'අත්ථි භික්ඛවෙ'**යනාදිය වදළයේක. එහි **'අත්ථි භික්ඛවෙ'** යනාදිය මාතෘකාපද දෙකෙකි. එය බෙදදක්වනයේක් **'කථඤ්ච භික්ඛවෙ'** යනාදිය වදළයේක. මේ එහි ප්‍රකටනොවූ පදවල වණ්නනාය: **'කථං'** කිනම් අයුරකින් **'දුබ්බල්‍යාවිකම්මං ච'** දුර්ව්ලභාවයාගේ පහළකිරීමද, **'ඉධ'** මේ ශාසනයෙහි. **'උක්කණ්ඨිතො'** නොඇලීමෙන් මේ ශාසනයෙහි දුඃඛජීවිකාවට පැමිණියේය. නොහොත් 'අද යම්, හෙට යම්, මෙතැනින් යම්, මෙහිදී යම්'යි ගෙල ඔසොවා ගෙන වසනුයේය. .විසුරුණු සිතැත්තේය. එකඟනොවූ සිතැත්තේයයි කියනලද්දේවේ. **'අනභිරතො'** ශාසනයෙහි ඇලීමෙන් තොරවූයේය. **'සාමඤ්ඤං චවිතුකාමො'** ශ්‍රමණභාවයෙන් පහවයනු කැමැත්තේය. **'භික්ඛුභාවං'** භික්ෂුභාවයෙන්. කරණාර්ථයෙහි දවිතීයාවචනයි. **'කණ්ඨෙ ආසත්තෙන අට්ටියෙය්‍ය'**[A]යනාදී තන්හිවිනාහි ලක්ෂණ පරිදි කරන වචනයෙන්ම වදරණලද්දේය. **'අට්ටියමානො'** බැගෑපත්වූවකු පෙළුනෙකු දුකට පත්වූවෙකුමෙන් තමන් හසුරුවන්නේය. ඒ භික්ෂුභාවයෙන් හෝ බැගෑපත්වූවෙක් කරනු ලබන්නේය, පෙළනුලබන්නේය යනඅර්ථයි. **'හරායමානො'** ලජ්ජිතවනුයේය. ඒ භික්ෂුභාවයෙන් හෝ බැගෑපත්වූවෙක් කරනු ලබන්නේය, පෙළනුලබන්නේය යනඅර්ථයි. **'හරායමානො'** ලජ්ජිත වනුයේය. **'ජිගුච්ඡමානො'** අසුචියටමෙන් ඒ භික්ෂුභාවය පිළිකුල්කරනුයේය. **'ගිහීභාවං පත්ථයමානො'** යනාදීහු ප්‍රකට අර්ථඇත්තාහුමය. **'යන්නූනාහං බුද්ධං පච්චක්ඛෙය්‍යං'**යන මෙහි **'යන්නූන'**යනු පරිවිතර්ක දර්ශනයෙහි නිපාතයි. 'ඉදින් මම බුදුන් ප්‍රතික්ෂෙපකරන්නෙම්නම් එකාන්තයෙන් මට යහපතක්වන්නේය'යි මේ කියනලද්දේවේ. **'වදති විඤ්ඤුපෙති'** මේ අර්ථය මෙයින් හෝ අන්‍යව්‍යඤ්ජනයන්ගෙන් හෝ වාග්භෙදකොට කියාද, යමක්හට කියාද ඔහුට හඟවාද දන්වාද **'එවම්පි'** මෙහිවූ පිකාරය මතුවෙහි අර්ථයන්ගේ පිඩුකිරීම ප්‍රයොජනකොට සිටියේය. මෙසේද දුර්ව්ල්‍යාවිකම්යවේ. අන් පරිද්දකින් ශික්ෂාවද ප්‍රත්‍යාක්‍යානය නොකරණ ලද්දේවේ.

දැන් ඒ දුබලබව පහළකිරීමද ශික්ෂාවගේ අප්‍රත්‍යාක්‍යානයද අන් පරිද්දකිනුදු දක්වනයේක් **'අථවා පන'** යනාදිය වදළයේක. ඒ සියල්ල අර්ථවශයෙන් ප්‍රකටවේමය. මෙහි පදවශයෙන් මූලපටන් **'බුද්ධං පච්චක්ඛෙය්‍යං, ධම්මං, සඞ්ඝං, සික්ඛං, විනයං, පාතිමොක්ඛං, උද්දෙසං, උපජ්ඣායං, ආචරියං, සද්ධිවිහාරිකං, අන්තෙවාසිකං, සමානුපජ්ඣායකං, සමානාචරියකං, සබ්‍රහ්මචාරිං පච්චක්ඛෙය්‍යං'**යන මේ තුදුස්පද

A ජාතිමනිකාය

ශික්ෂාප්‍රතික්ෂෙප කිරීම් ආකාරයෙන් කියනලදී. **'ගිහී අස්සං'** ගිහී, උපාසකො, **ආරාමිකො, සාමණෙරො, තිත්ථියො, තිත්ථියසාවකො, අස්සමණො, අසක්‍යපුත්තියො අස්සං,** යනාදීවූ මේ පදඅට **'අස්සං'**යන මේ භාවවිකල්පනාකාරයෙන් වදරණලදී. මෙසේ **'යන්නූනාහං'**යන මේ හා යෙදුනු මේ දෙවිසිපද යම්සේවේද, එසේ **'යදිපනාහං, අපාහං, හන්දහං, හොති මෙ'** යන මොවුන්අතුරෙහි එකක් එකක් හා යුක්තවූ දෙවිස්සයයි සියලුම පද එක්සියදසයක්වේ.

එයින් මතුවෙහි සිහිකටයුතු වස්තූන්ගේ දක්වීම්නයින් පැවති **'මාතරං සරාමි'** යනාදීවූ සතළොස් පදවෙයි. එහි **'බෙත්තං'** හැල්කෙත් ආදියය. **'වත්ථුං'** තණපත් පලා කුදුමහත්පළ හටගන්නා තැන්ය. **'සිපපං'** කුම්භකාර පෙසකාර ශිල්පාදියය.

එයින් මතුවෙහි සකිඤ්චන සපළිබොධභාවය දක්වීම්වසයෙන් පැවති 'මාතා මෙ අත්ථි, සා මයා පොසෙතබ්බා' යනාදි පදනවයක් වෙයි.

එයින් මතුවෙහි නිශ්‍රය සහිත සප්‍රතිඤා භාවයාගේ දක්වීම්වසයෙන් පැවැති **'මාතා මෙ අත්ථි සා මං පොසෙස්සති'** යනාදීවූ සොළොස්පද වෙයි.

එයින් මතුවෙහි එකභත්ත එකසෙය්‍යා බ්‍රහ්මචරිය යන මොවුන්ගේ දුෂ්කරභාවය දක්වීම්වසයෙන් පැවැති **'දුක්කරං'** යනාදීවූ සොළොස්පද වෙයි.

එහි **'දුක්කරං'**යන මෙය එක් වේලේ බත්බුදීම් ආදිය කිරීමෙහි දුෂ්කරභාවය දක්වන්නේය. **'න සුකරං'**යන මෙය පහසුවෙන් කටහැකිබව ප්‍රතික්ෂෙප කරන්නේය. **'දුච්චරං න සුචරං'**යනුද මෙසේය. මෙහි **'න උස්සහාමි'**යන මෙය එහි උත්සාහය නැතිබව නොහැකිබව දක්වන්නේය. **'න විසහාමි'**යන මෙය එක්වේලේ බත්බුදීම නොඉවසියහැකිබව පළකරන්නේය **'න රමාමි'**යන මෙය පැවිද්ද මුල්කොට මට සැපයක් නැතැයි දක්වාලන්නේය. **'නාභිරමාමි'**යන මෙය පැවිද්දෙහි තමන්ගේ ඇල්මක් නැතිබව කියාලන්නේය. මෙසේ මේපණසද පළමුදක්වූ දසයක් අධිකකොටසිටි සියයද එක්ව එක්සිය සැටපද දුබ්ල්‍යාවිකම් වාරයෙහි කියනලදහයි දතයුතුය.

ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන වාරයෙහිද **'කථඤ්හි භික්ඛවෙ'** යනාදීවූ සියල්ල අත්ථිවශයෙන් ප්‍රකටවේමය. මෙහි පදවශයෙන්වනාහි **'බුද්ධං පච්චක්ඛාමි, ධම්මං, සඞ්ඝං, සික්ඛං, විනයං, පාතිමොක්ඛං, උද්දෙසං, උපජ්ඣායං, ආචරියං, සද්ධිවිහාරිකං, අන්තෙවාසිකං, සමානුපජ්ඣායකං,**

සමානාචරියකං, සබ්‍රහ්මචාරිං, පච්චක්ඛාමි'යන මේ තුදුස්පදත් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන වචන සම්බන්ධයෙන් පැවැත්තේය. ඒ සියලු පදයන්හිද **'වදති විඤ්ඤූපෙති**'යන වචනය පිළිබඳ මේ අර්ථයවේ. වාග්ගෝද කොටම කියයි. එය යමක්හට කියාද ඔහුට ඒ වාග්ගෝදයෙන්ම 'මෙතෙමේ ශාසනය හරිණුකැමැත්තේ ශාසනයෙන් මිදෙනුකැමැත්තේ භික්ෂුභාවය හරිණුකැමැත්තේ මේ වාග්ගෝදය කෙරේය'යි හඟවයි. අස්වයි. දන්වයි.

ඉදින් වනාහි මෙතෙමේ **'බුද්ධං පච්චක්ඛාමි'** කියනුකැමැත්තේ පද පෙරැළීකොට **'පච්චක්ඛාමි බුද්ධං**'යි කියන්නේනම් හෝ, මෙලෙස භාෂාවන්අතුරෙහි එක්තරා භාෂාවකින් ඒ අර්ථය කියන්නේනම් හෝ **'බුද්ධං පච්චක්ඛාමි**'යි කියනුකැමැත්තේ උපිළිවෙළින් පදපිළිවෙළ වරදවා **'ධම්මං පච්චක්ඛාමි**'යි හෝ **'සබ්‍රහ්මචාරිං පච්චක්ඛාමි**'යි හෝ කියන්නේනම් උත්තරිමනුෂ්‍යධර්මවිභඩගයෙහි යම්සේ **'පඨමජ්ඣානං සමාපජ්ජාමි**'යි කියනුකැමැත්තේ **'දුතියජ්ඣානං**'යි කියාද, ඉදින් යමක්හට කියාද, හෙතෙමේ 'මේ මහණතෙමේ භික්ෂුභාවය හරිණුකැමැතිව මේ කරුණ කීයා'යි මෙපමණකුත් දනීද, ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය වැළකුනේනම් නොවේ. ක්ෂේත්‍රයටම බටුයේවේ. ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කරණලද්දේමවේ. ශක්‍රාත්මයෙන් හෝ බ්‍රහ්මාත්මයෙන් හෝ ච්‍යුතසත්ත්වයකුමෙන් ශාසනයෙන් ච්‍යුතවූයේමවේ.

ඉදින්වනාහි **'බුද්ධං පච්චක්ඛිං**'යි හෝ **'බුද්ධං පච්චක්ඛිස්සාමි**'යි හෝ 'බුද්ධං පච්චක්ඛෙය්‍යං'යි හෝ අතීතානාගත පරිකල්ප වචනයන්ගෙන් කියාද, දූතයකු හෝ යවාද, හසුනක් හෝ යවාද, අකුරක් හෝ සිඳීද, හස්තමුද්‍රාවෙන් හෝ ඒ අර්ථය සැලකෙරේද, ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය නොකරණලද්දේවේ. උත්තරිමනුෂ්‍යධර්මාරොචනයවනාහි හස්තමුද්‍රාවෙන්ද කෙළපැමිණේ. ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය මනුෂ්‍යජාතිකසත්ත්වයකුගේ සමීපයෙහි සිත හා එක්වයෙදුනු වාග්භෙදය කරන්නහුටම කෙළපැමිණේ. වාග්භෙදකොට හඟවනුයේද ඉදින් 'මෙතෙමේම දැනගනීවා'යි එකෙකු නියමකොට සැලකෙරේද, හෙතෙමේම එයදැනගනීද, ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කරනලද්දේවේ. තවද හෙතෙමේ දැනනොගනීද, සමීපයෙහි සිටි අනිකෙක් දැනගනීද, ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය නොකරනලද්දේවේ. දෙදෙනෙකු සිටිතන්හි දෙදෙනාහටම නියමකොට මොවුනට සැලකරමියි කියාද, ඔවුන්අතුරෙහි එකෙකු දැනගන්නාකල්හිද, දෙදෙන දැනගන්නාකල්හිද ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කරණලද්දේවේ. බොහෝදෙන අතුරෙහිද මෙසේ දතයුතුය.

ඉදින් සසුනෙහි නොඇලීමෙන් පෙළුනේ සහාගභික්ෂූන් ගැන සැකකරණුයේ 'යම් කිසිවෙක් දැනගනීවා'යි උස්හඬ කරනුයේ **'බුද්ධං**

පච්චක්ඛාමි'යි කියාද, නොදුරෙහිසිටි වනකැමියෙක් හෝ ශාසනාචාරය දන්නාවූ අන්‍යපුරුෂයෙක් එය අසා 'මේ මහණ උකටලීවූයේ ගිහිබව පතන්නේය, ශාසනයෙන් චුතවූයේයයි දැනගනීද, ශික්ෂා ප්‍රත්‍යාක්ඛ්‍යානය කරණලද්දීමවේ. එකෙණෙහිම පෙරපසු නොකොට දැනගත නොහැකිවූයේද, ඉදින් යම්සේ ලෝවැසි මිනිස්සු ප්‍රකෘතියෙන් වචන අසා දැනගනීද, එසේ මෙනෙහිකරනකල්හි දැනගනීද ශික්ෂා ප්‍රත්‍යාක්ඛ්‍යානය කරනලද්දීමවේ. නැවත මෑතකාලයෙහි 'මොහුවිසින් කුමක් කියනලදද'යි සැකකරනුයේ කල්ගෙවා දැනගනීද, ශික්ෂා ප්‍රත්‍යාක්ඛ්‍යානය නොකරනලද්දීමවේ. මේ ශික්ෂා ප්‍රත්‍යාක්ඛ්‍යානයද මතුවෙහි අහුතාරොචන - දුට්ඨුල්ලවාචා - අත්තකාම - දුට්ඨදෝස - භූතාරොචන ශික්ෂාපදද එක්ම පිරිසිදීම් ඇත්තේය. ආවර්ජන සමයයෙහි දත්කල්හිම කෙළපැමිණෙන්නේය. 'මෙතෙමේ කුමක්කියාද'යි සැකකරන්නහුවිසින් කල්ගෙවා දත්කල්හි කෙළනොපැමිණේ. **'බුද්ධං පච්චක්ඛාමි'**යන පදයෙහි කියනලද මේ විනිශ්චය යම්සේවේද, සියලු පදයන්හි විනිශ්චය එසේ දතයුතුය. යම්හෙයකින් යම්කලෙක ශික්ෂා ප්‍රත්‍යාක්ඛ්‍යානය කරනලද්දීවේද, එකල්හි **'යතඤ්ඤාහං බුද්ධං පච්චක්ඛෙය්‍යං'** යනාදිය නොකියන්නහු විසිනුදු දුබලබව ප්‍රකාශකරනලද්දේමවේද, එහෙයින් සියලුපදයන්හි අවසන්හි **'එවමපි ගිහිකමේව දුඛබ්‍යාවිකම්මඤ්ච හොති, සික්ඛා ච පච්චක්ඛාතා'**යනු වදරණලද්දේය.

එයින් මතුවෙහි **'ගිහීති මං ධාරෙහි'**යන මෙහි ඉදිනුදු 'ගිහියෙක් වන්නෙමි'යි හෝ 'ගිහියෙක් වෙමි'යි හෝ 'ගිහියෙක් වූයෙමි'යි හෝ 'ගිහියෙක්මි'යි හෝ කියාද, ශික්ෂා ප්‍රත්‍යාක්ඛ්‍යානය නොකරණලද්දීමවේ. ඉදින්වනාහි 'අදපටන් මා ගිහියෙකුකොට දරවයි හෝ දනුවයි හෝ මැනැවින් දනුවයි හෝ මෙනෙහිකරව'යි හෝ මගධභාෂාවෙන් හෝ මේලච්ඡභාෂාවකින් හෝ කියාද, එපරිද්දෙන්ම ඒ අර්ථය කියූකල්හි යමෙකුහට කියාද, ඉදින් හෙතෙමේ දැනගනීද, ශික්ෂා ප්‍රත්‍යාක්ඛ්‍යානය කරනලද්දීවේ. සෙසු **'උපාසකෝ'**යනාදීවූ පදසතෙහිද මේ ක්‍රමයවේ. මෙසේ මේ පදඅටද පළමුකියූ පදතුදුසදයි යනමෙහි දෙවිසිපදවේ. මෙයින් මතුවෙහි පළමුකියූ පදතුදුසම **'අලං මේ, කිත්තු මෙ, න මමත්ථෝ, සුමුත්තාහං'**යන මේ සතර හා යොද කියනලද්දහු සපණසක් වෙයි.

එහි **'අලං'**යනු වේවා, සෑහේයන අර්ථයි. **'කිත්තුමේ'** මට ඇති කාය්‍යය කිම? කිනම් කටයුත්තක් සිද්ධකටයුතුද යනඅර්ථයි. **'න මමත්ථෝ'** මට අර්ථයක් නැත්තේය. **'සුමුත්තාහං'** මම මිදුනේවෙමි. මෙහි සෙස්ස කියූ නයමය. මෙසේ මේ සපණසද, පළමුකියූ දෙවිස්සදයි යන අටසැත්තෑ පද සාරූපවශයෙන්ම කියනලද්දේය. යම් හෙයකින්වනාහි ඒ පද පිළිබඳ වෙවචනයන්ගෙන්ද ශික්ෂා ප්‍රත්‍යාක්ඛ්‍යානයවේද, එහෙයින් **යානි වා**

පනඤ්ඤනිපි යනාදිය වදළසේක. එහි **යානි වා පනඤ්ඤනිපි** යනාදිය වදළසේක. එහි **යානි වා පනඤ්ඤනිපි** යන පාළියෙහි බුදධං යනාදිවසයෙන් ආවාවූ පද හැරපියා යම් අන්‍යවූ **අපි බුද්ධවෙවචනානි වා** බුදුරජුන් පිළිබඳ වෙවචන හෝ -පෙ- අශාක්‍ය පුත්‍රයා පිළිබඳ වෙවචන හෝ වෙයිද, එහි මහාසාඞ්ඝිකයන්ගේ බුදධගුණ ප්‍රකාශකවූ **වණ්ණප්‍රසථානයෙහි** ආවාවූ නම් දහසද, **උපාලි ගාථාවන්හි** නම් සියයද, ගුණවසයෙන් ලැබෙන අන්‍යනාම බුද්ධවෙවචනයි දතයුත්තාහ. ධම්ය පිළිබඳ සියලු නාමයෝ ධම්වෙවචනයි දතයුත්තාහ. සියලුතන්හි මේ ක්‍රමයවේ.

මේ වනාහි මෙහි යොජනාය: **'බුද්ධං පවවක්ඛාමි'**යනු වචනයෙන් කෙරෙන ප්‍රත්‍යාඛ්‍යානයෙක් නොවේ. කියූපරිදි පෙළෙහි ආයේමවේ. **'සම්මාසම්බුද්ධං පවවක්ඛාමි, අනන්තබුද්ධිං, අනොමබුද්ධිං, බොධිපඤ්ඤං, ධීරං, විගතමොහං, පහින්නභීලං, විජිතවිජයං පවවක්ඛාමි'**යන මේආදීවූ බුද්ධවෙවචනයන්ගෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'ධම්මං පවවක්ඛාමි' යනු වචනය කරනකොටගෙන යථාරුතවසයෙන් හෙවත් පෙළෙහි කියනලද පරිදි කරන ප්‍රත්‍යාඛ්‍යානයක්නොවේ. **'සවාක්ඛාතං ධම්මං පවවක්ඛාමි, සන්දිට්ඨිකං, අකාලිකං, එහිපස්සිකං, ඔපනයිකං, පවවත්තං වෙදිතබ්බං විඤ්ඤූහි ධම්මං පවවක්ඛාමි, අසඞ්ඛතං ධම්මං පවවක්ඛාමි, බ්‍රහ්මජාලං පවවක්ඛාමි මජ්ඣිමනිකාය, මූලපරියාය, සංයුත්තනිකාය, අඞ්ගුත්තරනිකාය, ජාතකනිකාය, අභිධම්මං, කුසලං ධම්මං, අකුසලං ධම්මං, අබ්‍යාකතං ධම්මං, සතිපට්ඨානං, සම්මප්පධානං, ඉද්ධිපාදං, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මග්ග, ඵල, නිබ්බානං පවවක්ඛාමි'**යි මෙසේ සූවාසූදහසක් ධම්ස්කන්ධයන්අතුරෙහි එක් ධම්ස්කන්ධයක්හුගේද නාමය ධම්වෙවචනමවේ. මෙසේ ධම්වෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'සඞ්ඝං පවවක්ඛාමි'යනු වෙවචනයෙන්කරන ප්‍රත්‍යාඛ්‍යානයෙක් නොවේ. **'සුපටිපන්නං සඞ්ඝං පවවක්ඛාමි, උජුපටිපන්නං, ඤායපටිපන්නං, සාමීචිපටිපන්නං සඞ්ඝං, චතුපුරිසයුග සඞ්ඝං, අට්ඨපුරිසපුග්ගල සඞ්ඝං ආහුනෙය්‍යං, පාහුනෙය්‍යං, දක්ඛිණෙය්‍යං, අඤ්ජලිකරණීයං, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං සඞ්ඝං පවවක්ඛාමි'**යි මෙසේ සඞ්ඝවෙවචනයෙන් ප්‍රත්‍යාඛ්‍යානයවේ.

'සික්ඛං පවවක්ඛාමි'යනු වෙවචනයෙන්කරන ප්‍රත්‍යාඛ්‍යානයක් නොවේ. **'භික්ඛුසික්ඛං පවවක්ඛාමි, භික්ඛුනීසික්ඛං පවවක්ඛාමි, අධිසීලසික්ඛං, අධිචිත්තසික්ඛං, අධිපඤ්ඤසික්ඛං පවවක්ඛාමි'**යි මෙසේ ශික්ෂාවෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'විනයං පවචක්ඛාමි'යනු වෙවචනයෙන්කරන ප්‍රත්‍යාඛ්‍යානයෙක් නොවේ. **'භික්ඛුවිනයං පවචක්ඛාමි, භික්ඛුනීවිනයං පවචක්ඛාමි, පඨමපාරාජිකං, දුතියං, තතියං, චතුත්ථං පාරාජිකං, සඞ්ඝාදිසෙසං, ථුල්ලවචයං, පාචිත්තියං, පාටිදෙසනීයං, දුක්කටං, දුබ්භාසිතං, පවචක්ඛාමි'**යි මේ ආදීවූ විනයවෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'පාතිමොක්ඛං පවචක්ඛාමි'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාඛ්‍යානයෙක් නොවේ. **භික්ඛුපාතිමොක්ඛං, භික්ඛුනීපාතිමොක්ඛං පවචක්ඛාමි'**යි මෙසේ ප්‍රාතිමොක්ෂවෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'උද්දෙසං පවචක්ඛාමි'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාඛ්‍යානයක් නොවේ. **භික්ඛුපාතිමොක්ඛුද්දෙසං, භික්ඛුනීපාතිමොක්ඛුද්දෙසං, පඨම පාතිමොක්ඛුද්දෙසං, දුතියං, තතියං, චතුත්ථං, පඤ්චම පාතිමොක්ඛුද්දෙසං සම්මාසම්බුද්ධුද්දෙසං, අනන්තබුද්ධිඋද්දෙසං, අනොමබුද්ධිඋද්දෙසං, බොධිපඤ්ඤුණුද්දෙසං, ධීරුද්දෙසං, විගතමොහුද්දෙසං, පහින්නතිලුද්දෙසං, විජිතවිජයුද්දෙසං පවචක්ඛාමි'**යි මේ ආදීවූ උද්දෙස වෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'උපජඣායං පවචක්ඛාමි'යනු වෙවචනයෙන්කරන ප්‍රත්‍යාඛ්‍යානයෙක් නොවේ. **'යො මං පබ්බාජෙසි, යො මං උපසම්පාදෙසි, යස්ස මූලෙනාහං පබ්බජිතො යස්ස මූලෙනාහං උපසම්පන්නො, යස්ස මූලිකා මය්හං පබ්බජ්ජා, යස්ස මූලිකා මය්හං උපසම්පද, තාහං පවචක්ඛාමි'**යි මෙසේ උපාධ්‍යායවෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'ආචරියං පවචක්ඛාමි'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාඛ්‍යානයෙක් නොවේ. **'යො මං පබ්බාජෙසි, යො මං අනුසාවෙසි, යාහං නිස්සාය වසාමි, යාහං උද්දිසාපෙමි, යාහං පරිපුච්ඡාමි, යො මං උද්දිසති, යො මං පරිපුච්ඡාපෙති, තාහං පවචක්ඛාමි'**යි මෙසේ ආචාර්‍යවෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'සද්ධිවිහාරිකං පවචක්ඛාමි'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාඛ්‍යානයෙක් නොවේ. **'යාහං පබ්බාජෙසිං, යාහං උපසම්පාදෙසිං, මය්හං මූලිකා යස්ස පබ්බජ්ජා, මය්හං මූලිකා යස්ස උපසම්පද, තාහං පවචක්ඛාමි'**යි මෙසේ සද්ධිවිහාරික වෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'අන්තෙවාසිකං පවචක්ඛාමි'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාඛ්‍යානයක් නොවේ. **'යාහං පබ්බාජෙසිං, යාහං අනුසාවෙසිං, යො මා නිස්සාය වසති, යො මං උද්දිසාපෙති, යො මං පරිපුච්ඡති,**

යස්සාහං උද්දිස්සාමි, යාහං පරිපුච්ඡාපෙමි, තං පව්වක්ඛාමි'යි මෙසේ අත්තෙවාසික වෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'**සමානුපජ්ඣායකං පව්වක්ඛාමි**'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාඛ්‍යානයක් නොවේ. '**මය්හං උපජ්ඣායෝ යං පබ්බාජේසි, යං උපසම්පාදෙසි, යෝ තස්ස මූලෙන පබ්බජිතෝ, යෝ තස්ස මූලෙන උපසම්පන්නෝ, යස්ස තම්මූලිකා පබ්බජ්ජා, යස්ස තම්මූලිකා උපසම්පද, තං පව්වක්ඛාමි**'යි මෙසේ සමානොපාදධ්‍යාය වෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'**සමානාචරියකං පව්වක්ඛාමි**'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාඛ්‍යානයක් නොවේ. '**මය්හං ආචරියෝ යං පබ්බාජේසි, යං උපසම්පාදෙසි, යං අනුසාවෙසි, යෝ තං නිස්සාය වසති, යෝ තං උද්දිසාපෙති, පරිපුච්ඡති, යස්ස මේ ආචරියෝ උද්දිසති, යං පරිපුච්ඡාපෙති, තං පව්වක්ඛාමි**'යි මෙසේ සමානාචාර්‍යක වෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'**සබ්‍රහ්මචාරිං පව්වක්ඛාමි**'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාඛ්‍යානයෙක් නොවේ. '**යෙනාහං සද්ධිං අධිසීලං සික්ඛාමි, අධිචිත්තං. අධිපඤ්ඤං සික්ඛාමි, තං පව්වක්ඛාමි**'යි මෙසේ සබ්‍රහ්මචාරී වෙවචයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'**ගිහීති මං ධාරෙහි**'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාඛ්‍යානයෙක් නොවේ. '**අගාරිකොති මං ධාරෙහි, කස්සකෝ, වාණිජෝ, ගොරක්ඛෝ, ඔතල්ලකෝ, මොලිබද්ධෝ, කාමගුණිකොති මං ධාරෙහි**'යි මෙසේ ගිහීවෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'**උපාසකොති මං ධාරෙහි**'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාඛ්‍යානයක් නොවේ. '**දෙවාචිකෝ උපාසකොති මං ධාරෙහි, තෙවාචිකෝ උපාසකෝ, බුද්ධං සරණගමනිකෝ, ධම්මං - සඞ්ඝං සරණගමනිකෝ, පඤ්චසික්ඛාපදිකෝ, දසසික්ඛාපදිකෝ, උපාසකොති මං ධාරෙහි**'යි මෙසේ උපාසකවෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'**ආරාමිකොති මං ධාරෙහි**'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාඛ්‍යානයක් නොවේ. '**කප්පියකාරකොති මං ධාරෙහි, වෙය්‍යාවච්චකරෝ, අපපහරිතකාරකෝ, යාගුභාජකෝ, ඵලභාජකෝ, ඛජ්ජකභාජකොති මං ධාරෙහි**'යි මෙසේ ආරාමිකවෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයවේ.

'**සාමණේරොති මං ධාරෙහි**'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාඛ්‍යානයක් නොවේ. '**කුමාරකොති මං ධාරෙහි, මෙල්ලකෝ,**

වෙටකො මොනිගලෙලා, සමණදෙදසොති මං ධාරෙහි'යි මෙසේ සාමණේර වෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාක්‍යානයවේ.

'තිතථියොති මං ධාරෙහි'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාක්‍යානයෙක් නොවේ. '**නිගණ්ඨොති මං ධාරෙහි, ආජීවකො, තාපසො, පරිබ්බාජකො, පණ්ඩරඞ්ගොති මං ධාරෙහි**'යි මෙසේ තීර්ථකශ්‍රාවක වෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාක්‍යානයවේ.

'**තිතථියසාවකොති මං ධාරෙහි**'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාක්‍යානයක් නොවේ. '**නිගණ්ඨසාවකොති මං ධාරෙහි, ආජීවක තාපස පරිබ්බාජක පණ්ඩරඞ්ගසාවකොති මං ධාරෙහි**'යි මෙසේ තීර්ථකශ්‍රාවක වෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාක්‍යානයවේ.

'**අසසමණොති මං ධාරෙහි**'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාක්‍යානයක් නොවේ. '**දුස්සිලොති මං ධාරෙහි, පාපධම්මො, අසුචිසඞ්කස්සරසමාචාරො, පටිච්ඡන්නකම්මන්තො, අසසමණො, සමණපටිඤ්ඤ, අබ්‍රහ්මචාරී, බ්‍රහ්මචාරීපටිඤ්ඤ, අන්තොපූති, අවස්සුතො, කසම්බුජාතො, කොණ්ඩොති මං ධාරෙහි**'යි මෙසේ අශ්‍රමණ වෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාක්‍යානයවේ.

'**අසක්‍යපුත්තියොති මං ධාරෙහි**'යනු වෙවචනයෙන් කරන ප්‍රත්‍යාක්‍යානයෙක් නොවේ. '**න සම්මාසම්බුද්ධපුත්තොති මං ධාරෙහි, න අනන්තබුද්ධිපුත්තො, න අනොමබුද්ධිපුත්තො, න බොධිපඤ්ඤපුත්තො, න ධීරපුත්තො, න විගතමොහපුත්තො, න පහීනකිලෙසපුත්තො, න විජිතවිජයපුත්තොති මං ධාරෙහි**'යි මේ ආදීවූ අශාක්‍යපුත්‍රීය වෙවචනයෙන් ශික්ෂාප්‍රත්‍යාක්‍යානයවේ.

'**තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි**' '**බුද්ධ වෙවචනානි වා**' යනාදි නයින් කියනලද බුදුධාදීන් පිළිබඳ ඒ වෙවචනයන්ගෙනි. වෙවචනයෝම ශික්ෂාප්‍රත්‍යාක්‍යානයටම කරුණුබැවින් ආකාරයෝය. බුදුධාදීන්ගේ සටහන් දක්වනබැවින්, ශික්ෂාප්‍රත්‍යාක්‍යානයෙහි සටහන්බැවින්ම හෝ ලිඞ්ගයෝය. ශික්ෂාප්‍රත්‍යාක්‍යානය දැනීමට හෙතුබැවින් මිනිසුන්ගේ තලකැලල්ආදිය මෙන් නිමිත්තයෝයයි කියනුලැබෙත්. '**එවං ඛො භික්ඛවෙ**'යනු මෙයින් මතුවෙහි අන්‍යවූ ශික්ෂාප්‍රත්‍යාක්‍යානකාරණයක් නොවන බැවින් නියම කරමින් වදළසේක. මේ මෙහි අර්ථයවේ: එපරිද්දෙන්ම දුබලබව පහළකිරීම හා ශික්ෂාප්‍රත්‍යාක්‍යානයදවේ. මෙයින් අන්‍යවූ කාරණයක් නැත්තේය යනුයි.

මෙසේ ශික්ෂාප්‍රත්‍යාක්‍යානයෙහි ලක්ෂණ දක්වා අප්‍රත්‍යාක්‍යානයෙහි නොමුලාබවපිණිස පුදගලාදීන්ගේවසයෙන් ඒ ශික්ෂාප්‍රත්‍යාක්‍යාණ

ලක්ෂණයාගේම විපත්තිය දක්වනු පිණිස **'කථඤ්ච භික්ඛවෙ අපච්චක්ඛිතා'**යනාදිය වදළසේක. එහි **'යෙහි ආකාරෙහි'**යනාදිය කියනලද නය ඇත්තේමය. **'උම්මත්තකො'** යක්ෂෝන්මත්තකයෙක් හෝ පිත්තෝන්මත්තකයෙක් හෝ යන යම්කිසි විපරීතසංඥ ඇත්තෙක්වේද, ඉදින් හෙතෙමේ ප්‍රතික්ෂෙප කෙරේද, ශික්ෂා ප්‍රතික්ෂෙප නොකරණුලද්දීමවේ. **'උම්මත්තකස්ස'** එබඳුවූම උමතුවූවක්හුගේ. එබඳුවූවක්හුගේ සමීපයෙහි ඉදින් පියවි සැහැවි ඇති මහණෙක් ශික්ෂාව ප්‍රතික්ෂෙප කෙරේනම්, උන්මත්තක තෙමේ නොදනීනම් ශික්ෂා ප්‍රතික්ෂෙප නොකරණුලද්දීවේ. **'විත්තවිත්තො'**යි යක්ෂෝන්මත්තක තෙමේ කියනුලැබේ. පළමු පදයෙහි යක්ෂෝන්මත්තකයෙක් හෝය, පිත්තෝන්මත්තකයෙක් හෝය යි උන්මත්තක සාමාන්‍යයෙන් කියනලද්දේය. දෙදෙනාගේම විශේෂය අනාපත්තිවාරයෙහි පහළවන්නේය. මෙසේ යක්ෂෝන්මත්තකතෙමේ ශික්ෂාව ප්‍රතික්ෂෙපකෙරේද, ප්‍රතික්ෂෙපනොකරනලද්දීවේ. ඔහුගේ සමීපයෙහි ප්‍රතික්ෂෙපකරනලද්දීද, ඔහු නොදන්නාකල්හි ප්‍රතික්ෂෙපනොකරනලද්දීවේ. **'වේදනට්ටො'** බලවත් දුඃඛ වෙදනාවෙන් පහස්නාලද්දේය. මූර්ඡාවෙන් මඩනාලද්දේය. නන්දෙඩන්නාවූ ඔහුවිසින් ප්‍රතික්ෂෙපකරනලද්දීද, ප්‍රතික්ෂෙපනොකරන ලද්දීමවේ. ඔහුගේ සමීපයෙහි ප්‍රතිකෙෂෙපකරනලද්දීද, ඔහු නොදන්නාකල්හි ප්‍රතික්ෂෙපනොකරනලද්දීවේ. **'දෙවතාය සන්තිකෙ'** බූමාටුදෙවියන් මුල්කොට අකනිට්ඨදෙවියන්තෙක් සිටි එකෙක්හුගේ සමීපයෙහි ප්‍රතික්ෂෙප කරනලද්දීද, ප්‍රතික්ෂෙපනොකරනලද්දීමවේ. **'තිරච්ඡානගතස්ස'** නාග මාණවකයෙකුගේ හෝ සුපණ්ණ මාණවකයෙකුගේ හෝ කින්නර, හත්ථි, මකීට ආදීන්අතුරෙහි යම්කිසිවෙකුගේ සමීපයෙහි ප්‍රතිකෙෂෙපකරනලද්දීද, ප්‍රතිකෙෂෙප නොකරණුලද්දීමවේ.

එහි උන්මත්තකාදීන්ගේ සමීපයෙහි ප්‍රතිකෙෂෙපකරනලද්දීද, උන් නොදන්නාබැවින් ප්‍රතික්ෂෙපනොකරනලදයි වදළසේක. දෙවතාවකගේ සමීපයෙහි ප්‍රතික්ෂෙපකරනලද්දීද, උන් ඉතා වහා දැනගන්නාබැවින් ප්‍රතික්ෂෙපනොකරනලද්දීවේ. දෙවතාවෝවනාහි මහා නුවණැත්තාහු ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි ඇතියෝ ඉතා වහා දැනගනිත්. මේ සිතනම් වහා පෙරළෙන්නේය. එහෙයින් වහා පෙරළෙන සිත්ඇති පුද්ගලයාගේ චිත්තවසයෙන්ම ඉතා වහා විනාශය නොවේවායි දෙවතාවකගේ සමීපයෙහි ශික්ෂාප්‍රතික්ෂෙපය වළකාලූසේක. මිනිසුන් අතුරෙහිවනාහි නියමයක් නැත්තේය. සහාගවූ හෝ විසහාගවූ හෝ ගිහියකුගේ හෝ පැවිද්දකුගේ යන යම්කිසි නුවණැත්තෙකුගේ සමීපයෙහි ප්‍රතික්ෂෙපකරනලද්දීනම්, ප්‍රතික්ෂෙපකරනලද්දීමවේ. ඉදින්වනාහි හෙතෙමේ නොදනීනම් ප්‍රතික්ෂෙපනොකරනලද්දීමවේය යන මේ අර්ථය දක්වනසේක් **'අරියකෙන'** යනාදිය වදළසේක.

එහි **අරියක**නම්, ආර්‍යව්‍යවහාරයයි. මගධභාෂාය. **මිලක්ඛක**නම්, යම්කිසි අනාර්‍යවූ ආන්ධ්‍රද්‍රවිඩාදිභූය. **'සො ච න පටිවිජානාති'** භාෂාන්තරයන් නොදත්බැවින් හෝ බුදුසමයෙහි අදක්ෂබැවින් මෙතෙමේ මෙනම් අත්‍ථියක් කියා යි නොදනියි. **'දවාය'** වහා අනිකක් කියනුකැමැත්තේ. වහා 'බුදුන් ප්‍රතික්ෂෙපකරමි'යි කියයි. **'රවාය'** වරදවා කීමෙන්. 'අනිකක් කියන්නෙමි'යි අනිකක් කියනුයේය. 'දවාය'යන මුල්පදය හා කවර විශෙෂයෙක් වේදයත්: මුල්පදය නුවණැතියක්හුගේ ඉක්මන්වසයෙන් අනිකක් කීමය. 'රවාය'යන මේ පදය නුවණමදබැවින් මුළාබැවින් නුවණනැතිබැවින් පැකිළෙන්නහුගේ 'අනිකක් කියන්නෙමි'යි අනිකක් කීමය. **'අසාවෙතුකාමො සාවෙති'** මේ ශික්ෂාපදය පිළිබඳ පාළිවිචාරයි. උගණියි. හදරයි. අත්‍ථී වණ්ණනාකරයි. මේවනාහි **'අසාවෙතුකාමො සාවෙති'**යි කියනුලැබේ. **'සාවෙතුකාමො න සාවෙති'** දුබලබව පහළකොට ශික්ෂාව ප්‍රතික්ෂෙපකරනුයේ ව්‍යාඝෙදය නොකරයි. මේවනාහි **'සාවෙතුකාමො න සාවෙති'**යි කියනුලැබේ. **'අවිඤ්ඤුස්ස සාවෙති'** මහල්ලක්හට හෝ පොතැලි රුවැන්නක්හට හෝ මදනුවණැතියක්හට හෝ ආගමධර්‍මයෙහි අදක්ෂවූවක්හට හෝ නුවණැතිබවට නොපැමිණි ගම්දරුවන්ට හෝ අස්වයි. **'විඤ්ඤුස්ස න සාවෙති'** දන්නට සමර්‍ථවූ පණ්ඩිතයක්හට නොඅස්වයි. **'සඛ්බසො වා පන' බුද්ධං පච්චක්ඛාමි'** යනාදීන්අතුරෙහි යම් යම් ක්‍රමයකින් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කරනලද්දීවේද, එයින් එකකුදු ව්‍යාඝෙදකොට නොඅස්වයි. **'එවං ඛො'**යන මෙය අප්‍රත්‍යාඛ්‍යාන ලක්ෂණය නියමකරනසේක. මේවනාහි එහි අත්‍ථියවේ. එපරිද්දෙන්ම ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කරනලද්දීවේ. අන්කාරණයකින් නොවේයයනුයි.

දැන් **'මෙථුනං ධම්මං පතිසෙවෙය්‍ය'** යනාදීන්ගේ අත්‍ථීදක්වීමපිණිස **'මෙථුනධම්මො නාම'**යනාදිය වද සේක. **'තත්‍ථ මෙථුනධම්මො නාම'** යන මෙය දක්වියයුතුවූ මෙථුනධර්‍මය පිළිබඳ උද්දෙසපදයයි. **'අසද්ධම්මො'** නොසන්සිදුනු ලාමකජනයන්ගේ ධර්‍මයය. **'ගාමධම්මො'** ගම්වැසියන්විසින් සෙවුනාලද ධර්‍මයයි. **'වසලධම්මො'** සැඩොලුන්ගේ ස්වභාවයයි. කෙලෙස් වස්වනබැවින් හෝ තෙමේම වසලවූ ධර්‍මනුයි වසලධම්මනම්, **'දුට්ඨුල්ලං'** අහිරිකාදීවූ කෙලෙසුන්විසින් දූෂිතකළබැවින් පුළුල්වූයේද, සියුම් නොවනබැවින් දළවූයේද දුට්ඨුල්ලනම්වේ. මේ දුට්ඨුල්ලපදය පටන් තෙපදයෙහි **'යො සො'**යන මෙය පෙරළා **'යං තං'**යිකොට **'යං තං දුට්ඨුල්ලං, යං තං ඔදකන්තිකං, යං තං රහස්සං'**යි යෙදියයුතුය. මෙහිද යම්හෙයකින් ඒ මෙථුනධර්‍මප්‍රතිසෙවනසඞ්ඛ්‍යාත කර්‍මයට පිරිවරවූ දැකීමද, අල්ලාගැනීමද, අතගෑමද, පැහැසීමද, ගැටීමද යන මෙය දුට්ඨුල්ලවෙයිද,

එහෙයින්ද ඒ කම්‍ය දුටුවුලලවේ. යම් ඒ කම්යක් දුටුවුලලවේද, ඒ මෙථුන ධම්යයි. මේ මෙථුන ධම් ප්‍රතිසෙවන ක්‍රියාවෙහි අවසානයෙහි පිරිසිදුකිරීමපිණිස දියගනීනුයි උදකන්තය. ඒ මේ උදකන්තයම **ඔදකන්තික** නම්වේ. යම් ඒ කම්යක් දියගැනීම කෙළවරකොට සිටියේද එය මෙථුනධම්යයි. රහස්හි පිළිසන් අවකාශයෙහි කළයුතුබැවින් **රහස්‍ය**. යම් ඒ කම්යක් රහස්තැන්හි කළයුතුද, ඒ මෙථුනධම්යයි. මෙසේ යෙදීම දතයුතුය. ස්ත්‍රී - පුරුෂ දෙදෙනකුන්විසින් සමවැදිය යුතුබැවින් **ද්වයං ද්වයසමාපත්ති** නම්. යම් ඒ **ද්වය-ද්වයසමාපත්තියක්** වන්නීද, ඒ මෙථුනධම්තමැයි මෙසේ යෙදීමයි. මෙහිවනාහි ඒ සියල්ල එක්තැන්කොට නිගමනය කරනයේක් **'එසො මෙථුනධමෙො නාම'**යි වදළසේක. කුමක්හෙයින් මෙථුන ධම්යි කියතුලැබේද, මෙථුනධම් රාගයෙන් රත්වූ, මෙථුනධම් රාගයෙන් තදින් රත්වූ, මෙථුනධම් රාගයෙන් තෙත්වූ, මෙථුන ධම් රාගය හටගැනීමෙන් වැසීගිය සිත්ඇත්තාවූ සමානවූ ස්ත්‍රී - පුරුෂ දෙදෙනෙකුන්ගේ ස්වභාවයවේය යනකරුණෙන් මෙථුනධම්යි කියතුලැබේ.

'පතිසෙවති නාම' මේ මෙථුනධම්ය සෙවනය කරන්නේය, යන මෙහි යම් අයුරකින් සෙවනයකරන්නේයයි **කියතුලැබේද, ඒ** ආකාරය දක්වනුපිණිස මේ මාතෘකාපදයවේ. **'යො නිමිත්තෙන නිමිත්තං'**යනාදිතන්හි යම් මහණෙක් ස්ත්‍රියගේ නිමිත්ත හා තමන්ගේ නිමිත්ත, ස්ත්‍රියගේ අඩගජාතය හා තමන්ගේ අඩගජාතය සියලු අන්තිමපමණින් එක්තල බිදුවටක් පමණකුදු වාතයෙන් නොපහස්නාලද තෙත්වූ අවකාශයෙහි ප්‍රවෙශකෙරේද, මේය **'පවෙසති'** නම්. මෙපමණකින් ශීලභෙදයට පැමිණේ. පාරාජිකවේ. මෙහිද ස්ත්‍රීනිමිත්තෙහි සතරපස හා යටතලයයි පස්තැනක් ලැබේ. පුරුෂනිමිත්තෙහි සතරපැත්ත, අගකෙළවර හා අගකෙළවරින් මතු මැද පෙදෙසැයි සතැනක් ලැබේ. එහෙයින් ස්ත්‍රියගේ නිමිත්තෙහි යටට, මහණහුගේ නිමිත්ත ප්‍රවෙශකරනුයේද පාරාජිකවේ. උඩ පෙදෙසින් ප්‍රවෙශකරනුයේද, දෙපසින් ප්‍රවෙශකරනුයේද සතරපැති හැර ඇතුල්තලය ගටමින් මැදින් ප්‍රවෙශකරනුයේද පාරාජිකවේ. පුරුෂනිමිත්තවනාහි යටකොටසින් පහසමින් ප්‍රවෙශකරනුයේද පාරාජිකවේ. උඩකොටසින් පහසමින් ප්‍රවෙශකරනුයේද, දෙපසින් පහසමින් ප්‍රවෙශකරනුයේද, මැදින්ම පහසමින් ප්‍රවෙශකරනුයේද, මැදුම්පුරුක, හැකුළූ ඇඟිල්ලක් මෙන් නිමිත්ත මැදින් නවා, නැවූ නිමිත්තෙහි උඩකොටසෙහි කෙළවරින් පහසමින් ප්‍රවෙශකරනුයේද පාරාජිකවේ. එහි තරාදිදඬුවක් වැනිකොට නොඇදකොට ප්‍රවෙශකරන්නහුටද, සතරපැත්තහා උඩකොටසෙහි මැදයන පස්තැනක්ද මැදින් නවා හකුළුවා ප්‍රවෙශකරන්නහුට සතරපැත්ත හා උඩකොටසෙහි මැදයන පස්තැනක්දයි මෙසේ පුරුෂනිමිත්තෙහි සියලුම ස්ථාන දසයක්වෙයි.

තමාගේ නිමිත්තෙහි හටගත් නොනට කායප්‍රසාදය ඇතිසම්කඩක් හෝ පිළිකාගඩක් හෝ ස්ත්‍රීනිමිත්තෙහි ප්‍රවේශකෙරේද, පාරාජිකාපත්තියවේ. නට කායප්‍රසාදය ඇති මළසමක් හෝ වියලුනු පිළිකාගඩක් හෝ ප්‍රවේශකෙරේද, දුක්කටාපත්තියවේ. මෛථුනාස්වාදයෙන් ලොමයක් හෝ ඇඟිලි මහපටඇඟිලි බීජාදිය හෝ ප්‍රවේශකරන්නහුටද දුක්කටයමවේ. මේ මෛථුනකථාව යම්හෙයකින් දුට්ඨුල්ලකථාවක් අසභ්‍යකථාවක් වන්නීද, එහෙයින් විනයයෙහි එන මෙතැන හෝ මෙයින් අන්‍යවූ මෙබඳුතැන් හෝ කියන්නහුවිසින් ප්‍රතික්කූලමනස්කාරයද ශ්‍රමණසංඥවද හිරිඔතප්ප සිහියට එළවා සම්මාසම්බුදු රජුන්කෙරෙහි ගෞරව උපදවා අසමකාරුණිකවූ ලොකනාථයන්වහන්සේගේ කරුණාගුණය මෙනෙහිකොට කියයුතුය. ඒ භාග්‍යවතුන්වහන්සේවනාහි මුළුමනින් කාමයන්ගෙන්වෙන්වූ සිත්ඇතිසේක්ද, සත්ත්වයන් අපායදුඃඛාදියෙන් රැකීමපිණිස සත්ත්වලොක විෂයක අනුකම්පාවෙන් සත්ත්වයන් කෙරෙහිවූ කරුණාවනිසා ශික්ෂාපද පැණවීමපිණිස මෙබඳුකථාවක් වදළසේක. ශාසතෘන්වහන්සේගේ කරුණාගුණය පුදුමය. මෙසේ ලොකනාථයන්වහන්සේගේ කරුණාගුණය මෙනෙහිකොට කියයුතුය. තවද භාග්‍යවතුන්වහන්සේ මෙබඳු කථා සියලුඅයුරින් නොවදරණ සේක්නම්, 'මෙපමණ තන්හි පාරාජිකය, මෙපමණ තන්හි ථුල්ලච්චය. මෙපමණ තන්හි දුක්කටය'යි කවරෙක් දන්නේද, එහෙයින් අසන්නහුවිසිනුදු කියන්නහුවිසිනුදු විජනිපතින් මුවවසා දන්විදහා සිනාසෙන්නහුවිසින් නොහිඳියයුතුය. 'සම්මාසම්බුදු රජානන්වහන්සේවිසින්ද මෙබන්දක් වදරණලද'යි ප්‍රත්‍යවෙක්ෂාකොට උත්සාහයෙන් හැකිළීමට නොපැමිණෙන්නහුවිසින් හිරිමතප් දෙකින් යුක්තවූවහු ශාස්තෘකලපවූවහුට කියයුතුය.

මූලප්‍රඥප්තිය නිමි.

—\\—

අනුප්‍රඥප්තිවාරයෙහි **'අන්තමසො'** සියලු අන්තිම පිරිසිඳීමෙන් **'තිරච්ඡානගතායපි'** පිළිසිඳ ගැනීම්වසයෙන් තිරිසනුන්කෙරෙහි උපන්නියක සමග. **'පගෙව මනුස්සිත්ථියා'** ඉතා පළමුකොට මනුෂ්‍යජාතිඇති ස්ත්‍රියක සමගය යනු කියනුකිම. මෙහි පාරාජිකාවට වස්තුවූම තිරශ්චීනස්ත්‍රීහු **'තිරච්ඡානගතා'**යි ගතයුතුය. සියලු තිරිසන්ගතයෝ නොගත යුත්තාහ. එහි මේ පිරිසිඳීමය:

'අපදානං අහි මච්ඡා - දිපදානඤ්ච කුක්කුටි,
චතුප්පදානං මජ්ජාරි - වජ්ජුං පාරාජිකස්සිමා'යනු.

පානැති සතුන්අතුරෙහි සජී - මතස්‍යස්ත්‍රීහුය, දෙපාඇති තිරිසන්සතුන්අතුරෙහි කිකිළිය, සිවුපාසතුන්අතුරෙහි බැළලියයන මේ තිරිසන්ස්ත්‍රීහු පාරාජිකාවට වස්තුහුය.

එහි **අහි** යි ගැනීමෙන් පිඹුරු - තෙලිසප්ආදි හෙදඇති සියලුම දීඝජාතීහු සඞ්ග්‍රහකරනලදහ. එහෙයින් දීඝජාතික තිරශ්චීනස්ත්‍රීන්අතුරෙහි යම් ස්ත්‍රියකකෙරෙහි වසමග - පසමග - මුවමගයන තුන්මගින් එක් මගක මහණහුගේ අඞ්ගජාතය තලඇටක්පමණ ප්‍රවේශකරන්නට හැක්කේද, පාරාජිකාවට වස්තුය. සෙසුසත්ත්‍රීහු දුක්කටවස්තුහුයි දතයුතුය. **මච්ඡ** යි ගැනීමෙන් සියලුමස්, කැසුබු මැඩිආදී හෙදඇති දියෙහි උපදින ජාතීහු සඞ්ග්‍රහකරනලදහ. උන්අතුරෙහිද දිග්ද සතුන්කෙරෙහි කියූනයින්ම පාරාජිකවස්තුද දුක්කට වස්තුද දතයුතුය. මේ විශෙෂයෙක්වේ: ඔවුන්අතුරෙහි බරඬකමුඛනම්වූ මැඩියෝවෙත්. ඔවුන්ගේ මුවසටහන මහත්වේ. එහෙත් සිදුර කුඩාවේ. එය ප්‍රවෙශකිරීමට නොපොහොනේය. මුවසටහනවනාහි ව්‍රණසඩෙක්ෂපයට යන්නේය. එහෙයින් එය ථුල්ලච්චයවස්තු යි දතයුතුය. **කුක්කුටි** යි ගැනීමෙන් කවුඩු, පරෙව්ආදි හෙදඇති සියලු පක්ෂිජාතීහු සඞ්ග්‍රහකරනලදහ. උන්අතුරෙහිද කියූපරිදිම පාරාජිකවස්තුද, දුක්කටවස්තුද දතයුතුය. **මජ්ජාරි** යි ගැනීමෙන් රුක්බලු, මුගටි, ගොයිආදි හෙදඇති සියලුම චතුෂ්පදජාතීහු ගැනෙත්. උන්අතුරෙහිද කියූලෙසින්ම පාරාජිකවස්තුද, දුක්කටවස්තුද දතයුතුය.

'පාරාජිකො' පරදවනලද්දේය. පරාජයට පැමිණියේය. මේ පාරාජික ශබ්දයවනාහි ශික්ෂාපද - ආපත්ති - පුද්ගල යන මෙතැන්හි පවත්නේ ය. එහි **'අඨානමෙතං ආනන්ද අනවකාසො යං තථාගතො වජ්ජිනං වා වජ්ජිපුත්තකානං වා කාරණා සාවකානං පාරාජිකං සික්ඛාපදං පඤ්ඤත්තං සමූහනෙය්‍ය'**[A]යි. මෙසේ ශික්ෂාපදයෙහි පවත්නේ දතයුතුය. **ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකං'**[B]යි මෙසේ ආපත්තියෙහි පවත්නේය. **'න මයං පාරාජිකා, යො අවහටො, සො පාරාජිකො'**[C]යි මෙසේ පුද්ගලයාකෙරෙහි පවත්නේ දතයුතුය. **'පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය'**[D]යි යනාදිතන්හි ධර්මයෙහි පවතීයයි කියත්. යම්හෙයකින්වනාහි එහි ධම්ම යි කිසිතැනක ආපත්තියද, කිසිතැනෙක්හි ශික්ෂාපදයම අදහස්කරනලද්දේද, එහෙයින් එය වෙන්ව නොකියයුතුය. එහි යමෙක් ඒ ශික්ෂාපදය ඉක්මවාද, ඒ ඉක්මවන්නහු පරදවාද එහෙයින් පාරාජිකයි කියනුලැබේ. ආපත්තියවනාහි යමෙක් ඒ ඇවැතට පැමිණේද

A පඨමපාරාජික
B පාරාජිකපාළි
C දුතියපාරාජික
D පාරාජිකපාළි අඨම සඞ්ඝාදිසෙස

ඒ ඇවැතට පැමිණියහු පරදවාද, එහෙයින් පාරාජිකායි කියනුලැබේ. පුද්ගලතෙමේ යම්හෙයකින් පැරදුනේද, පරාජයට පැමිණියේද, එහෙයින් පාරාජිකයි කියනුලැබේ. මේ අර්ථයම සඳහා පරිවාරයෙහිද

'පාරාජිකන්ති යං වුත්තං - තං සුණොහි යථා තථං,
වුත්තෝ පරජ්ජා භට්ඨෝ ච - සද්ධම්මාහිනිරඞ්කතෝ,
සංවාසෝ ච තහිං නත්ථි - තෙනෙතං ඉති වුච්චති'යි කියනලදී.

පාරාජිකයි යමක් කියනලදද, එය තතුලෙසින් අසව. ශාසනයෙන් ච්‍යුතවූයේද, පැරදුනේද, ගිලිහුනේද, බැහැරකරනලද්දේද, ඔහුකෙරෙහි උපොසථ පවාරණාදි ප්‍රභෙදවත්වූ සංවාසය නැත්තේද, එහෙයින් මේ ශික්ෂාපදය පාරාජිකයි කියනුලැබේ.

මේ එහි අර්ථයවේ: ඒ ශික්ෂාපදය ඉක්මවන්නාවූ ඇවැතට පැමිණියාවූ පුද්ගලතෙමේ ශාසනයෙන් ච්‍යුතවූයේයයි සියල්ල යෙදියයුතුය. **යම් කාරණයකින් අශ්‍රමණයෙක්වේද, අශාක්‍යපුත්‍රියයෙක්වේද, ශාසනයෙන් ගිලිහුනේවේද, සිදුනේවේද, පරදවනලද්දේවේද ඒ කාරණයෙන් කියනුලැබේ.** එයින් කුමක් කියනුලැබේදයත්: පාරාජිකවේයයි කියනුලැබේ. මෙහි එක්ව වසත්තුයි සංවාස, ඒ දක්වන්නට **'සංවාසෝ නාම'**යි වදාරා **'එකං කම්මං'**යනාදිය වදළසේක. එහි මේ යොජනාවසමග සංවණ්ණනාය: අපලොකනාදිවසයෙන් සිවුවැදෑරුම්වූද සඞ්ඝකර්මය එක් සීමාවෙක්හි ඇතුළත්වූ පියවිසැහැවිඇති භික්ෂූන්විසින් එක්ව කටයුතුබැවින් එකකර්මනම්. එසේ පස්වැදෑරුම්වූ ප්‍රාතිමොක්ෂාදෙශය එක්ව උදෙසියයුතුබැවින් එකොදෙශනම්. පණවාවදළ ශික්ෂාපදය සියලු ලජ්ජී පුද්ගලයන්විසින් සමව හික්මියයුතුබැවින් සමශික්ෂතානම්. මෙහි යම්හෙයකින් සියලුම ලජ්ජීභික්ෂූහු මේ කර්මාදීන්හි එක්ව වසත්ද එකෙකුත් එයින් බැහැර නොදක්නාලැබේද එහෙයින් ඒ සියල්ලගෙන **'එසෝ සංවාසෝ නාම'**යනාදිය වදළසේක. ඒ කියූඅයුරු ඇති සංවාසය **'තෙන'** ඒ පුද්ගලයා **'සද්ධිං නත්ථි'** සමග නැත්තේය. **'තෙන'** ඒ කාරණයෙන් ඒ පාරාජික පුද්ගලතෙමේ **'අසංවාසෝ'** සංවාස නැත්තේයයි කියනුලැබේ.

මෙසේ උදෙසූ ශික්ෂාපදය පදපිළිවෙළින් විභාගකොට දක්වා දැන් **'යං තං පතිසෙවෙය්‍ය'**යන මෙහි යම්අයුරකින් ප්‍රතිසෙවනය කරන්නේයයි කියනුලැබේද, ඒ ප්‍රතිසෙවනය පිළිබඳ ආකාරය දක්වීමපිණිස **'පතිසෙවති නාම'**යන මේ මාතෘකාපදය තබා **'නිමිත්තෙන නිමිත්තං අඞ්ගජාතෙන අඞ්ගජාතං'**යි වදරනලද්දේය. එහි යම්හෙයකින් හුදෙක් ස්ත්‍රියගේම නිමිත්ත පාරාජිකාපත්තියට වසතුනොවේද, මනුෂ්‍යඅස්ත්‍රියගේම නිමිත්ත පාරාජිකාපත්තියට වසතුනොවේද, රත්‍රිදී ආදියෙන් කළ ස්ත්‍රීන්ගේද

නිමිත්ත වසඟ නොවේද, එහෙයින් යම් යම් නිමිත්තක් වසඟවේද, ඒ ඒ නිමිත්ත දක්වනුපිණිස **'තිස්සෝ ඉත්ථියෝ'**යනාදිනයින් යම් කෙනෙකුන්ගේ නිමිති වසඟවේද, ඒ සත්ත්වයන් වදරා **'මනුස්සිත්ථියා තයෝ මග්ගෙ'**යනාදි නයින් ඒ වසඟ දක්වා වදළසේක.

එහි ස්ත්‍රීහු තිදෙනෙකි. උභතොබ්‍යඤ්ජනකයෝ තිදෙනෙකි. **පණ්ඩකයෝ** තිදෙනෙකි. පුරුෂයෝ තිදෙනෙකැයි පාරාජිකවස්තුවූ නිමිත්තයනට නිශ්‍රයවූ සත්ත්වයෝ දෙළොස්දෙනෙක්වෙත්. ඔවුන් අතුරෙහි ස්ත්‍රීපුරුෂයෝ ප්‍රකටයහ. පණ්ඩක - උභතෝ ව්‍යඤ්ජනක භෙදය ප්‍රව්‍රජ්‍යාස්කන්ධවර්ණනාවෙහි පළටවන්නේය.

'මනුස්සිත්ථියා තයෝ මග්ගෙ මෙථුනං ධම්මං පතිසෙවන්තස්ස'යන මෙහිද මනුෂ්‍යස්ත්‍රියගේ වසමග - පසමග - මුවමගයන තුන්මගෙහිය යනඅර්ථය දතයුතුය. සියලුතන්හි මෙසේය. මනුෂ්‍යස්ත්‍රියගේ තෙමගය, තිරශ්චීනසත්ත්‍රියගේ'තෙමගයයි මාඝීනවයෙක. මනුෂ්‍ය උභතොබ්‍යඤ්ජනකාදීන්ගේ මාඝීනවයෙක. මනුෂ්‍යපණ්ඩකාදීන්ගේ වසමග - මුවමගවිසින් දෙකක් දෙකක්කොට මාඝීසයෙක. මනුෂ්‍යපුරුෂාදීන්ගේ වසමග - මුවමගවිසින් දෙකක් දෙකක්කොට මාඝීසයෙකැයි මේ සියලුමමාඝී සමතිසක්වෙයි. නිමිත්ත සඞ්ඛ්‍යාතවූ මේ මාඝීයන්අතුරෙහි යම්කිසි මගෙක මහණතෙමේ තමන්ගේ අඞ්ගජාතය තලැටක් පමණකුදු ප්‍රවේශකොට මෙවුන්දම් සෙවීම කරනුයේ පාරාජිකාවට පැමිණේ. යම් හෙයකින් පාරාජිකාවට පැමිණෙනුයේද, සෙවනය කිරීමෙහි සිතින්ම පැමිණේද, ඒ සිතින් වෙන්ව නොපැමිණේද, එහෙයින් ඒ ලක්ෂණ දක්වනාවූ භාග්‍යවතුන්වහන්සේ **'භික්ඛුස්ස සෙවනචිත්තං උපට්ඨිතෙ'**යනාදිය වදළසේක.

එහි **'භික්ඛුස්ස'** මෙවුන්දම්සෙවීම කරන මහණහුට. **'සෙවන චිත්තං උපටඨිතෙ' සපතම්‍යතථියෙහි ප්‍රථමාවචනයි**. සෙවීමෙහි සිත එළැඹසිටිකල්හිය යනඅර්ථයි. **'වචචමග්ගං අඞ්ගජාතං පවෙසෙන්තස්ස'** යම් මගකින් අශුචි නික්මේද, ඒ මලමගට තමන්ගේ අඞ්ගජාතය, පුරුෂනිමිත්ත තලැටක් පමණකුදු ප්‍රවේශකරන මහණහුට **'ආපත්ති පාරාජිකස්ස'** ඇවැත පාරාජිකාවමවේ. **'අස්ස'**වේය යනඅර්ථයි. නොහොත් **'ආපත්ති'**නම් පැමිණීමවේ. **'පාරාජිකස්ස'** පාරාජිකධර්මයට. සියලුතන්හි මේ ක්‍රමයවේ.

මෙසේ මෙවුන්දම් සෙවීමෙහි සිතින්ම ප්‍රවේශකරන මහණහුට පාරාජිකාපත්තිය දක්වා දන් යම්හෙයකින් ඒ ප්‍රවේශයනම් හුදෙක් තමන්ගේ උපක්‍රමයෙන්මනොව අන්හුවිසින් යොදන උපක්‍රමයෙන්දවේ. එහිදීද පිළිසෙවීමෙහි සිතින් යුක්තව ඉවසන්නහුටම ආපත්තියවේ. අන්හට නොවේ.

එහෙයින් සැදහයෙන් පැවිදිව සසුන්පිළිවෙතෙහි මොනවට පිළිපන් යම් කුලපුත්‍රකෙනෙක් අන්හුවිසින් යොදන උපක්‍රමයෙන් ප්‍රවේශය ඇතිකල්හිදු නොඉවසත්ද, ඔවුන් රැකීම පිණිස **'භික්ඛුපච්චත්ථිකා මනුසස්සිත්ථී'**යනාදිය වදළසේක. එහි ප්‍රතිපක්ෂයකු (දුසිල්බව හෝ) පතත්. සොයත්. කැමතිවෙත්නුයි පච්චත්ථිකයහ. භික්ෂූහුම පසමිතුරුවූවාහු, භික්ඛුපච්චත්ථික නම්වෙත්. විසභාග වෛරී භික්ෂූන්ට මේ නමකි. **'මනුසස්සිත්ථී, භික්ඛුසස සන්තිකෙ ආනෙත්වා'** ඊර්ෂ්‍යාවෙන් මඩනාලද මහණෝ ඒ මහණහු නසනුකැමැතිව ආමිෂයෙන් හෝ පොළොඹවා මිත්‍රසන්ථවවශයෙන් හෝ 'අපගේ මේ කිස කරව'යි කියා කිසි මනුෂ්‍යස්ත්‍රියක රාත්‍රිකාලයෙහි ඒ මහණහු වසනතැනට ගෙනවුත්. **වච්චමග්ගෙන අඞ්ගජාතං අභිනිසීදෙනති** ඒ මහණහු සැලෙන්නට පෙරළෙන්නට නොහැකිවනසේ අතින් පයින් හිසින් දඩිව අල්ලා ගෙන ස්ත්‍රියගේ මලමග හා මහණහුගේ අඞ්ගජාතය ඇතුල්වනසේ මහණහුගේ අඞ්ගජාතය මතුවෙහි හිඳුවත්. ස්ත්‍රියගේ මලමග සමග යොදත්ය යනඅර්ථයි. **'සො වෙ'** යනාදිතන්හි ඉදින් ඒ මහණතෙමේ ස්ත්‍රියගේ මලමග තුළට තමන්ගේ අඞ්ගජාතය. **'පවෙසනං සාදියති'** ඇතුල්කිරීම ඉවසාද, ඒ මොහොතෙහි මෙවුන්දම් සෙවීමෙහි සිත එළවාද **'පවිට්ඨං සාදියති'** ඇතුල්කිරීම ඉවසාද, ඇතුල්වූකල්හි සෙවීමෙහි සිත එළවාද, **'ඨිතං සාදියති'** සිටීම ඉවසාද, ස්ත්‍රියගේ මලමගතුළ තමන්ගේ අඞ්ගජාතය සිටීමට පැමිණිකල්හි ශුක්‍ර මිදෙන කල්හි සෙවීමෙහි සිත එළවාද, **'උද්ධරණං සාදියති'** උඩටනගාගැනීම ඉවසාද, බැහැරට ඇදගන්නාකල්හි සෙවීමෙහි සිත එළවාදැයි මෙසේ මේ සිවුතන්හි ඉවසනුයේ 'මාගේ සතුරු මහණුන්විසින් මේ කරනලදැයි කියන්නට නොලබන්නේය. පාරාජිකාපත්තියටම පැමිණෙන්නේය. මෙ කියූ සිවුතැන ඉවසනුයේ යම් සේ පාරාජිකාපත්තියට පැමිණේමය. හැමතින්වනාහි තමන්ගේ අඞ්ගජාතය ආසීවිඡයක්නුගේ මුවෙහි පිවිසියක්මෙන්ද, අඟුරු වළක පිවිසියක් මෙන්ද, හහිමින් නොඉවසනුයේ පාරාජිකාපත්තියට නොපැමිණේ. **'පවෙසනං න සාදියති -පෙ- උද්ධරණං න සාදියති අනාපත්ති'** යි එහෙයින් වදරණලදී. පටන්ගත් විදසුන් ඇති කයෙහිද ජීවිතයෙහිද බලාපොරොත්තු නැති සියලුඅායතන රාගදෙවෂාදීවූ එකොළොස්ගින්නෙන් ඉතාදදින් ඇවිළගත්තවුන්මෙන් වටහාගන්නාවූ පස්කම්ගුණ ඔසොවාගත් කඩුඇති වධකයන්මෙන් දක්නාවූ මෙබඳුවූ මේ පුඟලයා රකිමින් භාග්‍යවතුන්වහන්සේ මේ මහණහුගේ පසමිතුරන්ගේ චිත්තාභිලාෂය නැසීම කරනසේක් **'පවෙසනං න සාදියති'**යනාදිවූ මේ වතුෂ්කය ගෙනහැර තැබූසේක.

ප්‍රථම වතුෂ්කකථාව නිමි.

—\\—

මෙසේ ප්‍රථමවතුෂ්කය දක්වා දැන් යම්හෙයකින් භික්ෂුප්‍රත්‍යනීකයෝ මහණහු වෙතට ස්ත්‍රියක ගෙනවුත් හුදෙක් මහණහුගේ අඩගජාතය ස්ත්‍රියගේ මලමග හාම නොයොදත්ද, තවද පසමග හා මුවමග හාද යොදත්. ස්ත්‍රියක ගෙනෙන්නාවූද ඇතැම් පසමිතුරෝ නොනිදන්නියක ගෙන එත්. කිසිවක්හු නිදන්නියක, කිසිවක්හු මත් තැනැත්තියක, කිසිවක්හු උමතු තැනැත්තියක, කිසිවක්හු පමා තැනැත්තියක, අන්‍යවිහිත වික්ෂිපත ස්ත්‍රියකයන අරටීයි. කිසිවක්හු මළාවූ ක්ෂයනොවූ නිමිතිඇත්තියක, බලු කැණහිල් ආදීන්විසින් ක්ෂයනොකළ නිමිති ඇත්තියක යනඅරටීයි. කිසිවක්හු මළාවූ බොහෝසෙයින් ක්ෂයනොවූ නිමිතිඇත්තියක, **යෙභුය්‍යෙන අකියිතා නම්,** යම් ස්ත්‍රියකගේ වයමගෙහි, පසමගෙහි, මුවමගෙහි හෝ ඉතාබොහෝවූ අවකාශයක් ක්ෂයනොවූයේද ඕතොමෝය. කිසිවක්හු මළාවූ බොහෝසෙයින් ක්ෂයවූ නිමිතිඇත්තියක ගෙනඑත්. **යෙභුය්‍යෙන ඛයිතා නම්,** යම් ස්ත්‍රියකගේ වයමග ආදීවූ නිමිත්තෙහි බොහෝ අවකාශයක් ක්ෂයවූයේද, මද අවකාශයක් ක්ෂයනොවූයේද, ඕ තොමෝය. හුදෙක් මනුෂ්‍යස්ත්‍රියකම ගෙන නොඑත්. උභතෝ ව්‍යඤ්ජනයකුදු පණ්ඩකයකුදු පුරුෂයෙකුදු ගෙන එත්. එහෙයින් ඔවුන්ගේ වසයෙන් අන්‍යවූද වතුෂ්කයන් දක්වනසේක් **'භික්ඛු පවවරථිකා මනුසසිත්ථී ජාගරන්තිං'**යනාදිය වදළසේක.

එහි නොමුළාබවපිණිස කියනලද වතුෂ්කයෝ සඞ්ඛ්‍යාවශයෙන් මෙසේ දතයුතුය. මනුෂ්‍යස්ත්‍රිය පිළිබඳ ත්‍රිවිධ මාඝීයන්ගේවශයෙන් ශුද්ධිකවතුෂ්කතුනක. නොනිදන ස්ත්‍රිය පිළිබඳ වතුෂ්කතුනක, නිදනස්ත්‍රිය පිළිබඳ වතුෂ්ක තුණෙක, මත් වූ ස්ත්‍රිය පිළිබඳ වතුෂ්ක තුණෙක, උනමත්තක ස්ත්‍රිය පිළිබඳ වතුෂ්කතුනක, ප්‍රමත්ත ස්ත්‍රිය පිළිබඳ වතුෂ්කතුනෙක, මළ නොනට නිමිත්තඇති ස්ත්‍රිය පිළිබඳ වතුෂ්කතුනක, බොහෝසෙයින් නොනට නිමිත්තඇති ස්ත්‍රිය පිළිබඳ වතුෂ්කතුනකුයි සත්විසි වතුෂ්කකෙනෙක්වෙත්. අමනුෂ්‍යස්ත්‍රිය පිළිබඳ ත්‍රිවිධ මාඝීයන්ගේවසයෙන් එසේ වතුෂ්කසත්විස්සෙක. නියඒගත ස්ත්‍රිය පිළිබඳ ත්‍රිවිධ මාඝීයන්ගේ වසයෙන් එසේ වතුෂ්කසත්විස්සෙකුයි ස්ත්‍රීන්ගේ වාරයෙහි එක්අසුවක් වතුෂ්කවෙයි. ස්ත්‍රීන්ගේ වාරයෙහි යම්සේද, උභතෝ ව්‍යඤ්ජනකයන්ගේ වාරයෙහිද එසේය. පණ්ඩක - පුරුෂ වාරයන්හි වසමග - මුවමග යන දෙවැදරුම්වූ මාඝීයන්ගේවසයෙන් සිවුපණස් සිවුපණස් වතුෂ්කවෙයි. මෙසේ ගත්කල්හි සියලුමවතුෂ්ක දෙසියසැත්තෑවක්වෙයි. ඒ දෙසිය සැත්තෑ වතුෂ්ක ප්‍රකටඅරටී ඇත්තාහුමය.

මෙහි සියලු වාරයන්හි **'මතං යෙභුය්‍යෙන අකියිතං ඛයිතං'**යන මෙතන්හි මේ විනිශ්චයවේ: තාම්‍රපර්ණි දීපයෙහිවනාහි **උපතිස්ස** සථවිර - **ඵුස්සදෙව** සථවිර යි විනයධර මහාසථවිරයන්වහන්සේ දෙනම එක්

ඇදුරක්හුගේ පාඨන්තෙවාසිකයෝවූහ. උන්වහන්සේ මෙහි මහත්බියක් උපන්කල්හිද, විනයපිටකය පරිහරණය කරන්නාහු එය රැකගත්හ. උන්වහන්සේ දෙනමඅතුරෙහි උපතිස්ස මහා සථවිරයන්වහන්සේ ව්‍යක්තතරයහ. **මහාපදුම - මහාසුම්ම** මහාසථවිරයන්වහන්සේ දෙනම උන්වහන්සේගේ අතවැස්සෝවූහ. ඒ දෙනමඅතුරෙහි මහාසුම්ම මහා සථවිරයන්වහන්සේ නවවරක් විනයපිටකය අසා හදරා පුහුණුකොට සිටියහ. මහාපදුම මහාසථවිරයන්වහන්සේ මහාසුම්ම මහා සථවිරයන්වහන්සේ හා එක්ව නව වරක් විනයපිටකය අසා හදරා පුහුණුකොට සිටියහ. මහාපදුම මහාසථවිරයන්වහන්සේ මහාසුම්ම මහාසථවිරයන්වහන්සේ හා එක්ව නවවරක්ද, වෙන්ව එකලාවම නවවරක්දැයි අටළොස්වරක් විනයපිටකය ඇසූහ. මේ දෙනම අතුරෙහි මහාපදුම මහාසථවිරයන්වහන්සේ ව්‍යක්තතරයහ ඒ දෙනම අතුරෙහි මහාසුම්ම මහා සථවිරයන්වහන්සේ නවවරක් විනයපිටකය අසා බලා හදරා ගුරුවරයා හැරපියා ගණින් එතරට වැඩියහ. එහෙයින් මහාපදුම මහා සථවිරයන්වහන්සේ නවවරක් විනයපිටකය අසාබලා හදරා ගුරුවරයා හැරපියා ගණින් එතරට වැඩියහ. එහෙයින් මහාපදුම මහා සථවිරයන්වහන්සේ 'නිතුවකි, යමෙක් දිවමන් ගුරුන්හැරපියා අත්තැනක විසියයුතුයයි සිතාද, මේ විනයධරතෙමේ සූරයෙකි, ගුරුන් දිවමන්ව සිටියදී විනයපිටකයත් අර්ථකථාවත් නොයෙක්වර අසාබලා ගෙනද නොහැරිය යුතුනොවේද, නිතිකල් ඇසියයුතුනොවේද, අවුරුදුපතා හැදරියයුතු නොවේදැයි' කීහ. මෙසේ විනයගරුක භික්ෂූන්වහන්සේගේ කාලයෙහි එක් දවසක් උපතිස්ස මහාසථවිරයන්වහන්සේ මහාපදුම සථවිරප්‍රමුඛවූ පන්සියයක් අතවැසියනට ප්‍රථම පාරාජික ශික්ෂාපදයෙහි මේ පෙදෙස වණ්ණනා කරමින් හුන්හ. එහිදී ඒ අතවැසි භික්ෂූන්වහන්සේ 'සාමීනි! බොහෝ සෙයින් නොනට, සිවුකොටසින් තුන්කොටසක් නොනැසී සිටි නිමිත්තෙහි කුමක් වියයුතුද'යි උන්වහන්සේගෙන් අසා සිටියහ. එකල්හි මහාසථවිරයන්වහන්සේ 'ඇවැත්නි! බුදුවරයෝවනාහි පාරාජිකය පණවනසේක් ඉතිරිකොට නොපනවනසේක. ඉතිරිනොකොටම සියලු පාරාජිකක්ෂේත්‍රය අනවශෙෂවශයෙන් ගෙන පාරාජිකක්ෂේත්‍රයෙහි ව්‍යතික්‍රම ප්‍රොතය සිඳහැර පාරාජිකවස්තුවෙහි පාරාජිකයම පනවනසේක. මේ භික්ෂාපදය ලොකවද්‍යවේ. ප්‍රඥප්තිවද්‍ය නොවේ. එහෙයින් ඉදින් සමඅඩක් නටනිමිත්තෙහි පාරාජිකය වන්නේනම්, සම්මා සම්බුදුරජානන්-වහන්සේ එය පනවනසේක. මෙහි වනාහි පාරාජිකවජ්‍යාවකුදු නොපෙනේ, ථුල්ලවචයම දක්නාලැබෙය'යි කීහ.

තවද මළසිරුරෙහි පාරාජිකය පනවන්නාවූ භාග්‍යවතුන්වහන්සේ බොහෝසෙයින් නොනට සිවුකොටසින් තුන්කොටසක් නොනට නිමිත්තෙහි එසේ තැබූසේක් එයින් මතුවෙහි පාරාජිකයක් නැතැයි දක්වනුපිණිසයයි. දතයුතුය.

මේ නට, නොනට නිමිත්ත මළසිරුරෙහිම දතයුතුය. දිවමන් සිරුරෙහි නොදතයුතුය. දිවමන් සිරුරෙහි නියපිටු පමණවූ සිවිමස් හෝ නහරවැලක් ඇතිකල්හි පාරාජිකයමවේ. ඉදිනුදු නිමිත්ත බලු, කැනහිල්ආදීන්විසින් කනලද්දක්වැනිව හැමඅතකින් නැසීගියේ, සිවිසම් නැත්තේනමුදු නිමිත්ත සටහන පෙනේද, එහි ප්‍රවේශය සිදුවේද පාරාජිකයමවේ. නිමිත්ත සටහන ඉතිරිනොකොට සියලුනිමිත්ත සිඳදමා හාත්පසින් සැස උපුටාහළකල්හි ව්‍රණසංක්ෂෙපවශයෙන් ථුල්ලච්චයවේ. නිමිත්තෙන් බැහැරට ඇදීසිටි මස්වැදල්ලෙහි උපක්‍රම කරන්නහුට දුක්කටයවේ. මළසිරුරෙහිවනාහි ඉදිනුදු සියලු සිරුර නැසී ගෙවීගියේද, ඉදිනුදු නැසී ගෙවී නොගියේද, තෙමගවනාහි නැසී ගෙවී නොගියේද, එතන්හි උපක්‍රම කරන්නහුට පාරාජිකයවේ. බොහෝසෙයින් නොනට නොගෙවුනු නිමිත්තෙහිද පාරාජිකයමවේ. අඩක් ගෙවීගියාවූද, බොහෝසෙයින් නැසුනාවූද නිමිත්තෙහි ථුල්ලච්චයවේ.

මිනිසුන්ගේ පණඇති සිරුරෙහි ඇස්, නාස්, කන්සිදුර, රහසඟ යන මෙතැන්හි හෝ සැත් ආදියෙන් කළ වණයෙහි හෝ මෙථුන රාගයෙන් තලැටක් පමණකුදු අඩඟජාතය ප්‍රවෙශකරන්නහුට ථුල්ලච්චයමවේ. සෙසු සිරුරෙහි කිසිළිඳාදියෙහි උපක්‍රමකරන්නහුට දුක්කටයවේ.

මළාවූ තෙත්සිරුරෙහි පාරාජිකක්ෂෙත්‍රයෙහි පාරාජිකයවේ. ථුල්ලච්චයක්ෂෙත්‍රයෙහි ථුල්ලච්චයවේ. දුක්කටක්ෂෙත්‍රයෙහි දුක්කටයවේ. යම්කලෙක ශරීරය ඉදිමී කුණුවීගියේ, නීලමැස්සන්ගෙන් ගැවසුනේ, පණුකැලින් ආකුලවූයේ, නවවණමුඛයන්ගෙන් වැගුරුණු සැරව ඇත්තේ, කුණුපබැවින් ලංවන්නට නොහැකිවන්නේද, එකල්හි පාරාජිකවස්තුභාවයත් ථුල්ලච්චයවස්තුභාවයත් හැර සිටුනේය. එබඳු සිරුරෙහි යම්කිසි තැනක උපක්‍රම කරන්නහුට දුක්කටයමවේ.

තිරිසන් ගිය ඇත්, අස්, ගොන්, කොටලු, ඔටු, මීගොන්ආදීන්ගේ නාසයෙහි උපක්‍රමකරන්නහුට ථුල්ලච්චයවේ. රහසඟෙහි උපක්‍රම කරන්නහුටද ථුල්ලච්චයමවේ. සියලු තිරිසන් ගියවුන්ගේ ඇස්, කන්, වණයන්හි දුක්කටයවේ. සෙසුසිරුරෙහිද දුක්කටයමය.

මළවුන්ගේ තෙත්සිරුරෙහි පාරාජිකක්ෂෙත්‍රයෙහි පාරාජිකයවේ. ථුල්ලච්චයක්ෂෙත්‍රයෙහි ථුල්ලච්චයවේ. දුක්කටක්ෂෙත්‍රයෙහි දුක්කටයවේ. කුණුවූ කුණුපයෙහිවනාහි පෙරකියූනයින්ම සියලුතන්හි දුක්කටයවේ.

කායසංසග්ගරාගයෙන් හෝ මෙථුනරාගයෙන් ජීවමාන පුරුෂයෙකුගේ වත්ථිකොෂයෙහි ඇතුල් නොකරමින් නිමිත්තෙන් නිමිත්ත පහසාද ගටාද දුක්කටයවේ. මෙථුනරාගයෙන් ස්ත්‍රියකගේ නිමිත්තතුළට ඇතුල් නොකරමින් නිමිත්තෙන් නිමිත්ත පහසාද ගටාද ථුල්ලච්චයවේ. මහා අට්ඨකථාවෙහිවනාහි මෙථුනරාගයෙන් ස්ත්‍රීනිමිත්ත මුවෙන් පහසාද ථුල්ලච්චයවේයයි කියනලදී. වම්මකඛන්ධකයෙහි **'ජඞ්ඝගච්ඡියහිඤ්ඤු අච්චවතියා නදියා ගාවිනං තරන්තිනං විසාණෙඤ්ඤුපි ගණ්හන්ති, කණෙණඤ්ඤුපි ගණ්හන්ති, ගීවායපි ගණ්හන්ති, ඡෙපායපි ගණ්හන්ති, පිට්ඨිම්පි අභිරුහන්ති, රත්තචිත්තාපි අඞ්ගජාතං ඵුසන්ති'**[A]යන මේ අට්ඨුප්පත්තියෙහි විශෙෂයක් නොතබා **'න ච භික්ඛවෙ රත්තචිත්තෙන අඞ්ගජාතං ඵුසිතබ්බං, යො ඵුසෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස'**යි වදරණලද්දේය. ඒ සියල්ලද සසඳ යම්සේ විරුද්ධ නොවේද, එසේ ගතයුතුය. කෙසේ විරුද්ධ නොවේදයත්: මහාඅට්ඨකථාවෙහිවනාහි මෙථුනරාගය කරනකොට මුවෙන් පහසායයි යමක් කියනලද්දේද, එහිවනාහි නිමිත්තමුඛය, මුඛයයි අදහස් කරනලද්දේය. මෙථුනරාගයෙනැයි කියූබැවින්ද, එහි මේ අදහසමැයි දතයුතුය. ප්‍රකෘතිමුඛයෙන් ස්ත්‍රීනිමිත්තෙහි මෙථුනය පිළිබඳ උපක්‍රමයක් නොවේමය. බන්ධකයෙහිද යම් භික්ෂුකෙනෙක් දෙනුන්පිට නගින්නාහු මෙථුනරාගය කරනකොට අඞ්ගජාතයෙන් අඞ්ගජාතය ස්පර්ශකළාහුද, ඔවුන් සඳහා ථුල්ලච්චය වදරණලදයි දතයුතුය.

අන්අයුරකින් හෙවත් ප්‍රකෘතිමුඛයෙන් පහසන්නහුට අංආදිය අල්ලාගැනීමෙහි මෙන් දුක්කටය වන්නේය. කිසි කෙනෙක්වනාහි බන්ධකයෙහිදු තොල්, දිවි ආදීවූ මුඛාවයවයකින්ම ස්පර්ශකිරීම සඳහා ව්‍යතික්‍රමසඞ්ඛ්‍යාතකර්මය තමා දළබැවින් ථුල්ලච්චය වදරණලදය. අට්ඨකථාවෙහිද ඒ අදධ්‍යාචාරය සඳහා කියනලද්දම ගෙන මෙථුන රාගය කරනකොට මුවෙන් පහසානම් ථුල්ලච්චය වේයයි කියනලදයිකියත්. එහෙයින් මැනවින් සලකාබලා දෙවැදරුම් විනිශ්චයන්අතුරෙහි යම් විනිශ්චයක් යුක්තිතරද ඒ ගතයුතුය. විනය දත්තාහුවනාහි පළමුවිනිශ්චය පසසත්. කායසංසර්ගරාගය කරනකොටවනාහි ප්‍රකෘතිමුඛයෙන් හෝ නිමිත්ත මුඛයෙන් හෝ ස්ත්‍රීනිමිත්ත ස්පර්ශකරන්නාහට සඞ්ඝාදිසෙසයවේ. තිරිසන් ගිය ස්ත්‍රියගේ මූත්‍රමාර්ග නිමිත්ත මුඛයෙන් ස්පර්ශකරන්නාහට කියූනයින්ම ථුල්ලච්චයවේ. තමන්ගේ නිමිත්ත මුඛයෙන් කායසංසර්ගරාගය කරනකොට ගෙන ස්පර්ශකරන්නාහට දුක්කටයවේ.

අවශෙෂ එකුනසප්පති දවිශතවතුෂ්ක කථාව නිමි.

—\\—

A මහාවග්ගපාළි

මෙසේ භාග්‍යවතුන්වහන්සේ ආරබ්ධවිදර්ශීක භික්ෂුවගේ රැකීමපිණිස දෙසියසැත්තෑවක් වතුෂ්ක ගෙනහැර දක්වා දැන් අනාගතයෙහි යම් පාපභික්ෂූහු පිළිසම් ආදි යමකින් වයසනලද්දවූ මේ කායෙන්ද්‍රියයෙන් යුත් කිසි නිමිත්තක් කායෙන්ද්‍රියයෙන් යුත් නිමිත්තෙන් නොපහසාද, මෙහි කවර දෙෂයක්දැයි සිතා දන ලෙශයක් නගා පිහිටුවන්නාහුද, ඔවුන්ට මාගේ ශාසනයෙහි ප්‍රතිෂ්ඨාවක්නම් නොවන්නීය යි දැකවදරා ඒ දෙසියසැත්තෑවක් වතුෂ්කයන්අතුරෙහි එක්එක් වතුෂ්කය චතුර්විධ සත්‍රතාදිභෙදයෙන් බිඳ දක්වනයේක් **'භික්ඛුපච්චත්ථිකා මනුස්සිත්ථී, භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන පස්සාවමග්ගෙන - මුඛමග්ගෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති සත්‍රතාය අසත්‍රතස්ස'** යනාදිය වදළසේක.

එහි **'සත්‍රතාය අසත්‍රතස්ස'**යනාදී තන්හි පිළිසම් ආදියකින් වයසනලද ස්ත්‍රියකගේ වසමග හා පසමග හා මුවමග හා පිළිසම් ආදි යමකින් නොවසනලද මහණහුගේ අඞ්ගජාතය යොදන් යි මේ නයින් යොජනාව දතයුතුය. එහි සත්‍රතා නම්: යම්කිසි ස්ත්‍රියකගේ වසමග පසමග-මුවමග යන තුන්මග අතුරෙහි යම්කිසි මගක් ඇතුළට ප්‍රවෙශ නොකොට පිටත වෙළා හෝ පිළිසම් ආදියක් ඇතුළත ප්‍රවෙශ කොට හෝ යම්කිසි පිළිකඩකින් හෝ කොළපතකින් හෝ වැහැරි පටකින් හෝ සමකින් හෝ කළුතුඹ, සුදුකුඩ ආදීවූ යම්කිසි පටකින් හෝ වසනලදද එසේ වැසූ මං ඇත්නී සත්‍රතාය. සත්‍රතනම්: යම්කිසි මහණක්නුගේ අඞ්ගජාතය ඒ වස්ත්‍රාදීන්අතුරෙහි යම්කිසිවකින් වසනලද්දේද ඒ ය. එහි නොනට කායප්‍රසාදය ඇති නිමිත්තකින් හෝ නැසුනු කායප්‍රසාදය ඇති නිමිත්ත ගටනුලබාවා හෝ නැසුනු කායප්‍රසාදය ඇති නිමිත්තකින් නොනැසුනු කායප්‍රසාදය ඇති නිමිත්ත ගටනුලැබේවා හෝ නැසුනු කායප්‍රසාදය ඇති නිමිත්තකින් නැසුන කායප්‍රසාදය ඇති නිමිත්ත ගටනුලැබේවා හෝ නොනැසුනු කායප්‍රසාදය ඇති නිමිත්තකින් නොනැසුනු කායප්‍රසාදය ඇති නිමිත්ත ගටනුලැබේවා හෝ ඉදින් යම් පමණ තලැටක් පමණකුදු ඇතුල්වූකල්හි පාරාජිකයවේය යි වදරණලද්දේද එහෙයින් එපමණකුදු ස්ත්‍රියකගේ තුන්මගින් එක්මගෙක ඇතුල්වේද, සියලුතන්හි එය ඉවසන්නහුට පාරාජිකක්ෂෙත්‍රයෙහි පාරාජිකයවේ. ථුල්ලවචයක්ෂෙත්‍රයෙහි ථුල්ලවචයවේ. දුක්කටක්ෂෙත්‍රයෙහි දුක්කටයමවේ. ඉදින් ස්ත්‍රීනිමිත්තෙහි ඇතුළට සමතලව හෝ මතුව සිටින සේ එයට සුදුසු කණුවක් ඇතුල්කොට යමකින් වැසූකණුව තමන්ගේ නිමිත්තෙන් ගටන්නහුට දුක්කටයවේ. ඉදින් පුරුෂ නිමිත්ත ඇතුළෙහි කණුවක් යවා යමකින් වැසූ ඒ කණුව ඇතුල් කරන්නහුට දුක්කටයවේ. ස්ත්‍රී-පුරුෂ නිමිති දෙක්හි කණු ඇතුල්කොට යමකින් වැසූ කණුව කණුවෙන්

ගටන්නහුට දුක්කටයවේ. ඉදින් ස්ත්‍රීනිමිත්තෙහි හුණබට පුරුක් ආදීන්ගෙන් කිසිවක් ඇතුල් කරනලද්දේද එහි යට කොටසද පහසමින් තලැටක්පමණ ප්‍රවේශකෙරේනම්, පාරාජිකයවේ. මතු කොටසද දෙපසින් එක්පසක්ද පහසමින් ප්‍රවේශකෙරේද, පාරාජිකයවේ. සතරපසම නොපහසමින් ඇතුල්කොට ඒ පුරුකෙහි ඇතුල්තලය නමුදු පහසානම් පාරාජිකයවේ. ඉදින්වනාහි සතරපසෙහි හෝ ඇතුල්තලයන්හි හෝ නොගටමින් නොපහසින් අහස්ගතමකොට ඇතුල්කොට පිටතටඇදගතීද දුක්කටයවේ. ස්ත්‍රීනිමිත්තෙහි ඇතුළට යැවූ කණුවෙහි පිටත පහසානම් දුක්කටයමවේ. ස්ත්‍රීනිමිත්තෙහි යම්සේ කියනලදද, වසමග ඈ සියලුතන්හි ලක්ෂණයද එසේ දතයුතුය.

සත්‍රථත චතුෂ්ක භෙදකථා නිමි.

—\\—

මෙසේ සත්‍රථත චතුෂ්කභෙදය දක්වා දැන් යම්හෙයකින් හුදෙක් මහණහුවෙතටම මනුෂ්‍යස්ත්‍රී ආදීහු ගෙන නොඑන්නාහුද, තවද ස්ත්‍රීන්වෙතට මහණහුද ගෙනඑන්නාහ. එහෙයින් ඒ භෙදය දක්වනසේක් **'භික්ඛුපවත්තිකා භික්ඛුං මනුසස්ත්‍රියා සන්තිකෙ'**යනාදි නයින් ඒ සියලුචතුෂ්ක නැවතත් ගෙනහැර දක්වූසේක. ඔවුන් කෙරෙහිවූ විනිශ්චය කියූනයින්ම දතයුතුය.

භික්ෂුප්‍රත්‍යනීක වශයෙන් චතුෂ්කභෙදවණ්ණනාව නිමි.

—\\—

යම්හෙයකින්වනාහි භික්ෂුප්‍රත්‍යනීකයෝම මෙසේ නොකරත්ද රාජප්‍රත්‍යනීකාදීහුත් මෙසේ කරත්ද, එහෙයින් ඒ භෙදය දක්වනසේක් **'රාජපවත්තිකා'**යනාදිය වදළසේක. එහි රජහුම පසම්තුරුවූවාහු **රාජපවත්තිකයහ**. ඒ රජහු තුමූම ගෙනඑන්නාහුද, අන්හුලවා ගෙන්වන්නාහුද ගෙනඑත්මැය යි දතයුතුය. සොරහුම පසම්තුරුවූවාහු **චොරපවත්තිකයහ**. ධූතීයෝනම් මෙවුන්දම් ඇසුරුකළ කෙළිසෙල්ලම්හි යෙදීගත් නුවර වසන කෙරාටික පුරුෂයෝය. ස්ත්‍රීධූතී - සුරාධූතීආදීහු හෝවෙත්. ධූතීයෝම පසම්තුරුවූවාහු **ධූත්තපවත්තිකයහ**. ගන්ධ යි හෘදය කියනුලැබේ. ඒ හෘදය උපුටන්නුයි උප්පලගන්ධයහ. උප්පලගන්ධයෝම පසම්තුරුවූවාහු **උප්පලගන්ධපවත්තිකයහ**. මොවුනුවනාහි සීසැම්, වෙළඳම්ආදියෙන් ජීවත්වන්නාහු නොවෙත්. මංපැහැරීම් ගම්පැහැරීම් ආදිය කොට අඹුදරුවන් පොෂණය කරත්. තමන්ගේ කම්සිඳුටිය පතන ඔවුහු දෙවියන් යැද ඔවුනට බිලියම්පිණිස මිනිසුන්ගේ හදමස් උපුටාගනිත්. ඒ

පිණිස ඔවුනට හැමද මිනිස්සු ලබනු නොහැක්කාහුය. වනයෙහි වසන භික්ෂූහු සුලභවෙත්. එහෙයින් ඔවුහු 'සිල්වත් මහණුන් අල්ලාගෙන සිල්වතෙකු මැරීම බරපතල පාපයකැ'යි සිතන්නාහු ඒ මහණුහුගේ ශීලවිනාශයපිණිස මනුෂ්‍යස්ත්‍රී ආදීන් අල්ලාගෙන එත්. මහණහු හෝ ස්ත්‍රීන්වෙත පමුණුවත්. එහි මේ විශෙෂය වේ. සෙස්ස කියූනයින්ම දතයුතුය. භික්ෂුප්‍රත්‍යනීකවාරයෙහි කියූපරිදිම මේ සිවුවාරයන්හිද චතුෂ්කයෝ දතයුත්තාහ. පෙළෙහිවනාහි සැකෙවින් කියනලදහ.

සඨාකාරයෙන් චතුෂ්කභෙදකථාව නිමි.

—\\—

දැන් **'මනුසසිත්‍ථියා තයො මග්ගෙ මෙථුනං ධම්මං පතිසෙවෙය්‍යාසස'** යනාදීවූ යමක් වදරනලද්දේද, එහි නොමුළාබවපිණිස **'මග්ගෙන මග්ගං'**යනාදිය වදළසේක. එහි **'මග්ගෙන මග්ගං'** ස්ත්‍රියගේ තුන්මගඅතුරෙහි එක්තරා මගකින් තමාගේ අඞ්ගජාතය ප්‍රවෙශකරයි. තවද මලමග පසමගයන දෙමග භගන්දරාදි රොගයකින් බිඳීගියකල්හි ඒ දෙමගඅතුරෙහි පසමගින් වසමගට, වසමගින් හෝ පසමගට ප්‍රවෙශකරයි. **'මග්ගෙන අමග්ගං'** පසමග ඇ මගකින් ප්‍රවෙශකොට එයට සමීපවූ වණයෙන් බැහැරට ඇදගනියි. **'අමග්ගෙන මග්ගං'** මගට ලංව සිටි වණයෙන් ප්‍රවෙශකොට, මගින් බැහැරට ඇදගනියි. **'අමග්ගෙන අමග්ගං'** දෙමග බිඳීගියකල්හි එක් වණයකින් ප්‍රවෙශකොට දෙවන වණයෙන් බැහැරට ඇදගනියි. මේ සූත්‍රයට අනුලොම්වසයෙන් සියලුතන්හි ව්‍රණසඞ්ඛෙපයෙහි ථුල්ලවචයවේය යි දතයුතුය.

දැන් ඉදිරියෙහි **'ආනාපත්ති අජානන්තස්ස අසාදියන්තස්ස'**යි යමක් වදරණසේක්ද, එහි නොමුළාබවපිණිස **'භික්ඛු සුත්තභික්ඛුම්හි'**යනාදිය වදළසේක. මේ එහි අදහසය: යම් මහණෙක් නින්දෙන් නැගීසිටියේ එය ඉවසාද, හෙතෙමේ 'මා නිදිගත්කල්හි මෙතෙමේ විපිළිපන්නේය. මම නොදනිමි'යි ඇවැතින් නොමිදෙන්නේය. **'උභො නාසෙතබ්බා'**යන මෙහි දෙදෙනම ලිඞ්ගනාශනයෙන් නැසියයුතුය. එහි දූෂකයාගේ ප්‍රතිඥාකරණයක් හෙවත් ඔහු විචාරා ප්‍රතිඥාගෙන නැසීමක් නැත්තේය. දූෂිතදයි අසා දූෂිතමහණහු විචාරා ප්‍රතිඥාගෙන ලිඞ්ගනාශනයෙන් නැසියයුතුය. ඉදින් නොඉවසානමි නොනැසිය යුතුය. හෙරණහුගේ වාරයෙහිද මේ ක්‍රමයවේ.

මෙසේ ඒ ඒ තන්හි ඒ ඒ ආපත්තියද අනාපත්තියද දක්වා දැන් අනාපත්තියම දක්වන්සේක් **'අනාපත්ති අජානන්තස්ස'**යනාදිය වදළසේක. එහි අජානන්තනම් යමෙක් මහා නින්දට පැමිණියේ **විඝාලාමභාවන**යෙහි

දිවාවිහරණයට ගිය මහණහුමෙන්' පරහුවිසින් කළ උපක්‍රමය නොදනීද, හෙතෙමේය. මෙබන්දහුට ඇවැත් නොවේ. **'නාහං භගවා ජානාමීති අනාපත්ති භික්ඛු අජානන්තස්ස'**යි මෙද වදරණලද්දේය. **අසාදියන්ත**නම් යම් මහණෙක් දැනද නොඉවසානම් ඒ මහණතෙමේය. එහිම වහා නැගීසිටි මහණහුමෙනි. **'නාහං භගවා සාදියන්ති අනාපත්ති භික්ඛු අසාදියන්තස්ස'**යි මෙද වදරණලද'දේය. **උනමත්තක** නම් පිත්තෝනමත්තකතෙමේය. බද්ධපිත්ත - අබද්ධපිත්ත යි පිත දෙවැදරුම්ය. එහි අබද්ධපිත්තය රුධිරයමෙන් මුළුසිරුර පැතිර සිටියේය. ඒ අබද්ධපිත්තය කිපීගියකල්හි සත්ත්වයන්ට කැසීම්, සිරුර වෙවුලීම් ආදි රෝගවේ. ඒ කැසීම් සිරුරවෙවුලීම් ආදිහු බෙහෙත්කිරීමෙන් සන්සිඳීයෙත්. බද්ධපිත්තයවනාහි පිත්තකොෂයෙහි පිහිටියේය. ඒ බද්ධපිත්තය කිපීගියකල්හි සත්ත්වයෝ උමතුවෙත්. පෙරළීගිය සන්ඇත්තාහු විළිබිය හැරපියා නොසරුප් හැසුරුම්හි හැසිරෙන්නාහ. ලහුක - ගරුක ශික්ෂාපද මඩින්නාහුද නොදනිත්. ඔවුහු බෙහෙත් කිරීමෙනුදු පිළියම් නොකොට හැකියෝවෙත්. මෙබඳු උමතුමහණහුට ඇවැත් නොවේ. **චිත්තචිත්ත**නම් හළසිත් ඇත්තේය. **යක්ෂෝනමත්තක** යි කියතුලැබේ. යක්ෂයෝවනාහි බිහිසුණු අරමුණු දක්වා මුවෙන් අත ඇතුල්කොට හෘදයරූපය හෝ මඩිමින් සත්ත්වයන් විසුරුණු සිත්ඇත්තවුන්, පෙරළුනු සන්ඇත්තවුන් කෙරෙත්. මෙබඳුවූ විසිරීගිය සිත්ඇති මහණහුට ඇවැත් නොවේ ඒ දෙදෙනාගේ මේ විශෙෂයවේ. පිත්තෝනමත්තකතෙමේ නිතැතින්ම උමතුව සිටුනේය. පියවිසන් නොලබන්නේය. යක්ෂෝනමත්තකතෙමේ අතරතුර පියවිසන් ලබන්නේය. මෙහිවනාහි පිත්තෝනමත්තක හෝ වේවා යක්ෂෝනමත්තක හෝ වේවා යමෙක් මුළුමනින් මුළා සිහිඇත්තේ කිසිත් නොදනීද, ගිනිද, රන්ද, අශ්වීද, සඳුන්ද එක් සමානකොට සලකා මඩිමින් හැසිරේද, මෙබඳු මහණහුට ඇවැත්නොවේ. අතරතුර සන් ලැබ දනකරන්නහු ඇවැත්මය. **වෙදනට්ට** නම් යම් මහණෙක් ඉතාදැඩි දුඃඛවෙදනාවෙන් ආතුරවූයේ කිසිත් නොදනීද, මෙබඳු මහණහුට ඇවැත්නොවේ. ආදිකම්මිකනම්. යම් මහණෙක් ඒ ඒ කර්මයෙහි ආදිවූයේද මුල්වූයේද හෙතෙමේය. මෙහිවනාහි **සුදින්න** ස්ථවිරතෙමේ ආදිකර්මිකවූයේය. ඔහුට ඇවැත් නොවේ. සෙසු මකීටී ශ්‍රමණ වජ්ජීපුත්‍රකාදීන්ට ඇවැත්වේමය.

පදභාජනීයවර්ණනාව නිමි.

——\\——

මේ ශික්ෂාපදයෙහි දක්ෂභාවයපිණිස මේ ප්‍රකීර්ණකය දතයුතුය:

‘සමුට්ඨානෂඪ කිරියා - අථො සඤ්ඤ සචිත්තකං
ලොකවජ්ජඤ්ච කම්මඤ්ච - කුසලං වෙදනාය ච’

උත්පත්තිකාරණයද ක්‍රියාද නැවත සංඥවද සචිත්තකයද ලොකවද්‍යයද කර්මයද වේදනාව හා කුශලයද යනමේය.

එහි **‘සමුට්ඨානං’**යනු සියලු ශික්ෂාපදයන්ගේ සඞ්ග්‍රහවශයෙන් සවැදෑරුම්වූ ශික්ෂාපද සමුත්ථානයයි. ඒ සමුත්ථාන පරිවාරයෙහි පහළවන්නේය. සඩෙක්ෂපවශයෙන්වනාහි ශික්ෂාපදයක් ඒටිසමුත්ථානයක් ඇත්තේය. චතුසසමුත්ථාන ශික්ෂාපදයක් ඇත්තේය. ත්‍රිසමුත්ථාන ශික්ෂාපදයක් ඇත්තේය. කඨිනසමුත්ථාන ශික්ෂාපදයක් ඇත්තේ ය. එළකලොමසමුත්ථාන ශික්ෂාපදයක් ඇත්තේය. ධුරනික්ෂෙපාදිසමුත්ථාන ශික්ෂාපදයක් ඇත්තේය.

සමුට්ඨාන වසයෙන් තෙළෙස්වැදරුම්වූ ශික්ෂාපදඅතුරෙහි කිසි ශික්ෂාපදයක් ආපත්තිව්‍යතික්‍රමකරන්නහුගේ කිරීමෙන් උපදී. කිසි ශික්ෂාපදයක් ඉටීම් ආදිය නොකරන්නහුගේ නොකිරීමෙන් උපදී. කිසි ශික්ෂාපදයක් කිරීමෙන් හා නොකිරීමෙන් උපදී. කිසි ශික්ෂාපදයක් කිසිකලෙක කිරීමෙන් හා කිසිකලෙක නොකිරීමෙන් උපදී. කිසි ශික්ෂාපදයක් කිසිකලක කිරීමෙන් කිසිකලක කිරීමෙන් හා නොකිරීමෙන් උපදී.

ඒ ක්‍රියා අක්‍රියාවශයෙන් පස්වැදරුම්වූ ශික්ෂාපදඅතුරෙහි ව්‍යතික්‍රමසංඥවගේ අභාවයෙන් ඇවැතින් මිදීම ඇති සචිත්තකසමුට්ඨානවූ සඤ්ඤවිමොක්ඛනම්වූ ශික්ෂාපදයක් ඇත්තේය. ව්‍යතික්‍රමසංඥවගේ අභාවයෙන් ඇවැතින් මිදීම නැති අචිත්තකසමුට්ඨානවූ නොසඤ්ඤවිමොක්ඛ නම්වූ ශික්ෂාපදයක් ඇත්තේය. එහි යම් ශික්ෂාපදයක් ආපත්තියට කරුණුවූ සංඥව හා යෙදිගත් චිත්තාඛ්‍යය ලබාමද ඒ ශික්ෂාපදය සඤ්ඤවිමොක්ඛනම්වේ. අන්‍යවූ ප්‍රඥප්තිවද්‍ය ශික්ෂාපදය නොසඤ්ඤවිමොක්ඛනම්වේ.

නැවත ප්‍රඥප්තිවිජානනචිත්තය හාද වත්‍යුව්‍යතික්‍රමචිත්තය හාද යම් ඇවැතකට පැමිණේද ඒ සචිත්තකය. ප්‍රඥප්තිවිජානනචිත්තයෙන් හා වත්‍යුව්‍යතික්‍රමචිත්තයෙන් තොරව යම් ඇවැතකට පැමිණේද ඒ අචිත්තකය. සචිත්තකසමුට්ඨානයෙන් යම් ඇවැතකට පැමිණේනම් ඒ සචිත්තකය. කිසිකලෙක අචිත්තකවූත් කිසිකලෙක සචිත්තකවූත් සමුට්ඨානයෙන් ඇවැතකට පැමිණේ නම් ඒ අචිත්තකය.

ඒ සියලු ශික්ෂාපද ලොකවද්‍ය ප්‍රඥප්තිවද්‍යයි දෙවැදරුම්වේ. ඒ ශික්ෂාපදයන්ගේ ලක්ෂණ මෛථුනශික්ෂාපදයෙහි අනුප්‍රඥප්තිකථාවෙහි කියනලද්දේමය.

කම්කුශල වෙදනා වශයෙන්ද මෙහි කායද්වාරයෙන් පැමිණිය යුතුවූ ශික්ෂාපදයක් ඇත්තේය. වාග්ද්වාරයෙන් පැමිණිය යුතුවූ ශික්ෂාපදයක් ඇත්තේය. එහි යම් ශික්ෂාපදයක් කායද්වාරයෙන් පැමිණියයුතුද ඒ ශික්ෂාපදය කායකර්මනම්. යම් ශික්ෂාපදයක් වාග්ද්වාරයෙන් පැමිණියයුතුද ඒ ශික්ෂාපදය වාක්කර්ම නමැයි දතයුතුය.

කුසල් සිතින් පැමිණියයුතුවූ ශික්ෂාපදයක් ඇත්තේය. අකුසල්සිතින් පැමිණිය යුතුවූ ශික්ෂාපදයක් ඇත්තේය. අව්‍යාකෘතචිත්තයෙන් පැමිණිය යුතුවූ ශික්ෂාපදයෙක් ඇත්තේය. අෂ්ටකාමාවචර කුශලචිත්ත, ද්වාදශඅකුශලචිත්ත, හසිතොත්පාද, ව්‍යවසථාපනචිත්ත හා අෂ්ටමහාක්‍රියාචිත්ත, කුශලක්‍රියාවිසින් අභිඥචිත්තයන මේ දෙතිස්චිත්ත ආපත්තිසමුට්ඨාපකචිත්තය. ඔවුනතුරෙහි යම් ඇවැතකට කුසල්සිතින් පැමිණේද ඒ කුශලය. යම් ඇවැතකට අන්‍යවූ අකුශල අව්‍යාකෘතචිත්තයෙන් පැමිණේද ඒ අන්‍යවූ අකුශල අව්‍යාකෘතය.

සුඛ, දුඃඛ, උපෙක්ඛායන වෙදනා තුනෙන් පැමිණියයුතුවූ ශික්ෂාපදයක් ඇත්තේය. සුඛ, දුඃඛයන දෙවැදරුම්වූ වේදනාවෙන් පැමිණිය යුතුවූ ශික්ෂාපදයක් ඇත්තේය. දුඃඛවේදනාවෙන් පැමිණියයුතුවූ ශික්ෂාපදයක් ඇත්තේය. එහි යම් ශික්ෂාපදයකට පැමිණෙනුයේ මෙකියූ ත්‍රිවිධවේදනාඅතුරෙහි එක්තරා වේදනාවකින්යුක්තව පැමිණේද, ඒ ශික්ෂාපදය ත්‍රිවේදනනම. යම් ශික්ෂාපදයකට පැමිණෙනුයේ සුඛසමඩඟීව හෝ උපෙක්ෂාසමඩඟීව හෝ පැමිණේද, ඒ ශික්ෂාපදය ද්විවේදනනම. යම් ශික්ෂාපදයකට පැමිණෙනුයේ දුඃඛවේදනා සමඩඟීවම පැමිණේද, ඒ ශික්ෂාපදය එකවේදනනමැයි දතයුතු ය. මෙසේ:-

'සමුට්ඨානඤ්ච -පෙ- වේදනාය ච'යි ආ මේ මිශ්‍රකනය දන ඒ සමුට්ඨානයන්අතුරෙහි මේ ශික්ෂාපදය සමුට්ඨානවිසින් එකසමුට්ඨානවේ. අඩඟවිසින් දුකසමුට්ඨානවේ. කාය - චිත්ත දෙකින් උපදී. ක්‍රියසමුට්ඨානදවේ. කරන්නේම මේ ප්‍රථමපාරාජිකාපත්තියට පැමිණේ. බොහෝසෙයින් වන සැටියෙන් මේ කියනලද්දේය. පරොපක්‍රමය ඇතිකල්හි එය ඉවසන මහණහුට අක්‍රියසමුට්ඨානයෙන්වන හෙයිනි. මෛථුනප්‍රතිසංයුක්ත කාමසංඥාවගේ අභාවයෙන් මිදෙනබැවින් සංඥාවිමොක්ෂානම. 'නොදන්නහුට නොඉවසන්නහුට අනාපත්තිමැ'යි වදරණලද්දේය. මෛථුනචිත්තයෙන්ම එයට පැමිණේ. සිතින්වෙන්ව නොපැමිණේයයි සචිත්තකනම. රාගවසයෙන්ම පැමිණියයුතුබැවින් ලොකවජ්‍ය. කායද්වාරයෙන්ම හටගන්නාබැවින් කායකර්ම්ය. මෙහිදී සිතවනාහි අඩඟමාත්‍රයක්මවේ, ඒ චිත්තයෙහි වසයෙන් කර්මභාවය

නොලැබේ. විඳපත්තිජනක වශයෙන් කායද්වාරයෙහි පැවැති බැවින් ඒ චිත්තයාගේ වසයෙන් මේ ශික්ෂාපදයට කම් භාවය නොලැබේයනු අර්ථයි. ලොභචිත්තයෙන් පැමිණියයුතුබැවින් අකුශලචිත්තයි. සුඛසමඩඟීව හෝ උපෙක්ෂාසමඩඟීව හෝ එයට පැමිණේත්‍යයි දවිවේදනායි දතයුතුය. මේ සියල්ලම ආපත්තියෙහි යෙදෙන්නේය. ශික්ෂාපදශීෂීයෙන්වනාහි සියලු අර්ථකථාවන්හි දෙශනා තොමෝ නැගුනීය. එහෙයින් මෙසේ කියනලදය.

'මක්කටී වජ්ජිපුත්තා ච -පෙ- බුඩ්ඨපඛඛජිතෝ මිගෝ'යනු මේ කිම? විනීතවස්තූන් පිළිබඳ මේ ගාථාවනාහි භාග්‍යවතුන්වහන්සේවිසින්, තමන්වහන්සේවිසින් **'ආපත්තිං ත්වං භික්ඛු ආපන්නෝ පාරාජිකං, අනාපත්ති භික්ඛු පාරාජිකස්ස'** යනාදිවසයෙන් විනිශ්චය කරණලද ඒ ඒ වස්තූන්ගේ උද්දනගාථානම්ය. සඩග්‍රහගාථාය. ඒ වස්තූහු විනයධරයෝ සුවසේ උගන්නාහයි ධම්සඩග්‍රාහක මහාසථවිරයන්වහන්සේවිසින් තබනලදහ. නිදනවස්තුප්‍රකාශකවූ විනීතවස්තුගාථා භාග්‍යවතුන්වහන්සේ ධරමානකාලයෙහිම උපාලි මහාසථවිරයන්වහන්සේවිසින් 'මේ ලක්ෂණය කරුණුකොට මත්තෙහි විනයධරයෝ විනය විනිශ්චයකරන්නාහ'යි තබනලදහ. එහෙයින් මෙහි කියූලක්ෂණ මැනවින් සලකා මැනැවින් උගෙන ප්‍රථමශික්ෂාපදය විනිශ්චය කටයුතුය. දවිතීය පාරාජිකාදීන්ගේද විනීතවස්තූන්හි කියූලක්ෂණයෙන් දවිතීයාදී විනීතවස්තූහු විනිශ්චය කළයුත්තාහ. විනීතවස්තූහුවනාහි චිත්‍රකාරාදිශිල්පීන්ගේ ආදර්ශරූපමෙන් විනයධරයන්ට ආදර්ශරූපවෙත්.

එහි ප්‍රථම මකීටී - වජ්ජීපුත්‍රක වස්තුදෙක අනුප්‍රඥප්තියෙහිම කියනලද අර්ථ ඇත්තේය. තෘතීය වස්තුවෙහි **'ගිහිලිඩෙඝන'** ගිහිවෙසින් හැදි සුදුවත් ඇත්තේවේ. චතුර්ථ වස්තුවෙහි කියයුතු කිසිවක් නැත්තේය. එයින් මතුවෙහි එන වස්තුසතෙහි **'කුසචීරං'** කුසතණගොතා කළවැහැරිය. **වාකචීර**නම් තවුසන්ගේ හැඳීමට පෙරවීමටගන්නා රුක්පතුරුගොතා කළවැහැරිය. **ඵලකචීර** නම් පුවරු සටහන් ඇතිව පුවරු එක්කොට බැඳ මසා කළවැහැරිය. **'කෙසකම්බලෝ'** මිනිස්කෙසින් හූ සකස්කොට වියා එයින් කළවැහැරිය. **'වාලකම්බලෝ'** සෙමරවලින් වියා කරනලදවැහැරිය. **'උලූකපක්ෂං'** බකමුහුණන්ගේ පියාපතින්කළ නිවාසනය. **'අජිනක්ඛිපං'** ලොම් සහිතවූ බුර සහිතවූ අජිනමුවසමය. දෙළොස්වන වස්තුවෙහි **'සාරත්තෝ'** කායසංසර්ගරාගයෙන් තදින් ඇලීගියේය. භාග්‍යවතුන්වහන්සේ ඒ රාගය දැන **'ආපත්ති සඩඝාදිසෙසස්ස'**යනු වදළසේක. තෙළෙස්වන වස්තුවෙහි **'උපපලවණ්ණා'** ඒ සථවිරාතොමෝ සැවැත්නුවර සිටුදුවක. කලපලක්ෂයක් මුළුල්ලෙහි කළ අභිනීහාරසම්පත්තියෙන් යුක්තවූය. ඇයගේ සිරුරුසිවිය ප්‍රකෘතියෙන්ම

ඉතා දකුම්කලුය. නිලුපුල් පැහැ ඇත්තීය. ඇතුළත කෙලෙස්තැවුලි නොවූබැවින් ඉතා තදින් බැබලුනීය. ඕතොමෝ ඒ වණ්ණසෞන්දර්‍යයී හෙතුකොටම 'උත්පලවණ්ණා'යන නම ලැබුය. **'පටිබද්ධචිත්තෝ'** ගිහිකලපටත් ඇලුනු සිත් ඇත්තේය. හෙතෙමේවනාහි සථවිරාවන්ගේ නෑදරුවෙක්වේ. **'අථ ඛෝ'**යනු අනන්තරාර්‍ථයෙහි නිපාතයකි. ඇදෙහි වැතිර ගැනීමට අනතුරුවමැයි කියනලද්දේය. දහවල බැහැරින් අවුත් දෙර වසාගෙන හුන්නවුන්ට පළමුකොට ඇස්ඇදිරියවේ. හෙතෙමේ මැයගේ ඒ ඇස්ඇදිරිය නොනැසේද එකෙණෙහිම මෙසේ කෙළේය යනඅර්‍ථයි. **'දූසෙසි'** බලාත්කාරයෙන් අල්ලාගෙන නැසුයේය. සථවිරාතොමෝවනාහි වරද රහිතය. තමන්ගේ ශ්‍රමණසංඥව එළවා නොඉවසන්නී අසද්ධම්මාදධ්‍යාසයෙන් පහස්නාලද්දී ගිනිකඳක් ගල්ටැඹක් කිහිරිහරකණුවක්මෙන් හුන්නීය. හෙතෙමේද තමන්ගේ මනදෙළ පුරවා ගෙන ගියේය. සථවිරාවන්ගේ ඇස්හමුව ඔහු හරිත්ම මහමෙර උසුලා සිටින්නට සමර්‍ථවූ මේ මහා පොළාව බඹයක්පමණ සිරුරුඇති ඒ පාපිපුරුෂයා උසුලා දරාගන්නට නොහැකියකුමෙන් දෙකඩව බිඳී ඔහුට විවර දුන්නේය. හෙතෙමේ එකෙණෙහිම අවීචිමහානරකයෙහි ගිනිදැල්වල දරබවට ගියේය. භාග්‍යවතුන්වහන්සේ මේ පුවත අසා **'අතාපත්ති භික්ඛවේ අසාදියන්තියා'**යනු වදරා සථවිරාවන් ලක්කොට ධම්මපදයෙහිඃ

'වාරිපොක්ඛරපත්තෙව - ආරග්ගෙරිව සාසපෝ,
යෝ න ලිම්පති කාමෙසු - තමහං බ්‍රූමි බ්‍රාහ්මණං'

යනමේ ගාථාව වදළසේක.

තුදුස්වන වස්තුවෙහි **'ඉත්ථිලිඞ්ගං පාතුභූතං'**යනු රෑ නින්දට වැටුනහුයේ යටඋඩරැවුල් ආදීවූ සියලු පුරුෂසටහන් අතුරුදහන්වූයේය. ස්ත්‍රීසටහන් උපන්නේය. **'තස්සෙවං උපජ්ඣං තමේව උපසම්පදං'**යනු පෙරගත් උපාධ්‍යායයාම පෙරකළ උපසම්පදවම අනුදනිමි. නැවැත උපාධ්‍යායයෙක් නොගතයුතුය. උපසම්පදතොමෝ නොකටයුත්තීයයන අර්‍ථයි. **'තානි වස්සානි'**යනු භික්ෂුඋපසම්පදවෙහිපටත් යම් වස් ගිනීමක්වේද, ඒ වස් ගිනීමම අනුදනිමි. මෙතැන්සිට වස්ගිනීම නොකටයුතුය යනඅර්‍ථයි. **'භික්ඛුනීහි සඞ්ඝමිතුං'**යනු මැයට භික්ෂුණීන්සමග එක්වන්නට අනුදනිමි යනඅර්‍ථයි. 'දන් මැයට භික්ෂූන් මැද විසීම නොසුදුසුය, මෙහෙණවරටගොස් භික්ෂුණීන්සමග වෙසේවා'යි වදරණලද්දේවේ. **'යා ආපත්තියෝ භික්ඛූනං භික්ඛුනීහි සාධාරණා'** භික්ෂූන්ගේ දෙසනාගාමිනීවූ හෝ වුට්ඨානගාමිනීවූ හෝ යම් ආපත්තීහු භික්ෂුණීන්සමග සාධාරණ වෙත්ද **'තා ආපත්තියෝ භික්ඛුනීනං සන්තිකෙ වුට්ඨාතුං'**යනු ඒ සියළුම ආපත්ති භික්ෂුණීන්විසින්

කටයුතුවූ විනයකර්මයකොට හික්ෂූණීන්ගේ හමුවෙහිදී නැගීසිටින්නට අනුදනිමි යනඅර්ථයි. **'තාහි ආපත්තීහි අනාපත්ති'** හික්ෂූණීන් හා අසාධාරණවූ හික්ෂූන්ගේ යම් සුක්කවිසට්ඨි ආදීවූ ආපත්තීවේද ඒ ආපත්තීන්ගෙන් අනාපත්තිවේ. ලිඞ්ගපරිවර්තනය හාම ඒ ආපත්තී නැගීසිටියාහුමවෙත්. නැවත ප්‍රකෘතිලිඞ්ගය උපන්කල්හිද ඒ ආපත්තීන්ගෙන් ඔහුට අනාපත්තිමය. මේවනාහි මෙහි පාලිවිනිශ්චයවේ.

මේවනාහි පෙළින් මිදුනු ආචාර්‍යවාදයෙහි බැසගත් පැමිණියයුතු අනුකූලගුණයට වැදසිටි විනිශ්චයවේ: මේ දෙවැදරුම් ලිඞ්ගයන්අතුරෙහි පුරුෂලිඞ්ගය උතුම්වේ. ස්ත්‍රීලිඞ්ගය ලාමකවේ. එහෙයින් පුරුෂලිඞ්ගය පරදරකර්මාදීවූ බලවත් අකුශලය හෙතුකොට අතුරුදහන්වේ. ස්ත්‍රීලිඞ්ගය දුර්ලකුශලය හෙතුකොට පිහිටන්නේය. ස්ත්‍රීලිඞ්ගය අතුරුදහන්වනුයේ දුර්ලඅකුශලය හෙතුකොට අතුරුදහන්වේ. පුරුෂලිඞ්ගය බ්‍රහ්මචර්‍යාවාසාදීවූ බලවත්කුශලය හෙතුකොට පිහිටාගන්නේය. මෙසේ ද්විවිධවූ ලිඞ්ගයම අකුසල් හෙතුකොට අතුරුදහන්වේ. කුසල් හෙතුකොට පිළිලබයි. එහි ඉදින් එක්ව සජ්ඣායනය හෝ ධර්‍මසාකච්ඡා හෝ කොට එක්ගෙයක වැදහෙව නින්දට වැටුනු හික්ෂූන්දෙනමඅතුරෙහි එකක්හට ස්ත්‍රීලිඞ්ගය පහළවේද, දෙදෙනාහටම සහසෙය්‍යාපත්තියවේ. ඉදින් හෙතෙමේ නින්දෙන් නැගිට තමන්ට සිදුවූ ඒ විප්‍රකාරය දැක දුක් ඇත්තේ, නොසතුටු සිත් ඇත්තේ රාත්‍රිකාලයෙහිම අන් මහණහුහට සැලකරන්නේනම් ඔහුවිසින් අස්වැසියයුතුය: ඒවා නොසිතුව මැනව, මෙය සංසාරයෙහිම දෙෂයෙක, සම්මාසම්බුදුරජුන්විසින් දොර දෙනලදී. මහණෙක් හෝ මෙහෙණක් වේවා පර්‍යාපන්නි, ප්‍රතිපත්නි, ප්‍රතිවේධ සඩ්ඛ්‍යාතධර්‍මය ඔවුනට නොඅවුරණුලද්දේය, සඞ්ගීතාගීය නොවළකනලද්දේයයි ඔහු අස්වසාද මෙසේ කියයුතුය: 'තා මෙහෙණවරට යායුතුය, තට දුටුම්තුරු කිසියම් මෙහෙණහු ඇත්තාහුද'යි විචාළයුතුය. ඉදින් මැයට මෙබඳු මෙහෙණෝ වෙත්නම් ඇතැයිද, නොවෙත්නම් නැතැයිද කියා 'මට සඞ්ග්‍රහකරණුමැනව, දැන්ම මා මෙහෙණවරට පමුණුවාලනු මැනව'යි ඒ මහණහුට කියයුතුය. ඒ මහණහුවිසින් ඒ මෙහෙණ ගෙන මෙහෙණගේ දුටුම්තුරුවූ හෝ තමන්ගේ දුටුම්තුරුවූ හෝ මෙහෙණන් වෙතට යායුතුය. යන්නහුවිසිනුදු එකලාව නොයායුතුය. සතරපස්නමක් මහණුන් සමග එළියක්ද සැරයටියක්ද ගෙන සංවිදහනය මුද 'අපි අසුවල්තැනට යමිහ'යි මෙහෙණ සමග කථාකොට යායුතුය. ඉදින් තමන් වසන ගමින් පිටත දුරගමෙහි මෙහෙණවර වේනම්, අතරමගදී ගාමන්තර, නදීපාර, රත්‍රිවිප්පවාසා, ගණඔහීයන ආපත්තීන්ගෙන් අනාපත්තිවේ. මෙහෙණවරට ගොස් 'අසුවල් මහණගැන දනීහුද'යි ඒ මෙහෙණන්අතින් විචාළයුතුය. 'ආය්‍යන්වහන්ස! එසේය'යි මෙහෙණන් කීකල්හි 'ඒ මහණහුට

ස්ත්‍රීලිඞ්ගය පහළවූයේය, එහෙයින් දැන් මේ මෙහෙණට සඞ්ග්‍රහකරවු'යි කියයුතුය. ඒ මෙහෙණෝ 'ආය්‍යෙනවහන්ස! මැනවි, දැන් අපිදු හදරන්නෙමු, දහම් අසන්නෙමු, ඔබවහන්සේලා වඩිනුමැනව'යි කියා සඞ්ග්‍රහ කෙරෙත්ද, සිත් සතුටුකිරීමෙහි සමර්ථවූවාහු සඞ්ග්‍රහ කරන්නාහු ලජ්ජා ඇත්තාහුවෙත්ද, ඒ මෙහෙණන් කුපිතකොට අත්තැනක නොයායුතුය. ඉදින් යේනම්, ගාමන්තර - නදීපාර - රත්තිවිප්පවාස - ගණඔහීයන ආපත්තීන්ගෙන් නොමිදෙන්නේය. ඉදින් ඒ මෙහෙණෝ ලජ්ජා ඇතියාහුනමුත් සඞ්ග්‍රහ නොකරන්නාහුනම් එකල්හි අන්තැනකටයන්නට ඉඩලැබේ. ඉදින් ඒ මෙහෙණෝ ලජ්ජා නැතියාහු නමුත් සඞ්ග්‍රහ කරන්නාහුවෙත්ද ඒ මෙහෙණන්ද හැරපියා අන්තැනක යන්නට ඉඩලැබේ. ලජ්ජා ඇතියාහු සඞ්ග්‍රහ කරන්නාහුද ඒ මෙහෙණෝ ඳුතීහු නොවෙත්ද අසලගමක පොෂණයකරන්නට හැකි අන් නැමෙහෙණෝ වෙත්නම් ඒ මෙහෙණන් සමීපයට යෑමෙහි වරද නැතැයි කියත්. ගොස් භික්‍ෂුකාලයෙහි නිශ්‍රයයෙන් යුක්තවූයේනම්, සුදුසු මෙහෙණක සමීපයෙහි නිශ්‍රය ගතයුතුය. මාතෘකාව හෝ විනය හෝ උගන්නාලද්දේනම් මැනවින් උගන්නාලද්දේවේ. නැවත උගෙණිමෙහි කරුණක් නැත්තේය. ඉදින් භික්‍ෂුකාලයෙහිද උපාද්‍යායයෙක්ව ආචාය්‍යයෙක්ව පිරිස් උවැටන් කරන්නෙක්වූයේද ඔහුගේ සමීපයෙහි යම්කෙනෙක් උපසපන්වූවාහුද, ඔවුහු සූපසම්පන්නයහ. අන් මහණක්හුවෙත නිසගතයුතුය. පෙර ඔහුනිසා විසුවන්විසින්ද අන් මහණක්හුවෙත ගතයුතුය. පිරිපුන් වස්ඇති හෙරණහුවිසින්ද අන් මහණහුවෙත උපාද්‍යායග්‍රහණය කළයුතුය. භික්‍ෂුභාවයෙහි සිටිකාලයෙහි මොහුවිසින් ඉටු යම් තුන්සිවුර හා පාත්‍රයද ඒ ඉටීම හැරලන්නේය. නැවත ඉටියයුතුය. තනවෙළුමද දියසළුවද ගතයුතුය. යම් අතිරෙක චීවරයක් හෝ අතිරෙක පාත්‍රයක් හෝ විනයකම්කොට තබනලද්ද එද සියලු විනයකම් අත්හැරසිටියි. නැවත විනයකම් කටයුතුය. කලින් පිළිගෙණතුබු තෙල්, මී, සකුරු ආදීහුද ඒ පිළිගැනීම හැරලති. ඉදින් පිළිගැණීමෙන් සත්වනදිනයෙහි ලිඞ්ගපරිවර්තීනයවේද, නැවත පිළිගෙණ සත්දවසක් වටියි. භික්‍ෂුකාලයෙහි අන් මහණහු අයත් යමක් පිළිගන්නා ලද්දේද, ඒ පිළිගැණීම නොහරියි. දෙදෙනාහට සාධාරණවූ යමක් නොබෙද තබනලද්දේද, ලිඞ්ගපරිවර්තීනයනොවූ මහණතෙමේ එය රකියි. යමක් බෙදනලද්දේද, ලිඞ්ගපරිවර්තීනය වූවහුටම අයත්වේද, එය පිළිගැනීම හැරසිටියි. පරිවාරයෙහි මෙය කියනලද්දේමය.

'තෙලං මධුං ඵාණිතං වාපි සපිං
සාමං ගහෙත්වාන නික්කිපෙය්‍ය,
අවීතිවත්තෙ සත්තාහෙ
සති පච්චයෙ පරිභුඤ්ජන්තස්ස ආපත්ති,
පඤ්චාමෙසා කුසලෙහි විනීතා'යි

තෙල් හෝ මී හෝ නැවත සකුරු හෝ තමන් පිළිගෙන තබන්නේද, සත්දවස නොඉක්මුත්තකල්හි ප්‍රත්‍යයයක් ඇතිකල්හි පරිභොගකරන්නහුට ඇවැත්වේ. මේ ප්‍රශ්නය දක්ෂයන්විසින් සිතනලදය.

මේ වනාහි ලිඛිතපරිවර්තනය සඳහා වදරණලද්දේය. පිළිගැනීමනම් ලිඛිතපරිවර්තනයෙන් කාලක්‍රියාවෙන් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයෙන් ගිහිබවට පෙරැළීමෙන් අනුපසම්පන්නයක්හට දීමෙන් බලාපොරොත්තුරහිතව අත්හැරීමෙන් සොරසතුරු ආදීන්විසින් අසිඳගැනීමෙන් හැරයිටියි. එහෙයින් ඉදිනුදු පිළිගෙන තබනලද අරඵකඩතුත් ඇත්තේද, මොහුගේ සියලු පිළිගැනීම් හරින්නේය. භික්ෂූන් වසන වෙහෙරකදී ලිහුපෙරැළියෙන් මෙහෙණකවු මැයසතුවූ පිළිගෙණ හෝ නොපිළිගෙන තබනලද යමක්වේද, ඒ සියල්ලට ඕතොමෝම ඊශ්වරවේ. ගෙන්වාගතයුතුය. මෙහි ඇය සතුවූ යම් සථාවර සෙනසුනක් හෝ රොපනයකළ ගස්වැල් හෝවේද, ඒ සෙනසුන් ගස්වැල් යමක්හට දෙනුකැමැතිවේද, ඔහුට දියයුතුය. තෙලෙස් සම්මුතිඅතුරෙහි යම් සම්මුතියක් භික්ෂුකාලයෙහි ලදද, ඒ සියලු සම්මුති සන්සිඳීයෙයි. පෙරවසෙහි සෙනසුන් ගැන්මෙක්වේද, එද සන්සිඳෙන්නේය. ඉදින් පසුවසෙහි සෙනසුන් ගත්කල්හි ලිහු පෙරැළීමවේද, භික්ෂුණී සඞ්ඝතෙමේත් උපන්ලාභය ඇයට දෙනු කැමැත්තේවේද, අපලොකනයකොට දියයුතුය. ඉදින් භික්ෂුණීන් හා සාධාරණවූ පිළිසන් ඇවැතපිණිස පිරිවෙස් සමාදන්ව වසන්නහුගේ ලිඛිතපරිවර්තනයවේද, පක්ඛමානත්තයම දියයුතුය. මානතෙහි හැසිරෙන්නහුගේ ලිඛිත පරිවර්තනනයවේද, නැවත පක්ඛමානත්තයම දියයුතුය. ඉදින් පිරූ මානත ඇත්තහුගේ ලිඛිත පරිවර්තනයවේද, භික්ෂුණීන්විසින් අබ්භානකර්ම කටයුතුය. ඉදින් අකුශලකර්ම ගෙවීගියකල්හි පක්ඛමානත්තයෙහි හැසිරෙණකල්හි නැවත ලිඛිත පරිවර්තනයවේද, ඡාරත්තමානත්තයම දියයුතුය. පිරූ පක්ඛමානත්තය ඇතිකල්හි ලිඛිත පරිවර්තනයවේද, භික්ෂූන්විසින් අබ්භානකර්ම කටයුතුය.

අනතුරු **'භික්ඛුනියා ලිඛිතපරිවත්තන'** වස්තුවෙහි මෙහි කියූනයින්ම සියලු විනිශ්චය දතයුතුය. මේ වනාහි විශෙෂයි: ඉදින් භික්ෂුණීකාලයෙහි පැමිණි සඤ්චරිත්තාපත්ති ප්‍රතිවිජත්තාවූවාවේද, භික්ෂුකාලයෙහි ප්‍රතිවිජත්ත නොවූබැවින් එහි පිරිවෙස්දීමෙක් නැත්තේය. ඡාරත්තමානත්තයම දියයුතුය ඉදින් පක්ඛමානත්තයෙහි හැසිරෙන්නියගේ ලිඛිත පරිවර්තනයවේද, එයින් අතීයක්නොවේ. ඡාරත්තමානත්තයම දියයුතුය. ඉදින් පිරූමානත්තය ඇත්තියගේ ලිඛිත පරිවර්තනයවේද, නැවත මානත්තය නොදී භික්ෂූන්විසින් අබ්භානකර්මවශයෙන් කැඳවියයුතුය. නැවත භික්ෂූන්විසින් මානත්තය නොදුන්කල්හි නැවත ලිඛිත පරිවර්තනයවේද, භික්ෂුණීන්විසින් පක්ඛමානත්තයම දියයුතුය. ඡාරත්තමානත්තයෙහි හැසිරෙන්නහුගේ නැවත

ලිඬගය පරිවර්තනයවේද, පකතිමානත්තයම දියයුතුය. පිරූ මානත්තය ඇත්තහුගේ ලිඬගය පරිවර්තනයවූකල්හි භික්ෂුණීන්විසින් අබ්භානකර්මය කටයුතුය. ලිඬගය නැවත පරිවර්තනයවූකල්හි භික්ෂුණීභාවයෙහි සිටි භික්ෂුණියගේ යම් අසාධාරණ ආපත්තීහු පෙර භික්ෂුකාලයෙහි සන්සිඳුනාහුද, ඒ ආපත්තීහු මැනවින් සන්සිඳුනාහුමවෙති.

මෙයින් මතුවෙහි **'මාතුයා මෙථුනං ධම්මං'** යනාදීවූ සතරවස්තූහු ප්‍රකටඅර්ථ ඇත්තාහුමය. **'මුදුපිට්ඨික'** වස්තුවෙහි ඒ මහණතෙමේ පෙර නළුවෙක්වූයේය. ශිල්ප දැක්වීමෙහි දක්ෂභාවයපිණිස ඔහුගේ පිට පිරියම්කරණලදීදී මොළොක්වූය. එහෙයින් තමන්ගේ පිට නමා තමන්ගේ නිමිත්තමුඛයෙන් ගන්නට හැකිවූයේය. **'ලම්බී'** වස්තුවෙහි ඒ මහණහුගේ අඬගජාතය දිග්වූයේ එල්බෙන්නේය. එහෙයින් **ලම්බී**යි කියනලද්දේය. තමන්ගේ අඬගජාතය තමන්ගේ මලමාර්ගයෙහි ඇතුල්කරන්නට හැකිවූයේය. මෙයින් මතුවෙහි ඛිවිධවූ **වණ** වස්තුහු ප්‍රකටමවෙත්. **ලෙපචිත්ත** වස්තුවෙහි සිතියම් කරනලද රූපය **ලෙපචිත්ත**නමිවේ. **දාරුඨිතලික** වස්තුවෙහි **දාරුඨිතලිකා**නම් දැවයෙන් කළරූපයයි. මේ වස්තුදෙකෙහි යම්සේද, අන්‍යවූ දන්තරූප, පොත්ථකරූප, ලොහරූපආදීවූ ජීවිතෙන්ද්‍රිය රහිත ස්ත්‍රීරූපයන්හි **නිමිත්තෙහි** මෛථුනරාගයෙන් උපක්‍රම කරන්නහුට අශුචි මිදේවා හෝ නොමිදේවා හෝ දුක්කටයමවේ. කායසංසර්ගරාගයෙන් උපක්‍රම කරන්නහුටද එසේම දුක්කටයවේ. මොචනරාගයෙන් උපක්‍රම කරන්නහුට අශුචි මිදුනුකල්හි සඬ්ඝාදිසෙසයවේ. අශුචි නොමිදුනුකල්හි ථුල්ලච්චයවේ.

සුන්දර වස්තුවෙහි මේ **සුන්දර**තෙමේවනාහි රජගහනුවර කුලදරුවෙක් වේ. සැඳහැයෙන් පැවිදිවූයේය. ආත්මභාවය අභිරූපබැවින් සුන්දරයි නම් ලැබුයේය. විථියෙහි යන ඒ තෙරුන් දක තදින් උපන් ඡන්දරාගයඇති ඒ **ස්ත්‍රී**නොමෝ මේ විප්‍රකාරය කළාය. සථවිරතෙමේවනාහි අනාගාමීය. එහෙයින් උන්වහන්සේ එය නොඉවසූහ. අන්හට මෙබඳුතන්හි මේ ඉවසීම නොකටහැකිබැවින් අවිෂයවේ. මෙයින් මතුවෙහි සතරවස්තුවෙහි දැක්වෙන ඒ මහණෙහි ජඩයහ. නුවණ නැත්තාහ. 'මම උත්සාහ කරමි, ඔබ උත්සාහ නොකරවු'යි මාගම කියූ බස් පිළිගෙණ දෙදෙනාගේම උත්සාහයෙන් එසේකොට පසුව කුකුස්කළහ. **'අඞ්ගායිතා'**දීවූ වස්තුතුන ප්‍රකටඅර්ථ ඇත්තේමය.

ජීතසීස වස්තුදෙකෙහි මේ විනිශ්චයවේ: විවෘතකළ මුඛයෙහි අඬගජාතය ප්‍රවේශකරනුයේ ඉදින් යට හෝ මතුවෙහි හෝ දෙපසෙහි හෝ ගටමින් පහසමින් ඇතුල්කෙරේද පාරාජිකවේ. සතරපැත්තෙහි නොගටමින් නොපහසමින් ඇතුල්කොට ඇතුලතතල්ල ගටාද පාරාජිකමවේ සතරපැත්තත් තල්ලත් නොපහසමින් ආකාශගතකොටම ඇතුල්කෙරේද,

පිටතට ඇදගනීද දුක්කටය වේ. ඉදින් උඩයටි දත් මැනවින් එකටහැපී සිටියාහුද, දත් එකටහැපී සිටුනාබැවින් මුවතුළ අවකාශ නැත්තේද, දත් පිටත තොල්මසින් වැසුනේද එහි ප්‍රකෘතිවාතයෙන් නොපහස්නාලද තෙත්පෙදෙසට තමන්ගේ අඞ්ගජාතය තලැටක් පමණකුත් ඇතුල්කරන්නහුට පාරාජිකයමවේ. උපුටනලද තොල්, මස් ඇතිකල්හි දත්වලම උපක්‍රමකරන්නහුට ථුල්ලච්චයවේ. යම් දතක් පිටතට නෙරාසිටියේ තොල්වලින් වසන්නට නොහැක්කේද, එහි උපක්‍රම කරනකල්හිද, පිටතට නික්මුනු දිවෙහි උපක්‍රම කරනකල්හිද ථුල්ලච්චයමවේ. ජීවමාන ශරීරයෙහිද පිටතට නික්මුනු දිවෙහි උපක්‍රම කරන්නහුටද ථුල්ලච්චයමවේ. ඉදින්වනාහි පිටතට නික්මුනු දිවෙන් වෙළා මුවතුළට ඇතුල්කෙරේද, පාරාජිකමවේ. බෙල්ලෙන් උඩ සුන් හිසෙහිද යටපසින් අඞ්ගජාතය ඇතුල්කොට තල්ල පහසන මහණහුට පාරාජිකමවේ.

අට්ඨිකවස්තුවෙහි සොහොනට යන්නහුටද දුක්කටයවේ. ඇට එකතුකරන්නහුටද, එහි තමාගේ **නිමිත්ත** ගටන්නහුටද, ඇට රැස්කොට තබා **නිමිත්තෙහි මෙථුනරාගයෙන් උපක්‍රම කරන්නහුටද, කායසංසර්ගරාගයෙන් උපක්‍රම කරන්නහුටද** අශුචි මිදේවා හෝ නොමිදේවා දුක්කටයමවේ. මොචනරාගයෙන්වනාහි උපක්‍රම කරන්නහුට අශුචි මිදෙනකල්හි සඞ්ඝාදිසෙසයවේ. අශුචි නොමිදෙනකල්හි ථුල්ලච්චයවේ. **නාගී** වස්තුවෙහි නා මෙණෙවියක්හෝවේවා, කිඳුරු ආදී එක්තරා මෙණෙවියක්හෝවේවා, මුන් හැමදෙනෙකෙරෙහි පාරාජිකයවේ.

යක්ඛී වස්තුවෙහි සියලු දෙවතාවෝ යකින්නෝමය. **පෙති** වස්තුවෙහි **නිජ්ඣාමතණ්හිකාදිපෙතීහු** ලොමකූපයන්ගෙන් නැගුනු ගිනිදැලින් නිතර ඇවිළගත් සිරුරු ඇතිබැවින් ආමාශීනය කරන්නටද නොහැක්කෝය. විමානපෙතීහුද ඇත්තාහ. යම් ප්‍රෙතීන්ගේ අකුශලකර්ම්ය කාලපක්ෂයෙහි විපාක දෙන්නේද ශුක්ලපක්ෂයෙහි දෙවතාවන්මෙන් සම්පත් අනුභව කෙරෙන්ද, මෙබඳුවූ ප්‍රෙතියකගේ හෝ යකින්නකගේ හෝ ඉදින් දැකීම, ගැනීම, අතගැම, පැහැසීම, ගැටීමයන මේ ක්‍රියා පෙනේද, පාරාජිකයවේ. එහෙත් දැකීමක් නැත්තේය, අන්හැම ක්‍රියා පෙනේද පාරාජිකයමවේ. තවද දැකීම්, ගැනීම් නොපෙනෙත්ද, පෙනෙන අතගැම්, පැහැසීම්, ගැටීම්වලින් ඒ පුද්ගලයා යම්සේ ඇයවිසින්කළ උපක්‍රමය නොදනීද, එසේ සිහිසන් නැතියෙකුකොට තමන්ගේ මනදෙළ පුරවාගෙනයේද, මේ අවිෂය නම්වේ. එහෙයින් මෙහි අවිෂයබැවින් ඇවැත් නැත්තේය.

පණ්ඩක වස්තුව ප්‍රකටමය. **උපහතින්ද්‍රිය** වස්තුවෙහි **'උපහතින්ද්‍රියෝ'**යනු, නටකායප්‍රසාදය ඇත්තේය. කණුකටුවක් මෙන් සැපක්

හෝ දුකක් හෝ නොවිඳියි. නොවිඳින්නහුටද සෙවුනාසිත්විසින් ඇවැත්වේ. **ඝුපිතමත්ත** වස්තුවෙහි යම් මහණෙක් 'මෙවුන්දම් සෙවනය කරන්නෙමි'යි මාගමක අල්ලාගෙන මෙවුන්දම්හි නොඇලී පසුතැවිලි සිත් ඇත්තේවේද, මොහුට දුක්කටයමවේ මෙථුනධම්මයපිළිබඳ අත්ගැනීම් ආදීවූ පූර්ප්‍රයොග යම්තාක් මාඟියෙන් මාඟිප්‍රතිපාදනයට නොපැමිණෙත්ද ඒතාක් දුක්කටයෙහි සිටිත්. මාඟියෙන් මාඟිප්‍රතිපාදනයට පැමිණිකල්හි පාරාජිකයවේ. ප්‍රථමපාරාජිකයපිළිබඳ සමීපය දුක්කටයමවේ. අනික් පාරාජිකාතුන පිළිබඳ සමීපය ථුල්ලච්චයවේ. මේ මහණතෙමේ මෙවුන්දම්හි නොඇලී කායසංසර්ග ඉවසීයයි දතයුතුය. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ **'ආපත්ති සඞ්ඝාදිසෙසස්'**යනු වදළසේක.

හදදිය වස්තුවෙහි ඒ තුවර හදදියනම්වේ. **ජාතියාවන**නම්, දසමන්මල්වනලැහැබ් බොහෝබැවින් මෙසේ ලැබුනම් ඇත්තේය. ඒ වනය ඒ තුවරට සමීපයෙහි පිහිටියේය. ඒ මහණ එහි නිදිගත්තේය. එහිවූ වාතයකරනකොට සිරුරුඅවයව තදවීමෙන් නින්දට වැටුනේය. ආවර්ජනාදීවූ චිත්තචිත්තයන්ගේවසයෙන් පෙළගැසීයන සිත් හා නොහැනුනු භවාඞ්ගයම පවත්නේය. **'කිලින්නං පසසිත්වා'** ශුකලයෙන් කිලිටිවූවහු දැක. මෙයින්මත්තෙහි ඉවසීම හා යෙදුනු වස්තුසතර හා අජානනවස්තුවදයන වස්තුපස ප්‍රකටඅර්ථ ඇත්තේමය. අසාදියන වස්තුදෙක්හි **'සහසා වුට්ඨාසි'** ආසීවිෂයෙකුවිසින් ඩැහගන්නා ලද්දෙකුමෙන් ගින්නෙන් දවුනෙකුමෙන්ද වහා නැඟිසිටියේය. **'අක්කමිත්වා පවට්ටෙසි'** පටන්ගත් විදසුන්ඇති එළඹසිටි සිහිඇති අප්‍රමත්තභික්ෂුතෙමේ වහා නැඟිසිටින්නේම පයින්පාගා බිමපෙරළන්නේ හැමතින් පෙරළන්නේ වෙහෙසන්නේ හෙලුයේය. පෘථග්ජන කල්‍යාණයාවිසින් මෙබඳුතන්හි සිත රැකියයුතුය. මේ මහණද ඔවුන්අතුරෙහි එක්තරා එකෙක්වූයේය. කෙලෙස් සතුරන්විසින් නොමැඩුනේ කෙලෙස්සතුරන් පරාජයකළේ යුදබිම යොධයෙකුවැනිවූයේය.

දෙර විවෘතකොට **නිපන්** වස්තුවෙහි **'දිවා පතිසල්ලීයන්තෙන'** දහවල නිදන්නහුවිසින් **'ද්වාරං සංවරිත්වා පතිසල්ලියිතුං'** දෙර වසා නිදන්නට. මෙහි මෙනම් ආපත්තියයි කියිසේත් පෙළෙහි නොවදරණ ලද්දීය. දෙර හැර නිදිගත් දෙසින් උපන් මෙථුනවස්තුවෙහි 'මහණෙනි! දවල් නිදන්නහුවිසින් දෙර වසා නිදන්නට අනුදනිමි'යි වදළබැවින් දෙර නොවසා නිදන්නහුට දුක්කටය වේයයි වදරනලදී. භාග්‍යවතුන්වහන්සේගේ අදහස දැන උපාලි සථවිරාදීන්විසින් අර්ථකථාව තබනලද්දීය. **'අනාපත්ති දිවා ආපජ්ජති නො රත්තිං'**[A]යි පරිවාරයෙහි එන මේ වචනයෙනුදු මේ දුක්කටය සිදධය.

A පරිවාරපාළි

කෙබඳු දෙර වැසියයුතුද? කෙබඳු දෙර නොවැසියයුතුද? යන මෙහි මෙසේ දතයුතුය. රුක්පුවරු උණපුවරු කලාල්පත් ආදීන්අතුරෙහි යම්කිසිවකින් කවුළුවක්කොට උළුවස්සෙහි යටපඩිකඳ විදකළසිදුරෙහිද උඩපඩිකඳ සිදුරෙහිද ඇතුල්කොට කරනලද ඔබමොබ පෙරළන දෙරම වැසියයුතුය. අන්‍යවූ ගෙරින්ගේ ගාල්හිමෙන් රුක්හිදියෙන්කළ දෙර, කටු අතුයෙන්කළ දෙර, ගමෙහි ගම්දෙරවසනුපිණිස යටඵක් සකක් යොදකළ එකෙකුවිසින් වසන්නට අරින්නට නොහැකි මහදෙර, පුවරුවල හෝ උණපතුරුවල දෙතුන්සකක් යොදකළ ඔබමොබ හැසිරවියහැකි දෙර, කඩපිල්හිමෙන් උණපතුරු, අමුඅතු ආදියක්යොද කළ ඔසොවා තැබියහැකි පැලලිදෙර, දෙතුන්තැනක උණකුරු හුයෙන්බැඳ ගොතාකළ කොළගෙවල උණකුරුබැඳි දෙර, තිරරෙද්දෙන්කළ දෙරයන මෙබඳුදෙර නොවැසියයුතුය. පාත්‍රයක් ගත් අත්ඇති මහණහුට දෙර හැරීමෙහිදී එක්ම තිරරෙද්දෙන් කළ දෙර ඇවැත් නොකරන්නේය. සෙසු දෙර අරින්නහුට ඇවැත්වේ. දවල නිදන්නහුටවනාහි පෙරළන දෙරම ඇවැත් කරන්නේය. සෙසු දෙර වසා නොවසා හෝ නිදිගත්තහුට ඇවැත් නැත්තේය. වසා තබාම නිදි ගතයුතුය. මේ වතයි.

පරිවතීක දවාරය (පෙරළන දෙර) කොපමණකින් වසන ලද්දේවේදයත්: මැද සිදුරුකොට වැද්දූ කුරද උඩපඩිකඳෙහි යෙදූ ඝටිකාසිදුරද යනදෙක යෙදූකල්හි මොනවට වසනලද්දේවේ. තවද කුර යෙදූපමණින්ද වටියි. ඝටිකාව පමණක් දුන්කල්හිද වටියි. දෙරබාව පහසා වැසුපමණින්ද වටියි. දෙරබාව මදක් නොපැහැස සිටිකල්හිද වටියි. සියලු අන්තිම විධියෙන් යම්පමණකින් හිස ඇතුල්නොවේද, එපමණක් නොවැදී සිටිකල්හිද වටියි. ඉදින් බොහෝදෙන ප්‍රයොජනයට ගන්නා තැනක්වේද, එතන්හි මහණක්හට හෝ හෙරණක්හට හෝ ඇවත! දෙර වසාලව'යිකියාද නිදන්නට වටියි. තවද භික්ෂූහු සිවුරුකම් හෝ අන් කිසිවක් කරමින් හුන්නාහුවෙත්ද, 'මොවුහු දෙර වසන්නාහ'යි සිතා කල්පනාකොට නිදන්නට වටියි. කුරුන්දී අටුවාවෙහිවනාහි උපාසකයකු නමුදු විචාරා හෝ මෙතෙමේ දෙර වසන්නේයයි කල්පනාකොට හෝ නිදන්නට වටියි. හුදෙක් මෙහෙණක හෝ මාගමක විචාරන්නට නොවටීයයිද කියනලද්දේය. තවද දෙරෙහි යටපඩි කඳෙහි සිදුර හෝ උඩපඩිකඳෙහි සිදුර කැඩිගියේවේද, නොතබනලද්දේ හෝ වේද, වසාතබන්නට නොහැක්කේද, දෙර වසන්නට නොහැකිසේ නවකම්මාන්තපිණිස හෝ ගඩොල්රැසක් හෝ සුණු මැටි ඇරැසක් හෝ දෙරතුළ තබනලද්දේද, අටල්ලක් හෝ බඳින්ද යම්සේ වසාලන්නට නොහැකිවේද, මෙබඳු අනතුරු ඇතිකල්හි දෙර නොවසාද, නිදීමෙහි

වරදක් නැත්තේය. ඉදින් කවුළුවක් නැත්තේනම් ලැබුසැටියක්ම කැපවේ. උඩමාලයෙහි නිදන්නහුවිසින් මතුතලයට හිණ නගා නිදිගතයුතුය. ඉදින් හිණමතුවෙහි වසන දෙරවේද, එය වසාතබා නිදිගතයුතුය. ඇතුළුගෙයි නිදන්නහුවිසින් ගැබ්දෙර හෝ අක්දෙරියයන යම්කිසි දෙරක් වසාතබා නිදිගතයුතුය. ඉදින් එක්බිත්තියක් ඇති ගෙයිදෙපසෙහි දෙරවුතබා ප්‍රයෝජන ගනිත්ද, දෙරවු දෙකම වැසියයුතුය. තෙමහල් පහයෙහිද දෙර වැසියයුතුමය. ඉදින් පිඩුසිහීමෙන් පෙරළාඅවුත් ලොහප්‍රාසාදයවැනි ප්‍රාසාදයකට බොහෝ භික්ෂූහු දිවා විහරණයපිණිස පැමිණෙත්නම්, සඞ්ඝස්ථවිරයන්වහන්සේවිසින් දෙරවුපල්හට 'දෙර වසාලව'යි කියා හෝ දෙර වැසීම මොහුට භාර'යි කල්පනාකොට ඇතුල්වී නිදිගතයුතුය. සඞ්ඝනවකයාතෙක් එපරිද්දෙන්ම කළයුතුය. පළමුකොට ගෙට ඇතුල්වන්නන්ගේ දෙරවැසීම පසුව ගෙට ඇතුල්වන්නන්ට භාරයයි මෙසේ කල්පනාකිරීමද නොසුදුසුනොවේ. නොවිචාරා හෝ කල්පනානොකොට හෝ ඇතුළුගැබෙහි හෝ නොවැසූ දෙරඇති ගෙයි හෝ පිටත හෝ නිදන්නවුන්ට ඇවැත්වේ. ගැබතුළ හෝ පිටත හෝ නිදනකල්හිද දෙරවැසීම මහදෙරවුවෙහි දෙරවුපල්හට භාරයයි කල්පනාකොට නිදීම වටීමය. ලොහප්‍රාසාදදියෙහි සැඳැල්ලෙහි නිදන්නහුවිසින්ද දෙර වැසියයුතුමය. මේ මෙහි කෙටිකථාය.

මේ දවල නිදීම යම්කිසිවකින් වටකරනලද ඣාරබන්ධනය සහිතවූ තැනක ලා වදරනලදී. එහෙයින් එළිමහනෙහි හෝ රුක්මුලෙක හෝ මණ්ඩපයෙක හෝ යන දවාරබන්ධනය සහිත යම්කිසි තැනක නිදන්නහුවිසින් දෙර වසාම නිදියයුතුය. ඉදින් මහාපරිවෙණසථානයක්වේනම්, මහාබොධිඝරණ ලොහප්‍රාසාදඝරණ සමානවූ බොහෝදෙන හැසිරෙන තැනක්වේනම්, යම්තැනක දෙර වැසුයේද වැසූතැන නොසිටිනම් ඇතුල්වන්නට දෙර නොලබන්නාහු පවුරට නැගද ඇතුළට පිවිසෙත්නම් එහි දෙර වැසීමෙක් නැත්තේය. රාත්‍රියෙහි දෙර හැරදමා හොත්තේ අරුණ නැගිකල්හි නැගීසිටීද, ඇවැත් නැත්තේය. ඉදින් නින්දෙන් නැගිට නැවත නිදද ඇවැත්වේ. යමෙක් වනාහි 'අරුණ නැගිකල්හි නැගී සිටින්නෙමි'යි පිරිසිඳම දෙර නොවසා රාත්‍රියෙහි නිදද, පිරිසිඳගත් පරිදි ම නැගීසිටීද, අපිරිසිදු සිතින්ම හොත්බැවින් ඒ මහණහුට දහවලනිදීම මුල්කොට සිටි ඇවැතමවේ. **මහාපච්චරි**යෙහිවනාහි 'මෙසේ නිදන්නේ අනාදරිය දුක්කටයෙන් නොමිදේය'යිකියනලදී. යමෙක් රෑ බොහෝවේලාවක් නොනිද ගොපනයකොට දිග්මග ගොස් හෝ දවල විඩාපත්වූයේ ඇඳෙහි හුන්නේ දෙපා පොළොවෙන් නොමුදම නිදීම්වසයෙන් නිදද, ඔහුට ඇවැත්නොවේ. ඉදින් බැසගත් නිදිඇත්තේ නොදන්නේම දෙපා ඇඳට නගාගනීනම් ඇවැත්මවේ. ඇඳෙහි හිඳ කටියපටන් පිටමැද

අතර ඉතා මදපෙදෙසක් බිමනොතබා ටැම්ආදියකට හේත්තුනොකොට නිදන්නහුට ඇවැත්නොවේ. යමෙක් 'නිදි දුරුකරන්නෙමි'යි සක්මන්කරනුයේ වැටී වහාම නැගීසිටීද, ඔහුටද ඇවැත් නොවේ. යමෙක් වැටී එහිම නිදද, නැගී නොසිටීද ඔහුට ඇවැත්වේ.

කවරෙක් මිදේද, කවරෙක් නොමිදේදයත්: මෙහිලා **මහාපච්චරි**යෙහියට කියූලෙසින් දෙපා පොළොවෙන් නොමුද එක්පසක් නමා බිඳ හොත්තේම මිදෙන්නේය, දෙපා පොළොවෙන් මුදහොත්තේ යකුන්විසින් ගන්නාලද්දේද විසංඥවූයේද නොමිදෙන්නේයයි කියනලදී. **කුරුන්දි** අටුවාවෙහිවනාහි 'බැඳ හොවන ලදුයේම මිදේය'යි කියනලදී. **මහාඅට්ඨකථා**වෙහි 'යමෙක් සක්මන් කරනුයේ මුසපත්ව වැටුනේ එහිම නිදද, එයට නොයටත්බැවින් ඔහුටද ඇවැත් නොදක්නාලැබේ, ඇදුරෝවනාහි මෙසේ නොකියත්. එහෙයින් ඇවැත්මැ'යි කියනලදී. **මහාපදුම** ස්ථවිරයන්වහන්සේවිසින් 'යමෙක් යකුන්විසින් ගන්නාලද්දේද, යමෙක් බැඳ නිදිගන්වනලද්දේදයන දෙදෙන ඇවැතින් මිදෙත්'යි කියනලදී.

භාරුකච්ඡවස්තුවෙහි **'අනාපත්ති සුපිනන්තෙන'** යම්හෙයකින් සිහිනෙහිදී අවිසයබැවින් මෙසේවේද, එහෙයින් **උපාලි** ස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේ විසින් විනිශ්චය නොකළවිරූද මේ වස්තුව නයග්‍රාහයෙන් විනිශ්චයකළහ. භාග්‍යවතුන්වහන්සේද අසා 'මහණෙනි! උපාලිවිසින් මනාකොට කියනලද්දේය, පා සලකුණු නොදක්විය හැකිතැන පා සලකුණු දක්වන්නකුමෙන්, අහසෙහි පියවර දක්වන්නකුමෙන් උපාලි මේ ප්‍රශ්නය විසඳුයේය'යි වදරා උපාලිතෙරුන් **එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං විනයධරානං යදිදං උපාලි'**[A]යි එතදග්‍රයෙහි තැබූසේක.

මෙයින් මතුවෙහි එන **සුපක්ක**ආදි වස්තු ප්‍රකටඅර්ථ ඇත්තේමය. මහණෙකු ගෙන මෙහෙණක හා යෙදීම් ආදියෙහි ඒ ලිච්ඡවිකුමාරයෝ කෙළිසෙල්ලම්හි යෙදුනාහු, තමන්ගේ අනාචාරය හෙතුකොට මහණුන් ගෙන මෙහෙණන් හා හෙරණින් හා මෙථුනයෙහි යෙදවීමෙන් මෙසේ කළාහුය. එතැන් පටන් ලිච්ඡීන්ගේ විනාශයම වූයේය. **ඛුද්දකපක්කරිත** වස්තුවෙහි **'දස්සනං අගමාසි'** අනුක්‍රමපාවෙන් පෙර බිරිඳ දකින්නෙමියි හෙතෙම ගෙට ගියේය. එකල්හි ඕතොමෝ මොහුට තමන්ගේද තමදරුවන්ගේද අනාථභාවය නොයෙක්ලෙසින් කියාපෑවාය. ඕතොමෝ ඔහු තමන් ගැන බලාපොරොත්තු රහිතයයි දැන කිපියා 'එව, ගිහි වෙව'යි බලාත්කාරයෙන් අල්ලාගත්තීය. හෙතෙමේ තමන් උන්ගෙන්

A එකඩ්ඨුත්තර - එතදග්ගපාළි

මිදෙන්නට හැරෙනුයේ ජරාවෙන් දුබලබැවින් උඩුකුරුව වැටුනේය. එවිට ඔතොමෝ තමාගේ අදහස ඉටුකරගත්තීය. ඒ මහණතෙමේ අනාගාමීය. සිදහළ කාමරාග ඇත්තේය. එහෙයින් නොඉවසුයේය. මිගපොතක වසුවෙහි ප්‍රකට අර්ථඇත්තේය.

විනයවිවෘති
නම්වූ
සිංහල සමන්තපාසාදිකාවෙහි
ප්‍රථමපාරාජිකවණ්ණනා නිමි.

——\\——

එහි භාත්පසින් හැමතින් ප්‍රසාදය උපදවනබැවින් එනම් ලද අර්ථකථාව පිළිබඳ මේ සමන්තපාසාදිකභාවයයි.

උපාලිදසකො යනාදීන් කියනලද ආචාර්‍ය්‍ය පරම්පරාවෙන්ද නිදනවසතුප්‍රභෙද දක්වීමෙන්ද පරලබධි දුරුකිරීමෙන්ද සවසමය පිහිටුවීමෙන්ද,

ව්‍යඤ්ජනපරිශොධනයෙන්ද පදත්‍ථ දක්වීමෙන්ද පාලියොජනා ක්‍රමයෙන්ද ශික්ෂාපද විනිශ්චයයෙන්ද විභඩගනයභෙද දක්වීමෙන්ද,

නුවණැසින් මොනවටබලන්නාවූ නුවණැත්තවුන්ට මේ සමන්තපාසාදිකාවෙහි නොපැහැදුම් එළවන කිසිවක් යම්හෙයකින් නොදක්නාලැබේද, එහෙයින් භික්මවියහැකි සත්ත්වයන් දැමීමෙහි දක්ෂවූ ලොවට අනුකම්පාකරන්නාවූ ලොකනාථයන්වහන්සේවිසින් වදළ විනයප්‍රවෘත්ති ඇත්තා වූ මේ සංවණ්ණනා සමන්තපාසාදිකාමයි දතයුතුය.

——\\——

දුතියපාරාජිකය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

—\\—

දෙවැන්නෙකු නැත්තාවූ සම්මාසම්බුදුරජානන්වහන්සේවිසින් යම් දෙවනපාරාජිකයක් ප්‍රකාශකරනලද්දේද, දැන් ඒ දෙවනපාරාජිකය පිළිබඳ සංවණ්ණනාක්‍රමය පැමිණියේය.

යම්හෙයකින් යමක් පෙර ප්‍රකාශකරනලද්දේද, එහෙයින් සුවසේ දතහැකිවූ ඒ සියල්ල හැරපියා කළ මේ දුතියපාරාජිකසංවණ්ණනාවයි.

'තෙන සමයෙන බුද්ධා භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ' යන මෙහි **'රාජගහෙ'** මෙනම්ඇති නුවරෙහි. ඒ නුවරවනාහි **මහාමන්ධාතු ගොවිඳුදීන්**විසින් අයත්කරගත්බැවින් **රාජගහයි** කියනුලැබේ. මෙහි අන්‍යාවූද ප්‍රකාරයක් වණ්ණනා කෙරෙත්. කිම, මේ නාමය ඒ නගරයට ඔවුන්විසින් කරනලද්දේද, ඒ මේ නගරය බුදුවරයන්ගේ කාලයෙහිද සක්විති රජුන්ගේ කාලයෙහිද නගරයක්වේ. අන්කල්හි ශූන්‍යවූයේ යකුන්විසින් පිරිගා කරනලද්දේවේ. ඒ යකුන්ට මේ නගරය වසන්න වනයක්ව සිටියේය. මෙසේ ගොදුරුගමදක්වා **'ගිජ්ඣකූටෙ පබ්බතෙ'**යි වාසස්ථානය කීහ. එද ගිජුලිහිණියෝ හෝ මේ පර්වතයාගේ මස්තකයෙහි විසූහ. නොහොත් ඒ පර්වතයාගේ මස්තක ගිජුලිහිණින්වැනියහ. එහෙයින් ඒ පර්වතයද ගිජ්ඣකූටයි කියනුලැබේයයි දතයුතුය. **'සම්බහුලා'** විනයපර්‍යායයෙන් තිදෙන සම්බහුලායි කියනුලැබෙත්. එතැන්පටන් සඞ්ඝතෙමේය. මෙහිවනාහි සූත්‍රාන්තපර්‍යායයෙන් තිදෙන තිදෙනමවෙත්. එතැන් පටන් සම්බහුලයහ. මෙහිවනාහි සූත්‍රාන්තපර්‍යායයෙන් සම්බහුලයි දතයුතුය. **'සන්දිට්ඨා'** අතිශය විශ්වාස ඇත්තාහු නොවෙති. දැඩිමිතුරෝ නොවෙතියි කියනුලබත්. ඒ ඒ තැන එක්වීමෙන් දුටුබැවින්ම ඔවුහු සන්දිට්ඨයි කියනුලබත්. **'සම්භත්තා'** අතිශය විශ්වාස ඇත්තාහුය. දැඩි මිතුරෝ කියනුලබත්. ඔවුහු උනුන් කෙරෙහි මැනවින් භක්තයහ. භජනය කරන්නෝය. එක්ව කරන සම්භොගපරිභොග ඇත්තාහයි සම්භක්තයහයි කියනුලබත්. **'ඉසිගිලිපස්සෙ'** ඉසිගිලිනම් පර්වතය. ඒ පර්වතයෙහි පස්සෙක්හි. පෙර පදුමවතියගේ පුත්‍රවූ පන්සියයක් පමණ පසේබුදුවරයෝ **කාසිකොසලාදි** ජනපදයන්හි පිඬුපිණිස හැසිර පසුබත ඒ පර්වතයෙහි

රූස්ව සමාපත්තියෙන් යුක්තව කල්ඉක්මවත්. මිනිස්සු එහි පිවිසෙන පයේබුදුවරයන්ම දකිත්. නික්මෙන්නවුන් නොදකිත්. එහෙයින් **'අයං පබ්බතෝ ඉමෙ ඉසි ගිලති**[A]යි කීහ. ඒ කරණකොට ඒ පර්වතයට ඉසිගිලියන නම උපන.

ඒ පර්වතයෙහි පසෙක, කඳුපාමුල **'තිණකුටියෝ කරිත්වා'** තණ සෙවෙනි ඇති දෙරබා සහිතවූ කිළි කොට, නාලකප්‍රතිපදවට පිළිපන්නහුවිසින්ද වස් එළඹෙන්නහු තණ පත් උළු, ගල් සුණුයන පස්වැදෑරුම් සෙවෙනිඅතුරෙන් එක්තරා එකකින් සෙවෙනි කළ දෙරබා සහිතවූ සෙනස්නකම වස් එළඹියයුතුය. **'න භික්ඛවෙ අසෙනාසනිකෙන වසිතං උපගන්තබ්බං යෝ උපගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්ස'**[B]යි මෙය වදරණලදය. එහෙයින් වැසිකාලයෙහි වස්විසීම සඳහා සෙනසුනක් ලබානම්, මේ මැනවි. නොලබානම් අත්කම් සොයාගෙන කටයුතුය. අත්කම් නොලබන්නහුවිසින් තමන් හෝ කටයුතුය. සෙනසුන් නැත්තහුවිසින් වස් නොඑළඹියයුතුමය. මේ අනුධර්මතාය. එහෙයින් ඒ මහණෝ තණකිළිකොට රැකැන් දිවාතැන්ආදිය පිරිසිඳ කතිතවත් කඳුවත් ඉටා ත්‍රිවිධශික්ෂාවන්හි හික්මෙන්නාහු වස් එළඹියාහුය.

'ආයස්මාපි ධනියෝ' හුදෙක් ඒ තෙරහුම වස් නොඑළඹියහ. මේ ශික්ෂාපදයට ආදිකර්මිකවූ ආයුෂ්මත් ධනිය තෙමේ ද වස් එළඹියේය. **'කුම්භකාරපුත්තෝ'**යනු කුඹල්කරුගේ පුත්‍රතෙමේය. ඔහුගේ නම ධනියය. පියතෙමේ කුඹල්කරුවෙකි. **'ධනියෝ කුම්භකාරපුත්තෝ'**යනු එහෙයින් වදරණලදී. **'වසිතං උපගච්ඡි'** ඒ තෙරුන් සමග එක් තැනම තණකිළියක්කොට වස් එළඹියේය. **'වසිතං වුත්ථා'** පෙරවස් එළඹියෝ, මහාපවාරණයෙන් පැවරුවෝ පෑළවිය දිනපටන් විසූ වස් ඇත්තාහයි කියනුලැබෙත්. මෙසේ විසූ වස්ඇතියෝව. කිසි අනතුරක්නිසා මහාපවාරණයෙන් නොපැවරුවෝද විසූ වස් ඇත්තාහුමවෙත්.

'තිණකුටියෝ භින්දිත්වා' දඬුමුගුරුආදියෙන් පහරදීමෙන් සුණුවිසුණුකොට නොවේ. වෘත්තශීඝ්‍රයෙන් තණ, දැව, වැල්ආදිය බහා තබායන අන්දමියි. යමෙකුවිසින් විහාරයෙහි කෙළවර කිළියක් කරනලද නම් විහාරයෙහි මහණෝ වෙත්නම් ඔහුවිසින් ඒ මහණෝ විචාළයුත්තාහ. ඉදින් මේ කිළිය පිළිදගුම්කොට එහි වසන්නට කිසිවෙක් උත්සාහ කෙරේනම් 'ඔහුට දෙව්'යි කියා යායුතුය. යමෙකුවිසින් වනයෙහි හෝ කිළියක් කරනලද්දේද, එය පිළිදගුම් කරන්නකු නොලබානම්, එය කළහුවිසින් අන්හටද පරිභෝගය පිණිසවන්නේයයි තණ, දැවආදිය

A ඉසිගිලි සූත්‍ර B මහාවග්ග - වස්සූපනායිකඛන්ධක

තැන්පත්කොටතබා යායුතුය. ඒ මහණෝ වනයෙහි කිළිකොට පිළිදගුම් කරන්නෙකු නොලබන්නාහු තණ හා දැවදඬු එක් පෙදෙසක තැන්පත්කොට තබා මොනවට ආරක්‍ෂාකොට තබායන අර්ථයි. යම් සේ තබනලද්දක් වේයන්විසින් නොකනුලැබේද, නොද තෙමෙන්නේත්වේද, එසේ තැන්පත්කොට තබා 'මෙතැනට පැමිණ වසනුකැමති සබ්‍රහ්මචාරීන්ට උපකාරපිණිසවේවා'යි ගම්කවත පුරා **ජනපදවාරිකං පක්කමිංසු'** තමතමන්ගේ සිතට අනුකූලවූ ජනපදයට ගියහ.

'ආයස්මා පන ධනියෝ කුම්භකාරපුත්තෝ තත්‍රේව වස්සං වසි'යනාදිය පැහැදිලිඅර්ථි ඇත්තේමය. **'යාවතකියකං'** තෙවනවරතෙක්. **'අත්‍රවයෝ'** අනු + අවයෝ'යන තන්හි සන්ධිවශයෙන් උකාරලොපයයි. අඩුබවක් නැත්තේය. තමන්ගේ ශීලයෙහි අඩුබවක් හානියක් නැත්තේය. කුඹල්කරුවන්විසින් කටයුතුවූ යමක් යමක්වේද, ඒ හැම කටයුත්තහේ නොඅඩුවූ පරිපූර්ණශීල ඇත්තේය යන අර්ථයි. **'සකෙ'** තමන් සතුවූ. **'ආචරියකෙ'** ඇදුරන් අයත් කම්‍යතයෙහි, **'කුම්භකාරකම්මෙ'** කුඹල්කරුවන්ගේ කම්‍යතයෙහි, කුඹල්කරුවන්විසින් කටයුතුකම්යෙහි යනඅර්ථයි. මෙයින් සකීය ආචාර්‍යකම්‍යතය සවරූපවශයෙන් දක්වනලද්දේවේ. **'පරියොදපසිපෙ'** පිරිසිදු ශිල්ප ඇත්තේය. අඩුබවක් ඇතිකල්හිදු අන්හු හා අසමාන ශිල්පඇත්තේයයි දක්වනලද්දේවේ. **'සක්‍කමත්තිකාමයං'** දොරබා කවුළු අඟුළවා කවුළු පමණක් හැර සෙසු බිත්ති සෙවෙනි ගඩොල් ටැම් ඇ ප්‍රභෙදවූ සියලු ගෘහොපකරන මැටිමුවාම කොටයනඅර්ථයි. **'තිණඤ්ච කට්ඨඤ්ච ගොමයඤ්ච සඩ්ඪිත්වා තං කුටිකං පචි'** ඒ කිළිය සියල්ල මැටිමුවාකොට මට්ටම් ලැලිකඩින් මට්ටම්කොට වියලවා තෙල් මුසු තඹමැටියෙන් පිරිමැද ඇතුළත හා පිටත තණ ආදියෙන් පුරවා යම් සේ පිසනලද්දී මොනවට පිසනලද්දීවේද, එසේ පිසූයේය. ඒ කිළියවනාහි මෙසේ පිසනලද්දීවූවාය. **'අභිරූපා'** මනාරූ ඇත්තීය. **'පාසාදිකා'** පැහැදීම දනවන්නීය. **'ලොහිතිකා'** රතුපැහැ ඇත්තීය. **'කිංකිණිකසදෙද'** කිකිණිදැල් හඬ. නොයෙක් රුවණින්කළ කිකිණිදැල්හි හඬ යම්සේ වූයේද, වාකවුළු ආදිය අතරින් ඇතුල්වූ වාතයෙන් පහරණලද ඒ කිළියෙන් නැගිහඬ එසේ වූයේය. මෙයින් මේ කිළියෙහි ඇතුළත හා පිටත මැනවින් පැසුනුබව දක්වනලද්දේවේ. **මහාඅර්ථකථාවෙහිවනාහි 'කිඩකිණිකා'** යනු කස්ලෝබදුනැයිද, එහෙයින් කුමකින් හෝ පහරණලද කස්ලෝ බදුනෙහි හඬ යම්සේවේද, වාතයෙන් පහරණලද මේ කිළියෙහි හඬත් මෙසේවූයේයයිද කියනලදී.

'කිං එතං භික්ඛවෙ' මෙහි භාග්‍යවතුන්වහන්සේ දන්නාසේක්ම කථාවක් උපදවනුපිණිස 'මහණෙනි මේ කිම්'යි අසා වදාළසේක.

'භගවතො එතමත්ථං ආරොචෙසුං' සියල්ල මැටිමුවා කිළියක් කරන බව මුලපටන් භාග්‍යවතුන්වහන්සේට සැලකළහ. **'කථං හි නාම සො භික්ඛවෙ -පෙ- කුටිකං කරිසසති'** යන මෙය අතීතාර්ථයෙහි අනාගතවචනයි. කෙළේයයි වදරණලද්දේවේ. එහි ලක්ෂණ ශබ්දශාස්ත්‍රයෙන් සෙවියයුතුය. **'න හි නාම භික්ඛවෙ තසස මොඝපුරිසසස පාණෙසු අනුදදයා අනුකම්පා අවිහෙසා භවිසසති'** මෙහි **'අනුදදයා'**යනු අනුරක්ෂණාතොමෝය. මෙයින් මෛත්‍රිය පිළිබඳ පූර්වභාගය දක්වනසේක. **'අනුකම්පා'**යනු අන්හු පිළිබඳ දුකින්වන සිතේසැලීමයි. **'අවිහෙසා**යනු හිංසා නොකිරීමය. මේ පදයන්ගෙන් කරුණාද්‍යාශය පිළිබඳ පූර්වභාගය දක්වනසේක. 'මහණෙනි! පොළොව සැරීම මැටිපෑගීම ගිනිතැබීමයන මෙතැන්හි බොහෝ ලොකුකුඩාප්‍රාණීන් පෙළන නසන ඒ හිස්පුරුෂයාහට ඒ ප්‍රාණීන්කෙරෙහි මෛත්‍රී කරුණා පිළිබඳ පූර්වභාගමාත්‍රවූද අනුරක්ෂණාවක් අනුකම්පාවක් අවිහිංසාවක් **'න හි නාම භවිසසති'** සඵලමාත්‍රයක්නමුදු නොවන්නීය. **'මා පච්ඡිමා ජනතා පාණෙසු පාතබ්‍යතං ආපජ්ජී'** පශ්චිමජනසමූහතෙමේ ප්‍රාණීන්කෙරෙහි නැසිය යුතු සිත් ඇතිබවට නොපැමිණේවා, බුදුරජුන් දවසද මහණුන් මෙසේ කරනලදය, මෙබඳුතන්හි ප්‍රාණඝාතය කරන්නවුන්ට දොෂයක් නැතැ'යි සලකා මොහුගේ දිට්ඨානුගතියට පැමිණෙන පශ්චිමජනසමූහතෙමේ ප්‍රාණීන් හෙළියයුතුකොට නැසියයුතුකොට නොම සිතාවායි වදරණලද්දේවේ. මෙසේ ධනිය තෙරුන් ගරහා **'න ච භික්ඛවෙ සඛමත්තිකාමයා කුටිකා කාතබ්බා'**යි මත්තෙහි එබදු කිළි කිරීම ප්‍රතික්ෂෙපකළසේක. ප්‍රතික්ෂෙපකොටද **'යො කරෙය්‍ය ආපත්ති දුක්කටසස'** යි සියල්ල මැටිමුවාකිළි කිරීම නිමිතිකොට ඇවැතක් තැබූසේක.

එහෙයින් යම් මහණෙක් පොළෝ කැණීම් ඇදියෙන් සතුන් නැසීමට නොපැමිණෙන්නේ එබදු කිළියකුදු කෙරේනම්, හෙතෙමේද දුක්කටාපත්තියට පැමිණේ. පොළොව කැණීම් ආදියෙන්වනාහි ප්‍රාණීන්කෙරෙහි නැසියයුතුබවට පැමිණෙනුයේ සතුන් නසන්නේ යම් යම් වස්තුවක් ඉක්මවාද, ඒ ඒ තැන කියනලද ඇවැතටම පැමිණේ. ධනිය තෙරුන් ආදිකර්මිකබැවින් ඇවැත් නැත. ශික්ෂාපද ඉක්මවා ක්‍රියාකරන සෙස්සන්හටද, කරණලද්දක්ලැබ එහි වසන්නවුන්ටද දුක්කටයමවේ. ද්‍රව්‍යොපකරණ මිශ්‍රකොට කරනලදකිළිය, යම් ඒ පරිද්දකින් හෝ මිශ්‍රකරනලද්දී හෝ වේවා වටියි. පිරිසිදු මැටියෙන් කරනලද්දීම නොවටියි. ඒ කිළියද ගඩොලින් ගඩොල්මුවා ආවාසයක්ලෙසින් කරනලද්දී වටියි. **'එවං භන්තෙති ඛො -පෙ- තං කුටිකං භින්දිංසු'** භාග්‍යවතුන්වහන්සේගේ වචනය පිළිගෙණ දඬුකඩින් හා ගල්වලින් පහරදී ඒ කිළිය විසුරුවමින් බිඳදැමූහ.

'අථ ඛො ආයස්මා ධනියො' යනාදියෙහි මේ සංක්ෂේපාර්ථයයි: ධනිය ස්ථවිරතෙමේ එක්පසෙක දිවාවිහරණයෙන් හුන්නේ ඒ හඬ අසා අවුත් 'ඇවැත්ති! කුමක් හෙයින් තෙපි මාගේ කිළිය බිඳිහුද'යි විචාරා 'භාග්‍යවතුන්වහන්සේ බිඳුවාලනසේකැ'යි අසා සුවවබැවින් පිළිගත්තේය. භාග්‍යවතුන්වහන්සේ මොහුවිසින් ඉතා මහත් උත්සාහයෙන් තමාගේ විසීමපිණිස කළ කිළිය කුමක් හෙයින් බිඳවාලූසේක්ද යත්: මෙහි මොහුගේ දෙර කවුළු ආදිය පිළියෙලකිරීමෙහිදී සිදුවූ ව්‍යයකර්මාන්තය ඇත්තේනොවේද යත්: ඇත්තේය. එහෙත් ඒ කිළිය අකැපබැවින් අකැපයයි කිළිය බිඳවාලූසේක. මේ මෙහි විනිශ්චයයි. **අට්ඨකථා**වෙහි වනාහි සත්ත්වයන්ට අනුකම්පාපිණිස මැටිමුවාකිළිය බිඳ සොරුන්ට පාසිවුරුආදිය පහසුවෙන් ගතහැකිබැවින් පාසිවුරු රැකීම්පිණිස සෙනසුන් බොහෝබව වළකනුපිණිස යනාදීවූ අන් කරුණුද දක්වන ලද්දේය. එහෙයින් දනුදු බොහෝ ඇසුපිරුතැන් ඇති විනය දන් යම් මහණෙක් අකැප පිරිකර ගෙන හැසිරෙණ අන් මහණෙකු දැක ඒ අකැප පිරිකර සිඳුවන්නේනම් හෝ බිඳුවන්නේනම් හෝ හෙතෙමේ දෙස්නගා නොකියයුතුමය. චොදනා නොකටයුතුය. සිහිනොකරවියයුතුය. 'මාගේ පිරිකර තාවිසින් නසනලදය. මට ඒ දෙව'යි ඔහුට කියන්නට නොලබන්නේය.

එහි මේ පෙළින් මිදුනු කැප අකැප පිරිකර පිළිබඳ විනිශ්චයයි: කිසිකෙනෙක් තල්පතින් කළ ඡත්‍රයක් ඇතුළත හෝ පිටත හෝ පස්පැහැති හුයින් මසා ඔපමට්ටම් කෙරෙත්ද, ඒ ඡත්‍රය දරීම සුදුසු නොවේ. නිල් හෝ කසාවන් හෝ යම්කිසි එක් පැහැතිහුයකින් ඇතුළත හෝ පිටත මයන්නට කුඩම්ට මතුවෙහි ගන්වන නනපෙළ වෙළන්නට වටියි. ඒ එක් පැහැතිහුයින් නනපෙළ වෙළීමද සථිරකරණු පිණිසය. පැහැය ඔප වැඩිකිරීම්පිණිස නොවේ. ඡත්‍රයෙහි කොළපත්හි මෝරුදත් සටහනක් හෝ අඩසඳ සටහනක් හෝ කැපීම නොවටියි. කුඩම්ටෙහි ගෙවල කණුවල මෙන් සටකයක් හෝ ව්‍යාලරූප හෝ කිරීම නොවටියි. ඉදින් ඡත්‍රදණ්ඩෙහි සියලුතන්හි ලියන කටුමුවෙන් ඉරි ගසනලද්දීවේද, එද සුදුසු නොවේ. සටකයත් ව්‍යාලරූපයත් බිඳහැර දැරියයුතුය. ඉරිද ගටා හෝ පහකටයුතුය. හුයකින් හෝ ඡත්‍රදණ්ඩ වෙළියයුතුය. දඬුමුල නයිහතු සටහන වරද නැත. හුළන් පහරින් නොසැලෙනුපිණිස කුඩමඩුල්ල හුයින්ගන්වා කුඩම්ටෙහි බඳින්ද, ඒ බඳින තැන වලල්ලක්මෙන් නගා ඉරක් ගසත්ද එය වටියි.

සිවුරු සැරසීමපිණිස නන්පැහැති හුයින් සියපාසපුන් සමානකොට මහන්නාහු අමුතුපත් තබත්ද, අනිකුදු යම්කිසි හිදිකම් වියරු කරත්ද, පත් දෙක එක්කොට මහණ තැන හෝ හුවා කෙළවර හෝ හමුකරල්අයුරින්

මැසීම හෝ බලල්හැකිලිඅයුරින් මැසීම හෝ කරත්ද, මේ ඈ සියල්ල නොවටියි. පියවිහිදිකම්ම වටියි. ගණ්ඨිකපට්ටය හා පාසකපට්ටය අටකොන්ද සොළොස්කොන්ද තබා කරත්ද, සෑසටහන් ගදමුගුරුසටහන් දක්වත්ද, කකුළුඇස් නගාතබත්ද, මේ හැම නොවටියි. සිවුකොන් තබා මැසීමම වටියි. ගණ්ඨිපාස වැටියෙහි කෙළවරින් පිටතට නික්මුනු හූ හා පිළකා ආකාරයෙන් සිටි හූකොන් සිවුරු රඳන් ගැන්වූකල්හි නොදතහැකි සඪරූප ඇත්තේනම් වටියි. කැඳ පිටිතලප ආදියෙහි සිවුරු බැහීම නොකටයුතුය. සිවුරුකම් කරනකාලයෙහිවනාහි අත්මල හිදිකටුමල ආදිය සෝදහැරීම හා කිලිටිකාලයෙහි කිලිටි සෝදහැරීමත් කටයුතුය. සුවඳක් හෝ ලතුවක් හෝ තෙලක් රඳන්දියෙහි බැහීම නොවටියි. සිවුර රඳන්ගන්වා සකකින් හෝ මැසිරිගල් ඈ ගලකින්යන යම්කිසිවකින් නොගැටියයුතුය. බිම දෙදනින් හිඳ සිවුර අතින් ගෙන රන්දෙණෙහිද නොගැටියයුතුය. දෙණෙහි හෝ ලැලිකඩෙක තබා කොන් අල්ලාගෙන අතින් පැහැරීම වටියි. ඒ පැහැරීමද මිටින් නොකටයුතුය. පැරණි තෙරහුවනාහි පඩුදෙණෙහිද නොතැබූහ. එකෙක් අල්ලාගෙන සිටියි. අනෙකෙක් අතෙහි තබා අතින් පහරයි. සිවුරෙහි කොන්වල හූ බැඳීම නොසුදුසුය. රඳන් ගැන්වූකල්හි හූ සිඳහැරියයුතුය. 'මහණෙනි! කොන්හි බඳින හූයක් අනුදනිමි'යි මෙසේ යමක් අනුදන්නාලද්දේද, එහෙයින් ඒ කොන්වල බැඳිනුල් රඳන් ගන්වන කාලයෙහි රඳන් ගන්වා සිවුර එල්ලීමපිණිස නුවාවෙහි මලපුඩුවක්කොට බැඳියයුතුය. ගණ්ඨියෙහිද ගණ්ඨිය ශොභාවත් කරනුපිණිස ඉරිගැසීම හෝ බින්දු බින්දුකොට පිළකා තැබීම හෝ නොකටයුතුය. ඒ සියල්ල සිඳහැර පරිභොගකටයුතුය.

පාත්‍රයෙහි හෝ තලියෙහි ඇතුළත හෝ පිටත හෝ නියන්කටු අඟින් ඉරිගසත් නොවටියි. පාත්‍රය ලියනකදට නගා පිරිමැද මිණිපැහැතියක් කරන්නෙමුයි පිළිස්සීම කරත්ද නොවටියි. ශ්‍රමණසාරුප්පබැවින් තෙල්පැහැති පාත්‍රය සුදුසුවේ. අනිකෙකුවිසින් කරනලද මිණිපැහැති පාත්‍රයක් ලැබුනුකල්හි එය පරිභොගකිරීම වරද නැතැයි සමහරු කියත්. පාත්‍රය තබන දරණුවෙහි හිත්තිකමීකිරීම නොසුදුසුය. මෝරුදත් සටහන්තැබීමවනාහි වරද නැත්තේය. ඩබරා මුවවිටෙහි උඩ හෝ යට හෝ ඩබරා කුසතුළ හෝ ඉරිගැසීම නොහොබනේය. ඩබරාවෙහි සත්මුවවිටෙහි ඉරිගැසීම වරදක් නොවේ.

සිවුරුපටිය හොබවනුපිණිස ඒ ඒ තැන හූය දිගුණකොට කොටත්. කකුළුඇස් නගත්. නොවටියි, දෙකෙළවරෙහි දවලුමුව තරකරණුපිණිස දිගුණකොට තැළීම වටියි. දවලුමුවෙහි සටකයක් හෝ මෝරුමුව සටහනක් හෝ දියබරිමුව සටහනක් හෝයන යම්කිසි වියරුරුවක් කිරීම සුදුසුනොවේ.

ඒ ඒ තන්හි ඇතුන්ගේ ඇස් සටහන් දක්වා මල්කම්ආදිය හෝ කොට තැලූ සිවුරු පටියද පරිභොගයට නොවටියි. අන් වියරුරු නොකොට සෘජුවම මස්කටු සටහනක් හෝ ඉදිපත් සටහනක් හෝ මටපිඩු සටහනක් හෝ කොට තළනලද්දේනම් වරද නැත්තේය. කාබානට එක් දවල්ලක් වටියි. දවලු දෙකක් තුනක් සතරක් කළ කාබානද පරිභොගයට වටියි. ඉන් වැඩියක්කිරීම සිදුසුනොවේ. රැහැන්කාබාන එක් ගුණකොටම බැඳියයුතුය. හවඩි සටහන් ඇති කාබාන එක් ගුණකොටද බැඳීම නොහොබනේය. දවල්ලවනාහි හවඩි සටහන් ඇත්තේද වරද නැත. බොහෝ රැහන් එකතුකොට එකෙකින් අතර නොතබා වෙළා කරනලද්ද බහුරජ්ජුකයි නොකියයුතුය. ඒ කාබාන පරිභොගයට ගැනීම වරදක් නොවේ. දත් ඇටඇදියෙන් කළ කාබාන්විතෙහි අෂ්ටමඞ්ගලාදීවූ යම් කිසි විකාරරූපයක් දක්වීම නොවටියි. එහි දෙකෙළවරෙහි කටයුතුවූ පරිවෙෂදලේඛා මාත්‍රයක්ම පමණවේ වීථියාගේ දෙකෙළවරෙහි **සීරකිරිමපිණිස** සටකයක් කරත්නම් එයද වටියි.

අඳුන්කුලාවෙහි **ස්ත්‍රීපුරුෂචතුෂ්පදපක්ෂිරූප** හෝ මාලාකම් ලතාකම් මකරදන්ත ගොමුත්‍ර අර්ද්ධචන්ද්‍රාදිභෙදවත්වූ විකාරරූප නොකටයුතුය. ගටා හෝ සිඳහැර හෝ යම්සේ හෝ නොපෙණේද, එසේ හුයකින් වෙළා හෝ පරිභොගකටයුතුය. සිවුරුස්වූ හෝ අටැස්වූ හෝ සොළොසැස්වූ හෝ අඳුන්කුලා එකතින්ම වටියි. අඳුන්කුලාවෙහි යටද දෙකක් තුනක්වට රෙඛා කිරීම වරදනොවේ. මෙහි ගැට්ටෙහි වියන්පත බැඳීමපිණිස එක් වටලෙඛාවක් කටයුතුය. අඳුන්කුරෙහිද පැහැය ඔපදැමීම නොවටියි. අඳුන්කුලා බහාලන පසුම්බියෙහිද නන් පැහැති හුයින් යම්කිසි පැහැයක ඔප දැමීමෙක්වේද, එද සුදුසුනොවේ. යතුරුලන කොපුවෙහිද මේ ක්‍රමයවේ. යතුරෙහිද පැහැය ඔපදැමීම නොයෙදෙයි. කතුරු ඈ බඳු බහාලන පසුම්බියෙහිද එසේය. මෙහි එක් පැහැති යම්කිසි හුයකින් මැසීම පමණවේ. පුඤ්ඡකාදිය සකස්කිරීමපිණිස කරණුලද දිග් මුවහත්ඇති ආයුධයෙහිද වටකුරුකොට අග කෙළවර නගන බුබුල හෝ අනෙකක් හෝ ඔපදැමීම නොහොබියි. ගෙලෙහි පිරිසිදීම දක්වනුපිණිස ඉරිගැසීම වරද නැත්තේය. කඩකතුරෙහි එකට බැඳුනු මැණිකක් හෝ අබපමණ මුතුඇට රැසක් හෝ සමාන යම්කිසි රෙඛාවක් හෝ නැගීම නොවටියි. ශස්ත්‍රදණ්ඩෙහිවනාහි පිරිසිදීමපිණිස රෙඛාවක් කිරීම වටියි. නිය සිඳිනකල්හි අල්ලා ගැනීමට මැද රැලියක් නගා කෙරෙත්ද, එහෙයින් එය වටියි. ගිනිගාන දඬු දෙකඅතුරෙහි මතු දඬුවෙහි හෝ යට දඬුවෙහි හෝ අරණිදුන්නෙහි හෝ මත්තෙහි පෙලන දඬුවෙහි හෝ මාලාකම්ආදීවූ යම්කිසි පැහැය ඔපදමක්වේද එද නොවටියි. පෙලන දඬුවෙහි මැද ගිනිගානා මතුදඬුව ඇතුල්කරනුපිණිස

ආවාට මණ්ඩලයක් වේද, එය පිරිසිදීමට ඉරිගැසීම පමණක් කටයුතුය. ඉදිඅඩුවක් කෙරෙත්ද යමකින් ඉදිකටුව ඩැහැගන්වා ගටත්ද එහිමුවර මුව ආදීවූ යම් කිසිවක් කොට පැහැ මටකෙරේ නම් එද නොසුදුසුය. ඉදිකටුව ඩැහැගන්නා පිණිස මුඛය පමණක්ම වේනම් ඒ වටියි.

දැහැටි සිඳින වැයෙහිද පැහැ මටකිරීම සුදුසුනොවේ. සෘජුවම කැප ලෝහයෙන් දෙපස හෝ එක් පසෙක හෝ සිවුරස්කොට හෝ අටස්කොට හෝ බැඳියයුතුය. කතුරුදඬුවෙහිද යම්කිසි සැරසීමක් නොයෙදියයුතුය. එහි යට එකක් හෝ දෙකක් හෝ වටරෙඛා තැබීම හෝ මත්තෙහි නයිහතු කැකුළක්පමණ තැබීමද වටියි. තෙල්බඳුන්අතුරෙහි අතෙහි හෝ කුලාවෙහි හෝ ලබුකබලෙහි හෝ නෙල්ලිපල අඹරා ඒ කල්කයෙන් කළ බඳුනෙහි හෝ ස්ත්‍රීරූපයද පුරුෂරූපයද හැර සෙසු සියලු සටහනක් නගා වණමටකම් කිරීම වරදක් නොවේ. ඇඳපුටුවෙහි ගුදිරිකොට්ටයෙහි බුමතුරුණෙහි පාපිස්නෙහි බිමලා සක්මන්කරන බිස්සෙහි මුස්නෙහි කසළ බහන බඳුනෙහි පඬුඔරුවෙහි පැන් ගන්නා කිණිස්සෙහි පැන්කළයෙහි නොසේදූ පාතබන දඬුකඩෙහි සේදූ පා තබන පුවරුපුටුවෙහි කළ තබන දරණුවෙහි දඬුමුවාබිම්වලල්ලෙහි පාපිස්නෙහි තල්වැටෙහි සිවුරස් විජිනිපතෙහි යනමෙතන්හි ස්ත්‍රීරූපය හැර සියලු මල්කම් ආදියෙන් වණමටකම් කිරීම වටියි.

සෙනසුනෙහිවනාහි දෙරකවුළු ජනෙල්කවුළු ආදීන්හි සළී රක්තමයවූද වණමටකම් කිරීම වරදක්නොවේ. විරුඬ සෙනාසනය හැර සෙසු සෙනසුනෙහි වළකාලියයුතු කිසිවක් නැත්තේය. විරුඬ සෙනාසනයනම් සීමාවට හිමිකම් කිය හැකි අන්‍යභික්ෂූන්ගේ සීමාවක රාජවල්ලභයන්විසින් කරනලද සෙනාසනයයි. එහෙයින් යම්කෙනෙක් එබඳුවූ සෙනසුනක් කරත්ද 'අපගේ සීමාවෙහි සෙනාසනයක් නොකරවු'යි ඔවුහු කියයුත්තාහ. නොපිළිගෙන කරත්මනම් නැවතත් 'මෙසේ නොකරවු, අපගේ උපොසථපවාරණයන්ට අන්තරාය නොකරවු, සමගිය නොබිඳිවු, තොපගේ කරනලද සෙනස්නද කළතැන නොසිටින්නේය'යි කියයුතුය. ඉදින් බලහත්කාරයෙන් කරත්මනම් යම්කලක ඔවුන්ගේ ලජ්ජාඇති පිරිස් බලවත්වේද, ධාර්මික විනිශ්චයක් ලබන්නට හැකිවේද, එකල්හි 'තොපගේ ආවාසය ගෙන යවු'යි ඔවුන්ට දන්වා යැවියයුතුය. තුන්වරක් මෙසේ දන්වා යැවූකල්හි ගෙනයෙත්නම් මනාය. ගෙන නොයෙත්නම්, බොධිය හා සෑය හැර සෙසු සෙනසුන් බිඳියයුතුය. එ ද අපරිභොග නොකරන්නවුන්විසිනි. පිළිවෙළින්වනාහි වහල පරාලගඩොල් ආදිය බැහැරකොට 'තොපගේ ද්‍රව්‍යොපකරණ ගෙන යවු'යි ඔවුන්ට දන්වා යැවියයුතුය. ගෙන යෙත්නම් මනාය. ගෙන නොයෙත්නම් ඒ

ගෘහොපකරණ හිමවැසි අවුසුළං ආදියෙන් දිරාගියකල්හි හෝ සොරුන් පැහැරගෙන ගියකල්හි හෝ ගිත්තෙන් දැවීගියකල්හි හෝ සීමාව අයත්වසිටි මහණෝ උපවාද නොකටයුත්තාහ. 'තොපවිසින් අපගේ ගෘහොපකරණ නසනලදැ'යි හෝ 'එය තොපට ශ්‍රීවාය'යි හෝ වොදනාකරන්නට ඉඩ නොලැබෙන්නේය. සීමාව හිමි මහණුන්විසින් යමක් කරනලද්දේද එය මැනවින් කරනලද්දේමවේ.

පාලිමුක්තකවිනිශ්චය නිමි.

—\\—

මෙසේ කිළිය බිඳහළකල්හි ධනිය තෙරුන්ට උපන් පරිවිතකීයද නැවත කිළිය කිරීමපිණිස කළ උත්සාහයද දක්වනුපිණිස **'අථ ඛො ආයස්මතො'** යනාදිය වදරණලද්දේය. එහි **'දරුගහෙ ගණකො'** යනු රජුගේ දැවමඩුවෙහි දැව පල්නේය. **'දෙවගහදරුනි'**යනු රජුවිසින් රක්නාලද දැව රජසතුවූ දැවය යනඅර්ථයි. **'නගර පවිසඩ්ඛාරිකාකි'** නුවර පිළිසකරකිරීම පිණිසවූ උපකරණයෝය. **'ආපදත්ථාය නික්ඛිත්තානි'** ගින්නෙන් දැවියාමෙන් හෝ පැරණිබැවින් හෝ සතුරුරජුන්විසින් ඇවිරීම්ආදියෙන් හෝ දෙරකොටු අටලු රජඇතොර ඇත්හල් ආදියට සිදුවූ විපත් ආපදයි කියනුලැබේ. ඒ පිණිස තබනලද්දෙයි කියනලද්දේවේ. **'ඛණ්ඩා ඛණ්ඩිකං ඡෙදපෙත්වා'** තමන්ගේ කිළියෙහි පමණ සලකා කිසිවක් අගින් කිසිවක් මැදින් කිසිවක් මුලින් කඩකඩකරමින් සිදවාලූයේය. **'වඩ්ඩකාරො'** යනු ඒ බ්‍රාහ්මණයාගේ නාමයයි. **'මගධමහාමත්තො'** මගධරට මහා ඇමති තෙමේය. මහත්වූ ඓශ්වර්‍ය්‍ය මාත්‍රයෙන් යුක්තවූයේය. මගධරජුගේ හෝ මහා ඇමතිතෙමේ මහාමාත්‍යයි කියනලද්දේවේ. **'අනුසඤ්ඤයමානො'** ඒ ඒ තැන ගොස් සලකාබලන්නේය. **'භණෙ'**යනු අධිපතියන්ගේ පහත්තැන සිටි පුරුෂයන්ට කරන ආමන්ත්‍රණයයි. **'ඛඩ්ඩං ආණාපෙසි'** බ්‍රාහ්මණ තෙමේ සවභාවයෙන්ම ඔහු කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් මඩනාලද්දේමවේ. හෙතෙමේ රජුගේ 'අණකරව'යි යනවචනය අසා යම්හෙයකින් 'කැඳවාලව'යි රජුවිසින් නොකියන ලද්දේද, එහෙයින් ඔහු අතින් පයින් බඳිනලද්දෙකුකොට ගෙනඑන්නට අණවන්නෙමියි බැඳීමට අණකෙළේය. **'අද්දසා ඛො ආයස්මා ධනියො'** කෙසේ දුටුවේදයත්: ආයුෂ්මත් ධනියතෙමේ තමන් යම්තම් ඉඩකින් දැව ගෙණගියබව දැන නිසැකයෙන්ම මොහු දැව හෙතුකොට රාජකුලයෙන් වධයට හෝ බන්ධනයට පැමිණෙන්නේය, එකල්හි මම ඔහු මුදගන්නෙමියි නිතර දෙවේලේ ඔහුපිළිබඳ තොරතුරු අසා බලන්නේම හැසිරෙන්නේය. එහෙයින් එකෙණෙහිම ගොස් දුටුයේය. ආයුෂ්මත් ධනියතෙමේ දුටුවේයයි එහෙයින් වදරණලදී. **'දරුනං**

කිව්වා' දව කරුණුකොට **'පුරාහං භක්ඛයුම්'** මම නොබෝකලකින් හිංසා කරනුලබම්. යම්තාක් මම හිංසා නොකරනු ලබන්නෙම්ද, ඒතාක් ඔබ ආයුතුය යනඅර්ථයි. **'ඉඩඤ භන්තෙ සරාපෙහි'** මෙහි **ඉඩඤ** යනු වොදනාඅර්ථයෙහි නිපාතයි. **'පඨමාභිසිත්තෙනා'** අභිෂෙකකරනලදුව පළමුකොට **'එවරූපිං වාචං භාසිතා'** 'මහණබමුණන්හට තණදුව දිය පරිභොග කෙරෙත්වායි දෙනලද්දේමයයි මේ මෙබඳු වචනයක් අභිෂෙක කරනලදුව පළමුකොටම යමක් ඔබ කීවහුද, එය තෙමේම කියා දැන් සිහිකරහුද, නොසිහි කරහුදයි කියනලද්දේවේ. රජහුවනාහි අභිෂෙක කරනලද්දුම 'මහණ බමුණන්හට තණ දුව දිය දෙන ලද්දේමය, එහෙයින් තණ දුව දිය පරිභොග කෙරෙත්වායි දහම්බෙරය හසුරුවාලන්නාහ. ඒ සඳහා මෙතෙමේ කියයි. **'තෙසං මයා සඤ්ඤාය භාසිතං'** සැලපමාත්‍රයෙහිද කුකුස් කරන්නාවූද සන්සිඳවූ පව්ඇති ඒ මහණබමුණන්ගේ තණ දුව දිය ගෙනයෑම සඳහා මාවිසින් මෙසේ කියනලදී. තොප වැන්නවුන් සඳහා නොකියනලදයයන අදහසවේ. **'තඤ්ච ඛො අරඤ්ඤෙ අපරිග්ගහිතං'** වනයෙහි නොරක්නාලද යම් තණ දුව දියක් වේද, ඒ නොරක්නාලද තණ දුව දිය සඳහා මාවිසින් මේ කියනලදයි දක්වාලන්නේය. **'ලොමෙන තවං මුඤ්චකාසි'** මෙහි ලොමය වැනිනුයි ලොමනම්වේ. ඒ කිම? පැවිදිලක්ෂණයයි. කුමක් කියනලද්දේවේද යත්: යම්සේ ධූර්තයෝ 'මස කන්නෙමු'යි මාහැගි ලොම්ඇති එළුවෙකු ගන්නාහුද, අන් නුවණැති පුරුෂයෙක් ඒ එළුවා දැක 'මේ එළුවාගේ මස් කහවණුවක් පමණ අගියි, ලොම්වනාහි ලොම්වාරයක් ලොම්වාරයක් පාසා නොයෙක් ගණන් කහවණු වටියි'යි ලොම්නැති එළුවන් දෙදෙනකුදී ඒ ලොම්ඇති එළුවාගන්නේද, මෙසේ ඒ ලොම්ඇති එළුවා නුවණැති පුරුෂයානිසා ලොම් හෙතුකොට මිදෙන්නේද, එපරිද්දෙන්ම ඔබ මේ කර්‍ම කළ බැවින් වධබන්ධනයට සුදුස්සෙහිය. යම්හෙයකින් වනාහි අහිද්ධජය සත්පුරුෂයන්විසින් නොනැසියයුතු සභාවය ඇත්තේවේද ඔබද ශාසනයෙහි පැවිදිවූබැවින් ඒ පැවිදිලක්ෂණවූ අහිද්ධජය දුරුයෙහිද එහෙයින් ඔබ මේ ප්‍රව්‍රජ්‍යාලිඞ්ගලොමය කරණකොට නුවණැති පුරුෂයානිසා එළුවා මෙන් මිදුනෙහිය.

'මනුස්සා උජ්ඣායන්ති' රජපිරිසෙහි කියන්නහුගේ වචනය හමුවෙහිද නොහමුවෙහිද අසා ඒ ඒ තැන මනුෂ්‍යයෝ ලාමකකොට සිතත්. අවමන් කරත්. අවමන් කරන්නාහු ඔහු ගැන සිතත්. බලත්. පහත්ලෙසින් හෝ සිතත්ය යනඅර්ථයි. **'ඛියන්ති'** ඔහුගේ අගුණ කියත්. පවසත්. **'විපාවෙන්ති'** අගුණ පතුරුවා හරිත්. හැමතැන පතුරුවත්. මේ අර්ථයද ශබ්දශාස්ත්‍රානුසාරයෙන් දතයුතුය. මේ වනාහි මෙහි යොජනාය:

‘අලජ්ජිනෝ ඉමේ සමණා සක්‍යපුත්තියා’ ‘මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ අලජ්ජීහ’යනාදි වයයෙන් සිතමින් ලාමකකොට සිතත්. **‘නත්ථි ඉමෙසං සාමඤ්ඤං’** ‘මොවුනට ශ්‍රමණභාවය නැත්තේය’යනාදිය කියමින් අගුණ පවසත්. **‘අපගතා ඉමේ සාමඤ්ඤා’** ‘මොවුහු ශ්‍රමණභාවයෙන් පහවූහ’යනාදිය ඒ ඒ තැන විස්තාරකරමින් පතුරුවාහරිත්. මේ ක්‍රමයෙන් මේ පදයන්ගේද, මෙයින් මතුවෙහි ඒ ඒ තැන ආපදයන්ගේද අනුරූපලෙසින් යෙදීම දතයුතුය. එහි **‘බ්‍රහ්මචාරිනෝ’** ශ්‍රෙෂ්ඨවූ හැසිරීම් ඇත්තාහුය. **‘සාමඤ්ඤං’** ශ්‍රමණභාවයයි. **‘බ්‍රහ්මඤ්ඤං’** ශ්‍රෙෂ්ඨභාවයයි. සෙස්ස පැහැදිලි අරුත් ඇත්තේමය. **‘රඤ්ඤෝ දරූනි’** යනාදියෙහි **‘අදින්නං ආදියිස්සති’** යනමෙය ලාමකකොට සිතීම අතිකොට ඇත්තේය. නොදෙනලද යමක් ගත්තේද, එය දක්වන්නට **‘රඤ්ඤෝ දරූනි’**යනු වදරණුලද්දේය. මෙසේ එකවචන බහුවචන භෙදයෙහි නොමුළාවන්නන්විසින් අතිකී දතයුතුය.

‘පුරාණ වොහාරිකෝ මහාමත්තෝ’ භික්‍ෂුභාවයෙන් පෙර ගිහිකාලයෙහි විනිශ්චය ව්‍යවහාරයෙහි යෙදීසිටිබැවින් විනිශ්චයකාරයෙකැයි ප්‍රසිද්ධියට ගිය මහාමාත්‍යතෙමේය. **‘අථ ඛෝ භගවා තං භික්ඛුං එතදවොච’** භාග්‍යවතුන්වහන්සේ, තමන්වහන්සේම ලොකව්‍යවහාරය දන්නාසේක. ‘පෙර බුදුවරයෝද මෙපමණකින් පාරාජිකය, මෙපමණකින් ථුල්ලවචය, මෙපමණකින් දුක්කටය පණවත්’යි අතීත බුදුවරයන්ගේ පැණවීමද දන්නාසේක. ඉදින් එසේ ඇතිකල්හිදු අන්‍යවූ ලොකව්‍යවහාරය දන්නවුන් සමග සංසන්දනය නොකොට පාදමාත්‍රයකින් පාරාජිකාව පණවන්නාහුනම්, ඒ හෙතුවෙන් ‘මේ එක් මහණක්හුගේද සීලසංවරය පමණනොකොට හැකිය, ගණන් නොකටහැකිය. මහපොලොව - මහසමුදුර - අහස මෙන් ඉතා තදින් පැතිරගත්තේය. භාග්‍යවතුන්වහන්සේ ඒ මේ සීලසංවරය පාදමාත්‍රයකින් නසනසේක්’යි මෙය කියන්නෝ වන්නාහ. එයින් තථාගතයන්වහන්සේගේ ඥනබලය නොදන්නාහු ශික්‍ෂාපදය කොප්‍යකරන්නාහුය. පණවනලද ශික්‍ෂාපදයද නියම තැන නොසිටින්නේය. ලොකව්‍යවහාරය දන්නවුන් සමග සංසන්දනයකොට පැණවූකල්හි ඒ දෙෂාරොපණය නොවන්නේය. ‘මේ අගාරිකයෝ පවා පාදමාත්‍රයෙන් සොරු අල්ලා නසත්. බඳිත්. පිටිවහල්ද කරත්. එසේ තිබියදී කුමක් හෙයින් භාග්‍යවතුන්වහන්සේ මෙබඳු පැවිද්දහු නොනසන සේක්ද යමක්හු විසින් අන්‍යතු තණඉරටුවක් තරම්දයක් නොගතයුතු නොවේද’යි එකාන්තයෙන් මෙසේ කියන්නෝවෙත්. ඔවුහු තථාගතයන් වහන්සේගේ ඥනබලය දන්නාහුවෙති. පණවනලද ශික්‍ෂාපදයද කොප්‍යනොවන්නේය. නියම තැන සිටින්නේය. එහෙයින් ලොකව්‍යවහාරය දන්නවුන් සමග සංසන්දනයකොට පණවනු කැමතිසේක්

මහණ, මෙහෙණ, උවසු, උවැසියන් ඇති සියලු පිරිස එක්වන්බලා වදරණසේක් නොදුරෙහි හුන් ඒ මහණහු දැක 'මහණ! කොපමණකින් මගධෙශ්වරවූ සෙනිය බිම්බිසාර රජතෙමේ සොරු අල්ලාගෙන නසාද, බැඳීද, පිටිවහල් කෙරේද'යි ඒ මහණහු අතින් අසාවදළසේක.

එහි **'මාගධො'** මගධයන්ගේ ඊශ්වරතෙමේය. **'සෙනියො'** සෙනාවෙන් යුක්තවූයේය. 'බිම්බිසාරො' ඔහුගේ නාමයයි. **'පබ්බාජෙති වා'** රටින් හෝ නෙරපාහරියි. මෙහි සෙස්ස පැහැදිලි අර්ථී ඇත්තේමය. **'පඤ්චමාසකො පාදෙ'** එ දවස රජගහා නුවර මසුවිස්සක් කහවණුවක්වේ. එහෙයින් මසුපසක් පාදයක්වේ. මේ ලක්ෂණයෙන් සියලු ජනපදයන්හි කහවණුව පිළිබඳ සිවුවනකොටස පාදයකැයි දතයුතුය. ඒ පාදයදවනාහි පුරාණ ශාසත්‍රයට අනුරූපව උතුම් රණින්කළ නීල කාර්ෂාපණයාගේවසයෙන්වේ. රුද්‍රදමකාදීවූ අන්‍යකාර්ෂාපණයන්ගේවසයෙන් නොවේ. ඒ පාදයෙන් අතීත බුදුවරයෝද පාරාජිකය පැණවූහ. අනාගත බුදුවරයෝද පාරාජිකය පණවන්නාහුය. පාරාජිකවස්තුවෙහි හෝ පාරාජිකයෙහි හෝ සියලු බුදුවරයන්ගේම වෙනස්බවක් නැත්තේය. මොවුහුම සතරපාරාජික වස්තුහුය. මොවුහුම සතරපාරාජිකයෝය. මෙයින් අඩුව හෝ වැඩිව හෝ නැත්තේය. එහෙයින් භාග්‍යවතුන්වහන්සේද ධනිය තෙරුන්ට ගරහා පාදයහෙතුකොටම දෙවන පාරාජිකය පණවනසේක් **'යො පන භික්ඛු අදින්නං තෙය්‍යසඞ්ඛාතං'** යනාදිය වදළසේක.

මෙසේ මූලවෙජ්‍ය වශයෙන් දැඩිකොට දෙවන පාරාජිකය පැණවූ කල්හි අනුප්‍රඥප්තියපිණිස අන්‍යවූද රජකභණ්ඩිකවස්තුව උපන්නේය එහි උත්පත්තිය දක්වනුපිණිස **'එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති'** යනමෙය වදරණුලද්දේය. එහි අර්ථීයද අනුප්‍රඥප්තිසම්බන්ධයද ප්‍රථමපාරාජිකවර්ණනාවෙහි කියූලෙසින්ම දතයුතුය. මෙහි යම්සේද මෙසේ මෙයින් මත්තෙහිවූ සියලු ශික්ෂාපදයන්හි යමක් යමක් පෙරකියනලද්දේද, ඒ සියල්ල හැරපියා මතුමතුවෙහි පෙර නොකියනලද්දම වර්ණනාකරන්නෙමු. ඉදින් කියූනයඇති යමක් යමක්වේද ඒ ඒ නැවතත් වර්ණනාකරන්නෙමුනම්, කවර කලෙක වර්ණනාවෙහි කෙළවරට යන්නෙමුද? එහෙයින් යමක් යමක් පෙරකියනලද්දේද, ඒ සියල්ල මනාකොට සලකාබලා ඒ ඒ තන්හි අර්ථීයද යොජනාද දතයුතුය. පෙර නොකියූ නොපැහැදිලි අර්ථීඇති යම් කිසිවක් වේනම් ඒ සියල්ල අපිම විස්තරකරන්නෙමු. **'රජකත්ථරණං ගන්ත්වා'** රදතොටට ගොස්. යම් හෙයකින් එහි රදවු රෙදි අතුරත්ද, එහෙයින් එතැන රජකත්ථරණයි කියනුලැබේ. **'රජකභණ්ඩිකං'** රදවුන්ගේ රෙදිපොදිය. රදවු සවස්කාලයෙහි

නුවරට පිවිසෙන්නාහු බොහෝ රෙදි එක් එක් පොදියට බඳිත්. ප්‍රමාද හෙතුවෙන් ඔවුන් නොදකිත්ම, ඒ රෙදිපොදිවලින් එකක් **'අවහරිත්වා'** සොරකම්කොට යනඅර්ථයි.

'ගාමෝ නාම'යන මේආදිය **'ගාමා වා අරඤ්ඤා වා'** යන මෙහි කියනලද ගමෙහි හා වනයෙහි ප්‍රභෙද දක්වනුපිණිස වදරණලද්දේය. එහි යම්කිසි ගමක මලයජනපදයෙහි මෙන් එක්ම කිළියක් එක්ම ගෙයක්වේද, මෙය **එකකුටිකගාම**නම්වේ. මේනයින් අන්‍ය ග්‍රාමයෝ ද දතයුත්තාහ. යම් ග්‍රාමයක් මිනිසුන්ගේ අභාවයෙන් මුළුමනින් යකුන්විසින් පිරිගාකරන ලද්දේද මනුෂ්‍යයෝ යම්කිසි කරුණක් නිසා නැවත එනුකැමතිවම යම්කිසි තැනකින් නික්මගියාහු වෙත්ද, එතැන **අමනුස්සගාම** නම්වේ. **පරිකිත්ත**නම් ගඩොලින් කළ පවුරු ආදිකොට යටත්පිරිසෙයින් කටු අතුවලින් හෝ වටකරණ ලද්දේය. වීටි පිහිටුවීම්ආදිවසයෙන් නොපිහිටුවා යම්සේ ගෙරිහු දෙතුන්දෙන ඒ ඒ තැන ලගිත්ද මෙසේ ඒ ඒ තැන ගෙවල් දෙකතුණක්කොට විසූතැන **ගොනිසාදිනිවිට්ඨගාම**නම්වේ. **'සත්ථා'** පාගමනින් යන වෙළඳ සමූහය. ගැල්නැග යන වෙළඳ සමූහයයන මොවුන් අතුරෙහි යම්කිසි වෙළෙඳ සමූහයක් සත්ථනම්වේ. මේ ශික්ෂාපදයෙහිද නිගම හා නගරද ග්‍රාමග්‍රහණයෙන් ගන්නාලදැයි දතයුතුය.

'ගාමූපචාරෝ' යනාදිය වනයෙහි සීමාව දක්වනුපිණිස වදරණලද්දේය. **'ඉන්දඛීලෙ ඨිතස්ස'** අනුරාධපුරයෙහිමෙන් යම් ගමක දෙරටු, එලිපත්, කණු දෙකක්වේද, එහි ඇතුල්එලිපත වෙතසිටියාවූ එහි පිටතඑලිපත් කණුවවනාහි අභිධම් නයින්වන සඩෙක්ෂපයට යන්නේය. යම් ගමක එක් එලිපත් කණුවක් නැත්තේද එහි ගම් දෙරබා මැදම ඉන්දඛීලයි කියනුලැබේ. **'ගාමදවාරබාහානං වෙමජ්ඣෙ ඨිතස්ස'** යනුඑහෙයින් කියනලදී. **'මජ්ඣිමස්ස'** මැදුම් බලඇති පුරුෂයක්හුගේ ප්‍රමාණයෙන් මධ්‍යම පුරුෂයක්හුගේනොවේ. අල්පශක්ති ඇත්තහුගේ නොවේ. මහත්ශක්ති ඇත්තහුගේ නොවේ. මධ්‍යමශක්ති ඇත්තහුගේ'යි කියනලද්දේවේ. **'ලෙඩ්ඩුපාතෝ'** යම්සේ මාගමක් කවුඩන් පලවාහැරීමට කෙලින්ම අත ඔසොවා කැටක් දමාගසාද, යම්සේ උදකුක්ඛිපයෙහිදී දිය දමාගසත්ද, මෙසේ දමා නොගසා යම්සේ තරුණ මනුෂ්‍යයෝ තමන්ගේ ශක්තිය දක්වමින් අත දිගුකොට කැටය දමාගසත්ද, මෙසේ දමාගැසූ කැටය වැටුනුතැනය. වැටුනු තැනින් පෙරැළීගොස් යම් තැනක රැඳේද, එතැන නොගතයුතුය. **'අපරික්ඛිත්තස්ස ගාමස්ස සමන්තා පරූපචාරෙ ඨිතස්ස මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතෝ'** යන මෙහිවනාහි පියයි කෙළවරින් දියවැටෙනතැන සිටි බලමැදුම් පුරුෂයකුවිසින් දමූ කුල්ල

වැටුනුතැන හෝ මොහොල වැටුනුතැන හෝ සරූපචාරනම්වේ. ඒ සරූපචාරයෙහි සිටියහුවිසින් දමා ගැසූ කැටය වැටුනු තැන ගාමූපචාරයි **කුරින්දි** අටුවාවෙහි කියනලදී. **මහාපච්චරියෙහිද** කියනලද්ද එබඳුමය. **මහාඅට්ඨකථා**වෙහිවනාහි 'සර, සරූපචාර, ගාම, ගාමූපචාරයි මාතෘකා තබා පියසිඅගින් දියවැටෙනතැනින් ඇතුළත **සර** නමැයිද, පියසි අගින් දියවැටෙන තැනින්ඇතුළත දෙරකඩසිටි මාගමක් බඳුන් සේදූ යම්දියක් දමාද, ඒ දිය වැටුනුතැනද, ඇතුළතගෙයි සිටි මාගමකවිසින්ම පියවිගතියෙන් පිටතට දමූ කුල්ල හෝ මුස්න හෝ වැටුනුතැනද, ගෙරින්ගේ ඇතුල්වීම වළකනුපිණිස ගේදොරියෙහි දෙකොන් සම්බන්ධකොට මැද කඩොල්ලක් තබා කළ වැටෙන් පරික්ෂේපයදයන මේ සියලු තැන් **සරූපචාර**නම්. ඒ සරූපචාරයෙහි සිටි බල මැදුම් පුරුෂයෙකුවිසින් දමාගැසූ කැටය වැටුනු තැනින් ඇතුළත **ගාම**නම්. එතැන්හි සිට දමා ගැසූ අන් කැටක් වැටුනුතැනින් ඇතුළත **ගාමූපචාර**නමැයිද කියනලද්දේය. මේ මෙහි පමණවේ. මෙහි යම්සේද එසේ සියලු තන්හි යම් යම් අට්ඨකථාවාදයක් හෝ සථවිරවාදයක් හෝ පසුව කියනුලැබේද, ඒම ප්‍රමාණවශයෙන් දතයුතුය. **මහාඅට්ඨකථා**වෙහි යම් මේ ප්‍රමාණයක් කියනලද්දේද, එය පෙළට විරුද්ධවූවක් සේ පෙණේ. පෙළෙහි 'සරූපචාරයෙහි සිටි බලමැදුම් පුරුෂයෙකුවිසින් දමාගැසූ කැටය වැටුනුතැනැ'යි මෙපමණක්ම දක්වනලද්දේය. අට්ඨකථාවෙහිවනාහි ඒ කැටය වැටුනු තැන, ග්‍රාමසඞ්ක්ෂපයකොට එයින් ඔබ්බ ගාමූපචාරයි කියනලදය. මේ සියල්ල පෙළෙහි වදරණුලදයි කියනුලැබේ. මෙහි අදහස දතයුතුය. හෙද අට්ඨකථාවායඨියන්විසින්ම දන්නාලද්දේය. එහෙයින් යම්සේ **'සරූපචාරෙ ඨිතස්ස'**යි සරූපචාරලක්ෂණය පෙළෙහි නොවදරණුලද්දේ නමුත් අට්ඨකථාවෙහි කියුලෙසින් ගන්නාලද්දේය. සෙස්සද මෙසේ ගතයුතුය.

එහි මේ ක්‍රමයවේ: මෙහි පවුරුආදියෙන් වටකළ ගම, වටනොකළ ගමැයි ගම දෙවැදරුම්වේ. එහි වටකළ ගමෙහි වටකිරීමම පිරිසිදීමවේ. එහෙයින් ඒ ගමෙහි පිරිසිදීම වෙනම නොකියා 'ගාමූපචාරයනම් වටකළ ගමෙහි එල්පත්කණුවෙහි සිටි බලමැදුම් පුරුෂයෙකුවිසින් දමාගැසූ කැටය වැටුනුතැනැ'යි පෙළෙහි වදරණුලද්දේය. වටනොකළ ගමෙහි ග්‍රාමපරිවෙෂ්දය කියයුතු වන්නේය. එහෙයින් ඒ ගමෙහි පරිවෙෂ්දය දක්වනුපිණිස 'වටනොකළ ගමෙහි සරූපචාරයෙහි සිටි බලමැදුම් පුරුෂයෙකුවිසින් දමාගැසූ කැටය වැටුනු තැනැ'යි පෙළෙහි වදරණුලද්දේය. වටනොකළ ගමෙහි පරිවෙෂ්දය දක්වනුපිණිස 'වටනොකළ ගමෙහි සරූපචාරයෙහි සිටි බලමැදුම් පුරුෂයෙකුවිසින් දමාගැසූ කැටය වැටුනු තැනැ'යි පෙළෙහි වදරණුලද්දේය. ගමෙහි පිරිසිදීම දැක්වූකල්හි ගාමූපචාර

ලක්ෂණය පෙරකියූ ලෙසින්ම දතහැකියයි නැවත 'එහි සිටි මැදුම්බලැති පුරුෂයෙකුවිසින් දමාගැසූ කැටය වැටුනු තැනැ'යි නොවදරණ ලද්දේය. යමෙක්වනාහි ඝරූපචාරයෙහි සිටියහුගේ ලෙඩඩුපාතයම ගාමූපචාරයයි කියාද, ඔහුට ඝරූපචාරය ගමවන්නේය. එහෙයින් ඝර - ඝරූපචාර - ගාම - ගාමූපචාරයන මේ විභාගය මිශ්‍රකරණුලැබේ. අමිශ්‍රවශයෙන්ම මෙහි නොකල්හි ගම්වැදීම් ආදියෙහි විනිශ්චය දතයුතුය. එහෙයින් පෙළද අටුවාවද සසඳ කියූලෙසින්ම මෙහි ගාම - ගාමූපචාර දතයුතුය. යම් ගමක් පෙර මහත්වතුබූයේ පසුකාලයෙහි කුලයන් නැසීගියකල්හි කුඩාවේද, ඒ ගම ඝරූපචාරයෙහි සිට දමාගැසූ කැටය වැටුනු තැන සිටම පිරිසිදිය යුතුය. වටකළ නොකළ මේ ගමෙහි පළමු පිරිසිදීම පමණනොවේමය.

'අරඤ්ඤං නාම ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච' යනුවිසින් යථොක්ත ලක්ෂණ ඇති මේ ගාම - ගාමූපචාර හැර මේ අදින්නාදන ශික්ෂාපදයෙහිදී ඉතිරි පෙදෙස අරණ්‍යනමැයි දතයුතුය. අභිධම්යෙහිවනාහි **'අරඤ්ඤං'** යනු එලිපත්කණුවෙන් පිටතට නික්මසිටි යම් පෙදෙසක්වේද, මේ සියලු පෙදෙස අරණ්‍යයි කියනලද්දේය. ආරණ්‍යක ශික්ෂාපදයෙහි ආරණ්‍යක සෙනාසනයනම් දුනුපන්සියයක් ඇති පශ්චිමසෙනාසනයයි කියනලදී. ඒ සෙනාසනය ගම් එලිපත්කණුවපටන් නගාගන්නාලද ඇදුරු දුන්නෙන් පන්සියයක් දුනු පමණයයි දතයුතුය. මෙසේ **'ගාමා වා අරඤ්ඤා වා'**යන මෙහි අර්ථය බෙද දක්වන්නාවූ භාග්‍යවතුන්වහන්සේවිසින් ඝර-ඝරූපචාර ගාම-ගාමූපචාර අරඤ්ඤ යි පාපභික්ෂුන්ට 'මාවිසින් ගමින් නො ගන්නාලද ය, වනයෙන් ගන්නාලදය' යනාදිලෙසින් යම්තමකිනුත් ඉඩ නොතබනුපිණිස පස් කොටසක්කොට දක්වා වදරණලද්දේය. එහෙයින් ගෘහයෙහිදී හෝ ගෘහොපචාරයෙහිදී හෝ ග්‍රාමයෙහිදී හෝ ග්‍රාමොපචාරයෙහිදී හෝ වනයෙහිදී හෝ පාදයක් වටිනා භාණ්ඩයෙහිපටන් සස්වාමිකවූ භාණ්ඩයක් සොර සිතින් ගන්නහුට පාරාජිකයමැයි දතයුතුය.

දැන් **'අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියෙය්‍ය'** යනාදීන්ගේ අර්ථී දක්වනුපිණිස **'අදින්නං නාම'**යනාදිය වදළසේක. එහි **අදින්නං** යනු දන්නපොනශික්ෂාපදයෙහි තමන් සතුවූද නොපිළිගත් කැපය වැළඳිය යුතුයයි කියනුලැබේ. මෙහිවනාහි අන්සතු සස්වාමිකවූ යම්කිසි භාණ්ඩයක්වේද, ඒ මේ භාණ්ඩය ඒ හිමියන්විසින් කයින් හෝ වචනයෙන් හෝ නොදෙනලද්දේනුයි **අදින්න** නම්වේ. තමන්ගේ අතින් හෝ පෙර තුබූතැනින් හෝ බැහැර නොකරණුලද්දේනුයි **අනිස්සට්ඨ** නම්වේ. පෙර තුබූතැන තුබුනේද බලාපොරොත්තු රහිතබැවින් නොහරණුලද්දේනුයි **අපරිච්චත්ත** නම්වේ. ආරක්ෂාසංවිධානයෙන් රක්නාලදබැවින් **රක්ඛිත**

නම්වේ. කරඩු පෙට්ටගම්ආදියෙහි බහා රක්නාලදබැවින් **ගොපිත** නම්වේ. 'මේ මාගේයයි තෘෂ්ණාමමත්වයෙන් මමායනය කළබැවින් **මමායිත** නම්වේ. ඒ අපරිත්‍යාගරක්ෂණගොපනයන්ගෙන් ඒ භාණ්ඩස්වාමීවූ අන්‍යයන්විසින් පරිගෘහීතබැවින් **පරපරිග්ගහිත** නම්වේ. මේය අදිත්තනම්.

'ථෙය්‍යසඞ්ඛාතං'යන මෙහි **ථෙනෝ** යනු සොරතෙමේය. සොරහුගේ භාවය **ථෙය්‍ය**නම්. පැහැරගැනීමපිණිස උපදින සිතට මේ නමක්වේ. සඞ්ඛාසඞ්ඛාතං,යනු අර්ථවශයෙන් එකක්වේ. කොටසට මේ නමකි. **'සසාහ නිදනා හි පඤ්චසඞ්ඛා'**යනාදිතන්හි මෙනි. ථෙය්‍යවූයේත් හේමය, සඞ්ඛාතවූයේත් හේමනුයි ථෙය්‍යසඞ්ඛාතනම්. ථෙය්‍යචිත්තසඞ්ඛ්‍යාතවූ එක් චිත්තකොට්ඨාසයක්යන අර්ථයි. මෙය කරණාර්ථයෙහි ප්‍රථමාවචනයි. එහෙයින් සොරබැවින්යුත් සිත් කොටසිනැයි අර්ථවශයෙන් දතයුතුය. යම් මහණෙක් සොරසිත් කොටසින් පැහැරගනීද, ඒ මහණ යම් හෙයකින් සොරසිත් ඇත්තේවේද, එහෙයින් අකුරු නොසලකා අර්ථය දක්වන්නට **'ථෙය්‍යචිත්තෝ අවහරණචිත්තෝ'**යි මෙසේ මේ පදයේ පදභාජනය දක්වනලදයි දතයුතුය.

'ආදියෙය්‍ය -පෙ- සඞ්ඛෙය්‍ය විඤ්ඤාපෙය්‍ය'යන මෙහිවනාහි ප්‍රථමපදය අභියොගවසයෙන් වදරණලද්දේය. දවීතියපදය අන්හු අයත් භාණ්ඩයක් පැහැරගන්නට යන්නහුගේවසයෙන්, තෘතීයපදය රැකීමටතැබූ භාණ්ඩයන්ගේවසයෙන්, චතුර්ථපදය සවිඥානක වස්තූන්ගේවසයෙන්, පඤ්චමපදය ගොඩබිම බහාතබනලද භාණ්ඩයන්ගේවසයෙන්, ෂඨපදය කල්පනාකිරීම්වසයෙන් හෝ අයබදු ගැනීම්වසයෙන් හෝ වදරණලදයි දතයුතුය. මෙහි යෙදීමවනාහි එක් භාණ්ඩයක්වසයෙන්ද, නානාභාණ්ඩයන්ගේවසයෙන්ද්වේ. එක් භාණ්ඩයක්වසයෙන්ද ලැබෙනුයේ සවිඥානකයන්ගේවසයෙන්මලැබේ. නානාභාණ්ඩයන්ගේවසයෙන්ද ලැබෙනුයේ සවිඥානක අවිඥානකයන්ගේ මිශ්‍රයෙන් හෝ ලබයි.

එහි නානාභාණ්ඩයන්ගේවසයෙන් යොජනාව පළමුකොට මෙසේ දතයුතුය. **'ආදියෙය්‍ය'** අන්හුඅයත්වූ පුෂ්පාරාම ඵලාරාමාදීවූ යම්කිසි තැනක් හෝ දැයක් අන්හුඅයත්යි දැන දැන තමන් සතුකරගැනීමෙහි සොරසිතින් අභියොග කෙරේද, ඔහුට දුක්කටාපත්තියවේ. මොහු හා යුක්ති කියා මා සතුදැය ලබම්ද, නොලබම්දැයි වස්තුහිමියාට විමති උපදවාද ථුල්ලච්චයාපත්තියවේ. හිමිතෙමේ 'මට නොවන්නේය'යි බලාපොරොත්තුව අත්හරිද පාරාජිකාපත්තියවේ.

'හරෙය්‍ය' අන්හු අයත් භාණ්ඩයක් හිසින් ගෙන යනුයේ හිසෙහිවූ ඒ භාණ්ඩය සොරසින් ඇත්තේ ආමර්ශනය කෙරේද, දුක්කටාපත්තියවේ. සොලවාද ථුල්ලච්චයාපත්තියවේ. කරට බාගනීද පාරාජිකාපත්තියවේ.

‘අවහරෙය්‍ය’ රූකීමපිණිස වෙතතැබූ භාණ්ඩයක් නැවත එහි හිමියාවිසින් ‘මාගේ භාණ්ඩය දෙව’යි කියනුලබන්නේ ‘මම නොගනිමි’යි කියාද, දුක්කටාපත්තියවේ. හිමියාට විමති උපදවාද, ථුල්ලච්චයාපත්තියවේ. හිමිතෙමේ ‘එය මට නොදෙන්නේය’යි බලාපොරොත්තුව අත්හරීද, පාරාජිකාපත්තියවේ.

‘ඉරියාපථං විකොපෙය්‍ය’ අන්‌හුඅයත් භාණ්ඩයක්, ගෙන යන්නහුත්සමග රවටාගෙන යන්නෙමියි පළමුපිය මාරුකෙරේද, ථුල්ලච්චයාපත්තියවේ. දෙවනපිය මාරුකෙරේද පාරාජිකාපත්තියවේ.

‘ඨානා චාවෙය්‍ය’ ගොඩබිම තුබූ භාණ්ඩය සොරසිත්ඇත්තේ ආමශීනය කෙරේද, දුක්කටාපත්තියවේ. සොලවාද, ථුල්ලච්චයාපත්තියවේ. තුබූතැනින් පහකෙරේද පාරාජිකාපත්තියවේ.

‘සඞ්කෙතං විනිනාමෙය්‍ය’ සලකා ගත්තැනින් පළමුපිය ඉක්මවාද ථුල්ලච්චයාපත්තියවේ. දෙවනපිය ඉක්මවාද පාරාජිකාපත්තියවේ. තවද පළමුපිය අයබදුගන්නා තැන ඉක්මවා තබාද, ථුල්ලච්චයාපත්තියවේ. දෙවනපිය ඉක්මවා තබාද පාරාජිකාපත්තියවේ. මේ මෙහි නානාභාණ්ඩයන්ගේවසයෙන් යොජනාය.

එක් භාණ්ඩයක්වසයෙන්වනාහි සඝාමිකවූ දසයෙකු හෝ තිරිසන් හෝ පෙරකියූ අභියොගාදි ක්‍රමයකින් ගනයි හෝ ගෙනයයි හෝ පැහැරගනීයි හෝ ඉරියවු වෙනස්කරයි හෝ තුබූතැනින් පහකරයි හෝ පිරිසිදීම ඉක්මවයි හෝයනු මේ මෙහි එක් භාණ්ඩයක්වසයෙන් යොජනාය.

අනෙකක්වේ: මේ පදසය වණ්නාකරන්නහුවිසින් පඤ්චක පස එක්කොට පස්විසිඅවහාරද දැක්විය යුතුය. මෙසේ වණ්නාකරන්නහුවිසින්ම මේ අදින්නාදනපාරාජිකය මැනවින් වණ්නාකරණලද්දේවේ. මෙතැනද සියලු අත්ථකථා අවුල්වූවාහු කැළඹීගියාහු දැනගතනොහැකි විනිශ්චය ඇත්තාහ. ඒ එසේමය. සියලු අත්ථකතාවන්හි පෙළෙහි **‘පඤ්චහි ආකාරෙහි අදින්නං ආදියන්නස්ස ආපත්ති පාරාජිකස්ස පරපරිග්ගහිතඤ්ච හොති’**යනාදික්‍රමයෙන් යම් ඒ අවහාරාඩඛ දක්වනලද්දේද, ඒ අවහාරාඩඛද ගෙන කිසිතැනක එක් පඤ්චකයක් දක්වනලද්දේය කිසිතැනක **‘ඡහාකාරෙහි’**යි ආවුන්සමග පඤ්චකදෙකක් දක්වනලද්දේය. මොවුහුම පඤ්චකයෝ නොවෙත්. යම් තැනෙකවනාහි එක්එක් පදයකින් අවහාරය සිදුවේද, එය පඤ්චකනමැයි කියනුලැබේ. **‘පඤ්චහාකාරෙහි’**යන මෙහිවනාහි **‘පරපරිග්ගහිතං’** යනාදීවූ සියලු පදයන්ගෙන්ම එක්ම අවහාරයක් ගැනේ. එහි ලැබෙන යම්ම පඤ්චකකෙනෙක් දක්වනලද්දහුද,

ඒ සියලුම පඤ්චකයන්ගේද අර්ථය නොදක්වනලද්දේය. මෙසේ මෙතන්හි සියලු අර්ථකථාවෝ අවුල්වූවාහු කැළඹීගියාහු දැනගත නොහැකි විනිශ්චය ඇත්තාහුද එහෙයින් පඤ්චකපස එක්කොට දක්වන මේ පස්විසිඅවහාරයෝ මනාකොට සලකාබැලියයුත්තාහ. පස්පඤ්චකනම්:

නානාභණ්ඩපඤ්චක - එකභණ්ඩපඤ්චක - සාහත්ථිකපඤ්චක - පුබ්බපයොගපඤ්චක - ථෙය්‍යාවහාරපඤ්චක යනමේය.

එහි නානාභණ්ඩ පඤ්චකය හා එකභණ්ඩපඤ්චකයද, ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය, ඉරියාපථං විකොපෙය්‍ය, ඨානාචාවෙය්‍ය' යන මේ පදයන්ගේවිසයෙන් ලැබෙන්නේය. ඔවුහු පෙර යොද දැක්වුලෙසින්ම දතයුත්තාහ. යම් මේ **'සංකෙතං විතිනාමෙය්‍ය'**යන මේ සවනපදයක්වේද, එය පරිකපපාවහාරයටද, නිස්සගගියාවහාරයටද සාධාරණවේ. එහෙයින් ඒ සවන පදය තෙවන පස්වන සාහත්ථික - ථෙය්‍යාවහාර පඤ්චකයන්හි ලැබෙන පදයන්ගේවිසයෙන් යෙදියයුතුය. නානාභණ්ඩපඤ්චකය හා එකභණ්ඩපඤ්චකය කියනලද්දේය.

සාහත්ථිකපඤ්චකය කවරේදයත්:- සාහත්ථික - ආණත්තික - නිස්සගගිය - අත්ථසාධක - ධුරනික්ඛිපයි අවහාර පසක්වේ. එහි **සාහත්ථිකනම්**, අන්හුඅයත් භාණ්ඩයක් සියතින් ගැනීමය. **ආණත්තිකනම්**, අසුවල් තැනැත්තහුගේ භාණ්ඩය ගනුවයි ඇණවීමය. **නිස්සගගියනම්**, අයබදු ගන්නාතැන ඇතුළත සිටියේ පාරාජිකයට පමණවන භාණ්ඩයක් අයබදු ගන්නාතැනින් පිටතට හෙළාද, පාරාජිකාපත්තියවන්නීය, යන මේ සමග **'සඞ්කෙතං විතිනාමෙය්‍ය'** යන මේ පදය යෙදීම ලබාද ඒ ය. **අත්ථසාධකනම්**, 'අසුවල් භාණ්ඩය යම් කලක ගතහැක්කේද එකල්හි ගණුවයි අණකෙරේද ඒ ය. එහි අණලදුයේ අන්තරායක් නැතිව එය ගනීද, අණකළ තැනැත්තේ ඇණවූ කෙණෙහිම පාරාජිකවේ. අවහාරකතෙමේ සොරාගත්කල්හි පාරාජිකවේ. මේ අත්ථසාධකයයි. ධුරනික්ඛිපයවනාහි රූකීමපිණිස තමන්වෙත තැබූ භාණ්ඩයන්ගේවිසයෙන් දතයුතුය. මේ සාහත්ථිකපඤ්චකයයි.

පුබ්බපයොගපඤ්චකය කවරේදයත්: පුබ්බපයොග - සහපයොග - සංවිදවහාර - සඞ්කෙතකම්ම - නිමිත්තකම්මයි අන්‍යවූද අවහාර පසක්වේ. එහි අණකිරීම්වසයෙන් පුබ්බපයොගය දතයුතුය. තුබූතැනින් පහකිරීම් ආදීහුද මෙහි ඇතුළත්වෙත්. සංවිදවහාරාදීවූ අන්‍යවූ ත්‍රිවිධ ප්‍රයොග පෙළෙහි ආලෙසින් දතයුත්තේය. මේ පූර්ව්‍රයොගපඤ්චකයයි.

ථෙය්‍යාවහාරපඤ්චකය කවරේදයත්: ථෙය්‍යාවහාර - පසය්හාවහාර - පරිකප්පාවහාර - පටිච්ඡන්නාවහාර - කුසාවහාර යි අන්‍යවූද අවහාරපසක්වේ. එහි යමෙක් ගෘහසන්ධි බිඳීම් ආදියකොට අන්හුවිසින් නොදක්නාලද්දේ ගනීද, තුලාකුට - මානකුට - කහවණුආදියෙන් අන්හු රවටා හෝ ගනීද, මෙසේ ගැනීම ථෙය්‍යාවහාරනම්. මැඩලා බලාත්කාරකම්කොට ගැනීම පසය්හාවහාරනම්. භාණ්ඩවසයෙන් හා අවකාස වසයෙන් කල්පනා කොට ගැණීම පරිකප්පාවහාර නම්. තණපත්ආදියෙන් ඇතිලිමුදුආදිය වසාදමා පසුව ගැනීම පටිච්ඡන්නාවහාරනම්. කුසපත්කොට පෙරළාගැනීම කුසාවහාර නම්. ඒ අවහාරපසද **'අඤ්ඤතරෝ භික්ඛු සඞ්ඝස්ස චීවරෙ හාරියමානෙ ථෙය්‍යචිත්තෝ කුසං සඞ්කාමෙත්වා චීවරං අගගහෙසි'**යන මේ කුසසඞ්කාමණ වත්‍තුවෙහිදී විත්‍තාරවශයෙන් කියන්නෙමු. මේ ථෙය්‍යාවහාර පඤ්චකයයි.

මෙසේ මේ පඤ්චකපස එක්කොට පස්විසිඅවහාර දතයුතුය. මේ පඤ්චකපසෙහි දක්ෂවූ විනයධරයාවිසින් අවතීර්ණවත්‍තුව වහා විනිශ්චය නොකොට කරුණුපසක් බැලියයුතුය. ඒ කරුණුපස පුරාණයෝ:

'වත්‍ථුං කාලඤ්ච දෙසඤ්ච - අග්ඝං පරිභොගපඤ්චමං,
තුලයිත්වා පඤ්චඨානානි - ධාරෙය්‍යත්‍ථං විචක්ඛණෝ'යි

මෙසේකීහු.

විචක්ෂණතෙමේ වසතුවද කාලයද දෙශයද අගයද පස්වනපරිභොගයද යනකරුණුපස පරීක්ෂාකොට බලා අර්ථය දරන්නේය.

එහි **වත්‍ථුනම්** භාණ්ඩයයි. අවහාරකයාවිසින්වනාහි 'මාවිසින් මෙනම් භාණ්ඩය පැහැරගන්නාලද්'යි කියුකල්හිද ඇවැත නොනගාම 'ඒ භාණ්ඩය සඤ්චාමිකද අඤ්චාමිකද'යි පරීක්ෂා කටයුතුය. සඤ්චාමික භාණ්ඩයෙහිද හිමියන්ගේ ආලයසහිතබව හා ආලයරහිතබව පරීක්ෂා කටයුතුය. ඉදින් හිමියන්ගේ ආලය තුබ්බකාලයෙහි ඒ භාණ්ඩය පැහැරගන්නාලද්දේනම් භාණ්ඩයෙහි වටිනාකම සොයාබලා භාණ්ඩය අගයකරවා ඇවැත නැගියයුතුය. ඉදින් නිරාලයකාලයෙහි ගන්නාලද්දේ නම් පාරාජිකාපත්තියෙන් ඇවැත් නොනැගියයුතුය. භාණ්ඩහිමියන් භාණ්ඩය ඉල්ලාසිටිකල්හි භාණ්ඩය ගෙන්වනකල්හි භාණ්ඩය ඔවුනට දියයුතුය. මේ මෙහි වතයි. මේ අර්ථය පැහැදිලිකරනුපිණිස මේ වත්‍තුව දතයුතුය:

භාතිය රජුගේ කාලයෙහි මහසෑය පුදනුපිණිස දකුණුදිගින් එක්මහණෙක් සත්රියතක් පමණවූ කසාවතක් කරලාගෙන සෑමිදුලට පැමිණියේය. එකෙණෙහිම රජතෙමේද සෑය වඳිනුපිණිස එහි පැමිණියේය. එහෙයින් එහි මිනිසුන් ඇත් මැත් කරනකල්හි මහාජනයාගේ මහත් කැළඹීමක් වූයේය. එකල්හි ඒ මහණතෙමේ මහාජනයාගේ කැළඹීමෙන් පෙළුනේ කරින් ඇදවැටෙන කසාවත නොඳකම එතැනින් නික්මුනේය. නික්මගොස්ද කසාවත නොදක්නේ 'කවරෙක් මෙබඳු මහාජනකැළඹීමක් පවත්නාකල්හි කසාවත ලබාද, දැන් ඒ වස්ත්‍රය මාගේ නොවේය'යි බලාපොරොත්තුව අතහැර ගියේය. එහිම අන් මහණෙක් පසුව එනුයේ ඒ කසාවත දක සොරසිතින් එය ගෙන නැවත එහි විපිළිසරව 'මම දැන් අශ්‍රමණයෙක් වෙමි, සිවුරු හැර යන්නෙමි'යි සිත් උපන්කල්හි විනයධරයන් විචාරා දැනගන්නෙමියි සිතුයේය.

ඒ කාලයෙහි සව්පයෂ්ඨිධර විනයාචාර්‍යයන්අතුරෙහි ප්‍රධානවූ **චූලසුමන**නම් මහාස්ථවිරයන්වහන්සේ **මහාවිහාරයෙහි** වැඩවසනසේක. ඒ මහණතෙමේ ඒ මහතෙරුන්වෙත එළඹ ඉඩ ලබාගෙන තමන්ගේ කුකුසගැන විචාළේය. ස්ථවිරයන්වහන්සේ මහාජනයා පහවගියකල්හි ඔහුවිසින් පසුව අවුත් ගත්බව දැන 'දැන් මෙහි ඉඩක් ඇතැ'යි සිතා 'ඉදින් කසාවතහිමි මහණහු ගෙනඑන්නෙහිනම්, තට පිහිටක් කරන්නට හැකිය'යි කීහ. 'ස්වාමීනි! මම දැන් ඔහු කෙසේ දකින්නෙමිද' යි විචාළකල්හි 'ඒ ඒ තැන ගොස් සොයාබලවු'යි කීහ. ඒ මහණතෙමේ පස්මහ වෙහෙරෙහිද සොයාබලනුයේ කසාවත හිමි මහණහු නොදුටුයේය. ඉක්බිති ස්ථවිරයන්වහන්සේ 'කවර දිසාවකින් බොහෝ භික්ෂූහු පැමිණෙත්ද'යි ඔහුගෙන් ඇසූහ. 'ස්වාමීනි! දකුණුදිසාවෙනැ'යි ඒ මහණතෙමේ කියේය. 'එසේනම් කසාවත දිගින්ද පළලින්ද මැන තබව, තබා දකුණුදිසාවෙහි වෙහෙර පිළිවෙළින් සොයාබලා ඒ මහණ කැඳවාගෙන එව'යිකීහ. ඒ මහණතෙමේ එසේකොට කසාවත හිමි මහණහු දක ඒ මහණහු තෙරුන්වෙතට කැඳවාගෙන ආයේය. ස්ථවිරයන්වහන්සේ ඔහුවිසින් කරනලද ධුරනිඃක්ෂේපය අසා කසාවත අවුලාගත් මහණහුඅතින් 'මේ කසාවත කොතැනකදී දැකගන්නාලදද'යි විචාළාහුය. ඔහුද සියලු තොරතුරු කියාසිටියේය. ඉක්බිති ස්ථවිරයන්වහන්සේ 'තාවිසින් මේ කසාවත පිරිසිදුසිතින් ගන්නාලද්දේ වන්නේනම්, තට අනාපත්තියම වන්නීය, සොර සිතින් ගත්බැවින් දුක්කටයට පැමිණියේ වෙහිය, එහෙයින් එය දෙසා ඇවැත් නැත්තෙක් වෙව, මේ කසාවතද තමන් සතුකොට මේ මහණහුට දෙව' යි ඔහුටම කීහ. ඒ මහණතෙමේ අමායෙන් අභිෂෙක කරනලද්දෙකුසේ පරමාස්චාදයට පැමිණියේය. මෙසේ වස්තුව බැලියයුතුය.

කාලනම් සොරා ගත් කාලයයි. ඒ භාණ්ඩයම සමහර කලක මදක් අගනේය. සමහර කලක මහත්සේ අගනේය. එහෙයින් ඒ භාණ්ඩය යම් කලක සොරාගන්නාලද්දේද, ඒ කාලයෙහි ඒ භාණ්ඩයෙහි යම් ඇගීමක්වේද, ඒ ඇගීම අනුව ඇවැත නැගියයුතුය. මෙසේ කාලය බැලියයුතුය.

දෙසනම් අවහාරදෙශයයි. ඒ භාණ්ඩය යම් දෙශයක්හිදී සොරා ගන්නාලද්දේවේද, ඒ දෙශයෙහිම එම භාණ්ඩයෙහි යම් ඇගීමක්වේද, ඒ අගය කරනකොට ඇවැත කටයුත්තීය. බඩු උපදින දෙශයෙහි භාණ්ඩය මදක් අගනේවේ. අන්තන්හි මාහැගිවේ. මේ අර්ථයාගේ දැක්වීමපිණිස මේ මතු කියනුලබන වස්තුවේ:

මුහුදමැද දිවයිනෙක එක් මහණෙක්තෙමේ තමන්ට ලැබුනු මනාසටහන් ඇති නාලිකෙරඵලයක් ලියනපට්ටලයට නගා සක්තලියක් වැනි මනරම් පැන්තලියක්කොට එහිම තබා **සැගිරියට** ගියේය. අන් මහණෙක්තෙමේ මුහුදමැද ඒ දිවයිනට ගොස් එහිවූ විහාරයෙහි වසනුයේ ඒ තලිය දැක සොරසිතින් එය ගෙන **සැගිරියටම** ගියේය. එහිදී කැඳ වළඳන ඒ මහණහු අතතුබූ ඒ තලිය දැක තලිය හිමි මහණතෙමේ 'මේ තලිය කොතැනින් ලැබුවේ'යි ඔහුගෙන් ඇසීය. 'මාවිසින් මෙය මුහුදමැද දිවයිනෙන් ගෙනඑනලදැ'යි ඔහු කීයේය. එකල්හි තලිය හිමි මහණතෙමේ 'මේ තලිය තාසතු නොවේ, මෙය තාවිසින් සොරසිතින් ගන්නාලදැ'යි ඔහු සහමැදට ඇදගත්තේය. එහිදී විනිශ්චයක් නොලැබ මහාවිහාරයට ගියහ. එහි අණබෙර ගස්වා **මහාසෑය** සමීපයෙහි රැස්වීම කොට විනිශ්චය ඇරඹූහ. විනයධර සථවිරයන්වහන්සේලා එහි අවහාරය පැණවූහ. ඒ රැස්වීමෙහිදී විනයයෙහි දක්ෂවූ **ආහිධම්මිකගොදත්ත** මහා සථවිරයන්වහන්සේ 'මොහුවිසින් මේ තලිය කොතැනකදී සොරාගන්නාලදැ'යි ඇසූහ. මුහුදමැද දිවයිනෙහිදී ගන්නාලදැයි කියූකල්හි, නැවත 'මේ තලිය එහි කෙතෙක් අගීද'යි ඇසූහ. 'මෙය එහි කිසිත් නොඅගියි, එහි පොල්ගෙඩිය බිඳ මිදුලු කා පොල්කටුව බැහැරලන්නාහ, දරපිණිස වන්නේය'යි කීහ. 'මේ මහණහුවිසින් මෙහි කළ අත්කම් කොතරම් අගීද'යි ඇසූහ. 'මස්සක් හෝ උනුමස්සක් හෝ වටිය'යි කීයේය. එකල්හි 'සම්මාසම්බුදුරජානන්වහන්සේවිසින් මස්සකින් හෝ උනුමස්සකින් පණවනලද පාරාජිකයක් ඇත්තේද'යි මෙසේ කියූකල්හි 'මැනවි, මැනවි, මැනවින් කියනලද්දේය, මැනවින් විනිශ්චය කරනලද්දේය'යි එහි එක්ම සාධුකාරයක් වූයේය. එදවස හාතිය රජතෙමේද සෑය වඳිනුපිණිස නුවරින් නික්මුනේ ඒ සාධුනාදය අසා 'මේ කිමැ'යි විචාරා සියලුතොරතුරු පිළිවෙළින් අසා 'මා ජීවත්ව ඉන්දදී ආහිධම්මිකගොදත්ත මහාසථවිරයන්වහන්සේවිසින් භික්ෂූන්ගේද භික්ෂුණීන්ගේද ගිහියන්ගේද

අධිකරණය විනිශ්චය කරනලද්දේ මනාකොටම විනිශ්චය කරනලද්දේය, එහෙයින් උන්වහන්සේගේ විනිශ්චයෙහි නොසිටින්නහු රජඅණෙහි තබමි'යි නුවර අණබෙර ගැස්විය. මෙසේ දෙශය බැලියයුතුය.

අගයනම් භාණ්ඩයන්ගේ අගයයි. අලුත් භාණ්ඩයක් යම් අගයක්වේද, ඒ අගය පසුව පිරිහීයයි. අලුත සේදූ පාත්‍රය අටක් හෝ දසයක් හෝ යම්සේ අගිද, එය පසුව බිඳුනේ හෝ සිදුරුවූයේ හෝ ගැටයකින් පහරනලද්දේ හෝ මදඅගය ඇත්තේවේද, එහෙයින් සියලුකල්හි භාණ්ඩය පියවිඅගයෙන්ම නොකටයුතුය. මෙසේ අගය බැලියයුතුය.

පරිභොගනම් භාණ්ඩයන්ගේ පරිභොගයයි. පරිභොගය හෙතුකොටද වෑ පොරෝ ආදි භාණ්ඩයන්ගේ අගය පිරිහීයයි. එහෙයින් මෙසේ පරීක්ෂා කටයුතුය: ඉදින් කිසිවෙක් කිසිවෙක්හුගේ පාදයක් අගනා වෑයක් පැහැරගනීද, එහිදී 'තාවිසින් මේ වෑය කොපමණ මුදලකින් ගන්නාලදද'යි වැහිමියා විචාළයුතුය. 'ස්වාමීනි! පාදයෙකිනැ'යි කියූකල්හි 'කිම තාවිසින් මිලදී ගෙනම තබනලදද නොහොත් එය ප්‍රයොජන ගත්තෙහිද'යි විචාළයුතුය. 'ස්වාමීනි! එක් දවසක් මාවිසින් දහැට්ටක් හෝ පඩුපතුරු හෝ පාපිසනදර හෝ සිඳිනලද්දේ මුවහත් තබනලදැ'යි ඔහු කියානම් එකල්හි ඒ වෑයෙහි මුලින් තුබූ අගය පිරිහී ගියේයයි දතයුතුය. වෑයෙහි යම්සේද එසේ අඳුන්කුලාවෙහි හෝ අඳුන්කුරෙහි හෝ කෙස්සෙහි හෝ පිදුරෙන් හෝ වීපොතුවලින් හෝ ගඩොල්කුඩුවලින් හෝ එක් වරක් ගටා සේදූපමණින්ද අගය පිරිහෙන්නේය. ඊයම්ගුළියෙහි මෝරදත් කැපීමෙන්ද පිරිමැදීම් පමණින්ද, දියසළුව වරක් හැඳීමෙන් හා පෙරවීමෙන්ද ප්‍රයෝජනගැනීම්වසයෙන් උරහිසෙහි හා හිසෙහි තැබූපමණින්ද සහල්ආදිය පොළාලීමෙන්ද ඒ සහලින් සහල්ඇට එකක් හෝ දෙකක් බැහැරකිරීමෙන්ද, යටත්පිරිසෙයින් එහි වැටිහුන් මැස්සෙකු හෝ කුඹියෙකු හෝ උදුරාදැමූ පමණින්ද, හකුරුපිඩක මිහිරිබව දැනගනුපිණිස නියෙන් ඇණ කඩා ඉතා මදකුත් නගාගත් පමණින්ද අගය ගිලිහෙන්නේය. එහෙයින් පාදයක් අගනා යම් කිසිවක් කියූනයින්ම හිමියන්විසින් කළ පරිභොගය හෙතුකොට අගය අඩුකරණුලද්දේවේද, එය සොරාගත් මහණහට පාරාජිකාපත්තිය නොකටයුතුය. මෙසේ පරිභොගය බැලියයුතුය. මෙසේ මේ කරුණු පස පරීක්ෂාකොට විවක්ෂණතෙමේ අර්ථය දරන්නේය. ආපත්තිය හෝ අනාපත්තිය හෝ ගරුකාපත්තිය හෝ ලහුකාපත්තිය හෝ යථාසථානයෙහි තබන්නේය.

ආදියෙය්‍ය -පෙ- සඞ්ඛතං වීතිනාමෙය්‍ය යන
මේ පද විනිශ්චය නිමි.

——\\——

දැන් **'යථාරූපෙ අදින්නාදනෙ'**යනාදිය බෙදා දක්වන්නහුවිසින් යම් මේ **'යථාරූපං නාම'**යනාදිය වදරණලද්දේද, එහි **'යථාරූපං'** යම්බඳුවූ සඞ්භාව ඇත්තේය. එයවනාහි යම්හෙයකින් පාදයපටන්වේද, එහෙයින් **'පාදං වා පාදරහං වා අතිරෙක පාදං වා'**යනු වදළසේක. එහි පාදයෙන් නිල් කහවණුවක සිවුවනකොටස තරම්වූ අකුප භාණ්ඩයක්ම දක්වනසේක. පාදරහ යන මෙයින් පාදයක් අගනා කුප භාණ්ඩයයක්ද අතිරෙකපාදයන මෙයින් එ දෙකම දක්වනසේක. මෙපමණකින් සියලු අයුරින් දෙවන පාරාජිකාවට පොහොනා වසකුව දක්වා වදරණලද්දේය.

'පථබ්‍යා රාජා' මුළුපොළොවෙහි රජතෙමේය. **දඹදිව චක්‍රවර්ති අශොක** රජු හා සමානවූයේය. **සිංහල රජු** සමානවූ එක් දිවයිනක රජවූ යම් අන්‍යයෙක් හෝවේ. **'පදෙස රාජා'** එක් දිවයිනක පෙදෙසිරජතෙමේය. **බිම්බිසාර - පසෙනදි** ආදීන්මෙනි. යම් කෙනෙක් දිවයින් - පෙදෙස්හි එක් එක් දනවු වළඳත්ද, ඔවුහු **මණ්ඩලිකයන**. රජුන් දෙදෙනකුට අයත්වූ ප්‍රදෙශ දෙකක් අතර පිහිටි ගම් කිහිපයක අධිපතීහු **අන්තරභොගිකයන**. ධර්මවිනිශ්චය කරන්නෝ **අක්ඛදස්සයන**. ඔවුහු විනිශ්චයසභාවෙහි හිඳ අපරාධයන්ට සුදුසුපරිදි සොරුන්ගේ අත්පාසිඳීම්ආදිය නියමකරත්. සථානාන්තර ප්‍රාප්තවූ යම් අමාත්‍යයෝ හෝ රාජකුමාරයෝ හෝ කළඅපරාධ ඇත්තාහුවෙත්ද, ඔවුන් ගැන රජුට දන්වත්. බැරෑරුම්වූ කරුණු තුමූ විනිශ්චය නොකරත්. **'මහාමත්තා'** සථානාන්තරප්‍රාප්ත මහා මාත්‍යයෝය. ඔවුහුද ඒ ඒ ගම්හි හෝ නියම්ගම්හි හෝ හිඳ රාජකෘත්‍යය කරත්. **'යෙ වා පන'** අන්‍යවූද යම් කෙනෙක් රාජකුලයන් ඇසුරුකළාහු හෝ සියඉසුරු ඇසුරුකළාහු හෝ සිදීම් බිඳීම් නියමකරත්ද, ඒ සියල්ලෝද මේ අර්ථයෙහි රජහුයි ගැනෙත්. **'හනෙය්‍යුං'** තැළීමද කරන්නාහුය. සිඳීමද කරන්නාහුය. **'පබ්බාජෙය්‍යුං'** රටින් නෙරපන්නාහුය. **'චොරොසි'** සොරවෙහි, යන මේආදිය කියා පරිභව කරන්නාහුය. එහෙයින්ම **'පරිභාසො එසො'**යි වදළසේක. **'පුරිමං උපාදය'** මෙවුන්දම් සෙවනය කොට පාරාජිකාපත්තියට පැමිණි පුද්ගලයාපටන් සෙස්ස පෙරකියූ නයඇතිබැවින්ද පැහැදිළි අර්ථඇතිබැවින්ද ප්‍රකටමය.

මෙසේ උදෙසූ ශික්ෂාපදය පදපිළිවෙළින් විභාගකොට දැන් යම් ඒ **'ආදියෙය්‍ය'** යනාදීවූ සපදයෙන් සැකෙවින් ගතයුත්ත දක්වා සැකෙවින්ම **'පාදං වා පාදරහං වා අතිරෙකපාදං වා'**යි ගතයුතුභාණ්ඩයම දක්වනලද්දේය. ඒ භාණ්ඩය යම් යම් තැනක සිටියේද, යම් යම් ලෙසකින් ගැනීමට පැමිණේද, අනාගතයෙහි පාපිභික්ෂූන්ට යම්තමකිනුදු ගැනීමටඇති ඉඩපහසුකම් වළකාලනුපිණිස ඒ ඒ ලෙසින් විස්තරවශයෙන් දක්වාලන්නට **'භුම්මට්ඨං ථලට්ඨං'**යනාදි ක්‍රමයෙන් මාතෘකාව තබා **'භුම්මට්ඨං නාම**

භණ්ඩං භූමියං නික්ඛිත්තං හොති'යනාදි ක්‍රමයෙන් එහි විභඞ්ගය ගෙනහැර දැක්වූයේක.

එහි මේ නොපැහැදිලි පදයන්ගේ වණ්ණනාවසමග විනිශ්චයකථාය: **'නිධානං'** බිම කැන තබනලද්දය. **'පටිච්ඡන්නං'** පස්, ගඩොල් ආදියෙන් වසනලද්දය. **'භූමට්ඨං භණ්ඩං -පෙ- ගච්ඡති වා ආපත්ති දුක්කටස්ස'** මෙසේ බිම කැන හෝ වසා හෝ තුබුබැවින් බිම තුබූ ඒ භාණ්ඩය යම් මහණෙක් කිසියම් උපායකින් දැනගෙන එන්නෙමියි සොරසිත් ඇත්තේ රාත්‍රිකාලයෙහි නැගිටයේද, හෙතෙමේ ඒ භාණ්ඩය තුබූතැනට නොපැමිණුද සියලු කායවාක් විකාරයන්හි දුක්කටයට පැමිණේ. කෙසේදයත්: හෙතෙමේ වනාහි එය ගෙනෙනුපිණිස නැගී සිටිනුයේ යම් යම් අභපසඟක් සොලොවාද ඒ සියලුතැන දුක්කටයවේ. අඳනය පොරෝණය හඳීද, පොරොවාද, අත්වරක් අත්වරක් පාසා දුක්කටයවේ. මහත් නිධානයක් එකෙකුවිසින් ගෙනඑනු නොහැකිය. ඒ පිණිස දෙවැන්නෙකු සොයන්නෙමියි කිසියම් යහළුවෙකුගේ සමීපයට යනුකැමැත්තේ දෙර හරීද, පියවරෙහිද අත්වරෙහිද දුක්කටයවේ. දෙරවැසීම නිමිත්තකොටද අන්තන්හි යැමට උපකාර නොකිරීම නිමිත්තකොටද ඇවැත් නොවේ. ඔහු හොත්තැනට ගොස් 'මෙනම් ඇත්තේ'යි කැඳවාද, එබව සැලකොට 'එව යමු'යි කියාද, වචනයක් වචනයක් පාසා දුක්කටයවේ. නැගිට ඔහු වෙතට යනුකැමැත්තේ අඳනය පොරෝණය අඳීද, පොරොවාද දෙර හැර ඔහු වෙතටයේද, අත්වර පියවර දෙක්හි සියලුතැන දුක්කටයවේ. ඔහු 'අසුවල් තැනැත්තේ කොහිද, අසුවල් තැනැත්තේ කොහිද'යි ඔහුගෙන් විචාරයි. 'අසුවලාත් අසුවලාත් කැඳවා'යි කියනවචනයක් වචනයක්පාසා දුක්කටයවේ. රැස්වූ සියලුදෙනා දක 'මාවිසින් අසුවල්තැන මෙබඳු නිධානයක් දන්නාලද්දේය, යමු එය ගෙන පින්ද කරන්නෙමු, සුවසේ ජීවත්ද වන්නෙමු'යි කියාද, වචනයක් වචනයක් පාසා දුක්කටයමවේ. මෙසේ ලැබූ සහායයෙක් ඇත්තේ උදැල්ලක් සොයාද, ඉදින්වනාහි මොහුට තමන්ට අයත් උදැල්ලක් ඇත්තේද එය ගෙන එන්නෙමියි යන්නේද, ගන්නේද, ගෙන එන්නේද සියලුතන්හි අත්වර පියවරෙහි දුක්කටයට පැමිණේ. ඉදින් උදැල්ලක් නැත්තේනම් අන් මහණෙකුකරා හෝ ගිහියෙකුකරා හෝ ගොස් ඉල්ලාද, ඉල්ලනුයේද 'මට උදැල්ලක් දෙව, උදැල්ලෙන් මට ප්‍රයොජන ඇත්තේය, කිසි කටයුත්තක් ඇත්තේය, ඒ කටයුත්තකොට නැවත ගෙන එන්නෙමි'යි බොරු නොකියමින් ඉල්ලාද, වචනයක් වචනයක් පාසා දුක්කටයවේ. ඉදින් පිරිසිදුකළයුතු දිය අගලක් ඇත්තේය, විහාරයෙහි භූමිකම්මාත්තයක් ඇත්තේය'යි බොරු කියානම්, එහි යම් යම් වචනයක් අසත්‍යවේද, ඒ ඒ හැමවචනය නිමිත්තකොට

පාචිත්තියවේ. **මහාඅට්ඨකථා**වෙහිවනාහි සත්‍යවචනය හා අසත්‍යවචනය නිමිතිකොට දුක්කටයම කියනලද්දේය. එය ප්‍රමාද ලිඛිතයෙකැයි දතයුතුය.

අදින්නාදානය පිළිබඳ පූර්ව්‍රප්‍රයොගයෙහි පාචිත්තියස්ථානයෙහි දුක්කටයක්නම් නැත්තේය. ඉදින් උදැල්ලට මිටක්නැත්තේනම් මිටක් කරන්නෙමියි වැයක් හෝ පොරොවක් මුවහත් තබාද, ඒ පිණිසයේද, ගොස් වියලිදරකඩක් සිඳීද, සසීද, තළාද, සියලුතැන අත්වරපියවරෙහි දුක්කටයවේ. අමුරුකක් සිඳීනම් පාචිත්තියවේ. එයින්පසු සියලු ප්‍රයොගයන්හි දුක්කටයවේ. **සඩ්ඝභේදඨ කථා**වෙහි හා **මහාපච්චරියෙහිද** එහි හටගත් දවවැල් කැපීමපිණිස වැ පොරෝ සොයන්නවුන්ටද දුක්කටය කියනලද්දේය. ඉදින්වනාහි 'අපි යමක්හු වෙතින් වැ පොරෝ උදලු ඉල්ලන්නමෝනම්, ඔවුන්විසින් අපි සැකකරනලද්දමෝ වන්නෙමු. එහෙයින් ලොභයක් නගාගෙන කරමු'යි ඔවුන්ට මෙබඳු අදහසක්වේද, එතැනින් ලොභ උපදින තැනකට ගොස් ලොභබිජ නගාගැනීමපිණිස පොළොව කනිත්, එකල්හි අකැපපොළොව කනින්නාවූ ඔවුන්ට දුක්කටසමග පාචිත්තියාපත්තීහුවෙතියි **මහාපච්චරියෙහි** කියනලදී. මෙහි යම්සේද මෙසේ සියලු පාචිත්තියස්ථානයෙහි දුක්කටයෝම්වෙත්. ලොභබිජ ගෙන ඉන්පසු කරන සියලු ක්‍රියාවන්හි ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටයවේ. මුසාවාදය නිමිතිකොට පාචිත්තියවේ. පැසක් කරණු කැමැත්තෙන් වැල් කැපීම නිමිතිකොට පාචිත්තියවේ. සියල්ල පෙර කියූනයින්ම දතයුතුය.

'ගච්ඡති වා ආපත්ති දුක්කටස්ස' මෙසේ සොයාගත් යහළු උදලු - පැස් ඇතිව නිධානය තිබෙනතැනට යේද, පියවරක් පියවරක්පාසා දුක්කටවේ. ඉදින් යන්නේවනාහි මේ නිධානය ගෙන බුද්ධපූජාවක් හෝ ධම්පූජාවක් හෝ සඟබතක් හෝ කරන්නෙමි'යි කුසල්සිත් උපදවානම්, කුසල්සිතින් යෑමෙහි අනාපත්තිවේ. කුමක් හෙයින්දයත්: **'ථෙය්‍යචිත්තෙන දුතියං වා -පෙ- ගච්ඡති වා ආපත්ති දුක්කටස්ස'**යි වදළබැවිනි. මෙහි යම්සේද, එසේ සියලුතන්හි සොරසිත් නැත්තහුට අනාපත්තිවේ. මගින් ඉවත්ව නිධානය තිබෙන තැනට යනුපිණිස මග පිළියෙල කරනුයේ රුක්ලියආදිය කපාහරීද, පාචිත්තියවේ. වියලි දරකඩ කපාද, දුක්කටයවේ. එහි **'ජාතකං'** බොහෝකල් තබනලද නිදන්සැළිය මතුවෙහි හටගත් **'කට්ඨා වා ලතා වා'** හුදෙක් දරකඩ වැල්ම නොවේ. තෙත්වූ හෝ වියලුනු යම්කිසි තණරුක්වැල් ආදියක් සිඳින මහණහුට සහප්‍රයොගබැවින් දුක්කටමවේ. අටවැදරුම්වූම මේ දුක්කටය ධම්සඞ්ග්‍රාහක සථවිරයන්වහන්සේලාවිසින් මෙතැන එක්කොට දක්වනලදී: **පුබ්බපයොග දුක්කට - සහපයොගදුක්කට - අනාමාසදුක්කට -දුරූපච්චණ්ණදුක්කට - විතයදුක්කට - ඝත්තදුක්කට - ඝත්තිදුක්කට - පටිසාවදුක්කට**යි.

එහි **'ථෙය්‍යචිත්තෝ දුතියං වා පරියෙසති කුද්දුලං වා පිටකං වා පරියෙසති, ගච්ඡති වා ආපත්ති දුක්කටස්ස'**යන මෙය **ප්‍රඥප්තියොග දුක්කට**නම්වේ. මෙහි දුක්කටතන්හි දුක්කටයවේ. පාචිත්තියතන්හි පාචිත්තියමවේ. **'තත්‍රථ ජාතකං කට්ඨං වා ලතං වා ඡින්දති ආපත්ති දුක්කටස්ස'**යන මෙය **සහපයොගදුක්කට** නම්වේ. මෙහිවනාහි පාචිත්තියවසතුව හා දුක්කටවසතුව දුක්කටතන්හිම සිටියි. කුමක් හෙයිනදයත්: අවහාරය තමා සහප්‍රයොගබැවිනි. දශවිධරතන, සප්තවිධධාන්‍ය, සියලු ආවුධභාණ්ඩාදිය පහසනමහණහුට යම් දුක්කටයක් වදරණලද්දේද, මෙය **අනාමාසදුක්කට** නම්වේ. කෙහෙල් පොල්ආදීන්ගේ එහි හටගත් ඵල පහසන මහණහුට යම් දුක්කටයක් වදරණලද්දේද, මෙය **දුරූපචිණණදුක්කට** නම්වේ. පිඩුපිණිස හැසිරෙණ මහණහුගේ පාත්‍රයෙහි රජස වැටුනුකල්හි පාත්‍රය නොපිළිගෙන හෝ නොසෝද හෝ එහි භික්ෂාව ගන්නා මහණහුට යම් දුක්කටයක් වදරණලද්දේද, මෙය **විනයදුක්කට** නම්වේ. **'සුත්වා න වදන්ති ආපත්ති දුක්කටස්ස'**යන මෙය **සඤ්ඤාදුක්කට** නම්වේ. **'එකාදසසු සම්මුඛාසනාසු ඤත්තියා දුක්කටං'**යි යම් දුක්කටයක් වදරණලද්දේද, මෙය **ඤත්තිදුක්කට** නම්වේ. **'තස්ස භික්ඛවෙ භික්ඛුනො පුරිමිකා ච න පඤ්ඤායති, පච්ඡිසවෙ ච ආපත්ති දුක්කටස්ස'**යනමෙය **පච්ඡිසවදුක්කට**නම්වේ. මේවනාහි **සහපයොගදුක්කට**යයි. එහෙයින් **'යං කිඤ්චි අල්ලං වා සුක්ඛං වා තිණරුක්ඛලතාදිං ඡින්දන්තස්ස සහපයොගත්තා දුක්කටමෙව හොති'**යි වදරණලද්දේය.

ඉදින්වනාහි මේ මහණහුට එහි හටගත් තණ, රුක්, වැල්ආදිය සිඳ දැමූකල්හි ලජ්ජිධම්ය එළඹසිටිද, සංවරය උපදීද, සිදීම් හෙතුවෙන්වන දුක්කටය දෙසා මිදෙන්නේය. නැවත ධුරනිඃක්ෂෙපය නොකොට උත්සාහය ඇතිවම පස් කනීද, එකල්හි සිදීමෙන්වන දුක්කටය සන්සිදී යන්නේය. කැනීමෙන්වන දුක්කටයෙහි පිහිටාගනියි. අකැප පොළොව කනිනුයේද, මෙහි සහප්‍රයොගබැවින් දුක්කටයටම පැමිණේ. ඉදින්වනාහි හැමපැත්ත කැන නිදන්සැළිය මුලට පැමිණි මොහුට ලජ්ජිධම්ය එළඹසිටීද, කැනීමහෙතුකොටවන දුක්කටය දෙසීමෙන් මිදෙන්නේය.

'ව්‍යූහති වා' නැවත උත්සාහය ඇත්තේම පස් රැස්කෙරේද, එක්පසෙක රැස්කෙරේද, කැනීම නිමිතිකොටවන දුක්කටය සන්සිදෙන්නේය. රැස්කිරීම නිමිතිකොටවන දුක්කටයෙහි පිහිටාගනියි. ඒ පස්ද ඒ ඒ තැන ගොඩගැසීම කරණුයේ ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටයට පැමිණේ. ඉදින් රැස්කොටද ධුරනිඃක්ෂෙපය කෙරේද, ලජ්ජිධම්යට පැමිණේද, රැස්කිරීම නිමිතිකොට වන දුක්කටය දෙසීමෙන් මිදෙන්නේය.

‘උද්ධරති වා’ නැවත උත්සාහය ඇත්තේම පස් උදුරා පිටතහෙලාද, රැස්කිරීම නිමිතිකොට වන දුක්කටයෙහි පිහිටාගනියි. පස් වනාහි උදැල්ලෙන් හෝ අතින් හෝ පැසෙන් හෝ ඒ ඒ තැන හෙලණුයේ ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටයට පැමිණේ. ඉදින්වනාහි පස් බැහැරකොට නිදන්සැළිය ගොඩසිටියක් කොටද ලජ්ජීධර්මයට පැමිණේද, ඉදිරීම නිමිතිකොට වන දුක්කටය දෙසීමෙන් මිදෙන්නේය. නැවත උත්සාහය ඇත්තේම නිදන්සැළිය පහසාද, ඉදිරීම නිමිතිකොට වන දුක්කටය සන්සිඳෙන්නේය. පැහැසීම නිමිතිකොට වන දුක්කටයෙහි පිහිටාගනියි. පහසාද ලජ්ජීධර්මයට පැමිණෙතුයේ, පැහැසීම නිමිතිකොට වන දුක්කටය දෙසීමෙන් මිදෙන්නේය. නැවත උත්සාහය ඇත්තේම නිදන්සැළිය සොලවාද, පැහැසීමනිමිතිකොට වන දුක්කටය සන්සිඳෙන්නේය. **‘එතෘපෙති ආපත්ති ථුල්ලච්චයස්ස.** යන දෙදෙනාගේ වචනාර්ථයවේ: පළමුකොටවනාහි මෙහි නිදිතකොට කරනලද්දේය, බුදුරජුන්විසින් වදළ කෘත්‍යය වරදවා කරනලද්දේනුයි දුක්කටනම්වේ. නොහොත් නපුරුකොට කරනලද්දේය. විරූපවූ ඒ ක්‍රියාව භික්ෂූන්විසින් කළයුතු ක්‍රියාවන්ගේ මධ්‍යයෙහි නොහොබීනුයි මෙසේද දුක්කටනම්වේ. මෙය පරිවාරයෙහි:

‘දුක්කටන්ති ච යං වුත්තං - තං සුණොහි යථාතථං,
අපරද්ධං විරද්ධං ච - ඛලිතං යඤ්ච දුක්කටං,

යං මනුස්සෝ කරෙ පාපං - ආවී වා යදි වා රහෝ,
දුක්කටන්ති පවෙදෙන්ති - තෙනෙතං ඉති වුච්චතීති’යි

මෙසේ වදරණලද්දේය.

‘දුක්කට’යි යමක් වදරණලදද, ඒ අතීත තතුසේ අසව, ශාස්තෘන්වහන්සේවිසින් වදළපරිදි නොකොට නපුරුකොට කරනලද කුශලයට ප්‍රතිපක්ෂව වැරදිලෙසින් කරනලද ආර්‍යවංශ ප්‍රතිපදවට නොනැගුනුබැවින් වැරදීගිය යම් දුක්කටයක්වේද.

මිනිස්තෙමේ ප්‍රකටව හෝ රහසිගතව යම් පාපයක්කරන්නේද, එය දුක්කටයි ප්‍රකාශකෙරෙත්. එහෙයින් මේ ආපත්තිය දුක්කටාපත්තියි කියනුලැබේ.

අනිකවනාහි මහත්බැවින්ද, වරද බැවින්ද ථුල්ලච්චයනම්වේ. **‘සම්පරායෙ ච දුග්ගතිං තං හොති කටුකඵලං’**යනාදි තන්හිමෙන් මෙහි සංයොගභාවය දතයුතුය. එකක්හුගේ සමීපයෙහි දෙසියයුතු වරදඅතුරෙහි ඒ හා සමවූ මහත්වරදක් නැත්තේය. එහෙයින් මහත්බැවින්ද, වරදබැවින්ද ථුල්ලච්චයයි කියනලද්දේය. මෙද පරිවාරයෙහි:

'ථුල්ලච්චයන්ති යං වුත්තං - තං සුණොහි යථාතථං,
එකස්ස මූලෙ දෙසෙති - යො ච නං පතිගණ්හති,
අච්චයො තෙන පමො නත්ථි - තෙනෙතං ඉති වුච්චතීති'යි

මෙසේ වදරණුලද්දේය.

'ථුල්ලච්චය'යි යමක් වදරණුලදද, ඒ අර්ථය තතුයේ අසව. එකක්හුගේ සමීපයෙහි දෙසාද, යමෙක් එය පිළිගනීද, ඒහා සමවූ වරදක් නැත්තේද, එබැවින් මෙය ථුල්ලච්චය,යි මෙසේ කියතුලැබේ.

නිදන්සැළිය සොලවන්නහුටද ප්‍රයොගයක් ප්‍රයොගයක්පාසා ථුල්ලච්චයවේ. සොලවාද ලජ්ජිධම්යට පැමිණියේ ථුල්ලච්චය දෙසීමෙන් මිදෙන්නේය. සහප්‍රයොගයපටන්ම මෙහි පළමු පළමු ඇවැත සන්සිඳීයයි. සහප්‍රයොගය නොකොට ලජ්ජිධම්යට පැමිණියහුවිසින් පූර්ප්‍රයොගයෙහි යම් දුක්කටාපත්තියාපත්තීහු පැමිණියාහුද, ඒ සියල්ලෝ දෙසිය යුත්තාහ. සහප්‍රයොගයෙහිද එහි හටගත් රුක්, වැල්ආදිය සිඳීමෙහි බොහෝවූද දුක්කටාපත්තීහු පස් කැපීමට පැමිණ සන්සිදෙන්නාහ. කැනීම නිමිතිකොට එක්ම දුක්කටයක්වේ. කැනීම නිමිතිකොට උපන් බොහෝවූද දුක්කටාපත්තීහු පස් ගොඩගැසීමටද, පස් ගොඩගැසීම නිමිතිකොට උපන් බොහෝවූද දුක්කටාපත්තීහු පස් ඉදිරීමටද, පස් ඉදිරීම නිමිතිකොට උපන් බොහෝවූද දුක්කටාපත්තීහු පැහැසීමටද, පැහැසීම නිමිතිකොට උපන් බොහෝවූද දුක්කටාපත්තීහු සෙලවීමටද පැමිණ සන්සිදෙන්නාහ. පස් කැනීම් ආදියෙහිදී ලජ්ජිධම්ය උපන්කල්හි බොහෝවූද ආපත්තීහු වෙත්වා, එකක්ම දෙසීමෙන් සියල්ලෙන් මිදෙන්නේයයි **කුරුන්දට්ඨකථා**වෙහි කියනලදී. මේ පළමු ඇවැත්සන්සිඳීමද ඤත්තියෙන් දුක්කටයද, කම්වාක්‍ය දෙකින් ථුල්ලච්චයෙන්ද සන්සිදෙයි මෙසේ සූත්‍රයෙහි අනුශ්‍රාවණයන්හිම ආයේය. මේ දවිතීය පාරාජිකයෙහි අට්ඨකථාචාර්‍යප්‍රමාණයෙන් ගතයුතුය.

'ඨානා චාවෙති ආපත්ති පාරාජිකස්ස' යම් මහණෙක් නිදන්සැළිය සොලවාද ලජ්ජිධම්යට නොපැමිණුම ඒ නිදන්සැළිය තුබූතැනින් යටත්පිරිසෙයින් කෙසගක්පමණකුදු පහකෙරේද, පාරාජිකයටම පැමිණේය යනඅර්ථයි. මෙහි තුබූතැනින් පහකිරීමද සයයුරකින් දතයුතුය. කිසේදයත්: සැළිමුවවිට ගෙන තමන්ගේ ඉදිරියට අදිනුයේ තමන්ට ලංවූ මේ මෑතකෙළවරින් පැහැසූ තැන, කෙසගක් පමණකුදු ඈත කෙළවරින් ඉක්මවා සිටීද, පාරාජිකයවේ. එසේම සැළිමුවවිට ගෙන පසුභාගයෙන් පෙළතුයේ ඈත කෙළවරින් පැහැසූ තැන, කෙසගක් පමණකුදු අවහාරකයාට ලංවූ මෑත කෙළවරින් ඉක්මවා සිටීද, පාරාජිකයවේ.

වමින් හෝ දකුණෙන් හෝ පහකරණයේ වම් කෙළවරින් පැහැසූ තැන, කෙසගක් පමණකුදු දකුණුකෙළවරින් ඉක්මවාසිටීද, පාරාජිකයවේ. දකුණුකෙළවරින් හෝ පැහැසූ තැන, කෙසගක්පමණකුදු වම්කෙළවරින් ඉක්මවා සිටීද, පාරාජිකයවේ. උඩට නගා ගනුයේ කෙසගක්පමණකුදු පොළොවෙන් මුදද, පාරාජිකයවේ. පොළොව සාරා යටට කිඳබස්වනුයේ සැළියෙහි යටතලින් පැහැසූ තැන, කෙසගක් පමණකුදු මුවවිටින් ඉක්මවා සිටීද, පාරාජිකයවේ. එක්තැනක තුබූ සැළිය පිළිබඳව මෙසේය.

ඉදින්වනාහි සැළිමුවවිටෙහි මළපුඩුවක්කොට ලොහොකණුවක් හෝ කිහිරිහර ආදියෙන්කළ කණුවක් පොළොව කැන සිටුවා එහි හැකිල්ලකින් බැඳතබත්ද, එක් දිසාවෙක එක්හැකිල්ලකින් බඳින ලද්දීනම්, දෙතැනෙක් ලැබේ. දෙදිසාවක, තුන් දිසාවක, සිවු දිසාවෙහි හැකිලි සතරකින් බඳිනලද්දීනම්, පස්තැනක් ලැබේ. එහි එක් කණුවක බඳිනලද නිදන්සැළියෙහිවූ පළමුකොට කණුව හෝ උදුරාද, හැකිල්ල හෝ කපාහරීද, ථුල්ලච්චයවේ. ඉන්පසු සැළිය පෙර කියූලෙසින් කෙසගක්පමණකුදු තුබූතැනින් පහකෙරේද, පාරාජිකයවේ. නැවත පළමුකොට සැළිය තුබූතැනින් නගා ගනීද ථුල්ලච්චයවේ. ඉන්පසු කණුව හෝ කෙසගක්පමණකුදු තුබූතැනින් පහකෙරේද, හැකිල්ල හෝ කපාහරීද, පාරාජිකයවේ. මේ උපායෙන් කණු දෙකක තුනෙක සතරෙක බඳිනලද සැළියෙහිද පැසුළුවූ යාතා චාවනයෙන් පාරාජිකයවේ. සෙස්සෙහි ථුල්ලච්චය දතයුතුය. ඉදින් කණුවක් නැත්තේනම් හැකිල්ලෙහි කෙළවර වලල්ලක්කොට එහි හටගත් මුලෙක ඒ වලල්ල ඇතුල්කරනලද්දේවේද, පළමුකොට සැළිය ගොඩනගා පසුව මුල කපාහැරම වලල්ල බැහැරකෙරේද පාරාජිකයවේ. නැවත මුල නොකපා වලල්ල ඔබිමොබ හසුරුවාද රකින්නේය. ඉදින්වනාහි මුලෙන් පහනොකොටද, අතින් ගෙන අහස්ගතවූවක් කෙරේද පාරාජිකයවේ. මේ මෙහි විශෙෂයවේ. සෙස්ස කියූනය ඇත්තේමය.

සමහර කෙනෙක්වනාහි නිමිතිපිණිස සැළියමතුවෙහි නුගරුක්ආදිය රොපණය කරත්. මුල්, සැළිය වසාගෙන සිටියේය. මුල් කපාහැර සැළිය ගන්නෙමියි මුල් කපන මහණහුට ප්‍රයොගයක් ප්‍රයොගයක්පාසා දුක්කටවේ. කපාහැර ඉඩ ලබාගෙන කෙසගක්පමණකුදු තුබූතැනින් සැළිය පහකෙරේද පාරාජිකයවේ. මුල් කපාහැරීමෙන්ම පෙරළීගොස් සැළිය පහත්තැනක වැටුනීද, ඒතාක් රකියි. වැටුනුතැනින් නගාගණීද, පාරාජිකයවේ. ඉදින් මුල් කපාහෙලූකල්හි එක් මුලකින් පමණක් සැළිය බැඳීසිටීද, ඒ මහණතෙමේද 'මේ මුලකපා හළකල්හි සැළිය වැටෙන්නේය'යි සිතා කපාහරීද, කපා හල ඇසිල්ලෙහි පාරාජිකයවේ. ඉදින්වනාහි එක් මුලකින්ම මළපුඩුවෙහි බැඳුනු හූරකුමෙන් නිදන්සැළිය බැඳීසිටියාවේද, රැඳීසිටුනා

අන්කිසිතැනක් නැත්තේද, ඒ මුලද කපාහළ ඇසිල්ලෙහි පාරාජිකවේ. ඉදින් සැළියමතුවෙහි මහත්ගලක් තබන ලද්දේවේද, ඒ ගල දඩුකඩකින් ඔසොවා බැහැරකරනුකැමැත්තේ සැළියමතුවෙහි හටගෙන තුබූ රුකක් කපාහරීද, දුක්කටයවේ. ඒ සැළිය සමීපයෙහි හටගත් රුකක් කපාගෙන ඒද, එහි නොහටගත්බැවින් ඒ රුක කපාහරිණ මහණහුට පාචිත්තියවේ.

'අත්තනෝ භාජනං' ඉදින්වනාහි සැළිය නගාගන්නට නොහැකිවනුයේ සැළියතුළවූ බඩු ගැනීමපිණිස තමන්ගේ බඳුනක් එහි ඇතුල්කොට සැළිය තුළඇති පස් මස්සක් හෝ පස් මස්සකට වඩා වටිනාකම්ඇති යම් වස්තුවක් සොරසිත්ඇත්තේ පහසාද, දුක්කටාපත්තිය වන්නීය. මෙහි පිරිසිදීමද පාරාජිකය නියමකරනුපිණිස කියනලද්දේය. සොරසිතින් වනාහි පස් මස්සකට අඩුතරම්වූ වස්තුවක් පහසනුයේ දුක්කටයට පැමිණේමය.

'එතෑපෙති'යන මෙහි යම්තාක් එකටබැඳුනක්කොට තමන්ගේ බඳුන එහි ඇතුල්කෙරේද, ඒ තාක් **'එතෑපෙති'**යි කියනුලැබේ. තවද යටතුබූ වස්තුව ගන්නෙමියි අතින් ගසා සැළිය දෙපලුකෙරේනම් සොලොවාමැයි කියනුලැබේ. ඔහු ථුල්ලච්චයට පැමිණේ. යම් කලකදී වනාහි එකටබැඳීසිටිබව සිදීගියේද, එකල්හි සැළියෙහි තුබූ වස්තුව සැළියෙහිම, බඳුනෙහි තුබූ වස්තුව බඳුනෙහිමවේ. එකල්හි තමාගේ බඳුනෙහිවූයේනම්වේ. මෙසේ කොට සැළියෙන් බඳුන පිටතට නොගත්කල්හිද, පාරාජිකයට පැමිණේ.

'මුඛීං වා ඡින්දති' මෙහි යම්සේ ඇගිලිඅතරින් ගිලිහුනු කහවණු සැළියෙහි තුබූ කහවණු සපඊ නොකෙරේද, මෙසේ මිටෙහි කරනුයේ මිට සිදීනම්, ඔහුද පාරාජිකයට පැමිණේ.

'සුත්තාරුළ්හං' හුයෙහි අවුණනලද්දේය. හුයෙන් අවුණන ලද්දහුටද හුයෙන් කරනලද්දහුටද මේ නමකි. ඉණබඳින හවඩි ආදීහු රනින් කරනලද්දහුද රිදියෙන් කරනලද්දහුද හුයෙන් කරනලද්දහුද වෙත්. මුතුවැල් ආදීහුද මෙහිම සඩ්ග්‍රහයට ගියහ.

'වෙඨනං' හිස් වෙළුම්පට කියනුලැබේ. මොවුන් අතුරෙහි යම් කිසිවක් සොරසිත් ඇත්තේ පහසාද, දුක්කටයවේ. සොලවාද, කෙළවර ගෙන අහස්හිවූවක් නොකරමින් නගාගනීද ථුල්ලච්චයවේ.

'සංසන්නෙත්වා නීහරති' මෙහි පිරුණුසැළිය මතුවෙහි මුවවිට සමව පිරුණුසැළියක්කොට තබනලද්දක් හෝ එක්කෙළවරක් නිදන් සැළිය මුලද, එක් කෙළවරක් මුවවිටෙහිදකොට තබනලද්දක් හෝ ගටමින්

ගන්නහුට ථුලලච්චයවේ. සැළිමුවෙන් මුදන්නහුට පාරාජිකයවේ. අඩක්පිරුණු සැළියෙහි හෝ හිස්සැළියක යමක් තබනලද්දේද, ඒ වස්තුවට තමන්ගේ පහසලද අවකාශයම ස්ථානවේ. මුළුසැළිය නොවේ. එහෙයින් ඒ පාමඩගදමය ගටමින්ද පිටතට ගන්නහුට පිහිටි අවකාශයෙන් කෙසගක්පමණ මිදුනුකල්හි පාරාජිකයමවේ. පිරුණුසැළියෙන් හෝ අඩුවසිටිසැළියෙන් හෝ කෙළින්ම නගාගන්නහුට, යටකෙළවර පිහිටි තැනින් මිදුනුකල්හිද පාරාජිකයමවේ. සැළියතුළ තබනලද පාරාජිකයට පොහොණා යම්කිසි භාණ්ඩයක් මුළුසැළියෙහි හසුරුවන්නහුටද, පාමඩගාදියද ගටා බැහැරට ගන්නහුටද, යම්තාක් සැළියෙහි මුවවිට නොඉක්මවාද ඒ තාක් ථුලලච්චයමවේ. ඒ වස්තුවටවනාහි මුළුසැළියම ස්ථානවේයයි **සඩෙක්ඛප - මහාපච්චරී** අට්ඨකථාවන්හි කියනලද්දේය. **මහාඅට්ඨකථා**වෙහිවනාහි 'තුබු තැනම ස්ථානයවේ, මුළුසැළිය ස්ථානනොවේ, එහෙයින් තුබුතැනින් කෙසගක්පමණතුදු මුදන්නහුට පාරාජිකයමැ'යි කියනලද්දේය. මහාඅට්ඨකථාවෙහි දක්වූ ඒ ස්ථානනියමය ප්‍රමාණවේ. අනිකවනාහි අහස්ගත නොකරන්නහුට සිවුරුලන උණ්ඩවුවෙහි තැබූ සිවුරුවෙළුම්නයින් කියනලද්දේය. එය නොගතයුතුය. විනයවිනිශ්චයෙහි ආවාවූ ගරුකයෙහි සිටියයුතුය. මේවනාහි විනයධම්මතාය. සඩෙක්ඛපාඨඨී කථාදියෙහි කියනලද්ද පෙළ හා සමනොවේයයි දක්වනුයේ **'අපි ච'** යනාදියකීහ.

තවද **'අත්තනෝ භාජනගතං වා කරොති මුට්ඨිං වා ඡින්දති'**යි කීබැවින්ද මුළුසැළිය ස්ථාන නොවේ. තැබූතැනම ස්ථානවේය යන මේකරුණ දතයුතුය. යම්සේ සැළියතුළ තුබූ වස්තුවට මුළුසැළිය ස්ථාන නොවේයයි කියනලද්දේද, එසේ ගිතෙල් ඇඳතුරෙහි යම්කිසිවක් බොන්නහුට එක් ප්‍රයොගයකින් බීඇසිල්ලෙහි පාරාජිකයවේයයි **මහාඅට්ඨකථා**වෙහි කියනලදී. ඉදින් මුව පහනොකොට ඇදබොන්නහුගේ බොටුවට පැමිණියක් පාදයක් නොඅගීද, මුඛයටගෙන තුබුදය හා අගීද, එය මුවෙහි තිබෙනතුරු රකියි. බොටුවෙන් පිරිසිදුතුකල්හිම අනුභවකළකල්හිම පාරාජිකයවේ. ඉදින් දෙතොලින් පිරිසිදින්නේ දෙතොල වසාද, පාරාජිකයමවේ. උපුල්දඩු හුණනළ බටනළ ආදියෙන් බොන්නහුගේද ගෙලෙන් පහතට වැටුනක්ම පාදයක් අගීද, පාරාජිකයවේ. ඉදින් මුඛගතය හාම අගීද, ඒ තාක් පාරාජිකය නොවේ. උපුල්දඩු ආදියෙහි රැඳුනහුසමග එකාබද්ධභාවය වෙන්කොට දෙතොලින් පිරිසිදිඇසිල්ලෙහි පාරාජිකයවේ. උපුල්දඩු ආදියෙහි රැඳුනහු හා අගීනම් උපුල්දඩු ආදීන්ගේ මුලඇහිල්ලෙන් වැසුකල්හි පාරාජිකයවේ. පාදයක් අගනා ගිතෙල් ඇ යමක් බොටුවෙන් පහතට ඇතුල්නොවූකල්හි උපුල්දඩු ආදියෙහිද මුවෙහිද පාදයට වැඩිතරමක්

එකාබද්ධව සිටීද රකීමයයි **මහාපච්චරි** ආදියෙහි මේ විභාගය දක්වනලද්දේය. ඒ සියල්ලම යම්හෙයකින් **'අත්තනෝ භාජනගතං වා කරොති මුට්ඨිං වා පීඳෙති'**යි කියූ මේ ක්‍රමය සෙවුනේද, එහෙයින් මැනවින් දක්වනලද්දේමවේ. මේවනාහි එකාබද්ධයෙහි නයය.

ඉදින්වනාහි අතින් හෝ පාත්‍රයෙන් හෝ තළුතැටි ඇ යම්කිසි බඳුනකින් හෝ ගෙන පානය කෙරේද, යම් ප්‍රයොගයක්හිදී පාදයක ඇඟීම පිරේද, ඒ ප්‍රයොගය කළකල්හි පාරාජිකයවේ. තවද මහත්සේ අඟීද, එක් ප්‍රයොගයකින්ම බෙලිකටුවකිනිදු පාදයක වටිනාතරමක් ගන්නට හැකිවේද, එක්ම නගාගැනීමෙහිදීම පාරාජිකයවේ. බඳුන ගිල්වා ගන්නහුට යම්තාක් එකාබද්ධවේද, ඒතාක් රකියි. මුවවිට පිරිසිඳීමෙන් හෝ නගා ගැනීමෙන් හෝ පාරාජිකයවේ. යම් කලෙකවනාහි ගිතෙල් හෝ තෙල් හෝ පහන්තෙලක් වැනිවූම මීහකුරු හෝ සැළිය පෙරළා නවා තමන්ගේ බඳුනට ඇතුල්කෙරේද, එකල්හි ඔවුන්ගේ ප්‍රසන්නභාවය හෙතුකොට එකටබැඳීමක් නැත්තේය. පාදයක වටිනාතරම් ගිතෙල් ආදියක් මුවවිටින් ගිලිහුනු ඇසිල්ලෙහි පාරාජිකයවේ. පිසතබනලද යමක්වනාහි මීහකුරු මැලියම්මෙන් ඉතාඝනව ඇතටමැතට ඇදීමට යොග්‍යව සිටියේවේද, කුකුස උපන්කල්හි එකට බැඳුනක්වම තමන්ගේ බඳුනෙන් බැහැරට ගන්නට හැකිවේද, මුවවිටින් පිටතට නික්ම බඳුනෙහි ඇතුල්වසිටි මෙය බැහැර සිටියක් සමග එකටබැඳීසිටිබැවින් රකියි. මුවවිටින් සුන් ඇසිල්ලෙහි පාරාජිකයවේ. යමෙක් සොර සිතින් අන්‍ය අයත් සැළියෙහි පාදයක් අඟිනා ගිතෙල් හෝ තෙල් හෝ එකකින් බිඟන්නාවූ යම්කිසි දුහුල් වතක් හෝ සම්කඩ ඇතුරෙහි එක්තරා එකක් හෝ බහාද, අතින් ගිලිහුනු ඇසිල්ලෙහි පාරාජිකයවේ. හිස් සැළියෙක 'දැන් තෙල් වක්කරන්නාහ'යි දැන යම්කිසි භාණ්ඩයක් සොරසිත් ඇත්තේ බහාද, ඒ භාණ්ඩය එහි තෙල් වක්කළකල්හි පස්මස්සක් අගනා තෙල් බිඟනීද, බිඟත් ඇසිල්ලෙහි පාරාජිකයවේයයි **මහාඅට්ඨකථා**වෙහි කියනලද්දේය. ඒ වනාහි එහිම වියලීගිය විලෙක, වියලී ගිය දිය ඇලක් සෑදුකිරීම පිළිබඳ විනිශ්චය හා විරුද්ධවන්නේය. මෙහි අවහාර ලක්ෂණයක්ද නොපෙණේ. එහෙයින් නොගතයුතුය. **මහාපච්චරි** ආදියෙහිවනාහි ඒ භාණ්ඩය සැළියෙහි පහසලද තැනින් කෙසගක්පමණ නමුදු ඉදිරීම නිමිතිකොට පාරාජිකය කියනලදී. ඨානාචාවනප්‍රයොගය ලැබෙනබැවින් ඒ ගතයුතුවේ. අනිකක්හුගේ හිස්සැළියෙහි රැකීමපිණිස භාණ්ඩයක් තබා එහි තෙල් වක්කළකල්හි ඉදින් මෙතෙමේ දන්නේ නම් මා වළකාලන්නේයයි බියවූයේ පාදයක් අගනා තෙල් බිඟත් භාණ්ඩය සොරසිතින් උදුරාද, පාරාජිකයවේ. පිරිසිදුසිතින් උදුරාද, අන්‍යථා එය ගෙන්වනකල්හි හණ්ඩදෙය්‍යයවේ.

භණ්ඩදෙය්‍යනම්: අන්හට අයත් යමක් නැසුනේද, ඒ නැසුනු වස්තුවෙහි මිල හෝ ඒ භාණ්ඩයම හෝ දියයුතුය යනඅර්ථයි. ඉදින් නොදේනම් භාණ්ඩහිමියාගේ ධුරනිඃක්ෂේපයෙහිදී පාරාජිකයවේ. ඉදින් අනෙකෙකු අයත් සැළියෙහි අනෙකෙක් ගිතෙල් හෝ තෙල් වක්කෙරේද, එහිද මෙතෙමේ සොරසිතින් තෙල් බොන භාණ්ඩයක් බහාද, කියූලෙසින්ම එය අතින් මිටුනු ඇසිල්ලෙහිම පාරාජිකයවේ. තමන්ගේ හිස් සැළියෙහි අනෙකෙකු ගිතෙල් හෝ තෙල් වක්කරනබව දැන සොරසිතින් භාණ්ඩයක් තබාද, පෙරකියූ ලෙසින්ම නගාගැනීම නිමිතිකොට පාරාජිකයවේ. පිරිසිදු සිත්ඇත්තේ බහාතබා පසුව සොරසිතින් නගාගනීද පාරාජිකයමවේ. පිරිසිදු සිත්ඇත්තේම නගාගනීද අවහාරයක් නොවේ. ශ්‍රීවාද නොවේ. **මහාපච්චරියෙහි**වනාහි අනාපත්තිමාත්‍රයක්ම කියනලදී. 'කුමකට මාගේ සැළියෙහි තෙල් වත්කෙළෙහිද'යි කිපියේ තමාගේ භාණ්ඩය උදුරාදමාද, එකල්හි භණ්ඩදෙය්‍ය නොවේයයි **කුරුන්දී**යෙහි කියනලදී. සොරසිතින් මුවවිට ගෙන තෙල් පහකරණු කැමැතිව සැළිය ඇද ඇලකෙරේද, පාදයක් අගනා තෙල් වැගිරීගියකල්හි පාරාජිකයවේ. සොරසිතින්ම වැගිරියන්නේයයි සැළිය දැදුරු කෙරේද, පාදයක් අගනා තෙල් වැගිරීගියකල්හි පාරාජිකයවේ. සොරසිතින්ම යටිකුරුවූ හෝ උඩුකුරුවූ හෝ නොඇදවූ හෝ සිදුරක්කෙරේද, මේවනාහි මුළාවන තැනක්වේ. එහෙයින් මැනවින් සලකාබැලිය යුතුය. මේ මෙහි විනිශ්චයවේ:

ඕමට්ඨනම්: යටිකුරුවූ මුවසිදුරය. **උම්මට්ඨනම්:** උඩුකුරුවූ සිදුරය. **වෙමට්ඨනම්:** කිනිස්සකමෙන් සෑදුව කළ සිදුරය. එහි කළ යටිකුරුමුව සිදුරෙහි පිටතපටන් ඇතුල්කෙළවරින් පාදයක් අගනා තෙල් වැගිරීගියකල්හි පිටතට නොනික්මුනු කල්හිද පාරාජිකයවේ. කුමක්හෙයින්දයත්: යම්හෙයකින් ඇතුල් කෙළවරින් වැගිරීම් පමණක්ම ඇති ඒ තෙල් පිටතට ගියේනම්වේද, කුමහිගතසඤ්ඤාව නොලබාද එහෙයිනි. ඇතුළතපටන් කළසිදුරෙහි බැහැරි කෙළවරින් පාදයක් අගනා තෙල් වැගිරීගියකල්හි පාරාජිකයවේ. යම් ඒ ලෙසකින්කළ අඩුකුරු මුවසිදුරෙහි බැහැරි කෙළවරින් පාදයක් අගනා තෙල් වැගිරීගියකල්හි පාරාජිකයවේ. ඒවනාහි යම්තාක් බැහැරි කෙළවරින් නොවැගිරේද, ඒතාක් සැළියෙහිවූයේමවේ. නොඇදව සෑදුව කළ සිදුරෙහි කබල මැදින් වැගිරීම්වසයෙන් කරවියයුතුයයි අර්ථකථාවන්හි කියනලදී. එයවනාහි කබලෙහි ඇතුළතද පිටතද පටන් කබල මැද හැර ඉතිරිකොට කළසිදුරෙහි තටාකයක්හුගේ සීමා බිඳීම හා සමානවේ. ඇතුළතපටන් කළසිදුරෙහිවනාහි බැහැරි කෙළවරින්ද, පිටතපටන් කළසිදුරෙහි ඇතුළත කෙළවරින්ද කරවියයුත්තේයයන මෙය මෙහි යුක්තියයි.

යම් මහණෙක්තෙමේ පෙරළී යන්නේයයි සොරසිතින් සැළිය තබා තුබූ දරණුව හෝ පිටිවහලපිණිස තැබූ ගල්කැට හෝ පහකෙරේද, සැළිය පෙරළී ගියකල්හි පාරාජිකයවේ. තෙල් වැගිරෙනබව දන හිස් සැළියෙහි දැදුරුබවෙහි හෝ සිදුරු හෝ කළකල්හි පසුව නික්මගිය තෙල් පමණින් හණ්ඩදෙය්‍යවේ. අට්ඨකථාවන්හිවනාහි කිසිතැනක පාරාජිකයයිද කියනලදී. එය ප්‍රමාදයෙන් කියනලද්දක්වේ. පිරිසිටි සැළිය මතුවෙහි කැටක් හෝ ගලක් වැටීමෙන් සැළිය බිඳෙන්නීය, එයින් තෙල් වැගිරෙන්නේයයි දන සොරසිතින් නොමතා බැඳීමක් හෝ කෙරේද, නොමතාව තබනලද්දක්කොට හෝ තබාද, එකකින් තෙල් වැගිරෙන්නක්කොට හෝ තබාද, එසේ කරන්නහුට කළඇසිල්ලෙහි පාරාජිකයවේ. හිස්සැළිය මතුවෙහි මෙසේ වූ යමක් කෙරේද, පසුව එය පිරීගියකල්හි වැටී බිඳේද, හණ්ඩදෙය්‍යවේ. මෙබඳු තන්හි හාණ්ඩයක් නැතිකල්හි කළ ප්‍රයොගයබැවින් පළමුකොටම පාරාජිකය නොවේ. හාණ්ඩ විනාශයට දෙරටුවක් කළබැවින් හණ්ඩදෙය්‍යවේ. ගෙන්වනකල්හි නොදෙන්නහුට අයිතිකරුවන්ගේ ධුරනිඃක්ෂෙපයෙන් පාරාජිකයවේ. 'පෙරළී හෝ යන්නේය, වේල්ල හෝ උතුරුවා ලන්නේය'යි සොරසිතින් සොරොව්ව සෘජුකරන කාලයෙහි පාරාජිකයවේ. මෙබඳු ප්‍රයොග සූචීප්‍රයොගාවහාරයෙහි සඞ්ග්‍රහයට යති. වියලිසොරොව්ව සෘජුකළකල්හි පසුව ජලය ගලා ආකල්හි පෙරළී හෝ යේවා, වේල්ල හෝ උතුරායේවා, හණ්ඩදෙය්‍යවේ. කුමක්හෙයින්දයත්: ඨානාවාවනප්‍රයොගය නැතිබැවිනි. එහි ලක්ෂණ නැවෙහි තුබූ හාණ්ඩ විනිශ්චයෙහි ප්‍රකාශවන්නේය.

'තත්‍රේව හිඳති වා' යනාදියෙහි අට්ඨකථාවෙහිවනාහි මෙසේ කියනලදී. **'හිඳති වා'** මුගුරෙන් තළා බිඳීද, **'ඡඩ්ඩෙති වා'** ජලය හෝ වැලි වගුරුවා උතුරවා හරීද, **'ඣාපෙති වා'** දර ගෙනවුත් දවාද, **'අපරිභොගං වා කරොති'** නොකැයුත්තක් හෝ නොපිවයුත්තක් හෝ කරාද, මල හෝ මූත්‍ර හෝ විසක් හෝ ඉදුල් හෝ කුණපයක් හෝ හෙලාද, **'ආපත්ති දුක්කටස්ස'** තුබූතැනින් ගිලිහීමක් නැතිබැවින් දුක්කටාපත්තියවේ. මේ විනිශ්චය බුද්ධවිෂයනම්වේ. කෙසේ නමුත් දුක්කටයවේ. ගෙන්වනකල්හි හණ්ඩදෙය්‍යයි කියනලදී. එහි බිඳීම හා බැහැරලීමයන පළමුදැක්වූ දෙක සමනොවේ එය සැළිය දැදුරුකිරීම සමගද සොරොව්ව සෘජුකිරීම සමගද එකලක්ෂණවේ. දවීම පරිභොග නොකිරීමයන පැසුළු කියුදෙක තුබූතැනින් පහනොකරන්නහුවිසින්ද, කටහැක්කේය. එහෙයින් මෙහි මෙසේ විනිශ්චය කියත්. අට්ඨකථාවෙහිවනාහි තුබූතැනින් පහකිරීමක් නැතිබැවින් දුක්කටයි මේ පශ්චිමඳ්වයසඳහා කියනලදී. තුබූතැනින් පහකිරීම නොකරනුයේම තමන් හෝ අන්‍ය හෝ හෙලනුකැමැත්තෙන් උපන් සොරසිතින් හෝ අත්පා සිඳින්නාක්මෙන් හුදෙක් විනාශකරනු කැමැත්තෙන් හෝ එය දවීමද

කරන්නේය. අපරිභොගයද කරන්නේය. පළමු දෙකින් කියූලෙසින් මුගුරෙන්තළා බිඳින්නහුටද, දිය වත්කර උතුරුවන්නහුටද යානාවාවනය ඇත්තේද එහෙයින් එසේ කරන්නහුට, නසනුකැමතිබැවින් හණ්ඩදෙය්‍යාවේ. සොරසිත කරනකොට පාරාජිකයවේ. පාළියෙහි 'දුක්කට'යි කියූබැවින් අයුතුදයත්: අයුතුනොවේ. අත්පරිද්දෙකින් ගතයුතු අර්ථී ඇතිබැවිනි. පෙළෙහිවනාහි චේය්‍යචිත්තපක්‍ෂයෙහි **'හිඳති වා'** ජලයෙන් බිඳියි. **'ඡඩ්ඩෙති වා'** එහි මල හෝ මූත්‍ර හෝ දමා, යන මෙහි ඇතැම්හු මෙසේ කියත්. මේ මෙහි සාරය වේ: විනීතවත්‍ථුවෙහි තණ දවු මහණහු මෙන් තුබූතැනින් පහකරණු නොකැමැත්තේම එකලාව බිඳියි. බිඳුනුබැවින් තෙල් ආදීය නික්මෙයි. යමක් මෙහි පැතුරුණේද එය එකටම බැඳීසිටියි. බැහැරලනු නොකැමැත්තේම එකලාව එහි දිය වැලි ආදිය වගුරවයි. වගුරණලදබැවින්වනාහි තෙල් පහවීයයි. එහෙයින් ව්‍යවහාරවශයෙන් **'හිඳති වා ඡඩ්ඩෙති වා'**යි කියනුලැබේනුයි මෙසේ පදයන්ගේ අර්ථය ගතයුත්තේය. නාසෙතුකාමතා පක්‍ෂයෙහිවනාහි සොරසින් නැතිබැවින් යානාවාවනය කරනු කැමැත්තහුටද අන් අයුරකින්ද දුක්කටය යෙදේ. මෙසේවනාහි කියනුලබනකල්හිද අර්ථකථාවද පූර්‍වාපරය හා සසඳ මනාකොට කියනලද්දහුවෙත්. මෙපමණකුදු සතුටට නොපැමිණ ගුරුන් ඇසුරුකොට විනිශ්චය දතයුතුය.

භූමට්ඨකථාව නිමි.

—\\—

ථලට්ඨකථාවෙහි **'ථලෙ නික්කිත්තං'** බිමිතෙලෙහි හෝ ප්‍රාසාද පර්‍යන්තලාදීන් අතුරෙහි වැයුනු හෝ නොවැසුනු යම්කිසි තැනක තැබූ භාණ්ඩය ථලට්ඨයයි දතයුතුය. ඉදින් ඒ භාණ්ඩය රැස්කරණලද්දක්වේද, සැළිය තුළ භාණ්ඩය, බඳුන් ගතකරන, මිට සිදින විනිශ්චයෙන් විනිශ්චය කටයුත්තේය. ඉදින් එකාබද්ධවූයේනම් සිලෙස නීය්‍යාසාදි පක්‍කමධුථාණිත විනිශ්චයෙන් විනිශ්චය කටයුතුය. ලෝපිඩු ගුළපිඩු තෙල් මී කළ ආදීවූ ගරුසාරභාණ්ඩයක්වේද, එය සැළිය පිළිබඳ යානාවාවන විනිශ්චයෙන් විනිශ්චය කටයුතුය. හැකිල්ලෙන් බැඳුනු භාණ්ඩයාගේ ස්ථානභෙදයද සැලකියයුතුය. අතුරාතැබූ උතුරුසළුආදිය සෘජුව ගෙන අදීද, ඇත කෙළවර මෑත කෙළවරින් පැහැසූ අවකාශය ඉක්මවූකල්හි පාරාජිකයවේ. සියලු දිශාවන්හි මෙසේ සැලකියයුතුය. වෙළා උදුරාද, කෙසගක් පමණ අහස්ගත කරන්නහුට පාරාජිකයවේ. සෙස්ස කියූනය ඇත්තේමය.

ථලට්ඨකථා නිමි.

—\\—

ආකාසට්ඨාවෙහි - ඉදිරිපසින් මුවතුඩින් පසුපසින් පිල්කලප් අගින් දෙපසෙහි පියාපත්කෙළවරින් යට පානියසිළුවෙන් මතුවෙහි සිළුඅගින්යි මොනරාගේ සථානපරිවෙජදය සයයුරකින් දතයුතුය. මහණතෙමේ අහස්හි සිටි සඤ්ඤාමිකවූ මොනරෙකු අල්ලාගන්නෙමියි ඉදිරියෙහි හෝ සිටීද, අත හෝ දිගු කෙරේද, මොනරා අහසෙහිම පියාපත් සලාද, හුළං ගන්වා ගමන් හැර සිටීද, ඒ මහණහුට දුක්කටයවේ. ඒ මොනරු සිටිතැනින් නොසොල්වම්න් අතින්පහසානම් දුක්කටයමවේ. සිටිතැනින් පහනොකරම්න් සොලවාද, ථුල්ලච්චයවේ. අතින් අල්වාගෙන හෝ අල්වානොගෙන හෝ මුවතුඩ කෙළවරින් පැහැසූ අවකාශයවූ පිල්කලබ් කෙළවර, පිල්කලබ් කෙළවරින් පැහැසූ අවකාශයවූ මුවතුඩ ඉක්මවාද පාරාජිකයවේ. එසේ වම්පස පියාපත්කෙලවරින් පැහැසූ අවකාශයවූ දකුණුපස පියාපත් කෙළවර, දකුණුපස පියාපත් කෙළවරින් පැහැසූ අවකාශයවූ වම්පස පියාපත් කෙළවර ඉක්මවාද, පාරාජිකයවේ. එසේ පානිය සිළුවෙන් පැහැසූ අවකාශයවූ සිළුඅග, සිළුඅගින් පැහැසූ අවකාශයවූ පානියසිළුව ඉක්මවාද පාරාජිකයවේ.

අහසින් යන මොනරා ශීෂ්ණීදීන් අතුරෙහි යම් අවයවයෙක සැහවේද, ඒ මොනරුගේ සථානය ඒය. එහෙයින් අතෙහි ලැගුනු ඒ මොනරු ඒ අතින්ම ඇත් මැත් කරනුයේද සොලවාමය. ඉදින්වනාහි අනික් අතින් ගෙන හුන්තැනින් පහකෙරේද, පාරාජිකයවේ. අනික් අත ලංකෙරේද මොනරා තමාම අහසට නැග ඒ අතෙහි සැහවේද ඇවැත් නොවේ. අවයවයෙහි ලැගුනුබව දන සොරසිතින් එක් පියවරක් යේද, ථුල්ලච්චයවේ. දෙවන පියවරෙහිදී පාරාජිකයවේ.

බිම සිටි මොනරා දෙපාදයන්ගේ හා පිල් කලාපයේ වසයෙන් තුන්තැනක් ලබයි. ඒ මොනරු ඔසොවන මහණහුට යම්තාක් ඒ මොනරාගේ එක් තැනෙකුදු පොළොව පහසාද, ඒතාක් ථුල්ලච්චයවේ. කෙසගක් පමණකුදු පොළොවෙන් මිදී ගියකල්හි පාරාජිකයවේ. මැදිරියෙහි සිටි මොනරු මැදිරියසමග ඔසොවාද, පාරාජිකයවේ. ඉදින් පාදයක් නොඅඟීනම් සියලුතැන ඇඟීම්වසයෙන් විනිශ්චය කටයුතුය. පවුරු ඇ යමකින් වටකළ වත්තතුළ හැසිරෙණ මොනරෙකු සොරසිතින් පා ගමනින් පිටත වත්තකට ගෙන යන්නේ දෙරඹම ඉක්මවාද පාරාජිකයවේ. ගොවුදෙහි සිටි ගොනුට ගොවුදමෙන් ඔහුට වත්තඇතුළ සථානවේ. අතින් ගෙන වත්ත ඇතුළතදීම අහස්ගත කරන්නහුට පාරාජිකයමවේ. ගමතුළ හැසිරෙන්නෙකු දක ගම්පවුර ඉක්මවායන්නහුට පාරාජිකයවේ. මොනරුම නික්මගොස් පිටත ග්‍රාමොපචාරයෙහි වෘතුපචාරයෙහි හෝ හැසිරෙන්නහුවනාහි සොරසිත් ඇත්තේ දරකඩකින් කැටකින් හෝ තැතිගන්වා වනමුඛයට අභිමුඛකෙරේද, මොනරා පියාහඹා ගොස් ගමතුළ හෝ

වත්තතුළ හෝ සෙවෙනිපිටක හෝ සැහවීගනීද, ඒ තාක් රකියි. ඉදින්වනාහි වනයට අභිමුඛව පියාහඹාද, ගමන් හෝ කෙරේද,'වනයට ඇතුල්කොට ගන්නෙමි'යි අදහසක් නැතිකල්හිද පොළොවෙන් කෙසගක් පමණකුදු අහසට නැඟීගත් ඇසිල්ලෙහි හෝ දෙවන පියවරෙහි හෝ පාරාජිකයවේ. කුමක් හෙයින් ද යත්: යම්හෙයකින් ගමින් නික්මුනහුට සිටිතැනම සථානයවේද, එහෙයිනි. ඔවුනොවුන් කොටවනුපිණිස නුවණනැති මිනිසුන්විසින් වැඩූ වටුආදීවූ පක්ෂිජාතීන් අතුරෙහිද මෙම විනිශ්චයවේ.

'සාටකං වා' පොළෝතෙලෙහි අතුරා තබනලද්දක් මෙන් වාතවෙගයෙන් නගනලදුව අහසින් යන පිටිතලපයෙන් බැඳි ඉදිරියට පැමිණි සළුවක් එක් කෙළවරකින් අතින් ගනීද, ඇතින් මැතින් තුබූතැන වෙනස් නොකරණුයේම සොලොවාද, ගමන් වැළකීම නිමිතිකොට දුක්කටයවේ. තුබූතැනින් පහනොකරණුයේ සොලොවාද සෙලවීම නිමිතිකොට ථුල්ලච්චයවේ. තුබූතැනින් පහකෙරේද, පාරාජිකයවේ. මේ සළුවෙහි සථානපරිච්ඡේදය මොනරුපිළිබඳ සථානපරිච්ඡේදයමෙන් සයයුරකින් දතයුතුය. නොබඳිනලද සළුවවනාහි එක්කෙළවරක් ගත්ඇසිල්ලෙහිම දෙවන කෙළවරින් වැටී බිම පිහිටාද, අතද, බිමදැයි එයට දෙතැනක්වේ. ඒ සළුව අල්ලාගත් පරිදිම අල්ලා ගත් පෙදෙසින් අල්ලාගෙන සොලොවාද ථුල්ලච්චයවේ. පසුව දෙවන අතින් හෝ පයින් පොළොවෙන් ඔසොවාගනීද පාරාජිකයවේ. පළමුකොට හෝ පොළොවෙන් නගාගනීද ථුල්ලච්චයවේ. පසුව අල්ලාගත් අවකාශ ප්‍රදේශයෙන් පහකෙරේද පාරාජිකයවේ. ගැනීම නොමුදමින් හෝ සෘජුවම අතනවා බිමවූවක්කොට ඒ අතින්ම ඔසොවාද, පාරාජිකයවේ. වෙළුමෙහිද මේ විනිශ්චයවේ.

'හිරඤ්ඤං වා සුවණ්ණං වා ඡඩ්ඩමානං' අබරණලා සැරසෙන මිනිසුන්ගේ ග්‍රීවාභරණාදීවූ පලඳනාවක් හෝ රන්කුරක් සිදින රන්කරුවන්ගේ රන්කඩක් හෝ සිදිනුලබන්නේ වැටේද. මහණතෙමේ අහසින් එන ඒ රන්කඩ, සොරසින් ඇත්තේ අතින් ගනීද, ගැනීමම සථානයවේ. අල්ලාගත් පෙදෙසින් අත පහකෙරේද, පාරාජිකයවේ. සිවුර මතුවෙහි වැටුනක් අතින් ඔසොවාද පාරාජිකයවේ. නොඑදුරාම යේද දෙවන පියවරෙහි පාරාජිකයවේ. පාත්‍රයෙහි වැටුනුකල්හිද මෙම ක්‍රමයවේ. හිසෙහි හෝ මුවෙහි හෝ පයෙහි හෝ පිහිටියක් අතින් ගනීද පාරාජිකයවේ. නොගෙනම යේද, දෙවන පියවරෙහි පාරාජිකයවේ. යම්කිසි තැනක වැටේද, එය පිහිටාගත් අවකාශයම සථානයවේ. සියලු අභපසභ පාසිවුරු සථානනොවේ.

ආකාසට්ඨකථා නිමි.

—\\—

වෙහාසට්ඨකථාවෙහි - ඇඳ පුටු ආදියෙහි තැබූභාණ්ඩයක් පැහැසියයුතු හෝ වේවා නොපැහැසියයුතු හෝ වේවා, එය සොරසිතින් පහසන්නහුට දුක්කටයවේ. ඇඳ පුටුවලතැබූ භාණ්ඩයන්හිද මෙහි ඵලට්ඨයෙහි කියූලෙසින්ම විනිශ්චය දතයුතුය. මේ වනාහි විශෙෂයවේ: ඉදින් පිටිතලපයෙන් බැඳිසළුව ඇඳක හෝ පුටුවක හෝ ඵලනලද්දේ මැදින් ඇඳෙහි තට්ටුව නොපහසාද ඇඳපාම පහසාද ඔවුන්ගේවසයෙන් සථානය දතයුතුය. මා මතුවෙහි පැහැසූ අවකාශයම ඉක්මවූ ඇසිල්ලකින් එහි පාරාජිකයවේ. ඇඳ පුටුසමග ගෙන යන්නහුටවනාහි ඇඳ පුටුවල පා පිහිටි අවකාශයාගේවසයෙන් සථානය දතයුතුය.

'චිවරවංසෙ' සිවුරු තැබීමපිණිස බැඳතැබූ හුණුදඬුවෙහි හෝ දූවදඬුවෙහි හෝ එහි සිවුර හකුළා හුණුදඬුවෙන් පරහාගයෙහි නමා එක්කළ නුවා කෙළවරද, තමා සිටිපසෙහි, නැමූසිවුරෙහි මැදකොටසද කොටතැබූ සිවුර පිහිටි අවකාශයෙන් පැහැසූ අවකාශයම සථානවේ. සිවුරුලන සියලු හුණුදඬුවම සථානනොවේ. එහෙයින් සොරසිතින් නවාතුබූ සිවුරෙහි මැද කොටස අල්ලාගෙන සිවුර අදින හුණුදඬුවෙහි පරහාගයෙන් හුණුදඬුවෙහි පිහිටි අවකාශයද, නමාසිටි දිශාවෙන් සිවුරෙන් හුණුදඬුවෙහි පහසලද අවකාශයද ඉක්මවන්නහුටද එකඟුල් පමණ ඇදීමෙන්ම පාරාජිකයවේ. කෙළවර ගෙන අදින්නහුටද මෙම නයවේ. එහිම සිවුරුලන හුණුදඬුවෙහි වමින් හෝ දකුණෙන් හෝ ඇතමෑත කරන්නහුට වම්කෙළවරින් දකුණුකෙළවර, දකුණුකෙළවරින් හෝ වම්කෙළවර ඉක්මුනු ඇසිල්ලෙහි දසදෙළොස් අඟුල් පමණ ඇතමෑත හැසිරවීමෙන්ම පාරාජිකයවේ. උඩට ඔසවන්නහුට කෙසඟක්පමණ එසවීමෙන් පාරාජිකයවේ. සිවුරුලන හුණුදඬුව පහසන්නාවූ හෝ නොපහසන්නාවූ හෝ රැහණින් බැඳතැබූ සිවුර එයින් මුදන්නහුට ථුල්ලච්චයවේ. මිදුනුකල්හි පාරාජිකයවේ. මිදුනු ඇසිල්ලම ඒ සිවුර සථානයෙන් ගිලිහුනේයයන ගිණීමට යන්නේය. හුණුදඬුවෙහි වෙළා තබනලද්ද වෙළුම හරින්නහුට ථුල්ලච්චයවේ. වෙළීම හළඇසිල්ලෙහි පාරාජිකයවේ. වලල්ලක්කොට තැබූකල්හි වලල්ල සිදියි හෝ මුදයි හෝ එක් වලල්ලක් හෝ හුණුදඬුකෙළවරින් මුදු බැහැරට ගනීද, ථුල්ලච්චයවේ. සුන්ඇසිල්ලෙහි මිදුනු ඇසිල්ලෙහි බැහැරටගත් ඇසිල්ලෙහි පාරාජිකයවේ. එසේ නොකොටම සිවුරුලන හුණුදඬුවෙහි ඇතමෑත හසුරුවාද, ඒතාක් රකින්නේය. වලල්ලටවනාහි සියලු හුණුදඬුව සථානවේ. කුමක්හෙයින්ද්යත්: එහි හැසිරෙණ සැහැවිඇතිබැවිනි. ඉදින්වනාහි ඒ වලල්ල අතින්ගෙන අහස්ගතවූවක් කෙරේද, පාරාජිකයවේ. දිගහැර තැබූ සිවුරට පිහිටි අවකාශයෙන් පැහැසූ අවකාශයම සථානවේ. එහි හකුළා තැබූකල්හි විනිශ්චයතෙමේ කියූනයින් දතයුතුය.

යම් සිවුරක්වනාහි එක් කෙළවරකින් බිම පහසා සිටියේද ඒ සිවුරට හුණුදඬුවෙහිද පොළොවෙහි ද පිහිටි අවකාශවශයෙන් ස්ථාන දෙකක්වේ. එහි පොළොවෙහි එක් කෙළවරකින් පිහිටිකල්හි අබද්ධසාටකයෙහි කියූ ලෙසින්ම විනිශ්චය දතයුතුය. සිවුරු ලන රැහණෙහිද මේ විනිශ්චයවේ.

අකුස්සෙහි එල්වාතැබූ භාණ්ඩයවනාහි බෙහෙත්කළයක් හෝ වේවා, බෙහෙත්පසුම්බියක් හෝ වේවා, ඉදින් බිත්තිය හෝ පොළොව හෝ නොපහසා සිටි එල්බෙන්නක් ගටමින් පහකරන්නහුට අකුස්කෙළවරින් ගිලිහුනු ඇසිල්ලෙහි පාරාජිකයවේ. එල්බෙන්නක් බැඳුනක්වේද, මුලින් ඔසොවා අහස්ගතවූවක් කරන්නහුට අකුස්කෙළවරින් නොමිදුනුකල්හිද පාරාජිකයවේ. බිත්තියෙහි ලැගීසිටි එය පළමුකොට අකුස්කෙළවරින් පහකෙරේද, ථුල්ලච්චයවේ. පසුව බිත්තිය මුදද, පාරාජිකයවේ. පළමුකොට බිත්තිය මුද පසුව අකුස්සෙන් බැහැර කරන්නහුටද මේ ක්‍රමයවේ. **ඉදින්වනාහි බරඇති භාණ්ඩයක් බැහැරට ගන්නට නොහැක්කේ, තෙමේ බිත්තිය ඇසුරුකළ එකක්කොට අකුස්සෙන් බැහැරකෙරේද, නැවත බිත්තිය නොමුදම අකුස්සෙන් බැහැරට ගත්ඇසිල්ලෙහිම පාරාජිකයවේ.** තමන් කළතැනවනාහි ස්ථානය නොවේ. බිම පහසාසිටි භාණ්ඩයට ස්ථාන දෙකක්වේ. එහි විනිශ්චය කියනලද්දේමය. යම් භාණ්ඩයක්වනාහි සහල්ලෙකලා එල්වනලද්දේවේද, ඒ භාණ්ඩය සහල්ලෙන් බැහැරට ගන්නහුටද සහල්ල සමග අකුස්සෙන් බැහැරට ගන්නහුටද පාරාජිකයවේ. භික්ඛුභූමිනිශ්‍රිත වශයෙන්ද මෙහි ස්ථානභෙදයද දතයුතුය.

'භිත්තිවිලෝ'යනු සෘජුකොට බිත්තියෙහි ගයන ලද්දක් හෝ එහි හටගත්තේම හෝ වේ. **'නාගදන්තා'** නාගදන්තයවනාහි වක්ව ගයනලද්දක්මය. ඒ තන්හි එල්වා තැබූ භාණ්ඩය අකුස්සෙහි කියූනයින්ම විනිශ්චය කටයුතුය. දෙකක් තුණක් පිළිවෙළින් තැබූ නාදැතිවල නගා තැබූ කුන්තයක් හෝ හිණ්ඩිවාලයක් හෝ අග හෝ මුල ගෙන අදීද, එකක් එකක්හුගේ පැහැසූ අවකාශමාත්‍රය ඉක්මුනුකල්හි පාරාජිකයවේ. පැහැසූ අවකාශමාත්‍රයම ඔවුනට ස්ථානවේ. සියලු හුල් හෝ නාදැති හෝ ස්ථාන නොවේ. බිත්තියට අභිමුඛවසිට මැද අල්ලාගෙන අදීද, මෑත කෙළවරින් පැහැසූ අවකාශය ඈත කෙළවරින් ඉක්මුනු ඇසිල්ලෙහි පාරාජිකයවේ. බිත්ති දෙසට මුණදී පරහාගයෙන් පෙළන්නහුටද මෙම ක්‍රමයවේ. අතින් අල්ලාගෙන සෘජුව ඔසොවනුයේ කෙසගක්පමණකුදු අහස්ගතවූවක්කෙරේද, පාරාජිකයවේ. බිත්තිය ඇසුරුකොට තබනලද්දක් බිත්තිය ගටමින් අදීද, අගින් පැහැසූ අවකාශයවූ මුල හෝ මුලින් පැහැසූ අවකාශයවූ අග හෝ ඉක්මවන්නහුට පාරාජිකයවේ. බිත්තියට

අභිමුඛව සිට අදිනුයේ එක් කෙළවරකින් පැහැසූ අවකාශය අනික් කෙළවර ඉක්මවාද, පාරාජිකයවේ. සෘජුව ඔසොවනුයේ කෙසඟක්පමණ අහස්ගතවූවක් කෙරේද, පාරාජිකයවේ.

'රුක්ඛෙ වා ලග්ගිතං' තල්රුක් ආදියෙහි නගා එල්වා තබනලද්දෙහි. විනිශ්චය අකුස්ආදියෙහි කියූලෙසින්ම දතයුතුය. එහි හටගන්නාවූ තල්ගෙඩිවල්ලවනාහි සොලවන්නහුට ථුල්ලච්චයවේ. යම් ඵලයකින් පාරාජිකවසතුව පිරේද, ඒ ඵලය නටුවෙන් ගිලිහුනුඇසිල්ලෙහි පාරාජිකයවේ. ගෙඩිවල්ල කපාහරීද, පාරාජිකයවේ. අගින් කොළඅතරෙහි නගා තබනලද්දේ, තැබූතැනද නටුවදැයි දෙතැනක් ලබයි. එහි විනිශ්චය කියූනයින් දතයුතුය. යමෙක්වනාහි සිදිපමණඇති තල්ගෙඩිවල්ල බිම වැටෙන්නේ හඬ නගන්නේයයි බියෙන්, තෙමේ එය අගින්ගෙන කොළඅතරට නගා කපාහරීද, කැපූඇසිල්ලෙහි පාරාජිකයවේ. තමන් කළ තැනම සථාන නොවේ. මේ උපායෙන් සියලු වෘක්ෂයන්ගේ පුෂ්පඵලයන්හි විනිශ්චය දතයුතුය.

'පත්තාධාරකෙපි' මෙහි වෘක්ෂාධාරයෙක් හෝ වේවා, වලයාධාරයෙක් හෝ වේවා, දණ්ඩාධාරයෙක් හෝ වේවා, පාත්‍රය තබන යම් කිසිවක්වේ. පැසක් හෝ වේවා පාත්‍රාධරකයි ගිනීමට යන්නේය. එහි තැබූ පාත්‍රයට පාත්‍රයෙන් පැහැසූ අවකාශයම සථානවේ. එහි වෘක්ෂාධාරකයෙහි පස්අයුරකින් සථාන පිරිසිඳීමවේ. එහි තැබූ පාත්‍රය මුවවිටින්ගෙන සිවුදිසාඅතුරෙහි යම්කිසි දිසාවකින් අදින්නේ එක් කෙළවරකින් පැහැසූ අවකාශය අනික් කෙළවර ඉක්මවාද, පාරාජිකයවේ. කෙසඟක්පමණ උඩට ඔසොවන්නහුට පාරාජිකයවේ. පාත්‍රාධාරකයසමග ගෙනයන්නහුටද මේ නයවේ.

වෙහාසථ්ඨකථා නිමි.

—\\—

උදකට්ඨකථායෙහි- **'උදකෙ නික්ඛිත්තං හොති'** රාජභයාදියෙන් බියපත්වූවන්විසින් දියෙන් නොනස්නා සැහැවි ඇති තඹලෝබඳුන් ආදීන්හිලා මැනවින් පිළිසන්කොට වැව් පොකුණු ආදියෙහි ගලානොබස්නා දියෙහි බහාලනලද්දේද, ඒ භාණ්ඩයට පිහිටි අවකාශයම සථානවේ. සියලුදිය සථාන නොවේ. **'ගච්ඡති වා ආපත්ති දුක්කටස්ස'** නොගැඹුරු දියෙහි පයින් යන්නහුට පියවරක් පියවරක්පාසා දුක්කටවේ. ගැඹුරුදියෙහි අත්වලින් හෝ පාවලින් හෝ අත්පාවලින් හෝ ප්‍රයොග කරන්නහුට ප්‍රයොගයක් ප්‍රයොගයක්පාසා දුක්කටවේ. සැළිය

නගාගැනීමපිණිස දියෙහි ගැලීම් ඉපිලීම්හි මෙම ක්‍රමයවේ. ඉදින්වනාහි මේ අතර කිසි දියනයෙකු හෝ සැඩමසෙකු හෝ දැක බියපැමිණියේ පලායේද, අනාපත්තියවේ. ආමඝීනාදියෙහිලා භූමිගතවූ සැළියෙහි කියූනයින්ම විනිශ්චය දතයුතුය. මේවනාහි විශෙෂයවේ:

එහි බිම කැන යටින් අදියි. මෙහි මඩෙහි කිඳුබස්වයි. මෙසේ සයයුරකින් ස්ථානපරිවෙජදයවේ. උපුල්පියුම්, හෙලපියුම්ආදීන්අතුරෙහි යම් පුඹුයකවසතුව පිරේද, ඒ පුඹුය සිදිඇසිල්ලෙහි පාරාජිකයවේ. මෙහි උත්පලජාතීන්ගේ එකද පසෙක්හි යම්තාක් එකද වැහැරියක් නොසිඳේද, ඒ තාක් රකියි. පද්මජාතීන්ගේවනාහි පියුම්දඬුවසිදිකල්හි ඇතුළත හුයක් නොසිඳ පැවැත්තේද, නොරකියි. හිමියන්විසින් සිදතැබූ උත්පලාදීහු වෙත්ද යමක් පාරාජිකවසතුව පුරාද, ඒ පුඹුය ඉදුරුඇසිල්ලෙහි පාරාජිකයවේ. මල්දසයක් එක්කොට මිටිබඳිනලද්දේ යම් මිටියක පාරාජිකවසතුව පිරේද, ඒ මිටිය ඉදුරුකල්හි පාරාජිකයවේ. මහත් මිටිකොට බඳිනලද්දහු වෙත්ද, ඒ මහත්මිටිය උඩ යටදිග් හා සිවුදිගදයන සයයුරින් යම් අයුරකින් තුබූතැනින් පහකරන්නහුට බිමසිටි සැළියෙහි කියූලෙසින් පාරාජිකයවේ. දිග්දඬු ඇති උපුල්ආදීහු වෙත්ද, මල්වල හෝ දඬුවල වැටිකොට දියපිට රැහැන්හි තණඅතුරා තබත් හෝ බඳිත් හෝ ඔවුන්ගේ දිගින් මල්අගින්ද දඬු කෙළවරින්ද සරසද කෙළවරින් යටපිහිටි අවකාශයෙන්ද, උඩද මතුවෙහි සිටියහුගේ පිටින්දැයි සයයුරකින් ඨානාවාවනපරිවෙජදය දතයුතුය.

යම් මහණ දියමතුපිට තැබූ මල්මිටියක් දිය සොලොවා රැළ ගතන්වා කෙසඟක්පමණතමුදු තුබූතැනින් පහකෙරේද, පාරාජිකවේ. නැවත 'මෙහි වූවක් ගන්නෙමි'යි තැන පිරිසිඳ කලපනාකෙරේද, ඒ තාක් රකියි. ගියතැනදී එය උදුරාගන්නහුට පාරාජිකයවේ. දියෙන් ඉතා උඩට නැගුනු මලට දඬුව හා පැහැසිසිටි දියසමග එකාබද්ධවූ සියලු දිය ස්ථාන වේ. එය උපුටා සෘජුව උදුරන්නහුට මල් දඬුවෙහි කෙළවර කෙසඟක්පමණ දියෙන් ඉක්මුනුකල්හි පාරාජිකයවේ. මල් අල්ලාගෙණ නවා අදිනුයේ උපුටාගනීද, දියස්ථාන නොවේ. උපුටාගත් ඇසිල්ලෙහි පාරාජිකයවේ. මිටිකොට බඳිනලද මල් දියතිබෙන තැන හෝ රුකක හෝ ගසක හෝ බැඳතබත්ද, බැඳීම නොමුදා ඇත මැත කරන්නහුට ථුල්ලච්චයවේ. බැඳීම බිඳීගියකල්හි පාරාජිකයවේ. පළමු බැඳීම මුදහැර පසුව ගෙනයේද, මෙහි සයයුරකින් ස්ථානපරිවෙජදයවේ. මෙදෙක **මහාපච්චරි** ආදියෙහි කියනලද්දේය.

පියුම්ගසෙහි හටගත් මල් පියුම්ගසසමග ගනුකැමැත්තහුට මල්නටුවෙන්ද, පත්නටුවෙන්ද, පැහැසූ ජලයෙහි වසයෙන් උඩ හා සරසද සථානපරිවෙජදය යි දතයුතුය. ඒ පියුම්ගස නොඋපුටා මල් හෝ පත් හෝ තමාට අභිමුඛව අදින්නාවූ මොහුට ථුල්ලචචයවේ. උපුටාගත් ඇසිල්ලෙහි පාරාජිකයවේ. මල් පත් නටු තුබූතැනින් තොරනොකොටද පළමුකොට පියුම්ගස උපුටන්නහුට ථුල්ලචචයවේ. පසුව මල් පත් නටු තුබූතැනින් පහවූකල්හි පාරාජිකයවේ. උපුටනලද පියුම්ගසෙහි මලක් ගන්නේවනාහි භාණඩය අගයකරවා කරවියයුත්තේය. පිටතතැබූ රස්කළ අතට තරම්වන සේ මිටිකොටබඳිනලද මලෙහිද මේ නයමවේ. නෙළඹලක් හෝ නෙළඹුදැල්ලක් හෝයන යමකින් පාරාජිකවසතුව පුරාද, එය උපුටන්නහුට පාරාජිකයවේ. මඩෙහි වැදීසිටි අවකාශයවසයෙන්ද මෙහි සථානය පිරිසිඳියයුතුය. ඒ පියුම්අල උදුරන්නහුට සියුම්මුලක් නමුදු නොසිඳුනේවේද, ඒතාක් රකියි. නෙළඹල පුරුකෙහි හටගත් පත්‍රයක් හෝ පුෂපයක් හෝවේද, එද රකීයයි **මහාඅට්ඨකථාවෙහිම** කියනලදී. නෙළඹල ගැටයෙහිවනාහි යොවුන්බවට පැමිණියවුන්ගේ මුවපිළිකාමෙන් කටුවක්වේද, මෙය නොදිග්බැවින් නොරකියි. සෙස්ස උත්පලාදීන්හි කියූනයඇත්තේමය.

සසථාමිකවූ මතස්‍යකවෂපයන්ට වැවිආදියෙහි සියලුජලය සථානවේද, එහෙයින් යම් මහණෙක් පොෂණය කරන තැනක සසථාමිකවූ මසෙකු බිලියකින් හෝ දැලකින් හෝ කුමිනකින් හෝ අතින් හෝ අල්ලාගනීද, ඒ මහණහුට යම් මසකුකරණකොට පාරාජිකවසතුව පිරේද, ඒ මසු කෙසගක්පමණකුදු දියෙන් උඩටගත් ඇසිල්ලෙහි පාරාජිකයවේ. කිසියම් මත්ස්‍යයෙක් අල්ලාගතුලබන්නේ ඇත මැත දුවාද, අහසට හෝ පනීද, ඉවුරෙහි හෝ වැටේද, අහසෙහි හෝ සිටි ඉවුරෙහි හෝ වැවුනු ඒ මසු අල්ලාගන්නහුටද පාරාජිකයමවේ. පිටත ගොදුරු සොයාගිය කැස්බහුද අල්ලාගත්තහුටද, මෙම නයවේ. ජලයෙහි සිටියෙකු ජලයෙන් මුදන්නහුට පාරාජිකයවේ.

ඒ ඒ ජනපදයන්හි සියල්ලන්ට සාධාරණවූ මහාවිලක දිය බැහැරකරන මග ඇසුරුකොට සියල්ලන්ට සාධාරණවූම කුඩා ගහක් සමානවූ මහාදියඇළක් කනිත්. එයින් කුඩාදිය ඇළවල් බැහැරකොට දියඇළ කෙළවර තමතමන්ගේ ප්‍රයොජනයපිණිස වල් සාරත්. ඔවුන්ටවනාහි යම් දවසක ජලයෙන් ප්‍රයෝජනයක්වේද, එකල්හි වල්ද කුඩාදිය ඇළවල්ද මහදියඇළද ශුද්ධකොට වැවෙන් දිය බැහැරකරන මග ඇරදමත්. එයින් දිය සමග මත්ස්‍යයෝ නික්ම අවුත් වළෙහි වැටී වසත්. එහි විලෙහිද මහාදිය ඇළෙහිද මසුන් අල්ලාගන්නවුන් නොවළකත්. තමතමන්ගේ කුඩාදියඇළවලද,

උදකාවාටයන්හිද, පිවිසි මසුන් අල්ලාගන්නට නොදෙත්. වළකාලත්. එහි යම් මහණෙක් විලෙහි හෝ දිය නික්මෙන මාඟියෙහි හෝ මහාදියඇළෙහි හෝ මසුන් අල්ලාගනීද, ඒ මහණ අවහාරයෙන් නොකරවිය යුත්තේය. කුඩාදිය ඇළවල හෝ ආවාටයෙහි හෝ පිවිසියකු අල්ලාගන්නේ අල්ලාගත් මසුගේ අගයවසයෙන් කරවිය යුත්තේය. ඉදින් එයින් අල්ලා ගනුලබන මත්‍සයා අහස්හි පනීද, ඉවුරෙහි හෝ වැටේද, අහස්ගතවූ හෝ ඉවුර වැටුනාවූ හෝ ජලයෙන් මිදුනු ඒ මසු අල්ලාගන්නහුට අවහාරයක් නැත්තේය. කුමක්හෙයින්ද යත්: යම්හෙයකින් ඔවුහු තමාට අයත්තන්හි සිටියහුගේ හිමියෝ වෙත්ද, එහෙයිනි. එහි ව්‍යවස්ථා එබඳුමවූය. කැස්බුකෙරෙහිද මෙම නයවේ.

ඉදින්වනාහි අල්ලාගනුලබන මත්‍සයා ආවාටයෙන් කුඩා ඇළට නගීද, එහිදී ඒ මසු ගන්නහුටද අවහාරයමවේ. කුඩා ඇළෙන් මහඇළටද, මහඇළෙන් විලටද නැගුනහු ගන්නහුට අවහාරයක් නැත්තේය. යම් මහණෙක් බත්හුළුවලින් මසු පොළොඹවා වළෙන් කුඩාඇළට නන්වාගනීද, අවහාරයම වේ. එයින්ද මසු පොළොඹවා මහඇළට නන්වා ගන්නහුට අවහාරයෙක් නැත්තේය. කිසි කෙනෙක්වනාහි කොතැනින් හෝ සියල්ලන්ට සාධාරණ තැනකින් මසුන් ගෙනවුත් පශ්චිමවාසුභාගවූ දියවළෙහි බහා වඩා දවසක් දවසක් පාසා මසුන් දෙතුන්දෙනෙකු මාළුව්‍යඤ්ජන පිණිස මරත්. දියෙහි හෝ අහසෙහි හෝ ඉවුරෙහි හෝ යන යම්කිසි තැනක සිටි මෙබඳු මසකු ගන්නහුට අවහාරය වේමය. කැසුබුකෙරෙහිද මෙම නයවේ. නියං කාලයෙහි නදියෙහි සැඩපහර සිඳී ගියකල්හි කිසි වළතැනෙක දිය රඳ පවතීද, එහි මිනිස්සු මසුන්ගේ විනාශයපිණිස කුකුරුමාන්ගෙඩිවිෂආදිය බහා යෙත්. මත්‍සයෝ ඒවා කා මැරී උඩුහුරුව දියෙහි ඉල්පෙමින් සිටිත්. යම්මහණෙක් එහි ගොස් අයිතිකරුවෝ යම්තාක් එහි නොඑත්ද, ඒතාක් මේ මසුන් ගන්නෙමියි ගනීද, එහි දී ඇගීම්වසයෙන් කරවියයුතුය. පාංශුකූලසංඥාවශයෙන් අල්ලාගන්නහුට අවහාරයක් නැත්තේය. ගෙන්වනාකල්හි හණ්ඩදෙය්‍යවේ. මසුන්ට විෂ දමාගිය මිනිස්සු බඳුන් ගෙනවුත් පුරවාගෙන යත්. 'නැවත එන්නෙමු'යි යම්තාක් ආලයසහිත වෙත්ද, ඒ තාක් ඒ මත්‍සයෝ සඤ්චාමික මත්‍සයෝ වෙත්. යම් කලෙකවනාහි ඒ මිනිස්සු 'අපට කම් නැතැ'යි ආලය රහිතව යෙත්ද, එතැන්පටන් සොරසිතින් ගන්නහුට දුක්කටයවේ. පාංශුකූලසංඥා ඇත්තහුට අනාපත්ති වේ. මස් කැසුබුන් කෙරෙහි යම්සේද සියලු දියෙහි උපදින සතුන් කෙරෙහිද විනිශ්චය මෙසේ දතයුතුය.

උදකට්ඨකථා නිමි.

—॥—

නාවට්ඨකථාවෙහි, පළමුකොට නැව දක්වන්නේ **'නාවා නාම යාය තරති'**යනු කීය. එහෙයින් මෙහි යටත්පිරිසෙයින් රඳන් දෙණුද උණලීයෙන් කළ පහුරද නාවායි දතයුතුය. සීමාසම්මතයෙහිදීවනාහි නිතර හැසිරෙන නෞකා ඇතුළත කැන හෝ පුවරුවලින් බැඳ හෝ කරනලද්දී යටත් පිරිසිදීමෙන් තුන් දෙනෙකු උසුලන්නීම වටී. මෙහිවනාහි එකකු උසුලන්නීද නාවායි කියතුලැබේ. **'නාවාය නිසජ්ජිතං'** ඉන්ද්‍රියබද්ධවූ හෝ ඉන්ද්‍රියබද්ධ නොවූ හෝ යම්කිසිවක්වේද, එහි අවහාරලක්ෂණය ඵලට්ඨයෙහි කියුනයින්ම දතයුතුය. **'නාවං අවහරිස්සාමි'** යනාදියෙහිද දෙවැන්නෙකු සෙවීම යෑම පැහැසීම සෙලවීමයන මොවුහු කියුනය ඇත්තාහුමවෙත්. **'ඛන්ධනං මොචෙති'**යන මෙහිවනාහි යම්තාක් බැම්ම මිදුනුඇසිල්ලෙහි තුබූ තැනින් පහ නොවේද, ඒ නැවෙහි බැම්ම යම්තාක් නොමිදුනේවේද, ඒ තාක් දුක්කටයවේ. මිදුනුකල්හි වනාහි ථුල්ලච්චයද පාරාජිකයදවේ. එය ඉදිරියෙහි පහළවන්නේය. සෙස්ස කියුනය ඇත්තේමය. මේවනාහි පාලිවර්ණනාය.

මෙහිවනාහි මේ පාලිමුක්තකවිනිශ්චයයි: සැඩ දියපහරෙහි බැඳතැබූ නැවට එක් ස්ථානයක්වේ. ඒ නම් බැඳීමය. ඒ බැඳීම මිදුනුඇසිල්ලෙහි පාරාජිකයවේ. එහි යුක්තිය මළපුවුවෙහි බැඳි ශුකරයාගේ විනිශ්චයයෙහිලා කියනලද්දීය. විෂමවාතාදියෙන් විනාශයට පැමිණ දියෙහිගැලී පොළෝතලයට නොපැමිණ මැද සිටි නැව යම් යම් දිය පෙදෙසක් පැතිරගෙන සිටියාවේද, ඒ පෙදෙස මේ නැවට ස්ථානයවේ. එහෙයින් ඒ නැව උඩට හෝ ඔයොවා සොලොවන්නහුට, යටට හෝ ගිල්වන්නහුට, සිවුදිසාවෙහි හෝ පහසලද අවකාශය ඉක්මවන්නහුට ඉක්මුනුඇසිල්ලෙහි පාරාජිකයවේ. නිශ්චලජලයෙහි නොබැඳුනු තමන්ගේ සැහැවියෙන් සිටිනැව ඉදිරියෙන් හෝ පසුපසින් හෝ වම්දකුණුපසින් හෝ අදින්නහුට, එක් කෙළවරකින් පහසනලද අවකාශය, දියෙහි පිහිටි අනික් කෙළවරින් ඉක්මුනුඇසිල්ලෙහි පාරාජිකයවේ. උඩට කෙසඟක් පමණ දියෙන් මිදීසිටිකල්හි යට නැවිතෙලෙන් පහසනලද අවකාශය මුවවිට ඉක්මුනුඇසිල්ලෙහි පාරාජිකයවේ. ඉවුරෙහි බැඳ නිශ්චල ජලයෙහි තැබූ නැවට බැඳීම හා නැව සිටි අවකාශයදැයි ස්ථාන දෙකක්වේ. ඒ නැව පළමුකොට බැඳුමෙන් මුදද, ථුල්ලච්චයවේ. පසුව සයයුරෙන් එක්තරා අයුරකින් තුබූතැනින් පහකෙරේද පාරාජිකයවේ. පළමුකොට තුබූතැනින් පහකොට පසුව බැඳීම මුද හැරීමෙහිද මෙම නයවේ.

ගොඩබිමට නගා උඩුහුරුකොට තැබූනැවට පහසනලද අවකාශයම ස්ථානවේ. පස් අයුරකින් ඒ නැවෙහි ස්ථානපරිච්ඡේදය දතයුතුය. යටිහුරුකොට තැබූනැවටවනාහි මුවවිටින් පහසනලද අවකාශයම

සථානවේ. ඒ නැවෙහිද පස් අයුරකින් සථානපරිවෙජදය දැන යම්කිසි තැනකින් පහසලද අවකාශය උඩට කෙසගක්පමණ ඉක්මුතුඇසිල්ලෙහි පාරාජිකය දතයුතුය. ගොඩබිමට නගා දැවගැට දෙකක් මතුවෙහි තැබුනැවෙහි ඒ දරුසටිකයන්ගේ පහසලද අවකාශයම සථානවේ. එහෙයින් එහි ඇළපා මතුවෙහිම එලූ බැඳුනු සළුවෙහිද නාගදනතයන්හිතැබූ හිණ්ඩිවාලයෙහිද කියූනයින් විනිශචය දතයුතුය. යොතින් බැඳි නැවෙහිවනාහි හැටහැත්තෑ බඹපමණ දිගයොත නොමුදුම ඇද පොළොවෙහි ලැගුනක්කොට යොතසමග ගොඩබිම තැබූ නැවට පැහැසූ අවකාශමාතුයම සථානනොවේ. තවද යොතෙහි කෙළවරපටන් නැව පොළොවෙහි පිහිටි අවකාශය පිළිබඳ පශචිමානතය යම්තාක්ද, ඒතාක් දිගින්ද, සරසවනාහි නැව හා යොතද පොළොවෙහි පිහිටි කෙළවරපමණක් සථානයයි දතයුතුය. ඒ නැව දිගින් හෝ සරසින් අදින්නහුට එක් කෙළවරකින් පහසලද අවකාශය, පොළොවෙහි පිහිටි අනික්කෙළවරින් ඉක්මුතුඇසිල්ලෙහි උඩින් කෙසගක්පමණ යොතසමග පොළොවෙන් මිදූකල්හි පාරාජිකයවේ. යම් මහණෙක් තොට තුබූ නැවකට නැගී සොරසිත් ඇත්තේ රිටකින් හෝ පළුපතකින් හෝ පදීද, පාරාජිකවේ. ඉදින්වනාහි කුඩය හෝ දිග හැර සිවුර හෝ පාවලින් පාගාගෙන අත්වලින් ඔසොවා රුවල සමාන කොට හුළං ගන්වාද බලවත් වාතයකින් නැව ගෙනයේද, වාතයෙන්ම ඒ නැව ගෙනයනලද්දේවේ. පුදගලයාහට අවහාරයක් නැත්තේය. ප්‍රයොගය ඇත්තේය. ඒවනාහි ඨානාචාවන ප්‍රයොගයනොවේ. ඉදින්වනාහි මෙසේ යන ඒ නැව පියවි ගමන සිදදමා අන් දිසාභාගයකට පමුණුවාද, පාරාජිකවේ. තෙමේම යම්කිසි ගම්තොටකට පැමිණිනැව තුබූතැනින් පහනොකරණුයේ විකුණායේද අවහාරයක් නැත්තේය. හණ්ඩදෙය්‍යවේ.

නාවට්ඨකථා නිමි.

—\\—

යානට්ඨකථාවෙහි, යානය පළමුකොට දක්වන්නේ **'යානං නාම වයහං'** යනාදිය කීය. එහි මතුවෙහි මණ්ඩපයක්වැනිවූ පුවරුවැසුම සියල්ල වෙළුනක්කොට හෝ වසාකරනලද්ද **වයහ** නම්වේ. දෙපස රන් රිදී ආදියෙන් කළ ගොනැස් දී ගුරුළු පියාපත්ලෙසින් කරනලද්දී **සඳුමානිකා** නම්වේ. රියද ගැලද ප්‍රසිද්ධමය. ඒ යානයන්අතුරෙහි යම්කිසි යානයක සවිඤඤණකවූ හෝ අවිඤඤණකවූ රාසි ආදිවසයෙන් තැබූ භාණ්ඩයක් සොරසිතින් තුබූතැනින් පහකරන්නහුට නාවට්ඨයෙහිද ථලට්ඨයෙහිද කියූනයින්ම පාරාජිකය දතයුතුය. මේවනාහි විශෙෂයවේ:

යානයෙහි තුබූ සහල්ආදී බඩුවක් පැසින් ගන්නහුට පැස නොඑසවූකල්හිද, පැසට පහරා සහල්ආදීන්ගේ එකටබැඳිබව වෙන්කළකල්හිද පාරාජිකයවේ. ගොඩබිම තුබූ භාණ්ඩාදියෙහිද මේ නයලැබේ.

'යානං අවහරිස්සාමි' යානයක් සොරසිතින් ගන්නෙමියි යනාදියෙහි දෙවැන්නෙකු සෙවීම්ආදීහු කියනලදනය ඇත්තාහුමය. **'යානා චාවෙති'** තුබූතැනින් පහකෙරේයයන මෙහිවනාහි ගොනුන් දෙදෙනෙකු යෙදූ යානයට, ගොනුන් දෙදෙනාගේ පාඅටද රියසක් දෙකදැයි සථානදසයෙක්වේ. වියගසෙහි හිඳ ඒ යානය පදවන්නාවූ සොරසිත්ඇති මහණහුට ගොනුන්ගේ පානැගීමෙහිදී ථුල්ලචචයවේ. පොළොවෙහි පිහිටි පෙදෙසින් රෝදදෙක කෙසගක්පමණ ඉක්මුනුකල්හි පාරාජිකයවේ. ඉදින්වනාහි ගොන්නු 'මෙතෙමේ අපගේ හිමියා නොවන්නේය'යි දැන වියගස හැරපියා අදිමින් යම්තාක් සිටිත් හෝ වෙත්ද, සොලවත් හෝ වෙත්ද, ඒ තාක්රකියි. ගොනුන් නැවත කෙලින් සිටුවා පිළියෙලකොට වියගස නන්වා දැඩිකොටයොද කැවිටෙන් ඇන පදවන මහණහුට කියූලෙසින්ම ඒ ගොනුන්ගේ පානැගීමෙහිදී ථුල්ලචචයවේ. රියසක් පොළොවෙහි පිහිටිපෙදෙසින් කෙසගක්පමණකුදු ඉක්මුනුකල්හි පාරාජිකයවේ.

ඉදින් මඩසහිත මගෙහි එක් සකක් මඩෙහි එරුණේවේද, දෙවන සක ගොනුන් පෙරළමින් අදින්ද, එක් සකක් සිටිබැවින් අවහාරයක් නොවේ. ගොනුන් කෙළින්සිටිනසේ පිළියෙලකොට පදවන මහණහුට පිහිටාසිටි සක පැහැසූ පෙදෙසින් කෙසගක්පමණ ඉක්මවූකල්හි පාරාජිකයවේ. ගොනුන් අටදෙනකු යෙදූ යානයට, සිවුතිසෙකැයි මේ උපායයෙන් ගොනුන්යෙදූ යානයපිළිබඳ සථානභෙදය දතයුතුය. ගොනුන් නොයෙදූ යම් යානයක් වියගසෙහි ඉදිරිපස හා පසුපස පිටිවහල්දඩු එකකින් හා පිටිවල්දඩු දෙකකින් රුකුල් දී තබනලද්දේද, ඒ යානයට රුකුල්දුන් තුන්දඩුකඩ හා දෙසක්හුගේවසයෙන් පස්තැනක්වේ. ඉදින් වියගසෙහි රුකුල්දඩුව යටපෙදෙසෙහි යම්සේ දෙකොටසකින්යට පිහිටාද, සථාන සයක්වේ. පසුපසින් රුකුල් නොදී වියගසෙහි රුකුල් දෙන ලද්දහුගේම රුකුල්දීම්වසයෙන් සථානතුණක් හෝ සතරක්වේ. වියගසින් පුවරුයෙක හෝ දූවක හෝ මතුවෙහි තබන ලද්දහුට සථානතුණක්වේ. පොළොවෙහි තැබූ යානයට එසේය. ඒ යානය ඇද හෝ ඔසවා ඉදිරිපසින් හා පසුපසින්ද තුබූතැනින් පහකරන්නහුට ථුල්ලචචයවේ. සක් පිහිටිතැන කෙසගක්පමණ ඉක්මුනුකල්හි පාරාජිකයවේ. සක් බැහැරකොට දෙඅක්හිසින් දූවමතුවෙහි තැබූ යානයට සථානදෙකක්වේ. ඒ යානය අදිනුයේ හෝ ඔසවනුයේ හෝ පැහැසූ අවකාශයඉක්මවාද පාරාජිකයවේ. බිමතැබූ යානයට වියගසින්ද ගැල්බාදෙකෙහි අක්දඩු ශක්තිමත්කරනුපිණිස

දෙඇනිලිමෙන් වැද්දූ දුවඇණසතරින්ද පිහිටා සිටීම්වයයෙන් සථානපසක්වේ. වියගස අල්ලාගෙන ඒ යානය අදින මහණහුට ඒ ඇණවල පැසුළුකෙළවරින් පළමුකෙළවර ඉක්මුනුකල්හි පාරාජිකයවේ. ඇණ අල්ලාගෙන අදින මහණහුට ඇණවල ඉදිරිකෙළවරින් පැසුළුකෙළවර ඉක්මුනුකල්හි පාරාජිකයවේ. ඒ ඒ පාඤියන් ගෙන අදින මහණහුට ඇණවලම සරසපිහිටි තැන ඉක්මීමෙන් පාරාජිකයවේ. මැදින් අල්ලාගෙන ඔසවන මහණහුට කෙසඟක්පමණ පොළොවෙන් මිදුනුකල්හි පාරාජිකයවේ.

නැවත උදධිකණු නොවේද, සමවම බාහුවකොට මැදින්විද අක්ඛිස්වද්දනලද්දේවේද, ඒ යානය යටතලයෙහි හාත්පසින් සියලු පොළොව පහසා සිටීද, එහි සිවුදිසාවෙහි උඩද පැහැසූ තැන් ඉක්මීම්වසයෙන් පාරාජිකය වේයයි දතයුතුය. නැබින් පොළොවෙහි තැබූ සකටයට එක්ම සථානයක්වේ. එහි පිරිසිදීම පස්අයුරකින්වේ. නිම්වළලුපසින්ද නැබින්ද පහසාසිටි සකටයට සථානදෙකක්වේ. නිම්වළල්ලෙන් නැගීසිටි පෙදෙස පයින් පාගා බිම පහසවා අර හෝ නිම්වළල්ල හෝ අල්ලාගෙන ඔසවන්නහුට තමන් පැගුතැන සථානනොවේ. එහෙයින් එහි සිටිකල්හිද සෙසු තැන් ඉක්මුනුඇසිල්ලෙහි පාරාජිකයවේ. බිත්තිය ඇසුරුකොට තැබූ වක්‍රයටද සථානදෙකක්වේ. එහි පළමුකොට බිත්තියෙන් මුදන්නහුට ථුලලවවයවේ. පසුව පොළොවෙන් කෙසඟක්පමණ නඟාගත්කල්හි පාරාජිකයවේ. පළමුකොට පොළොවෙන් මුදන්නහුට ඉදින්බිත්තියෙහි පිහිටිතැන වෙනස්නොවේනම්, මේ නයමවේ. නැවත අර අල්ලාගෙන යටට අදින්නහුට බිත්තිය පැහැසසිටි අවකාශයෙහි උඩකෙළවර යටකෙළවර ඉක්මවාද, පාරාජිකයවේ. මගටබැස සිටි යානයෙහි යාන හිමියා කිසියම් කටයුත්තක් හෙතුකොට බැස මඟින් ඉවත්වූයේවේද, එකල්හි අන් මහණෙක් පෙරමග එනුයේ රකින්නකු නැති යානය දැක 'යානය අවහරණය කරන්නෙමි' යි නඟීද, ඔහුගේ ප්‍රයොගයක් නැතිවම ගොන්නු එයගෙන ගියාහුද අවහාරයක් නැත්තේය. සෙස්ස නැවෙහි තුබූ භාණඩයෙහිලා කියනලද්ද සමානවේ.

යානථාකථා නිමි.

—\\—

මෙයින් මතු හාරයම **භාරථ**නම්වේ. ඒ භාරය සීසභාරාදීන්ගේවසයෙන් සිවුපරිද්දෙකින් දක්වනලද්දේවේ. එහි සීසභාරාදියෙහි නො මුළාබවපිණිස ඛීණාදීන්ගේ පිරිසිදීම මෙසේ දතයුතුය.

එහි හිසපිළිබඳ ඉදිරියෙහි බෙල්ලෙන්මතු ගලවළුය. කිසිවකුන්ගේ බෙල්ලෙහි පිටිපස කෙසයන්ගේ කෙළවර සුළියක්වේ. බෙල්ලෙහිම දෙපස කිසිවකුන්ගේ කෙසයෝත් පහතට බැස හටගනිත්. ඔවුහු කණ්ඨවූළිකායි කියනුලබත්. ඔවුන්ගේ යට කොටසදැයි මේ යටපසින් පිරිසිඳීමය. එයින් උඩ හිසය. මේ අතර සිටි හාරය **සීසභාර**නම්වේ. දෙපස කන්සිළුපටන් යට, වැලමිටපටන් උඩ, බෙල්ලෙහි පිට මැදසුළියපටන්ද, ගලවළුයෙහි පටන්ද යට, පිට මැද සුළියපටන්ද, උරහිස පිරිසිඳීමපිළිබඳ මැද හෘදයාවාටයපටන්ද, මතුයෙහි සකන්ධයයි. මේ අතර සිටි හාරය **බන්ධභාර**නම්වේ. පිටමැද සුළියෙන්ද හෘදයාවාටයෙන්ද පටන්, යට පානිය සිළුවදක්වාවූ පෙදෙස කටියපිළිබඳ පිරිසිඳීමය. මේ අතර හාත්පස සිරුරෙහි සිටි හාරය **කටිභාර**නම්වේ. වැලමිට පටන් යට අත්තියසිළුදක්වාවූ මේ පෙදෙස **ඔලම්බකපරිවෙජදය**යි. මේ අතර සිටිහාරය ඔලම්බකනම්වේ.

දැන් **'සීසභාරං'**යනාදි තන්හි පෙර නොකියූ මේ විනිශ්චයවේ. යම් මහණෙක් 'මෙය ගෙන මෙහි යව'යි අයිතිකරුවන්විසින් නොඅණුවනලදුයේ, තෙමේම 'මට මෙනම් භාණ්ඩය දෙවු, මම තොපගේ භාණ්ඩය උසුලම්'යි ඔවුන්ගේ භාණ්ඩය හිසින්ගෙන යනුයේ සොරසිතින් ඒ භාණ්ඩය පහසාද, දුක්කටයවේ. පෙරකියූ සීසපරිවෙජදය නොඉක්මවන්නේම හිසෙන් නොඔසවම්නම් ඈත මැත ගටම්න් හසුරුවාද, නැවත නැවත හසුරුවාද, ථුල්ලච්චයවේ. කරට බාගත්ඇසිල්ලෙහි 'උසුලාවා'යි අයිතිකරුවන්ට සිතක් ඇත්තේද, ඔවුන්විසින් ඒ පිණිසනොඅණුවනලදබැවින් පාරාජිකයවේ. කරට නොනගාම හිසින් කෙසගක්පමණ මුදන්නහුට පාරාජිකයවේ. බර දෙකක් අතුරෙහි එක් බරක් හිසෙහිද එක් බරක් පිටෙහිද පිහිටියේවේ. එහි දෙතැනක්හුගේවසයෙන් විනිශ්චය දතයුතුය. මේවනාහි සුඛසීසභාරාදීන්ගේවසයෙන්ම දෙශන අරඹනලද්දීය. යම් මේ විනිශ්චයක් සීසභාරයෙහි කියනලද්දේද, බන්ධභාරාදියෙහිද මේ විනිශ්චයවේ. **'හත්ථභාරං'** යනමෙහිවනාහි අතින්ගත්බැවින් එල්බෙන බර, අතෙහි බර යි කියනලද්දේය. ඒ අතෙහිවූ බර, පළමුකොටම බිමින් හෝ ගන්නාලද්දේවේවා, පිරිසිදු සිතින් සීසාදියෙන් හෝ ගන්නාලද්දේවේවා, අතෙහි බරයි කියාම ගිනීමට යන්නේය. ඒ අතෙහි බර සොරසිතින් එබඳුවූ ග්‍රහණඨානයක් දක බිම හෝ ගස් ආදීන්අතුරෙහි හෝ තබන්නහුට අතින් මිදුනු ඇසිල්ලෙහි පාරාජිකයවේ. **'භූමිට්ඨෝ ගණ්හාති'** යන මෙහිවනාහි ඒ බරඅතුරෙහි යම් කිසිවක් උදය වැළඳීම්ආදීවූ කරුණක් හෙතුකොට පිරිසිදු සිතින් බිම තබා නැවත සොරසිතින් කෙසගක්පමණ නගාගන්නහුට පාරාජිකයවේ.

භාරඨඨකථා නිමිය.

——\\——

ආරාමට්ඨකථායෙහිද - ආරාමය පළමුකොට දක්වන්නේ, **'ආරාමො නාම පුප්ඵාරාමො ඵලාරාමො'**යනු කියේය. ඔවුනතුරෙහි සීනිද්දආදීන්ගේ මල් පිපෙනුයේ පුෂ්පාරාමනම්වේ. ආම්‍රඵලාදීන් පලගැනෙන පෙදෙස ඵලාරාමනම්වේ. ආරාමයෙහි සිවුතැනෙකින් තැබූ භාණ්ඩයේ විනිශ්චය භූමට්ඨාදියෙහි කියූනයමවේ. එහි හටගත්තෙහිවනාහි **'මූලං'**යනු සුවඳහොට ඉරිවෙරාදීවූ යම්කිසිමූලෙකි. එය උපුටා හෝ උපුටනලද්දක් හෝ ගන්නහුට යම් මූලකින් පාරාජිකවසුතුව පිරේද, එය ගත්කල්හි පාරාජිකයවේ. අලයද මූලයන වචනයෙන්ම සඩ්ග්‍රහකරනලද්දේය. උපුටන්නහුටද මෙහි සැලපමාත්‍රයක් නමුත් නොසිදුනුකල්හි ථුල්ලච්චයමවේ. එහි විනිශ්චය නෙළුඔලයෙහි කියූනයින් දතයුතුය. **'තචං'** යනු බෙහෙත්පිණිස හෝ සිවුරුරඳන්පිණිස හෝ ප්‍රයොජනයට ගැනීමට සුදුසුවූ යම්කිසි රුක්සුඹුලෙකි. එය උපුටා හෝ උපුටනලද්දක් හෝ ගන්නහුට මූලයෙහි කියූනයින් පාරාජිකයවේ. **'පුප්ඵං'**යනු දසමන් බෝලිද්ද ආදීවූ යම්කිසිමලෙකි. එය නෙලා හෝ නෙලනලද්දක් හෝ ගන්නහුට උපුල්පියුම්හි කියූනයින් පාරාජිකයවේ. මල්වලනටුව හෝ බැඳීම හෝ නොසිදුනේනම් රකියි. කිසියම් මලක නටුව තුළ හිද්දක්වේද, ඕතොමෝ ඔහු නොදරකියි. **'ඵලං'**යනු අඹඵල තල්ඵල ආදීවූ යම්කිසි ඵලයකි. එය රුකකින් නෙලාගන්නහු ගේ විනිශ්චය රුකෙහි එල්ලූ බඳුපොදිආදිය පිළිබඳ කථාවෙහි කියනලද්දේය. බැහැරකොට තබනලද්ද භූමට්ඨාදියෙහි සඩ්ග්‍රහ කරනලද්දේමය.

'ආරාමං අභියුඤ්ජති'යනු අන්සතුවූවක් 'මෙය මා සතුය'යි බොරුකියා අන්සතුබව දැන දැන තමන් සතුයයි යුකතිබැණ අයත්කරගනුපිණිස සොරසිතින් සහායභාවාදියපිණිස දෙවැන්නෙකු සෙවීම්වසයෙන් අභියොගකෙරේද, අදිනනාදනයෙහි ප්‍රයොගබැවින් දුක්කටයවේ.

'සාමිකස්ස විමතිං උපපාදෙති' විනිශ්චයෙහි දක්ෂබැවින් හෝ බලවතුන් ඇසුරුකිරීම්ආදියෙන් හෝ අරම්භිම්යාහට සැක උපදවා යනුයි. කෙසේදයත්: එසේ විනිශ්චයෙහි යෙදුනු ඔහු දැක අරම්භිම්තෙමේ මෙසේ සිතයි. 'මම මේ ආරාමය තමන් සතුකරගන්නට හැකිවන්නෙමිද නොහැකි වන්නෙමිදැයි මෙසේ ඔහුට උපදින විමතිය ඔහුවිසින් උපදවනලද්දී වන්නීය. එහෙයින් ථුල්ලච්චයට පැමිණේ. **'ධුරං නික්ඛිපති'** යම් කලෙකවනාහි හිම්තෙමේ 'මෙතෙමේ තදය, කැකුළුය, මාගේ ජීවිතයට හා බ්‍රහ්මචර්‍යයට අනතුරු කරන්නේය, දැන් මට මේ ආරමයෙන් කම්නැතැ'යි ධුරනිඃක්ෂෙප කෙරේද චොදකතෙමේ පාරාජිකාවට පැමිණේ. ඉදින් තෙමේත් කළ ධුරනිඃක්ෂෙප ඇත්තේවේද, තවද හිමියාවිසින් ධුරනිඃක්ෂෙපය කළකල්හිද,

චොදකතෙමේ ධුරය නිඃක්ෂෙප නොකොටම 'මොහු මොනවට පෙළා මාගේ අණ පැවැත්මදක්වා කුම්කරමිදැයි විචාරන්නෙකුගේ තත්ත්වයෙහි ඔහු තබාදෙන්නෙම්'යි දියයුතුබැවිහි උත්සාහසහිතවේද, ඒතාක් රකියි.

නැවතත් චොදකතෙමේ අසිඳැ 'දැන් මොහුට එය නොදෙන්නෙම්'යි ධුරනිඃක්ෂෙපය කෙරේද, හිමිතෙමේ ධුරනිඃක්ෂෙපය නොකෙරේද, පක්ෂයක් සොයාද, ලජ්ජිපිරිසක් ලබම්ද, පසුව දැනගන්නෙම්යි ඒතාක් කල්බලා ඉඳීද, නැවත ගැනීමෙහිම උත්සාහ ඇත්තේවේද, රකීමය. යම් කලෙකවනාහි හෙතෙමේද 'නොදෙන්නෙම්'යිද හිමිතෙමේත් 'නොලබම්'යිද මෙසේ දෙදෙනම ධුරය බහාතබත්ද, එකල්හි චොදකයාහට පාරාජිකයවේ. නැවත අභියොගකොට විනිශ්චයකරන්නේ විනිශ්චය නොනිමිකල්හි හිමියාවිසිනුදු ධුරනිඃක්ෂෙපය නොකළකල්හි තමන්ගේ අස්වාමිකභාවය දන්නේම එයින් කිසිමලක් හෝ ඵලයක්හෝ ගනීද, බඩුවෙහි අගයවිසින් කරවියයුත්තේය. **'ධම්මං චරන්තො'** භික්ෂුසඞ්ඝයාගේ සමීපයෙහි හෝ රාජකුලයෙහි හෝ විනිශ්චය කරන්නේ. **'සාමිකං පරාජෙති'** විනිශ්චයකරන්නවුන්ට අල්ලස් දී කූටසාක්ෂි බස්වා අරම්භිමියා දිනායයන අත්ථියි. **'ආපත්ති පාරාජිකස්ස'** පාරාජිකාපත්තිය වන්නීය. හුදෙක් ඔහුටම නොවේ. දැන සිතා ඔහුගේ අත්ථසිද්ධියෙහි පැවති කූටවිනිශ්චයෙහි නියුක්ත විනයධරයන්ටද, කූටසාක්ෂිකයන්ටද, යන සියල්ලන්ට පාරාජිකයවේ. මෙහිද හිමියාගේ ධුරනිඃක්ෂෙපවශයෙන්ම පරාජය දතයුතුය. අත්නොහළ ධුරය ඇත්තේ නොපරදවනලද්දේමවේ. **'ධම්මං චරන්තා පරජ්ජති'** ඉදින්ධර්මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් විනිශ්චය පැවතිබැවින් තෙමේ පරාජයට පැමිණේද, මෙසේද මුසාවාදයෙන් හිමියන්ට පීඩාකිරීම හේතුවෙන් ථුල්ලච්චයටපැමිණේ.

ආරාමට්ඨකථා නිමි.

——\\——

විහාරට්ඨකථාවෙහිද - සිවුතැනින් බහාතැබූ භාණ්ඩය කියූනය ඇත්තේමය. යුකති කියා පෑමෙහිදී සිවුදිසා වැසි සඞ්ඝයා උදෙසා හික්ෂූන්ට දෙනලද මහත්වූද කුඩාවූද විහාරයකට හෝ විහාරයතුළ වෙන් වෙන්ව පවුරින් වටකළ තැනකට හෝ මහත්වූද කුඩාවූද ආවාසයකට හෝ යුකතිය කියාපාන්නහුගේ යුකතිය කියාපෑම නොතහිය. අසිඳ ගන්නටද නොහැකිවේ. කුමක්හෙයින්ද්යත්: සියල්ලන් පිළිබඳ ධුරනිඃක්ෂෙපය නොකෙරෙත්යයි **දීඝභාණකාදි** හෙදඇති ගණයක් සතුවූවකට හෝ එක් පුද්ගලයක්හට සතුවූවකට හෝ යුකතිය කියා පාගන්නේ ඔවුන්ලවා

ධුරනිඃක්ෂෙපය කරවන්නට හැකිවේද, එහෙයින් එහි ආරාමයෙහිකියූනයින් විනිශ්චය දතයුතුය.

විහාරඨඨකථා නිමි.

—\\—

ඛෙත්තඨඨකථාවෙහිද කෙත පළමුකොට දක්වන්නේ **'ඛෙත්තං නාම යත්ථ පුබ්බණ්ණං වා අපරණ්ණං වා ජායති'**යනු කීයේය. එහි **'පුබ්බණ්ණං'**යනු සාලිආදි යජනවිධධාන්‍යයෝය. **'අපරණ්ණං'**යනු මුං, මෑ ආදීහුය. උක්, කෙත්ආදියද මෙහිම ඇතුළත්ය. මෙහිද සිවුතැනින් තබනලද්ද කියූනය ඇත්තේමය. එහි හටගත්තෙහිවනාහි ඇටපමණක් අතට එනලෙසින් හැල්කරල් ආදිය සූරාගෙන හෝ එකෙකක් අතින්ම සිඳ හෝ දකැත්තෙන් ලියා හෝ බොහෝ කරල් එකට උපුටා හෝ ගන්නහුට, යම් බිජුවටක හෝ කරලෙක හෝ මිටෙක හෝ මුං, මෑ, ඇපලයක හෝ පාරාජිකවස්තුව පිරේද, එය බැඳුමෙන් මිදුනුඇසිල්ලෙහි පාරාජිකයවේ. දණ්ඩ හෝ පට්ටය හෝ සිවිය හෝ සවලපමාත්‍රවූයේ නොසිඳුනේනම් රකියි. වීනටුව දිග්වූයේවේද, යම්තාක් ඇතුල්නළින් වීකරලෙහි දඬුව නොනික්මේද, ඒතාක් රකියි. කෙසගක්පමණ නමුදු නළින් දඬුවෙහි යටතලය නික්මුනුකල්හි භාණ්ඩයාගේ අගයවසයෙන් කරවියයුතුය. දැකැත්තෙන් සිඳගැනීමෙන්වනාහි මිටින් අල්ලාගත්තවුන් යටින් සිඳිකල්හිද, ඉදින් කරල් නොසිඳීසිටි කරල්සමග අවුල්වූයේද, බැඳුනේද ඒතාක් රකියි. අවුල් හැර කෙසගක්පමණකුදු ඔසවන්නහුට පාරාජිකවස්තුව පුරාද, පාරාජිකයවේ. නිම්යන්විසින් දැකැත්තෙන් සිඳතබනලද්දක් බොල්සහිතකොට හෝ බොල්රහිතකොට හෝ ගන්නහුට යමකින් පාරාජිකවස්තුව පුරාද, එය ගත්කල්හි පාරාජිකයවේ. 'මේ වීකරල් මැඩ බොල්ආදිය පොළාහැර හරබිජු ගන්නෙමි'යි කලපනාකෙරේද, ඒ තාක් රකියි. මැඩීම් පොළාලීම්හි තුබූ තැනින් පහකරන්නහුටද පාරාජිකයක් නැත්තේය. පසුව ඒ වී බඳුනට දමූඇසිල්ලෙහි පාරාජිකයවේ. මෙහි අභියොගය කියූනය ඇත්තේමය.

හුල් සිටුවීම් ආදියෙහිලා පොළොවවනාහි අගය නොකටහැකිය. එහෙයින් එක්ම හුලින් කෙසගක්පමණ නමුදු පෘථිවිප්‍රදෙශය හිමියන් බලාසිටියදී හෝ නොබලා සිටියදී තමන් සතුකෙරේද ඒ හුලෙහි නමකොටා හෝ තම නොකොටා හෝ පොළොව කැන හුල පිහිටුවාලූඇසිල්ලෙහි ඔහුටද, මෙහිදී යම්කෙනෙක් එකවඡඳ වෙයිද, ඒ සියල්ලන්ටද පාරාජිකයවේ. ඉදින් හුල් දෙකකින් ගතයුතුවේනම්, පළමු හුල නිමිතිකොට

ථුල්ලච්චයවේ. දෙවන හුල නිමිතිකොට පාරාජිකයවේ. ඉදින් හුල් තුනකින් ගතයුතුවේනම්, පළමු හුල නිමිතිකොට දුක්කටයවේ. දෙවන හුල නිමිතිකොට ථුල්ලච්චයවේ. තෙවන හුල නිමිතිකොට පාරාජිකයවේ. මෙසේ බොහෝ හුල් පිහිටුවාලූකල්හිද අවසන්හිවූ හුල් දෙක හැර, පළමු හුල් නිමිතිකොට දුක්කටවේ. අවසන්හිවූ හුල් දෙකින් එකකින් ථුල්ලච්චයවේ. අනිකෙන් පාරාජිකයවේයයි දතයුතුය. හෙදවනාහි හිමියන්ගේ ධුරනිඃක්ෂෙපයෙන්වේ. සියලුතන්හි මෙසේය.

'රජ්ජුං වා' 'මෙය මාසතුය'යි හඟවනු කැමැත්තේ රූහණක් හෝ අදීද, මනිනයටක් හෝ හෙළාද, දුක්කටයවේ. දැන් ප්‍රයොග දෙකකින් තමන්සතු කරන්නෙමියි යෙදූ ඔවුන් අතුරෙහි පළමුවැන්න නිමිතිකොට ථුල්ලච්චයවේ. දෙවැන්න නිමිතිකොට පාරාජිකයවේ. **'වතිං වා'** අන්හු අයත් කෙතක් වටකිරීම්වසයෙන් තමන්ට අයත්කරනු කැමැත්තේ දැව කැන සිටුවාද, ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටවේ. එක් ප්‍රයොගයක් නොයෙදුනුකල්හි ථුල්ලච්චයවේ. එද යෙදුනුකල්හි පාරාජිකයවේ. ඉදින් එපමණකින් නොහැකිවන්නේ ශාඛාපරිවාරයෙන්ම තමාට කරන්නට හැකිවේදැයි සිතා කොළ අතු කපා හෙළීමෙහිද මේ නයමවේ. මෙසේ යමකින් යමකින් වටකොට තමන්ට අයත්කරන්නට හැකිවේද, ඒ ඒ තන්හි ප්‍රථම ප්‍රයොගයන්ගෙන් දුක්කටයවේ. අවසන්හි ප්‍රයොග දෙක අතුරෙහි එකකින් ථුල්ලච්චයවේ. අනිකෙන් පාරාජිකයවේයයි දතයුතුය. **'මරියාදං වා'** අන්හු අයත් කෙතක් 'මේ මාගේය'යි හඟවනුකැමැතිව තමන්ගේ කෙතෙහි ඉමවූ කෙත්නියර, යම්සේ අන්හු අයත් කෙත ඉක්මවායේද, මෙසේ හුල් සිටුවාද, පස් මැටි ආදියෙන් වඩාපළල්කෙරේද, පෙර නොකළ ඉමක් පිහිටුවාද, පළමු ප්‍රයොගයන්ගෙන් දුක්කටවේ. පැසුළු ප්‍රයොග දෙකින් එකෙකින් ථුල්ලච්චයවේ. අනිකෙන් පාරාජිකයවේ.

ඛෙත්තට්ඨකථා නිමි.

——\\——

වත්ථුට්ඨකථායෙහිද වාසනුව පළමුකොට දක්වන්නේ **'වත්ථු නාම ආරාමවත්ථු විහාරවත්ථු'**යනු කීයේය. එහි බිජුවට හෝ රොපණයකටයුතු පැල හෝ රොපණය නොකොටම හුදෙක් බිම පිරිසිදුකොට ගඩොල් ගල් දැව යන මෙයින් කළ තෙවැදරුම්පවුරු අතුරෙන් යම්කිසි පවුරකින් වටකොට හෝ වටනොකොට හෝ මල්වතු ආදියපිණිස තැබුබිම්පෙදෙස **ආරාමවත්ථු**නම්වේ. මේ නයින්ම එක් විහාරයක් එක් පිරිවෙණක් එක් ආවාසයක් යන මොවුන්සඳහා තැබුබිම්පෙදෙස **විහාරවත්ථු**නම්වේ. යම්

බිම්පෙදෙසක් පෙර ආරාමයක්ව විහාරයක්ව තුබුනේ, පසුව නැසීගොස් බිම පමණක් සිටියේ ආරාම විහාර කෘත්‍යය නොකෙරේද, ඒ බිම්පෙදෙසද ආරාම විහාරවාසතු සඞ්ග්‍රහයෙන්ම සඞ්ග්‍රහ කරණුලද්දේය. මෙහි විනිශ්චය බෙත්තඨයෙහි කියනලද්ද සමානවේමය.

වත්ථුඨකථා නිමි.

—\\—

ගාමඨකථාවෙහි යමක් කියයුතුද, එය කියනලද්දේමය.

අරඤ්ඤඨකථාවෙහි අරණ්‍යය පළමුකොට දක්වන්නේය. **'අරඤ්ඤං නාම යං මනුස්සානං පරිග්ගහිතං හොති තං අරඤ්ඤං'**යි කීයේය. එහි යම්යෙකින් මිනිසුන්විසින් අයත්කරගත් අරණ්‍යඇත්තේද, මිනිසුන්විසින් අයත්කර නොගත් අරණ්‍යඇත්තේද, මෙහිවනාහි මිනිසුන්විසින් අයත්කර ගත් ආරක්ෂාසහිතවූ යම් අරණ්‍යයක්වේද, යම් තැනකින් මිල නොදී දව වැල්ආදිය ගන්නට නොලබත්ද ඒ අරණ්‍යය අදහස් කරණුලදය. එහෙයින් **'යං මනුස්සානං පරිග්ගහිතං හොති'** කියා නැවත **'අරඤ්ඤං'**යනු කියනලද්දේය. එයින් මේ අර්ථය දක්වාලන්නේය: මිනිසුන්විසින් අයත්කරගත්බව අරණ්‍යයයපිළිබඳ ලක්ෂණයනොවේ. යම් තැනක් තමන්ගේ අරණ්‍යලක්ෂණයෙන් අරණ්‍යවේද, මිනිසුන්විසිනුදු අයත්කරගන්නා ලද්දේද, එතැන මේ අර්ථයෙහි අරණ්‍යයවේය. එහි විනිශ්චය ආරාමඨාදියෙහි කියනලද්ද සමානවේ. එහි හටගත් ගස්කොළන් අතුරෙහිවනාහි මෙහි එකද මාහැහි රුකක් සිඳලූකල්හි පාරාජිකයවේ.

'ලතං වා'යන මෙහි වේවැලද ලියද ලතාමය. එහි යම් වේවැලක් හෝ ලියක් හෝ දිග්වේද, මහරුක් හා ගස්ද විනිවිද හෝ වෙළා හෝ ගියාවේද, ඒ ලිය මුලින් සිඳිනලද්දීවේද, අවහාරය නොද උපදවයි. අගින් සිඳිනලද්දීද, අවහාරය නොද උපදවයි. යම් කලෙක්හි අගත් මුලත් සිඳිනලද්දීවේද, එකල්හි අවහාරය උපදවයි. ඉදින්වනාහි මහරුක් ඈ වෙළාගෙන සිටියාවේද, එසේ වෙළාගෙන සිටි ලිය, රුකෙන් මිදූ පමණඇත්තී අවහාරය උපදවයි. **'තිණං වා'** යන මෙහි තණ හෝවේවා පත් හෝ වේවා, ඒ සියල්ල තෘණග්‍රහණයෙන් සඞ්ග්‍රහකරන ලද්දේය. ගෙවල් සෙවනිආදිය කරනුපිණිස ඒ තණ අත්හුවිසින් සිඳිනලද්දේ හෝ තෙමේ සිඳ හෝ ගන්නේ භාණ්ඩයාගේ අගයවසයෙන් කරවියයුත්තේය. හුදෙක් තණපත්ම නොවේ. අනිකුදු යම්කිසි වැහැරිසුඹුලු ආදියක් වේද, යම්තැනෙක හිමියෝ ආලයසහිතවෙත්ද එය ගන්නේ බඩුඅගයවිසින් කරවියයුත්තේය. සැසතැබූ කල්ගිය රුකද නොගතයුතුය. යම්රුකක්

අගින්ද මුලින්ද සිඳිනලද්දේවේද, මේ රුකෙහි අතුද කුණුවී ගියාද සුඹුලුද ගිලිහී වැටුනාද මේ රුක හිමියන්විසින් හැර දැමුයේද ගන්නට වටියි. අකුරු ඇඳ ලකුණු කැපූ රුකක්හුගේද යම් කලෙක ඒ ලකුණු සුඹුලුයෙන් වැසී නොපෙණී ගියේවේද, එකල්හි ගැනීම වටියි. ගෙවල් ගොඩනැගීමපිණිස රුක්සිඳ, යම් කලෙක ගෙවල්ගොඩනගනලද්දහු මිනිසුන් වසනලද්දහු වෙත්ද, දැවද අරණ්‍යයෙහි වැස්සෙන් හා අව්වෙන් නැසීයන්නාහුද, මෙබඳු දැව දැක හැරදමන ලදහයි ගැනීම වටියි. කුමක්හෙයින්ද්‍යත්: යම්හෙයකින් අරණ්‍යඝාමීහු මේ දැවට ඝාමීහු නොවෙත්ද එහෙයිනි. යම් කෙනකුන්විසින් වනහිමියන්ට දියයුතු මිල දී සිඳිනලදද, ඔවුහුම එහි ඝාමීහුය. ඔවුන්විසිනුදු ඒ දැව හැරදමනලදහ. ඔවුහු එහි ආලය නැත්තෝවූහ.

යම් මහණෙක් පළමුකොටම වනපල්ලන්ට දියයුතුමිල දී වනයට පිවිස තමන් කැමති රුක් ගන්වාද, ඔහුට ඒ වනපල්ලන්ගේ ආරක්ෂාස්ථානයට නොගොස් තමන් කැමති මගකින් යන්නට වටීද, තවද වනයට පිවිසෙන්නේ ඔවුන්ට දියයුතුමිල දී යේද, වටීමය. තවද 'දෙව'යි කියූකල්හි දියයුතුමය. ඉදින් කිසිවෙක් තමන්ගේ ධනය දී මහණහුට යන්නට දෙවු'යි කියාතම් ලද දෙය කැපමය. යෑම වටියි. ඉදින්වනාහි කිසියම් ඉසුරුද ඇතියෙක් ධනය නොදීම 'මහණුන්ගේ කොටස නොගනිවු'යි වළකානම් වනපල්ලෝද 'අපි මහණුන්ගේ හා තවුසන්ගේ කොටස නොගන්නමෝනම්, කොතැනින් ලබමුද, වහන්ස! දෙවු'යි කියන්නම් දියයුත්තේමය. යම් මහණෙක් වනපල්ලන් නිදිගත්කල්හි හෝ කෙළිසෙල්ලම්හි නියැලුතුකල්හි හෝ කිසිතැනක ගියකල්හි හෝ අවුත් 'වනපල්ලෝ කොහිදැ'යි කැඳවා නොදක යේද, හණ්ඩදෙය්‍යවේ. යම් මහණෙක් අරක්ෂාස්ථානයට පැමිණ කම්සස්ථානාදිය මෙනෙහිකරමින් හෝ අන් තන්හි කළ සිහිඇතිව හෝ නොසිහියෙන් එතැනඉක්මවාද, හණ්ඩදෙය්‍යමවේ. එතැනට පැමිණි යමක්හට සොරෙක් හෝ ඇතෙක් හෝ වණ්ඩමෘගයෙක් හෝ මහාමෙඝයක් හෝ නගීද, ඒ මහණතෙමේද, ඒ උවදුරෙන් මිදෙනු කැමැති බැවින් වහා එතැන ඉක්මවාද, ඒ තාක් රකියි. හණ්ඩදෙය්‍යවේ. වනයෙහි මේ ආරක්ෂාස්ථානයනම් සුංවත්ගන්නා තැනටද වඩා ගරුතරවේ. සුංවත් ගන්නා තැන සීමාව නොඉක්මවා දුරින්ම යන්නේ දුකකටයටම පැමිණේ. සොරසිතින් මෙතැන හරිමියි යන්නහුටද එතැන ඉක්මවීම්වසයෙන් අහසින් යන්නහුටද, පාරාජිකයමවේ. එහෙයින් මෙහි අප්‍රමත්තයෙකු වියයුතුය.

අරක්ඛඋට්ඨකථා නිමි.

——\\——

ජලයෙහිවනාහි **'භාජනගතං'**යනු ජලය දුලීභකාලයෙහි ප්‍රයොජන ගනුපිණිස කුසමහත්වූ දියසැළි ආදියෙහි ආරක්ෂාකොට තැබූ ජලයයි. ඒ ජලය යම්බඳුනක තබනලද්දේවේද, ඒ බඳුන තමා හෝ සිදුරක්කොට ගන්නහුපිළිබඳ විනිශ්චය ගිතෙල් තෙල්හි කියූනයින් දතයුත්තේය. සීමා සිඳ හැරීමෙහිදීවනාහි එක් හටගත් ගස් වැල් පැලෑටි ආදීවූ භූතගාමයසමගද සීමාව බිඳින්නහුට අදින්නාදන ප්‍රයොගයබැවින් දුක්කටයවේ. ඒ දුක්කටයද පහරක් පහරක් පාසා සිදුවේ. ඇතුළතසිට පිටතට මුහුණදී සිඳින්නේ පිටතකෙළවර හෙතුකොට කරවියයුත්තේය. පිටතසිට ඇතුළට මුහුණුදී සිඳින්නේ ඇතුළතකෙළවර හෙතුකොට කරවියයුත්තේය. ඇතුළත හා පිටත සිඳින්නේ මැදහැර එය සිඳින්නේ මැද හෙතුකොට කරවියයුත්තේය. වේල්ල දුර්ලකොට ගෙරින් කැඳවාද, ගම්දරුවන්ලවා හෝ කැඳවාලන්නේද, ඒ ගෙරිහු අවුත් කුරවලින් වේල්ල සිඳින්ද, ඔහු විසින්ම සිඳිනලද්දීවේ. වේල්ල දුර්ලකොට ගෙරින් ජලයෙහි ප්‍රවේශකෙරේද, ගම්දරුවන්ලවා හෝ ප්‍රවේශ කරවාද, ඒ ගෙරින්විසින් නංවනලදරැළ, වේල්ල සිඳ යෙත්ද 'ජලයෙහි ක්‍රීඩා කරවු'යි ගම්දරුවන්ට හෝ කියාද, ක්‍රීඩා කරන්නවුන් තැතිගන්වාද, ඔවුන්විසින් නැගූ රැළද වේල්ල බිඳයෙත්ද, ජලයතුළ හටගත් රුකක් සිඳහරිද, අනිකෙකුලවා හෝ සිඳවාද, එහි ඇදවැටෙන ඒ රුකෙන්ද නැගූ රැළවේල්ල සිඳයෙත්ද, ඔහු විසින්ම වේල්ල සිඳිනලද්දීවේ. වේල්ල දුර්ලකොට වැව රකිනු පිණිස වැවෙන් එහි එක් පසකින් බැහැරකළ ජලය හෝ ගොයම්ආදියපිණිස ජලය නික්මෙනකාණුව හෝ වසාද අන්අතකින් පිටවියන ජලය යම්සේ මෙහි ඇතුල්වේද, එසේ වේල්ලක් හෝ බඳිද, ඇල හෝ සෘජු කෙරේද, එහි මතුභාගයෙහි තුබූ තමන්ගේ වැව හෝ බිඳීද, නැගීගිය ජලය වේල්ල බිඳගෙනයේද, ඔහුවිසින්ම සිඳිනලද්දීවේ. සියලු තන්හි පිටවීගිය ජලයෙහි ඇගීමට අනුරූපවූ අවහාරයෙන් කරවියයුත්තේය. ජලය නික්ම යනකාණුව ඇර ජලය බැහැරකරන්නහුටද මේ නයමවේ. ඉදින්වනාහි ඔහුවිසින් නියර දුර්ලකළකල්හි තමන්ගේම ධර්මතාවෙන් අවුත් හෝ නොඅණුවනලද ගම්දරුවන්විසින් නංවන ලද්දවූ හෝ දෙන්නු කුරවලින් නියර සිඳින්ද තමන්ගේම ධර්මතාවෙන් නොඅණුවන ලද්දවූ ගම්දරුවන්විසින් හෝ ජලයෙහි බස්වනලද්දවූ දෙන්නු රැළනංවන්ද, ගම්දරුවෝ හෝ තුමූම ඇතුල්ව ක්‍රීඩාකරන්නාහු රැළ නංවන්ද, ජලයතුළ හෝ අන්‍යයෙකුවිසින් සිඳිනුලබන ගසක් වැටී රැළ නංවාද, නංවනලද ඒ රැළ නියරසිඳින්ද, ඉදින් නියර දුර්ලකොට වියලි විළෙහි දිය බැහැරකරන ඇල හෝ දිය පිටවන කාණුව හෝ වසාද, අන් තැනකින් යන මගෙහි හෝ නියරක් බඳීද, වියලි ඇල හෝ සෘජුකෙරේද, පසුව වැසිවටකල්හි දිය ගලාඅවුත් නියර බිඳීද, සියලු තැන භණ්ඩදෙය්‍යවේ.

යම් මහණෙක්වනාහි නියංකාලයෙහි වියලි විලෙහි නියර යම්තාක් පතුලට පමුණුවා සිඳීද, පසුව වැසි වට කල්හි එහි ආඳා දිය බැහැරට ගලායේද හණ්ඩදෙය්‍ය වේ. ඒ හේතුකොට යම්පමණ ගොයම් හටගනීද, එයින් පාදයක් අගනාපමණකුත් නොදෙනුයේ අයිතිකරුවන්ගේ ධුරනිඃක්ෂෙපයෙන් අශ්‍රමණයෙක්වේ. සියල්ලන්ට සාධාරණවූ යම් විලක් වේද, ඒ විලෙහි යට පෙදෙසෙහි ගොයම් කරත්. ගොයම් රකිනුපිණිස විලෙන් මහා දියඇලක් නික්ම කෙත මැදින්යයි. ඒ දියඇලද බැසයන හැමකල්හි සවීසාධාරණවේ. එයින් කුඩාදියඇල කපා බැහැරකොට තමතමන්ගේ කුඹුරුවලට ජලය ඇතුල්කෙරෙත්. ඒ ජලය අන්හට ගන්නට නොදෙත්. නියංකාලයෙහිම ජලය මඳවූකල්හි වාරයෙන්වාරය ජලය දෙත්. යමෙක් උදකවාරය පැමිණිකල්හි ජලය නොලබාද, ඔහුගේ ගොයම් මැලවියේද, එහෙයින් අන්‍යයන්ගේ වාරයෙහි අනෙකෙක් දියගන්නට නොලබයි. එහි යම් මහණෙක් අනුන්අයත් කුඩාදිය ඇලකින් හෝ කුඹුරකින් හෝ ජලය, සොරසිතින් තමන්ගේ හෝ අන්‍යයන්ගේ හෝ ඇලකට හෝ කුඹුරකට හෝ ඇතුල්කෙරේද, වනමුවට හෝ පමුණුවාද මොහුට අවහාරයමවේ. යම් මහණෙක් 'මට බොහෝ කලක් ගියකල්හි උදකවාරය වන්නේය, මේ ගොයම්ද මැලවේය' යි අන්‍යයන්ගේ කුඹුරට ඇතුල්කෙරේද, ඔහුටද අවහාරයමවේ. ඉදින්වනාහි විලෙන් ජලය පිටට ගලානොගියකල්හිද, අන්‍යයන්ගේ ඇලමුවට ජලය ගලානොආකල්හි හෝ වියලි ඇලටම ගලාඑන ජලය අන්‍යයන්ගේ කුඹුරට නොවැද තමන්ගේම කුඹුරට යමිසේ වදීද, මෙසේ ඒ ඒ කැන බඳීද, විලෙන් ජලය ගලානොගියකල්හී බඳිනලද්දීනම් හණ්ඩදෙය්‍යවේ. විලට ගොස් තෙමේම ජලය නිකුත්වන කාණුව ඇරදමා තමන්ගේ කුඹුරට ජලය ඇතුල්කරන්නහුටද අවහාරයක් නැත්තේය. කුමක්හෙයින්ද යත්: විල ඇසුරුකොට කුඹුර කළබැවිනි. **කුරුන්දි** ආදියෙහිවනාහි අවහාරය කියනලද්දේය. එය **'වත්තුං කාලඤ්ච දෙසඤ්ච'** යන මේ ලක්ෂණය හා සමනොවේ. එහෙයින් මහාඅට්ඨකථාවෙහි කියනලද්දම සුදුසුවේ.

උදකකථා නිමි.

—\\—

දන්තපොනය ආරාමට්ඨක විනිශ්චයයෙන් විනිශ්චය කටයුතුය. මේ වනාහි විශෙෂයවේ: යමෙක් සඞ්ඝයාගේ වැටුපෙන් තරවූවෙක්ව දවස්පතා හෝ පක්ෂමාසවාරයෙන් හෝ දැහැටිගෙන ඒද, හෙතෙමේ එය ගෙනඅවුත් සිඳීද භික්ෂුසඞ්ඝයාහට යම්තාක් නොපිළිගන්වාද, ඒතාක් එය ඔහුගේමවේ. එහෙයින් එය සොරසිතින් ගන්නේ බඩු ඇගීමෙන්

කරවිය යුත්තේය. එහි හටගත්තේ ගරුභාණ්ඩයක්වේ. භික්ෂුසඞ්ඝයාවිසින් රක්ෂිත ගොපිතවූ ඒ භාණ්ඩය ගන්නේ බඩු ඇඟීමෙන් කරවියයුත්තේය. ගණ පුදගල ගෘහසථ මනුෂ්‍යයන් සතුයෙහිද සිදිනලද්දෙහි හා නොසිදිනලද්දෙහිද, ඔවුන්ගේ අරමිඵයන්හි හටගත්තෙහිද මෙම නයවේ. සාමණේරයෝ භික්ෂුසඞ්ඝයාහට වාරයෙන්වාරය දෑහැටිගෙන එන්නාහු ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් හටත් ගෙනඒත්. ඒ දෑහැටි සිඳ යම්තාක් සඞ්ඝයාහට නොපිළිගන්වත්ද, ඒතාක් ඒ සියල්ල ඔවුන්ගේමවේ. එහෙයින් එද සොරසිකින් ගන්නේ බඩු ඇඟීමෙන් කරවියයුත්තේය. යම් කලෙකවනාහි ඔවුහු දෑහැටි සිඳ සඞ්ඝයාහට පිළිගන්වා 'භික්ෂුසඞ්ඝයා පහසුපරිද්දකින් පරිභොගකෙරේවා'යි දන්තකථාමාලකයෙහි තබත්ද, එතැන්පටන් ගන්නහුට අවහාරයක් නැත්තේය. දෑහැටිවත දතයුතුය. යමෙක් දවස්පතා සහමැදට බසීද, ඔහුවිසින් දවසක් දවසක්පාසා දෑහැටිඑකක්ම ගතයුතුය. යමෙක්වනාහි සහමැදට දවස්පතා නොබසීද, ප්‍රධන්ගෙයි වැස බණ ඇසීමෙහිදී හෝ පොහෝගෙයිදී හෝ දක්නාලැබේද, ඔහුවිසින් පමණසලකා දෑහැටි සතරක්පහක් තමන් වසනතැන තබාගෙන පරිභොගකළයුතුය. ඒ දෑහැටි අවසන්වූකල්හි නැවතද ඉදින් දන්තකථාමාලකයෙහි දෑහැටි බොහෝවේනම්, නැවතද ගෙනගොස් පරිභොගකළයුතුය. ඉදින්වනාහි පමණනොසලකා ගෙන ඒනම්, ඒ දෑහැටි අවසන්නොවූ කල්හිම දන්තකථාමාලකයෙහි දෑහැටි අවසන්වේද, ඉන්පසු ඇතැම්තෙරහු 'යම් කෙනෙකුන්විසින් දෑහැටි ගන්නාලද්දේද, ඔවුහු නැවත ගෙනඒත්වායි කිසිකෙනෙක් පරිභොග කරත්වා, නැවත හෙරණහු ගෙනඒන්නාහ'යි කියන්නාහුද, එහෙයින් විවාදපරිහාරයපිණිස පමණසලකා ගැනීමෙහි දෙසයක් නැත්තේය. මඟ යන්නහුවිසින්ද දෑහැටි එකක් හෝ දෙකක් හෝ ඵවිකයෙහි බහාගෙන යායුතුය.

දන්තකථාකථා නිමි.

—\|—

වනස්පතියනු වනයෙහි සාමිතෙමේය. වනදෙවු රුකට මේ නමෙකි. මෙහිවනාහි මිනිසුන්විසින් අයත්කරගත් අඹ, දෙල්, කොස්ආදීවූ සියලුම රුක් අදහස්කරනලද්දේය. යම්රුක්මූලෙක මිරිස්වැල් ආදිය රොපණයකෙරෙත්ද ඒ රුක සිදිනුලබන්නේ එක්ම පතුරකින් හෝ වැහරියකින් හෝ කැබල්ලකින් හෝ ඵලයෙන් හෝ සම්බන්ධයඇත්තේම බිම වැටේද, ඒතාක් රකියි. යම්රුකක් සිදිනලද්දේනමුත් වැල්වලින් හෝ අවටසිටි ගස් අතුවලින් හෝ දරාසිටිබැවින් කෙළින්ම සිටීද, වැටෙන්නේ හෝ බිම නොවැටේද, එහි පරිහාරයක් නැත්තේය. අවහාරයමවේ. කියතින්

සිදිනලද යම්රුකක් නොසිදිනලද්දක් මෙන්වී එසේම සිටීද, එහිද මේ නයමවේ. යමෙක්වනාහි රුක දුවිලකොට පසුව සොලොවා බිම හෙළාද, අනිකකුලවා හෝ සොලොවාලන්නේද, මේ රුක සමීපයෙහි අන් රුකක් සිඳදමා එය යටපත්කෙරේද, අනිකෙකුලවා හෝ යටපත්කරවාද, වඳුරන් හෝ හෙළා එහි නගාද, අනිකෙකුලවා හෝ නංවාද වවුලන් හෝ එහි නගාද, අනිකෙකුලවා හෝ නංවාද, ඒ වවුලෝ ඒ රුක බිමහෙලත්ද, ඔහුටම අවහාරයවේ. ඉදින්වනාහි ඔහුවිසින් රුක දුවිලකළකල්හි නො අණවනලද්දවුම අනිකෙක් එය සොලොවා හෙළාද, රුකකින් හෝ යටපත්කෙරේද, තමන්ගේ ධර්මතාවෙන් වඳුරෝ හෝ වවුලෝ හෝ එයට නගිත්ද, නොඅණවනලද අනිකෙක් හෝ එහි නගීද, තෙමේ හෝ මෙතෙමේ හුළං එනමග ශුද්ධකෙරේද, සැඩසුළඟක් නැගඅවුත් රුක බිමහෙළාද, සියලුතන්හි භණ්ඩදෙය්‍යවේ. මෙහි වාමුව පිරිසිදුකිරීමවනාහි හුළං නොහැමුකල්හි වියලි දියඇල සෘජුකිරීම්ආදිය හා සමවේ. අන්පරිද්දක් හා සමනොවේ. රුක විද ආයුධයකින් හෝ කොටාද, ගිනි හෝ තබාද මඩු කටු හෝ විස හෝ කොටාද, යන යමකින් රුක මැරේද, සියලුතන්හි භණ්ඩදෙය්‍යමවේ.

වනස්පතිකථා නිමි.

—\\—

හරණකයෙහි **'අසඤ්ඤස්ස හරණකං භණ්ඩං ථෙය්‍යචිත්තෝ ආමසති'** **ශීෂීහාරාදියෙන් භාණ්ඩයක් ගෙනයන අනිකෙකු දක 'මේ භාණ්ඩය ගන්නෙමි'යි වෙගයෙන් ගොස් පහසාද මෙපමණකින් මොහුට දුක්කටයවේ. **'එතූපෙති'** ඉදිරියට පස්සට ඇදීම කෙරේද, හිමියා අත්නොහරීද, එයින් මේ මහණහුට ථුල්ලවචයවේ. **'ඨානා චාවෙති'** ඇද හිමියාගේ අතින් මුද ගනීද, එයින් මේ මහණහුට පාරාජිකයවේ. ඉදින්වනාහි භාණ්ඩස්වාමිතෙමේ නැගිට ඔහුට තළා නැවත ඒ භාණ්ඩය මුදවාගන්නේනම්, මහණතෙමේ පළමු ගැණීමෙන්ම පාරාජිකවේ. හිසින් හෝ කණින් හෝ බෙල්ලෙන් හෝ අතින් හෝ ආභරණයක් සිඳ හෝ මුද හෝ ගන්නහුට ශීෂීාදියෙන් මිදුකල්හි පාරාජිකයවේ. අතෙහිවූ නොඇදකොට මටකළ වලල්ලක් හෝ ඇදකොට බුබුලුආදිය නගා කළ වලල්ලක් හෝ අතින් බැහැරට නොගෙන වැලමිටපටන් බාහුඅග ගටමින්ම ඇතමැත හෝ හසුරුවාද, අහස්ගතවූවක් හෝ කෙරේද, ඒතාක් රකියි. රුක්මුල්හිද සිවුරුහුණෙහිදවූ වලල්ලමෙන් පාරාජිකය නො උපදවයි. කුමක් හෙයින්දයත්: සවිඤ්ඤනක බැවිනි. සවිඤ්ඤක කොටඨාශගතවූවෙක් යම්තාක් එයින් බැහැරට

නොගන්නාලදද, ඒතාක් එහිමවේ. ඇහිලිමුදු නුරුවලා උකුළුපලඳනාවන්හි මේ නයමවේ.

යම් මහණෙක් තෙමේ අනිකෙකුවිසින් අදිනලද සළුවක් අසිඳගනීද, අන්‍යයාද ලජ්ජාසහිතබැවින් වහා නොමුදද, සොරතෙමේ එක් කෙළවරකින් අදීද, අන්‍යයා එක් කෙළවරකින්අදීද, එතෙක් රකියි. එය අන්‍යයාගේ අතින් මිදුනුඇසිල්ලෙහි පාරාජිකයවේ. තවද එසේඅදින වස්ත්‍රය සිදීගොස් එහි එක්කොටසක් අතටආයේද, ඒ කොටස පාදයක් අගීද, පාරාජිකයමවේ. **‘සහභණ්ඩහාරකං’** භාණ්ඩය ගෙනයන්නහුසමග භාණ්ඩය ගෙනයන්නෙමියි සිතා ‘මෙතැනින් යව’යි භාණ්ඩය ගෙනයන්නහුට තර්ජනයකෙරේද, බියවූ හෙතෙමේ සොරමහණහුවිසින් අදහස්කළ දෙසට මූණදී එක් පයක් ඉදිරියට තබාද, සොරමහණහුහට ටුලලවවයවේ. දෙවන පය තැබූකල්හි පාරාජිකයවේ. **‘පාතාපෙති’** තවද සොරමහණතෙමේ භාණ්ඩය ගෙන යන්නහුගේ අතෙහි ආයුධයක් දක සැකඇතිව හෙළවාගනු කැමැත්තේ එකත්පසෙක නැවත සිට තැතිගත්වා හෙළවාද, අන්‍යයාගේ අතින් මිදුනුඇසිල්ලෙහි පාරාජිකයවේ. **‘පාතාපෙති ආපත්ති දුක්කටස්ස’**යනාදිය වනාහී ‘මේ දය ගනිමි’යි පරිකල්පවශයෙන් වදරණලද්දේය. යමෙක් භාණ්ඩය හෙළවා ‘යමක් මට රුවිවේනම්, එය ගන්නෙමි’යි කල්පනාකොට හෙළවාද, ඔහුට එය එළවාලීමෙහිද, පැහැසීමෙහිද දුක්කටයවේ. සොලොවාලීම නිමිතිකොට ටුලලවවයවේ. පාදයක් අගනා භාණ්ඩයක් තුබූකැනින් පහකිරීම නිමිතිකොට පාරාජිකයවේ. එය පසුව හෙලනලදුව මුදන්නහුට ශ්‍රමණභාවයක් නැත්තේමය. යමෙක් භාණ්ඩය ගෙන ඉක්මයන්නහු දක ලුහුබඳින්නේ ‘සිටුව, සිටුව, භාණ්ඩය හෙළව’යි කියා හෙළවාද, ඔහුටද ඔහුවිසින් භාණ්ඩය අතින් මිදූ ඇසිල්ලෙහි පාරාජිකයවේ. යමෙක්වනාහි ‘සිටුව, සිටුව’යි කියාද, ‘හෙළව’යි නොකියාද, අන්‍යයාද ඔහු දෙස බලා ‘ඉදින් මෙතෙමේ මා කරා පැමිණෙන්නේනම්, මා නසන්නේය’යි ආලය සහිතවම ඒ භාණ්ඩය ගහණසථානයක බහා නැවත පෙරළා අවුත් ගන්නෙමියි බැහැරයේද, එහි හෙළීම් හේතුවෙන් පාරාජිකයන් නැත්තේය. අවුත් සොරසිතින් ගන්නහුට ඉදිරීම නිමිතිකොට පාරාජිකයවේ. නැවත ඔහුට ‘භාණ්ඩය හෙළවන්නාවූම මාවිසින් ෙ භාණ්ඩය මාසතුකරනලද’යි මෙබඳු අදහසක්වේ. ඉන්පසු එය තමාගේයයි හැඟීමෙන් ගනීද, ගැනීමෙහිදී රකියි. භණ්ඩදෙය්‍යවේ. ‘දෙව’යි කියූකල්හි නොදෙන්නහුට හිමියන්ගේ ධුරනිඃක්ෂෙපයෙන් පාරාජිකයවේ. හෙතෙමේ මේ භාණ්ඩය හැරදමා ගියේය. දන් මෙය අන්‍යයන්විසින් අයත්කරන ලද්දක්නොවේයයි පාංශුකූල සංඥවෙන් ගන්නහුටද මෙම නයවේ. තවද හිමියා ‘සිටුව, සිටුව’යි කියූ ඇසිල්ලකින්ම බලනුයේ, ඔහු දක ‘දන් මේ භාණ්ඩය මාගේ නොවේය’යි ධුරනිඃක්ෂෙපකොට ආලයරහිතව දමා පලායේද,

එය සොරසිතින් ගන්නහුට නගාගැනීම නිමිතිකොට දුක්කටයවේ. ගෙන්වනකල්හි දියයුතුය. නොදෙන්නහුට පාරාජිකයවේ. කුමක්හෙයින්ද යත්: ඔහුගේ ප්‍රයොගයෙන් හැරදමූබැවිනැයි **මහාඅට්ඨකථා**වෙහි කියනලද්දේය. අන්‍යවූ **මහාපච්චරි**ආදි අට්ඨකථාවන්හි මෙහිලා විමසීමක් නැත්තේය. පෙර කියූනයින්ම තමා සතුයයි හැඟීමෙන් හෝ පාංශුකූලසංඥාවෙන් හෝ ගන්නාකල්හිද මේ විනිශ්චයමවේ.

හරණකකථා නිමි.

—\\—

උපනිධියෙහි **'නාහං ගණ්හාමි'** මම නොගනිමියි දැන බොරුකීමෙහිද අදින්නාදනයේ ප්‍රයොගබැවින් දුක්කටයවේ. 'තෙපි කුමක් කියහුද, මේ භාණ්ඩය මට සුදුසුනොවේ, තොපටද සුදුසුනොවේ' යනාදිය කියන්නහුටද දුක්කටයමවේ. 'මාවිසින් රහසින් මොහුගේ අතෙහි තබනලද්දේය, අන් කිසිවෙක් නොදනියි, මට මෙය දෙන්නේද, නොදෙන්නේද'යි භාණ්ඩසාමි විමතිය උපදවානම්, මහණහුට ථුල්ලච්චයවේ. ඒ මහණහුගේ එරුෂාදිභාවය දැක සාමිතෙමේ 'මෙය මට නොදෙන්නේය'යි ධුරනිඃක්ෂෙපය කෙරේද, එහිදී ඉදින් මේ මහණතෙමේ වෙහෙසට පත්කොට එය දෙන්නෙමියි දීමෙහි උත්සාහ සහිතවූයේනම්, ඒ තාක් රකියි. ඉදිනුදු ඔහු දීමෙහි උත්සාහ රහිතවූයේද, භාණ්ඩසාමිතෙමේ ගැනීමෙහි උත්සාහසහිතවූයේද රකීමය. ඉදින්වනාහි ඔහු දීමෙහි උත්සාහ රහිතකල්හි භාණ්ඩසාමිතෙමේ 'මට නොදෙන්නේය'යි ධුරනිඃක්ෂෙපයකෙරේද, මෙසේ දෙදෙනාගේ ධුරනිඃක්ෂෙපයෙන් මහණහුට පාරාජිකයවේ. ඉදිනුදු මුවෙන් දෙන්නෙමියි කියාද සිතින්වනාහි නොදෙනුකැමැත්තේද. මෙසේද හිමියාගේ ධුරනිඃක්ෂෙපයෙහිදී පාරාජිකයවේ. ඒ උපනිධිතම්වූ රැකීමපිණිස අන්‍යයන්විසින් තමාගේ අත තැබූ භාණ්ඩය, ආරක්ෂාරහිතතැනින් ඨානාවාවනය කොට රක්ෂාස්ථානයෙක තැබීම පිණිස ගෙණ යන්නහුට ඇවැත්නොවේ. සොරසිතිනුදු තුබූතැනින් පහ කරන්නහුට අවහාරයක් නැත්තේය. කුමක්හෙයින්දයත්: තමන්ගේ අතෙහි තුබූබැවිනි. හණ්ඩදෙය්‍යවේ. සොරසිතින් පරිභොගකරන්නහුටද මේ නයමවේ. තාවකාලිකකොට ගැනීමෙහිද එසේමය. **'ධම්මං චරන්තෝ'** යනාදිය කියූනයඇත්තේමය. මේවනාහි පාලිවණ්ණනාවය.

පෙළින් මිදුනු විනිශ්චය මෙහි පත්තවතුක්කාදිවිසයෙන් මෙසේ කියනලද්දේය: එක් මහණෙක්වනාහි මෙරමාගේ මාහැගි පාත්‍රයෙහි ලොභ උපදවා එය ගෙනයනු කැමැත්තේ මේ පාත්‍රය තුබූතැන මොනවට

සලකා තමන්ගේ පාත්‍රයද ඒ පාත්‍රය ලහම තැබුයේය. ඒ මහණතෙමේ උදසන අලුයම්කාලයෙහි අවුත් ධර්මය කියවා නිදන මහතෙරුන්ට 'ස්වාමීනි! වඳිමි'යිකීයේය. උන්වහන්සේ 'මේ කවරෙක්ද'යි ඇසූහ. 'ස්වාමීනි! මම ආගන්තුක මහණෙක්මි, කල්ඇතිවම යනුකැමැත්තෙමි, ස්වාමිනි! මාවිසින් අසුවල්තැන මෙබඳු අස්වැටියක් හා මෙබඳු පාපසුම්බියක් හා පාත්‍රයක් තබනලද්දේය. 'ස්වාමීනි! එය ලබන්නෙමිනම් මැනවැ'යි ඔහු කීයේය. ස්ථවිරයන්වහන්සේ එහි ඇතුල්ව එය ගත්හ. එය නගාගැනීමෙහිදීම සොරමහණහුට පාරාජිකයවිය. ඉදින් අවුත් 'නොකල්හි ආවාවු තෝ කවරෙක්වෙහිද'යි ඇසූකල්හි බියවූයේ පලායේද, පාරාජිකයට පැමිණම පලායයි. තෙරුන්ටවනාහි පිරිසිදු සිත්ඇතිබැවින් ඇවැත් නොවේ. ස්ථවිරයන්වහන්සේ 'ඒ පාත්‍රය ගන්නෙමි'යි අන්‍යපාත්‍රයක් ගත්තාහුද මෙම නයවේ. මෙයවනාහි අන්‍යවූ එබඳුවූවක්ම ගන්නාකල්හි යෙදෙන්නේය. මනුෂ්‍යවිග්‍රහයෙහි ආණත්තිසදිස වසනුවෙහි මෙනි. **කුරුන්දියෙහි** වනාහි තෙරුන් විසින් ගෙණෙන ලද පාත්‍රය ගෙණ යන්නහුගේ පියවරින් කරවියයුතුයයි කියනලද්දේය. එය ඒ හා සමාන නොවූවක් ගන්නාකල්හි යෙදෙන්නේය. ඒ පාත්‍රයයි හඟිමින් තමන්ගේ පාත්‍රය ගෙනදුන්නේය. හිමියාවිසින් දුන්බැවින් සොරුට පාරාජිකයක් නැත්තේය. අපිරිසිදු සිතින් ගත්බැවින් දුක්කටයවේ. ඒ පාත්‍රයයි හඟිමින් සොරුගේම පාත්‍රය ගෙනදුන්නේය. මෙහිද සොරුට තමන් සතුබැවින් පාරාජිකයක් නැත්තේය. අපිරිසිදු සිතින් ගත්බැවින් දුක්කටයමවේ. සියලුතන්හි තෙරුන්ට ඇවැත් නැත්තේය.

අනිකෙක් 'පාත්‍රයක් සොරකම් කරන්නෙමි'යි එසේම නිදන තෙරුන්වැන්දේය. මේ කවරෙක්ද'යි තෙරුන් විචාළකල්හි 'ස්වාමීනි! මම ගිලන් මහණෙක්මි, මට එක් පාත්‍රයක් දුනමැනව, ඇතුළගමට ගොස් බෙහෙතක් ගෙනඑන්නෙමි'යි ඔහු කීයේය. ස්ථවිරතෙමේ 'මෙහි ගිලනෙක් නැත්තේය, මෙතෙමේ සොරෙක් වන්නේය'යි සලකා 'මේ පාත්‍රය ගෙනයේවා'යි තමාට වෛරී භික්ෂුනමකගේ පාත්‍රයක් ගෙනවුත් දුන්නේය. එය නගා ගන්නාකල්හිද මෙම නයවේ. ඉදින්වනාහි 'මේ පාත්‍රය වෛරීහුගේමය' යන හැඟීමෙන් සොරහුගේම පාත්‍රය නගාදේද, කියූනයින්ම තෙරුන්ට පාරාජිකයවේ. සොරුට දුක්කටයවේ. නැවත 'වෛරීහුගේය'යි හඟිමින් තමන්ගේ පාත්‍රය දේද, කියූනයින්ම දෙදෙනාහටම දුක්කටයවේ.

එක් මහාස්ථවිරනමක් උපස්ථායකවූ එක් තරුණ භික්ෂුනමක්හට 'පා සිවුරු ගනුව, අසුවල් ගමට ගොස් පිඬුපිණිස හැසිරෙන්නෙමු'යි කීයේය. තරුණ භික්ෂුතෙමේ තෙරුන් පසුපස යනුයේ සොරසිත් උපදවා හිස තුබූ බර කරටගනීද, පාරාජිකයක් නැත්තේය. කුමක් හෙයින්දයත්:

අණින් ගත්බැවිනි. ඉදින් වනාහි මඟින් ඇත්ව වනයට පිවිසේද, පදවාරයෙන් කරවියයුත්තේය. නැවත නැවතී විහාරයට අභිමුඛව පලාගොස් විහාරයට පිවිසියේද, උපචාරය ඉක්මීමෙහිදී පාරාජිකයවේ. තවද මහතෙරුන් අදනය මාරුකරන තැනින් ගමට අභිමුඛව පලායේද ග්‍රාමොපචාරය ඉක්මවීමෙහි දී පාරාජිකයවේ. ඉදින්වනාහි දෙදෙනම පිවූ පිණිස හැසිර වළඳ හෝ ගෙන හෝ නික්මෙත්ද, සඨවිරතෙමේද, එහිදී නැවතත් 'පාසිවුරු ගනුව, විහාරයට යන්නෙමු'යි ඔහුට කියයි, එහිදී ඔහු පෙරකියූ නයින්ම සොරසිතින් හිස තුබූ බර කරට ගනීද, ඒතාක් රකියි. වනයට පිවිසේද, පදවාරයෙන් කරවියයුතුය. නැවතී ගමට අභිමුඛවම පලායේද, ග්‍රාමොපචාරය ඉක්මීමෙහිදී පාරාජිකයවේ. ඉදිරියෙහි විහාරයට අභිමුඛව පලාගොස් විහාරයෙහි නොසිට නොඉඳ නොසන්සිඳුනාවූම සොරසිතින් යේද, උපචාරය ඉක්මීමෙහිදී පාරාජිකයවේ. යමෙක්වනාහි නොඅණවනලදුයේ ගණීද, ඔහුට හිසෙහි බර කරෙහි තැබීම් ආදියෙහිද පාරාජිකයවේ. මඟින් පහවීම විහාරයට අභිමුඛව යෑම යනාදීවූ සියල්ල පෙරකියනලද්දම සමානවේ.

යමෙක්වනාහි 'අසුවල් විහාරයට ගොස් සිවුර සෝද හෝ රඳන්ගන්වා හෝ එව'යි කියනලද්දේ 'යහපතැ'යි ගෙනයේද, ඔහුටද අතරමගදී සොරසිත් උපදවා හිසෙහි තුබූ බර, කරෙහි තැබීම් ආදියෙහිදී පාරාජිකයක් නැත්තේය මඟින් ඉවත්වීමෙහිදී පදවාරයෙන් කරවියයුතුය. ඒ විහාරයට ගොස් එහිම වසන්නේ සොරසිතින් එය පරිභොග කරන්නේ දිරුම්කඩට පමුණුවාද, සොරු හෝ මොහුගේ ඒ සිවුර ගෙනයත්ද, අවහාරයක් නැත්තේය. හණ්ඩදෙය්‍යවේ. එතැනින් නික්ම එන්නහුටද මේ නයමවේ. යමෙක්වනාහි නොඅණවනලදුයේ තෙරුන්විසින් 'මාගේ සිවුර කිලිටිවූයේය, කවරෙක් රඳන්කොට දෙන්නේද'යි තිමිති හෝ කළකල්හි, තෙමේ හෝ කිලිටිබව සලකා 'සාමීනි! සිවුර දෙනුමැනව, අසුවල් ගමට ගොස් රඳන්කොට ගෙනඑන්නෙමි'යි ගෙනයේද, ඔහුට අතරමගදී සොරසිත් උපදවා හිසෙහි බර කර තැබීම්ආදීන්හි පාරාජිකයවේ. **කුමක්හෙයින්ද යත්:** නොඇණවීමෙන් ගත්බැවිනි. මඟින් ඉවත් වන්නහුට පෙරළා ඒ විහාරයටම අවුත් විහාර සීමාව ඉක්මවන්නහුටද කියනලද නය ඇත්තාවූම පාරාජිකයවේ. එහි ගොස් රඳන්කොට පෙරළා එන්නහුටද සොරසිත් උපන්කල්හි මේ නයමවේ.

ඉදින්වනාහි යම් තැනෙක ගියේද, එහි හෝ අතරමඟ විහාරයක හෝ ඒ විහාරයටම පෙරළා අවුත් ඒ විහාරයෙහි එක් පසෙක හෝ උපචාරසීමාව නොඉක්මවා වසනුයේ සොරසිතින් පරිභොගකරනුයේ එය දිරීමට පමුණුවාද, සොරු හෝ මොහුගේ ඒ සිවුර ගෙනයෙත්ද, යම් ඒ

ලෙසකින් නැසේද, හණ්ඩදෙය්‍යවේ. උපචාර සීමාව ඉක්මවන්නහුටවනාහි පාරාජිකයවේ. යමෙක්වනාහි තෙරුන්විසින් නිමිතිකරනුලබනකල්හි 'ස්වාමීනි! දුනමැනව, මම රඳන්කොට ගෙනඑන්නෙම්'යි කියා, 'ස්වාමිනි! කොතැන ගොස් රඳන් කරමිද'යි විචාරයි. සථවිරතෙමේද ඔහුට යම් තැනක කැමැතතෙහි නම්, 'එහි ගොස් රඳන්කරව'යි කියාද, මෙතෙමේ හරණුලද දූතනම්වේ. සොරසිතින් පලායනුයේද අවහාරයෙන් නොකරවියයුත්තේයි. සොරසිතින් පලායන්නහුටද පරිභොගයෙන් හෝ අන්අයුරකින් හෝ නසන්නහුටද හණ්ඩදෙය්‍යමවේ.

මහණෙක් මහණක්හුගේ අත කිසි පිරිකරක් 'අසුවල් විහාරයෙහි අසුවල් මහණහුට දෙව'යි යවාද, ඔහුට සොරසිත උපන්කල්හි සියලුතන්හි **'අසුකං නාම විහාරං ගන්ත්වා චීවරං ධොවිත්වා රජිත්වා වා එහි'**යන මෙහි කියනලද්ද සමානවූ විනිශ්චයවේ.

අන් මහණෙක් මහණකු යවනුකැමැත්තේ 'කවරෙක්වනාහි ගෙනයන්නේද'යි නිමිතිකරයි. එහිදී ඉදින් එකෙක් 'ස්වාමීනි! දුනමැනව, මම ගෙනයන්නෙම්'යි ගෙනයේනම් ඔහුට සොරසිත උපන්කල්හි සියලුතන්හි **'දෙථ භන්තෙ අමුකං නාම ගාමං ගන්ත්වා රජිත්වා ආහරිස්සාමි'**යන මෙහි කියනලද්දසමානවූ විනිශ්චයවේ.

තෙරුන්විසින් සිවුරු පිණිස වස්ත්‍රයක් ලබා උපස්ථායක කුලයෙක තබනලද්දේවේද, නැවත මොහුගේ අතැවැස්සෙක් වස්ත්‍රය ගෙනයනු කැමැත්තේ එහි ගොස් 'ඒ වස්ත්‍රය දෙව'යි තෙරුන්විසින් යවන ලද්දෙකුමෙන් කියාද ඔහුගේ වචනය අදහා උපාසකයාවිසින් තබනලද්ද, උපාසිකාව හෝ උපාසිකාවවිසින් තබනලද්ද උපාසකයා හෝ අන්කිසිවෙක් හෝ ගෙන අවුත් දේද, නගාගැනීමෙහිදීම මොහුට පාරාජිකයවේ.

ඉදින්වනාහි තෙරුන්ගේ උපස්ථායකයන්විසින් 'මේ වස්ත්‍රය තෙරුන්ට දෙන්නෙමු'යි තමන්ගේ වස්ත්‍රයක් තබනලද්දේවේද, ඉක්බිති මේ තෙරුන්ගේ අතවැස්සෙක් ඒ වස්ත්‍රය ගෙනයනුකැමැත්තේ එහි ගොස් 'තෙරුන්ට වස්ත්‍රය දෙනුකැමැත්තහුනම් එය දෙව'යි කියාද ඔවුහුද මේ අතවැස්සාගේ වචනය අදහා 'ස්වාමීනි! අපි වළඳවා දෙන්නෙමු'යි තැබුම්හ, එහෙයින් ගනිවු'යි දෙත්ද, හිමියන්විසින් දුන්බැවින් පාරාජිකයක් නැත්තේය. අපිරිසිදු සිතින් ගත්බැවින් දුක්කටයවේ. හණ්ඩදෙය්‍යදවේ.

මහණෙක් මහණක්හට 'මෙනම්ඇත්තේ මට වස්සාවාසිකයක් දෙන්නේය, එය ගෙන තබව'යි කියා ගමට යන්නේය. ඒ මහණතෙමේ 'යහපතැ'යි ඔහුවිසින් දෙනලද මාහැගිසළුව තමන්ලත් මදක්අගනා සළුවසමග තබා ඒ පැමිණි ඔහුවිසින් තමන්ට මාහැගිසළුවක් ලැබුනුබව

දැන හෝ නොදැන හෝ 'මාගේ වස්සාවාසිකය දෙව'යි කියනලද්දේ 'තට ලැබුණු සළුව දළය, මට ලැබුණු සළුව මාහැගිය, ඒ දෙකම අසුවල්තැන තබනලදය, එහි ගොස් ගනුව'යි කියාද, ඔහු එහි පිවිස දළ සළුව ගත්කල්හි ඉතිරි සළුව ගන්නාවූ අන්හට නගාගැනීම නිමිතිකොට පාරාජිකයවේ. තවද ඔහුගේ සළුවෙහි තමන්ගේ නමද තමන්ගේ සළුවෙහි ඔහුගේ නමද ලියා 'යව, නම කියවාගනුව'යි කියාද, එහිද මේ නයමවේ.

යමෙක් තමන්විසින්ද ඔහු විසින්ද ලත් සළු එකට තබා 'තාවිසින්ද මාවිසින්ද ලත් සළුදෙකම ඇතුළුගෙයි එකට තබනලද්දේය, යව, යමක් ගනු කැමැත්තෙහිද එය පරීක්ෂාකොට ගනුව'යි ඔහුට මෙසේ කියයි, ඔහුද ලජ්ජාවෙන් ආවාසිකයාවිසින් ලත් දළසළුවම ගන්නේද එහි සොයා බලා ගන්නාලද්දෙන් ඉතිරිවූ අනික් සළුව ගන්නාවූ ආවාසිකයාහට ඇවැත් නොවේ.

ආගන්තුක මහණෙක් සිවුරුකම් කරන්නාවූ ආවාසිකයන්ගේ සමීපයෙහි පාසිවුරු තබා 'මොවුහු රකින්නාහ'යි හඟින්නේ නාන්නට හෝ අන්තැනක හෝ යන්නේය. ඉදින් එය ආවාසිකයෝ රකිත්නම්, මේ මැනවි. නොරකිත්නම් නැසුනුකල්හි ශ්‍රීවා නොවේ. නැවතද ඒ මහණතෙමේ 'සාමීනි! මේ පාසිවුරු තබහු'යි කියායේද, අන්‍යයෝද කටයුතුවල යෙදීසිටියබැවින් ඔහුවිසින් කියූ වචනය නොඇසුනුබැවින් නොදනිත්ද, සිතින් නොපිළිගනිත්ද, මෙම නයවේ. නැවතද ඔවුහු 'සාමීනි! මේ පාසිවුරු තබහු'යි කියනලද්දහු 'අපි කටයුතුවල ව්‍යාවෘතවූමිහ'යි ප්‍රතික්ෂෙප කෙරෙත්ද, අනික්තැනැත්තේද 'අවශ්‍යයෙන් තබන්නෙමි'යි නොගෙනෙයේද, එහිද මේ නයවේ. ඉදින්වනාහි ඔහුවිසින් යාචඤ්ඤාකරනලද්දහු හෝ යාචඤ්ඤානොකරනලද්දහු හෝ 'අපි තබන්නෙමු, තෝ යව'යි කියත්ද, ඒ පාසිවුරු රැකියයුතුය. ඉදින් නොරකිත්නම් නැසීගියකල්හි ශ්‍රීවාවේ. කුමක්හෙයින්ද යත්: පිළිගත්බැවිනි.

යම් මහණෙක් භාණ්ඩාගාරිකව උදසනකාලයෙහිම භික්ෂූන්ගේ පාසිවුරු යටපහයට බස්වා දෙරනොවසා ඔවුනටද නොදන්වාම දුරතැනක පිඬු සිඟීමට යේද, ඒ පාසිවුරු සොරු ගෙනයෙත්නම් ඔහුටම ශ්‍රීවාවේ. යම් මහණෙක් භික්ෂූන්විසින් 'සාමීනි! පාසිවුරු බස්වනු මැනවි, ලහ ගැණීමට කාලයවේය'යි කියනලද්දේ 'රැස්වූවහුද'යි විචාරා 'එසේය රැස්වූමිහ'යි කියූකල්හි පාසිවුරු බැහැරට ගෙන බහාතබා භාණ්ඩාගාරයෙහි දෙර බැඳ 'තෙපි පාසිවුරුගෙන යටපහයෙහි දෙර පිළිදගුම්කොට යවු'යි කියායේද, එහිද අලසඤ්ඤාභාවය ඇති එක් මහණෙක් භික්ෂූන් ගියකල්හි පසුව ඇස් පිසලමින් නැගිට දිය තිබෙන තැනකට

මුව දේනාපිණිස හෝ යේද, ඒ මොහොත දක සොරු ඔහුගේ පාසිවුරු ගෙනයෙන්නම් මනාකොට ගෙනයනලද්දේවේ. භාණ්ඩාගාරිකයාහට ශ්‍රීවා නොවේ. ඉදිනුදු කිසිවෙක් භාණ්ඩාගාරිකයාහට ආරොචනය නොකොටම භාණ්ඩාගාරයෙහි තමන්ගේ පිරිකර තබාද, ඒ පිරිකරද නටකල්හි භාණ්ඩාගාරිකයාහට ශ්‍රීවා නොවේ. ඉදින්වනාහි භාණ්ඩාගාරිකතෙමේ ඒ පිරිකර දැක නොසුදුසුතැන තබනලදැයි ගෙනතබාද, නටකල්හි ඔහුට ශ්‍රීවාවේ. ඉදිනුදු තැබූ මහණහුවිසින් 'ස්වාමීනි! මාවිසින් මෙබඳු පිරිකරක් තබනලද්දේය, පරීක්ෂා කරනුමැනැව'යි කියූකල්හි 'යහපතැ'යි පිළිගණිද, නොමනාව තබනලදැයි සහිත්නේ අන්තැනක තබාද, ඔහුටම ශ්‍රීවාවේ. 'මම නොදනිමි'යි ප්‍රතික්ෂෙප කරන්නහුට ශ්‍රීවාවක් නැත්තේය.

යමෙක් ඔහු බලා සිටියදීම තබාද භාණ්ඩාගාරිකයාහටද නොපිළිගන්වාද නැසුනේ, මොනවට නැසුනේමවේ. ඉදින් භාණ්ඩාගාරිකතෙමේ එය අන්තැනක තබාද, නැසුනුකල්හි ඔහුට ශ්‍රීවාවේ. ඉදින් භාණ්ඩාගාරය මොනවටරක්නාලද්දේවේද, සඞ්ඝයාගේද චෛත්‍යයාගේද සියලුපිරිකර එහිම තබනුලැබේද, භාණ්ඩාගාරිකතෙමේත් අඥවූයේ අව්‍යක්තවූයේ භාණ්ඩාගාරයෙහි දෙර ඇරතබා ධම්කථාවක් අසන්නට හෝ අන්කිසිවක් හෝ කරන්නට කිසිතැනක යේද ඒ මොහොත බලා සොරු යම්පමණ ගෙනයෙත්ද ඒ සියල්ල ඔහුට ශ්‍රීවාවේ. භාණ්ඩාගාරයෙන් නික්ම පිටත සක්මන්කරන්නාවූ හෝ, දෙර හැරදමා සිරුර උතුගන්වන්නාවූ හෝ එහිම ශ්‍රමණධර්මානුයෝගයෙන් හුන්නාවූ හෝ, එහිම හිඳ කිසි කර්මාන්තයක යෙදීගන්නාවූ හෝ, මලමූ දෙකින් පෙළුනාවූ හෝ, එහිම භාණ්ඩාගාරය සමීපයෙහි මලමූ කරනතැනක් තිබියදී පිටත යන්නාවූ හෝ, අන්කිසි අයුරකින් ප්‍රමත්තවූ හෝ ඔහුගේ ප්‍රමාදය හෙතුකොට දෙරහැර හෝ හළදෙරඇති ගෙටම පිවිස හෝ ගෘහසන්ධි බිඳ සොරු යම්පමණ ගෙනයෙත්ද, ඒ සියල්ල ඔහුටම ශ්‍රීවාවේ. උෂ්ණකාලයෙහි වාකවුළු හැරදමා නිදන්නට වටිය'යි කියත්. මලකිසෙන් පෙළුනු එහි සමීපයෙහි මලමූ කරනතැනක් නැතිකල්හි අන් තැනකට යන්නහුට ගිලානපක්ෂයෙහි සිටිබැවින් විසයනොවේ. එහෙයින් ශ්‍රීවා නොවේ.

යමෙක් ඇතුළත උෂ්ණයෙන් පෙළුනේ දෙර මොනවට රක්නාලද්දක්කොට පිටතට නික්මේද, සොරුද ඔහු අල්ලාගෙන 'දෙර හරුව'යි කියත්ද, තුන්යළතෙක් දෙර නොහැරියයුතුය. ඉදින්වනාහි ඒ සොරු 'ඉදින් දෙර නොහරින්නෙහි නම් තාද මරන්නෙමු, දෙරද කඩා බිඳදමා පිරිකර ගෙනයන්නෙමු'යි පොරෝආදිය ඔසවත්ද, මාද මළකල්හි සඞ්ඝයාගේ සෙනසුන නැසීගියකල්හි ගුණයක් නැතැයි දෙරහැරීම වරද නැත්තේය. මෙහිද අවිසයබැවින් ශ්‍රීවා නැතැයි කියත්. ඉදින් කිසි

ආගන්තුකයෙක් යතුරක් හෝ දේද, දෙර හෝ විවෘතකෙරේද, සොරු යම්පමණ ගෙනයෙත්ද, ඒ සියල්ල ඔහුට ශ්‍රීවාවේ. සඞ්ඝයාවිසින් හෝ ගණයාවිසින් භාණ්ඩාගාරය රැකීම්පිණිස හිදියතුරක්ද යතුරු මුදුවක්ද යොදදෙනලද්දීවේද, භාණ්ඩාගාරිකතෙමේ අගුල පමණක්දී නිදද, සොරු දෙර හැර පිරිකර ගෙනයෙත්ද, ඔහුටම ශ්‍රීවාවේ. හිදියතුරද යතුරුමුදුවද යොද නිදිගත් මොහුට ඉදින් සොරු අවුත් 'දෙර හරුව'යි කියත්ද, එහිදී පළමු ක්‍රමයෙන්ම පිළිපැදියයුතුය. මෙසේ ආරක්ෂාකොට නිදිගත්කල්හි බිත්තිය හෝ වහල්පලය හෝ බිඳ උමඟින් හෝ පිවිස පිරිකර ගෙනයෙත්ද, ඔහුට ශ්‍රීවා නොවේ. ඉදින් භාණ්ඩාගාරයෙහි අන්‍යවූත් තෙරහු වසත්ද, දෙරඇරිය කල්හි තමතමන්ගේ පිරිකර ගෙනයෙත්ද, භාණ්ඩාගාරිකතෙමේ ඔවුන් ගියකල්හි දෙර නොවසාද, ඉදින් එහිවූ කිසිවක් සොරා ගෙනයනු ලැබේද, භාණ්ඩාගාරිකගේ ඊශ්වරත්වය නිසා භාණ්ඩාගාරිකයාහටම ශ්‍රීවාවේ. තෙරුන් සහායයන් වියයුතුය. මේ විනාහි භාණ්ඩාගාරයෙහි වසන්නහුගේ වතය.

ඉදින් භාණ්ඩාගාරිකතෙමේ 'තෙපි පිටත සිටම තොපගේ පිරිකර ගනිවු, නොපිවිසෙවු'යි කියාද, ඔවුන් අතුරෙහි එක් ලොල්මහතෙරනමක් සාමණේරයන්ද උපස්ථායකයන්ද සමග භාණ්ඩාගාරයට ඇතුල්ව හිඳීද, නිදද, ඒ අතර යම්පමණ භාණ්ඩ නැසීයේද, ඒ සියල්ල ඔහුට ශ්‍රීවාවේ. භාණ්ඩාගාරික හා සෙසුතෙරුන්ද සහායයන් වියයුතුය. නැවත භාණ්ඩාගාරිකතෙමේම ලොල් හෙරණුන්ද උපස්ථායකයන්ද ගෙන භාණ්ඩාගාරයෙහි හිඳීද, නිදද, එහි යමක් නැසීයේද සියල්ල ඔහුටම ශ්‍රීවාවේ. එහෙයින් භාණ්ඩාගාරිකම එහි විසියයුතුය. සෙස්සන් මැනවැයි රුක්මුල විසියයුතුය. භාණ්ඩාගාරයෙහි නොවිසියයුතුය. යම් කෙනෙක් තමතමන්ගේ සහාග භික්ෂූන් වසන ඕවරකයන්හි පිරිකර තබත්ද, ඒ පිරිකර නැසුනුකල්හි යම් කෙනෙකුන්විසින් පිරිකර තබනලද්දේද, ඔවුන්ටම ශ්‍රීවාවේ. අන්හු සහායයන් වියයුතුය. ඉදින්වනාහි සඞ්ඝතෙමේ භාණ්ඩාගාරිකහට විහාරයෙහිදීම කැඳබත් දෙවාද, ඔහුද භික්ෂාචාරයපිණිස ගමට යේද, පිරිකර නැසුනේ ඔහුටම ශ්‍රීවාවේ. භික්ෂාචාරයට පිවිසෙන්නන්විසින් වැඩිසිටුරු රැකීම්පිණිස සිටුවනලද විහාරවාරිකයාහටද කැඳබත් හෝ බත් වැටුප් හෝ ලබන්නාවූම භික්ෂාචාරයට යන්නහුටද එහිදී යමක් නස්නේද සියල්ල ශ්‍රීවාවේ. හුදෙක් මෙපමණෙක්ම නොවේ. භාණ්ඩාගාරිකයාහට මෙන් ඔහුගේ ප්‍රමාදය හෙතුකොට යමක් නස්නේද, සියල්ල ශ්‍රීවාවේ. ඉදින් විහාරය මහත්වේද, අන් පෙදෙසක් රකින්නට යන්නහුට අන් පෙදෙසෙක්හි තබනලද යමක් සොරු ගෙනයෙත්ද, අවිසයබැවින් ශ්‍රීවානොවේ. මෙබඳු විහාරයක මැද සියල්ලන් රැස්වනතැන

පිරිකර තබා හිඳියයුතුය. විහාර වාරිකයෝ හෝ දෙතුන්දෙනෙක් තැබියයුත්තාහ. ඉදින් අප්‍රමත්තවූ ඔවුන් විසින් අතනමෙතනලා රක්නාලද යම්කිසිවක් නැසේද ග්‍රීවා නොවේ. විහාරවාරිකයන් බැඳ තබාගෙන යනලද භාණ්ඩයද සොරුන්ගේ පෙරමගට ගියකල්හි අන් මගකින් ගෙනයනලද භාණ්ඩය ඔවුන්ට ග්‍රීවානොවේ.

ඉදින්විහාරවාරිකයන්හට විහාරයෙහිදී දියයුතු කැඳබත් හෝ බත්වැටුප් නොවේද, ඔවුන්විසින් ලැබියයුතුවූ ලාභයට වඩා වැඩිවූ දෙකක්තුණක් කැඳසලාකද ඔවුන්ට පොහොනා බත් සලාකද තබන්නට වටියි. අසුවල් කාලයෙහි කැඳබත් විහාරවාරිකයන්ට මැයි නිබඳකොට නොතැබියයුතුය. මනුෂ්‍යයෝ විහාරවාරිකයෝම අපගේ බත් බුදිත්ය'යි විපිළිසර ඇත්තාහුවෙත්ද, එහෙයින් පෙරළා තැබියයුතුය. ඉදින් ඔවුන්ගේ සහාගයෝ ලහබත් ගෙනදෙත්ද මෙසේ මෙය යහපත්ය. ඉදින් නොදෙත්නම් වාරය ගන්වා ගෙන්වියයුත්තාහ. ඉදින්විහාරවාරිකතෙමේ දෙකතුණක් කැඳසලාකද, සතරක්පහක් ලහබත්ද, ලබන්නේම භික්ෂාචාරයටයේද භාණ්ඩාගාරිකහට මෙන් සියල්ල නවුයේ ග්‍රීවාවේ. ඉදින් සඞ්ඝයාහට විහාරපාලකයන්හට දියයුතු බත් හෝ බත්වැටුප් නැත්තේද, භික්ෂූහු විහාරවාරය ගෙන තමතමන්ගේ නිශ්‍රිතකයන්ලවා පොෂණය කරවත්ද, පැමිණිවාරය නොගන්නට නොලබයි. අන්‍ය භික්ෂූහු යම්සේ කරත්ද, එසේම කටයුතුය. භික්ෂූන්විසින් සහකාරයකු නැත්තාවූ හෝ දෙවැන්නෙකු නැත්තාවූ හෝ යමක්හට බත්ගෙන දෙන්නාවූ සහාගභික්ෂූනමක් නැත්තේද, මෙබඳුවූවහුට වාරය නොපැමිණවියයුතුය. නිතර පිසියයුතුවූ කැඳබත් වියදමපිණිස යමක් විහාරයෙහි තබත්ද, ආරාමිකාදීන්විසින්දෙනලද ඒ පාකවට්ටය ගෙන ජීවත්වන්නාවූ අඛෝකාසික රුකමූලිකාදීන්විසින් පාසිවුරු රක්නාපිණිස විහාරවාරය පැමිණිකල්හි සිටියයුතුය. යමෙක් ඒ කොටස ගෙන ජීවත්නොවේද, වාරය නොගැන්වියයුතුය. ඵලාඵලපිණිසද විහාරයෙහි මහණෙකු තබත්ද, දඟුම්කොට ආරක්ෂාකොට ඵලවාරයෙන් බෙද අනුභව කරත්ද, යමෙක් ඒ ඵලාඵල අනුභවකෙරේද, ඔහු සිටියයුතුය. ඵලාඵල නිසා ජීවත්නොවන්නෙක් නොගැන්වියයුත්තේය. සෙනසුන් ඇද පුටු, පසතුරුණු රැකීමපිණිස තබත්ද ආවාසයෙහි වසන්නෙකු සිටියයුතුය. අඛෝකාසිකයෙක් හෝ රුකිමූලිකයෙක් නොගැන්විය යුත්තේය. බොහෝ ඇසුපිරු තැන්ඇති නවකභික්ෂූනමක්වේද බොහෝදෙනාට පාලිධර්ම කියවාද, පිළිවිසීම කෙරේද, පෙළ විස්තර කෙරේද, ධර්මකථා කියාද, සඞ්ඝයාගේ බර උසුලාද, මෙතෙමේ ලාභය බුදින්නේද, ආවාසයෙහි වසන්නේද, වාරය නොගැන්වියයුත්තේය. පුරුෂවිශෙෂයනම් දතයුතුයයි කියත්.

පොහෝගේ පිළිමගේ පිළිදගුම් කරන්නහුටවනාහි දෙකොටසක් කැඳබත්ද, දවස්පතා සහල් නැළියක්ද, අවුරුද්දක් පාසා තුන්සිවුරුද දසයක් විස්සක් අගනා කැපබඩුවක්ද දියයුතුය. ඉදින්වනාහි එය ලබන්නාවූම මහුගේ ප්‍රමාදයෙන් එහි කිසිවක් නැසේද සියල්ල ශ්‍රීවාවේ. බැඳදමා බලාත්කාරයෙන් සිඳගන්නාලද්දවනාහි ශ්‍රීවා නොවේ. එහි චෛත්‍යය සතුවූ හෝ සඞ්ඝයා සතුවූ දැයින් චෛත්‍යය සතුවූවක් රක්වන්නට වටින්නේය. චෛත්‍යසන්තකය සමග සඞ්ඝයා සතුවූ යමක් තබනලද්දේද, එය චෛත්‍යසන්තකය රැක්කවූකල්හි රක්නාලද්දේමවේයයි මෙසේකිරීම සුදුසුවේ. පක්‍ෂවාරයෙන් පොහෝගේ ආදිය රකින්නහුටද ප්‍රමාදයෙන් නැසුනුදය ශ්‍රීවාවේ.

උපනිධිකථා නිමි.

—\\—

එතැනින් අයබද්ද නසත්තුයි **සුඞ්කඝාත**නම්. අයබදු අයකරන තැනට මේ නමෙකි. යම්හෙයකින් එතැනින් අයබදුදීමට සුදුසුවූ ඒ භාණ්ඩය, අයබදු නොදී ගෙනයන්නාහු රජුගේ අයබද්ද නසත්ද, වනසත්ද එහෙයින් **සුඞ්කඝාත**යි කියනලද්දේය. එහි **'පවිසිත්වා'**යනු එහි පවිතබණ්ඩාදීන්අතුරෙහි රජුවිසින් පරිසිදීමකොට තබනලද අයබදු ගන්නාතැනට පිවිස. **'රාජගඃ භණ්ඩඃ'** රජුට සුදුසුවූ භාණ්ඩයක්. යම් භාණ්ඩයකින් රජුට පස්මස්සක් හෝ පස්මස්සට වැඩිතරම්වූ හෝ අගනා අයබද්ද දියයුතුවේද, ඒ භාණ්ඩය යනඅර්ථයි. 'රාජකඃ'යිද පාඨයක්වේ. එය මේ අර්ථයම වේ. **'ථෙය්‍යචිත්තෝ'** මේ භාණ්ඩයෙන් රජුට අයබදු නොදෙන්නෙම්'යි සොරසිත් උපදවා ඒ භාණ්ඩය පහසාද, දුක්කටයවේ. තැබූතැනින් ගෙන ඨවිකයක හෝ බහාද, වැසිතුබූ තැනකදී හෝ කලවයහා බඳීද ථුල්ලච්චයවේ. අයබදු ගන්නාතැනින් පිරිසිදි බැවින් ඨානාචාවනයෙක් නොවේ. සුඞ්කසථානය පරිසිදි තැනින් දෙවනපය ඉක්මවාද පාරාජිකයවේ. **'ඉති සුඞ්කඝාතඃ පාතෙති'** රාජපුරුෂයන්ගේ අන්‍යවිහිතභාවය දැක ඇතුළත සිටියේම පිටතට වැටෙනුපිණිස ගෙනෙනලද යමක් බහාද, එකාන්තයෙන් පිටතට වැටෙන එය අතින්ම්දුනු ඇසිල්ලෙහි පාරාජිකයවේ. ඉදින් ඒ භාණ්ඩය රුකක හෝ කණුවක හෝ වැදුනේ බලවත් වාතවේගයෙන් නගනලද්දක්ව හෝ නැවත ඇතුළටම වැටේද, රකියි. නැවත ගෙන බහාද, පෙරකියූ නයින්ම පාරාජිකයවේ. බිමවැටී පෙරළෙන්නේ නැවත ඇතුළට පිවිසේද, පාරාජිකයමවේ. **කුරුන්දී සඞ්ඛෙපපාඨීකථා**වන්හිවනාහි පිටත වැටුනක් සිටසිට පෙරළෙමින් පිවිසේද පාරාජිකයවේ. ඉදින් රැඳී නොසිටින්නේම පෙරළී පිවිසේද, රකී යි කියනලදී.

ඇතුළෙහි සිට අතින් හෝ පයින් හෝ යටින් හෝ පෙරළාද, අනිකෙකුලවා හෝ පෙරළවාද, ඉදින්නොසිට පෙරළෙමින් ගියේද, පාරාජිකයවේ. ඇතුළත සිට පිටතටයන්නේ රකියි. පෙරළීයන්නේයයි හෝ අනිකෙක් එය පෙරළන්නේයයි හෝ ඇතුළත තැබූ භාණ්ඩයක් පසුව තමන්විසින් හෝ පෙරළතුලබන්නේ අනිකෙකුවිසින් හෝ පෙරළනලද්දේ පිටතටද යේද, රකීමය. පිරිසිදුසිතින් තැබූ භාණ්ඩය එසේ පෙරළීයනකල්හි කියයුත්තෙක්ම නැත්තේය. ගොටුදෙකක් ඒකාබද්ධකොට අයබදුගන්නා ස්ථානසීමාව තුළ තබාද කොයිලෙසකින් නමුත් එහි පිටත ගොටුවෙහි අයබද්ද පාදයක් අගීද, ඒ සමග ඒකාබද්ධබැවින් ඇතුළතතුබූ ගොටුව රකියි. ඉදින්වනාහි පෙරළා ඇතුළතතුබූ ගොටුව පිටත තබාද, පාරාජිකයවේ.

කදෙහිද කදකෙළවර රැහණින් බැඳ ඒකාබද්ධකොට තැබූකල්හි මේනයමවේ. ඉදින්වනාහි නොබැඳ කදකෙළවර තැබූමාත්‍රයෙක්මවේද, පාරාජිකයවේ. සොරහුගේ ප්‍රයෝගයක් නැතිව තමන් යන්නාවූ යානාවක හෝ එසේ යන අසුන්ගේ පිටආදියෙහි හෝ පිටතට ගෙනයන්නේනුයි තබාද, ගෙනගියකල්හිද අවහාරයක් නැත්තේය. භණ්ඩදෙය්‍යද නොවේ. කුමක් හෙයින්දයත්: මෙතන්හි පිවිසියහුගේ අයබද්ද ගනිත්වායි කියූබැවිනි. මෙද අයබදු ගන්නා ස්ථානයෙන්පිටත තබනලද්දේද ඔහුවිසින් ගෙනයනලද්දේනොවේද, එහෙයින් භණ්ඩදෙය්‍ය නොමවේ. පාරාජිකය නොවේ. නැවතීසිටි යානාවන්හි තැබූකල්හි ඔහුගේ ප්‍රයොගයක් නැතිවගියකල්හි සොරසිත ඇතිකල්හිදු අවහාරයක් නැත්තේමය. ඉදින්වනාහි යානාදියෙහි භාණ්ඩ තබා පදවන්නේ අයබදු ගන්නාතැන ඉක්මවාද, හසතිශික්ෂාදියෙහි හෝ කළපුරුද්ද ඇතිබැවින් ඉදිරියෙහිසිට 'බොල එව'යි කැඳවාද, සීමාව ඉක්මීමෙහිදී පාරාජිකයවේ.

එළකලොම ශික්ෂාපදයෙහි යටකියූ යානාදිය කරණකොට කියූලෙසින් යනමෙතැන්හි අනිකෙකුලවා ගෙන යවාද ඇවැත් නොවේ. මේ අදත්තාදන ශික්ෂාපදයෙහි පාරාජිකයවේ. ඒ එළකලොම ශික්ෂාපදයෙහි නොදන්නාවූ අනිකෙක්හුගේ යානයක හෝ භාණ්ඩයක හෝ බහා තුන්යොදුනක් ඉක්මවාද, යමක් හෙතුකොට එළලොම් නිසගීහු වෙත්නුයි පාචිත්තියවේ. මේ ශික්ෂාපදයෙහි ඇවැත් නොවේ. අයබදු ගන්නාතන්හි අයබදු දීලාම යැම සුදුසුවේ. එකෙක්, 'අයබදු දෙව'යි කියත්නම් දෙන්නෙම්, නොකියත්නම් යන්නෙම්'යි කල්පනාකොට යේද, එසේ යන ඔහු දැක එක් අයබදු ගන්නෙක් 'මේ මහණ යන්නේය, ඔහුගෙන් අයබදු ගනිවු'යි කියාද අනිකෙක්

'පැවිද්දහුට අයබදු කොයින්ද යේවා'යි කියන්නේද ලබනලද්ද කැපවේ. යායුතුය. අයබදු නොදී මහණුන්ට යෑම නොවටියි. 'උපාසකයෙනි! අයබදු ගනිවු'යි කියූකල්හි අයබදු ගන්නවුන්විසින් 'මහණහුගේ පාසිවුරු ගතයුතු වන්නේය, ඒ ගැනීමෙන් කිම? යේවා'යි කියූකල්හිද ලබනලද්ද කැපමය. ඉදින්අයබදුගන්නෝ නිදත් හෝ දූකෙළි හෝ කෙළිත්ද, යම්කිසි තැනක ගියාහු හෝ වෙත්ද, මේ මහණතෙමේද අයබදු ගන්නෝ කොහිදැයි කැඳවාද නොදකීද, ලබනලද්ද කැපමය. ඉදින් අයබදුගන්නා තැනටපැමිණ අන්‍යවිහිතවූයේ හෝ කිසිවක් සිතන්නේ හෝ හඳරන්නේ හෝ මනස්කාරයෙහි යෙදුනේ හෝ සොරු ඇත් සිංහ කොටිආදීන්විසින් වහානැඟීසිට එක්වන් ලුහුබඳිනලද්දේ හෝ නැංගාවූ මහාමෙඝයක් දැක ඉදිරියෙහි ශාලාවකට ඇතුල්වනු කැමැතිව හෝ එතැන ඉක්මවායේද, ලබනලද්ද කැපමය. **'සුඛං පරිහරති'** යනමෙහි අයබදු ගන්නාතැනින් පිටත භාත්පස ලෙඩ්ඩුපාත දෙකක්හුගේ උපචාරයට බැස කිසිසේත් පරිහරණය කෙරේද අවහාරයමැයි, **කුරුන්දිඅට්ඨකථාවෙහි** කියනලද්දේය. **මහාඅට්ඨකථාවෙහි** වනාහි රාජපුරුෂයෝ පරිහරණය කරන්නහු වෙහෙසත්යයි හුදෙක් ආදීනවය දක්වා උපචාරයට බැස පරිහරණය කරන්නහුට දුක්කටයවේ. නොබැස පරිහරණයකරන්නහුට ඇවැත් නොවේයයි කියනලදී. මේ ක්‍රමය පෙළ හා සමවේ. මේ සුඩකඝාතඝථානයෙහි ලෙඩ්ඩුපාත දෙකකින් උපචාරය පිරිසිදියයුත්තේය.

සුඩකඝාතකථා නිමි.

—\\—

මෙයින් මත්තෙහි එකාන්තයෙන් අවහාරයට පොහෝනා ප්‍රාණියෙකු දක්වන්නේ **'මනුඝසපාණෙ'**යනු වදළසේක. දසකමින් නිදහස්වූ ඔහුද සොරසිතින් ගෙනයන්නහුට අවහාරයක් නැත්තේය. යමෙක්වනාහි නිදහස්වූයේද, මවවිසින් හෝ පියාවිසින් හෝ ණය ගන්නාකාලයෙහි යම්තාක් කලකින් ණය ආපසු දෙන්නෙම්ද, ඒතාක්කල් මෙතෙමේ තොපසතු වේවායි ණය දෙන්නවුන්ට පාවාදෙනලද්දේවේද, තමන්විසින් හෝ තමන්ගේ මත්තෙහිකොට පණුසක් හෝ සැටක් ගන්නේද ඔහුද සොරසිතින් ගෙනයන්නහුට අවහාරයක් නැත්තේය. පාවාදී ගත් ධනය ගියතන්හිම වැඩේ. ගෙයි දසියගේ කුස දසයාහටදව උපන්නහු, ධනයෙන් විකිණීගන්නාලද්දහු, පරවිෂය විලොපනයකොට ගෙනවුත් දසභාවයට පමුණුවා ගන්නාලද්දහුයන ප්‍රභෙදඇති දසයාම සොරසිතින් ගෙනයන්නහුටම අවහාරයවේ. ඒ සඳහාම **'පාණොනාම**

මනුස්සපාණෝ වුච්චති'යනු වදරණලදී. මෙහිද ගෙයිසිටි දසියගේ කුසෙහි දසයාහටදව උපන්නේ **අන්තොජාතක** නම්වේ. ධනයෙන් මිලදී ගන්නාලද්දේ **ධනක්කීත** නම්වේ. පරදෙශය විලොපනයකොට ගෙනවුත් දාසභාවයට පමුණුවනලද්දේ **කරමරාතීත**යි දතයුතුය. මෙබඳු ප්‍රාණියෙකු ගෙනයන්නෙමියි පහසාද දුක්කටයවේ. අත් හෝ පා හෝ ගෙන ඔසවමින් සොලොවාද ථුල්ලච්චයවේ. ඔසවා පලායනු කැමැතිව කෙසගක් පමණකුදු සිටිතැනින් අන්තැනකට පමුණුවාද පාරාජිකයවේ. කෙස් හෝ අත් හෝ ගෙනඅදීද, පදවාරයෙන් කටයුත්තේය. පයින් ගෙනයන්නෙමියි තර්‍ජනයකරන්නේ හෝ පහරදෙන්නේ හෝ 'මෙතැනින් යව'යි කියාද, ඔහුවිසින් කියූ දිසාභාගට යන්නහුගේ දෙවන පියවර නිමිතිකොට පාරාජිකයවේ.

යම් මහණකෙනෙක් ඔහු හා සමාන අදහස් ඇත්තාහු වෙත්ද, සියලුදෙනාහට එකෙණෙහි පාරාජිකයවේ. මහණෙක් දසයෙකු දෙක සුවදුක් විචාරා හෝ නොවිචාරා යව පලාගොස් සුවසේ ජීවත්වෙව'යි හිමියන්ගේ සමීපයෙන් පහකරනු කැමතිව සොරසිතින් කියාද, ඉදින් ඔහු පලායේද, දෙවන පියවර නිමිතිකොට පාරාජිකයවේ. තමන්ගේ සමීපයට ආවාවූ ඔහුට අනිකෙක් 'පලායව'යි කියාද, ඉදින් මහණුන් සියයක් පිළිවෙළින් තමතමන්ගේ සමීපයට ආවහුට කියාද, සියල්ලන්ට පාරාජිකයවේ. යමෙක්වනාහි වෙගයෙන් පලායන්නහුටම 'හිමියෝ තා නොඅල්ලා ගනිත්ද, එයට පෙර තෝ පලායව'යි කියාද පාරාජිකයෙන් ඇවැත් නොවේ. ඉදින්වනාහි හිමින් යන්නහුට කියාද, ඔහුද ඔහුගේ වචනයෙන් වහායේද පාරාජිකයවේ. පලාගොස් අන්ගමකට හෝ දෙශයකට ගියහු දක එතැනිතුදු පලවා යවන්නහුට පාරාජිකයමවේ. අදින්නාදනයනම් පරියාය වචනය කරනකොට මිදේ. යමෙක්වනාහි 'තෝ මෙහි කුමක්කරන්නෙහිද? පලායැම තට නොවටීද'යි හෝ කිම, කොතැනක හෝ ගොස් සුවසේ ජීවත්වීම නොවටීදයි හෝ දැසිදස්සෝ පලාගොස් අසුවල් පෙදෙසට පැමිණ සුවසේ ජීවත්වෙතියි හෝ මෙසේකියාද, හෙතෙමේද ඔහුගේ වචනය අසා පලායේද, අවහාරයක් නැත්තේය. යමෙක් 'අපි අසුවල් පෙදෙසට යමු, එහි ගියාහු සුවසේ ජීවත්වෙත්, අප සමග යන්නවුන්ටද අතර මගදී මාඟෝපකරණාදියෙන් පීඩාවක් නැත්තේය'යි කියා සුවසේ තමන්සමග එන්නහු ගෙනයේද, මග යැම්විසයෙන්මුත් සොරසිත කරනකොට නොවේද, එහෙයින් අවහාරයක් නැත්තේමය. අතරමගද සොරු නැගීසිටිකල්හි 'කොල! සොරු නැගීසිටියාහුය, වෙගයෙන් පලායව, එව, යව'යි

කියන්නහුටද සොරුන්ගෙන් වන අනතුරුවලින් මිදීමපිණිස කියුබැවින් අවහාරයක් නොකියත්.

පාණකථා නිමි.

——\\——

පා නැත්තවුන් අතුරෙහි - **අහි** නම් සසවාමිකවූ අහිගුණ්ඨිකාදීන්විසින් ගන්නාලද සර්පතෙමේය. යම් සර්පයෙකු ක්‍රීඩා කරවන්නාහු අඩක්ද පාදයක්ද කහවණුවක්ද ලබත්ද, මුදහරින්නාහු අමුරන් හෝ රන් හෝ ගෙනම මුදහරිත්ද, ඔවුහු කිසියම් මහණෙකු හුන්තැනට ගොස් නයිපෙට්ටිය තබා නිදත් හෝ කොතැනක හෝ යෙත්ද, එහිදී ඒ මහණ සොරසිතින් ඒ පෙට්ටිය පහසාද, දුක්කටයවේ. සොලවාද, ථුල්ලච්චයවේ. තුබුතැනින් පහකෙරේද පාරාජිකයවේ. ඉදින්වනාහි පෙට්ටිය හැර සර්පයා බෙල්ලෙන් අල්ලාගනීද, දුක්කටයවේ. එයින් නගාගනීද, ථුල්ලච්චයවේ. කෙලින් නගාගන්නහුට පෙට්ටියේ යටතලින් සර්පයාගේ නගුට කෙසගක් පමණ මිදුනු ඇසිල්ලෙහි පාරාජිකයවේ. පෙට්ටියෙහි මූණත මදක් ඇර පහරක් හෝ දී 'කොල! එව'යි නාමයෙන් කැඳවා නික්මවාද, පාරාජිකයවේ. එසේම පෙට්ටිය ඇර මැඩිහඬක් හෝ මීහඬක් හෝ විලඳවිසිරීම හෝ කොට නමින් කැඳවාද, අසුරක් හෝ ගසාද, මෙසේ නික්මුනුකල්හිද පාරාජිකයවේ. පෙට්ටියෙහි මූණත නොඇරද මෙසේ කළකල්හි බඩසයින් පෙරළුණු සර්පයා හිසින් පෙට්ටියෙහි පියනට පැහැර ඉඩලබාගෙන පලායේද පාරාජිකයමවේ. ඉදින්වනාහි පෙට්ටියෙහි මූණත විවෘතකළකල්හි සර්පයා, තෙමේම පලායේද, භණ්ඩදෙය්‍යවේ. නැවතද මුඛය විවෘතකොට හෝ විවෘතනොකොට හෝ හුදෙක් මැඩිහඬ මීහඬ හෝ විලඳවිසිරීම හෝ කෙරේද, නම කියා නොකැඳවාද, අසුර හෝ නොගසාද, සර්පයා බඩසයින් පෙළුනුබැවින් මැඩිආදීන් කන්නෙමියි පිටතට නික්ම පලායේද, භණ්ඩදෙය්‍යමවේ. මතස්‍යයා හුදෙක් මෙහි අපදග්‍රහණයෙන් ආයේය. මෙහි යමක් කියයුතුනම් එය උදකට්ඨකථාවෙහි කියනලද්දේමය.

අපදකථා නිමි.

——\\——

දෙපා ඇත්තවුන්අතුරෙහි යම් කෙනෙකු අවහරණය කරන්නට හැක්කේද, ඔවුන් දක්වන්නෝ '**මනුස්සා පක්ඛිජාතා**'යනු වදළසේක. දෙවියන් අවහරණය කරන්නට නොහැකිය. මොවුනට පක්ෂයෝ

හටගත්හයි **පක්ඛජාත**නම්වූහ. ඔවුහු ලොමපක්ෂ - චම්පක්ෂ - අසථි පක්ෂයි තෙපරිදිවෙත්. ඔවුන්අතුරෙහි මොනර, කුකුළු ආදීහු ලොමපක්ෂයෝය. වවුළුආදීහු චම්පක්ෂයෝය. භ්‍රමරාදීහු අසථි පක්ෂයෝයයි දතයුත්තාහ. ඒ සියල්ලෝද මනුෂ්‍යයෝද පක්ෂජාතීහුද හුදෙක් මෙහි දවිපදග්‍රහණයෙන් ආවාහුය. මෙහි යමක් කියයුත්තේනම් එය ආකාසඨකථාවෙහිද ප්‍රාණිකථාවෙහිද කියනලදනය ඇත්තේමය.

දවිපදකථා නිමි.

—\\—

සිවුපා ඇත්තවුන් අතුරෙහි - **පසුකා** යන මෙයින් පෙළෙහි ආවාවූ සෙසු සියල්ලෝ සිවුපාජාතිහයි දතයුත්තාහ. හසතිආදීහු ප්‍රකටයෝමය. එහි සොරසිතින් ඇතෙකු පහසන්නහුට දුක්කටයවේ. සොලවන්නහුට ථුල්ලවචයවේ. මහත් ශක්තිඇති යමෙක් බලමදය කරණකොට තරුණවූ හිඬක, හිඬකයි හඬනගනබැවින් එනම්ලද ඇත්පැටවෙකු නැබමුල හිසින්උඩට නගාගන්නේ පාසතර හා සොඬය බිමින් කෙසගක්පමණ නමුදු මුදද පාරාජිකයවේ. කිසි ඇතෙක්වනාහි ඇත්හලෙහි බැඳ තබනලද්දේවේද, කිසි ඇතෙක් නොබඳිනලදුවම සිටිද, කිසි ඇතෙක් වත්තතුළ සිටිද, කිසි ඇතෙක් රජමිදුලෙහි සිටිද, එහි ඇත්හලෙහි බෙල්ලෙන් බැඳතැබූ ඇතුගේ බෙල්ල බැඳීමද පාසතරදැයි පස්තැනක්ලැබේ. බෙල්ලෙන්ද එක් පාදයක් යකඩහැකිල්ලෙන්ද බඳිනලද ඇතුට සතැනක්ලැබේ. බෙල්ලෙන් හා දෙපාදයෙන් බඳිනලදඇතුට සත්තැනක් ලැබේ. ඒ සථානයන්ගේවසයෙන් සෙලවීම් හුන්තැනින් පහකිරීම්ආදිය දතයුතුය. නොබඳිනලද ඇතුට මුළු ඇත්හලම තැන්වේ. ඒ ඇත්හලින් ඉක්මවාද පාරාජිකයවේ. වත්තතුළ සිටි ඇතුට සියලු ඇතුල්වත්තම තැන්වේ. ඒ ඇතු වත්තදෙර ඉක්මීමෙහිදී පාරාජිකයවේ. රජ මිදුලෙහි සිටියහුට සියලු නගරය ස්ථානවේ. ඒ ඇතු නුවරදෙරින් ඉක්මීමෙහිදී පාරාජිකයවේ. පිටනුවරෙහි සිටියහුට සිටිතැනම සථානවේ. ඔහු ගෙනයන්නේ පදවාරයෙන් කරවියයුත්තේය. හොත්තහුට එක්ම ස්ථානයක්වේ. ඔහු සොරසිතින් නගාසිටුවන්නහුට නැගීසිටි ඇසිල්ලෙහි පාරාජිකයවේ. අසුකෙරෙහිද මේ විනිශ්චයවේ.

ඉදින්වනාහි ඒ අසු පාසතරින් බඳිනලද්දේවේද ඔහු පිළිබඳව අටතැනක් දතයුතුය. ඔටුවාකෙරෙහිද මේ නයමවේ. කිසි ගොනෙක් ගෙයි බැඳ තබනලද්දේවේ. එකෙක් නොබඳිනලදුවම සිටියි. කිසි ගොනෙක් ගාලෙහි බැඳතබනලද්දේවේ. කිසි ගොනෙක් නොබඳිනලදුවම සිටියි. එහි

ගෙයි බැඳතැබූ ගොනු පිළිබඳව පාසතර හා බැඳීමයි ස්ථානපසක්වේ. නොබඳිනලද ගොනුට මුළු ගෙයම ස්ථානවේ. ගාලෙහි බැඳතබනලද්දහුට පස්තැනක්ලැබේ. නොබඳිනලද්දහුට මුළු ගාලම ස්ථානවේ. ඒ ගාල්දෙර ඉක්මවාද පාරාජිකයවේ: ගාල බිඳගෙන යන්නේ තමන් කැඩූදෙර ඉක්මවාද පාරාජිකයවේ. දෙර විවෘතකොට හෝ ගාල බිඳ හෝ පිටතසිටියේ නම කියා කැඳවා නික්මවාද, පාරාජිකයවේ. අතුකඩක් හෝ දක්වා කැඳවන්නහුටද මෙම නයවේ. දෙර නොඇර ගාල නොබිඳ හුදෙක් අතුකඩක් සොලවා නොකැඳවාද, ගොනාට බඩසා ඇතිබැවින් ගාලෙන් පැන නික්මේද, පාරාජිකයමවේ. ඉදින්වනාහි දෙර ඇරියකල්හි, ගාල හෝ බිඳිකල්හි තෙමේම නික්මේද, හණ්ඩදෙය්‍යවේ. දෙර විවෘතකොට හෝ විවෘතනොකොට හෝ ගාල බිඳ හෝ නොබිඳ හෝ හුදෙක් අතුකඩක් සොලවාද, නොකැඳවාද, ගොන් තෙමේ බඩසා ඇති බැවින් පයින් හෝ උඩපැන හෝ නික්මේද, හණ්ඩදෙය්‍යමවේ. එක් ගොනෙක් ගම්මැද බඳිනලදුව සිටියේවේද, එකෙක් හොත්තේවේද, සිටි ගොන්හට පස්තැනක් ලැබේ. හොත්තහුට දෙතැනක් ලැබේ. ඔවුන්ගේවසයෙන් සෙලවීම් හුන්තැනින් පහකිරීම් දතයුතුය. යමෙක්වනාහි හොත්තහු නොනැගුටුවා එතැනදීම නසාද හණ්ඩදෙය්‍යවේ. මනාකොට වට කළ දෙරකින් යුත් ගමෙහි සිටි ගොන්හට මුළුගම ස්ථානවේ. වටනොකළ ගමෙහි සිටියහුට හෝ හැසිරෙන්නහුට හෝ පාවලින් පැගූ තැනම ස්ථානවේ. කොටලූ සිවුපා ආදීන් අතුරෙහිද මේ විනිශ්චයමවේ.

චතුප්පදකථා නිමි.

—\\—

බොහෝ පාඇත්තවුන් අතුරෙහි එක් සතපදියක කරණකොට පාරාජික වසතුව පිරේද, ඔහු පයින් යවන්නහුට නවාතුවක් ථුල්ලච්චයෝවෙත්. එක් පාරාජිකයෙක්වේ. සෙස්ස කියූනය ඇත්තේමය.

බහුප්පදකථා නිමි.

—\\—

විමසා බලාතුයි **ඔවරක** නම්. ඒ ඒ තැන ඇතුළට පිවියේතුයි කියනලද්දේවේ. **'ඔවරිත්වා'** සලකා විමසා යනඅර්ථයි. **'ආවික්ඛති'** පරකුලයන්හි හෝ විහාරාරාමාදියෙහි හෝ නොමනාව තැබූ නොකළ රූකුම්ඇති භාණ්ඩයක් සොරකම්කරන්නට ප්‍රතිබලඇති අනෙකක්හට සැලකෙරෙයි. **'ආපත්ති උභින්නං පාරාජිකස්ස'** අවශ්‍යයෙන් සොරකම්කොට

ගතයුතුභාණ්ඩයෙහි ඔත්තු කියන්නහුට අණකළ මොහොතෙහිද, අනෙකාහට ඨානාවාවනයෙහිදයි මෙසේ දෙදෙනාහට පාරාජිකාපත්තියවේ. යම් මහණෙක්වනාහි 'පුරුෂතෙමේ ගෙයි නැත්තේය, භාණ්ඩය අසුවල් පෙදෙසෙහි තබනලද්දේය, නොකළ රැකුමිඇත්තේය, දෙර නොවසනලද්දේය, ගිය ඇසිල්ලකින්ම ගන්නට හැක්කේය, පුරුෂයන්විසින් කළයුතු කටයුතුවලින් ජීවත්වන කිසිවෙක් නම් නැත්තේය, යමෙක් ගොස් එය ගන්නේ ය' යන මේ ආදි ක්‍රමයෙන් පරියාය කථාකෙරේද, එද අසා අනෙකෙක් 'මම දැන් ගෙනයන්නෙමි'යි ගොස් ගණිද, එය ගන්නහුට ඨානාවාවනය නිමිතිකොට පාරාජිකයවේ. අනෙකාටවනාහි ඇවැත් නොවේ. පරියාය කථාවෙන් අදින්නාදනයෙන් මිදෙන්නේය.

ඔවරකකථා නිමි.

—\\—

ගෙන අවුත් තැබූබවු රකින්නේනුයි **ඔණිරක්ඛ**නම්වේ. යමෙක් අනිකෙකුවිසින් තමන්ගේ වාසසථානයට ගෙනෙනලද භාණ්ඩයක් **'සාමිනි! මම මෙනම් කෘත්‍යයකොට යම්තාක් එන්නෙමිද ඒතාක් මොහොතක් මේ භාණ්ඩය බලාගණු මැනවැ'යි** කියන ලද්දේවේද, ඒතාක් රකියි. ඔහුට මේ නමෙකි. එහෙයින්ම **'ඔණිරක්ඛෝ නාම ආහට∘ භණ්ඩ∘ ගොපෙත්තා'**යනු වදළසේක. එහි ඔණිරක්ඛ තෙමේ බොහෝසෙයින් බැඳ එල්ලාතැබූ භාණ්ඩයක් නොමුදම යට පසුම්බිය හෝ ගොටුව හෝ කපා සඵලපමාත්‍රයක් ගෙන මැහීම්ආදිය නැවත ප්‍රකෘතිමත්කෙරේද, 'මෙසේ ගන්නෙමි'යි පැහැසීම්ආදිය කරන්නහුට සුදුසුවූ ආපත්තීහු දතයුත්තාහ.

ඔණිරක්ඛකථා නිමි.

—\\—

සංවිධානයකොට සොරකම්කිරීම **සංවිදවහාර** නම්වේ. ඔවුනොවුන්ගේ ප්‍රඥප්තිය කරණකොට කළ සොරකමැයි කියනලද්දේවේ. **'සංවිදහිත්වා'** සමානවඡන්දය ඇතිබැවින් සමානාධ්‍යාසය ඇතිබැවින් එක්ව මන්ත්‍රණයකොට යනඅර්ථියි. එහි මේ විනිශ්චයවේ: බොහෝභික්ෂූහු 'අසුවල්ගෙට ගොස් වහල හෝ බිඳ ගෘහසන්ධි හෝ සිඳ භාණ්ඩය ගන්නෙමු'යි නියමකොට ගෙනයෙත්ද, ඔවුන් අතුරෙහි එකෙක් භාණ්ඩය සොරකම්කරයි. ඒ භාණ්ඩය ඉදිරීම නිමිතිකොට සියල්ලන්ට පාරාජිකයවේ.

පරිවාරයෙහි ද:

'චතුරෝ ජනා සංවිධාය ගරුභණ්ඩං අවාහරුං,
තයෝ පාරාජිකා වුත්තා එකෝ ච න පාරාජිකෝ,
පඤ්හා මෙසා කුසලෙහි චින්තිකා'යි

වදරණලද්දේය.

'සිවුදෙනෙක් තුමූ සමානචඡන්දයෙන් මනත්‍රණයකොට ගරුභාණ්ඩයක් සොරකම්කළහ. එහිදී තිදෙනෙක් පාරාජිකාවට පැමිණියාහුයයි කියනලදහ. එකෙක් නොද පාරාජිකවූයේය. මේ ප්‍රශ්නය විඳයන්විසින් සිතනලදය,

ඒ ප්‍රශ්නයෙහි මේඅර්ථයවේ:

ආචාර්‍ය්‍ය - අන්තෙවාසිකයෝ සිවුදෙනෙක් සමස්සක් වටිනා ගරුභාණ්ඩයක් සොරකම්කොටගනු කැමැත්තෝවූහ. එහි ආචාර්‍ය්‍යතෙමේ 'තෝ එක්මස්සක් ගනුව, තෝ එක් මස්සක් ගනුව, තෝ එක් මස්සක් ගනුව, මම තුන් මස්සක් ගන්නෙමි'යිකීයේය. අන්තෙවාසිකයන් අතර පළමුවැන්නා 'ස්වාමීනි! ඔබවහන්සේ මසුතුනක් ගනුමැනව, තෝ එක්මස්සක් ගනුව, තෝ එක්මස්සක් ගනුව, මම එක්මස්සක් ගන්නෙමි'යිකීයේය. අනික් දෙදෙනද මෙපරිද්දෙන්මකීහ. එහි අතවැසියන්අතුරෙහි එකක් එකක්හට එක් එක් මස්සෙක් සාහත්‍ථිකවේ. එයින් ඔවුන්ට දුක්කටාපත්ති වේ. පසෙක් ආණත්තික වේ. එයින් තිදෙනකුටම පාරාජිකාපත්තිය වේ. ආචාර්‍ය්‍යාහටවනාහි තුනක් සාහත්‍ථික වේ. එයින් මොහුට ථුල්ලච්චය වේ. තුනක් ආණත්තිකවේ. එයිනුදු ථුල්ලච්චයම වේ. මේ අදින්නාදානශික්ෂාපදයෙහි සාහත්‍ථිකයට ආණත්තිය හෝ ආණත්තියට සාහත්‍ථිකය හෝ අඩු නොවේ. සාහත්‍ථිකයවනාහි සාහත්‍ථිකයෙන්ම කරවියයුතුය. ආණත්තිකය ආණත්තිකයෙන් ම කරවිය යුතු ය. එහෙයින්,

'චතුරෝ ජනා සංවිධාය -පෙ- පඤ්හා මෙසා කුසලෙහි චින්තිකා'යි

කියනලදී.

තවද සංවිදවහාරයෙහි නොමුළාබව පිණිස **'එකං භණ්ඩං එකට්ඨානං, එකං භණ්ඩං නානාට්ඨානං, නානාභණ්ඩං එකට්ඨානං, නානාභණ්ඩං නානාට්ඨානං,** යන මේ වතුෂ්කයද අර්ථවශයෙන් සැලකියයුතුය. එහි **'එකං භණ්ඩං එකට්ඨානං'** එක් කුලයකට අයත් කඩලෑල්ලක නො මනාව තබනලද පස්මස්සක් වටින භාණ්ඩයක් දක බොහෝ භික්ෂූහු, එකක්හට 'යව, මේ භාණ්ඩය ගෙනඑව'යි අණ කෙරෙත්ද,

එය නගාගැනීම නිමිතිකොට සියල්ලන්ට පාරාජිකයවේයතුයි. **'එකං භණ්ඩං නානාඨානං'** එක් කුලයකට අයත් කඩලැලි පසෙක්හි නොමනාව තබනලද එක් එක් මස්ස දක බොහෝ භික්ෂූහු එකක්හට 'යව මේ මසුගෙන එව'යි අණකෙරෙත්ද, පස්වනමස්ස නගාගැනීම නිමිතිකොට සියල්ලන්ට පාරාජිකයවේයතුයි. **'නානාභණ්ඩං එකඨානං'** බොහෝදෙනෙකුන් සතුවූ එක්තැනක නොමනාව තබනලද පස්මස්සකට හෝ පස්මස්සකට වැඩිතරම්වූ විටින්නාවූ භාණ්ඩයක් දක බොහෝභික්ෂූහු එකක්හට 'යව, මේ භාණ්ඩය ගෙනඑව'යි අණකෙරෙත්. ඒ භාණ්ඩය නගාගැනීම නිමිතිකොට සියල්ලන්ට පාරාජිකයවේයතුයි. **'නානාභණ්ඩං නානාඨානං'** කුලපසකට අයත්වූ කඩලැලි පසෙක නොමනාව තබනලද එක් එක් මස්සදක බොහෝභික්ෂූහු, එකක්හට 'යව, මේ මසු ගෙන එව'යි අණකෙරෙත්. පස්වනමස්ස උදුරාගැනීම නිමිතිකොට සියල්ලන්ට පාරාජිකයවේයතුයි.

සංවිදහාරකථා නිමි.

—\\—

'සඤ්චෙතන කම්මං' හැඳිනගැනීමපිණිස කරනකම්යයි. කාලපරිච්ඡේදවසයෙන් සලකුණුකිරීමය යනඅර්ථයි. මෙහිදී 'පෙරබත සොරකම්කොට ගෙනඑව'යි කියනලද්දේ, අද හෝ පෙරබත ගෙන ඒවා, හෙට හෝ අනාගත සංවත්සරයෙහි හෝ ගෙනඒවායි කියනලද්දේද කාලයාගේ පිරිසිදීම්වසයෙන් සලකුණුකිරීමෙහි විසඤ්චෙතනයක් නැත්තේය. දෙදෙනාහටම ඔවරක කථාවෙහි කියූනයින්ම පාරාජිකයවේ. ඉදින්වනාහි 'අද පෙරබත ගෙනඑව'යි කියනලද්දේ, හෙට ගෙනඒද, 'අද'යි නියමකරනලද ඒ සලකුණ ඉක්මවා පසුව ගෙනඑන ලද්දේවේද, ඉදින් 'හෙට පෙරබත ගෙනඑව'යි කියනලද්දේ, හෙටගෙන ඒද, 'අද'යි නියමකරනලද ඒ සලකුණ ඉක්මවා පසුව ගෙන එනලද්දේවේද, ඉදින් 'හෙට පෙරබත ගෙන එව'යි කියනලද්දේ අද පෙරබත ගෙන ඒද, 'සෙටැ'යි නියමකරනලද ඒ සලකුණට නොපැමිණ එයටපෙර ගෙනඑනලද්දේවේද, මෙසේ අවහරණයකරන අවහාරකයාහටම පාරාජිකයවේ. ඇණවූවිහුට ඇවැත් නොවේ. 'හෙට පෙරබතැ'යි කියූකල්හි එදවසම හෝ හෙට පසුබත හෝ ගන්නේද, ඒ සලකුණට පෙරද පසුද ගෙනේයයි දතයුතුය. පසුබත රැඳවලද මෙම නයවේ. පෙරයම මැදුම්යම පැසුළුයම අවපුර දෙපස මාස උතු අවුරුදු යනාදීන්ගේ වසයෙන්ද මෙහි කාලය පිරිසිදීම් වසයෙන් සඤ්චෙතන විසඤ්චෙතන භාවය දතයුතුය. 'පෙරබත

ගෙනඑව'යි කියූ කල්හි 'පෙරබත ම ගන්නෙමි'යි ව්‍යායාම කරන්නහුට පසුබතවේද, යන මෙහිලා කෙසේවේද යන ප්‍රශ්නයෙහි **මහාසුම්ම** සථවිරයන්වහන්සේ මෙය පුරෙභත්තප්‍රයොගයම වේ. එහෙයින් මූලසථතෙමේ නොමිදේයයිකීහ. **මහාපදුම** සථවිරයන්වහන්සේවනාහි කාලයාගේ පිරිසිදීම ඉක්මවූබැවින් විසඬෙකතයවේ. එහෙයින් මූලසථතෙමේ මිදේයයිකීහ.

සඬෙකතකම්මකථා නිමි.

—\\—

"නිමිත්තකම්මං'යනු කල්පනා උපදවනුපිණිස වණ්ණසංසථානාදි වශයෙන් කිසි නිමිත්තක්කිරීමය. ඒ නිමිතිකිරීම **'අක්ඛිං වා නිඛණිස්සාමි'** යනාදි නයින් තෙපරිද්දෙකින් වදරණුලද්දේය. මෙහි අන්‍යවූද අත එසවීම අප්පුඩිගැසීම අසුරුගැසීම බෙල්ල එසවීම කෑරීම යනාදීවූ අන්අයුරුද සඬග්‍රහ කටයුතු ය. මෙහි සෙස්ස සඬෙකත කම්යෙහි කියූනය ඇත්තේය.

නිමිත්තකම්මකථා නිමි.

—\\—

දන් මෙම සඬෙකතකම් - නිමිත්තකම්යන්හි නොමුළාබවපිණිස **"භික්ඛු භික්ඛුං ආණාපෙති'** යනාදිය වදළසේක. එහි **'සො තං මඤ්ඤමානො තං'**යනු, ඒ අවහාරක අණවන්නහුවිසින් යම්නිමිති හැහවීමක්කොට කියනලද්ද, 'ඒ මෙය'යි සිතමින් ඒ භාණ්ඩයම සොරකම්කොට ගනීද, දෙදෙනාහට පාරාජිකයවේ. **'සො තං මඤ්ඤමානො අඤ්ඤං'** යමක් සොරකම්කොට ගනුවයි කියනලද්දේ 'ඒ මෙය'යි සිතමින් එතැන්හිම තැබූ අනිකක් සොරකම්කොට ගනීද, මූලසථවූ ඇණවූවහුට ඇවැත් නැත්තේය. **'අඤ්ඤං මඤ්ඤමානො තං'** ඇණවූවහුවිසින් නිමිති හඟවා කියූභාණ්ඩය මදක් අගනේය, ඒ භාණ්ඩයාගේ සමීපයෙහි තැබූ මේ අනික් භාණ්ඩය සාරභාණ්ඩයකැයි මෙසේ අනිකක් සිතමින් ඒ භාණ්ඩයම සොරකම්කොට ගනීද දෙදෙනාහටම පාරාජිකයවේ. **'අඤ්ඤං මඤ්ඤමානො අඤ්ඤං'** පෙරකියූ නයින්ම මෙය ඒ භාණ්ඩය සමීපයෙහි තැබූ අනික් සාරභාණ්ඩයයි සලකාද, එද අනෙකක්මවේද, ඒ සොරකම්කොට ගත්තහුටම පාරාජිකයවේ. **'ඉත්ථන්නාමස්ස පාවද'** යනාදිතන්හි එකෙක් ආවායීවේ. **බුද්ධරක්ඛිත - ධම්මරක්ඛිත - සඬරක්ඛිත**යන නම්ඇති තිදෙන අතැවැසියෝයි දතයුත්තාහ. එහි **'භික්ඛු භික්ඛුං ආණාපෙති'** ආවායීී තෙමේ කිසි භාණ්ඩයක් කිසි තැනෙකැයි සලකා ඒ භාණ්ඩය

ගෙනඊමපිණිස බුද්ධරක්ඛිතහට අණවයි: **'ඉත්ථන්නාමස්ස පාවද'**යි බුද්ධරක්ඛිත! යව, තෝ මේ කාරණය ධම්මරක්ඛිතහට 'මෙනම් ඇත්තේ මෙනම් ඇත්තහුට කියාවා'යි කියව. ධම්මරක්ඛිතතෙමේද 'මෙනම් ඇත්තේ මෙනම් ඇති භාණ්ඩය අවහරණය කෙරේවා'යි සඞ්ඝරක්ඛිතහට කියාවායි මෙසේ තා විසින් අණවනලද ධම්මරක්ඛිත, ධම්මරක්ඛිත විසින්, අණවනලද සඞ්ඝරක්ඛිත තෙමේ මෙනම්ඇති භාණ්ඩය අවහරණය කෙරේවා, හෙතෙමේ මේ කම්යෙහි අප අතර වීරසභාවය ඇත්තේ ප්‍රතිබලයි කියාද, **'ආපත්ති දුක්කටස්ස'** මෙසේ අණවන්නාවූ ආචාර්‍යයාහට පළමුකොට දුක්කටයවේ. ඉදින්වනාහි ඒ අණකිරීම අදහස්කළ ලෙසින් සිදුවේද, පසුව යමකට ථුල්ලවය්‍ය කියනලද්දේද, අණකළ මොහොතෙහිම එම ථුල්ලවය්‍යවේ. නැවත ඒ භාණ්ඩය ඒකාන්තයෙන් සොරකම්කොට ගෙනයායුතුවේද, පසුව **'සඞ්ඝිකං ආපත්ති පාරාජිකස්ස'**යි යමක් කියනලද්දේද, එයින් මොහුට එකෙණෙහිම පාරාජිකයවේ. මේ යුක්තිය සියලුතන්හි දතයුතුය.

'සෝ ඉතරස්ස ආරොචෙති' බුද්ධරක්ඛිතතෙමේ ධම්මරක්ඛිතහට, ධම්මරක්ඛිතතෙමේද සඞ්ඝරක්ඛිතහට 'අපගේ ආචාර්‍යතෙමේ 'මෙනම්ඇති භාණ්ඩය සොරකම්කොට ගනුව, තෝ අපඅතර වීරපුරුෂ'යි මෙසේකියායි සැලකෙරේද, මෙසේ ඔවුන්ටද දුක්කටයවේ. **'අවහාරකෝ පතිගණ්හාති'** 'මැනව ගන්නෙමි'යි සඞ්ඝරක්ඛිතතෙමේ පිළිගනීද, **'මූලට්ඨස්ස ආපත්ති ථුල්ලවය්‍යස්ස'** සඞ්ඝරක්ඛිතවිසින පිළිගත්ඇසිල්ලෙහි ආචාර්‍යයාහට ථුල්ලවය්‍යවේ. ඔහුවිසින් මහාජනතෙමේ පාපයෙහි යොදනලද්දේය. මෙහි 'මහාජනෝ'යනු බුද්ධරක්ඛිත - ධම්මරක්ඛිත - සඞ්ඝරක්ඛිතයන් සඳහා කියනලද්දේය. **'සෝ තං භාණ්ඩං'** ඒ සඞ්ඝරක්ඛිතතෙමේ ඒ භාණ්ඩය සොරාගනීද, සියලු සිවුදෙනාහටම පාරාජිකයවේ. හුදෙක් සිවුදෙනාහටම පාරාජිකයනොවේ. මේ උපායෙහි විසඬෙකතය නොකොට පරම්පරාවෙන් අණවන්නාවූ ශ්‍රමණයන් සියයක්වේවා, ශ්‍රමණයන් දහසක්වේවා, සියල්ලන්හටම පාරාජිකයවේ.

දුතිය වාරයෙහි - **'සෝ අඤ්ඤං ආණාපෙති'** ආචාර්‍යයාවිසින් අණවනලද ඒ බුද්ධරක්ඛිත තෙමේ ධම්මරක්ඛිත නො දක හෝ නො කියනු කැමැතිව හෝ සඞ්ඝරක්ඛිතයන් කරා ම එළැඹ අපගේ ආචාර්‍යතෙමේ මෙසේ කීයේය: 'මෙනම්ඇති භාණ්ඩය සොරාගනුව'යි අණකරවාද, **'ආපත්ති දුක්කටස්ස'** ඇණවීම හෙතුකොට පළමුව බුද්ධරක්ඛිතහට දුක්කටයවේ. **'පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස'** සඞ්ඝරක්ඛිතවිසින් පිළිගත්කල්හි මූලස්ථයාහටම දුක්කටයයි දතයුතුය. ඉදින් මෙතෙමේ ඒ භාණ්ඩය සොරකම්කෙරේද, ඇණවූ බුද්ධරක්ඛිතහට ද

සොරාගත් සඞ්ඝරක්ඛිතහටද යනදෙදෙනාහටම පාරාජිකයවේ. මූලසථවූ ආචාය්‍යාහට නියමය වෙනස්වූබැවින් පාරාජිකයෙන් ඇවැත්නොවේ. ධම්මරක්ඛිතහට නොදන්නාබැවින් මුළුමනින් ඇවැත්නොවේ. බුද්ධරක්ඛිතතෙමේ දෙදෙනාහට සොරථිභාවයකොට තෙමේ නැසුනේය.

මෙයින් මතු සිවුවැදරුම්වූ ආණත්තිවාරයන්හි ප්‍රථමවාරයෙහි පළමු කොට **'සො ගන්ත්වා පුන පච්චාගච්ඡති'** බඩු තිබෙනතැනට ගොස් ඇතුළත හා පිටතකළ ආරක්ෂා දක සොරකම්කොට ගන්නට නොහැකිවනුයේ පෙරළා ඒද, **'යදි සක්කොසි තදා'** 'අදම ගන්නාලද්දේ කුමක්වේද, යව, යම්කලෙක හැක්කේවෙහිද, එකල්හි ඒ භාණ්ඩය සොරකම්කොට ගණුව'යි. **'ආපත්ති දුක්කටස්ස'** මෙසේ නැවත ඇණවීම හෙතුකොටද දුක්කටයමවේ. ඉදින් ඒ භාණ්ඩය අවශ්‍යයෙන් ගතහැකිවේද, අත්ථසාධකචෙතනා නම්මාඝීයට අනතුරුවලබන ඵලය සමානවන්නීද, එහෙයින් මෙතෙමේ ඇණවූ කෙණෙහිම පාරාජිකවේ. ඉදිනුදු අවහාරකතෙමේ සැටඅවුරුද්දක් ඉක්ම ගියපසු ඒ භාණ්ඩය සොරකම්කෙරේද ඇණවූ තැනැත්තේද අතරදීම කලුරිය හෝ කෙරේද, ගිහිබවට හෝ පෙරළේද, අශ්‍රමණයෙක්වම කලුරිය හෝ කරන්නේද, ගිහිබවට හෝ පෙරළෙන්නේද අවහාරකයාහට භාණ්ඩය සොරාගත් කෙණෙහිම පාරාජිකයවේ.

දුතියවාරයෙහි - යම්හෙයකින් ඔහුට වහාකියන්නේ හෝ ඔහුගේ බිහිරිබව හෙතුකොට හෝ 'සොරා නොගණුව' යන මේ වචනය නොඅස්වාද, මූලසථවූ ආණාපකතෙමේ පාරාජිකයෙන් නොමිදුනේය.

තෘතියවාරයෙහිවනාහි, අස්වනලදබැවින් පාරාජිකයෙන් මිදුනේය.

චතුත්ථවාරයෙහි, ඔහුවිසින් අස්වනලදබැවින්ද අන්‍යයාවිසිනුදු 'යහපතැ'යි පිළිගෙණ වැළකුණුබැවින්ද දෙදෙනම මිදුනාහ.

ආණත්තිකථා නිමි.

—\\—

දැන් ඒ ඒ තන්හි ඨානාවාවනවසයෙන් කියනලද අදින්නාදනය පිළිබඳ අඞ්ගයන්ගේ හා වස්තූන්ගේ භෙදයෙන්ද ආපත්තිභෙදය දක්වනසේක් **'පඤ්චහාකාරෙහි'**යනාදිය වදළසේක. එහි **'පඤ්චහි ආකාරෙහි'**යනු පස්කරුණකින්ය. පස්අහකින්යි වදරණුලද්දේවේ. මේ එහි සඞ්ඛෙපපාඨියවේ: වත්‍ථුස්වාමියාවිසින් තුන්දෙරින් කිසිත්අයුරකින් නොදුන්දෙය ගන්නහුට. **'පරපරිග්ගහිතඤ්ච හොති'** යනාදි නයින් කියනලද

පස්අයුරින් පාරාජිකයවේ. එයින් අඩුවෙන් පාරාජිකය නොවේ. අන්හු සතුබව, අන්හු සතුයයි හැඟීම, පිරිකරෙහි ගරුබව, සොරසිත, තුබූතැනින් පහකිරීම යන එහි පස් ආකාරයෝයි. මෙයින් අන්‍යවූ දෙවරින් ලඝුපරිඡ්ඡාරයෙහි වස්තුභෙදයෙන් ථුල්ලච්චයද දුක්කටයද දක්වනලදී. **'ඡහාකාරෙහි'**යනාදිනයින් කියනලද වාරතුනෙහි තමාගේය යනහැඟීම නැතිබව, විශ්වාසයෙන් ගැනීම නැතිබව, තව්කැලි නොවනබව්, පිරිකරෙහි ගරුබව, සොරසිත, තුබූ තැනින් පහකිරීමයි සයයුර මෙසේ දතයුතුය. සොරාගන්නා වස්තූන්ගේ ගරුක - ලඝුක භෙදයෙන් මෙහිද ප්‍රථමවාරයෙහි පාරාජිකයවේ. දවිතීය තෘතීය වාරයන්හි ථුල්ලච්චය - දුක්කටයෝ වදරණලද්දහුය. එයින් අන්‍යවූ තුන්වාරයෙහි වස්තූන්ගේ භෙදය ඇතිකල්හිද වස්තුව තබා අන්හුවිසින් අපරිගෘහිතබැවින් දුක්කටයම වදරණලදී. එහි යම් මේ **'න ච පරපරිග්ගහිතං'**යනු වදරණලද්දේද, එය අපරිගෘහිතයක් හෝ වේවා, ප්‍රයෝජන රහිතබැවින් හැරදමනලද, ආලය සුන්බැවින් සුන්මුල්ඇති අඤ්ඡාමික වස්තුවක් හෝ වේවා, තමන් සතුවූවක් හෝ වේවා, ඒ අඤ්ඡාමිකය හා ආතමසන්තකය යනදෙකම අනුන් සතුමයයි ගිනීමට නොයන්නේය. යම්හෙයකින්වනාහි මෙහි අනුන් සතුය, යන හැඟීම ඇත්තේද, සොරසිතින් ගන්නාලද්දේද, එහෙයින් ඇවැත් නොවේයයි නොවදරණලද්දේය. මෙසේ වස්තුවශයෙන්ද චිත්තවශයෙන්ද ආපත්තිභෙදය වදරා දන් අනාපත්තිය දක්වනසේක් **'අනාපත්ති සසඤ්ඤිස්ස'** යනාදිය වදළසේක. එහි **'සසඤ්ඤිස්ස'**යනු සකසංඥා ඇත්තහුට. 'මේ භාණ්ඩය මාසතුය'යි මෙසේ තමාගේය යනහැඟීම් ඇතිව අන්සතු භාණ්ඩයක් ගන්නහුට ගැනීම නිමිතිකොට ඇවැත්නොවේ. ගන්නාලද්දවනාහි දියයුතුය. ඉදින් හිමියන්විසින් 'දෙව'යි කියනලද්දේ, නොදේනම් ඔවුන්ගේ ධුරනිඃක්ෂෙපය නිමිතිකොට පාරාජිකයවේ. **'විස්සාසගාහෙ'** විශ්වාසයෙන් ගැනීමෙහිද ඇවැත්නොවේ. විශ්වාසයෙන් ගැනීමෙහි ලක්ෂණ **'අනුජානාමි භික්ඛවෙ පඤ්චහඩෙහි සමන්නාගතස්ස විස්සාසං ගහෙතුං, සන්දිට්ඨො ච හොති සම්භත්තො ච ආලපිතො ච ජීවති ච ගහිතෙ ච අත්තමනෝ'**යන මේ සූත්‍රයෙන් දතයුතුය. එහි **'සන්දිට්ඨො'** දුටුපමණින් මිත්‍රවූයේය. **'සම්භත්තො'** දැඩි මිත්‍රතෙමේය. **'ආලපිතො'** 'මාසතු යමක් කැමැත්තෙහිද, එය ගනුව'යි විචාරා ගැනීමෙහි කාරණයක් නැත්තේයයි කියනලද්දේය. **'ජීවති'** නොනැගී සිටි සෙය්‍යාවෙන් සයනය කරණලද්දේද, යම්තාක් ජීවිතෙන්ද්‍රිය සිදීමට නොපැමිණේද, ඒතාක් සිටියේය. **'ගහිතෙ ච අත්තමනෝ'** ගත්කල්හි තුටු සිත් ඇත්තේවේද, එබඳුවූවහුගේ සන්තකය මා ගත්කල්හි තුටුසිත් ඇත්තේ වන්නේයයි දන්නාහුවිසින් ගැනීම වටියි. ඉතිරිනොකොට සියල්ල ගැනීම්වසයෙන්ද මේ අඩගපස වදාරණලද්දේය. විශ්වාසයෙන් ගැනීම කරුණුතුණකින් රුහණයවේ. සන්දිට්ඨමිත්‍රයෙක්වේද,

ජීවත්වේද, ගත්කල්හි සතුටුවේද, සමඟකෑමිත්‍රයෙක්වේද, ජීවත්වේද, ගත්කල්හි සතුටුවේද, ආලපිතමිත්‍රයෙක්වේද, ජීවත්වේද, ගත්කල්හි සතුටුවේද යන මේකරුණුතුණය. යමෙක්වනාහි ජීවත්වේද, ගත්කල්හි සතුටුවූයේ නොවේද, ඔහු සතුවූවක් විඤ්ඤාසග්‍රහණයෙන් ගන්නාලද්දේද නැවත දියයුතුය. දෙන්නහුවිසින්ද මළහුගේ ධනයවනාහි ඔහුගේ ධනයෙහි ගෘහස්ථවූ හෝ ප්‍රව්‍රජිතවූ හෝ යම්කෙනෙක් අධිපතිවෙත්ද ඔවුන්ට දියයුතුය. නොසතුටු සිත්ඇත්තහු සතුධනය ඔහුටම දියයුතුය. යමෙක්වනාහි පළමුකොටම 'මා සන්තකය ගන්නාවූ තාවිසින් කරණුලද්දේ යහපතැ'යි වාග්ඡෝදයෙන් හෝ චිත්තෝත්පාදමාත්‍රයකින් හෝ අනුමෝදන්ව පසුව කිසිකරුණක් හෙතුකොට කිපියේ පෙරළා ගෙන්වන්නට නොලබන්නේය. යමෙක් නොදෙනු කැමැත්තේ සිතින් ඉවසාද, කිසිවක් නොකියාද, ඔහුද නැවත ගෙන්වීම නොලබයි. යමෙක්වනාහි 'මාවිසින් නොපගේ සන්තකය ගන්නාලද්දේයයි හෝ පරිභොගකරනලද්දේයයි හෝ කියූකල්හි ගන්නාලද්දේ හෝ වේවා, පරිභොග කරනලද්දේ හෝ වේවා, මාවිසින් එය කිසි කටයුත්තක් හෙතුකොට තබනලද්දේය, එය ප්‍රකෘතිමත් කරන්නට වටීය'යි කියාද, මෙතෙමේ පෙරළා ගෙන්වීමලබයි.

'තාවකාලිකෙ' නැවත දෙන්නෙමි, නැවත කරන්නෙමියි මෙසේ ගන්නහුට තාවකාලිකය ගැණීමෙහිද ඇවැත්නැත්තේය. ඉදින්ගන්නාලද්දවනාහි භාණ්ඩඝාමිවූ පුදගලයෙක් හෝ ගණුයෙක් හෝ මෙය තටම වේවායි අනුදනීනම් මෙසේ මේ අනුදනීම මැනවි, ඉදින් නොඅනුදනීනම් ගෙන්වනකල්හි දියයුතුය. සඞ්ඝසන්තකයවනාහි පෙරළාදීමම වටීයි. **'පෙතපරිග්ගහෙ'** මෙහිවනාහි ප්‍රෙතවිෂයයෙහි උපදින්නාහුද කාලක්‍රියාකොට එම ආත්මභාවයෙහිම උපන්නාහුද වාතුම්භාරාජිකාදී වූ සියලුදෙවියෝද ප්‍රෙතයෝමයි ගිනීමට ගියාහුය. ඔවුන් අයත් භාණ්ඩයෙහි අනාපත්තිවේ. ඉදින්වනාහි සක්දෙවිරජතෙමේ අවන්හලක් විවෘතකොට හුන්නේවේද, දිවැස්ඇති මහණෙක්තෙමේ එය දැන තමන්ට සිවුරුපිණිස සියදහසක් අගනාසළුවක් ඔහු 'නොගණුව, නොගණුව'යි මොරගා කියනකල්හිත් ගෙනයේද වටියි. දෙවතාවක උදෙසා බිලියම් කරන්නන්විසින් ගස්, වැල්ආදියෙහි එල්ලාතැබූ සළුවෙහි කියයුත්තක් නැත්තේමය.

'තිරච්ඡානගතපරිග්ගහෙ' තිරිසන්ගියවුනට අයත් දෑයෙහි අනාපත්තිවේ. ඉදිනුදු නාරජෙක් හෝ ගරුඩමාණවකයෙක් හෝ මිනිස්වෙසින් සිට අවන්හලක් විවෘතකෙරේද, එතැනින්ද කිසි මහණෙක්තෙමේ මොහු අයත්වූවක් පෙර කියුලෙසින්ම ගෙනයේනම් වරද

නොවේ. සිංහයෙක් හෝ ව්‍යාඝ්‍රයෙක් හෝ මුව, මී, ගොන්ආදීන් නසාකන්නේ බඩගින්නෙන් පෙළුනේ පළමුකොටම නොවැළක්විය යුතුය. යම්හෙයකින් නපුරක් කෙරේද එහෙයිනි. ඉදින්වනාහි මදක් කෑ වළකන්නට හැක්කේද, වළක්වාගැනීම වටියි. සුනඛආදීන්ද ආමිෂයක් ගෙන යනකල්හි හෙළවාගැනීම වටියි. **'පංසුකූල සඤ්ඤිස්ස'** 'මේ පාංශුකූලය අස්වාමිකය'යි මෙසේ හැඟීම්ඇත්තහුටද ගැනීමෙහි අනාපත්තිවේ. ඉදින් එය සස්වාමිකවේනම් ගෙන්වනකල්හි දියයුතුය. **'උම්මත්තකස්ස'** පෙර කියූඅයුරු ඇති උමතුවූවහුටද අනාපත්තිවේ. **'ආදිකම්මිකස්ස'** මෙහි ධනිය සථවිරතෙමේ ආදිකර්මිකවේ. ඔහුට ඇවැත්නොවේ. සෙසු රජක භණ්ඩිකාදිය සොරකම්කළ සවගමහණ්ආදීන්ට ඇවැත්මය.

පදභාජනීයවණ්ණනා නිමි.

—\\—

'සමුට්ඨානසීසං කිරියා - අථෝ සඤ්ඤා සචිත්තකං,
ලොකවජ්ජඤ්ච කම්මඤ්ච - කුසලං වේදනාය චාති'

මේ මිශ්‍රකතයෙහි මේ ශික්ෂාපදය ත්‍රිසමුත්ථානිකය. සාහත්ථික ප්‍රයොගයෙන් නිපන්නේය. කයින්ද සිතින්ද හටගණියි. ආණත්තිකයෙන් නිපන්නේය. වචනයෙන්ද සිතින්ද හටගනියි. සාහත්ථික ආණත්තිකයෙන් නිපන්නේය. කයින්ද වචනයෙන්ද සිතින්ද හටගනියි. ක්‍රියාසමුත්ථානදවේ. කරන්නේම මේ ඇවැතට පැමිණේ. නොකරන්නේ මේ ඇවැතට නොපැමිණේ. 'නොදුන් දෙය ගනිමි'යි යනසංඥවගේ අභාවයෙන් මිදෙනබැවින් සංඥවිමොක්ෂවේ. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. තුටුවූයේ හෝ බියවූයේ හෝ මැදහත්වූයේ හෝ එයට පැමිණේයයි ත්‍රිවේදනවේ. සියල්ල ප්‍රථම ශික්ෂාපදයෙහි කියූනයින්ම දතයුතුය.

විනීතවත්‍ථුකථාඅතුරෙහි - **ෂට්වර්ගිකවත්‍ථුව** අනුප්‍රඥප්තියෙහි කියනලද්දේමය. ද්වීතියවත්‍ථුවෙහි - පෘථග්ජනයන්ගේ සිතවනාහි රාගාදීන්ගේවසයෙන් පියවීගතිය හැරපියා දුවයි. තදින් දුවයි. නොයෙක් අයුරින් දුවයි. ඉදින්භාග්‍යවතුන්වහන්සේ කායවිඤ්ඤාර හෙදය හැරද චිත්තෝත්පාදමාත්‍රයෙන් ඇවැත් පණවනසේක්නම්, කවරෙක් තමන් අනාපත්තියෙකු කරන්නට සමර්ථවන්නේද එහෙයින් **'අනාපත්ති භික්ඛු චිත්තුප්පාදේ'**යනු වදළසේක. සිතට වසභවූවකු නොවියයුතුය. මේ චිත්තෝත්පාදයෙහි ආදීනව ප්‍රත්‍යවෙක්ෂාබලයෙන් සිත වළකාගතයුතුමය.

ආමසන - එකුපන - ඨානාවාවනවසතු ප්‍රකට අර්ථඇත්තේමය. එයින් අන්‍යවූවෝද **'ථෙය්‍යචිත්තෝ භූමිතෝ අඝඝහෙසි'**යන වසතු කෙළවරකොට ඇත්තාහුය. නිරුක්තිපථවසතුවෙහි - **'ආදියි'**යනු ගත්තේය. 'තෝ සොරෙහි'යි පැහසීය. අන්‍යයාවනාහි 'කවරක්හු විසින් ගන්නාලදදැ'යි විචාළකල්හි 'මා විසින් සොරාගන්නා ලද්දේය'යි පිළිවිසීමට සහාගවසයෙන් ප්‍රතිඥදුන්නේය. ඉදින් අන්‍යයා විසින් 'කවරෙකු විසින් සොරාගන්නාලදද, කවරකු විසින් බැහැර කරනලදද, කවරකු විසින් තබනලදදැ'යි කියනලද්දේවන්නේනම්, නැවත මෙතෙමේද 'මා විසින් ගන්නාලදය, බැහැර කරනලදය, තබනලදැ'යි හෝ කියන්නේය. මුඛයවනාහි අනුභවය පිණිසත් කථා කරනුපිණිසත් කරනලද්දේය. සොරසිත හැර අවහාරයක් නැත්තේය. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ **'අනාපත්ති භික්ඛු නිරුත්තිපථෙ'**යනු වදළසේක. ව්‍යවහාරවචන මාත්‍රයෙහි ඇවැත් නොවේය යනඅර්ථයි.

එයින් අන්‍යවූ වෙඨනවසතුව කෙළවර කොට ඇති සියලු වසතු කියනලද අර්ථ ඇත්තේමය. අභින්නසරීර වසතුවෙහි - **'අධිවත්ථෙථා'**යනු සළුවකෙරෙහි කළ තෘෂ්ණාව හෙතුකොට එම සිරුරෙහිම උපන්නේය. **'අනාදියන්තො'** ඒ ප්‍රෙතයාගේ වචනය නොගන්නේ ආදරය හෝ නොකරන්නේ. **'තං සරීරං උට්ඨහිත්වා'** ප්‍රෙතතෙමේ තමන්ගේ ආනුභාවයෙන් ඒ ශරීරය නැගුටුවාලූයේය. **'තං සරීරං උට්ඨහිත්වා'**යනු එහෙයින් වදරණලද්දේය. **'ඛාරං ඨකෙසි'** මහණහුගේ විහාරය සොහොන සමීපයෙහිම. වූයේද එහෙයින් බියසුලු සැහැවි ඇතිමහණතෙමේ වහාම එහි පිවිස දෙර වැසුයේය. **'තත්ථෙව පරිපවී'** දෙර වැසූකල්හි ප්‍රෙතතෙමේ සළුවෙහි ආලය රහිතව ඒ මළසිරුර හැරපියා කම්වූපරිදි ගියේය. එහෙයින් ඒ ශරීරය එහිම වැටුනේය. වැටෙනලදැයි කියනලද්දේවේ.

'අභින්නෙ සරීරෙ' ඉතා උණුසුම්වූතෙත් සිරුරෙහි පාංශුකූලය නොගත යුතුය. ගන්නහුට මෙබඳුවූ උවදුරුවේ. දුක්කටයටද පැමිණේ. සිරුර බිඳීගියකල්හි ගැනීම වටියි. කොපමණකින් බිඳුනේවේදයත්ඃ කවුඩු උකුසු බලු හිවල්ආදීන්විසින් මුවතුඩින් හෝ දළින් හෝ මදක් පැළූ පමණින්ද බිඳුනේවේ. ඒ මත යමක්හුගේ වැටීමෙන්වූ ගැටීමෙන් සිවිය පමණකුත් සිදුනේවේද, සම නොසිදුනේවේද, මෙය නොබිඳුනේමවේ. සම සිඳීගියකල්හි බිඳුනේවේ. යමක්හුගේ දිවිසහිත කාලයෙහිම බිඳුනු ගණ්ඩ කුෂ්ඨ පිළිකාවෝ හෝ වෙයිද, වණයක් හෝ වේද, මේ සිරුරද බිඳුනේවේ. සිරුර තෙවනදින පටන් ඉදිමීම් ආදියට පැමිණීමෙන් කුණුපබවට පැමිණියේවේද, බිඳුනේමවේ. මුඑමනින් නොබිඳුනුකල්හිද සොහොන්ගොවිවන් ලවා හෝ අන් මිනිසුන්ලවා හෝ ගැන්වීම සුදුසුවේ. ඒ පිණිස අනිකෙකු

නොලබානම්, සැතකින් හෝ අන්කිසිවකින් හෝ වණයක්කොට ගතයුතුය. විසභාග සරීරයෙහිවනාහි සිහිඑළවා ශ්‍රමණසංඥව උපදවා හිසෙහි හෝ අත්පා පිටෙහි හෝ වණයක් කොටගැනීම වටියි.

එයට අනතුරු වසතුවෙහි - **'කුසං සඩ්කාමෙත්වා චීවරං අග්ඝාහෙසි'** පෙර 'ආදියෙය්‍ය' යන මේ පදයාගේ අත්ථවිඤ්ඤාවෙහි නාමමාත්‍රයෙන් දක්වනලද ථෙය්‍යාවහාර - පසය්හාවහාර - පරිකප්පාවහාර - පටිච්ඡන්නාවහාර - කුසාවහාර යන මේ අතුරෙහි කුසාවහාරයෙන් සොරකම් කෙළේය යනඅර්ථයි. මේ අවහාරයන්ගේ වෙනසවනාහි මෙසේ දතයුතුය. යම් කිසිවෙක් සඤ්චාමිකභාණ්ඩයක් රාත්‍රිකාලයෙහි හෝ දවල්කාලයෙහි හෝ ගෘහසන්ධිසිදීම් ආදියකොට නොපෙණෙනුයේ සොරාගනීද කුටමාන කුටකභාපණාදියෙන් හෝ වඤ්චාකොට රවටාගනීද, මෙසේ ගන්නාවූ ඔහුගේ අවහාරය **ථෙය්‍යාවහාරය**යි දතයුතුය. යම් මහණෙක්තෙමේ පරහුමැඩ බලාත්කාරයෙන් යටපත්කොට, නොහොත් තැතිගන්වා භයදක්වා ඔවුන්සතු භාණ්ඩය ගනීද, මංපැහැරීම් ගම්පැහැරීම්ආදිය කරමින් රාජ්‍යය පතමින්සිටින ප්‍රකට සොරුන්මෙන්ද, ක්‍රොධවශයෙන් අන්හුඅයත් ගෘහය නැසීමකරමින් තමන්ට ලැබුනු බලියට වඩා වැඩියක් බලත්කාරයෙන් ගන්නාවූ රාජරාජමහාමාත්‍යාදීන් මෙන් ගනීද, මෙසේ ගන්නාවූ ඔහුගේ අවහාරය **පසය්හාවහාරය**යි දතයුතුය.

කල්පනාකොට බලාගන්නහුගේ අවහාරයට **පරිකප්පාවහාරය**යි කියනුලැබේ. ඒ අවහාරය භණ්ඩපරිකප්ප - ඔකාසපරිකප්පවසයෙන් දෙවැදරුම්වේ. එහි මේ භණ්ඩපරිකප්පයයි: මෙහි ඇතැම්එකෙක් සළුවෙන් ප්‍රයොජනඇත්තේ ගැබතුළට පිවිස 'ඉදින් සළුවක්වන්නේනම් ගන්නෙමි, හූ නම් නොගන්නෙමි'යි කල්පනාකොට අදුරෙහි පසුම්බියක් ගනීද, එහි සළුවක්වේද නගාගැනීමෙහිදීම පාරාජිකයවේ. හූයක්වීනම් රකියි. පිටතට ගෙනගොස් පසුම්බිය ඇරබලා හූය යි දැන නැවත තුබූතැනම තබාද රකීමය. හූය යි දැනද යමක් ලද්දේද, එය ගතයුතුයයියේද, පියවරින් කරවියයුතුය. බිම තබාගනීද නගාගැනීමෙහිදී පාරාජිකයවේ. 'සොරෙක සොරෙකැ'යි හිමියන් විසින් ලුහුබඳිනලද්දේ හැරපියා පලායේද රකියි. හිමියෝ හැරදැමූ එය දැක ගනිත්තම් මැනවි. අන්කිසිවෙක් ගනීනම් භණ්ඩදෙය්‍යවේ. නැවත හිමියන් ගමන් නවතාලූකල්හි තෙමේම එය දැක 'පළමුකොටම මා විසින් ඒ භාණ්ඩය ගෙනඑනලද්දේය. දැන් මාසතුයයි ගනීද රකියි. භණ්ඩදෙය්‍යවේ. 'ඉදින් හූයක් වන්නේනම්, ගන්නෙමි, සළුවක් වන්නේනම්, නොගන්නෙමි, ඉදින් ගිතෙල් වන්නේනම්, ගන්නෙමි, තෙල් වන්නේනම් නොගන්නෙමි'යි මේආදිනයින් කල්පනාකොට ගන්නහුටද මේ නයමවේ. **මහාපච්චරි** ආදියෙහිවනාහි සළුවෙන් ප්‍රයොජන ඇත්තේද

සළුපසුම්බියම ගෙන නික්මුණේ පිටතසිට පසුම්බිය ඇරබලා 'මෙය සළුවකැ'යි දැක යන්නේ පියවරින්ම කරවියයුතුයයි කියනලද්දේය. මෙහි 'සළුවක් වන්නේනම් ගන්නෙමි'යි කලපනාකළබැවින් පරිකලපය දක්නාලැබේ. දැක ගෙන ගියබැවින් පරිකප්පාවහාරය නොදක්නාලැබේ. **මහාඅට්ඨකථා**වෙහිවනාහි යමක්ගැන කලපනාකරනලදද, එය නොදක්නාලද්දේද, පරිකලිතහාවයෙහිම සිටියක්ම නගාගන්නහුට අවහාරය කියනලද්දේය. එහෙයින් එහි පරිකප්පාවහාරය දක්නාලැබේ. **'තං මඤ්ඤමානෝ තං අවහරි'**යන පාළි හාද සමවේ. එහි සළුවක් වන්නේනම්, ගන්නෙමියි මේආදිනයින් පැවති යම් මේ පරිකලපයක්වේද, මෙය හණ්ඩපරිකප්පනම්වේ.

ඔකාසපරිකප්පයවනාහි මෙසේ දතයුතුය: මෙහි ඇතැම් ලොල් මහණෙක් අන්‍යයන්ගේ පිරිවෙණකට හෝ කුලගෙයකට හෝ වනයෙහි කම්හලකට හෝ පිවිස එහි කථාසලලාපයෙහි යෙදීහුන්නේම ලෝහකටයුතුවූ කිසිපිරිකරක් දෙසබලයි. බලන්නේද අක්දෙරිය යටපහ පිරිවෙන් දෙර කොටු රුක්මුල් ආදීන්ගේවසයෙන් පිරිසිදීමකොට 'ඉදින් කිසිකෙනෙක් මේ අතරදී මා දකින්නාහුනම්, දකිනු කැමතිබැවින් ගෙන හැසිරෙන්නෙකු මෙන් මොවුන්ටම දෙන්නෙමි. ඉකින් නොදකින්නාහුනම් ගෙනයන්නෙමියි කලපනාකරයි. ඒ ඒ හාණ්ඩය ගෙන කලපනාකොට පිරිසිදගත් තැන ඉක්මුනු ඇසිල්ලෙහි ඔහුට පාරාජිකයවේ. ඉදින් උපචාරසීමාව ගැන කලපනාකෙරේද, එයට අභිමුඛව යන්නේ කමටහන්ආදිය මෙනෙහිකරමින් හෝ අන්තැන යැවූ සිත්ඇතිව හෝ නොසිහියෙන් උපචාරසීමාව ඉක්මවානම් හණ්ඩදෙය්‍යවේ. තවද මොහු එතැනට පැමිණිකල්හි සොරෙක් හෝ ඇතෙක් හෝ වණ්ඩමෘගයෙක් හෝ මහාමෙඝයක් හෝ නගීද, ඔහුද ඒ උවදුරෙන් මිදෙනු කැමතිබැවින් වහා එතැන ඉක්මවාද, හණ්ඩදෙය්‍යමවේ. මෙහි ඇතැම් ආචාය්‍යවරයෝ යම්හෙයකින් මුලදීම සොරසිතින් ගන්නාලද්දේද, එහෙයින් නොරකියි. අවහාරයම වේයයි කියත්. මේවනාහි **මහාඅට්ඨකථානය**වේ. **මහාපච්චරියෙහි**වනාහි ඉදිනුදු යමෙක් පිරිසිද ගත්තැන ඇතුළතදී ඇතෙකුපිට හෝ අසෙකුපිට හෝ නොම යවාද, පිරිසිදගත් තැන ඉක්මගියකල්හිද පාරාජිකයක් නැත්තේය. හණ්ඩදෙය්‍යම වේය'යි කියනලදී. එහි 'මේ අතරදී මා දකින්නාහුද, දකිනු කැමතිබැවින් ගෙන හැසිරෙන්නෙකු මෙන් මොවුන්ටම දෙන්නෙමි'යි පැවති යම් මේ පරිකලපයක්වේද, මෙය ඔකාසපරිකප්පනම්වේ. මෙසේ මේ දෙවැදරුම්වූ පරිකලපයන්ගේවසයෙන් කල්පනාකොට සලකාගෙන ගන්නහුගේ අවහාරය **පරිකප්පාවහාරය**යි දතයුතුය.

වසා තබාගැනීමවනාහි **පටිවජ්ජනාවහාර** නම්වේ. ඒ පටිවජ්ජනාවහාරය මෙසේ දතයුතුය. යම් මහණෙක් උයන් ආදියෙහි කෙළින්නාවූ හෝ එහි හිඳ වළඳන්නාවූ හෝ මිනිසුන්ගේ ගලවා තැබූ ඇහිලිමුදු ආදී අලඞ්කාර භාණ්ඩයක්දක 'ඉදින් මම මෙය නැමී ගන්නෙමිනම්, මහණතෙමේ කුමක් ගනීද'යි ඔවුහු මා හැඳින වෙහෙසන්නාහයි සිතා පසින් හෝ කොළපතින් හෝ 'පසුව ගන්නෙමි'යි වසාතබාද, ඔහුට මෙපමණකින් නගාගැනීමක් නැත්තේය'යි ඒතාක් අවහාරයක් නොවේ. යම් කලෙකවනාහි ඒ මිනිස්සු ගමතුළට වදිනුකැමැත්තාහු ඒ භාණ්ඩය සොයන්නාහුද නොදක 'දැන් ඇදිරිවූයේය, හෙට දැනගන්නමෝයයි ආලය සහිතවම ගියාහු වෙත්ද, එකල්හි ඒ භාණ්ඩය නගාගන්නාවූ මේ මහණහුට නගාගැනීම නිමිතිකොට පාරාජිකයවේ. වසාදමූ කාලයෙහිම 'ඒ භාණ්ඩය මා සතුය'යි සඤ්ඤායන සංඥවෙන් හෝ 'ඒ මිනිස්සු දැන් ගියහ, මේ භාණ්ඩය හැරදමන ලද්දේය'යි පාංශුකූල සංඥවෙන් හෝ ගන්නහුට භණ්ඩදෙය්‍යවේ. ඔවුන් දෙවනදිනයෙහි අවුත් සොයා නොදක ධුරනිඃක්ෂෙපයකොට ගියකල්හි ගන්නාලද්දේද භණ්ඩදෙය්‍යමවේ. කුමක්හෙයින්දයත්: යම්හෙයකින් ඔහුගේ ප්‍රයොගය හෙතුකොට ඒ මිනිසුන් විසින් භාණ්ඩය නොදක්නා ලද්දේද එහෙයිනි. යම් මහණෙක් එබඳුවූ භාණ්ඩයක් දක තැබූතැන තුබූ භාණ්ඩය නොවසා සොරසිත් ඇත්තේ පයින් පාගාමඩෙහි හෝ වැල්ලෙහි හෝ ඇතුල්කෙරේද, ඇතුල්කළ ඇසිල්ලෙහිම ඔහුට පාරාජිකයවේ.

කුසපත තුබූතැනින් පහකොට ගැනීමවනාහි **කුසාවහාරය**යි කියනුලැබේ. ඒ කුසාවහාරයද මෙසේ දතයුතුය: යම් මහණෙක් වැහැරියෙන් හෝ තල්පතින් හෝ කළ යම්කිසි කුසපතක් හෙලා සිවුරු බෙදනකල්හි තමන්ගේ කොටස සමීපයෙහි තුබූ ඉතාමද මිලක් අගනාවූ හෝ ඉතාමහත් මිලක් අගනාවූ හෝ ඇඟිමෙන් සමසමවූ හෝ අන්හුඅයත් කොටසක් ගනුකැමැත්තේ තමන්ගේ කොටසෙහි වැටුනු කුසදණ්ඩ අන්හු අයත්කොටසෙහි හෙලනු කැමැතිව නගා ගනීද, ඒතාක් රකියි. අන්හුඅයත් කොටසෙහි හෙළාද රකීමය. යම්කලෙක එය වැටුනුකල්හි අන්හුඅයත් කොටසින් අන්හුඅයත් කුසදණ්ඩ උදුරාගනීද, උදුරාගත් ඇසිල්ලෙහි පාරාජිකයවේ. ඉදින් ඉතා පළමුකොට තමන්ගේ කොටසෙහි හෙළනුකැමතිබැවින් අන්හු අයත්කොටසින් කුසදණ්ඩ උදුරාගනීද, උදුරා ගැනීමෙහිදී රකියි. හෙළීමෙහිදී රකියි. තමන්ගේ කොටසින් තමන්ගේ කුසදණ්ඩ උදුරාගනීද, උදුරා ගැනීමෙහිදීම රකියි. ඒ කුසදණ්ඩ උදුරාගෙන අන්හු අයත් කොටසෙහි හෙළන්නහුට අතින් මිදුනුඇසිල්ලෙහි පාරාජිකයවේ. ඉදින්වනාහි දෙකොටසෙහිම වැටුනු කුසදඬු නොදක්මට

පමුණුවාද, ඉන්පසු සෙසු භික්ෂූන් ගියකල්හි අනික්තැනැත්තේ 'සඞ්ඝමිනි! මාගේ කුසදණ්ඩ නොපෙණේ, ඇවැත! මාගේ කුසදණ්ඩද නොපෙණේ, සඞ්ඝමිනි! මාගේ කොටස කවරේදැ'යි විචාරකල්හි 'මේ තාගේ කොටසැ'යි තමන්ගේ කොටස දක්වාද, ඔහු විවාදකොට හෝ විවාදනොකොට හෝ ඒ කොටස ගෙනගියකල්හි අනික් තැනැත්තේ ඔහුගේ කොටස උදුරාගනීද, උදුරාගැනීම නිමිතිකොට පාරාජිකයවේ. ඉදිනුදු ඔහුවිසින් 'මම මාගේ කොටස තට නොදෙමි, තෝ තමන්ගේ කොටස දැන ගනුව'යි කියුකල්හිද, 'මේ කොටස මාගේ නොවේය'යි දන්නේ ඔහුගේම කොටස ගණිද, උදුරා ගැනීම නිමිතිකොට පාරාජිකයවේ. ඉදින් අනික් තැනැත්තේ 'මේ තාගේ කොටසය, මේ මාගේ කොටසය' යි යන මේ විවාදයෙන් කිමැයි සිතා 'මට හෝ පැමිණියේවේවා, තට හෝ පැමිණියේවේවා, යම් උතුම් කොටසක්වේද, ඒ කොටස ඔබවහන්සේ ගනිවු'යි කියාද, එකල්හි දුන්දෙය ගන්නාලද්දේනම්වේ. මෙහි අවහාරයක් නැත්තේය. ඉදිනුදු විවාදයට බියවූ ඒ මහණතෙමේ 'තට යමක් රුස්නේද, එය ගනුව'යි කියනලද්දේ තමන්ට පැමිණි උතුම්කොටස තබා ලාමකවූම කොටස ගෙනයේද, ඉන්පසු සොයාගත්දෙයින් ඉතිරිකොටස ගන්නාවූද අනික් මහණහුට අවහාරයක් නැත්තේමය.

කුසසඞ්කාමනවත්‍ථුකථා නිමි.

—\\—

අට්ඨකථාවන්හිවනාහි මෙතන්හි කුසසඞ්ක්‍රාමණ වශයෙන් චීවරභාජනීයනම්වූ එක්ම පරිවෙජදයක් ආයේය. සිවුපසය පිළිබඳ උත්පත්තියද බෙදියයුත්තද ගෙණහැර දක්විය යුතුය'යි කියනලද්දේය. මෙසේද කියා චීවරක්ඛන්ධකයෙහි **'පතිගණ්හාතු මේ භන්තෙ භගවා සීවෙය්‍යකං දුස්සයුගං භික්ඛුසඞ්ඝස්ස ච ගහපතිචීවරං අනුජානාතූ'** යනමේ ජීවකවත්‍ථුව ආදිකොට උපන් චීවරකථාවද, සෙනාසනක්ඛන්ධකයෙහි **'තෙන ඛො පන සමයෙන රාජගහං දුබ්භික්ඛං හොති, මනුස්සා න සක්කොන්ති සඞ්ඝභත්තං කාතුං, ඉච්ඡන්ති උද්දෙසභත්තං නිමන්තණං සලාකභත්තං පක්ඛිකං උපොසථිකං පාටිපදිකං කාතුං'**යන මේ සූත්‍රය ආදිකොට පිණ්ඩපාතකථාද, සෙනාසනක්ඛන්ධකයෙහිම **'තෙන ඛො පන සමයෙන සත්තරසවග්ගියා භික්ඛූ අඤ්ඤතරං පව්වන්තිමං විහාරං පටිසඞ්ඛරොන්ති ඉධ මයං වස්සං වසිස්සාම, අද්දසංසු ඛො ඡබ්බග්ගියා භික්ඛූ සත්තරස වග්ගියෙ භික්ඛූ විහාරං පටිසඞ්ඛරොන්තෙ'**යන මේ ෂට්වර්ගීයවත්‍ථුව ආදිකොට ආවාවූ සෙනාසනකථා ඒ අවසානයෙහිද සපිඨාදි හෙසජ්ජකථාවද විස්තරවශයෙන්

කියනලදී. අපිවනාහි ඒ සියල්ල ආ ආ තන්හිම කියන්නෙමු. මෙසේ කීමෙහි හෙතුව පෙර කියනලද්දේමය.

මෙයින් අන්‍යවූ **ජනතාඝරවත්ථුව** ප්‍රකට අර්ථඇත්තේමය. විසාඛවත්ථුපයෙහි ඒ භික්ෂූහු අනුපසම්පන්නයකුලවා කැපකරවා පියවා අනුභවකළහ. සිංහාදීන්විසින් කා ඉතිරිය ගන්නහුවිසින් කා ඉතිරිකොට දමනලද්ද ගතයුතුය. ඉදින් කනකල්හි බැහැර දම්මවා ගන්නට හැකිවේද මෙද වටියි. ආත්මාරක්ෂාව පිණිසද පරහට අනුකම්පා පිණිසද නොගතයුතුය. **ඔදන - ඛාදනීය - පූව - තිම්බරුසකභාජනීය වත්ථූන්හි 'අපරස්ස භාගං දෙහි'** අන්‍යයාගේ කොටස දෙවයි නැත්තාවූ පුද්ගලයකු ගෙන වදළසේක. **'අමූලකං අග්ඝහෙයි'** ආනාපත්ති භික්ෂු පාරාජිකස්ස හිමියන් දෙනකල්හි මෙසේ ගත්තේය. එහෙයින් මොහුට අනාපත්ති වදරණලදී. **'ආපත්ති සම්පජානමුසාවාදෙ පාචිත්තියස්ස'** මේ කරණකොට යම් සම්පජානමුසාවාදයක් වදරණලද්දේ ද, එහි පාචිත්තිය වදළසේක. ඉදිරියෙහි එන තෙකටුලයාගුවත්ථුවෙහි මෙනි. ගැනීමෙහි මේ විනිශ්චය වේ: ලද සම්මතය ඇත්තකුවිසින් හෝ අණකරණලද ආරාමිකාදීන්විසින් හෝ දෙනුලබන ගිහින් සතුවූවක්ද 'අනෙකාගේ කොටස දෙව'යි කියා ගන්නහුට හණ්ඩදෙය්‍යවේ. අනිකකුවිසින් දෙනුලබන්නක් ගන්නේ බඩුවෙහි ඇඟීමෙන් කරවියයුතුය. සම්මතය නොලද්දහුවිසින් හෝ හිමියන්විසින් නොඅණවන ලද්දහුවිසින් හෝ දෙනුලබනකල්හි 'අනික් කොටසද දෙව'යි කියා හෝ හොරට අවුරුදු ගැන හෝ ගන්නේ පාත්‍රවතුෂ්කයෙහි මෙන් එය උදුරාගත් ඇසිල්ලෙහිම බඩුවෙහි ඇඟීම්වසයෙන් කරවියයුතුය. අන්‍යයන් විසින් දෙනුලබන්නක් මෙසේ ගන්නහුට හණ්ඩදෙය්‍ය වේ. හිමියාවිසින්වනාහි 'මොහුට දෙව'යි දෙවූ දෙය හෝ තමන් විසින් දෙනලද දෙය හෝ මොනවට දෙනලද්දේවේ. මේ මෙහි සියළු අර්ථකථා විනිශ්චයෙන් ගතයුතු සාරයවේ.

ඔදනීයඝරාදිවත්ථූන්හි - ඔදනීයඝරනම්, විකිණියයුතු බත් පිසන ගෙයයි. **සූනාඝර**නම්, විකිණියයුතු මස් පිසන ගෙයයි. **පූවඝර**නම්, විකිණියයුතු කැවිලි පිසනගෙයයි. මෙහි සෙස්ස පරිෂ්කාරවත්ථූන්හිද ප්‍රකටවූයේමය. **පීඨවත්ථුවෙහි** ඒ මහණතෙමේ කල්පනාකොට බලා 'මෙතැනට පැමිණියක් ගන්නෙමි'යි තුබුතැනින් පහකොට සඞ්ක්‍රාමණය කරවූයේය. එයින් මේ භාණ්ඩයාගේ සඞ්ක්‍රමණයෙහි අවහාරයක් නැත්තේය. සඞ්ක්‍රමණය කරවා කල්පනාකළ අවකාශයෙන් ගැනීමෙහි පාරාජිකය කියනලද්දේය. මෙසේ ගෙනයන්නේද පුටුවෙහි සොරසිතක් නැත්තේනම් පසුම්බිය අගයකරවා කරවියයුතුය. පුටුවෙහි සොරසිත ඇත්තේනම් පසුම්බිය හා පුටුවයන දෙක අගයකරවා කරවියයුතුය. හිසිආදි වත්‍ථූනූ

ප්‍රකටමය. විඤ්ඤාසග්‍රහණාදිවසතු තුනෙහි ගැනීමෙහි අනාපත්ති වේ. ගෙන්වනකල්හි හණ්ඩදෙය්‍ය වේ. පිඬුපිණිස පිවිසියහුගේ කොටස උපචාරසීමාවතුළ සිටියහුම ගැනීම වටියි. ඉදින්වනාහි දයකයෝ උපචාරස්ථානයෙහි පිටත සිටියවුන්ට 'සචාමීනි! ගනුමැනව, අවුත් වළඳන්නාහුය'යි කියන්නම් මෙසේ ගමතුළ සිටියවුන්ටද ගැනීම වරද නොවේ. සෙස්ස ප්‍රකටඅර්ථ ඇත්තේමය.

අම්බවොරකාදිවසතුසතෙහි පාංසකූලසංඥාවෙන් ගැනීමෙහි අනාපත්තිවේ. ගෙන්වනකල්හි හණ්ඩදෙය්‍යවේ. සොරසිතින් වැළඳීමෙහි පාරාජිකයවේ. එහි මේ විනිශ්චයයි. හිමියෝද ආලයසහිතයෝය. සොරුද ආලය සහිතයෝය. පාංශුකූලසංඥාවෙන් කන්නහුට හණ්ඩදෙය්‍යවේ. සොරසිතින් ගන්නහුට නගාගැනීමෙහිදී අවහාරයවේ. බඩුව අගයකරවා කරවියයුතුය. හිමියෝ ආලය සහිතයෝය. සොරු ආලය රහිතයෝය. එකල්හිද මෙම නයම වේ. හිමියෝ ආලය රහිතයෝය. සොරු ආලය සහිතයෝය. 'නැවත ගන්නෙමි'යි කියාසිටියම් වන ඇසුරුකළ තැනක බහා ගියාහුද මේ නයම වේ. දෙදෙනම ආලය රහිතයෝය. පාංශුකූල සංඥාවෙන් කන්නහුට අනාපත්තිවේ. සොර සිතින් කන්නහුට දුක්කටය වේ. සඞ්ඝයා අයත් අඹ ආදීන් අතුරෙහි සඞ්ඝාරාමයෙහි හටගත්තක් හෝ වේවා, ගෙන අවුත් දෙනලද්දක් හෝ වේවා, පස්මස්සක් හෝ පස්මස්සකට වැඩිතරම්වූ හෝ අඟින්නක් සොරකම්කොට ගන්නහුට පාරාජිකයවේ.

ප්‍රත්‍යන්තයෙහි හොරළුවදුරක් හෙතුකොට ගම්වැස්සන් ගම්හැර පලායනකල්හි භික්ෂූහුද විහාර හැරදමා 'නැවත දනවුවැස්සන් අවුත් වසනකල්හි එන්නෙමු'යි උත්සාහසහිතවම යෙත්ද, භික්ෂූහු එබඳු විහාරයකට පැමිණ අඹපල ආදිය හැරදමනලද'යි පාංශුකූල සංඥාවෙන් වළඳත්ද, ඇවැත් නොවේ. සොරසිතින් වළඳන්නහුට අවහාරය වේ. බඩුව අගයකරවා කරවියයුතුය. **මහාපච්චරියෙහි** හා **සඞ්ඝභේදවත්ථුඨකථා**වෙහිද උත්සාහයෙන්ද නිරුත්සාහයෙන්දැයි වෙනසක් නොකොට කියනලද්දේය. හැරදමූ විහාරයෙහි කුදුමහත් පල සොරසිතින් වළඳන්නහුට පාරාජිකය නොවේ. කුමක්හෙයින්දයත්: පැමිණියවුන් හා නොපැමිණියවුන් සතුබැවිනි. ගණසන්තකයෙහි හා පුද්ගලසන්තකයෙහි ද සළතැසාහ මාත්‍රයම ප්‍රමාණ වේ. ඉදින්වනාහි ඒ ගණසන්තකයෙන් හා පුද්ගලසන්තකයෙන් අඹපලආදිය කුලසඞ්ග්‍රහයපිණිස දේනම්, කුලදූසනදුක්කටය වේ. සොරසිතින් දෙන්නේ ඇගීමෙන් කරවියයුතුය. සඞ්ඝිකයෙහිද මේ නයම වේ. සෙනසුන්පිණිස නියම කරණලද්දක් කුලසඞ්ග්‍රයපිණිස දෙන්නහුට දුක්කටය වේ. අධිපතිභාවය හෙතුකොට

දෙන්නහුට ථුල්ලච්චය වේ. සොරසිතින් දෙන්නහුට පාරාජිකයවේ. ඉදින් පාරාජිකවසතුවට නොපොහොනේනම්, ඇඟීමෙන් කරවියයුතුය. උපචාරසීමාවෙන් පිටතසිට අධිපතිභාවය හෙතුකොට වළඳන්නහුට ශ්‍රීවාවේ. ගෙඩිය ගසා කාලසොෂාකොට 'මට පැමිණේය'යි සිතා කනලද්දේ නිවැරදිලෙසින් කනලද්දේවේ. ගෙඩිය නොගසා කාලයපමණක්ම සොෂාකොට හෝ ගෙඩිය පමණක්ම ගසා කාලයසොෂා නොකොට, ගෙඩියද නොගසා කාලයද සොෂා නොකොට, අන්හු නැතිබව දැන 'මට පැමිණේය'යි කනලද්දේද, නිවැරදිලෙසින් කනලද්දේම වේ. **පුෂ්පාරාම වස්තු**දෙක ප්‍රකටමය.

වුත්තවාදික වස්තු තුණෙහි **'වුත්තෝ වජෙමි'**යනු 'තාවිසින් කියන ලද්දක්ව තාගේ වචනයෙන් කියමි' යනඅර්ථයි. **'අනාපත්ති භික්ඛු පාරාජිකස්ස'** හිමියන්විසින් දුන්බැවින් ඇවැත් නොවේ. **'න ච භික්ඛවේ වුත්තෝ වජෙමීති වත්තබ්බෝ'**යනු 'මම තාවිසින් කියනලද්දෙම්ව තාගේ වචනයෙන් කියමි'යි මෙසේ අන් මහණෙක් අන් මහණකු විසින් නොකියයුතුය යනඅර්ථයි. පිරිසිදීමකොට මෙනම් ඇත්තහුට තාගේ වචනයෙන් ගන්නෙමියි කීමෙහි වරදක් නැත්තේය. **'වුත්තෝ වජෙහි'**යනු 'මාවිසින් කියනලද්දක්ව මාගේ වචනයෙන් කියව' යනඅර්ථයි. සෙස්ස කියූනය ඇත්තේමය. මේ වස්තු දෙක්හිද පිරිසිදීමකොට කියයුතුය. මෙපමණකින්ම පිරිසිදීම නොකොට කියතියන ගණීවෙන් මිදුනේවේය'යි දතයුතුය. **මාණික්‍යවස්තු තුන** අතුරෙහි මධ්‍යම වස්තුවෙහි **'නාහං අකල්ලකෝ'**යනු 'මම නොගිලන්මි' යනඅර්ථයි. සෙස්ස ප්‍රකටමය.

සූකර වස්තුදෙක්හි බඩසයින් පෙළෙන්නහු දක කරුණාවෙන් මිදුබැවින් පළමු මහණහුට කිසිසේත් ඇවැත්නොවේ. හිමියන් නොපිළිගන්නාකල්හි හණ්ඩදෙය්‍ය වේ. ඔහුට වඩා මහත්වූ හෝ මළ හූරෙක් ගෙනවුත් දියයුතුය. ඔහුගේ වටිනකමට පමණවන බඩුවක් හෝ ගෙනවුත් දියයුතුය. මළපුඩු හිමියන් කොතැනකදී හෝ නොදකීනම්, මළපුඩුව සමීපයෙහි ඔහු තරම් අගනා සළුවක් හෝ කසටවතක් හෝ තැලියක් හෝ එහි ආවාවූ ඔවුහු යම් සේ දකිත්ද එබඳු තැනක තබා යායුතුය. සොරසිතින් මුදන්නහුට පාරාජිකයමවේ. මෙහිද කිසි ඌරෙක් තමන්ගේ පියවිගතියෙන් සිටියේ වේද, කිසි ඌරෙක් හොත්තේ වේද, කිසි ඌරෙක් කුටමළයෙන් බැඳුනේ වේද, කුටපාස නම් යම් මළපුඩුවක කෙළවර දුන්නක් හෝ අකුස්සක් හෝ අත්කිසි දඩුකඩක් හෝ බඳිනලද්දේද ඒය. යම් කුටපාසයක් ඒ ඒ තැන රුක්වැල් ආදියෙහි ඇවිණි ඌරාගේ ගමන වළකාද එහි පාසය ඇදසිටියහුට එක්ම පාසබන්ධනය ස්ථාන වේ. ඒ ඌරා පාසය මිදුඇසිල්ලෙහිම හෝ සිද හළඇසිල්ලෙහි හෝ

පලායේද තමන්ගේ පියවිගතියෙන් සිටියහුට බැම්මද පා සතරදෑයි පස්තැනක් වේ. හොත්තහුට බැම්මද නිදීමදෑයි දෙතැනක් වේ. කුටපාසයෙන් බැඳුනහුට යම් යම් තැනක යේද, ඒ ඒ තැනම තැන්වේ. එහෙයින් ඒ ඌරා ඒ ඒ තැනින් මුදහරින භික්ෂූහු දසදෙනද විසිදෙනද සියදෙනද පාරාජිකයට පැමිණෙත්. ඒ ඒ තැන ආවාවූ එක්ම දසයෙකු දක පලවාහරින්නාක් මෙනි. පළමු තිදෙනාහාට චතුෂ්පද කථාවෙහි කියූනයින් සෙලවීම හා තුබූතැනින් පහකිරීම දතයුතුය.

බල්ලන්විසින් ඩැහගත් ඌරෙකු කුළුණුසිතින් පලවාහරින්නහුටද හණ්ඩදෙය්‍යවේ. සොරසිතින් පලවාහරින්නහුට පාරාජිකයවේ. පාසට්ඨානයට හෝ බලුසමීපයට හෝ නොපැමිණියෙකු පෙරමගට ගොස් පළමුකොටම පලවාහරින්නහුට අවහාරයක් නැත්තේය. යමෙක් බැඳුනු ඌරුහට කෑමද පැන්ද දී බලගන්වා 'තැතිගත්තේ පලායන්නේය'යි සිතා මහහඬ කෙරේද, ඉදින් ඌරා පලායේනම් පාරාජිකයවේ. පාසය දුබලකොට මහහඬ නගා පලවාහරින්නහුටද මේ නයමවේ. යමෙක්වනාහි ශක්තිය ලබා පලායන්නේයයි සිතා කෑමද පැන්ද දී යේද, ඌරා පලා යේනම් හණ්ඩදෙය්‍යවේ. පාසය දුබලකොට යන්නහුටද මේ නයමවේ. පාසය කපා හළකල්හි හෝ දගියකල්හි පලායන්නේය යි සිතා පාසය සමීපයෙහි ආයුධයක් හෝ ගින්නක් හෝ තබාද ඌරා පාසය සොලවන්නේ සිදුනුකල්හි හෝ දවුනුකල්හි පලායේද, හණ්ඩදෙය්‍යමවේ. පාසය යටයසමග බිම හෙළාද, ඌරා පසුව පාසය මඩිමින් යේද, හණඩදය්‍යවේ. ඌරා යන්ත්‍රපාෂාණයන්ගෙන් මැඩුනේ, යටවූයේවේ ඒ ඌරා පලවාහරිනු කැමැතිව යන්ත්‍රපාෂාණය කුළුණුසිතින් ඔසවන්නහුට හණ්ඩදෙය්‍යවේ. සොරසිතින් ඔසවන්නහුට පාරාජිකය වේ. ඉදින් යන්ත්‍රයෙහි යෙදූගල එසවූ ඇසිල්ලෙහි පලානොගොස් පසුවයේද, හණ්ඩදෙය්‍යමවේ. සොරසිතින් ඔසවන්නහුට පාරාජිකය වේ. ඉදින් යන්ත්‍රයෙහි යෙදූගල එසවූ ඇසිල්ලෙහි පලානොගොස් පසුවයේද, හණ්ඩදෙය්‍යම වේ. ඔසවාතුබූ යන්ත්‍රපාෂාණය බිම හෙළාද, ඌරා පසුව එය මඩිමින් යේද, හණ්ඩදෙය්‍ය වේ. වළෙහි වැටුනු ඌරෙකුද කුළුණුසිතින් නගාගන්නහුට හණ්ඩදෙය්‍ය වේ. වළෙහි සොරසිතින් නගන්නහුට පාරාජිකය වේ. වළපුරවා නසාද ඌරා පසුව එය මඩමින්යේද, හණ්ඩදෙය්‍ය වේ. උලක ඇවුණුනු ඌරකු කුළුණුසිතින් එයින් නගාද, හණ්ඩදෙය්‍ය වේ. සොරසිතින් නගානම් පාරාජිකය වේ. උල උදුරාදමාද, හණ්ඩදෙය්‍ය වේ. විහාරය අවට වනබිමෙහි මළපුවු හෝ යන්ත්‍රපාෂාණයක් හෝ අටවන්නාහු 'මුවන්ට මේ පිළිසරණතැනකි, මෙහි මෙසේ නොකරවු'යි වැළැක්වියයුත්තාහ. ඉදින් 'ස්වාමීනි! පහකරහු'යි කියත්නම් පහකිරීම වටියි. එකල්හි තුමූ පහකෙරෙත්නම් යහපත්මය.

නොම පහකෙරෙත්නම්, පහකරන්නට නොදෙත්නම්, රාජරාජමහාඇමැති ආදීන්වෙත ගොස් නොඋදෙසා රැකවල ඉල්ලාගෙන පහකරවීම සුදුසුවේ. මිනිස්සු ගොයම් රක්නාකාලයෙහි මස්කමින් ගොයම් රකින්නෙමුයි කුඹුරුවල පාසඳ යන්ත්‍රපාෂාණද අටවන්නාහුය. ගොයම්කාලය ඉක්මගියකල්හි ආලයරහිතව ඔවුන් ගියකල්හි එහි බැඳුනවුන් හෝ වැටුනවුන් මුදහැරීම වරද නොවේ.

මඟවසතු දෙක්හිද - සූකරවසතුන්හි කියනලද්ද සමානවූම විනිශ්චය වේ. මත්‍සයවසතු දෙක්හිද මේ නයමවේ. මේ මතු කියන්නේ වෙනසය. කුම්භතුළට මසුන්වදනා කුම්භ්මුව විවෘතකොට හෝ පසුව ගොටුව මුද හෝ පසකින් සිදුරක් කොට හෝ මසුන් තළාපෙළා කුම්භනෙන් පලවාහරින්නහුට පාරාජිකය වේ. බත්උළු පෙන්වා මෙසේ පලවා හරින්නහුටද පාරාජිකය වේ. කුම්භනසමග නගාගන්නහුටද පාරාජිකයවේ. හුදෙක් කුම්භනෙහි මුව විවෘත කෙරේද, පසුව ගොටුව මුදද, සිදුරක් හෝ කෙරේද, මත්‍සයයෝ තමන්ගේ පියවිගතියෙන් පලායෙත්ද හණ්ඩදෙය්‍යවේ. මෙසේ කොට බත්උළු දක්වාද, මත්‍සයයෝ ගොදුරුපිණිස නික්ම පලායෙත්ද හණ්ඩදෙය්‍යමවේ. මුව විවෘතනොකොට පසුව ගොටුව මුද පසකින් සිදුරු නොකොට හුදෙක් බත්උළු දක්වාද, මත්‍සයයෝ බඩසයින් පෙළෙනබැවින් හිසින් පැහැර ඉඩ ලබා ගෙණ ගොදුරු පිණිස නික්ම පලායෙත්ද, හණ්ඩදෙය්‍යමවේ. හිස් කුම්භනෙහි මුව හෝ විවෘතකෙරේද, පසුව ගොටුව හෝ මුදද, සිදුරක් හෝ කෙරේද, ආ ආ මත්‍සයයෝ දෙරකඩට පැමිණ ගොටුවෙහි කළ සිදුරෙන් පලායෙත්ද, හණ්ඩදෙය්‍යමවේ. හිස්කුම්න ගෙන වනලැහබෙක දමාද හණ්ඩදෙය්‍යමවේ. යානයෙහි තුම්බ භාණ්ඩය පුටුවෙහි තුම්බ පසුම්බිය සමානවේ.

මංසපෙසී වසතුවෙහි - ඉදින් අහසෙහිදී ගණ්ඳ, ගත්තැනම තැන් වේ. එතැන සයයුරකින් පිරසිදීමෙන් ඨානාවාවනය දතයුත්තේය. මෙහි සෙස්ස **දරුගොපාලක - රජකසාටක වසතුන්හිද අම්බවොරකාදිවසතුන්හිද** කියූනයින් විනිශ්චය කටයුතුය. **කුම්භිවසතුවෙහි** යමෙක් පාදයක නොඅගින ගිතෙල් - තෙල්ආදිය ගෙන 'නැවත මෙසේ නොකරන්නෙමි'යි සංවරයෙහි සිට දෙවනදවස් ආදියෙහිද නැවත සිත උපන්කල්හි එපරිද්දෙන්ම ධුරනිඃක්ෂෙපයකොට වළඳන්නේ සියල්ලම වළඳද, පාරාජිකයක් නැත්තේය. දුක්කටයට හෝ ථුල්ලවවයට පැමිණේ. හණ්ඩදෙය්‍ය වන්නේය. මේ මහණතෙමේද එපරිද්දෙන්ම කෙළේය. **'අනාපත්ති භික්ඛු පාරාජිකස්ස'**යනු එහෙයින් වදළසේක. ධුරනිඃක්ෂෙපය නොකොට දවසක් දවසක් පාසා වළඳන්නෙමියි එය ටික ටිකද ගෙන වළඳන්නහුට, යම්දවසක පාදයක්අගින

ගිතෙල් තෙල් පිරිගියේද එකල්හි පාරාජිකයවේ. **සංවිදවහාරවත්‍ථූහු** සංවිදවහාරයෙහි **මුට්ඨිවත්‍ථූහු** ඔදනීයසරාදිවත්‍ථූන්හි **විඝාසවත්‍ථූ** දෙක අම්බඵොරකාදි වත්‍ථූන්හි කියනලද විනිඡ්ඡයනයින් දතයුතුය. **තෘණවත්‍ථූ** දෙක ප්‍රකටඅර්ථ ඇත්තේමය.

අම්බභාජාපනාදිවත්‍ථූන්හි - ඒ භික්ෂූහු විසිතිස්ආදිවසයෙන් පිරිසිදිනලද මහණුන් ඇති එක් ගමක ආවාසයකට ගියහ. එහි භික්ෂූහු කුදුමහත්පල අනුභව කරන්නාහුද ඔවුන් පැමිණිකල්හි ආගන්තුක තෙරුන්ට ගඩාගෙඩි ගෙනවුත් දෙවු'යි කැපකරුවන්ට නොකීහ. එකල්හි ඒ භික්ෂූහු 'කිම සඞ්ඝසන්තකය අපට නොපැමිණේද්ද'යි ගෙඩිය ගසා බෙදවා ඔවුන්ටද වස්ගණනින් කොටසදී තුමුද අනුභවකළහ. එහෙයින් ඔවුන්ට භාග්‍යවතුන්වහන්සේ **'අනාපත්ති භික්ඛවෙ පරිභොගත්‍ථාය'**යනු වදළසේක. එහෙයින් දැනුදු යම්තැනක ආවාසිකභික්ෂූහු ආගන්තුකභික්ෂූන්ට නොදෙත්ද, එලවාරය පැමිණිකල්හි අන්‍ය ආගන්තුකභික්ෂූන්ගේ අභාවය දක සොරකමින් තුමුම අනුභවකෙරෙත්ද, එබඳු ආවාසයෙක්හි ආගන්තුක භික්ෂූන් විසින් ගෙඩිය ගසා බෙදවා අනුභවකිරීම සුදුසුවේ. යම් ආවාසයෙක්හිවනාහි ආවාසික භික්ෂූහු පලරුක් රැකගෙන එලවාරය පැමිණිකල්හි බෙද අනුභවකෙරෙත්ද, අඹපලාදිය විකුණවා සිවුපසයෙහිලා මොනවට එළවත්ද, ඒ ආවාසයෙහි ආගන්තුක භික්ෂූහු ඉසුරෝ නොවෙත්. යම් වෘක්ෂයක් සිවුරුපිණිස නියමකොට දෙනලද්දේද, නියමකොට දුන්බැවින් ඒ වෘක්ෂයන්හිද ආගන්තුකභික්ෂූහු රුක්පල බෙද අනුභවකිරීමෙහි ඉසුරෝ නොවෙත්. සෙසු ප්‍රත්‍යය පිණිස නියමකොට දෙනලද වෘක්ෂයන්හිද මේ නයමවේ. යම් වෘක්ෂ එසේ නියම නොකරණලද්දේද, ආවාසික භික්ෂූහුද ඒ වෘක්ෂ රැකබලාගෙන ගොපනයකොට සොරකමින් අනුභවකෙරෙත්ද, ඒ වෘක්ෂයන්හි ආවාසික භික්ෂූන්ගේ කතිකාවෙහි නොසිටියයුතුය. යම් වෘක්ෂයක් ඵලපරිභොගයපිණිස දෙනලද්දේද, ආවාසිකයෝද ඒ වෘක්ෂ රැකබලාගෙන ගොපනයකොට මනාකොට එළවත්ද ඒ වෘක්ෂයන්කෙරෙහි ඒ ආවාසිකයන්ගේ කතිකාවෙහි සිටියයුතුය.

මහාපච්චරියෙහිවනාහි සිවුපසයපිණිස නියමකොට දෙනලද්ද සොරසිතින් අනුභවකරන්නේ භාණ්ඩය අගයකරවා කරවියයුතුය. පරිභොගවසයෙන්ම එය බෙද අනුභවකරන්නහුට භණ්ඩදෙය්‍යවේ. මෙහි යමක් සෙනසුන්පිණිස නියමකරනලද්දේද, එය පරිභොගවසයෙන්ම බෙද අනුභවකරන්නහුට ථුල්ලච්චය හා භණ්ඩදෙය්‍යයි කියනලද්දේය. උදෙසා සිවුරුපිණිසම දුන්දෙය සිවුරු පිණිසම එළවියයුතුය. ඉදින් දුර්භික්ෂයක්වේනම් භික්ෂූහු පිණ්ඩපාතයෙන් වෙහෙසට පත්වෙත්නම්

සිවුරුවනාහි සුලභවේනම් සඞ්ඝයාගේ යහපතපිණිස අපලොකකම්යකොට පිණ්ඩපාතයෙහිද එළවීම වරදක් නොවේ. සෙනසුනෙන් හෝ ගිලන්පසින් හෝ වෙහෙසට පත්වනකල්හි සඞ්ඝයාගේ යහපතපිණිස අපලොකනකම්යකොට ඒ පිණිසද එළවීම වටියි. පිණ්ඩපාතයපිණිසද ගිලන්පසපිණිසද නියමකොට දෙනලද්දෙහිද මේ නයමවේ. සෙනසුන්පිණිස උදෙසා දෙනලද්දවනාහි ගරුභාණ්ඩයක්වේද, එය රක්ෂා කොට ගොපනයකොට ඒ පිණිසම එළවිය යුතුය. ඉදින්වනාහි දුර්භික්ෂයක්වේනම්, භික්ෂූහුද පිණ්ඩපාතයෙන් නොයැපෙත්ද, මේ විහාරයෙහි නොහොත් විහාරය පිහිටි පෙදෙසෙහි රාජරොගචොරභයාදිය හෙතුකොට අන්තැනක යන්නවුන්ගේ විහාර නැසීයයිද, තල් පොල්ආදිය වනසත්ද, සෙනසුන්පසය නිසා යැපෙන්නට හැකිවේද, මෙබඳුකාලයෙහි සෙනසුන හැරදමාද, සෙනසුන් පිළිදගුම්පිණිස භාග්‍යවතුන්වහන්සේවිසින් පරිභොගය අනුදන්නාලද්දේය.

එහෙයින් එකක් හෝ දෙකක් උතුම් සෙනසුන් තබා අන්සෙනසුන් පහත් සෙනසුන පටන් පිණ්ඩපාතයපිණිස හැරීම සුදුසුවේ. මූලවස්තුවෙහිදයකොට නො එළවිය යුතුය.

යම් ආරාමයක් වනාහි සිවුපසය පිණිස නියමකොට දෙනලද්දේද, එහි අපලොකනකම්ය කරවියයුතුය. යම් ප්‍රත්‍යයකින් අඩුවක්වේද, ඒපිණිස එළවියහැකිය. ආරාමය පිළිදගියයුතුය. වැටුප්දීද, පිළිදග්ගවීම වටියි. යම්කෙනෙක්වනාහි වැටුප් ලබා ආරාමයෙහිම ගෙයක්කොට වසන්නාහු රකිත්ද, ඉදින් ඔවුහු ආවාවූ භික්ෂූන්ට පොල්පල හෝ තල්පල දෙත්ද, සඞ්ඝයාවිසින් 'දවසක් දවසක්පාසා මෙපමණ අනුභවකරවු'යි ඔවුන්ට යමක් අනුදන්නාලද්දේවේද, ඒම ඔවුහු දෙන්නටලබත්. ඔවුන් එයින් වැඩියක් දෙනකල්හි ගැනීම නොවටියි. යමෙක්වනාහි ආරාමය මිලයෙන් බදුගෙන සඞ්ඝයාහට සිවුපසයපිණිස කැප භාණ්ඩයක්ම දේද, මෙතෙමේ මෙයට වඩා බොහෝ දෙයක් දෙන්නටලබයි. සෑයට පහන්පිණිස හෝ කැවුම් බිදුම් පිළිසකරකිරීමපිණිස හෝ දුන් ආරාමයද පිළිදගියයුතුය. වැටුප් දීද පිළිදගුම් කරවියයුතුය. මෙහි වැටුප් සෑසතුවූයේද සහසතුවූයේද දීමෙහි වරදනැත. මේ ආරාමයද වැටුපෙන් එහිම වැස රකින්නවුන්ගේද, මිලයට බදුගෙණ කැපබඩු දෙන්නවුන්ගේද එහි හටගත්ඵලදීමද කියූ නයින්ම දතයුතුය.

අම්බපාලකාදිවත්‍ථූන්හි - 'අනාපත්ති භික්ඛවෙ ගොපකස්ස දූනෙ' මෙහි ගොපකයාහට කවරතරම් දීමක් වටීද, කවරතරම් දීමක් නොවටීදයත්: **මහාසුම්ම** ස්ථවිරයන්වහන්සේවනාහි ගොපකයාහට දවසක්

දවසක් පාසා මෙපමණ ගතුවයි යමක් පිරිසිඳ දෙනලද්දේද, එයම වටියි, එයින් වැඩියක් නොවටියයි කීහ. **මහාපදුම** ස්ථවිරයන්වහන්සේවනාහි 'කිම? ගොපකයන්ට මෙපමණුරුකෙන් මෙපමණ ගතයුතුය'යි දැක්වූබැවින් පතක ලියා හෝ සලකුණුකොට දෙනලද යමක් ඇත්තේද, මොවුන්ගේ අතෙහි ඒ හරණුලදදෙයට මොවුහු අධිපතිවෙත්. එහෙයින් ඔවුහු යමක් දෙත්ද, එය බොහෝවුවද වටියයිකීහ. **කුරුන්දි** අට්ඨවාවෙහිවනාහි මිනිසුන්ගේ ආරාමයක් හෝ අන්කිසි ඵලාඵලයක් හෝ ඔවුන්ගේ දරුමුනුබුරු ආදීහුහෝ අන්කිසි කෙනෙක් හෝ රකිත්ද, එහෙයින් ඔවුන් විසින් දෙනලද්ද වටියි. ගෙන්වා නොගතයුතුය. සහසතුයෙහිද සෑසතුයෙහිද මිලට බදුගෙන රකින්නහුගේම දීම වටියි. වැටුපෙන් රකින්නහු තමන්ගේ කොටස පමණක් දීම වටියයි කියනලදී. **මහාපච්චරියෙහි**වනාහි ගිහියන්ගේ අරම් රකින්නෝ භික්ෂූන්ට යමක් දෙත්ද, එය වටියි. ආරාමගොපකයෝ තමන්ගේ බැලයෙන් භික්ෂුසඞ්ඝයාහට යමක් වෙන්කොට දෙත්නම් එය වටියි. යමෙක් ආරාමයක අඩක් හෝ ගස්කොළන් කිසිවක් හෝ බැලය ලබා රකීද, ඔහුටද තමන්ට පැමිණි රුකෙන්ම යමක් දීම වටියි. මිලයට බදුගෙන රකින්නහුට සියල්ලම වටියයි කියනලදී. මේ සියල්ලවනාහි අක්ෂරවශයෙන් වෙනස්වේ. අර්ථවශයෙන් එකෙක්මය. එහෙයින් අදහස දැනගතයුතුය.

දරුවසතුවෙහි - 'තාවකාලිකො අහං භගවා' 'භාග්‍යවතුන්වහන්ස! මම තවුකැලි සිත් ඇතියෙමි'යි කියනුකැමැත්තහුවිසින් කියනලදී. **'තාවකාලිකචිත්තො'** 'නැවත ගෙනවුත් දෙන්නෙමි'යි මම මෙසේ සිත් ඇතියෙමියි කියනලද්දේවේ. භාග්‍යවතුන්වහන්සේ **'තාවකාලිකෙ අනාපත්ති'**යි වදළසේක. මේවනාහි මෙහි පාලිමුක්තකවිනිශ්චයවේ: ඉදින් සඞ්ඝතෙමේ පොහෝගෙයක් හෝ බොජුන්හලක් හෝ යන සඞ්ඝයාහට හිතවූ කම්මාන්තයක් කරවාද කාරකසඞ්ඝයා විචාරා ඒ දවදඩුවලින් යමක් ඒ පිණිස තාවකාලිකව ගෙනයායුතුය. සඞ්ඝයාට අයත්වූ යම් ද්‍රව්‍යසමූහයක් නොරක්නාලද්දේවේද, වැසි වස්නාකල්හි තෙමේද, අව්වෙන් වියලේද, ඒ සියල්ලම නොවිචාරාද තාවකාලිකව ගෙනවුත් තමන්ගේ ආවාසයෙහි තැබියයුතුය. සඞ්ඝතෙමේ ගෙන්වන්නේ නම් අන්‍යවූ ද්‍රව්‍යසමූහයකින් හෝ මිලයකින් දන්විය යුතුය. සඞ්ඝතෙමේ නොගෙන්වනුයේද, 'මෙසේ ද්‍රව්‍යසම්භාරය දියයුත්තේය'යි හඟවන්නට නොහැක්කේනම් 'සවාමීනි! සඞ්ඝයාහට අයත් ද්‍රව්‍යයෙන් මෙය කරණුලද්දේය. එහෙයින් සඞ්ඝපරිභොගයෙන් වළඳනු මැනැවයි කියයුතුය. මේ මහණතෙමේම සෙනසුනට අධිපතිවේ. ඉදින් පහන්ටැඹක් රුක්ටැඹක් හෝ කවුළුවකට හෝ ජනේලයකට හෝ නොපොහොනේද, සඞ්ඝයාහට

අයත්වූ ද්‍රව්‍ය තාවකාලිකව ගෙනවුත් ප්‍රකෘතිමත්කිරීම වටියි. අන්‍යවූ ද්‍රව්‍යසමහාරයෙහිද මේ නයමවේ.

උදකවසතුවෙහි - යම් කලෙක ජලය දුලීහවේද, එකල්හි යොදුනකින් හෝ අඩ යොදුනකින් ඈතසිට හෝ ජලය ගෙනඑනු ලැබේද, එබඳුවූ පරිගෘහිතජලයෙහි අවහාරයවේ. යම් තැනකින් ගෙන ආ ජලයෙන් හෝ පොකුණුආදියෙහි සිටි ජලයෙන් හෝ හුදෙක් කැඳබත් පිළියෙල කරත්ද, පානීයපරිභොගය කරත්ද, අන්‍යවූ මහත් පරිභොගයක් නොකරත්ද, ඒ ජලයද සොරසිතින් ගන්නහුට අවහාරයවේ. යම් තැනකින් පැන්කළ එකක් හෝ දෙකක් හෝ ගෙන අසුන් සේදීමට බෝරුකෙහි ඉසීමට උදකපූජා කිරීමට පඬුපිසීමට ලැබේද, එහිදී සඞ්ඝයාගේ කතිකාවසයෙන්ම පිළිපැදියයුතුය. වැඩියක් ගන්නේ සොරසිතින් මැටිඇදිය බහන්නේ භාණ්ඩය අගයකරවා කරවියයුතුය. ඉදින් ආවාසිකයෝ කතිකාවත දඩිකරත්ද, අන්හට භාණ්ඩයක් සෝදන්නට රඳන්කරන්නට නොදෙත්ද, අන්හු නොදක්නාකල්හි ගෙන තුමූ සියල්ල කරත්ද, ඔවුන්ගේ කතිකාවෙහි නොසිටියයුතුය. ඔවුහු යම් පමණ සෝදත්ද, එපමණ සේදියයුතුය. ඉදින් සඞ්ඝයාහට පොකුණු දෙකතුනක් හෝ ගල්පොකුණු දෙකතුනක් හෝ වේද, 'මෙහි සනානයකළයුතුය. මෙයින් පැන් ගතයුතුය. මෙහි සියලු පරිභොගය කටයුතුය යි කතිකා කරණුලද්දේද, කතිකාවතින් ම සියල්ල කටයුතුය. යම් තැනක කතිකා නැත්තේද, එහි සියලු පරිභොගය වටියයි දතයුතුය.

මත්තිකා වසතුවෙහි - යම් තැනක මැටි දුලීහවේද, නන්අයුරු පැහැති මැටි හෝ ගෙනවුත් තබනලද්ද, එහි මදක් නමුත් මැටි පස්මස්සක් අගීද, එහෙයින් පාරාජිකයවේ. සඞ්ඝකම් හා චෛත්‍ය කම්ද නිමිකල්හි සඞ්ඝයා විචාරා තාවකාලිකවසයෙන් හෝ ගැනීම වටියි. සුණුපිරියම්හිද සිත්කම් පැහැයෙහිද මේ නයමවේ.

තෘණ වසතුත්හි - දවූ තෘණයෙහි ඨානාචාවනයාගේ අභාවයෙන් දුක්කටයවේ. හණ්ඩදෙය්‍යවනාහි වන්නේවේ. සඞ්ඝතෙමේ තණවත්තක් සංස්කරණය කොට සඞ්ඝිකආවාසයක වසයි. නැවත කිසිකලෙකත් දගුම් කරන්නට නොහැකිවේ. එකල්හි අන් මහණෙක්තෙමේ වත්හිසින් දගුම් කරයි. මෙය සඞ්ඝයාගේමවේ. ඉදින් දගුම් නොකෙරේනම්, සඞ්ඝයාවිසින් 'දගුම් කොට දෙව'යි එක් මහණක්හට කියයුතුයය. ඒ මහණතෙමේ කොටසක් ගන්නට කැමතිවේනම්, කොටසක් දීද දගුම් කරවියයුතුය. ඉදින් කොටස වඩා, දියයුතුමය. වඩාම නම් 'යව, දගුම්කොට සියල්ල ගෙන තමන්ගේ

සෙනසුන වසාලව'යි කියයුතුය. කුමක් හෙයින්දයත්: නැසුනුකල්හි වැඩක් නැත්තේද, එහෙයිනි. දෙන්නහු විසින්වනාහි භූමියසහිතව නොදියයුතුය. ගරුභාණ්ඩයවේ. තණපමණක් දියයුතුය. ඒ තණ අවුරුදුපතා දැගුම්කොට තමන්ගේ සෙනසුන වසනකල්හි නැවත සඞ්ඝතෙමේ දැගුම් කරන්නට පොහොතේද, 'තෝ දැගුම් නොකරව, සඞ්ඝතෙමේ දැගුම් කරන්නේයයි කියයුතුය.

මඤ්චාදීවූ වසනුසත ප්‍රකටමය. පෙළෙහි නොදක්වන ලද්දවූද ගල්ටැඹක් හෝ රුක්ටැඹක් හෝ පාදයක් අගින අන්කිසිවක් හෝ ගෙන යන්නහුට පාරාජිකයමවේ. ප්‍රදහනගෘහාදීන් අතුරෙහි හැරදැමූ වැටුන පිරිවෙන් ආදීන්ගේ බිත්තියක් හෝ පවුරක් බිඳ ගඩොල්ආදිය සොරකම් කරන්නහුටද මේ නයමවේ. කුමක්හෙයින්දයත්: සඞ්ඝික විහාරයෙහි කිසිකලෙක වාසයකරත්. කිසි කලෙක වාසය නොකරත්. එහෙයිනි, ප්‍රත්‍යන්තයෙහි සොරබියෙන් ජනපදය හැරයනකල්හි හැරදැමූ විහාරාදියෙහිවූ කිසි පිරිකරක් ගන්නහුටද මේ නයමවේ. යම් කෙනෙක්වනාහි ඒ හැරදැමූ විහාරයෙන් තාවකාලිකව යමක් ගෙනයෙත්ද, නැවත ආවාසිකයන් විහාරයන්හි වසනකල්හි හික්ෂූහු එය ගෙන්වත්ද දියයුතුය. ඉදින් ඒ හැරදැමූ විහාරයෙන් ගෙනඅවුත් සෙනසුනක් කරනලද්දේවේද ඒ ගෙනෙනලද්ද හෝ එයට අගින යමක් හෝ දියයුතුය. 'නැවත අවුත් වසන්නෙමු'යි ආලය නොසිඳ නොහැර දනවූවැස්සන් නැගීගියකල්හි ගණසන්තකයක් හෝ පුද්ගලසන්තකයක් හෝ ගන්නාලද්දේවේද, ඔවුහු අනුදනිත්නම් පිළියම් කිරීමෙන් වැඩක් නැත්තේය. සඞ්ඝිකයවනාහි ගරුභාණ්ඩයක්වේ. එහෙයින් ප්‍රතිකම් කටයුතුමවේ.

විහාරපරිභොගවසානුව ප්‍රකට අර්ථ ඇත්තේමය. **'අනුජානාමි භික්ඛවෙ තාවකාලිකං හරිතුං'** මෙහි යම් මහණෙක් සඞ්ඝසන්තකවූ ඇඳක් හෝ පුටුවක් හෝ තාවකාලිකව ගෙනගොස් තමාට පහසුතන්හි තබා එකක් දෙකක් මාස්පතා සඞ්ඝිකපරිභොගයෙන් පරිභොගකෙරේද, ආ ආ වෘද්ධතරයන්ට දේද, ඔවුන් නොවළකාද, ඔහුට ඒ ඇඳ පුටු නැසුනු කල්හිද දිරුකල්හිද සොරුන් ගෙනගියකල්හිද ග්‍රීවා නොවේ. වාසයකොට යන්නහුවිසින්වනාහි තුබූතැන නියමතැන තැබියයුතුය. යම් මහණෙක් පෞද්ගලික පරිභොගයෙන් පරිභොග කෙරේද, ආ ආ වෘද්ධතරයන්ට නොදේද, ඔහුට ඒ ඇඳපුටු නටකල්හි ග්‍රීවාවේ. අන් ආවාසයකට ගෙනගොස් පරිභොගකරන්නහුවිසින් ඉදින් එහි වෘද්ධතරයෙක් අවුත් නගාසිටුවාද, 'මාවිසින් මේ ආසනය අසුවල් ආවාසයෙන් ගෙනඑනලද්දේය, යම්, එය ප්‍රකෘතිමත් කරම්'යි කියයුතුය. ඉදින් ඒ මහණ 'මම ප්‍රකෘතිමත්

කරන්නෙමි'යි කියාද, ඔහුට භාරකොටද යෑම වටී'යි **සංක්ෂේපට්ඨකථාවෙහි** කියනලද්දේය.

චම්පාවත්ථුවෙහි 'තෙ කවුලා' තල, සහල්, මුංවලින් හෝ තල, සහල්, මැයෙන් හෝ තල, සහල්, කොල්ලුයෙන් හෝ තල, සහල් සමග මුං මෑ ආදී වූ යම්කිසි එක් අපරණ්ණයක් බහා තුනකින් කරන ලද්දීය. මේ තෙකවුල යාගුව මෙකියූ තුන හා සතරෙන් කොටසක් දියෙන් මුසුවූ කිරෙහි බහා ගිතෙල්, මී, සකුරු යොද කරන්නාහුය.

රාජගහවත්ථුවෙහි - 'මධුගොලකො' යන මෙයින් අතිරස, කැවුම් කියනුලැබේ. මධුසීසකයිද කියත්. සෙස්ස මේ වත්ථුදෙකෙහිද ඔදනභාජනීය වත්ථුවෙහිද කියූනයින්ම දතයුතුය. **අජ්ජුකවත්ථුවෙහි - 'එතදවොච'** ගිලෙනෙක්ව කීයේය. **'ආයස්මා උපාලි ආයස්මතො අජ්ජුකස්ස පකතා'** අගති ගමනවසයෙන් පක්ෂ නොවූයේය. තවද අනාපත්තිසංඥ ඇතිබැවින්ද, ලජ්ජීනට අනුග්‍රහයෙන්ද, විනයානුග්‍රහයෙන්ද, ස්ථවිරයන්වහන්සේ පක්ෂවූහයි දතයුතුය. මෙහි සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. **ඛාරාණසීවත්ථුවෙහි 'වොරෙහි උපදුතං'** සොරුන්විසින් පැහැරගන්නා ලද්දේය. **'ඉද්ධියා ආනෙත්වා පාසාදෙ ඨපෙසි'** ස්ථවිරයන්වහන්සේවනාහි ශොකනමැති හුලින් විදිනලදුව ඔබමොබ පෙරළෙන, වෙසෙසින් පෙරළෙන, ඒ කුලය දක, ඒ කුලයට අනුකම්පාවෙන් ප්‍රාසාදය රකිනුපිණිස ධර්මානුග්‍රහයෙන් තමන්ගේ සෘද්ධියෙන් ඔවුන්ගේම ප්‍රාසාදය ලදරුවන්ගේ සමීපයෙහි වේවායි ඉටුහ. ලදරුවෝ 'අපගේ ප්‍රාසාදය'යි හැඳින එයට නැංගාහ. ඉක්බිති ස්ථවිරයන්වහන්සේ සෘද්ධිය හළහ. ප්‍රාසාදයද ස්වකීය ස්ථානයෙහිම පිහිටියේය. ව්‍යවහාර වශයෙන් **'තෙ දරකෙ ඉද්ධියා ආනෙත්වා පාසාදෙ ඨපෙසි'**යි කියනලද්දේය. **ඉද්ධිවිසයෙ** මෙබඳු අධිෂ්ඨාන සෘද්ධියෙන් අනාපත්තිවේ. විකුර්ණ සෘද්ධියවනාහි නොවටියි. අවසානයෙහි වත්ථුදෙක ප්‍රකට අර්ථ ඇත්තේමය.

විනයවිවෘති නම්වූ සිංහලසමන්තපාසාදිකාවෙහි
දුතියපාරාජිකවණ්ණනාව නිමි.

—\\—

මේ එහි අනුශාසනාය:

දෙවැන්නෙකු නැත්තාවූ එකලාවූ පරදවනලද සියලුකෙලෙස්ඇති පස්මරුන් දිනූ බුදුරජානන්වහන්සේවිසින් මේ ශාසනයෙහි යම් මේ දෙවන පාරාජිකයක් වදරණලද්දේද.

ඒ ශික්ෂාපදය සමවූ නොයෙක්නයින් ව්‍යාකීර්ණවූ ගැඹුරුවූ අර්ථ හා විනිශ්චය ඇත්තාවූ අන්කිසි ශික්ෂාපදයක් නැත්තේය.

එහෙයින් වොදනාවස්තුව සහ මැදට පැමිණිකල්හි මේ පැමිණි වස්තුවෙහි විනයානුග්‍රහයෙන් විනිශ්චය කරන්නාවූ විනය දන්නාවූ මහණහුවිසින්,

අනවශෙෂයෙන් අභිප්‍රාය සහිතවූ පෙළට හා අටුවාවට බැස අප්‍රමත්තවූවහු පාරාජිකාපත්ති විනිශ්චයකටයුතුය.

කිසිකලෙක ඇවැත් දක්මෙහි උත්සාහය නොකටයුතුය. අනාපත්තිය දකින්නෙමුයි සිත උපදවමු.

ඇවැත දැකද 'තෝ පරිජියට පැමිණියෙහි'යි නොකියාම නුවණැතියන් සමග නැවත නැවත සංසන්දනයකොටම විමසාබලා නැවත පාරාජිකාපත්තිය. කියන්නේය.

මේ ශාසනයෙහි පෘථග්ජනයෝ, කියා හෝ නොකියා ගන්නට සුදුසුවූ මවුපියන් සතු වස්තුවෙහි පවා සොරසිත් ඉපදවීමෙන් ලුහුව පෙරළෙන සුභාවයඇති චිත්තයාගේවසයෙන් ශ්‍රාමණ්‍ය ගුණයෙන් ගිලිහෙත්.

එහෙයින් විචක්ෂණතෙමේ මෙරමා සතුපිරිකර ආසීවිසඇති සර්පයෙකුමෙන්ද ගින්නක් මෙන්ද දක්නේ නොපහසන්නේය.

තෘතීයපාරාජිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

—\\—

කායාදි තුන් දෙරින් පිරිසිදු වූ මැනැවින් සිවුසස් දහම් අවබෝධ කළා වූ බුදුරජානන් වහන්සේ විසින් යම් තෘතීය ශික්ෂාපදයෙක් පණවන ලද්දේ ද දැන් ඒ ශික්ෂාපදය පිළිබඳ සංවර්ණනා ක්‍රමය පැමිණියේය.

යම්හෙයකින් පෙර ද ප්‍රකාශ කරණ ලද යමක් මනාකොට දත හැක්කේ ද, එහෙයින් එය හැර පියා තෘතීයපාරාජිකය පිළිබඳ මේ සංවර්ණනාව වේ.

'තෙන සමයෙන බුද්ධෝ භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං' යන මෙහි **වෙසාලියං** මෙසේ නම් ඇති ස්ත්‍රීලිඩග වශයෙන් පැවැති ව්‍යවහාර ඇති නගරයෙහි. ඒ නගරය වනාහි තෙවරක් ප්‍රාකාරපරික්ෂෙපයෙන් නුවර බිම වැඩීම් හෙතුවෙන් අතරතුර ගව්ව ගව්ව පමණ පුළුල් කළ බැවින් වෙසාලී යි කියනු ලැබේ. මේ නගරය ද සම්මා සම්බුදුරජානන් වහන්සේ සර්ව්ඥභාවයට පැමිණි කල්හි ම හැමකින් මහත්බවට පැමිණියේය යි දතයුතු ය. මෙසේ ගොදුරුගම දක්වා **'මහාවනෙ කූටාගාරසාලායං'** යි නිවාස ස්ථානය දක්වූයේ ය. එහි මහාවන නම් තෙමේ ම හටගත් අනෙකකු විසින් රෝපණය නොකළ පිරිසිදීම් සහිත වූ මහත් වනය යි. කිඹුල්වත්පුරයට සමීප වූ මහාවනය වනාහි හිමවත සමග එකාබද්ධව පිරිසිදීම් රහිතව මහාසමුද්‍රය හා හැපී සිටියේ ය. මේ මහාවනය එබඳු නොවේ. මෙය පිරිසිදීම් සහිත වූ මහත් වූ වනය නු යි මහාවන නම් වීය. කූටාගාරය ඇතුළත් කොට හස්මඩුලු සෙවනියෙන් කරණලද සියලු ආකාරයෙන් යුක්ත වූ භාග්‍යවත් බුදුරජානන් වහන්සේගේ ගඳකිළිය යි දතයුතුය.

'අනෙක පරියායෙන අසුභකථං කථෙති' නොයෙක් කාරණයන්ගෙන් කෙශාදීන්ගේ වසයෙන් අශුභාකාරය දක්වීම් වසයෙන් පැවැති තමන්ගේ හා අන්‍යයාගේ ද කරජකායයෙහි නො ඇලීම උපදවන කථාව වදරණ සේක. 'අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා -පෙ- මුත්තං' යි. කුමක් කියන ලද්දේ වේ ද, මහණෙනි! බඹයක් පමණ වූ මේ

සිරුරෙහි සියලු අයුරින් සොයන්නේ කිසිවෙක් කිසි මුතුවක් හෝ මැණිකක් හෝ වයිරෝඩියක් හෝ අහිලක් හෝ යදුනක් හෝ කොකුමක් හෝ කපුරක් හෝ වත්සුණු ආදියක් හෝ අණුවක් තරම් වූ පිරිසිදු බවක් නො දකියි. එහෙත් ඉතා තද දුගඳැති පිළිකුල් කටයුතු වූ නො සිරි දකුම් ඇති කෙස් ලොම් ආදී වූ නන් වැදරුම් වූ අශුචියක් ම දකියි. එහෙයින් මෙහි දුර්විලරාගයක් හෝ බලවත් රාගයක් හෝ නො කටයුතු ය. හිසෙහි හටගත් කෙශයෝ වෙත් ද ඔවුහු පවා අශුභ ද වෙති. අශුචි ද වෙති. පිළිකුල් ද වෙති. ඔවුන් ගේ ඒ අශුභ අශුචි ප්‍රතිකූලභාවය ද වණ්ණවිසින් ද යන පස් කරුණෙන් දත යුතු ය. ලොමාදීන් පිළිබඳව ද මෙසේ දතයුතු ය. මෙහි මේ සංක්ෂෙපය යි. විස්තරය වනාහි විශුද්ධිමාර්ගයෙහි කියූ නයින් ම දතයුතු ය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ එක් එක් කොටසෙහි පස් පස් අයුරකින් බෙදීමෙන් නොයෙක් කාරණයෙන් අශුභකථාව වදරණ සේක. 'අසුභාය වණ්ණං භාසති' උද්ඝාතකාදීන්ගේ වසයෙන් අශුභ මාතෘකා තබා පදභාජනීයයෙන් ඒ මාතෘකාව විභජනය කරණ සේක් වණ්නා කරණ සේක් මොනවට විස්තර කරණ සේක් අශුභ කථාවෙහි වණ්නාව කරණ සේක. **'අසුභභාවනාය වණ්ණං භාසති'** කෙශාදීන් අතුරෙහි හෝ උද්ඝාතකාදීන් අතුරෙහි හෝ අධ්‍යාත්මික බාහිර වස්තූන් අතුරෙහි හෝ අශුභාකාරය ගෙණ පැවැති සිත පිළිබඳ යම් මේ භාවනාවක් වැඩීමෙක් බහුල කිරීමෙක් වේ ද, ඒ අශුභ භාවනාවගේ අනුසස් දක්වන සේක් **'අසුභභාවනාභියුත්තො භික්ඛවෙ භික්ඛු කෙසාදීසු වා වත්ථූසු උද්ඝාතකාදීසු වා වත්ථූසු පඤ්චඞ්ගසමන්නාගතං කිට්ඨකල්‍යාණං දසලක්ඛණසම්පන්නං පඨමජ්ඣානං පටිලභති. සො තං පඨමජ්ඣානසඞ්ඛාතං චිත්තමස්සූසං නිස්සාය විපස්සනං වඩ්ඪෙත්වා උත්තමත්ථං අරහත්තං පාපුණාති'**යි ගුණය වදරණ සේක. ගුණය කීර්තනය කරණ සේක.

එහි මේ දශලක්ෂණවිභාවනයෙහි ප්‍රථමධ්‍යානයාගේ දශලක්ෂණයෝය:- විරුද්ධකාරණයන්ගෙන් වෙන් වූ සිතෙහි පිරිසිදුබව, මධ්‍යම වූ සමාධි නිමිත්තට පැමිණීම, එහි සිත වැඳීම, පිරිසිදු සිතෙහි මැදහත් බව, බැලීම, සමථයට පැමිණියහුගේ උපෙක්ෂාව, සමථයට පිළිපන් බැවින් කෙලශසංඝීය හැර එකත්වයෙන් වැටහුනු සමාධිහුගේ උපෙක්ෂාව, එහි උපන් ධර්මයන් නො ඉක්ම පවත්නා අවර්‍යෙන් ඥානයාගේ කෘත්‍යනිෂ්පත්ති වශයෙන් ශොධනය, ඉන්ද්‍රියයන්ගේ එක රසාවර්‍යෙන් එයට අනුරූප වූ ව්‍යායාම පැවැත්වීමෙන් විශොධනය, ආසෙවනාවර්‍යෙන් විශොධනය, යන මොවුහුයි. එහි මේ කල්‍යාණ ලක්ෂණයෙහි පාළියය:-

'පඨමස්ස ඣානස්ස කො ආදි, කිං භික්ඛවෙ මජ්ඣෙ, කිං පරියොසානං, පඨමස්ස ඣානස්ස පටිපදවිසුද්ධි ආදි උපෙක්ඛානුබ්‍රූහණා මජ්ඣෙ සංපහංසනා පරියොසානං පඨමස්ස ඣානස්ස පටිපද විසුදධි ආදි. ආදිස්ස කති ලක්ඛණානි, ආදිස්ස තීනි ලක්ඛණානි. යො තස්ස පරිපන්ථො තතො චිත්තං විසුජ්ඣති. විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමාධි නිමිත්තං පටිපජ්ජති, පටිපන්නත්තා තත්‍රථ චිත්තං පක්ඛන්දති, යඤ්ච පරිපන්ථතො චිත්තං විසුජ්ඣති, යඤ්ච විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමාධිනිමිත්තං පටිපජ්ජති, යඤ්ච පටිපන්නත්තා තත්‍රථ චිත්තං පක්ඛන්දති, පඨමස්ස ඣානස්ස පටිපද විසුද්ධි ආදි, ආදිස්ස ඉමානි තීනි ලක්ඛණානි. තෙන වුච්චති පඨමජ්ඣානං ආදිකල්‍යාණංකෙදවව හොති, තිලක්ඛණසම්පන්නඤ්චාති. පඨමස්ස ඣානස්ස උපෙක්ඛානුබ්‍රූහණා මජ්ඣෙ. මජ්ඣස්ස කති ලක්ඛණානි, මජ්ඣස්ස තීනි ලක්ඛණානි. විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති, සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති, යඤ්ච විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති. යඤ්ච සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති, යඤ්ච එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති පඨමස්ස ඣානස්ස උපෙක්ඛානුබ්‍රූහණා මජ්ඣෙ. මජ්ඣස්ස ඉමානි තීනි ලක්ඛණානි. තෙන වුච්චති පඨමජ්ඣානං මජ්ඣෙකල්‍යාණඤ්චෙව හොති තිලක්ඛණසම්පන්නඤ්චාති. පඨමස්ස ඣානස්ස සංපහංසනා පරියොසානං පරියොසානස්ස කති ලක්ඛණානි, පරියොසානස්ස චත්තාරි ලක්ඛණානි. තත්‍රථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන සම්පහංසනා ඉන්ද්‍රියානං එකරසට්ඨෙන සංපහංසනා. තදුපගවීරිය වාහනට්ඨෙන සම්පහංසනා, ආසෙවනට්ඨෙන සංපහංසනා, පඨමස්ස ඣානස්ස සංපහංසනා පරියොසානං, පරියොසානස්ස ඉමානි චත්තාරි ලක්ඛණානි. තෙන වුච්චති, පඨමජ්ඣානං පරියොසානකල්‍යාණඤ්චෙව හොති චතුලක්ඛණසම්පන්නඤ්චාති. එවං තිවිධතථගතං චිත්තං තිවිධ කල්‍යාණං දසලක්ඛණසම්පන්නං විතක්කසම්පන්නඤ්චෙව හොති විචාර පීති සුඛ සම්පන්නඤ්ච. චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච සද්ධා සම්පඤ්ච. විරිය සති සමාධි පඤ්ඤ සම්පන්නඤ්චාති'[A]

'ආදිස්ස ආදිස්ස අසුභසමාපත්තියා වණ්ණං භාසති' මෙසේ ද මේ ආකාරයෙන් ද යි නැවත නැවත ව්‍යවසථා කොට දක්වන සේක් අශුභසමාපත්තියෙහි ගුණ වදරණ සේක. අනුසස් වදරණ සේක. ගුණ කීර්තනය කරණ සේක. ඒ කෙසේ ද යත්: 'අසුභසඤ්ඤ පරිචිතෙන භික්ඛවෙ භික්ඛුනො චෙතසා බහුලං විහරතො මෙථුනධම්මසමාපත්තියා

A පටිසම්භිදමග්ග

චිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති, න සම්පසාරීයති, උපෙක්ඛා වා පාටිකුල්‍යතා වා සණ්ඨාති. සෙය්‍යථාපි භික්ඛවෙ කුක්කුටපත්තං වා නහාරුදද්දුලං වා අග්ගිම්හි පක්ඛිත්තං පතිලීයති පතිකුටති න සම්පසාරීයති, එවමෙව ඛො භික්ඛවෙ අසුභසඤ්ඤා පරිචිතෙන භික්ඛුනො චෙතසා බහුලං විහරතො මෙථුනධම්මසමාපත්තියා චිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරීයතීති'[B]

'ඉච්ඡාමහං භික්ඛවෙ අද්ධමාසං පතිසල්ලීයිතුං' යනු 'මහණෙනි! මම එක් අඩමසක් මුළුල්ලෙහි විවෙකයෙන් යුක්තවන්නට සැහවෙන්නට තනිව හෝ වාසය කරන්නට කැමැත්තෙමි' යන අර්ථ යි. **'නමඤ්ඤෙකෙචි උපසඞ්කමිතබ්බා අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙන'** යමෙක් තමන් විසින් ප්‍රයුක්තවවනය නො කොට මා පිණිස සැදැහැති කුලයන්හි පිළියෙල කළ පිණ්ඩපාතය ගෙණ අවුත් මට එළවා ද, ඒ පිණ්ඩපාතය ගෙණ එන එක් මහණකු හැර අන් කිසි මහණකු විසින් හෝ ගිහියකු විසින් හෝ මම නො එළැඹිය යුතුවෙමි. කුමක් හෙයින් මෙසේ වදළ සේක් ද යත්:-

අතීතයෙහි පන්සියයක් මුවවැද්දෝ මහත් වූ දිග් දඩු බඳිනලද දිග් දැලින් වනය වට කොට තුටුපහටුව එකතුව ම දිවිහිමි කොට මුවකුරුලු නැසීම් කම්යෙන් ජීවිකාව කොට නිරයෙහි උපන්නාහු ය. ඔවුහු එහි පැසී පෙර කළ කිසියම් කුශලකම්යකින් මිනිසුන් අතර උපන්නාහු ප්‍රව්‍රජ්‍යොපනිශ්‍රය වශයෙන් සියල්ලෝ ම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද හා උපසම්පදව ද ලැබූහ. ඔවුන්ගේ ඒ මුල් අකුශල කම්යෙන් නො පැසුනු විපාක ඇත්තා වූ අපරාපර්‍යවෙතනා කොමෝ ඒ අඩමස තුළ ආතෙමාපක්‍රමයෙන් ද පරොපක්‍රමයෙන් ද දිවි නසාලීමට අවකාශ කළා ය. ඉඩ තැබීය. භාග්‍යවතුන් වහන්සේ එය දුටු සේක. කම්විපාකය වනාහි කිසිවක්හු විසිතුදු ප්‍රතිබාහනය කරන්නට නො හැකි ය. ඒ භික්ෂූන් අතුරෙහිද පෘථග්ජනයෝද ස්‍රොතාපන්නයෝද සකෘදගාමීහු ද අනාගාමීහු ද ක්ෂීණාස්‍රවයෝ ද ඇත්තාහ. ඔවුන් අතුරෙහි ක්ෂීණාස්‍රවයෝ ඉදිරියෙහි පිළිසිඳගැණුම් නැත්තෝ වූහ. අන්‍ය වූ ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ නියතගතිකයෝ වූහ. සුගතිපරායණයෝ ය. පෘථග්ජනයන්ගේ වනාහි ගතිය අනියත වේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ 'මොවුහු ආත්මභාවයෙහි ඡන්දරාගය හෙතු කොට මරණබියෙන් බිය පත් වූවාහු ගති විශොධනය කරන්නට නො හැක්කාහු ය. එබැවින් ඔවුන්ගේ ඡන්දරාගය පහ කොට හරිණු පිණිස අශුභකථාව කියම්, එය අසා අත්බවෙහි පහ වූ ඡන්දරාගය ඇති බැවින් ගති විශොධනය කොට

B පටිසම්භිදාමග්ග

සඟයෙහි පිළිසිඳ ගන්නාහු ය. මෙසේ ඇති කල්හි මාගේ සමීපයෙහි ඔවුන්ගේ පැවිද්ද සාර්ථක වන්නේය' යි සිතා වදළ සේක. එහෙයින් ඔවුන්ට අනුග්‍රහ පිණිස කමටහන් හිසින් අශුභ කථාව වදළ සේක. මරණයෙහි ගුණ වර්ණන අදහසින් නො වදළ සේක. වදරා ද උන්වහන්සේට 'ඉදින් මේ අඩමස මුළුල්ලෙහි භික්ෂූහු මා දකින්නාහු නම්, අද එක් මහණෙක් මළේ ය, අද දෙදෙනෙක් මළාහු ය -පෙ- අද දස දෙනෙක් මළාහුය'යි අවුත් මට සැල කරන්නාහු ය, මේ කර්මවිපාකය මා විසින් හෝ අනිකක්හු විසින් හෝ ප්‍රතිබාහනය කරන්නට නො හැක්කේ ය. ඒ මම එය අසා ද කුමක් කරන්නෙමි ද අසනලද අර්ථ රහිත වූ අනයව්‍යසනයෙන් මට කවර වැඩෙක් ද, එබැවින් මම භික්ෂූන්ගේ නො දක්මට එළැඹෙමි යි මෙබඳු අදහසක් වූයේ ය. එහෙයින් **'ඉච්ඡාමහං භික්ඛවෙ අද්ධමාසං පතිසල්ලීයිතුං නමහි කෙනචි උපසඞ්කමිතබ්බො, අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙන'** යනු වදළ සේක.

අන්‍යයෝ වනාහි 'පරොපවාදය දුරු කරණු පිණිස මෙසේ වදරා විවෙකයෙන් යුක්ත වූහ' යි කීහු. පරහු වනාහි මේ සවිඥ තෙමේ, 'මම සද්ධර්මවර චක්‍රවර්ති වෙමි'යි පිළිණ කරන්නේ ද, තමන්ගේ ඔවුනොවුන් නසන ශ්‍රාවකයන් වළකා ලන්නට නො හැක්කේ ද? අනෙකක්හට කිම හැක්කේද්ද'යි භාග්‍යවත්හට උපවාද කරන්නාහු ය. එහි දී පණ්ඩිතයෝ 'භාග්‍යවත් තෙමේ විවෙකයෙහි යෙදී ගත්තේ මේ ප්‍රවෘත්ත නො දන්නේ ය. උන්වහන්සේට සැල කරණ කිසිවෙක් ද නැත්තේ ය, ඉදින් දන්නේ වී නම් එකාන්තයෙන් වළකාලන්නේය' යි කියන්නාහ. මේ වනාහි ඊර්ෂ්‍යා මාත්‍රයෙකි. පළමු කියන ලද්ද ම මෙහි කාරණය වේ.

'නාසුධ' යන මෙහි **අසුධ** යනු පදපූරණ මාත්‍රයෙහි හෝ අවධාරණාර්ථයෙහි නිපාතයකි. කිසිවෙක් භාග්‍යවතුන් වහන්සේ කරා නො ම එළැඹේ යන අර්ථ යි. නොයෙක් වර්ණසංස්ථානාදී වූ කාරණයන්ගෙන් ලාමක භාවය තෙමේ මෝහට නු යි **අනෙකාකාරවොකාර** නම් වේ. නොයෙක් අයුරින් ව්‍යාකීර්ණ වූයේ ය. නොයෙක් කරුණෙන් මිශ්‍ර වූයේ ය යි කියන ලද්දේ වේ. ඒ කවරේ ද යත්:- අශුභභාවනානුයෝගය යි. ඒ නොයෙක් අයුරින් ලාමක වූ අශුභභාවනානුයෝගයෙහි **'අනුයුත්තා විහරන්ති'** යුක්තවූවාහු ප්‍රයුක්තවූවාහු වාසය කරත්. **'අට්ටියන්ති'** ඒ කයින් පෙළනාහු හටගත් දුක් ඇත්තාහු වෙත්. **'හරායන්ති'** ලජ්ජිත වෙත්. **'ජිගුච්ඡන්ති'** හටගත් පිළිකුල ඇත්තාහු වෙත්. **'දහරො'** තරුණ වූයේ ය. **'යුවා'** යොවුන් බැවින් යුක්ත වූයේ ය. **'මණ්ඩනක ජාතියො'** සැරසීම සභාව කොට ඇත්තේ ය. **'සීසං නහාතො'** හිස පටන් නැයේ ය. **'දහරො යුවා'** යන මෙහි දහරවචනයෙන් පසළොස් වන වස පටන්

දෙතිස් වන වස තෙක් මේ අතර වූ පළමු යොවුන් බව දක්වන්නේ ය. පළමු යොවුන් බවෙහි වනාහි සත්ත්වයෝ වෙසෙසින් සැරසීම සුභාවය කොට ඇත්තාහු වෙත්. **‘සීසං නහාතෝ’** යන මෙයින් සැරසීමට සුදුසු කාලය දක්වන්නේ ය. තරුණ තෙමේ වනාහි කිසි කර්මාන්තයක් කොට තදින් කිලිටි වූ සිරුරු ඇත්තේ සැරසීමෙහි යෙදුනේ නො වේ. හිස පටන් සානාය කළ හෙතෙමේ සැරසීමෙහි ම යෙදෙයි. **සකුණපාදියක්** දකින්නට ද කැමැති නො වේ. හෙතෙමේ එකෙණෙහි **‘අහිකුණපෙන වා කුක්කුරකුණපෙන වා මනුස්සකුණපෙන වා කණ්ඨේ ආසත්තෙන’** කිසියම් සතුරකු විසින් ගෙණවුත් ගෙළෙහි බඳින ලද ගෙළෙහි යොදන ලද පලඳවන ලද බොටුවෙහි ලැගුනු සර්පකුණපයකින් හෝ බලුකුණපයකින් හෝ මිනිස්කුණපයකින් හෝ යම්සේ පෙළෙන්නේ ද, ලජ්ජිත වන්නේ ද, පිළිකුල් කරන්නේ ද, එ පරිද්දෙන් ම ඒ භික්ෂූහු සිය කය කරණ කොට පෙළෙන්නාහු ලජ්ජිත වන්නාහු පිළිකුල් කරන්නාහු, ඒ කුණපයට ඒ පුරුෂයා මෙන් පහ වූ ඡන්දරාගභාවය හෙතු කොට තම තමන්ගේ කය හරිණු කැමැත්තාහු, තුමූ ද ශස්ත්‍රයක් ගෙණ තම තමන් ජීවිතයෙන් තොර කරත්. ‘තෝ මා ජීවිතයෙන් තොර කරව, මම ද තා ජීවිතයෙන් තොර කරමි’යි මෙසේ උනුන් ජීවිතයෙන් තොර කරත්. **‘මිගලණ්ඩිකම්පි සමණකුත්තකං’** මිගලණ්ඩික යනු ඔහුගේ නාමය වේ. **සමණකුත්තක** යනු මහණවෙස් දරන්නේ ය යනුයි. හෙතෙමේ වනාහි සිඵපමණක් තබා හිස මුඩු කොට එක් කසාවතක් හැඳ එකක් උරහිසෙහි කොට විහාරය ම ඇසුරු කොට හිඳ ඉතිරිවන ඉදුල් කෑමෙන් ජීවත් වන්නේ ය. ඒ මහණවෙස් දරණ මිගලණ්ඩිකයා වෙත එළැඹ මෙසේ කියත්. **සාධු** යනු ආයාචනාර්ථයෙහි නිපාතයකි. **නො** යනු ද්විතීයා බහුවචන යි. ‘ඇවැත්නි! යහපතැ’ අප ජීවිතයෙන් තෙර කරව යි කියන ද්දේ වේ. මෙහි ද ආර්‍යයෝ ප්‍රාණඝාතය නො කළාහු ය. එහි සමාදන් නො කරවූහ. අනුමත කරණ ලද්දෝ නො වූහ. එහි සතුටු වූවෝ නො වූහ. පෘථග්ජනයෝ වනාහි සියල්ල කළහ.

‘ලොහිතකං’ ලෙයින් වැකුනහු. **‘යෙන වඟ්ගුමුදී’** ලොකයා විසින් සිත්කලු යි පිළිගත් පවිත්‍රය යි සම්මත නදී තොමෝ ය. හෙතෙමේ වනාහි තමන් කළ ඒ පාපය එහි පාකොට හරින්නෙමි යි යන හැඟීමෙන් ගියේ ය. **‘අඤ්ඤදෙව කුක්කුච්චං’** ඒ භික්ෂූන් අතුරෙහි කිසිවකු විසිනුදු කායවිකාරයෙක් හෝ වාග්විකාරයෙක් හෝ නො කරණ ලද්දේ ය. ඒ සියලු භික්ෂූහු සිහි ඇත්තාහු මනා නුවණ ඇත්තාහු දකුණැලයෙන් නිදි ගත්හ. එය සිහි කරණ ඔහුට කුකුසක් වූයේ ම ය. නදියෙහි ආනුභාවයෙන් සුළුපමාත්‍ර වූ ද පාපයක් ප්‍රහීණවූයේ නම් නො වේ. **‘අඤ්ඤ විප්පටිසාරෝ’**

ඒ කුකුස පිළිබඳ වූ ම සභාවය නියම කරණු පිණිස මෙය වදරණ ලද ය විපිළිසර කුකුස වූයේ ය. විනය පිළිබඳ කුකුසක් නො වේ. **'අලාභා වත මේ'** යන මේ ආදිය කුකුස පැවැති ආකාරය දක්වීම පිණිස වදරණ ලද්දේ ය. එහි **'අලාභා වත මේ'** මත්තෙහි හා දැන් මට හිතසුව ලැබීමක් නම් නැත්තේය' යි තතනමින් ශොක කරයි. **'න වත මේ ලාභා'** යන මෙයින් ඒ අර්ථය ම දැඩි කරයි. මෙහි මේ අදහස වේ:- ඉදිනුදු කිසිවෙක් 'තට ලාභයෙකැ'යි කියා නම් ඒ මිථ්‍යා ය. ඒකාන්තයෙන් මට ලාභයක් නො වේ. **'දුල්ලද්ධං වත මේ'** කුශලානුභාවයෙන් ලද්ද වූ ද මේ මනුෂ්‍යත්වය මා විසින් ලද්දේ නො මනා ය. **'න වත මේ සුලද්ධං'** යන මෙයින් ඒ අර්ථය ම දැඩි කරයි. මෙහි මේ අදහස වේ:- ඉදිනුදු කිසිවෙක් 'තා විසින් ලද්දේ මනාය' යි කියා නම්, එය මිථ්‍යා ය. මා විසින් එකාන්තයෙන් මැනැවින් ලද්දේ නො වේ යනුයි. **'අපුඤ්ඤං පසුතං'** අකුසල් රැස් කරන ලද්දේ ය. උපදවන ලද්දේ හෝ ය. කවර හෙයින් ද යත්:- **'යථාහං භික්ඛු -පෙ- වොරොපෙසිං'** එහි අර්ථය මෙසේ ය:- යම්බඳු වූ මම සිල්වත් වූ ඒ සිල්වත් බැවින් ම කලණ දහම් ඇත්තා වූ උතුම් සභාව ඇත්තා වූ ශ්‍රේෂ්ඨසභාව ඇත්තා වූ භික්ෂූන් ජීවිතයෙන් තොර කෙළෙමි ද එහෙයිනි.

'අඤ්ඤතරා මාරකායිකා' නම් වසයෙන් අප්‍රකට වූ මිසදිටු ගත්තා වූ මාරපාක්ෂික වූ මාරයාට අනුව පවත්නා වූ එක් භූමිගත දෙවතාවක. මෙසේ මෙතෙමේ මාරයාගේ ගොදුර මාරයාගේ විෂය නො ඉක්ම වන්නේය'යි සිතා සර්වාභරණයෙන් විභූෂිතව තමන්ගේ ආනුභාවය දක්වමින් පොළොතෙලෙහි සක්මන් කරන්නියක මෙන් නො බිඳෙන දියෙහි අවුත් මහණවෙස් ගත් මිගලණ්ඩිකයාහට මෙය කිවු ය. 'සාධු, සාධු' යනු සම්ප්‍රහර්ෂණාර්ථයෙහි නිපාත යි. දෙවරක් කීම ද එහෙයින් ම ය. **'අතිණ්ණං තාරෙසි'** සසරින් එතෙර නො වූවන් මේ දිවි තොර කිරීමෙන් එතෙර කරවූයේ ය. භාත්පසින් මුදවාලූයේ ය. අඳ වූ නුවණ නැති මේ දෙවහනගේ මේ ලබ්ධිය ය:- 'යම් කෙනෙක් නො මළාහු නම් ඔවුහු සසරින් නො මිදුනාහ, යම් කෙනෙක් මළාහු නම්, ඔවුහු මිදුනාහ' යනුයි. එහෙයින් සංසාරමොචකමිලක්ඛයන් මෙන් මෙසේ ලබ්ධි ඇතිව මහු ද එහි යොදන්නී මෙසේ කිවු ය. ඉක්බිති මහණවෙස් ගත් මිගලණ්ඩික තෙමේ පළමුව තදින් උපන් විපිළිසර ඇත්තේ ද, දෙවහනගේ ඒ ආනුභාවය දක 'මේ දෙවතා තොමෝ මෙසේ කිවු ය, එකාන්තයෙන් මේ කරුණෙන් මෙසේ විය යුතුය'යි නිෂ්ඨාවට ගොස් **'ලාභා කිර මේ'** යනාදිය කියමින් **'විහාරෙන විහාරං පරිවෙණෙන පරිවෙණං උපසඞ්කමිත්වා එවං වදෙති'** ඒ ඒ වෙහෙරට ද ඒ ඒ පිරිවෙණටද එළැඹ දෙර ඇර ඇතුළට පිවිස **'කො අතිණ්ණො, කං තාරෙමි'**යි භික්ෂූන්ට මෙසේ කියයි. **'හොතියෙව**

භයං' මරණය නිසා චිත්තෝත්‍රාසය වේ. **'ජම්හිතත්තං'** හෘදයමාංසය ආදි කොට ශරීරවලනය වේ. අධික භීතියෙන් තදබද සිරුර ඇති බවය යි සමහරු කියත්. තදබව ම **ජම්හිතත්ත** යි කියනු ලැබේ. **'ලොමහංසෝ'** උඩුහුරුව සිටි ලොම් ඇතිබව ය. ක්ෂීණාස්‍රවයෝ වනාහි සත්ත්වයන්ගේ ශූන්‍යත්වය මනාව දුටු බැවින් මැරෙණ සත්ත්වයකු නො දක්නාහු ය. මරණ මාත්‍රය දකිත්. එහෙයින් ඒ ක්ෂීණාස්‍රවයන්හට මේ තැතිගැන්ීම් ආදි සියල්ල නො වූයේය යි දත යුතු ය. **'එකම්පි භික්ඛුං දෙවපි -පෙ- සට්ඨිම්පි භික්ඛූ එකාහෙනෙව ජීවිතා වොරොපෙසි'** මෙසේ ගණන් වසයෙන් පන්සියයක් භික්ෂූන් දිවියෙන් තොර කෙළේ ය.

'පටිසල්ලානා වුට්ඨිතෝ' ඒ පන්සියයක් භික්ෂූන් ජීවිතක්ෂයට පැමිණිබව දැන ඒ එකීභාවයෙන් නැගී සිටි සේක්. දන්නා සේක් ද නො දන්නකු මෙන් කථා උපදවනු පිණිස **'ආයස්මන්තං ආනන්දං ආමන්තෙසිං- කින්නුඛෝ ආනන්ද තනුභූතෝ විය භික්ඛුසඞ්ඝෝ'** ආනන්ද! මෙයට පෙර බොහෝ භික්ෂූහු එකතුව උපස්ථානයට එන්නෝ ය, උදෙසීම් පිළිවිසීම් කරන්නෝ ය, හදරන්නෝ ය. ආරාමය එක් ම ආලොකයක් මෙන් දක්නා ලබන්නේ ය. දැන් අඩ මසක පමණ කාලය පටන් භික්ෂුසඞ්ඝ තෙමේ තුනී වූවාක් මෙන් තුනී වූයේ මද වූයේ සුළප වූයේ අතරතුර හැර පවත්නා මෙන් වූයේ ය. එහි කරුණු කිම? කිම භික්ෂූහු දිශාවන්හි ගියාහු ද යි විචාළසේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කම්විපාක වශයෙන් ඔවුන්ගේ ජීවිතක්ෂයට පැමිණීම නො සලකමින් අශුභකම්ස්ථානයොග හෙතුවෙන් ජීවිතක්ෂයට පැමිණීම විය'යි සලකන්නාහු **'තථා හි පන භන්තෙ භගවා'** යනාදිය කියා භික්ෂූන්ට රහත්බවට පැමිණීමට හිත වූ අන්‍ය කම්ස්ථානයක් යාවඤ්ච කරණුවෝ **'සාධු භන්තෙ භගවා'** යනාදිය කියා සිටියහ. එහි අර්ථය මෙසේ යැ:- ස්වාමිනි! භාග්‍යවතුන් වහන්ස! භික්ෂුසඞ්ඝ තෙමේ යමක් කරණ කොට ගෙණ රහත් බවෙහි පිහිටා ගන්නේ නම්, එයට හිත වූ අන් කරුණක් වදරණ සේක්වා, ඒ මැනැවි, මහාසමුද්‍රයට බස්නා තොටුපලවල් මෙන් අන්‍ය වූ ද දසානුස්සති, දසකසිණ, චතුධාතුවවත්ථාන, බ්‍රහ්මවිහාර ආනාපානස්සතිවිවසයෙන් ප්‍රභෙදගත වූ නිවණට බස්නා බොහෝ කම්ස්ථාන ඇත්තේ ය, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අස්වසා ඒ කමටහන් අතුරෙහි එක්තරා කම්ස්ථානයක් වදරණ සේක්වා, යනු අදහස වේ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ එසේ කරණු කැමැතිසේක් තෙරුන් පිටත් කොට යවන්නාහු **'තෙනාහානන්ද'** යනාදිය වදළසේක.

එහි **'වෙසාලියං උපනිස්සාය'** විශාලා මහානගරය ගොදුරුගම් කොට අවට ගව්වක් තන්හි ද අඩ යොදුනක් තන්හි ද යම් පමණ

භික්ෂූහු වෙසෙත් ද ඒ සියල්ලන් රැස් කරව, යන අර්ථ යි. **'තෙ සබ්බෙ උපට්ඨානසාලායං සන්නිපාතෙත්වා'** තමන් යා යුතු තැනට තමන් ගොස් අන් තන්හි තරුණ භික්ෂූන් යවා මොහොතකින් ම ඉතිරි නො කොට සියලු භික්ෂූන් උපස්ථානශාලාවට රැස් කරවා, **'යස්සදානි භන්තෙ භගවා කාලං මඤ්ඤති'** යන මෙහි මේ අදහස වේ:- 'භාග්‍යවතුන් වහන්ස! භික්ෂුසඞ්ඝතෙමේ රැස් කරවන ලද්දේ ය. භික්ෂූන්ට ධර්මදේශනා කරන්නට, අනුශාසනා කරන්නට මේ කාලය වේ, දැන් යමකට භාග්‍යවතුන් වහන්සේ කල් දන්නාහු ද, එය කටයුතු ය යනු යි.

'අථ ඛො භගවා -පෙ- භික්ඛූ ආමන්තෙසි අයම්පි ඛො භික්ඛවෙ' ආමන්ත්‍රණය කොට ද භික්ෂූන්ට රහත්බවට පැමිණීම පිණිස පෙර දේශනා කළ අශුභකම්ස්ථානයෙන් පිටත් අනික් කාරණයක් දේශනා කරණ සේක් **'ආනාපානසතිසමාධි'** යනු වදළ සේක. දැන් යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට ශාන්තප්‍රණීත කම්ස්ථාන දක්වනු පිණිස ම මේ පාළිය වදරණ ලද්දී ය. එහෙයින් නො පිරිහෙළා අර්ථයොජනාක්‍රමය මෙහි වණ්ණනා කරන්නෙමි. එහි පළමු කොට **'අයම්පි ඛො භික්ඛවෙ'** යන මේ පදයාගේ මේ යොජනාය:- 'මහණෙනි! හුදෙක් අශුභභාවනාව ම කෙලෙස් දුරු කිරීම පිණිස නො ද පවතියි. අනෙකුදු ඇත. **'අයම්පි ඛො ආනාපානසති සමාධි -පෙ- වූපසම්මෙති'** යන මෙහි මේ වනාහි අර්ථවණ්ණනා ය:- **'ආනාපානසති'** යනු ආශ්වාස ප්‍රශ්වාසයන් තදින් අල්ලාගත් සිහිය. **පටිසම්භිදාවෙහි ආනං** යනු ආශ්වාසය ය. ප්‍රශ්වාසය නොවේ. අපානං යනු ප්‍රශ්වාසය. ආශ්වාසය නොවේ. ආශ්වාසය අරමුණුකොට එළඹසිටි සිහි තොමෝය. ඔහුට එළැඹ සිටි සිහි තොමෝ ය. යමෙක් ප්‍රශ්වාස කෙරේ ද, ඔහුට එළැඹ සිටිය'යි. මෙය කියන ලද්දේ ය. **සමාධි** යනු ආනාපානය අරබයා පැවැති සිහිය සමග උපන් චිත්තෙකාග්‍රතා ය. මේ දෙශනා තොමෝ සමාධිශීර්ෂයෙන් කරණ ලද්දී ය. සඃතිශීර්ෂයෙන් නො කරණ ලද ය. එහෙයින් ආනාපාන සඃතිය සමග යෙදී ගත් සමාධිය ආනාපානසඃතිසමාධි නම් වේ. ආනාපානසඃතියෙහි හෝ සමාධිය **'ආනාපානසතිසමාධි'** යි මෙසේ ද මෙහි අර්ථ දතයුතු ය. **'භාවිතො'** උපදවන ද්දේ ය. වඩන ලද්දේ ද වේ. **'බහුලීකතො'** නැවත නැවත කරණ ලද්දේ ය. **'සන්තො චෙව පණීතො ච'** ශාන්ත ද ප්‍රණීත ද වේ. දෙතැන්හි ම වූ එව ශබ්දයෙන් නියමය දතයුතු ය. කුමක් කියන ලද්දේ වේ ද යත්: අශුභකම්ස්ථානය යම් සේ හුදෙක් ධ්‍යානප්‍රතිවෙධ වශයෙන් ශාන්ත වූයේද ප්‍රණීත වූයේද ඖදරික අරමුණක් බැවින්ද පිළිකුල් අරමුණක් බැවින්ද, අරමුණු වසයෙන් ශාන්ත නොවේමය. ප්‍රණීත නොවේමය. මේ ආනාපානසතිතොමෝ එසේ

කිසිකරුණකින් ශාන්ත නොවූයේ හෝ ප්‍රණීත නො වූයේ හෝ නොවේ. වැලි කිම? ආලම්බනය පරමසුඛුම බවට පැමිණීමෙන් ශාන්ත බැවින් ද ශාන්ත වේ. අතිශයින් ශාන්ත වේ. නිවුනු සියලු පරිදහ ඇත්තේ වේ. ප්‍රතිවෙධසඞඛ්‍යාත අඞගශාන්තභාවයෙන් ද ආලම්බනප්‍රණීතභාවයෙන් ද ප්‍රණීත ය. අතෘප්තිකර ය. අඞගප්‍රණීතභාවයෙන් ද ප්‍රණීත ය. අතෘප්තිකර ය. **'සන්තෝ චෙව පණීතෝ ච'**යි එහෙයින් කියනලදී.

'අසෙවනකෝ ච සුඛෝ ච විහාරෝ' යන මෙහි වනාහි ශාන්ත ප්‍රණීතභාවය එළවන කිසි වැගිරීමෙක් මොහුට නැත්තේ නු යි **අසෙවනක** නම්. වැගිරීමක් නැති බැවින් නොතෙත්ය. නො තෙත් බැවින් පරිකම්‍මාදියෙන් අසම්මිශ්‍ර ය. එහෙයින් වෙන්ව සිටියේය. අසාධාරණය. මෙහි පරිකම්‍මයෙන් හෝ උපචාරයෙන් හෝ ශාන්ත භාවයක් නැත්තේ ය. මුල් මෙනෙහි කිරීමෙහි පටන් තමන්ගේ ස්වභාවයෙන් ම ශාන්ත ද ප්‍රණීත ද වේය, යන අර්ථ යි. උත්තරවිහාර වාසීහු **'අසෙවනකෝ'** යන්නට ලං කොට ඉසීමෙන් නො තෙත් වූයේ ය. ඔදවත් වේ. ස්වභාවයෙන් ම මිහිරි ය, යන අර්ථ කියත්, මෙසේ මෙය අසෙවනක වූයේ ද සමවන් සමවන් කෙරෙහි කය සිත පිළිබඳ සැප ලැබීම පිණිස පවත්නා බැවින් සැපවූ විහරණ ඇත්තේය'යි වදතයුතු ය. **'උප්පන්නුප්පන්නෙ'** යටපත් නොකළ, යටපත් නො කළ. **'පාපකෙ'** ලාමක වූ **'අකුසලෙ ධම්මෙ'** අවිද්‍යාවෙන් හටගත් ධර්මයන්. **'ඨානසෝ අන්තරධාපෙති'** ක්ෂණයකින් ම අතුරුදහන් කරයි. යටපත් කරයි. **'වූපසමෙති'** මොනවට සන්සිඳුවයි. නිර්වේධභාගීයභාවයෙන් හෝ පිළිවෙළින් ආර්‍යමාර්ගයෙන් වැඩීමට පැමිණියේ මුළුමනින් සිඳලන්නේ ය. සන්සිඳුවා ලන්නේ ය යන අර්ථ යි. **'සෙය්‍යථාපි'** යන මෙය උපමා දක්වීම ය. **'ගිම්හානං පච්ඡිමෙ මාසෙ'** ඇසළ මාසයෙහි. **'උභතෝ රජොජල්ලං'** අඩ මසෙහි සුළඟින් හා අවිවෙන් වියලී ගියා වූ ගොමහිසාදීන්ගේ පාපහරින් බිඳුනු පොළොවෙන් අහසට නැගි උඩට නැගි අහසෙහි පිහිටි රජස් හා රේණු ද **'මහාඅකාලමෙඝෝ'** සියලු අහස තදින් පැතිර ගෙණ නැගී සිටියා වූ ඇසළමස පුරපසු සියලු අඩමස මුළුල්ලෙහි වස්නා මෙඝය තෙමේ. ඒ මෙඝය වනාහි වැසිකාලය නො පැමිණියදීම හටගත් බැවින් අකාලමෙඝය යි මෙහි අදහස් කරණ ලද්දේ ය. **'ඨානසෝ අන්තරධාපෙති වූපසමෙති'** ක්ෂණයකින් ම නොදක්වීමට පමුණුවයි. පොළොවෙහි හිඳුවාලයි. **'එවමෙව ඛෝ'** යන මෙය උපමා ප්‍රතිපාදනය යි. එයින් මත්තෙහි කියූ නය ම වේ.

දැන් **'කථං භාවිතෝ ච භික්ඛවෙ ආනාපානසතිසමාධි'** යන මෙහි **කථං** යනු ආනාපානසතිසමාධිභාවනාව නොයෙක් අයුරින් විස්තර කරණු කැමැති පිළිවිසීම ය. **'භාවිතෝ ච භික්ඛවෙ ආනාපානසතිසමාධි'** යනු

නොයෙක් අයුරින් විස්තර කරණු කැමැත්තෙන් විචාළ ධම්යාගේ දක්වීමය. දෙවන පදයෙහි ද මේ නය ම වේ. මේ වනාහි මෙහි සඞ්ඛේපපාඨීයයි:- 'මහණෙනි! කවර ප්‍රකාරයකින් කවර අයුරකින් කවර විධියකින් ආනාපානසතිසමාධිය වඩනලද්දේ කවර ප්‍රකාරයකින් බහුල කරණ ලද්දේ ශාන්ත වේ ද -පෙ- ව්‍යුපශමනය කෙරේ ද'යි දැන් ඒ අර්ථය විස්තර කරණ සේක් **'ඉධ භික්ඛවෙ'** යනාදිය වදළ සේක. එහි **'ඉධ භික්ඛවෙ භික්ඛු'** යන මෙහි 'මහණෙනි! මේ ශාසනයෙහි මහණ තෙමේ යන අර්ථ යි. මෙහි මේ ඉධ ශබ්දයතෙමේ සර්ව්‍ප්‍රකාරයෙන් ආනාපානසතිසමාධිය උපදවන පුද්ගලයාහට සංනිශ්‍රය වූ ශාසනය දක්වනසේක් තීර්ථකශාසනයෙහි පුද්ගලයාහට සංනිශ්‍රය වූ ශාසනය දක්වනසේක් තීර්ථකශාසනයෙහි තථාභාවය ප්‍රතිෂේධය කරණ සේක. මෙය 'ඉධෙව භික්ඛවෙ සමණොා -පෙ- සුඤ්ඤා පරප්පවාදා සමණෙභි අඤ්ඤෙ'[A] යි වදරණලද්දේය. එහෙයින් 'ඉමස්මිං සාසනෙ භික්ඛු' යනු ද වදරණ ලදී. **'අරඤ්ඤගතො වා -පෙ- සුඤ්ඤාගාරගතො වා'** යන මෙය මේ යොගීහට ආනාපානසතිසමාධි භාවනාවට අනුරූප වූ සෙනසුන් ගැන්ම දක්වීම ය. මේ මහණහුගේ බොහෝ කලක් මුළුල්ලෙහි රූපාදී වූ අරමුණුවල විසුරුණු සිත ආනාපානසතිසමාධි අරමුණට නගින්නට කැමැති නො වේ. කුළුගොනකු යෙදූ රියක් මෙන් නො මගට ම දුවන්නේය. එහෙයින් යම්සේ ගොපලුතෙමේ, කුළුදෙනකගේ කිරි බී වැඩුනු කුළුවසු දමනු කැමැත්තේ දෙනගෙන් ඈත් කොට එක් පසෙක බිම මහත් කණුවක් සිටුවා එහි යොතකින් බඳින්නේ ය, එකල්හි ඒ වසු ඇතට මැතට පැන සැලී පලායන්නට නො හැක්කේ ඒ කණුව වෙත ම හිඳින්නේ හෝ වේ ද, නිදන්නේ හෝ වේ ද, එපරිද්දෙන් ම මේ මහණහු විසින් ද බොහෝ කාලයක් මුළුල්ලෙහි රූපාරම්මණාදි රසපානයෙන් වැඩුනු දුෂ්ටචිත්තය දමනු කැමැත්තහු රූපාදිආරම්මණයන්ගෙන් ඈත් කොට වනයට හෝ -පෙ- ශූන්‍යාගාරයකට හෝ ඇතුල් කරවා එහි ආශ්වාස ප්‍රශ්වාස නැමැති කණුවෙහි සෘති නැමැති යොතින් බැඳිය යුතු ය. මෙසේ මේ මහණහුගේ සිත ඔබ මොබ සැලී ද පෙර පුරුදු අරමුණක් නො ලබන්නේ සෘති නැමැති යොත සිඳපියා පැනයන්නට නො හැකි වන්නේ ඒ ආශ්වාස ප්‍රශ්වාස අරමුණ වෙත ම උපචාරඅප්පණා වශයෙන් එළැඹ හිඳිම ද කරයි. හොවීම ද කරයි. එහෙයින් පොරාණයෝ:-

'යථා ථමෙහ නිබන්ධෙය්‍ය වච්ඡං දමමං නරෝ ඉධ,
බන්ධෙය්‍යෙවං සකං චිත්තං - සතියාරම්මණෙ දළ්හං' යි කීහ.

A මජ්ඣිමනිකාය චූළසීහනාද සූත්‍ර

මෙසේ මොහුට ඒ සෙනසුන භාවනාවට අනුරූප වෙයි. 'ඉදමස්ස ආනාපානසතිසමාධි භාවනානුරූපසෙනාසනපරිග්ගහපරිදීපනං' යනු එහෙයින් කියන ලදී. තවද යම්හෙයකින් කම්සථාන ප්‍රභෙදයෙහි මුදුන් වූ උතුම් වූ සව්ඤ්ඤුබුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ බුද්ධශ්‍රාවකයන්ගේ විශෙෂාධිගමයට ද අන්‍ය කම්සථානයකින් ලැබූ විශෙෂ ඇත්තන්ගේ දිට්ඨධම්ම සුඛවිහරණයට ද ආසන්න කාරණය වූ මේ ආනාපානසතිකම්මට්ඨානය ස්ත්‍රී පුරුෂ භෙදයි අඤ්ඤාදීන්ගේ හඬින් ආකුල වූ ග්‍රාමාන්තය නො හැර සැපයීම පහසු නො වේ. ධ්‍යානයට ශබ්දය තමා කටු බැවිනි. අගාමකාරණ්‍යයෙහි දී යොගාවචරයාහට මේ කම්සථානය දැඩිව ගෙණ ආනාපානචතුත්ථධ්‍යානය උපදවා එය ම පාදක කොට සංසකාරයන් අනිත්‍යාදිවශයෙන් සම්මර්ශනය කොට අග්‍රඵලසඞඛ්‍යාත වූ රහත් බවට පැමිණෙන්නට පහසු වේ ද, එහෙයින් මේ යොගාවචරයාහට සුදුසු වූ සෙනාසනය දක්වන භාග්‍යවතුන් වහන්සේ 'අරඤ්ඤගතො වා' යනාදිය වදළ සේක. භාග්‍යවතුන් වහන්සේ වාසනුවිද්‍යාචාර්‍යයකු වැනියහ. ඒ භාග්‍යවතුන් වහන්සේ යම්සේ වාසනුවිද්‍යාචාර්‍යතෙමේ නුවරක් ඉදිකිරීමට සුදුසු බිමක් බලා මැනැවින් පරීක්ෂා කොට මෙහි නුවර ඉදි කරවු යි දක්වන්නේ ද, ගැහැටින් තොරව නුවර ඉදි කිරීම නිමි කල්හි රජකුලයෙන් මහත් සත්කාර ලබන්නේ ද, එපරිද්දෙන් ම යොගාවචරයාහට සුදුසු සෙනසුනක් පරීක්ෂා කොට බලා මෙහි ඉඳ කම්සථානයෙහි යෙදිය යුතුය යි වදරණ සේක. ඉක්බිති එහි කම්සථානයෙහි යෙදුනු යොගීහු විසින් ක්‍රමයෙන් රහත්බවට පැමිණි කල්හි ඒ භාග්‍යවතුන් වහන්සේ එකාන්තයෙන් 'සම්‍යක් සම්බුද්ධ'යි මහත් සත්කාර ලබන සේක. මේ මහණතෙමේ දිවියකු වැනිය යි කියනු ලැබේ. යම් සේ මහාදිවිරජෙක් වනයෙහි තෘණ ගහණයක් හෝ වන ගහණයක් හෝ පර්‍වත ගහණයක් හෝ නිසා සැහවී සිට වන මී ගෝන හූරු ආදී වූ සතුන් අල්ලා ගණී ද, එපරිද්දෙන් ම වන සෙනසුන් ආදියෙහි කමටහන්හි යෙදෙන මේ මහණතෙමේ පිළිවෙළින් සොතාපන්ති සකෘදගාමී අනාගාමී අර්හන්මාර්ගයන් හා ආර්‍යඵලයන් ද අල්ලා ගණියි යි දතයුතු ය. පුරාතනයෝ

> 'යථා පි දීපිකො නාම නිලීයිත්වා ගණ්හති මිගෙ,
> තථෙවායං බුද්ධපුත්තො යුත්තයොගො විපස්සකො,
> අරඤ්ඤං පවිසිත්වාන ගණ්හාති ඵලමුත්තමන්ති'යි

එහෙයින් කියන ලදී.

දිවි තෙමේ සැහවී සිට යම් සේ මුවන් අල්ලා ගණී ද, එසේ ම යුක්තයොගී වූ මේ විදර්‍ශක බුද්ධපුත්‍රතෙමේ වනයට වැද ශ්‍රාමණ්‍යඵලය විඳ ගන්නේ ය යන අර්ථ යි.

එහෙයින් මොහුට භාවනොත්සාහජවයට යොග්‍යභූමි වූ සෙනාසනය දක්වන භාග්‍යවතුන් වහන්සේ **'අරඤ්ඤගතො වා'** යනාදිය වදළ සේක. එහි **'අරඤ්ඤගතො වා'** යනු අරණ්‍ය නම්, පිටත ඉන්ද්‍රකීලයෙන් නික්මුනු තැන පටන් මේ සියලු පෙදෙස අරණ්‍යය යි ද, ආරණ්‍යක සෙනාසනය නම් ඉන්ද්‍රකීලයෙහි පටන් දුනු පන්සියයක් ඇත්තේ පශ්චිමය යි ද මෙසේ කියනලද ලක්ෂණ ඇති අරණ්‍යයන් අතුරෙහි යම්කිසි විවෙක සුඛ ඇති අරණ්‍යයට ගියේ හෝ ය. **'රුක්ඛමූලගතො වා'** රුක්මුලක් සමීපයට ගියේ හෝ ය. **'සුඤ්ඤාගාරගතො වා'** ජනශූන්‍ය වූ විවික්ත අවකාශ ස්ථානයකට ගියේ හෝ ය. මෙහි ද අරණ්‍යය ද වෘක්ෂමූලය ද හැර සෙසු පව්ත කන්දර ගිරිගුහා ශ්මශාන වානප්‍රස්ථ අභ්‍යවකාශ පලාලපුඤ්ජ යන සත්වැදරුම් සෙනසුනකට ගියේ ද, ශූන්‍යාගාරයට ගියේය යි ද කීම වටියි. මෙසේ මොහුට සෘතුත්‍රයානුරූප වූ ධාතුචර්‍යාවනට අනුකූල වූ ආනාපානසති භාවනාවට අනුරූප වූ සෙනාසනය දක්වා නො හැකිලුනු අවික්ෂෙපපාක්ෂික වූ ශාන්තර්‍යාපථය දක්වන සේක් **'නිසීදති'** යනු වදළ සේක. නැවත මොහුගේ නිෂද්‍යාවෙහි දඩිබව ද ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ පැවැත්මෙහි සැපය ද අරමුණු ගැනීමෙහි උපාය ද දක්වන සේක් **'පල්ලඞ්කං ආභුජිත්වා'** යනාදිය වදළ සේක.

එහි **'පල්ලඞ්කං'** යනු භාත්පසින් ඌරුබද්ධාසනය යි **'ආභුජිත්වා'** අභිමුඛ කොට බැඳ, **'උජුං කායං පණිධාය'** මතු සිරුර කෙලින් තබා අටළොස් පිටකටු කොණිණ් කොණ සිටින සේ පිළියෙල කොට, මෙසේ හුන්නහුගේ වනාහි සම් මස් නහර නො නැමේ. මොහුට **සම්** මස් නහර නැමීම හෙතු කොට **ක්ෂණක්ෂණයෙහි** යම් වෙදනාවෝ උපදින්නාහු ද, ඒ වෙදනාවෝ නො උපදින්නාහ. ඒ වෙදනාවන් නො උපදින කල්හි සිත එකඟ වන්නේ ය. කම්ඨානවිථිය නො ඉක්මවයි. වැඩීමට සමෘද්ධියට පැමිණෙයි. **'පරිමුඛං සතිං උපට්ඨපෙත්වා'** කම්ඨානයට අභිමුඛ කොට සිහිය තබා නොහොත් **පරි** යනු පරිග්‍රහාර්‍ථ යි. **මුඛං** යනු නීයානාර්‍ථ යි. **සති** යනු උපස්ථානාර්‍ථ යි. 'පරිමුඛං සතිං' යි එහෙයින් කියනු ලැබේ. **ප්‍රතිසම්භිදාවෙහි** කියූ නයින් ද මෙහි මෙහේ අර්‍ථ දතයුතු ය. එහි පරිගෘහිත නෛය්‍යානික සමෘතිය කොට යනු සඞ්ක්ෂේපය යි. **'සෝ සතොව අස්සසති'** ඒ මහණ තෙමේ මෙසේ හිඳ මෙසේ ද සිහිය එළවා ඒ සිහිය නො හරිමින් සිහි ඇත්තේ ම ආශ්වාස කරයි. සිහි ඇත්තේ ම ප්‍රශ්වාස කරයි. සිහියෙන් කරණසුලු වේය යි වදරණ ලද්දේ වේ.

දන් යම් අයුරකින් සිහි ඇතිව කරණසුලු වේ ද, ඒ ආකාරයන් දක්වන සේක් **'දීඝං වා අස්සසන්තො'** යනාදිය වදළ සේක. ප්‍රතිසම්භිදාවෙහි

'හෙතෙමේ සිහි ඇත්තේ ම ආශ්වාස කෙරේ. සිහි ඇත්තේ ම ප්‍රශ්වාස කෙරේ'යි මෙය කියනලදී. මොහුගේ ම විභඞ්ගයෙහි 'දෙතිස් අයුරකින් සිහි ඇතිව කරණසුලු වේ. දීඝ කොට ආශ්වාස වශයෙන් සිතෙහි එකඟබව නො විසිරීම දන්නහුට සිහි තොමෝ එළැඹ සිටියා වන්නී ය. ඒ සිහියෙන් ඒ ඤණයෙන් සිහි ඇතිව කරණ සුලු වේ. දීඝ කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් -පෙ- බැහැර කිරීම එක්වන් දක්නාසුලුව ආශ්වාස කිරීම් වශයෙන් බැහැර කිරීම එක්වන් දක්නාසුලුව ප්‍රශ්වාස කිරීම් වශයෙන් සිතෙහි එකඟබව නො විසිරීම දන්නහුට සිහි තොමෝ එළැඹ සිටියා වන්නී ය. ඒ සිහියෙන් ඒ ඤණයෙන් සිහි ඇතිව කරණසුලු වේය'යි කියනලදී.

එහි **'දීඝං වා අස්සසන්තෝ'** දීඝ කොට ආශ්වාස පවත්වනුයේ ය. **'අස්සාසෝ'** පිටත නික්මෙන වාතය යි. **'පස්සාසෝ'** ඇතුළට පිවිසෙන වාතය යි. සූත්‍රාන්තාථකථාවන්හි වනාහි උපපිළිවෙළින් ආයේ ය. එහි මවුගැබ හෝනා සියල්ලන්ගේ ම මවුකුසින් නික්මෙන කාලයෙහි පළමු කොට ඇතුළත වූ වාතය පිටතට නික්මෙන්නේ ය. පසුව පිටත්හි වූ වාතය සියුම් රජස් ගෙණ ඇතුළට පිවිසෙනුයේ තල්ල හපා සන්සිඳී නිවී යන්නේ ය. මෙසේ වනාහි ආශ්වාස ප්‍රශ්වාසයෝ දතයුත්තාහ. ඒ ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ යම් දීඝභ්‍රස්වත්වයක් වේ ද එය අද්ධාන වශයෙන් දතයුතු ය. යම් සේ වනාහි ඉඩ ඇති තැනෙක පැතිර සිටි ජලය හෝ වැලි හෝ දීඝ ජලය, දීඝ වැලිය, භ්‍රස්ව ජලය, භ්‍රස්ව වැලිය යි කියනු ලැබේ ද, එපරිද්දෙන් සුණු විසුණු වූ ද ආශ්වාස ප්‍රශ්වාසයෝ, හසති ශරීරයෙහි ද සඊශරීරයෙහි ද ඔවුන්ගේ ආත්මභාව සඞ්ඛ්‍යාත දීඝ ප්‍රදේශය හිමිහිට පුරවා හිමිහිට ම නික්ම යන්නාහ. එහෙයින් දීඝා යි කියනු ලැබෙත්. බලු සා ආදීන්ගේ ආත්මභාව සඞ්ඛ්‍යාත භ්‍රස්ව අද්ධානය වහා පුරවා වහාම නික්ම යන්නාහ. එහෙයින් **රස්සා** යි කියනු ලැබෙත්. මිනිසුන් අතුරෙහි සමහර කෙනෙක් හසති සඊදීන් මෙන් කාලද්ධාන වසයෙන් දීඝ කොට ආශ්වාසද කරත්. ප්‍රශ්වාස ද කරත්. සමහර කෙනෙක් බලු සා ආදීන් මෙන් ලුහුඬු කොට ආශ්වාස ද ප්‍රශ්වාස ද කරත්. එහෙයින් කාල වසයෙන් ඔවුන්ට දීඝ වූ අද්ධානය වේ. නික්මෙන්නා වූ ද ඇතුළට පිවිසෙන්නා වූ ද ඒ ආශ්වාස ප්‍රශ්වාසයෝ දීඝයෝ ය. අනෙක් අද්ධාන සඞ්ඛ්‍යාත ප්‍රදේශයෙහි සුළු කාලයක් තුළ නික්මෙන්නා වූ ද ඇතුළට පිවිසෙන්නා වූ ද ආශ්වාස ප්‍රශ්වාසයෝ භ්‍රස්වයෝය යි දතයුත්තාහ. එහි මේ මහණතෙමේ නව අයුරකින් දීඝ කොට ආශ්වාස කරන්නේ ද ප්‍රශ්වාස කරන්නේ ද, දීඝ කොට ආශ්වාස කරමි, ප්‍රශ්වාස කරමි යි දැන ගණියි. මෙසේ දන්නා වූ ද මොහුට දීඝභ්‍රස්වාදි කරුණු

සතරින් එක් අයුරකින් කායානුපස්සනාසතිපට්ඨානභාවනාව පැමිණේයයි දතයුතුය.

ප්‍රතිසම්භිදාවෙහි මෙසේ වදළ සේක. දීඝිකොට ආශ්වාස කරණුයේ දීඝිකොට ආශ්වාස කරමි යි කෙසේ දනී ද, දීඝිකොට ප්‍රශ්වාස කරණුයේ දීඝිකොට ප්‍රශ්වාස කරමියි කෙසේ දනී ද, දීඝිශ්වාසය දීඝික්ෂණයෙහි ආශ්වාස කරයි. දීඝිප්‍රශ්වාසය දීඝික්ෂණයෙහි ප්‍රශ්වාස කරයි. දීඝිශ්වාස ප්‍රශ්වාසය දීඝික්ෂණයෙහි ආශ්වාස ද ප්‍රශ්වාස ද කරයි. දීඝිශ්වාස ප්‍රශ්වාසය දීඝික්ෂණයෙහි ආශ්වාස ප්‍රශ්වාස කරන්නහුට කර්තුකම්‍යතාලක්ෂණ කුශලචිත්තය උපදියි. කුශලචිත්තවශයෙන් එයට වඩා ඉතා සියුම්වූ දීඝි ආශ්වාසය දීඝික්ෂණයෙහි දීඝි කොට ආශ්වාස කරයි. කුශලචිත්තවශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීඝි ප්‍රශ්වාසය දීඝික්ෂණයෙහි දීඝිකොට ප්‍රශ්වාස කරයි. කුශලචිත්තවශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීඝිආශ්වාස ප්‍රශ්වාසය දීඝික්ෂණයෙහි දීඝිකොට ආශ්වාස ද කරයි. ප්‍රශ්වාස ද කරයි. කුශලචිත්තවශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීඝිආශ්වාස ප්‍රශ්වාසය දීඝික්ෂණයෙහි දීඝි කොට ආශ්වාස කරන්නහුට ද ප්‍රශ්වාස කරන්නහුට ද බුද්ධිකාදි ප්‍රභෙද ගත තරුණ ප්‍රීතිය උපදියි. ප්‍රමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීඝි ආශ්වාසය දීඝික්ෂණයෙහි දීඝිකොට ආශ්වාස කරයි. ප්‍රමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීඝිප්‍රශ්වාස කරයි. ප්‍රමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීඝිප්‍රශ්වාසය දීඝි කොට -පෙ- දීඝි වූ ආශ්වාස ප්‍රශ්වාසය දීඝික්ෂණයෙහි දීඝි කොට ආශ්වාස ද කරයි. ප්‍රශ්වාස ද කරයි. ප්‍රමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීඝිආශ්වාස ප්‍රශ්වාසය දීඝික්ෂණයෙහි දීඝි කොට ආශ්වාස ප්‍රශ්වාසයෙන් සිත තවන්නේ ය. ත්‍රිමජ්ඣත්තුපෙක්ඛාව පිහිට යි. මේ නව ආකාරයෙන් දීඝාකාර වූ ආශ්වාස ප්‍රශ්වාස කායයෝ සුණු විසුණු වූවාහු ද සමූහාත්මයෙන් කාය නම් වෙති. අරමුණ කරා එළැඹ සිටින අත්මයෙන් සමෘතිය උපට්ඨාන නම් වේ. ශමථ වශයෙන් නිමිත්ත දකීම සැණ නම් වේ. සිහිය කය අරමුණ කිරීම් වසයෙන් එළැඹ මෙහි සිටිනුයි උපට්ඨාන නම් වේ. ඒ කය සති නම් නො වේ. සතිය උපට්ඨාන ද සති ද වේ. ඒ සතිය හෙතු කොට ඒ සැණය හෙතු කොට ඒ කය එක්වන් දක්නෙය යි 'කායෙ කායානුපසසනා සතිපට්ඨානභාවනා'යි එහෙයින් කියනු ලැබේ. හ්‍රස්වපදයෙහි ද මෙම නය වේ. මේ වනාහි විශෙෂය වේ:-

යම් සේ මෙහි 'දිඝං අසසාසං අද්ධානසඞ්ඛාතෙ'යි කියන ලද්දේ ද, එසේ මෙහි 'රසසං අසසාසං ඉත්තරසඞ්ඛාතෙ අසසසති'යි ආයේය. එහෙයින් ඒ හ්‍රස්වආශ්වාසයාගේ වසයෙන් 'කායෙකායානුපසසනා සතිපට්ඨානභාවනා'යි යම්තාක් කියනු ලැබේද, ඒතාක් යෙදිය යුතුය.

මෙසේ මේ යොගාවචර තෙමේ දීඝීකෂණවශයෙන් ද ඝඨලපකෂණවශයෙන් ද යන මේ නව ආකාරයෙන් ආශ්වාස කරමි'යි දැනගණියි -පෙ- හ්‍රස්ව කොට ප්‍රශ්වාස කරන්නේ හ්‍රස්ව කොට ප්‍රශ්වාස කරමි'යි දැන ගණියි දතයුතු ය. මෙසේ දන්නා වූ මේ යොගීහටඃ- දීඝීකාර හ්‍රස්වාකාර දෙක ද එබඳු වූ ආශ්වාස ප්‍රශ්වාස දෙක ද යන සතර ආකාරයෝ මහණහුගේ නාසිකාග්‍රයෙහි මතු තොලෙහි පවතිත්.

'සබබකායපටිසංවෙදී අසසසිසසාමි -පෙ- පසසසිසසාමීති සිකඛති' සියලු ආශ්වාසකයාගේ මුල මැද කෙළවර පහද ලමින් ප්‍රකට කරමින් ආශ්වාස කරමි'යි හික්මෙන්නේ ය. සියලු ප්‍රශ්වාස කායයාගේ මුල මැද කෙළවර පහද ලමින් ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරමි යි හික්මෙන්නේ ය. මෙසේ පහද ලමින් ප්‍රකට කරමින් ඤණසම්ප්‍රයුක්ත චිත්තයෙන් ආශ්වාස ද කරයි. ප්‍රශ්වාස ද කරයි. එහෙයින් 'අසසසිසසාමි පසසසිසසාමීති සිකඛති'යි කියනු ලැබේ. එක් මහණක්හුගේ ආශ්වාසකාය හෝ ප්‍රශ්වාසකාය හෝ නොයෙක් කලාප බැවින් සුණු විසුණුව විසුරුණු කල්හි මුල ප්‍රකට වේ. මැද හා කෙළවර ප්‍රකට නො වේ. ඒ මහණතෙමේ මුල ම අල්ලා ගැණීමට සමර්ථ වේ. මැද හා කෙළවර වෙහෙසට පත් වේ. එක් මහණක්හට මැද ප්‍රකට වේ. මුල හා කෙළවර ප්‍රකට නො වේ.එක් මහණක්හට කෙළවර ප්‍රකට වේ. මුල මැද ප්‍රකට නො වේ. හෙතෙමේ කෙළවර ම අල්ලා ගැණීමට සමර්ථ වේ. මුල මැද දෙක්හි වෙහෙසට පත් වේ. එකක්හට සියල්ල ම ප්‍රකට වේ. ඔහු සියල්ල ම අල්ලා ගැණීමට සමර්ථ වේ. කිසි තැනෙක වෙහෙසට පත් නො වේ. එබන්දකු වියයුතු ය යි දක්වන සේක් 'සබබකායපටිසංවෙදී අසසසිසසාමි -පෙ- පසසසිසසාමීති සිකඛති'යි වදළ සේක.

එහි **'සිකඛති'** මෙසේ උත්සාහ කරයි. වැයම් කරයි. එසේ ආනාපානසතිය වඩන්නහුගේ යම් සංවරයක් වේ ද මෙය මෙහි අධිශීලශිකෂා නම් වේ. එබඳු වූවහුගේ යම් සමාධියක් වේ ද, මෙය අධිචිත්තශිකෂා නම් වේ. එබඳු වූවහුගේ යම් ප්‍රඥාවක් වේ ද, මෙය අධිප්‍රඥාශිකෂා නම් වේ. මේ ත්‍රිවිධ ශිකෂාවන් ඒ අරමුණෙහි ඒ ආනාපානයන් අරබයා පැවැති සිහියෙන් ඒ සිහිය පෙරටු කරගත් මනසිකාරයෙන් හික්මෙන්නේ ය. සෙවනය කරන්නේ ය. වඩාලන්නේ ය. බහුල කරන්නේය යි මෙසේ මෙහි අර්ථ දතයුතු ය. එහි යම් හෙයකින් ප්‍රථමභාවනාවෙහි හුදෙක් ආශ්වාස කටයුතු වේ ද, ප්‍රශ්වාස කටයුතු ම වේ ද, අන් කිසිවක් නො කටයුතු ද මෙතැන් පටන් ඤාතෝත්පාදනාදියෙහි යෙදීම කටයුතු වේ ද, එහෙයින් එහි **'අසසසාමීති පජානාති පසසසාමීති පජානාති'**යි වර්තමාන කාල වශයෙන් පාළිය කියා මෙතැන් පටන් කටයුතු වූ

ඥානොත්පාදනාදී වූ ආකාරය දක්වීම පිණිස **'සබ්බකායපටිසංවේදී අස්සසිස්සාමීති සික්ඛති'** යනාදි නයින් අනාගතවචන වශයෙන් පාළිය නගන ලද යි දතයුතු ය.

'පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමි -පෙ- පස්සසිස්සාමීති සික්ඛති' ඖදරික වූ ආශ්වාස ප්‍රශ්වාස කායසංස්කාරය සන්සිඳුවමින් දඩිව සන්සිඳුවමින් වළකාලමින් ව්‍යුපශමය කරමින් ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය. එහි මෙසේ ඖදරික සූක්ෂමභාවය ද ප්‍රශ්‍රබ්ධිය ද දතයුතු ය. පෙර කමටහන් වැඩීමට පටන් නො ගත් කාලයෙහි මේ මහණහුගේ කයත් සිතත් පරිදහ සහිත වේ. ඖදරික වූ කායචිත්තයන්ගේ ඖදරිකභාවය නො සන්සිඳුනු කල්හි ආශ්වාස ප්‍රශ්වාසයෝ ද ඖදරික වෙත්. ඉතා බලවත්ව පවතිත්. ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ යෑම ඊමට නැහැය ද නො පෙහොනී ය. මුඛයෙන් ආශ්වාස කරමින් ද ප්‍රශ්වාස කරමින් ද සිටියි. යම් කලෙක වනාහි මොහුගේ කාය චිත්තයෝ පරිගෘහිත වෙත් ද, කම්ඨාන වශයෙන් අරඹන ලද්දහු වෙත් ද, එකල්හි ඒ සංස්කාරයෝ ශාන්ත වූවාහු සන්සිඳුනාහු වෙත්. ඔවුන් සන්සිඳුනු කල්හි ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම්ව පවතිත්. ඇත්තාහු ද, නැත්තාහු ද යි පරීක්ෂා කටයුතු ආකාරයට පැමිණියාහු වෙත්. දුවැවිත් හෝ කඳුමුදුනකින් බැස හෝ මහත් බරක් හිසින් බහා තබා හෝ සිටි පුරුෂයාගේ ආශ්වාස ප්‍රශ්වාසයෝ යම්සේ මහත් වූවාහු වෙත් ද, නැහැය ආශ්වාස ප්‍රශ්වාසයට නො පොහොනී ද, මුඛයෙන් ආශ්වාස කරමින් ද ප්‍රශ්වාස කරමින් ද සිටී ද, යම් කලෙක වනාහි මෙතෙමේ ඒ විඩාව දුරුකොට නා පැන් බී තෙත් සළුවක් ලෙහි තබා සිහිල් සෙවණෙක හොත්තේ වේ ද, එකල්හි මොහුගේ ඒ ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම් වූවාහු වෙත්. ඇත්තාහු ද, නැත්තාහු ද යි විමසා බැලිය යුතු ආකාරයට පැමිණියාහු වෙත්. එපරිද්දෙන් ම කමටහන් අරඹන්නට පෙර මේ යොගී මහණහුගේ කය ද සිත ද -පෙ- විමසා බැලිය යුතු ආකාරයට පැමිණ සිටියාහු වෙති. එයට හෙතු කවරේ ද යත්:- එසේ මැ නු. මොහුට කමටහන් අරඹන්නට පෙර මහත් මහත් වූ සංස්කාරයන් සන්සිඳුවම් යි ආභොගසමන්නාහාරමනස්කාර ප්‍රත්‍යවෙක්ෂා යන මොවුහු නැත්තාහු. කමටහන් ඇරඹූ කාලයෙහි ආභොගසමන්නාහාර මනස්කාර ප්‍රත්‍යවෙක්ෂාවෝ ඇත්තාහු ය. එහෙයින් කමටහන් නො ඇරඹූ කාලයට වඩා කමටහන් ඇරඹූ කාලයෙහි මොහුගේ කායසංස්කාරය සියුම් වේ. එහෙයින් පුරාතනයෝ මෙසේ කීහු:- 'කයත් සිතත් පරිදහ සහිත කාලයෙහි ඉතා දඩිව පවතී. කය ද සිත ද පරිදහ රහිත කාලයෙහි සියුම්ව පවතී'යි

කමටහන් ඇරඹූ කාලයෙහි ඔඳරික වූ කායසංඛාරය ප්‍රථමධ්‍යානයාගේ උපචාරයෙහි සියුම් වේ. ප්‍රථමධ්‍යානයාගේ උපචාරයෙහි ද ඔඳරික වූයේ ප්‍රථමධ්‍යානයෙහි සියුම් වේ. ප්‍රථමධ්‍යානයෙහි හා දවිතීයධ්‍යානයාගේ උපචාරයෙහි ඔඳරික වූයේ දවිතියධ්‍යානයෙහි සියුම් වේ. දවිතීයධ්‍යානයෙහි ද තෘතීයධ්‍යානයාගේ උපචාරයෙහි ද ඔඳරික වූයේ තෘතීයධ්‍යානයෙහි සියුම් වේ. තෘතීයධ්‍යානයෙහි ද චතුත්‍රථධ්‍යානයාගේ උපචාරයෙහි ද ඔඳරික වූයේ චතුත්‍රථධ්‍යානයෙහි ඉතා සියුම් වේ. නො පැවැත්මට ම පැමිණේ. මේ වනාහි **දීඝභාණකසංයුත්තභාණකයන්ගේ** මතය වේ. **මජ්ඣිමභාණකයෝ** වනාහි ප්‍රථමධ්‍යානයෙහි ඔඳරික වූයේ දවිතීයධ්‍යානයාගේ උපචාරයෙහි සියුම්ය යි මෙසේ යට යට ධ්‍යානයන්ට වඩා මතු මතු ධ්‍යානයන්ගේ උපචාරයෙහි ද ඉතා සියුම් යි කැමැති වෙත්. සියල්ලන්ගේ මත විසින් වනාහි කමටහන් පටන් නො ගත් කල්හි පැවැති කායසංඛාරය කමටහන් පටන් ගත් කල්හි සන්සිඳී යන්නේ ය. කමටහන් පටන් ගත් කල්හි පැවැති කායසංඛාරය ප්‍රථමධ්‍යානයාගේ උපචාරයෙහි -පෙ- චතුත්‍රථධ්‍යානයාගේ උපචාරයෙහි පැවැති කායසංඛාරය චතුත්‍රථධ්‍යානයෙහි සන්සිඳී යන්නේය'යි ගතයුතු ය. මේ වනාහි ශමථයෙහි ක්‍රමය වේ.

විදර්ශනාවෙහි වනාහි කමටහන් පටන් නො ගත් කාලයෙහි පැවැති කායසංඛාරය ඔඳරික වේ. මහාභූතපරිග්‍රහයෙහි සියුම් වේ. එ ද ඔඳරික වේ. උපාදරූපපරිග්‍රහයෙහි සියුම් වේ. එ ද ඔඳරික වේ. සකලරූපපරිග්‍රහයෙහි සියුම් වේ. එ ද ඔඳරික වේ. අරූපපරිග්‍රහයෙහි සියුම් වේ. එ ද ඔඳරික වේ. රූපාරූපපරිග්‍රහයෙහි සියුම් වේ. එ ද ඔඳරික වේ. ප්‍රත්‍යයපරිග්‍රහයෙහි සියුම් වේ. එ ද ඔඳරික වේ. සප්‍රත්‍යය නාමරූපපරිග්‍රහයෙහි සියුම් වේ. එ ද දුර්විල විදර්ශනාවෙහි ඔඳරික වේ. බලවත් විදර්ශනාවෙහි සියුම් වේ. එහි 'අපරිග්‍රහිත කාලෙ' යනාදි වසයෙන් පෙර ශමථයෙහි කියූ නයින් ම පුරිම පුරිමයන්ගේ පශ්චිම පශ්චිමය සමග සන්සිඳීම දතයුතු ය. මෙසේ මෙහි ඔඳරික සූක්ෂමභාව හා ප්‍රශ්‍රබ්ධිය ද දතයුතු ය. **ප්‍රතිසම්භිදාවෙහි** වනාහි 'පස්සම්භයං කායසඞ්ඛාරං' යන මේ පදයාගේ අනුයොගපරිහාරයන් සමග මෙසේ අර්ථ කියන ලද්දේ ය: කායසංඛාරයන් සන්සිඳුවමින් ආශ්වාස කරන්නෙමි -පෙ- ප්‍රශ්වාස කරන්නෙමි යි කෙසේ හික්මේ ද යත්:- කායසංඛාරයෝ කවරහු ද යත්:- දීඝිකාකාර ආශ්වාසයෝ ය. මේ ආශ්වාස සඞ්ඛ්‍යාතධර්මයෝ කයෙහි වූහ. කායසන්නිශ්‍රිතයෝ ය. කයෙන් පිළියෙල කරණ ලද්දෝ ය. ඒ කායසංඛාරයන් සන්සිඳුවමින් අනුත්පාදනිරෝධයට පමුණුවමින්

මනා කොට ශාන්ත භාවයට පමුණුවමින් හික්මේ. දීඝීකාර ප්‍රශ්වාසයෝ කයෙහි වූහ. මේ ප්‍රශ්වාස ධර්මයෝ -පෙ- හ්‍රස්වාකාර ආශ්වාසයෝ - හ්‍රස්වාකාර ප්‍රශ්වාසයෝ - සියලු ආශ්වාස ප්‍රශ්වාසකාය මොනවට වැටහීමෙන් නුවණැසින් දක්නාහුගේ ආශ්වාසයෝ සියලු ආශ්වාස ප්‍රශ්වාසකාය මොනවට වැටහීමෙන් නුවණැසින් දක්නහුගේ ප්‍රශ්වාසයෝ කයෙහි වූහ. මේ ආශ්වාස ප්‍රශ්වාස සඞ්ඛ්‍යාත ධර්මයෝ කායප්‍රතිබද්ධයහ. කයින් පිළියෙල කරණ ලද්දහ. ඒ කායසංස්කාරයන් සන්සිඳුවමින් අනුත්පාද නිරෝධයට පමුණුවමින් මනා කොට ශාන්තභාවයට පමුණුවමින් හික්මේ. යම්බඳු වූ ඖදරික කායසංස්කාරයන් කරණ කොට කායයාගේ යම් ඉදිරියට නැමීමෙක් දෙපසට නැමීමෙක් සියලු පසට මනාව නැමීමෙක් පිටට නැමීමෙක් වේ ද, ඉඤ්ජන එඳන වලන කම්පනයෙක් වේ ද, ඉදිරියට නැමීම් ආදියට කරුණු වූ ඒ කායසංස්කාරයන් සන්සිඳුවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මේ. කායසංස්කාරයන් සන්සිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ. යම්බඳු වූ කායසංස්කාරයන් කරණ කොට කායයාගේ යම් ඉදිරියට නො නැමීමෙක් දෙපසට නො නැමීමෙක් සියලු පසට මනාව නො නැමීමෙක් පිටට නො නැමීමෙක් වේ ද, අනිඤ්ජන - අඵඳන - අවලන - අකම්පනයෙක් වේ ද, ඒ ශාන්ත වූ සියුම් වූ කායසංස්කාරය සන්සිඳුවමින් ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ. මෙසේ කියූ ලෙසින් ඉතා සියුම් වූ කායසංස්කාරය සන්සිඳුවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මේ ඉතා සියුම් වූ කායසංස්කාරය සන්සිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ. මෙසේ ඇති කල්හි ආශ්වාසාදිවාතය අරමුණු කොට පවත්නා චිත්තයාගේ ඉපැත්ම පැවැත්ම නො වේ. ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ඉපැත්ම පැවැත්ම නො වේ. ආනාපානලම්බන සමෘතියගේ ඉපැත්ම පැවැත්ම නො වේ. උක්තප්‍රකාර වූ සමාපත්තියට පණ්ඩිතයෝ සමවදනාහු ද නො වෙත්. නැගීසිටින්නාහු ද නො වෙත්. මෙසේ වනාහි කායසංස්කාරය සන්සිඳුවමින් ආශ්වාස කරන්නෙමි -පෙ- ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ. මෙසේ මේ සන්සිඳීම ඇති කල්හි ආශ්වාසාදිවාතය අරමුණු කොට පවත්නා ආනාපාන විඥ්ඤනයාගේ පැවැත්ම වේ. ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ද පැවැත්ම වේ. ආනාපානසමෘතියගේ ද පැවැත්ම වේ. ආනාපානසමෘති සමාධියගේ ද පැවැත්ම වේ. උක්තප්‍රකාර සමාපත්තියට පණ්ඩිතයෝ සමවදනාහු ද වෙත්. එයින් නැගී සිටින්නාහු ද වෙත්. ඒ කුමක් මෙන් ද යත්:- කසුන් බඳුනකට ගැසූ කල්හි යම්සේ පළමු කොට එහි ඖදරික ශබ්දයෝ පවතින්ත් ද, ඖදරික ශබ්දයන්ගේ නිමිත්ත මනා කොට ගත් බැවින් මැනැවින් සිත්හි කළ බැවින් මැනැවින් විමසූ බැවින් ඒ ඖදරික ශබ්දය නිරුද්ධව ගිය කල්හි ද නැවත පසුව සියුම් වූ ශබ්දයෝ පවතින්ත් ද, ඒ

සියුම් වූ ශබ්දයන්ගේ නිමිත්ත මනා කොට ගත් බැවින් මැනැවින් සිත්හි කළ බැවින් මැනැවින් විමසූ බැවින් සියුම් ශබ්දය නිරුද්ධව ගිය කල්හි ද, නැවත පසුව සියුම් වූ ශබ්දයාගේ නිමිත්තාරම්මණතාවෙන් සිත පවතී ද, එපරිද්දෙන් ම පළමු කොට ඖදරිකාශ්වාස ප්‍රශ්වාසයෝ පවතිත්. ඖදරිකාශ්වාසප්‍රශ්වාසයන්ගේ නිමිත්ත මනා කොට ගත් බැවින් මැනැවින් සිත්හි කළ බැවින් මැනැවින් විමසූ බැවින් ඖදරිකාශ්වාස ප්‍රශ්වාසයන් නිරුද්ධව ගිය කල්හි ද නැවත පසුව සියුම් වූ ආශ්වාස ප්‍රශ්වාසයෝ පවතිත්. සියුම් වූ ආශ්වාසප්‍රශ්වාසයන්ගේ නිමිත්ත මනා කොට ගත් බැවින් මැනැවින් සිත්හි කළ බැවින් මැනැවින් විමසූ බැවින් සියුම් වූ ආශ්වාසප්‍රශ්වාසයන් නිරුද්ධව ගිය කල්හි ද, නැවත පසුව සියුම් වූ ආශ්වාසප්‍රශ්වාස නිමිත්තාරම්මණතාවෙන් ද සිත වික්ෂේපයට නො පැමිණේ. මෙසේ ඇති කල්හි ආශ්වාසාදිවාතාලම්බනයාගේ ද ඉපැත්ම පැවැත්ම වේ. ආශ්වාසප්‍රශ්වාසයන්ගේ ඉපැත්ම පැවැත්ම වේ. ආනාපාන සතිය‍ගේ ද ඉපැත්ම පැවැත්ම වේ. ආනාපානසතිසමාධියගේ ද ඉපැත්ම පැවැත්ම වේ. ඒ සමාපත්තියට පණ්ඩිතයෝ සමවදනාහු ද වෙත් එයින් නැගී සිටින්නාහු ද වෙත්. 'පස්සම්භයං කායසඞ්ඛාරං' යන මෙහි ආශ්වාසප්‍රශ්වාසයෝ කාය නම් වෙති. එළැඹ සිටීම සතිය ය. අනුකූල දර්‍ශනය ඥනය ය. කය උපස්ථාන නම්. සතිය නො වේ සතිය උපස්ථාන ද සතිය ද වේ. ඒ සතියෙන් ඒ ඥනයෙන් ඒ කය නැවත නැවත බලන්නේ ද එහෙයින් 'කායෙ කායානුපස්සනාසතිපට්ඨාන භාවනා' යි කියනු ලැබේ. මේ වනාහි මෙහි පළමු කොට කායානුපස්සනා වසයෙන් කියූ ප්‍රථම චතුෂ්කය පිළිබඳ අනුපුබ්බපදවණ්ණනා යි දතයුතු ය.

යම්හෙයකින් වනාහි මෙහි මෙම චතුෂ්කය ආදිකර්මිකයාගේ කම්ඨාන වශයෙන් කියන ලද්දේ ද, අනෙක් තුන් චතුෂ්කයෝ මෙහි පැමිණි ධ්‍යාන ඇත්තහුට වෙදනානුපස්සනා - චිත්තානුපස්සනා - ධම්මානුපස්සනා වශයෙන් කියනලද්දාහු ද එහෙයින් මේ කමටහන වඩා ආනාපානයෙහි උපදවාගත් චතුත්‍රථධ්‍යානය පාදක කොට ඇති විදර්‍ශනාවෙන් සිවුපිළිසැඹියාවන් සමග රහත්බවට පැමිණෙනු කැමැති බුද්ධපුත්‍රයාවිසින් යමක් කටයුතු ද, ඒ සියල්ල මෙහි ම ආදිකර්මික කුලපුත්‍රයාගේ වසයෙන් මුල පටන් මෙසේ දතයුතු ය.

පළමු කොට ප්‍රාතිමොක්ෂසංවරාදි චතුර්විධ ශීලය පිරිසිදු කළයුතු ය. එහි චතුර්විධ ශීලවිශොධනයෙහි සප්තාපත්තිස්කන්ධයන්ගෙන් එක්තරා එකකට ද නො පැමිණීම, පැමිණියා වූ ආපත්තීන්ගෙන් දෙසීමෙන් හා පිරිවෙස් ඇ පිරීමෙන් නැගී සිටීම, ක්‍රොධාදිකෙලශයන්ගෙන් නො පෙළීමැයි විශොධනාව තෙපරිදි වන්නීය. මෙසේ ඉතා පිරිසිදු සිල් ඇත්තාහුගේ ම

භාවනා තොමෝ සමෘද්ධ වන්නීය. වෙතියඩඟණවත්ත බොධියඩඟණවත්ත - උපජ්ඣායවත්ත - ආචරියවත්ත - ජන්තාඝරවත්ත - උපොසථාගාරවත්ත - දෙයසූ බන්ධකවත්ත - තුදුස්වැදෑරුම් මහාවත්ත - ආගන්තුකවත්ත යන මොවුන්ගේ වසයෙන් යම් මේ ආභිසමාචාරික සීලයක් කියනු ලැබේ ද, එ ද මනාකොට පිරිය යුතු ය. යමෙක් වනාහි 'මම සිල් රකිමි, ආභිසමාචාරිකයෙන් කවර වැඩෙක් ද' යි කියන්නේ නම් ඔහුගේ ශීලය පිරෙන්නේ ය, යන මේ කාරණය නො දන්නේ ය ආභිසමාචාරය පිළිබඳ වත් පිරූ කල්හි ශීලය පිරෙන්නේ ය. ශීලය පිරී සිටි කල්හි සමාධිය ගැබ් ගන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් 'සො වත භික්ඛවෙ භික්ඛු ආභිසමාචාරිකං ධම්මං අපරිපූරෙත්වා සීලානි පරිපූරෙස්සතීති නෙතං ඨානං විජ්ජති' යන මෙය වදරණ ලද්දේ ය. මෙය විස්තර කටයුතු ය. කරුණු මෙසේ බැවින් ඔහු විසින් යම් මේ වෙතියඩඟණවත්තාදිය ආභිසමාචාරිකශීලය යි කියනු ලැබේ ද, එ ද මනාකොට පිරිය යුතු ය.

එයින් මතු ආවාසපළිබොධ - කුලපළිබොධ - ලාභපළිබොධ - ගණපළිබොධ - පස්වන කම්මපළිබොධ - අද්ධානපළිබොධ - ඤාතිපළිබොධ - ආබාධපළිබොධ - ගන්ථපළිබොධ - ඉද්ධිපළිබොධ යන ඔවුහු දස පළිබොධයෝ යි.

මෙසේ කියනලද දස පළිබොධයන් අතුරෙහි යම් පළිබොධයක් ඇත්තේ ද ඒ පළිබොධය සිදහළ යුතු ය. මෙසේ සිදහළ පළිබොධ ඇත්තහු විසින් කමටහන් උගත යුතු ය. ඒ කමටහන, **සබ්බත්ථක කම්මට්ඨාන - පාරිහාරිය කම්මට්ඨාන** යි දෙවැදරුම් වේ. එහි භික්ෂු සඞ්ඝයාදීන් කෙරෙහි මෛත්‍රිය ද මරණානුස්සතිය ද යන මේ දෙක **සබ්බත්ථක කම්මට්ඨාන** නම් වේ. ඇතැම් කෙනෙක් **අසුභසංඥ** යි කියත්. කමටහන්හි යෙදී ගත් මහණහු විසින් පළමු කොට වනාහි පිරිසිද ගෙණ සීමාවෙහි සිටි භික්ෂුසඞ්ඝයා කෙරෙහි මෛත්‍රිය වැඩිය යුතු ය. ඉනික්බිති සීමාවෙහි සිටි දෙවතාවන් කෙරෙහි ද, ඉන්පසු ගොදුරු ගමෙහි ඊඤ්චර ජනයා කෙරෙහි ද, ඉන්පසු එහි මිනිසුන් පටන් සියලු සත්ත්වයන් කෙරෙහි ද මෛත්‍රිය වැඩිය යුතු ය. ඒ යෝගාවචර මහණතෙමේ භික්ෂුසඞ්ඝයා කෙරෙහි කළ මෛත්‍රිය කරණ කොට එක්ව වසන මහණුන්ගේ සිත්හි මොළොක් බව උපදවයි. එකල්හි ඔහුගේ සැපසේ වසන බව වේ. සීමාවෙහි සිටි දෙවතාවන් කෙරෙහි කළ මෛත්‍රිය කරණ කොට මොළොක් සිත් ඇති දෙවතාවන් විසින් දහමි රැකුමෙන් මැනැවින් කළ රැකුම් ඇත්තේ වේ. ගොදුරුගමිහි ඊඤ්චර ජනයන් කෙරෙහි කළ මෛත්‍රිය කරණ කොට මොළොක්ව ගිය සිත් සතන් ඇති ඊඤ්චර

ජනයන් විසින් දහැමි රැකුමෙන් මොනවට රක්නා ලද පිරිකර ඇත්තේ වේ. එහි මිනිසුන් විසින් නො පෙළනලද්දෙක්ව හැසිරෙන්නේ ය. සියලු සත්ත්වයන් කෙරෙහි කළ මෛත්‍රිය කරණ කොට සියලු තන්හි නො පැකුළුණු හැසිරීම් ඇත්තේ වේ.

මරණසතිය කරණ කොට වනාහි 'එකාන්තයෙන් මළයුතුය' යි සිතන්නේ එක්විසි අනෙසන හැරපියා මතු මතුවෙහි වැඩෙන සංවෙග ඇත්තේ මනා පිළිවෙත්හි ඇරඹූ වැර ඇත්තේ වේ. අශුභසංඥව කරණ කොට දිව්‍යාලම්බනයන්හි ද තෘෂ්ණාව නො උපදියි. එහෙයින් මොහුගේ මේ තුණ, මෙසේ බොහෝ උපකාර බැවින් 'සියලු ශ්‍රමණ කාය්‍යයන්හි පැතිය යුතු ය. කැමැති විය යුතුය'යි කොට අදහස් කළ යොගීහුගේ භාවනාවෙහි එක්වන් යෙදෙන ඒ යොගානුයොග කර්මයට නිෂ්පත්ති හෙතු බැවින් **සඞ්ඛෙපක කම්මට්ඨානයි** කියනු ලැබේ. අටතිස් අරමුණු අතුරෙහි යම් අරමුණක් යමක්හුගේ චරිතයට අනුකූල වේ ද, ඒ අරමුණ ඔහු විසින් නිරතුරුව යථොක්ත නයින් ම පරිහරණය කටයුතු බැවින් **පාරිහාරියකම්මට්ඨානයි** ද කියනු ලැබේ. මෙහි වනාහි මේ ආනාපානසතිකම්මට්ඨානය ම පාරිහාරියකම්මට්ඨාන යි කියනු ලැබේ. මේ මෙහි කෙටි කතා ය. විස්තරය වනාහි සීලවිසොධනකථාව ද පළිබොධුපවෙජදකථාව ද දැනගණු කැමැත්තහු විසින් විශුද්ධිමාර්ගයෙන් දතයුතු ය.

මෙසේ පිරිසිදු සිල් ඇති සිදහළ පළිබොධ ඇති මේ කමටහන උගන්නහු විසින් මේ කමටහනින් ම චතුර්ථධ්‍යානය උපදවා විදසුන් වඩා රහත්බවට පැමිණි බුද්ධපුත්‍රයන්හුගේ සමීපයෙහි ම මෙය උගත යුතු ය. රහත්වූවකු නො ලබන්නහු විසින් අනැගැමියන්හුගේ ද, අනැගැමියකු නො ලබන්නහු විසින් සෙදගැමියකුහුගේ ද, සෙදගැමියකු නො ලබන්නහු විසින් සෝවාන්වූවන්හුගේ ද, සෝවාන්වූවකු නො ලබන්නහු විසින් ආනාපානචතුර්ථධ්‍යානලාභියන්හුගේ ද, චතුර්ථධ්‍යානලාභියකු නො ලබන්නහු විසින් පෙළෙහි හා අටුවාවෙහි නො මුළා වූ විනිශ්චයාචාර්‍යයන්හුගේ සමීපයෙහි උගත යුතු ය. රහත් ආදීහු තමන් ගිය මග ම කියත්. මෙතෙමේ වනාහි ගස් ගල් ආදිය ගහන පෙදෙසෙක කම්සථානවිථිය මහාභාසිපථයක් කොට දක්වන්නකු මෙන් හැම තැන නො මුළා වූයේ උපකාරානුපකාරයුකිමාර්ග පිරිසිද කියාලන්නේ ය. එහි මේ අනුපූර්වකථා තොමෝ ය:-

සැහැල්ලු පැවතුම් ඇති විනයාචාරයෙන් යුක්ත වූ ඒ මහණහු විසින් කියූ ආකාර ඇති ආචාර්‍යවරයකු වෙත එළැඹ වත්පිළිවෙතින්

සතුටු කළ සිත් ඇති ඒ ආචාර්‍යවරයාගේ සමීපයෙහි පඤ්චසන්ධික කම්සථානය උගත යුතු ය. එහි උදග්‍රහ - පරිපෘච්ඡා - උපසථාන - අර්‍පණා - ලක්‍ෂණ යන මොවුහු පඤ්චසන්ධීහු ය. එහි උදග්‍රහ නම් කමටහන් උගෙණීම ය. පරිපෘච්ඡා නම් කමටහන් විචාරීම ය. උපසථාන නම් කමටහන් නිමිති වැටහීම ය. අර්‍පණා නම් මෙසේ කම්සථානයට පැමිණේය යි කම්සථානයට පැමිණීම ය. ලක්‍ෂණ නම් කම්සථානයාගේ සභාවය යි. මේ කම්සථානය මෙසේ ලක්‍ෂණැ යි කම්සථානය පිළිබඳ සභාවය යි. මේ කම්සථානය මෙසේ ලක්‍ෂණැ යි කම්සථානය පිළිබඳ සභාවය සැලකීමය යි කියන ලද්දේ වේ. මෙසේ කොටස් පසකින් යුත් කමටහන උගන්නේ තෙමේ ද වෙහෙසට පත් නො වේ. ආචාර්‍යයා ද නො වෙහෙසයි. එහෙයින් මදක් උදෙසවා ගෙණ බොහෝ කලක් හදරා මෙසේ කොටස් පසකින් යුත් කමටහන උගෙණ ඉදින් එහි සත්‍ප්‍රාය වේ නම් එහි ම විසිය යුතු ය. ඉදින් එහි සත්‍ප්‍රාය නො වේ නම් ඇදුරහු විචාරා මද නුවණැත්තේ වේ නම් යොදුනක් පරම කොට ඇති තන්හි ගොස්, ඉදින් තියුණු නුවණැත්තේ වේ නම් දුර ද ගොස් අටළොස් සෙනසුන් දෙසින් දුරු වූ පස් සෙනසුන් අතින් යුක්ත වූ සෙනසුනක් කරා එළැඹ සිදහළ කුඩා පළිබොධ ඇතිව කළ බත් කිස ඇතිව එහි වසන්නහු විසින් බත් මත සන්සිඳුවා තෙරුවන් ගුණ සිහිකිරීමෙන් සිත පහදවා ගෙණ ඇදුරහු වෙතින් උගත් භාවනා විධීන්ගෙන් එක් පදයකුදු මුළා නො කරන්නහු විසින් මේ ආනාපානසතිකම්මට්ඨානය මෙනෙහි කළ යුතු ය. මෙහි මේ සඞ්ඛේපකථා ය. මෙහි විත්‍ථාරය මේ කථා මාර්‍ගීය ඥානගණු කැමැත්තහු විසින් විශුද්ධිමාර්‍ගයෙන් දතයුතු ය. 'මේ ආනාපානසතිකම්මට්ඨානය සිත්හි කටයුතුය'යි යමක් කියනලද ද එහි මේ මනසිකාර විධිය යි:-

'ගණනා අනුබන්ධනා - ඵුසනා ඨපනා සල්ලක්‍ඛණා,
විවට්ටනා පාරිසුද්ධි - තෙසඤ්ච පතිපස්සනා'ති

එහි ගණනා නම් ගිණීම ම ය. අනුබන්ධනා නම් ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ අනුගමන වසයෙන් නිරතුරුව සිහියට අනුව පැවැත්ම ය. ඵුසනා නම් ආශ්වාස ප්‍රශ්වාසයන් විසින් පැහැදූ තැන ය. ඨපනා නම් සිත මනාකොට අරමුණෙහි තැබීම ය. සල්ලක්‍ඛණා නම් විදර්‍ශනා ය. විවට්ටනා නම් මාර්‍ගීය ය. පාරිසුද්ධි නම් ඵලය ය. 'තෙසඤ්ච පතිපස්සනා' යනු ඔවුන්ගේ ම නැවත නැවත බැලීම ය.

එහි මේ ආදිකර්‍මික කුලපුත්‍රයා විසින් පළමු කොට ගණනින් මේ කම්සථානය මෙනෙහි කටයුතු ය. ගණින්නහු විසින් ද පස් කොටසින්

යට නො තැබිය යුතු ය. දස කොටසින් උඩට නො පැමිණවිය යුතු ය. මේ අතර එක, තුණ, පස යි ගණන් කැඩීම නො දක්විය යුතු ය. පසකින් යට ගණන් තබන්නහුට සම්බාධ වූ ගණනවීථිසඞ්ඛ්‍යාත අවකාශයෙහි චිත්තොත්පාදය සැලෙන්නේ ය. ඉඩ පහසු රහිත වූ ගාලෙක සිරකර තැබූ ගෙරිසමූහයක් මෙනි. දසයකින් උඩට පමුණු වන්නහුට චිත්තොත්පාදය කමටහන් ඇසුරු නො කොට ගණන ම ඇසුරු කොට පවත්නේ ය. අතර කඩ දක්වන්නහුගේ සිත 'මාගේ කම්සථානය මුදුන් පැමිණියේ ද, නො පැමිණියේ ද'යි කම්පිත වන්නේ ය. එහෙයින් මේ දෙෂයන් දුරු කොට ගිණිය යුතු ය. ගණින්නහු විසින් ද පළමු කොට සෙමින් ගිණීම යි කියූ වී මණින්නහු ගේ ගණනින් ගිණිය යුතු ය. වී මණින්නේ වනාහි නැළිය පුරවා එකයි කියා නැළියෙහි තුබූ වී බහාලන්නේ ය. නැවත නැලියෙහි වී පුරවන්නේ කිසියම් කසළක් දක එය හැර දමමින් 'එක එක' යි කියන්නේ ය. 'දෙක දෙක' යනාදි ගණන්හි ද මේ ක්‍රමය වේ.

එපරිද්දෙන් ම මේ යොගාවචරයා විසින් ද ආඤ්ඣාස ප්‍රඤ්ඣාසයන් අතුරෙහි යමක් වැටහේ ද, එය අල්ලා ගෙණ එක, එක යි ගිණීම ආදි කොට දස ය, දස ය යන තැන් දක්වා පවත්නා පවත්නා ආඤ්ඣාස ප්‍රඤ්ඣාස සලකා ගෙණ ම ගිණිය යුතු ය. මෙසේ ගණින්නා වූ ඒ යොගාවචරයාහට පිටතට නික්මෙන ඇතුළට වදින ආඤ්ඣාස ප්‍රඤ්ඣාසයෝ ප්‍රකට වන්නාහු ය. ඉක්බිති මේ යොගාවචරයා විසින් ඒ ලැසි ගිණීම වූ ධාන්‍යමාපකගණන හැරපියා සෙද ගිණීම වූ ගොපාලකගණනින් ගිණිය යුතු ය. දක්ෂ වූ ගොපලු තෙමේ වනාහි බොරළුකැට උඩොක්කුවෙහි ලා ගෙණ රැහන් දඬු ගත් අත් ඇතිව උදැසන ම ගාලට ගොස් ගෙරින් පිටට ගසා ඉදිකඩුලු ටැම්මතුවෙහි හුන්නේ ඉදිදෙරට පැමිණි පැමිණි දෙන ම බලා 'එකියක, දෙන්නෙකැ'යි බොරළුකැට දමමින් ගණින්නේ ය. තුන්යම් රෑ මුළුල්ලෙහි ඉඩ පහසු නැති ගාලතුළ දුකසේ විසූ ගෙරිසමූහතෙමේ නික්මෙන්නේ උන් උන් ඇල ගටමින් වහ වහා කැටි කැටිව නික්මෙන්නේ ය. ඒ ගොපලු තෙමේ ද වහ වහා තුණ, හතර, පස -පෙ- දස යි ගණින්නේ ම ය. මෙසේ පෙර කියූ නයින් ගණින්නා වූ මේ යොගාවචරයාහට ආඤ්ඣාස ප්‍රඤ්ඣාසයෝ ප්‍රකටව වහ වහා නැවත නැවත හැසිරෙන්නාහුය.

ඉක්බිති ඒ යෝගාවචරයා විසින් ආඤ්ඣාස ප්‍රඤ්ඣාසයෝ නැවත නැවත හැසිරෙත් යි දැන ඇතුළත පිටත වාතය අල්ලා නො ගෙණ දෙරකඩට පැමිණියහු ම දෙරකඩට පැමිණියහු ම ගෙණ එකෙක, දෙකක, තුණෙක, සතරෙක, පසෙක, එකෙක, දෙකෙක, තුණෙක, සතරෙක,

පයෙක, සයෙක, සතෙක, අටෙක, නවයෙක, දසයෙකැ යි වහ වහා ගිණිය යුතුම ය. ගණනින් පිළිබැඳි කම්සථානයෙහි ගිණීමෙහි බලයෙන්ම සිත එකඟ වන්නේ ය. රිටෙහි උපකාරයෙන් සැඩපහරෙහි නැව තැබීම මෙනි. මෙසේ වහ වහා ගණින්නා වූ ඒ යොගාවචරයාහට කම්සථානය නිතර පවත්නක්හු මෙන් වැටහෙන්නේ ය. එසේ වැටහෙන කල්හි නිතර පවතීය'යි දන ඇතුළත පිටත වාතය අල්ලා නො ගෙණ පෙර නයින් ම වහ වහා ගිණිය යුතු ය. ඇතුළට පිවිසෙන වාතය සමග සිත ප්‍රවෙශ කරන්නහුට ඇතුළත වාතයෙන් පහරණ ලද්ද, මේද තෙලින් පිරුණක් මෙන් ද වැටහෙන්නේ ය. පිටතට නික්මෙන වාතය සමග සිත, පහස්නාලද අවකාශය මුදු නික්මවන්නහුට පිටත මහත් අරමුණෙහි සිත වික්‍ෂෙපයට පැමිණෙන්නේ ය. පැහැදූ අවකාශය වූ නාසිකාග්‍රයෙහි සිහිය පිහිටුවා භාවනා කරන්නහුගේ ම භාවනාව සිද්ධ වන්නී ය. එහෙයින් **'අනෙකා ච බහි ච වාතං අපරිග්ගහෙත්වා පුරිම නයෙනෙව වෙග වෙගෙන ගණෙතබ්බං'** යනු කියන ලද්දේ ය. මෙය කෙතෙක් කල් ගිණිය යුත්තේ ද යත්:- යම්තාක් කල් ගිණීමෙන් වෙන්ව ආශ්වාස ප්‍රශ්වාසාලම්බනයෙහි සිහිය පිහිටා සිටී ද, ඒ තාක් ගිණිය යුතු ය. පිටත පැතිරි විතර්කීයන්ගේ සිඳීම කෝට ආශ්වාස ප්‍රශ්වාසාලම්බනයෙහි සිහිය පිහිටුවනු පිණිස ම ගිණීම වේ.

මෙසේ ගිණීමෙන් මෙනෙහි කොට ඊට අනතුරුව අනුබන්ධනායෙන් මෙනෙහි කටයුතු ය. අනුබන්ධනා නම් ගණන් එකතු කොට සිහියෙන් නිරතුරුව පැවැති ආශ්වාස ප්‍රශ්වාසයන් අරමුණු කිරීම් වසයෙන් සිහියට අනුව පැවැත්ම ය. එ ද වනාහි ආදිමධ්‍යපය්‍යවසානානුගමන වශයෙන් මෙනෙහි නො කටයුතු ය. පිටත නික්මෙන වාතයට නැබ ආදිය වේ. හෘදයවාස්තුව මධ්‍යය වේ. නැහැය පයය්වසානය වේ. ඇතුළට පිවිසෙන වාතයට නැහයෙහි කෙළවර ආදිය වේ. හෘදයවාස්තුව මධ්‍යය වේ. නැබ පය්‍යවසානය වේ. එයට ද අනුව යන මොහුගේ වික්‍ෂෙපයට පැමිණි සිත දරථ සහිත භාවය පිණිස ද කම්සථාන මනස්කාරයාගේ වලනය පිණිස ද වේ. ඒ මෙසේ වදළේ ම යෝ- 'ආශ්වාසයාගේ ආදි මධ්‍යපය්‍යවසානය කරා සිහියෙන් අනුව යන්නහු ගේ ඇතුළත වික්‍ෂෙපයට පැමිණි සිත හෙතු කොට ගෙණ කය හා සිත දරථ සහිත ද වේ. කම්පිත ද වේ. වලිත ද වේ. ප්‍රශ්වාසයාගේ ආදි මධ්‍යපය්‍යවසානය කරා සිහියෙන් අනුව යන්නහුගේ පිටත වික්‍ෂෙපයට පැමිණි සිත හෙතු කොට ගෙණ කය හා සිත ද දරථ සහිත ද කම්පිත ද වලිත ද වේ' යි.

එහෙයින් අනුබන්ධනායෙන් මෙනෙහි කරන්නහු විසින් ආදි මධ්‍යපය්‍යවසාන වශයෙන් මෙනෙහි නො කටයුතු ය. කෙසේ මෙනෙහි

කටයුත්තේ ද යත්:- ඵුසනා වසයෙන් ද අප්පණා වසයෙන් ද මෙනෙහි කටයුතු ය. ගණනා අනුබන්ධනා වසයෙන් මෙන්, ඵුසනා වසයෙන් හා ඨපනා වසයෙන් වෙන් වූ මනස්කාරයක් නැත්තේ ය. ආඤ්ඣාස ප්‍රඤ්ඣාසයෙන් පහළ පහළ තන්හි ම ගණින්නේ ගණනින් ද ඵුසනයෙන් ද මෙනෙහි කරන්නේ ය. ඒ පහළ තන්හි ම ගණන එක් කොට හකුළුවා ඒ ආඤ්ඣාස ප්‍රඤ්ඣාසයන් සිහියෙන් ලුහුබඳින්නේ අප්පණා වසයෙන් ද සිත තබන්නේ අනුබන්ධනාවෙන් ද ඵුසනාවෙන් ද ඨපනාවෙන් ද මෙනෙහි කෙරේය යි කියනු ලැබේ.

ඒ මේ අර්ථය තෙමේ අටුවාවෙහි කියනලද පඬුල - ඛාරපාල උපමාවන්ගෙන් ද, ප්‍රතිසම්භිදාවෙහි කියනලද ඝණවොපමාවෙන් ද දතයුතු ය. එහි මේ පඬුලොපමාව යි:- යම්සේ පිළුතෙමේ හොවිල්ලෙන් කෙළින තම භාර්‍යාවගේ හා පුතුගේ හොවිල්ල පහකොට එහි ම හොවිලි ටැම් මුල හුන්නේ ක්‍රමයෙන් මෙහා එහා එන යන හොවිලි පුවරුවෙහි දෙකෙළවර හැ මැද ද දකියි. දෙකෙළවර ද මැද ද දැකීම පිණිස ව්‍යාවෘත නො වේ. එපරිද්දෙන් ම මේ යොගාවචර මහණ තෙමේ සම්‍යෘති වශයෙන් නාසිකාග්‍ර මුඛනිමිත්ත යන මොවුන්ගේ සමීපයෙහි සිට ආඤ්ඣාස ප්‍රඤ්ඣාස නැමැති හොවිල්ල පහ කොට එහි නාසිකාග්‍රාදි නිමිත්තෙහි ම සිහියෙන් යුක්තව හුන්නේ ක්‍රමයෙන් එන යන පහස ලද තන්හි ආඤ්ඣාස ප්‍රඤ්ඣාසයන්ගේ ආදි මධ්‍යපර්‍යවසානය කරා සිහියෙන් අනුව යන්නේ එහි ද සිත තබමින් දකියි. ඔවුන් දැකීම පිණිස ව්‍යාවෘත නො වේ. මේ පඬුලොපමා ය.

මේ වනාහි දෙවාරිකොපමා ය:- යම් සේ දෙරටුපල් තෙමේ තුවර ඇතුළත ද පිටත ද සිටි පුරුෂයන් අතින් 'තෝ කවරෙක් වෙහි, කොතැනින් ආයෙහි, කොතැන යෙහි, තාගේ අතැ කිමැ'යි නො විමසා ද, ඔහුට ඒ භාර නො වේ ද, දෙරකඩට පැමිණි පැමිණියහු ම විමසා ද එපරිද්දෙන් ම මේ මහණහුට ඇතුළට පිවිසි වාතයෝ ද, පිටතට නික්මුනු වාතයෝ ද භාර නො වෙත්. දෙරටුවට පැමිණි, දෙරටුවට පැමිණි වාතයෝ ම භාරවෙත්. මේ දෙවාරිකොපමා ය. කකවොපමාව වනාහි උපමෙය්‍යාර්ථ දර්‍ශනය පටන් මෙසේ දතයුතු ය.

'නිමිත්තං අස්සාසපස්සාසා - අනාරම්මණමෙකචිත්තස්ස,
අජානතො ච තයො ධම්මෙ - භාවනානුපලබ්භති.
නිමිත්තං අස්සාසපස්සාසා - අනාරම්මණමෙකචිත්තස්ස,
ජානතො ච තයො ධම්මෙ - භාවනා උපලබ්භතීති

යි මෙය කියන ලද්දේම ය.

උපනිබන්ධන නිමිත්තය ද ආශ්වාස ප්‍රශ්වාසයෝ ද එක් සිතකට අරමුණු නො වෙත්. නිමිත්තය ආශ්වාසය ප්‍රශ්වාසය යන ධර්ම තුණ අරමුණු කිරීම වසයෙන් නො දන්නහුට ආනාපානසති භාවනාව සිද්ධ නො වේ. උපනිබන්ධන නිමිත්තය ද ආශ්වාස ප්‍රශ්වාසයෝ ද එක් සිතකට අරමුණු නො වෙත්. ඒ ධර්මතුන දක්නහුට ආනාපානසති භාවනා තොමෝ සිද්ධ වේ.

මේ ධර්මතුන එක් සිතකට කෙසේ අරමුණු නො වෙත් ද? මේ ත්‍රිවිධධර්මයෝ කෙසේ අවිදිත නො වෙත් ද? සිත කෙසේ වික්ෂෙපයට නො යේ ද? භාවනා නිෂ්පාදක වූ වීර්‍යයක් පෙණේ ද? නීවරණයන් යටපත් කරණ සමාධිය එළවන භාවනාවෙහි යෙදීම කෙසේ සිදු කෙරේ ද? මතු මතුවෙහි ලෞකික ලොකොත්තර ගුණ විශෙෂයට කෙසේ පැමිණේ ද යත්:- සමබිම් පෙදෙසෙක තුබූ රුකක් යම්සේ ද, ඒ මේ රුක පුරුෂයෙක් තෙමේ කියතින් සිඳින්නේ ය. රුකෙහි පහස ලද කියත් දතුන්ගේ වසයෙන් පුරුෂයාගේ සිහිය එළැඹ සිටියා වේ. ආවා වූ හෝ ගියා වූ හෝ කියත්දත් නො දන්නා ලද්දේ නො වේ. රුක සිඳින වීර්‍යය ද පෙණේ. රුක සිඳින ක්‍රියාව ද සිදුකෙරේ. කොටස් කරමින් සිදු කළ යුතු ප්‍රයොජන විශෙෂයට පැමිණේ. සමබිම් පෙදෙසෙක බැහූ රුකක් යම් සේ ද උපනිබන්ධන නිමිත්තය ද මෙසේ ය. කියත්දත් යම් සේ ද, ආශ්වාස ප්‍රශ්වාසයෝ මෙසේ ය. යම් සේ රුකෙහි පහළ කියත්දතුන්ගේ වසයෙන් පුරුෂයාගේ සිහිය එළැඹ සිටියා වන්නී ද, ආවා වූ හෝ ගියා වූ හෝ කියත්දත් මෙනෙහි නො කෙරේ ද, ආවා වූ හෝ ගියා වූ හෝ කියත්දත් අප්‍රකට නො වේ ද, රුක සිඳින වීර්‍යයක් පෙණේ ද, රුක සිඳින ක්‍රියාවන් සිදුකෙරේ ද, ප්‍රයොජන විශෙෂයට පැමිණේ ද, එපරිද්දෙන් යොගාවචර මහණ තෙමේ නැහැය අග හෝ මුව නිමිත්තෙහි හෝ සිහි එළවා හුන්නේ වේ. ආවා වූ හෝ ගියා වූ හෝ ආශ්වාස ප්‍රශ්වාසයන් මෙනෙහි නො කරයි. ආවා වූ හෝ ගියා වූ හෝ ආශ්වාස ප්‍රශ්වාසයෝ අවිදිත නො වෙත්. වීර්‍යය ද පෙණේ. ප්‍රයොගය ද සිදු කරයි. ලෞකිකලොකොත්තරගුණ විශෙෂයට පැමිණේ.

පධානං යනු කවර ප්‍රධානයක් ද යත්:- භාවනාවට වැර ඇරඹූ යොගාවචරයාගේ කය ද සිත ද භාවනාකර්මයට සුදුසු වේ නම් මේ ප්‍රධාන නම්. ප්‍රයොගය කවරේ ද යත්:- ඇරඹූ වැර ඇත්තහුගේ චිත්තොපක්ලෙශ වූ නීවරණයෝ විෂ්කම්භණ වශයෙන් ප්‍රහීණ වෙත් ද කාමවිතර්කාදී වූ මිථ්‍යාවිතර්කයෝ ව්‍යපශමනය වෙත් ද මේ ප්‍රයොගය යි. විශෙෂය කවරේ ද යත්:- භාවනාවට ඇරඹූ වැර ඇති යොගාවචරයාගේ දශසංයොජනයෝ ප්‍රහීණ වෙත් ද සප්තඅනුශයෝ නැසී යෙත් ද, මේ

විශෙෂය යි. මෙසේ මේ උපනිබන්ධන ආශ්වාස ප්‍රශ්වාස යන ධර්මතුන එක් සිතකට අරමුණු නො වේ. මේ ධර්මතුන එක් සිතකින් නො දන්නා ලද්දේ නො වේ. සිත වික්ෂෙපයට නො යයි. වීර්‍යය ද පෙණේ. ප්‍රයොගය ද සිදු කෙරේ. ප්‍රයොජන විශෙෂය ලබයි.

'බුදුරජානන් වහන්සේ විසින් දෙශනා කරණලද ආනාපානසතිය යම් යොගාවචරයකු විසින් යම් සේ සමපුණි කරණ ලද්දී ද, මැනැවින් වඩන ලද්දී ද, පිළිවෙළින් පුරුදු කරණ ලද්දී ද, හෙතෙමේ වලාකුළින් මිදුනු සඳ මෙන් තමාගේ සකඩාදී වූ මේ ලොකය බබුලුවයි' මේ කකවොපමා ය.

මෙහි වනාහි මේ ආශ්වාසප්‍රශ්වාසය ආගතාගත වසයෙන් අමනසිකාරමාත්‍රය ම ප්‍රයොජනය යි දතයුතු ය. මේ කමටහන මෙනෙහි කරණ කිසිවක්හට නො බෝ කලකින් ම ප්‍රතිභාග නිමිත්ත ද උපදියි. සෙසු ධ්‍යානාඩගයන්ගෙන් ප්‍රතිමණ්ඩිත අපිණාසඩඛ්‍යාතඨපනාව ද නිෂ්පාදනය වේ. කිසිවක්හුගේ, ආශ්වාසප්‍රශ්වාසයන් ගණන් වසයෙන්ම මෙනෙහි කිරීමට පටන් ගත් කාලයෙහි පටන් අනුක්‍රමයෙන් ඖදරික ආශ්වාස ප්‍රශ්වාසයන් නිරුද්ධවීම් වසයෙන් කායදහය සන්සිඳී ගිය කල්හි කය ද සිත ද සැහැල්ලු වේ. සිරුර අහසෙහි නැගී යන ආකාරයට පැමිණියක් මෙන් වේ. යම් සේ කෙලෙස් දැවිලි සහිත සිරුරු ඇතිව ඇදක හෝ පුටුවක හෝ හිඳින්නහුගේ ඇද පුටු නැමේ ද හඬ නගා ද පසතුරුණු රැලි ගණී ද, එසේ කෙලෙස් දැවිලි සහිත සිරුරු ඇතිව ඇදක හෝ පුටුවක හෝ හිඳින්නහුගේ ඇද පුටු නැමේ ද හඬ නගා ද, පසතුරුණු රැලි ගණී ද, එසේ කෙලෙස් දැවිලි රහිත සිරුරු ඇතිව හිඳන්නහුගේ ඇද පුටු නො නැමේ. හඬ නො නගයි. පසතුරුණු රැලි නො ගණී. ඇද පුටු පුලුන් පොදින් පිරුණක් මෙන් වේ. කුමක් හෙයින් ද යත්:- යම්හෙයකින් කෙලෙස් දැවිලි රහිත කය සැහැල්ලු වේ ද, එහෙයිනි. එපරිද්දෙන් ම ගණන් වසයෙන් මෙනෙහි කරණ කාලයෙහි පටන් ඖදරික ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ නිරුද්ධවීමේ වශයෙන් කායදහය නිවී ගිය කල්හි කය ද සිත ද සැහැල්ලු වේ. සිරුර අහසෙහි නැගී යන ආකාරයට පැමිණියක් මෙන් වේ. ඒ යොගීහුගේ ඖදරික ආශ්වාස ප්‍රශ්වාසයන් නිරුද්ධ වූ කල්හි සියුම් වූ ආශ්වාස ප්‍රශ්වාස නිමිත්ත අරමුණු කොට සිත පවත්නේ ය. ඒ සිත ද නිරුද්ධව ගිය කල්හි නැවත නැවත එයට වඩා සුඛුමතර වූ සුඛුමතම වූ ආශ්වාස ප්‍රශ්වාස නිමිත්ත අරමුණු කොට සිත පවත්නේම ය. කෙසේ ද යත්:- යම් සේ පුරුෂයෙක් තෙමේ මහත් ලොහො කුරකින් ලොහො තලියකට ගසන්නේ නම් එක් පහරින් ම මහත් ශබ්දයක් උපදින්නේ ය. ඒ ඖදරික ශබ්දය අරමුණු

කොට ඔහුගේ සිත පවත්නේ ය. ඖදරික ශබ්දය නිරුද්ධව ගිය කල්හි නැවත පසුව සියුම් ශබ්ද නිමිත්ත අරමුණු කොට සිත පවතී. එ ද නිරුදධව ගිය කල්හි නැවත නැවත එයට වඩා අනික් අනික් සුක්‍ෂුමතර සුබුමතම ශබ්ද නිමිත්ත අරමුණු කොට සිත පවතී ම ය. මේ මෙසේය යි දතයුතු ය. මෙ ද කිය ලද්දී ය. 'සෙය්‍යථාපි කංසෙ ආකොටිතෙ' යනු විස්තරය වේ.

අන්‍ය කම්ඨානයෝ මතු මතුවෙහි යම් සේ ප්‍රකට වෙත් ද, මේ කම්ඨානය වනාහි එසේ නො වේ. මේ වනාහි මතු මතුවෙහි වඩත් වඩත් ම සියුම් බවට යන්නේ ය. වැටහීමට ද නො පැමිණේ. මෙසේ ඒ කම්ඨානය නො වැටහෙන කල්හි ඒ මහණහු විසින් හුනස්නෙන් නැගිට සම්කඩ ගසා දමා නො යායුතු ය. කුමක් කටයුතු ද යත්:- 'ආචාය්‍යියා විචාරන්නෙමි යි හෝ මාගේ කම්ඨානය දැන් නටුයේය'යි හෝ නො නැගිටිය යුතු ය. ඉරියවු වෙනස් කොට යන්නහුට කම්ඨානය අළුත් අළුත් ම වේ. එහෙයින් හුන්තැන ම හුන්නහු විසින් ම පෙර තමන් විසින් සාශී කිරීම් වසයෙන් සලකන ලද තැනින් කම්ඨානය එළවිය යුතු ය. මේ එහි කම්ඨානය එළවන උපාය ය. ඒ මහණහු විසින් කම්ඨානය නො වැටහෙන බව දැන 'මේ ආශ්වාසප්‍රශ්වාසයෝ නම් කොතැන ඇත්තාහු ද, කොතැන නැත්තාහු ද, කවරක්හට හෝ ඇත්තාහු ද, කවරක්හට හෝ නැත්තාහු ද'යි මෙසේ සැලකිය යුතු ය. නැවත මෙසේ සලකන්නහු විසින් 'මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ මවුකුස තුළ වසන්නවුන්ට නැත්තාහ, දියෙහි ගිලුනවුන්ට නැත්තාහ, විසංඥවූවන්ට, මළවුන්ට, චතුර්ථධ්‍යානයට සමවැදුනවුන්ට, රූපාරූපභවයන්හි උපන්නවුන්ට, නිරොධ සමාපත්තියට නැත්තාහයි දැන "පණ්ඩිතය තෝ මවුකුසට නොගියේම නො වෙහිද? දියෙහි නොගිලුනෙක් නොවෙහිද? විසංඥ නොවූයේ, නොමළේ චතුර්ථධ්‍යානයට නො සමවැදුනේ රූපාරූපභව හා නො යෙදුනේ නිරොධ සමාපත්තියට නො පැමිණියේ නො වෙහි ද? තට මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ ඇත්තාහු ම ය, නුවණ මඳ බැවින් කම්ඨානය හැමතින් ගන්නට නො හැක්කෙහි යි මෙසේ තමන් විසින් ම තෙමේ පෙරළා වොදනා කළයුතු ය.

එකල්හි මේ යොගීහු විසින් ප්‍රකෘතියෙන් පහස්නාලද අවකාශයා ගේ වසයෙන් සිත තබා මනස්කාරය පැවැත්විය යුතු යි. මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ වනාහි දීඝනාසය ඇත්තහුගේ නාසාපුටය ගටමින් පවතිත්. දීඝී නො වූ (කොට) නැහය ඇත්තහුගේ උඩු තොල් කෙළවර ගටමින් පවතිත්. එහෙයින් මේ යොගීහු විසින් 'ආශ්වාස ප්‍රශ්වාසයෝ මෙනම් තැන ගටත්' යි නිමිත්ත තැබිය යුතු ය. මේ අර්ථය සඳහා ම භාග්‍යවතුන්

වහන්සේ විසින් 'මහණෙනි! මම මුළා වූ සිහි ඇති නුවණ නැත්තහුට ආනාපානසතිය වැඩීම නො කියමි' යි වදරණ ලද්දේ ය. කිසියේත් ම යම්කිසි කම්සථානයක් වේ ද, එය සිහි ඇතියහුට ම නුවණ ඇතියහුට ම නිපදනේ ය. මෙයින් අන්‍ය කම්සථානයක් මෙනෙහි කරන්නහුට නිමිත්ත ප්‍රකට වේ. මේ ආනාපානසතිකම්මට්ඨානය ගරුක ය. ගරුභාවනාවක් වේ. බුදු පසේබුදු බුදුපුත් වූ මහාපුරුෂයන්ගේ ම මනස්කාරභූමිය වූයේ ය. මේ කම්සථානය සුලු එකක් නො වේ. ලාමකසත්ත්වයන් විසින් සෙවුනා ලද්දක් නො වේ. යම් යම් අයුරකින් මෙනෙහි කරණු ලැබේ ද, ඒ ඒ අයුරින් ශාන්ත ද සියුම් ද වේ. එහෙයින් මේ ආනාපානසතියෙහි බලවත් සිහිය ද නුවණ ද කැමැති විය යුතු ය. යම් සේ පටසළුව මසන කාලයෙහි සියුම් වූ ඉදිකටුවක් කැමැති විය යුතු ද, එයට වඩා ඉතා සියුම් හිදිවිදින කටුවක් කැමැති විය යුතු ද, එපරිද්දෙන් ම පටසළුවක් සමාන වූ මේ කම්සථානය භාවනා කරණ කාලයෙහි හිදි සමාන වූ සිහිය ද, හිදිවිදින කටුව සමාන වූ ඒ භාවෙදුනු බලවත් නුවණ ද කැමැති විය යුතු ය. ඒ සමෘති ප්‍රඥවන්ගෙන් යුක්තවූ මහණහු විසින් ඒ ආශ්වාසප්‍රශ්වාසයෝ ප්‍රකෘතියෙන් පහස්නාලද අවකාශය හැර නො සෙවිය යුත්තාහ.

යම් සේ වනාහි ගොවියෙක් තෙමේ සීසෑම කොට ගොනුන් මුදහැර ගොදුරුබිමට අභිමුඛ කොට සෙවණෙක හුන්නේ විඩා හරින්නේද එකල්හි මොහුගේ ඒ ගොන්නු වෙගයෙන් දුවගොස් වනයට පිවිසෙන්නාහු ද, යම් ගොවියෙක් දක්ෂ වේ ද, ඒ ගොවි තෙමේ නැවත උන් අල්ලා ගෙණ වැඩෙහි යොදනු කැමැත්තේ උන්ගේ පා අනුව ගොස් වනයෙහි නො ඇවිදියි. එකල්හි රැහණ ද කැවිට ද ගෙණ සෘජුව ම ඒ ගොනුන් රැස්ව තොටට ගොස් හිඳින්නේ හෝ වෙයි. හෝනේ හෝ වෙයි. එකල්හි ඒ ගොනුන් දවල ඇවිද තණ කා රැස් වන තොටට බැස නා පැන් ද බී ගොඩ නැඟී සිටියවුන් දක රැහණින් බැඳ කැවිටෙන් විදිමින් ගෙණ අවුත් තගුලෙහි යොද නැවත වැඩ කෙරේ ද, එපරිද්දෙන් ම ඒ මහණහු විසින් ඒ ආශ්වාසප්‍රශ්වාසයෝ ප්‍රකෘතියෙන් පහස්නාලද අවකාශය හැර නො සෙවිය යුත්තාහ. සිහි නැමැති රැහණ ද නුවණ නැමැති කෙවිට ද ගෙණ සුභාවයෙන් පහස්නාලද තැන සිත තබා මනස්කාරය පැවැත්විය යුතු ය. මෙසේ මෙනෙහි කරණ මොහුට වැඩි දවස් නො ගොස් ම ආශ්වාස ප්‍රශ්වාසයෝ වැටහෙන්නාහ. පැන් තොටට පැමිණි ගොනුන් මෙනි. ඉක්බිති ඒ මහණහු විසින් ඒ ආශ්වාස ප්‍රශ්වාසයන් සිහි නැමැති රැහණින් බැඳ උපනිබන්ධන නම් වූ එතැන ම මනස්කාරයන් යොද නුවණ නැමැති කෙවිටෙන් විදින්නාහු නැවැත කම්සථානයෙහි යෙදිය යුතු ය. මෙසේ කම්සථානයෙහි යෙදෙන්නා

වූ ඔහුට නොබෝ කලකින් ම උදග්‍රහ නිමිත්ත හෝ ප්‍රතිභාග නිමිත්ත හෝ උපදියි. ඒ මේ නිමිත්ත හැමදෙනාහට ම එක හා සමාන නො වේ. වැලි කෙසේ ද යත්:- කිසිවක්හට සුවපහස් උපදවන ඉඹුල්පුලුන් පිඩක් මෙන් ද, කපුපුලුන් පිඩක් මෙන් ද, වායුධාරාවක් මෙන් ද වැටහේය යි ඇතැම් ඇදුරෝ කියත්. මේ වනාහි අට්ඨකථා විනිශ්චය යි:- මේ නිමිත්ත වනාහි කිසිවක්හට තාරකාවෙහි ප්‍රභාරූපයක් මෙන් ද, මිණිගුළියක් මෙන් ද, මුතුගුළියක් මෙන් ද, කිසිවක්හට රළුපහස් ඇති කපුඇටක් මෙන් ද, හරඳවඉද්දක් මෙන් ද, කිසිවක්හට දිගහවඩියක් මෙන් ද, මල්දමක් මෙන් ද, දුම්සිළක් මෙන් ද, කිසිවක්හට පතළ මකුළුහුයක් මෙන් ද, වලාපටලයක් මෙන් ද, නෙළුම් මලක් මෙන් ද, රියසකක් මෙන් ද, සඳමඬල මෙන් ද හිරුමඬල මෙන් ද වැටහේ.

ඒ මේ නිමිත්ත ද වනාහි යම් සේ බොහෝ මහණුන් සූත්‍රාන්තය හදරා හුන් කල්හි එක් මහණක්හු විසින් 'තොපට මේ සූත්‍රය කෙසේ වැටහේ ද'යි විචාළ කල්හි උන් අතුරෙහි එක් මහණෙක් 'මහා පර්වතයකින් ගලා බස්නා ගඩගාවක සේ මට වැටහේය'යි කීය. අනෙකෙක් 'මට එක් වනරොදක් සේ' ද, අනෙකෙක් 'මට සිහිල් සෙවණැති අතු පතරින් යුත් පලින් බර වූ රුකක් සේ ද වැටහේය'යි කීය. ඔවුන්ට ඒ එක් ම සූත්‍රය නිමිත්ත එළැඹ සිටීමට පෙර පැවැති සංඥාවන්ගේ නානාත්වයෙන් නොයෙක් අයුරින් වැටහුනේ ය. මෙසේ එක් ම කර්මස්ථානය සංඥානානාත්වයෙන් නොයෙක් ලෙසින් වැටහේ. මෙය නිමිත්ත සංඥාවෙන් හටගත්තේ ය. සංඥාව නිදන කොට ඇත්තේ ය. සංඥාව ප්‍රභවස්ථානය කොට ඇත්තේ ය. එහෙයින් සංඥා නානාත්ව හෙතුවෙන් නොයෙක් අයුරින් වැටහේය යි දතයුතු ය. මෙහිදු ආශ්වාසය අරමුණු කොට ඇති සිත අනෙකෙක් ම ය. ප්‍රශ්වාසය අරමුණු කොට ඇති සිත අනෙකෙක. නිමිත්ත අරමුණු කොට ඇති සිත අනෙකෙක. යම් යොගාවචරයක්හට මේ ආශ්වාස - ප්‍රශ්වාස - නිමිත්ත යන ධර්ම තුණ නැත්තේ ද ඔහුගේ කර්මස්ථානය අර්පණාවට නො ම පැමිණේ. උපචාරයට නො ම පැමිණේ. යම් යොගාවචරයක්හට වනාහි මේ ධර්ම තුණ ඇත්තේ ද, ඔහුගේ ම කර්මස්ථානය අර්පණාවටත් උපචාරයටත් පැමිණේ.

'නිමිත්තං අස්සාසපස්සාසා - අනාරම්මණමෙකචිත්තස්ස,
අජානතෝ ව තයෝ ධම්මෙ - භාවනා නුපලබ්භති.
නිමිත්තං අස්සාසපස්සාසා - අනාරම්මණමෙකචිත්තස්ස,
ජානතෝ ව තයෝ ධම්මෙ - භාවනා උපලබ්භති '

යන මෙය කියන ලද්දේ ය.

මෙසේ යථොක්ත ප්‍රතිභාග නිමිත්ත එළැඹ සිටි කල්හි ඒ මහණහු විසින් ඇදුරහු වෙතට ගොස් 'ස්වාමීනි! මට මෙවැන්නක් වැටහේය'යි කියයුතු ය. ඇදුරහු විසින් වනාහි 'මෙය නිමිත්තයි හෝ නිමිත්ත නොවේ' යි හෝ නො කිය යුතු ය. 'ඇවැත! භාවනාවෙහි යෙදෙන්නවුනට මෙසේ වේය' යි කියා 'නැවත නැවත මෙනෙහි කරව'යි කියයුතු ය. නිමිත්ත යි කියූ කල්හි 'නිමිත්ත ඉපදවීම දුෂ්කර ය, එය මා විසින් ලද්දේ ය, එහෙයින් මම දැන් යම් ඒ කලෙක විශෙෂය උපදවන්නෙම්'යි හැකිළීමට පැමිණෙන්නේ ය. 'නිමිත්ත නො වේය'යි කියූ කල්හි ආලය රහිතව පසුබස්නේ ය. එහෙයින් එදෙක ම නො කියා මනස්කාරයෙහි ම යෙදිය යුතුය යි මෙසේ වනාහි දීඝභාණකයෝ කීහ. මජ්ඣිමභාණකයෝ වනාහි 'ඇවැත! සත්පුරුෂය 'මේ නිමිත්ත ය, නැවත නැවතත් කර්මස්ථානය මෙනෙහි කරව' යි කියයුතුය යි කීහ. එකල්හි මේ යොගාවචරයා විසින් නිමිත්තෙහි ම සිත තැබිය යුතු ය. මෙසේ ඇති කල්හි මොහුගේ මේ ප්‍රතිභාගනිමිත්තොත්පත්තියෙහි පටන් මුලින් කියූ අනුබන්ධන ඵුසන දෙක හැර ඨපනා වසයෙන් මෝ භාවනාව වන්නී ය. පෙර ඇදුරන් විසින්:-

ධෙය්‍යවත් යොගීතෙමේ ආශ්වාස ප්‍රශ්වාසයන් නන් අයුරින් ප්‍රකට කරමින් නොහොත් ඖදරික ඖදරික ආශ්වාස ප්‍රශ්වාසයන් සන්සිඳුවමින් එහි යම් ප්‍රතිභාග නිමිත්තක් ලබන්නේ ද එහි සිත පිහිටුවමින් පිළිවෙළින් තමාගේ සිත ඒ ප්‍රතිභාග නිමිත්තෙහි අර්පණා වශයෙන් බඳින්නේය, යි කියන ලද්දේ ය.

මෙසේ ඔහුට නිමිත්ත වැටහුනු තැන් පටන් පඤ්චනීවරණයෝ යටපත් වූවාහු ම වෙත්. කෙලශයෝ සන්සිඳුනාහු ම වෙත්. සිහිය එළැඹ සිටියා ම වේ. සිත එකඟ වූයේ ම ය. මේ සිත උපචාර භූමියෙහි නීවරණ ප්‍රහාණයෙන් හෝ ධ්‍යානාධිගම අවස්ථාවෙහි ධ්‍යානාඞ්ගයන්ගේ පහළවීමෙන් හෝ යන දෙයාකාරයෙන් සිත එකඟ වේ. එහි උපචාරභූමි යනු උපචාර සමාධියයි. පටිලාභභූමි යනු අර්පණාසමාධියයි. ඔවුන්ගේ වෙනස කවරේ ද යත්:- උපචාර සමාධිය කුශලවීථියෙහි දුවගොස් භවාඞ්ගයට බස්නේ ය. අර්පණා සමාධිය දිවයහාගයෙහි පමුණුවා භුන්නහුට දවස මුළුල්ලෙහි ම කුශලවීථියෙහි දුවන්නේ ය. භවාඞ්ගයට නො බස්නේ ය. මේ සමාධි දෙක අතුරෙහි නිමිත්ත පහළ වීමෙහි දී උපචාර සමාධියෙන් සිත එකඟ වේ. එකල්හි යොගීහු විසින් ඒ නිමිත්ත, එළැඹ සිටි වණ්ණ වශයෙන් සිත්හි නො ම කටයුතු ය. ක්‍රූරභාවාදි ස්වභාවයෙන් හෝ අනිත්‍යාදිස්වභාවයෙන් හෝ ප්‍රත්‍යවෙක්ෂා නො කටයුතු ය. එතකුදු වුවත් කැත් මෙහෙසියක විසින් සක්විති ගැබක් මෙන් ද ගොවියකු විසින්

හැල්යවගැබක් මෙන් ද අප්‍රමත්ත වූවහු විසින් රැකිය යුතු ය. රක්නාලද නිමිත්ත වනාහි මොහුට ඵල දෙන්නේ වේ.

'නිමිත්ත රක්නාහට ලැබූ උපචාරඛ්‍යාන පරිහානියක් නැත්තේ ය. රැකීම් නැති කල්හි ලද ලද උපචාරඛ්‍යානය නැසී යන්නේ ය, මේ එහි රක්නා උපාය ය:- යම් ආවාසයෙක වසන්නහුට නො උපන් නිමිත්ත නො උපදී ද, උපන් නිමිත්ත නැසී යේ ද, නො එළැඹ සිටි සිහිය නො එළැඹ සිටී ද, එකඟ නො වූ සිත එකඟ නො වේ ද, එබඳු ආවාසය, සෙනසුනට උතුරෙන් හෝ දකුණෙන් හෝ ඉතා දුර වූ සැතපුම් එක්හමාරකට වඩා දුර වූ ආහාරපාන සුලභ නො වූ ගොදුරු ගම ය, දෙතිස් තිරශ්චීන කථාවට ඇතුළත් වූ දශකථාවසතු ඇසුරු නො කළ කථා ය, ශීලාදිගුණයුක්ත කථාවෙන් තොර වූ යමකු නිසා එකඟ නො වූ සිත එකඟ නො වේ ද, එකඟ වූ සිත නො එකඟ වේ ද එබඳු පුද්ගලයා තමහට නො සැප වූ භොජනය, නො සැප වූ සෘතුය, නො සැප වූ ඉරියවුය, යන මේ සප්තවිධ අසත්ප්‍රායයන් දුරුකොට කියන ලද්දවුනට වෙනස් වූ සත්ප්‍රාය වූ එම සත සෙවනය කරණ ඒ මහණහු විසින් නැවත නැවත ඒ නිමිත්ත මෙනෙහි කටයුතු ය. මෙසේ සත්ප්‍රාය සෙවනයෙන් නිමිත්ත ස්ථිර කොට වැඩීමට හටගැණීමට පමුණුවා, ආධ්‍යාත්මික බාහිරවසතු පිරිසිදු කිරීම, ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ සමබව කිරීම, භාවනාවෙන් ලත් නිමිත්ත රැකීමෙහි දක්ෂභාවය, යම් කලෙක සිත ප්‍රග්‍රහ කටයුත්තේද ඒකාලයෙහි චිත්තනිග්‍රහණය, යම් කලෙක සිත සතුටු කළ යුත්තේද, ඒ කාලයෙහි සිත සතුටු කිරීම, යම් කලෙක සිත නිග්‍රහ කටයුත්තේ ද; ඒ කාලයෙහි චිත්තනිග්‍රහණය, යම් කලෙක සිත මැදහත්ව බැලිය යුත්තේ ද ඒ කාලයෙහි සිත මැදහත්ව බැලීම, වික්ෂිප්ත පුද්ගලයන් දුරුකිරීම, සමාධිලාභී පුද්ගලයන් සෙවනය කිරීම, සමාධියට සිත නැමීම යන මේ දශඅඞ්ගා කෞශල්‍යයන් නො හරින්නහු විසින් වීර්‍ය්‍ය සමත්වයෙහි යොදා නැවත නැවත යොග කටයුතු ය.

මෙසේ යෙදී වසන ඒ යොගීහට අඞ්ගාව දන් උපදින්නීය යි හවාඞ්ගය සිඳගෙණ නිමිත්ත, අරමුණුකොට මනොද්වාරාවර්ජනය උපදන්නේ ය. එය නිරුද්ධව ගිය කල්හි ඒ අරමුණ ම ගෙණ සතරක් හෝ පසක් ජවනයෝ වෙත්. යම් ජවන කෙතකුත් අතුරෙහි පළමුවැන්න පරිකර්‍ම වේ ද, දෙවැන්න උපචාරය වේ ද,. තෙවැන්න අනුලොමය වේ ද, සිවුවැන්න ගොත්‍රභු වේ ද, එකල්හි පස්වැන්න අඞ්ගාවිත්තය වේ. නොහොත් පළමුවැන්න පරිකර්‍ම ද උපචාර ද වේ ද දෙවැන්න අනුලොමය වේ. තෙවැන්න ගොත්‍රභු වේ. සිවුවැන්න අඞ්ගාවිත්තය යි කියනු ලැබේ. සිවුවැනි වූ ම ගොත්‍රභුඥනය පස්වැනි වූ අඞ්ගාවිත්තයට හෝ පැමිණේ.

සවැන්නට හෝ සත්වැන්නට හෝ නො පැමිණේ. ලං වූ භවාඩ්ගපාතය ඇති බැවිනි. 'ආසෙවන ප්‍රත්‍යයයෙන් කුශල ධර්මයෝ බලවත් වෙති. එහෙයින් සවැනි වූ ජවන චිත්තයට හෝ සත්වැනි වූ ජවන චිත්තයට හෝ පැමිණේය යි ආභිධර්මික ගොදත්ත ස්ථවිරයන් වහන්සේ කීහ. ඒ කීම අට්ඨකථාවන්හි ප්‍රතික්ෂෙප කරණ ලදි. එහි පූර්වභාග තෘතීය චතුර්ථ චිත්තයෝ කාමාවචර වෙති. අර්හත්ත්ව චිත්තය වනාහි රූපාවචර වේ. මෙසේ මේ යොගීහු විසින් පඤ්චාඩ්ගයෙන් යුක්ත වූ දශලක්ෂණසමන්වාගත වූ ත්‍රිවිධකල්‍යාණයක් ඇති ප්‍රථමධ්‍යානය අවබොධ කරණ ලද්දේ වේ. ඒ යොගී තෙමේ එම අරමුණෙහි චිත්තෝදය සන්සිඳුවා දෙවන තෙවන සිවුවන ධ්‍යානයන්ට පැමිණේ. මෙපමණකින් ඨපනා වශයෙන් භාවනාවෙහි කෙළවරට පැමිණියේ වේ. මේ මෙහි කෙටිකතා ය. විස්තරය කැමැත්තහු විසින් විශුද්ධිමාර්ගයෙන් ගතයුතු ය.

මෙසේ මෙහි පැමිණි චතුර්ථධ්‍යානය ඇති මහණතෙමේ සලලක්ඛණා විවට්ටනා යන මොවුන්ගේ වසයෙන් කර්මස්ථානය වඩා කෙලෙස් කසළ හැර පාරිශුද්ධියට පැමිණෙනු කැමැත්තේ ඒ ධ්‍යානයම ආවජ්ජන - සමාපජ්ජන - අධිට්ඨාන - වුට්ඨාන - පච්චවෙක්ඛණ යන පස් අයුරින් වශීප්‍රාප්ත කොට ප්‍රගුණ කොට අරූපපූර්වභාග රූප යි හෝ රූපපූර්වභාග අරූප යි හෝ රූපාරූපකර්මස්ථානය පරිග්‍රහණය කොට විදර්ශනාව පිහිටුවයි. කෙසේ ද යත්:- ඒ යොගීතෙමේ වනාහි ධ්‍යානයෙන් නැගිට ධ්‍යානාඩ්ගයන් හා තත්සම්ප්‍රයුක්ත ධර්මයන් ලක්ෂණරසාදි වශයෙන් පරිග්‍රහණය කොට ඒ ධ්‍යානාඩ්ගයන්ට නිශ්‍රය වූ හෘදයවාස්තුව ද, එයට නිශ්‍රය වූ සතර මහාභූත ද ඔවුන්ට නිශ්‍රය වූ සියලුම කරජකාය ද දකින්නේ ය. ඉක්බිති ධ්‍යානාඩ්ගයන් අරූපය, හෘදයවාස්තු ආදිය රූපය යි රූපාරූප ව්‍යවස්ථා කරන්නේ ය. නොහොත් සමාපත්තියෙන් නැගිට කෙසාදි කොටස්හි පෘථිවි ධාත්වාදීන්ගේ වසයෙන් සතර මහාභූතයන් ද තන්නිශ්ශ්‍රිත රූපයන් ද ලක්ෂණරසාදිවශයෙන් පරිග්‍රහණය කළ රූපවාස්තුද්වාරාලම්බන වූ හෝ සම්ප්‍රයුක්තධර්මසහිත වූ විඤ්ඤාණය දකියි. ඉක්බිති භූතාදිරූපය සම්ප්‍රයුක්ත ධර්මසහිත වූ විඤ්ඤාණය දකියි. ඉක්බිති භූතාදිරූපය සම්ප්‍රයුක්ත ධර්මසහිත වූ විඤ්ඤාණය අරූප යි ව්‍යවස්ථා කරන්නේ ය. නොහොත් සමවතින් නැගිට ආශ්වාසප්‍රශ්වාසයන්ගේ උත්පත්තිය ද කරජකය ද සිත ද යන මොවුන් දකියි. යම්සේ කම්මුරන්ගේ ගිනි පිඹින සම් පසුම්බියෙන් පිඹින කල්හි සම් පසුම්බිය ද පුරුෂයාගේ එයට අනුරූප වූ ව්‍යායාමය ද නිසා වාතය හැසිරේ ද, එපරිද්දෙන් ම කයත් සිතත් නිසා ආශ්වාස ප්‍රශ්වාසයෝ ය. ඉක්බිති ආශ්වාසප්‍රශ්වාසයන් හා කය, රූපයි ද, සිත හා චිත්තසම්ප්‍රයුක්ත ධර්මයන් අරූපය යි ද

ව්‍යවසථා කරන්නේ ය. මෙසේ නාමරූප ව්‍යවසථා කොට ඒ නාමරූපයාගේ ප්‍රත්‍යය සොයන්නේ ය. සොයන්නේ ද එය දැක අතීතාදිකාලත්‍රයයෙහි නාමරූපය පිළිබඳ පැවැත්ම අරභයා 'මම අතීතයෙහි වූයෙමි දෝ' යනාදි නයින් පැවැති ෂොඩශවසතුක විචිකිචඡාව දුරු කරන්නේ ය. තරණය කළ සැක ඇත්තේ කලාප සම්මර්ශන වශයෙන් තිලකුණට නගා පටිපදඤාණදසසන විසුදධියට ඇතුළත් වූ උදයබබයානුපසසනාඤාණයට පෙරටුව උපන් ඔභාසාදී වූ දශවිදශීනොපකෙලශයන් හැර උපකෙලශයන්ගෙන් මිදුනු පටිපදඤාණය මාඝීය යි ව්‍යවසථා කොට උදයව්‍යයානුදශීනයෙන් ගන්නාලද සංසකාරයන්ගේ උදය හැර බිඳීම දක්නා භඞගානුදශීනයෙන් භයතොපසථානඥනයාගේ වසයෙන් එළැඹ සිටි සියලු සංසකාරයන්හි කලකිරෙමින් නොඇලෙමින් මිදෙමින් පිළිවෙළින් සතර ආයර්‍ය මාඝීයන්ට පැමිණ අර්හත්ඵලයෙහි පිහිටා එකුන්විසි ප්‍රභෙද වූ ප්‍රත්‍යවෙක්ෂා ඥනයාගේ කෙළවරට පැමිණියේ දෙවියන් සහිත ලොකයට අග්‍රදක්ෂිණාර්හයෙක් වේ. මෙපමණකින් මේ ආනාපානසමෘති කම්සථානිකයාගේ ගණන ආදි කොට විදශීනාව කෙළවර කොට ඇති ආනාපානසමෘති සමාධි භාවනා තොමෝ ද සමාපත්ත වූවා ය. මෝ සියලු අයුරින් ප්‍රථම චතුෂ්ක වර්ණනා තොමෝ ය.

අනික් තුන් චතුෂ්කයන්හි යම්හෙයකින් කම්සථාන භාවනා ක්‍රමයෙන් වෙන් වූ කම්සථාන භාවනානයක් නම් නැත්තේ ද, එහෙයින් පද අනුව ගිය වර්ණනා නයින් ම ඔවුන්ගේ අර්ථ දතයුතු ය. 'පීතිපටිසංවෙදී' ප්‍රීතිය මොනවට දන්නා ලද්දක් කරමින් ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ. එහි අරමුණු වසයෙන් ද අසමෙමාහ වසයෙන් ද යන දෙයයුරෙන් ප්‍රීතිය දන්නා ලද්දී වේ. ප්‍රීතිය අරමුණු වසයෙන් කෙසේ දන්නා ලද්දී වන්නී ද යත්:- ප්‍රීතිසහගත ප්‍රථම ද්විතීය ධ්‍යාන දෙකට සමවදියි. ඒ යෝගීහු විසින් සමාපත්තික්ෂණයෙහි ධ්‍යානප්‍රතිලාභය හෙතු කොට ආරම්මණ වසයෙන් ප්‍රීතිය දන්නා ලද්දී වේ. අරමුණ තමා මොනවට දත් බැවිනි. ප්‍රීතිය නො මුළා වසයෙන් කෙසේ දන්නාලද්දී වේ ද යත්:- ප්‍රීති සහගත ප්‍රථමද්විතීයධ්‍යාන දෙකට සමවැද එයින් නැගිට ධ්‍යානසම්ප්‍රයුක්ත ප්‍රීතිය ක්ෂය වශයෙන් ව්‍යය වශයෙන් සම්මර්ශනය කරයි. ඒ යොගීහු විසින් විදශීනා ක්ෂණයෙහි ප්‍රීතිය පිළිබඳ සවලක්ෂණ සාමාන්‍ය ලක්ෂණ ප්‍රතිවෙධ කිරීම හෙතු කොට නො මුළා වසයෙන් ප්‍රීතිය මොනවට දන්නාලද්දීවේ.

'දීඝාකාර අශ්වාසාලම්බන වශයෙන් ධ්‍යානයට ඇතුළත් වූ අවික්ෂෙපචිත්තයාගේ එකහ බව, නො විසිරීම නුවණින් දන්නහුට සිහිය එළැඹ සිටියා වේ. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ ප්‍රීතිය මොනවට දන්නා

ලද්දී වේ. දීඝාකාරප්‍රශ්වාසාලම්බන වශයෙන්, හ්‍රස්වාකාරආශ්වාසාලම්බන වශයෙන්, හ්‍රස්වාකාර ප්‍රශ්වාසාලම්බන වශයෙන් ආශ්වාසාලම්බන වශයෙන්, හ්‍රස්වාකාර හ්‍රශ්වාසාලම්බන වශයෙන් ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ වශයෙන් සියලු කය මොනවට දන්නේ, කාය සංස්කාරයන් සන්සිඳුවමින් ආශ්වාස ප්‍රශ්වාසාලම්බනයන්ගේ වශයෙන් ධ්‍යානපය්‍යාපන්න අවික්ෂෙප චිත්තයාගේ එකභ බව, නො විසිරීම තුවණින් දන්නහුට සිහිය එළැඹ සිටියා වේ. ඒ සිහියෙන් ඒ තුවණින් ඒ ප්‍රීති තොමෝ මොනවට දන්නා ලද්දී වේ. ධ්‍යානය ආවර්ජනය කරන්නහු විසින් ධ්‍යානපය්‍යාපන්න වූ ඒ ප්‍රීති තොමෝ මොනවට දන්නා ලද්දී වේ. සමාපත්ති ක්ෂණයෙහි අරමුණු වසයෙන් දන්නහු විසින් - විදසුන් තුවණින් ධ්‍යානයෙන් නැගිට දක්නහු විසින් - ධ්‍යානය ප්‍රත්‍යවෙක්ෂා කරන්නහු විසින් - 'මෙපමණ කල් ධ්‍යානයෙන් යුක්ත වන්නෙමි'යි ධ්‍යානචිත්තය ඉටන්නහු විසින් - ශ්‍රද්ධාවෙන් ශමථ විදර්ශනා වශයෙන් අදහන්නහු විසින් - වීර්‍ය්‍ය දැඩිව ගන්නහු විසින් - සිහිය එළවා තබන්නහු විසින් - සිත එකභබවට පමුණුවන්නහු විසින් - විදර්ශනා ඥනයට පූර්ඩගම වූ ප්‍රඥවෙන් දන්නහු විසින් - විශිෂ්ට ඥනයෙන් දතයුත්ත විදර්ශනා ඥනයට පූර්ඩගම වූ ප්‍රඥවෙන් දන්නහු විසින් - දුඃඛසත්‍යය තීරණප්‍රඥවෙන් හා මාර්ගප්‍රඥවෙන් ප්‍රහාණය කරන්නහු විසින් - මාර්ගසත්‍යය වඩන්නහු විසින් - නිරෝධසත්‍යය සාක්ෂාත් කරන්නහු විසින් ඒ ප්‍රීති තොමෝ මොනවට දන්නා ලද්දී වේ. මෙසේ ඒ ප්‍රීතිය දන්නා ලද්දී වේ, යන මෙය ප්‍රතිසම්භිදාවෙහි කියනලදී. සෙසු පද ද මේ නයින් ම අර්ථ වශයෙන් දතයුත්තේ ය.

මේ මෙහි විශෙෂමාත්‍රය යි:- ත්‍රිවිධධ්‍යානයන්ගේ වසයෙන් සැපය මනාකොට දක්බව, චතුර්විධ ධ්‍යානයන්ගේ වසයෙන් චිත්තසංස්කාරයන් මනාකොට දක්බව දතයුතු ය. චිත්තසඩ්ඛාර යනු වෙදනා-සඤ්ඤා යන ස්කන්ධ දෙක ය. සුඛපටිසංවෙදී පදයෙහි ද මෙහි විදර්ශනා භූමිය දක්වනු පිණිස, 'සුඛ යන මෙයින් කායික සුඛ - චෙතසික සුඛ' යි සුඛ දෙකක් ප්‍රතිසම්භිදාවෙහි කියනලදී.

'පස්සම්භයං චිත්තසඩ්ඛාරං' යනු මහත් මහත් වූ චිත්තසංස්කාරය සන්සිඳුවමින් නිරුද්ධ කරමින් යන අර්ථයි. සන්සිඳීම් ආකාරයෙන් කියූ ඒ නිරෝධය විස්තර වශයෙන් 'ඉමස්ස භික්ඛුනො අපරිගහිත කාලෙ' යනාදීන් කායසංස්කාරයෙහි කියූ නයින් දතයුතු ය. වැලිදු මෙහි 'පීතිපටිසංවෙදී' යන පදයෙහි ප්‍රීතිශීර්ෂයෙන් වෙදනා තොමෝ කියන ලදී. 'සුඛපටිසංවෙදී' යන පදයෙහි ස්වරූපයෙන් ම වෙදනා තොමෝ කියන ලදී. 'චිත්තසඩ්ඛාරපටිසංවෙදී, පස්සම්භයං චිත්ත සඩ්ඛාරං' යන චිත්තසංස්කාර ප්‍රතිසංයුක්ත දෙපදයෙහි 'සඤ්ඤාවෙදනා යන මොවුහු

සිතෙහි උපදනාහ. මේ ධර්ම, සිත පිළිබඳ චිත්ත සංඛාර යි කියූ බැවින් සංඥව හා යෙදුනු වෙදනා යි දතයුතු ය. මෙසේ වෙදනානුපස්සනා නයින් මේ චතුෂ්කය වදරණ ලද්දේය යි දත යුතු ය. තෘතීයචතුෂ්කයෙහි ද චතුර්විධ ධ්‍යානයන්ගේ වසයෙන් චිත්ත පටිසංවෙදිතාව දතයුත්තී ය.

'අභිපපමොදයං චිත්තං' ධ්‍යාන - විදර්ශනා සමග යෙදුනු සිත ප්‍රීතියෙන් සතුටු කරන්නේ අතිශයින් සතුටු කරන්නේ ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේ. එහි සමාධි වශයෙන් හා විදර්ශනා වශයෙන් ද යන දෙයයුරින් අභිප්‍රමොදය වේ. සමාධි වශයෙන් කෙසේ ද යත්:- ප්‍රීතිසහගත ප්‍රථම - දවීතීය ධ්‍යාන දෙකට සමවදියි. ඒ යොගාවචර තෙමේ සමාපත්තික්ෂණයෙහි ධ්‍යානචිත්තය සමග යෙදුනු ධ්‍යානප්‍රීතියෙන් සිත සතුටු කරන්නේ ය. ප්‍රමුදිත කරන්නේ ය. විදර්ශනා වශයෙන් කෙසේ ද යත්:- ප්‍රීති සහගත ධ්‍යාන දෙකට සමවැද එයින් නැඟිට ධ්‍යානසම්ප්‍රයුක්ත ප්‍රීතිය ක්ෂය වශයෙන්ද ව්‍යය වශයෙන්ද සම්මර්ශනය කරන්නේ ය. මෙසේ විදර්ශනාක්ෂණයෙහි ධ්‍යානසම්ප්‍රයුක්ත ප්‍රීතිය අරමුණු කොට සිත සතුටු කරන්නේය. ප්‍රමුදිත කරන්නේය. මෙසේ පිළිපන්නේ සිත සතුටු කරමින් ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයයි කියනු ලැබේ.

'සමාදහං චිත්තං' ප්‍රථමධ්‍යානාදීන්ගේ වසයෙන් අරමුණෙහි සිත හැකිළීමට හෝ උඩඟුවීමට නො පමුණුවා සම කොට පිහිටුවමින් සම කොට තබමින් ඒ ධ්‍යානයන්ට හෝ සමවැද එයින් නැඟිට ධ්‍යාන සම්ප්‍රයුක්තචිත්තය ක්ෂය වශයෙන් ව්‍යයවශයෙන් සම්මර්ශනය කරන්නහුට විදර්ශනාක්ෂණයෙහි අනිත්‍යාදි ලක්ෂණාවබොධයෙන් ක්ෂණමාත්‍රයක් පවත්නා සිතෙහි එකඟ බව උපදනේය. මෙසේ උපන් ක්ෂණික චිත්තෛකාග්‍රතාවගේ වසයෙන් ද අරමුණෙහි සිත සමව පිහිටුවමින් සමව තබමින් මනාකොට තැබූ සිත ඇත්තේ ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාස කරන්නෙමි'යි හික්මෙය යි කියනු ලැබේ.

'විමොචයං චිත්තං' ප්‍රථමධ්‍යානයෙන් විෂ්කම්භණ විමුක්ති වශයෙන් සිත නීවරණයන්ගෙන් මුදමින් වෙසෙසින් මුදමින් දවීතීය ධ්‍යානයෙන් විතර්ක විචාරයන්ගෙන්, තෘතීය ධ්‍යානයෙන් ප්‍රීතියෙන්, චතුර්ථධ්‍යානයෙන් සුඛදුඃඛයෙන් සිත මුදමින් නීවරණයන් දුරු කරමින්, ඒ ධ්‍යානයන්ට හෝ සමවැද එයින් නැඟිට ධ්‍යාන සම්ප්‍රයුක්ත චිත්තය ක්ෂය වශයෙන් ව්‍යය වශයෙන් සම්මර්ශනය කරන්නේ ය. ඒ යොගාවචර තෙමේ විදර්ශනා ක්ෂණයෙහි අනිත්‍යානුදර්ශනයෙන් නිත්‍යසංඥවෙන්, සිත මුදමින් නිත්‍යසංඥවන් දුරුකරමින්, දුඃඛානුදර්ශනයෙන් සුඛසංඥවෙන්, අනාත්මානුදර්ශනයෙන් ආත්මසංඥවෙන්, නිර්වේදානුදර්ශනයෙන් ප්‍රීතිසහගත

තෘෂ්ණාවෙන්, විරාගානුදර්ශනයෙන් රාගයෙන්, නිරෝධානුදර්ශනයෙන් සමුදයයෙන්, ප්‍රතිනිස්සර්ගානුදර්ශනයෙන් නිත්‍යාදිවශයෙන් ගැණීමෙන් සිත මුදමින් නිත්‍යාදිවශයෙන් ගැණීම් දුරුකරමින් ආශ්වාස ද කරන්නේ ය· ප්‍රශ්වාස ද කරන්නේ ය. 'විමොචයං චිත්තං අස්සසිස්සාමි පස්සසිස්සාමීති සික්ඛති'යි එහෙයින් වදරණ ලද්දේ ය. මෙසේ චිත්තානුපස්සනා වසයෙන් මේ චතුෂ්කය වදරණ ලදැ යි දතයුතු ය.

චතුර්ථ චතුෂ්කයෙහි වනාහි **'අනිච්චානුපස්සි'** මෙහි පළමුකොට අනිත්‍යය දතයුතු ය. අනිත්‍යතා දතයුත්තී ය. අනිත්‍යානුදර්ශිනය දත යුතු ය. අනිත්‍යානුදර්ශී දතයුතු ය. එහි පඤ්චස්කන්ධය අනිත්‍යය ය. කුමක් හෙයින් යත්:- ඉපදීම - නැසීයෑම - වෙනස්වීම යන මෙයින් යුක්ත බැවිනි. ඔවුන්ගේ ම ඉපදීම - නැසීයෑම - වෙනස්වීම අනිත්‍යතා නම. ඉපිද නැසීයෑම හෝ යි. උපන්නවුන්ගේ ඒ උපන් අයුරින් ම නො සිට ක්ෂණික භඩගයෙන් බිඳීමය යන අර්ථ යි. අනිත්‍යානුදර්ශිනය නම් ක්ෂණ භඩග සඩ්ඛ්‍යාත අනිත්‍යතාවගේ වසයෙන් රූපාදීන් විෂයයෙහි අනිත්‍යය යි එක්වන් දකීම ය. අනිත්‍යානුදර්ශී නම් ඒ අනිත්‍යානුදර්ශිනයෙන් සමන්වාගත වූයේ ය. එහෙයින් මෙසේ වූයේ ආශ්වාස කරන්නේ ද ප්‍රශ්වාස කරන්නේ ද මෙහි අනිත්‍යය දක්නාසුලුව ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාස කරන්නෙමි යි භික්මේය යි දතයුතු ය.

'විරාගානුපස්සි' මෙහි වනාහි ක්ෂයවිරාග - අත්‍යන්තවිරාග යි විරාග දෙකක් වේ. එහි ක්ෂයවිරාග නම් සංස්කාරයන්ගේ ක්ෂණයක් පාසා බිඳීම ය. අත්‍යන්තවිරාග නම් නිර්වාණය ය. විරාගානුදර්ශන නම් ක්ෂයවිරාග - අත්‍යන්තවිරාග දෙදෙනාගේ වසයෙන් පැවැති විදර්ශනාව හා මාර්ගය යි. ඒ දෙවැදරුම් වූ ම අනුදර්ශනයන්ගෙන් සමන්වාගතව ආශ්වාස කරන්නේ ද, ප්‍රශ්වාස කරන්නේ ද, විරාගානුදර්ශිව ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාස කරන්නෙමි යි භික්මේය යි දතයුතු ය. **'නිරෝධානුපස්සි'** යන පදයෙහි ද මේ ක්‍රමය ම වේ.

'පටිනිස්සග්ගානුපස්සි' යන මෙහි ද පරිත්‍යාග ප්‍රතිනිස්සර්ගය, ප්‍රසක්ඛන ප්‍රතිනිස්සර්ගය යි ප්‍රතිනිස්සර්ග දෙකක් වේ. ප්‍රතිනිස්සර්ගය ම අනුදර්ශන වූයේ පටිනිස්සග්ගානුපස්සනා නම් වේ. විදර්ශනාමාර්ගයන්ට මේ නමෙකි. විදර්ශනාව වනාහි තදඩග වසයෙන් සක්කාධාභිසංස්කාරයන් සමග කෙලෙසුන් දුරුකරයි. රැස් කරණුලද තෙභූමික සංස්කාරරගත අනිත්‍යාදීන්ගේ දෙස දැකීමෙන් තද්විපරීත වූ නිර්වාණයෙහි ද එයට නැමීමෙන් බැසගණිනු යි පරිත්‍යාග ප්‍රතිනිස්සර්ගය ම ප්‍රසක්ඛන ප්‍රතිනිස්සර්ගය යි කියනු ලැබේ. මාර්ගය තෙමේ සමුච්ඡේද වශයෙන් සක්කාධාභිසංස්කාරයන්

සමග කෙලෙස් දුරුකරයි. අරමුණු කිරීමෙන් ද නිවණෙහි බැසගණිනු යි පරිත්‍යාග ප්‍රතිනිස්සඝීය ම ප්‍රසාදන ප්‍රතිනිස්සඝීය යි ද කියනු ලැබේ. මෙකියූ දෙක ම පළමු පළමු ඤාණයන් පුන පුනා දැකීම් වසයෙන් අනුදර්‍ශිනා යි කියනු ලැබේ. ඒ දෙවැදරුම් වූ ප්‍රතිනිස්සඝීානුදර්‍ශිනයෙන් සමන්වාගතව ආශ්වාස කරන්නේ ද ප්‍රශ්වාස කරන්නේ ද ප්‍රතිනිස්සඝීානුදර්ශීව ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මේය යි දතයුතු ය. **'එවං භාවිතෝ'** මෙසේ සොළොස් අයුරින් වඩනා ලද්දේ වේ. සෙස්ස කියූ නය ඇත්තේම ය.

ආනාපානසතිසමාධිකථාව නිමි.

—\\—

'අථ ඛෝ භගවා' යනාදියෙහි මේ සඬ්ඛ්‍යාතීය වේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ආනාපානසතිසමාධිකථාවෙන් භික්ෂූන් අස්වසා නැවත තෘතීය පාරාජිකප්‍රඥප්තිය පිළිබඳ යම් ඒ නිදනයක් ප්‍රකරණයක් උපන්නේ ද, මහණුන්ගේ ඔවුනොවුන් දිවි තොර කිරීමෙක් වී ද මේ නිදනයෙහි මේ ප්‍රකරණයෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා විචාරා ගන්නා ද කොට යම්හෙයකින් එහි තමා විසින් තමන් දිවියෙන් තොර කිරීම ද මිගලණ්ඩිකයා ලවා ද තොරකරවීම පාරාජිකයට වැතු නො වේ ද, එහෙයින් එය හැර පාරාජිකයට වැතු වූ ඔවුනොවුන් දිවියෙන් තොරකිරීම ම ගෙණ පාරාජිකය පණවන සේක් **'යෝ පන භික්ඛු සඤ්චිච්ච මනුස්සවිග්ගහං'** යනාදිය වදළසේක. ආයිපුඝලයන් හා මිශ්‍ර බැවින් මෙහි 'මොඝපුරුස' යි නො වදරා **'තෙ භික්ඛූ'** යි වදළ සේක.

මෙසේ මූලවෙද්‍ය වශයෙන් දැඩි කොට තෘතීයපාරාජිකය පැණවූ කල්හි අනුප්‍රඥප්තිය පිණිස අන්‍ය වූ ද මරණ ගුණසංවණ්ණන වැතුවක් පහළ වූයේ ය. එහි උත්පත්තීය දක්වනු පිණිස **'එවඤ්චිදං භගවතා'** යනාදිය වදරණ ලද්දේ ය. එහි **'පටිබද්ධචිත්තා'** ඡන්දරාගය හෙතු කොට පිළිබඳ සිත් ඇත්තාහු, තදින් ඇලුනාහු, බලාපොරොත්තු ඇත්තාහු යන අර්ථ යි. **'මරණවණ්ණං සංවණ්ණෙසි'** ජීවිතයෙහි දෙස් දක්වා මරණයෙහි ගුණවණ්ණනා කරමිහ. අනුසස් දක්වමිහ. **'කත්තකල්‍යාණො'** යනාදි තන්හි මේ පදත්‍රීය වේ. 'තා විසින් යහපත් වූ පවිත්‍ර කර්මයක් කරණ ලද්දේ නු' යි හෝ **කතකල්‍යාණ** වෙහි ය. 'තා විසින් නිරවද්‍ය වූ කුශලකර්මයක් කරණ ලද්දේ' යි **කතකුසල** වෙහි ය. මරණ කාලය පැමිණි කල්හි සත්ත්වයන්ට භයසඞ්ඛ්‍යාත වූ යම් භීරුත්වයක් උපදී ද, එයින් රකින රක්‍ෂණකර්මයක් තා විසින් කරණ ලද්දේ නු යි **කතභීරුත්තාණ** වෙහි ය.

තා විසින් පවිටු වූ ලාමක කර්මයක් නො කරණ ලද්දේ නු යි **අකතපාප** වෙහි ය. තා විසින් රෞද්‍ර වූ දරුණු වූ දුශ්ශීල්‍ය කර්මයක් නො කරණ ලද්දේ නු යි **අකතලුද්ද** වෙහි ය. තා විසින් ලොභාදිකෙලශයන්ගෙන් ඉතා උතුසන්නවූ නපුරු වූ සාහසිකකර්මයක් නො කරණ ලද්දේනු යි **අකතකිබ්බිස** වෙහි ය. කුමක් හෙයින් මෙය කියනු ලැබේ ද යත්:- යම්හෙයකින් 'තා විසින් සියලු ආකාර වූ ම කුසල් කරණ ලද්දේ ද, තා විසින් පවි නො කරණ ලද්දේ ද, එහෙයින් තට එය කියමිහ' රොගයෙන් මැඩුනු බැවින්, දුක් බහුල බැවින් ලාමක වූ පවිටු වූ නින්දිත ජීවිතයෙන් තට කම් කිම? **'මතං තෙ ජීවිතා සෙය්‍යො'** තාගේ මරණය ජීවත්වීමට වඩා සුන්දරතර ය. කුමක් හෙයින යත්:- යම් හෙයකින් **'ඉතො තවං කාලකතො'** කළ කලුරිය කිරීම් ඇතිව. කලුරිය කොට මැරී යන අර්ථ යි. **'කායස්ස භෙදා -පෙ- උප්පජ්ජිස්සසි'** මෙසේ උපන්නේ ද **'තත්‍ර දිබ්බෙහි'** දෙවිලොව උපන් **'පඤ්චහි කාමගුණෙහි'** මන වඩන රූපාදී වූ පස්වැදරුම් වූ වසනුකාම කොටඨාසයන්ගෙන් **'සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙස්සසි'** සම්ප්‍රයුක්ත වූයේ, මනාකොට එකීභාවයට ගියේ, ඔබිමොබ හැසිරෙන්නෙහි ය. වසන්නෙහි ය. ඇලෙන්නෙහි ය යන අර්ථ යි. **'අසපාපයාසි'** අහිත වූ අවෘද්ධිකර වූ යමක් වහාම ජීවිත විනාශයට පමුණුවත් ද.

'සඤ්චිච්ච' යන මෙය, **'සඤ්චිච්ච මනුසස්ස විගඝහං'** යන මාතෘකාවෙහි කියනලද 'සඤ්චිච්ච' යන පදයාගේ නඟා දැක්වීම ය. එහි සං යනු උපසර්ගයි. ඒ හා සමග 'සඤ්චිච්ච' යන මෙය, පූර්ව කාල ක්‍රියා වචන යි. සඤ්චෙතනය කොට මොනවට සිතා යනු එහි අර්ථ යි. යම්හෙයකින් වනාහි යමෙක් තෙමේ සිතා දිවි තොර කෙරේ ද, හෙතෙමේ දන්නේ මනාකොට දන්නේ වේ. ඔහුගේ ඒ දිවි තොර කිරීම සිතා සනිටුහන් කොට කළ ව්‍යතික්‍රමය වේ. එහෙයින් ව්‍යඤ්ජනයෙහි ආදරය නො කොට අර්ථය ම දක්වනු පිණිස **'ජානන්තො සඤ්ජානන්තො චෙව අභිවිතරිත්වා වීතික්කමෝ'**යි මෙසේ ඔහු පිළිබඳ පදභාජනය වදරණලදී. එහි **'ජානන්තො'** යනු ප්‍රාණියෙකැයි දන්නේ ය. **'සඤ්ජානන්තො'** ජීවිතයෙන් තොර කරමි යි මනාකොට දන්නේ ය. එම ප්‍රාණිය දන්නා ආකාරය සමග මනාකොට දන්නේ ය යන අර්ථ යි. **'චෙච්ච'** වධක චෙතනා වසයෙන් සිතා කල්පනා කොට **'අභිවිතරිත්වා'** උපක්‍රම වශයෙන් මඩිමින් නිසැක සිත යවා **'වීතික්කමෝ'** මෙසේ පැවැතියහුගේ යම් ව්‍යතික්‍රමයක් වේ ද, මෙය සඤ්චිච්ච ශබ්දයාගේ කෙළ පැමිණි අර්ථය යි කියන ලද්දේ වේ. දැන් **'මනුසස්ස විගඝහං ජීවිතා වොරොපෙය්‍ය'** යන මෙහි වදළ මිනිසත් බව ප්‍රතිසන්ධිවිඥානය සමග

උපන් කලල රූපය මුල පටන් දක්වනු පිණිස **'මනුස්සවිග්ගහෝ නාම'** යනාදිය වදළ සේක.

එහි ගැබ හෝනවුන්ගේ වයසෙන් සියල්ලට වඩා සියුම් අත්බව දක්වනු පිණිස **'යං මාතුකුච්ඡිසම්'** යනු වදරණලදී. **'පඨමං චිත්තං'** ප්‍රතිසන්ධිචිත්තය යි. **'උප්පන්නං'** උපන්නේ ය **'පඨමං විඤ්ඤාණං පාතුභූතං'** යන මෙය එයට ම පර්‍යායවචන යි. 'මාතුකුච්ඡිසම්ං පඨමං චිත්තං' යන වචනයෙන් ද මෙහි සියලු ම පිරිපුන් නො අඩු වූ රූපාදි පඤ්චස්කන්ධයන්ගේ ප්‍රතිසන්ධිය දක්වන ලද්දී වේ. එහෙයින් ඒ ප්‍රථම චිත්තයක් වේ ද, ඒ ප්‍රථමචිත්තය හා යෙදී ගත් ත්‍රිවිධ අරූපස්කන්ධයෝ ද, ඒ හා උපන් කලලරූපය ද යි යන මෙය සියල්ලට පළමු වූ මිනිස් සිරුර ය. එහි 'කලලරූපං' යනු ස්ත්‍රීපුරුෂයන්ගේ කාය වස්තු භාව දශකවයසෙන් සමතිස්රූපයෝය. නපුංසකයන්ට කායවස්තු දශක වශයෙන් රූප විස්සක් වේ. එහි ස්ත්‍රී පුරුෂයන්ගේ කලල රූපය හිමාලයෙහි වසන ජාතිඤ්ඤා නම් මකුළුවකුගේ එක් හුයකින් නගා ත් එහි අග රැඳී සිටි මසැසට විෂය නො වූ පිරිසිදු වූ වෙසෙසින් පහන් වූ තෙල් බින්දුවක් පමණ වේ. මෙය අට්ඨකථාවෙහිඃ-

'තිලතෙලස්ස යථා බින්දු - සපපිමණ්ඩා අනාවිලෝ,
එවං වණ්ණපටිභාගං - කලලන්ති පවුච්චති' යි

කියන ලද්දේ ය.

'තලතෙල් බින්දුවක්, නො කැලඹුනු පහන් ගිතෙලක් යම්සේ ද, එසේ රූ සටහන් ඇත්තේ කලල රූප' යි කියනු ලැබේ.

මෙසේ සිඳුණු වූ වස්තුවක් ආදිකොට ප්‍රකෘතියෙන් එක්සිය විසිවස් ඇති සත්ත්වයාගේ මරණ කාලය දක්වා මේ අතර පිළිවෙළින් වැඩීමට පැමිණි මේ අත්බව මනුෂ්‍යවිග්‍රහ නම් වේ.

'ජීවිතා වොරොපෙය්‍ය' පළමු සතිය තුළ සන්තති වසයෙන් පැවැති කලල සඞ්ඛ්‍යාත ආත්මභාවය දිවියෙන් තොර කරන්නට හැකි බැවින් කලල කාලයෙහි හෝ හැවීම් මැඩීම් වලින් හෝ බෙහෙත් යෙදීමෙන් හෝ ඒ කලල කාලයෙන් මත්තෙහි හෝ එයට අනුරූප වූ උපක්‍රමයෙන් ජීවිතයෙන් තොරකරන්නේ ය, යන අර්ථ යි. යම්හෙයකින් වනාහි ජීවිතයෙන් තොර කිරීම අර්ථ වශයෙන් ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීම ම වේ ද, එහෙයින් මේ පිළිබඳ පදභාජනයෙහි **ජීවිතින්ද්‍රියං උපච්ඡින්දති උපරොධෙති සන්තතිං විකොපෙති**'යි වදරණ ලද්දේ ය. එහි ජීවිතෙන්ද්‍රිය පිළිබඳ සන්තතියගේ ගැළපීම සිදින්නේ වළකා ලන්නේ ජීවිතෙන්ද්‍රිය සිදියි,

වළකාලයි කියනු ලැබේ. ඒ මේ අර්ථය තෙමේ 'සන්තතිං විකොපෙති' යන පදයෙන් දක්වන ලද්දේ ය. **'විකොපෙති** වෙන් කරයි. එහි රූපජීවිතෙන්ද්‍රිය-අරූපජීවිතෙන්ද්‍රිය යි ජීවිතෙන්ද්‍රිය දෙවැදරුම් වේ. එදෙක අතුරෙහි අරූපජීවිතෙන්ද්‍රියයෙහි උපක්‍රමයක් නැත්තේ ය. එය උපක්‍රමයෙන් තොර කරන්නට නො හැක්කේ ය. රූපජීවිතෙන්ද්‍රියයෙහි වනාහි උපක්‍රමය ඇත්තේ ය. එය තොර කරන්නට හැක්කේ ය. රූපජීවිතෙන්ද්‍රිය තොර කරණුයේ අරූපජීවිතෙන්ද්‍රිය ද තොර කරයි. එයට අයත් පැවැතුම් ඇති බැවින් රූපජීවිතෙන්ද්‍රිය සමග අරූපජීවිතෙන්ද්‍රිය ද නිරුද්ධ වන්නේ ය. කිම? රූප ජීවිතෙන්ද්‍රිය තොර කරණුයේ අතීත ජීවිතෙන්ද්‍රිය තොර කෙරේ ද, අනාගත ජීවිතෙන්ද්‍රිය තොර කෙරේ ද, වර්තමාන ජීවිතෙන්ද්‍රිය තොර කෙරේ දැ යන මෙහි අතීත ජීවිතෙන්ද්‍රිය තොර නොකෙරේ ම ය. එසේ ම අනාගත ජීවිතෙන්ද්‍රිය ද තොර නො කෙරේ ම ය. ඔවුන් අතුරෙහි එකෙක් නිරුද්ධ වූයේ, එකෙක් නො උපන්නේය යි අතීත - අනාගත රූප දෙක ම නැත්තේ ය. නැති බැවින් උපක්‍රමයක් නැත්තේ ය. උපක්‍රමයක් නැති බැවින් එකකුදු තොර කරන්නට නො හැකි ය. 'අතීත චිත්තක්ෂණයෙහි ජීවත් වූයේ ය, ජීවත් නො වේ, ජීවත් නො වන්නේ ය, අනාගත චිත්තක්ෂණයෙහි ජීවත් වන්නේ ය, ජීවත් නො වූයේ ය, ජීවත් නො වේ, වර්තමාන චිත්තක්ෂණයෙහි ජීවත් වේ. ජීවත් නො වූයේ ය, ජීවත් නො වන්නේය' යි මෙය වදරණ ලද්දේ ය. එහෙයින් යම් කලෙක්හි ජීවත් වේ ද, එකල්හි උපක්‍රමය තෙමේ යුතුය යි වර්තමාන ජීවිතෙන්ද්‍රිය තොර කරයි. මේ වර්තමාන ජීවිතෙන්ද්‍රිය ක්ෂණප්‍රත්‍යුත්පන්න - සන්තතිපත්‍යුත්පන්න - අද්ධාප්‍රත්‍යුත්පන්න යි තෙවැදරුම් වේ. එහි ක්ෂණප්‍රත්‍යුත්පන්න ජීවිතෙන්ද්‍රිය නම් උප්පාද ජරා - භඞ්ග යන මෙයින් යුක්ත වූයේ ය. එය තොර කරන්නට නො හැක්කේ ය. කුමක් හෙයින් යත්:- තමා ම නිරුද්ධ වන බැවිනි. සන්තතිප්‍රත්‍යුත්පන්නය වනාහි ජවන වාර සක අටක් පමණ කුසලාකුසලසොමනස්සඋපෙක්ඛාආදිසභාගසන්තති වසයෙන් පැවැත නිරුද්ධ වන්නේ ය. යම්තාක් කල් උෂ්ණයෙහි සිට අවුත් ඇතුල් ගබඩාවට පිවිස හුන්නහුට යම්තාක් විසභාග සෘතු පහළවීමෙහි හෙතුවෙන් පළමු පැවැති සෘතුව නො සන්සිඳේ ද මේ අතර සන්තතිප්‍රත්‍යුපන්න යි කියනු ලැබේ. ප්‍රතිසන්ධිය පටන් ව්‍යුතිය දක්වා ඇති මෙය අද්ධාප්‍රත්‍යුත්පන්න නම් වේ. එදෙක ම තොර කරන්නට හැක්කේ ය. කිසේය යත්:- එහි උපක්‍රම කළ කල්හි ලද උපක්‍රම ඇති ජීවිතනවකය නිරුද්ධ වනුයේ දුර්බල වූ පිරිහුනු කර්මවෙගය ඇති සන්තානයට සහකාරී ප්‍රත්‍යය වේ. එහෙයින් සන්තතිප්‍රත්‍යුත්පන්නය හෝ අද්ධාප්‍රත්‍යුත්පන්නය හෝ පිරිසිඳින ලද කාලයට නො පැමිණ අතර දී ම නිරුද්ධ වන්නේ ය. මෙසේ එදෙක

ම තොර කරන්නට හැක්කේ ය. එහෙයින් එය ම සඳහා 'සන්තතිං විකොපෙති' යන මෙය වදරණ ලද්දේය යි දතයුතු ය.

මේ අර්ථය පැහැදිලි කරණු පිණිස ප්‍රාණය දතයුතු ය. ප්‍රාණාතිපාතය දතයුතු ය. ප්‍රාණාතිපාතී දතයුතු ය. ප්‍රාණාතිපාත ප්‍රයොගය දතයුතු ය. එහි පාණො යනු ව්‍යවහාර වශයෙන් සත්ත්ව තෙමේ ය. පරමාර්ථ වශයෙන් ජීවිතෙන්ද්‍රිය ය. ජීවිතෙන්ද්‍රිය වනසනුයේ ප්‍රාණය ජීවිතයෙන් වහා පහකෙරේය යි කියනු ලැබේ. එය කියූ අයුරු ඇත්තේම ය. 'පාණාතිපාතො' යනු යම් චෙතනාවකින් ජීවිතෙන්ද්‍රිය සිඳලන ප්‍රයොග උපදවා ද, ඒ වධක චෙතනා තොමෝ පාණාතිපාත යි කියනු ලැබේ. 'පාණාතිපාතී' යනු කියනලද චෙතනාවෙන් යුක්ත පුද්ගල තෙමේය යි දතයුතු ය. 'පාණාතිපාතස්ස පයොගො' ප්‍රාණාතිපාතයට සාහත්‍ථික - ආණත්තිය - නිස්සග්ගිය - ඨාවර - විජ්ජාමය - ඉද්ධිමය යි ප්‍රයොග සයක් වේ.

එහි **'සාහත්‍ථිකො'** යනු සතකු මරන්නාහු තමන්ගේ කයින් හෝ කය පිළිබඳ වූවකින් හෝ පැහැරීම ය. **'ආණත්තියො'** යනු 'මෙසේ විද හෝ පහර දී හෝ මරව'යි අනෙකක්හට අණවන්නහුගේගේ අණ කිරීම ය. **'නිස්සග්ගියො'** යනු දුර සිටියකු මරණු කැමැත්තහුගේ කයින් හෝ කය පිළිබඳ වූවකින් හෝ ඊ සැත් යතුරු පහන් ආදිය දමාගැසීම ය. **'ඨාවරො'** යනු නිශ්චල වූ උපකරණයකින් මරණු කැමැත්තහුගේ වළකැණීම් හේත්තු පුවරු තැබීම් කඩු ආදිය එළවා තැබීම්, බෙහෙත් යෙදීම් ය. සාහත්‍ථිකාදී වූ ඔවුහු සතර ම ඉදිරියෙහි පාලිවණ්ණනාවෙහි විසතර වශයෙන් ප්‍රකාශ වන්නාහු ය. විද්‍යාමය - සෘද්ධිමය ප්‍රයොග දෙක පෙළෙහි නො ආයේ ය. එදෙක මෙසේ දතයුතු :-

මැරීම පිණිස මන්ත්‍ර ජපකිරීම විද්‍යාමයප්‍රයොගය යි සැකෙවින් කිය යුතු ය. අර්ථකථාවන්හි 'විද්‍යාමය ප්‍රයොගය කවරේ ද'යි ප්‍රශ්න කොට අථර්වන වෙදිහු අථර්වණය යොදත්. නුවර ඇවුරු කල්හි හෝ යුද්ධයක් එළැඹ සිටි කල්හි හෝ සතුරු සෙනාවෙහි විරොධී වූ පසමිතුරන් කෙරෙහි දඹ කොට මරණු පිණිස ගෝනුසු විසකුරු සතුන් හැසිරවීමෙන් පීඩා උපදවත්. එයට වැඩිතරම් වූ උවදුරු උපදවත්. රොග උපදවත්. විෂමජ්වර උපදවත්. අහපසහ හිදිවලින් විද රුජා උපදවත්, රුජා සහිත ආමාතිසාරය උපදවත්, රක්තාතිසාරය උපදවත්. මෙසේ අථර්වන් වෙදය දන්නෝ අථර්වණය යොදත්. විද්‍යාධරයෝ ගන්ධාරවිද්‍යාදිය ජපකොට නුවර ඇවුරු කල්හි හෝ -පෙ- රක්තාතිසාරය උපදවත් යි මෙසේ විද්‍යාමය ප්‍රයොගය දක්වා ආථර්වණිකයන් විසින් ද විද්‍යාධරයන් විසින් ද මරණ ලද්දවුන්ගේ බොහෝ වත්‍ථූහු කියන ලද්දහ. එයින් කම් කිම?

මේ මෙහි ලක්ෂණය යි. මැරීම පිණිස විද්‍යා පරිජල්පනය විද්‍යාමය ප්‍රයොගය යි.

කම්විපාකජසෘදධිය යෙදීම සෘදධිමය ප්‍රයොගයයි. මේ කම්විපාකජසෘදධිය නම් නාගයන්ගේ නාගසෘදධිය, ගුරුළන්ගේ ගුරුළුසෘදධිය, යකුන්ගේ යක්ෂසෘදධිය, දෙවියන්ගේ දෙවසෘදධිය, රජුන්ගේ රාජසෘදධිය යි බොහෝ අයුරු වන්නී ය. එහි දක්නාලද දෂ්ට කරණුලද පැහැසූ විෂ ඇති නාගයන්ගේ දැකීමෙන් දෂ්ට කිරීමෙන් ස්පර්ශ කිරීමෙන් අන්හු නැසීමෙහි නාගසෘදධිය දතයුතු ය. ගුරුළන්ගේ ගරුඩසෘදධිය මහ මුහුදින් බඹ දෙතුන්සියය පමණ වූ නාගයන් නගාගැනීමෙහි දත යුතු ය. යක්ෂයෝ වනාහි එන්නෝත් පහර දෙන්නෝත් නො පෙණෙත් ම ය. ඔවුන් විසින් පහර දෙන ලද සත්ත්වයෝ එතැන ම මැරී වැටෙත්. එහි ඔවුන්ගේ යක්ෂසෘදධිය දතයුතු ය. වෛශ්‍රවණයා තමා සෝවාන්වීමට පෙර නයනායුධයෙන් බැලූ කුම්භාණ්ඩයන්ගේ මරණයෙහි ද, අන්‍යවූත් දෙවියන්ගේ තම තමන් පිළිබඳ සෘදධ්‍යනුභාවයෙහි දෙවසෘදධිය දතයුතු ය. පිරිස් සහිත වූ සක්විති රජුගේ අහස් ගමන් ආදියෙහි ද, අශොක රජුගේ යට උඩ යොදුනක් පමණ තැන අණ පැවැතීම් ආදියෙහි ද, පිතෘරාජ නම් වූ සිංහල නරෙන්ද්‍රයාගේ දත්වල ගැටීම හෙතු කොට චූලසුමන කෙළෙඹිහුගේ මැරීමෙහි රාජසෘදධිය දතයුතු ය.

මහාසඞ්කනිකායික වූ ඇතැම් කෙනෙක් 'පුන ච පරං භික්ඛවෙ සමණො වා බ්‍රාහමාණො වා ඉදධිමා චෙතොවසිප්පත්තො අඤ්ඤිස්සා කුච්ඡිගතං ගබ්භං පාපකෙ මනසානුපෙක්ඛිතා හොති අහො වතායං කුච්ඡිගතං ගබ්භං න සොත්ථිනා අභිනික්ඛමෙය්‍යාති, එවමපි භික්ඛවෙ කුලුම්බස්ස උපඝාතො හොති' යනාදී වූ සූත්‍ර දක්වා භාවනාමය සෘදධියෙන් ද පරුපඝාතකර්මය කියන්නාහු ය. පරුපඝාතකරණය සමග ද ගිනි ගත් ගෙයක් මතුවෙහි තුබූ පැන්කළයක බිඳීම මෙන් සෘදධි විනාශය ද කැමැති වෙත්. එය ඔවුන්ගේ ඊර්ෂ්‍යාමාත්‍රයෙකි. කුමක් හෙයින යත්:- යම්හෙයකින් කුශලවෙදනා චිතකී පරිත්තත්‍රිකය හා සම නො වේ ද, එහෙයිනි. මේ භාවනාමය සෘදධිය කෙසේ කුශලත්‍රිකයෙහි කුශලයත් අව්‍යාකෘතයත් වී ද, ප්‍රාණාතිපාතය අකුශල වේ. වෙදනාත්‍රිකයෙහි උපෙක්ෂාව හා යුක්ත ය. ප්‍රාණාතිපාතය දුඃඛසම්ප්‍රයුක්ත ය. විතකීත්‍රිකයෙහි විතකීවිචාර රහිත ය. ප්‍රාණාතිපාතය විතකීවිචාර සහිත ය. පරිත්තත්‍රිකයෙහි මහද්ගතය. ප්‍රාණාතිපාතය පරිත්තය සියුම් ය.

'සප්පාහාරකං වාසස පරියෙසෙය්‍ය' මෙහි හරී නු යි හාරක නම්. කුමක් හරී ද? ජීවිතය යි. නොහොත් හැරිය යුත්තේ නු යි හාරක නම්. එළවා තැබිය යුත්තේ ය යන අර්ථ යි. ශාස්ත්‍රා වූයේත් ඒ ම ය, හාරක

වූයේත් ඒ ම නු යි සත්ථහාරක නම්. 'අසස' මනුෂ්‍ය ශරීරයාගේ. **'පරියෙසෙය්‍ය'** යම් සේ ලබා ද, එසේ කරන්නේ ය. එළවා තබන්නේ ය යන අර්ථ යි. මෙයින් සථාවරප්‍රයොගය දක්වන්නේ ය. අන් ලෙසකින් වනාහි සෙවූ පමණකින් ම පාරාජිකයෙක් වන්නේ නම් මෙය යුතු නො වේ. පෙළෙහි වනාහි සියලු ව්‍යඤ්ජන නො ගෙණ මෙහි සථාවර ප්‍රයොගයෙන් සඩ්ග්‍රහ කරණලද යම් ආයුධයෙක් වේ ද, එය ම දක්වන්නට **'අසිං වා -පෙ- රජ්ජුං වා'** යි පදභාජනයෙහි වදරණ ලද්දේ ය.

එහි **සත්ථං** යනු කියනලද කඩු ආදියෙන් ඉතිරි වූ මුවහත් කළ යම්කිසි ආයුධයෙකැ යි දතයුතු ය. මුගුරු ගල් විස රැහන් ද ජීවිතය නසන බැවින් මාතෘකාවෙහි 'සත්ථහාරකං වා' යි කියූ ශස්ත්‍ර සඩ්ග්‍රහයෙහි දතයුතු ය.

'මරණවණ්ණං වා' යන මෙහි යම්හෙයකින් 'තට මේ ලාමක වූ නින්දිත ජීවිතයෙන් කම් කිම? යම්බඳු වූ තෝ ප්‍රණීත වූ භොජනයන් වළඳන්නට නො ලබහි ද, යනාදි නයින් ජීවිතයෙහි ආදීනව දක්වන්නේ ද, 'උපාසකය! තෝ කළ පිරිසිදු කම් ඇත්තෙහිය -පෙ- තා විසින් පවි නො කරණ ලද ය. තට ජීවත්වීමට වඩා මැරියෑම ශ්‍රෙෂ්ඨ ය, තෝ මෙහි කලුරිය කෙළෙහි -පෙ- ඉදුරන් හසුරු වන්නෙහි ය, දෙවහනන් විසින් පිරිවරණ ලදුයෙහි නන්දන වනයෙහි සැපයට පැමිණියේ වසන්නෙහි ය, යනාදි ක්‍රමයෙන් මරණයෙහි ගුණ කියන්නේ, මරණයෙහි ගුණ ම වණිනා කෙරේ. එහෙයින් **'ජීවිතෙ ආදීනවං දස්සෙති මරණෙ වණ්ණං භණති'** යි දෙපරිද්දෙකින් බිඳ පදභාජනය වදරණ ලද්දේ ය.

'මරණාය වා සමාදපෙය්‍ය' මැරෙණු පිණිස උපාය හෝ ගන්වන්නේ ය. **'සත්ථං වා ආහර'** යනාදි තන්හි ද **'සොබ්භෙ වා පපත, නරකෙ වා පපත,'** යනාදී වූ යමක් වදරණ ලද ද, ඒ සියල්ල පසුභාගයෙහි කියූ නය ඇති බැවින් අර්ථ වශයෙන් කියනලද මැ යි දතයුතු ය. සියල්ල ඍරූප වශයෙන් කියන්නට නො හැකි ය.

'ඉතිචිත්තමනො' මෙබඳු සිතැත්තේ ය. මෙබඳු මනස් ඇත්තේ ය. 'මතන්‍තෙ ජීවිතා සෙය්‍යො' යන මෙහි කියූ මරණ සිත් ඇත්තේ ය. මරණයෙහි මනස් ඇත්තේ ය යන අර්ථ යි. යම්හෙයකින් වනාහි මෙහි මනො යනු චිත්තයාගේ අර්ථ දක්වනු පිණිස වදරණ ලද්දේ ද, අර්ථ වශයෙන් මේ දෙක ම එකක් ම වේ. එහෙයින් අර්ථ වශයෙන් භෙදයක් නැති බව දක්වනු පිණිස **'යං චිත්තං තං මනො, යං මනො තං චිත්තං'** යනු වදරණ ලද්දේ ය. ඉති ශබ්දය වනාහි උදුරා ද ඒ තාක් අර්ථය නො කියන ලද ය. **'චිත්තසඩ්කප්පො'** යන මේ පදයෙහි අධිකාර වසයෙන්

ඉති ශබ්දය ගෙණ හැර දක්විය යුතු ය. මේ වනාහි 'ඉතිචිත්තසඞ්කප්පෝ' යි මෙසේ නො කියන ලද්දේ ද, අධිකාර වසයෙන් කියන ලද්දේ ම වේය යි දතයුතු ය. ඒ එසේ ම ය. මේ ඉති ශබ්දය පිළිබඳ ඒ මරණසඞ්ඛ්‍යාත අතීය දක්වන සේක් **'මරණසඤ්ඤී'** යනාදිය වදළ සේක. යම්හෙයකින් මෙහි 'සඞ්කප්ප' යන මෙය චිතකීයට නමක් නො වේ ද, එහෙත් සංවිදහනමාත්‍රයට මේ නමක් වේ. ඒ සංවිදහනය ද මේ අතීයෙහි සංඥාවෙතනාහිප්‍රායයන් හා සඞ්ග්‍රහයට යන්නේ ය. එහෙයින් විචිත්‍ර වූ නානාප්‍රකාර වූ සඞ්කල්පය මොහුට නු යි චිත්තසඞ්කප්පයි මෙසේ අතීී දතයුතු ය. ඒ එසේ ම ය. මොහු පිළිබඳ පදභාජනය ද සංඥාවෙතනාහිප්‍රාය වශයෙන් කියන ලදී. මෙහි ද අභිප්‍රාය යන චිතකීය දතයුත්තේ ය.

'උච්චාවචෙහි ආකාරෙහි' මහත් නො මහත් උපායයන්ගෙන් එහි මරණය පිළිබඳ ගුණවිණිනාවෙහි වනාහි ජීවිතයෙහි ආදීනව දක්වීම් වශයෙන් නො මහත් අයුරු ඇති බව ද මරණයෙහි ගුණකීම් වසයෙන් මහත් අයුරු ඇති බව ද දතයුතු ය. සමාදන් කරවීමෙහි වනාහි මිටින් දණින් මැඩීම් ආදියෙන් මරණයෙහි සමාදන් කරවීම් වසයෙන් මහත් අයුරු ඇති බව ද එක්ව බුදින්නහුගේ හිසෙහි විෂ බහා මරණයෙහි සමාදන් කරවීම් වසයෙන් නො මහත් අයුරු ඇති බව ද දතයුතු ය. **'සොඛෙ වා නරකෙ වා පපාතෙ වා'** යන මෙහි සොඛ නම් හාත්පසින් සුන්විගිය තටය ඇති ගැඹුරු වළ ය. නරක නම් ඒ ඒ තැන පැළියන බිමෙහි තමන් ම හටගත් මහත් විවර ඇති බිහිසුණු ගැඹුරු වළ ය. යම් තැනෙක් හි ඇත්තු වැටෙත් ද, සොරු සැහවී සිටිත් ද ඒ තැන ය. **පපාත** නම් කඳු අතර හෝ ගොඩ බිම් අතර හෝ එක් පසකින් සිදුනේ වේ ද ඒ ය. කඳු බෑවුම් ය. **'පුරිමෙ උපාදය'** මෙවුන්දම් සෙවනය කොට, නො දුන් දෙය ද ගෙණ පරිජී ඇවතට පැමිණි පුඟලයා පටන් සෙස්ස පෙර කියූ නය ඇති බැවින් ද පැහැදිලි අරුත් ඇති බැවින් ද ප්‍රකට වේ ම ය.

මෙසේ උදෙසූ ශික්ෂාපදය පද පිළිවෙළින් විභාග කොට දන් යම් හෙයකින් යට පදභාජනියෙහි සැකෙවින් ම මනුෂ්‍යවිග්‍රහ පාරාජිකය දක්වන ලද්දේ විස්තර වශයෙන් නො දක්වන ලද්දේ ද, ආපත්තියට නගා පාළිය තබන ලද්දී ද, අතීය සැකෙවින් දක්වූ කල්හි භික්ෂූහු මුළුමනින් නය ගැණීමෙහි අසමර්ථ වෙත් ද, අනාගතයෙහි ද පාපී පුඟලයන්ටත් ඉඩ ලැබේ ද, එහෙයින් සියලු අයුරින් භික්ෂූන්ට නය ගැණීම පිණිස ද, අනාගතයෙහි පාපී පුද්ගලයන්ට අවකාශ වළකනු පිණිස ද නැවත **'සාමං අධිට්ඨාය'** යනාදි නයින් මාතෘකාව තබා

විස්තර වශයෙන් මනුෂ්‍යවිග්‍රහපාරාජිකය දක්වන සේක් **'සාමන්තා සයං භනති'** යනාදිය වදළ සේක.

එහි මේ ප්‍රකට නො වූ පද වර්ණනාව සමග විනිශ්චය කථා ය. **'කායෙන'** අතින් හෝ පයින් හෝ මිටින් හෝ දණින් හෝ යන යම් කිසි අභපසහකින්. **'කායපටිබද්ධෙන'** කයින් නො මිදූ කඩු ආදී වූ ආවුධයෙන්, **'නිස්සග්ගියෙන'** කයින් ද කය පිළිබැඳියකින් ද මුදන ලද ඊ සැත් ආදියෙන්. මෙපමණකින් සාහත්‍ථිය ද නිස්සග්ගිය ද යන ප්‍රයොග දෙක කියන ලද්දේ වේ. එහි එකක් එකක් උද්දිස්ස-අනුද්දිස්ස භෙදයෙන් දෙවැදෑරුම් වේ. එහි උද්දිස්සක ප්‍රයොගයෙහි යමකු උදෙසා පහර දේ ද, ඔහුගේ ම මරණයෙන් ප්‍රාණඝාතකර්මයෙන් බැඳේ. 'යම් කිසිවෙක් මැරේවා'යි මෙසේ අනුද්දෙසික ප්‍රයොග විෂයයෙහි පහරදීම් හෙතුවෙන් යම්කිසිවෙක් මැරේ ද, ඔහුගේ මරණයෙන් ප්‍රාණඝාතකර්මයෙන් බැඳේ. උද්දිස්ස - අනුද්දිස්ස යන දෙයයුරෙන් ම පහරදුන් ඇසිල්ලෙහි හෝ මැරේවා, පසුව හෝ එයින් හටගත් රොගයකින් ම මැරේවා පහරදුන් ඇසිල්ලෙහි ම ප්‍රාණඝාතකර්මයෙන් බැඳෙන්නේ ය. මැරිමෙහි අදහසින් ම පහර දී, ඒ පහරින් නො මැරුණහුට, නැවත අන් සිතකින් පහර දුන් කල්හි, ඉන් පසු ද පළමු පහරින් ම මැරේ ද, එකල්හි ම ප්‍රාණඝාතයෙක් නැත්තේ ය. පළමු දෙවන පහරදීම්වලින් මළ කල්හි ද පළමු පහරින් ම කර්මයෙන් බැඳේ. දෙපහරින් ම නො මළ කල්හි ප්‍රාණඝාතයෙක් නැත්තේ ය. බොහෝ දෙනකුන් විසින් එකක්හට පහර දුන් කල්හි ද මේ ක්‍රමය ම වේ. එහිදු යමක්හුගේ පහරින් මැරේ ද, ඔහුට ම ප්‍රාණඝාත කර්මයෙන් බැඳීම වේ.

ආනන්තර්‍යාදිකර්මවිභාගය, පාරාජිකාදිආපත්තිවිභාගය යන මොවුන්ගේ ප්‍රකට භාවය පිණිස ද මෙහි එළකවතුෂ්කය ද දතයුතු ය.

යමෙක් වනාහි එක් තැනක හොත් එළවකු රැ අවුත් මරන්නෙමි යි විමසා බලා ද, එළවා හොත් අවකාශයෙහි ඔහුගේ මව හෝ පියා හෝ රහත් නමක් හෝ පඬුකඝාවතක් පොරොවා ගෙණ හොත්තේ වේ ද, එළවා සොයා දැන ගත් ඔහු රැ අවුත් 'එළවා මරමි' යි මව හෝ පියා හෝ රහත්තම හෝ මරා ද, මේ වැකුව 'මරමි'යි සිත් ඇති බැවින් ඝාතකයෙක් ද වේ. ආනන්තර්‍යකර්මය ද පහසයි. පරිජි ඇවැතට ද පැමිණේ.

එහි අන් කිසි ආගන්තුකයෙක් හොත්තේ වේ ද 'එළවා මරමි' යි ඒ අගන්තුකයා මරා ද, ඝාතකයෙක් ද වේ. පරිජි ඇවැතට ද පැමිණේ. ආනන්තර්‍යකර්මය නො පහසයි. එහි යක්ෂයෙක් හෝ ප්‍රෙතයෙක් හෝ

හොත්තේ වේ ද, 'එළුවා මරමි'යි ඒ එකකු ම රා ද, ඝාතකයෙක් ද වේ. ආනන්තර්‍යකර්‍මය නොපහසයි. පරිජි ඇවැතට ද නොපැමිණේ. ථුල්ලච්චය වේ. එහි හොත් අන් කිසිවෙක් නැත්තේ ද, එළුවා ම හොත්තේ වේ ද, ඒ එළුවා මරා ද, ඝාතකයෙක් වේ. පාචිත්තියට ද පැමිණේ. මවු පිය රහත් යන මොවුන් අතුරෙහි එක්තරා එකකු මරමි යි ඔවුන්ගෙන් එක්තරා එකකු මරා ද, ඝාතකයෙක් ද වේ. ආනන්තර්‍යකර්‍මය ද පහසයි. පරිජි ඇවැතට ද පැමිණේ. ඔවුන් අතුරෙන් ම එක්තරා එකකු මරමි යි අන්‍ය වූ ආගන්තුකයකු මරා ද, යකකු හෝ ප්‍රේතයකු හෝ මරා ද, එළුවකු හෝ මරා ද, පෙර කියූ නයින් ම දතයුතු ය. මෙහි වනාහි චේතනා තොමෝ දරුණු වන්නී ය.

මෙහි අන්‍ය වූ ද පිදුරු බිසි ආදී වූ වස්තූහු දතයුත්තාහ. යමෙක් වනාහි ලෙයින් වැකුණු කඩුවක් හෝ සැතක් හෝ පිසදමන්නෙමි යි පිදුරු බිස්සක් තුළට ප්‍රවේශ කරන්නේ එහි හොත් මව හෝ පියා හෝ රහතකු හෝ ආගන්තුක පුරුෂයකු හෝ යකකු හෝ ප්‍රේතයකු හෝ තිරිසනකු හෝ මරා ද, හෙතෙමේ ව්‍යවහාර වශයෙන් ඝාතක යි කියනු ලැබේ. වධක චේතනාව නැති බැවින් කර්‍මය නොම පහසයි. ඇවැතට ද නොපැමිණේ. යමෙක් වනාහි මෙසේ ප්‍රවේශ කරන්නේ සිරුරු පහස සලකා ඇතුළත වූයේ සත්ත්වයෙකැ යි හඟිමි, මැරේවා යි ප්‍රවේශ කොට මරා ද, ඔහුගේ ඒ වස්තූන්ට අනුරූප වසයෙන් කර්‍මයෙන් බැඳීම ද, ඇවැත ද දතයුතු ය. එහි තැබීම පිණිස ප්‍රවේශ කරන්නහුට ද වන ලැහැබ් ආදියෙහි බහන්නහුට ද මේ ක්‍රමය වේ. යමෙක් තෙමේ 'සොරහු මරමි'යි සොර වෙසින් යන පියා මරා ද, ආනන්තර්‍යය ද පහසයි. පාරාජික ද වේ. යමෙක් වනාහි පරසෙනඟක අන් යොධයකු ද පියා ද කර්‍මාන්ත කරන්නවුන් දැක 'මූට විද මාගේ පියාට විදින්නෙමි'යි යොධයාට ඊයක් දමා ගසා ද, අදහස් කළ පරිදි පැමිණි කල්හි යොධයාට විද පියාට විද්ද කල්හි පිතෘඝාතකයෙක් වේ. යොධයාට විද්ද කල්හි මාගේ පියා පැන යන්නේය යි ඊය දමා ගසා ද, ඊය තමන් අදහස් නොකළ පරිදි ගොස් පියා මරා ද, ව්‍යවහාර වශයෙන් පිතෘඝාතකයෙක් වේය යි කියනු ලැබේ. ආනන්තර්‍යකර්‍මයක් නම් නැත්තේ ය.

'අධිට්ඨහිත්වා' සමීපයෙහි සිට, **'ආණාපෙති'** උදෙසා හෝ නොඋදෙසා හෝ අණවයි. එහි අන් සෙනාවක එළැඹ සිටි කල්හි නොඋදෙසා ම. **'එවං විජ්ඣ, එවං පහර, එවං ඝාතෙහි'** මෙසේ විදුව, මෙසේ පහර දෙව, මෙසේ නසව යි ඇණ වූ කල්හි යම් පමණක අණවන ලද්දේ නසා ද, ආනාපක-ආණත්ත දෙදෙනාහට ම එපමණ වූ ප්‍රාණඝාතයෝ වෙති. ඉදින් එහි ආණාපකයාගේ මවුපියෝ වෙත් ද,

ආනන්තර්‍යීකර්‍මය පහසයි. ඉදින් එහි අණවන ලද්දහුගේ ම මවුපියෝ වෙත් ද, ඒ අණවන ලද්දේ ම ආනන්තර්‍යීකර්‍මය පහසයි. ඉදින් එහි රහතෙක් වේ ද දෙදෙන ම ආනන්තර්‍යීකර්‍මය පහසත්. උදෙසා වනාහි 'මේ දික් වූ මිටි වූ රතුසැටිටය ලෑ නිල් සැටිටය ලෑ ඇත්කදෙහි හුන් ඇතු පිට මැද හුන් මොහුට විදුව, මොහුට පහර දෙව, මොහු නසව'යි ඇණ වූ කල්හි ඉදින් ඒ අණවන ලද්දේ ඔහු ම නසා ද, දෙදෙනාහට ම ප්‍රාණඝාතය වේ. ආනන්තර්‍යීවස්තුවෙහි ද ආනන්තර්‍යී ම වේ. ඉදින් අනෙකකු මරා ද අණකළහුට ප්‍රාණඝාතයෙක් නැත්තේ ය. 'අධිට්ඨහිත්වා ආණපෙති' යන මෙයින් ආණත්තිප්‍රයොගය කියන ලද්දේ ය. එහිඃ-

'වත්ථු - කාල - ඔකාස - ආවුධ - ඉරියාපථ යන කරුණු පස ප්‍රමාණ කොට බලා විචක්ෂණ තෙමේ අර්‍ථය දරන්නේ ය. එහි අන් ක්‍රමයෙක් ද වේඃ- 'වත්ථු - කාල - ඔකාස - ආවුධ - ඉරියාපථ - කිරියා විසෙස යන මේ සය ආණත්තිය නියම කරන්නේ ය.

එහි **වත්ථු** යනු මැරිය යුතු සත්ත්ව තෙමේ ය. **කාල** යනු පෙරවරු පස්වරු ආදි කාල හා යෞවන - ශක්ති - වියර්‍ධාදි කාලය යි. **ඔකාස** යනු ගමක් හෝ වනයක් හෝ ගෙදෙරක් හෝ ගෙමැද්දක් හෝ වීථියක් හෝ සිවුමංසන්දියක් හෝ යන මේ ආදිය ය. **ආවුධ** යනු කඩුවක් හෝ ඊයක් හෝ සැතක් හෝ යන මේ ආදිය ය. **ඉරියාපථ** යනු මැරියයුත්තහුගේ යෑම හෝ හිඳීම හෝ යන මේ ආදිය ය. **කිරියාවිසෙස** යනු විදීම හෝ සිඳීම හෝ බිඳීම හෝ හිස සකක් සේ මුඩුකිරීම හෝ යන මේ ආදිය ය.

ඉදින් වනාහි 'යමකු මරව' යි අණවන ලදුයේ වස්තුව වරදවා එයින් අනෙකකු මරා ද, 'ඉදිරියෙන් පහර දී මරව'යි අණවනලදුයේ පසුපසින් හෝ පසකින් හෝ අන් පෙදෙසෙක හෝ පහරා මරා ද, ඇණවූවහුට කර්‍මයෙන් බැඳීමක් නැත්තේ ය. ඇණවුම් ලද්දහුට ම කර්‍මබන්ධනය වේ. නැවත වස්තුව නො වරදවා අණකළ පරිදි මරා ද, ඇණවූවහුට ඇණ වූ කෙණෙහි ද ඇණවුම් ලද්දහුට මැරූ කෙණෙහිද යි දෙදෙනාහට ම කර්‍මබන්ධනය වේ. මෙහි වස්තු විශෙෂයෙන් වනාහි ආනන්තර්‍යාදි කර්‍මවිශෙෂය ද පාරාජිකාදි ආපත්තිවිශෙෂය ද වේය යි මෙසේ වස්තුවෙහි සඞ්කෙත විසඞ්කෙතතාවෝ දතයුත්තාහ.

කාලයෙහි වනාහි යමෙක් අද - සෙට යි නියම නො කොට පෙරවරුයෙහි මරවයි අණවන ලද්දේ යම්කිසි කලෙක පෙරවරුයෙහි මරා ද, එහි විසඞ්කෙතයක් නැත්තේය. හෙතෙමේ 'අද පෙරවරුයෙහි'යි කියන ලද්දේ මැද්දහනයෙහි හෝ සවස හෝ හෙට පෙරවරුයෙහි හෝ මරා ද, එහි විසඞ්කෙතය වේ. අණකළහුට කර්‍ම බන්ධනයක් නැත්තේය.

පෙරවරුයෙහි මරන්නට වෑයම් කරන්නහුට මද්දහනය වූ කල්හි ද මේ නය ම වේ. මේ නයින් සියලු කාලප්‍රභෙදයන්හි සඞ්කෙත - විසඞ්කෙතතාවෝ දතයුත්තාහ.

ආවුධයෙහි ද යමෙක් කඩුවෙන් හෝ ඊයෙන් හෝ යි නියම නොකොට 'ආයුධයෙන් මරව' යි අණවන ලද්දේ යම්කිසි ආයුධයකින් මරා ද, විසඞ්කෙතයක් නැත්තේ ය. යමෙක් වනාහි 'කඩුවෙන් මරව'යි අණවන ලද්දේ ඊයෙන් මරා ද, 'මේ කඩුවෙන් හෝ මරව'යි කියන ලද්දේ, අනික් කඩුවකින් මරා ද, මේ කඩුවෙහි ම හෝ මේ මුවහතින් ම මරව යි කියන ලද්දේ අන් මුවහතින් හෝ තලයෙන් හෝ තුඩින් හෝ කඩුමිටින් හෝ මරා ද, එහි විසඞ්කෙතය වේ. මේ නයින් සියලු ආයුධ ප්‍රභෙදයන්හි සඞ්කෙත විසඞ්කෙතතාවෝ දතයුත්තාහ.

ඊර්‍ය්‍යාපථයෙහි යමෙක් 'යන්නා වූ මොහු මරව' යි කියා ද, අණ ලද්දේ ද යන්නා වූ ඔහු මරා ද, විසඞ්කෙතයක් නැත්තේ ය. 'යන්නහු ම මරව'යි කියන ලද්දේ වනාහි, ඉදින් හුන්නහු මරා ද, හුන්නහු ම මරව යි කියන ලද්දේ, යන්නහු මරා ද, එහි විසඞ්කෙතය වේ. මේ නයින් සියලු ඊර්‍ය්‍යාපථ ප්‍රභෙදයන්හි සඞ්කෙත විසඞ්කෙතතාවෝ දතයුත්තාහ.

ක්‍රියාවිශෙෂයෙහි ද 'විද මරව' යි කියන ලද්දේ විද මරා ද, විසඞ්කෙතයක් නැත්තේ ය. යමෙක් වනාහි 'විද මරව'යි කියන ලද්දේ, අත් පා ආදිය සිඳ දමා මරා ද, විසඞ්කෙතය වේ. මේ නයින් සියලු ක්‍රියාවිශෙෂ ප්‍රභෙදයන්හි සඞ්කෙත විසඞ්කෙතතාවෝ දත යුත්තාහ.

යමෙක් වනාහි ලිඞ්ගවශයෙන් 'දිග්වූවකු මිටිවූවකු කලුපැහැතියකු සුදුපැහැතියකු කෙට්ටුවූවකු තරවූවකු මරව'යි නියම නොකොට අණ කෙරේ ද, අණ ලදුයේ ද එබඳු වූ යම් කිසිවකු මරා ද විසඞ්කෙතයක් නැත්තේ ය. දෙදෙනාහට ම පාරාජිකය වේ. තවද හෙතෙමේ තමන් සඳහා ම අණවා ද, අණවන ලදුයේ 'මෙතෙමේ ම මෙබඳුය'යි අණ කළහු ම මරා ද, අණ කළහුට දුක්කටය වේ. වධකයාහට පාරාජිකය වේ. ආණපක තෙමේ තමන් සඳහා අණවා නම්, අනික් තැනැත්තේ එවැනි අනෙකකු මරා ද, ආණපක තෙමේ මිදෙන්නේ ය. වධකයාහට ම පාරාජිකය වේ. කුමක් හෙයින යත්:- අවකාශය තමන් නියම නොකළ බැවිනි. ඉදින් වනාහි තමන් සඳහා අණවනුයේ ද 'අසුවල් රාත්‍රි ස්ථානයෙහි දී හෝ දිවාස්ථානයෙහිදී හෝ ඵෙරාසනයෙහි හෝ නවකාසනයෙහි හෝ මදධ්‍යමාසනයෙහි හෝ හුන් මෙවැන්නහු මරව'යි අවකාශය නියම කෙරේ ද, එහි ද හුන්නේ අනෙකෙක් වේ ද, අණවන ලදුයේ ඔහු මරා ද, වධක තෙමේ නොමිදෙන්නේ ම ය. ආණපක තෙමේ ද නො

මිදෙන්නේ ය. කුමක් හෙයින යත්:- අවකාශය නියම කළ බැවිනි. නියම කළ තැනින් අන් තැනක දී මරා ද, ආණාපක තෙමේ මිදෙන්නේ ය. මේ ක්‍රමය **මහාඅට්ඨකථාවෙහි** මැනැවින් දැඩි කොට කියන ලද්දේ ය. එහෙයින් මෙහි අනාදරය නො කටයුතු ය.

අට්ඨකථාය යන මාතෘකාවශයෙන් ආණත්තිකප්‍රයොගකථා නිමි.

—\\—

දැන් **'දූතෙන'** යන මේ මාතෘකාපදය පිළිබඳ නිර්දේශය දක්වනු පිණිස **'භික්ඛු භික්ඛුං ආණාපෙති'** යනාදී වූ යම් සිවු වාර කෙනෙක් වදරණ ලද්දහු ද, ඔවුනතුරෙහි **'සො තං මඤ්ඤමානො'** ඒ ඇණවුම් ලද්දේ ආණාපකයා විසින් 'යමෙක් තෙමේ මෙනම් ඇත්තේ ය'යි කියන ලද්දේ ද, ඔහු යි හහිමින් ඔහු ම ජීවිතයෙන් තොර කෙරේ ද, දෙදෙනාහට ම පාරාජිකය වේ. **'තං මඤ්ඤමානො අඤ්ඤං'** යමකු ජීවිතයෙන් තොර කරව යි කියන ලද්දේ, ඔහු යි හහිමින් එබඳු වූ අනෙකකු ජීවිතයෙන් තොර කෙරේ ද, ඇණවූවහුට ඇවැත් නො වේ. **'අඤ්ඤං මඤ්ඤමානො තං'** ඇණවූවහු විසින් යමෙක් දක්වන ලද්දේ ද, ඔහුගේ සමීපයෙහි සිටි බලවත් සහායයකු දැක, 'මොහුගේ බලයෙන් මෙතෙමේ යන්නේ ය, එහෙයින් පළමු කොට මොහු ජීවිතයෙන් තොර කරමි'යි පහර දෙන්නේ පෙරැළී එතැන සිටි අන්‍යයාම යහළුවා යි හහිමින් ජීවිතයෙන් තොර කෙරේ ද දෙදෙනාහට පාරාජිකය වේ. **'අඤ්ඤං මඤ්ඤමානො අඤ්ඤං'** පෙර කියූ නයින් ම වනාහි 'මොහුගේ මේ යහළුවා ජීවිතයෙන් තොර කරමි'යි යහළුවා ම ජීවිතයෙන් තොර කෙරේ ද, ඔහුට ම පාරාජිකය වේ.

දූතපරම්පරාපදයාගේ නිර්දේශවාරයෙහි **'ඉත්ථන්නාමස්ස පාවද'** යනාදි තන්හි එකෙක් ඇදුරු ය. බුද්ධරක්ඛිත - ධම්මරක්ඛිත - සඞ්ඝරක්ඛිත නම් ඇති තිදෙන අතවැසියෝය යි දතයුත්තාහ. එහි **'භික්ඛු භික්ඛුං ආණාපෙති'** ඇදුරු තෙමේ කිසියම් පුද්ගලයකු මරවනු කැමැත්තේ ඒ කරුණ කියා, බුද්ධරක්ඛිතහට 'මෙනම් ඇත්තහුට කියව'යි අණවා ද 'බුද්ධරක්ඛිත! තෝ යව, මේ කරුණ ධම්මරක්ඛිතහට කියව, මෙනම් ඇත්තේ මෙනම් ඇත්තහුට කියාවා යි. ධම්මරක්ඛිත තෙමේ ද සඞ්ඝරක්ඛිතහට කියාවා:- මෙනම් ඇත්තේ මෙනම් ඇත්තහු ජීවිතයෙන් තොර කෙරේවා යි. මෙසේ තා විසින් අණවනලද ධම්මරක්ඛිත විසින් අණවනලද සඞ්ඝරක්ඛිත තෙමේ මෙනම් ඇති පුද්ගලයා ජීවිතයෙන් තොර කෙරේවා, හෙතෙමේ වනාහි අප අතුරෙහි වීර සභාවය ඇත්තේ ය, මේ ක්‍රියාවෙහි

ප්‍රතිබල ඇත්තේය යි. **'ආපත්ති දුක්කටස්ස'** මෙසේ අණ කරන්නා වූ ඇදුරුහට පළමු කොට දුක්කටය වේ. **'සො ඉතරස්ස ආරොචෙති'** බුද්ධරක්ඛිත තෙමේ ධම්මරක්ඛිතහට, ධම්මරක්ඛිත තෙමේ ද සඞ්ඝරක්ඛිතහට, 'මෙනම් ඇත්තහු ජීවිතයෙන් තොර කරව'යි අපගේ ඇදුරු තෙමේ මෙසේ කියයි, තෝ අප අතරෙහි වීරපුරුෂයි සැලකෙරේ ද, මෙසේ ඇති කල්හි ඔවුන්ට ද ආරොචන හෙතුවෙන් දුක්කටය වේ. **'වධකො පතිගණ්හාති'** මැනැව, තොර කරන්නෙමි'යි සඞ්ඝරක්ඛිත තෙමේ පිළිගණියි. **'මූලට්ඨස්ස ආපත්ති ථුල්ලච්චයස්ස'** සඞ්ඝරක්ඛිත විසින් පිළිගත් ඇසිල්ලෙහි ඇදුරුහට ථුල්ලච්චය වේ. මහාජන තෙමේ වනාහි ඔහු විසින් පාපයෙහි යොදන ලද්දේ ද එහෙයිනි. **'සො තං'** ඉදින් ඒ සඞ්ඝරක්ඛිත තෙමේ ඒ පුද්ගලයා ජීවිතයෙන් තොර කෙරේ නම්, සිවු දෙනාහට ම පාරාජිකය වේ. ඒ සිවුදෙනාහට පමණක් ම නො වේ. මේ උපායයෙන් විසඳෙකත නො කොට පරම්පරාවෙන් අණවන්නා වූ ශ්‍රමණයන් සියයක් හෝ වේවා, දහසක් හෝ වේවා, සියල්ලන්ට පාරාජිකය වේ.

විසඤ්ඤීයදූතපද නිදේශයෙහි **'සො අඤ්ඤං ආණාපෙති'** ඇදුරහු විසින් අණවනලද ඒ බුද්ධරක්ඛිත තෙමේ ධම්මරක්ඛිත නො දක හෝ නො කියනු කැමැතිව හෝ සඞ්ඝරක්ඛිත කරා ම එළැඹ 'අපගේ ඇදුරු තෙමේ මෙනම් ඇත්තහු ජීවිතයෙන් තොර කරව'යි මෙසේ කීයේ ය යි විසඳෙකත කරමින් අණ කෙරේ ද, විසඳෙකත කරණයෙන් ම මෙතෙමේ'විසඤ්ඤීයදූත'යි කියනු ලැබේ. **'ආපත්ති දුක්කටස්ස'** ඇණවීම නිමිත්තෙන් පළමු කොට බුද්ධරක්ඛිතහට දුක්කටය වේ. **'පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස'** සඞ්ඝරක්ඛිත විසින් පිළිගත් කල්හි මූලසථායාහට ම දුක්කටය වේය යි දතයුතු ය. මෙසේ ඇති කල්හි පිළිගැණීම නිමිති කොට ආපත්තිය නො ම වන්නී ද, සඤ්චරිත්තය පිළිගැණීම මරණයට සතුටුවීම යන මොවුන් නිමිති කොට ආපත්තිය නො ම වන්නී ද, සඤ්චරිත්තය පිළිගැණීම මරණයට සතුටුවීම යන මොවුන් නිමිති කොට ආපත්තිය වන්නී නම්, මරණය පිළිගැණීම නිමිති කොට කෙසේ නො වන්නී ද, එහෙයින් පිළිගන්නහුට ම මේ දුක්කටය වේ. එහෙයින් ම මෙහි මූලසථායාහට යි නො කියන ලදී. පෙර නයින් ද, හෙවත් අවිසඤ්ඤීය දූත නිදේශයෙන් ද මේ දුක්කටය පිළිගන්නහුටය යි දතයුත්තේ ම වේ. අවකාශයක් නැති බැවින් නො කියන ලද්දේ ය. එහෙයින් යමෙක් යමෙක් පිළිගණී ද, ඔහුට ඔහුට ඒ පිළිගැණීම් හෙතුවෙන් ආපත්තිය මැ යි මේ මෙහි අපගේ රුචිය වේ. මෙහි යම්සේ ද අදින්නාදනයෙහි ද එසේ ය. ඉදින් වනාහි සඞ්ඝරක්ඛිත තෙමේ ඔහු ජීවිතයෙන් තොර කෙරේ ද, අණ කළ බුද්ධරක්ඛිතහට ද දිවි තොර කළ

සඞ්ඝරක්ඛිතහට ද යන දෙදෙනාහට ම පාරාජිකය වේ. මූලසථ වූ ආචාර්‍යයා හට වනාහි විසඞ්කත බැවින් පාරාජිකයෙන් ඇවැත් නො වේ. ධම්මරක්ඛිතහට නො දන්නා බැවින් මුළුමනින් ම ඇවැත් නො වේ. බුද්ධරක්ඛිත තෙමේ වනාහි දෙදෙනාහට ම සොත්‍ථිභාවය කොට තෙමේ නැසුනේ ය.

ගතපච්චාගත නිදේශයෙහි **'සො ගන්ත්වා පුන පච්චාගච්ඡති'** ජීවිතයෙන් තොර කළ යුතු ඔහුගේ සමීපයට ගොස් මැනැවින් කළ ආරක්‍ෂා ඇති බැවින් ඔහු ජීවිතයෙන් තොර කරන්නට නො හැක්කේ එයි. **'යද සක්කොසි තද'** කිම? අද ම මරණ ලද්දේ, මරණ ලද්දේ වේ ද, යව, යම් කලෙක හැක්කෙහි ද? එකල ඔහු ජීවිතයෙන් තොර කරව යි. **'ආපත්ති දුක්කටස්ස'** මෙසේ නැවත ඇණවීමෙන් ද දුක්කටය ම වේ. ඉදින් වනාහි හෙතෙමේ එකාන්තයෙන් ජීවිතයෙන් තොර කළ යුත්තේ නම්, අත්‍ථසාධක චෙතනා තොමෝ මාඝීයට අනතුරු ඵලය සමාන වන්නී ය. එහෙයින් මෙතෙමේ අණ කළ කෙණෙහි ම පාරාජික වේ. ඉදින් වධක තෙමේ සැට වසක් ඉක්ම යෑමෙන් පසු ඔහු මරා ද, ආණපක තෙමේත් අතර දී ම කලුරිය කෙරේ ද, ගිහිබවට හෝ පැමිණේ ද, අශ්‍රමණයෙක්ව ම කලුරිය ද කරන්නේ ය. ගිහිබවට හෝ පැමිණෙන්නේ ය. ඉදින් ආණපක තෙමේ ගිහි කාලයෙහි මව හෝ පියා හෝ රහතකු හෝ සඳහා මෙසේ අණ කරවා පැවිදි වේ ද, ඔහු පැවිදි වූ කල්හි අණ ලදුයේ ඔහු මරා ද, ආණපක තෙමේ ගිහි කාලයෙහි ම මාතෘඝාතක හෝ පිතෘඝාතක හෝ අරහන්තඝාතක හෝ වේ. එහෙයින් ඔහුට පැවිද්ද නො ම හටගණියි. උපසම්පදව නො පිහිටයි. මැරිය යුතු පුද්ගල තෙමේ ඇණවීම කළ කාලයෙහි පෘථග්ජනව සිටියේ ද, යම් කලෙක්හි වනාහි අණ ලද්දේ ඔහු මරා ද, එකල්හි රහත්ව සිටියේ වේ ද, අණලද්දහුගෙන් හෝ පහර ලැබ දුඃඛමූලික ශ්‍රද්ධාව නිසා විදර්‍ශනා කරන්නේ රහත්බවට පැමිණ ඒ ආබාධයෙන් ම කලුරිය කෙරේ ද, ආණපක තෙමේ අණ කළ කෙණෙහි ම අරහන්තඝාතක වේ. වධක තෙමේ වනාහි සියලු තන්හි උපක්‍රම කළ කෙණෙහි ම පාරාජික වේ.

දැන් දූතවසයෙන් කියූ මේ සියලු ම මාතෘකා පදයන්හි සඞ්කෙත විසඞ්කෙත දක්වනු පිණිස යම් වාර තුණක් වදරණ ලද ද, ඔවුනතුරෙහිහි ප්‍රථම වාරයෙහි වනාහි යම්හෙයකින් ඒ වචනය ශීඝ්‍රව හෝ කියනුයේ ඔහුගේ බිහිරි බැවින් හෝ 'නො නසව' යන මේ වචනය නො අස්වා ද එහෙයින් මූලසථ තෙමේ පරිජියෙන් නො මිදුනේ ය. දෙවනවර ඇස් වූ බැවින් මිදුනේ ය. තෙවනවර වනාහි ඔහු විසින් ඇස් වූ බැවින් ද

අන්‍යයා විසින් මැනැවැ'යි පිළිගෙණ වැළකුනු බැවින් ද දෙදෙන ම මිදුනාහ.

දූතකථා නිමි.

—\\—

'අරහො රහොසඤ්ඤී' යන නිදේශාදීන් අතුරෙහි **අරහො** යනු හමුවෙහි ය. **රහො** යනු නො හමුවෙහි ය. එහි යමෙක් උපසථාන කරණ කාලයෙහි වෛරී භික්ෂූන් සමග අවුත් ඉදිරියෙහි හුන් කල්හි ම අන්ධකාර දෙෂයෙන් ඔහු ආ බව නො දන්නේ 'එකාන්තයෙන් මෙනම් ඇත්තේ නැසුනේ වන්නේ නම් මැනැවි, හොරු ද ඔහු නො නසති, සපීයෙක් ඩැහ නො ගනියි, සැතක් හෝ විසක් හෝ නො එළවා' යි ඔහුගේ මරණයට සතුටු වෙමින් මෙබඳු වචන කියා ද, මෙතෙමේ හමුවෙහි වූයේ නො හමුවෙහි වූයේය යන සංඥා ඇතිව කියා නම් වේ. ඔහු හමු වූ කල්හි ම පරාඩ්මුඛසංඥා ඇත්තේ ය යන අර්ථ යි. යමෙක් වනාහි ඉදිරියෙහි හුන් ඔහු දක නැවත උපසථාන කොට ගිය භික්ෂූන් සමග ඔහු ගිය කල්හි ද හෙතෙමේ මෙහි ම හුන්නේ ය යන සංඥා ඇතිව මූල කියූ ලෙසින් ම කියා ද, මේ රහසිව නො රහස් සංඥා ඇතිව කියා නම් වේ. මේ උපායයෙන් ම **'අරහො අරහො සඤ්ඤි රහො රහො සඤ්ඤී ච'** යනු ද දතයුත්තේ ය. මේ සිවුදෙනාහට ම වචනයක් වචනයක් පාසා දුක්කටය වේය යි දතයුතු ය.

දැන් මරණසංවර්ණනාවෙහි විභාග දක්වනු පිණිස කියන ලද පස් වැදරුම් කයින් සංවර්ණනා දී වූ මාතෘකා නිදේශයන්හි **'කායෙන විකාරං කරොති'** සැතක් හෝ ගෙණ විෂක් හෝ අනුභව කොට රෝහණකින් හෝ බැඳ උඩ එල්වා හෙබ් ආදියෙහි හෝ වැටී යමෙක් මැරේ ද, හෙතෙමේ වනාහි ධනය හෝ ලබයි, යසස හෝ ලබයි, සුගතියට හෝ යයි, යන මේ අර්ථය මොහු විසින් කියන ලද යි යම්සේ හෙතෙමේ දනී ද, එසේ හස්තාමුද්‍රාදියෙන් දක්වයි. **'වාචාය භණති'** ඒ අර්ථය ම වාග්‍රොද කොට කියයි. තෙවන වාරය කාය වාක් දෙක පිළිබඳ කොට වදරණ ලද්දේ ය. සියලු තන්හි මරණය පිළිබඳ ගුණ කීමෙහි ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටය වේ. ඔහුට දුක් ඉපදීමෙහි ලා ගුණ කීවහුට ථුල්ලච්චය වේ. යමකු උදෙසා ගුණ වැර්ණීම කරණුලද ද ඔහු මළ කල්හි ගුණ වැර්ණූ කෙණෙහි ම ගුණ කීවහුට පාරාජිකය වේ. හෙතෙමේ එය නො දනී ද, අනෙකෙක් දැන 'මා විසින් එකාන්තයෙන් සැප උපදින උපායක් ලද'යි ඒ ගුණ කීම නිමිති කොට මැරේ ද, ඇවැත් නො වේ.

දෙදෙනකු උදෙසා ගුණ කීම කළ කල්හි ඔවුන්ගෙන් එකෙක් එය දන මැරේ ද, පාරාජිකය වේ. දෙදෙනම මැරෙත් ද පාරාජිකයට ද අකුසල රාසියකට ද පැමිණේ. බොහෝ දෙනා කෙරෙහි ද මේ නය වේ.

නො උදෙසා මරණය වණිනා කරමින් ඇවිදී ද, යමෙක් යමෙක් ඒ මරණ සංවණිනාව අසා දන මැරේ ද, සියලු දෙන ඔහු විසින් මරණ ලද්දහු වෙති. දූතයකු ලවා සංවණිනා කරවීමෙහි දී 'අසුවල් ගෙට හෝ ගමට හෝ ගොස්, මෙනම් ඇත්තහුට ම මරණයෙහි ගුණ වණිනා කරව'යි හසුන දන්වූ ඇසිල්ලෙහි දුක්කටය වේ. යමකු පිණිස යවන ලද්දේ නම් ඔහුට දුක් ඉපදීම නිමිති කොට මූලසථයාහට ථුල්ලච්චය වේ. මරණයෙන් පාරාජිකය වේ. 'මෙය සඟී මාඟියකැ'යි දන් දන්නා ලද්දේය යි දූත තෙමේ ඔහුට නො දන්වා තමන්ගේ නෑයකුහට හෝ දන්වා ද, ඔහු මළ කල්හි විසඬෙකතය වේ. මූලසථ තෙමේ මිදෙන්නේ ය. දූත තෙමේ එසේ ම සිතා තමන් ගුණ වැණීමෙහි කියන ලද්ද කොට මැරේ ද, විසඬෙකතය ම වේ. අසුවලාටය යි නො උදෙසා හසුන සැලකළ කල්හි දූතයාගේ ගුණ වැණීම නිමිති කොට යම් පමණ දෙන මැරෙත් ද, එපමණ ප්‍රාණඝාතයෝ වෙත්. ඉදින් මවු පියෝ මැරෙත් ද, ආනන්තය්‍යකර්මය ද වේ.

ලියවිල්ලෙන් කළ වැණුමෙහි **'ලෙඛං ඡින්දති'** 'යමෙක් සැතක් හෝ ගෙණ ප්‍රපාතයෙක හෝ වැටී අන්‍ය වූ අග්නිප්‍රවෙශ උදකප්‍රවෙශා දී වූ උපායයන්ගෙන් හෝ මැරේ ද, හෙතෙමේ මේ මේ දය ලබා යි හෝ එය ඔහුගේ ගුණයක් හෝ වේය යි පතෙක හෝ පොතෙක හෝ අකුරු ලියා ද, මෙහි ද දුක්කට ථුල්ලච්චයෝ කියූ නයින් ම දතයුත්තාහ. උදෙසා ලියන ලද්දෙහි යමකු උදෙසා ලියන ලද්දේ නම්, ඔහුගේ මරණයෙන් පාරාජිකය වේ. බොහෝ දෙනකු උදෙසා ලියන ලද්දෙහි යම් පමණ දෙන මැරෙත් ද, එපමණ වූ ප්‍රාණඝාතයෝ වෙත්. මවු පියන්ගේ මරණයෙන් ආනන්තය්‍යකර්මය වේ. නො උදෙසා ලියන ලද්දෙහි ද මේ නය ම වේ. බොහෝ දෙන මැරෙති යි විපිළිසර උන් කල්හි ඒ පොත දවා හෝ, යම්සේ අකුරු නො පෙණේ ද, එසේ කොට හෝ මිදෙන්නේ ය, එය අනෙකක්හුගේ පොතක් හෝ වේ ද, උදෙසා ලියන ලද්දක් හෝ වේ ද, නො උදෙසා ලියන ලද්දක් හෝ වේ ද, ගත් තැන තැබීමෙන් මිදෙන්නේ ය. ඉදින් මිල දී ගන්නා ලද්දේ වේ ද, පොත හිමියන්ට පොත ද, යම් කෙනකුන් අතින් මිල දී ගන්නා ලද්දේ වේ ද, ඔවුන්ට මිලක් දී මිදෙන්නේ ය. ඉදින් බොහෝ දෙන මරණයෙහි ගුණ ලියා තබන්නෙමු'යි එක් අදහස් ඇතිව එකෙක් ඒ පිණිස ගසකට නැගී කොළයක් සිඳ ගණියි. එකෙක් එය ගෙණ එයි. එකෙක් පොත කරයි. එකෙක් ලියයි.

එකෙක් කටුරෙඛා වන්නී නම් කළු මදියි. කළු මැද ඒ පොත සාද සියල්ලෝ ම සභාවක හෝ කඩ පිළක හෝ යන යම් තැනෙක ලියවිලි දක්මෙහි කුහුල් ඇති බොහෝ දෙන රැස්වෙත් ද එතැනක තබත්. ඒ පොත කියවා එකෙක් හෝ මැරේ නම් සියල්ලනට පාරාජිකය වේ. බොහෝ දෙනෙක් මැරෙත් නම් කියන ලද්ද සමාන වූ ම නය වේ. විපිළිසර උපන් කල්හි වනාහි ඒ පොත පෙට්ටියක ලා රකිත් නම් අනෙකෙක් ද එය දැක බැහැරට ගෙණ නැවත බොහෝ දෙනාට දක්වා ද, ඔවුහු නො මිදෙත් ම ය. පෙට්ටිය තිබියේවා, ඉදින් ඒ පොත ගහක හෝ මුහුදෙහි හෝ බහත් ද සේදීම හෝ කරත් ද, කුදු මහත් කඩ කොට සිඳීම හෝ කරත් ද, ගින්නෙහි ලා හෝ දවත් ද, මැනවින් උලන ලද්දවූ ද නො මනාව සෝදන ලද්ද වූ හෝ නො මනාව දවන ලද්ද වූ හෝ පත්‍රයෙක අකුරු පෙණේ නම් ඒ තාක් නො මිදෙන්නාහ. යම්සේ අකුරු නො පෙණේ ද, එසේ කළ කල්හි මිදෙන්නාහ.

දැන් සථාවරප්‍රයොගයෙහි විභාග දක්වනු පිණිස කියන ලද ඔපාතාදිමාතෘකා නිදේශයන්හි **'මනුස්සං ඔදිස්ස ඔපාතං ඛණති'** 'මෙනම් ඇත්තේ වැටී මැරෙන්නේය' යි කිසියම් මිනිසකු උදෙසා හෙතෙමේ යම් තැනක එකලාව හැසිරේ ද, එහි වළක් ගණී ද, කණින්නහුට පළමු කොට ජාතපෘථිවියෙහි කණී නම්, ප්‍රාණඝාතයාගේ ප්‍රයොග බැවින් ප්‍රයොගය නිමිති කොට දුක්කටය වේ. යමකු උදෙසා කණී නම් ඔහුට දුක් ඉපදීම නිමිති කොට ථුල්ලච්චය වේ. මරණයෙන් පාරාජිකය වේ. අනෙකකු වළ වැටී මළ කල්හි ඇවැත් නො වේ. ඉදින් නො උදෙසා 'යම් කිසිවෙක් මැරෙන්නේය' යි කණින ලද්දේ වේ ද, එහි යම් පමණ දෙන වැටී මැරෙත් ද, එපමණ ප්‍රාණඝාතයෝ වෙත්. ආනන්තය්‍යවසතුන්හි ද ආනන්තයයිකර්මය ද වේ. ථුල්ලච්චය පාචිත්තිය වස්තූන්හි ථුල්ලච්චය පාචිත්තියාපත්තිහු වෙත්. එහි චෙතනා බොහෝ ය. කවර චෙතනාවකින් පාරාජිකය වේ ද, යන මෙහිලා **මහාඅට්ඨකථාවෙහි** වනාහි 'වළ ගැඹුරින් ද දිග පළලින් ද කැණ තමන් සැලකු පමණෙහි තබා නවතා, උස් පෙදෙස් සැස පිසදමා පස් පැස උදුරන්නහුගේ සන්නිට්ඨාපක අට්ඨසාධක චෙතනා තොමෝ මාඝීයට අනතුරු වූ ඵලය සමාන වන්නී ය. ඉදිනුදු අවුරුදු සියයක්හුගේ ඇවැමෙන් වළ වැටී එකාන්තයෙන් මැරෙණ සත්ත්වයෙක් වේ නම්, සන්නිට්ඨාපකචෙතනාවෙන් පාරාජිකය වේය'යි කියනලදී.

මහාපච්චරියෙහි හා සඞ්ඛෙපට්ඨකථාවෙහි ද 'මේ වළෙහි වැටී මැරෙන්නේය' යි එක් උදලු පහරකුදු දුන් කල්හි එකි කිසිවෙක් පැකිළී වැටී මැරේ ද, පාරාජිකය ම වේ. සූත්‍රානතික සථවිරයන් වහන්සේලා

වනාහි සන්නිට්ඨාපක චෙතනාව ගණිත් යි කියනලදී. එකෙක් වළක් කැණ 'අසුවලා ගෙණුවුත් මෙහි හෙළා මරව'යි අනිකක්හට අණ කෙරේ ද, හෙතෙමේ ඔහු ගෙණුවුත් හෙළා මරා ද දෙදෙනාහට පාරාජිකය වේ. අනෙකකු හෙළා මරා ද, තෙමේ වැටී මැරේ ද, අනෙකෙක් තමන්ගේ ධර්මතාවෙන් වැටී මැරේ ද, හැම තන්හි විසඬෙකතය වේ. මූලසථ තෙමේ මිදෙන්නේ ය. අසුවල් තෙමේ අසුවලා ගෙණුවුත් මරන්නේය යි වළ සෑරූ කල්හි ද මේ නය ම වේ. 'යම් කෙනෙක් මැරෙණු කැමැත්තාහු නම් ඔවුහු මෙහි වැටී මැරෙන්නාහ යි වළ කණී ද, එකක්හුගේ මැරීම නිමිති කොට පාරාජිකය වේ. බොහෝ දෙනාගේ මරණය නිමිති කොට අකුසල රාසියක් වේ. මවු පියන්ගේ මැරීම නිමිති කොට ආනන්තර්‍යකර්මය වේ. ථුල්ලච්චය පාචිත්තිය වසූන්හි ථුල්ලච්චය පාචිත්තියාපත්තීහු වෙත්. යම් කිසි කෙනෙක් මරණු කැමැත්තාහු ද ඔවුහු මෙහි හෙළා මරන්නාහ යි වළ කණී ද, එහි හෙළා මරත් ද, එකකු මළ කල්හි පාරාජිකය වේ. බොහෝ දෙනකුන් මළ කල්හි අකුසල රාසියක් වේ. ආනන්තර්‍යාදි වසූන්හි ආනන්තර්‍යාදීහු වෙත්. රහත්හු ද මෙහි ම සඞ්ග්‍රහයට යෙත්.

'මරණු කැමැත්තාහු මෙහි මරන්නාහ'යි පෙර කියූ නයෙහි මැරෙණු කැමැති බැවින් ඔවුන්ගේ වැටීමෙක් නැත්තේය යි ඔවුහු සඞ්ග්‍රහ කරණු නො ලබත්. දෙවැදෑරුම් නයයෙහි තමන්ගේ ධර්මතාවෙන් වැටී මළ කල්හි විසඬෙකතය වේ. යම් කිසි කෙනෙක් තමන්ගේ වෛරීන් මෙහි හෙළා මරන්නාහ යි වළ කණීත් ද, එහි ද වෛරීහු වෛරීන් හෙළා මරත් ද, එකකු මළ කල්හි පාරාජිකය වේ. බොහෝ දෙනකුන් මළ කල්හි අකුසල රාසිය වේ. මව හෝ පියා හෝ රහතකු හෝ වෛරීන් විසින් ගෙණුවුත් එහි මැරූ කල්හි ආනන්තර්‍යය වේ. තමන්ගේ ධර්මතාවෙන් වැටී මළ කල්හි විසඬෙකතය වේ. යමෙක් වනාහි 'මරණු කැමැත්තා වූ හෝ නො මරණු කැමැත්තා වූ හෝ මරවනු කැමැත්තා වූ හෝ නො මරවනු කැමැත්තා වූ හෝ යම් කිසි කෙනෙක් මෙහි හෙළනාහු හෝ හෙළන ලද්දහු හෝ මැරෙන්නාහ යි මුළුමනින් නො උදෙසා ම කණී ද, යමෙක් මැරේ ද, ඔහුගේ ඔහුගේ මරණයෙන් සුදුසු පරිදි කර්මය ද පහස යි. ඇවැතට පැමිණේ. ඉදින් ගැබිනියක් ගැබ සහිතව වැටී මැරේ ද, ප්‍රාණඝාත දෙකක් වේ. ගැබ ම නැසේ නම් එක් ප්‍රාණඝාතයක් වේ. සොරුන් විසින් ලූහු බඳිනා ලද්දේ වැටී මැරේ ද, වළ සෑරුවහුට ම පාරාජිකය වේ. සොරු එහි හෙළා මරත් ද පාරාජික ම වේ. එහි වැටුනු ගැබිනියක පිටතට ගෙණ මරත් ද පාරාජිකම වේ. කුමක් හෙයින යත්:- වළෙහි වැටුනු ප්‍රයෝගයෙන් ගත් බැවිනි. වළෙන් ගොඩ ඇවිත් ඒ ආබාධයෙන් ම මැරේ ද, පාරාජික ම වේ. අවුරුදු බොහෝ ගණනක්

ඉක්ම ගොස් නැවත කිපියා වූ ඒ ආබාධයෙන් ම මැරේ ද, පාරාජික ම වේ. වළෙහි වැටීම් හේතුවෙන් උපන් රොගයෙන් ගිලන් වූවහුට ම අන් රොගයෙක් හටගණී ද, එහි වළෙහි වැටීමෙන් හටගත් රොගය ඉතා බලවත් වේ ද, එයින් මළ කල්හි ද වළ කැණූයේ නො මිදෙන්නේ ය. පසුව හටගත් රොගය බලවත්ව ගියේ වේ ද, එයින් මළ කල්හි මිදෙන්නේ ය. මුලින් හටගත් රොගය හා පසුව හටගත් රොගය යන දෙකෙන් මළ කල්හි නො මිදෙන්නේ ය. ඔපපාතිකව මනුෂ්‍යයෙක් වළෙහි ඉපද ගොඩ නගින්නට නො හැකිව එහි ම මැරේ ද, පාරාජික ම වේ. මිනිසකු උදෙසා කැණූ වළෙහි යක්ෂාදීන් වැටී මළ කල්හි ඇවැත් නො වේ. යක්ෂාදීන් උදෙසා කැණූ වළෙහි මනුෂ්‍යාදීන් වැටී මැරෙණ කල්හි ද මේ නය වේ. යක්ෂාදීන් උදෙසා වළ කණින්නාහුට වනාහි කැණීමෙහි ද ඔවුන්ට දුක් ඉපදීමෙහි ද දුක්කටම වේ. මරණයෙහි වසනු වශයෙන් ථුල්ලච්චය හෝ පාචිත්තිය හෝ වේ. නො උදෙසා කැණූ වළෙහි යක්ෂ රූපයෙන් හෝ ප්‍රේතරූපයෙන් හෝ වැටී තිරශ්චීන රූපයෙන් මැරේ ද, එහි වැටුන රූපය පමණ වේ. එහෙයින් ථුල්ලච්චය යි **උපතිස්ස** ස්ථවිරයන් වහන්සේ කීහ. මරණ රූපය පමණ වේ. එහෙයින් පාචිත්තිය යි **ඵුස්සදේව** ස්ථවිරයන් වහන්සේ කීහ. තිරශ්චීනරූපයෙන් වැටී යක්ෂ ප්‍රේතරූපයෙන් මළ කල්හි ද මේ නය ම වේ. වළ කැණූයේ වළ අනෙකක්හට විකුණා ද, මිල නො ගෙණ හෝ දේ ද, යමෙක් යමෙක් එහි වැටී මැරේ ද, ඒ හෙතුවෙන් ඔහුට ම ආපත්තිය ද කම්යෙන් බැඳීම ද වන්නේ ය. යමකු විසින් එය ලද්දේ ද, හෙතෙමේ නිදෙස් ය.

නැවත හෙතෙමේ ද 'මෙසේ මෙහි වැටුනාහු ගොඩ නගින්නට නො හැක්කාහු නැසී යන්නාහ, සුවසේ ගොඩ නැගිය හැක්කාහු නො වන්නාහ යි ඒ වළ ඉතා ගැඹුරු වූවක් හෝ ඉතා උඩුහුරු වූවක් හෝ ඉතා දිග් වූවක් හෝ ඉතා ලුහුඩු වූවක් හෝ ඉතා පුළුල් වූවක් හෝ ඉඩ පහසු ඉතා අඩු වූවක් හෝ කෙරේ ද, දෙදෙනාහට ම ආපත්තිය ද කම්යෙන් බැඳීම ද වේ. 'බොහෝ දෙන මැරෙති'යි මූලස්ථයාහට විපිළිසරයක් උපන් කල්හි හෙතෙමේ වළ පස්වලින් පුරවා ද, එහෙත් කිසිවෙක් පයෙහි වැටී මැරේ ද, පස් පිරවීමෙන් ද, මූලස්ථයාහට එයින් මිදීමෙක් නැත්තේ ය. නො මිදෙන්නේ ය. වැසි වස්නා කල්හි මඩ වේ ද, එහි ගැලී මළ කල්හි ද, පාරාජික වේ. රුකක් හෝ හෙන්නේ, වාතය හෝ වැසිදිය හෝ පස් පහ කෙරේ ද, අල මුල් පිණිස හෝ පොළොව කණින්නාහු එහි වළක් කෙරෙත් ද, ඉදින් කිසිවෙක් එහි ලැගී හෝ වැටී හෝ මැරේ ද, මූලස්ථ තෙමේ නො මිදෙන්නේ ය. ඒ අවකාශයෙහි මහත් විලක් හෝ පොකුණක් හෝ කරවා සැයක් හෝ පිහිටුවා බෝධියක්

හෝ රෝපණය කොට ආවාසයක් හෝ ගැල්මගක් හෝ කරවා මිදෙන්නේ ය. යම් කලෙක සථිර කොට පිරුණු වළෙහි ගස් වැල් ආදියෙහි මුල්, මුල්වලින් ඝනව හෙවුනාහු ගෙතුනාහු වෙත් ද, ජාතපඨවිය හෝ වූවා ද, එකල්හි ද මිදෙන්නේ ය. ඉදිතුදු ගඩගාවක් ගලා අවුත් වළ ගසා ගෙණ යා ද, මෙසේ ද මිදෙන්නේ ය.

මේ වනාහි ඔපාතකථාය.

—\\—

ඔපාතයට ම අනුලොම් වූ පාසාදියෙහි ද - යමෙක් 'සත්ත්වයෝ මෙහි බැඳී මැරෙන්නාහ'යි මළපුඩු අටවා ද, එකතින් එහි බැඳෙන සත්ත්වයන්ගේ වසයෙන් මළපුඩු අටවා අතින් මිදුනු ඇසිල්ලෙහි පාරාජික - ආනන්තරිය - ථුල්ලච්චය - පාචිත්තියයෝ දකයුත්තාහ. උදෙසා ඇටවූ කල්හි යමකු උදෙසා අටවන ලද්දේ නම් එයින් අන්හු බැඳීමෙහි ආපත්ති නො වන්නී ය. මළය මිලයට හෝ නො මිලයේ හෝ දුන් කල්හි ද මූලසථායාහට ම කම්බන්ධනය වේ. ඉදින් එය යමකු විසින් ලද්දේ නම් හෙතෙමේ ගිලිහුනු හෝ මළය තබා ද, පසෙකින් හෝ යන්නවුන් දැක වැටක් කොට හමුවෙහි ප්‍රවෙශ කෙරේ ද, පාශයෂ්ටියෙහි සථිරභාවය පිණිස අනික් යටක් සමග දැඩිතරව බැඳ හෝ තබා ද, දැඩිතර කොට පාස රැහණක් හෝ බඳී ද, පාශයෂ්ටිය බඳිනු පිණිස සථිරභාවය පිණිස අනික් යටක් සමග දැඩිතරව බැඳ හෝ තබා ද, දැඩිතර කොට පාස රැහණක් හෝ බඳී ද, පාශයෂ්ටිය බඳිනු පිණිස සථිරතර වූ කණුවක් හෝ සිටුවාද, දෙදෙන ම නො මිදෙන්නාහ. ඉදින් මූලසථායාහට විපිළිසරයක් උපන් කල්හි පාශය උගුලුවා දමා යේ ද, අන්‍යයෝ එය දක නැවත පිහිටුවත් ද එහි බැඳුනු බැඳුනෝ මැරෙක් ද, මූලසථ තෙමේ නො මිදෙන්නේ ය. ඉදින් වනාහි ඔහු විසින් පාශයෂ්ටිය තමන් නො කරණ ලද්දී වේ ද, ගත් තැන තැබීමෙන් මිදෙන්නේ ය. එහි හටගත් පාශයෂ්ටිය සිඳලීමෙන් මිදෙන්නේ ය. තමන් කළ යෂ්ටිය රකින්නේ ද නො මිදෙන්නේ ය. ඉදින් අනෙකෙක් එය ගෙණ මළපුඩුව පිහිටුවා ද, ඒ හෙතුවෙන් මැරෙණ කල්හි මූලසථයා නො මිදෙන්නේ ය. ඉදින් එය දවා පෙණෙහෙලි කොට බැහැර ලන්නේ ද, ඒ පෙණහෙල්ලෙන් පහර ලැබ මැරණ කල්හි ද නො මිදෙන්නේ ය. මුළුමනින් දැවීමෙන් හෝ නැසීමෙන් හෝ මිදෙන්නේ ය. අන්‍යයන් විසින් වැටි කළ මළපුඩු රැහැණ ද ගත් තැන තැබීමෙන් මිදෙන්නේ ය. කුඩා රැහැන් ලැබ තමන් වැටි කරණ ලද්ද නැවත වෙන් වෙන් කොට වැහැරි ලැබ වැටි කරණ ලද්ද තීරු තීරු කොට ලෑමෙන් මිදෙන්නේ ය. වනයෙන් තමන් වැහැරි

ගෙණවුත් වැටි කරණ ලද්ද රකින්නේ ද නො මිදෙන්නේ ය. මුළුමනින් දැවීමෙන් හෝ නැසීමෙන් හෝ මිදෙන්නේ ය.

යන්ත්‍රපාෂාණය සාදන්නේ පා සතරෙහි හබක තබා ඒ මත්තෙහි ගල් නගා තබා ද, ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටය වේ. සියල්ල සාද නිම කොට අතින් මිදුනු ඇසිල්ලෙහි එකකින් එයට යට කළ යුතු සත්ත්වයන්ගේ වසයෙන් උදෙස් නො උදෙස් ඇත්තවුන්ට අනුරූප වශයෙන් පාරාජිකාදීහු දතයුත්තාහ. යන්ත්‍රපාෂාණය මිලයට හෝ නො මිලයේ හෝ දුන් කල්හි ද මූලසථයාහට ම කම්බන්ධනය වේ. යමකු විසින් එය ලද්දේ නම්, හෙතෙමේ වැටුනක් හෝ ඔසොවා ද, අන්‍ය වූ ද ගල් නගා තබා ඉතා බරවූවක් හෝ කෙරේ ද, පසෙකින් හෝ යන්නවුන් දක වැටක් කොට යන්ත්‍රපාෂාණයෙහි ඇතුල් කෙරේ ද දෙදෙන ම නො මිදෙත්. ඉදින් විපිළිසරයක් උපන් කල්හි යන්ත්‍රපාෂාණය හෙළා යේ ද, අනෙකෙක් එය දක ගෙණ පිහිටුවා ද, මූලසථ තෙමේ නො මිදේ. පාෂාණය ගත් තැන ම තබා අදූහලපාදයෙහි හා පාශයෂ්ටියෙහි කියූ නයින් ගත් තැන ම තැබීමෙන් හෝ දැවීමෙන් හෝ මිදේ.

හුල් නගා තබන්නහුට ද සියල්ල සාද නිම කොට අතින් මිදුනු ඇසිල්ලෙහි හුල් මුවෙහි වැටී අවශ්‍යයෙන් මැරෙණ සත්ත්වයන්ගේ වසයෙන් උදෙස් නො උදෙස් ලෙසින් පාරාජිකාදීහු දතයුත්තාහ. හුල මිලයට හෝ නො මිලයේ දුන් කල්හි ද මූලසථයාහට කම්බන්ධනය වේ. ඉදින් යමකු විසින් උල ලද්දේ නම්, හෙතෙමේ 'එක් පහරින් ම මැරෙන්නාහ'යි ඉතා මොටවූවක් හෝ කෙරේ ද, උසැ යි සලකා ඉතා මිටි වූවක් හෝ මිටි යි සලකා ඉතා උස්වූවක් හෝ කොට, නැවත නගා තබා ද, වක්වූවක් සෘජු හෝ කෙරේ ද, ඉතා සෘජුවූ වක් මදක් නැමුනක් හෝ කෙරේ ද, දෙදෙන ම නො මිදෙත්. ඉදින් වනාහි එය නො සුදුසු තැන තුබුනේය යි අන් තැනක තබා ද, මරණු පිණිස ඒ උල මුල පටන් සොයා වනයට ගොස් රුකක් සිඳ ගෙණ අවුත් සැස කරණ ලද්දේ වේ ද, මූලසථ තෙමේ නො මිදේ. නො සොයා කරණ ලද්දක් ම ලැබ නගා තැබූ කල්හි මූලසථ තෙමේ මිදේ. විපිළිසර උපන් කල්හි පාශයෂ්ටියෙහි කියූ නයින් ගත් තැන තැබීමෙන් හෝ දවා ලීමෙන් හෝ මිදේ.

'අපස්සෙනසථං වා' යන මෙහි **අපස්සෙන** නම් නිත්‍යපරිභොග වූ ඇඳක් හෝ පුටුවක් හෝ හේත්තු ලැලි කඩක් හෝ දිවාසථානයෙහි හුන්නහුගේ හේත්තු කණුව හෝ, එහි හටගත් රුකක් හෝ, සක්මනෙහි සිටින්නහුට හේත්තුවීම පිණිස වූ රුකක් හෝ එල්බෙන පුවරුකඩක් හෝ යන මේ සියල්ල හේත්තු යුතු අර්ථයෙන් අපස්සෙන නම් වේ. ඒ

අපසෙසනයෙහි පිට දී සිටින්නහු යම් සේ විදීම හෝ කෙරේ ද, සිදීම හෝ කෙරේ ද එසේ කොට වැ පොරෝ අඩයටි ලියන කටු ආදීන් අතුරෙහි එක්තරා ශස්ත්‍රයක් තබා ද, දුක්කට වේ. නිත්‍යපරිභොගස්ථානයෙහි නිසැකව හුන්නහුට හෝ නිදන්නහුට හෝ හේත්තුවන්නහුට හෝ ශස්ත්‍රඝාතී හෙතුවෙන් දුක් ඉපදීම නිමිති කොට ථුල්ලච්චය වේ. මරණයෙන් පාරාජිකය වේ.

ඔහුගේ අන්‍ය වූ ද වෛරී භික්ෂුනමක් විහාර චාරිකාවෙහි හැසිරෙන්නේ එය දැක 'මොහු මැරීම පිණිස මෙය තබන ලදැ යි හඟිමි, යහපති, මැනැවි, මැරේවා'යි සතුටු වෙමින් යේ ද, දුක්කටය වේ. ඉදින් වනාහි හෙතෙමේ ද එහි මෙසේ කළ කල්හි යහපතක් කරණ ලද්දේ වන්නේය යි ඉතා සියුම් කිරිමි ඇ කිරීමෙන් කිසි කම්යක් කෙරේ ද, ඔහුට ද පාරාජිකය වේ. ඉදින් වනාහි අස්ථානයෙහි තබන ලදැ යි උදුරා අන්තැනක තබා නම්, ඒ පිණිස ම කොට තැබූ කල්හි මූලස්ථ තෙමේ නො මිදේ. ප්‍රකෘති ස්වභාව ඇත්තක් ලැබ තබන ලද්දේ වේ නම් මිදේ. ඒ වැ පොරෝ ආදිය පහකොට ඉතා තියුණු වූ අනිකක් තබා නම් මූලස්ථතෙමේ මිදේ ම ය.

විෂ ආලෙපයෙහි ද, මරණයට සතුටුවීම නිමිති කොට යම්තාක් දුක්කටය වේ ද, ඒ තාක් මෙහි කියූ නය ම වේ. ඉදින් වනාහි හෙතෙමේ ද, ඇද පුටු ආදියෙහි ආලෙප කළ කුඩා විෂමණ්ඩලකැයි සලකා එය ඉතා මහත් කෙරේ ද, මහත්ය යි හෝ සලකා කුඩා කෙරේ ද, තුනී වූවකැ යි හෝ සලකා ඝන කෙරේ ද, ඝනවූවකැ යි හෝ සලකා තුනී කෙරේ ද, ගින්නෙන් තවා යට හෝ මතුවෙහි හෝ හසුරුවා ද, ඔහුට ද පාරාජිකය වේ. මේ විෂය අස්ථානයෙහි තබන ලදැයි සියල්ල ම සැස පිසදමා අන් තැනක තබා ද, තමන් බෙහෙත් යොද කළ කල්හි මූලස්ථ තෙමේ නො මිදේ. තමන් නො කළ කල්හි මිදේ. හෙතෙමේ 'මේ විෂ ඉතා මදය'යි සලකා අන් විෂයකුත් ගෙණ අවුත් එහි බහා ද, යමක්හුගේ විෂයෙන් මැරේ ද, ඔහුට පාරාජිකය වේ. ඉදින් දෙදෙනාම සතු විෂයෙන් මැරේ ද, දෙදෙනාහට ම පාරාජික වේ. මේ විෂය, වීර්‍ය්‍ය රහිත ය, විෂ නැතැ යි එය බැහැර කොට තමන්ගේ විෂය ම තබා ද ඔහුට ම පාරාජිකය වේ. මූලස්ථ තෙමේ මිදේ.

'දුක්ඛලං වා කරොති' ඇද පුටු, ඇඳවිට්ටම යටහාගය සිඳ දමා වේවැල්වලින් හෝ රැහැන්වලින් හෝ යන යමකින් පවත්නේ වේ ද, වියන ලද්දේ වේ ද ඒ වේවැල් රැහන් සිඳ දමා හෝ ටිකක් ම ඉතිරි කොට 'මෙහි වැටී මැරෙන්නේය'යි යට ආයුධයක් තබා ද, හේත්තු

පුවරු ආදීන්ගේ ද, සක්මනෙහි එල්බෙන රුක්පුවරු කෙළවර කොට කියූ වසූනන්ගේ ද, පසුභාගය සිඳදමා යට ආයුධයක් තබා ද, හෙබ් ආදියෙහි ඇඳක් හෝ පුටුවක් හෝ හේත්තු පුවරුකඩක් හෝ ගෙණ අවුත් තබා ද, එහි හුන් පමණ ඇත්තේ හෝ පිටදුන් පමණ ඇත්තේ හෝ යම් සේ වැටේ ද, හෙබ් ආදියෙහි හෝ හැසිරෙණ හෙයක් වේ ද, එය දුවිල කෙරේ ද, මෙසේ කරන්නහුට ඒ කිරීම නිමිති කොට දුක්කටය වේ. අන්හට දුක් ඉපදීම නිමිති කොට ථුල්ලවචය වේ. මරණය නිමිති කොට පාරාජිකය වේ. 'දැක බියෙන් සැලෙන්නේ වැටී මැරෙන්නේය'යි මහණකු ගෙණ අවුත් හෙබ් ආදීන්ගේ ඉවුරෙහි තබා ද දුක්කටය වේ. ඒ මහණ තෙමේ එහි ම වැටේ නම්, දුක් ඉපදීම නිමිති කොට ථුල්ලවචය වේ. මරණයෙන් පාරාජිකය වේ. තෙමේ හෙළා ද, අනෙකකු ලවා හෝ හෙළවා ද, නො කියනලද අනෙකෙක් හෝ තමන්ගේ ධම්තාවෙන් හෙළා ද, අමනුෂ්‍යයෙක් හෙළා ද, හුළං පහරින් වැටේ ද, තමන්ගේ ධම්තාවෙන් වැටේ ද, සියලු තන්හි මරණය නිමිති කොට පාරාජිකය වේ. කුමක් හෙයින යත්:- ඔහුගේ ප්‍රයොගයෙන් හෙබ් ආදීන්ගේ ඉවුරෙහි සිටි බැවිනි.

'උපනික්ඛිපනං' උපනික්ඛිපන නම්, සමීපයෙහි තැබීම ය. එහි යමෙක් මේ කඩුවෙන් මළේ ද, හෙතෙමේ ධනය හෝ ලබා, යනාදි නයින් මරණයෙහි ගුණ හෝ වර්ණනා කොට 'මරණයෙන් ප්‍රයොජන ඇත්තාහු මෙයින් මැරෙත්වා, අන්හු මැරවීමෙන් ප්‍රයොජන ඇත්තාහු මෙයින් මරවත්වා'යි හෝ කියා කඩුවක් එළවා තබා ද, එය එළවා තැබීම නිමිති කොට දුක්කටය වේ. මැරෙණු කැමැත්තේ හෝ එයින් තමාට පහර දේවා, මරවනු කැමැත්තේ හෝ අනෙකක්හට පහර දේවා, යන දෙපරිද්දෙන් ම අන්හට දුක් ඉපදීම නිමිති කොට වෙත එළවා තැබුවහුට ථුල්ලවචය වේ. මරණයෙන් පාරාජිකය වේ. නො උදෙසා එළවා තැබූ කල්හි බොහෝදෙනාගේ මරණය නිමිති කොට අකුසල රාසියක් වේ. පාරාජිකාදි වසූනන්හි පාරාජිකාදීහු වෙත්. විපිළිසර උපන් කල්හි කඩුව ගත් තැන තැබීමෙන් මිදේ. මිලදී ගන්නා ලද්දේ වේ ද, කඩු හිමියන්ට කඩුව දී යමකු අතින් මිල ගන්නා ලද්දේ නම්, ඔවුන්ට මිල දීමෙන් මිදේ. ඉදින් ලොහොපිඩක් හෝ සීවැලක් හෝ උදැල්ලක් හෝ ගෙණ කඩුව කරවන ලද්දේ නම්, යම් බඩුවක් ගෙණ කරවනලද්දේ නම් එයම කොට මිදේ. ඉදිනුදු උදැල්ලක් ගෙන කරවනලද කඩුව විනාශ කොට සීවැලක් කෙරේ ද, සීවැලෙන් පහර ලැබ මැරෙණ කල්හි ද ප්‍රාණඝාතයෙන් නො මිදේ. ඉදින් ලොහොයක් උපදවා එළවා තැබීම පිණිස ම කඩුවක් කරවන ලද්දේ වේ ද, මිටියෙන් තළා සුණු විසුණු

කොට විසුරුණු කල්හි මිදේ. ඉදින් මරණයෙහි ගුණ පවසා ලියූ පොතක් මෙන් සම අදහස් ඇති බොහෝ දෙනකුන් විසින් කඩුව කරවන ලද්දේ වේ ද, පොතෙහි කියූ නයින් ම කම්බන්ධනවිනිශ්චය දතයුතු ය. අඩයටි හෙණ්ඩිවාලයන්හි මෙම නය වේ. මුගුරෙහි විනිශ්චය පාශයෂ්ටියෙහි කියූ විනිශ්චය සමාන වේ. පාෂාණයෙහි ද එසේ ය. ශස්ත්‍රයෙහි විනිශ්චය කඩුවෙහි කියූ විනිශ්චය සමාන වේ. 'විසං වා' විෂ එළවා තබන්නහුගේ වසතු වශයෙන් ඔදිසස අනොදිසසයන්ට අනුරූප ලෙසින් පාරාජිකාදි වසතූන්හි පාරාජිකාදීහු දතයුත්තාහ. මිල දී ගෙණ තැබූ කල්හි පෙර කියූ නයින් නැවත ප්‍රකෘති සභාව ඇත්තක් කොට මිදී සිටියි. තමන් යෙදූ බෙහෙතෙහි විෂ නැති කිරීමෙන් මිදේ. රුහණෙහි විනිශ්චය මළපුඩු රුහණෙහි කියූ විනිශ්චය සමාන වේ.

'හෙසජ්ජ' යම් මහණෙක් වෙරී භික්ෂු නමක්හට උණක් හෝ විසභාග රොගයක් හෝ උපන් කල්හි නො කැපවූ හිත නො වූ ගිතෙල් ආදිය සත්ප්‍රාය යි මැරීමෙහි අදහස් ඇතිව දේ ද, අන් කිසි අල මුල් ගෙඩි හෝ දේ ද, මෙසේ ඔහුට බෙහෙත් දීම නිමිති කොට දුක්කටය වේ. අන්හට දුක් ඉපදීම නිමිති කොට ද, මරණය නිමිති කොට ද ථුල්ලච්චය පාරාජිකාපත්තීහු වෙත්. ආනන්තයී වසතුවෙහි ආනන්තයීය වේය යි දතයුතු ය.

රූපූපහාරයෙහි **'උපසංහරති'** අතිශයින් අමනාපවූ හෝ රූපයක් ඔහුගේ සමීපයෙහි තබා ද, තෙමේ හෝ යක්ෂප්‍රේතාදි වෙශයක් ගෙන සිටී ද, ඔහුට එළවීම් මාත්‍රය නිමිති කොට දුක්කටය වේ. ඒ රූපය දැක පරහට බිය ඉපදීම නිමිති කොට ථුල්ලච්චය වේ. මරණය නිමිති කොට පාරාජිකය වේ. ඉදින් ඒ රූපය ම ඇතැම් එකක්හට මන වඩන්නේ වේ ද, එය නො ලැබීමෙන් වියලී මැරේ ද විසඩෙකතය වේ. මනවඩන රුවෙහි ද මෙම නය වේ. එහි වනාහි විශෙෂයෙන් ස්ත්‍රීන්ට පුරුෂ රූපය ද, පුරුෂයන්ට ස්ත්‍රී රූපය ද මන මඩන්නේ වේ. ඒ රුව සරසා එළවා නම් දුටු පමණ ඇත්තක් ම කෙරේ ද, බොහෝ වේලාවක් බලන්නටත් නො දේ ද, අනෙක් තැනැත්තේ නො ලැබීමෙන් වියලී මැරේ ද, පාරාජිකය වේ. ඉදින් තැති ගෙණ හෝ මැරේ ද විසඩෙකතය වේ. තවද තැතිගෙන හෝ නො ලැබීමෙන් හෝ යි විචාරයක් නො කොට හුදෙක් දැක මැරෙන්නේය යි එළවා ද, තැති ගැණීමෙන් හෝ වියලීමෙන් හෝ මළ කල්හි පාරාජිකය ම වේ. මේ උපායයෙන් ම ශබ්දෙපහාරාදීහු ද දතයුත්තාහ. හුදෙක් මෙහි අමනුෂ්‍ය ශබ්දාදීහු බිය උපදවන අමනාප ශබ්දයෝ ය. පුරුෂයන්හට ස්ත්‍රී ශබ්ද මිහිරි වේ. ගන්ධර්ශබ්දාදීහු චිත්තාහ්ලාදකර වූ මනාප ශබ්දයෝ ය. හිමවත්හි විෂ වෘක්ෂයන්ගේ මූලාදිගන්ධයෝ ද,

කුණපගන්ධයෝ ද, අමනාපගන්ධයෝ ය. කාලානුසාරී මූලගන්ධාදීහු මනාපගන්ධයෝ ය. ප්‍රතිකූල මූලරසාදීහු අමනාපරසයෝ ය. අප්‍රතිකූල මූලරසාදීහු මනාපරසයෝ ය. විස පහස් ඇති මහාකසඹිලිය පහස් ආදීහු අමනාපඵස්සෂ්ඨව්‍යයෝ ය. වීනපිළි හස්පියාපත් පුළුන්පහස් ආදීහු මනාපඵස්සෂ්ඨව්‍යයෝය' යි දතයුත්තාහ.

ධම්මූපහාරයෙහි **'ධම්මෝ'** යනු දෙශනාධර්මය යි දතයුතු ය. දෙශනාවශයෙන් හෝ නිරයෙහි ද සඞ්ඝයෙහි ද විපත්ති - සම්පත්ති හෙදය ධර්මාලම්බනය ම වේ. **'නෙරයිකඤ්ඤ'** බිඳුනු සංවරය ඇති, කළ පව් ඇති නිරයෙහි ඉපැත්මට සුදුසු වූ සත්ත්වයාහට පඤ්චවිධවධබන්ධන කම්කරණාදි නෙරයික කථා කියන්නේ ය. ඉදින් හෙතෙමේ එය අසා තැති ගෙණ මැරේ නම්, කථිකයාහට පාරාජිකය වේ. ඉදිනුදු අසා ද තමන්ගේ ධර්මතාවෙන් මැරේ නම් අනාපත්ති වේ. මෙය අසා ම මෙබඳු වූ පවක් නො කරන්නේ ය, නො ඇලෙන්නේ ය, වළකින්නේ ය යි නිරය කථාව කියා ද, එය අසා අනෙකෙක් තැතිගෙණ මැරේ ද, අනාපත්ති වේ. **'සඟඝකථං'** දෙවනාටකාදීන් පිළිබඳවූත් නන්දන වනාදීන් පිළිබඳ වූත් සම්පත්තිකථාව. අනෙකෙක් එය අසා **'සඞ්ඝයෙහි උපදිමි'** යි නිශ්චය ඇතිව වහා ඒ සැපතට පැමිණෙනු කැමැත්තේ සැත්ගැනීම් විස කෑම් අහර නො ගැනීම් හුස්ම ඉහල පහළ නො කිරීම් ආදියෙන් දුක් උපදවා ද කථිකයාහට ථුල්ලච්චය වේ. මැරේ ද, පාරාජිකය වේ. ඉදින් හෙතෙමේ එය අසා ද ආයු පමණින් සිට තමන්ගේ ධර්මතාවෙන් මැරේ ද, අනාපත්ති වේ. 'මෙය අසා පින් කරන්නේය'යි කියා ද, අනෙකෙක් එය අසා තමන්ගේ ධර්මතාවෙන් කැමැත්ත ඇතිව කලුරිය කෙරේ ද, අනාපත්ති වේ.

'ආවික්ඛතාය පුට්ඨා භණති' 'ස්වාමිනි! කෙසේ මළේ ධනය හෝ ලබා ද, සඞ්ඝයෙහි හෝ උපදී ද'යි මෙසේ විචාරණ ලද්දේ කියයි. **'අනුසාසනියං අපුට්ඨා'** අනුශාසනාවෙහි මෙසේ නො විචාරණ ලද්දේ තෙමේ ම කියයි. **සඩෙකතකම්ම නිම්මතකම්මයෝ** අදින්නාදන කථාවෙහි කියූ නයින් ම දතයුත්තාහ.

මෙසේ නන් අයුරින් ආපත්තිභෙදය දක්වා දැන් අනාපත්තිභෙදය දක්වන සේක් **'අනාපත්ති අසඤ්චිච්ච'** යනාදිය වදළ සේක. එහි **අසඤ්චිච්ච** 'මේ උපක්‍රමයෙන් මොහු මරම්'යි නො සිතා. මෙසේ නො සිතා කරණ ලද උපක්‍රමයෙන් අනෙකකු මළ කල්හි ද අනාපත්ති වේ. එහෙයින් 'අනාපත්ති භික්ඛු අසඤ්චිච්ච'යි වදරණ සේක. **'අජානන්තස්ස'** මෙයින් මෙතෙමේ මැරෙන්නේය යි නො දන්නහුට. උපක්‍රමයෙන් අනෙකකු මළ

කල්හි ද අනාපත්ති වේ. විසගතපිණ්ඩපාත වසතුවෙහි 'අනාපත්ති භික්ඛු අජානන්තස්ස' යි එහෙයින් වදරණ ලේක. **'න මරණාධිප්පායස්ස'** මරණය නො කැමැත්තහුට, යම් උපක්‍රමයෙකින් අනෙකෙක් මැරේ ද, ඒ උපක්‍රමයෙන් ඔහු මළ කල්හි ද මරණයෙහි අදහස නැත්තහුට අනාපත්ති වේ. 'අනාපත්ති භික්ඛු න මරණාධිප්පායස්ස' යි එහෙයින් වදරණ ලේක. උන්මත්තාකාදීහු පෙර කියූ නය ඇත්තාහු ම ය. මෙහි වනාහි ආදිකර්මිකයෝ ඔවුනොවුන් ජීවිතයෙන් තොර කරණලද භික්ෂූහු ය. ඔවුනට අනාපත්ති වේ. මරණයෙහි ගුණ වැණුම් ආදිය කළ සෙසු භික්ෂූන්ට ආපත්ති වේ ම ය.

පදභාජනීයවණ්ණනාව නිමි.

—\\—

සමුට්ඨානාදීන් අතුරෙහි මේ ශික්ෂාපදය ත්‍රිසමුට්ඨානය. කායචිත්තයෙන් ද, වාචාචිත්තයෙන් ද, කායවාචාචිත්තයෙන් ද නගියි. උපදියි. ක්‍රියාවෙන් පැමිණිය යුතු බැවින් ක්‍රියා සමුට්ඨාන ය. ව්‍යතික්‍රම සංඥවගේ අභාවයෙන් මිදෙන බැවින් සංඥවිමොක්ෂ ය. සිත් සහිතව පැමිණිය යුතු බැවින් සචිත්තක ය. ලොකයා විසින් අකුසලය යි හැරිය යුතු නියමයෙන් ලොකවජ්ජය, කායකම්ම යි. වාක්කම්ම යි. අකුශල චිත්ත යි. දුඃඛවේදනා යි. ඉදින් සිරියහනට නැඟී රජසිරි විඳින රජෙක් 'දෙවයන් වහන්ස, සොරෙක් ගෙණ එන ලද්දේය' යි කියූ කල්හි 'යවු, ඔහු මරවු'යි සිනාසෙමින් ම කියන්නේ ද, දෙමිනස් සිතින් ම කියා යි දතයුතු ය. සැපයෙන් මුසු බැවින් ද සන්සුන් පැවැත්මක් නැති බැවින් ද පෘථග්ජනයන් විසින් මේ කරුණු දැනගණු නො හැක්කේ ය.

විනීතවසතු කථාවන් අතුරෙහි ප්‍රථම වසතුවෙහි **'කාරුඤ්ඤතා'** ඒ භික්ෂූහු ඔහුගේ මහත් වූ ගිලන් බවෙන් හටගත් දුක දක කරුණාව උපදවා 'තෝ සිල්වත් වෙහි, කළ කුසල් ඇත්තෙහි, කුමක් හෙයින් මියෙන්නේ බිය වෙහි ද, සිල්වත්හට ඍඝීය නම් මරණ මාත්‍රප්‍රතිබද්ධ මය'යි මෙසේ මරණය කැමැත්තාහු ම ව මරණය කැමැති බව නො දන්නාහු මරණයෙහි ගුණ වැණූහ. ඒ මහණ තෙමේ ද ඔවුන්ගේ ඒ ගුණ වැණීමෙන් අහර ගැණීම වළකා සිට අතරදී ම කලුරිය කෙළේය. එහෙයින් ඇවැතට පැමිණියාහු ය. ව්‍යවහාර වශයෙන් 'කාරුඤ්ඤතා මරණවණ්ණං සංවණ්ණෙසුං' යනු වදරණ ලද්දේ ය. එහෙයින් දතුදු නුවණැති මහණහු විසින් ගිලන් මහණහුට මෙසේ මරණයෙහි ගුණ නො වැණිය යුතු ය. ඉදින් ඔහුගේ මරණ ගුණ වැණුම් අසා ආහාර වළකාලීම් ආදී වූ උපක්‍රමයෙකින් එක් ජවන් වාරයක් ඉතිරිව සිටි

ආයුෂයෙහි අතර දී කලුරිය කෙරේ නම්, මොහු විසින් ම මරණ ලද්දේ වේ. 'සිල්වත්හට නම් මාඟීඵල ලැබීම අරුමයක් නො වේ. එහෙයින් වෙහෙර අරම් ආදියෙහි ආලය නො කොට බුදුන් කෙරෙහි බැස ගත් ධර්මය කෙරෙහි බැස ගත් සඞ්ඝයා කෙරෙහි බැස ගත් කයෙහි බැසගත් සිහිය එළවා මනස්කාරයෙහි අප්‍රමාදය කටයුතු ය, යන මේ නයින් අවවාද දිය යුතු ය. මරණ ගුණ වැණූ කල්හි ද හෙතෙමේ ඒ ගුණ වැනීමෙන් කිසි උපක්‍රමයක් නොකොට තමන්ගේ ධර්මතාවෙන් ආයු පරිදි ආයු පිරිසිදීම් පරිදි මැරියේද ඒ හේතුවෙන් ඒ ගුණ වැණූ තැනැත්තේ ඇවැතින් නො කටයුතු ය.

දවිතීය වස්තුවෙහි **'න ච භික්ඛවෙ අපපටිවෙක්ඛිත්වා'** 'කෙබඳු අසුනක් පරීක්ෂා කටයුතු ද? කෙබඳු අසුනක් පරීක්ෂා නො කටයුතු ද?' යන මෙහි යම් අසුනක් ඇතිරිලි නො ඇතුරූ පිරිසිදු අසුනක් වේ ද, යම් අසුනක් අවුත් සිටියවුන් බලා සිටියදී ම අතුරණු ලැබේ ද, ඒ අසුන පරීක්ෂා නො කටයුතු ය. එහි හිඳීම වරද නැත. මිනිස්සු තමන් අතින් මැඩ 'සාමීනි! මෙහි හිඳිනු මැනැවැ' යි යම් අසුනක් දෙත් ද, එහි ද හිඳීම සුදුසු ය. පළමුවම අවුත් හුන්නාහු පසුව පැමිණියවුන්ට ඉඩ දෙනු පිණිස උඩට හෝ පහළට හෝ යෙත් ද, එහි ද පසුව පැමිණියවුන්ට පරීක්ෂා කිරීමක් නැත්තේ ය. යම් අසුනක් තුනී වතකින් අතුරණ ලද්දේ යමසේ තට්ටුව පෙනේ ද, මෙසේ වසන ලද්දේ වේ ද, එහි ද පරීක්ෂණයක් නැත්තේ ය. යම් අසුනක් පළමු කොට ම උතුරුසළු කොදුපලස් ආදියෙන් අතුරණ ලද්දේ වේ ද, එය අතින් පහසා ම සලකා බලා හිඳිය යුතු ය. **මහාපච්චරියෙහි** වනාහි ඝනවස්ත්‍රයකින් නමුදු ඇතුරූ කල්හි යම් අසුනෙක රැලි නො පෙනේ ද, එය පරීක්ෂා කටයුතුය යි කියනලදී.

මූසලවස්තුවෙහි - 'අසඤ්චිච්චා' යනු වධ නො කරණ සිත් ඇතියෙමි ය. ඒ විරුද්ධප්‍රයොගයක් ම ය. 'අසඤ්චිච්චා අහං' යනු එහෙයින් වදළ සේක. **උදුක්ඛල** වස්තුව ප්‍රකට ම ය. **බුද්ධපඤ්ඤත්ත** වස්තූන් අතුරෙහි ප්‍රථම වස්තුවෙහි භික්ෂුසඞ්ඝයාහට ප්‍රතිබන්ධයක් පළිබොධයක් නො කරව යි පහ කෙළේ ය. දවිතීයවස්තුවෙහි සහ මැද ද ගණ මැද ද මහලු තෙරහුගේ පුත්‍ර යි කියනු ලබන්නේ ඒ වචනයෙන් පෙළෙනු ලබන්නේ මෙතෙමේ මැරේවා'යි බැහැර කෙළේ ය. තෘතීය වස්තුවෙහි ඔහුට දුක් ඉපදවීමෙන් ථුල්ලච්චය වේ. එයින් අන්‍ය වූ වස්තු තුණ ප්‍රකට අර්ථ ඇත්තේ ම ය.

විසගතපිණ්ඩපාත වස්තුවෙහි සාරාණීයධර්මය පුරණ ඒ භික්ෂූ තෙමේ අග්‍රපිණ්ඩය සබ්‍රහ්මචාරීන්ට දීලා ම වළඳන්නේ ය. 'අග්ගකාරිකං අදාසි' යනු එහෙයින් වදරණ ලදී. **අග්ගකාරිකං** යනු අග්‍රක්‍රියා ය. පළමු ලද පිණ්ඩපාතය ඉතා අග්‍ර වූ හෝ ඉතා ප්‍රණීත වූ හෝ පිණ්ඩපාතය යන අර්ථයි. ඔහුගේ දානසඞ්ඛ්‍යාත වූ යම් අග්‍ර ක්‍රියාවක් වේ ද, එය දෙන්නට නො හැකි ය. හෙතෙමේ පිණ්ඩපාතය ථෙරාසනය පටන් දුන්නේ ය. **'තෙ භික්ඛූ'** ථෙරාසනය පටන් වැළඳූ පිණ්ඩපාතය ඇති ඒ භික්ෂූහු ය. ඒ සියලු භික්ෂූහු ම කලුරිය කළහ. මෙහි සෙස්ස ප්‍රකට ම ය. ශ්‍රද්ධා නැති මිත්‍යාදෘෂ්ටික වූ කුලයන්හි සකස් කළ ප්‍රණීත භොජනයක් ලැබ පරීක්ෂා නො කොට තමන් විසින් ම නො වැළඳිය යුතු ය. අන්හට නො දිය යුතු ය. පිළුනු වූ යම් බතක් හෝ කැවිල්ලක් හෝ එතැනින් ලැබේ ද, එ ද නො වැළඳිය යුතු ය. නො වසා තැබූ වස්තුවක් සපී ගෝනුසු ආදීන් විසින් හෝනා ලද්දේ හළයුතු සුභාවය ඇත්තේ වේ ද, එබඳු වස්තු ද ඒ කුලයෝ දෙන්නාහු ය. ගඳ කහා ආදිය වැකුනා වූ පිණ්ඩපාතය ද නො පිළිගත යුතු ය. ඒ කුලයෝ සිරුරෙහි රොගස්ථාන පිස දමා තැබූ බත ද දිය යුතු යි සිතන්නාහ. **විමංසන** වස්තුවෙහි විමසන්නේ කරුණු දෙකක් විමසයි. 'මොහු මරන්නට හැක්කේ ද, නො හැක්කේ ද' යි විෂය හෝ විමසයි. 'මෙතෙමේ මේ විෂය කා මැරෙන්නේ ද, නො මැරෙන්නේ ද' යි පුද්ගලයා හෝ විමසයි. මෙ කියූ දෙපරිද්දෙන් ම විමසන අදහසින් දුන් කල්හි මැරේවා හෝ නො මැරේවා හෝ ථුල්ලච්චය වේ. 'මේ විෂය තෙමේ මොහු මරාවා'යි හෝ මෙතෙමේ මේ විෂය කා මැරේවා'යි හෝ මෙසේ දුන් කල්හි ඉදින් මැරේ ද, පාරාජිකය වේ. නො මැරේ නම් ථුල්ලච්චය වේ. මෙයින් අන්‍ය වූ ශිලාවස්තු තුණ, තෘණවස්තු තුණ, ඉටිකවස්තු තුණ, වාසිවස්තු තුණ, ගොපානසීවස්තු තුණ ද ප්‍රකට අර්ථ ඇත්තාහු ම ය. හුදෙක් ශිලාදීන්ගේ වසයෙන් ම මේ ආපත්ති අනාපත්ති භෙදය නො වේ. දඬු මුගුරු නියන් වියන දඬු ආදීන්ගේ ද වසයෙන් වේ ම ය. එහෙයින් පෙළෙහි නො ආයේ ද ඇ නයින් ම දතයුතු ය.

අට්ටක වස්තූන් අතුරෙහි - **අට්ටකො** යනු අභ්‍යන්තර ඇඳය යි කියනු ලැබේ. යම් මැස්සක් සුදුවියන් බැඳීම හා මල්ලියකම් ආදිය පිණිස බඳින් ද ඒ ය. එහි **'ආවුසො අනුට්ඨිතො බන්ධාහි'** යනු මරණ අදහස් ඇත්තේ යම් තැනක සිටියෙක් වැටී කණුවකින් හෝ අහපසඟ බිඳෙන්නේ ද, ගැඹුරු වළ පල්ලම් ආදීන්හි හෝ වැටී මැරෙන්නේ ද, එබඳු තැන් සඳහා වදළ සේක. මෙහි ද කිසිවෙක් 'මෙතැනින් වැටී මැරෙන්නේය'යි මතුවෙහි තැනක් නියම කෙරේ ද, කිසිවෙක් 'මෙහි වැටී

මැරෙන්නේය'යි යට තැනක් නියම කෙරේ ද, කිසිවෙක් 'මෙතැනින් මෙහි වැටී මැරෙන්නේය'යි දෙතැන ම නියම කෙරේ ද, එහි යමෙක් මතුවෙහි නියම කළ තැනින් නො වැටී අන් තැනකින් වැටේ ද, යට නියම කළ තැන හෝ නො වැටී අන් තැනක වැටෙට් ද, නියම කළ දෙතැන යම්කිසි එක් තැනක් වරදවා වැටේ ද, එහි මළ කල්හි විසඥෙතන බැවින් ඇවැත් නො වේ. **විභාරවර්ණන** වස්තුවෙහි ද මෙ ම නය වේ.

අභිරති වස්තුවෙහි - ඒ මහණ තෙමේ වනාහි කාමවිතර්කාදීන්ගේ බලවත් පැවැත්ම දැක එය වළකා ලන්නට නො හැකි වන්නේ, සසුනෙහි නො ඇලුනේ ගිහිබවට අභිමුඛ වූයේ ය. එහෙයින් 'යම්තාක් ශීලභෙදයට නො පැමිණෙම් ද, ඒ තාක් මැරෙන්නෙමි'යි සිතූයේ ය. ඉක්බිති ඒ පර්‍වතයට නැගී පල්ලමක හෙන්නේ එක්තරා කුලුපොත්තකු යට කොට මැරුයේ ය. **'විලීවකාරං'** යනු කුලුපොත්තකු ය. **'න ච හික්ඛවේ අත්තානං පාතෙතබ්බං'** තෙමේ නො හෙළිය යුත්තේ ය. 'අත්තානං පාතෙතබ්බං' යන මෙය විභක්ති විපර්‍යාසයෙන් කියන ලදී. හුදෙක් මෙහි ද නො හෙළිය යුත්තේ නො වේ. අන්‍ය වූ ද යම්කිසි උපක්‍රමයකින් යටත් පිරිසයින් ආහාර වැළකීමෙන් ද නො මැරිය යුත්තේ ය. යමෙක් ගිලන් වූයේ වනාහි බෙහෙත් තිබිය දී ද, උපස්ථායකයන් ඇති කල්හි ද මැරෙණු කැමැත්තේ ආහාර වළකා ද, දුක්කටයම වේ. යම් මහණක්හුගේ මහත් ආබාධයක් බොහෝ කලක් ලුහුබැඳී පවත්නේ ද, උපස්ථාන කරන භික්‍ෂූහු වෙහෙසෙත් ද, පිළිකුල් කෙරෙත් ද, 'කවද වනාහි ගිලනාගෙන් මිදෙන්නෙමුද'යි පෙළෙත් ද, එකල්හි ඒ මහණ තෙමේ 'මේ ආත්මභාවය පිළිදගුම් කරණු ලබන්නේ ද, නො පවත්නේ ය භික්‍ෂූහු ද වෙහෙසෙත්'යි ආහාර වළකා නම්, බෙහෙත් නො වළඳ නම් වරද නැත. යමෙක් වනාහි 'මේ රොගය ක්‍රූරය, ආයුසංස්කාරයෝ නො පවතිත්, මේ විශෙෂාධිගමය ද මාගේ අතට පැමිණියක් මෙන් පෙනෙන්නේය යි ආහාර වළකා ද, එ ද වටීම ය. උපන් සංවේගය ඇති නො ගිලන් වූවහුට ද ආහාර සෙවීම ප්‍රමාදයෙකි. කමටහන්හි ම යෙදෙන්නෙමි යි කම්ඨාන මුඛයෙන් ආහාර වළකා සිටීම වරද නො වේ, ලොකොත්තර ධර්‍මප්‍රතිලාභය ප්‍රකාශ කොට ආහාර වළකා නම්, එය නො වටියි. සහාගලජ්ජී භික්‍ෂූන්ට කීම සුදුසු වේ.

සිලා වස්තුවෙහි - දවාය ක්‍රීඩා වශයෙන් සිනාවෙන්, ක්‍රීඩා පිණිසය යන අර්ථ යි. **සිලා** යනු ගල ය. හුදෙක් ගල ම පමණක් නො වේ. අන් කිසි දෘඪකඩක් හෝ ගඩොල්කඩක් හෝ අතින් හෝ යන්ත්‍රයකින් හෝ විදීම සුදුසු නො වේ. සෑ ආදීන් පිණිස සිනාසෙමින් සිනාසෙමින් ගල් ආදිය පෙරළත් ද, දමත් ද, ඔසොවත් ද කම්සමය යි වරද නැත්තේ ය.

අන්‍ය වූ ද මෙබඳු නවකර්මයක් හෝ කරන්නාහු, චීවර සඞ්ඛ්‍යාතභාණ්ඩයක් හෝ සෝදන්නාහු, රුකක් හෝ බඩු දෝනා දඬුවක් හෝ ඔසොවා විදින් ද වටියි. බත් බෙදන කාලාදියෙහි ලීදඬු කඩක් හෝ කැටක් හෝ දමා ගසා කවුඩන් හෝ බල්ලන් හෝ පලවා හරී ද, එ ද වරද නැත. **දෙසනාදි** වස්තූහු සියල්ල ම ප්‍රකට අර්ථ ඇත්තාහු ම ය. මෙහි ද 'මම මාගේ ක්‍රියාවෙන් මැරෙමි ද, නො මැරෙමි ද'යි උපන් කුකුස් ඇතියෙමි යි ගලානොපස්ථානය නො කට යුතු නො වේ. හිත කැමැති බැවින් ගිලනහුගේ සියලු බල අබල ද රුචිය ද සත්ප්‍රාය අසත්ප්‍රාය ද සලකා බලා කයුතු ය.

ජාරගබ්භිණී වස්තුවෙහි - **පවුත්ථපතිකා** වෙන්ව විසීමට නො රට ගිය හිමියා ඇත්තී. **ගබ්භපාතං** වැළඳූ යමකින් ගැබ වැටේ ද, එබඳු බෙහෙතකි. **පජාපතික** වස්තු දෙක ප්‍රකට වූ අර්ථ ඇත්තේ ම ය. **ගබ්භමද්දන** වස්තුවෙහි - 'මැඩ හෙළව'යි කියූ කල්හි ද අනෙකකු ලවා මඩවා හෙළා ද, විසඞ්ගතය වේ. මඩවා හෙළවා ලව යි කියූ කල්හි ද තෙමේ මැඩ හෙළා ද විසඞ්ගතය ම වේ. මනුෂ්‍ය විග්‍රහයෙහි ප්‍රාණියෙක් නැත්තේ ය. එහෙයින් 'මැඩූ කල්හි ගැබ වැටේ ය' කියූ කල්හි ඕතොමෝ, තොමෝ හෝ මඩිවා, අනෙකකු ලවා හෝ මඩවා හෙළාවා, විසඞ්ගතයක් නැත්තේ ය. පාරාජිකය ම වේ. **තාපන** වස්තුවෙහි ද මේ නය ම වේ. **වඤ්ඣිත්ථි** වස්තුවෙහි වඳ ස්ත්‍රිය නම්, යම් ස්ත්‍රියක් තෙමෝ ගැබ් නො ගණී ද, ඕ තොමෝ ය. ගැබ් නො ගන්නා ස්ත්‍රියක් නම් නැත්තී ය. යම් ස්ත්‍රියකගේ හටගත් ගැබ පිහිටා නො සිටී ද, එය සඳහා මෙය වදරණ ලදී. සෘතුකාලයෙහි සියලු ස්ත්‍රීහු ගැබ් ගණිත්. යම් මේ ස්ත්‍රියක් තොමෝ වඳය යි කියනු ලබන්නී ද, ඇයගේ කුසයෙහි උපන් සත්ත්වයන්ට අකුශල විපාකය පැමිණේ. සඵල වූ කුශල විපාකයකින් ගත් ප්‍රතිසන්ධි ඇති ඔවුහු අකුශල විපාකයකින් මඩනා ලද්දහු වැනසෙන්නාහ. අභිනව ප්‍රතිසන්ධියෙහි ම කර්මානුභාවයෙන් වාතයෙන් හෝ පණුවන්ගෙන් හෝ යන දෙයයුරෙන් ගැබ නො පිහිටයි. වාතය තෙමේ ගැබ වියලා අතුරුදහන් කරයි. පණුවෝ කා දමා අතුරුදහන් කරත්. ඒ වාතය හෝ පණුවන් හෝ නසනු පිණිස බෙහෙත් කළ කල්හි ගැබ පිහිටන්නේ ය. ඒ මහණ තෙමේ එය නො කොට අන් රළු බෙහෙතක් දුන්නේ ය. එයින් ඕ තොමෝ කලුරිය කළා ය. භාග්‍යවතුන් වහන්සේ බෙහෙත් කළ බැවින් දුක්කටය පැණවූසේක. ද්විතීයවස්තුවෙහි ද මේ නය ම වේ.

එහෙයින් පැමිණි පැමිණි අන්දෙනාහට බෙහෙත් නො කටයුතුය. කරන්නේ නම් දුක්කටයට පැමිණේ. භික්ෂු - භික්ෂුණී - ශික්ෂමාණ - ශ්‍රාමණේර - ශ්‍රාමණේරී යන පස් සහ දැහැමියන්ට බෙහෙත් කටයුතු ය.

සම ශීල ශ්‍රද්ධා ප්‍රඥ ඇති ත්‍රිවිධ ශික්ෂාවන්හි යෙදී ගත් මොවුන්ට බෙහෙත් නො කරන්නට නො ලබන්නේ ය. බෙහෙත් කටයුතු ය. ඉදින් බෙහෙත් කරන්නහු විසින් ද ඔවුන්ට බෙහෙත් ඇත්තේ නම්, ඔවුන් සතු දෙය ගෙණ යොද දියයුතු ය. ඔවුනට නැත්තේ නම් තමන් සතු දෙය ගෙණ යොද දියයුතු ය. ඔවුනට නැත්තේ නම් තමන් සතු දෙය දිය යුතු ය. ඉදින් තමහට ද නැත්තේ නම්, භික්ෂාචාරවතින් හෝ තමන්ගේ හෝ ඔවුන්ගේ නෑයන්ගෙන් හෝ පැවැරූ තැනින් හෝ සොයා ගත යුතු ය. නො ලබන්නහු විසින් ගිලනහු පිණිස නො නෑ නො පැවරූවන්ගෙන් ඉල්ලීමය යි කියූ නො කළ යුතු තැන පවත්වන විඥප්තියෙනුදු ගෙණ අවුත් කටයුතු ය.

මවට, පියාට, ඔවුන්ට උවැටන් කරන්නවුන්ට, තමාගේ වතාවත් කරන්නහුට, **පණ්ඩුපලාසහට** යන මේ අන්‍ය වූ පස්දෙනාහට ද බෙහෙත් කිරීම වරද නො වේ. **පණ්ඩුපලාස** නම්, යමෙක් පැවිද්දෙහි බලාපොරොත්තු ඇතිව යම්තාක් පා සිවුරු පිළියෙල කර ගණී ද, ඒ තාක් වෙහෙර වසන්නේ ය. ඔවුන් අතුරෙහි මවුපියෝ ධනවත් වෙත් ද, පිළියම් බලාපොරොත්තු නො වෙත් ද, එසේ ඇති කල්හි ඔවුන්ට බෙහෙත් නො කිරීම වටියි. ඉදින් වනාහි රජයේ සිටියේත් බලාපොරොත්තු වෙත් නම් දුෂ්කෘත හෙයින් නො කිරීම නො වටියි. බෙහෙත් ප්‍රාර්ථනා කරන්නවුන්ට බෙහෙත් දිය යුතු ය. සියල්ලන් පිණිස සහ දහැමියන් විෂයයෙහි කියූ නයින් ම බෙහෙත් සෙවිය යුතු ය. ඉදින් මව වෙහෙරට ගෙණ අවුත් පිළිදගුම් කරන්නේ නම්, නො පහසන්නහු විසින් සියලු පිරියම් කටයුතු ය. කෑ යුතු බිදිය යුතු දය සියතින් දියයුතු ය. සාමණේර තෙමේ යම් සේ ද, පියා එසේ සියතින් නැවීම් මිරිකීම් ආදිය කොට උවැටන් කළයුතු ය. යම් කෙනෙක් මවු පියන්ට උවැටන් කෙරෙත් ද, පිළිදගුම් කෙරෙත් ද, ඔවුනට ද එපරිද්දෙන් ම කළයුතු ය. **වෙය්‍යාවච්චකර** නම්, යමෙක් තෙමේ වැටුප් ගෙණ වනයෙහි දර කපා ද, අන් කිසි වැඩක් හෝ කෙරේ ද, හෙතෙමේ ය. ඔහුට රොගයක් හටගත් කල්හි යම්තාක් නෑයෝ නො බලත් ද, ඒ තාක් බෙහෙත් කට යුතු ය. යමෙක් වනාහි මහණුන් ඇසුරු කළ එකෙක්ව ම සියලු වැඩ කෙරේ ද, ඔහුට බෙහෙත් කටයුතු ම ය. පණ්ඩුපලාසයා කෙරෙහි ද සාමණේරයා කෙරෙහි මෙන් පිළිපැදිය යුතු ය.

අනිකුදු දෙටු බෑයාහට, කනිටු බෑයාහට, දෙටුබුහුනැනියට, කනිටු බුහුනැනියට, සුලු මවට, මහ මවට, සුලු පියාට, මහ පියාට, පියාගේ සොහොයුරියට, මවුගේ සොහොයුරාට යන දසදෙනාහට බෙහෙත් කිරීම

වරද නො වේ. ඒ සියල්ලන්ට ම බෙහෙත් කරන්නහු විසින් ඔවුන් සතු වූ ම බෙහෙත් ගෙණ එකලාව එය ම යොදා දියයුතු ය. බෙහෙත් නො පොහොනේ නම්, 'ස්වාමීනි! දුන මැනැව, ඔබ වහන්සේට නැවත දෙන්නෙමු'යි ඉල්ලත් නම්, තාවකාලික කොට දිය යුතු ය. ඉදින් නො ඉල්ලත් නම් 'අපගේ බෙහෙත් තිබේ, තාවකාලික කොට ගණිවු'යි කියා හෝ 'යම් කලෙක ඔවුන්ට වන්නාහු නම්, එකල්හි දෙන්නාහ'යි කල්පනා කොට දියයුතු ය. ඉදින් පෙරළා දෙත් නම්, ගතයුතු ය. නො දෙත් නම් චොදනා නො කටයුතු ය. මේ දස නැයන් හැර අන්‍යයන්හට බෙහෙත් නො කටයුතු ය.

මොවුන්ගේ පුත්‍රපරම්පරාවෙහි සත්වන කුලපරපුර යම්තාක් ද, ඒතාක් සිවුපසය ගෙන්වන්නහුට අකතවිඤ්ඤත්තිය හෝ බෙහෙත් කරන්නහුට වෙදකම හෝ වෙදකමින් වන කුලදූසකාපත්තිය හෝ නො වේ. බැබිරිය හෝ බුහුනැනි හිමියා හෝ ගිලන්හු වෙත් ද, නැයෝ හෝ වෙත් නම්, ඔවුන්ට ද බෙහෙත් කිරීම සුදුසු වේ. නො නැයෝ නම්, සහෝදරයාහට ද සහොදරියහට ද අයත් කොට 'තොප පිළිදග්නා තැනට දෙවු'යි දියයුතු ය නොහොත් ඔවුන්ගේ දූ පුතුන්ට අයත් කොට 'තොපගේ මවුපියන්ට දෙවු'යි දියයුතු ය. මේ උපායයෙන් සියලු පදයන්හි විනිශ්චය දතයුතු ය. ඔවුන්ගේ ප්‍රයොජනය පිණිස හෙරණුන් ලවා වතයෙන් බෙහෙත් ගෙන්වන්නහු විසින් නෑ හෙරණුන් ලවා හෝ ගෙන්විය යුතු ය. තමන්ගේ ප්‍රයොජනය පිණිස හෝ ගෙන්වා දිය යුතු ය. ඔවුන් විසින් ද 'උපාධ්‍යායයාහට ගෙණෙමු'යි වත්හිසින් ගෙණ ආ යුතු ය.

උපාධ්‍යායයාගේ මවුපියෝ ගිලන්වූවාහු විහාරයට එත් ද, උපාධ්‍යාය තෙමේත් දිසා බලා ගියේ වේ ද, සද්ධිවිහාරිකයා විසින් ඔවුන්ට උපාධ්‍යායයා සතු බෙහෙත් දිය යුතු ය. නැත්තේ නම් තමන්ගේ බෙහෙත් උපාධ්‍යායයාහට පරිත්‍යාග කොට දිය යුතු ය. තමන්ට ද බෙහෙත් නැති කල්හි කියූ නයින් සොයා බලා උපාධ්‍යායයා සතු කොට දිය යුතු ය. උපාධ්‍යායයා විසිනුදු සද්ධිවිහාරිකයාගේ මවුපියන් කෙරෙහි මෙපරිද්දෙන් ම පිළිපැදිය යුතු ය. ආචාර්‍ය අන්තෙවාසිකයන් කෙරෙහි ද මේ නය වේ.

අන්‍ය වූ යම් ආගන්තුකයෙක් හෝ සොරෙක් හෝ යුදෙන් පැරදුනු ඉසුරෙක් හෝ නැයන් විසින් හැර දමූ දුගියෙක් හෝ ගම්ක මනුෂ්‍යයෙක් හෝ ගිලන්ව විහාරයට පැමිණේ ද, ඒ සියල්ලන්ට, ඔවුන් විසින් තමාට කරණ ලාභය ගැණ නො තකන්නහු විසින් බෙහෙත් කටයුතු ය.

භික්ෂුසඞ්ඝයාහට සිවුපසයෙන් උපස්ථාන කරණ මවුපිය තනතුරට සුදුසු සැදැහැති කුලයක් වේ. එහි ඉදින් කිසිවෙක් ගිලන් වේ ද, ඔහු පිණිස විඤ්ඤාසයෙන්, 'ඤාමීනි! බෙහෙත් කොට දුන මැනැවැ'යි කියත් නම්, බෙහෙත් නො දිය යුතු ම ය. බෙහෙත් නො කටයුතු ය. තවද කැපය දන 'ඤාමීනි! අසුවල් රොගයට කිනම් බෙහෙතක් කරත් ද' යි මෙසේ විචාරත් ද, 'මේ මේ දය ගෙණ කෙරෙත්' යි කීම වටියි. 'ඤාමීනි! මාගේ මවු තොමෝ ගිලන් වූ ය. බෙහෙත් කියනු මැනැවැ'යි මෙසේ විචාළ කල්හි වනාහි නො කියයුතු ය. 'ඇවැත! අසුවල් භික්ෂු නමට මේ රොගයෙහි දී කිනම් බෙහෙතක් කළාහු ද? 'ඤාමීනි! මේ බෙහෙතැ'යි ඔවුනොවුන් කථා කළයුතු ය. ඒ අසා අන්‍යයා මවට බෙහෙත් කෙරේ ද, වරද නැත්තේ ම ය. **මහාපදුම** ස්ථවිරයන් වහන්සේ වනාහි වසහ රජුගේ දෙවියට රොගයක් උපන් කල්හි එක් ස්ත්‍රියක අවුත් විචාරණ ලද්දේ 'නො දකිමි' යි නො කියා භික්ෂූන් සමග මෙපරිද්දෙන් ම කථා කළහ. එය අසා ඇයට බෙහෙත් කළහ. රොගය සන්හුන් කල්හි තුන් සිවුරක් ද කහවණු තුන්සියයක් ද සමග බෙහෙත් කරඬුවක් පුරවා ගෙණ අවුත් තෙරුන්ගේ පාමුල තබා 'ඤාමීනි! මල් පූජා කරණු මැනැවැ' යි කීහ. ස්ථවිරයන් වහන්සේ 'මේ ආචාර්‍යභාගය' යි කැප වසයෙන් ගන්වා මල්පූජාව කළහ. මෙසේ වනාහි බෙහෙතෙහි පිළිපැදිය යුතු ය.

පිරිතෙහි වනාහි 'ඤාමීනි! ගිලන්හට පිරිත් කරණු මැනැවැ' යි කියූ කල්හි 'ගිහින්ට වතාවත් කරණ තැන සිටිය' යි පිරිත් නො කට යුතු ය. 'වදළ මැනැවැ' යි කියූ කල්හි 'ධම්කථාවට ආරාධනා කළ තැන සිටින බැවින් කටයුතු ය. 'මනුෂ්‍යයෝ නො දනිත්, නො කරණ කල්හි විපිළිසර ඇත්තාහු වන්නාහ'යි ඔහුට මෙසේ අදහස් වන්නේ නම් කටයුතු ය. 'පිරිත්දිය කොට පිරිත්හූ කොට දෙනු මැනැවැ'යි කියන ලද්දහු විසින් වනාහි ඔවුන්ගේ ම දිය අතින් සොලොවා හුය පිරිමැද දියයුතු ය. විහාරයෙන් දිය හෝ තමන් සතු හූ හෝ දේ ද, නො නැයන්හට දෙන්නහුට දුක්කටය වේ. මිනිස්සු දියත් හූත් ගෙණ හිඳ පිරිත් වදළ මැනැවැ යි කියත් නම්, කටයුතු ය. මෙසේ කියන්නට නො දනිත් නම් කියයුතු ය. වැඩහුන් භික්ෂූන්ගේ පාමුල, රොග සන්සිඳීම් ආදිය පිණිස දක්ෂිණොදකය ද වත් කොට හූ ද තබා 'පිරිත් කළ මැනැවැ, පිරිත් වදළ මැනැවැ'යි කියා යෙත් ද, තැබූ තැනින් පා බැහැර නො කටයුතු ය. පා පහ කළ කල්හි මිනිස්සු අවමඩ්ගලසංඥ ඇත්තාහු විපිළිසර ඇත්තාහු වෙත්. ඇතුළුගමින් ගිලනකු සඳහා 'පිරිත් බෙණෙත්වා'යි විහාරයට යවත් ද, පිරිත් බිණිය යුතු ය. ගම තුළ රජගේ ආදියෙහි රොගයක් හෝ උවදුරක් හෝ උපන් කල්හි කැඳවා කියවත් නම්,

ආටානාටිය සූත්‍රාදිය කිය යුතු ය. 'අවුත් ගිලනහුට ශික්ෂාපද දෙත්වා, ධර්මය කියත්වා, රාජන්තඃපුරයට හෝ ඇමතිගෙයකට හෝ අවුත් ශික්ෂාපද දියයුතු ය. ධර්මය කියයුතු ය. මළවුන්ට පිරිවර පිණිස එත්වා'යි කැඳවත් නම් නො යා යුතු ය. සොහොන දැකීමෙහි ද, අසුබ දැකීමෙහි ද, මරණසතිය පිළිලබන්නෙමු යි කමටහන් හිසින් යෑම සුදුසු වේ. පිරිතෙහි මෙසේ පිළිපැදිය යුතු ය.

පිණ්ඩපාතයෙහි වනාහි නො පැවිද්දකු අතින් ලද තමන් විසින් හෝ අන් පැවිද්දකු විසින් හෝ නො ගත් ඉදුල් නො කළ අග්‍රපිණ්ඩපාතය කවරක්හට දියයුතු ද? කවරක්හට නො දියයුතුද යත්:- මවුපියන්ට දියයුතු ය. කහවණුවක් අගනේ නමුත් එහි සද්ධාදෙය්‍යවිනිපාතනයක් නැත්තේ ය. මවුපියන්ට උවැටන් කරන්නවුන්ට වතාවත් කරන්නහුට පණ්ඩුපලාසයාහට යන මොවුන්ට ද දියයුතු ය. එහි පණ්ඩුපලාසයාහට තලුයෙහි බහා ද දීම වරද නැත්තේ ය. ඔහු හැර අන්‍ය අගාරික වූ මවුපියන්ට ද තලුයෙහි බහා දීම නො වටියි. ප්‍රව්‍රජිත පරිභොග වස්තුව වනාහි ගිහියන්ට චෛත්‍යස්ථානයට සුදුසු වේ. තවද අනාමෘෂ්ට පිණ්ඩපාත නම් වූ මෙය පැමිණි රාජ්‍යය පතන ප්‍රකට සොරාට ද අධිපතියාහට ද දිය යුත්තේ ය. කුමක් හෙයින යත්:- ඔවුහු වනාහි නො දෙනු ලබන කල්හි නො දෙත් යි ද, අත ගා දෙන කල්හි ඉදුල් දෙත් යි ද කිපෙන්නාහ. කිපියාහු ජීවිතයෙන් ද තොර කරත්. සසුනට ද අන්තරාය කරන්නාහ. රාජ්‍යය පතමින් හැසුරුණු **චොරනාගයාගේ** වස්තුව මෙහිලා කියයුතු ය. පිණ්ඩපාතයෙහි මෙසේ පිළිපැදිය යුතු ය.

පටිසන්ථාරය වනාහි කවරක්හට කටයුතු ද? කවරක්හට නො කටයුතු ද යත්:- පටිසන්ථාරය වනාහි විහාරයට පැමිණි ආගන්තුක වූ යම් කිසිවක්හට හෝ දිළින්දහුට හෝ සොරුට හෝ අධිපතියහුට හෝ කටයුතු ම ය. කෙසේ ද යත්:- ක්ෂය වූ මග වියදම් ඇති විහාරයට පැමිණි ආගන්තුකයා දැක පැන් දිය යුතු ය. පා ගල්වන තෙල් දිය යුතු ය. සුදුසු කාලයෙහි ආවහුට කැඳ බත් ද, නො කල්හි ආවහුට සහල් තිබේ නම් සහල් දිය යුතු ය. 'නො කල්හි පැමිණියෙහි, යව'යි නො කියයුතු ය. නිදන්නට තැනක් දිය යුතු ය. මේ සියල්ල ම කිසිත් ලාභයක් බලාපොරොත්තු නො වන්නහු විසින් ම කළයුතු ය. මිනිස්සු වනාහි සිවුපසය දෙන්නෝ ය, ඔවුන්ට මෙසේ සඞ්ග්‍රහ කරණු ලබන කල්හි නැවත නැවත පැහැද උපකාර කරන්නාහ යි සිත් නො ඉපදවිය යුතු ය. සොරුන්ට වනාහි සහසතු දය ද දිය යුතු ය. පටිසන්ථාරයෙහි අනුසස් දක්වීම පිණිස **චොරනාග** වස්තුව, බෑයා සමග දඹදිව ගිය **මහානාග** රජුගේ වස්තුව, **පිතුරජ්ජුගේ** රාජ්‍යයෙහි සිවු ඇමැතියන්ගේ

වස්තුව, **අභයවොර** වස්තුව යනාදී වූ බොහෝ වස්තූහු **මහාඅට්ඨකථාවෙහි** විස්තර වශයෙන් කියන ලදහ.

ඔවුන් අතුරෙහි මේ එක් වස්තුවක් දක්වීම යඃ- හෙළදිව අභය නම් සොරතෙමේ පන්සියයක් සොරු පිරිවර කොට ගත්තේ එක් තැනක කඳවුරු බැඳ හාත්පස තුන් යොදුන් තැන කොල්ල කමින් මිනිසුන් පලවාහැර වාසය කරන්නේ ය. **අනුරාධපුර** වැසියෝ **කොළොම් හොය** තරණය කොට නො යෙත්. **සැගිරියට** යන මගෙහි මිනිසුන්ගේ හැසිරීම මුළුමනින් සිදින ලද්දේ ය. නැවත එක් දවසක් සොර තෙමේ 'සැගිරිය පැහැර ගන්නෙමි'යි එහි ගියේ ය. අරමි රක්නෝ ඔහු දැක **දීඝභාණක** අභය මහාස්ථවිරයන් වහන්සේට සැලකළහ. එවිට ස්ථවිරයන් වහන්සේ 'ගිතෙල් උක්හකුරු ආදිය ඇත් ද'යි ඔවුන්ගෙන් ඇසූහ. 'ස්වාමීනි! සඞ්ඝයාගේ ප්‍රයොජනය පිණිස ගෙණෙන ලද සහල් පලා කොළ කිරි වෙඩරු ඈ පස්ගෝරස තිබේය' යි කීකල්හි 'එසේ නම් බත් පිළියෙල කොට සොරුන්ට දෙවු'යි කීහ. ආරාමිකයෝ එසේ කළහ. සොරු බත් අනුභව කොට 'කවරකු විසින් මේ පටිසන්ථාරය කරණ ලද ද' යි ඇසූහ. 'අපගේ ආර්‍ය්‍ය වූ අභය මහාස්ථවිරයන් වහන්සේ විසිනැ'යි කියූ කල්හි සොරු මහතෙරුන් වෙතට ගොස් වැඳ 'ස්වාමීනි! අපි සඟසතු දයත් සෑය සතු දයත් පැහැර ගන්නෙමු'යි ආවෝ වෙමු. ඔබවහන්සේගේ මේ පටිසන්ථාරයෙන් ඔබවහන්සේ කෙරෙහි අපි පැහැදුනෝ වෙමු, අද පටන් මෙහි විහාරයෙහි ධාර්මිකාරක්ෂාව අප අයත් වේවා, තුවරු අවුත් දන් දෙත්වා, සෑය වඳිත්වා'යි වැඳ කියා සිටියහ. එතැන් පටන් තුවරුන් දන් දෙන්නට පැමිණෙන කල්හි ගං ඉවුරෙහි දී ම ඔවුන් ඉදිරියට ගොස් ඔවුන්ට රැකවරණ කරමින් තුවරුන් විහාරයට පමුණුවත්. විහාරයෙහි ද දන් දෙන්නවුන්ට ආරක්ෂා සංවිධානය කොට සිටිත්. ඔවුහු ද භික්ෂූන් වළඳ ඉතිරි වූ දය සොරුන්ට දෙත්. දන් දුන්නවුන් දන් දී පෙරළා යන කල්හි ද සොරු ඔවුන් ගංඉවුරට පමුණුවා නවතිත්. එක් දවසක් 'මහාස්ථවිරයන් වහන්සේ තමන් අධිපති බැවින් සඟසතුදය සොරුන්ට දුන්හ'යි සඞ්ඝයා අතර අගුණ කීමෙක් උපන. ස්ථවිරයන් වහන්සේ රැස්වීමක් කරවා 'සොරු සඞ්ඝයාගේ පිසීමට ගන්නා පියවි දය ද, සෑ සතුදය ද පැහැර ගන්නෙමු' යි ආවාහු ය. එකල්හි මෙසේ කළොත් පැහැර නො ගන්නාහ' යි සිතා ඔවුන්ට මා විසින් මෙපමණ වූ පටිසන්ථාරයක් කරණ ලද්දේ ය, ඒ සියල්ල ම එක් රැස් කොට අගය කරවා ලවු, ඒ කාරණයෙන් සොරු පැහැර නො ගත් බවුත් එක් රැස් කොට අගය කරවා ලවු යි කීහ. එයින් තෙරුන් විසින් දෙන ලද සියල්ල ම සෑහෙයි. නන්වැදරුම් වූ උතුම් රූපයන්ගෙන් විසිතුරු වූ

ඇතිරිල්ලක් පමණකුත් නො අගනේ ය. ඉක්බිති ඔවුහු තෙරුන් කරණලද පටිසඤ්ඨාරය මැනැවින් කරණ ලද්දෙක, වොදනා කරන්නට හෝ සිහි කරවන්නට හෝ නො ලබයි, ශ්‍රීවාවක් හෝ අවහාරයක් හෝ නැත්තේ ය. මෙසේ පටිසඤ්ඨාරය මහත් අනුසස් ඇත්තේය යි සලකා නුවණැති මහණහු විසින් ඒ කටයුතුය යි කීහ.

අඞ්ගුලිපතෝදක වත්‍රුවෙහි - **'උත්තසන්තෝ'** කලාත්ත වනුයේ 'අනස්සාසකෝ' ආශ්වාස ප්‍රශ්වාස රහිත වූයේ ය. මේ වත්‍රුවෙහි වනාහි යම් ආපත්තියක් වියයුතු නම් ඒ ආපත්තිය බුදුකයන්හි දක්වන ලද යි මෙහි නො කියන ලදී. එයට අනතුරු වත්‍රුවෙහි **'ඔස්ථරිත්වා'** යටපත් කොට පාගා හෙතෙමේ වනාහි ඔවුන් විසින් අදිනු ලබනුයේ වැටුනේ ය. එකෙක් ඔහුගේ උදරයෙහි නැඟී හුන්නේ ය. සෙසු පසළොස් දෙන ද පොළොවෙහි ගැලී ගෙණ හබකයෙහි නැඟ ගල් මෙන් සිට මුවකු මැරූහ. යම්හෙයකින් ඔවුහු කම්‍මාභිප්‍රාය ඇත්තාහු මරණාභිප්‍රාය නැත්තාහු ද, එහෙයින් පාරාජිකය නො කියන ලදී. **හූතවෙජ්ජක** වත්‍රුවෙහි **'යක්ඛං මාරෙසි'** හූතවිද්‍යාපාඨකයෝ යකකු විසින් ගන්නා ලද්දකු මුදනු කැමැත්තාහු යකු ආවෙශ කරවා මුදව යි කියත්. ඉදින් නො මුද නම්, පිටියෙන් හෝ මැටියෙන් හෝ රූපයක් කොට එහි අත්පා ආදිය සිදිත්. එහි යම් යම් අවයවයක් සිඳී ද, යකුගේ ඒ ඒ අවයවය සිඳින ලද්දේ ම වේ. හිස සිදි කල්හි යක්‍ෂ තෙමේ ද මැරී වැටේ. මෙසේ හෙතෙමේ ද මැරුයේ ය. එහෙයින් ථුල්ලච්චය වදරණ ලදී. හූදෙක් යක්‍ෂයකු ම නො මරා ද, යමෙක් තෙමේ ද සක් දෙවිරජු මරන්නේ ද, හෙතෙමේ ද ථුල්ලච්චයට ම පැමිණේ.

වාළයක්ඛ වත්‍රුවෙහි- **'වාළයක්ඛවිහාරං'** යම් විහාරයක කැකුළු සැඩ යකෙක් වෙසේ ද, ඒ විහාරය යි. යමෙක් වනාහි මෙබඳු විහාරයකැ යි නො දන්නේ හූදෙක් එහි වසනු පිණිස යමකු යවා ද, ඇවැත් නො වේ. යමෙක් තෙමේ මරණ අදහස් ඇත්තේ යවා ද, හෙතෙමේ අනෙකාගේ මරණයෙන් පාරාජිකයට පැමිණේ. නොමළොත් ථුල්ලච්චයට පැමිණේ. වාළයක්ඛවිහාරය යම් සේ ද, එසේ යම් විහාරයෙක ව්‍යාල සිංහ වයාඝ්‍රාදි මෘගයෝ හෝ පිඹුරු කලුසප් ආදී වූ දීඝී ජාතිකයෝ හෝ වසත් ද, ඒ ව්‍යාලවිහාරයට යවන්නහු පිළිබඳ ආපත්ති අනාපත්ති භෙදය මෙහි ද දතයුතු ය. මේ පාලිමුක්තක නය වේ. මහණකු ව්‍යාලයක්ඛවිහාරයට යවන්නහු පිළිබඳ ආපත්ති අනාපත්ති භෙදය යම් සේ ද ව්‍යාලයක්ඛයකු, මහණහු වෙතට යවන්නහු පිළිබඳ ආපත්ති අනාපත්ති භෙදය එසේ දතයුතු ය. **වාළකාන්තාරාදි** වත්‍රුන්හි ද මෙම නය වේ. හූදෙක් මෙහි යම් කාන්තාරයෙක්හි ව්‍යාලමෘගයෝ හෝ දීඝීජාතිකයෝ හෝ වෙසෙත්

ද, එය වාළකත්තාර නම්. මෙහි මෙසේ පදැඳීමාත්‍රය ම වෙනස් වේ. මේ මනුෂ්‍යවිග්‍රහපාරාජිකය වනාහි සියුම් ය. පරියාය කථාවෙන් නො මිදේ. එහෙයින් යමෙක් 'අසුවල් පෙදෙසෙහි සොරෙක් හුන්නේ ය. යමෙක් ඔහුගේ හිස සිඳ ගෙණ ඒ නම්, ඔහු රජුගෙන් සත්කාර විශෙෂ ලබාය යි කියන්නේ නම්, ඔහුගේ මේ වචනය අසා කිසිවෙක් ඔහු වෙනට ගොස් මරා ද, මෙතෙමේ පාරාජික වේ.

'තං මඤ්ඤමානො' යනාදි තන්හි ඒ මහණතෙමේ වනාහි තමන්ගේ වෛරී භික්ෂුනමක් මරණු කැමැත්තේ, මොහු දවල මරන්නා වූ මට සුවසේ යෑම පහසු නො වන්නේ ය, රාත්‍රියෙහි ඔහු මරන්නෙමි යි සිතුයේ ය, එසේ සලකා රාත්‍රියෙහි අවුත් බොහෝ දෙනකුන් නිදිගස්තැන ඔහු යි සිතමින් ඔහු ම ජීවිතයෙන් තොර කෙළේ ය. අනෙකෙක් ඔහු යි සිතමින් අනෙකකු, අනෙකෙක් ඔහුගේ ම යහළු යි සිතමින් ඒ අනෙකකු, අනෙකෙක් ඔහුගේ ම යහළු වූ අනෙකකු යි සිතමින් ඔහුගේ ම යහළු වූ අනෙකකු ජීවිතයෙන් තොර කෙළේ ය. සියල්ලන්ට ම පාරාජිකය වේ.

අමනුස්සගහිත වස්තූන් අතුරෙහි ප්‍රථම වස්තුවෙහි 'යකු පලවා හරින්නෙමි'යි අන් මහණෙක්තෙමේ 'දැන් මෙතෙමේ විරුද්ධ වන්නට සමර්ථ නො වේ, ඔහු මරන්නෙමි යි පහර දුන්නේ ය. මෙහි ද මරණයෙහි අදහස් නැත්තහුට අනාපත්තිය කියන ලදැ යි මෙපමණකින් ම අමනුෂ්‍යයන් විසින් ගන්නා ලද්දහුට පහර නො දියයුතු ය. තල්පතක් හෝ පිරිත් සූයක් හෝ අතෙහි හෝ පයෙහි හෝ බැඳිය යුතු ය. රතනසූත්‍රාදී වූ සූත්‍ර කියයුතු ය. 'සිල්වත් මහණහු වෙහෙස නො කරව' යි ධර්මකථා කටයුතු ය.

සඟඝකථාදිය ප්‍රකට අර්ථ ඇත්තාහු ය. මෙහි යමක් කියයුතු ද එය කියන ලද්දේ ම ය. **රුක්ඛවෙජ්ජන** වස්තුව **අට්ඨබන්ධන** වස්තුව සමාන වේ. මේ වනාහි විශෙෂය වේ:- යමෙක් රුකින් යට වූයේ ද නො මැරේ ද, එක් පසකින් රුක සිඳ පොළොව හෝ සාරා නික්මෙන්නට හැක්කේ වේ ද, මොහුගේ අතෙහි වැයක් හෝ පොරොවක් හෝ දැත්තේ ද, ඔහු විසිනුදු ජීවිතය හළයුතු ය. රුක හෝ නො සිඳිය යුතු ය. පොළොව හෝ නො කැණිය යුතු ය. කුමක් හෙයින ය යත්:- මෙසේ කරන්නේ වනාහි පාචිත්තියට පැමිණේ. බුදුරජුන්ගේ අණ බිඳියි. ජීවිතය කෙළවර කොට සිල් නො රකියි. එහෙයින් කිම? ජීවිතය හළයුතු ද, සීලය නො හළයුතු ද යි සලකා මෙසේ නො කට යුතු ය. අන් මහණුන්හට වනාහි රුක සිඳ හැර හෝ පොළොව කැන හෝ ඔහු බැහැර කිරීම වටියි. උදුක්ඛල යන්ත්‍රයෙන් රුක පෙරළා බැහැර කටයුත්තේ

වේ ද, ඒ රුක ම සිඳ උදුක්කලය ගතයුතුය යි **මහාසුම්ම** ස්ථවිරයන් වහන්සේ කීහ. අනිකක් ද සිඳ ගැනීම වටීය' යි **මහාපදුම** ස්ථවිරයන් වහන්සේ කීහ. හෙබ් ආදියෙහි වැටනහු ද ඉණිමං බැඳ උඩට නගා ගැනීමෙහි මේ නය ම වේ. තමන්ට ගස් කොළන් සිඳ ඉණිමං නො කට යුතු ය. අන්හට ඉණිමං කොට නගා ගැනීම වටියි.

දයාලිම්පන වසූනුන්හි **'දයං ආලිම්පෙසුං'** වනයෙහි ගිනි දුන්හ. මෙහි වනාහි ඔදිස්ස අනොදිස්ස වසයෙන් පාරාජික - ආනන්තරිය - ථුල්ලච්චය - පාචිත්තිය වසූනුන්ට අනුරූප වසයෙන් පාරාජිකාදිය හා අකුසලරාසිභාවය ද පෙර කියූ නයින් ම දතයුතු ය. අමුතණ වන ලැහැබ් ආදීහු දනු ලැබෙත්වා යි ගිනිදල්වන්නහුට ද පාචිත්තිය වේ. ද්‍රව්‍යොපකරණයෝ නැසෙත්වා යි ගිනිදල්වන්නහුට දුක්කටය වේ. ක්‍රීඩාධ්‍යාසයෙනුදු ගිනිදල්වන්නහුට දුක්කටය යි **සඩ්ඝභේදපරිවාරකථාවෙහි** කියනලදී. අටු වියලුනු ඉන්ද්‍රියානින්ද්‍රියබද්ධ වූ යම් කිසිවක් දවෙනු ලැබේවා යි ගිනි දල්වන්නහුට වසූ වශයෙන් පාරාජික - ථුල්ලච්චය - පාචිත්තිය - දුක්කටයෝ දතයුත්තාහ. ගිනි පැහිරීම වළකනු පිණිස ගිනි දැල්වීම හා ආරක්ෂා කිරීම ද භාග්‍යවතුන් වහන්සේ විසින් අනු දන්නා ලද්දේ ය. එහෙයින් වනයෙහි වනකාර්මිකයන් විසින් දල්වන ලද්ද වූ හෝ තමන් ම නැඟී සිටියා වූ හෝ පැහිර එන ගින්න දැක 'තණ කිළිඳු නො දවෙත්වා, නො නැසෙත්වා' යි ඒ ගින්නට, පැහිර එන ගින්න යමක් සමග එකතුව දර නැතිව නිවියේ ද, එයට ප්‍රතිපක්ෂ වූ ගිනිදැල්වීම වටියි. ආරක්ෂා කිරීම ද වටියි. තණකිළි හාත්පස බිම සැසීම හෝ අගල් කැණීම හෝ යන මේ සියල්ල, යම්සේ පැහිර ආ ගින්න දර නො ලැබ නිවියේ ද, ගින්න නැඟී සිටි කල්හි ම කිරීම සුදුසු වේ. ගින්න නො නැඟී කල්හි අනුපසම්පන්නයන් ලවා කැපවහරින් කරවිය යුතු ය. දියෙන් නිවන්නවුන් විසින් සතුන් නැති දිය ම ඉසිය යුතු ය.

ආඝාතන වසූතුවෙහි - එක් පහරිනැ යි යන වචනය නිමිති කොට පාරාජිකය යම්සේ වේ ද, දෙපහරිනැ යි යනාදි වචනයෙන් ද නිමිති කොට පාරාජිකය මෙසේ දත යුතු ය. දෙපහරිනැ යි කියූ කල්හි ද එක් පහරින් මැරූ කල්හි ද ක්ෂේත්‍රයට බැස සිටි බැවින් පාරාජිකයට පැමිණේ. පහර තුණකින් මැරූ කල්හි විසඤ්ඤිකතය වේ. මෙසේ නියමිත පිරිසිදීමෙහි හෝ පිරිසිදීම තුළ හෝ විසඤ්ඤිකතයක් නැත්තේ ය. පිරිසිදි නැන ඉක්මගිය කල්හි සියඵනැන් විසඤ්ඤිකතය වේ. අණ කළ මහණ තෙමේ මිදෙන්නේ ය. වධකයාහට ම දෙසය වේ. පහරදීම් හි යමසේ ද මෙසේ පුරුෂයන් අතුරෙහි ද 'එකෙක් මැරේවා' යි කියූ කල්හි එකෙකු විසින් ම මැරූ කල්හි පාරාජිකය වේ. දෙදෙනකු විසින් මැරූ කල්හි

විසඬ්ඪතය වේ. දෙදෙනෙක් එක්ව මරත්වා යි කියූ කල්හි එකෙකු විසින් හෝ දෙදෙනෙකු විසින් හෝ මැරූ කල්හි පාරාජිකය වේ. තිදෙනකු විසින් මැරූ කල්හි විසඬ්ඪතය යි දතයුතු ය. එකෙක් යුදබිම වෙගයෙන් දුවන පුරුෂයක්හුගේ හිස කඩුවෙන් සිඳ හැරියේ ය. හිස නැති කවඬශරීරය දුවයි. අනෙකෙක් ඒ කවඬයට පහර දී බිම හෙළී ය. මේ දෙදෙනා අතුරෙහි කවරක්හට පාරාජිකයද යි විචාල කල්හි අඩක් තෙරහු 'ගමන් සිදලූවහුටය' යි කීහ. **ආහිඨමේකගොදත්ත** ස්ථවිරයන් වහන්සේ 'හිස සිඳ හැරියහුටය'යි කීහ. මෙබඳු වස්තුහු මේ වස්තුවෙහි අතී දක්වීම පිණිස කියයුත්තාහ.

තක්ක වස්තුවෙහි - නියම නො කොට 'මෝරු පොවවු'යි කියූ කල්හි යම් ඒ මෝරු වෙසෙසක් පොවා මැරූ කල්හි පාරාජිකය වේ. සීත වූ උණුසුම් වූ තැවූ හෝ නො තැවූ ගවමෝරු මීමෝරු එළුමෝරු හෝ යි නියම කොට කියූ කල්හි යමක් කියනලද ද, එයින් අන්‍යවූවක් පොවා මැරූ කල්හි විසඬ්ඪතය වේ.

සොවීරක වස්තුවෙහි - **ලොණසොවීරක** නම් සියලු රසයන්ගෙන් පිළියෙල කළ එක් බෙහෙතකි. එය පිළියෙල කරන්නෝ අරළු නෙල්ලි බුළු යන තිපල තම්බාගත් කෂාය සැළියක වත්කර, එහි සියලු ධාණ්‍ය වර්ග, මුං මෑ ආදී වූ අපරාණ්ණ, සවැදෑරුම් ධාන්‍යයෙන් පිසූ බත්, කෙසෙල් ආදී වූ සියලු ඵලවර්ග, වේවැල් වැටකේ දුනුකේ කරාකේ ඉදිබඩ ආදී වූ සියලු බඩ වර්ග, මස් මාලු කැබලි, නොයෙක් මී උක් හකුරු සවිදලුණු හා කුළු බෙහෙත් බහා සැළිමුව මැටි බැඳ, අවුරුදු එකක් හෝ දෙකක් හෝ තුණක් හෝ තබන්නාහ. එතෙක් කල් මැනැවින් පැසුනු එය දඹ පැන් පැහැය වැනි පැහැය ඇත්තේ වේ. වාත කාශ කුෂ්ඨ පාණ්ඩු භගන්දරාදි රොගයන්ට ද සිතිදු බොජුන් වළඳන්නවුන්ට ද මෙය ඉතා උසස් පානයෙකි. මෙබඳු බත් දිරවන බෙහෙතක් නැත්තේ ය. මෙය භික්ෂූන්ට පසුබත් කාලයෙහි ද වැළඳීමට සුදුසු වේ. ගිලනුන්හට පියවිගති ඇත්තක් ම වටියි. නො ගිලනුන්හට පානපරිභොගයෙන් දිය හා මිශ්‍ර කරනලද්දේ සුදුසු .වේ.

විනයවිවෘති
නම්වූ
සිංහල සමන්තපාසාදිකාවෙහි
තෘතීයපාරාජිකවර්ණනාව

——\\——

චතුත්‍රීපාරාජිකය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

—\\—

චතුස්සත්‍යාවබොධය කළා වූ ශාස්තෘන් වහන්සේ යම් චතුත්‍රීපාරාජිකා ශික්ෂාපදයක් ප්‍රකාශ කළ සේක් ද, දැන් ඒ පාරාජිකය පිළිබඳ සංවර්ණනා ක්‍රමය පැමිණියේ ය.

යම්හෙයකින් පෙර ද ප්‍රකාශ කළ යමක් මනාකොට දතහැක්කේ ද එහෙයින් එය හැරපියා මේ චතුත්‍රීපාරාජිකය පිළිබඳ සංවර්ණනාව වන්නී ය.

'තෙන සමයෙන බුද්ධො භගවා වෙසාලියං විහරති -පෙ- ගිහීනං කම්මන්තං අධිට්ඨෙම' ගිහීන්ගේ කෙත්වල ද අරමෙහි ද කටයුතු කිස සංවිධානය කරමු, 'මෙසේ කටයුතු ය, මෙසේ නො කටයුතුය යි කියමු, අනුශාසනා ද කරමු' යි කියන ලද්දේ වේ. **'දූතෙය්‍යං'** දූතකර්මය. **'උත්තරිමනුස්සධම්මස්ස'** මනුෂ්‍යධර්ම ඉක්ම වූ ධ්‍යානාදි ධර්ම පිළිබඳ. මනුෂ්‍යත්වය ඉක්මවා බ්‍රහ්මත්වයට හෝ නිර්වාණයට පමුණුවන්නා වූ ධර්මය පිළිබඳ ය යන අර්ථ යි. නොහොත් උත්තරි මනුෂ්‍යධර්මයට පැමිණි ශ්‍රේෂ්ඨ පුරුෂයන්ගේ ද, ධ්‍යායීන්ගේ ද, ආර්‍යයන්ගේ ද ධර්මය පිළිබඳ. **'අසුකො භික්ඛු'** යනාදි තන්හි තුමූ මෙසේ මන්ත්‍රණය කොට පසුව ගිහියන්ට කියන්නාහු, 'බුද්ධරක්ඛිත නම් මහණ තෙමේ ප්‍රථමධ්‍යානය ලැබුයේ ය. ධම්මරක්ඛිත තෙමේ දවිතීය ධ්‍යානය ලැබුයේය'යි මෙසේ නම් වසයෙන් ම ගුණ කියූහ යි දත යුතු ය. එහි **'එසෙව තො ආවුසො සෙය්‍යො'** කර්මාන්තසංවිධානය හා පණිවුඩ ගෙණ යෑම ද බොහෝ සතුරන් ඇත්තකි. මහත් උවදුරු ඇත්තකි. ශ්‍රමණයන්ට යොග්‍ය ද නො වේ. ඒ දෙකට ම වඩා **'යො අම්හාකං ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණං භාසිතො'** යන මෙය ම ශ්‍රේෂ්ඨ ය. ඉතා පැසසිය යුතු ය. ඉතා සුන්දර ය. කුමක් කියන ලද්දේ වේ ද යත්:- ප්‍රධන්වීර්‍යයට සුදුසු පරිදි ඉරියවු පිහිටුවා හුන්නා වූ හෝ සක්මන් කරන්නා වූ මහණකු ගැණ විචාරන්නා වූ හෝ හෝ නො විචාරන්නා වූ හෝ ගිහියන්ට 'මේ අසුවල් මහණ තෙමේ ප්‍රථමධ්‍යානලාභීය' යන මේ ආදි ක්‍රමයෙන් අප අතර අනෙකකු විසින් අනෙකක්හුගේ

උත්තරිමනුෂ්‍යධර්මය පිළිබඳ යම් ගුණයෙක් කියන ලද්දේ වන්නේ ද, මෙය ම ශ්‍රේෂ්ඨ වේ ය යනුයි. අනාගත සම්බන්ධයක් වනාහි නැති කල්හි මොවුන් විසින් ඒ මොහොතෙහි ඒ උත්තරිමනුෂ්‍යධර්ම ගුණය නො කියන ලද්දේ ම යම් හෙයකින් නො යෙදේ ද, එහෙයින් අනාගතය සම්බන්ධ කොට 'යම් ගුණයක් මෙසේ කියන ලද්දේ වන්නේ ද, එය ශ්‍රේෂ්ඨ නු යි මෙසේ මෙහි අර්ථ දතයුතු ය. මෙහි ලක්ෂණ ශබ්දශාස්ත්‍රයෙන් සෙවිය යුතු ය.

'වණ්ණවා අහෙසුං' ඔවුන්ට අන්‍ය වූ ම අලුත් සිරුරුපැහැයක් උපන්නේ ය. ඒ උපන් පැහැයෙන් වර්ණවත් වූවාහු ය. **'පිණින්ද්‍රියා'** පඤ්ච ප්‍රසාදරූපයන් විසින් වැදුනු හෘදයවස්තුරූපය පිරිපුන් බැවින් මනස සවන කොට ඇති ඉන්ද්‍රියයන් නො මැලවුනු බැවින් පිණාගිය ඉඳුරන් ඇත්තාහ. **'පසන්නමුඛවණ්ණා'** අවිශේෂයෙන් සාමාන්‍යයෙන් වර්ණවත් වූවාහු ය. ශරීරවර්ණයට වඩා ඔවුන්ගේ මුඛවර්ණය ඉතා වැඩියක් පහන් වූයේ ය. නිර්මල ය. නො කැළඹුනේ ය. පිරිසිදු ය. යන අර්ථ යි. **'විප්පසන්නඡවිවණ්ණා'** ඔවුහු කිණිහිරි මල් ඇ සමාන වූ යම් වර්ණයකින් වර්ණවත් වූවාහු ද, මොවුන්ට මෙන් අන් මිනිසුන්ට ද එබඳු වූ වර්ණයක් ඇත්තේ ද, ඔවුන්ගේ ඡවිවර්ණය එසේ විප්‍රසන්න නො වේ. එහෙයින් 'විප්පසන්නඡවිවණ්ණා'යි වදරණ ලද ය. මෙසේ ඒ භික්ෂූහු උද්දෙශපරිවෘච්ඡාවන්හි නො ම යෙදුනාහු, කර්මස්ථානයන්හි නො යෙදුනාහු, කුහක බැවින් නැති ගුණ කියා පෑමෙන් ලැබූ පිණි බොජුන් වළඳ සුව ඇති පරිදි නිදිඇලුම්හි සමූහඇලුම්හි යෙදෙන්නාහු මේ ශරීරශොභාවට පැමිණියාහු ය. භ්‍රාන්ත මෘගයන් වැනි බාලයෝ යම්සේ ද, කටයුතු නො කටයුතු නො දන්නා බැවින් මොවුහු ද එසෙ ය. **'වඤ්ඣමුදකතීරියා'** වඤ්ඣමුදගංතෙරවැසියෝ. **කච්චිහිකිකවේ ඛමනීයං'** 'මහණෙනි! කිම? තොපට සිවුඉරියවුවකින් යුත් නවදෙරක් ඇති මේ ශරීරයන්ත්‍රය ඉවසිය හැකි ද? ඉවසන්නට උසුලන්නට පරිහරණය කරන්නට හැකි ද? කිසි දුකක් නො උපදවා ද? **'කච්චි යාපනීයං'** කිම? සියලු කටයුතුවල යෙදෙන්නට පවතින්නට හැකි ද? කිසි අනතුරක් නො දක්වා ද? **'කුච්ඡිපරිකන්තෙතා'** කුස කපාගැනීම උතුම් වන්නේ ය. 'පරිකන්තෙතා' යන පාඨය ද යෙදේ.

මෙසේ වඟගුමුදගංතෙර වස් විසූ භික්ෂූන්ට නොයෙක් අයුරින් ගරහා දැන් යම්හෙයකින් ඔවුන් විසින් කළ කර්මය, වෛරකර්මයක් වේ ද, එහෙයින් මතුවෙහි අන්හට ද මෙබඳු කම් නො කරණු පිණිස **'අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි'** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතු සේක. අමතා ද වනාහි **'පඤ්චිමෙ භික්ඛවෙ මහාචොරා'** යනාදිය වදළ

සේක. එහි **'සන්තෝ සංවිජ්ජමානා'** ඇත්තාහු ද දක්නා ලැබෙත් ද යි කියන ලද්දේ වේ. **ඉධ** මේ සත්ත්ව ලොකයෙහි. **'එවං හොති'** මෙසේ පූර්භාගයෙහි ආශාව උපදියි. **'කුදස්සුනාමාහං'** යන මෙහි **සු** යනු නිපාතයි. කවද නම් යන අර්ථ යි. **'සෝ අපරෙන සමයෙන'** හෙතෙමේ පූර්භාගයෙහි මෙසේ සිතා පිළිවෙලින් පිරිස වඩන්නේ මං පැහැරීම් පසල්ගම් කොල්ලකෑම් යන මේ ආදිය කොට මහත් බවට පැමිණි පිරිස් ඇත්තේ ගම් නොගම් ද දනවු නොදනවු ද කරමින් **'හනන්තෝ ඝාතෙන්තෝ -පෙ- පචන්තෝ පාවෙන්තෝ'** මරමින් මරවමින් - දවමින් දවවමින් වෙසෙයි.

මෙසේ බැහැරි මහසොරහු දක්වා ඒ සොරු සමාන වූ ශාසනයෙහි පස් මහසොරුන් දක්වන්නට **'එවමේව ඛෝ'** යනාදිය වදළ සේක. එහි **'පාපභික්ඛුනෝ'** අන් තන්හි මුල් සිදුනු පාරාජිකාපත්තියට පැමිණියේ 'පාපභික්ඛු' යි කියනු ලැබේ. මෙහි වනාහි පාරාජිකාවට නොපැමිණියේ, කැමැති සේ හැසිරීමෙහි සිටියේ ක්ෂුද්‍රානුක්ෂුද්‍රක ශික්ෂාපදයන් මැඩ හැසිරෙණුයේ 'පාපභික්ඛු'යි අදහස් කරණ ලද්දේ ය. ඔහුට ද බැහැරි මහසොරුට මෙන් පූර්භාගයෙහි **'කුදස්සු නාමාහං -පෙ- පරික්කාරානං'**යි මෙසේ අදහස් වේ. එහි **'සක්කතෝ'** සත්කාරයට පැමිණියේ. **'ගරුකතෝ'** ගරුකාරයට පැමිණියේ. **'මානිතෝ'** සිතින් ප්‍රිය කරණ ලද්දේ. **'පූජිතෝ'** සිවුපසය එළවීමෙන් පුදන ලද්දේ **'අපචිතෝ'** පූජාවට පමිණියේ ය. එහි යමක්හට සිවුපසය සකස් කොට මැනැවින් පිළියෙල කොට ඉතා ප්‍රණීත කොට දෙත් ද, හෙතෙමේ සත්කාර කරණ ලද්දේ වේ. යමකු කෙරෙහි ගරු බව පිහිටුවා දෙත් ද, හෙතෙමේ ගරු කරණ ලද්දේ වේ. යමකු සිතින් ප්‍රිය කෙරෙත් ද, හෙතෙමේ සිතින් ප්‍රියකරණ ලද්දේ වේ. යමක්හට මේ සියල්ල කෙරෙත් ද හෙතෙමේ පුදන ලද්දේ වේ. යමක්හට වැඳීම් නැගීසිටීම් ඇදිලිබැඳීම් ආදිවසයෙන් ඉතා යටත් පහත් පැවැතුම් දක්වත් ද, හෙතෙමේ පූජාවට පැමිණියේ ය. ලොකාමිෂය පතන්නා වූ මොහුට මෙසේ මේ සියල්ල වන්නේ ය.

'සෝ අපරෙන සමයෙන' හෙතෙමේ පූර්භාගයෙහි මෙසේ සිතා පිළිවෙළින් ශික්ෂාපදයන්හි දැඩි ගෞරව නැත්තා වූ උඩඟු වූ නැගී සිටි හිස් මාන නළ ඇත්තා වූ පාසිවුරුවලින් සැරසී ගැනීම් ආදී වූ චපල භාවයෙන් යුක්ත වූ රළුබස් ඇත්තා වූ නොහික්මුනු බස් ඇත්තා වූ මුළා වූ සිහි ඇත්තා වූ නුවණ නැත්තා වූ අසංවර බැවින් සැහැවි ඉඳුරන් ඇත්තා වූ ආචාර්‍ය්‍ය - උපාධ්‍යායයන් විසින් බැහැර කරණ ලද්ද වූ සිවුපසය ගරු කොට ගත් පාප භික්ෂූන්ට සඬ්ග්‍රහ කොට ඉරියවු පිහිටුවීම් ආදී වූ කොහොන්වත් උගන්වා 'මේ සථවිර තෙමේ අසුවල්

නම් සෙනසුනෙහි වස් එළැඹ වත්පිළිවෙත් පුරමින් වස් වැස නික්ම ගියේය' යි ලොකසම්මත සෙනාසන සංවර්ණනාදි උපායයන්ගෙන් ලොකය පෙරළන්නට ප්‍රතිබල වූ ජාතකකථාදියෙහි කළ පුරුද්ද ඇති මධුර ස්වරයෙන් යුත් පාපභික්ෂූන් විසින් වර්ණනා කරණු ලබන ගුණ ඇතිව සියයකින් හෝ දහසකින් පිරිවරන ලදුව - පෙ- බෙහෙත් පිරිකර ලැබීම් ඇත්තේ හැසිරෙන්නේ ය. **'අයං භික්ඛවෙ පඨමො මහාචොරො'** මෙතෙමේ ගෘහසන්ධි සිදීම් ආදිය කරන සොරකු මෙන් එක් කුලයක් සිදින්නේ නො වේ. දෙ කුලයක් සිදින්නේ නො වේ. තවද මොහු මහාජනයා රවටා සිවුපසය ගන්නා බැවින් පළමුවන මහ සොරුය යි දතයුතු ය. සූත්‍රාන්තික වූ හෝ ආභිධර්මික වූ හෝ විනයධර වූ හෝ යම් භික්ෂූහු වනාහි පිඬුපිණිස හැසිර ලැබිය යුතු පිණ්ඩපාතය නො ලැබෙන කල්හි පාළිය කියවමින් අර්ථකථාව කියවමින් අනුමොදනාවෙන් ධර්මකථාවෙන් ඊර්ෂ්‍යාපථසම්පත්තියෙන් ලොකය පහද වන්නාහු ජනපදවාරිකාව කෙරෙත් ද, සත්කාර කරන ලද ගරුකාර කරනලද සිතින් ප්‍රිය කරනලද සිවුපසය එළවීමෙන් පුදනලද පූජාවනට පැමිණි ත්‍රිපිටකපරම්පරාව ගළපන ඔවුහු සසුන බබුළුවන්නාහ යි දතයුතු ය.

'තථාගතප්පවෙදිතං' තථාගතයන් වහන්සේ විසින් පිළිවිදින ලද ඉදුරන්ට හමුකරණලද දන්වනලද හෝ **'අත්තනො දහති'** පිරිස් මැද පාළිය ද අර්ථකථාව ද සසඳ මිහිරිහඬින් ප්‍රසාදය එළවන සූත්‍රාන්ත කියා ඒ ධර්මකථාවසානයෙහි ඉතා පුදුමයට පැමිණි තුවණැත්තන් විසින් 'අහෝ ස්වාමීනි! පාළිය ද අර්ථකථාව ද ඉතා පිරිසිදු ය, කවරක්හුගේ සමීපයෙහි උගත්තහු දැ' යි විචාරණ ලද්දේ, 'අප වැන්නන්හට උගන්වන්නට කවරෙක් සමර්ථ වේද' යි ගුරුවරයා නො දක්වා, ධර්මවිනය තමන් විසින් ම පිළිවිදින ලද ය, තමන්ගේ තුවණින් අවබොධ කරණ ලදැ' යි ප්‍රකාශ කරන්නේ ය. මෙතෙමේ තථාගතයන් වහන්සේ විසින් සාරාසඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි පාරමීන් පුරා ඉතා දුකින් අවබොධ කළ ධර්ය සොරකම් කළ **දෙවන සොර තෙමේ** ය.

'සුද්ධං බ්‍රහ්මචාරිං' ක්ෂීණාස්‍රව භික්ෂු **'පරිසුද්ධං බ්‍රහ්මචරියං චරන්තං'** උපක්ලෙශ රහිත වූ ශ්‍රෙෂ්ඨචර්‍යාවෙහි හැසිරෙන්නහු අන්‍ය වූ ද අනාගාමීහු ආදි කොට අවිප්‍රතිසාරාදිය වසඟ කොට ඇති පිරිසිදු බඹසර හැසිරෙණ සිල්වත් පුහුදුනහු තෙක් **'අමූලකෙන අබ්‍රහ්මචරියෙන අනුද්ධංසෙති'** ඒ පුද්ගලයා කෙරෙහි අවිද්‍යමාන වූ අන්තිම වසඟුවෙන් දෙස් නගයි. වොදනා කරයි. මෙතෙමේ විද්‍යමාන ගුණ මකාලන සුලු වූ ආර්‍යගුණ සොරකම් කරණ **තෙවන සොර තෙමේ** ය.

'ගරුභණ්ඩානි ගරුපරික්ඛාරානි' අදිනනාදන පාරාජිකයෙහි 'චතුරෝ ජනා සංවිධාය ගරුභණ්ඩං අවාහරුං' යන මෙහි පස් මස්සක් අගනා වසතුව ගරු භාණ්ඩ යි යමිසේ කියනු ලැබේ ද, මෙහි මෙසේ නො වේ. තවද 'පඤ්චිමානි භික්ඛවෙ අවිස්සජ්ජියානි න විස්සාජෙතබ්බානි සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා, විස්සජ්ජිතානිපි අවිස්සජ්ජිතානි හොන්ති, යො විස්සජ්ජෙය්‍ය, ආපත්ති ථුල්ලච්චයස්ස කතමානි පඤ්ච: ආරාමො ආරාමවත්ථු -පෙ- දරුභණ්ඩං මත්තිකාභණ්ඩං' යි වදළ වචනයෙන් මොවුහු නො හළ යුතු බැවින් ගරුභාණ්ඩ නම් වෙත්. 'පඤ්චිමානි භික්ඛවෙ අවෙභඩ්ගියානි න විභජිතබ්බානි සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා, විභත්තානිපි අවිභත්තානි හොන්ති, යො විභජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස කතමානි පඤ්ච: ආරාමො ආරාමවත්ථු -පෙ- දරුභණ්ඩං මත්තිකාභණ්ඩං' යි වදළ වචනයෙන් මොවුහු වෙන් නො කටයුතු බැවින් සාධාරණ පරිෂ්කාර බැවින් ගරු පරිෂ්කාර නම් වෙත්. **'ආරාමො ආරාමවත්ථු'** යනාදියෙහි යමක් කියයුතු නම්, ඒ සියල්ල 'පඤ්චිමානි භික්ඛවෙ අවිස්සජ්ජියානි' යි බන්ධකයෙහි ආවා වූ සූත්‍රවිභඞ්ගයෙහි ම කියන්නෙමු. **'තෙහි ගිහී සඞ්ගණ්හාති'** ඒවා දීමෙන් ගිහින්ට සඞ්ග්‍රහ කරයි. අනුග්‍රහ කරයි. **'උපලාපෙති'** 'අනේ අපගේ ආය්‍යතෙමේ'යි මෙසේ කියන්නන්, ලුහුබැඳ එන්නන්, ස්නෙහ සහිතන් කරයි.නොහළයුතු වෙන් නො කටයුතු ගරුපරිෂ්කාර එසේ නො කිරීමෙන් සොරකම් කොට ගිහින්ට සඞ්ග්‍රහ කරන්නා වූ මෙතෙමේ **සිවුවන මහා සොර තෙමේ** ය. ඒ මේ තෙමේ මේ ගරුභාණ්ඩ කුසලසඞ්ග්‍රහ පිණිස දෙන්නේ හරින්නේ කුලදූසකදුක්කටයට පැමිණේ. පබ්බාජනීයකම්යට සුදුසු වූයේ ද වේ. භික්ෂුසඞ්ඝයා මැඩගෙණ අධිපතිභාවහෙතුවෙන් දෙන්නේ ථුල්ලච්චයට පැමිණේ. සොරසිතින් දෙන්නේ දුන් බවුව අගය කරවා ඇවැත් නැගිය යුතු ය.

අයං අග්ගො මහාචොරො' මෙතෙමේ මේ සොරුන් අතුරෙහි දෙවු සොර තෙමේ ය. යමෙක් පඤ්චෙන්ද්‍රියග්‍රහණය ඉක්මවා සිටි ඉතා සියුම් වූ ලොකොත්තරධම්ය සොරකම් කෙරේ ද, එහෙයින් මොහු සමාන සොරෙක් නම් නැත්තේ ය. කිම? ලොකොත්තර ධම්ය හිරණ්‍ය සුවර්ණාදිය මෙන් රවටා සොරකම් කොට ගන්නට හැක්කේ ද? නො හැක්කේ ය. එහෙයින් **'යො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති'** මෙතෙමේ වනාහි තමන් කෙරෙහි අවිද්‍යමාන වූ ඒ ලොකොත්තරධම්ය. 'මේ ලොකොත්තරධම්ය හුදෙක් මට ඇත්තේ ය'යි ප්‍රකාශ කෙරේ ද, එහෙත් ධ්‍යානාවාවනය කරන්නට වනාහි නො හැක්කේ ය. තමන් කෙරෙහි විද්‍යමානවූවක් කරන්නට හෝ නො හැක්කේ ය. එසේ නම් කුමක්

හෙයින් සොරා යි කිනු ලැබේ ද? යම්හෙයකින් ඒ ලොකොත්තරධර්මය ප්‍රකාශ කොට අසන්තසම්භාවනා හෙතුවෙන් උපන් සිවුපසය ගණී ද, මෙසේ ගන්නහු විසින් ඒ සිවුපසය සියුම් වූ උපායයෙන් රවටා සොරකම් කොට ගන්නා ලද්දේ වේ. එහෙයින් **'තං කිස්ස හෙතු? ථෙය්‍යාය වො භික්ඛවෙ රට්ඨපිණ්ඩා භුත්තෙතා'** යනු වදළ සේක. මේ මෙහි අර්ථය වේ. **'අයං අග්ගො මහාවොරො, යො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපතීති, තං කිස්ස හෙතු'** යි යමක් කීවෙමු ද? කුමන කරුණකින් මෙය කීවෙමු ද යත්:- **'ථෙය්‍යාය වො භික්ඛවෙ රට්ඨපිණ්ඩා භුත්තෙතා'** මහණෙනි! යම්හෙයකින් ඔහු විසින් ඒ රාෂ්ට්‍රපිණ්ඩය සොර සිතින් අනුභව කරණ ලද්දේ වේ ද, එහෙයිනි. මෙහි වූ වො කාරය 'යෙහි වො අරියා අරඤ්ඤෙ වනපත්ථානි' යනාදි තන්හි මෙන් පද පූරණ මාත්‍රයෙහි නිපාතයි. එහෙයින් 'තොප විසින් අනුභව කරණ ලද්දේය' යි මෙහි අර්ථ නො දත යුතු ය.

දන් ඒ අර්ථය ම ගාථාවන්ගෙන් අතිශයින් ප්‍රකට කරණ සේක් **'අඤ්ඤථා සන්තං'** යනාදිය වදළ සේක. එහි **'අඤ්ඤථා සන්තං'** අපිරිසිදු වූ කායසමාචාරාදී වූ අන් අයුරකින් විද්‍යාමනවූවහු **'අඤ්ඤථා යො පවෙදයෙ'** පිරිසිදු වූ කායසමාචාරාදී වූ අන් අයුරකින්, යමෙක් පවසන්නේ ද, 'මම පරමපරිශුද්ධයෙක්මි, මාගේ සිතතුළ ලොකොත්තරධර්මය ඇතැ'යි මෙසේ දන්වන්නේ නම් මෙසේ පවසා ද, ඒ පැවසීමෙන් උපන් බොජුන් රහතකු මෙන් වළඳයි. **'නිකච්ච කිතවසෙසව භුත්තං ථෙය්‍යෙන තස්ස තං'** යන මෙහි **නිකච්ච** රවටා. අන්පරිද්දකින් වූවහු අන්පරිද්දකින් දක්වා පදුරක් වනරොදක් ගසක් නො වූ තමා, අතු කොළ දලු ආදියෙන් වසා ගැණීමෙන් පදුරක් මෙන් වනරොදක් මෙන් ගසක් මෙන් තමන් දක්වා **'කිතවසෙසව'** වඤ්චක වූ කෙරාටික වූ පදුරු වනරොද ගස් ය යන හැඟීමෙන් වනයෙහි තමන් වෙත ආ ආ පක්ෂීන් අල්වා ගෙණ මරා කා දිවි යවන ලිහිණිවැද්දකුගේ වැනි **'භුත්තං ථෙය්‍යෙන තස්ස තං**' 'නො රහත්ව ම රහත්බව හඟවා ලත් බොජුන් අනුභව කරණ ඔහුගේ ද, යම් ඒ බොජුනක් අනුභව කරණ ලද්දේ වේ ද, එය ලිහිණි වැදි කෙරාටිකයාගේ ලිහිණින් රවටා වඤ්චා කොට ලිහිණින් අල්ලා ගැණීම යම් සේ ද, මෙසේ මිනිසුන් රවටා ලත් බොජුන් අනුභව කළ බැවින් සොරසිතින් අනුභව කරණ ලද්දේ නම් වේ. මේ කාරණය නො දත් යම් කෙනෙක් මෙසේ අනුභව කෙරෙත් ද, **'කාසාවකණ්ඨා -පෙ- නිරයං තෙ උපපජ්ජරෙ' යන මෙහි 'කාසාවකණ්ඨා'** කසාවතින් වෙළූ බොටුව ඇත්තාහු. අභිඬවජධාරණමාත්‍රය ම මොවුනට ඇත්තේ ය. සෙසු ශ්‍රමණගුණ නැත්තේය යි කියන ලද්දේ වේ. 'හවිස්සන්ති ඛො පන

ආනන්ද අනාගතමද්ධානං ගොත්‍රභූනො කාසාවකණ්ඨා' යි මෙසේ වදළ දුශ්ශීලයන්ට මේ නමෙකි.

'පාපධම්මා' ලාමකස්වභාව ඇත්තා වූ, **'අසඤ්ඤතා'** කායාදියෙන් නො හික්මුනු. **'පාපා'** ලාමකපුද්ගලයෝ. **'පාපෙහි කම්මෙහි'** කරන කාලයෙහි ආදීනව නො දැක කරනලද අන්හු රැවටීම් ආදී වූ ඒ පවිකම්වලින්. **'නිරයං තෙ උපපජ්ජරෙ'** ආස්වාදයක් නැති දුගතියෙහි ඔවුහු උපදිත්. එහෙයින් **'සෙය්‍යො අයොගුලො'** යන ගාථාව වදරණලදී. එහි අර්ථය මෙසේ ය:- ඉදින් දුශ්ශීල වූ සංයමක් නැති ඊර්ෂ්‍යාචාරයෙහි සිටි කුහකකමින් ලොව රවටන මේ පුද්ගල තෙමේ ගිනිසිළක් වැනි ගිනියම් කළ යගුළියක් අනුභව කරන්නේ ද, බුදින්නේ ද, ඔහුගේ යම් මේ රටවැසියා දෙන පිණ්ඩය බුදින්නේ ද, යම් මේ යගුළියක් බුදින්නේ ද, ඒ දෙක අතුරෙහි යගුළිය ම අනුභ කරණ ලද්දේ ශ්‍රෙෂ්ඨ වන්නේ ය. සුන්දරතර ද වන්නේ ය. ප්‍රණීතතර ද වන්නේ ය. යගුළිය තමා අනුභව කළ බැවින් පරලොව සර්වඥතාඥානයෙනුදු නො දත හැකි පිරිසිදීම් ඇති දුකක් නො ම අනුභව කරන්නේ ය. මෙසේ පිළිලද ඒ රාෂ්ට්‍රපිණ්ඩය තමා අනුභව කළ බැවින් පරලොව කී පරිදි වූ දුක් අනුභව කරන්නේ ය. මේ ම කෙළ පැමිණි මිත්‍යාජීවය යි.

මෙසේ පාපක්‍රියාවෙහි ආදීනව නො දක්නවුන්ට ආදීනව දක්වා **'අථ ඛො භගවා වග්ගුමුදාතීරියෙ භික්ඛූ අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය දුප්පොසතාය -පෙ- ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ'** යි වදරා මේ සතරවන පාරාජිකාව පණවන සේක් **'යො පන භික්ඛු අනභිජානං'** යනාදි වදළ සේක. මෙසේ මූලවෙද්‍යවශයෙන් දැඩි කොට සතරවන පාරාජිකය පැණ වූ කල්හි අනිකුදු අනුප්‍රඥප්තිය පිණිස අධිමානවස්තුවක් පහළවූයේ ය. ඒ අනුප්‍රඥප්තියගේ උත්පත්තිය දක්වනු පිණිස **'එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති'** යන මෙය වදරණ ලද්දේ ය.

ඒ අනුප්‍රඥප්තියෙහි **'අදිට්ඨෙ දිට්ඨසඤ්ඤිනො'** රහත්බව, ඥන චක්ෂුසින් නො දක්නාලද කල්හි ම 'අප විසින් රහත් බව දක්නා ලද්දේය'යි දුටුහැඟීම් ඇතිව අප්පත්තා යනාදියෙහි ද මේ නය වේ. මේ වනාහි වෙනස ය:- **'අප්පත්තෙ'** තමන්ගේ සන්තානයෙහි උත්පත්ති වශයෙන් නො පැමිණියෙහි. **'අනධිගතෙ'** මාර්ගභාවනාවෙන් අවබොධ නො කරණ ලද්දෙහි. නො ලබන ලද්දෙහි යන අර්ථයි. **'අසච්ඡිකතෙ'** ප්‍රතිවෙධ නො කරණ ලද්දෙහි. ප්‍රත්‍යවෙක්ෂා වශයෙන් හෝ ප්‍රත්‍යක්ෂ නො කරණ ලද්දෙහි. **'අධිමානෙන'** අධිගතමානයෙන්. 'අපි පැමිණියමිහ'යි මෙසේ

උපන් මානයෙන් යන අර්ථ යි. අධික මානයෙන් හෝ තදමානයෙන් යන අර්ථ යි. **'අඤ්ඤං ව්‍යාකරිංසු'** රහත්බව ප්‍රකාශ කළාහු ය. 'ඇවැත්නි! අප විසින් රහත්බව පැමිණෙන ලද්දේ ය, කළයුත්ත කරණ ලද්දේය'යි භික්ෂූන්ට සැලකළහ. මාඝීයෙන් **ප්‍රහීණ** නො වූ කෙලෙස් ඇති බැවින් හුදෙක් ශමථ විදර්ශනා බලයෙන් යට එබූ කෙලෙස් ඇති ඔවුන්ගේ **'අපරෙන සමයෙන'** අන් කලෙක. එබඳු හෙතුවක යෙදීම ඇති කල්හි **'රාගාය චිත්තං නමති'** රාගයට සිත නැමේ. රාගය පිණිස නැමේ ය යන අර්ථ යි. අන්තන්හි ද මේ නියා ය. **'තඤ්ච බො එතං අකප්පියං'** ඔවුන්ගේ ඒ මේ රහත්බව පැවසීම අව්‍යවහාරික වේ. ඇවැත් පැණවීමෙහි ව්‍යවහාරයට නො යයි. ඇවැතට අඩිගයක් නො වේ යන අර්ථ යි.

කවරක්හට මේ අධිමානය උපදී ද, කවරක්හට නො උපදී ද යත්:- ආර්‍යශ්‍රාවකයාහට වනාහි නො උපදියි. ඒ ආර්‍යශ්‍රාවක තෙමේ වනාහි මාර්ගඵල නිර්‍වාණයෙන් ප්‍රහීණ කළ කෙලෙසුන්ගෙන් ඉතිරි කෙලෙස් ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන් උපන් සොමනස් ඇත්තේ ආර්‍යගුණ ප්‍රතිවෙධයෙහි සැක නැත්තේ ය. එහෙයින් ස්‍රොතාපන්නාදීන්ට 'මම සෙදගැමි වෙමි' යනාදි වශයෙන් අධිමානය නො උපදනේ ය. දුශ්ශීලයාහට ද නො උපදියි. හෙතෙමේ වනාහි ආර්‍යගුණාවබොධයෙහි ආශා නැත්තේ ම ය. හළ කමටහන් ඇති නිද්‍රාරාමතාදියෙහි යෙදුනු සිල්වත්හට ද නො උපදියි. කමටහන් වැඩීමෙහි අප්‍රමත්ත වූ නාමරූප ධර්ම මේ මේය යි තීරණය කොට 'මේ හෙතුව නිසා මේ ඵලය වේය' යි හෙතු පරිග්‍රහයෙන් පහ වූ සැක ඇති කලාප සම්මර්ශනයෙන් තිලකුණට නගා සංස්කාරධර්මයන් සම්මර්ශනය කරන්නා වූ ආරබ්ධවිදර්ශික වූ පිරිසිදු සිල් ඇත්තහුට උපදියි. උපන්නේ ද ශුද්ධශමථලාභී යි හෝ ශුද්ධවිදර්ශනාලාභී යි හෝ අතර වෙනස තබා ලන්නේ ය. හෙතෙමේ වනාහි දස වසක් ද විසි වසක් ද තිස් වසක් ද මුළුල්ලෙහි කෙලෙසුන්ගේ නැගිට හැසිරීමක් නො දක්නේ 'මම සෝවාන් වෙමි, යි හෝ සෙදගැමි වෙමි යි හෝ අනගැමි වෙමි' යි හෝ සලකන්නේ ය. ශමථවිදර්ශනාලාභීහු රහත්බවෙහි ම තබන්නේ ය. ඔහුගේ වනාහි සමාධිබලයෙන් කෙලෙශයෝ යටපත්ව ගියාහු ය. විදර්ශනා බලයෙන් සංස්කාරයෝ මැනැවින පරිග්‍රහණය කරණ ලදහ. එහෙයින් සැට වසක් මුළුල්ලෙහි ද අසූ වසක් මුළුල්ලෙහි ද සිය වසක් මුළුල්ලෙහි ද කෙලෙශයෝ නැගී නො හැසිරෙත්. නැගී නො සිටිත්. සිත්හසර රහත්හුගේ මෙන් වේ. හෙතෙමේ මෙසේ බොහෝ කලක් මුළුල්ලෙහි කෙලෙසුන්ගේ නැගී හැසිරීමක් නො දක්නේ අතර නො සිට ම 'මම රහත්මි'යි සලකයි සිතයි.

'අනිභිඤානං' 'න+අභිඤානං' නොදන්නේ ය. යම්හෙයකින් මෙතෙමේ උත්තරිමනුෂ්‍යධර්මය තමන් කෙරෙහි ඇති බව නොදන්නේ 'මට මේ ධර්මය ඇතැ'යි කියා ද, දන්වීම හෝ කෙරේ ද, ඒ ධර්මය මොහුගේ සන්තානයෙහි නොඋපන්නේ ය. තුවණින් ද සාක්ෂාත් නොකරණ ලද්දේ ය. නොවූයේ වේ ය. එහෙයින් මෙහි පදභාජනයෙහි **'අසන්තං අභූතං අසංවිජ්ජමානං'** යි වදරා **'අජානන්තෝ අපස්සන්තෝ'** යනු වදරණ ලද්දේ ය. **'උත්තරිමනුස්සධම්මං'** උත්තම මනුෂ්‍ය වූ ධ්‍යානලාභීන්ගේ ද, ආර්‍යයන්ගේ ද ධර්මය ය. **'අත්තූපනායිකං'** තමන් කෙරෙහි ඒ උත්තරිමනුෂ්‍යධර්මය එළවානු යි හෝ තමන් හෝ ඒ උත්තරිමනුෂ්‍යධර්මය කෙරෙහි එළවා නු යි අත්තූපනායික නම් වේ. ඒ අත්තූපනායික ය මෙසේ කොට දන්වන්නේ ය යනු හා සම්බන්ධ වේ. පදභාජනයෙහි වනාහි යම්හෙයකින් **'උත්තරිමනුස්සධම්මෝ නාම ඣානවිමොක්ඛසමාධිසමාපත්ති ඤාණදස්සනං -පෙ- සුඤ්ඤාගාරෙ අභිරති'** මෙසේ ධ්‍යානාදී වූ නොයෙක් ධර්මයෝ වදරණ ලද්දහු ද, එහෙයින් ඒ සියලු ධර්මයන්ගේ වසයෙන් අත්තූපනායික භාවය දක්වන සේක් 'තෙ වා කුසලෙ ධම්මෙ අත්තනි උපනෙති'යි බහුවචනයෙන් දක්වීම කළ සේක. එහි 'මේ ධර්මයෝ මා කෙරෙහි ඇත්තාහ'යි කියමින් ඒ ධර්ම තමන් කෙරෙහි එළවයි. 'මම ඒ ධර්මයන් කෙරෙහි දක්නෙමි' යි කියමින් තමන් ඒ ධර්මයන් කෙරෙහි එළවා නු යි දතයුතු ය.

'අලමරියඤාණදස්සනං' මෙහි ලෞකිකලොකොත්තර ප්‍රඥා තොමෝ ප්‍රකාරයෙන් දන්නා අර්ථයෙන් ඤාණ නම්. ධර්මය ඇසින් දුටුවක් මෙන් කරණ හෙයින් දර්‍ශනාර්ථයෙන් දස්සනනු යි ඤාණදස්සන නම්. ආර්‍ය්‍ය වූ පිරිසිදු වූ උතුම් වූ ඤාණදස්සන නු යි අරියඤාණදස්සන නම්. කෙලෙස් නැසීමෙහි සමර්ථ වූ ප්‍රමාණවත් වූ අරියඤාණදස්සනය මෙහි ධ්‍යානාදිප්‍රභෙද ඇති උත්තරිමනුෂ්‍යධර්මයෙහි සමර්ථ වූ හෝ අරියඤාණදස්සනය මොහුට නු යි අලමරියඤාණදස්සන නම්. ඒ ආර්‍යඥානදර්‍ශනයට සමර්ථ වූ උත්තරිමනුෂ්‍යධර්මය යි. මෙසේ පදභාජනසම්බන්ධය දතයුත්තේ ය. එහි යම් ඥානදර්‍ශනයකින් හෙතෙමේ අලමරියඤාණ දස්සන යි කියනු ලැබේ ද, එය ම දක්වන්නට 'ඤාණං' යනු ත්‍රිවිද්‍යා ය. 'දස්සනං' යනු යම් ඥානයෙක් වේ ද, ඒ දස්සන ය. යම් දස්සනයෙක් වේ ද, ඒ ඤාණ යි. විද්‍යාශීර්ෂයෙන් පදභාජනය වදරණලද්දේ ය. මෙහි සියලු මහද්ගත ලොකොත්තර ප්‍රඥාවෝ ඤාණ යි දතයුතු ය. **'සමුදාචරෙය්‍ය'** උක්තප්‍රකාර වූ මේ උත්තරිමනුෂ්‍යධර්මය අත්තූපනායික කොට සැලකරන්නේ ය. **'ඉත්ථියා වා'** යනාදිය වනාහි සැළ කළ යුතු වූ පුද්ගලයන් දක්වීම ය. මොවුන්ට සැළකළ කල්හි සැළකරණ ලද්දේ වේ. දෙව මාර බ්‍රහ්මයන්ට සැළ කළ

කල්හි සැලකරණු ලද්දේ නො වේ. ප්‍රේත යක්ෂ තිරශ්චීගතයන්ට සැළ කළ කල්හි සැළකරණු ලද්දේ නො වේ. **'ඉති ජානාමි, ඉති පස්සාමි'** යන මෙය, එය කියා පෑමෙහි ආකාර දක්වීම ය. මෙහි පදභාජනයෙහි **'ජානාමහං එතෙ ධම්මෙ, පස්සාමහං එතෙ ධම්මෙ'** යන මෙය ඒ ධ්‍යානාදී වූ ධර්මයන්හි දැනීම් දැකීම් පිළිබඳ පැවැතුම් දක්වීම ය. **'අත්ථි ච මෙ එතෙ ධම්මා'** යනාදිය අත්තූපනායිකභාවය දැක්වීම ය. **'තතො අපරෙන සමයෙන'** යනු ඇවැත් පිළිදන්වන කාලය දක්වීම ය. මෙතෙමේ වනාහි දැන්වීම කළ කෙණෙහි ම පාරාජිකයට පැමිණේ. ඇවැතට පැමිණියේ වනාහි යම්හෙයකින් අන්‍යු විසින් චොදනා කරණු ලද්දේ හෝ චොදනා නො කරණු ලද්දේ හෝ පිළිදන්වා ද, එහෙයින් **'සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා'** යි වදරණු ලද්දේ ය.

එහි විචාරණු ලබන්නහු කෙරෙහි වනාහි පළමු කොට **'කිං තෙ අධිගතං'** යනු අධිගමය විචාරීම ය. ධ්‍යානවිමොක්ෂාදීන් අතුරෙහි හෝ ස්‍රොතාපත්ති මාර්ගාදීන් අතුරෙහි හෝ තා විසින් කුමක් අවබොධ කරණු ලද්දේ ද, යනු යි. **'කිනත්ති තෙ අධිගතං'** යනු උපායය විචාරීම ය. මේ වනාහි මෙහි අදහස වන්නේ ය:- 'කිම? තා විසින් අනිත්‍යලක්ෂණය ධුර කොට අවබොධ කරණු ලද්දේ ද? දුඃඛ අනාත්ම ලක්ෂණයන් අතුරෙහි එක්තරා එකක් හෝ ධුර කොට අවබොධ කරන ලද්දේ ද? කිම? සමාධිවසයෙන් පිවිස හෝ අවබොධ කරණු ලද්දේ ද? නොහොත් විදර්ශනා වශයෙන් පිවිස අවබොධ කරණු ලද්දේ ද? කිම? එසේ රූපයෙහි පිවිස නොහොත් බාහිරාත්මයෙහි පිවිස අවබොධ කරණු ලද්දේ ද? **'කදා තෙ අධිගතං'** යනු කාලය විචාරීම ය. පූර්වාහ්ණ මධ්‍යාහ්න කාලාදීන් අතුරෙහි කවර කලෙක දැ යි කියන ලද්දේය. **'කත්ථ තෙ අධිගතං'** යනු අවකාශය විචාරීම ය. කිනම් අවකාශයෙක්හි, කිම? රථතන්හි, දිවාතන්හි, රුක්මුලෙක්හි, මණ්ඩපයෙක්හි, කවර විහාරයෙක්හි හෝ යි කියන ලද්දේ වේ. **'කතමෙ තෙ කිලෙසා පහීණා'** යනු පැහැ කෙලෙස් විචාරීම ය. කවර මාර්ගයකින් නැසිය යුතු වූ තාගේ කෙලෙසයෝ ප්‍රහීණ වූවාහු ද යි කියන ලද්දේ වේ. **'කතමෙසං ත්වං ධම්මානං ලාභී'** යනු පිළිලද දහම් පළිබඳ විචාරීම ය. තෝ ප්‍රථම මාර්ගාදීන් අතුරෙහි කවර ධර්ම කෙනකුන් ලාභී දැ යි කියන ලද්දේ වේ.

එහෙයින් දතුදු කිසි මහණෙක් තෙමේ උත්තරිමනුෂ්‍යධර්මාවබොධයක් ප්‍රකාශ කරන්නේ නම් හෙතෙමේ මෙපමණකින් ම සත්කාර නො කටයුත්තේ ය. මේ සතැන පිරිසිදු කරගණු පිණිස 'තා විසින් කුමක් අවබොධ කරණ ලද ද, කිම? ධ්‍යානයක් අවබොධ කරණ ලද ද: නොහොත් විමොක්ෂාදීන් අතුරෙහි එක්තරා එකක් අවබොධ කරණ ලද දැ යි

කියයුතු ය. යමකු විසින් යම් ධර්මයක් අවබොධ කරණු ලද්දේ ද, ඒ ධර්මය ඔහුට ප්‍රකට වේ. ඉදින් 'මෙ නම් ධර්මය මා විසින් අවබොධ කරණු ලද ' යි කියා නම්, ඉක්බිති 'කවර අයුරකින් අවබොධ කරණු ලද ද' අනිත්‍යාදිලක්ෂණාදීන් අතුරෙහි කුමක් ධුර කොට අටතිස් අරමුණු අතුරෙහි හෝ, රූපාරූප ආධ්‍යාත්මික බාහිරාදිප්‍රභෙද වූ ධර්ම අතුරෙහි හෝ කවර කරුණකින් පිවිස ද යි විචාළ යුතු ය. යමක්හට යමෙක අභිනිවෙශයක් වේ ද, ඒ අභිනිවෙශය ඔහුට ප්‍රකට වේ. ඉදින් මේ නම් මාගේ අභිනිවෙශය ය, මා විසින් මෙසේ අවබොධ කරණුලද යි කියා නම්, ඉන් පසු 'කවර කලෙක තා විසින් අවබොධ කරණුලද ද' කිම? පෙරවරු කාලයෙහි නොහොත් මැදිදවල් ආදීන් අතුරෙහි එක්තරා කාලයෙක ද යි විචාළ යුතු ය. සියල්ලන්ට වනාහි තමන් අවබොධ කළ කාලය ප්‍රකට වේ. ඉදින් 'අසුවල් කාලයෙහි අවබොධ කරණුලද' යි කියා නම්, ඉන්පසු 'කොතැනක දී තා විසින් අවබොධ කරණුලද ද, කිම? දිවා තන්හි නොහොත් රෑ තැන් ආදීන් අතුරෙහි එක්තරා අවකාශයෙක්හි ද' යි විචාළ යුතු ය. සියල්ලන්ට වනාහි තමන් අවබොධ කළ අවකාශය ප්‍රකට වේ. ඉදින් අසුවල් නම් අවකාශයෙහි දී අවබොධ කරණුලද යි කියා නම්, ඉන් පසු 'තා විසින් කවර නම් කෙලශයෝ ප්‍රහීණ කරණුලද්දහු ද? කිම? ප්‍රථමමාර්ගයෙන් නැසිය යුත්තාහු ද? නොහොත් ද්වීතියාදිමාර්ගයෙන් නැසිය යුත්තාහු ද යි විචාළ යුතු ය. සියයල්ලන්ට වනාහි තමන් අවබොධ කළ මාර්ගයෙන් ප්‍රහීණ කෙලශයෝ ප්‍රකට වෙත්. ඉදින් 'මා විසින් මෙනම් කෙලශයෝ ප්‍රහීණ කරණු ලදහ'යි කියා නම්, ඉන්පසු 'තෝ කවර ධර්ලාභීවෙහි ද? කිම? ස්‍රොතාපත්තිමාර්ගය නොහොත් සකෘදගාමී මාර්ගාදීන් අතුරෙහි එක්තරා එකක් ලාභී වෙහි ද' යි විචාළ යුතු ය. සියල්ලන්ට වනාහි තමන් අවබොධ කළ ධර්මය ප්‍රකට වේ. මම මෙනම් ධර්ලාභී වෙමි යි කියා නම්, මෙපමණකිනුදු මොහුගේ වචනය නො ඇදහිය යුතු ය.

බහුශ්‍රැත වූ සජ්ඣායනාමාර්ගී වණ්ණනාවන්හි දක්ෂ වූ භික්ෂූහු මේ සකරුණු පිරිසිදු කොට කියාපාන්නට සමර්ථ වෙති. මේ මහණහුගේ යම් ප්‍රතිපත්තියක් යමක්හට ආර්‍යමාර්ගය පැමිණේ ද, ඒ පූර්භාග ප්‍රතිපත්තිසඞ්ඛ්‍යාත ආගමන ප්‍රතිපද තොමෝ ශුද්ධ ද, අශුද්ධ ද යි විචාරීම් වසයෙන් ශුද්ධ කටයුතු ය. ඉදින් ආගමන ප්‍රතිපද තොමෝ පිරිසිදු නො වේ ද, මේ ප්‍රතිපදවෙන් ලොකොත්තර ධර්මය නම් නො ලැබෙය යි බැහැර කළයුතු ය. ඉදින් වනාහි මොහුගේ ආගමන ප්‍රතිපද තොමෝ පිරිසිදු වේ ද, බොහෝ කලක් මුළුල්ලෙහි ත්‍රිවිධ ශික්ෂාවන්හි අප්‍රමත්ත වූයේ නිදිවැරීමෙහි යෙදුනේ සිවුපසයෙහි නො ලැගුනේ අහසෙහි

අත්ල සමාන වූ සිතින් යුක්තව වාසය කෙරේය යි පැණේ ද, ඒ මහණහුගේ විවරණය ප්‍රකාශය ප්‍රතිපදව හා සැසඳෙන්නේ ය. ගඞ්ගා නදී ජලය යමුනා නදී ජලය හා යම් සේ සැසඳේ ද සමවේ ද, එපරිද්දෙන් ම ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට නිර්‍වාණ ගාමිණී ප්‍රතිපදතොමෝ මැනැවින් පණවන ලද්දී ය. නිර්‍වාණය ද ප්‍රතිපදව ද සැසඳේය යි සූත්‍රයෙහි කියන ලද්ද හා සමාන වේ. එහෙත් මෙපමණකිනුදු සත්කාර නො කටයුතු ය. කවර හෙයින යත්: ඇතැම් පෘථග්ජනයක්හුගේ ද ප්‍රතිපදතොමෝ රහතුන්ගේ ප්‍රතිපදව සමාන වේ ද එහෙයින් ඒ මහණ තෙමේ ඒ ඒ උපායයන්ගෙන් තැතිගැන්විය යුතු ය. රහතුන් වහන්සේට වනාහි හෙණක් නමුදු මුදුනෙහි වැටෙන කල්හිදු බියක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදහැගැන්මෙක් හෝ නො වේ. ඉදින් මොහුට බියක් හෝ තැතිගැන්මක් හෝ ලොමුදහගැන්මක් හෝ උපදී ද, එහෙයින් 'තෝ රහත් නො වෙහි' යි බැහැර කළ යුතු ය. ඉදින් වනාහි නො බියව වෙවුලීම් නැතිව තැති ගැණුම් නැතිව සිංහයකු මෙන් හිඳී ද, එසේ ඇති කල්හි මේ මහණ තෙමේ සුදුසු පැවසීම් ඇත්තේ වේ. හාත්පසින් රාජරාජමහාමාත්‍යාදීන් විසින් එවනලද සත්කාරයට සුදුසු වේ.

'පාපිච්ඡා' මේ ශාසනයෙහි ඇතැම් එකෙක් දුශ්ශීල වූයේ මා සිල්වත් යි ජනතෙමේ දැන ගණිවා යි කැමති වේය යනාදි නයින් යම් ඒ ලාමක ඊපසාවක් වදරණලද්දී ද, ඒ පාපෙච්ඡාවෙන් යුක්ත වූයේ ය. **'ඉච්ඡාපකතො'** ඒ ලාමක ඊපසාවෙන් සම්‍යක් ආජීවයෙන් පහකරන ලද්දේ මඩනා ලද්දේ පැරදුනෙක්ව **'විසුද්ධාපෙක්ඛො'** තමන් ගේ පිරිසිදුබව බලාපොරොත්තුවනුයේ කැමැතිවනුයේ පතනුයේය. යම්හෙයකින් මෙතෙමේ පාරාජිකයට පැමිණියේ ද, එහෙයින් භික්ෂුභාවයෙහි සිට ධ්‍යානාදීන් ලබන්නට සුදුසු නො වේ. මොහුගේ භික්ෂුභාවය තෙමේ ඝඨීයට හා මාඝීයට අන්තරායයෙක් වේ. 'ශ්‍රමණභාවය ඛණ්ඩසීලතාදියෙන් පහස්නා ලද්දේ නිරයෙහි උපදවා, මෙය වදරණ ලද්දේ ම ය. 'ලිහිල්ව ගත් ඛණ්ඩාදිභාවයට ගිය පැවිද්ද බෙහෙවින් රජස් වගුරුවා' යි අනෙකෙක් ද වදරණලද්දේ ය. මේ ආකාර වූ මොහුගේ භික්ෂුභාවය තෙමේ පිරිසිදු නම් නො වේ. යම්හෙයකින් වනාහි ගිහියෙක්ව හෝ උපාසකයෙක්ව හෝ ආරාමිකයෙක්ව හෝ සාමණේරයෙක්ව හෝ දන සරණසීලසංවරාදියෙන් ඝඨීමාඝීය හෝ ධ්‍යානවිමොක්ෂාදියෙන් මොක්ෂමාඝීය හෝ සිද්ධකරන්නට සුදුසු වේ ද, එහෙයින් මොහුගේ ගිහිආදිභාවය විශුද්ධියට කරුණු වන බැවින් පිරිසිදු වූයේ නම් වේ. එහෙයින් ඒ විශුද්ධිය බලාපොරොත්තු වන බැවින් විසුද්ධාපෙක්ඛ යි කියනු ලැබේ. එහෙයින් ම මෙහි පදභාජනයෙහි **'ගිහී වා හොතුකාමො'**

යනාදිය වදරණ ලද්දේ ය. **'එවං වදෙය්‍ය'** මෙසේ කියන්නේ ය. කෙසේ ද යත්:- **'අජානමෙවං ආවුසො අවච‍ං ජානාමි, අපස්‍සං පස්‍සාමි'** යි පදභාජනයෙහි වනාහි. **'එවං වදෙය්‍ය'** යන මේ පදය නො උදුරා ම, යම්සේ කියන්නේ 'ඇවැත්නි! මෙසේ නො දන්නේ ම දනිමි, නො දක්නේ දකිමි යි කීමි' යි කියා නම් වේය' යි කියනු ලැබේ. ඒ ආකාරය දක්වන්නට **'නාහං එතෙ ධම්මෙ ජානාමි'** යනාදිය වදරණ ලද්දේ ය. **'තුච්ඡං මුසා විලපිං'** 'මම වචනාර්ථයෙන් වෙන් වූ හිස් වූ රැවටීමෙහි අදහසින් බොරු කීමි, මම බිණුවෙමි' යි වදරණ ලද්දේ වේ. පදභාජනයෙහි වනාහි මෙයට අන්‍යපදබ්‍යඤ්ජනයකින් අර්ථමාත්‍රයක් දක්වන්නට **'තුච්ඡකං මයා භණිතං'** යනාදිය වදරණ ලදී. **'පුරිමෙ උපාදය'** පළමු තුන් පාරාජිකයන්ට පැමිණි පුද්ගලයන් පටන් සෙස්ස පෙර කියූ නය ඇති බැවින් ද, ප්‍රකට අර්ථ ඇති බැවින් ද ප්‍රකට ම ය.

මෙසේ උදෙසනලද ශික්‍ෂාපදය පදපිළිවෙළින් විභාග කොට දැන් යම්හෙයකින් යට කියූ පදභාජනයෙහි **'ඣානං විමොක්ඛං සමාධි සමාපත්ති සුඤ්ඤතං -පෙ- සුඤ්ඤාගාරෙ අභිරති'** යි මෙසේ සැකෙවින් ම උත්තරිමනුෂ්‍යධර්ම්‍ය දක්වන ලද්දේ ය. විස්තර වශයෙන් නො දක්වන ලද්දේ ය. ඇවැතට නගා පාළිය තබන ලද්දී ය. අර්ථය සැකෙවින් දක්වූ කල්හි ද සියල්ලෝ හැමතින් නයක්‍රම ගන්නට අසමර්ථ වෙත්. එහෙයින් හැමතින් නයක්‍රම ගැනීම පිණිස නැවත ඒ පදභාජනය ම මාතෘකාස්ථානයෙහි තබා විස්තර වශයෙන් උත්තරිමනුෂ්‍ය ධර්ම්‍ය දක්වා ආපත්තිභෙදය දක්වනු කැමැති සේක් **'ඣානන්ති පඨමං ඣානං දුතියං ඣානං'** යනාදිය වදළ සේක.

එහි ප්‍රථමධ්‍යානාදියෙන් මෛත්‍රීධ්‍යානාදීහු ද, අශුභධ්‍යානාදීහු ද, ආනාපානස්මෘතිසමාධිධ්‍යානය ද, ලෞකිකධ්‍යානය ද, ලොකොත්තර ධ්‍යානය ද සඞ්ග්‍රහ කරන ලද්දේ ම ය. එහෙයින් 'ප්‍රථමධ්‍යානයට පැමිණියෙමි' යි ද -පෙ- චතුර්ථධ්‍යානයට - මෛත්‍රීධ්‍යානයට - උපෙක්ෂාධ්‍යානයට - අශුභධ්‍යානයට - ආනාපානස්මෘති-සමාධිධ්‍යානයට - ලෞකිකධ්‍යානයට - ලොකොත්තරධ්‍යානයට පැමිණියෙමි' යි ද කියන්නේ පාරාජික ම වේය යි දතයුතු ය. මැනැවින් මිදුනේ හෝ නන්වැදරුම් කෙලෙසුන්ගෙන් මිදුනේ නු යි හෝ **විමොක්ඛ** නම් වේ. ඒ මේ විමොක්ෂය වනාහි රාග දෙවිෂ මොහයන්ගෙන් ශූන්‍ය බැවින් **සුඤ්ඤත,** රාග දෙවිෂ මොහ නිමිත්තයන්ගෙන් නිමිත්ත රහිත බැවින් **අනිමිත්ත,** රාග දෙවිෂ මොහ ප්‍රාර්ථනාවන්ගේ අභාවයෙන් **අප්පණිහිත,** යි කියනු ලැබේ. සිත සමව අරමුණෙහි පිහිටුවා නු යි

තබානුයි **සමාධි** නම්. ආර්‍යයන් විසින් මනා කොට සමවැදිය යුතු බැවින් **සමාපත්ති** නම. මෙහි යෙස්ස කියූ නය ඇත්තේ ම ය.

මෙහි ද ශූන්‍යතාදිවිමොක්ෂත්‍රිකයෙන් ද, සමාධිත්‍රිකයෙන් ද ආර්‍ය්‍ය මාර්‍ගය ම වදරණ ලද්දේ ය. සමාපත්තිත්‍රිකයෙන් ඵලසමාපත්ති තොමෝ දක්වන ලද්දී ය. ඔවුනතුරෙහි යම්කිසි එක් පදයකුදු ගෙණ'මම මේ ධර්‍මය ලැබීම්' යි කියනුයේ පාරාජික ම වේ. **'තිසෙසා විජ්ජා'** යනු පූර්‍වේනිවාසානුස්මෘති, දිව්‍යචක්ෂුස්, ආස්‍රවක්ෂයඥන යන තිදෙනය. එහි එක් විද්‍යාවකගේ ද නම ගෙණ 'මම මේ විද්‍යාව ලැබීම්' යි කියනුයේ පාරාජික වේ. සඩෙක්ෂපාඨී කථාවෙහි වනාහි විද්‍යාවන් ලැබුයේ වෙමි යි කියනුයේ ද 'ත්‍රිවිද්‍යාවන් ලැබුයේ වෙමි' යි කියනුයේ ද පාරාජිකමය යි කියන ලද්දේ ය. මාර්‍ගභාවනා පදභාජනයෙහි කියනලද සප්තත්‍රිංශත් බොධිපාක්ෂික ධර්‍මයෝ මාර්‍ගසම්ප්‍රයුක්ත වූවාහු ලොකොත්තර ම වූවාහුයි මෙහි අදහස් කරණ ලදහ. එහෙයින් ලොකොත්තර ම වූවාහුයි මෙහි අදහස් කරණ ලදහ. එහෙයින් ලොකොත්තර සතිපට්ඨාන, සම්මප්පධාන, ඉද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්‍ගය ලැබුයේ වෙමි යි කියන්නහුට පාරාජිකය යි **මහාඅට්ඨකථාවෙහි** කියනලදී. **මහාපච්චරි** ආදියෙහි 'සතිපට්ඨානයන් ලැබූයේ වෙමි' යි මෙසේ එක් එක් කොටස වසයෙන් ද, 'කායානුපස්සනා සතිපට්ඨානය ලැබුයේ වෙමි'යි එක් එක් ධර්‍මයාගේ වසයෙන් ද ගෙණ කියන්නහුට පාරාජිකය මැ යි කියනලදී. එ ද සම වේ. කුමක් හෙයින් ද යත්:- මාර්‍ගක්ෂණයෙහි උපන් ධර්‍මයන් සඳහා කියූ බැවිනි. ඵල ප්‍රත්‍යක්ෂ කිරීමෙහි ද එක් එක් ඵලයක්හුගේ වසයෙන් පාරාජිකය දතයුතු ය. **'රාගස්ස පහාණං'** යනාදි ත්‍රිකයෙහි කෙලෙස්ප්‍රහාණයම වදරණ ලදී. යම්හෙයකින් ඒ ප්‍රහාණය ද මාර්‍ගයෙන් වෙන්ව නො වේ ද, තෘතීය මාර්‍ගයෙන් රාගදෝෂයන්ගේ ප්‍රහාණය හා චතුර්‍ථමාර්‍ගයෙන් මොහයාගේ ප්‍රහාණය වේ ද, එහෙයින් 'මාගේ රාගය ප්‍රහීණ වූයේ ය' යනාදිය කියන්නහුට ද පාරාජිකය කියනලදී. **'රාගා චිත්තං විනීවරණතා'** යනාදි ත්‍රිකයෙහි ලොකොත්තර චිත්තය ම කියනලදී. එහෙයින් 'මාගේ සිත රාගයෙන් පහවූයේ ය' යනාදිය කියන්නහුට ද පාරාජිකය ම වේ.

ශූන්‍යාගාරපදභාජනයෙහි වනාහි යම්හෙයකින් ධ්‍යානය හා නො ගටා 'ශූන්‍යාගාරයෙහි ඇලෙමි' යන වචන මාත්‍රයෙන් පාරාජිකය අදහස් නො කරණ ලද්දේ ද, එහෙයින් **'පඨමෙන ඣානෙන සුඤ්ඤාගාරෙ අභිරති'** යනාදිය වදරණ ලද්දේ ය. එහෙයින් යම් මහණෙක් ධ්‍යානය සමග ගටා 'මෙ නම් ධ්‍යානයෙන් ශූන්‍යාගාරයෙහි ඇලෙමි' යි කියා

නම්, මෙතෙමේ ම පාරාජික වේය'යි දත යුතු ය. **'යාවඤ්ඤං'** යන මේ පදය පිළිබඳ පදභාජනයෙහි අම්බට්ඨසූත්‍රාදීන්හි කියූ අෂ්ටවිද්‍යාවන්හි විපස්සනාඤ්ඤ, මනොමයිද්ධි, ඉද්ධිවිධ, දිබ්බසොත, චෙතොපරියඤ්ඤ වසයෙන් භෙද වූ පස්වැදෑරුම් විද්‍යාවෝ නො ආවාහු ද, ඔවුන් අතුරෙහි එක් ම විදර්‍ශනාව පාරාජිකයට වස්තු නො වේ. සෙස්සෝ පාරාජිකයට වස්තු වෙත්යයි දතයුතු ය. එහෙයින් 'විදර්‍ශනාව ලැබුයේ වෙම් යි ද, විදර්‍ශනා ඥනය ලැබුයේ වෙම්' යි ද, කියන්නහුට පාරාජිකයක් නැත්තේ ය.

ඵුස්සදෙව සථවිරයන් වහන්සේ වනාහි 'අන්‍ය වූ ද සිවුවැදරුම් වූ විද්‍යාවෝ ඥනය සමග නො ගැවුනාහු පාරාජික වස්තු නො වෙත්. එහෙයින් මනොමයඍද්ධිය ලැබුයේ වෙම්, ඍද්ධිවිධඥනය - දිව්‍ය ශ්‍රොත්‍රඥනය - චෙතොපරියඥනය - ලැබුයේ වෙම්'යි කියන්නහුට ද පාරාජිකය නැතැ යි කියත්. එය උන්වහන්සේගේ අතවැසියන් විසින් ම ප්‍රතික්‍ෂෙප කරණ ලද්දේ ය. 'ආචාර්‍යයන් වහන්සේ ආභිධර්මික නො වෙත්. එහෙයින් භූම්විශෙෂය නො දනිත්. අභිඥව වනාහි චතුර්ථධ්‍යානය පාදක කොට සිටියා වූ ම මහද්ගතධර්මයෙකි, ධ්‍යානය සමග ම සමෘද්ධ වේ. එහෙයින් **'මනොමයස්ස ලාභීම්හි'** යි හෝ, **'මනොමයඤ්ඤස්ස ලාභීම්හි'** යි හෝ යම් ඒ ලෙසකින් කියාවා, පාරාජිකය ම වේ යි ප්‍රතික්‍ෂෙප කරණ ලද්දේ ය. මෙහි නිවණ කිසිසේත් පෙළෙහි නො ආයේ ය. එහෙත් 'මා නිවණට පැමිණෙන ලදැ' යි කියා හෝ, මා විසින් නිවණ සාක්‍ෂාත් කරණ ලදැ' යි කියා හෝ කියන්නහුට පාරාජිකය ම වේ. කුමක් හෙයින් ද යත්:- නිවණ තමා උපදවන ලද ලොකොත්තර ගුණය ඇති බැවිනි. එසේ ම 'චතුස්සත්‍යයන් අවබොධ කෙළෙමි, මා විසින් ප්‍රතිවෙධ කරණ ලද්දහුය'යි කියන්නහුට ද පාරාජිකය ම වේ. කුමක් හෙයින් ද යත්:- යම්හෙයකින් සත්‍යප්‍රතිවෙධය වනාහි මාර්‍ගයට පර්‍යාය වචනයක් වේ ද, එහෙයිනි. යම් හෙයකින් වනාහි ත්‍රිවිධ ප්‍රතිසම්භිදාවෝ කාමාවචර කුසලයන් අතුරෙන් චතුර්විධඥන සම්ප්‍රයුක්ත චිත්තෙත්පාදයන්හි උපදින් ද, ක්‍රියාචිත්තයන් අතුරෙන් චතුර්විධ ඥනසම්ප්‍රයුක්ත චිත්තෙත්පාදයන්හි උපදින් ද, අර්‍ථප්‍රතිසම්භිද තොමෝ මොවුන් අතුරෙහි ද චතුර්විධ මාර්‍ගයන්හි ද චතුර්විධ ඵලයන්හි ද උපදීය යි විභඩගයෙහි කියනලද ද, එහෙයින් 'ධම්ප්‍රතිසම්භිදව ලැබුයේ වෙම්'යි හෝ නිරුක්ති -පෙ- ප්‍රතිභාන ප්‍රතිසම්භිදව ලැබුයේ මේ යි හෝ ලොකීය අර්‍ථප්‍රතිසම්භිදව ලාභී වූයෙම් යි හෝ කියූ කල්හි ද පාරාජිකයෙක් නැත්තේ ය. ප්‍රතිසම්භිද ලාභී වූයෙම් යි කියූ කල්හි ද පාරාජිකයෙක් නැත්තේ ය. ප්‍රතිසම්භිද ලාභී වූයෙම් යි කියූ කල්හි ද ඒ තාක් කෙලවරට

නො බසියි. ලොකොත්තර අත්ථිප්‍රතිසමහිදව ලාභී වූයෙමි'යි කියූ කල්හි පාරාජිකය වේ.

සඞ්ඝභේදපාත්‍රිකථාවෙහි වනාහි අත්ථිප්‍රතිසමහිදව පැමිණියේ වෙමි'යි විශෙෂයක් නො තබා ද කියන්නහුට පාරාජිකය කියන ලද්දේ ය. **කුරුන්දියෙහි** ද නො මිදේය යි කියනලදී. **මහාඅත්ථකථාවෙහි** 'මෙපමණකින් පාරාජිකයක් නැත්තේ ය. මෙපමණකින් කෙළවරට නො බස්නේ ය, මෙපමණකින් පාරාජිකයක් නො වේ ය' යි විචාරණය කළ බැවින් අනිකක් ප්‍රමාණ කරන්නට නො හැක්කේ ය' යි කියන ලදී. 'නිරොධ සමාපත්තියට සමවදිමි'යි හෝ 'මම එය ලැබුයේ වෙමි' යි හෝ කියන්නහුට ද පාරාජිකයක් නැත්තේ ය. කුමක් හෙයින් ද යත්:- නිරොධසමාපත්තිය තමා ලෞකික ද නො වන බැවිනි. ලොකොත්තර ද නො වන බැවිනි. ඉදින් මොහුට අනාගාමියෙක් හෝ ක්‍ෂීණාස්‍රවයෙක් හෝ නිරොධයට සමවදියි, ඔවුනතුරෙහි මා අන්‍යතරයෙකැ යි දැනගන්නාහ යි ප්‍රකාශ කෙරේය යි මෙබඳු අදහසක් වේ නම්, හෙතෙමේ ද 'ඔහු එසේය' යි දැනගණී ද පාරාජිකය යි **මහාපච්චරි - සඞ්ඝභේදපාත්‍රිකථාවන්හි** කියනලදී. එය විමසා ගතයුතු ය. අතීතභවයෙහි කාශ්‍යප සම්‍යක්සම්බුද්ධයන් වහන්සේගේ කාලයෙහි සෝවන් වීම් යි කියන්නහුට ද පාරාජිකයක් නැත්තේ ය. අතීතස්කන්ධයන් පරාමර්ශනය කළ බැවින් කෙළවරට නොබස්නේය. **සඞ්ඝභේදපාත්‍රිකථාවෙහි** වනාහි අතීතයෙහි අෂ්ට සමාපත්තිලාභී වෙමි' යි කියන්නහුට කොප්‍යධම් නැති බැවින් පාරාජිකය නැත්තේය. මෙහි වනාහි කොපධම් නැති බැවින් පරාජිකය ඇත්තේය. ඇතැම් කෙනකුන් කියති යි කියනලදී. එහි ද එය අතීතාත්මභාවය සඳහා කියන්නහුට පාරාජිකයක් නො වේ. වර්තමානාත්මභාවය සඳහා කියන්නහුට ම වේය යි ප්‍රතික්‍ෂෙප කරණලදී.

මෙසේ ධ්‍යානාදී වූ දශමාතෘකාපදයන් විස්තර කොට දැන් උත්තරි මනුෂ්‍යධර්ම පවසනුයේ යම් සම්පජානමුසාවාදයක් කියා ද, ඒ සම්පජාන මුසාවාදයෙහි අඞ්ග දක්වා ඔහුගේ ම විස්තර වශයෙන් වක්‍රපෙය්‍යාලය බඳින සේක් 'සමාපජ්ජති' යනාදීන් කියන ආකාරය ද ආපත්තිභෙදය ද දක්වන්නට **'නිහාකාරෙහි'** යනාදිය වදළසේක. එහි සුද්ධිකවාර - වත්තුකාමවාර - පච්චයපටිසංයුත්තවාර යි මහාවාර තුණක් වේ. ඔවුනතුරෙහි සුද්ධිකවාරයෙහි ප්‍රථමධ්‍යානය ආදිකොට **'මොහා චිත්තං විනීවරණපදං'** යනු යම්තාක් ද ඒ තාක් එක් එක් පදයෙහි 'සමාපජ්ජිං, සමාපජ්ජාමි, සමාපන්නො, ලාභිම්හි, වසිම්හි, සවජිකතං මයා' යන මේ සපදයෙහි එක් එක් පදයක් තුන් අයුරකින් සිවු අයුරකින් පස් අයුරකින් සයයුරකින් සත් අයුරකින් යි මෙසේ පස්වරක් යොද සුද්ධිකනයය

වදරණ ලද්දේ ය. ඉක්බිති 'පඨමඤ්ඣ ඣානං, දුතියඤ්ඣ ඣානං'යි මෙසේ ප්‍රථමධ්‍යානය සමග එක් එක් පදය ගළපන්නහු විසින් සියලු පද ගළපා ඒ විස්තරයෙන් ම ඛණ්ඩ චක්‍රය වදරණ ලද්දේ ය. නැවත එය ගෙණ අවුත් ප්‍රථමධ්‍යානාදිය සමග නො යොදන ලද්දේ ය. එහෙයින් ඛණ්ඩචක්‍ර යි කියනු ලැබේ.

ඉක්බිති 'දුතියඤ්ඣ ඣානං, තතියඤ්ඣ ඣානං' යි මෙසේ ද්විතීය ධ්‍යානය සමග එක් එක් පදය ගළපා නැවත ගෙණ අවුත් ප්‍රථම ධ්‍යානය සමග සම්බන්ධ කොට ඒ විස්තාරයෙන් ම බද්ධචක්‍ර නමැ යි වදරණ ලදී. ඉක්බිති ද්විතීයධ්‍යානය සමග යම්සේ ද, මෙසේ තෘතීය ධ්‍යානාදිය සමග එක් එක් පදය ගළපා නැවත ගෙණ අවුත් ද්විතීය ධ්‍යානාදිය සමග සම්බන්ධ කොට ඒ විස්තාරයෙන් ම අන්‍ය වූ ද එකුන් තිස් බද්ධචක්‍රයන් දක්වා එකමූලකනය නිමකරණ ලද්දේ ය. පාඨය වනාහි සැකෙවින් දක්වන ලද්දේ ය. එය නො මුළා වන්නහු විසින් විස්තර වශයෙන් දතයුත්තේ ය. එකමූලකනය යම්සේ ද ද්විමූලකාදීහු ද එසේ ය. සථිමූලකනයෙහි කෙළවර දක්වා සාරසියයක්හුගේ මතුවෙහි පන්තිස් නය කෙනෙක් දක්වන ලදහ. ඔවුහු කවරහු ද යත්:- ද්විමූලකයෝ එකුන්තිසෙක, ත්‍රිමූලකයෝ අටවිස්සෙක චතුර්මූලකයෝ සත්විස්සෙක. මෙසේ පංචමූලකාදීහු ද එක එක අඩු කොට තිංසමූලකයෝ යම්තාක් ද ඒ තාක් දතයුතු ය. පාඨයෙහි වනාහි ඔවුන්ගේ නම ද හකුළා කෙටි කොට මෙය සථිමූලකැ යි එක් තිංසමූලක නයක් දක්වන ලද්දේ ය. යම්හෙයකින් ශූන්‍යාගාරපදය ධ්‍යානය සමග නො ගැටුනේ ද, කෙළවරට නො බස්නේ ද, එහෙයින් එය ආමඝීනය නො කොට මොහාවිත්ත විනීවරණපදය කෙළවර කොට ඇති හැම තැන යොජනා තොමෝ දක්වන ලදැ යි දතයුත්තී ය. මෙසේ ප්‍රථම ධ්‍යානාදිය පිළිවෙළින් හෝ උපිළිවෙළින් හෝ ද්විතීයධ්‍යානාදීන් සමග ගටා හෝ නො ගටා හෝ 'සමාපජ්ජිං' යනාදී නයින් කියන්නහුට මුක්තියක් නැත්තී ය. පාරාජිකයට පැමිණේ මය යි මේ අර්ථය දක්වීම් වසයෙන් කියනලද ඒ සුඛධික මහාවාරයෙහි මේ වනාහි සැකෙවින් කළ අර්ථ වර්ණනා ය.

'තීහාකාරෙහි' සමජජානමුසාවාදයට අඩග වූ කරුණු තුණෙන් 'පුබෙබවසස හොති' පූර්භාගයෙහි ම මේ පුද්ගලයාහට 'බොරු කියන්නෙමි' යි මෙබඳු සිතක් වේ. **'හණුණසස හොති'** කියන්නහුට මෙබඳු සිතක් වේ. **'හණිතසස හොති'** කියූ කල්හි මොහුට මෙබඳු සිතක් වේ. යමක් කියයුත්තේ නම් එය කියූ කල්හි වේය, යන අර්ථ යි. නොහොත් **'හණිතසස'** යි කියූ වචනයෙන් නිමියා වූ වචන ඇත්තහුට වන්නේය යි මෙසේ යමෙක් පූර්භාගයෙහි දී දනී ද, කියනුයේත් දනී ද,

පසුවත් 'මා විසින් බොරු කියන ලදැ' යි දනී ද, හෙතෙමේ ප්‍රථමධ්‍යානයට සමවැදුනෙමියි කියනුයේ පාරාජිකයට පැමිණේය යි. මෙහි 'තීහඩෙහ සමන්නාගතො මුසාවාදෙ' යන මේ අර්ථය දක්වන ලද්දේ ය. එසේ දක්වන ලද්දේ නමුත් මේ මෙහි වෙනස යෑ:- පළමු කොට විචාරීමෙක් වේ. 'බොරු කියන්නෙමි'යි ද බොරු කියන්නහුට බොරු කියමි'යි ද දන්නහුට, පසුභාගයෙහි 'මා විසින් බොරු කියන ලද්දේය'යි නො වන්නට නො හැක්කේය. ඉදින් නොවේ නමුදු පාරාජිකය ම වේ. පළමු අඩඟ දෙක ම මෙයට ප්‍රමාණ වේ.

යමක්හට වනාහි පූර්භාගයෙහි 'බොරු කියන්නෙමි'යි අදහසක් නැත්තේ ද, කියන්නේ වනාහි 'බොරු කියමි' යි දනී ද, කියූ කල්හි ද 'මා විසින් බොරු කියන ලදැ' යි දනී ද, ඔහුට ඇවැත් නො නැගිය යුතු ය. එහිලා පූර්භාගය ම ප්‍රමාණතර වේ. එය නැති කල්හි වහා කියන ලද්දක් හෝ අනිකක් කියනු කැමැතිව පැකිල අනිකක් කියන ලද්දක් හෝ වේය යි මෙහි ද ඒ දන්නා බව ද එකචිත්තොත්පාදයෙහි අනෙකඤ්ඤසමොධානය ද දුරුකටයුතු ය. 'තඤ්ඤඤ්ඤතා පරිච්චජිතබ්බා' යම් සිතකින් බොරු කියන්නෙමි යි දනී ද, ඒ සිතින් ම 'බොරු කියමි' යි ද, 'මා විසින් බොරු කියන ලදැ' යි ද දනී ද, මෙසේ එක් ම සිතින් ක්ෂණ තුනෙහි දනී ය යන මේ තඤ්ඤඤ්ඤභාවය හැරිය යුතු ය. ඒ සිතින් ම ඒ සිත දැන ගන්නට නො හැකි ය. ඒ කඩුවෙන් ඒ කඩුව සිඳින්නට යම් සේ නො හැක්කේ ද එසේ ය. පළමු පළමු සිත පසු පසු සිත පිළිබඳ එසේ ඉපැත්මට ප්‍රත්‍යය ව නිරුද්ධ වේ. එහෙයින්:-

'කියන්නෙමි'යි යන පූර්භාගය ම ප්‍රමාණ වේ. 'කියන්නෙමි' යන ඒ පූර්භාගය ඇති කල්හි 'කියමි, කියන ලද ය' යන සෙසු දෙක නො වන්නේ ය යන මෙය නැතැ යි මෙසේ වාක් තොමෝ අඩඟත්‍රයයෙන් යුක්තය, යි එහෙයින් මේ කාරණය කියනු ලැබේ.

'ඤණ සමොධානං පරිච්චජිතබ්බං' යන මෙහි මේ සිත් තුණ එක ක්ෂණයෙහි උපදීය යි නො ගත යුතු ය මේ සිත නම්:

'පළමු සිත නිරුද්ධ නො වූ කල්හි පැසුළු සිත නො උපදියි. අතර නො තබා උපදින බැවින් එක් සිතක් මෙන් පෙණෙන්නේය'යි.

මෙයින් මතුවෙහි වනාහි යම් ඒ මහණෙක් ප්‍රථම ධ්‍යානයට පැමිණියෙමි'යි දැන බොරු කියා ද, යම්හෙයකින් හෙතෙමේ 'මට ප්‍රථමධ්‍යානය නැතැ'යි මෙබඳු දෘෂ්ටි ඇත්තේ වේ ද, ඔහුට 'එසේ මට ප්‍රථමධ්‍යානය නැතැ'යි මේ ලබ්ධිය ඇත්තීම ය. 'මට ප්‍රථමධ්‍යානය

නැත්තේ ය, මොහුගේ සිත මෙබඳු සභාව ඇත්තේ ම වන්නේය' යි මෙසේ මොහුගේ ඉවසීම ද වේ. මොහුට රුස්නේ ද වේ. යම් කලෙක වනාහි බොරු කියනු කැමැත්තේ වේ ද, එකල්හි ඒ දෘෂ්ටිය හෝ දෘෂ්ටිය සමග, වැටහීම හෝ දෘෂ්ටියත් වැටහීමත් සමග, රුචිය හෝ දෘෂ්ටිය ඉවසීම රුචිය සමග අදහස හෝ සහවා බහා තබා වසා අවිද්‍යමාන කොට කියා ද එහෙයින් ඔවුන්ගේ ද වසයෙන් අඞ්ගභෙදය දක්වන්නට **'චතුහාකාරෙහි'** යනාදිය වදළසේක. පරිවාරයෙහි ද 'මුසාවාදය අටහක් ඇතැ'යි කියූ බැවින් එහි අදහස් කරණුලද සංඥව සමග මෙහි 'අට අයුරකින්' යි අන්‍ය වූ ද එක් ක්‍රමයක් යෙදිය යුතු ය. මෙහි ද **'විනිධාය දිට්ඨිං''** යන මේ නය බලවත් ධම් ප්‍රතිවිඛාදන වශයෙන් කියනලදී. **'විනිධාය ඛන්තිං'** යනාදිය එයට වඩා දුර්ල දුර්ල ධම්යන්ගේ නිඃක්ෂෙපවශයෙනි. **'විනිධාය සඤ්ඤං'** යන මෙය වනාහි මෙහි සියලු දුර්ල ධම්යන්ගේ නිඃක්ෂෙපය යි. සංඥමාත්‍රයක් නමුදු ප්‍රතිවිඛාදනය නො කොට දැන බොරු කියන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වේ. යම්හෙයකින් 'සමවදින්නෙමි' යනාදී වූ අනාගත වචනයෙන් පාරාජිකය නො වේ ද, එහෙයින් 'සමවැදීමි' යනාදී වූ අතීත වර්තමාන පදයෝ ම පාඨයෙහි කියන ලදහ යි දතයුත්තාහ. මින් මතුවෙහි මේ සුදධිකමහාවාරයෙහි සියල්ල ම ප්‍රකට අර්ථ ඇත්තේම ය. මෙහි කිලෙසපපභාණපදයාගේ පදභාජනයෙහි **'රාගො මෙ වත්තො වත්තො'** යනාදි පදයන්ගේ අර්ථය හැර යමක් මේ විනිශ්චයයෙන් දැන ගන්නට නො හැකි වන්නේ ද, එබන්දක් මෙහි නො ම ඇත්තේ ය. ඒ මේ අර්ථය දැන් කියනු ලැබේ. මෙහි **'වත්තො'** යන මෙය සකීයභාවය ඇත්හැරීම් වසයෙන් වදරණ ලද්දේය. **'වන්තො'** යන මෙය නැවත නො ගන්නා බව දැක්වීම් වසයෙන් වදරණ ලද්දේය. **'මුත්තො'** යන මෙය සන්තතියෙන් මිදීම් වසයෙන්, **'පහීණො'** යන මෙය මිදුනහුගේ ද කිසි තැනක එකසේ නො පැවැතීම දැක්වීම් වසයෙන්, **'පටිනිස්සට්ඨො'** යන මෙය පෙර නො දෙන ලද්දහුගේ නැවත දුරලීම දැක්වීම් වසයෙන්, **'උක්කෙට්ඨිතො'** යන මෙය ආයූහිමාඛියෙන් තැති ගන්වා පලවා හැරිය බැවින් නැවත නො ඇලෙනබව දැක්වීම් වසයෙන් වදරණ ලද්දේ ය. ඒ මේ අර්ථය තෙමේ ශබ්දශාස්ත්‍රයෙන් සෙවිය යුතු ය. **'සමුක්කෙට්ඨිතො'** යන මෙය මනාකොට තැති ගන්වා ඉතා කුඩා වූවක්හුගේ ද නැවත නො ඇලෙනබව දැක්වීම් වසයෙන් වදරණ ලද්දේ ය.

සුදධිකවාරකථා නිමි.

—\\—

වත්තුකාමවාරයෙහි ද- **'තීහාකාරෙහි'** යනාදීන් පිළිබඳ අර්ථය ද වාරපෙය්‍යාලයාගේ ප්‍රභෙදය ද යන සියල්ල මෙහි කියූ නයින් ම දතයුතුය. හුදෙක් 'වරදවා අනිකක් කියනු කැමැති වූ මා විසින් යම් මේ අනෙකක් කියන ලද ද, එහෙයින් මට ඇවැත් නැතැ'යි මෙසේ ඉඩපහසුකම් සොයන පාපී පුද්ගලයන්ට අවකාශ වළකනු පිණිස වදරණ ලද්දේ ය. යම්සේ 'බුද්ධං පච්චක්ඛාමි' යි කියනු කැමැත්තේ 'ධම්මං පච්චක්ඛාමි' යනාදී වූ ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන පදයන් අතුරෙහි යම් ඒ පදයක් කියනුයේ ක්ෂෙත්‍රයෙහි බැසගත් බැවින් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කෙළේ ම වේ ද, එසේ ප්‍රථමද්‍යානාදී වූ උත්තරිමනුෂ්‍ය ධර්මපදයන් අතුරෙහි යම්කිසි එක් පදයක් කියනු කැමැතිව එයින් අන්‍ය වූ යමක් හෝ එය හෝ කියනුයේ ද ක්ෂෙත්‍රයට බැසගත් බැවින් පාරාජික ම වේ. ඉදින් යමක්හට කියා ද, හෙතෙමේ ඒ ඇසිල්ලෙහි ම ඒ කරුණ දන ගණී ද, දනීම පිළිබඳ ලක්ෂණ ද මේ ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයෙහි කියූ නයින් ම දතයුතු ය. මෙහි මේ වෙනස යඃ- ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය හස්තමුද්‍රාවෙන් කෙළවරට නො බස්නේ ය. මේ අභූතාරොචනය වනාහි හස්තමුද්‍රාවෙන් ද කෙළවරට බස්නේ ය. යමෙක් වනාහි හස්තවිකාරාදී වූ අභපසහ සැලීමෙන් අවිද්‍යමාන වූ උත්තරිමනුෂ්‍යධර්මය කායවිඥප්තිපථයෙහි සිටි පුද්ගලයක්හට සැල කෙරේ ද, හෙතෙමේ ඒ අර්ථය දනී ද, පාරාජික ම වේ. නැවත වනාහි මොහුට කියා ද යි 'මෙතෙමේ කුමක් කියා ද' යි හෙතෙමේ නො දන්නේ හෝ වේ ද, සැකයට හෝ පැමිණේ ද, කලක් විමසා හෝ පසුව දන ගණී ද දන නො ගන්නේ ම ය යන සඞ්ඛ්‍යාවට යන්නේ ය. මෙසේ දන නො ගන්නහුට කියූ කල්හි ථුල්ලච්චය වේ. යමෙක් වනාහි ධ්‍යානාදිය තමන්ගේ අධිගම වසයෙන් හෝ උග්ගහපරිපුච්ඡාදී වසයෙන් හෝ නො දනී ද, හුදෙක් ධ්‍යානය යි හෝ විමොක්ෂය යි හෝ වචනමාත්‍රයක් ම අසන ලද්දේ වේ ද, හෙතෙමේ ද ඔහු විසින් කියූ කල්හි මෙතෙමේ ධ්‍යානයකට සමවැදුනෙමි යි කියා යි මෙපමණකුත් ඉදින් දනී නම්, දනී ම ය යන සඞ්ඛ්‍යාවට යයි. ඔහුට කියූ කල්හි පාරාජිකය ම වේ. එකකුහට හෝ දෙදෙනකුට හෝ බොහෝ දෙනකුට හෝ නියමිත අනියමිත වසයෙන් සෙසු සියලු වෙනස ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කථාවෙහි කියූ නයින් ම දතයුතු ය.

වත්තුකාමවාරකථා නිමි.

—\\—

පච්චයපටිසංයුත්තවාරයෙහි ද - සියලු වාරපෙය්‍යාලභෙදය ද පෙර ආවා වූ පදයන්ගේ අර්ථ ද කියූ නයින් ම දන පාලික්‍රමය පළමු

කොට මෙසේ දතයුතු ය. මෙහි වනාහි 'යමෙක් තාගේ විහාරයෙහි විසූයේ ද, යමෙක් තාගේ සිවුරු පරිභොග කෙළේ ද, යමෙක් තාගේ පිණ්ඩපාතය වැළඳූයේ ද, යමෙක් තාගේ සෙනසුන් පරිභොග කෙළේ ද යමෙක් තාගේ ගිලන්පස බෙහෙත් පිරිකර වැළඳූයේ ද, යන මේ පස් වැදරුම් පවත්තවවනවාරයෝ 'යමකු විසින් තාගේ විහාරය පරිභොග කරණ ලද්දේ ද යනාදී වූ පස්වැදරුම් කරණවවනවාරයෝ තෝ යමකු උදෙසා විහාරය දුන්නේ ද, යනාදී වූ පස්වැදරුම් උපයොග වවන වාරයෝ කියන ලද්දහු ද, ඒ වාරයන්ගේ වසයෙන් මෙහි කියන ලද ශූන්‍යාගාර පදය සමග පෙර කියූ ප්‍රථමධ්‍යානාදී වූ සියලු පදයන්හි වාරපෙය්‍යාලභෙදය දතයුතු ය. 'යො තෙ විහාරෙ, යෙන තෙ විහාරො, යං තවං ආගමම විහාරං' යි මෙසේ පිළිවෙළින් කියූ බැවින් වනාහි 'අහං යි නො කියූ බැවින් ද දනගන්නහුට කියූ කල්හි ද මෙහි ථුල්ලවවය වේ. නො දන්නහුට කියූ කල්හි දුක්කටය වේ ය යනු මෙහි විනිශ්චය වේ. මෙසේ විසතර වශයෙන් ආපත්තිභෙදය දක්වා දුන් අනාපත්තිභෙදය දක්වන සේක් **'අනාපත්ති අධිමානෙන'** යනාදිය වදළසේක. එහි එහි **'අධිමානෙන'** අධිකමානයෙන් කියූ ආකාර ඇති උත්තරිමනුෂ්‍යධර්මය අත්තුපනායික කොට ආරොචනය කරන්නහුට ඇවැත් නො වේ. **'අත්තුල්ලපනාධිප්පායස්ස'** කුහකබවෙහි හෝ ඉච්ඡාචාරයෙහි හෝ නො පිහිටා නො කියන අදහස් ඇත්තා වූ ද සබ්‍රම්සරුන් වෙත රහත්බව ප්‍රකාශ කරන්නහුට ඇවැත් නො වේ. උනමත්තකාදීහු පෙර කියූ නය ඇත්තාහු ම ය. මෙහි වනාහි වඟතුමුදතීරිය භික්ෂූහු ආදිකර්මිකයෝ ය. ඔවුන්ට ඇවැත් නො වේ.

පදභාජනීයවණ්ණනා නිමි.

—\\—

සමුට්ඨානාදීන් අතුරෙහි මේ ශික්ෂාපදය ත්‍රිසමුත්ථානය. හස්තමුද්‍රාවෙන් සැලකරන්නහුට කායචිත්තයෙන්, වාගෙභදයෙන් සැලකරන්නහුට වාචාචිත්තයෙන්, කායචිත්ත - වාචාචිත්ත දෙකින් සැලකරන්නහුට කායවාචාචිත්තයෙන් සමුත්ථානය වේ. ක්‍රියාවෙන් පැමිණිය යුතු බැවින් ක්‍රියාසමුත්ථානය වේ. ව්‍යතික්‍රම සංඥාවගේ අභාවයෙන් මිදෙන බැවින් සංඥාවිමොක්ෂ ය. සිත් ඇතිව කටයුතු බැවින් සචිත්තක ය. ලොකවද්‍යය. කායකම් යි. වාක්කම් යි. අකුශලචිත්ත යි. ත්‍රිවෙදන යි. සිනාසෙන්නේ ද සොම්නස් ඇත්තෙක්ව ප්‍රකාශ කරයි. මා කෙරෙහි උත්තරිමනුෂ්‍යධර්මය නැති බව දන්නා අන්‍යයෝ ද ඇත්තාහ යි බිය වන්නේ ද මද්‍යසථ ද වූයේය යි.

විනීතවත්‍ථූන් අතුරෙහි - අධිමාන වත්‍ථුව අනුප්‍රඥප්තියෙහි කියා ලද නය ඇත්තේ ම ය. දවිතීය වත්‍ථුවෙහි - **'පණිධාය'** ප්‍රාර්ථනා කොට **'එවං මං ජනෝ සම්භාවෙස්සති'** මෙසේ ජනතෙමේ අරණ්‍යයෙහි වසන මා රහත්බවෙහි හෝ ශෛක්‍ෂභූමියෙහි හෝ ලා සම්භාවනා කරන්නේ ය. එයින් ලොකයා විසින් සත්කාර කරණ ලද්දෙමි ගරු කරණ ලද්දෙමි බුහුමන් කරන ලද්දෙමි පූදන ලද්දෙමි වන්නෙමි යි ප්‍රාර්ථනා කොට. **'ආපත්ති දුක්කටස්ස'** මෙසේ ප්‍රාර්ථනා කොට 'වනයෙහි වසන්නෙමි' යි යන්නහුට පියවරක් පියවරක් පාසා දුක්කටය වේ. එසේ වනයෙහි කුටිකිරීම් සක්මන් කිරීම් හිඳීම් හැඳීම් පෙරවීම් ආදී වූ සියලු කටයුතුවල දි ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටය වේ. එහෙයින් වනයෙහි මෙසේ නො විසිය යුතු ය. මෙසේ වසනුයේ ද සම්භාවනය ලබාවා හෝ නො ලබාවා හෝ දුක්කටයට පැමිණේ.

යමෙක් ධුතාඞ්ග සමාදන්වූයේ 'ධුතාඞ්ග රකින්නෙමි' යි හෝ 'ග්‍රාමාන්තයෙහි වසන මාගේ සිත විසිරෙන්නේ ය, එහෙයින් වනය සැපය' යි සිතා හෝ වනයෙහි දී එකාන්තයෙන් කාය - චිත්ත - උපධි යන ත්‍රිවිධ විවේකයන්ගෙන් එක්තරා එකකට පැමිණෙන්නෙමියි හෝ වනයට පිවිස රහත්බවට නො පැමිණ නො නික්මෙන්නෙමි යි හෝ අරණ්‍යවාසය භාග්‍යවතුන් වහන්සේ විසින් පසස්නා ලද්දේ ය, මා ද වනයෙහි වසන කල්හි බොහෝ සබ්‍රහ්මචාරීහු ග්‍රාමාන්තය හැර ආරණ්‍යකයෝ වන්නාහ යි හෝ මෙසේ නිරවද්‍ය වාසයෙන් වසනු කැමැත්තේ වේ ද ඔහු විසින් විසිය යුතු ය.

තෘතීය වත්‍ථුවෙහි - අත් පා දිගුකිරීම් ආදිය මනාව පිහිටුවා **පිඬු පිණිස** හැසිරෙන්නෙමි යි හැඳීම් පෙරවීම් කිසපටන් වැළඳීම කෙළවර තෙක් ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටය වේ. සම්භාවනය ලබාවා හෝ නො ලබාවා හෝ දුක්කටය ම වේ. බන්ධකවත්ත සෙඛියවත්ත පුරණු පිණිස හෝ සබ්‍රහ්මචාරීන්ගේ දිට්ඨානුගතියට පැමිණෙනු පිණිස හෝ පැහැදීම එළවන යෑම් ඊම් ආදියෙන් යුක්තව පිඬුපිණිස පිවිසෙනුයේ නුවණැත්තන් විසින් උපවාද නො කටයුත්තේ ය. චතුර්ථ - පඤ්චම වත්‍ථූන්හි 'යො තෙ විහාරෙ වසී' යන මෙහි කියූ නයින් ම 'මමැ' යි නො කියූ බැවින් පාරාජිකයක් නැත්තේ ය. තමන් කෙරෙහි උත්තරිමනුෂ්‍යධර්ම හෝ උත්තරිමනුෂ්‍යධර්ම කෙරෙහි තමන් හෝ පමුණුවා ම කියන්නහුට පාරාජිකය වදරණ ලදී. **'පණිධාය වඩ්ඪමි'** යනාදීහු යට කියූ නය ඇත්තාහු ම ය. සංයොජනවත්‍ථුවෙහි **'සංයොජනා පහීණා'** දසසංයොජනයෝ ප්‍රහීණ කරන ලදහ යි ද, එක් සංයොජනයක් ප්‍රහීණ

කරන ලද යි ද කියන්නහු විසින් කෙලශ ප්‍රහාණය ම සැලකරන ලද්දේ වේ ද, එහෙයින් පාරාජිකය වේ. රහෝ වසනූන්හි **'රහො උලපති'** රහසිගතව 'මම රහත්මි' යි කියයි. සිතින් සිතන ලද්දක් ම නො කරයි. එහෙයින් මෙහි දුක්කටය වදරණ ලදී. විහාරවසතුව හා උපට්ඨාන වසතුව ද කියූ නය ඇත්තේ ම ය.

න දුක්කර වසතුවෙහි- 'ආයුෂ්මත්පුද්ගලයෝ ම භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවකයෝ' යි ඒ මහණහුගේ මේ ලබ්ධිය වේ. එහෙයින් **'යෙ ඛො තෙ භගවතො සාවකා තෙ එවං වදෙය්‍යුං'** යනු වදළ සේක. සිල්වත් වූ පටන්ගත් විදසුන් ඇත්තහු විසින් රහත්බව පැවසීම දුෂ්කර නො වේ. හෙතෙමේ රහත් බවට පැමිණීමෙහි ප්‍රතිබල වේය' යනු යම්හෙයකින් මොහුගේ මෙහි අදහස වේ ද, එහෙයින් **'අනුලපනාධිප්පායො අහං'** යනු වදළ සේක. විරියවසතුවෙහි - **'ආරාධනීයො'** සතුටු කරන්නට හැක්කේ ය. සපයන්නට උපදවන්නට හැක්කේ ය යන අර්ථ යි. සෙස්ස කියූ නය ඇත්තේ ම ය. මව්වුවසතුවෙහි - ඒ මහණතෙමේ යමක්හට විපිළිසරයක් උපදී ද, හෙතෙමේ කියන්නේ ය. මාගේ වනාහි අවිප්‍රතිසාරවසතුක ශීලය පිරිසිදු ය. ඒ මම කිම, මරණයට බිය වන්නෙම් ද යි මේ අර්ථය සඳහා **'නාහං ආවුසො මව්වුනො භායාමි'** යි කීයේ ය. එහෙයින් මේ මහණහුට ඇවැත් නො වේ. විප්පටිසාරවසතුවෙහි ද මේ නය ම වේ. ඉන් මතුවෙහි එන වසතුත්‍රය විරියවසතුව සමාන වේ. වෙදනාවසතූන් අතුරෙහි ප්‍රථමවසතුවෙහි වනාහි ඒ මහණ තෙමේ ප්‍රතිසඞ්ඛ්‍යාන නම් වූ සමෘතිබලයෙන් අධිවාසනක්ෂාන්තියෙහි සිට **'න ආවුසො සක්කා යෙන වා තෙන වා අධිවාසෙතුං'** ඇවැත්නි! යමකින් හෝ එයින් හෝ ඉවසන්නට නො හැක්කෙමි යි කීයේ ය. එහෙයින් මේ මහණහුට ඇවැත් නොවේ. දවීතියවසතුවෙහි වනාහි අතතුපනායික නො කොට **'න සක්කා පුථුජ්ජනෙන'** ඇවැත්නි! පෘථග්ජනයා විසින් නො හැක්කේය යි පරියායයෙන් කියූ බැවින් ථූලලවය වේ.

බ්‍රාහ්මණවසතුවෙහි - ඒ බ්‍රාහ්මණ තෙමේ **'ආයනතු හොන්තො අරහන්තො'** පින්වත් රහත්හු එත්වා, යනු පමණක් නො කීයේය. ඔහුගේ මුඛයෙන් යම් යම් වචනයක් නිකුත් වේ ද, ඒ සියලු වචන 'රහතුන්ට අසුන් පණවවු, පාදේනා පැන් දෙවු, රහත්හු පා දෙවත්වා' යි අරහන්තවාද ප්‍රතිසංයුක්තම වූයේ ය. ඒ වනාහි මොහු ශ්‍රද්ධාචරිතයකු බැවින් තමන්ගේ ශ්‍රද්ධාබලයෙන් තදින් උත්සාහවත් වූ මොහුගේ ප්‍රසාදයෙන් කියවුනු වූ වචන යි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ **'අනාපත්ති හික්ඛවෙ පසාදහෙතූ'** යි වදළ සේක. මෙසේ කියනු ලබන තුටුපහටු වූ ම මහණහු විසින් වනාහි සිවුපසය පරිභොග කටයුතු ය. රහත් බවට

පමුණුවන පිළිවෙත පුරන්නෙමි'යි මෙසේ යොග කටයුතු ය. අක්ඛරව්‍යාකරණවසතුහු සංයොජනවසතු සමාන ම වෙත්.

අගාරවසතුවෙහි- ඒ මහණතෙමේ ගිහිබවෙහි ප්‍රයොජන රහිත බැවින් අපෙක්ෂාවක් නැති බැවින් **'අභබ්බො බො ආවුසො මාදිසො'** ඇවැත්නි! මා වැනියෙක් අභව්‍ය මැ යි කීයේ ය. උත්තරිමනුෂ්‍යධර්ම පවසන අදහසින් නො වේ. එහෙයින් මොහුට ඇවැත් නො වේ. ආවටකාම වසතුවෙහි - ඒ මහණතෙමේ වස්තුකාමයන්හි ද කෙලශකාමයන්හි ද ලෞකික වූ ම ආදීනවදර්ශනයෙන් අපෙක්ෂා රහිත වූයේ ය. එහෙයින් **'ආවටා මෙ ආවුසො කාමා'** ඇවැත්නි! මා විසින් කාමයෝ ආවරණය කරණ ලදහයි කීයේ ය. එහෙයින් මේ මහණහුට ඇවැත් නො වේ. මෙහි ද 'ආවටා' යනු වළකන ලද්දහ, නිවාරණය කරන ලද්දාහ. බැහැර කරන ලද්දහ. යන අර්ථයි. අභිරති වසතුවෙහි ඒ මහණතෙමේ සසුනෙහි නො කළකිරුණු බැවින් උදෙසීම් පිළිවිසීම් ආදියෙහි ද ඇලුනු බැවින් **'අභිරතො අහං ආවුසො පරමාය අභිරතියා'** ඇවැත්නි! මම උත්තමාභිරතියෙන් ඇලුනෙමි යි කීයේ ය. උත්තරිමනුෂ්‍යධර්ම පවසන අදහසින් නො වේ. එහෙයින් මේ මහණහුට ඇවැත් නො වේ.

පක්කමනවසතුවෙහි - **'යො ඉම්මහා ආවාසා පඨමං පක්කමිස්සති'** යමෙක් මේ ආවාසයෙන් පළමු කොට යන්නේ ද යි මෙසේ ආවාසයක් හෝ මණ්ඩපයක් හෝ සීමාවක් හෝ යන යම්කිසි තැනක් පිරිසිඳ කළ කතිකාවකින් 'යමෙක් මා රහත් යි දනිත්වා' යි ඒ ස්ථානයෙන් පළමු කොට යේ ද, හෙතෙමේ පාරාජික වේ. යමෙක් ආචාර්‍යඋපාධ්‍යායයන්ගේ කටයුත්තකින් හෝ මවුපියන් පිළිබඳ කිසියම් කටයුත්තකින් හෝ පිඬු සිහා යෑම පිණිස හෝ උදෙසීම් පිළිවිසීම් පිණිස හෝ එවැනි අන් කටයුත්තකින් හෝ එතැන ඉක්මවා යේ ද, ඇවැත් නො වේ. ඉදින් එසේ ගියා වූ මේ මහණහුට පසුව 'දැන් මම එහි නො යන්නෙමි, එසේ නො ගිය කල්හි මා රහත් යි සම්භාවනය කරන්නාහ'යි ඉච්ඡාචාරයෙක් උපදී නම් ඇවැත් නො වේ මය. යමෙක් යම්කිසි කටයුත්තකින් එතැනට පැමිණ හැදෑරීම් මෙනෙහි කිරීම් ආදිවසයෙන් අන්‍යවිහිතව හෝ සොරු ආදීන් විසින් ලුහුබඳන ලද්දේ හෝ නැඟී සිටි මෙසයක් දැක හෝ නො තෙමෙන තැනකට පිවිසෙනු කැමැතිව හෝ එතැන ඉක්මවා ද, ඇවැත් නො වේ. යානයකින් හෝ විද්‍යාමයඍද්ධියකින් හෝ යන්නේ ද පාරාජිකයට නො පැමිණේ. පා ගමනින් ම පාරාජිකයට පැමිණේ. එ ද යම් කෙනකුන් සමග කතිකා කරණ ලද්දී ද, ඔවුන් සමග පෙර පසු නො වී යනුයේ පාරාජිකයට නො පැමිණේ. මෙසේ යන්නා වූ සියල්ලෝ ම ඔවුනොවුන් රකිත්.

ඉදිනුදු මණ්ඩප රුක් මුල් ආදීන් අතුරෙහි කිසි තැනක් පිරිසිඳ ‘යමෙක් මෙහි හිඳියි හෝ සක්මන් කරයි හෝ වේ ද, ඔහු රහත්’ යි දන්නෙමු, මල් හෝ තබා ‘යමෙක් මේ මල් ගෙණ පූජා කරන්නේ ද, ඔහු රහත් යි දන්නෙමු’ යි යනාදි නයින් කතිකාවක් කරණ ලද්දී වේ ද, එහි ද ඉරියාවාර වසයෙන් එසේ කරන්නහුට පාරාජිකය ම වේ. ඉදින් උපාසකයකු විසින් ‘යම්කෙනෙක් රහත්හු වෙත් ද, ඔවුහු මේ වෙහෙර වෙසෙත්වා, පා සිවුරු ආදිය හෝ ගණිත්වා’ යි අතරමග විහාරයක් කරණ ලද්දේ ද, තුන් සිවුරු ආදීහු හෝ තබන ලද්දාහු වෙත් ද, එහි ද ඉරියාවාර වසයෙන් වසන්නහුට ද සිවුරු ආදිය ගන්නහුට ද පාරාජිකය ම වේ. මේ වනාහි නො දහැම් කතිකාවතෙකි. එහෙයින් නො කටයුතු ය. ‘මේ තෙමස තුළ සියල්ලෝ ම ආරණ්‍යක වෙත්වා, පිණ්ඩපාතාඩ්ගාදි අවශෙෂ ධුතඩ්ගධරයෝ හෝ වෙත්වා නොහොත් සියල්ලෝ ම රහත්හු වෙත්වා, යනාදී වූ මෙවැනි අනෙකක් හෝ නො කටයුතු ය. නොයෙක් දනවු වැසි භික්ෂූහු රැස් වෙත්. ඔවුන් අතුරෙහි කිසි කෙනෙක් දුර්ල වූවාහු මද ශක්‍ති ඇත්තාහු මෙවැනි වත් රකින්නට අපොහොසත් වෙත් ද එහෙයින් මෙවැනි ව්‍රත නො කටයුතු ය. මේ තෙමස මුළුල්ලෙහි සියල්ලන් විසින් ම නො උදෙසිය යුතු ය. නො විවාළ යුතු ය. පැවිදි නො කටයුතු ය. මුගව්‍රතය ගත යුතු ය. සීමාවෙන් පිටත සිටියහුට ද මහලු පිළිවෙළින් තමහට පැමිණිය යුතු සඞ්ඝලාභය දියයුතු ය යන මේ ආදිය නො කටයුතු ය.

ලක්ඛණසංයුත්ත - **‘යථායං ආයස්මා ච ලක්ඛණෝ’** මෙයින් ලක්ෂණ ස්ථවිර තෙමේ දක්වන ලද්දේ ය මෙතෙමේ ජටිලයන් දහසට ඇතුළත් වූ එහිහික්ඛූඋපසම්පදවෙන් උපසපන් වූ ආදිත්තපරියායසූත්‍ර දෙශනාවසානයෙහි රහත් බවට පැමිණි එක් මහාශ්‍රාවකයෙකැ යි දතයුතු ය. යම්හෙයකින් මේ ස්ථවිරතෙමේ පුරුෂලක්ෂණයෙන් යුක්ත වූ හැම අයුරින් පරිපූර්ණ වූ බ්‍රහ්මාත්තභාවය සමාන වූ ආත්මභාවයෙන් යුක්ත වූයේ ද, එහෙයින් ලක්ෂණ යි ප්‍රසිද්ධියට ගියේ ය. මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ වනාහි පැවිදි වූ දිනයෙන් සත්වන දිනයෙහි රහත්බවට පැමිණියාහු දෙවන අගසවු වූහ. **‘සීතං පාත්‍රවාකාසි’** මහසිනාවක් පහළ කළහ. ප්‍රකාශ කළහ. දැක්වූහ යි කියන ලද්දේ වේ. කුමක් දක ස්ථවිරයන් වහන්සේ සිනහ පහළ කළ සේක් ද යත්:- උපරිපාළියෙහි දැක්වූ ප්‍රෙතලොකයෙහි උපන් ඇටසැකිල්ලක් වූ එක් සත්ත්වයකු දක ය. ඒ ප්‍රෙතයා දිවැසින් දකීමෙනි. ප්‍රසාදචක්ෂුසින් දක නො වේ. මේ ආත්මභාවයෝ වනාහි ප්‍රසාද චක්ෂුයෙහි ඉදිරියට නො පැමිණෙත්. මෙබඳු ආත්මභාවයක් ද දැක කරුණාව එළවිය යුතු තන්හි කුමක් හෙයින් සිනහ පහළ කළ

සේක් ද යත්:- තමන්ගේ ද බුද්ධඥානයාගේ ද සම්පත්තිය මැනැවින් සිහි කිරීමෙනි. සථවිරයන් වහන්සේ ඒ ප්‍රේතරූපය දැක 'නො දත් සිවුසස් ඇති පුද්ගලයා විසින් පිළිලැබිය යුතු මෙබඳු ආත්මභාවයෙන් මම මිදුනෙමි, එකාන්තයෙන් මට වූයේ ලාභයෙකි, එකාන්තයෙන් මා විසින් ලද්දේ මනාය යි තමන්ගේ සම්පත්තිය සිහිකොට භාග්‍යවතුන් වහන්සේගේ ඥානසම්පත්තිය ආශ්චර්‍යය. යම් කෙනෙක් 'මහණෙනි! කර්මවිපාකය නො සිතිය හැකි ය, නො සිතිය යුතුය' යි දෙසූ සේක් ද එකාන්තයෙන් බුදුවරයෝ ප්‍රත්‍යක්ෂ කොට දෙශනා කරන සේක. බුදුවරයන් විසින් සර්වඥතාඥානය මැනැවින් අවබොධ කරනලද්දේය යි මෙසේ බුදුරජානන් වහන්සේගේ ඥානසම්පත්තිය ද සිහිකොට සිනහ පහළ කළහ.

ක්ෂීණාස්‍රවයෝ යම්හෙයකින් නිකරුණේ සිනහ පහළ නො කෙරෙත් ද, එහෙයින් ලක්ෂණ සථවිරයන් වහන්සේ 'ඇවැත! මෞද්ගල්‍යායන සථවිරයන් වහන්ස! සිනහ පහළ කිරීමෙහි හෙතු කවරේ ද? ප්‍රත්‍යය කවරේ ද යි විචාළාහු ය. මෞද්ගල්‍යායන සථවිරයන් වහන්සේ වනාහි යම්හෙයකින් යම් කෙනකුන් විසින් මේ උත්පත්තිය තමන් විසින් නො දක්නා ලද ද, ඔවුහු ඇදහැවිය නො හැක්කාහු වෙත් ද, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ සාක්ෂි කොට පවසනු කැමැත්තෙන් **'අකාලො ඛො ආවුසො'** යනාදිය කීහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි දී විචාරණ ලද්දාහු **'ඉදඤ ආවුසො'** යනාදි නයින් එය ප්‍රකාශ කළහ. එහි **'අවධීසඩ්ඛලිකං'** සුදු, මස් ලේ නැති ඇටසැකිල්ලක් **'ගිජ්ඣාපි කාකාපි කුලලාපි** මොවුහු ද යක් ගිජුලිහිණියෝ ය, යක් කවුඩෝ ය, යක් උකුස්සෝ යි දතයුත්තාහු ය. පියවි ගිජුලිහිණි ආදීන්ගේ ඉදිරියට මේ රූපය නො පැමිණේ. **'අනුපතිත්වා අනුපතිත්වා'** ලුහුබැඳ ලුහුබැඳ. **'විතුදෙනති'** විනිවිද යෙත්. 'විතුදෙනති'යි හෝ පාඨයි. කඩු මුවහත් වැනි තියුණු වූ ලෝ තුඩින් විදින් යන අර්ථ යි. **'සා සුදං අට්ඨසතරං කරොති'** මෙහි සුදං යනු නිපාත යි. ඒ ප්‍රේත ඇටසැකිල්ල බැගෑපත් හඬ පෙළනු හඬ කෙරේ ය යන අර්ථ යි. අකුශල විපාක අනුභව කරනු පිණිස යොදුන් පමණ වූ ද එබඳු ආත්මභාවයෝ උපදින්නාහ. පැසුනු ගඩ සමාන වූ බලවත්ව නැගුනු කායප්‍රසාදයෝ වෙත්. එහෙයින් ඒ ඇටසැකිල්ල බලවත් වේදනාවෙන් ආතුරව එබඳු හඬ නැගුය. මෙසේ ද වදරා ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන සථවිරයන් වහන්සේ සසර සැරිසරණ සත්ත්වයෝ නම් එබඳු ආත්මභාවයෙන් නො මිදෙති යි සත්ත්වයන් කෙරෙහි වූ කරුණාව නිසා උපන් ධර්මසංවේගය දක්වන සේක් **'තස්ස මය්හං ආවුසො එතදහොසි අච්ඡරියං වත භො'** යනාදිය වදළාහුය.

'භික්ඛූ උජ්ඣායන්ති' යම් කෙනකුන්හට ඒ ප්‍රතොත්‍යපත්තිය ප්‍රත්‍යක්ෂ නො වූවා ද, එහෙයින් ඔවුහු අවමන් කරත්. භාග්‍යවතුන් වහන්සේ වනාහි තෙරුන්ගේ ආනුභාවය වදරණ සේක් **'චක්ඛුභූතා වත භික්ඛවෙ සාවකා විහරන්ති'** යනාදිය වදළ සේක. එහි ඔවුන්ට ඇස වූයේ හටගත්තේ උපන්නේ නු යි චක්ඛුභූත නම්. හටගත් ඇස් ඇත්තාහු උපන් ඇස් ඇත්තාහු දිවැස උපදවා වාසය කෙරෙති, යන අර්ථ යි. දෙවන පදයෙහි ද මේ නය ම වේ. **'යත්‍ර හි නාම'** මෙහි යත්‍ර යනු කාරණවචන යි. එහි මේ අර්ථයොජනාය:- යම්හෙයකින් නම් ශ්‍රාවකයෙක් මෙවැන්නක් දන්නේ හෝ වේ ද, දක්නේ හෝ වේ ද, සාක්ෂි හෝ කරන්නේ ද, එහෙයින් 'මහණෙනි! එකාන්තයෙන් ශ්‍රාවකයෝ උපන් දිවැස් ඇතිව වසත්. මහණෙනි! එකාන්තයෙන් ශ්‍රාවකයෝ උපන් දිව්‍යඥනය ඇතිව වසත්' යි කීමු යනු ය.

'පුබ්බෙව මෙ සො භික්ඛවෙ! සත්තො දිට්ඨො බෝමැඩ දී සර්ඥතාඥනප්‍රතිවෙධයෙන් අප්‍රමාණ චක්‍රවාටයන්හි අප්‍රමාණ සත්ත්ව සමූහයෙහි භවගතියොනිවිඥන සථිති නිවාසයන් ප්‍රත්‍යක්ෂ කරන්නා වූ මා විසින් පෙර ම ඒ සත්ත්ව තෙමේ දක්නා ලද්දේය යි වදරණ සේක. 'ගොඝාතකො' ගෙරින් මරමරා ඇටින් මස් වෙන් කොට විකුණා ජීවිකාව කරන සත්ත්වතෙමේ ය. **'තසෙව කම්මස්ස විපාකාවසෙසෙන'** නානාවිධ චෙතනාවන්ගෙන් රැස්කර ලද අපරාපර්‍යවේදනීය කම් ඇති ඒ ගොඝාතකයාගේ යම්හෙයකින් යම් චෙතනාවකින් ඒ නිරයෙහි ප්‍රතිසන්ධිය හටගත්තී ද, ඒ ප්‍රතිසන්ධියගේ විපාකය ගෙවී ගිය කල්හි සෙසු කම්යක් හෝ කම්නිමිත්තක් හෝ අරමුණු කොට නැවත ප්‍රෙතයොනි ආදීන්හි ප්‍රතිසන්ධිය උපදී ද, එහෙයින් ඒ ප්‍රතිසන්ධිය, කම්සභාගත්වයෙන් හෝ ආලම්බනසභාගත්වයෙන් හෝ එම කම්යාගේ විපාකාවශෙෂය යි කියනු ලැබේ. මේ සත්ත්ව තෙමේ ද එසේ උපන්නේ ය. **'තසෙව කම්මස්ස විපාකාවසෙසෙන'** යනු එහෙයින් වදළ සේක. ඔහුට වනාහි නරකයෙන් චුතවන කල්හි මස් රහිත වූ ගවයන්ගේ ඇට රාසියක් ම නිමිත්ත වූයේ ය. හෙතෙමේ වැසී ගියා වූ ද ඒ කම්ය නුවණැත්තවුන්ට ප්‍රකට කරන්නා සේ ඇටසැකිලි ප්‍රෙතයෙක් වූයේ ය.

මංසපෙසිවත්ථුවෙහි - ගොඝාතක තෙමේ මස් කපා වැදිලි කොට වියලා වියලිමස් විකිණීමෙන් අවුරුදු බොහෝ ගණනක් ජීවිකාව කෙළේය. එහෙයින් ඔහුට නරකයෙන් චුතවන කල්හි මස්වැදිලි ම නිමිත්ත වූයේ ය. හෙතෙමේ මාංසපෙශී ප්‍රෙතයෙක් වූයේ ය. මංසපිණ්ඩවත්ථුවෙහි - ඒ ලිහිනිවැදි තෙමේ පක්ෂීන් අල්ලා ගෙණ විකුණන කාලයෙහි ඒ පක්ෂීන් පියාපත් සම් රහිත කොට මස් පිඩු පමණ කොට විකුණමින් ජීවිකාව

කෙළේ ය. එහෙයින් ඔහුට නරකයෙන් ච්‍යුතවන කාලයෙහි මස්පිඬ ම නිමිත්ත වූයේ ය. හෙතෙමේ මංසපිණ්ඩප්‍රෙතයෙක් වූයේ ය. නිච්ඡවිවස්තුවෙහි - එළුවන් මරා සම් රහිත කොට කරණුලද ජීවිකාව ඇති ඒ එළුවන් මැරුවහුට පළමු කියූ නයින් ම සම් රහිත එළුසිරුරක් නිමිත්ත වූයේ ය. හෙතෙමේ නිච්ඡවිප්‍රෙතයෙක් වූයේ ය. අසිලොමවස්තුවෙහි - ඒ ඌරු වැදි තෙමේ බොහෝ කලක් තමන් වපුළ ගොදුරෙන් පොහොනියට ගිය ඌරන් කඩුවෙන් කපා මරා විකුණමින් ජීවිකාව කෙළේ ය. එහෙයින් ඔහුට එසවූ කඩු ඇති බව ම නිමිත්ත වූයේ ය. එහෙයින් අසිලොම ප්‍රෙතයෙක් වූයේ ය. සත්තිලොම වස්තුවෙහි ඒ මුව වැදිතෙමේ එක් මුවකු ද අඩයටියක් ද ගෙන වනයට ගොස් ඒ මුවාගේ සමීපයට ආ ආ මුවන් සැතින් විද මැරූයේ ය. ඔහුට සැතින් විදින්නකු බව ම නිමිත්ත වූයේ ය. එහෙයින් සත්තිලොමප්‍රෙතයෙක් වූයේ ය. උසුලොම වස්තුවෙහි - 'කාරණිකො' යනු රාජාපරාධීන් අල්ලා නොයෙක් කම් කටොලුවලින් පෙළා අවසානයෙහි ඊයෙන් විද මරණ පුරුෂතෙමේය. හෙතෙමේ අසුවල් පෙදෙසට විදිනලද්දේ මැරේය යි දන ම මර්මස්ථානයට විදියි. මෙසේ ජීවිකාව කොට නිරයෙහි උපන් ඔහුට පැසී ඉතිරී වූ කර්මයාගේ වසයෙන් මෙහි උපදින කාලයෙහි ඊයෙන් විදිනබවම නිමිත්ත වූයේ ය. එහෙයින් උසුලොම ප්‍රෙතයෙක් වූයේ ය. සූචිලොම වස්තුවෙහි- **'සාරථී'** අශ්වයන් දමනය කරන්නේ ය. ගවයන් දමනය කරන්නෙකැ යි **කුරුන්දිඅට්ඨකථාවෙහි** කියනලදී. ඔහුට කැවිටිහිදියෙන් විදින බව ම නිමිත්ත වූයේ ය. එහෙයින් සූචිලොමප්‍රෙතයෙක් වූයේ ය. දවීතීය සූචිලොම වස්තුවෙහි - **'සූචකො'** ප්‍රියභාවය ශූන්‍ය කරන්නේ ය. හෙතෙමේ වනාහි මිනිසුන් ඔවුනොවුන් බිඳ හැරීයේ ය. රජකුලයෙහි ද මොහුගේ මෙනම් සභාවයක් ඇත්තේ ය, මොහුවිසින් මෙනම් දෙයක් කරණ ලද' යි කේලම් කිය කියා අනයව්‍යසනයට පත් කෙළේ ය. එහෙයින් යමසේ මොහු විසින් ප්‍රියභාවය ශූන්‍ය කොට මනුෂ්‍යයෝ බිඳින ලද්දහු ද, එහෙයින් හිදියෙන් බිඳින දුක අනුභව කරණු පිණිස ඒ කර්ම ම නිමිත්ත කොට සූචිලොමප්‍රෙතයෙක් වූයේ ය.

අණ්ඩභාරිවස්තුවෙහි - **'ගාමකූටො'** විනිශ්චයකාරක අමාත්‍ය තෙමේ ය. ඔහු කළ කර්මයට සමානභාවයෙන් ඔහුගේ අණ්ඩයෝ කුඹු පමණ මහාකළගෙඩි පමණ වූහ. හෙතෙමේ වනාහි යම්හෙයකින් රහසිගතව පිළිසන් තැන දී අල්ලස් ගෙණ කුට විනිශ්චයෙන් දෙස් පළට කරමින් හිමියන් අහිමියන් කෙළේ ය. එහෙයින් ඔහුගේ රහස් අවයවය ප්‍රකටව උපන්නේ ය. යම්හෙයකින් දඩ පිහිටුවමින් දඩ ගස්වමින් අන්හට නො ඉවසිය හැකි බර නැංවී ද, එහෙයින් මොහුගේ රහසහ නො

ඉවසිය හැකි බර ඇත්තක්ව හටගත්තේ ය. යම්හෙයකින් යම්තැනක සිටියහුවිසින් සම විය යුත්තේ ද, එහි සිට විසම වූයේ ය. නො දැහැමි වූයේ ය. එහෙයින් මොහුගේ රහසහෙහි හිඳීම් වයසෙන් විසම වූ පිහිටීම් ඇත්තේ වීය. පාරදාරික වසතුවෙහි - ඒ සත්ත්වතෙමේ අන්හු විසින් රක්නාලද ගොපනය කරණුලද අන්හිමියනට අයත් වූ පහස පහසන්නේ **ගූථසුඛය** යි කියනු ලබන කාමසුඛයෙන් සිත අලවා කම්සමානත්වයෙන් ගූථසාශීය පහසමින් දුක් අනුභව කරන්නට එහි උපන්නේ ය.

දුට්ඨබ්‍රාහ්මණත්වසතුව ප්‍රකට ම ය. නිරජවිවසතුවෙහි - යම්හෙයකින් මාගම සඤ්ඡාමික බැවින් තමන්ගේ පහසෙහි ඊර්ෂ්‍යාවර නො වේ ද, ඕ තොමෝ ද හිමියා සතු පහස සොරකම් කොට අන්හට ඇල්ම ඉපද වූවා ද, එහෙයින් කම්සමානත්වයෙන් සුවපහසින් පිරිහී දුක්පහස විඳීමට සිවිරහිතස්ත්‍රියක්ව උපන්නී ය. මඬගුලිත්ථීවසතුවෙහි **'මඬගුලි'** විරූප වූ නො දැකිය හැකි බිහිසුණු වූ ඕ තොමෝ වනාහි ඉක්ඛිණිකාකම්ම නම් වූ යක් දසිකම් කරන්නී, 'මේ මේ දැයින් මෙසේ බිලියම් කළ කල්හි තොපට මෙනම් වැඩීම වන්නේය' යි මහාජනයාගේ ගඳ මල් ආදිය රැවටීමෙන් ගෙන මහාජනයා ලවා නිඳිත දෘෂ්ටිය වූ මිත්‍යාදෘෂ්ටිය ගැන්වූ ය. එහෙයින් කම්සමානත්වයෙන් සුවඳ මල් ආදිය සොරකම් කළ බැවින් දුගඳ ඇත්තී නපුරු දැකුම් ගැන්වූ බැවින් නපුරු දැකුම් ඇතිව විරූපව බිහිසුණුව උපන්නීය.

ඔකිලිනීවසතුවෙහි - **'උපපක්ඛං ඔකිලිනිං ඔකිරිනිං'** යනු ඕ තොමෝ වනාහි අඟුරුසෑයෙක හොත්තී තදින් සැලෙන්නී ඔබිමොබ පෙරළෙමින් පැසේ. එහෙයින් මතු මතු ව ගින්නෙන් පැසුණී වේ ද, රළු ගින්නෙන් පැසුනු සිරුරු ඇත්තී ම වේ. යට වැගිරීම් වයසෙන් තෙත් සිරුරු ඇත්තී ය. මැයගේ සිරුරෙන් ඔජා බින්දු බින්දු වැගිරෙත්. ඔබමොබ අඟුරින් වටකරණු ලද්දී අඟුරින් ගැවසුනී ය. ඇගේ යටින් ද කැලමල් පැහැති ගිනි අඟුරු වැටෙත්. එහෙයින් **'උපපක්ඛං ඔකිලිනිං ඔකිරිනිං'** යනු වදළ සේක. ඕ තොමෝ ඊර්ෂ්‍යාවෙන් මඩනා ලද්දී සපත්තියක මත අඟුරුකබලක් හෙළූය. යනු ඇගේ සැමී වූ කලිඟුරජුගේ එක් නාටිකාස්ත්‍රියක්තොමෝ අඟුරුකබලක් සමීපයෙහි තබා සිරුරෙන් දිය පිසදමයි. අතින් ද ඩහ ගන්වයි. රජතෙමේ ද ඇය හා කථා කරයි. සතුටු අයුරු ද දක්වයි. අගමෙහෙසීතොමෝ එය නො ඉවසන්නී ඊර්ෂ්‍යාවෙන් මැඩුනී රජු එතැනින් නැගී ගිය නො බෝ වේලාවක දී ඒ අඟුරු කබල ගෙණ ඇයගේ මතුවෙහි අඟුරු වැගිර වූ ය. ඕ තොමෝ ඒ කම්ය කොට එබඳු වූ ම විපාක විඳින්නට ප්‍රෙතලොකයෙහි උපන්නීය.

වොරසාතකවස්තුවෙහි - හෙතෙමේ රජුගේ අණින් බොහෝ කාලයක් සොරුන්ගේ හිස් සිඳ ප්‍රේතලොකයෙහි ඉපැදෙනුයේ හිස නැති ක්‍රියා සහිත ශරීරයක් ඇතිව උපන්නේ ය. භික්ඛුවස්තුවෙහි - 'පාපභික්ඛු' හීනාචාර ඇති බැවින් ලාමක මහණ තෙමේ ය. හෙතෙමේ වනාහි ලොකයා විසින් ශ්‍රද්ධාවෙන් දෙනලද සිවුපසය වළඳ කායවචීද්වාරයන්ගෙන් අසංයතව බිඳී ගිය ආජීවය ඇත්තේ සිතට රිසි කෙළි කෙළිමින් හැසුරුණේ ය. ඉන් පසු එක් බුද්ධාන්තරයක් නිරයෙහි පැසී ප්‍රේතලොකයෙහි ඉපැදෙනුයේ මහණකු සමාන වූ ම ආත්මභාවයෙන් යුක්තව උපන්නේ ය. භික්ඛුණී - සික්ඛමානා - සාමණේර - සාමණේරී වස්තූන්හි ද මේ විනිශ්චය ම වේ.

තපොදවස්තුවෙහි - **'අවෙජ්ජදකෝ'** පහන්දිය ඇත්තේ ය. **'සීතොදකෝ'** සිහිල් දිය ඇත්තේ ය. **'සාතොදකෝ'** මිහිරිදිය ඇත්තේ ය. **'සෙතකෝ'** පිරිසිදු ය. තිලබීජකාදිභෙද ඇති සෙවෙලින් හා නිල්මැඩිපිට පැහැයෙන් දිය පිට වසා හටගත් පණක නම් සෙවෙලින් හා මඩෙන් ද තොර වූයේ ය. **'සුපතිත්‍ථෝ'** සොඳුරු තොටුපලින් යුක්ත වූයේ ය. **'රමණීයෝ'** ඇලීම උපදවන්නේ ය. **'චක්ඛුමත්තාහි'** රියසක් පමණ වූ **'කඨිතා සන්දති'** කැකැරී ඉතා තදින් කැකැරී ගලාබසියි. **'යත්‍රායං භික්ඛවේ'** මහණෙනි! යම්හෙයකින් මේ **'සෝ දහෝ'** ඒ විල. කොතැනින් මේ විල ගලා බසී ද යත්:- වෙහාරපර්වතයාගේ යට බුමාටුනයින්ගේ පන්සියයක් යොදුන් ඇති දෙවිලොව සමාන වූ මිණිමුවා තෙලින් හා අරමිදයනින් යුක්ත වූ නාග භවනයෙක් වේ. එහි නාගයන්ගේ කෙළිබිමෙහි ඒ දියවිල පිහිටියේ ය. එතැනින් මේ තපොදවිල ගලා බසියි. **'ඉච්ඡානංගලා මහානිරයානං අන්තරිකාය ආගච්ඡති'** රජගහා නුවර වට කොට මහාප්‍රේතලොකයක් වේ. එහි මහත් වූ ලෝකුඹු නිරය දෙකක් අතරින් මේ තපොදව එන්නී ය. එහෙයින් කැකැරී ගලා බසියි.

යුද්ධවස්තුවෙහි- 'නන්දී වරති' ජයබෙරය ගෙණ හැසිරේ. **'රාජා ආවුසෝ ලිච්ඡවී'** ස්ථවිරයන් වහන්සේ තමන්ගේ දිවා තන්හි හා රෑ තන්හි හිඳ 'ලිච්ඡවීහු ධනුශ්ශිල්පයෙහි අති දක්ෂයහ. රාජකුලාදියෙහි දක්වන ලද ශිල්ප ඇත්තාහ. බිම්සර රජතෙමේ ද ඔවුන් සමග පහර දේය' යි ආවර්ජනය කරන්නහු රජු පැරදී පලායන්නහු දිවැසින් දුටහ. ඉක්බිති භික්ෂූන් අමතා 'ඇවැත්නි! තොපගේ උපස්ථායක වූ රජතෙමේ ලිච්ඡවීන් විසින් පරදවනලද'යි කීහ. **'සච්චං භික්ඛවේ මොග්ගල්ලානෝ ආහ'** පැරදුනු කාලය ආවර්ජනය කොට යමක් දක්නාලද ද, එය කියනුයේ ඇත්ත කියේ ය. නාගොගාහවස්තුවෙහි **'සප්පිනිකාය'** මෙනම් ඇති **'ආනෙඤ්ජං සමාධිං'** නො කැපෙන නො සැලෙන කයවචන දෙක්හි සැලීම් රහිත වූ චතුර්ථධ්‍යාන සමාධිය. 'නාගානං' ඇතුගේ **'ඔගාහං**

උත්තරත්තානං' බැස බැස නැවත ගොඩ නගින්නා වූ ඒ හස්තීහු ගැඹුරු දියට බැස එහි නා පැන් බී සොඩින් දිය ගෙණ ඔවුනොවුන් අලළා ගොඩ නගිත්. මෙසේ බැස ගොඩ නගින ඔවුන්ගේ යි කියන ලද්දේ වේ. **'කොඤ්චං කරොන්තානං,** ගංඉවුරෙහි සිට සොඬ මුවෙහි බහා කුඤ්චනාද කරන්නවුන්ගේ **'සද්දං අස්සොසි'** ඒ කුඤ්චනාද ශබ්දය ඇසීම්. **'අත්‍ථෙසො භික්ඛවෙ සමාධි, සො ච අපරිසුද්ධො'** මුගලන්හට මේ සමාධිය ඇත්තේ ය. හෙ ද පිරිසිදු නො වේ.

සථවිරයන් වහන්සේ වනාහි පැවිද්දෙන් සත්වන දිනයෙහි එදවස රහත්බවට පැමිණියාහු අෂ්ටසමාපත්තිවිෂයයෙහි පස්අයුරින් පුරුදු නො කළ වශීභාවය ඇත්තාහු සමාධියට සතුරු වූ ධර්මයන් මැනැවින් පිරිසිදු නො කොට, ආවජ්ජන - සමාපජ්ජන - අධිට්ඨාන - උට්ඨාන - පච්චවෙක්ඛණවසිතාවන් පිළිබඳ හැතීම් පමණක්ම කොට චතුර්ථ ධ්‍යානයට පැමිණ හුන්නාහු, ධ්‍යානාඞ්ගයන්ගෙන් නැගිට ඇතුන්ගේ ශබ්දය අසා සමාපත්තිය තුළදී ම ඇසීම් යි මෙසේ හැතීම් අත්තාහු වූහ. එහෙයින් **'අත්‍ථෙසො භික්ඛවෙ සමාධි, සො ච ඛො අපරිසුද්ධො'** යනු වදළ සේක.

සොහිතවත්‍ථුවෙහි - **'අහං ආවුසො පඤ්ච කප්පසත්තානි අනුස්සරාමි'** යන මෙයින් එකාවජ්ජනයෙන් සිහි කරමි' යි කීය. අන් පරිද්දෙකින් වනාහි ආයුෂ්ශ්‍රාවකයන්ගේ පිළිවෙළින්, නානා වජ්ජනයන්ගෙන් අතීතයෙහි ඒ ඒ විසීම් සිහිකිරීම් ආශ්චය්‍ර්‍ය නො වේය යි භික්ෂූහු අවමන් නො කරන්නාහු ය. යම්හෙයකින් මෙතෙමේ වනාහි එකාවජ්ජනයෙන් සිහිකරමි' යි කීයේ ද, එහෙයින් භික්ෂූහු අවමන් කළාහු ය. **'අත්‍ථෙසා භික්ඛවෙ සොහිතස්ස සා ච ඛො එකායෙව ජාති'** සොහිත තෙමේ යම් ජාතියක සිහිකරමි'යි කීයේ ද සොහිත මේ ජාතිය ඇත්තී ය. ඕ තොමෝ ද එක් ම ජාතියකි. අතර රහිතව උපිළිවෙළින් සිහි නො කරණ ලද ය යන අදහස වේ.

කෙසේ වනාහි මෙතෙමේ මේ එක්ම ජාතියක් සිහි කෙළේ ද යත්:- මෙතෙමේ කප් පන්සියයකට පෙර තීර්ථායතනයෙක පැවිදිව අසංඥසමාපත්තිය උපදවා නො පිරිහුනු ධ්‍යාන ඇත්තේ කලුරිය කොට අසංඥභවයෙහි උපන්නේ ය. එහි ආයු ඇතිතාක් සිට අවසානයෙහි මිනිස් ලොව උපන්නේ සසුනෙහි පැවිදිව ත්‍රිවිද්‍යාවන් සාක්ෂාත් කෙළේ ය. හෙතෙමේ පූර්වේනිවාසය සිහිකරණුයේ මේ ආත්මභාවයෙහි ප්‍රතිසන්ධිය දක ඉන් ඔබ තෙවන අත්බවෙහි ව්‍යුතිය පමණක් ම දුටු යේය. ඉක්බිති ඒ ව්‍යුති - ප්‍රතිසන්ධි දෙක අතර අචිත්තක ආත්මභාවය සිහි කරන්නට නො හැකිවනුයේ 'එකාන්තයෙන් මම අසංඥීභවයෙහි උපන්මි'යි නය වසයෙන් සැලකුයේ ය. මෙසේ සලකන ඔහු විසින් දුෂ්කරයක් කරන ලද්දේ ය. සියක් වර පැළූ අස්ලොම් කෙළවරින් කෙළවර අවබොධ

කරණ ලද්දී ද, ඒ සමාන වේ. අහසෙහි පියවර දක්වීම සමාන වේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මේ වස්තුවෙහි 'මහණෙනි! පූර්වේනිවාසය සිහිකරණ මාගේ ශ්‍රාවක භික්ෂූන් අතුරෙහි යම් මේ සොහිත භික්ෂු නමක් වේ ද, මෙතෙමේ අග්‍ර වේය' යි එතදග්‍රයෙහි තැබූසේක.

'උද්දිට්ඨා ඛො ආයස්මන්තෙහා චත්තාරො පාරාජිකා ධම්මා' මෙය මෙහි උදෙසූ පාරාජිකාවන්ගේ දැක්වීම වේ. සියල්ල එක් කොට සූවිසි පාරාජිකයෝ දතයුත්තාහ. කවර සූවිස්සක් ද යත්:- පෙළෙහි ආවා වූ භික්ෂූන් පිළිබඳ සතරය. භික්ෂූන් හා අසාධාරණ වූ භික්ෂුණීන් පිළිබඳ උභතොසඞ්ඝමණ්ඩලිකා - වජ්ජපටිච්ඡාදිකා - උක්ඛිත්තානුවත්තිකා - අට්ඨවත්ථුකා යන සතර ද යි යන අට ය. එකොළොස් අභව්‍ය පුද්ගලයෝ ය. ඔවුන් අතුරෙහි පණ්ඩක - තිරච්ඡානගත - උභතොබ්‍යඤ්ජනක යන තිදෙන පැවිද්දට හා උපසම්පදවට වසඟ නො වන බැවින් වසඟ විපන්නයෝ ය. පැවිදි - උපසම්පදවෙහි සිට උපරිමාගී හෙතුව සැපයීම නොකටහැකි බැවින් අහෙතුකප්‍රතිසන්ධිකයෝ ය. ඔවුන්ට සඞ්ඝීය නො වළකන ලද්දේ ය. මාගීය වනාහි වළකන ලද්දේ ය. වසඟ විපන්න බැවින් ඔවුහු මාගීප්‍රතිලාභය පිණිස අභව්‍යයෝ ම ය. ඔවුන්ට පැවිද්ද වළකන ලද ය. එහෙයින් ඔවුහු ද පාරාජිකයෝ ය.

ථෙය්‍යසංවාසක තෙමේ ය, තිත්ථියපක්කන්තක තෙමේ ය, මාතුඝාතක තෙමේ ය, පිතුඝාතක තෙමේ ය, අරහන්තඝාතක තෙමේ ය, භික්ඛුනීදූසක තෙමේ ය, රුහිරුප්පාදක තෙමේ ය, සඞ්ඝභෙදක තෙමේ ය යන මොවුහු අට දෙන තම තමන්ගේ ක්‍රියා හෙතුවෙන් විපතට පැමිණි බැවින් අභව්‍යස්ථානයට පැමිණියහ යි පාරාජිකයෝ ම වෙති. ඔවුන් අතුරෙහි ථෙය්‍යසංවාසක තෙමේ ය, තිත්ථියපක්කන්තක තෙමේ ය, භික්ඛුනීදූසක තෙමේ ය යන මොවුන් තිදෙනාහට සඞ්ඝීය නො වළකන ලද ය. මාගීය වනාහි වළකන ලද්දේ ම ය. අන්හු පස් දෙනාහට සඞ්ඝීමොක්ෂ දෙක ම වළකන ලද්දේ ය. ඔවුහු වනාහි අතර නො තබා ම නිරයෙහි උපදින සත්ත්වයෝ ය. මෙසේ මේ එකොළොස්දෙන ද, පළමු අටදෙන ද යි එකුන්විසිදෙන වෙති. ඔවුහු ගිහි වෙස් දරීමෙහි ආශා උපදවා ගිහිනිවාසනය හැන්ද වූ භික්ෂුණිය සමග විසිදෙනෙක් වෙති. ඕ තොමෝ වනාහි අඛ්‍යාචාරව්‍යතික්‍රමයක් නො කොට ද මෙපමණකින් අශ්‍රමණී වූය. මේ වනාහි විසි පාරාජිකයෝ ය.

එල්බෙන දිග් වූ අඞ්ගජාතය ඇති බැවින් තමන්ගේ මුවමග හෝ වසමග ප්‍රවේශ කරන්නේ ය. මුදුපිට ඇති බැවින් තම නිමිත්ත මුවෙන් ගන්නේ ය. අනුන්ගේ අඞ්ගජාතය මුවෙන් ගන්නේ ය. අන්හුගේ කම්ණ්‍ය

අඞ්ගජාතය මතුවෙහි තමනගේ වසමග යොද හිඳින්නේ ය. යන මොවුන් සිවුදෙනාගේ වසයෙන් අනුලොම පාරාජිකයෝ සතරකැ යි කියත්. මේ පාරාජිකයෝ යම්හෙයකින් රාග වසයෙන් සමාන බවට ගියා වූ දෙදෙනක්හුගේ ධර්‍මය, මෙථුන ධර්‍මැ යි කියනු ලැබේ ද, එහෙයින් මේ ක්‍රමයෙන් මෙවුන්දම් සෙවුම් නො කොට හුදෙක් මගින් මග ප්‍රවෙශ කිරීම් වසයෙන් පැමිණිය යුතු බැවින් මෙථුන පාරාජිකයට අනුලොම් වෙත් නු යි අනුලොම පාරාජිකයෝ ය යි කියනු ලැබෙත්. මෙසේ මේ සතර ද පළමු දක්වූ විස්ස ද එක් කොට සියල්ලෝ ම සූවිසි පාරාජිකයෝ ය යි දත යුත්තාහ.

'න ලභති භික්ඛූහි සද්ධිං සංවාසං' භික්ෂූන් සමග උපොසථ-පවාරණ - පාතිමොක්ඛුද්දෙස - සඞ්ඝකම්ම වසයෙන් ප්‍රභෙදවත් වූ සංවාසය නො ලබයි. **'යථා පුරෙ තථා පච්ඡා'** පෙර ගිහි කාලයෙහි හා අනුපසම්පන්නකාලයෙහි යම්සේ නම්, පසුව පාරාජිකයට පැමිණියේ ද, එසේ ම සංවාසයක් නැත්තේ වේ. ඔහුට භික්ෂූන් සමග උපොසථ - පවාරණ - පාතිමොක්ඛුද්දෙස - සඞ්ඝකම්ම යි ප්‍රභෙදයට ගියා වූ සංවාසය නැත්තේය යි භික්ෂූන් සමග සංවාසය නො ලබයි. **'තත්‍රායස්මන්තෙ පුච්ඡාමි'** ඒ සිවුපාරාජිකා අතුරෙහි ආයුෂ්මත්හු මෙහිලා කිම? පිරිසිදු වහු ද යි විචාරම්. **'කච්චිත්ථ'** කිම මෙහි? මේ සිවු පාරාජිකා අතුරෙහි කිම? පිරිසිදු වහු ද යි යන අර්‍ථ යි. නොහොත් **'කච්චිත්ථ පරිසුද්ධා'** කිම? පිරිසිදු වහු, වහු ද යන අර්‍ථ යි. සෙස්ස සියලු තන්හි පැහැදිලි අර්‍ථ ඇත්තේ ම ය.

විනයවිවෘති නම් වූ
සිංහලසමන්තපාසාදිකාවෙහි
චතුරථපාරාජිකවර්‍ණනාව නිමි.

—\\—

පාරාජිකකාණ්ඩය නිමියේ ය.